බුද්ධජයන්තිත්‍රිපිටකග්‍රන්ථමාලා: 19

සූත්‍රාන්තපිටකයෙහි

13 වන ග්‍රන්ථය

# අඞ්ගුත්තරනිකාය

## ද්විතීයභාගය

## චතුක්කනිපාතය

---

ත්‍රිපිටක පරිවර්තන කාරක සභාවෙහි

අඞ්ගුත්තරනිකාය සංශෝධක මණ්ඩලය
විසින් කරණ ලද

සිංහල පරිවර්තනයෙන් යුක්ත යි.

බු.ව. 2500
ක්‍රි.ව.1956

Buddha Jayanti Tripitaka Series, Volume 19

The Thirteenth Book in the
**Suttanta-Pitaka**

**13**

# ANGUTTARANIKĀYA (II)

With the Sinhala translation by

**The Anguttaranikāya Editorial Board**
**of**
**The Tripitaka Translation Committee**

නමෝ තස්ස භගවතෝ සබ්බධම්මේසු අප්පටිහතඤාණචාරස්ස දසබලධරස්ස චතුවේසාරජ්ජවිසාරදස්ස සබ්බසත්තුත්තමස්ස ධම්මිස්සරස්ස ධම්මරාජස්ස ධම්මස්සාමිස්ස තථාගතස්ස සබ්බඤ්ඤුනො සම්මාසම්බුද්ධස්ස !!!

භාග්‍යවත් වූ සියලු ධර්මයන්හි නොපැකිල ඥානචාර සහිත වූ දසබලධාරී වූ චතුර්වෛශාරදත්ව විශාරද වූ සියලු සත්වයන්ට උත්තම වූ ධර්මයට ඊශ්වර වූ ධර්මරාජ වූ ධර්මස්වාමී වූ තථාගත වූ සර්වඥ වූ සම්මා සම්බුදුනට නමස්කාර කරමි !!!

කෙළලක්ෂයක් සක්වලයන්හි සියලු ආර්යයෝ ද සියලු සත්පුරුෂයෝ ද මාගේ නමස්කාරය පිළිගනිත්වා !!!

## බුද්ධජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා
## පරිගණක ගත කර නොමිළයේ බෙදාහැරීමේ
## මහා ධර්ම දානමය පුණ්‍යකර්මය

**"අපාරුතා තේසං අමතස්ස ද්වාරා**
**යේ සෝතවන්තෝ පමුඤ්චන්තු සද්ධං"**

"කන් ඇත්තාහු සැදැහැ මුදත්වා
ඔවුනට අමා දොර විවෘත කරන ලදී"

අප භාග්‍යවත් අර්හත් සම්මා සම්බුදුරජාණන් වහන්සේගේ ප්‍රථම අනුසාසනය මෙහි ලා සිහි කිරීම ත්‍රිපිටක ශ්‍රී සද්ධර්මය පරිශීලනය කරන්නා වූ පින්වතුන්ගේ අභිවෘද්ධිය පිණිස ම වන බව අපගේ හැඟීම ය.

සැම කල්හි ඥාන සම්ප්‍රයුක්ත ව ක්‍රියා කරන්නා වූ සියලු සම්මා සම්බුදුරජාණන් වහන්සේලාගේ පලමු අනුශාසනය, බුද්ධ රත්නය කෙරෙහි ගෞරව කරන්නා වූ බුදුරජාණන් වහන්සේගේ සම්මා සම්බුදු බෝධිය අදහන්නා වූ කවර නම් පුද්ලයෙකු නො සළකා හිදිත් ද ? චතු වෛශාරදත්ව සහිත වූ දශ බල සහිත වූ අනාවරණ ඥාන සහිත වූ සර්වඥ වූ මහා කාරුණිකයන් වහන්සේ පවා නිවන අවබෝධ කර ගැනීම පිණිස ධම්මානුධම්ම ප්‍රතිපදාව ආරම්භ කරන පුද්ගලයා තුල 'සද්ධා' නම් වූ ගුණය අත්‍යාවශ්‍ය ය යන්න අවධාරනය කරන සේක.

මෙම ත්‍රිපිටක ශ්‍රී සද්ධර්මය සැක නොකළ යුතු ය. සැක කරමින් හදාරන ලෞකික ශිල්ප ශාස්ත්‍ර පවා පරිපූර්ණ ව නො පිහිටන බව සිහි ඇතිව බැලීමෙන් නුවණ ඇත්තාහට දැක ගත හැකි ය. පුරුෂයා ශ්‍රේෂ්ඨ බවට පමුනු වන්නා වූ සද්ධා ධනය සහිත ව ("සද්ධීධ වින්තං පුරිසස්ස සෙට්ඨං") මෙම ධර්ම රත්නය පරිශීලනය කරන්නාහට සද්ධා අංගයෙන් ලැබිය යුතු සියල්ල ලැබෙනු නො අනුමාන ය. එසේ ම සිහියෙන් ලැබිය යුතු කොටස ද වීර්යයෙන් ලැබිය යුතු කොටස ද සමාධියෙන් ලැබිය යුතු කොටස ද ප්‍රඥාවෙන් ලැබිය යුතු කොටස ද ලැබෙන පරිදි සද්ධා, සති, විරිය, සමාධි සහ ප්‍රඥා යන පංච ධර්මයන් තමා තුල ඇති කර ගෙන මහත් වූ ගෞරවය සහිත ව ධර්මාවබෝධය පිණිස ම යොමු වූ දැඩි අධිෂ්ඨානයෙන් මෙම ධර්ම පුස්තක පරිශීලනය කළ යුතු ය. අපගේ බුද්ධ ශාසනයෙහි

ධර්ම ශ්‍රවනයෙන් මග ඵල ලැබුවෝ ම අධික ය. විමුක්තිය ලබන්නා වූ ක්‍රම වේදයන් පහක් විස්තර කරන්නා වූ අංගුත්තර පංචක නිපාතයෙහි 'විමුත්තායතන' සූත්‍රයෙහි නිවන ලබන ක්‍රම වේද සතරක් ම ධම්ම දේශණාමය සහ ධම්ම සවනමය පුණ්‍ය කර්ම ඇසුරින් සිදුවන බව පැහැදිලි කර ඇත. පස්වැනි ක්‍රම වේදය භාවනාමය පුණ්‍ය කර්මය ප්‍රගුණ කිරීමෙන් සාර්ථක වන බව ද එහි සඳහන් වේ.

මහත් වූ ගෞරවාදරයෙන් මහා සුගතයන් වහන්සේගේ අනුශාසනය පිළිපදින්නා වූ අප්‍රමාදී ව ධම්මානුධම්ම ප්‍රතිපදාව වඩන්නා වූ සියලු සත්නට, ත්‍රෛකාලික වූ සියලු දුකින් මිදී ලබන්නා වූ අජර වූ අමර වූ අමා මහ නිවන අවබෝධ වීම පිණිස මෙම මහඟු පුණ්‍ය කර්මය උපනිශ්‍රය වේවා !

ආර්යයන් වහන්සේලා පහළවීමෙන් සිරිලක බැබලේවා !

බුද්ධ ශාසනය දියුණුවී චිරස්ථිතික වේවා !

ලෝ සත්නට සෙත් වේවා !

**"අමතං දදෝ ච සෝ හෝති, යෝ ධම්මමනුසාසති"**

( *යමෙක් ධර්මානුශාසනය කරන්නේ ද, හේ අමෘතය දෙන්නේ ය* )

මෙම ධර්ම දානමය පුණ්‍ය කර්මය

මෝහ තිමිර විධ්වංසනය කරන්නා වූ ලොවට උතුම් ආලෝකය වූ මහා කාරුණික වූ

සම්මාසම්බුදුරජාණන් වහන්සේගේ සර්වඥතා ඥානයට ද මහා කරුණා ගුණයට ද

පූජෝපහාරයක් ම වේවා !!!

කෙළලක්ෂයක් සක්වලයන්හි සියලු ආර්යයෝ ද සියලු සත්පුරුෂයෝ ද

අපගේ පුණ්‍ය කර්මය අනුමෝදන් වෙත්වා !!!

ශාසනාභිවෘද්ධිකාමී,

සමින්ද රණසිංහ.

2009.06.28

# සුත්තන්තපිටකෙ

# අඞ්ගුත්තරනිකායො

## දුතියො භාගො

# සූත්‍රාන්තපිටකයෙහි

# අඞ්ගුත්තරනිකාය

## ද්විතීයභාගය

Free Distribution www.aathaapi.org

"තථාගතප්පවෙදිතො භික්ඛවෙ ධම්මවිනයො විවටො විරොචති නො පටිච්ඡන්නො"

"මහණෙනි, තථාගතයන් වහන්සේ විසින් දෙශනා කරණ ලද ධර්මය හා විනය විවෘත වූයේ බබලයි. වැසුනේ නො බබලයි."

(අඞ්ගුත්තරනිකාය, තිකනිපාත - භරණ්ඩුවග්ග, 9 සූත්‍රය.)

සැලකිය යුතුය : මෙම පොතෙහි පටුන, පිටු අංක 13 හි ඇතුලත් කර ඇත. එම පටුනෙහි මාතෘකාවන් හා පිටු අංක අදාළ පිටු සමඟ සම්බන්ධ කර ඇත. මෙහි කියවීමට ඇති ප්‍රදේශයට වම් පසින් ඇති 'පිටු යොමුව' භාවිතා කිරීමෙන් නැවත පටුනට පැමිණීමට පුලුවන. වම් පසින් පාළි පිටුව ද දකුණු පසින් අදාළ සිංහළ පිටුව ද කියවීම සඳහා VIEW menu PAGE DISPLAY option and select TWO-UP CONTINUOUS යන ක්‍රමය භාවිතා කරන්න.

Please note : The TABLE OF CONTENTS of this book is located in page no:13 and it is linked with associated pages in the book for your convenience. You can easily click on the page number or content description in the 'Table of Contents' and you will be directed to the relevant page. Bookmarks located to the left of reading area can be used to navigate back to 'Table of Contents' Page. If you would like to view Pali page on your left and the relevant Sinhala page on your right select the menu items as follows; VIEW menu PAGE DISPLAY option and select TWO-UP CONTINUOUS.

# පටුන

## CONTENTS


| | | පිටුව |
|---|---|---|
| සංස්කාරක නිවේදනය | ... | xi |
| සංකේත නිරූපණය — ABBREVIATIONS | ... | xiii |
| පාළි හෝඩිය — PĀLI ALPHABET | ... | xv |
| විෂයසූචි | ... | xvi |
| පෙළ හා පරිවර්තනය | ... | 2-497 |
| ගාථාදිපාදානුක්කමණිකා | ... | 498-500 |
| සද්දත්ථානුක්කමණිකා | ... | 501-502 |
| පදානුක්කමණිකා | ... | 503-553 |

# සංස්කාරකනිවේදනය

**අඞ්ගුත්තරනිකායෙහි** චතුක්කනිපාතය අවසන් කොට ඇති මේ ද්විතීය භාගය **බුද්ධජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා** සංඛ්‍යාවෙන් එකුන්විසි (19) වැනි **සූත්‍රාන්තපිටක ග්‍රන්ථ** සංඛ්‍යාවෙන් තෙළෙස්වැනි ග්‍රන්ථයයි.

ත්‍රිපිටක පරිවර්තන සංස්කාරක සභාවෙහි අඞ්ගුත්තරනිකාය සංශෝධක මණ්ඩලයට ඇතුළත් ශ්‍රී ලංකා විද්‍යාලඞ්කාර විශ්ව විද්‍යාලයෙහි කථිකාචාර්ය පණ්ඩිත **කෝද්දගොඩ ඤාණාලෝක**, දක්ෂිණ ලඞ්කාවෙහි ප්‍රධාන සඞ්ඝනායක ස්ථවිරයන් වහන්සේ, ශ්‍රී ලඞ්කා විද්‍යෝදය විශ්ව විද්‍යාලයෙහි කථිකාචාර්ය දෙනමක් වන පණ්ඩිත **පරවාහැර පඤ්ඤානන්ද** ස්ථවිරයන් වහන්සේ හා පණ්ඩිත **කලල්ලේ ධම්මානන්ද** ස්ථවිරයන් වහන්සේ යන තෙනම විසින් මෙය සිංහල භාෂාවට පරිවර්තනය කරණ ලදී. මේ පරිවර්තනය ද අර්ථව්‍යක්තියෙහි විසද වන්නාසේ ම සිංහල සාහිත්‍යයෙහි උද්දීපනයක් ද වන බව මෙය කියනුවෝ දැනගණිත් ම ය.

මේ කාණ්ඩය මුද්‍රණයට සකස් කිරීමේ දී පෙළෙහි දක්නා ලද පෙර සිට පැවැති ලිපි දෝෂයන් හා අපපාඨයන් ද සංකීර්ණ වූ පදවාක්‍යයන් හා අස්ථාන පතිත පෙය්‍යාලයන් ද යථාස්ථානයට පැමිණවීම සඳහා අප විසින් දරණ ලද ආයාසය අල්ප නොවේ. සූත්‍රාගත අර්ථයට ගැළපෙන සේ සූත්‍ර නම් කිරීමත්, සූත්‍රාගතපාලිසම්බන්ධය ආකූල නොවන සේ පෙය්‍යාල - සංකේත යෙදීමත්, අර්ථාවබෝධයට බාධාවන සේ පෙය්‍යාලයෙන් ඌනවූ තැන් පිරවීමත් මේ සංස්කරණයෙහි ඇති විශේෂයෝ ය.

මෙහි විශේෂයෙන් සැලකිය යුතු කරුණක් ද කියමි. සත්විසි වර්ගයකින් ද පණ්ණාස පසකින් ද බෙදන ලද සූත්‍ර 273 ක් ඇති **චතුක්කනිපාතය** අවසානයෙහි වර්ගසංඛ්‍යාවෙන් නො බෙදූ අතිරේකයක් සේ එන සූත්‍ර 510 ක් ගර්භ කොට ඇති රාගාදි ක්ලේශ ප්‍රහාණය පිළිබඳ දේශනාවෙකි. ධර්මනය දත් අඞ්ගුත්තරභාණකයන් විසින් පෙය්‍යාලමුඛයෙන් සංක්ෂිප්ත කොට දැරූ බැවින් අඞ්ගුත්තර අර්ථකථාචාර්යයෝ එයට "රාගපෙය්‍යාල"යයි කියති. රාග, දෝස, මෝහාදි පද සතළොසක් සම්බන්ධ බැවින් එය "රාගාදි පෙය්‍යාල"යයි අප විසින් දක්වා ඇත. එහි පාලිය පැරැණි පුස්කොළපොත්හි ආසැටියෙන් ම සිංහල අකුරෙන් ද සියම් අකුරෙන් ද මුද්‍රිත පොත්හිද අනුපයුක්ත පෙය්‍යාලයෙන් සංක්ෂිප්ත කොට එක ම වාක්‍යයක් සේ දක්වේ.

"රාගස්ස භික්ඛවෙ අභිඤ්ඤාය චත්තාරො ධම්මා භාවෙතබ්බා, **කතමෙ** චත්තාරො: ඉධ භික්ඛවෙ භික්ඛු කායෙ කායානුපස්සී විහරති ආතාපී සම්පජානො සතිමා විනෙය්‍ය ලොකෙ අභිජ්ඣාදොමනස්සං, වෙදනාසු -පෙ- චිත්තෙ -පෙ- ධම්මෙසු ධම්මානුපස්සී විහරති ආතාපී සම්පජානො සතිමා විනෙය්‍ය ලොකෙ අභිජ්ඣාදොමනස්සං. රාගස්ස භික්ඛවෙ අභිඤ්ඤාය ඉමෙ චත්තාරො ධම්මා භාවෙතබ්බා. රාගස්ස භික්ඛවෙ අභිඤ්ඤාය චත්තාරො ධම්මා භාවෙතබ්බා, කතමෙ චත්තාරො: ඉධ භික්ඛවෙ භික්ඛු අනුප්පන්නානං පාපකානං අකුසලානං ධම්මානං අනුප්පාදාය ඡන්දං ජනෙති වායමති විරියං ආරභති චිත්තං පග්ගණ්හාති පදහති, උප්පන්නානං අකුසලානං ධම්මානං

පහානාය -පෙ- අනුප්පන්නානං කුසලානං ධම්මානං උප්පාදාය -පෙ- උප්පන්නානං කුසලානං ධම්මානං ඨිතියා අසම්මොසාය භීයො භාවාය වෙපුල්ලාය භාවනාය පාරිපූරියා ඡන්දං ජනෙති වායමති විරියං ආරභති චිත්තං පග්ගණ්හාති පදහති. රාගස්ස භික්ඛවෙ අභිඤ්ඤාය ඉමෙ චත්තාරො ධම්මා භාවෙතබ්බා රාගස්ස භික්ඛවෙ අභිඤ්ඤාය චත්තාරො ධම්මා භාවෙතබ්බා, කතමෙ චත්තාරො: ඉධ භික්ඛවෙ භික්ඛු ඡන්දසමාධිපධානසංඛාර සමන්නාගතං ඉද්ධිපාදං භාවෙති, විරියසමාධි -පෙ- චිත්තසමාධි -පෙ- වීමංසාසමාධි-පධානසංඛාරසමන්නාගතං ඉද්ධිපාදං භාවෙති රාගස්ස භික්ඛවෙ අභිඤ්ඤාය ඉමෙ චත්තාරො ධම්මා භාවෙතබ්බා. රාගස්ස භික්ඛවෙ පරිඤ්ඤාය - පරික්ඛයාය - පහානාය - ඛයාය - වයාය - විරාගාය - නිරොධාය - චාගාය - පටිනිස්සග්ගාය ඉමෙ චත්තාරො ධම්මා භාවෙතබ්බා -පෙ- දොසස්ස -පෙ- මොහස්ස -පෙ- කොධස්ස -පෙ- උපනාහස්ස -පෙ- මක්ඛස්ස -පෙ- පළාසස්ස -පෙ- ඉස්සාය -පෙ- මච්ඡරියස්ස -පෙ- මායාය -පෙ- සාඨෙය්‍යස්ස -පෙ- ථම්භස්ස -පෙ- සාරම්භස්ස -පෙ- මානස්ස -පෙ- [අතිමානස්ස -පෙ-] මදස්ස -පෙ- පමාදස්ස -පෙ- අභිඤ්ඤාය - පරිඤ්ඤාය-පරික්ඛයාය - පහානාය - ඛයාය - වයාය - විරාගාය - නිරොධාය-චාගාය - පටිනිස්සග්ගාය ඉමෙ චත්තාරො ධම්මා භාවෙතබ්බා''ති.

මෙහි "රාගස්ස භික්ඛවෙ අභිඤ්ඤාය චත්තාරො ධම්මා භාවෙතබ්බා. කතමෙ චත්තාරො" ආදි උද්දෙස - නිද්දෙස - නිගමන විසින් වදාළ කරුණු සතරින් සතරින් යුත් සූත්‍ර තුනකි. ඒ සූත්‍ර තදන්තර්ගත විෂයානුරූප ව "චතුසතිපට්ඨාන, චතුසම්මප්පධාන, චතුරිද්ධිපාද" නමින් අප විසින් වෙන් කොට දක්වා ඇත. (පිටු 492) මේ සූත්‍ර හා මෙත වෙත ම යෙදෙන රාගාදි පද සතළොස් දෙනෙකි. රාගාදි එක් එක් පදය හා සම්බන්ධ වන "අභිඤ්ඤාය" ආදි පද දසයකි. "රාගස්ස භික්ඛවෙ අභිඤ්ඤාය චත්තාරො ධම්මා භාවෙතබ්බා' ආදි අනුපුබ්බපදඝටනායෙන් යුත් දෙශනා ක්‍රමය අනුව එක් පදයෙක යෙදෙන සූත්‍ර 30 ක් වේ. මෙසෙසින් සතළොස් පදයෙහි සූත්‍ර 510 කි. රාගාදි පෙය්‍යාලයෙහි මෙතෙක් සූත්‍ර ඇතුළත් බව ද එහි ක්‍රමය ද මෙහි මුද්‍රිත පාළියෙහි අප විසින් යොදා ඇති පෙය්‍යාලයෙන් හා අධොලිපියෙන් දත හැකි වේ. අධොලිපිය (පිටු 496-97) යෙදී ඇත්තේ රාගාදි **සොළොස්පදයන්ගේ** වශයෙනි. එය පෙළේ එන "**අතිමාන** පදය පිටපත් කරණ ලද සිංහල පොතේ ගිලිහී යාමෙන් වූ ප්‍රමාදයෙකි.

මේ ග්‍රන්ථය ද මුද්‍රණය කරවා ප්‍රසිද්ධ කිරීම සඳහා උපකාරී වූ **ලංකා ආණ්ඩුව** ද, එහි **සාංස්කෘතික කාර්යාංශයෙහි** අධිකාරීහු ද, **සිංහල ජාතික මුද්‍රණාලයෙහි** අධිකාරීන් හා මුද්‍රණ ශිල්පීහු ද, ග්‍රන්ථ පරිවර්තනය හා සංශොධනය කිරීමෙහි යෙදුනු ස්ථවිරයන් වහන්සේ ද ධර්මදානමය පුණ්‍යමහිමයෙන් සුඛභාගී වෙත්වා යි ආශංසනය කරම්හ.

මීට:

**පරවාහැර වජිරඤාණ ස්ථවිර**
ත්‍රිපිටකපරිවර්තන කාරක සභාවෙහි ද
සංස්කාරක මණ්ඩලයෙහි ද සම්පාදක

බුද්ධ වර්ෂ 2505.
ත්‍රිපිටක කාර්යාලය,
ධර්මදූතාශ්‍රම විද්‍යාලය,
දෙමටගොඩ පාර, කොළඹ.

# සඞ්කෙතනිරූපණය

## ABBREVIATIONS

සී. — සීහළ-තාළපණ්ණපොත්ථකං

සීමු. — සීහළක්ඛර-මුද්දිතපොත්ථකං

ස්‍යා. — ස්‍යාමක්ඛර-මුද්දිතපොත්ථකං

මජසං. — මරම්මඡට්ඨසඞ්ගීති-පිටකපොත්ථකං

PTS. — Pali Text Society-edition.

# PALI ALPHABET

### IN SINHALESE CHARACTERS.

## VOWELS

අa ආā ඉi ඊī උu ඌū එē ඔō

## CONSONANTS

| | | | | |
|---|---|---|---|---|
| කka | ඛkha | ගga | ඝgha | ඞṅa |
| චca | ඡcha | ජja | ඣjha | ඤña |
| ටṭa | ඨṭha | ඩḍa | ඪḍha | ණṇa |
| තta | ථtha | දda | ධdha | නna |
| පpa | ඵpha | බba | භbha | මma |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| යya | රra | ලla | වva | සsa | හha | ළḷa | අංṃ |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| කka | කාkā | කිki | කීkī | කුku | කූkū | කෙkē | කොkō |
| ඛkha | ඛාkhā | ඛිkhi | ඛීkhī | ඛුkhu | ඛූkhū | ඛෙkhē | ඛොkhō |
| ගga | = | = | = | = | = | = | = |

## Conjunct - Consonants

| | | | |
|---|---|---|---|
| ක්කkka | ඤ්චñca | ත්වtva | ම්ඵmpha |
| ක්ඛkkha | ඤ්ඡ=ඡñcha | ද්දdda | ම්බ=බmba |
| ක්‍යkya | ඤ්ජ=ජñja | ද්ධ=ධddha | ම්භmbha |
| ක්‍රිkri | ඤ්ඣñjha | ද්‍රdra | ම්මmma |
| ක්වkva | ඤ්ඤñña | ද්ව=වdva | ම්හmha |
| ඛ්‍යkhya | ඤ්හñha | ධ්වdhva | ය්‍ය=ය්යyya |
| ඛ්වkhva | ට්ටṭṭa | න්තnta | ය්හyha |
| ග්ගgga | ට්ඨ=ඨṭṭha | න්ථntha | ල්ලlla |
| ග්ඝggha | ඩ්ඩḍḍa | න්දnda | ල්‍යlya |
| ග්‍රgra, | ඩ්ඪḍḍha | න්ධndha | ල්හlha |
| ඞ්කṅka | ණ්ටṇṭa | න්නnna, | ව්හvha |
| ඞ්ඛṅkha | ණ්ණṇṇa | න්හnha | ස්මsma |
| ඞ්ගṅga | ණ්ඨṇṭha | ප්පppa | ස්වsva |
| ඞ්ඝṅgha | ණ්ඩ=ඩṇḍa | ප්ඵppha | ස්සssa |
| ච්චcca | ණ්හṇha | බ්බbba | හ්මhma |
| ච්ඡccha | ත්තtta | බ්භbbha | හ්වvha |
| ජ්ජjja | ත්ථttha | බ්‍රbra | ළ්හḷha |
| ජ්ඣjjha | ත්‍රtra | ම්පmpa | |

ා ā ි i ී ī ු u ූ ū ෙ ē ෙ ා ō



Free Distribution www.aathaapi.org

# අඞ්ගුත්තරනිකායො

## දුතියභාග - විසයසූචි


| විසයා: | පිටඞ්කා |
|---|---|
| **චතුක්කනිපාතො** | 2-496 |
| **1. පඨමො පණ්ණාසකො** | **2-104** |
| **1. භණ්ඩගාමවග්ගො** | **2-24** |
| 1. අනුබුද්ධ සුත්තං ... ... ... | 2-4 |
| 2. පතිත ,, ... ... ... | 4-6 |
| 3. පඨමඛත ,, ... ... ... | 6-8 |
| 4. දුතියඛත ,, ... ... ... | 8-10 |
| 5. අනුසොත ,, ... ... ... | 12-14 |
| 6. අප්පස්සුත ,, ... ... ... | 14-16 |
| 7. සොභන්ති ,, ... ... ... | 16-18 |
| 8. වෙසාරජ්ජ ,, ... ... ... | 18-20 |
| 9 තණ්හා ,, ... ... ... | 20 |
| 10. යොග ,, ... ... ... | 20-24 |
| **භණ්ඩගාමවග්ගො පඨමො** | |
| **2. චරවග්ගො** | **26-40** |
| 1. චර සුත්තං ... ... ... | 26-28 |
| 2. සීල ,, ... ... ... | 28-30 |
| 3. පධාන ,, ... ... ... | 30-32 |
| 4. සංවරප්පධාන ,, ... ... ... | 32-34 |
| 5. අග්ගපඤ්ඤත්ති ,, ... ... ... | 34 |
| 6. සොඛුම්ම ,, ... ... ... | 36 |
| 7. අගති ,, ... ... ... | 36 |
| 8. නාගති ,, ... ... ... | 38 |
| 9. අගතිනාගති ,, ... ... ... | 38 |
| 10. භත්තුද්දෙස ,, ... ... ... | 38-40 |
| **චරවග්ගො දුතියො** | |
| **3. උරුවෙලවග්ගො** | **42-64** |
| 1. පඨම උරුවෙල සුත්තං ... ... ... | 42-44 |
| 2. දුතිය උරුවෙල ,, ... ... ... | 44-48 |
| 3. ලොක ,, ... ... ... | 48-50 |
| 4. කාළකාරාම ,, ... ... ... | 50-52 |
| 5. බ්‍රහ්මචරිය ,, ... ... ... | 52 |
| 6. කුහක ,, ... ... ... | 54 |
| 7. සන්තුට්ඨි ,, ... ... ... | 54 |
| 8. අරියවංස ,, ... ... ... | 56-58 |
| 9. ධම්මපද ,, ... ... ... | 58-60 |
| 10. පරිබ්බාජක ,, ... ... ... | 60-64 |
| **උරුවෙලවග්ගො තතියො** | |




Free Distribution www.aathaapi.org

| විෂයො | | පිට්ඨඞ්කො |
|---|---|---|
| | **4. චක්කවග්ගො** | **66-86** |
| 1. | චක්ක සුත්තං ... ... ... | 66 |
| 2. | සඞ්ගහවත්ථු ,, ... ... ... | 66 |
| 3. | සීහ ,, ... ... ... | 66-68 |
| 4. | අග්ගප්පසාද ,, ... ... ... | 70 |
| 5. | වස්සකාර ,, ... ... ... | 72-76 |
| 6 | දෙණ (ලොක) ,, ... ... ... | 76-78 |
| 7. | අපරිහානිය ,, ... ... ... | 78-80 |
| 8. | පතිලීන ,, ... ... ... | 80-82 |
| 9. | උජ්ජය ,, ... ... ... | 84 |
| 10. | උදයී සුත්තං ,, ... ... ... | 86 |

**චක්කවග්ගො චතුත්ථො**

| | | |
|---|---|---|
| | **5. රොහිතස්සවග්ගො** | **88-104** |
| 1. | සමාධි භාවනා සුත්තං ... ... ... | 88-90 |
| 2 | පඤ්හ ව්‍යාකරණ ,, ... ... ... | 90 |
| 3. | පඨමකොධගරු ,, ... ... ... | 90-92 |
| 4. | දුතියකොධගරු ,, ... ... ... | 92 |
| 5. | පඨමරොහිතස්ස ,, ... ... ... | 92-96 |
| 6. | දුතියරොහිතස්ස ,, ... ... ... | 96-98 |
| 7. | සුවිදූර විදූර ,, ... ... ... | 98 |
| 8. | විසාඛ ,, ... ... ... | 100 |
| 9. | විපල්ලාස ,, ... ... ... | 100-102 |
| 10. | උපක්කිලෙස ,, ... ... ... | 102-104 |

**රොහිතස්සවග්ගො පඤ්චමො**

**පඨමො පණ්ණාසකො**

| | | |
|---|---|---|
| | **2 දුතියො පණ්ණාසකො** | **106-194** |
| | **1 පුඤ්ඤාභිසන්දවග්ගො** | **106-122** |
| 1. | පඨම පුඤ්ඤාභිසන්ද සුත්තං ... ... ... | 106-108 |
| 2. | දුතිය පුඤ්ඤාභිසන්ද ,, ... ... ... | 108-110 |
| 3. | පඨම සංවාස ,, ... ... ... | 110-114 |
| 4. | දුතිය සංවාස ,, ... ... ... | 114-116 |
| 5. | පඨම (නකුල) සමජීවි ,, ... ... ... | 116-118 |
| 6. | දුතිය (නකුල) සමජීවි ,, ... ... ... | 118 |
| 7. | සුප්පවාසා ,, ... ... ... | 120 |
| 8. | සුදත්ත අනාථපිණ්ඩික ,, ... ... ... | 120 |
| 9 | භොජනදායක ,, ... ... ... | 122 |
| 10. | ගිහිසාමීචි පටිපදා ,, ... ... ... | 122 |

**පුඤ්ඤාභිසන්දවග්ගො පඨමො.**

| විෂයය | | පිටු අංකය |
|---|---|---|
| | **2 පත්තකම්මවග්ගො** | **124-142** |
| 1. | පත්තකම්ම සුත්තං ... ... ... | 124-130 |
| 2. | අනණ ,, ... ... ... | 130-132 |
| 3. | සබ්‍රහ්ම ,, ... ... ... | 132 |
| 4. | නිරය ,, ... ... ... | 132 |
| 5. | රූප (ප්‍රමාණ) ,, ... ... ... | 134 |
| 6. | සරාග (පුග්ගල) ,, ... ... ... | 134 |
| 7. | අහි (මෙත්ත) ,, ... ... ... | 134-136 |
| 8. | දෙවදත්ත ,, ... ... ... | 136-138 |
| 9. | පධාන ,, ... ... ... | 138-140 |
| 10. | අධම්මික ,, ... ... ... | 140-142 |
| | පත්තකම්මවග්ගො දුතියො | |
| | **3 අපණ්ණකවග්ගො** | **144-156** |
| 1. | පධාන අපණ්ණකපටිපදා සුත්තං ... ... | 144 |
| 2. | දිට්ඨිඅපණ්ණකපටිපදා ,, ... ... | 144 |
| 3. | අසප්පුරිසවධුකා ,, ... ... | 144-148 |
| 4. | පඨම අග්ග ,, ... ... | 148 |
| 5. | දුතිය අග්ග ,, ... ... | 148 |
| 6. | කුසිනාරා ,, ... ... | 148-150 |
| 7. | අචින්තෙය්‍ය ,, ... ... | 150 |
| 8. | දක්ඛිණාවිසුද්ධි ,, ... ... | 152 |
| 9. | වණිජ්ජා ,, ... ... | 152-154 |
| 10. | කම්බොජ ,, ... ... | 156 |
| | අපණ්ණකවග්ගො තතියො | |
| | **4 මචලවග්ගො** | **158-172** |
| 1. | පාණාතිපාති සුත්තං ... ... | 158 |
| 2. | මුසාවාදී ,, ... ... | 158 |
| 3. | වණ්ණ ,, ... ... | 158-160 |
| 4. | කොධගරු ,, ... ... | 160 |
| 5. | තමොතම පරායන ,, ... ... | 162-164 |
| 6. | ඔනතොනත ,, ... ... | 164 |
| 7. | සමණමචල ,, ... ... | 166-168 |
| 8. | සමණමචල සංයොජන ,, ... ... | 168-170 |
| 9. | සමණමචල දිට්ඨි ,, ... ... | 170 |
| 10 | සමණමචල ඛන්ධ ,, ... ... | 172 |
| | මචලවග්ගො චතුත්ථො | |

| විසයා | | | පිට්ඨඞ්කා |
|---|---|---|---|
| | **5. අසුරවග්ගො** | | **174-194** |
| 1 | අසුර | සුත්තං ... ... ... | 174- |
| 2. | පඨමසමාධි | ,, ... ... ... | 174-176 |
| 3. | දුතියසමාධි | ,, ... ... ... | 176-178 |
| 4. | තතියසමාධි | ,, ... ... ... | 178-180 |
| 5 | ඡවාලාත | ,, ... ... ... | 180-182 |
| 6. | රාගවිනය | ,, ... ... ... | 182-184 |
| 7. | ඛිප්පනිසන්ති | ,, ... ... ... | 184-186 |
| 8. | අත්තහිත | ,, ... ... ... | 186 |
| 9. | සික්ඛාපද | ,, ... ... ... | 186-190 |
| 10 | පොතලිය | ,, ... ... ... | 190-194 |

**අසුරවග්ගො පඤ්චමො**

**දුතියො පණ්ණාසකො.**

| | | | |
|---|---|---|---|
| | **තතියො පණ්ණාසකො.** | | **196-272** |
| | **1. වලාහකවග්ගො.** | | **196-216** |
| 1. | පඨමවලාහක | සුත්තං ... ... ... | 196-198 |
| 2. | දුතියවලාහක | ,, ... ... ... | 198-200 |
| 3. | කුම්භසුත්තං | ,, ... ... ... | 200-202 |
| 4. | උදකරහද | ,, ... ... ... | 204-206 |
| 5. | අම්බ | ,, ... ... ... | 206-208 |
| 6. | | (පාළියං නදිස්සති) | — — |
| 7. | මූසිකා | සුත්තං ... ... ... | 208-210 |
| 8. | බලිවද්ද | ,, ... ... ... | 210-212 |
| 9. | රුක්ඛ | ,, ... ... ... | 214 |
| 10. | ආසිවිස | ,, ... ... ... | 216 |

**වලාහකවග්ගො පඨමො.**

| | | | |
|---|---|---|---|
| | **2. කෙසිවග්ගො.** | | **218-234** |
| 1. | කෙසි | සුත්තං ... ... ... | 118-220 |
| 2. | අස්සාජානීයජව | ,, ... ... ... | 220 |
| 3. | අස්සාජානීයපතොද | ,, ... ... ... | 222-224 |
| 4. | නාග | ,, ... ... ... | 226-228 |
| 5. | ඨාන | ,, ... ... ... | 228-230 |
| 6. | අප්පමාද | ,, ... ... ... | 230 |
| 7 | ආරක්ඛ | ,, ... ... ... | 232 |
| 8. | සංවෙජනීය | ,, ... ... ... | 232 |
| 9. | භය | ,, ... ... ... | 234 |
| 10. | දුතියභය | ,, ... ... ... | 234 |

**කෙසිවග්ගො දුතියො.**

| විසයො | | | | | පිටඞ්කො |
|---|---|---|---|---|---|
| | **3. භයවග්ගො** | | | | **234-256** |
| 1. | භය සුත්තං | ... | ... | ... | 234-236 |
| 2. | උදකොරොහභය ,, | ... | ... | ... | 238–242 |
| 3. | පුග්ගල ,, | ... | ... | ... | 242-446 |
| 4. | දුතියපුග්ගල ,, | ... | ... | ... | 246 |
| 5. | තතියපුග්ගල ,, | ... | ... | ... | 246–248 |
| 6. | චතුත්ථපුග්ගල ,, | ... | ... | ... | 248–250 |
| 7. | තථාගත අච්ඡරිය ,: | ... | ... | ... | 250-252 |
| 8. | දුතියතථාගතඅච්ඡරිය ,, | ... | ... | ... | 252–254 |
| 9. | ආනන්දඅච්ඡරිය ,, | ... | ... | ... | 254 |
| 10. | චක්කවත්ති අච්ඡරිය ,, | ... | ... | ... | 256 |

භයවග්ගො තතියො.

| | | | | | |
|---|---|---|---|---|---|
| | **4 පුග්ගලවග්ගො.** | | | | **258-268** |
| 1. | සංයොජන පුග්ගල සුත්තං | ... | ... | ... | 258-260 |
| 2 | පටිභාන පුග්ගල ,, | ... | ... | ... | 260 |
| 3. | නෙය්‍යපුග්ගල ,, | ... | ... | ... | 260 |
| 4. | ඵලූපජීවිපුග්ගල ,, | ... | ... | ... | 260 |
| 5. | වජ්ජපුග්ගල ,, | ... | ... | ... | 262 |
| 6. | පරිපූරකාරීපුග්ගල ,; | ... | ... | ... | 262 |
| 7. | ගරුපුග්ගල ,, | ... | ... | ... | 264 |
| 8. | නෙකට්ඨපුග්ගල ,, | ... | ... | ... | 264-266 |
| 9. | ධම්මකථික ,, | ... | ... | ... | 266 |
| 10. | වාදී ,, | ... | ... | ... | 268 |

පුග්ගලවග්ගො චතුත්ථො.

| | | | | | |
|---|---|---|---|---|---|
| | **5. ආභාවග්ගො** | | | | **268-272** |
| 1. | ආභා සුත්තං | ... | ... | ... | 268 |
| 2. | පභා ,, | ... | ... | ... | 268 |
| 3. | ආලොක ,, | ... | ... | ... | 270 |
| 4. | ඔභාස ,, | ... | ... | ... | 270 |
| 5. | පජ්ජොත ,, | ... | ... | ... | 270 |
| 6. | කාල ,, | ... | ... | ... | 270 |
| 7. | දුතියකාල ,, | ... | ... | ... | 272 |
| 8. | වචීදුච්චරිත ,, | ... | ... | ... | 272 |
| 9. | වචීසුචරිත ,, | ... | ... | ... | 272 |
| 10. | සාර ,, | ... | ... | ... | 272 |


ආභාවග්ගො පඤ්චමො.

තතියො පණ්ණාසකො.

| විෂයය | | පිටු අංකය |
|---|---|---|
| | 4. චතුත්ථො පණ්ණාසකො | 274-412 |
| | 1. ඉන්ද්‍රියවග්ගො. | 274-286 |
| 1. | ඉන්ද්‍රිය සුත්තං ... ... ... | 274 |
| 2. | බල ,, ... ... ... | 274 |
| 3. | දුතියබල ,, ... ... ... | 274 |
| 4 | තතියබල ,, ... ... ... | 274 |
| 5. | චතුත්ථබල ,, ... ... ... | 276 |
| 6. | අසඞ්ඛෙය්‍ය ,, ... ... ... | 276 |
| 7. | රොග ,, ... ... ... | 276 |
| 8. | පරිහාණි ,, ... ... ... | 278 |
| 9. | භික්ඛුණී ,, ... ... ... | 280-282 |
| 10. | සුගතවිනය ,, ... ... ... | 284-286 |
| | ඉන්ද්‍රියවග්ගො පඨමො. | |
| | 2. පටිපදාවග්ගො | 288-304 |
| 1. | පටිපදා සුත්තං ... ... ... | 288 |
| 2. | දුතියපටිපදා ,, ... ... ... | 288-290 |
| 3. | තතියපටිපදා ,, ... ... ... | 290-292 |
| 4. | චතුත්ථපටිපදා ,, ... ... ... | 294 |
| 5. | පඤ්චමපටිපදා ,, ... ... ... | 296 |
| 6. | ඡට්ඨපටිපදා ,, ... ... ... | 296-298 |
| 7. | මොග්ගල්ලානපටිපදා ,, ... ... ... | 298 |
| 8. | සාරිපුත්තපටිපදා ,, ... ... ... | 300 |
| 9. | කිලෙසපරිනිබ්බාන ,, ... ... ... | 300-302 |
| 10. | අරහත්තපත්ති ,, ... ... ... | 304 |
| | පටිපදාවග්ගො දුතියො | |
| | 3. සඤ්චෙතනියවග්ගො | 306-330 |
| 1, | සඤ්චෙතනා සුත්තං ... ... ... | 306-310 |
| 2. | සාරිපුත්තපටිසම්භිදා ... ... ... | 310-312 |
| 3. | මහාකොට්ඨිත ,, ... ... ... | 312-314 |
| 4. | ආනන්ද ,, ... ... ... | 314-316 |
| 5. | උපවාන ,, ... ... ... | 316-318 |
| 6. | ආයාචමාන ,, ... ... ... | 318 |
| 7. | රාහුල ,, ... ... ... | 318-320 |
| 8. | චෙතොවිමුත්ති ,, ... ... ... | 320-324 |
| 9. | පරිනිබ්බානහෙතු ,, ... ... ... | 324 |
| 10. | මහාපදෙසදෙසනා ,, ... ... ... | 326-330 |
| | සඤ්චෙතනියවග්ගො තතියො | |
| | 4 බ්‍රාහ්මණවග්ගො | 332-356 |
| 1. | යොධාජීව සුත්තං ... ... ... | 332-334 |
| 2. | පාටිභොග ,, ... ... ... | 334 |
| 3. | වස්සකාර ,, ... ... ... | 334-336 |
| 4. | ජාණුස්සොණි ,, ... ... ... | 336-342 |

| විෂයෝ | | පිටඅංකා |
|---|---|---|
| 5. | චතුකොටික සුඤ්ඤතා සුත්තං | 342-344 |
| 6. | බහුස්සුත ,, | 344-346 |
| 7. | දුතියවස්සකාර ,, | 346-350 |
| 8 | උපක ,, | 352 |
| 9. | සච්ඡිකරණීය ,, | 354 |
| 10. | භික්ඛුසඞ්ඝපොමිත ,, | 354-356 |

බ්‍රාහ්මණවග්ගො චතුත්ථො.

5. මහාවග්ගො. 358-412

| | | |
|---|---|---|
| 1. | සොතානුගත සුත්තං | 358-362 |
| 2. | ඨාන ,, | 362-368 |
| 3. | භද්දිය ,, | 370-376 |
| 4. | සාපුගිය ,, | 37-3786 |
| 5. | වප්ප ,, | 378-384 |
| 6. | සාළ්හ ,, | 384-388 |
| 7. | මල්ලිකා ,, | 388-392 |
| 8. | තප ,, | 392-402 |
| 9. | තණ්හාජාලිනී ,, | 402-404 |
| 10 | පෙම - දොස ,, | 406-412 |

මහාවග්ගො පඤ්චමො.

මහාපණ්ණාසකො චතුත්ථො

5. පඤ්චමපණ්ණාසකො. 414-472

1 සප්පුරිසවග්ගො. 414-428

| | | |
|---|---|---|
| 1. | සප්පුරිස සුත්තං | 414 |
| 2. | දුතියසප්පුරිස ,, | 416 |
| 3. | තතියසප්පුරිස ,, | 416-418 |
| 4. | චතුත්ථසප්පුරිස ,, | 418-420 |
| 5. | පඤ්චමසප්පුරිස ,, | 420-422 |
| 6: | ඡට්ඨසප්පුරිස ,, | 422 |
| 7. | පඨමපාප - කල්‍යාණ ,, | 424 |
| 8, | දුතියපාප - කල්‍යාණ ,, | 424-426 |
| 9. | පඨමපාපධම්ම - කල්‍යාණධම්ම ,, | 426 |
| 10. | දුතියපාපධම්ම - කල්‍යාණධම්ම ,, | 426-428 |

සප්පුරිසවග්ගො පඨමො.

2 පරිසසොභනවග්ගො 430-436

| | | |
|---|---|---|
| 1. | පරිසසොභන සුත්තං | 430 |
| 2. | පඨමනිරය - සග්ගනික්ඛිත්ත ,, | 430 |
| 3. | දුතියනිරය - සග්ගනික්ඛිත්ත ,, | 432 |
| 4 | තතියනිරය - සග්ගනික්ඛිත්ත ,, | 432 |
| 5. | චතුත්ථනිරය - සග්ගනික්ඛිත්ත ,, | 432 |

| විසයා | | | | පිට්ඨඞ්කා |
|---|---|---|---|---|
| 6. | පඤ්චමනිරය - සග්ගනික්ඛිත්ත සුත්තං | ... | ... | 434 |
| 7. | ඡට්ඨනිරය - සග්ගනික්ඛිත්ත | ,, ... | ... | 434 |
| 8 | සත්තමනිරය - සග්ගනික්ඛිත්ත | ,, ... | ... | 434 |
| 9. | අට්ඨමනිරය - සග්ගනික්ඛිත්ත | ,, ... | ... | 436 |
| 10. | නවමනිරය - සග්ගනික්ඛිත්ත | ,, ... | ... | 436 |

පරිසොභනවග්ගො දුතියො

**3. සුචරිතවග්ගො** **438-444**

| | | | | | |
|---|---|---|---|---|---|
| 1. | වචීසුචරිත සුත්තං | ... | ... | ... | 438 |
| 2. | පඨම බාලපණ්ඩිය ,, | ... | ... | ... | 438 |
| 3. | දුතිය බාලපණ්ඩිත ,, | ... | ... | ... | 440 |
| 4. | තතිය බාලපණ්ඩිත ,, | ... | ... | ... | 440 |
| 6. | චතුත්ථබාලපණ්ඩිත ,, | ... | ... | ... | 440 |
| 6. | පඤ්චම බාලපණ්ඩිත ,, | ... | ... | ... | 452 |
| 7. | ඡට්ඨ බාලපණ්ඩිත ,, | ... | ... | ... | 442 |
| 8. | සත්තම බාලපණ්ඩිත ,, | ... | ... | ... | 442 |
| 9. | අට්ඨම බාලපණ්ඩිත ,, | ... | ... | ... | 444 |
| 10. | නවම බාලපණ්ඩිත ,, | ... | ... | ... | 444 |
| 11. | කවිසුත්තං ,, | ... | ... | ... | 444 |

සුචරිතවග්ගො තතියො

**4. කම්මවග්ගො** **446-460**

| | | | | | |
|---|---|---|---|---|---|
| 1 | පඨමකම්ම සුත්තං | ... | ... | ... | 446 |
| 2. | දුතියකම්ම ,, | ... | ... | ... | 446-448 |
| 3. | තතිය කම්ම ,, | ... | ... | ... | 448-450 |
| 4. | චතුත්ථකම්ම ,, | ... | ... | ... | 452 |
| 5. | පඤ්චමකම්ම ,, | ... | ... | ... | 452-454 |
| 6. | ඡට්ඨකම්ම ,, | ... | ... | ... | 454-456 |
| 7. | සත්තමකම්ම ,, | ... | ... | ... | 456 |
| 8. | සාවජ්ජඅනවජ්ජ ,, | ... | ... | ... | 456-458 |
| 9. | සබ්‍යාපජ්ඣ අබ්‍යාපජ්ඣකම්ම සුත්තං | | ... | ... | 458 |
| 10. | සමණ සුත්තං | ... | ... | ... | 458-460 |
| 11. | සප්පුරිසානිසංස ,, | ... | ... | ... | 460 |

කම්මවග්ගො චතුත්ථො

**5. ආපත්තිභයවග්ගො** **462-472**

| | | | | | |
|---|---|---|---|---|---|
| 1. | පාපභික්ඛු සුත්තං | ... | ... | ... | 462-464 |
| 2. | ආපත්තිභය ,, | ... | ... | ... | 464-466 |
| 3. | සික්ඛානිසංස ,, | ... | ... | ... | 468-470 |
| 4. | සෙය්‍යා ,, | ... | ... | ... | 470 |
| 5. | ථූපාරහ ,, | ... | ... | ... | 470 |
| 6. | පඤ්ඤාවුඩ්ඪි ,, | ... | ... | ... | 470 |

| විෂයෝ | | | පිට්ඨඞ්කෝ |
|---|---|---|---|
| 7. | බහුකාර | සුත්තං | 472 |
| 8. | අනරියවෝහාර | ,, | 472 |
| 9. | අරියවෝහාර | ,, | 472 |
| 10. | අනරියවෝහාර | ,, | 472 |

ආපත්තිභයවග්ගෝ පඤ්චමෝ

පණ්ණාසකං පඤ්චමං

| | | | |
|---|---|---|---|
| 6. | අභිඤ්ඤාවග්ගෝ | | 474-484 |
| 1. | අභිඤ්ඤා | සුත්තං | 474 |
| 2. | පරියෙසනා | ,, | 474-476 |
| 3. | සඞ්ගහවත්ථු | ,, | 476 |
| 4. | මාලුඞ්ක්‍ය | ,, | 476-478 |
| 5. | කුල | ,, | 478 |
| 6. | පඨම ආජානීය | ,, | 480 |
| 7. | දුතිය ආජානීය | ,, | 480-482 |
| 8. | බලසුත්තං | ,, | 482 |
| 9. | අරඤ්ඤසේනාසන | ,, | 482-484 |
| 10 | සාවජ්ජසුත්තං | ,, | 484 |

අභිඤ්ඤාවග්ගෝ ඡට්ඨෝ

| | | | |
|---|---|---|---|
| 7. | කම්මපථවග්ගෝ | | 486-492 |
| 1. | පාණාතිපාත | සුත්තං | 486 |
| 2. | අදින්නාදාන | ,, | 486 |
| 3. | කාමමිච්ඡාචාර | ,, | 488 |
| 4. | මුසාවාද | ,, | 488 |
| 5 | පිසුණාවාච | ,, | 488 |
| 6. | පරුසාවාච | ,, | 490 |
| 7. | සම්ඵප්පලාප | ,, | 490 |
| 8. | අභිජ්ඣාලු | ,, | 490 |
| 9. | බ්‍යාපන්න චිත්ත | ,, | 492 |
| 10 | මිච්ඡාදිට්ඨි | ,, | 492 |

කම්මපථවග්ගෝ සත්තමෝ

| | | | |
|---|---|---|---|
| 8. | රාගාදිපෙය්‍යාලං | | 494-496 |
| 1. | චතුසතිපට්ඨාන | සුත්තං | 494 |
| 2. | චතුසම්මප්පධාන | ,, | 494 |
| 3. | චතුරිද්ධිපාද | ,, | 494 |
| 4. | 480 (රාගාදිපෙය්‍යාලං.) | | 496 |

රාගාදිපෙය්‍යාලං නිට්ඨිතං

චතුක්කංගුත්තරං

සුත්තන්තපිටකෙ

# අඞ්ගුත්තරනිකායො

## දුතියො භාගො

Free Distribution www.aathaapi.org

# සුත්තන්තපිටකෙ

# අඞ්ගුත්තරනිකායො

## දුතියො භාගො

---

# චතුක්කනිපාතො

### 1. පඨමො පණ්ණාසකො

## 1. භණ්ඩගාමවග්ගො

**නමො තස්ස භගවතො අරහතො සම්මාසම්බුද්ධස්ස.**

**4. 1. 1. 1.**

**[ අනුබුද්ධසුත්තං ]**

1\. එවං මෙ සුතං: එකං සමයං භගවා වජ්ජීසු විහරති භණ්ඩගාමෙ. තත්‍ර ඛො භගවා භික්ඛූ ආමන්තෙසි භික්ඛවොති. භදන්තෙති තෙ භික්ඛූ භගවතො පච්චස්සොසුං භගවා එතදවොච:

චතුන්නං භික්ඛවෙ ධම්මානං අනනුබොධා අප්පටිවෙධා එවමිදං දීඝමද්ධානං සන්ධාවිතං සංසරිතං මමඤ්චෙව තුම්හාකඤ්ච. කතමෙසං චතුන්නං?

අරියස්ස භික්ඛවෙ සීලස්ස අනනුබොධා අප්පටිවෙධා එවමිදං දීඝමද්ධානං සන්ධාවිතං සංසරිතං මමඤ්චෙව තුම්හාකඤ්ච.

අරියස්ස භික්ඛවෙ සමාධිස්ස අනනුබොධා අප්පටිවෙධා එවමිදං දීඝමද්ධානං සන්ධාවිතං සංසරිතං මමඤ්චෙව තුම්හාකඤ්ච.

අරියාය භික්ඛවෙ පඤ්ඤාය අනනුබොධා අප්පටිවෙධා එවමිදං දීඝමද්ධානං සන්ධාවිතං සංසරිතං මමඤ්චෙව තුම්හාකඤ්ච.

අරියාය භික්ඛවෙ විමුත්තියා අනනුබොධා අප්පටිවෙධා එවමිදං දීඝමද්ධානං සන්ධාවිතං සංසරිතං මමඤ්චෙව තුම්හාකඤ්ච.

# සූත්‍රාන්තපිටකයෙහි

# අඞ්ගුත්තරසඞ්ගිය

## ද්විතීය භාගය

---

# චතුක්කනිපාතය

### 1. ප්‍රථම පණ්ණාසකය

## 1. භණ්ඩගාම වර්ගය

## ඒ භගවත් අර්හත් සම්මාසම්බුද්ධරජාණන් වහන්සේට නමස්කාර වේවා.

**4. 1. 1. 1.**

### [ අනුබුද්ධ සූත්‍රය ]

1. **මා** විසින් මෙසේ අසන ලදී: එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ වැදූරට භණ්ඩගාමයෙහි වැඩ වසන සේක. එකල්හි භාග්‍යවතුන් වහන්සේ මහණෙනි, යි භික්ෂූන් ඇමතූ සේක. ඒ භික්ෂූහු පින්වතුන් වහන්සැ යි භාග්‍යවතුන් වහන්සේට පිළිවදන් ඇස්වූහ. භාග්‍යවතුන් වහන්සේ මෙම සූත්‍රය වදාළ සේක.

මහණෙනි, ධර්ම සතර දෙනකු අවබෝධ නොකිරීමෙන් පසක් නොකිරීමෙන් මා විසිනුදු තොප විසිනුදු මෙසේ දීර්ඝකාලයෙක් (භවයෙන් භවයට ගමන වශයෙන්) දුවන ලදි. (පුන පුනා යාම් ඊම් විසින්) ඇවිදුනා ලදී. නොහොත් මා හා තොපගේ සන්ධාවන සංසරණ වී. කවර සතර දෙනකුය යත්:

මහණෙනි, නිර්දෝෂ ශීලය අවබෝධ නොකිරීමෙන් පසක් නො කිරීමෙන් මා විසිනුදු තොප විසිනුදු මෙසේ දීර්ඝකාලයෙක් දුවන ලදි. ඇවිදුනා ලදි.

මහණෙනි, නිර්දෝෂ සමාධිය අවබෝධ නොකිරීමෙන් පසක් නොකිරීමෙන් මා විසිනුදු තොප විසිනුදු මෙසේ දීර්ඝකාලයෙක් දුවන ලදි ඇවිදුනා ලදි.

මහණෙනි, නිර්දෝෂ ප්‍රඥාව අවබෝධ නොකිරීමෙන් පසක් නොකිරීමෙන් මා විසිනුදු තොප විසිනුදු මෙසේ දීර්ඝකාලයෙක් දුවන ලදි. ඇවිදුනා ලදි.

මහණෙනි, නිර්දෝෂ විමුක්තිය අවබෝධ නොකිරීමෙන් පසක් නොකිරීමෙන් මා විසිනුදු තොප විසිනුදු මෙසේ දීර්ඝකාලයෙක් දුවන ලදි. ඇවිදුනා ලදි.

Free Distribution www.aathaapi.org

තයිදං භික්ඛවෙ අරියං සීලං අනුබුද්ධං පටිවිද්ධං. අරියො සමාධි අනුබුද්ධො පටිවිද්ධො. අරියා පඤ්ඤා අනුබුද්ධා පටිවිද්ධා. අරියා විමුත්ති අනුබුද්ධා පටිවිද්ධා. උච්ඡින්නා භවතණ්හා ඛීණා භවනෙත්ති. නත්ථි'දානි පුනබ්භවොති.

ඉදමවොච භගවා. ඉදං වත්වා සුගතො අථාපරං එතදවොච සත්ථා:

1. සීලං සමාධි පඤ්ඤා ච විමුත්ති ච අනුත්තරා,
අනුබුද්ධා ඉමෙ ධම්මා ගොතමෙන යසස්සිනා.

2. ඉති බුද්ධො අභිඤ්ඤාය ධම්මමක්ඛාසි භික්ඛුනං,
දුක්ඛස්සන්තකරො සත්ථා චක්ඛුමා පරිනිබ්බුතො'ති.

## 4. 1. 1 2.

## [ පපතිතසුත්තං ]

**[ සාවත්ථිනිදානං ]**

2. චතූහි භික්ඛවෙ ධම්මෙහි අසමන්නාගතො ඉමස්මා ධම්මවිනයා පපතිතො'ති වුච්චති. කතමෙහි චතූහි?

අරියෙන භික්ඛවෙ සීලෙන අසමන්නාගතො ඉමස්මා ධම්මවිනයා පපතිතො'ති වුච්චති.

අරියෙන භික්ඛවෙ සමාධිනා අසමන්නාගතො ඉමස්මා ධම්මවිනයා පපතිතො'ති වුච්චති.

අරියාය භික්ඛවෙ පඤ්ඤාය අසමන්නාගතො ඉමස්මා ධම්මවිනයා පපතිතො'ති වුච්චති.

අරියාය භික්ඛවෙ විමුත්තියා අසමන්නාගතො ඉමස්මා ධම්මවිනයා පපතිතො'ති වුච්චති.

ඉමෙහි ඛො භික්ඛවෙ චතූහි ධම්මෙහි අසමන්නාගතො ඉමස්මා ධම්මවිනයා පපතිතො'ති වුච්චති.

චතූහි භික්ඛවෙ ධම්මෙහි සමන්නාගතො ඉමස්මා ධම්මවිනයා අප්පපතිතො'ති[1] වුච්චති. කතමෙහි චතූහි?

අරියෙන භික්ඛවෙ සීලෙන සමන්නාගතො ඉමස්මා ධම්මවිනයා අප්පපතිතො'ති වුච්චති.

අරියෙන භික්ඛවෙ සමාධිනා සමන්නාගතො ඉමස්මා ධම්මවිනයා අප්පපතිතො'ති වුච්චති.

අරියාය භික්ඛවෙ පඤ්ඤාය සමන්නාගතො ඉමස්මා ධම්මවිනයා අප්පපතිතො'ති වුච්චති.

1. අපතිතො - සී. PTS.

මහණෙනි, ඒ ආර්‍යශීලය අවබෝධ කරණ ලදි. පසක් කරණ ලදි. ඒ ආර්‍යසමාධිය අවබෝධ කරණ ලදි. පසක් කරණ ලදි. ඒ ආර්‍යප්‍රඥාව අවබෝධ කරණ ලදු. පසක් කරණ ලදු. ඒ ආර්‍යවිමුක්තිය අවබෝධ කරණ ලදු. පසක් කරණ ලදු. භවතෘෂ්ණාව සිඳුනා ලදු. භවනෙත්තිය ක්ෂීණ වූවා. දැන් නැවත පුනර්භවයෙක් නැති.

භාග්‍යවතුන් වහන්සේ මේ සූත්‍රය වදාළ සේක. සුගතයන් වහන්සේ මෙය වදාරා වැලි ශාස්තෲන් වහන්සේ අත්‍ය වූ ද මෙල දෙගය වදාළ සේක:

1. යශස්වී වූ ගෞතමයන් වහන්සේ විසින් (මාර්ගඵලසම්ප්‍රයුක්ත) ශීලය සමාධිය ප්‍රඥාය ලොකොත්තර වූ විමුක්තිඵලය යන මේ දහම්හු අවබෝධ කරණ ලදහ.

2. මෙසේ බුදුහු විශිෂ්ටඥානයෙන් දැන භික්ෂූනට දහම් දෙසූ සේක. වටදුක් කෙළවර කොට සිටි පසැස් ඇති ශාස්තෲන් වහන්සේ (කෙලෙස් පිරිනිවණින්) පිරිනිවි සේක.

## 4. 1. 1. 2.

## [ පපතිත සූත්‍රය ]

[ සැවැත් නිදනයි: ]

2. මහණෙනි, සතර කරුණෙකින් අසමන්වාගත පුද්ගල මෙසස්නෙන් ගිළිහිනැයි කියනු ලැබේ. කවර සතර කරුණෙක යත්:

මහණෙනි, නිර්දෝෂ ශීලයෙන් සමන්වාගත නොවූයේ මෙසස්නෙන් ගිළිහිනැයි කියනු ලැබේ.

මහණෙනි, නිර්දෝෂ සමාධියෙන් සමන්වාගත නොවූයේ මෙසස්නෙන් ගිළිහිනැයි කියනු ලැබේ.

මහණෙනි, නිර්දෝෂ ප්‍රඥයෙන් සමන්වාගත නොවූයේ මෙසස්නෙන් ගිළි-හිනැයි කියනු ලැබේ.

මහණෙනි, නිර්දෝෂ විමුක්තියෙන් සමන්වාගත නොවූයේ මෙ සස්නෙන් ගිළිහිනැයි කියනු ලැබේ.

මහණෙනි, මේ සතර කරුණින් සමන්වාගත නොවූයේ මෙසස්නෙන් ගිළිහිනැයි කියනු ලැබේ.

මහණෙනි, සතර කරුණෙකින් සමන්වාගත වූ පුද්ගල මෙසස්නෙන් නො ගිළිහිනැයි කියනු ලැබේ. කවර සතර කරුණෙක යත්:

මහණෙනි, නිර්දෝෂ ශීලයෙන් සමන්වාගත වූයේ මෙසස්නෙන් නො-ගිළිහිනැයි කියනු ලැබේ.

මහණෙනි, නිර්දෝෂ සමාධියෙන් සමන්වාගත වූයේ මෙසස්නෙන් නො-ගිළිහිනැයි කියනු ලැබේ.

මහණෙනි, නිර්දෝෂ ප්‍රඥයෙන් සමන්වාගත වූයේ මෙසස්නෙන් නොගිළි-හිනැයි කියනු ලැබේ.

අරියාය භික්ඛවෙ විමුත්තියා සමන්නාගතො ඉමස්මා ධම්මවිනයා අප්පපතිතො'ති වුච්චති.

ඉමෙහි ඛො භික්ඛවෙ චතූහි ධම්මෙහි සමන්නාගතො ඉමස්මා ධම්මවිනයා අප්පපතිතො'ති වුච්චතීති.

3. චුතා පතන්ති පතිතා ගිද්ධා ච පුනරාගතා,
කතං කිච්චං[1] රතං රම්මං සුඛෙනාන්වාගතං සුඛං'ති.

## 4. 1. 1. 3.

## [ පඨමඛතසුත්තං ]

3. චතූහි භික්ඛවෙ ධම්මෙහි සමන්නාගතො බාලො අබ්‍යත්තො අසප්පුරිසො ඛතං උපහතං අත්තානං පරිහරති. සාවජ්ජො ච හොති සානුවජ්ජො විඤ්ඤූනං. බහුං ච අපුඤ්ඤං පසවති. කතමෙහි චතූහි?

අනනුවිච්ච අපරියොගාහෙත්වා අවණ්ණාරහස්ස වණ්ණං භාසති.

අනනුවිච්ච අපරියොගාහෙත්වා වණ්ණාරහස්ස අවණ්ණං භාසති.

අනනුවිච්ච අපරියොගාහෙත්වා අප්පසාදනීයෙ ඨානෙ පසාදං උපදංසෙති.

අනනුවිච්ච අපරියොගාහෙත්වා පසාදනීයෙ ඨානෙ අප්පසාදං උපදංසෙති.

ඉමෙහි ඛො භික්ඛවෙ චතූහි ධම්මෙහි සමන්නාගතො බාලො අබ්‍යත්තො අසප්පුරිසො ඛතං උපහතං අත්තානං පරිහරති. සාවජ්ජො ච හොති සානුවජ්ජො විඤ්ඤූනං. බහුං ච අපුඤ්ඤං පසවතීති.

චතූහි භික්ඛවෙ ධම්මෙහි සමන්නාගතො පණ්ඩිතො වියත්තො සප්පුරිසො අක්ඛතං අනුපහතං අත්තානං පරිහරති. අනවජ්ජො ච හොති අනනු-වජ්ජො විඤ්ඤූනං. බහුං ච පුඤ්ඤං පසවති. කතමෙහි චතූහි?

අනුවිච්ච පරියොගාහෙත්වා අවණ්ණාරහස්ස අවණ්ණං භාසති.

අනුවිච්ච පරියොගාහෙත්වා වණ්ණාරහස්ස වණ්ණං භාසති.

අනුවිච්ච පරියොගාහෙත්වා අප්පසාදනීයෙ ඨානෙ අප්පසාදං උපදංසෙති.

අනුවිච්ච පරියොගාහෙත්වා පසාදනීයෙ ඨානෙ පසාදං උපදංසෙති.

1. සතං කිච්චං.

මහණෙනි, තිදේශ විමුක්තියෙන් සමන්වාගත වූයේ මෙසත්නෙත් නොගිලිහිනැ යි කියනු ලැබේ.

මහණෙනි, මේ සතර කරුණෙන් සමන්වාගත වූයේ මෙ සත්නෙත් නොගිලිහිනැ යි කියනු ලැබේ.

3. (යම් කෙනෙක්) ච්‍යුත වූහු ද, (ඔහු ච්‍යුත වන බැවින්) හෙන්. යම් කෙනෙක්) පතිත වූහු ද, (ඔහු පතිත වන බැවින්) ච්‍යුත වෙත්. රාගයෙන් රත්වූවාහුදු යලි ජාත්‍යාදියට වැටුනහ. සිවුමගින් කළයුතු කිස කොට නිමවන ලදී. ඇලියයුතු ගුණෙහි ඇලෙන ලදී. (මානුෂ්‍යසුඛාදී) සුඛයෙන් (දිව්‍යසුඛාදී) සුඛය පිළිවෙලින් ලබන ලදී.

## 4. 1. 1. 3.

## [ පඨමඛත සූත්‍රය ]

3. මහණෙනි, සතර කරුණෙකින් සමන්වාගත වූ අව්‍යක්ත වූ අසත්පුරුෂ වූ බාලයා ගුණ විසින් සාළ (එහෙයින් ම) නට, ආත්මය (ස්වසන්තානය) පස්වටයි. නුවණැත්තනට දෙස් සහිතයෙක් ද උපවාද සහිතයෙක් ද වෙයි. බොහෝ අකුසල් ද රැස් කෙරෙයි. කවර සතර කරුණෙක යත්:

නොදැන (විමසීම් විසින්) නො බැස ගෙණ නුගුණ කියයුත්තහුගේ ගුණ කියයි.

නො දැන නො බැස ගෙණ ගුණ වැණිය යුත්තහුගේ අගුණ කියයි.

නොදැන නො බැස ගෙණ නොපහදනට නිසි කරුණෙහි පැහැදීම උපදවයි.

නොදැන නො බැස ගෙණ පහදනට නිසි කරුණෙහි අප්‍රසාදය උපදවයි.

මහණෙනි, මේ සතර කරුණෙන් සමන්වාගත වූ අව්‍යක්ත වූ අසත්පුරුෂ වූ බාලයා ගුණ විසින් සැරු එහෙයින් ම නටුවා වූ ආත්මය පිළිදගනේය. නුවණැතියනට වරද සහිතයෙක් ද උපවාද සහිතයෙක් ද වේ. බොහෝ අකුසල් ද ප්‍රසව කෙරෙයි.

මහණෙනි, සතර කරුණෙකින් සමන්වාගත, ව්‍යක්ත, සත්පුරුෂ, පණ්ඩිත තෙමේ ගුණ විසින් සාරු නො ලන ලද (එහෙයින් ම) නො න ටුවා වූ ආත්මය පරිහරණය කෙරෙයි. නුවණැතියනට දෙෂ රහිතයෙක් ද උපවාද රහිතයෙක් ද වෙයි. බොහෝ කුසල් ද රැස් කෙරෙයි. කවර සතර කරුණෙක යත්:

දැන ගෙණ විමසීම් විසින් බැස ගෙණ නුගුණ කිය යුත්තහුගේ නුගුණ කියයි.

දැන ගෙණ බැස ගෙණ ගුණ කියනට නිස්සහුගේ ගුණ කියයි.

දැන ගෙණ බැස ගෙණ නො පහදනට නිසි කරුණෙහි නො පැහැදීම උපදවයි.

දැන ගෙණ බැස ගෙණ පහදනට නිසි කරුණෙහි ප්‍රසාදය උපදව යි.

ඉමෙහි ඛො භික්ඛවෙ චතූහි ධම්මෙහි සමන්නාගතො පණ්ඩිතො වියත්තො සප්පුරිසො අක්ඛතං අනුපහතං අත්තානං පරිහරති. අනවජ්ජො ච හොති අනනුවජ්ජො විඤ්ඤූනං, බහුං ච පුඤ්ඤං පසවතීති.

4. යො නින්දියං පසංසති තං වා නින්දති යො පසංසියො,
විචිනාති මුඛෙන සො කලිං කලිනා තෙන සුඛං න වින්දති.

5. අප්පමත්තකො අයං කලි යො අක්ඛෙසු ධනපරාජයො,
සබ්බස්සාපි සහාපි අත්තනා අයමෙව මහන්තතරො කලි
යො සුගතෙසු මනං පදොසයෙ.

6. සතං සහස්සානං නිරබ්බුදානං ඡත්තිංසති[2] පඤ්ච ච අබ්බුදානි,
යමරියගරහී[3] නිරයං උපෙති වාචං මනඤ්ච පණිධාය පාපකන්ති.

## 4. 1. 1. 4.

## [ දුතියඛතසුත්තං ]

4. චතූසු භික්ඛවෙ මිච්ඡා පටිපජ්ජමානො බාලො අව්‍යත්තො අසප්පුරිසො ඛතං උපහතං අත්තානං පරිහරති. සාවජ්ජො ච හොති සානුවජ්ජො විඤ්ඤූනං. බහුං ච අපුඤ්ඤං පසවති. කතමෙසු චතූසු?

මාතරි භික්ඛවෙ මිච්ඡා පටිපජ්ජමානො බාලො අව්‍යත්තො අසප්පුරිසො ඛතං උපහතං අත්තානං පරිහරති. සාවජ්ජො ච හොති සානුවජ්ජො විඤ්ඤූනං. බහුං ච අපුඤ්ඤං පසවති.

පිතරි භික්ඛවෙ මිච්ඡා පටිපජ්ජමානො -පෙ- තථාගතෙ භික්ඛවෙ මිච්ඡා පටිපජ්ජමානො -පෙ- තථාගතසාවකෙ භික්ඛවෙ මිච්ඡා පටිපජ්ජමානො බාලො අව්‍යත්තො අසප්පුරිසො ඛතං උපහතං අත්තානං පරිහරති. සාවජ්ජො ච හොති සානුවජ්ජො විඤ්ඤූනං. බහුං ච අපුඤ්ඤං පසවති.

ඉමෙසු ඛො භික්ඛවෙ චතූසු මිච්ඡා පටිපජ්ජමානො බාලො අව්‍යත්තො අසප්පුරිසො ඛතං උපහතං අත්තානං පරිහරති. සාවජ්ජො ච හොති සානුවජ්ජො විඤ්ඤූනං. බහුං ච අපුඤ්ඤං පසවතීති.

1. යො සුගතෙසු න මනං පදොසයෙ - සී මු. 2. ඡත්තිංසති - මජ්ඣං. ඡත්තිංස ච - PTS.
3. යමරියං ගරහිය - සං.

මහණෙනි, මේ සතර කාරණයෙන් සමන්නාගත, ව්‍යක්ත, සත්පුරුෂ, පණ්ඩිත තෙමේ ගුණ විසින් නො සෑරූ එහෙයින් ම නො නට ආත්මය පිළිදගනී ය. නුවණැතියනට දොෂ රහිතයෙක් ද උපවාද රහිතයෙක් ද වේ. බොහෝ කුසල් ද ප්‍රසව කෙරෙයි.

4. යමෙක් නින්දනීය පසසා ද, යමෙක් ප්‍රශංසනීය වේ නම් ඔහු හෝ නිගණී ද, හෙ තෙමේ මුවින් පව් රැස් කෙරෙයි. ඒ පවින් සුවයක් නො ලබන්නේ ය.

5. දූකෙළියෙහි ලා සියලු ස්වකීය ධනය හා තමා ද හා සමග යම් ධනපරාජයෙක් වේ ද, මේ පරාජය ස්වල්පමාත්‍ර ය. යමෙක් සම්‍යග්ගත පුද්ගලයන් කෙරෙහි සිත අප්‍රීතික කරන්නේ නම් මේය ම මහත්තර පරාජය වේ.

6. යම් හෙයෙකින් ලාමක වූ වචනය හා සිත ද පිහිටුවා ආර්යයන් ගරහනුයේ නිරයට වැදේ ද, (එහි ආයුඃප්‍රමාණය) නිරර්බුද එක්ලක්‍ෂ සතිසෙකි. අර්බුද පසෙකි.

## 4. 1. 1. 4.

## [ දුතියඛතසුත්‍රය ]

4. මහණෙනි, සතර දෙනකු කෙරෙහි වරදවා පිළිපන් අව්‍යක්ත අසත්-පුරුෂ බාල තෙමේ ගුණ විසින් සෑරූ (එහෙයින් ම) නටුවා වූ ආත්මය පරිහරණය කෙරෙයි. නුවණැතියනට දොෂ සහිතයෙක් ද උපවාද සහිත-යෙක් ද වෙයි. බොහෝ පව් ද ප්‍රසව කෙරෙයි. කවර සතර දෙනකු කෙරෙහිද යත්:

මහණෙනි, මෑනියන් කෙරෙහි වරදවා පිළිපදනා අව්‍යක්ත අසත්පුරුෂ බාල තෙමේ ගුණ විසින් සෑරූ නටුවා වූ ආත්මය පරිහරණය කෙරෙයි. නුවණැතියනට දොෂ සහිතයෙක් ද උපවාද සහිතයෙක් ද වෙයි. බොහෝ පව් ද රැස් කෙරෙයි.

මහණෙනි, පියානන් කෙරෙහි වරදවා පිළිපන් ... මහණෙනි, තථාගතයන් වහන්සේ කෙරෙහි වරදවා පිළිපන් ... මහණෙනි, තථාගතශ්‍රාවකයා කෙරෙහි වරදවා පිළිපන් අව්‍යක්ත අසත්පුරුෂ බාල තෙමේ (ගුණ විසින්) සෑරු ලත ලද (එහෙයින් ම) නටුවා වූ ආත්මය පිළිදගනී ය. නුවණැතියනට දොෂ සහිතයෙක් ද උපවාද සහිතයෙක් ද වෙයි. බොහෝ පව් ද ප්‍රසව කෙරෙයි.

මහණෙනි, මේ සතර දෙනා කෙරෙහි වරදවා පිළිපන් අව්‍යක්ත අසත්පුරුෂ බාල තෙමේ සෑරූ නටුවා වූ ආත්මය පිළිදගනී ය. නුවණැතියනට දොෂ සහිතයෙක් ද උපවාද සහිතයෙක් ද වෙයි. බොහෝ අකුසල් ද ප්‍රසව කෙරෙයි.

චතුසු භික්ඛවෙ සම්මා පටිපජ්ජමානො පණ්ඩිතො වියත්තො සප්පුරිසො අක්ඛතං අනුපහතං අත්තානං පරිහරති. අනවජ්ජො ච හොති අනනුවජ්ජො විඤ්ඤූනං. බහුං ච පුඤ්ඤං පසවති. කතමෙසු චතුසු?

මාතරි භික්ඛවෙ සම්මා පටිපජ්ජමානො පණ්ඩිතො වියත්තො සප්පුරිසො අක්ඛතං අනුපහතං අත්තානං පරිහරති. අනවජ්ජො ච හොති අනනුවජ්ජො විඤ්ඤූනං. බහුං ච පුඤ්ඤං පසවති.

පිතරි භික්ඛවෙ සම්මා පටිපජ්ජමානො -පෙ- තථාගතෙ භික්ඛවෙ සම්මා පටිපජ්ජමානො -පෙ- තථාගතසාවකෙ භික්ඛවෙ සම්මා පටිපජ්ජමානො පණ්ඩිතො වියත්තො සප්පුරිසො අක්ඛතං අනුපහතං අත්තානං පරිහරති. අනවජ්ජො ච හොති අනනුවජ්ජො විඤ්ඤූනං. බහුං ච පුඤ්ඤං පසවති.

ඉමෙසු ඛො භික්ඛවෙ චතුසු සම්මා පටිපජ්ජමානො පණ්ඩිතො වියත්තො සප්පුරිසො අක්ඛතං අනුපහතං අත්තානං පරිහරති. අනවජ්ජො ච හොති අනනුවජ්ජො විඤ්ඤූනං. බහුං ච පුඤ්ඤං පසවතීති.

7. මාතරි පිතරි චාපි යො මිච්ඡා පටිපජ්ජති,
තථාගතෙ ච සම්බුද්ධෙ අථ වා තස්ස සාවකෙ,
බහුඤ්ච සො පසවති අපුඤ්ඤං තාදිසො නරො.

8. තාය අධම්මචරියාය මාතාපිතුසු පණ්ඩිතා.
ඉධෙව නං ගරහන්ති පෙච්චාපායඤ්ච ගච්ඡති,

9. මාතරි පිතරි චාපි යො සම්මා පටිපජ්ජති.
තථාගතෙ ච සම්බුද්ධෙ අථ වා තස්ස සාවකෙ,
බහුඤ්ච සො පසවති පුඤ්ඤම්පි තාදිසො නරො.

10. තාය ධම්මචරියාය මාතාපිතුසු පණ්ඩිතා,
ඉධ චෙව නං පසංසන්ති පෙච්ච සග්ගෙ ච මොදතීති.

මහණෙනි, සතරදෙනකු කෙරෙහි මොනොවට පිළිපන් ව්‍යක්ත සත්පුරුෂ පණ්ඩිත තෙමේ නොසාරු ලත ලද (එහෙයින් ම) නො නට ආත්මය පරිහරණය කෙරෙයි. නුවණැතියනට දෙෂරහිතයෙක් ද උපවාදරහිතයෙක් ද වෙයි. බොහෝ පින් ද ප්‍රසව කෙරෙයි. කවර සතර දෙනෙකු කෙරෙහිය යත්:

මහණෙනි, මෑණියන් කෙරෙහි මොනොවට පිළිපදනා ව්‍යක්ත සත්පුරුෂ පණ්ඩිත තෙමේ නො සරු එහෙයින් ම නො නට ආත්මය පිළිදගනේ ය. නුවණැතියනට දෙෂ රහිතයෙක් ද උපවාද රහිතයෙක් ද වෙයි. බොහෝ පින් ද ප්‍රසව කෙරෙයි:

මහණෙනි, පියාතන් කෙරෙහි මොනොවට පිළිපදනා ... මහණෙනි, තථාගතයන් වහන්සේ කෙරෙහි මොනොවට පිළිපදනා ... මහණෙනි, තථාගතශ්‍රාවකයා කෙරෙහි මොනොවට පිළිපදනා ව්‍යක්ත සත්පුරුෂ පණ්ඩිත තෙමේ නො සාරු ලත ලද එහෙයින් ම නො නට ආත්මය පිළිදගනේ ය. නුවණැතියනට දෙෂ රහිතයෙක් ද උපවාද රහිතයෙක් ද වෙයි. බොහෝ පින් ද ප්‍රසව කෙරෙයි.

මහණෙනි, මේ සතර දෙනා කෙරෙහි මොනොවට පිළිපදනා ව්‍යක්ත සත්පුරුෂ පණ්ඩිත තෙමේ සාරු නො වූ එහෙයින් ම නො නට ආත්මයක් පිළිදගනේ ය. නුවණැතියනට දෙෂරහිතයෙක් ද උපවාද රහිතයෙක් ද වෙයි. බොහෝ පින් ද ප්‍රසව කෙරෙයි.

7. යම් මිනිසෙක් (මිත්තවින්දකාදීන් සෙයින්) මෑණියන් කෙරෙහි ද, (අජාතශත්‍රු ආදීන් සෙයින්) පියා කෙරෙහි ද වරදවා පිළිපදනේ ද, (දෙවදත්ත ආදීන් සෙයින්) සම්‍යක්සම්බුද්ධ තථාගතයන් වහන්සේ කෙරෙහි ද වරදවා පිළිපදනේ ද, වැලිත් (කොකාලිකාදීන් සෙයින්) තථාගත ශ්‍රාවකයා කෙරෙහි වරදවා පිළිපදනේ ද, එබඳු ඒ මිනිස් බොහෝ අකුසල් ද ප්‍රසව කරෙයි.

8. මවු පියන් කෙරෙහි ලා කළ ඒ අධර්මචර්‍යාවෙන් පඬිහු මෙලොවිහි ම ඔහු ගරහත් මෙයින් සැව අපායට ද යෙයි.

9. යම් මිනිසෙක් මවුකෙරෙහි ද පියා කෙරෙහිද සම්‍යක් සම්බුද්ධ තථාගතයන් වහන්සේ කෙරෙහි ද වැලිද තථාගතශ්‍රාවකයා කෙරෙහිද මොනොවට පිළිපදනේ ද, එබඳු ඒ මිනිස් බොහෝ පිණුදු ප්‍රසව කෙරෙයි.

10. මවුපියන්කෙරෙහි ලා කළ (සම්‍යක් ප්‍රතිපත්ති සඞ්ඛ්‍යාත) ඒ පඬිහු ඔහු මෙලොවිහි ම පසසත්. මෙයින් සැව ධර්මචර්‍යාවෙන් ස්වර්ගයෙහි ද (විපාකානුභවනයෙන්) සතුටු වෙයි.

## 4. 1. 1. 5.

## [ අනුසොතසුත්තං ]

5. චත්තාරො'මෙ භික්ඛවෙ පුග්ගලා සන්තො සංවිජ්ජමානා ලොකස්මිං. කතමෙ චත්තාරො?

අනුසොතගාමී පුග්ගලො, පටිසොතගාමී පුග්ගලො, ඨිතත්තො පුග්ගලො, තිණ්ණො පාරගතො ථලෙ තිට්ඨති බ්‍රාහ්මණො.

කතමො ච භික්ඛවෙ අනුසොතගාමී පුග්ගලො? ඉධ භික්ඛවෙ එකච්චො පුග්ගලො කාමෙ ච පටිසෙවති, පාපඤ්ච කම්මං කරොති, අයං වුච්චති භික්ඛවෙ අනුසොතගාමී පුග්ගලො.

කතමො ච භික්ඛවෙ පටිසොතගාමී පුග්ගලො? ඉධ භික්ඛවෙ එකච්චො පුග්ගලො කාමෙ න පටිසෙවති, පාපඤ්ච කම්මං න කරොති, සහාපි දුක්ඛෙන සහාපි දොමනස්සෙන අස්සුමුඛො'පි රුදමානො පරිපුණ්ණං පරිසුද්ධං බ්‍රහ්මචරියං චරති. අයං වුච්චති භික්ඛවෙ පටිසොතගාමී පුග්ගලො.

කතමො ච භික්ඛවෙ ඨිතත්තො පුග්ගලො? ඉධ භික්ඛවෙ එකච්චො පුග්ගලො පඤ්චන්නං ඔරම්භාගියානං සඤ්ඤොජනානං පරික්ඛයා ඔපපාතිකො හොති, තත්ථ පරිනිබ්බායී අනාවත්තිධම්මො තස්මා ලොකා. අයං වුච්චති භික්ඛවෙ ඨිතත්තො පුග්ගලො.

කතමො ච භික්ඛවෙ පුග්ගලො තිණ්ණො පාරගතො ථලෙ තිට්ඨති බ්‍රාහ්මණො? ඉධ භික්ඛවෙ එකච්චො පුග්ගලො ආසවානං ඛයා අනාසවං චෙතොවිමුත්තිං පඤ්ඤාවිමුත්තිං දිට්ඨෙව ධම්මෙ සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරති. අයං වුච්චති භික්ඛවෙ පුග්ගලො තිණ්ණො පාරගතො ථලෙ තිට්ඨති බ්‍රාහ්මණො.

ඉමෙ ඛො භික්ඛවෙ චත්තාරො පුග්ගලා සන්තො සංවිජ්ජමානා ලොකස්මින්ති.

11. යෙ කෙචි කාමෙසු අසඤ්ඤතා ජනා අවීතරාගා ඉධ කාමභොගිනො,
පුනප්පුනං ජාතිජරූපගාමිනො තණ්හාධිපන්නා අනුසොතගාමිනො.

12. තස්මා හි ධීරො ඉධූපට්ඨිතස්සති කාමෙ ච පාපෙ ච අසෙවමානො,
සහාපි දුක්ඛෙන ජහෙය්‍ය කාමෙ පටිසොතගාමීති තමාහු පුග්ගලං.

## 4. 1. 1. 5.

## [ අනුසොතසූත්‍රය ]

5. මහණෙනි, පුද්ගලයෝ සතර දෙනෙක් ලොකයෙහි විද්‍යමානයහ. කවර සතර කෙනෙක යත්:

අනුසොතගාමී පුද්ගලය, පටිසොතගාමී පුද්ගලය, ඨිතත්ත පුද්ගලය, ඔඝතරණය කොට සිටි එගෙයින් ම පරතෙරට ගිය තිවන් තෙලෙහි සිටුනා ක්ෂීණාස්‍රව බ්‍රාහ්මණ යි.

මහණෙනි, අනුසොතගාමී පුද්ගල නම් කවරේය? මහණෙනි, මෙලොව ඇතැම් පුද්ගලයෙක් වස්තුකාමයන් ද සෙවුනේ ය. පව්පව් ද කෙරේ. මහණෙනි, මේ අනුසොතගාමී පුද්ගල යී කියනු ලැබේ.

මහණෙනි, පටිසොතගාමී පුද්ගල නම් කවරේය? මහණෙනි, මෙලොව ඇතැම් පුද්ගලයෙක් වස්තුකාමයන් නො සෙවුනේ ය. පව්පව් ද නොකරයි. සහගිය දුකින් ද සහගිය දොම්නසින් ද කඳුළු හුනු මුහුණු ඇතියේත් හඬතේ පිරිපුන් පිරිසිදු බඹසර පුරයි. මහණෙනි, මේ පටිසොතගාමී පුද්ගල යී කියනු ලැබේ.

මහණෙනි, ඨිතත්ත පුද්ගල නම් කවරේය? මහණෙනි, මෙලොව ඇතැම් පුද්ගලයෙක් පඤ්ච ඔරම්භාගිය සංයොජනයන් ක්ෂය ව යැමෙන් ඖපපාතික වෙයි. ඒ සුද්ධාවාස බඹලොව පිරිනිවන් පානා සුලු වූයේ ඒ බඹලොවින් වට්ලා නො එන සැහැවි ඇත්තේ වෙයි. මහණෙනි, මේ ඨිතත්ත පුද්ගල යී කියනු ලැබේ.

මහණෙනි, ඔඝතරණය කොට සිටි එගෙයින් ම පරතෙර ගිය නිවන් තෙලෙහි සිටුනා බ්‍රාහ්මණ පුද්ගල නම් කවරේය? මහණෙනි, මෙලොව ඇතැම් පුද්ගලයෙක් ආස්‍රවයන් ක්ෂය ව යැමෙන් අනාස්‍රව වූ (ඵලසමාධි සඞ්ඛ්‍යාත) චෙතොවිමුක්තිය (ඵලප්‍රඥා සඞ්ඛ්‍යාත) ප්‍රඥා විමුක්තිය මෙලොවිහි ම තෙමේ විශිෂ්ටඥානයෙන් දැන ප්‍රත්‍යක්ෂ කොට ඊට එළඹ වෙසෙයි. මහණෙනි, මේ පුද්ගල ඔඝ තරණය කොට සිටි එගෙයින් ම පරතෙර ගිය නිවන් තෙලෙහි සිටුනා ක්ෂීණාස්‍රව බ්‍රාහ්මණ යී කියනු ලැබේ.

මහණෙනි, මේ සතර පුද්ගල කෙනෙක් ලොකයෙහි විද්‍යමානයහ.

11. මෙලොව කාමයන් කෙරෙහි ලා අසංයත වූ අවීතරාග වූ කාම-භොගී වූ පුන පුනා ජාති ජරා දෙකට වැදගත්තා වූ තෘෂ්ණාවට බැස ගත් යම් ජන කෙනෙක් ඇද්ද ඔහු අනුසොතගාමීහු යි.

12. එගෙයින් ම මෙලොව එළඹ සිටි සිහි ඇති ධීර තෙමේ වස්තුකාමයන් ද පාපයන් ද නො සෙවුනේ සහගිය දුකිනුත් කාමයන් හැර සිටුනේ ය. ඒ පුහුලා පටිසොතගාමී යි කියත්.

13. යො වෙ කිලෙසානි පහාය පඤ්ච පරිපුණ්ණසෙඛො  
අපරිහානධම්මො,  
චෙතොවසිප්පත්තො සමාහිතින්ද්‍රියො ස වෙ ඨිතත්තො'ති  
නරො පවුච්චති.

14. පරොවරා යස්ස සමෙච්ච ධම්මා විධූපිතා අත්ථගතා න සන්ති,  
ස වෙදගූ වුසිතබ්‍රහ්මචරියො ලොකන්තගූ පාරගතො'ති වුච්චතීති.

## 4. 1. 1. 6.

### [ අප්පස්සුතසුත්තං ]

6. චත්තාරො'මෙ භික්ඛවෙ පුග්ගලා සන්තො සංවිජ්ජමානා ලොකස්මිං. කතමෙ චත්තාරො?

අප්පස්සුතො සුතෙන අනුපපන්නො, අප්පස්සුතො සුතෙන උපපන්නො, බහුස්සුතො සුතෙන අනුපපන්නො, බහුස්සුතො සුතෙන උපපන්නො.

කථඤ්ච භික්ඛවෙ පුග්ගලො අප්පස්සුතො හොති සුතෙන අනුපපන්නො? ඉධ භික්ඛවෙ එකච්චස්ස පුග්ගලස්ස අප්පකං සුතං හොති සුත්තං ගෙය්‍යං වෙය්‍යාකරණං ගාථා[1] උදානං ඉතිවුත්තකං ජාතකං අබ්භුතධම්මං වෙදල්ලං. සො තස්ස අප්පකස්ස සුතස්ස න අත්ථමඤ්ඤාය න ධම්මමඤ්ඤාය න ධම්මානුධම්මපටිපන්නො හොති. එවං ඛො භික්ඛවෙ පුග්ගලො අප්පස්සුතො හොති සුතෙන අනුපපන්නො.

කථඤ්ච භික්ඛවෙ පුග්ගලො අප්පස්සුතො හොති සුතෙන උපපන්නො? ඉධ භික්ඛවෙ එකච්චස්ස පුග්ගලස්ස අප්පකං සුතං හොති සුත්තං ගෙය්‍යං වෙය්‍යාකරණං ගාථා උදානං ඉතිවුත්තකං ජාතකං අබ්භුතධම්මං වෙදල්ලං. සො තස්ස අප්පකස්ස සුතස්ස අත්ථමඤ්ඤාය ධම්මමඤ්ඤාය ධම්මානුධම්මපටිපන්නො හොති. එවං ඛො භික්ඛවෙ පුග්ගලො අප්පස්සුතො හොති, සුතෙන උපපන්නො.

කථඤ්ච භික්ඛවෙ පුග්ගලො බහුස්සුතො හොති සුතෙන අනුපපන්නො? ඉධ භික්ඛවෙ එකච්චස්ස පුග්ගලස්ස බහුං[2] සුතං හොති සුත්තං ගෙය්‍යං වෙය්‍යාකරණං ගාථා උදානං ඉතිවුත්තකං ජාතකං අබ්භුතධම්මං වෙදල්ලං. සො තස්ස බහුකස්ස සුතස්ස න අත්ථමඤ්ඤාය න ධම්මමඤ්ඤාය න ධම්මානුධම්ම පටිපන්නො හොති. එවං ඛො භික්ඛවෙ පුග්ගලො බහුස්සුතො හොති, සුතෙන අනුපපන්නො.

1. ගාථං. මජසං. 2. බහුකං - මජසං.

13. යම් ආර්‍ය්‍යශ්‍රාවකයෙක් ඒකාන්තයෙන් පයාදම්බරමහාශීන කෙලෙසුන් පිඩා පිරිපුන් ශික්ෂා ඇත්තේ අපරිහාණස්වභාව ඇත්තේ චිත්තවශීභාවප්‍රාප්ත වූයේ මොනොවට පිහිටුවා ලූ ෂඩින්ද්‍රිය ඇත්තේ වේ ද, ඒ ආර්‍ය්‍යශ්‍රාවක ඒකාන්තයෙන් ඨිතත්ත යි කියනු ලැබේ.

14. යමෙක්හු විසින් කුශලාකුශලධර්මයෝ නුවණින් වැදගෙණ තසහ ලද්දාහු, අස්තඞ්ගත වූවාහු, විද්‍යමාන නොවෙත් ද, වැස නිම කළ බඹසර ඇති තුන්ලෝ කෙළපත් සිවුම්ග නුවණින් නිවන් ගියා වූ ඒ ආර්‍ය්‍යශ්‍රාවක තෙම පාරගත යි කියනු ලැබේ.

## 4. 1. 1. 6.

## [ අප්පස්සුතසුත්‍රය ]

6. මහණෙනි, මේ පුද්ගලයෝ සතර දෙනෙක් ලොකයෙහි විද්‍යමානයහ. කවර සතර දෙනෙක යත්:

ශ්‍රැතයෙන් උපපන්න නොවූ (සිද්ධිප්‍රාප්ත නොවූ) අල්පශ්‍රැත ය. ශ්‍රැතයෙන් උපපන්න වූ අල්පශ්‍රැත ය. ශ්‍රැතයෙන් අනුපපන්න වූ බහුශ්‍රැත ය. ශ්‍රැතයෙන් උපපන්න වූ බහුශ්‍රැත යි.

මහණෙනි, කෙසේ නම් පුද්ගල ශ්‍රැතයෙන් අනුපපන්න අල්පශ්‍රැතයෙක් වේ ද? මහණෙනි, මෙසත්හෙති කිසි යම් පුහුලකු විසින් සූත්‍ර ගෙය්‍ය වෙය්‍යාකරණ ගාථා උදාන ඉතිවුත්තක ජාතක අබ්භුතධම්ම වෙදල්ල යන නවඟසුත් මඳක් අසන ලද්දේ වෙයි. හෙතෙම අල්ප වූ ඒ ශ්‍රැතයාගේ අර්ථය නො දැන පෙළ දහම නො දැන ධර්මානුධර්ම සංඛ්‍යාත පූර්වභාගප්‍රතිපදාවට නො පිළිපන්නේ වෙයි. මහණෙනි, මෙසේ පුද්ගල ශ්‍රැතයෙන් අනුපපන්න අල්පශ්‍රැතයෙක් වෙයි.

මහණෙනි, කෙසේ නම් පුද්ගල ශ්‍රැතයෙන් උපපන්න අල්පශ්‍රැතයෙක් වේ ද? මහණෙනි, මෙ සත්හෙහි ඇතැම් පුහුලකු විසින් සූත්‍ර ගෙය්‍ය වෙය්‍යාකරණ ගාථා උදාන ඉතිවුත්තක ජාතක අබ්භුතධම්ම වෙදල්ල යන නවඟ සසුන් ලෙශමාත්‍රයක් අසන ලද්දේ වෙයි. හෙතෙම අල්ප වූ ඒ ශ්‍රැතයාගේ අටුවා දැන පෙළ දැන ධර්මානුධර්මයට පිළිපන්නේ වෙයි. මහණෙනි, මෙසේ පුද්ගල ශ්‍රැතයෙන් උපපන්න අල්පශ්‍රැතයෙක් වෙයි.

මහණෙනි, කෙසේ නම් පුද්ගල ශ්‍රැතයෙන් අනුපපන්න බහුශ්‍රැතයෙක් වේ ද? මහණෙනි, මෙ සත්හෙහි කිසියම් පුහුලකු විසින් සූත්‍ර ගෙය්‍ය වෙය්‍යාකරණ ගාථා උදාන ඉතිවුත්තක ජාතක අබ්භුතධම්ම වෙදල්ල යන නවඟ සසුන් බොහෝ අසන ලද්දේ වෙයි. හෙතෙම බොහෝ වූ ඒ ශ්‍රැතයාගේ අටුවා නො දැන පෙළ නො දැන ධර්මානුධර්මයට නො පිළිපන්නේ වෙයි. මහණෙනි, මෙසේ පුද්ගල ශ්‍රැතයෙන් අනුපපන්න බහුශ්‍රැතයෙක් වෙයි.

කථඤ්ච භික්ඛවෙ පුග්ගලො බහුස්සුතො හොති සුතෙන උපපන්නො? ඉධ භික්ඛවෙ එකච්චස්ස පුග්ගලස්ස බහුං සුතං හොති සුත්තං ගෙය්‍යං වෙය්‍යාකරණං ගාථා උදානං ඉතිවුත්තකං ජාතකං අබ්භුතධම්මං වෙදල්ලං. සො තස්ස බහුකස්ස සුතස්ස අත්ථමඤ්ඤාය ධම්මමඤ්ඤාය ධම්මානුධම්මපටිපන්නො හොති. එවං ඛො භික්ඛවෙ පුග්ගලො බහුස්සුතො හොති සුතෙන උපපන්නො.

ඉමෙ ඛො භික්ඛවෙ චත්තාරො පුග්ගලා සන්තො සංවිජ්ජමානා ලොකස්මින්ති.

15. අප්පස්සුතො'පි චෙ හොති සීලෙසු අසමාහිතො,
උභයෙන නං ගරහන්ති සීලතො ච සුතෙන ච.

16. අප්පස්සුතොපි චෙ හොති සීලෙසු සුසමාහිතො,
සීලතො නං පසංසන්ති නාස්ස සම්පජ්ජතෙ සුතං.

17. බහුස්සුතොපි චෙ හොති සීලෙසු අසමාහිතො,
සීලතො නං ගරහන්ති තස්ස සම්පජ්ජතෙ සුතං.

18. බහුස්සුතොපි චෙ හොති සීලෙසු සුසමාහිතො,
උභයෙන නං පසංසන්ති සීලතො ච සුතෙන ච.

19. බහුස්සුතං ධම්මධරං සප්පඤ්ඤං බුද්ධසාවකං,
නෙක්ඛං ජම්බොනදස්සෙව කො තං නින්දිතුමරහති,
දෙවාපි නං පසංසන්ති බ්‍රහ්මුනාපි පසංසිතො'ති.

## 4. 1. 1. 7.

## [ සොභනසුත්තං ]

7. චත්තාරො'මෙ භික්ඛවෙ පුග්ගලා වියත්තා විනීතා විසාරදා බහුස්සුතා ධම්මධරා ධම්මානුධම්මපටිපන්නා සඞ්ඝං සොභෙන්ති. කතමෙ චත්තාරො?

භික්ඛු භික්ඛවෙ වියත්තො විනීතො විසාරදො බහුස්සුතො ධම්මධරො ධම්මානුධම්මපටිපන්නො සඞ්ඝං සොභෙති.

භික්ඛුනී භික්ඛවෙ වියත්තා විනීතා විසාරදා බහුස්සුතා ධම්මධරා ධම්මානුධම්මපටිපන්නා සඞ්ඝං සොභෙති.

උපාසකො භික්ඛවෙ වියත්තො විනීතො විසාරදො බහුස්සුතො ධම්මධරො ධම්මානුධම්මපටිපන්නො සඞ්ඝං සොභෙති

උපාසිකා භික්ඛවෙ වියත්තා විනීතා විසාරදා බහුස්සුතා ධම්මධරා ධම්මානුධම්මපටිපන්නා සඞ්ඝං සොභෙති.

ඉමෙ ඛො භික්ඛවෙ චත්තාරො වියත්තා විනීතා විසාරදා බහුස්සුතා ධම්මධරා ධම්මානුධම්මපටිපන්නා සඞ්ඝං සොභෙන්තීති.

මහණෙනි, කෙසේ නම් පුද්ගල ශ්‍රැතයෙන් උපපන්න බහුශ්‍රැතයෙක් වේ ද? මහණෙනි, මෙසස්නෙහි කිසියම් පුද්ගලයකු විසින් සුත්ත ගෙය්‍ය වෙය්‍යාකරණ ගාථා උදාන ඉතිවුත්තක ජාතක අබ්භූතධම්ම වෙදල්ල යන නවඅඞ්ග සත්‍ථු ශාසනය බොහෝ අසන ලද්දේ වෙයි. හෙතෙම බොහෝ වූ ඒ ශ්‍රැතයාගේ අටුවා දැන පෙළ දහම් දැන ධර්මානුධර්මයට පිළිපන්නේ වෙයි. මහණෙනි, මෙසේ පුද්ගල ශ්‍රැතයෙන් උපපන්න බහුශ්‍රැතයෙක් වේ.

මහණෙනි, මේ සතර පුද්ගල කෙනෙක් ලෝකයෙහි විද්‍යමානයහ.

15. ඉදින් අල්පශ්‍රැතත් වේ ද, ශීලයෙහි පරිපූරකාරීත් නො වේ ද, ඔහු ශීලයෙනුදු ශ්‍රැතයෙනුදු මෙසේ උභයභාගයෙන් ගරහත්.

16. ඉදින් අල්පශ්‍රැතත් වේ ද, ශීලයෙහි පරිපූරකාරීත් වේ ද, ඔහු ශීලභාගයෙන් පසසත්. ඔහුට ශ්‍රැතය නො සැපයේ.

17. ඉදින් බහුශ්‍රැතත් වේ ද, ශීලයෙහි පරිපූරකාරීත් නොවේ ද, ඔහු ශීලභාගයෙන් ගරහත්. ඔහුට ශ්‍රැතය ශ්‍රැතසම්පත්තිය සපයා.

18. ඉදින් බහුශ්‍රැතත් වේ ද, ශීලයෙහි පරිපූරකාරීත් වේ ද, ඔහු ශීලභාගයෙනුදු ශ්‍රැතභාගයෙනුදු මෙසේ උභයභාගයෙන් පසසත්.

19. බහුශ්‍රැත වූ ශ්‍රැතධර්මයනට ආධාර වූ සුප්‍රාඥ වූ ජාම්බූනද සවර්ණනිෂ්කයක් බඳු වූ ඒ බුද්ධශ්‍රාවකයා නිගත්තට කවරෙක් නම් අගී වේ ද? දෙවියෝ ද පවා ඔහු පසසත්. බ්‍රහ්මයා විසිනුදු පසස්නා ලද්දේ ය.

## 4. 1. 1. 7.

## [ සොභනානි සූත්‍රය ]

7. මහණෙනි, ව්‍යක්ත, විනීත, විශාරද, බහුශ්‍රැත, ධර්මධර, ධර්මානුධර්මප්‍රතිපන්න සතර පුද්ගල කෙනෙක් සඞ්ඝයා හොබවත්. කවර සතර කෙනෙක යත්:

මහණෙනි. ව්‍යක්ත, විනීත, විශාරද, බහුශ්‍රැත, ධර්මධර, ධර්මානුධර්මප්‍රතිපන්න මහණ සඟුන් හොබවයි.

මහණෙනි, ව්‍යක්ත, විනීත, විශාරද, බහුශ්‍රැත, ධර්මධර, ධර්මානුධර්මප්‍රතිපන්න මෙහෙණ සඟුන් හොබවයි.

මහණෙනි, ව්‍යක්ත, විනීත, විශාරද, බහුශ්‍රැත, ධර්මධර, ධර්මානුධර්මප්‍රතිපන්න උපාසක සඟුන් හොබවයි.

මහණෙනි, ව්‍යක්ත, විනීත, විශාරද, බහුශ්‍රැත, ධර්මධර, ධර්මානුධර්මප්‍රතිපන්න උපාසිකා තොමෝ සඟුන් හොබවයි.

මහණෙනි, ව්‍යක්ත, විනීත, විශාරද, බහුශ්‍රැත, ධර්මධර, ධර්මානුධර්මප්‍රතිපන්න මේ සතර දෙන සඟුන් හොබවත්.

20. යො හොති වියත්තො ච විසාරදො ච
බහුස්සුතො ධම්මධරො ච හොති,
ධම්මස්ස හොති අනුධම්මචාරී
ස තාදිසො වුච්චති සඞ්ඝසොභනො.

21. භික්ඛු ච සීලසම්පන්නො භික්ඛුනී ච බහුස්සුතා,
උපාසකො ච යො සද්ධො යා ච සද්ධා උපාසිකා,
එතෙ ඛො සඞ්ඝං සොභෙන්ති එතෙ හි සඞ්ඝසොභනා'ති.

## 4. 1. 1. 8

### [ වෙසාරජ්ජසුත්තං ]

8. චත්තාරිමානි භික්ඛවෙ තථාගතස්ස වෙසාරජ්ජානි යෙහි වෙසාරජ්ජෙහි සමන්නාගතො තථාගතො ආසභං ඨානං පටිජානාති, පරිසාසු සීහනාදං නදති, බ්‍රහ්මචක්කං පවත්තෙති. කතමානි චත්තාරි?

"සම්මාසම්බුද්ධස්ස තෙ පටිජානතො ඉමෙ ධම්මා අනභිසම්බුද්ධා"ති තත්‍ර වත මං සමණො වා බ්‍රාහ්මණො වා දෙවො වා මාරො වා බ්‍රහ්මා වා කොචි වා ලොකස්මිං සහධම්මෙන පටිචොදෙස්සතීති නිමිත්තමෙතං භික්ඛවෙ න සමනුපස්සාමි. එතමහං භික්ඛවෙ නිමිත්තං අසමනුපස්සන්තො ඛෙමප්පත්තො අභයප්පත්තො වෙසාරජ්ජප්පත්තො විහරාමි.

"ඛීණාසවස්ස තෙ පටිජානතො ඉමෙ ආසවා අපරික්ඛීණා"ති තත්‍ර වත මං සමණො වා බ්‍රාහ්මණො වා දෙවො වා මාරො වා බ්‍රහ්මා වා කොචි වා ලොකස්මිං සහධම්මෙන පටිචොදෙස්සතීති නිමිත්තමෙතං භික්ඛවෙ න සමනුපස්සාමි. එතමහං භික්ඛවෙ නිමිත්තං අසමනුපස්සන්තො ඛෙමප්පත්තො අභයප්පත්තො වෙසාරජ්ජප්පත්තො විහරාමි.

"යෙ ඛො පන තෙ අන්තරායිකා ධම්මා වුත්තා. තෙ පටිසෙවතො නාලං අන්තරායායා"ති තත්‍ර වත මං සමණො වා බ්‍රාහ්මණො වා දෙවො වා මාරො වා බ්‍රහ්මා වා කොචි වා ලොකස්මිං සහධම්මෙන පටිචොදෙස්සතීති නිමිත්තමෙතං භික්ඛවෙ න සමනුපස්සාමි. එතමහං භික්ඛවෙ නිමිත්තං අසමනුපස්සන්තො ඛෙමප්පත්තො අභයප්පත්තො වෙසාරජ්ජප්පත්තො විහරාමි.

"යස්ස ඛො පන තෙ අත්ථාය ධම්මො දෙසිතො සො න නිය්‍යාති තක්කරස්ස සම්මා දුක්ඛක්ඛයායා"ති තත්‍ර වත මං සමණො වා බ්‍රාහ්මණො වා දෙවො වා මාරො වා බ්‍රහ්මා වා කොචි වා ලොකස්මිං සහධම්මෙන පටිචොදෙස්සතීති නිමිත්තමෙතං භික්ඛවෙ න සමනුපස්සාමි. එතමහං භික්ඛවෙ නිමිත්තං අසමනුපස්සන්තො ඛෙමප්පත්තො අභයප්පත්තො වෙසාරජ්ජප්පත්තො විහරාමි.

20. යම් මහණෙක්, ව්‍යක්ත වූයේත් විශාරද වූයේත් වේ ද, බහුශ්‍රුත වූයේත් ධර්මධර වූයේත් වේ ද, සව ලොකොත්තර ධර්මයට අනුධර්ම සඞ්ඛ්‍යාත පූර්වභාගප්‍රතිපදාව පුරන්නේත් වේ ද, එබඳු ඒ මහණ සඞ්ඝසොභනය යි කියනු ලැබේ.

21. සිල් සපත් යම් මහණෙක් වේ ද, ආගමබුහුසු (ඇසූපිරූ තැන් ඇති) යම් මෙහෙණක් වේ ද, සැදැහැති යම් උවසුවෙක් වේ ද, සැදැහැති යම් උවැසි-යක් වේ ද, මොහු සඟුන් හොබවත්. මොහු වනාහි සඞ්ඝසොභනයෝ යි.

## 4. 1. 1. 8.

## [ වෙසාරජ්ජසූත්‍රය ]

8. මහණෙනි, යම් වෛශාරද්‍යයෙකින් සමන්නාගත තථාගතයන් වහන්සේ ශ්‍රේෂ්ඨස්ථානය පිළිගණ්ණ කරණ සේක් ද, අෂ්ටපර්ෂද්හි සිංහනාද කරණ සේක් ද, බ්‍රහ්මචක්‍ර සඞ්ඛ්‍යාත දම්සක් පවත්වන සේක් ද, තථාගතයන් වහන්සේගේ මේ සතර වෛශාරද්‍ය කෙනෙක් වෙති. කවර සතර කෙනෙක යත්:

මහණෙනි, "සම්‍යක් සම්බුද්ධයම්හ යි පිළිගණ කරණ තොප විසින් මේ ධර්මයෝ අනභිසම්බුද්ධයහ"යි (ඔවුන් කියන) එකරුණෙහි ලා මහණෙක් හෝ බමුණෙක් හෝ දෙවියෙක් හෝ මරෙක් හෝ බඹෙක් හෝ ලොව අන් කිසිවෙක් හෝ සකාරණයෙන් මට චොදනා කරන්නේ ය යි මෙබඳු පුද්ගලයකු නො දක්මි. මහණෙනි, මම මෙබඳු පුද්ගලයකු නො දක්නෙම් ක්ෂෙමයට පැමිණියෙම්, අභයට පැමිණියෙම්, වෛශාරද්‍යයට පැමිණියෙම් වෙසෙමි.

මහණෙනි, "ක්ෂීණාස්‍රවයම්හයි පිළිගණ කරණ තොප විසින් මේ ආස්‍රවයෝ අපරික්ෂීණයහ"යි එකරුණෙහි ලා මහණෙක් හෝ බමුණෙක් හෝ දෙවියෙක් හෝ මරෙක් හෝ බඹෙක් හෝ ලොව අන් කිසිවෙක් හෝ සකාරණයෙන් මට චොදනා කරන්නේ ය යි මෙබඳු පුද්ගලයකු නොදක්මි. මහණෙනි, මම මෙබඳු පුද්ගලයකු නො දක්නෙම් ක්ෂෙමයට පැමිණියෙම්, අභයට පැමිණියෙම්, වෛශාරද්‍යයට පැමිණියෙම් වෙසෙමි.

මහණෙනි, "තොප විසින් යම් ඒ අන්තරායකර ධර්ම කෙනෙක් වදරණ ලද්දාහු ද, ඒ ධර්මයෝ සෙවුනාහට අන්තරාය පිණිස අසමර්ථයහ"යි එකරුණෙහි ලා මහණෙක් හෝ බමුණෙක් හෝ දෙවියෙක් හෝ මරෙක් හෝ බඹෙක් හෝ ලොව අන් කිසිවෙක් හෝ සකාරණ වචනයෙන් මට චොදනා කරන්නේ ය යි මෙබඳු පුද්ගලයකු නො දක්මි. මහණෙනි, මම මෙබඳු පුද්ගලයකු නො දක්නෙම් ක්ෂෙමයට පැමිණියෙම්, අභයට පැමිණියෙම්, වෛශාරද්‍යයට පැමිණියෙම් වෙසෙමි.

මහණෙනි, "තොප විසින් යම් අර්ථයක් සඳහා දහම් දෙසන ලද ද ඒ දහම පුරණුවහට මොනොවට දුක් නසනු පිණිස නො යෙති" යි එකරුණෙහි ලා මහණෙක් හෝ බමුණෙක් හෝ දෙවියෙක් හෝ මරෙක් හෝ බඹෙක් හෝ ලොව අන් කිසිවෙක් හෝ සකාරණ වචනයෙන් මට චොදනා කරන්නේ ය යි මෙබඳු පුද්ගලයකු නො දක්මි. මහණෙනි, මම මෙබඳු පුද්ගලයකු නො දක්නෙම් ක්ෂෙමයට පැමිණියෙම්, අභයට පැමිණියෙම්, වෛශාරද්‍යයට පැමිණියෙම් වෙසෙමි.

ඉමානි ඛො භික්ඛවෙ චත්තාරි තථාගතස්ස වෙසාරජ්ජානි යෙහි වෙසාරජ්ජෙහි සමන්නාගතො තථාගතො ආසභං ඨානං පටිජානාති, පරිසාසු සීහනාදං නදති, බ්‍රහ්මචක්කං පවත්තෙතීති.

22. යෙ කෙචි'මෙ වාදපථා පුථුස්සිතා යන්නිස්සිතා සමණබ්‍රාහ්මණා ච,
තථාගතං පත්වා න තෙ භවන්ති විසාරදං වාදපථාතිවත්තිනං.[1]

23. යො ධම්මචක්කං අභිභුය්‍ය කෙවලී[2] පවත්තයී සබ්බභූතානුකම්පී,
තං තාදිසං දෙවමනුස්සසෙට්ඨං සත්තා නමස්සන්ති භවස්ස
පාරගුන්ති.

## 4. 1. 1. 9

### [ තණ්හාසුත්තං ]

9. චත්තාරො'මෙ භික්ඛවෙ තණ්හුප්පාදා යත්ථ භික්ඛුනො තණ්හා උප්පජ්ජමානා උප්පජ්ජති. කතමෙ චත්තාරො?

චීවරහෙතු වා භික්ඛවෙ භික්ඛුනො තණ්හා උප්පජ්ජමානා උප්පජ්ජති. පිණ්ඩපාතහෙතු වා භික්ඛවෙ භික්ඛුනො තණ්හා උප්පජ්ජමානා උප්පජ්ජති. සෙනාසනහෙතු වා භික්ඛවෙ භික්ඛුනො තණ්හා උප්පජ්ජමානා උප්පජ්ජති. ඉතිභවාභවහෙතු වා භික්ඛවෙ භික්ඛුනො තණ්හා උප්පජ්ජමානා උප්පජ්ජති.

ඉමෙ ඛො භික්ඛවෙ චත්තාරො තණ්හුප්පාදා යත්ථ භික්ඛුනො තණ්හා උප්පජ්ජමානා උප්පජ්ජතීති.

24 තණ්හාදුතියො පුරිසො දීඝමද්ධාන සංසරං,
ඉත්ථභාවඤ්ඤථාභාවං සංසාරං නාතිවත්තති.

25 එතමාදීනවං ඤත්වා තණ්හං දුක්ඛස්ස සම්භවං,
වීතතණ්හො අනාදානො සතො භික්ඛු පරිබ්බජෙ'ති.

## 4. 1. 1. 10

### [ යොගසුත්තං ]

10. චත්තාරො'මෙ භික්ඛවෙ යොගා. කතමෙ චත්තාරො? කාමයොගො භවයොගො දිට්ඨියොගො අවිජ්ජායොගො.

කතමො ච භික්ඛවෙ කාමයොගො? ඉධ භික්ඛවෙ එකච්චො කාමානං සමුදයඤ්ච අත්ථගමඤ්ච අස්සාදඤ්ච ආදීනවඤ්ච නිස්සරණඤ්ච යථාභූතං නප්පජානාති. තස්ස කාමානං සමුදයඤ්ච අත්ථගමඤ්ච අස්සාදඤ්ච ආදීනවඤ්ච නිස්සරණඤ්ච යථාභූතං අප්පජානතො යො කාමෙසු කාමරාගො කාමනන්දී කාමසිනෙහො කාමමුච්ඡා කාමපිපාසා කාමපරිළාහො කාමජ්ඣොසානං කාමතණ්හා සානුසෙති. අයං වුච්චති භික්ඛවෙ කාමයොගො. (ඉති කාමයොගො)

---

1. වාදපථාභිවත්තං - මජසං.
2. කෙවලො - මජසං, කෙවලං - සයා

මහණෙනි, යම් වෛශාරද්‍යයෙකින් සමන්‍වාගත තථාගතයන් වහන්සේ ශ්‍රෙෂ්ඨස්ථානය පිළිඥණ කරණ සේක් ද, අෂ්ටපර්ෂද්හි සිංහනාද කරණ සේක් ද, බ්‍රහ්මචක්‍ර සඞ්ඛ්‍යාත ධර්මයක් පවත්වන සේක් ද, මේ ඒ තථාගතයන් වහන්සේගේ සතර වෛශාරද්‍යයෝ යි.

22. යම් මහණ බමුණු කෙනෙක් (මෙකල) යම් වාදපථයක් ඇසුරු කළාහු ද, (එනෙසින් ම) බොහෝ බවට ගියාහු ද, එබඳු යම් කිසි මේ වාදපථයෝ වෙත් නම් ඔහු විශාරද වූ වාද ඉක්මවා සිටුනා තථාගතයන් වහන්සේ කරා පැමිණ බිඳෙත්.

23. සර්වසත්‍වහිතානුකම්පී වූ සකලගුණ සමන්‍වාගත වූ වාදපථ මැඩ-ගෙණ සිටුනා යමෙක් දම්සක් පැවැත්වී ද, භවාන්තයට ගිය දෙව්මිනිසුනට ශ්‍රෙෂ්ඨ වූ එබඳු ඒ තථාගතයන් වහන්සේට සත්හු නමදිත්.

## 4. 1. 1. 9.

## [ තෘෂ්ණාසූත්‍රය ]

9. මහණෙනි, යම් විෂයයෙක මහණහට තෘෂ්ණාව උපදිනී වේ ද, මේ ඒ තෘෂ්ණා උත්පාදයෝ සතරෙකි. කවර සතරෙක යත්:

මහණෙනි, චීවරහේතුයෙන් හෝ මහණහට තෘෂ්ණාව උපදී. මහණෙනි, පිණ්ඩපාතහේතුයෙන් හෝ මහණහට තෘෂ්ණාව උපදී. මහණෙනි, ශයනාසන-හේතුයෙන් හෝ මහණහට තෘෂ්ණාව උපදී. මහණෙනි, ඉති භවාභව-සඞ්ඛ්‍යාත (චීවරාදියෙහි) ප්‍රණීත – ප්‍රණීතතරාදි හේතුයෙන් හෝ තෘෂ්ණාව උපදී.

මහණෙනි, මහණහට යම් විෂයයෙක තෘෂ්ණාව උපදිනී වේ ද, මේ ඒ සතර තෘෂ්ණා උත්පාදයෝ ය.

24. තෘෂ්ණාව දෙවෙනි කොට ගත් (=තෘෂ්ණාව සහායිකාව කොට ඇති) පුරුෂ දීර්ඝකාලයක් සැරිසරණුයේ ඉත්ථම්භාව – අන්‍යථාභාවසඞ්ඛ්‍යාත (=මෙලොව-පරලොව) සංසාරය පැන නො යයි.

25. මෙලෙ ආදීනවය දැන, දුඃඛයාගේ සම්භවය වූ තෘෂ්ණාව දැන, පැහූ තෘෂ්ණා ඇති, උපාදාන වියින් නො ගන්නා සතිසම්පජඤ්ඤයෙහි පිහිටියේ මහණ වෙසේ.

## 4. 1. 1. 10.

## [ යොගසූත්‍රය ]

10. මහණෙනි, මේ සතර යොග කෙනෙක් වෙති. කවර සතර කෙනෙක යත්: කාමයොගය, භවයොගය, දෘෂ්ටියොගය, අවිද්‍යායොග යි.

මහණෙනි, කාමයොගය කවරේය: මහණෙනි, මෙසස්නෙහි ඇතැම් මහණෙක් කාමයන්ගේ උත්පත්තිය ද, බිඳීම ද, මිහිර ද, දෝෂය ද, නිස්සර-ණය ද, තත් වූ සැටියෙන් නො දනියි. කාමයන්ගේ ඉපැදීම ද, බිඳීම ද, මිහිර ද, දෝෂය ද, හැරපීම ද, තත් වූ සැටියෙන් නො දන්නා ඔහුට වස්තුකාමයෙහි යම් කාමරාගයෙක්, කාමනන්දියෙක්, කාමස්නෙහයෙක්, කාමමූර්ඡාවෙක්, කාමපිපාසාවෙක්, කාමපරිදාහයෙක්, කාමයෙහි බැසගැණී මෙක්, කාමතෘෂ්ණාවෙක් ඇද්ද, ඒ තෘෂ්ණාව උපදියි. මහණෙනි, මේ කාමයොග යි කියනු ලැබේ. (මේ කාමයොග යි.)

භවයොගො ච කථං හොති? ඉධ භික්ඛවෙ එකච්චො භවානං සමුදයඤ්ච අත්ථගමඤ්ච අස්සාදඤ්ච ආදීනවඤ්ච නිස්සරණඤ්ච යථාභූතං නප්පජානාති. තස්ස භවානං සමුදයඤ්ච අත්ථගමඤ්ච අස්සාදඤ්ච ආදීනවඤ්ච නිස්සරණඤ්ච යථාභූතං අප්පජානතො යො භවෙසු භවරාගො භවනන්දී භවසිනෙහො භවමුච්ඡා භවපිපාසා භවපරිළාහො භවජ්ඣොසානං භවතණ්හා සානුසෙති. අයං වුච්චති භික්ඛවෙ භවයොගො. (ඉති කාමයොගො භවයොගො)

දිට්ඨියොගො ච කථං හොති? ඉධ භික්ඛවෙ එකච්චො දිට්ඨීනං සමුදයඤ්ච අත්ථගමඤ්ච අස්සාදඤ්ච ආදීනවඤ්ච නිස්සරණඤ්ච යථාභූතං නප්පජානාති. තස්ස දිට්ඨීනං සමුදයඤ්ච අත්ථගමඤ්ච අස්සාදඤ්ච ආදීනවඤ්ච නිස්සරණඤ්ච යථාභූතං අප්පජානතො යො දිට්ඨීසු දිට්ඨිරාගො දිට්ඨිනන්දී දිට්ඨිසිනෙහො දිට්ඨිමුච්ඡා දිට්ඨිපිපාසා දිට්ඨිපරිළාහො දිට්ඨිඅජ්ඣොසානං දිට්ඨිතණ්හා සානුසෙති. අයං වුච්චති භික්ඛවෙ දිට්ඨියොගො. (ඉති කාමයොගො භවයොගො දිට්ඨියොගො)

අවිජ්ජායොගො ච කථං හොති? ඉධ භික්ඛවෙ එකච්චො ඡන්නං ඵස්සායතනානං සමුදයඤ්ච අත්ථගමඤ්ච අස්සාදඤ්ච ආදීනවඤ්ච නිස්සරණඤ්ච යථාභූතං නප්පජානාති. තස්ස ඡන්නං ඵස්සායතනානං සමුදයඤ්ච අත්ථගමඤ්ච අස්සාදඤ්ච ආදීනවඤ්ච නිස්සරණඤ්ච යථාභූතං අප්පජානතො යා ඡසු ඵස්සායතනෙසු අවිජ්ජා අඤ්ඤාණං සානුසෙති, අයං වුච්චති භික්ඛවෙ අවිජ්ජායොගො (ඉති කාමයොගො භවයොගො දිට්ඨියොගො අවිජ්ජායොගො.)

සංයුත්තො පාපකෙහි අකුසලෙහි ධම්මෙහි සංකිලෙසිකෙහි පොනොභවිකෙහි සදරෙහි දුක්ඛවිපාකෙහි ආයතිං ජාතිජරාමරණිකෙහි, තස්මා අයොගක්ඛෙමීති වුච්චති.

ඉමෙ ඛො භික්ඛවෙ චත්තාරො යොගා.

චත්තාරො'මෙ භික්ඛවෙ විසංයොගා. කතමෙ චත්තාරො? කාමයොගවිසංයොගො භවයොගවිසංයොගො දිට්ඨියොගවිසංයොගො අවිජ්ජායොගවිසංයොගො.

කතමො ච භික්ඛවෙ කාමයොගවිසංයොගො? ඉධ භික්ඛවෙ එකච්චො කාමානං සමුදයඤ්ච අත්ථගමඤ්ච අස්සාදඤ්ච ආදීනවඤ්ච නිස්සරණඤ්ච යථාභූතං පජානාති. තස්ස කාමානං සමුදයඤ්ච අත්ථගමඤ්ච අස්සාදඤ්ච ආදීනවඤ්ච නිස්සරණඤ්ච යථාභූතං පජානතො යො කාමෙසු කාමරාගො කාමනන්දී කාමසිනෙහො කාමමුච්ඡා කාමපිපාසා කාමපරිළාහො කාමජ්ඣොසානං කාමතණ්හා සා නානුසෙති. අයං වුච්චති භික්ඛවෙ කාමයොගවිසංයොගො. (ඉති කාමයොගවිසංයොගො.)

භවයෝගය කෙසේද යත්: මහණෙනි, මෙසස්හෙහි ඇතැම් මහණෙක් භවයන්ගේ උත්පත්තිය ද, බිඳීම ද, මිහිර ද, දොස් ද, හැරපීම ද තත් වූ සැටියෙන් නො දනී ද, භවයන්ගේ ඉපැද්ම ද, බිඳීම ද, මිහිර ද, දොස් ද, හැරපීම් ද තත් වූ සැටියෙන් නො දන්නා ඔහුට භවයෙහි යම් භවරාගයෙක්, භවනන්දියෙක් භවසෙනහයෙක්, භවමූර්ඡායෙක්, භවපිපාසායෙක්, භවපරිදාහයෙක්, භවයෙහි ගැලීසිටීමෙක්, භවතෘෂ්ණායෙක් ඇද්ද, ඒ තෘෂ්ණාව උපදියි. මහණෙනි, මේ භවයොග යි කියනු ලැබේ. (මේ කාමයොග හා භවයොග යි.)

දෘෂ්ටියොගය කෙසේද යත්: මහණෙනි, මෙසස්හෙහි ඇතැම් මහණෙක් දෘෂ්ටීන්ගේ ඉපැද්ම ද, බිඳීම ද, මිහිර ද, දොස් ද, හැරපීම ද, තත් වූ සැටියෙන් නො දනී ද, දෘෂ්ටීන්ගේ ඉපැද්ම ද, බිඳීම ද, මිහිර ද, දොස් ද, හැරපීම් ද තත් වූ සැපියෙන් නො දන්නා ඔහුට දෘෂ්ටියෙහි යම් දෘෂ්ටිරාගයෙක්, දෘෂ්ටිනන්දියෙක්, දෘෂ්ටිසෙනහයෙක්, දෘෂ්ටිමූර්ඡායෙක්, දෘෂ්ටිපිපාසායෙක්, දෘෂ්ටිපරිදාහයෙක්, දෘෂ්ටියෙහි ගැලීසිටීමෙක්, දෘෂ්ටිතෘෂ්ණායෙක් ඇද්ද, ඒ උපදී. මහණෙනි, මේ දෘෂ්ටියොග යි කියනු ලැබේ. (මේ කාමයොග-භවයොග හා දෘෂ්ටියොග යි.)

අවිද්‍යායොගය කෙසේද යත්: මහණෙනි, මෙසස්හෙහි ඇතැම් මහණෙක් සවැදෑරුම් ස්පර්ශායතනයන්ගේ ඉපැද්ම ද, බිඳීම ද, මිහිර ද, දොස් ද, හැරපීම ද, තත් වූ සැටියෙන් නො දනී ද, සවැදෑරුම් ස්පර්ශායතනයන්ගේ ඉපැද්ම ද, බිඳීම ද, මිහිර ද, දොස් ද, හැරපීම ද, තත් වූ පරිදි නො දන්නා වූ ඔහුට ෂට්ස්පර්ශායතනයෙහි යම් අවිද්‍යායෙක් අඥානයෙක් ඇද් ද, ඒ අවිද්‍යාව උපදී. මහණෙනි, මේ අවිද්‍යායොග යි කියනු ලැබේ. (කාමයොග - භවයොග - දෘෂ්ටියොග - අවිද්‍යායොග මෙසේ ය.)

කිලිටි කරණ, පුනර්භවය ඇති කරණ, දරථ සහිත දුක් උපදවන, මතු ජාතිජරාමරණ උදාකරණ ලාමක අකුසල් දහමින් පිරිවැරුනේ වේ ද, එහෙයින් (හෙතෙම) අයොගක්ඛෙමී යි කියනු ලැබේ.

මහණෙනි, මේ සතර යොගයහ.

මහණෙනි, මේ සතර විසංයොග කාරණයෝ ය. කවර සතරක යත්: කාමයොගයෙන් විසංයොගය, භවයොගයෙන් විසංයොගය, දිට්ඨියොගයෙන් විසංයොගය, අවිජ්ජායොගයෙන් විසංයොග යි.

මහණෙනි, කාමයොගයෙන් විසංයොගය කවරේද: මහණෙනි, මෙසස්-හෙහි ඇතැම් මහණෙක් කාමයන්ගේ ඉපැද්ම ද, බිඳීම ද, මිහිර ද, දොස් ද, හැරපීම ද, තත් වූ සැටියෙන් දනී ද, කාමයන්ගේ ඉපැද්ම ද, බිඳීම ද, මිහිර ද, දොස් ද, හැරපීම ද, තත් වූ සැටියෙන් දන්නා ඔහුට කාමයෙහි යම් කාමරාගයෙක්, කාමනන්දියෙක්, කාමසෙනහයෙක්, කාමමූර්ඡායෙක්, කාමපිපාසායෙක්, කාමපරිදාහයෙක්, කාමයෙහි ගැලීසිටීමෙක් කාමතෘෂ්ණා-යෙක් ඇද්ද, ඒ නූපදී. මහණෙනි, මේ කාමයොග විසංයොග යි කියනු ලැබේ. (මේ කාමයොග විසංයොග යි.)

භවයොගවිසංයොගො ච කථං හොති? ඉධ භික්ඛවෙ එකච්චො භවානං සමුදයඤ්ච අත්ථඞ්ගමඤ්ච අස්සාදඤ්ච ආදීනවඤ්ච නිස්සරණඤ්ච යථාභූතං පජානාති. තස්ස භවානං සමුදයඤ්ච අත්ථඞ්ගමඤ්ච අස්සාදඤ්ච ආදීනවඤ්ච නිස්සරණඤ්ච යථාභූතං පජානතො යො භවෙසු භවරාගො භවනන්දි භවසිනෙහො භවමුච්ඡා භවපිපාසා භවපරිළාහො භවජ්ඣොසානං භවතණ්හා සා නානුසෙති. අයං වුච්චති භික්ඛවෙ භවයොගවිසංයොගො. (ඉති කාම-යොගවිසංයොගො භවයොගවිසංයොගො.)

දිට්ඨියොගවිසංයොගො ච කථං හොති? ඉධ භික්ඛවෙ එකච්චො දිට්ඨීනං සමුදයඤ්ච අත්ථඞ්ගමඤ්ච අස්සාදඤ්ච ආදීනවඤ්ච නිස්සරණඤ්ච යථාභූතං පජානාති. තස්ස දිට්ඨීනං සමුදයඤ්ච අත්ථඞ්ගමඤ්ච අස්සාදඤ්ච ආදීනවඤ්ච නිස්සරණඤ්ච යථාභූතං පජානතො යො දිට්ඨිසු දිට්ඨිරාගො දිට්ඨිනන්දි දිට්ඨිමුච්ඡා දිට්ඨිපිපාසා දිට්ඨිපරිළාහො දිට්ඨිඅජ්ඣොසානං දිට්ඨිතණ්හා සා නානුසෙති. අයං වුච්චති භික්ඛවෙ දිට්ඨියොගවිසංයොගො. (ඉති කාමයොගවිසංයොගො භවයොගවිසංයොගො දිට්ඨියොගවිසංයොගො.)

අවිජ්ජායොගවිසංයොගො ච කථං හොති? ඉධ භික්ඛවෙ එකච්චො ඡන්නං ඵස්සායතනානං සමුදයඤ්ච අත්ථඞ්ගමඤ්ච අස්සාදඤ්ච ආදීනවඤ්ච නිස්සරණඤ්ච යථාභූතං පජානාති. තස්ස ඡන්නං ඵස්සායතනානං සමුදයඤ්ච අත්ථඞ්ගමඤ්ච අස්සාදඤ්ච ආදීනවඤ්ච නිස්සරණඤ්ච යථාභූතං පජානතො යා ඡසු ඵස්සායතනෙසු අවිජ්ජා අඤ්ඤාණං සා නානුසෙති. අයං වුච්චති භික්ඛවෙ අවිජ්ජායොගවිසංයොගො. (ඉති කාමයොගවිසංයොගො භවයොග-විසංයොගො දිට්ඨියොගවිසංයොගො අවිජ්ජායොගවිසංයොගො.)

විසංයුත්තො පාපකෙහි අකුසලෙහි ධම්මෙහි සංකිලෙසිකෙහි පොනො-භවිකෙහි සදරෙහි දුක්ඛවිපාකෙහි ආයතිං ජාතිජරාමරණිකෙහි. තස්මා යොගක්ඛෙමීති වුච්චති.

ඉමෙ ඛො භික්ඛවෙ චත්තාරො විසංයොගාති.

26. කාමයොගෙන සංයුත්තා භවයොගෙන චූභයං,
දිට්ඨියොගෙන සංයුත්තා අවිජ්ජාය පුරක්ඛතා,
සත්තා ගච්ඡන්ති සංසාරං ජාතිමරණගාමිනො.

27. යෙ ච කාමෙ පරිඤ්ඤාය භවයොගඤ්ච සබ්බසො,
දිට්ඨියොගං සමූහච්ච අවිජ්ජඤ්ච විරාජයං,
සබ්බයොගවිසංයුත්තා තෙ වෙ යොගාතිගා මුනීති.

භණ්ඩගාමවග්ගො පඨමො.

**තස්සුද්දානං:**

අනුබුද්ධං පපතිතං ද්වෙ ඛතං අනුසොතපඤ්චමං,
අප්පස්සුතො ච සොභෙන්ති වෙසාරජ්ජං තණ්හායොගෙන තෙ දසා'ති.

භවයොගයෙන් විසංයොගය කෙසේද යත්: මහණෙනි, මෙසස්නෙහි ඇතැම් මහණෙක් භවයන්ගේ ඉපැද්ම ද, බිඳීම ද, මිහිර ද, දොස් ද, හැරපීම ද, තත් වූ සැටියෙන් දනී ද, භවයන්ගේ ඉපැද්ම ද, බිඳීම ද, මිහිර ද, දොස් ද, හැරපීම ද තත් වූ සැටියෙන් දන්නා ඔහුට භවයෙහි යම් භවරාගයෙක්, භවනන්දියෙක්, භවස්නෙහයෙක්, භවමූර්ඡායෙක්, භවපිපාසායෙක්, භවපරිදාහයෙක්, භවයෙහි ගැලීසිටීමෙක්, භවතෘෂ්ණායෙක් ඇද්ද, ඒ තෘෂ්ණාව නූපදී. මහණෙනි, මේ භවයොග විසංයොග යි කියනු ලැබේ. (මේ කාමයොග විසංයොග හා භවයොග විසංයොග යි.)

දෘෂ්ටියොගයෙන් විසංයොගය කෙසේද යත්: මහණෙනි, මෙසස්නෙහි ඇතැම් මහණෙක් දෘෂ්ටීන්ගේ ඉපැද්ම ද, බිඳීම ද, මිහිර ද, දොස් ද, හැරපීම ද තත් වූ සැටියෙන් දනී ද, දෘෂ්ටීන්ගේ ඉපැද්ම ද, බිඳීම ද, මිහිර ද, දොස් ද, හැරපීම ද, තත් වූ සැටියෙන් දන්නා ඔහුට දෘෂ්ටියෙහි යම් දෘෂ්ටිරාගයෙක්, දෘෂ්ටිනන්දියෙක්, දෘෂ්ටිමූර්ඡායෙක්, දෘෂ්ටිපිපාසායෙක්, දෘෂ්ටිපරිදාහයෙක්, දෘෂ්ටියෙහි ගැලීසිටීමෙක්, දෘෂ්ටිතෘෂ්ණායෙක් ඇද්ද, ඒ තෘෂ්ණාව නූපදී. මහණෙනි, මේ දෘෂ්ටියොගවිසංයොග යි කියනු ලැබේ. (මේ කාමයොග-විසංයොගය, භවයොගවිසංයොගය, දෘෂ්ටියොග විසංයොග යි.)

අවිද්‍යායොගයෙන් විසංයොගය කෙසේද යත්: මහණෙනි, මෙසස්නෙහි ඇතැම් මහණෙක් ෂට්ස්පර්ශායතනයන්ගේ ඉපැද්ම ද, බිඳීම ද, මිහිර ද, දොස් ද, හැරපීම ද, තත් වූ සැටියෙන් දනී ද, ෂට්ස්පර්ශායතනයන්ගේ ඉපැද්ම ද, බිඳීම ද, මිහිර ද, දොස් ද, හැරපීම ද, තත් වූ සැටියෙන් දන්නා ඔහුට ෂට්ස්පර්ශායතනයෙහි යම් අවිද්‍යායෙක් නො දැන්මෙක් ඇද්ද, ඒ අවිද්‍යාව නූපදී. මහණෙනි, මේ අවිද්‍යායොගයෙන් විසංයොග යි කියනු ලැබේ. (කාමයොගවිසංයොගය, භවයොගවිසංයොගය, දෘෂ්ටියොගවිසංයොගය, අවිද්‍යායොගවිසංයොගය මෙසේ යි.)

කිලිටි කරණ, පුනර්භවය ඇති කරණ, දරථ සහිත, දුක් උපදවන, මතු ජාතිජරාමරණ උදාකරණ, ලාමක අකුසල් දහමින් වෙන් වූයේ වේ ද, එහෙයින් (හෙතෙම) අයොගක්ඛෙමී යි කියනු ලැබේ.

මහණෙනි, මේ සතර විසංයොග කාරණයෝ යි.

26. කාමයොගයෙන් සංයුක්ත වූත්, භවයොගයෙන් සංයුක්ත වූත්, මෙසේ උභයභාගයෙන් හෝ සංයුක්ත වූත්, දෘෂ්ටියොගයෙන් සංයුක්ත වූත්, අවිද්‍යායෙන් පෙරටු කරණ ලද්ද වූත්, ජාතිජරාමරණ කරා යන සුළු සත්හු සසරට වදිත්.

27. යම් කෙනෙක් දෙවැදෑරුම් කාමයන් පිරිසිඳ දැන සර්වප්‍රකාරයෙන් භවයොගයන් දැන දෘෂ්ටියොගය සිඳපියා අවිද්‍යාවත් හැරපියා සර්වයොගයන් කෙරෙන් විසංයුක්ත වූහු ද, ඒ ක්ෂීණාශ්‍රව මුනීහු ඒකාන්තයෙන් කාමාදි-යොගයන් පැන ගියාහු යි.

භණ්ඩගාමවර්ගය පළමුවැනි යි.

එහි උද්දානය:

අනුබුද්ධය, පපතිතය, බත දෙක ය,
පස්වැනි අනුසොතය, අප්පස්සුතය,
සොභනාතිය, වෙසාරජ්ජය, තණ්හාය, යොගය
යන මෙහින් ඒ සූත්‍රයෝ දස දෙනෙකි.

# 2. චරවග්ගො

## 4. 1. 2. 1.

## [ චරණසුත්තං ]

[සාවත්ථිනිදානං:]

11. චරතො චෙපි භික්ඛවෙ භික්ඛුනො උප්පජ්ජති කාමවිතක්කො වා ව්‍යාපාදවිතක්කො වා විහිංසාවිතක්කො වා. තඤ්චෙ භික්ඛු අධිවාසෙති, නප්පජහති, න විනොදෙති, න ව්‍යන්තීකරොති, න අනභාවං ගමෙති. චරම්පි භික්ඛවෙ භික්ඛු එවම්භූතො අනාතාපී අනොත්තාපී සතතං සමිතං කුසීතො හීනවිරියො'ති වුච්චති.

ඨිතස්ස චෙපි භික්ඛවෙ භික්ඛුනො උප්පජ්ජති කාමවිතක්කො වා ව්‍යාපාදවිතක්කො වා විහිංසාවිතක්කො වා. තඤ්චෙ භික්ඛු අධිවාසෙති, නප්පජහති, න විනොදෙති, න ව්‍යන්තීකරොති, න අනභාවං ගමෙති. ඨිතො චෙපි භික්ඛවෙ භික්ඛු එවම්භූතො අනාතාපී අනොත්තාපී සතතං සමිතං කුසීතො හීනවිරියො'ති වුච්චති.

නිසින්නස්ස චෙපි භික්ඛවෙ භික්ඛුනො උප්පජ්ජති කාමවිතක්කො වා ව්‍යාපාදවිතක්කො වා විහිංසාවිතක්කො වා. තඤ්චෙ භික්ඛු අධිවාසෙති, නප්පජහති, න විනොදෙති, න ව්‍යන්තීකරොති, න අනභාවං ගමෙති. නිසින්නොපි භික්ඛවෙ භික්ඛු එවම්භූතො අනාතාපී අනොත්තාපී සතතං සමිතං කුසීතො හීනවිරියො'ති වුච්චති.

සයානස්ස චෙපි භික්ඛවෙ භික්ඛුනො ජාගරස්ස උප්පජ්ජති කාමවිතක්කො වා ව්‍යාපාදවිතක්කො වා විහිංසාවිතක්කො වා. තඤ්චෙ භික්ඛු අධිවාසෙති, නප්පජහති, න විනොදෙති, න ව්‍යන්තීකරොති, න අනභාවං ගමෙති. සයානොපි භික්ඛවෙ භික්ඛු ජාගරො එවම්භූතො අනාතාපී අනොත්තාපී සතතං සමිතං කුසීතො හීනවිරියො'ති වුච්චති.

චරතො චෙපි භික්ඛවෙ භික්ඛුනො උප්පජ්ජති කාමවිතක්කො වා ව්‍යාපාදවිතක්කො වා විහිංසාවිතක්කො වා. තඤ්චෙ භික්ඛු නාධිවාසෙති, පජහති විනොදෙති, ව්‍යන්තීකරොති, අනභාවං ගමෙති. චරම්පි භික්ඛවෙ භික්ඛු එවම්භූතො ආතාපී ඔත්තාපී සතතං සමිතං ආරද්ධවිරියො පහිතත්තො'ති වුච්චති.

ඨිතස්ස චෙපි භික්ඛවෙ භික්ඛුනො උප්පජ්ජති කාමවිතක්කො වා ව්‍යාපාදවිතක්කො වා විහිංසාවිතක්කො වා. තඤ්චෙ භික්ඛු නාධිවාසෙති පජහති විනොදෙති ව්‍යන්තීකරොති අනභාවං ගමෙති ඨිතොපි භික්ඛවෙ භික්ඛු එවම්භූතො ආතාපී ඔත්තාපී සතතං සමිතං ආරද්ධවිරියො පහිතත්තො'ති වුච්චති.

නිසින්නස්ස චෙපි භික්ඛවෙ භික්ඛුනො උප්පජ්ජති කාමවිතක්කො වා ව්‍යාපාදවිතක්කො වා විහිංසාවිතක්කො වා. තඤ්චෙ භික්ඛු නාධිවාසෙති පජහති විනොදෙති ව්‍යන්තීකරොති අනභාවං ගමෙති. නිසින්නොපි භික්ඛවෙ භික්ඛු එවම්භූතො ආතාපී ඔත්තාපී සතතං සමිතං ආරද්ධවිරියො පහිතත්තො'ති වුච්චති.

# 2. චරවග්ගය

## 4. 1. 2. 1.

## [ චරනසූත්‍රය ]

**[සැවැත් නිදනයි:]**

11. මහණෙනි, ඇවිදිනා මහණහට ද කාමවිතර්කයෙක් හෝ ව්‍යාපාදවිතර්කයෙක් හෝ විහිංසාවිතර්කයෙක් හෝ උපදනේ ය. මහණ ඒ විතර්කය ද ඉවසයි. නො හරියි, නො තෙරයි. විගතාන්ත නො කෙරෙයි. අභාවයට නොද පමුණුවයි. මහණෙනි, වීර්‍ය්‍යරහිත වූ උපවාද භය රහිත වූ හැමදා නිරතුරු කුසීත වූ මෙබඳු ඇවිදිනා මහණ ද, "හීනවීර්‍ය්‍ය ඇත්තේ" යයි කියනු ලැබේ.

මහණෙනි, සිටිනා වූ ද මහණහට කාමවිතර්කයෙක් හෝ ව්‍යාපාදවිතර්කයෙක් හෝ විහිංසාවිතර්කයෙක් හෝ උපදනේ ය. මහණ ඒ විතර්කය ද ඉවසයි. නො හරියි. නො තෙරයි. විගතාන්ත නො කෙරෙයි. අභාවයට නොද පමුණුවයි. මහණෙනි, වීර්‍ය්‍ය රහිත වූ උපවාද භය රහිත වූ හැමදා නිරතුරු කුසීත වූ මෙබඳු සිටිනා මහණ ද "හීනවීර්‍ය්‍ය ඇත්තේ" යි කියනු ලැබේ.

මහණෙනි, හිඳිනා වූ ද මහණහට කාමවිතර්කයෙක් හෝ ව්‍යාපාදවිතර්කයෙක් හෝ විහිංසාවිතර්කයෙක් හෝ උපදනේ ය. මහණ ඒ විතර්කය ද ඉවසයි. නො හරියි. නො තෙරයි. විගතාන්ත නො කෙරෙයි. අභාවයට නොද පමුණුවයි. මහණෙනි, වීර්‍ය්‍යරහිත වූ උපවාද භය රහිත වූ හැමදා නිරතුරු කුසීත වූ මෙබඳු හිඳිනා මහණ ද "හීනවීර්‍ය්‍ය ඇත්තේ" යි කියනු ලැබේ.

මහණෙනි, නිදිවරණ හෝනා වූ ද මහණහට කාමවිතර්කයෙක් හෝ ව්‍යාපාදවිතර්කයෙක් හෝ විහිංසාවිතර්කයෙක් හෝ උපදනේ ය. මහණ ඒ විතර්කය ද ඉවසයි. නො හරියි. නො තෙරයි. විගතාන්ත නො කෙරෙයි. අභාවයට නොද පමුණුවයි. මහණෙනි, වීර්‍ය්‍ය රහිත වූ උපවාද භය රහිත වූ හැමදා නිරතුරු කුසීත වූ මෙබඳු නිදිවරණ හෝනා වූ ද මහණ "හීනවීර්‍ය්‍ය ඇත්තේ' යි කියනු ලැබේ.

මහණෙනි, ඇවිදිනා වූ ද මහණහට කාමවිතර්කයෙක් හෝ ව්‍යාපාදවිතර්කයෙක් හෝ විහිංසාවිතර්කයෙක් හෝ උපදනේ ය. මහණ ඒ විතර්කය ද නො ඉවසයි. හරියි. තෙරයි. විගතාන්ත කෙරෙයි. අභාවයට පමුණුවයි. මහණෙනි, වීර්‍ය්‍ය ඇති උපවාද භය ඇති හැමදා නිරතුරු පටන් ගත් වීර්‍ය්‍ය ඇති මෙබඳු ඇවිදිනා වූ ද මහණ "සමථ විදර්ශනා දෙක්හි මෙහෙයූ සිත් ඇත්තේ" යි කියනු ලැබේ.

මහණෙනි, සිටිනා වූ ද මහණහට කාමවිතර්කයෙක් හෝ ව්‍යාපාදවිතර්කයෙක් හෝ විහිංසාවිතර්කයෙක් හෝ උපදනේ ය. මහණ ඒ විතර්කය ද නො ඉවසයි. හරියි. තෙරයි. විගතාන්ත කෙරෙයි. අභාවයට පමුණුවයි මහණෙනි, වීර්‍ය්‍ය ඇති උපවාද භය ඇති හැමදා නිරතුරු පටන් ගත් වීර්‍ය්‍ය ඇති මෙබඳු සිටිනා වූ ද මහණ "සමථ විදර්ශනා දෙක්හි මෙහෙයූ සිත් ඇත්තේ" යි කියනු ලැබේ.

මහණෙනි, හුන්නා වූ ද මහණහට කාමවිතර්කයෙක් හෝ ව්‍යාපාදවිතර්කයෙක් හෝ විහිංසාවිතර්කයෙක් හෝ උපදනේ ය. මහණ ඒ විතර්කය ද නො ඉවසයි. හරියි. තෙරයි. විගතාන්ත කෙරෙයි. අභාවයට පමුණුවයි. මහණෙනි, වීර්‍ය්‍ය ඇති උපවාද භය ඇති හැමදා නිරතුරු පටන් ගත් වීර්‍ය්‍ය ඇති මෙබඳු වූ ද ඒ මහණ "සමථ විදර්ශනා දෙක්හි මෙහෙයූ සිත් ඇත්තේ" යි කියනු ලැබේ.

සයානස්ස චෙපි භික්ඛවෙ භික්ඛුනො ජාගරස්ස උප්පජ්ජති කාමවිතක්කො වා ව්‍යාපාදවිතක්කො වා විහිංසාවිතක්කො වා, තං ච භික්ඛු නාධිවාසෙති පජහති, විනොදෙති, බ්‍යන්තීකරොති, අනභාවං ගමෙති. සයානොපි භික්ඛවෙ භික්ඛු ජාගරො එවම්භූතො ආතාපී ඔත්තාපී සතතං සමිතං ආරද්ධවිරියො පහිතත්තො'ති වුච්චතීති.

28. චරං වා යදි වා තිට්ඨං නිසින්නො උද වා සයං,
යො විතක්කං විතක්කෙති පාපකං ගෙහනිස්සිතං.

29. කුම්මග්ගං පටිපන්නො සො මොහනෙය්‍යෙසු මුච්ඡිතො,
අභබ්බො තාදිසො භික්ඛු ඵුට්ඨුං සම්බොධිමුත්තමං.

30. යො චරං වා තිට්ඨං වා නිසින්නො උද වා සයං,
විතක්කං සමයිත්වාන විතක්කූපසමෙ රතො,
භබ්බො සො තාදිසො භික්ඛු ඵුට්ඨුං සම්බොධිමුත්තමන්ති.

## 4. 1. 2. 2.

## [ සීලසුත්තං ]

**12. සම්පන්නසීලා භික්ඛවෙ විහරථ සම්පන්නපාතිමොක්ඛා, පාතිමොක්ඛසංවරසංවුතා විහරථ ආචාරගොචරසම්පන්නා අණුමත්තෙසු වජ්ජෙසු භයදස්සාවිනො. සමාදාය සික්ඛථ සික්ඛාපදෙසු. සම්පන්නසීලානං චො භික්ඛවෙ විහරතං සම්පන්නපාතිමොක්ඛානං පාතිමොක්ඛසංවරසංවුතානං විහරතං ආචාරගොචරසම්පන්නානං අණුමත්තෙසු වජ්ජෙසු භයදස්සාවීනං සමාදාය සික්ඛතං සික්ඛාපදෙසු, කිමස්ස උත්තරිං කරණීයං?**

චරතො චෙපි භික්ඛවෙ භික්ඛුනො අභිජ්ඣා ව්‍යාපාදො විගතො හොති. ථිනමිද්ධං උද්ධච්චකුක්කුච්චං විචිකිච්ඡා පහීණා හොති. ආරද්ධං හොති විරියං අසල්ලීනං. උපට්ඨිතා සති අපම්මුට්ඨා. පස්සද්ධො කායො අසාරද්ධො. සමාහිතං චිත්තං එකග්ගං. චරම්පි භික්ඛවෙ භික්ඛු එවම්භූතො ආතාපී ඔත්තාපී සතතං සමිතං ආරද්ධවිරියො පහිතත්තො'ති වුච්චති.

ඨිතස්ස චෙපි භික්ඛවෙ භික්ඛුනො අභිජ්ඣා ව්‍යාපාදො විගතො හොති. ථිනමිද්ධං උද්ධච්චකුක්කුච්චං විචිකිච්ඡා පහීණා හොති. ආරද්ධං හොති විරියං අසල්ලීනං. උපට්ඨිතා සති අපම්මුට්ඨා. පස්සද්ධො කායො අසාරද්ධො. සමාහිතං චිත්තං එකග්ගං. ඨිතොපි භික්ඛවෙ භික්ඛු එවම්භූතො ආතාපී ඔත්තාපී සතතං සමිතං ආරද්ධවිරියො පහිතත්තො'ති වුච්චති.

මහණෙනි, නිදිවරණ හෝනා වූත් මහණහට කාමවිතර්කයෙක් හෝ ව්‍යාපාද විතර්කයෙක් හෝ විහිංසා විතර්කයෙක් හෝ උපදනේ ය. මහණ තෙමේ ඒ විතර්කය ද සිත්හි තගා නො වසවයි, හරියි. තෙරයි. විගතාභාව කෙරෙයි. අභාවයට පමුණුවයි. මහණෙනි, වීර්‍ය්‍ය ඇති උපවාදයට භය ඇති හැමදා නරතුරු පටන් ගත් වීර්‍ය්‍ය ඇති මෙබඳු වූ හෝනාවූත් නිදිවරණ මහණ "සමථ විදර්ශනා දෙක්හි මෙහෙයූ සිත් ඇත්තෝ"යි කියනු ලැබේ.

28. යම් මහණෙක් ඇවිදුතෝ හෝ වැලිත් සිටුතෝ හෝ හුන්තේ හෝ නොහොත් හෝනේ හෝ කෙලෙසනිඃශ්‍රිත ලාමක වීතර්ක විතර්කනය කෙරේ ද,

29. උත්මාර්ගයට වැදුනු මෝහජනක අරමුණෙහි මූසපත් එබඳු ඒ මහණ උතුම් අභිඥත්තවඥනය පහන්නට අභව්‍යය.

30. යම් මහණෙක් ඇවිදුතෝ හෝ සිටුතෝ හෝ නොහොත් හුන්තේ හෝ හෝනේ හෝ විතර්කව්‍යුපශමයෙහි ඇලුනේ කාමාදි විතර්ක ශමනය කොට වෙයේ ද, එබඳු ඒ මහණ උතුම් අභිඥත්තවඥනය පහන්නට භව්‍ය ය.

## 4. 1. 2. 2

## [ ශීලසූත්‍රය ]

12. මහණෙනි, පරිපූර්ණ සිල් ඇති ව පිරිපුන් පාමොක් ඇති ව වසව. ප්‍රාතිමොක්ෂසංවර ශීලයෙන් යුක්ත ව ආචාර ගොචර දෙකින් යුක්ත ව වසව. අණුප්‍රමාණ වූ ද දෝෂයෙහි බිය විසින් දක්නා සුලු ව සික පෙදෙහි සමාදන කොට ගෙණ හික්මෙව. මහණෙනි, පරිපූර්ණ සිල් ඇති ව පිරිපුන් පාමොක් ඇති ව ප්‍රාතිමොක්ෂසංවර ශීලයෙන් යුක්තව ආචාර ගොචර දෙකින් යුක්ත ව අණුප්‍රමාණ වරදෙහි බිය දක්නා සුලු ව සික පෙදෙහි සමාදන කොට ගෙණ හික්මීම් කරමින් වසන තොප විසින් මතුයෙහි කරණී කිමය යත්:

මහණෙනි, ඇවිදුනා වූ ද මහණහට අභිධ්‍යා ව්‍යාපාද විගත වේ ද, ථින මිද්ධ, උද්ධච්චකුක්කුච්ච, විචිකිච්ඡා ප්‍රහීණ වේ ද, රැකුළු වැර අසංලීන වේ ද, සමෘතිය එළඹ සිටියා මූෂිත නො වූවා වේ ද, කය සංහිඳුනේ දරථ නැත්තේ වේ ද, සිත මොනොවට පිහිටුවන ලද්දේ එකඟ වූයේ වේ ද, මහණෙනි, කෙලෙස් තවන වැර ඇති, උපවාද භය ඇති, හැමදා නරතුරු පටන්ගත් වීර්‍ය්‍ය ඇති මෙබඳු වූ ඇවිදුනා වූත් ඒ මහණ "සමථ විදර්ශනා දෙක්හි මෙහෙයූ සිතැත්තේ" යි කියනු ලැබේ.

මහණෙනි, සිටුනා වූ ද මහණහට අභිධ්‍යා ව්‍යාපාද විගත වේ ද, ථින-මිද්ධ උද්ධච්චකුක්කුච්ච විචිකිච්ඡා ප්‍රහීණ වේ ද, ආරබ්ධවීර්‍ය්‍ය අසංලීන වේ ද, සමෘතිය එළඹ සිටියා මූෂිත නොවූවා වේ ද, කය සංහිඳුනේ දරථ නැත්තේ වේ ද, සිත මොනොවට පිහිටුවන ලද්දේ එකඟ වූයේ වේ ද, මහණෙනි, කෙලෙස් තවන වැර ඇති උපවාද භය ඇති හැමදා නරතුරු පටන් ගත් වීර්‍ය්‍ය ඇති මෙබඳු වූ සිටුනා වූත් ඒ මහණ "සමථ විදර්ශනා දෙක්හි මෙහෙයූ සිතැත්තේ" යි කියනු ලැබේ.

නිසින්නස්ස චෙපි භික්ඛවෙ භික්ඛුනො අභිජ්ඣා ව්‍යාපාදෙ විගතො හොති. ථීනමිද්ධං උද්ධච්චකුක්කුච්චං විචිකිච්ඡා පහීණා හොති. ආරද්ධං හොති විරියං අසල්ලීනං. උපට්ඨිතා සති අපම්මුට්ඨා.[1] පස්සද්ධො කායො අසාරද්ධො. සමාහිතං චිත්තං එකග්ගං. නිසින්නොපි භික්ඛවෙ භික්ඛු එවම්භූතො ආතාපී ඔත්තාපී සතතං සමිතං ආරද්ධවිරියො පහිතත්තො'ති වුච්චති.

සයානස්ස චෙපි භික්ඛවෙ භික්ඛුනො ජාගරස්ස අභිජ්ඣා ව්‍යාපාදෙ විගතො හොති. ථීනමිද්ධං උද්ධච්චකුක්කුච්චං විචිකිච්ඡා පහීණා හොති. ආරද්ධං හොති විරියං අසල්ලීනං. උපට්ඨිතා සති අපම්මුට්ඨා. පස්සද්ධො කායො අසාරද්ධො. සමාහිතං චිත්තං එකග්ගං. සයානොපි භික්ඛවෙ භික්ඛු ජාගරො එවම්භූතො ආතාපී ඔත්තාපී සතතං සමිතං ආරද්ධවිරියො පහිතත්තො'ති වුච්චතීති.

31. යතං චරෙ යතං තිට්ඨෙ යතං අච්ඡෙ යතං සයෙ,
යතං සම්මිඤ්ජයෙ භික්ඛු යතමෙව තං පසාරයෙ.

32. උද්ධං තිරියං අපාචීනං යාවතා ජගතො ගති,
සමවෙක්ඛිතා ච ධම්මානං ඛන්ධානං උදයබ්බයං.

33. චෙතොසමථසාමීචිං සික්ඛමානං සදා සතං,
සතතං පහිතත්තො'ති ආහු භික්ඛුං තථාවිධන්ති.

## 4. 1. 2. 3.

## [ පධානසුත්තං ]

13. චත්තාරිමානි භික්ඛවෙ සම්මප්පධානානි. කතමානි චත්තාරි?

ඉධ භික්ඛවෙ භික්ඛු අනුප්පන්නානං පාපකානං අකුසලානං ධම්මානං අනුප්පාදාය ඡන්දං ජනෙති, වායමති, විරියං ආරභති, චිත්තං පග්ගණ්හාති පදහති.

උප්පන්නානං පාපකානං අකුසලානං ධම්මානං පහානාය ඡන්දං ජනෙති, වායමති, විරියං ආරභති, චිත්තං පග්ගණ්හාති පදහති.

අනුප්පන්නානං කුසලානං ධම්මානං උප්පාදාය ඡන්දං ජනෙති, වායමති, විරියං ආරභති, චිත්තං පග්ගණ්හාති පදහති.

උප්පන්නානං කුසලානං ධම්මානං ඨිතියා අසම්මොසාය භීය්‍යොභාවාය වෙපුල්ලාය භාවනාය පාරිපූරියා ඡන්දං ජනෙති, වායමති, විරියං ආරභති, චිත්තං පග්ගණ්හාති පදහති.

ඉමානි ඛො භික්ඛවෙ චත්තාරි සම්මප්පධානානීති.

1. අසම්මුළ්හා - මජ්සං.

මහණෙනි, හුන්නාවූත් මහණහට අභිධ්‍යා ව්‍යාපාද විගත වේ ද, ථීනමිද්ධ, උද්ධච්චකුක්කුච්ච විචිකිච්ඡා ප්‍රහීණ වේ ද, වීර්‍ය්‍ය පටන්ගන්නා ලද්දේ නො හැකුළුනේ වේ ද, ස්මෘතිය එළඹ සිටියා මූෂිත නොවූවා වේ ද, කය සංසිඳුනේ දරථ නැත්තේ වේ ද, සිත මොනොවට පිහිටුවන ලද්දේ එකඟ වූයේ වේ ද, මහණෙනි, කෙලෙස් තවන වැර ඇති උපවාදභය ඇති හැමදා නරතුරු පටන්ගත් වීර්‍ය්‍ය ඇති මෙබඳු වූ හුන්නාවූත් ඒ මහණ "ශමථ-විදර්ශනා දෙක්හි මෙහෙයූ සිත් ඇත්තේ" යි කියනු ලැබේ.

මහණෙනි, හෝනාවූත් නිදිවරණ මහණහට අභිධ්‍යා ව්‍යාපාද විගත වේ ද, ථීනමිද්ධ උද්ධච්චකුක්කුච්ච විචිකිච්ඡා ප්‍රහීණ වේ ද, වීර්‍ය්‍ය පටන්ගන්නා ලද්දේ නො හැකුළුනේ වේ ද, ස්මෘතිය එළඹ සිටියා මූෂිත නොවූවා වේ ද, කය සංසිඳුනේ දරථ නැත්තේ වේ ද, සිත මොනොවට පිහිටුවන ලද්දේ එකඟවූයේ වේ ද, මහණෙනි, කෙලෙස් තවන වැර ඇති, උපවාදභය ඇති නරතුරු පටන්ගත් වීර්‍ය්‍ය ඇති මෙබඳු වූ හෝනාවූත් නිදිවරණ ඒ මහණ "ශමථවිදර්ශනා දෙක්හි මෙහෙයූ සිතැත්තේ" යි කියනු ලැබේ.

31. මහණ සංයත කොට ගෙණ හැසිරෙන්නේ ය. සංයත කොට ගෙණ සිටුනේ ය. සංයත කොට ගෙණ හිඳුනේ ය. සංයත කොට ගෙණ හෝනේ ය. සංයත කොට ගෙණ අත්පා හකුළුන්නේ ය. සංයත කොට ගෙණ ම ඒ අඟ පසඟ දිගු කරන්නේ ය.

32. (යම් මහණෙක්) උඩ මැද යට යි ලොක නිෂ්පත්තිය තෙක් (අතීතාදි භෙද භින්න) පඤ්චස්කන්ධ ධර්මයන්ගේ උදය - ව්‍යය දක්නේ වේ ද,

33. චිත්තශමථයට අනුච්ඡවික පටිපදාව පූරණ සියලු කල්හි ස්මෘතිමත් එබඳු ඒ මහණ නරතුරු ශමථ විදර්ශනා දෙක්හි මෙහෙයූ සිතැත්තෙකැ යි කියත්,

## 4. 1. 2. 8.

13. මහණෙනි, මේ සතර සම්‍යක් ප්‍රධන් වීර්‍ය්‍යයෝ ය. කවර සතර කෙනෙක යත්:

**මහණෙනි, මෙ සස්නෙහි මහණ තෙම නූපන් ලාමක අකුශල ධර්මයන්ගේ නො ඉපැද්ම පිණිස ඡන්දය උපදවයි. ව්‍යායාම කෙරෙයි. වීර්‍ය්‍යාරම්භ කෙරෙයි. සිත දැඩි කොට ගණියි. ප්‍රධන් වීර්‍ය්‍ය කෙරෙයි.**

උපන් ලාමක අකුශල ධර්මයන්ගේ ප්‍රහාණය පිණිස ඡන්දය උපදවයි. ව්‍යායාම කෙරෙයි. වීර්‍ය්‍යාරම්භ කෙරෙයි. සිත දැඩි කොට ගණියි. ප්‍රධන් වීර්‍ය්‍ය කෙරෙයි.

නූපන් කුශල ධර්මයන්ගේ ඉපැද්ම පිණිස ඡන්දය උපදවයි. ව්‍යායාම කෙරෙයි. වීර්‍ය්‍යාරම්භ කෙරෙයි. සිත දැඩි කොට ගණියි. ප්‍රධන් වීර්‍ය්‍ය කෙරෙයි.

උපන් කුශල ධර්මයන්ගේ ස්ථිතිය පිණිස අසම්මොෂය පිණිස බොහෝ බව පිණිස විපුල බව පිණිස වැඩීම පිණිස සම්පූර්ණ බව පිණිස ඡන්දය උපදවයි. ව්‍යායාම කෙරෙයි. වීර්‍ය්‍යාරම්භ කෙරෙයි. සිත දැඩි කොට ගණියි. ප්‍රධන් වීර්‍ය්‍ය කෙරෙයි.

මහණෙනි, මේ සතර සම්‍යක් ප්‍රධන් වීර්‍ය්‍යයෝ යි.

34. සම්මප්පධානා මාරධෙය්‍යාභිභූතා[1]
තෙ අසිතා ජාතිමරණභයස්ස පාරගූ,
තෙ තුසිතා ජෙත්වාන මාරං සවාහිනිං[2]
තෙ අනෙජා (සබ්බං) නමුචිබලං උපාතිවත්තා තෙ සුඛිතාති.

## 4. 1. 2. 4.

## [ සංවරප්පධානසුත්තං ]

14. චත්තාරිමානි භික්ඛවෙ පධානානි, කතමානි චත්තාරි? සංවරප්පධානං පහාණප්පධානං, භාවනාප්පධානං, අනුරක්ඛණප්පධානං.

කතමඤ්ච භික්ඛවෙ සංවරප්පධානං? ඉධ භික්ඛවෙ භික්ඛු චක්ඛුනා රූපං දිස්වා න නිමිත්තග්ගාහී හොති නානුබ්‍යඤ්ජනග්ගාහී, යත්වාධිකරණමෙනං චක්ඛුන්ද්‍රියං අසංවුතං විහරන්තං අභිජ්ඣා දොමනස්සා පාපකා අකුසලා ධම්මා අන්වාස්සවෙය්‍යුං, තස්ස සංවරාය පටිපජ්ජති, රක්ඛති චක්ඛුන්ද්‍රියං, චක්ඛුන්ද්‍රියෙ සංවරං ආපජ්ජති. සොතෙන සද්දං සුත්වා - ඝාණෙන ගන්ධං ඝායිත්වා - ජිව්හාය රසං සායිත්වා - කායෙන ඵොට්ඨබ්බං ඵුසිත්වා - මනසා ධම්මං විඤ්ඤාය න නිමිත්තග්ගාහී හොති නානුබ්‍යඤ්ජනග්ගාහී, යත්වාධිකරණමෙනං මනින්ද්‍රියං අසංවුතං විහරන්තං අභිජ්ඣා දොමනස්සා පාපකා අකුසලා ධම්මා අන්වාස්සවෙය්‍යුං, තස්ස සංවරාය පටිපජ්ජති, රක්ඛති මනින්ද්‍රියං, මනින්ද්‍රියෙ සංවරං ආපජ්ජති. ඉදං වුච්චති භික්ඛවෙ සංවරප්පධානං.

කතමඤ්ච භික්ඛවෙ පහාණප්පධානං? ඉධ භික්ඛවෙ භික්ඛු උප්පන්නං කාමවිතක්කං නාධිවාසෙති, පජහති, විනොදෙති, ව්‍යන්තීකරොති, අනභාවං ගමෙති. උප්පන්නං ව්‍යාපාදවිතක්කං -පෙ- උප්පන්නං විහිංසාවිතක්කං — උප්පන්නුප්පන්නෙ පාපකෙ අකුසලෙ ධම්මෙ නාධිවාසෙති, පජහති, විනොදෙති, බ්‍යන්තීකරොති අනභාවං ගමෙති. ඉදං වුච්චති භික්ඛවෙ පහාණප්පධානං:

1. මාරධෙය්‍යාභිභූතං -- මජසං.
2 සවාහනං - මජසං.

35. සම්‍යක්ප්‍රධන්වීර්යයයි ඇති සසරවට නැමැති මාරධෙය්‍යය මැඩ ගෙණ සිටුනා ඒ රහත්හු අනිඃශ්‍රිතයහ ජාතිමරණ සඞ්ඛ්‍යාත භීතියගේ කෙළ පැමිණියාහු ය. ඒ රහත්හු තුෂ්ටයහ. සෙනා සහිත මරහු දිනා සිටියහ. ඒ රහත්හු තෘෂ්ණා නැතියහ. මුළු මරබල විධමා සිටියහ. (එසින් ම) ඒ රහත්හු සුඛිතයෝ යි.

## 4. 1. 2. 4.

## [ සංවරප්පධාන සූත්‍රය ]

14. මහණෙනි, මේ සතර ප්‍රධන්වීර්යයයි කෙනෙකි. කවර සතර කෙනෙක යත්:

සංවරප්පධානය, පහාණප්පධානය, භාවනාප්පධානය, අනුරක්ඛණප්පධාන යි.

මහණෙනි, සංවරප්පධාන කවරේ ය? මහණෙනි, මෙසස්නෙහි මහණ යමක් හෙතු කොට ගෙණ චක්ෂුරින්ද්‍රිය අසංවෘත කොට විහරණය කරණ තෙල මහණහු අභිධ්‍යා දෞර්මනස්‍ය සඞ්ඛ්‍යාත ලාමක අකුශල ධර්මයෝ ලුහුබඳනාහු ද, ඇසින් එබඳු රූපයක් දැක නිමිත්තග්‍රාහී නො වේ. අනුව්‍යඤ්ජනග්‍රාහී නො ද වේ. ඒ චක්ෂුරින්ද්‍රියසංවරය පිණිස පිළිපදනේ ය. චක්ෂුරින්ද්‍රිය රක්නේ ය. චක්ෂුරින්ද්‍රිය විෂයෙහි සංවරයට පැමිණේ.

ශ්‍රොත්‍රයෙන් ශබ්දය අසා ... ඝ්‍රාණයෙන් ගන්ධය අසා ... දිවින් රස විඳ ... කයින් ස්පර්ශය පැහැස ... යමක් හෙතු කොට ගෙණ මනින්ද්‍රිය අසංවෘත කොට ගෙණ වසන තෙල මහණහු අභිධ්‍යා දෞර්මනස්‍ය සඞ්ඛ්‍යාත ලාමක අකුශල ධර්මයෝ ලුහුබඳනාහු ද, සිතින් එබඳු ධර්මාලම්බනයක් දැන නිමිත්තග්‍රාහී නො වේ. අනුව්‍යඤ්ජනග්‍රාහී නො ද වේ. ඒ මනින්ද්‍රියසංවරය පිණිස පිළිපදනේ ය. මනින්ද්‍රිය රක්නේ ය. මනින්ද්‍රිය විෂයෙහි සංවරයට පැමිණේ. මහණෙනි, මේ 'සංවරප්පධාන' යි කියනු ලැබේ

මහණෙනි, පහාණප්පධාන කවරේ ය? මහණෙනි, මෙසස්නෙහි මහණ උපන් කාමවිතර්කය නො ඉවසයි. හරියි. නෙරයි. විගතාන්ත කෙරෙයි. අභාවයට පමුණුවයි. උපන් ව්‍යාපාදවිතර්කය ... උපන් විහිංසාවිතර්කය ... උපනුපන් ලාමක අකුශලධර්මයන් නො ඉවසයි. හරියි. නෙරයි. විගතාන්ත කෙරෙයි. අභාවයට පමුණුවයි. මහණෙනි, මේ 'පහාණප්පධාන' යි කියනු ලැබේ.

කතමඤ්ච භික්ඛවෙ භාවනාප්පධානං? ඉධ භික්ඛවෙ භික්ඛු සති-සම්බොජ්ඣඞ්ගං භාවෙති විවෙකනිස්සිතං විරාගනිස්සිතං නිරොධනිස්සිතං වොස්සග්ගපරිණාමිං. ධම්මවිචයසම්බොජ්ඣඞ්ගං භාවෙති -පෙ- විරිය-සම්බොජ්ඣඞ්ගං භාවෙති-පීතිසම්බොජ්ඣඞ්ගං භාවෙති - පස්සද්ධිසම්බොජ්ඣඞ්ගං භාවෙති - සමාධිසම්බොජ්ඣඞ්ගං භාවෙති-උපෙක්ඛාසම්බොජ්ඣඞ්ගං භාවෙති විවෙකනිස්සිතං විරාගනිස්සිතං නිරොධනිස්සිතං වොස්සග්ගපරිණාමිං. ඉදං වුච්චති භික්ඛවෙ භාවනාප්පධානං.

කතමඤ්ච භික්ඛවෙ අනුරක්ඛණප්පධානං? ඉධ භික්ඛවෙ භික්ඛු උප්පන්නං භද්දකං සමාධිනිමිත්තං අනුරක්ඛති අට්ඨිකසඤ්ඤං පුලවකසඤ්ඤං විනීලකසඤ්ඤං විපුබ්බකසඤ්ඤං විච්ඡිද්දකසඤ්ඤං උද්ධුමාතකසඤ්ඤං. ඉදං වුච්චති භික්ඛවෙ අනුරක්ඛණප්පධානං.

ඉමානි ඛො භික්ඛවෙ චත්තාරි පධානානීති.

36. සංවරො ච පහානඤ්ච භාවනා අනුරක්ඛණා,
එතෙ පධානා චත්තාරො දෙසිතාදිච්චබන්ධුනා,
යෙහි භික්ඛු ඉධාතාපී ඛයං දුක්ඛස්ස පාපුණෙ'ති.

### 4. 1. 2. 5

### [ අග්ගපඤ්ඤත්තිසුත්තං ]

15. චතස්සො ඉමා භික්ඛවෙ අග්ගපඤ්ඤත්තියො. කතමා චතස්සො?

එතදග්ගං භික්ඛවෙ අත්තභාවීනං යදිදං රාහු අසුරින්දො.

එතදග්ගං භික්ඛවෙ කාමභොගීනං යදිදං රාජා මන්ධාතා.

එතදග්ගං භික්ඛවෙ ආධිපතෙය්‍යානං යදිදං මාරො පාපිමා.

සදෙවකෙ භික්ඛවෙ ලොකෙ සමාරකෙ සබ්‍රහ්මකෙ සස්සමණබ්‍රාහ්මණියා පජාය සදෙවමනුස්සාය තථාගතො අග්ගමක්ඛායති අරහං සම්මාසම්බුද්ධො.

ඉමා ඛො භික්ඛවෙ චතස්සො අග්ගපඤ්ඤත්තියො'ති.

37 රාහග්ගං[1] අත්තභාවීනං මන්ධාතා කාමභොගිනං,
මාරො ආධිපතෙය්‍යානං ඉද්ධියා යසසා ජලං.

38. උද්ධං තිරියං අපාචීනං යාවතා ජගතො ගති,
සදෙවකස්ස ලොකස්ස බුද්ධො අග්ගං පවුච්චතී'ති.

1. රාහුග්ගං - මජසං.

මහණෙනි, භාවනාප්පධාන කවරේ ය? මහණෙනි, මේ සස්නෙහි මහණ (අධිගන්තව්‍යවශයෙන්) විවේකනිඃශ්‍රිත කොට විරාගනිඃශ්‍රිත කොට නිරෝධනිඃශ්‍රිත කොට (ක්ලේශපරිත්‍යාගය හා නිර්වාණප්‍රස්කන්දනය යි කියන ලද) වොස්සග්ගයට පරිණාමශීල කොට ස්මෘතිසම්බෝධ්‍යඞ්ගය වඩයි. ... ධර්මවිචය-සම්බෝධ්‍යඞ්ගය වඩයි ... වීර්‍යසම්බෝධ්‍යඞ්ගය වඩයි ... ප්‍රීතිසම්බෝධ්‍යඞ්ගය වඩයි ... ප්‍රශ්‍රබ්ධිසම්බෝධ්‍යඞ්ගය වඩයි ... සමාධිසම්බෝධ්‍යඞ්ගය වඩයි ... විවේක-නිඃශ්‍රිත කොට විරාගනිඃශ්‍රිත කොට නිරෝධනිඃශ්‍රිත කොට වොස්සග්ගයට පරිණාමශීල කොට උපෙක්ෂාසම්බෝධ්‍යඞ්ගය වඩයි. මහණෙනි, මේ 'භාවනාප්පධාන' යි කියනු ලැබේ.

මහණෙනි, අනුරක්ඛණාප්පධාන කවරේ ය? මහණෙනි, මේ සස්නෙහි මහණ උපන් කල්‍යාණ වූ සමාධිනිමිත්තක රක්නේ ය. අට්ඨිකසඤ්ඤය, පුළවකසඤ්ඤය, විනීලකසඤ්ඤය, විපුබ්බකසඤ්ඤය, විච්ඡිද්දකසඤ්ඤය, උද්ධුමාතකසඤ්ඤය යන මේ ය. මහණෙනි, මේ 'අනුරක්ඛණප්පධාන' යි කියනු ලැබේ.

මහණෙනි, මේ සතර ප්‍රධන් වීර්‍යයෝ ය.

36. මේසස්නෙහි කෙලෙස් තවන වීර්‍යය ඇති මහණ යම් වීර්‍ය කෙනකුත් කරණ කොට ගෙණ දුඃඛක්ෂය සඞ්ඛ්‍යාත අර්හත්වයට පැමිණේ ද, එබඳු වූ සංවරය, ප්‍රහාණය, භාවනාය, අනුරක්ෂණය යන මේ සතර ප්‍රධන් වීර්‍යයෝ ආදිච්චබන්ධු වූ බුදුරජානන් වහන්සේ විසින් දෙසන ලදහ.

4. 1. 2. 6.

[ අග්ගපඤ්ඤත්ති සූත්‍රය ]

15. මහණෙනි, මේ අග්‍රප්‍රඥප්තීහු සතර දෙනෙකි. කවර සතර දෙනෙක යත්:

මහණෙනි, ආත්මභාවීන් අතුරෙන් යම් මේ රාහු අසුරේන්ද්‍රයෙක් වේ ද, මෙ තෙම අග්‍රය.

මහණෙනි, කාමභෝගීන් අතුරෙන් යම් මේ මාන්ධාතෘ නම් රජෙක් වේ ද, මෙ තෙම අග්‍රය.

මහණෙනි, ආධිපත්‍යය කරන්නවුන් අතුරෙන් යම් මේ පාපී මාරයෙක් වේ ද, මෙ තෙම අග්‍ර ය.

මහණෙනි, මරුන් සහිත බඹුන් සහිත දෙවියන් සහිත ලොකයෙහි ශ්‍රමණ බ්‍රාහ්මණයන් සහිත දෙවිමිනිසුන් සහිත සත්ත්වාබ්‍ය ප්‍රජාවෙහි අර්හත් වූ සම්‍යක් සම්බුද්ධ වූ තථාගතයන් වහන්සේ අග්‍රයහ යි කියනු ලැබේ.

මහණෙනි, මේ සතර අග්‍රප්‍රඥප්තීහු යි.

37. ආත්මභාවීන් අතුරෙන් රාහු අසුරිඳු අග්‍ර වේ. කාමභෝගීන් අතුරෙන් මාන්ධාතෘ සක්විති රජ අග්‍ර වේ. ආධිපත්‍යය කරන්නවුන්, දිව්‍ය-සම්පත්හි සමෘද්ධියෙනුදු පරිවාර සඞ්ඛ්‍යාත යශසිනුදු බබලනුවුන් අතුරෙන් මරදෙව්පුත් අග්‍ර වේ.

38. උඩය මැදය යටය යන ලොකනිශ්පත්තිය හෙවත් දෙවියන් සහිත ලොකයාට බුදුරජානන් වහන්සේ අග්‍රයහ යි කියනු ලැබේ.

## 4. 1. 2. 6

### [ සොඛුම්මසුත්තං ]

16. චත්තාරිමානි භික්ඛවෙ සොඛුම්මානි. කතමානි චත්තාරි?

ඉධ භික්ඛවෙ භික්ඛු රූපසොඛුම්මෙන සමන්නාගතො හොති පරමෙන, තෙන ච රූපසොඛුම්මෙන අඤ්ඤං රූපසොඛුම්මං උත්තරිතරං වා පණීතතරං වා න සමනුපස්සති. තෙන ච රූපසොඛුම්මෙන අඤ්ඤං රූපසොඛුම්මං උත්තරිතරං වා පණීතතරං වා න පත්ථෙති.

වෙදනාසොඛුම්මෙන සමන්නාගතො හොති පරමෙන. තෙන ච වෙදනාසොඛුම්මෙන අඤ්ඤං වෙදනාසොඛුම්මං උත්තරිතරං වා පණීතතරං වා න සමනුපස්සති. තෙන ච වෙදනාසොඛුම්මෙන අඤ්ඤං වෙදනාසොඛුම්මං උත්තරිතරං වා පණීතතරං වා න පත්ථෙති.

සඤ්ඤාසොඛුම්මෙන සමන්නාගතො හොති පරමෙන. තෙන ච සඤ්ඤාසොඛුම්මෙන අඤ්ඤං සඤ්ඤාසොඛුම්මං උත්තරිතරං වා පණීතතරං වා න සමනුපස්සති. තෙන ච සඤ්ඤාසොඛුම්මෙන අඤ්ඤං සඤ්ඤාසොඛුම්මං උත්තරිතරං වා පණීතතරං වා න පත්ථෙති.

සඞ්ඛාරසොඛුම්මෙන සමන්නාගතො හොති පරමෙන. තෙන ච සඞ්ඛාරසොඛුම්මෙන අඤ්ඤං සඞ්ඛාරසොඛුම්මං උත්තරිතරං වා පණීතතරං වා න සමනුපස්සති. තෙන ච සඞ්ඛාරසොඛුම්මෙන අඤ්ඤං සඞ්ඛාරසොඛුම්මං උත්තරිතරං වා පණීතතරං වා න පත්ථෙති.

ඉමානි ඛො භික්ඛවෙ චත්තාරි සොඛුම්මානීති.

39. රූපසොඛුම්මතං ඤත්වා වෙදනානඤ්ච සම්භවං,
සඤ්ඤා යතො සමුදෙති අත්ථං ගච්ඡති යත්ථ ච.

40. සඞ්ඛාරෙ පරතො ඤත්වා දුක්ඛතො නො ච අත්තතො,
ස වෙ සම්මද්දසො භික්ඛු සන්තො සන්තිපදෙ රතො,
ධාරෙති අන්තිමං දෙහං ජෙත්වා මාරං සවාහිනින්ති.

## 4. 1. 2. 7

### [ අගතිසුත්තං ]

17. චත්තාරිමානි භික්ඛවෙ අගතිගමනානි. කතමානි චත්තාරි?

ඡන්දාගතිං ගච්ඡති. දොසාගතිං ගච්ඡති. මොහාගතිං ගච්ඡති. භයාගතිං ගච්ඡති.

ඉමානි ඛො භික්ඛවෙ චත්තාරි අගතිගමනානීති.

41. ඡන්දා දොසා භයා මොහා යො ධම්මං අතිවත්තති,
නිහීයති තස්ස යසො කාළපක්ඛෙව චන්දිමා'ති.

## 4 1. 2 6.

### [ සොඛුම්ම සූත්‍රය ]

16. මහණෙනි, මේ සූක්ෂ්මලක්ෂණප්‍රතිවේධකඥානයෝ සතර දෙනෙකි. කවර සතර දෙනෙක යත්:

මහණෙනි, මෙ සස්නෙහි මහණ රූපයෙහි උතුම් සූක්ෂ්මලක්ෂණ-පරිග්‍රාහකඥානයෙන් සමන්වාගත වෙයි. ඒ රූපසූක්ෂ්මභාවඥානයෙන් උත්තරිතර වූ හෝ ප්‍රණීතතර වූ හෝ අනෙක් රූපසූක්ෂ්මත්වයක් නො දක්නේ ය. ඒ රූපසූක්ෂ්මභාවඥානයෙන් උත්තරිතර වූ හෝ ප්‍රණීතතර වූ හෝ අන් රූපසූක්ෂ්මත්වයක් නො පතයි.

වේදනායෙහි උතුම් සූක්ෂ්මලක්ෂණප්‍රතිවේධකඥානයෙන් සමන්වාගත වෙයි. ඒ වේදනායෙහි සූක්ෂ්මලක්ෂණපරිග්‍රාහකඥානයෙනුදු උත්තරිතර වූ හෝ ප්‍රණීතතර වූ හෝ අනෙක් වේදනාසූක්ෂ්මභාවයක් නො දක්නේ ය ඒ වේදනාසූක්ෂ්මභාවඥානයෙන් උත්තරිතර වූ හෝ ප්‍රණීතතර වූ හෝ අනෙක් වේදනාසූක්ෂ්මභාවයක් නො පතයි.

සංඥායෙහි උතුම් සූක්ෂ්මලක්ෂණප්‍රතිවේධකඥානයෙන් සමන්වාගත වෙයි. ඒ සංඥායෙහි සූක්ෂ්මලක්ෂණපරිග්‍රාහකඥානයෙනුදු උත්තරිතර වූ හෝ ප්‍රණීතතර වූ හෝ අනෙක් සංඥාසූක්ෂ්මභාවයක් නො දක්නේ ය. ඒ සංඥාසූක්ෂ්මභාවඥානයෙනුදු උත්තරිතර වූ හෝ ප්‍රණීතතර වූ හෝ අනෙක් සංඥාසූක්ෂ්මභාවයක් නො පතයි.

සංස්කාරයෙහි උතුම් සූක්ෂ්මලක්ෂණප්‍රතිවේධකඥානයෙන් සමන්වාගත වෙයි ඒ සංස්කාරයෙහි සූක්ෂ්මලක්ෂණපරිග්‍රාහකඥානයෙනුදු උත්තරිතර වූ හෝ ප්‍රණීතතර වූ හෝ අනෙක් සංස්කාරසූක්ෂ්මභාවයක් නො දක්නේ ය. ඒ සංස්කාරසූක්ෂ්මභාවඥානයෙනුදු උත්තරිතර වූ හෝ ප්‍රණීතතර වූ හෝ අනෙක් සංස්කාරසූක්ෂ්මභාවයක් නො පතයි.

**මහණෙනි, මේ සතර සූක්ෂ්මලක්ෂණප්‍රතිවේධකඥානයෝ ය.**

39. රූපස්කන්ධයාගේ සූක්ෂ්මභාවය දැන, වේදනාවන්ගේ ප්‍රභවය ද දැන, යම් කරුණින් සංඥාස්කන්ධය උදය වේ ද එ ද දැන, යම් තැනෙක සංඥාස්කන්ධය නිරුද්ධ වේ ද එ ද දැන,

40. සංස්කාරයන් අනිත්‍යතායෙන් පරවශයෙන් දැන, දුක් විසින් දැන, අනාත්ම විසින් දැන සිටුනා, මොනවට පස්කඳ දක්නා, සන්හුන් කෙලෙස් ඇති වන බැවින් ශාන්ත වූ, එහෙයින් ම ශාන්තපද සඞ්ඛ්‍යාත නිවණෙහි ඇලුනු, ඒ මහණ එකාන්තයෙන් සෙන් සියෝ මරදෙව්පිස් දිනා අන්තිම දෙහය දරයි.

## 4. 1. 2 7.

### [ අගති සූත්‍රය ]

17. මහණෙනි, මේ අගතියට යන කරුණු සතර දෙනෙකි. කවර සතර දෙනෙක යත්:

ඡන්දයෙන් අගතියට යෙයි. ද්වේෂයෙන් අගතියට යෙයි. මෝහයෙන් අගතියට යෙයි. බියෙන් අගතියට යෙයි.

මහණෙනි, මේ අගතිගමන කරුණු සතර දෙනය.

41 ඡන්දයෙනුදු ද්වේෂයෙනුදු භයෙනුදු මෝහයෙනුදු යමෙක් දහම පැන යේ ද ඔහුගේ යශස් පිරිහෙයි. කළුවරපස සඳු මෙනි.

## 4. 1. 2. 8

### [ නාගතිසුත්තං ]

18. චත්තාරිමානි භික්ඛවෙ නාගතිගමනානි. කතමානි චත්තාරි?

න ඡන්දාගතිං ගච්ඡති. න දොසාගතිං ගච්ඡති න මොහාගතිං ගච්ඡති. න භයාගතිං ගච්ඡති.

ඉමානි ඛො භික්ඛවෙ චත්තාරි නාගතිගමනානීති.

42. ඡන්දා දොසා භයා මොහා යො ධම්මං නාතිවත්තති,
ආපූරති තස්ස යසො සුක්කපක්ඛෙව චන්දිමා'ති.

## 4. 1. 2. 9

### [ අගතිනාගතිසුත්තං ]

19. චත්තාරිමානි භික්ඛවෙ අගතිගමනානි. කතමානි චත්තාරි?

ඡන්දාගතිං ගච්ඡති දොසාගතිං ගච්ඡති. මොහාගතිං ගච්ඡති. භයාගතිං ගච්ඡති.

ඉමානි ඛො භික්ඛවෙ චත්තාරි අගතිගමනානීති.

චත්තාරිමානි භික්ඛවෙ නාගතිගමනානි. කතමානි චත්තාරි?

න ඡන්දාගතිං ගච්ඡති. න දොසාගතිං ගච්ඡති. න මොහාගතිං ගච්ඡති. න භයාගතිං ගච්ඡති.

ඉමානි ඛො භික්ඛවෙ චත්තාරි නාගතිගමනානීති.

43. ඡන්දා දොසා භයා මොහා යො ධම්මං අතිවත්තති,
නිහීයති තස්ස යසො කාළපක්ඛෙව චන්දිමා'ති.

44. ඡන්දා දොසා භයා මොහා යො ධම්මං නාතිවත්තති,
ආපූරති තස්ස යසො සුක්කපක්ඛෙව චන්දිමා'ති.

## 4. 1. 2. 10

### [ භත්තුද්දෙසකසුත්තං ]

20. චතූහි භික්ඛවෙ ධම්මෙහි සමන්නාගතො භත්තුද්දෙසකො යථාභතං නික්ඛිත්තො එවං නිරයෙ. කතමෙහි චතූහි?

ඡන්දාගතිං ගච්ඡති. දොසාගතිං ගච්ඡති. මොහාගතිං ගච්ඡති. භයාගතිං ගච්ඡති.

ඉමෙහි ඛො භික්ඛවෙ චතූහි ධම්මෙහි සමන්නාගතො භත්තුද්දෙසකො යථාභතං නික්ඛිත්තො එවං නිරයෙ.

### 4. 1. 2. 8.

### [ නාගති සූත්‍රය ]

18. මහණෙනි, මේ සතර අගතිගමන නොවන කරුණු ය. කවර සතර කරුණුය යත්:

ඡන්දයෙන් අගතියට නො යෙයි. ද්වේෂයෙන් අගතියට නො යෙයි. මෝහයෙන් අගතියට නො යෙයි. භයෙන් අගතියට නො යෙයි.

මහණෙනි, මේ අගතිගමන නොවන සතර කරුණු යි.

42. ඡන්දයෙනුදු ද්වේෂයෙනුදු භයෙනුදු මෝහයෙනුදු යමෙක් දහම් පැන නො යේ ද, ඔහුගේ යශස් පිරේ. පුරපස සඳු මෙනි.

### 4. 1. 2. 9.

### [ අගතිනාගති සූත්‍රය ]

19. මහණෙනි, මේ සතර අගතිගමන කරුණු ය. කවර සතර කරුණුය යත්:

ඡන්දයෙන් අගතියට යෙයි. ද්වේෂයෙන් අගතියට යෙයි. මෝහයෙන් අගතියට යෙයි. භයෙන් අගතියට යෙයි.

මහණෙනි, මේ අගතිගමන වන සතර කරුණු යි.

මහණෙනි, මේ සතර අගතිගමන නොවන කරුණු ය. කවර සතර කරුණුය යත්:

ඡන්දයෙන් අගතියට නො යෙයි. ද්වේෂයෙන් අගතියට නො යෙයි. මෝහයෙන් අගතියට නො යෙයි. භයෙන් අගතියට නො යෙයි.

මහණෙනි, මේ අගතිගමන නොවන සතර කරුණු යි.

43. ඡන්දයෙනුදු ද්වේෂයෙනුදු භයෙනුදු මෝහයෙනුදු යමෙක් දහම් පැන යේ ද ඔහුගේ යශස් පිරිහෙයි. කළුවරපස සඳු මෙනි.

44. ඡන්දයෙනුදු ද්වේෂයෙනුදු භයෙනුදු මෝහයෙනුදු යමෙක් දහම් පැන නො යේ ද ඔහුගේ යශස් පිරේ. පුරපස සඳු මෙනි.

### 4. 1. 2. 10.

### [ භත්තුද්දේසක සූත්‍රය ]

20. මහණෙනි, සතර කරුණෙකින් සමන්වාගත 'භත්තුද්දේසක' මහණ යම් සේ ගෙනවුත් බහා තැබූයේ වේ ද එපරිද්දෙන් නිරයෙහි සිටුනේ ය. කවර සතර කරුණෙන යත්:

ඡන්දයෙන් අගතියට යෙයි. ද්වේෂයෙන් අගතියට යෙයි. මෝහයෙන් අගතියට යෙයි. බියෙන් අගතියට යෙයි.

මහණෙනි, මේ සතර කරුණින් සමන්වාගත භත්තුද්දේසක මහණ යම සේ ගෙනවුත් බහා තැබූයේ වේ ද එපරිද්දෙන් නිරයෙහි සිටුනේ ය

චතූහි භික්ඛවෙ ධම්මෙහි සමන්නාගතො භත්තුද්දෙසකො යථාභතං නික්ඛිත්තො එවං සග්ගෙ. කතමෙහි චතූහි?

න ඡන්දාගතිං ගච්ඡති න දොසාගතිං ගච්ඡති. න මොහාගතිං ගච්ඡති න භයාගතිං ගච්ඡති

ඉමෙහි ඛො භික්ඛවෙ චතූහි ධම්මෙහි සමන්නාගතො භත්තුද්දෙසකො යථාභතං නික්ඛිත්තො එවං සග්ගෙති.

45. යෙ කෙචි කාමෙසු අසඤ්ඤතා ජනා
අධම්මිකා හොන්ති අධම්මගාරවා,
ඡන්දා ච දොසා ච භයා ච ගාමිනො[1]
පරිසක්කසාවො[2] ච පනෙස වුච්චති.
එවං හි වුත්තං සමණෙන ජානතා

46. තස්මා හි තෙ සප්පුරිසා පසංසියා,
ධම්මෙ ඨිතා යෙ න කරොන්ති පාපකං,
න ඡන්දදොසා න භයා ච ගාමිනො,
පරිසාය මණ්ඩො ච පනෙස වුච්චති.
එවං හි වුත්තං සමණෙන ජානතා'ති.

වග්ගො දුතියො.

**තස්සුද්දානං:**

වරං සීලං පධානානි සංවර පඤ්ඤත්ති පඤ්චමං,
සොඛුම්මං තයො අගති භත්තුද්දෙසෙන තෙ දසාති.

1 [illegible] ච භයා, ගාමිනො - සී. මු. 2. පරිසා කසටො - මජසං

මහණෙනි, සතර කරුණෙකින් සමන්‍විගත 'භත්තුද්දෙසක' මහණ යම්සේ ගෙනවුත් බහා තැබූයේ වේ ද එපරිද්දෙන් ස්වර්ගයෙහි සිටුනේ ය. කවර සතර කරුණෙක යත්:

ඡන්දයෙන් අගතියට නො යෙයි. ද්වෙෂයෙන් අගතියට නො යෙයි. මොහයෙන් අගතියට නො යෙයි. බියෙන් අගතියට නො යෙයි

මහණෙනි, මේ සතර කරුණින් සමන්‍විගත 'භත්තුද්දෙසක' මහණ යම්සේ ගෙනවුත් බහා තැබූයේ වේ ද එපරිද්දෙන් ස්වර්ගයෙහි සිටුනේ ය.

**45. කාමයෙහි අසංයත වූ යම් කිසි ජන කෙනෙක් අධාර්මික වෙත් ද ධර්මගෞරව රහිත වෙත් ද ඡන්දයෙනුදු ද්වෙෂයෙනුදු භයෙනුදු අගතිගාමීහු වෙත් ද (මෙ බඳු ජනයන් ඇති පිරිසෙහි) මේ භත්තුද්දෙසක තෙමේ 'පිරිස්කසළය' යි කියනු ලැබේ. සියල්ල දන්නා වූ බුද්ධශ්‍රමණයන් වහන්සේ විසින් මෙසේ වදාරණ ලදී.**

46. යම් ජන කෙනෙක් ධර්මයෙහි සිටියාහු පව් නො කෙරෙද්ද, ඡන්දයෙන් හා ද්වෙෂයෙන් අගතිගාමී නො වෙද්ද, බියෙනුදු අගතිගාමීහු නොවෙත් ද, එහෙයින් ඒ සත්පුරුෂයෝ පැසසිය යුත්තාහ. (මෙබඳු ජනයන් ඇති) පිරිසෙහි මේ භත්තුද්දෙසක තෙමේ 'මණ්ඩන' යි කියනු ලැබේ. සියල්ල දන්නා වූ බුද්ධශ්‍රමණයන් වහන්සේ විසින් මෙසේ වදාරණ ලදී.

**චරවර්ග දෙවැනි යි.**

එහි උද්දානය:

චර, සීල, පධාන, සංවර, පස් වැනි පඤ්ඤත්ති, සොබ්මම, අගති (සූත්‍ර) තුනය, භත්තුද්දෙස යනු හා ඒ සූත්‍ර දසයෙකි.

---

# 3. උරුවෙලවග්ගො

## 4. 1. 3. 1.

## [ පඨම උරුවෙලසුත්තං ]

21 [එවං මෙ සුතං:] එකං සමයං භගවා **සාවත්ථියං** විහරති ජෙතවනෙ අනාථපිණ්ඩිකස්ස ආරාමෙ. තත්‍ර ඛො භගවා භික්ඛූ ආමන්තෙසි භික්ඛවො'ති. භදන්තෙති තෙ භික්ඛූ භගවතො පච්චස්සොසුං. භගවා එතදවොච:

එකමිදාහං භික්ඛවෙ සමයං **උරුවෙලායං** විහරාමි නජ්ජා **නෙරඤ්ජරාය** තීරෙ **අජපාලනිග්‍රොධෙ** පඨමාභිසම්බුද්ධො.

තස්ස මය්හං භික්ඛවෙ රහොගතස්ස පටිසල්ලීනස්ස එවං චෙතසො පරිවිතක්කො උදපාදි: දුක්ඛං ඛො අගාරවො විහරති අප්පතිස්සො. කන්නු ඛො අහං සමණං වා බ්‍රාහ්මණං වා සක්කත්වා ගරුකත්වා උපනිස්සාය විහරෙය්‍යන්ති. තස්ස මය්හං භික්ඛවෙ එතදහොසි:

අපරිපූරස්ස ඛො අහං සීලක්ඛන්ධස්ස පාරිපූරියා අඤ්ඤං සමණං වා බ්‍රාහ්මණං වා සක්කත්වා ගරුකත්වා උපනිස්සාය විහරෙය්‍යං, න ඛො පනාහං පස්සාමි සදෙවකෙ ලොකෙ සමාරකෙ සබ්‍රහ්මකෙ සස්සමණබ්‍රාහ්මණියා පජාය සදෙවමනුස්සාය අඤ්ඤං සමණං වා බ්‍රාහ්මණං වා අත්තනා සීලසම්පන්නතරං යමහං සක්කත්වා ගරුකත්වා උපනිස්සාය විහරෙය්‍යං.

අපරිපූරස්ස ඛො අහං සමාධික්ඛන්ධස්ස පාරිපූරියා අඤ්ඤං සමණං වා බ්‍රාහ්මණං වා සක්කත්වා ගරුකත්වා උපනිස්සාය විහරෙය්‍යං, න ඛො පනාහං පස්සාමි සදෙවකෙ ලොකෙ සමාරකෙ සබ්‍රහ්මකෙ සස්සමණ බ්‍රාහ්මණියා පජාය සදෙවමනුස්සාය අඤ්ඤං සමණං වා බ්‍රාහ්මණං වා අත්තනා සමාධිසම්පන්නතරං යමහං සක්කත්වා ගරුකත්වා උපනිස්සාය විහරෙය්‍යං.

අපරිපූරස්ස ඛො අහං පඤ්ඤාක්ඛන්ධස්ස පාරිපූරියා අඤ්ඤං සමණං වා බ්‍රාහ්මණං වා සක්කත්වා ගරුකත්වා උපනිස්සාය විහරෙය්‍යං, න ඛො පනාහං පස්සාමි සදෙවකෙ ලොකෙ සමාරකෙ සබ්‍රහ්මකෙ සස්සමණබ්‍රාහ්මණියා පජාය සදෙවමනුස්සාය අඤ්ඤං සමණං වා බ්‍රාහ්මණං වා අත්තනා පඤ්ඤාසම්පන්නතරං යමහං සක්කත්වා ගරුකත්වා උපනිස්සාය විහරෙය්‍යං.

අපරිපූරස්ස ඛො අහං විමුත්තික්ඛන්ධස්ස පාරිපූරියා අඤ්ඤං සමණං වා බ්‍රාහ්මණං වා සක්කත්වා ගරුකත්වා උපනිස්සාය විහරෙය්‍යං, න ඛො පනාහං පස්සාමි සදෙවකෙ ලොකෙ සමාරකෙ සබ්‍රහ්මකෙ සස්සමණබ්‍රාහ්මණියා පජාය සදෙවමනුස්සාය අත්තනා විමුත්තිසම්පන්නතරං යමහං සක්කත්වා ගරුකත්වා උපනිස්සාය විහරෙය්‍යන්ති.

තස්ස මය්හං භික්ඛවෙ එතදහොසි: යන්නූනාහං ය්වායං ධම්මො මයා අභිසම්බුද්ධො තමෙව ධම්මං සක්කත්වා ගරුකත්වා උපනිස්සාය විහරෙය්‍යන්ති.

# 3. උරුවෙල වර්ගය

## 4. 1. 3. 1.

### [ ප්‍රථම උරුවෙල සූත්‍රය ]

21. [මා විසින් මෙසේ අසන ලදී] එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ **සැවැත්** නුවර සමීපයෙහි වූ **ජේතවන** නම් වූ, **අනේපිඩු** මහසිටුහුගේ අරම්හි වැඩවසන සේක. එකල්හි භාග්‍යවතුන් වහන්සේ මහණෙනි, යි භික්ෂූන් ඇමතූ සේක. ඒ භික්ෂූහු වහන්සැ යි භාග්‍යවතුන් වහන්සේට පිළිවදන් ඇස්වූහ. භාග්‍යවතුන් වහන්සේ මෙම සූත්‍රය වදාළ සේක:

මහණෙනි, මම එක් කලෙක **උරුවෙල්** දනව්වෙහි **නෙරඤ්ජරා** හෝතෙර **අජපාල** න්‍යග්‍රොධමූලයෙහි සම්‍යක් සම්බුද්ධ ව පළමු ම වෙසෙමි.

මහණෙනි, රහොගත වූ එකත් අරමුණෙහි ඇලුනු මට මෙබඳු වූ චිත්තපරිවිතර්කයෙක් උපන: අනෙකකු කෙරෙහි ගෞරව නැතියේ ප්‍රතිශ්‍රය නැතියේ දුකසේ වෙසෙයි. මම කිනම් මහණකු හෝ බමුණකු හෝ සත්කාර කොට ගෙණ ගුරු කොට ගෙණ ඇසුරු කොට ගෙණ වෙසෙම් දෝයි. මහණෙනි, ඒ මට මෙබඳු සිතෙක් වී:

මම නො පිරිපුන් ශීලස්කන්ධයාගේ පිරිපුන්බව පිණිස අන් මහණකු හෝ බමුණකු හෝ සත්කාර කොට ගෙණ ගුරු කොට ගෙණ ඇසුරු කොට ගෙණ වෙසෙම් නම්, දෙවියන් සහිත මරුන් සහිත බඹුන් සහිත ලොකයෙහි-ශ්‍රමණබ්‍රාහ්මණයන් සහිත අවශෙෂ දෙවමනුෂ්‍යයන් සහිත සත්ත්වාබ්‍ය ප්‍රජායෙහි, මම යමකු සත්කාර කොට ගෙණ ගුරු කොට ගෙණ ඇසුරු කොට ගෙණ වෙසෙම් නම්, තමාට වඩා සිල්සපන් එබඳු අන් මහණකු හෝ බමුණකු හෝ මම (බුදුඇසින්) නො දක්මි.

මම නොපිරිපුන් සමාධිස්කන්ධයාගේ පිරිපුන් බව පිණිස අන් මහණකු හෝ බමුණකු හෝ සත්කාර කොට ගෙණ ගුරුකොට ගෙණ ඇසුරුකොට ගෙණ වෙසෙම් නම්, දෙවියන් සහිත මරුන් සහිත බඹුන් සහිත ලොකයෙහි මහණ බමුණන් සහිත සෙසු දෙව්මිනිසුන් සහිත ප්‍රජායෙහි මම යමකු සත්-කාර කොට ගෙණ ගුරුකොට ගෙණ වෙසෙම් නම්, තමාට වඩා සමාධිසම්පන්න වූ එබඳු අන් මහණකු හෝ බමුණකු හෝ මම නො දක්මි.

මම නොපිරිපුන් ප්‍රඥාස්කන්ධයාගේ පිරිපුන් බව පිණිස අන් මහණකු හෝ බමුණකු හෝ සත්කාර කොට ගෙණ ගුරු කොට ගෙණ ඇසුරු කොට ගෙණ වෙසෙම් නම්, දෙවියන් සහිත වූ මරුන් සහිත වූ බඹුන් සහිත වූ ලොකයෙහි - මහණ බමුණන් සහිත වූ අවශෙෂ දෙව්මිනිසුන් සහිත වූ ප්‍රජායෙහි මම යමකු සත්කාර කොට ගෙණ ගුරු කොට ගෙණ ඇසුරු කොට ගෙණ වෙසෙම් නම්, තමාට වඩා ප්‍රඥාසම්පන්න වූ එබඳු අන් මහණකු හෝ බමුණකු හෝ මම නො දක්මි.

මම නො පිරිපුන් විමුක්තිස්කන්ධයාගේ පිරිපුන්බව පිණිස අන් මහණකු හෝ බමුණකු හෝ සත්කාර කොට ගෙණ ගුරු කොට ගෙණ ඇසුරු කොට ගෙණ වෙසෙම් නම්, දෙවියන් සහිත වූ මරුන් සහිත වූ බඹුන් සහිත වූ ලොකයෙහි – මහණබමුණන් සහිත වූ අවශෙෂ දෙව්මිනිසුන් සහිත වූ ප්‍රජායෙහි මම යමකු සත්කාර කොට ගෙණ ගුරු කොට ගෙණ ඇසුරු කොට ගෙණ වෙසෙම් නම්, තමාට වඩා විමුක්ති සම්පන්න වූ එබඳු අන් මහණකු හෝ බමුණකු හෝ මම නො දක්මි.

මහණෙනි, ඒ මට මෙබඳු සිතෙක් වී: මා විසින් යම් මේ ධර්මයෙක් අවබොධ කරණ ලද නම්, ඒ දහම ම සත්කාර කොට ගෙණ ගුරු කොට ගෙණ ඇසුරු කොට ගෙණ මම වෙසෙම් නම් මැනවි නො! යි.

අථ ඛො භික්ඛවෙ බ්‍රහ්මා **සහම්පති** මම චෙතසා චෙතොපරිවිතක්කමඤ්ඤාය සෙය්‍යථාපි නාම බලවා පුරිසො සම්මිඤ්ජිතං[1] වා බාහං පසාරෙය්‍ය, පසාරිතං වා බාහං සම්මිඤ්ජෙය්‍ය, එවමෙවං බ්‍රහ්මලොකෙ අන්තරහිතො මම පුරතො පාතුරහොසි.

අථ ඛො භික්ඛවෙ බ්‍රහ්මා සහම්පති එකංසං උත්තරාසඞ්ගං කරිත්වා දක්ඛිණං ජාණුමණ්ඩලං පුථුවියං නිහන්ත්වා යෙනාහං තෙනඤ්ජලිං පණාමෙත්වා මං එතදවොච: එවමෙතං භගවා එවමෙතං සුගත, යෙපි තෙ භන්තෙ අහෙසුං අතීතමද්ධානං අරහන්තො සම්මාසම්බුද්ධා, තෙපි භගවන්තො ධම්මං යෙව සක්කත්වා ගරුකත්වා උපනිස්සාය විහරිංසු. යෙපි තෙ භන්තෙ භවිස්සන්ති අනාගතමද්ධානං අරහන්තො සම්මාසම්බුද්ධා, තෙපි භගවන්තො ධම්මං යෙව සක්කත්වා ගරුකත්වා උපනිස්සාය විහරිස්සන්ති. භගවාපි භන්තෙ එතරහි අරහං සම්මාසම්බුද්ධො ධම්මං යෙව සක්කත්වා ගරුකත්වා උපනිස්සාය විහරතූති.

ඉදමවොච බ්‍රහ්මා සහම්පති. ඉදං වත්වා අථාපරං එතදවොච:

47. යෙ චබ්භතීතා[2] සම්බුද්ධා යෙ ච බුද්ධා අනාගතා,
යො චෙතරහි සම්බුද්ධො බහුන්නං සොකනාසනො.

48. සබ්බෙ සද්ධම්මගරුනො විහංසු විහරන්ති ච,
අථොපි විහරිස්සන්ති එසා බුද්ධාන ධම්මතා.

49. තස්මා හි අත්තකාමෙන මහත්තමභිකඞ්ඛතා,
සද්ධම්මො ගරුකාතබ්බො සරං බුද්ධානසාසනන්ති.

ඉදමවොච භික්ඛවෙ බ්‍රහ්මා සහම්පති. ඉදං වත්වා මං අභිවාදෙත්වා පදක්ඛිණං කත්වා තත්ථෙවන්තරධායි.

අථඛ්වාහං භික්ඛවෙ බ්‍රහ්මුනො ච අජ්ඣෙසනං විදිත්වා අත්තනො ච පතිරූපං, යොපායං ධම්මො මයා අභිසම්බුද්ධො, තමෙව ධම්මං සක්කත්වා ගරුකත්වා උපනිස්සාය විහාසිං. යතො ච ඛො භික්ඛවෙ සඞ්ඝොපි මහත්තෙන සමන්නාගතො අථ මෙ සඞ්ඝෙපි (තිබ්බ) ගාරවොති.

## 4. 1. 3. 2.

## [ දුතිය උරුවෙලසුත්තං ]

[සාවත්ථිනිදානං:]

22. එකමිදාහං භික්ඛවෙ සමයං **උරුවෙලායං** විහරාමි නජ්ජා **නෙරඤ්ජරාය** තීරෙ **අජපාල**නිග්‍රොධෙ පඨමාභිසම්බුද්ධො. අථ ඛො භික්ඛවෙ සම්බහුලා බ්‍රාහ්මණා ජිණ්ණා වුද්ධා මහල්ලකා අද්ධගතා වයො-අනුප්පත්තා යෙනාහං තෙනුපසඞ්කමිංසු. උපසඞ්කමිත්වා මම සද්ධිං සම්මොදිංසු. සම්මොදනීයං කථං සාරාණීයං වීතිසාරෙත්වා එකමන්තං නිසීදිංසු. එකමන්තං නිසින්නා ඛො භික්ඛවෙ තෙ බ්‍රාහ්මණා මං එතදවොචුං:

1. සමිඤ්ජිතං - මජසං. 2. යෙ ච අතීතා - මජසං.

මහණෙනි, එක්බිති **සහම්පතී** මහබඹ මහු සිතින් මාගේ චිත්තපරිවිතර්කය දැන යම්සේ බලවත් පුරුෂයෙක් හැකුළු අතක් දිගු කරන්නේ ද දිග් කළ අතක් හකුළා ගන්නේ ද එපරිද්දි බ්‍රහ්මලොකයෙහි අතුරුදහන් කොළේ මා පෙරට පහළ වී.

මහණෙනි, එක්බිති සහම්පතී මහබඹ උතුරුසළුව එකස් කොට ලා දකුණු දණමඩල බිම හැන මා වෙත ඇඳිලි නමා මට මෙ තෙපුල් සැළ කෙළේ ය: භාග්‍යවතුන් වහන්ස, තෙල එසේ ම ය. සුගතයන් වහන්ස, තෙල එසේ ම ය. වහන්ස, අතීත කාලයෙහි යම් ඒ අර්හත් සම්‍යක් සම්බුද්ධ කෙනෙක් වූහු ද, ඒ භගවත්හුදු දහම් ම සත්කාර කොට ගෙණ ගුරු කොට ගෙණ ඇසුරු කොට ගෙණ විසූහ. වහන්ස, අනාගතයෙහි යම් ඒ අර්හත් සම්‍යක් සම්බුද්ධ කෙනෙක් වෙද් ද, ඒ භගවත්හුදු දහම ම සත්කාර කොට ගෙණ ගුරු කොට ගෙණ ඇසුරු කොට ගෙණ වෙසෙත්. වහන්ස, මෙකල අර්හත් සම්‍යක් සම්බුද්ධ වූ භාග්‍යවතුන් වහන්සේ ද දහම ම සත්කාර කොට ගෙණ ගුරු කොට ගෙණ ඇසුරු කොට ගෙණ වෙසෙත්වා යි.

සහම්පති මහබඹ මෙය කීය. මෙය කියා වැලිත් අනෙක් තෙල බස් ද කීය:

47. අතීතකාලික වූ යම් සම්බුදු කෙනෙක් වූහු ද, අනාගතකාලික වූ යම් සම්බුදු කෙනෙකුත් වෙද්ද, දැන් බොහෝ දෙනාගේ ශොක නසන යම් සම්බුද්ධයන් වහන්සේ කෙනෙක් ඇද්ද,

48. එහැම සද්ධර්මය ගුරු කොට ඇත්තාහු විසූහ. දැනුදු වෙසෙත්. වැලි අනාගතයෙහිදු වෙසෙත්. බුදුවරුන්ගේ මේ ධර්මතා ය.

49. එහෙයින් වැඩ කැමැති, මහත්බව පතන, බුදුවරුන්ගේ සස්න සිහි කරන්නහු විසින් සද්ධර්මය ගුරු කටයුත්තේ යි.

මහණෙනි, සහම්පති මහබඹ මෙ කීය. මෙය කියා මා වැඳ පැදකුණු කොට එහි ම අතුරුදහන් කෙළේ ය.

මහණෙනි, එක්බිති මම බ්‍රහ්මාරාධනය ද තමහට නිස්සද දැන, මා විසින් යම් ධර්මයෙක් අවබොධ කරණ ලද ද, ඒ දහම ම සත්කාර කොට ගෙණ ගුරු කොට ගෙණ ඇසුරු කොට ගෙණ විසීමි. මහණෙනි, යම් කලෙක සිට සඞ්ඝයාත් (චතුර්විධ) මහත්තවයෙන් සමන්වාගත ද එකල සඞ්ඝයා කෙරෙහිදු මාගේ බලවත් ගෞරවය විය.

4. 1. 3. 2.

[ද්විතීය උරුවෙල සූත්‍රය]

**[සැවැත්නිදානයි:]**

22. මහණෙනි, මම එක් කලෙක **උරුවෙලා** දනව්වෙහි **නෙරඤ්ජරා** ගෝතෙර **අජපාල** න්‍යග්‍රොධමූලයෙහි සම්‍යක්සම්බුද්ධ ව **පළමු** ම වෙසෙමි. මහණෙනි, එකල ජරාජීර්ණ වූ වයොවෘද්ධ වූ දුමහලු වූ තුන් විය ඉක්ම වූ පැසිම්විය වපාප්ත බොහෝ බමුණෝ (**ශුෂ්කධජාතික** බමුණු සමග) මා කරා එළඹියහ. එළඹ මා සමග සතුටු වූහ සතුටුව සිහි කල යුතු කථා කොට නිමවා එකත්පසෙක හුන්හ. මහණෙනි, එකත්පසෙක හුන් ඒ බමුණෝ මට මෙහෙල වචන කීහ:

සුතං තෙතං[1] භො ගොතම න සමණො ගොතමො බ්‍රාහ්මණෙ ජිණ්ණෙ වුඩ්ඪෙ මහල්ලකෙ අද්ධගතෙ වයොඅනුප්පත්තෙ අභිවාදෙති වා පච්චුට්ඨෙති වා ආසනෙන වා නිමන්තෙතීති. තයිදං භො ගොතම තථෙව. න හි භවං ගොතමො බ්‍රාහ්මණෙ ජිණ්ණෙ වුඩ්ඪෙ මහල්ලකෙ අද්ධගතෙ වයො-අනුප්පත්තෙ අභිවාදෙති වා පච්චුට්ඨෙති වා ආසනෙන වා නිමන්තෙති. තයිදං භො ගොතම න සම්පන්නමෙවාති.

තස්ස මය්හං භික්ඛවෙ එතදහොසි: න වතිමෙ[2] ආයස්මන්තො ජානන්ති ථෙරං වා ථෙරකරණෙ වා ධම්මෙ. වුඩ්ඪො චෙපි භික්ඛවෙ හොති ආසීතිකො වා නාවුතිකො වා වස්සසතිකො වා ජාතියා. සො ච හොති අකාලවාදී අභූතවාදී අනත්ථවාදී අධම්මවාදී අවිනයවාදී අනිධානවතිං වාචං භාසිතා අකාලෙන අනපදෙසං අපරියන්තවතිං අනත්ථසංහිතං. අථ ඛො සො බාලො ථෙරොත්වෙව සඞ්ඛං ගච්ඡති.

දහරො චෙපි භික්ඛවෙ හොති යුවා සුසුකාළකෙසො භද්‍රෙන යොබ්බනෙන සමන්නාගතො පඨමෙන වයසා. සො ච හොති කාලවාදී භූතවාදී අත්ථවාදී ධම්මවාදී විනයවාදී නිධානවතිං වාචං භාසිතා කාලෙන සාපදෙසං පරියන්තවතිං අත්ථසංහිතං. අථ ඛො සො පණ්ඩිතො ථෙරොත්වෙව සඞ්ඛං ගච්ඡති.

චත්තාරොමෙ, භික්ඛවෙ ථෙරකරණා ධම්මා. කතමෙ චත්තාරො?

ඉධ භික්ඛවෙ භික්ඛු සීලවා හොති පාතිමොක්ඛසංවරසංවුතො විහරති ආචාරගොචරසම්පන්නො අණුමත්තෙසු වජ්ජෙසු භයදස්සාවී සමාදාය සික්ඛති සික්ඛාපදෙසු.

බහුස්සුතො හොති සුතධරො සුතසන්නිචයො. යෙ තෙ ධම්මා ආදිකල්‍යාණා මජ්ඣෙකල්‍යාණා පරියොසානකල්‍යාණා සාත්ථා සබ්‍යඤ්ජනා කෙවලපරිපුණ්ණං පරිසුද්ධං බ්‍රහ්මචරියං අභිවදන්ති. තථාරූපාස්ස ධම්මා බහුස්සුතා හොන්ති ධතා වචසා පරිචිතා මනසානුපෙක්ඛිතා දිට්ඨියා සුප්පටිවිද්ධා.

චතුන්නං ඣානානං ආභිචෙතසිකානං දිට්ඨධම්මසුඛවිහාරානං නිකාම-ලාභී හොති අකිච්ඡලාභී අකසිරලාභී.

ආසවානං ඛයා අනාසවං චෙතොවිමුත්තිං පඤ්ඤාවිමුත්තිං දිට්ඨෙව ධම්මෙ සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරති.

ඉමෙ ඛො භික්ඛවෙ චත්තාරො ථෙරකරණා ධම්මාති

1. මෙතං - සි 2. [illegible]

භවත් ගෞතමයෙනි, “මහණ ගොයුම්හු ජරාජීර්ණ, වයෝවෘද්ධ, දිරාමහලු, තුන්වියස ඉක්ම සිටි, පැසිම්වියට පැමිණි බමුණන් නොවඳිති යි, දැක හුනස්නෙන් නො නැගිටිති යි, අසුනෙන් නො අමතති” යි අප විසින් තෙල අසන ලදී. භවත් ගෞතමයෙනි, එය (අප විසින් ඇසූ කරුණ) එසේ ම ය. භවත් ගෞතමයෝ ජීර්ණ, වෘද්ධ, මහලු, අධ්වගත, පශ්චිමවයසට ගිය, බමුණන් නො වඳිති. දැක හුනස්නෙන් නො නැගිටිති. අසුනෙන් නො කැඳවති. භවත් ගෞතමයෙනි, එකරුණ නොනිසි මැ යි.

මහණෙනි, මට මෙබඳු සිතෙක් වී: මේ ආයුෂ්මත්හු ස්ථවිර හෝ ස්ථවිර භාවය කරණ දහම් හෝ එකාන්තයෙන් ම නො දනිත්. මහණෙනි, ඉදින් උපතින් අසූවයස් ඇති හෝ අනූවයස් ඇති හෝ සියක් වයස් ඇති හෝ වෘද්ධයෙක් වෙයි, හෙ ද අකාලවාදීත් වෙයි. අභූතවාදීත් වෙයි. අනර්ථවාදීත් වෙයි. අධර්මවාදීත් වෙයි. අවිනයවාදීත් වෙයි. අකාලයෙහි නිෂ්කාරණ වූ පර්යන්ත-රහිත වූ ලොවීලොව්තුරු අරුත් නැති ලෙහි නිධන් නො කටයුතු තෙපුල් කියන්නේත් වෙයි. ඒ අඥබල් ද ස්ථවිර ම ය යි ගණනට වැටෙයි.

මහණෙනි, ඉදින් තුරුණු වූ ඉතාළු කෙස් ඇති භද්‍රයෞවනයෙන් සමන්වාගත ප්‍රථමවයසින් යුත් ළදරුවෙක් වෙයි. හෙ ද කාලවාදීත් වෙයි. භූතවාදීත් වෙයි. අර්ථවාදීත් වෙයි. ධර්මවාදීත් වෙයි. විනයවාදීත් වෙයි. නිසි කල කරුණු සහිත වූ පර්යන්ත ඇති ලොවී ලොවුතුරු අරුත් ඇති ලෙහි නිධන් කළයුතු තෙපුල් කියන්නේත් වෙයි. ඒ පණ්ඩිත තෙමේ ස්ථවිර ම ය යි ගණනට වැටේ

මහණෙනි, මේ ථෙර (තෙරබව) කරණ ධර්මයෝ සතර දෙනෙකි. කවර සතර දෙනෙක යත්:

මහණෙනි, මෙසස්නෙහි මහණ සිල්වත් වෙයි, ප්‍රාතිමෝක්ෂසංවරශීලයෙන් සංවෘත ව වෙසෙයි, ආචාරගොචරසම්පන්න වෙයි, අණුමාත්‍ර වරදෙහි බිය දක්නා සුලු වෙයි, සිකපද මොනවට ගෙණ හික්මෙයි.

බහුශ්‍රැත වෙයි, ශ්‍රැතධර වෙයි, ශ්‍රැතසන්නිචය (=රැස් කොට ගත් ශ්‍රැත ඇත්තේ) වෙයි, ආදිකල්‍යාණ වූ මධ්‍යකල්‍යාණ වූ පර්‍යවසාන කල්‍යාණ වූ අර්ථ සහිත වූ ව්‍යඤ්ජනසහිත වූ කෙවලපරිපූර්ණ වූ පරිශුද්ධබ්‍රහ්මචර්‍ය්‍යය කියන යම් ඒ දහම්හු ඇත් ද, එබඳු දහම්හු මොහු විසින් බෙහෙවින් අසන ලද්දාහු දරණ ලද්දාහු තෙපුලෙන් වණපොත් කරණ ලද්දාහු සිතින් පුන පුනා දක්නා ලද්දාහු (අරුත් විසින් කරුණු විසින්) ප්‍රඥයෙන් අවබොධ කරණ ලද්දාහු වෙත්.

අධිචිත්තය ඇසුරු කොට සිටි ඉහාත්මයෙහි සුඛවිහරණ ඇති සතර දැහැන් (රිසි රිසි කෙණෙහි සමවැදීම් විසින්) කැමැතියේ ලබන සුලු වෙයි. සුවසේ ලබන සුලු වෙයි, විපුල කොට ලබන සුලු වෙයි.

ආස්‍රවක්ෂයහෙතුයෙන් අනාස්‍රව වූ චෙතොවිමුක්ති ප්‍රඥාවිමුක්ති මෙලොවෙහි ම තමා විසින් විශිෂ්ටඥානයෙන් දැන ප්‍රත්‍යක්ෂ කොට ගෙණ ඇටි-ඇටිසඳ සම්වැද වෙසෙයි.

මහණෙනි, මේ සතර ථෙර කරණ ධර්මයෝය.

50. යො උද්ධතෙන චිත්තෙන සම්ඵඤ්ච බහු භාසති,
අසමාහිතසඞ්කප්පො අසද්ධම්මරතො මිගො,
ආරා සො ථාවරෙය්‍යම්හා පාපදිට්ඨි අනාදරො.

51. යො ච සීලෙන සම්පන්නො සුතවා පටිභානවා,
සඤ්ඤතො ධීරධම්මෙසු[1] පඤ්ඤායත්ථං විපස්සති,
පාරගූ සබ්බධම්මානං අඛිලො පටිභානවා.

52. පහීනජාතිමරණො බ්‍රහ්මචරියස්ස කෙවලී,
තමහං වදාමි ථෙරොති යස්ස නො සන්ති ආසවා,
ආසවානං ඛයා භික්ඛු සො ථෙරොති පවුච්චතීති.

## 4. 1. 3. 3.

## [ ලොකසුත්තං ]

[ සාවත්ථිනිදානං: ]

23. ලොකො භික්ඛවෙ තථාගතෙන අභිසම්බුද්ධො. ලොකස්මා තථාගතො විසංයුත්තො. ලොකසමුදයො භික්ඛවෙ තථාගතෙන අභිසම්බුද්ධො. ලොකසමුදයො තථාගතස්ස පහීනො. ලොකනිරොධො භික්ඛවෙ තථාගතෙන අභිසම්බුද්ධො. ලොකනිරොධො තථාගතස්ස සච්ඡිකතො. ලොකනිරොධගාමිනීපටිපදා භික්ඛවෙ තථාගතෙන අභිසම්බුද්ධා. ලොකනිරොධගාමිනීපටිපදා තථාගතස්ස භාවිතා.

යං භික්ඛවෙ සදෙවකස්ස ලොකස්ස සමාරකස්ස සබ්‍රහ්මකස්ස සස්සමණබ්‍රාහ්මණියා පජාය සදෙවමනුස්සාය දිට්ඨං සුතං මුතං විඤ්ඤාතං පත්තං පරියෙසිතං අනුවිචරිතං මනසා, සබ්බං තං තථාගතෙන අභිසම්බුද්ධං. තස්මා තථාගතො'ති වුච්චති.

යඤ්ච භික්ඛවෙ රත්තිං තථාගතො අභිසම්බුජ්ඣති, යඤ්ච රත්තිං පරිනිබ්බායති, යං එතස්මිං අන්තරෙ භාසති ලපති නිද්දිසති, සබ්බං තං තථෙව හොති. නො අඤ්ඤථා. තස්මා තථාගතො'ති වුච්චති.

යථාවාදී භික්ඛවෙ තථාගතො තථාකාරී, යථාකාරී තථාවාදී, ඉති යථාවාදී තථාකාරී යථාකාරී තථාවාදී. තස්මා තථාගතො'ති වුච්චති.

සදෙවකෙ භික්ඛවෙ ලොකෙ සමාරකෙ සබ්‍රහ්මකෙ සස්සමණබ්‍රාහ්මණියා පජාය සදෙවමනුස්සාය තථාගතො අභිභූ අනභිභූතො, අඤ්ඤදත්ථු දසො වසවත්ති. තස්මා තථාගතො'ති වුච්චති

53. සබ්බලොකං[2] අභිඤ්ඤාය සබ්බලොකෙ යථා තථා,
සබ්බලොකවිසංයුත්තො සබ්බලොකෙ අනූපයො.

1. ධීරො ධම්මෙසු - මජසං. 2. සබ්බං ලොකං - ම. ජ. සං.

Free Distribution www.aathaapi.org

50. යමෙක් විසුරුණු සිතින් බොහෝ කොට පලප බෙණේ ද, නොපිහි- ටුවාලූ සංකල්ප ඇති අසද්ධර්මයෙහි නියැලී මෘග සදෘශ ලමු දිට්ඨිය ඇති නිරුදර වූ හෙ තෙමේ ස්ථාවරභාවයෙන් දුරුව සිටුනේ ය.

51. යමෙක් ශීලසම්පන්න වූයේ ශ්‍රැතවත් වූයේ ප්‍රතිභාණ ඇතියේ ස්ථාවරධර්මයෙහි සංයත වූයේ මාර්ගප්‍රඥයෙන් සත්‍යාර්ථය විනිවිද දක්නේ ද සැම සසාඝාදි දහම්හි තෙරපත් වේ ද, රාගාදි බිල රහිත වේ ද,

52. පැහු දූමරණ ඇතියේ ද, බඹසර පිරිපුන් කෙළේ වේ ද, යමක්හට ආශ්‍රවයෝ නැත් ද, ඔහු මම 'ථෙර' ය යි කියමි. ආශ්‍රවක්‍ෂයයෙන් ඒ මහණ 'ථේර' ය යි කියනු ලැබේ.

## 4. 1. 8. 3.

## [ ලෝක සූත්‍රය ]

**[ සැවැත් නිදානයි: ]**

23. මහණෙනි, ලෝකය - දුඃඛසත්‍යය තථාගතයන් වහන්සේ විසින් පසක් කරණ ලදී. තථාගතයන් වහන්සේ ලෝකයෙන් - දුඃඛසත්‍යයෙන් විසංයුක්තයහ. මහණෙනි, ලෝකසමුදය (තෘෂ්ණාව) තථාගතයන් වහන්සේ විසින් පසක් කරණ ලදී. තථාගතයන් වහන්සේ විසින් ලෝකසමුදය ප්‍රහීණ කරණ ලදී. මහණෙනි, ලෝකනිරෝධය තථාගතයන් වහන්සේ විසින් අවබෝධ කරණ ලදී. ලෝකනිරෝධය තථාගතයන් වහන්සේ විසින් පසක් කරණ ලදී. මහණෙනි, ලෝකනිරෝධගාමිනී ප්‍රතිපද්තථාගතයන් වහන්සේ විසින් අවබෝධ කරණ ලදී. ලෝකනිරෝධගාමිනීප්‍රතිපද් තථාගතයන් වහන්සේ විසින් වඩන ලදී

මහණෙනි, දෙවියන් සහිත මරුන් සහිත බඹුන් සහිත ලෝකයා විසින් ශ්‍රමණබ්‍රාහ්මණයන් සහිත අවශේෂ දෙවමිනිසුන් සහිත සත්ත්වාඛ්‍ය ප්‍රජාව විසින් යම් රූපායතනයෙක් ශබ්දායතනයෙක් ගන්ධරස ස්ප්‍රෂ්ටව්‍යා- යතනයෙක් ධර්මාලම්බනයෙක් ලබන ලද ද, සොයන ලද ද, සිතින් ලුහුබැඳ ගන්නා ලද ද, ඒ සැම තථාගතයන් වහන්සේ විසින් අවබෝධ කරණ ලදී. එසින් 'තථාගත'යයි කියනු ලැබේ.

මහණෙනි, යම් රැයෙක තථාගතයන් වහන්සේ චතුස්සත්‍යාවබෝධය කරණ සේක් ද, යම් රැයෙක පිරිනිවන් පානා සේක් ද, මේ අතර යමක් බණන සේක් ද, තෙපලන සේක් ද, නිදෙසන සේක් ද, එහැම එපරිදි ම වෙයි. වෙනස් නො වෙයි. එසින් 'තථාගත' ය යි කියනු ලැබේ.

මහණෙනි, තථාගතයන් වහන්සේ යථාවාදී සේක් තථාකාරී සේක. යථාකාරී සේක් තථාවාදී සේක. මෙසේ යථාවාදී තථාකාරීයහ. යථාකාරී තථාවාදීයහ. එසින් 'තථාගත'ය යි කියනු ලැබේ.

මහණෙනි, දෙවියන් සහිත මරුන් සහිත බඹුන් සහිත ලෝකයෙහි ශ්‍රමණබ්‍රාහ්මණයන් සහිත, අවශේෂ දෙවමිනිසුන් සහිත සත්ත්වාඛ්‍ය ප්‍රජායෙහි තථාගතයන් වහන්සේ සැම මැඩ ගෙණ සිටුනා සේක් මෙරමා විසින් නො මඩනා ලදහ. ඒකාන්තයෙන් සැම දක්නා සේක් තමා වශයෙහි ලා සිටුනා සේක. එසින් 'තථාගත'ය යි කියනු ලැබේ.

53. සියලු ත්‍රෛධාතුක ලෝකසන්නිවාසය හා එහි (සර්වලෝකයෙහි) සැම ශ්‍රේයධර්ම ඇති සැටි දන්න යොගප්‍රඥාණයෙන් ත්‍රෛධාතුකලෝකයෙන් විසංයුක්ත වූයේ ත්‍රෛධාතුකලෝකයෙහි තෘෂ්ණා-දෘෂ්ටිරහිත වූයේ-

54. ස වෙ සබ්බාභිභූ ධීරො සබ්බගන්ථප්පමොචනො,
ඵුට්ඨස්ස පරමා සන්ති නිබ්බානං අකුතොභයං.

55. “එස ඛීණාසවො බුද්ධො අනීඝො ඡින්නසංසයො,
සබ්බකම්මක්ඛයං පත්තො විමුත්තො උපධිසඞ්ඛයෙ.

56. එස සො භගවා බුද්ධො එස සීහො අනුත්තරො,
සදෙවකස්ස ලොකස්ස බ්‍රහ්මචක්කං පවත්තයී.”

57. ඉති දෙවමනුස්සා ච යෙ බුද්ධං සරණං ගතා,
සඞ්ගම්ම තං නමස්සන්ති මහන්තං වීතසාරදං.

58. “දන්තො දමයතං සෙට්ඨො සන්තො සමයතං ඉසි,
මුත්තො මොචයතං අග්ගො තිණ්ණො තාරයතං වරො.”

59. ඉති හෙතං නමස්සන්ති මහන්තං වීතසාරදං,
සදෙවකස්මිං ලොකස්මිං නත්ථි තෙ පටිපුග්ගලොති.

## 4. 1. 3. 4.

### [ කාළකාරාමසුත්තං ]

24. [එවං මෙ සුතං:] එකං සමයං භගවා **සාකෙතෙ** විහරති **කාළකාරාමෙ.** තත්‍ර ඛො භගවා භික්ඛූ ආමන්තෙසි භික්ඛවොති. භදන්තෙති තෙ භික්ඛූ භගවතො පච්චස්සොසුං භගවා එතදවොච:

යං භික්ඛවෙ සදෙවකස්ස ලොකස්ස සමාරකස්ස සබ්‍රහ්මකස්ස සස්සමණ-බ්‍රාහ්මණියා පජාය සදෙවමනුස්සාය දිට්ඨං සුතං මුතං විඤ්ඤාතං පත්තං පරියෙසිතං අනුවිචරිතං මනසා, තමහං ජානාමි.

යං භික්ඛවෙ සදෙවකස්ස ලොකස්ස සමාරකස්ස සබ්‍රහ්මකස්ස සස්සමණ-බ්‍රාහ්මණියා පජාය සදෙවමනුස්සාය දිට්ඨං සුතං මුතං විඤ්ඤාතං පත්තං පරියෙසිතං අනුවිචරිතං මනසා, තමහං අබ්භඤ්ඤාසිං. තං තථාගතස්ස විදිතං. තං තථාගතො න උපට්ඨාසි.

යං භික්ඛවෙ සදෙවකස්ස ලොකස්ස සමාරකස්ස සබ්‍රහ්මකස්ස සස්සමණ-බ්‍රාහ්මණියා පජාය සදෙවමනුස්සාය දිට්ඨං සුතං මුතං විඤ්ඤාතං පත්තං පරියෙසිතං අනුවිචරිතං මනසා, තමහං ජානාමීති වදෙය්‍යං, තං මම අස්ස මුසා.

54. සිවුවැදෑරුම් හැම ග්‍රන්ථයන් මුදා හැර සිටියේ රූපාදි හැම අරමුණු මැඩ ගෙණ සිටියේ වේ ද, හේ ඒකාන්තයෙන් ධීරයෙකි. කොයිනුදු බිය නැති නිර්වාණසඞ්ඛ්‍යාත පරමශාන්තිය ඔහු විසින් පහස්නා ලද්දී.

55. "කෙලෙස් දුක් නැති මුලුසුත් සැක ඇති ඛීණාස්‍රව වූ තුලුන් වහන්සේ සම්බුද්ධයහ. සම්කාමීක්‍ෂයට පැමිණියහ. නිවන් නිමිත්තෙහි (එය අරමුණු කොට සිටුනා) ඵලවිමුක්තියෙන් විමුක්තයහ.

56. ඒ භගවත්හු නම් තෙල බුද්ධයහ. තුලුන් වහන්සේ අනුත්තර-සිංහයහ. දෙවියන් සහිත ලොවට බ්‍රහ්මචක්‍රය පැවැත් වූ සේක."

57. මෙසේ කියමින් දෙවිමිනිස්හු හෝ යම් කෙනෙක් බුදුරජුන් සරණ ගියාහු ද, ඔහු එළඹ මහත් වූ පහ වූ බිය ඇති උන්වහන්සේ වඳිත්.

58. "තුමූ දැමුනාහු දමනය කරණුවන් අතර ශ්‍රෙෂ්ඨය හ. තුමූ ශාන්ත වූවාහු ශමනය කරණුවන් අතර ඍෂියහ. තුමූ මිදුනාහු මුදනුවන් අතර අග්‍රයහ. තුමූ තීර්ණ වූවාහු තරණය කරණුවන් අතර උත්තමයහ.

59. දෙවියන් සහිත ලෝකයෙහි මුඹ වහන්සේට ප්‍රතිපුද්ගලයෙක් නැතැ"යි මෙසේ කියා පහ වූ බිය ඇති පූජ්‍ය වූ තෙල බුදුරජුන් වඳිත්.

## 4. 1. 3. 4

## [ කාලකාරාම සූත්‍රය ]

24. [මා විසින් මෙසේ අසන ලදී:] එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ **සාකේතයෙහි** වූ **කාලකාරාමයෙහි** වැඩ වසන සේක. එකල්හි භාග්‍යවතුන් වහන්සේ මහණෙනි, යි භික්ෂූන් ඇමතූ සේක. පින්වතුන් වහන්සැ යි ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට පිළිවදන් ඇස්වූහ. භාග්‍ය-වතුන් වහන්සේ තෙල වදාළහ:

මහණෙනි, දෙවියන් සහිත මරුන් සහිත බඹුන් සහිත ලෝකයා විසින්, ශ්‍රමණබ්‍රාහ්මණයන් සහිත අවශේෂ දේවමනුෂ්‍යයන් සහිත ප්‍රජාව විසින් යම් රූපායතනයෙක් ශබ්දායතනයෙක් ගන්ධ-රස-ස්ප්‍රෂ්ටව්‍යායතනයෙක් ධර්මා-ලම්බනයෙක් ගන්නා ලද ද, සොයා ගන්නා ලද ද, සිතින් ලුහුබඳනා ලද ද, එ හැම මම දනිමි.

මහණෙනි, දෙවින් සහිත මරුන් සහිත බඹුන් සහිත ලොකයා විසින්, ශ්‍රමණබ්‍රාහ්මණයන් සහිත අවශෙෂ දෙවමනුෂ්‍යයන් සහිත ප්‍රජාව විසින් යම් රූපායතනයෙක් ශබ්දායතනයෙක් ගන්ධ - රස - ස්ප්‍රෂ්ටව්‍යායතනයෙක් ධර්මා-ලම්බනයෙක් ගන්නා ලද ද, සොයා ගන්නා ලද ද, සිතින් ලුහුබඳනා ලද ද, එ හැම මම (අතීත වශයෙන්) දැන ගතිමි. එ හැම තථාගතයන් වහන්සේට ප්‍රකටසේ විදිතය. (එනෙත්) එ හැම සදෙර අරමුණු කරා තථාගතයන් වහන්සේ තෘෂ්ණාදෘෂ්ටීන් වැද නොගත්හ.

මහණෙනි, දෙවියන් සහිත මරුන් සහිත බඹුන් සහිත ලොකයා විසින්, ශ්‍රමණබ්‍රාහ්මණයන් සහිත අවශෙෂ දෙවමනුෂ්‍යයන් සහිත ප්‍රජාව විසින් යම් රූපායතනයෙක් ශබ්දායතනයෙක් ගන්ධ - රස - ස්ප්‍රෂ්ටව්‍යායතනයෙක් ධර්මාලම්බනයෙක් ගන්නා ලද ද, සොයා ගන්නා ලද ද, සිතින් ලුහුබඳනා ලද ද, එ හැම මම (මහාජනයා දක්නා සෙයින් ඝ්‍රාණාදීන්) දනිමි යි කියම් නම් එය මාගේ මෘෂාවෙක් වෙයි. (ආත්ම· ආත්මීයභාවයෙන් ශුන්‍යතා ඇතිහෙයිනි.)

යං භික්ඛවෙ -පෙ- තමහං ජානාමි ච න ච ජානාමීති වදෙය්‍යං, තම්පස්ස තාදිසමෙව. තමහං නෙව ජානාමි න නජානාමීති වදෙය්‍යං, තං මම අස්ස කලි.

ඉති ඛො භික්ඛවෙ තථාගතො දට්ඨා දට්ඨබ්බං දිට්ඨං න මඤ්ඤති. අදිට්ඨං න මඤ්ඤති. දට්ඨබ්බං න මඤ්ඤති. දට්ඨාරං න මඤ්ඤති. සුතා[1] සොතබ්බං සුතං න මඤ්ඤති. අසුතං න මඤ්ඤති. සොතබ්බං න මඤ්ඤති. සොතාරං න මඤ්ඤති. මුතා[2] මොතබ්බං මුතං න මඤ්ඤති. අමුතං න මඤ්ඤති. මොතබ්බං න මඤ්ඤති. මොතාරං න මඤ්ඤති. විඤ්ඤාතා[3] විඤ්ඤාතබ්බං විඤ්ඤාතං න මඤ්ඤති. අවිඤ්ඤාතං න මඤ්ඤති. විඤ්ඤාතබ්බං න මඤ්ඤති. විඤ්ඤාතාරං න මඤ්ඤති.

ඉති ඛො භික්ඛවෙ තථාගතො දිට්ඨසුතමුතවිඤ්ඤාතබ්බෙසු ධම්මෙසු තාදීයෙව තාදී. තම්හා ච පන[4] තාදිතම්හා අඤ්ඤො තාදී උත්තරිතරො වා පණීතතරො වා නත්ථීති වදාමීති.

60. යං කිඤ්චි දිට්ඨං ව සුතං මුතං වා අජ්ඣොසිතං සච්චමුතං පරෙසං,
න තෙසු තාදී සයසංවුතෙසු සච්චං මුසා වාපි පරං දහෙය්‍යං.

61. එතං ච සල්ලං පටිගච්ච[5] දිස්වා අජ්ඣොසිතා යත්ථ පජා විසත්තා,
ජානාමි පස්සාමි තථෙව එතං අජ්ඣොසිතං නත්ථි තථාගතානන්ති.

## 4. 1. 3. 5.

## [ බ්‍රහ්මචරියසුත්තං ]

[ සාවත්ථිනිදානං: ]

25. නයිදං භික්ඛවෙ බ්‍රහ්මචරියං වුස්සති ජනකුහනත්ථං, න ජනලපනත්ථං, න ලාභසක්කාරසිලොකානිසංසත්ථං, න ඉතිවාදප්පමොක්ඛානිසංසත්ථං, න ඉති මං ජනො ජානාතූති. අථ ඛො ඉදං භික්ඛවෙ බ්‍රහ්මචරියං වුස්සති සංවරත්ථං, පහාණත්ථං, විරාගත්ථං, නිරොධත්ථන්ති.

62. සංවරත්ථං පහාණත්ථං බ්‍රහ්මචරියං අනීතිහං,
අදෙසයි සො භගවා නිබ්බානොගධගාමිනං.

63. එස මග්ගො මහත්තෙහි අනුයාතො මහෙසිහි,
යෙ ච තං පටිපජ්ජන්ති යථා බුද්ධෙන දෙසිතං,
දුක්ඛස්සන්තං කරිස්සන්ති සත්ථුසාසනකාරිනොති.

1. සුත්වා - මජසං. 2. මුත්වා - මජසං. 3. විඤ්ඤත්වා - මජසං. 4. තාදිම්හා - මජසං.
5. පටිකච්ච - මජසං.

මහණෙනි, ... එ හැම මම දනිමි යි ද, නො දනිමි යි ද කියම් නම් එ ද එබඳු ම වෙයි. එ හැම මම නො ම දනිමි යි ද නො දන්නෙමි නො වෙමි යි ද කියම් නම්, එබස මාගේ දෝෂයෙක් වෙයි.

මහණෙනි, මෙසේ වනාහි තථාගතයන් වහන්සේ දෘෂ්ටව්‍ය වූ රූපායතනය දැක ඒ රූපායතනය (තෘෂ්ණාදිට්ඨිමඤ්ඤනා විසින්) නො ගනිත්. (මහාජනයා විසින් නො දක්නා ලද) රූපායතනය (මම දනිමැ යි තෘෂ්ණාදීන්) නො ගනිත්. දෘෂ්ටව්‍යය නො ගනිත්. දෘෂ්ටෘ සඞ්ඛ්‍යාත සත්ත්වයකු නො ගනිත්. ශ්‍රොතව්‍ය වූ ශබ්දායතනය අසා ඒ ශබ්දායතනය (තෘෂ්ණා දිට්ඨි මඤ්ඤනා විසින්) නො ගනිත්. (මහාජනයා විසින් නො අසන ලද) ශබ්දායතනය (මම දනිමැ යි තෘෂ්ණාදීන්) නො ගනිත්. ශ්‍රොතව්‍යය නො ගනිත්. ශ්‍රොතෘ සඞ්ඛ්‍යාත සත්ත්වයකු නො ගනිත්. මුතසඞ්ඛ්‍යාත ගන්ධරසස්ප්‍රෂ්ටව්‍යායතනය දැන ඒ මුතායතනය (තෘෂ්ණා-දිට්ඨි මඤ්ඤනා විසින්) නො ගනිත්. (මහාජනයා විසින් නො දන්නා ලද) මුතසඞ්ඛ්‍යාත ගන්ධාදිය නො ගනිත්. මන්තව්‍ය සඞ්ඛ්‍යාත ගන්ධාදිය නො ගනිත්. මන්තෘ සඞ්ඛ්‍යාත සත්ත්වයකු නො ගනිත්. විඥාතව්‍යධර්මාලම්බනය දැන ඒ විඥාතව්‍යය තෘෂ්ණාදීන් නො ගනිත්. (මහාජනයා විසින් අවිඥාත) ධර්මාලම්බනය නො ගනිත්. විඥාතව්‍යය නො ගනිත්. විඥාතෘ සඞ්ඛ්‍යාත සත්ත්වයකු නො ගනිත්.

මහණෙනි, මෙසේ වනාහි තථාගතයන් වහන්සේ දිට්ඨසුතමුතවිඤ්ඤාත වූ ධර්මයන් කෙරෙහි තාදී සේක් ම තාදීයහ ඒ තථාගතතාදීභාවයට වැඩි උත්තරිතර වූ හෝ ප්‍රණීතතර වූ හෝ තාදීභාවයෙක් නැති යි වදරමි.

60. මෙරමාගේ බසින් (පරප්‍රත්‍යයෙන්), සැබවැ'යි හැඟිම් කොට ගිල ගන්නා ලද යම් කිසි රූපායතනයෙක් වේවයි ශබ්දායතනයෙක් වේවයි ගන්ධාදිමුතයෙක් වේවයි ස්වයංසංවෘත සඞ්ඛ්‍යාත ඒ දෘෂ්ටිගතීන් කෙරෙහි තාදී වූයෙම් සත්‍යය යි හෝ මෘෂාය යි හෝ පරම කොට නො හදහමි.

61. යම් දෘෂ්ටිගතියෙක ප්‍රජාවෝ ඇලුනාහු බැස ගත්තාහු වෙත් ද කාලම තෙල ශල්‍යය දැක තෙල දෘෂ්ටිශල්‍යය එසේ ම දනිමි යි දක්මියි තථාගතයන්ගේ ගැලැගැන්මෙක් නැත.

## 4. 1. 3. 5.

## [ බ්‍රහ්මචරියසූත්‍රය ]

**[ සැවැත්නිදානයි: ]**

25. මහණෙනි, මේ බ්‍රම්සර වනාහි ජනයා විස්මයපත් කරණු පිණිස, දනා තලවනු පිණිස, ලාභසත්කාරකීර්ති පිණිස, වාදප්‍රමොක්ෂය පිණිස, ජනයෝ මා මෙසේ හඳුනත්වා යන මේ පිණිස නො වැසෙයි. මහණෙනි, වැලිත් මේ බඹසර වනාහි සංවරය පිණිස, කෙලශප්‍රහාණය පිණිස, රාගාදීන්ගේ විරාගය පිණිස, රාගාදීන්ගේ නිරෝධය පිණිස වැසේ.

62. ඒ භාග්‍යවතුන් වහන්සේ ශ්‍රුතිහරණීන (මෙහි මේ මෙසේයීල යන පරප්‍රත්‍යය නැති) නිවන් තුළට පමුණුවන සුලු, බඹසර කෙලශයන්ගේ සංවරය පිණිස, ප්‍රහාණය පිණිස වදාළහ.

63. පූජ්‍ය මහර්ෂීන් විසින් තෙල මග අනුගමනය කරණ ලදී. බුදුන් විසින් දෙසූ සැටියෙන් යම් කෙනෙක් එමග පිළිපදිත් ද ශාස්තෲශාසනකර වූ ඔහු දුක් කෙළවර කෙරෙත්.

4. 1. 3. 6.

[ කුහසුත්තං ]

26. යෙ තෙ භික්ඛවෙ භික්ඛූ කුහා ථද්ධා ලපා සිඞ්ගී උන්නළා අසමාහිතා, න මෙ තෙ භික්ඛවෙ භික්ඛූ මාමකා. අපගතා ච තෙ භික්ඛවෙ භික්ඛූ ඉමස්මා ධම්මවිනයා. න ච තෙ ඉමස්මිං ධම්මවිනයෙ වුද්ධිං විරූළ්හිං වෙපුල්ලං ආපජ්ජන්ති.

යෙ ච ඛො තෙ භික්ඛවෙ භික්ඛූ නික්කුහා නිල්ලපා ධීරා අත්ථද්ධා සුසමාහිතා, තෙ ඛො මෙ භික්ඛවෙ භික්ඛූ මාමකා. අනපගතා ච තෙ භික්ඛවෙ භික්ඛූ ඉමස්මා ධම්මවිනයා. තෙ ච ඉමස්මිං ධම්මවිනයෙ වුද්ධිං විරූළ්හිං වෙපුල්ලං ආපජ්ජන්තීති.

64. කුහා ථද්ධා ලපා සිඞ්ගී උන්නළා අසමාහිතා,
න තෙ ධම්මෙ විරූහන්ති සම්මාසම්බුද්ධදෙසිතෙ.

65. නික්කුහා නිල්ලපා ධීරා අත්ථද්ධා සුසමාහිතා,
තෙ වෙ ධම්මෙ විරූහන්ති සම්මාසම්බුද්ධදෙසිතෙති.

4. 1. 3. 7.

[ සන්තුට්ඨිසුත්තං ]

27. චත්තාරිමානි භික්ඛවෙ අප්පානි ච සුලභානි ච, අනවජ්ජානි තානි ච. කතමානි චත්තාරි?

පංසුකූලං භික්ඛවෙ චීවරානං අප්පඤ්ච සුලභඤ්ච, තඤ්ච අනවජ්ජං. පිණ්ඩියාලොපො භික්ඛවෙ භොජනානං අප්පඤ්ච සුලභඤ්ච, තඤ්ච අනවජ්ජං. රුක්ඛමූලං භික්ඛවෙ සෙනාසනානං අප්පඤ්ච සුලභඤ්ච, තඤ්ච අනවජ්ජං. පූතිමුත්තං භික්ඛවෙ භෙසජ්ජානං අප්පඤ්ච සුලභඤ්ච, තඤ්ච අනවජ්ජං.

ඉමානි ඛො භික්ඛවෙ චත්තාරි අප්පානි ච සුලභානි ච, තානි අනවජ්ජානි.

යතො ඛො භික්ඛවෙ භික්ඛු අප්පෙන ච සන්තුට්ඨො හොති සුලභෙන ච. ඉදමස්සාහං අඤ්ඤතරං සාමඤ්ඤඞ්ගන්ති වදාමීති.

66. අනවජ්ජෙන තුට්ඨස්ස අප්පෙන සුලභෙන ච,
න සෙනාසනමාරබ්භ චීවරම්පානභොජනං,
විඝාතො හොති චිත්තස්ස දිසා න පටිහඤ්ඤති.

67. යෙ චස්ස ධම්මා අක්ඛාතා සාමඤ්ඤස්සානුලොමිකා,
අධිගහිතා තුට්ඨස්ස අප්පමත්තස්ස භික්ඛුනොති.

## 4. 1. 3. 6.

## [ කුහක සූත්‍රය ]

26. මහණෙනි, යම් ඒ භික්ෂු කෙනෙක් කුහක වූවාහු ක්‍රොධය හා මානයෙන් දැඩි වූවාහු තමන් හුවා බණන්නාහු කෙලෙස්සිඟු ඇත්තාහු ඔසොවා ගත් මානතල ඇත්තාහු එකඟසිත් නොලද්දාහු වෙත් ද, මහණෙනි, මාගේ ඒ භික්ෂූහු මාමක නො වෙත්. මහණෙනි, ඒ භික්ෂූහු මෙසස්නෙන් බැහැර ද වූහ. ඔහු මෙසස්නෙහි වෘද්ධියට විරූඪියට වෛපුල්‍යයට නො ද පැමිණෙත්.

මහණෙනි, යම් ඒ භික්ෂු කෙනෙක් කුහක නොවූවාහු හුවා නොබණන්නාහු ධීර වූවාහු තද නොවූවාහු එකඟසිත් ඇත්තාහු වෙත් ද, මහණෙනි, මා උදෙසා පැවිදි වූ ඒ භික්ෂූහු මා අයත්හ. මහණෙනි, ඔහු මෙසස්නෙන් බැහැර ද නො වූහ. වැලිත් ඔහු මෙසස්නෙහි (ගුණයෙන්) වැඩීමට (නිශ්චල-භාවයෙන්) විරූඪියට (පතළ බැවින්) විපුලබවට පැමිණෙත්.

64. කුහක වූවාහු මනින් දැඩි වූවාහු හුවා බණන්නාහු කෙලෙස්සිඟු ඇත්තාහු ඔසොවාලූ කෙලෙස්තල ඇත්තාහු එකඟසිත් නැත්තාහු වෙත් ද, ඔහු සම්මා සම්බුදුන් විසින් දෙසන ලද දහම්හි නො වැඩෙත්.

65. කුහක නො වූවාහු හුවා නොබණන්නාහු ධීර වූවාහු මෙනෙත් නොදැඩි වූවාහු මොනොවට එකඟසිතැත්තාහු වෙත් ද, ඔහු සම්මා සම්බුදුන් විසින් දෙසන ලද දහම්හි එකාන්තයෙන් වැඩෙත්.

## 4. 1. 3. 7.

## [ සන්තුට්ඨි සූත්‍රය ]

27. මහණෙනි, මේ කරුණුහු සතර දෙනෙක් අල්ප ද සුලභ ද වෙත්. ඔහු නිරවද්‍ය ද වෙත් කවර සතර දෙනෙක යත්:

මහණෙනි, පහුල සිවුරු අතුරෙන් අල්ප ද සුලභ ද වෙයි. එ ද අන-වද්‍යයි. මහණෙනි, පිඬු සිඟා ලත් ආලොපය බොජුන් අතුරෙන් අල්ප ද සුලභ ද වෙයි. එ ද අනවද්‍යයි. මහණෙනි, රුක්මුල සෙනසුන් අතුරෙන් අල්ප ද සුලභ ද වෙයි. එ ද අනවද්‍යයි. මහණෙනි, පූතිමූත්‍රය භෛෂජ්‍ය-යන් අතුරෙන් අල්ප ද සුලභ ද වේ. එ ද අනවද්‍යයි.

මහණෙනි, මේ කරුණුහු සතර දෙන අල්ප ද සුලභ ද වෙත්. ඔහු ද අනවද්‍යයහ.

මහණෙනි, යම් හෙයෙකින් මහණ අල්ප වූත් සුලභ වූත් චීවරාදීන් සතුටු වේ ද, මේ ඔහුගේ අන්‍යතර ශ්‍රාමණ්‍ය-අඞ්ගයෙකැ (ශ්‍රමණ ගුණයෙකැ යි) මම කියමි.

66 – 67 අල්ප වූත් සුලභ වූත් අනවද්‍ය වූත් චීවරාදීන් සතුටු මහණහුගේ සිතට සෙනසුන් අරභයා චීවරය චීවර අරභයා වේවයි පැනබොජුන් අරභයා වේවයි වෙහෙසෙක් නො වේ. දිස් නො හැපේ. ශ්‍රමණධර්මයට අනුලොම් වූ යම් පිළිවෙත් දහම්හු ඔහුට දෙසන ලදහු ද, ඒ ධර්මයෝ සතුටු වූ අප්‍රමත්ත වූ ඒ මහණහු විසින් අධිගෘහීතයහ.

## 4. 1. 3. 8.

## [ අරියවංසසුත්තං ]

28. චත්තාරොමෙ භික්ඛවෙ අරියවංසා අග්ගඤ්ඤා, රත්තඤ්ඤා, වංසඤ්ඤා, පොරාණා, අසංකිණ්ණා, අසංකිණ්ණපුබ්බා, න සංකියන්ති, න සංකියිස්සන්ති, අප්පටිකුට්ඨා සමණෙහි බ්‍රාහ්මණෙහි විඤ්ඤූහි. කතමෙ චත්තාරො?

ඉධ භික්ඛවෙ භික්ඛු සන්තුට්ඨො හොති[1] ඉතරීතරෙන චීවරෙන, ඉතරීතරචීවරසන්තුට්ඨියා ච වණ්ණවාදී. න ච චීවරහෙතු අනෙසනං අප්පතිරූපං ආපජ්ජති. අලද්ධා ච චීවරං න පරිතස්සති. ලද්ධා ච චීවරං අගථිතො[2] අමුච්ඡිතො අනජ්ඣාපන්නො ආදීනවදස්සාවී නිස්සරණපඤ්ඤො පරිභුඤ්ජති. තාය ච පන ඉතරීතරචීවරසන්තුට්ඨියා නෙවත්තානුක්කංසෙති, නො පරං වම්භෙති. සො හි තත්ථ දක්ඛො අනලසො සම්පජානො පතිස්සතො. අයං වුච්චති භික්ඛවෙ භික්ඛු පොරාණෙ අග්ගඤ්ඤෙ අරියවංසෙ ඨිතො.

පුන ච පරං භික්ඛවෙ භික්ඛු සන්තුට්ඨො හොති ඉතරීතරෙන පිණ්ඩපාතෙන, ඉතරීතරපිණ්ඩපාතසන්තුට්ඨියා ච වණ්ණවාදී. න ච පිණ්ඩපාතහෙතු අනෙසනං අප්පතිරූපං ආපජ්ජති. අලද්ධා ච පිණ්ඩපාතං න පරිතස්සති. ලද්ධා ච පිණ්ඩපාතං අගථිතො අමුච්ඡිතො අනජ්ඣාපන්නො ආදීනවදස්සාවී නිස්සරණපඤ්ඤො පරිභුඤ්ජති. තාය ච පන ඉතරීතරපිණ්ඩපාතසන්තුට්ඨියා නෙවත්තානුක්කංසෙති. නො පරං වම්භෙති. සො හි තත්ථ දක්ඛො අනලසො සම්පජානො පතිස්සතො. අයං වුච්චති භික්ඛවෙ භික්ඛු පොරාණෙ අග්ගඤ්ඤෙ අරියවංසෙ ඨිතො.

පුන ච පරං භික්ඛවෙ භික්ඛු සන්තුට්ඨො හොති ඉතරීතරෙන සෙනාසනෙන, ඉතරීතරසෙනාසනසන්තුට්ඨියා ච වණ්ණවාදී. න ච සෙනාසනහෙතු අනෙසනං අප්පතිරූපං ආපජ්ජති. අලද්ධා ච සෙනාසනං න පරිතස්සති. ලද්ධා ච සෙනාසනං අගථිතො අමුච්ඡිතො අනජ්ඣාපන්නො ආදීනවදස්සාවී නිස්සරණපඤ්ඤො පරිභුඤ්ජති. තාය ච පන ඉතරීතරසෙනාසනසන්තුට්ඨියා නෙවත්තානුක්කංසෙති. නො පරං වම්භෙති. සො හි තත්ථ දක්ඛො අනලසො සම්පජානො පතිස්සතො. අයං වුච්චති භික්ඛවෙ භික්ඛු පොරාණෙ අග්ගඤ්ඤෙ අරියවංසෙ ඨිතො.

පුන ච පරං භික්ඛවෙ භික්ඛු භාවනාරාමො හොති භාවනාරතො, පහානාරාමො හොති පහානරතො. තාය ච පන භාවනාරාමතාය භාවනාරතියා පහානාරාමතාය පහානරතියා නෙවත්තානුක්කංසෙති. නො පරං වම්භෙති. සො හි තත්ථ දක්ඛො අනලසො සම්පජානො පතිස්සතො. අයං වුච්චති භික්ඛවෙ භික්ඛු පොරාණෙ අග්ගඤ්ඤෙ අරියවංසෙ ඨිතො.

---

1. තුට්ඨො - මජසං. 2. අගධිතො - මජසං

Free Distribution www.aathaapi.org

## 4. 1. 3. 8.

## [ අරියවංශ සූත්‍රය ]

28. මහණෙනි, මේ සතර ආර්‍ය්‍යවංශධර්ම කොතෙක් අග්‍රයහ යි දතයුත්තාහ. දිගුකල් පැවතියහ යි දතයුත්තාහ. ආර්‍ය්‍යයන්ගේ වංශයහ යි දතයුත්තාහ. පුරාණයහ යි දතයුත්තාහ. අවිකීර්ණයහ යි දතයුත්තාහ. (අතීත බුදුවරුන් විසිනුත් මෙයින් කිමැ යි) බැහැර නො කරණ ලද්දහ. (දැනුදු) බැහැර නො කරණු ලැබෙත්. (අනාගතයෙහි බුදුවරුන් විසිනුත්) බැහැර නො කරණු ලබන්නාහු වෙත්. මහණුන් විසින් බමුණන් විසින් නුවණැතියන් විසින් අනින්දිතයහ. කවර ධර්ම සතර කොතෙක යත්:

මහණෙනි, මෙසස්නෙහි මහණ ඉතරෙතරචීවරයෙන් සතුටු වෙයි ඉතරෙතරචීවරසන්තොෂයෙහි ද ගුණ බණනා සුලු වෙයි චීවරහෙතුයෙන් අයුතු අනෙෂණයට නො පැමිණෙයි. සිවුරු ද නොලැබ නො තැතිගණී. සිවුරු ලැබ ද පත වූ ලොබගැට ඇතියේ (අධිමාත්‍රතෘෂ්ණායෙන්) හටගත් තෘෂ්ණා නැත්තේ තෘෂ්ණායෙන් නොවළඳනා ලද්දේ දොස් දක්නා සුලු වූයේ නිඃසරණ ප්‍රඥාඇත්තේ වළඳ කෙරෙයි. ඒ ඉතරෙතරචීවරසන්තොෂයෙනුත් තමා හුවා නො දක්වයි. මෙරමා හෙළා නො දකී. හෙ ද වනාහි ඒ චීවරසන්තොෂයෙහි දක්ෂ වූයේ අනලස් වූයේ මනා නුවණින් දන්නේ එළඹ සිටි සිහි ඇත්තේ වේ. මහණෙනි, මේ මහණ පැරණි වූ අග්‍ර ය යි දන්නා ලද ආර්‍ය්‍ය වංශයෙහි (ආර්‍ය්‍ය ධර්මයෙහි) සිටියේ යි කියනු ලැබේ.

තවද මහණෙනි, මහණ ඉතරෙතරපිණ්ඩපාතයෙන් සතුටු වෙයි. ඉතරෙතරපිණ්ඩපාතසන්තුෂ්ටියෙහි ගුණ කියන්නේ ද වෙයි. පිණ්ඩපාතහෙතුයෙන් අයුතු අනෙෂණයට නො පැමිණේ. පිඩුවා නො ලැබ ද ත්‍රාසත නො වේ. පිඩුවා ලැබත් ලොබගැට නැතියේ අධිමාත්‍ර තෘෂ්ණායෙන් මුසපත් නො වූයේ තෘෂ්ණායෙන් නොවළඳනා ලදූයේ ආදීනව දක්නා සුලු වූයේ නිඃසරණ ප්‍රඥා ඇත්තේ වළඳ කෙරෙයි. ඒ ඉතරෙතරපිණ්ඩපාතසන්තුෂ්ටියෙනුත් තමා නගා නො තබයි, මෙරමා හෙළා නො දකියි. හෙ ද ඒ පිණ්ඩපාතසන්තොෂයෙහි දක්ෂ වූයේ (සාතච්චාභ්‍යාස විසින්) අනලස් වූයේ නුවණින් දන්නේ එළඹ සිටි සිහි ඇත්තේ වෙයි. මහණෙනි, මේ මහණ පොරාණ වූ අග්‍රඥ වූ ආර්‍ය්‍යවංශයෙහි සිටියේ යි කියනු ලැබේ.

තවද මහණෙනි, මහණ ඉතරෙතර ශයනාසනයෙන් සතුටු වෙයි. ඉතරෙතරශයනාසනසන්තුෂ්ටියෙහිදු ගුණ කියන සුලු වෙයි. ශයනාසනහෙතුයෙන් අයුතු අනෙෂණයට ද නො පැමිණෙයි. සෙනසුන් නො ලැබත් ත්‍රාසත නො වෙයි. ශයනාසන ලැබත් ලොබගැටින් නොගැටුනේ අධිමාත්‍රතෘෂ්ණායෙන් මුසපත් නොවූයේ තෘෂ්ණාව විසින් නොවළඳනා ලදූයේ දොස් දක්නා සුලු වූයේ නිඃසරණ ප්‍රඥා ඇත්තේ වළඳ කෙරෙයි ඒ ඉතරෙතර ශයනාසනසන්තුෂ්ටියෙනුදු තමා නගා නො තබයි, මෙරමා නො ගරහයි. හෙ ද ඒ ශයනාසනසන්තොෂයෙහි දක්ෂ වූයේ අනලස් වූයේ නුවණින් දන්නේ පැමිණ සිටි සිහි ඇත්තේ වෙයි. මහණෙනි, මේ මහණ පොරාණ වූ අග්‍රඥ වූ ආර්‍ය්‍ය වංශයෙහි සිටියේ යි කියනු ලැබේ.

තවද මහණෙනි, මහණ භාවනාභිරති ඇතියේ බවුන්හි ඇලුනේ වෙයි, ප්‍රහාණාභිරති ඇතියේ ප්‍රහාණයෙහි ඇලුනේ වෙයි. වැලිත් ඒ භාවනාරාමතායෙන් වේවයි, භාවනාරතියෙන් වේවයි, ප්‍රහාණාරාමතායෙන් වේවයි, ප්‍රහාණරතියෙන් වේවයි තමා හුවා නො දක්වයි. මෙරමා හෙළා නො දකී. හෙ ද වනාහි ඒ භාවනාරතියෙහි ප්‍රහාණරතියෙහි දක්ෂ වූයේ අනලස් වූයේ නුවණින් දන්නේ එළඹ සිටි සිහි ඇතියේ වෙයි. මහණෙනි, මේ මහණ පුරාණ වූ අග්‍රඥ වූ ආර්‍ය්‍යවංශධර්මයෙහි සිටියේ යි කියනු ලැබේ.

ඉමෙ ඛො භික්ඛවෙ චත්තාරො අරියවංසා අග්ගඤ්ඤා, රත්තඤ්ඤා, වංසඤ්ඤා, පොරාණා, අසඞ්කිණ්ණා, අසඞ්කිණ්ණපුබ්බා, න සඞ්කීයන්ති, න සඞ්කීයිස්සන්ති, අප්පටිකුට්ඨා සමණෙහි බ්‍රාහ්මණෙහි විඤ්ඤූහි.

ඉමෙහි ච පන භික්ඛවෙ චතූහි අරියවංසෙහි සමන්නාගතො භික්ඛු පුරත්ථිමාය චෙපි දිසාය විහරති, සොව අරතිං සහති, න තං අරති සහති. පච්ඡිමාය චෙපි දිසාය විහරති, සොව අරතිං සහති, න තං අරති සහති. උත්තරාය චෙපි දිසාය විහරති, සොව අරතිං සහති, න තං අරති සහති. දක්ඛිණාය චෙපි දිසාය විහරති, සොව අරතිං සහති, න තං අරති සහති. තං කිස්ස හෙතු: අරතිරතිසහො හි භික්ඛවෙ ධීරොති.

68. නාරති සහති වීරං නාරති වීරසංහති,
ධීරො ච අරතිං සහති ධීරො හි අරතිං සහො.

69. සබ්බකම්මවිහායිනං පනුන්නං කො නිවාරයෙ,
නෙක්ඛං ජම්බොනදස්සෙව කො තං නින්දිතුමරහති,
දෙවාපි තං පසංසන්ති බ්‍රහ්මුනාපි පසංසිතොති.

### 4. 1. 3. 9

### [ ධම්මපදසුත්තං ]

29. චත්තාරිමානි භික්ඛවෙ ධම්මපදානි අග්ගඤ්ඤානි, රත්තඤ්ඤානි, වංසඤ්ඤානි, පොරාණානි, අසඞ්කිණ්ණානි, අසඞ්කිණ්ණපුබ්බානි, න සඞ්කීයන්ති, න සඞ්කීයිස්සන්ති, අප්පටිකුට්ඨානි සමණෙහි බ්‍රාහ්මණෙහි විඤ්ඤූහි කතමානි චත්තාරි?

අනභිජ්ඣා භික්ඛවෙ ධම්මපදං අග්ගඤ්ඤං, රත්තඤ්ඤං, වංසඤ්ඤං, පොරාණං, අසඞ්කිණ්ණං, අසඞ්කිණ්ණපුබ්බං, න සඞ්කීයති, න සඞ්කීයිස්සති, අප්පටිකුට්ඨං සමණෙහි බ්‍රාහ්මණෙහි විඤ්ඤූහි.

අබ්‍යාපාදො භික්ඛවෙ ධම්මපදං අග්ගඤ්ඤං, රත්තඤ්ඤං, වංසඤ්ඤං පොරාණං, අසඞ්කිණ්ණං, අසඞ්කිණ්ණපුබ්බං, න සඞ්කීයති, න සඞ්කීයිස්සති, අප්පටිකුට්ඨං සමණෙහි බ්‍රාහ්මණෙහි විඤ්ඤූහි.

මහණෙනි, මේ සතර ආර්‍යවංශධර්මයෝ අග්‍රයහ යි දතයුත්තාහ. දිගුකල් පැවතියහ යි දතයුත්තාහ. ආර්‍යයන්ගේ වංශයහ යි දතයුත්තාහ. පුරාණයහ යි දතයුත්තාහ. අවිකීර්ණයහ යි දතයුත්තාහ. (අතීත බුදුවරයන් විසිනුත් මෙයින් හිමැයි) බැහැර නො කරණ ලද්දහ (දැනුදු) බැහැර නො කරණු ලැබෙත් (අනාගතයෙහි බුදුවරයන් විසිනුත්) බැහැර නො කරණු ලබන්නාහ. මහණුන් විසින් බමුණන් විසින් නුවණැතියන් විසින් අනින්දිතයහ.

මහණෙනි, මේ සතර ආර්‍යවංශධර්මයෙන් සමන්‍වාගත වූ මහණ පැදුම්-දික්හිදු වේසේ නම් හෙ ම අනභිරතිය මැඩගෙණ සිටියි. අරතිය ඔහු නො මඩියි. පැළදිග්හිදු වේසේ නම් හෙ ම අනභිරතිය මැඩ සිටියි. අරතිය ඔහු නො මඩියි. උතුරුදික්හිදු වේසේ නම් හෙ ම අරතිය මැඩ සිටියි. අරතිය ඔහු නො මඩියි. දකුණුදික්හිදු වේසේ නම් හෙ ම අරතිය මඩනේ ය. අනභිරතිය ඔහු නො මඩියි. ඒ කවර හෙයින යත්: මහණෙනි, ධීර තෙම අරතිය හා පඤ්චකාමගුණරතිය හා මැඩ සිටුනට පොහොනේ ය.

68. අරතිය ධීරයා මැඩ නො සිටුනේ ය; අරතිය ධීරයාහට යෙක් නොවේ. වැලිත් ධීරයා අරතිය මඩියි, ධීරයා වනාහි අරතිය මැඩ පියහෙන්නෙයි.

69. සියලු ත්‍රෛභූමකකර්ම හැරපියා සිටිනසුලු කෙලෙස් දුර ලූ රහත්හු (රාගාදීන් කෙරෙහි) කවරෙක් නම් වළනා ද. දඹරන් නික්ක් සෙයින් ඔහුට ගරහන්නට හැකි වේ ද, දෙවියෝ ද පවා ඔහු පසසත්. බඹහු විසිනුත් පසස්නා ලදී.

## 4. 1. 3. 9.

## [ ධම්මපදසුත්තය ]

29 මහණෙනි, මේ සතර ධර්මපද කෙනෙක් අග්‍රයහ යි දතයුත්තාහ. දිගුකල් පැවතියහ යි දතයුත්තාහ. ආර්‍යයන්ගේ වංශයහ යි දතයුත්තාහ. පෞරාණිකයහ. අසංකීර්ණයහ (අතීත බුදුවරුන් විසිනුත් මෙයින් කිමැ යි) බැහැර නොකරණ ලදහ. දැනුදු බැහැර නො කරණු ලැබෙති. අනාගතයෙහිදු බැහැර නොකරණු ලබන්නාහ. මහණුන් විසින් බමුණන් විසින් නුවණැතියන් විසින් නොගරහන ලදහ. කවර සතර දෙනෙක යත්:

මහණෙනි, අනභිධ්‍යා ධර්මපදය අග්‍රය යි දත යුතුය. දිගුකල් පැවැත්තැ යි දත යුතුය. ආර්‍යවංශය යි දතයුතුය. පෞරාණිකය. අසංකීර්ණය. (අතීත බුදුවරුන් විසිනුත් මෙයින් කිමැ යි) බැහැර නොකරණ ලදය දැනුදු බැහැර නොකරණු ලැබේ. අනාගතයෙහිදු බැහැර නො කරණු ලබන්නේ ය. මහණුන් විසින් බමුණන් විසින් නුවණැතියන් විසින් නොගරහන ලදී.

මහණෙනි, අව්‍යාපාද ධර්මපදය අග්‍රය යි දතයුතුය. දිගුකල් පැවැත්තැ යි දතයුතුය. ආර්‍යවංශය යි දතයුතුය. පෞරාණිකය. අසංකීර්ණය. (පෙර බුදුවරුන් විසිනුදු මෙයින් කිමැ යි) බැහැර නොකරණ ලදී. දැනුදු බැහැර නොකරණු ලැබේ. අනාගතයෙහිදු බැහැර නොකරණු ලබන්නේ ය. මහණුන් විසින් බමුණන් විසින් නුවණැතියන් විසින් නොගරහන ලදී

සම්මාසති භික්ඛවෙ ධම්මපදං අග්ගඤ්ඤං, රත්තඤ්ඤං, වංසඤ්ඤං, පොරාණං, අසඞ්කිණ්ණං, අසඞ්කිණ්ණපුබ්බං, න සඞ්කියති, න සඞ්කියිස්සති. අප්පටිකුට්ඨං සමණෙහි බ්‍රාහ්මණෙහි විඤ්ඤූහි.

සම්මාසමාධි භික්ඛවෙ ධම්මපදං අග්ගඤ්ඤං, රත්තඤ්ඤං, වංසඤ්ඤං, පොරාණං, අසඞ්කිණ්ණං, අසඞ්කිණ්ණපුබ්බං, න සඞ්කියති, න සඞ්කියිස්සති. අප්පටිකුට්ඨං සමණෙහි බ්‍රාහ්මණෙහි විඤ්ඤූහි.

ඉමානි ඛො භික්ඛවෙ චත්තාරි ධම්මපදානි අග්ගඤ්ඤානි, රත්තඤ්ඤානි, වංසඤ්ඤානි, පොරාණානි, අසඞ්කිණ්ණානි, අසඞ්කිණ්ණපුබ්බානි, න සඞ්කියන්ති, න සඞ්කියිස්සන්ති. අප්පටිකුට්ඨානි සමණෙහි බ්‍රාහ්මණෙහි විඤ්ඤූහීති

70. අනභිජ්ඣාලු විහරෙය්‍ය අබ්‍යාපන්නෙන චෙතසා,
සතො එකග්ගචිත්තස්ස අජ්ඣත්තං සුසමාහිතොති.

## 4. 1. 3. 10

## [ පරිබ්බාජකසුත්තං ]

30. [එවං මෙ සුත්තං] එකං සමයං භගවා **රාජගහෙ** විහරති ගිජ්ඣකූටෙ පබ්බතෙ. තෙන ඛො පන සමයෙන සම්බහුලා අභිඤ්ඤාතා අභිඤ්ඤාතා පරිබ්බාජකා **සප්පිනියාතීරෙ**[1] පරිබ්බාජකාරාමෙ පටිවසන්ති. සෙය්‍යථීදං: අන්නභාරො වරධරො සකුලුදායී ච පරිබ්බාජකො අඤ්ඤෙ ච අභිඤ්ඤාතා අභිඤ්ඤාතා පරිබ්බාජකා.

අථ ඛො භගවා සායන්හසමයං පටිසල්ලානා වුට්ඨිතො යෙන සප්පිනියාතීරං පරිබ්බාජකාරාමො තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා පඤ්ඤත්තෙ ආසනෙ නිසීදි. නිසජ්ජ ඛො භගවා තෙ පරිබ්බාජකෙ එතදවොච:

චත්තාරිමානි පරිබ්බාජකා ධම්මපදානි අග්ගඤ්ඤානි, රත්තඤ්ඤානි, වංසඤ්ඤානි, පොරාණානි, අසඞ්කිණ්ණානි, අසඞ්කිණ්ණපුබ්බානි, න සඞ්කියන්ති, න සඞ්කියිස්සන්ති. අප්පටිකුට්ඨානි සමණෙහි බ්‍රාහ්මණෙහි විඤ්ඤූහි. කතමානි චත්තාරි?

1. සිප්පිනියාතීරෙ - මජසං.

මහණෙනි, සම්‍යක් ස්මෘතිධර්මපදය අග්‍රය යි දතයුතුය. දිගුකල් පැවැත්තැ යි දතයුතුය. ආර්‍ය්‍යවංශය යි දතයුතුය. පෞරාණිකය. අවිකීර්ණය. (පෙර බුදුවරුන් විසිනිදු මෙයින් කිමැයි) බැහැර නොකරණ ලදී. දැනුදු බැහැර නොකරණු ලැබේ. අනාගයෙහිදු බැහැර නොකරණු ලබන්නේ ය. මහණුන් විසින් බමුණන් විසින් නුවණැතියන් විසින් නොගහරන ලදි.

මහණෙනි, සම්‍යක්සමාධි ධර්මපදය අග්‍රය යි දතයුතුය. දිගුකල් පැවැත්තැ යි දතයුතු ය. ආර්‍ය්‍යවංශ යයි දතයුතු ය පෞරාණික ය. අවිකීර්ණ ය. (අතීතයෙහි බුදුවරුන් විසිනුත් මෙයින් කිමසි) බැහැර නො කරණ ලදී. දැනුදු බැහැර නො කරණු ලැබේ. අනාගයෙහිදු බැහැර නො කරණු ලබන්නේ ය. මහණුන් විසින් බමුණන් විසින් නුවණැතියන් විසින් නොගරහන ලදී.

මහණෙනි, මේ සතර ධර්මපදයෝ අග්‍රයහයි දතයුත්තාහ. දිගුකල් පැවැත්තහයි දත යුත්තාහ. ආර්‍ය්‍යයන්ගේ වංශයහ යි දතයුත්තාහ. පෞරාණිකයහ. අවිකීර්ණයහ. අතීතයෙහි බුදුවරුන් විසිනුත් (මෙයින් කිමැයි) බැහැර නො කරණ ලදහ. දැනුදු බැහැර නො කරණු ලැබේ අනාගයෙහිත් බැහැර නො කරණු ලබන්නාහ. මහණුන් විසින් බමුණන් විසින් නුවණැතියන් විසින් නො ගරහන ලදහ.

70 නිස්තෘෂ්ණ වැ පියවි සිතින් වසන්නේ ය. ස්මෘතියෙන් සමන්වාගත වැ ඒකාග්‍රචිත්ත වැ තමා කෙරෙහි ලා මොනොවට තැබූ සිතැතියෙක් වන්නේ යි.

## 4. 1. 3. 10

## [ පරිබ්බාජක සූත්‍රය ]

30. [මා විසින් මෙසේ අසන ලදී.] එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ **රජගහනුවර ගිජුකුළු** පව්වෙහි වැඩවසන සේක. එසමයෙහි ඉතා ප්‍රකට වූ බොහෝ පිරිවැජියෝ **සප්පිනියා** හෝතෙර පිරිවැජි අරම්හි වෙසෙති. ඔහු කවරහ: "අන්නභාර යැ, වරධර යැ, සකුලුදායී පිරිවැජි යැ, අන්‍ය වූත් ඉපහළ (ප්‍රකට) පිරිවැජියෝ"යි

එකල්හි භාග්‍යවතුන් වහන්සේ සවස්වේලෙහි පිළිසලනින් නැඟිසිටි සේක් සප්පිනියා හෝතෙර පිරිවැජි අරම් කරා වැඩි සේක. වැඩ පැනවූ අස්නෙහි වැඩහුන් සේක. භාග්‍යවතුන් වහන්සේ වැඩහිඳ ඒ පිරිවැජියන් බණවා තෙල සුත් වදළහ:

පිරිවැජියෙනි, මේ සතර ධර්මපද කෙනෙක් අග්‍රයහයි දත යුත්තාහ. දිගුකල් පැවැතියහයි දත යුත්තාහ, ආර්‍ය්‍යයන් ගේ වංශයහයි දත යුත්තාහ. පෞරාණිකයහ. අවිකීර්ණයහ. (අතීතයෙහි බුදුවරුන් විසිනුත් මෙයින් කිමැයි) බැහැර නො කරණ ලදහ. දැනුදු බැහැර නො කරණු ලැබෙති. අනාගයෙහිත් බැහැර නො කරණු ලබන්නාහ. මහණුන් විසින් බමුණන් විසින් නුවණැතියන් විසින් හෙළා නො දක්නා ලදහ. කවර සතර ධර්මපද කෙනෙක යත්:

අනභිජ්ඣා පරිබ්බාජකා ධම්මපදං අග්ගඤ්ඤං රත්තඤ්ඤං වංසඤ්ඤං පොරාණං අසඞ්කිණ්ණං අසඞ්කිණ්ණපුබ්බං, න සඞ්කියති න සඞ්කියිස්සති. අප්පටිකුට්ඨං සමණෙහි බ්‍රාහ්මණෙහි විඤ්ඤූහි. අබ්‍යාපාදං පරිබ්බාජකා ධම්මපදං -පෙ- සම්මාසති පරිබ්බාජකා ධම්මපදං -පෙ- සම්මාසමාධි පරිබ්බාජකා ධම්මපදං අග්ගඤ්ඤං රත්තඤ්ඤං පොරාණං අසඞ්කිණ්ණං අසඞ්කිණ්ණපුබ්බං, න සඞ්කියති න සඞ්කියිස්සති. අප්පටිකුට්ඨං සමණෙහි බ්‍රාහ්මණෙහි විඤ්ඤූහි.

ඉමානි ඛො පරිබ්බාජකා චත්තාරි ධම්මපදානි අග්ගඤ්ඤානි රත්තඤ්ඤානි වංසඤ්ඤානි පොරාණානි අසඞ්කිණ්ණානි අසඞ්කිණ්ණපුබ්බානි, න සඞ්කියන්ති න සඞ්කියිස්සන්ති. අප්පටිකුට්ඨානි සමණෙහි බ්‍රාහ්මණෙහි විඤ්ඤූහි.

යො ඛො පරිබ්බාජකා එවං වදෙය්‍ය: අහමෙතං අනභිජ්ඣං ධම්මපදං පච්චක්ඛාය අභිජ්ඣාලුං කාමෙසු තිබ්බසාරාගං සමණං වා බ්‍රාහ්මණං වා පඤ්ඤාපෙස්සාමීති. තමහං තත්‍ථ එවං වදෙය්‍යං: එතු. වදතු. ව්‍යාහරතු. පස්සාමිස්ස ආනුභාවන්ති.

සො වත පරිබ්බාජකා අනභිජ්ඣං ධම්මපදං පච්චක්ඛාය, අභිජ්ඣාලුං කාමෙසු තිබ්බසාරාගං සමණං වා බ්‍රාහ්මණං වා පඤ්ඤාපෙස්සතීති නෙතං ඨානං විජ්ජති.

යො ඛො පරිබ්බාජකා එවං වදෙය්‍ය: අහමෙතං අබ්‍යාපාදං ධම්මපදං පච්චක්ඛාය බ්‍යාපන්නචිත්තං පදුට්ඨමනසඞ්කප්පං සමණං වා බ්‍රාහ්මණං වා පඤ්ඤාපෙස්සාමීති. තමහං තත්‍ථ එවං වදෙය්‍යං: එතු. වදතු. ව්‍යාහරතු. පස්සාමිස්ස ආනුභාවන්ති.

සො වත පරිබ්බාජකා අබ්‍යාපාදං ධම්මපදං පච්චක්ඛාය, බ්‍යාපන්නචිත්තං පදුට්ඨමනසඞ්කප්පං සමණං වා බ්‍රාහ්මණං වා පඤ්ඤාපෙස්සතීති නෙතං ඨානං විජ්ජති.

යො ඛො පරිබ්බාජකා එවං වදෙය්‍ය, අහමෙතං සම්මාසතිං ධම්මපදං පච්චක්ඛාය, මුට්ඨස්සතිං අසම්පජානං සමණං වා බ්‍රාහ්මණං වා පඤ්ඤාපෙස්සාමීති. තමහං තත්‍ථ එවං වදෙය්‍යං: එතු. වදතු. ව්‍යාහරතු. පස්සාමිස්ස ආනුභාවන්ති.

සො වත පරිබ්බාජකා සම්මාසතිං ධම්මපදං පච්චක්ඛාය, මුට්ඨස්සතිං අසම්පජානං සමණං වා බ්‍රාහ්මණං වා පඤ්ඤාපෙස්සතීති නෙතං ඨානං විජ්ජති.

පිරිවැජියෙනි, අනභිධ්‍යා ධම්පදය අග්‍රයයි දතයුතු ය. දිගුකල් පැවැත්-තැ'යි දතයුතු ය. ආයනීවංශ යයි දතයුතු ය. පෞරාණික ය. අසඞ්කීර්ණ ය. පෙර බුදුවරුන් විසිනුත් බැහැර නො කරණ ලදී. දැනුදු බැහැර නො කරණු ලැබේ. අනාගතයෙහි දු බැහැර නො කරණු ලබන්නේ ය. මහණුන් විසින් බමුණන් විසින් නුවණැතියන් විසින් නො ගරහන ලදී. පිරිවැජියෙනි, අව්‍යාපාද සඞ්ඛ්‍යාත ධම්පදය ... පිරිවැජියෙනි, සම්‍යක්සමෘති සඞ්ඛ්‍යාත ධම්පදය ... පිරිවැජියෙනි, සම්‍යක්සමාධි සඞ්ඛ්‍යාත ධම්පදය අග්‍ර යයි දතයුතු ය. දිගුකල් පැවැත්තැ'යි දතයුතුය. ආයනීවංශ යයි දතයුතුය. පෞරාණික ය. අසඞ්කීර්ණ ය. පෙර බුදුවරුන් විසින් බැහැර නො කරණ ලදී. දැනුදු බැහැර නො කරණු ලැබෙයි. අනාගතයෙහිත් බැහැර නො කරණු ලබන්නේ ය. මහණුන් විසින් බමුණන් විසින් නුවණැතියන් විසින් නො නිගත්නා ලදී.

පිරිවැජියෙනි, මේ සතර ධම්පදයෝ අග්‍රයහයි දත යුත්තාහ. දිගුකල් පැවැතියහයි දතයුත්තාහ. ආයනීවංශයහයි දතයුත්තාහ පෞරාණිකයහ. අසඞ්කීර්ණයහ. පෙර බුදුවරුන් විසින් බැහැර නො කරණ ලදහ. දැනුදු බැහැර නො කරණු ලැබෙති. අනාගතයෙහිත් බැහැර නො කරණු ලබන්නාහ. මහණුන් විසින් බමුණන් විසින් නුවණැතියන් විසින් නො නිගත්නා ලදහ.

පිරිවැජියෙනි, යමෙක් "මම මෙල අනභිධ්‍යා ධම්පදය හැරපියා අභිධ්‍යා-බහුල වූ වස්තුකාමයෙහි තීව්‍රසංරාග ඇති මහණකු හෝ බමුණකු හෝ පණවමි" මෙසේ බෙණේ නම් එහි දී මම ඔහුට මෙසේ කියමි: "එත්තෙ යැ. කියන්නෙ යැ. පවසන්නෙ යැ. ඔහුගේ අනුභාවය දක්මි" යි

පිරිවැජියෙනි, එකාන්තයෙන් හෙතෙම අනභිධ්‍යා ධම්පදය හැරපියා අභිධ්‍යා බහුල කොටගෙණ වසන වස්තුකාමයෙහි තීව්‍රසංරාග ඇති මහණකු හෝ බමුණකු හෝ පණවන්නේ ය යන මෙල කරුණ විද්‍යමාන නො වේ.

පිරිවැජියෙනි, යමෙක් "මම මෙල අව්‍යාපාද ධම්පදය හැරපියා ව්‍යාපාද-යට වන් සිතැති ප්‍රදුෂ්ට වූ මනසඞ්කල්ප ඇති මහණකු හෝ බමුණකු හෝ පණවමි" මෙසේ බෙණේ නම්, මම ඒ වචනයෙහි දී ඔහුට මෙසේ කියමි: "එත්තෙ යැ. කියන්නෙ යැ. පවසන්නෙ යැ. ඔහුගේ අනුභාව දක්මි" යි.

පිරිවැජියෙනි, හෙතෙම එකාන්තයෙන් අව්‍යාපාද ධම්පදය හැරපියා ව්‍යාපාදයට වන් සිතැති ප්‍රදුෂ්ට වූ මනසඞ්කල්ප ඇති මහණකු හෝ බමුණකු හෝ පණවන්නේ ය යන මෙල කරුණ විද්‍යමාන නො වේ.

පරිව්‍රාජකයෙනි, යමෙක් "මම මෙල සම්‍යක්සමෘතිධම්පදය හැරපියා මුලාසිහි ඇති නුවණින් නො දන්නා මහණකු හෝ බමුණකු හෝ පණවන්-නෙමි" මෙසේ බෙණේ නම්, මම එහි දී ඔහුට මෙසේ කියමි:" එත්තෙ යැ. කියන්නෙ යැ. පවසන්නෙ යැ. ඔහුගේ අනුභාව දක්මි" යි.

පිරිවැජියෙනි, හෙතෙම එකාන්තයෙන් සම්‍යක්සමෘතිධම්පදය හැරපියා මුලාසිහි ඇති සම්‍යග්ඥාන නැති මහණකු හෝ බමුණකු හෝ පණවන්නේ ය යන මෙල කරුණ විද්‍යමාන නො වේ.

යො ඛො පරිබ්බාජකා එවං වදෙය්‍ය: අහමෙතං සම්මාසමාධිං ධම්මපදං පච්චක්ඛාය අසමාහිතං විබ්භන්තචිත්තං සමණං වා බ්‍රාහ්මණං වා පඤ්ඤපෙස්සාමීති. තමහං තත්‍ථ එවං වදෙය්‍යං, එතු. වදතු. ව්‍යාහරතු. පස්සාමිස්ස ආනුභාවන්ති.

සො වත පරිබ්බාජකා සම්මාසමාධිං ධම්මපදං පච්චක්ඛාය අසමාහිතං විබ්භන්තචිත්තං සමණං වා බ්‍රාහ්මණං වා පඤ්ඤපෙස්සතීති නෙතං ඨානං විජ්ජති.

යො ඛො පරිබ්බාජකා ඉමානි චත්තාරි ධම්මපදානි ගරහිතබ්බං පටික්කොසිතබ්බං මඤ්ඤෙය්‍ය, තස්ස දිට්ඨෙව ධම්මෙ චත්තාරො සහධම්මිකා වාදානුපාතා ගාරය්හා ඨානා ආගච්ඡන්ති. කතමෙ චත්තාරො?

අනභිජ්ඣඤ්චෙ භවං ධම්මපදං ගරහති, පටික්කොසති. යෙ ච හි අභිජ්ඣාලූ කාමෙසු තිබ්බසාරගා සමණබ්‍රාහ්මණා, තෙ භොතො පුජ්ජා තෙ භොතො පාසංසා.

අබ්‍යාපාදඤ්චෙ භවං ධම්මපදං ගරහති, පටික්කොසති. යෙ ච හි බ්‍යාපන්නචිත්තා පදුට්ඨමනසඞ්කප්පා සමණ බ්‍රාහ්මණා. තෙ භොතො පුජ්ජා. තෙ භොතො පාසංසා.

සම්මාසතිඤ්චෙ භවං ධම්මපදං ගරහති, පටික්කොසති. යෙ ච හි මුට්ඨස්සතී අසම්පජානා සමණබ්‍රාහ්මණා, තෙ භොතො පුජ්ජා. තෙ භොතො පාසංසා.

සම්මාසමාධිඤ්චෙ භවං ධම්මපදං ගරහති, පටික්කොසති. යෙ ච හි අසමාහිතා විබ්භන්තචිත්තා සමණබ්‍රාහ්මණා. තෙ භොතො පුජ්ජා. තෙ භොතො පාසංසා.

යො ඛො පරිබ්බාජකා ඉමානි චත්තාරි ධම්මපදානි ගරහිතබ්බං පටික්කොසිතබ්බං මඤ්ඤෙය්‍ය, තස්ස දිට්ඨෙව ධම්මෙ ඉමෙ චත්තාරො සහධම්මිකා වාදානුපාතා ගාරය්හා ඨානා ආගච්ඡන්ති.

යෙපි තෙ පරිබ්බාජකා අහෙසුං **උක්කලා වස්ස-භඤ්ඤා** අහෙතුවාදා, අකිරියවාදා, නත්ථිකවාදා. තෙපි ඉමානි චත්තාරි ධම්මපදානි න ගරහිතබ්බං න පටික්කොසි තබ්බං අමඤ්ඤිංසු. තං කිස්ස හෙතු: නින්දාබ්‍යාරොසා උපාරම්භභයාති.

71. අබ්‍යාපන්නො සදා සතො අජ්ඣත්තං සුසමාහිතො,
අභිජ්ඣාවිනයෙ සික්ඛං අප්පමත්තොති වුච්චතීති.

## උරුවෙලවග්ගො තතියො.

**තස්සුද්දානං:**

ද්වෙ උරුවෙලා ලොකො කාළිකො බ්‍රහ්මචරියෙන පඤ්චමං,
කුහං සන්තුට්ඨි වංසො ධම්මපදං පරිබ්බාජකෙන චාති.

පිරිවැජියෙනි, යමෙක් “මම තෙල සම්‍යක්සමාධිධර්මපදය හැරපියා සමාධිගත නො වූ විභ්‍රාන්ත සිත් ඇතියකු මහණකු හෝ බමුණකු හෝ කොට පණවන්නෙමි” මෙසේ බෙණේ නම්, එබන්හි දී මම ඔහුට මෙසේ කියමි: “එන්නෙ යැ. කියන්නෙ යැ. පවසන්නෙ යැ. ඔහුගේ අනුභාවය දක්මි” යි.

පිරිවැජියෙනි, හෙතෙම එකාන්තයෙන් සම්‍යක්සමාධිධර්මපදය හැරපියා සමාධිගත නො වූ විභ්‍රාන්ත සිත් ඇතියකු මහණකු හෝ බමුණකු හෝ කොට පණවන්නේ ය යන තෙල කරුණ විද්‍යමාන නො වේ.

පිරිවැජියෙනි, යමෙක් මේ සතර ධර්මපදයන් ගැරැහියැ යුතු කොට බැහැරැලියැ යුතු කොට හඟනේ නම්, ඔහුට මෙලොවහි මැ සහෙතුක වූ ගර්හණීයස්ථාන වූ සතර වැදෑරුම් වාදප්‍රවාතීහු කෙනෙක් එති. කවර සතර කෙනෙක යත්:

ඉදින් භවත් අනභිධ්‍යාධර්මපදය ගරහනේ නම්, බැහැරලා නම්, අභිධ්‍යා බහුල කොට ඇති වස්තුකාමයෙහි තීව්‍රසංරාග ඇති යම් මහණබමුණු කෙනෙක් ඇද් ද, ඔහු භවත්හු විසින් පූජ්‍යයහ. ඔහු භවත්හු විසින් ප්‍රශස්‍යයහ.

ඉදින් භවත් අව්‍යාපාදධර්මපදය ගරහනේ නම්, බැහැරලා නම්, ව්‍යාපාදයට වත් සිත් ඇති ප්‍රදුෂ්ට වූ මනසඞ්කල්ප ඇති යම් මහණබමුණු කෙනෙක් ඇද් ද, ඔහු භවත්හු විසින් පූජ්‍යයහ. ඔහු භවත්හු විසින් ප්‍රශස්‍යයහ.

ඉදින් භවත් සම්‍යක්ස්මෘතිධර්මපදය ගරහා නම්, බැහැරලා නම්, මුළාසිහි ඇති සම්ප්‍රජ්ඤාන නැති යම් මහණබමුණු කෙනෙක් ඇද් ද, ඔහු භවත්හු විසින් පූජ්‍යයහ. ඔහු භවත්හු විසින් ප්‍රශස්‍යයහ.

ඉදින් භවත් සම්‍යක්සමාධි ධර්මපදය ගරහා නම්, බැහැරලා නම්, සමාහිත නො වූ විභ්‍රාන්ත සිත් ඇති යම් මහණබමුණු කෙනෙක් ඇද් ද, ඔහු භවත්හු විසින් පූජ්‍යයහ. ඔහු භවත්හු විසින් ප්‍රශස්‍යයහ.

පිරිවැජයෙනි, යමෙක් මේ සතර ධර්මපදයන් ගැරැහියැ යුතු කොට බැහැරැලියැ යුතු කොට හඟනේ නම්, ඔහුට මෙලොවහි මැ සකාරණ වූ ගර්හණීයස්ථාන වූ මේ සතර වැදෑරුම් වාදානුපාතයෝ එති.

පිරිවැජියෙනි, උක්කලදනව්වැසි වස්ස යැ භඤ්ඤ යැ යන අහෙතුවාද අක්‍රියාවාද නාස්තිකවාද ඇති යම් ඒ වාදීහු දෙ දෙනෙක් වූහු ද, ඔහුත් මේ සතර ධර්මපදයන් ගැරැහියැ යුතු කොට නෙරැලියැ යුතු කොට නො සිතූහු. ඒ කවර හෙයින යත්: නින්දාබියෙන් හා ඝට්ටනබියෙන් හා උපවාදබියෙන් හා ය' යි.

71. ව්‍යාපාදයට නො වත් සිත් ඇති හැමකල සමෘතිමත් ධාමා කෙරෙහි ලා මොනොවට සමාධිගත වූ අභිධ්‍යාවිනය සඞ්ඛ්‍යාත අභීත්වඩයෙහි හික්මෙනු–යේ අප්‍රමත්ත යයි කියනු ලැබේ.

## උරුවෙල වර්ගය තුන්වැනි යි.

**එහි උද්දානය:**

උරුවෙලසූත්‍ර දෙක යැ, ලෝකසූත්‍ර යැ, කාළික (කාළකාරාම) සූත්‍ර යැ, පස්වැනි බ්‍රහ්මචරියසූත්‍ර යැ, කුහකසූත්‍ර යැ, සන්තුට්ඨිසූත්‍ර යැ, වංසසූත්‍ර යැ, ධම්මපද සූත්‍ර යැ, පරිබ්බාජකසූත්‍ර දැ යි (මෙසින් වර්ගය පිරෙයි)



Free Distribution www.aathaapi.org

# 4. චක්කවග්ගො.

## 4. 1. 4. 1

### [ චක්කසුත්තං ]

[සාවත්ථිනිදානං:]

31. චත්තාරිමානි භික්ඛවෙ චක්කානි යෙහි සමන්නාගතානං දෙවමනුස්සානං චතුචක්කං වත්තති, යෙහි සමන්නාගතා දෙවමනුස්සා නචිරස්සෙව මහන්තත්තං වෙපුල්ලත්තං පාපුණන්ති භොගෙසු.

කතමානි චත්තාරි? පතිරූපදෙසවාසො, සප්පුරිසූපස්සයො, අත්තසම්මාපණිධි, පුබ්බෙ ච කතපුඤ්ඤතා.

ඉමානි ඛො භික්ඛවෙ චත්තාරි චක්කානි, යෙහි සමන්නාගතානං දෙවමනුස්සානං චතුචක්කං වත්තති, යෙහි සමන්නාගතා දෙවමනුස්සා න චිරස්සෙව මහන්තත්තං වෙපුල්ලත්තං පාපුණන්ති භොගෙසූති.

72. පතිරූපෙ[1] වසෙ දෙසෙ අරියමිත්තකරො[2] සියා,
සම්මාපණිධිසම්පන්නො පුබ්බෙ පුඤ්ඤකතො නරො,
ධඤ්ඤං ධනං යසො කිත්ති සුඛං චෙතාධිවත්තතීති.[3]

## 4. 1. 4. 2

### [ සඞ්ගහවත්ථුසුත්තං ]

32. චත්තාරිමානි භික්ඛවෙ සඞ්ගහවත්ථූනි.

කතමානි චත්තාරි? දානං, පෙය්‍යවජ්ජං, අත්ථචරියා, සමානත්තතා.

ඉමානි ඛො භික්ඛවෙ චත්තාරි සඞ්ගහවත්ථූනීති.

73. දානං ච පෙය්‍යවජ්ජඤ්ච අත්ථචරියා ච යා ඉධ,
සමානත්තතා ච ධම්මෙසු තත්ථ තත්ථ යථාරහං,
එතෙ ඛො සඞ්ගහා ලොකෙ රථස්සාණීව යායතො.

74. එතෙ ච සඞ්ගහා නාස්සු න මාතා පුත්තකාරණා,
ලභෙථ මානං පූජං වා පිතා වා පුත්තකාරණා.

75. යස්මා ච සඞ්ගහා එතෙ සමවෙක්ඛන්ති පණ්ඩිතා,
තස්මා මහත්තං පප්පොන්ති පාසංසා ච භවන්ති තෙ'ති.

## 4. 1. 4. 3.

### [ සීහසුත්තං ]

33. සීහො භික්ඛවෙ මිගරාජා සායන්හසමයං ආසයා නික්ඛමති. ආසයා නික්ඛමිත්වා විජම්භති. විජම්භිත්වා සමන්තා චතුද්දිසා අනුවිලොකෙති. සමන්තා චතුද්දිසා අනුවිලොකෙත්වා තික්ඛත්තුං සීහනාදං නදති. තික්ඛත්තුං සීහනාදං නදිත්වා ගොචරාය පක්කමති. යෙ ඛො පන තෙ භික්ඛවෙ තිරච්ඡානගතා පාණා සීහස්ස මිගරඤ්ඤො නදතො සද්දං සුණන්ති, තෙ යෙභුය්‍යෙන භයං සංවෙගං සන්තාසං ආපජ්ජන්ති. බිලං බිලාසයා පවිසන්ති. දකං දකාසයා පවිසන්ති. වනං වනාසයා පවිසන්ති. ආකාසං පක්ඛිනො භජන්ති.

1. පටිරූපෙ - ස්‍යා: 2. අරියමිත්තකරො - ස්‍යා: 3. චෙතං සිවත්තති - ස්‍යා සීමු.

# 4. චක්ක වර්ගය.

## 4. 1. 4. 1

### [ චක්ක සූත්‍රය ]

**[සැවැත් නිදානයි:]**

31. මහණෙනි, යමෙකින් සමන්වාගත දෙවිමිනිස්නට චතුඃසම්පච්චක්‍ර රඳා පවත්නේ ද, යමෙකින් සමන්වාගත දෙවිමිනිස්හු මඳ කලෙකින් ම භොග-යෙහි මහත්බවට විපුලබවට පැමිණෙත් ද, එබඳු වූ මේ සතර චක්‍ර කෙනෙකි.

කවර සතර කෙනෙක යත්: ප්‍රතිරූපදෙශවාසය, සත්පුරුෂ භජනය, තමන් මොනොවට (ශ්‍රද්ධාදියෙහි) පිහිටුවා ගැන්ම ය, පෙර කළ පින් ඇති බව යි.

මහණෙනි, යමෙකින් සමන්වාගත දෙවිමිනිස්නට චතුශ්චක්‍ර රඳා පවත්නේ ද, යමෙකින් සමන්වාගත දෙවිමිනිස්හු මඳ කලෙකින් ම භොගයෙහි මහත්බවට විපුලබවට පැමිණෙත් ද, එබඳු වූ මේ සතර චක්‍රසම්පත්හු යි.

72. මිනිස් ප්‍රතිරූපදෙශයෙහි වසන්නේ ය. බුද්ධාදී ආර්‍යයන්ගේ සිත් අරියනුවෙක් වන්නේ ය. සම්‍යක් චිත්තප්‍රණිධියෙන් සමන්වාගත වන්නේ ය. පෙර කළ පින් ඇතියෙක් වන්නේ ය. ධාන්‍යය ද ධනය ද යශස් ද කීර්ති ද සුඛ ද යන මේ තෙල මිනිසා වතුරන්නේ ය.

## 4 1. 4. 2

### [ සඞ්ගහවත්ථු සූත්‍රය ]

32. මහණෙනි, මේ සංග්‍රහ වස්තූහු සතර දෙනෙකි.

කවර සතර දෙනෙක යත්: දානය, ප්‍රියවචනය, අර්ථචර්‍යාය, සමානාත්-මතා යි.

මහණෙනි, මේ සතර සඞ්ග්‍රහ වස්තූහු යි.

73. මෙලොව යම් දානයෙක් වේ ද, යම් ප්‍රිය වචනයෙක් වේ ද, යම් අර්ථසංවර්ධනකර්‍යයෙක් වේ ද, ඒ ඒ ධර්මයෙහි යථාභිමතයෙන් සුඛදුඃඛ විසින් සමානාත්මතායෙක් වේ ද, ලොකයෙහි සිටුනා තෙල සඞ්ග්‍රහයෝ ගමන්ගත් රථයාගේ අකුරග ගැසූ ඇණය මැනියහ.

74. තෙල සංග්‍රහයෝ නො වෙත් නම්, මවු පුතු කාරණ කොට ගෙණ බුහුමන් හෝ පිදුම් හෝ නො ලබයි. පුතු කාරණ කොට ගෙණ පියා හෝ (මාතාදිය) නො ලබයි.

75. යම් හෙයෙකින් පඬිහු තෙල සඞ්ග්‍රහයන් මොනොවට දකිත් ද, එහෙයින් ඔහු මහත්ත්වයට පැමිණෙත්, ප්‍රශස්‍ය ද වෙති.

## 4. I. 4. 3

### [ සීහ සූත්‍රය ]

33. මහණෙනි, මෘගරාජන් වූ සිංහ සවස් වෙලෙහි වසන තැනින් නික්මෙයි. වාසයෙන් නික්ම වජඹයි. වැජඹ අවට සතර දික් බලයි. හාත්පස සිවුදිගුන් බලා තුන් යලක් සිහනද කෙරෙයි. තුන් යලක් සිංහනාද කොට ගොදුරට යෙ යි. මහණෙනි, යම් තිරිසන්ගිය ප්‍රාණීහු නද කරණ මෘගරාජන් වූ සිංහයාගේ නාද අසත් ද, ඔහු බෙහෙවින් භයට සංවෙගයට සන්ත්‍රාසයට පැමිණෙත්. බිලවාසීහු බිලට වදිත්. උදකවාසීහු දියට වදිත්. වනවාසීහු වලට වදිත්. පක්ෂීහු අහස බෙජෙත්.

යෙපි තෙ භික්ඛවෙ රඤ්ඤො නාගා ගාමනිගමරාජධානීසු දළ්හෙහි වරත්තෙහි බන්ධනෙහි බද්ධා, තෙපි තානි බන්ධනානි සඤ්ඡින්දිත්වා සම්පදාලෙත්වා භීතා මුත්තකරීසං චජමානා යෙන වා තෙන වා පලායන්ති. එවං මහිද්ධිකො ඛො භික්ඛවෙ සීහො මිගරාජා තිරච්ඡානගතානං පාණානං එවං මහෙසක්ඛො එවං මහානුභාවො.

එවමෙව ඛො භික්ඛවෙ යදා තථාගතො ලොකෙ උප්පජ්ජති අරහං සම්මාසම්බුද්ධො විජ්ජාචරණසම්පන්නො සුගතො ලොකවිදූ අනුත්තරො පුරිසදම්මසාරථි සත්ථා දෙවමනුස්සානං බුද්ධො භගවා. සො ධම්මං දෙසෙති: 'ඉති සක්කායො, ඉති සක්කායසමුදයො, ඉති සක්කායනිරොධො, ඉති සක්කායනිරොධගාමිනී පටිපදා'ති.

යෙපි තෙ භික්ඛවෙ දෙවා දීඝායුකා වණ්ණවන්තො සුඛබහුලා උච්චෙසු විමානෙසු චිරට්ඨිතිකා, තෙපි තථාගතස්ස ධම්මදෙසනං සුත්වා යෙභුය්‍යෙන භයං සංවෙගං සන්තාසං ආපජ්ජන්ති.

අනිච්චා වත කිර භො මයං සමානා නිච්චම්හා'ති අමඤ්ඤිම්හ. අද්ධුවා වත කිර භො මයං සමානා ධුවම්හා'ති අමඤ්ඤිම්හ. අසස්සතා වත කිර භො මයං සමානා සස්සතම්හා'ති අමඤ්ඤිම්හ. මයම්පි කිර භො අනිච්චා අද්ධුවා අසස්සතා සක්කායපරියාපන්නා'ති.

එවං මහිද්ධිකො ඛො භික්ඛවෙ තථාගතො සදෙවකස්ස ලොකස්ස. එවං මහෙසක්ඛො එවං මහානුභාවොති.

76. යදා බුද්ධො අභිඤ්ඤාය ධම්මචක්කං පවත්තයි,
සදෙවකස්ස ලොකස්ස සත්ථා අප්පටිපුග්ගලො.

77. සක්කායඤ්ච නිරොධඤ්ච සක්කායස්ස ච සම්භවං,
අරියං චට්ඨඞ්ගිකං මග්ගං දුක්ඛූපසමගාමිනං.

78. යෙපි දීඝායුකා දෙවා වණ්ණවන්තො යසස්සිනො,
භීතා සන්තාසමාපාදුං සීහස්සෙවිතරෙ මිගා.

79. අවීතිවත්තා සක්කායං අනිච්චා කිර භො මයං,
සුත්වා අරහතො වාක්‍යං විප්පමුත්තස්ස තාදිනො'ති.

1 උදකා උදකාසයා - මජසං

මහණෙනි, ගම් නියම්ගම් රජදහන්හි දළ සම්මුවා යොත්බහනින් බැඳ ලූ රජකීය යම් හස්තීහු ඇත් ද, ඔහු දු ඒ බහන් සිඳ බිඳ බියපත් වූවාහු මලමූ හෙළමින් හිස් ලූ ලූ අත පලත්. මහණෙනි, එවැනි මහත් ඉදුහ ඇති සිංහ මෘගරජ තිරිසන්ගිය සතුනට එවැනි මහේශාඛ්‍ය වෙයි. එවැනි මහානුභාව වෙයි.

මහණෙනි, එපරිදි ම යම් කලෙක අර්හත් වූ සම්‍යක්සම්බුද්ධ වූ විද්‍යාචරණසම්පන්න වූ සුගත වූ ලොකවිද් වූ අනුත්තර වූ පුරුෂදම්‍යසාරථි වූ දෙව් මිනිස්නට ශාස්තෘ වූ සිවුසස් අවබොධ කළා වූ භාග්‍යවත් වූ තථාගතයන් වහන්සේ ලොකයෙහි උපදනා සේක් ද, උන්වහන්සේ දහම් දෙසන සේක: සත්කාය මේ ය, සත්කායසමුදය මේ ය, සත්කායනිරොධය මේ ය, සත්කායනිරොධගාමිනී ප්‍රතිපත් මේ ය, කියා යි.

මහණෙනි, දීර්ඝායුෂ්ක වූ ශරීරවර්ණයෙන් වර්ණවත් වූ සුඛබහුල වූ උස් විමානයෙහි චිරස්ථායී ව සිටුනා වූ යම් දෙවි කෙනෙක් ඇත් ද, ඔහුත් තථාගතයන් වහන්සේගේ දම්දෙසුම් අසා බොහොසෙයින් භයට සංවේගයට සන්ත්‍රාසයට වදිත්.

“භවත්නි, අපි ඒකාන්තයෙන් අනිත්‍ය ව සිටියමෝ නිත්‍යයම්හ යි සිතුම්හ භවත්නි, අපි ඒකාන්තයෙන් අධ්‍රැව වූවමෝ ධ්‍රැවයම්හ යි සිතුම්හ. භවත්නි, අපි ඒකාන්තයෙන් අශාශ්වත වූවමෝ ශාශ්වතයම්හ යි සිතුම්හ. භවත්නි, අපි වූකලී අනිත්‍යයම්හ, අධ්‍රැවයම්හ, අශාශ්වතයම්හ. පඤ්චස්කන්ධපර්යාපන්නයම්හ” යි කියා යි.

මහණෙනි, සදේවක ලෝකයාට තථාගතයන් වහන්සේ එවැනි මහර්ධි ඇතියහ. එවැනි මහේශාඛ්‍යයහ. එවැනි මහානුභාවයහ.

76-77. ශාස්තෘ වූ, සදෘශපුද්ගලරහිත වූ තථාගතයන් වහන්සේ යම් කලෙක චතුස්සත්‍යාවබොධ කොට ගෙණ සදෙවක ලොකයාහට පඤ්චස්කන්ධය ද එහි නිරොධය ද පඤ්චස්කන්ධසමුදය ද දුක් සන්හිඳීම වූ නිවන් කරා යන අරිඅටඟි මග ද යි ධර්මචක්‍රය (දෙශනාඥානයෙන්) පැවැත් වූ සේක් ද.

78-79 (ලාභාදියෙහි) තාදී වූ කෙලෙසුන් කෙරෙන් මිදුනු අර්හත් ඒ බුදුන්ගේ බස් අසා, “භවත්නි, අපි පඤ්චස්කන්ධය පැන නොගියම්හු ලු, අනිත්‍යයම්හු ලු” යි කියා, ශරීරවර්ණයෙන් වර්ණවත් වූ යශස්වී වූ දීර්ඝායුෂ්ක වූ යම් දෙවියෝ ඇත් ද ඔහු සිංහරාජයාට ඉතරමෘගයන් බියපත් වන්නා සෙයින් බිය වැදුනාහු සංත්‍රාසයට වැටුනාහ.

## 4. 1. 4. 4

### [ අග්ගප්පසාදසුත්තං ]

34. චත්තාරො'මෙ භික්ඛවෙ අග්ගප්පසාදා. කතමෙ චත්තාරො?

යාවතා භික්ඛවෙ සත්තා අපදා වා දිපදා වා චතුප්පදා වා බහුප්පදා වා රූපිනො වා අරූපිනො වා සඤ්ඤිනො වා අසඤ්ඤිනො වා නෙවසඤ්ඤි-නාසඤ්ඤිනො වා, තථාගතො තෙසං අග්ගමක්ඛායති අරහං සම්මාසම්බුද්ධො. යෙ භික්ඛවෙ බුද්ධෙ පසන්නා, අග්ගෙ තෙ පසන්නා, අග්ගෙ ඛො පන පසන්නානං අග්ගො විපාකො හොති.

යාවතා භික්ඛවෙ ධම්මා සඞ්ඛතා, අරියො අට්ඨඞ්ගිකො මග්ගො තෙසං අග්ගමක්ඛායති. යෙ භික්ඛවෙ අරියෙ අට්ඨඞ්ගිකෙ මග්ගෙ පසන්නා, අග්ගෙ තෙ පසන්නා. අග්ගෙ ඛො පන පසන්නානං අග්ගො විපාකො හොති.

යාවතා භික්ඛවෙ ධම්මා සඞ්ඛතා වා අසඞ්ඛතා වා, විරාගො තෙසං ධම්මානං අග්ගමක්ඛායති. යදිදං මදනිම්මදනො පිපාසවිනයො ආලය-සමුග්ඝාතො වට්ටුපච්ඡෙදො තණ්හක්ඛයො විරාගො නිරොධො නිබ්බානං. යෙ භික්ඛවෙ ධම්මෙ පසන්නා, අග්ගෙ තෙ පසන්නා. අග්ගෙ ඛො පන පසන්නානං අග්ගො විපාකො හොති.

යාවතා භික්ඛවෙ සඞ්ඝා වා ගණා වා, තථාගතසාවකසඞ්ඝො තෙසං අග්ගමක්ඛායති. යදිදං චත්තාරි පුරිසයුගානි අට්ඨපුරිසපුග්ගලා එස භගවතො සාවකසඞ්ඝො ආහුනෙය්‍යො පාහුණෙය්‍යො දක්ඛිණෙය්‍යො අඤ්ජලිකරණීයො අනුත්තරං පුඤ්ඤක්ඛෙත්තං ලොකස්ස. යෙ භික්ඛවෙ සඞ්ඝෙ පසන්නා, අග්ගෙ තෙ පසන්නා. අග්ගෙ ඛො පන පසන්නානං අග්ගො විපාකො හොති

ඉමෙ ඛො භික්ඛවෙ චත්තාරො අග්ගප්පසාදාති.

80. අග්ගතො වෙ පසන්නානං අග්ගං ධම්මං විජානතං,
අග්ගෙ බුද්ධෙ පසන්නානං දක්ඛිණෙය්‍යෙ අනුත්තරෙ.

81. අග්ගෙ ධම්මෙ පසන්නානං විරාගූපසමෙ සුඛෙ,
අග්ගෙ සඞ්ඝෙ පසන්නානං පුඤ්ඤක්ඛෙත්තෙ අනුත්තරෙ.

82. අග්ගස්මිං දානං දදතං අග්ගං පුඤ්ඤං පවඩ්ඪති,
අග්ගං ආයුං[1] ච වණ්ණො ච යසො කිත්ති සුඛං බලං.

83. අග්ගස්ස දාතා මෙධාවී අග්ගධම්මසමාහිතො,
දෙවභූතො මනුස්සො වා අග්ගප්පත්තො පමොදතීති.

---

1. ආයුඤ්ච - මජසං

## 4. 1. 4. 4.

## [ අග්ගප්පසාද සූත්‍රය ]

34. මහණෙනි, මේ අග්‍රප්‍රසාදයෝ සතර දෙනෙකි. කවර සතර දෙනෙක යත්:

මහණෙනි, පා නැති හෝ දෙපා ඇති හෝ සියුපා ඇති හෝ බොහෝ පා ඇති හෝ රූපී වූ හෝ අරූපී වූ හෝ සංඥී වූ හෝ අසංඥී වූ හෝ නෙවසංඥීනාසංඥී (භවාග්‍රගත) වූ හෝ යම් පමණ සත්ත්වයෝ ඇත් ද, ඔවුනට අර්හත් සම්‍යක්සම්බුද්ධ තථාගතයන් වහන්සේ අග්‍රයයි කියනු ලැබෙත්. මහණෙනි, යම් කෙනෙක් බුදුන් කෙරෙහි ප්‍රසන්න වෙත් ද, ඔහු අග්‍රස්ථානයෙහි ප්‍රසන්නයහ. අග්‍රස්ථානයෙහි ප්‍රසන්නයනට අග්‍රවිපාකයෙක් වෙයි.

මහණෙනි, යම් පමණ හේතුයෙන් නිපන් දහම්හු ඇත් ද, අරි අටඟිමග ඔවුනට අග්‍රය යි කියනු ලැබේ. මහණෙනි, යම් කෙනෙක් අරි අටඟි මඟෙහි ප්‍රසන්න වෙත් ද, ඔහු අග්‍රස්ථානයෙහි ප්‍රසන්නයහ. අග්‍රස්ථානයෙහි ප්‍රසන්නයනට අග්‍ර විපාකයෙක් වෙයි.

මහණෙනි, හේතුයෙන් නිපන්නා වූ හෝ හේතුයෙන් නො නිපන්නා වූ හෝ යම් පමණ දහම්හු ඇත් ද, ඔවුනට නිවණ අග්‍රය යි කියනු ලැබේ. රාගාදි මද මඩනා, පවස් සන්හිඳුවනා, ආලයතෘෂ්ණා නසනා, වටදුක් සිඳලනා, තෘෂ්ණාක්ෂය කරණ, විගතරාග ඇති, නිරෝධ සඞ්ඛ්‍යාත නිවණෙක් ඇත් ද, එය යි. මහණෙනි, යම් කෙනෙක් විරාගධර්මයෙහි ප්‍රසන්න වෙත් ද, ඔහු අග්‍රස්ථානයෙහි ප්‍රසන්නයහ. අග්‍රස්ථානයෙහි ප්‍රසන්නයනට අග්‍රවිපාකයෙක් වෙයි.

මහණෙනි, යම් පමණ සඟහු හෝ වෙත් ද, ගණහු හෝ වෙත් ද, තථාගතශ්‍රාවකසඞ්ඝ ඔවුනට අග්‍රය යි කියනු ලැබේ. යම් සතර පුරුෂයුග කෙනෙක් වෙත් ද, අෂ්ටායී පුද්ගල කෙනෙක් වෙත් ද, බුදුන් ගේ මේ ශ්‍රාවක සඞ්ඝ තෙමේ ආහුන සඞ්ඛ්‍යාත සත්කාරයට නිසිය, පාහුණ සඞ්ඛ්‍යාත ආගන්තුක සත්කාරයට නිසිය, දක්ෂිණාවට නිසිය, අඤ්ජලිකරණයට නිසිය, ලෝකයාහට අනුත්තර පුණ්‍යක්ෂෙත්‍රය වෙයි. මෙබඳු ශ්‍රාවකසඞ්ඝයා යි. මහණෙනි, යම් කෙනෙක් සඟුන් කෙරෙහි ප්‍රසන්න වෙත් ද, ඔහු අග්‍රස්ථානයෙහි ප්‍රසන්නයහ. අග්‍රස්ථානයෙහි ප්‍රසන්නයනට අග්‍රවිපාකයෙක් වෙයි.

මහණෙනි, මේ සතර අග්‍රප්‍රසාදයෝ ය.

80. අග්‍රස්ථානයෙහි එකැහිත් පහන් වූ අග්‍ර චතුසත්‍යධර්මය දන්නා වූ, දක්ෂිණාර්හ වූ අනුත්තර වූ අග්‍ර වූ බුදුන් කෙරෙහි පහන් ඇත්තනට –

81. විරාගොපශමසුඛ සඞ්ඛ්‍යාත අග්‍රධර්මයෙහි පහන් ඇත්තනට, පුණ්‍යක්ෂෙත්‍ර වූ අනුත්තර වූ අග්‍ර සඞ්ඝයා කෙරෙහි පහන් ඇත්තනට –

82. අග්‍රස්ථානයෙහි ලා දන් දෙන ඇත්තනට අග්‍ර පින් වැඩේ. අග්‍ර වූ ආයුෂය, වර්ණය, යශස, කීර්තිය, සුඛය, බලය ද ලැබේ.

83. අග්‍ර වූ ශ්‍රද්ධාදි ධර්මයෙන් යුක්ත වූයේ අග්‍ර වූ සඞ්ඝරත්නය විෂයෙහි දන් දෙන ප්‍රඥාවත නුවණ ඇතියේ දෙව්බවට පැමිණියේ හෝ මිනිසත්බවට පැමිණියේ හෝ අග්‍රප්‍රාප්ත ව සතුටු වෙයි.

## 4. 1. 4 5

### [ වස්සකාරසුත්තං ]

35. එකං සමයං භගවා **රාජගහෙ** විහරති වෙළුවනෙ **කලන්දකනිවාපෙ.** අථ ඛො **වස්සකාරො** බ්‍රාහ්මණො මගධමහාමත්තො යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවතා සද්ධිං සම්මොදි. සම්මොදනීයං කථං සාරාණීයං වීතිසාරෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නො ඛො වස්සකාරො බ්‍රාහ්මණො මගධමහාමත්තො භගවන්තං එතදවොච:

චතූහි ඛො මයං භො ගොතම ධම්මෙහි සමන්නාගතං මහාපඤ්ඤං මහාපුරිසං පඤ්ඤපෙම. කතමෙහි චතූහි?

ඉධ භො ගොතම බහුස්සුතො හොති තස්ස තස්සෙව සුතජාතස්ස. තස්ස තස්සෙව ඛො පන භාසිතස්ස අත්ථං ජානාති 'අයං ඉමස්ස භාසිතස්ස අත්ථො, අයං ඉමස්ස භාසිතස්ස අත්ථො'ති. සතිමා ඛො පන හොති චිරකතම්පි චිරභාසිතම්පි සරිතා අනුස්සරිතා. යානි ඛො පන තානි ගහට්ඨකානි කිඞ්කරණීයානි, තත්ථ දක්ඛො හොති, අනලසො තත්‍රුපායවීමංසාය සමන්නාගතො අලං කාතුං අලං සංවිධාතුං. ඉමෙහි ඛො මයං භො ගොතම චතූහි ධම්මෙහි සමන්නාගතං මහාපඤ්ඤං මහාපුරිසං පඤ්ඤපෙම. සචෙ පන මෙ භො ගොතම අනුමොදිතබ්බං, අනුමොදතු මෙ භවං ගොතමො. සචෙ පන මෙ භො ගොතම පටික්කොසිතබ්බං, පටික්කොසතු මෙ භවං ගොතමොති.

නෙව ඛො ත්‍යාහං බ්‍රාහ්මණ අනුමොදාමි. න පන පටික්කොසාමි. චතූහි ඛො අහං බ්‍රාහ්මණ ධම්මෙහි සමන්නාගතං මහාපඤ්ඤං මහාපුරිසං පඤ්ඤපෙමි. කතමෙහි චතූහි?

ඉධ බ්‍රාහ්මණ බහුජනහිතාය පටිපන්නො හොති බහුජනසුඛාය බහු'ස්ස ජනතා අරියෙ ඤායෙ පතිට්ඨාපිතා, යදිදං කල්‍යාණධම්මතා කුසලධම්මතා.

සො යං විතක්කං ආකඞ්ඛති විතක්කෙතුං, තං විතක්කං විතක්කෙති. යං විතක්කං නාකඞ්ඛති විතක්කෙතුං, න තං විතක්කං විතක්කෙති. යං සඞ්කප්පං ආකඞ්ඛති සඞ්කප්පෙතුං, තං සඞ්කප්පං සඞ්කප්පෙති. යං සඞ්කප්පං නාකඞ්ඛති සඞ්කප්පෙතුං, න තං සඞ්කප්පං සඞ්කප්පෙති. ඉති චෙතොවසිප්පත්තො හොති විතක්කපථෙසු.

චතුන්නං ඣානානං ආභිචෙතසිකානං දිට්ඨධම්මසුඛවිහාරානං නිකාමලාභී හොති අකිච්ඡලාභී අකසිරලාභී.

ආසවානං ඛයා අනාසවං චෙතොවිමුත්තිං පඤ්ඤාවිමුත්තිං දිට්ඨෙව ධම්මෙ සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරති.

## 4. 1. 4. 5.

## [ වස්සකාර සූත්‍රය ]

35. එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ රජගහ නුවර සමීපයෙහි (ලෙහෙනුන්ට මැවුප් දුන් හෙයින්) කලන්දකනිවාප* නම් වූ වෙළුවනයෙහි වැඩ වසන සේක. එක්බිති මගධමහාමාත්‍ය වූ වස්සකාර බමුණු බුදුන් කරා එළඹියේ ය. එළඹ බුදුන් සමග සතුටු විය. සමෝදනයට නිසි සිහිකරනට නිසි කථා කොට නිමවා එකත්පස්ව හුන්නේ ය. එකත්පස්ව හුන් මගධමහාමාත්‍ය වස්සකාර බමුණු බුදුනට මෙල සැළ කෙළේ ය.

භවත් ගෞතමයන් වහන්ස, අපි සතර කරුණෙකින් සමන්වාගත වූ මහාප්‍රාඥයා මහාපුරුෂයකු කොට පණවම්හ. කවර සතර කරුණෙක යත්:

භවත් ගෞතමයන් වහන්ස, මෙලොව්හි ඒ ඒ ශ්‍රැතජාතය පිළිබඳ බහු-ශ්‍රැතයෙක් වෙයි. "මේ මෙල භාෂිතයාගේ අර්ථය, මේ මෙල භාෂිතයාගේ අර්ථය" යි කියා ඒ ඒ භාෂිතය පිළිබඳ අර්ථය දන්නේ වෙයි. පෙර කළ දෑ පෙර වුණු දෑ සිහි කරණ, පුන පුනා ගොස් සිහි කොට ගන්නා සමෘති ඇතියෙක් වෙයි. ගිහිගෙහි වැටෙන, කුම් කෙරෙම්දැ යි විමසා කළ යුතු යම් ඒ දෑ ඇත් ද, එහි ලා අනලස් වූ එහි ලා උපායවීමංසායෙන් සමන්වාගත වූ කරන්නට පොහොසත් සංවිධානයට පොහොසත් දක්‍ෂයෙක් වෙයි. භවත් ගෞතමයන් වහන්ස, අපි මේ සතර කරුණෙන් සමන්වාගත මහාප්‍රාඥයා මහාපුරුෂයකු කොට පණවම්හ. භවත් ගෞතමයන් වහන්ස, ඉදින් මබස අනුමෙවිය යුතු නම් භවත් ගෞතමයන් වහන්සේ මබස අනුමෝදන් කෙරෙත්වා. භවත් ගෞතමයන් වහන්ස, ඉදින් මබස නෙරලිය යුතු නම් භවත් ගෞතමයන් වහන්සේ මබස නෙරත්වා යි.

බමුණ, තාගේ වචනය මම අනුමෝදන් නො කරමි. නො ද බැහැර කරමි. බමුණ, මම සතර කරුණෙකින් සමන්වාගත මහපැණැතියා මහපුරිස් කොට පණවමි. කවර සතර කරුණෙක යත්:

බමුණ, මෙලොව බොහෝ දෙනාට හිත පිණිස, බොහෝ දෙනාට සුව පිණිස පිළිපන්නෙක් වෙයි. ඔහු විසින් කල්‍යාණධර්මතා සඞ්ඛ්‍යාත, කුශලධර්මතා සඞ්ඛ්‍යාත විඳුනු සඟගිය මගෙහි බොහෝ ජනතාව පිහිටුවන ලදු වෙයි.

හේ නෛෂ්ක්‍රම්‍යාදී යම් විතර්කයක් විතර්කනය කරන්නට කැමැති වේ ද, ඒ විතර්කය විතර්කනය කෙරෙයි. කාමාදී යම් විතර්කයක් විතර්කනය කරන්නට නො කැමැති වේ ද, ඒ විතර්කය විතර්කනය නො කෙරෙයි. යම් සංකල්පයක් සංකල්පනා කරන්නට කැමැති වේ ද, ඒ සංකල්පය සංකල්පනා කෙරෙයි. යම් සංකල්පයක් සංකල්පනා කරන්නට නො කැමැති වේ ද, ඒ සංකල්පය සංකල්පනා නො කෙරෙයි. මෙසේ විතර්කපථයෙහි චිත්තවශිප්‍රාප්ත වේ;

විශුද්ධචිත්තසංනිඃශ්‍රිත වූ දෘෂ්ටධර්මසුඛවිහරණ ඇති සතර වැදෑරුම් ධ්‍යාන කැමැති සේ ලබන සුල්ලේ, නිදුකින් ලබන සුල්ලේ, විපුල සේ ලබන සුල්ලේ වෙයි.

ආශ්‍රවක්‍ෂය කිරීමෙන් අනාශ්‍රව වූ චෙතොවිමුක්තිය හා ප්‍රඥාවිමුක්තිය දෘෂ්ටධර්මයෙහි ම තමන් විසින් ම විශිෂ්ටඥානයෙන් දැන ප්‍රත්‍යක්‍ෂ කොට ගෙණ ඇටිඇටිසඳ සමවැද වෙසෙයි,

---

* "කලන්දක නිවාසාඛ්‍ය රම්‍ය වෙණුවනාශ්‍රමෙ" කලන්දක (සිවුහුගේ) නිවාස නම් වූ මනරම් වේණුවනාශ්‍රමයෙහි — බෞද්ධ සංස්කෘත

නෙව ඛො ත්‍යාහං බ්‍රාහ්මණ අනුමොදමි. න පන පටික්කොසාමි. ඉමෙහි ඛො අහං බ්‍රාහ්මණ චතුහි ධම්මෙහි සමන්නාගතං මහාපඤ්ඤං මහාපුරිසං පඤ්ඤපෙමීති.

අච්ඡරියං භො ගොතම, අබ්භුතං භො ගොතම. යාවසුභාසිතං චිදං භොතා ගොතමෙන. ඉමෙහි ච මයං චතූහි ධම්මෙහි සමන්නාගතං භවන්තං ගොතමං ධාරෙම.

භවං හි ගොතමො බහුජනහිතාය පටිපන්නො බහුජනසුඛාය, බහු තෙ ජනතා අරියෙ ඤායෙ පතිට්ඨාපිතා යදිදං කල්‍යාණධම්මතා කුසලධම්මතා.

භවං හි ගොතමො යං විතක්කං ආකඞ්ඛති විතක්කෙතුං, තං විතක්කං විතක්කෙති. යං විතක්කං නාකඞ්ඛති විතක්කෙතුං, න තං විතක්කං විතක්කෙති. යං සඞ්කප්පං ආකඞ්ඛති සඞ්කප්පෙතුං, තං සඞ්කප්පං සඞ්කප්පෙති. යං සඞ්කප්පං නාකඞ්ඛති සඞ්කප්පෙතුං, න තං සඞ්කප්පං සඞ්කප්පෙති. භවං හි ගොතමො චෙතොවසිප්පත්තො විතක්කපථෙසු.

භවං හි ගොතමො චතුන්නං ඣානානං ආභිචෙතසිකානං දිට්ඨධම්මසුඛවිහාරානං නිකාමලාභී අකිච්ඡලාභී අකසිරලාභී.

භවං හි ගොතමො ආසවානං ඛයා අනාසවං චෙතොවිමුත්තිං පඤ්ඤාවිමුත්තිං දිට්ඨෙව ධම්මෙ සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරතීති.

අද්ධා ඛො තෙ බ්‍රාහ්මණ ආසජ්ජ උපනීයවාචා භාසිතා, අපි ච ත්‍යාහං ව්‍යාකරිස්සාමි:

අහං හි බ්‍රාහ්මණ බහුජනහිතාය පටිපන්නො බහුජනසුඛාය, බහු මෙ ජනතා අරියෙ ඤායෙ පතිට්ඨාපිතා යදිදං කල්‍යාණධම්මතා කුසලධම්මතා.

අහං හි බ්‍රාහ්මණ යං විතක්කං ආකඞ්ඛාමි විතක්කෙතුං, තං විතක්කං විතක්කෙමි. යං විතක්කං නාකඞ්ඛාමි විතක්කෙතුං, න තං විතක්කං විතක්කෙමි. යං සඞ්කප්පං ආකඞ්ඛාමි සඞ්කප්පෙතුං, තං සඞ්කප්පං සඞ්කප්පෙමි. යං සඞ්කප්පං නාකඞ්ඛාමි සඞ්කප්පෙතුං, න තං සඞ්කප්පං සඞ්කප්පෙමි.

අහං හි බ්‍රාහ්මණ චෙතොවසිප්පත්තො විතක්කපථෙසු. අහං හි බ්‍රාහ්මණ චතුන්නං ඣානානං ආභිචෙතසිකානං දිට්ඨධම්මසුඛවිහාරානං නිකාමලාභී අකිච්ඡලාභී අකසිරලාභී

අහං හි බ්‍රාහ්මණ ආසවානං ඛයා අනාසවං චෙතොවිමුත්තිං පඤ්ඤාවිමුත්තිං දිට්ඨෙව ධම්මෙ සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරාමීති.

Free Distribution www.aathaapi.org

බමුණ, තාගේ වචනය මම අනුමෝදන් නො කරමි. නො ද බැහැර කෙරෙමි. බමුණ, මේ සතර කරුණින් සමන්නාගත මහපැණැතියා මහපුරිස් කොට පණවමි.

භවත් ගෞතමයන් වහන්ස, ආශ්චර්ය්‍යය, භවත් ගෞතමයන් වහන්ස, අද්භූතය, භවත් ගෞතමයන් වහන්සේ විසින් තෙල බස පරමකොටින් සුභාෂිතය. අපි භවත් ගෞතමයන් වහන්සේ මේ සතර ධර්මයෙන් සමන්නා-ගතයකු කොට ධරම්හ.

භවත් ගෞතමයන් වහන්සේ වනාහි බොහෝ දෙනාට හිත පිණිස බොහෝ දෙනාට සුව පිණිස පිළිපන් සේක. මුඹ වහන්සේ විසින් බොහෝ ජනතාවක් කල්‍යාණධර්මතා කුශලධර්මතා සඞ්ඛ්‍යාත ආර්‍ය්‍යන්‍යායය යි කියන ලද විවසුන් සහගිය මගෙහි පිහිටුවන ලදු.

භවත් ගෞතමයන් වහන්සේ නෙක්ඛම්මාදී යම් විතර්කයක් විතර්කනයට කැමැති සේක් ද, ඒ විතක් විතර්කන සේක. යම් කාමාදි විතර්කයක් විතර්කන්-නට නො කැමැති සේක් ද, ඒ විතක් නො විතර්කන සේක. යම් සංකල්පයක් සංකල්පනය කිරීමට කැමැති සේක් ද, ඒ සංකල්පය සංකල්පනය කරණ සේක. යම් සංකල්පයක් සංකල්පනා කරන්නට නො කැමැති සේක් ද, ඒ සංකල්පනාව සංකල්පනා නො කරණ සේක. භවත් ගෞතමයන් වහන්සේ විතර්ක පථයෙහි චිත්තවශී ප්‍රාප්තයහ.

භවත් ගෞතමයන් වහන්සේ වනාහි විශුද්ධ චිත්ත සංනිඃශ්‍රිත වූ ඉහාත්ම සුඛ විහරණ ඇති සිව් දැහැන් කැමැති සේ ලබන සුල්ලභ. නිදුකින් ලබන සුල්ලභ. විපුල කොට ලබන සුල්ලභ.

භවත් ගෞතමයන් වහන්සේ ආශ්‍රවයන් ක්‍ෂය කිරීමෙන් අනාශ්‍රව වූ ඵලසමාධිය ඵලප්‍රඥාව ඉහාත්මයෙහි ම තමන් වහන්සේ වෙසෙසින් දැන පසක් කොට ගෙණ සමවැද වසන සේක.

බමුණ, තා විසින් සටා එළවා තෙපුලෙක් ඒකාන්තයෙන් ම බණන ලදී. වැළිත් තාහට මම එළි කොට කියන්නෙමි.

බමුණ, මම වනාහි බහුජනහිතය පිණිස, බහුජනසුවය පිණිස පිළිපන්මි. මා විසින් කල්‍යාණධර්මතා කුශලධර්මතා සඞ්ඛ්‍යාත වූ ආර්‍ය්‍යන්‍යායය යි කියන ලද විවසුන් සහගිය මගෙහි බොහෝ ජනතාවක් පිහිටුවන ලදු.

බමුණ, මම යම් විතර්කයක් විතර්කන්නට කැමැතියෙම් ද, ඒ විතක් විතර්කමි. යම් විතර්කයක් විතර්කන්නට නො කැමැතියෙම් ද, ඒ විතක් නො විතර්කමි. යම් සංකල්පයක් සංකල්පනය පිණිස කැමැතියෙම් ද, ඒ සංකල්පය සංකල්පනා කරමි. යම් සංකල්පයක් සංකල්පනය පිණිස නො කැමැතියෙම් ද, ඒ සංකල්පය සංකල්පනා නො කරමි.

බ්‍රාහ්මණය, මම විතර්කපථයෙහි චිත්තවශීප්‍රාප්තයෙමි. බ්‍රාහ්මණය, මම විශුද්ධචිත්තසංනිඃශ්‍රිත වූ දෘෂ්ටධර්මසුඛ විහරණ වූ සිව් දැහැන් කැමැති සේ ලබන සුල්ලෙම් නිදුකින් ලබන සුල්ලෙම්, විපුල සේ ලබන සුල්ලෙම් වෙමි.

බ්‍රාහ්මණය, මම ආශ්‍රවයන් ක්‍ෂය කිරීමෙන් අනාශ්‍රව වූ ඵලසමාධිය හා ඵලප්‍රඥාව ඉහාත්මයෙහි ම තමා විසින් වෙසෙසින් දැන පසක් කොට සමවැද වෙසෙමි.

84 යො වෙදි සබ්බසත්තානං මච්චුපාසා පමොචනං,
හිතං දෙවමනුස්සානං ඤායං ධම්මං පකාසයී,
යං වෙ දිස්වා ච සුත්වා ච පසීදන්ති බහුජ්ජනො.

85. මග්ගාමග්ගස්ස කුසලො කතකිච්චො අනාසවො,
බුද්ධො අන්තිමසාරීරො මහාපඤ්ඤො මහාපුරිසොති වුච්චතීති.

## 4. 1. 4. 6

## [ දොණ (ලොක) සුත්තං* ]

36. එකං සමයං භගවා අන්තරා ච **උක්කට්ඨං** අන්තරා ච සෙතබ්‍යං අද්ධානමග්ගපටිපන්නො හොති. **දොණොපි** සුදං බ්‍රාහ්මණො අන්තරා ච උක්කට්ඨං අන්තරා ච සෙතබ්‍යං අද්ධානමග්ගපටිපන්නො හොති. අද්දසා ඛො දොණො බ්‍රාහ්මණො භගවතො පාදෙසු චක්කානි සහස්සාරානි සනෙමිකානි සනාභිකානි සබ්බාකාරපරිපූරානි. දිස්වානස්ස එතදහොසි: "අච්ඡරියං වත භො. අබ්භුතං වත භො න වතිමානි මනුස්සභූතස්ස පාදානි භවිස්සන්තී"ති.

අථ ඛො භගවා මග්ගා ඔක්කම්ම අඤ්ඤතරස්මිං රුක්ඛමූලෙ නිසීදි, පල්ලඞ්කං ආභුජිත්වා උජුං කායං පණිධාය පරිමුඛං සතිං උපට්ඨපෙත්වා.

අථ ඛො දොණො බ්‍රාහ්මණො භගවතො පාදානි අනුගච්ඡන්තො අද්දස භගවන්තං අඤ්ඤතරස්මිං රුක්ඛමූලෙ නිසින්නං පාසාදිකං පසාදනීයං සන්තින්ද්‍රියං සන්තමානසං උත්තමදමථසමථමනුප්පත්තං දන්තං ගුත්තං සංයතින්ද්‍රියං නාගං. දිස්වා යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවන්තං එතදවොච:

දෙවො නො භවං භවිස්සතීති? න ඛො අහං බ්‍රාහ්මණ දෙවො භවිස්සාමීති. ගන්ධබ්බො නො භවං භවිස්සතීති? න ඛො අහං බ්‍රාහ්මණ ගන්ධබ්බො භවිස්සාමීති. යක්ඛො නො භවං භවිස්සතීති? න ඛො අහං බ්‍රාහ්මණ යක්ඛො භවිස්සාමීති. මනුස්සො නො භවං භවිස්සතීති? න ඛො අහං බ්‍රාහ්මණ මනුස්සො භවිස්සාමීති.

දෙවො නො භවං භවිස්සතීති ඉති පුට්ඨො සමානො 'න ඛො අහං බ්‍රාහ්මණ දෙවො භවිස්සාමී'ති වදෙසි. ගන්ධබ්බො නො භවං භවිස්සතීති ඉති පුට්ඨො සමානො 'න ඛො අහං බ්‍රාහ්මණ ගන්ධබ්බො භවිස්සාමී'ති වදෙසි. යක්ඛො නො භවං භවිස්සතීති ඉති පුට්ඨො සමානො 'න ඛො අහං බ්‍රාහ්මණ යක්ඛො භවිස්සාමී'ති වදෙසි. මනුස්සො නො භවං භවිස්සතීති ඉති පුට්ඨො සමානො 'න ඛො අහං බ්‍රාහ්මණ මනුස්සො භවිස්සාමී'ති වදෙසි. අථ කො චරහි භවං භවිස්සතීති.

---

* උද්දානෙ 'ලොකො' ති සුත්තනාමං.

84. යම් කෙනෙක් සත්ත්වයන්ගේ මෘත්‍යුපාශය මුදා ලන මග අවබොධ කළ සේක් ද, යම් ධර්මයක් නුවණින් දැක අසා බොහෝ දෙන ඒකාන්තයෙන් පහදනේ ද, දෙවිමිනිස්නට හිත වූ ඒ න්‍යායධර්මය පැවසූ සේක් ද,

85. මාර්ගාමාර්ග පිළිබඳ කුශල වූ කෘතකෘත්‍ය වූ අනාස්‍රව වූ අන්තිම දෙහධාරි වූ චතුස්සත්‍යාවබෝධ ඇති ඒ මහාප්‍රාඥයන් වහන්සේ මහා-පුරුෂයහ යි කියනු ලැබෙත්.

## 4. 1. 4. 6

## [ ද්‍රෝණ (ලොක) සූත්‍රය ]

36. එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ **උක්කට්ඨා** සෙතව්‍යා දෙනුවර අතර අද්දමගට පිළිපන් සේක. ද්‍රොණ බමුණුත් උක්කට්ඨා සෙතව්‍යා දෙනුවර අතර දික්මගට පිළිපන්නේ වෙයි. ද්‍රොණ බමුණු භාග්‍යවතුන් වහන්සේගේ පාදයෙහි දහසක් අර ඇති නිම් සියෝ තැබ සියෝ සම්කාරයෙන් පරිපූර්ණ වූ ලක්ෂණ චක්‍රයන් දිට. දැක ඔහුට මේ බඳු සිතෙක් වී: "භවත්නි, ඒකාන්තයෙන් ආශ්චර්ය, භවත්නි, ඒකාන්තයෙන් අද්භූතය. ඒකාන්තයෙන් මෙල පාද මිනිසක්හුගේ පාද නොවන්නේ වනැ" යි.

එක්බිති භාග්‍යවතුන් වහන්සේ මඟින් බැහැරව එක්තරා රුක්මුලෙක පලක් බැඳ උපරිමකාය ඍජු කොට තබා අභිමුඛ කොට සිහිය එළවා වැඩ හුන්හ.

එක්බිති ද්‍රොණ බමුණා භාග්‍යවතුන් වහන්සේගේ පිය අනුව යන්නේ එක්තරා රුක්මුලෙක හුන් ප්‍රසාද ජනක වූ ප්‍රසාදයට කරුණු වූ සන්හුන් ඉඳුරන් ඇති සන්හුන් සිත් ඇති උත්තම දමථ ශමථ සඞ්ඛ්‍යාත අග්‍ර්‍යත්ව මාර්ග-සමාධි දෙකට පත් දාන්ත වූ ගෝපිත වූ රැකි ඉඳුරන් ඇති නාග වූ භාග්‍යවතුන් වහන්සේ දිටි. දැක භාග්‍යවතුන් වහන්සේ කරා එළඹියේ ය. එළඹ භාග්‍යවතුන් වහන්සේට මෙල සැළ කෙළේ ය:

භවත් දෙව් වෙයි හොයි? බමුණ, මම දෙව් නො වෙමි යි. භවත් ගන්ධර්ව වෙයි හොයි? බමුණ, මම ගන්ධර්ව නො වෙමි යි. භවත් යක්ෂ වෙයි හොයි? බමුණ, මම යක්ෂ නො වෙමි යි. භවත්, මනුෂ්‍ය වෙයි හො යි? බමුණ, මම මනුෂ්‍ය නො වෙමි යි.

'භවත් දෙව් වෙයි හොයි?' මෙසේ පුළුවුස්නා ලද්දෙහි 'බමුණ, මම දෙව් නො වෙමි' යි කියයි, 'භවත් ගන්ධර්ව වෙයි හො යි?' මෙසේ පුළුවුස්නා ලද්-දෙහි 'බමුණ, මම ගන්ධර්ව නො වෙමි' යි කියහි. 'භවත් යක්ෂ වෙයි හොයි?' මෙසේ පුළුවුස්නා ලද්දෙහි 'බමුණ, මම යක්ෂ නො වෙමි' යි කියහි. භවත් මනුෂ්‍ය වෙයි හොයි?' මෙසේ පුළුවුස්නා ලද්දෙහි 'බමුණ, මම මනුෂ්‍ය නො වෙමි' යි කියහි. එබැවින් භවත් කවරේ ද? යි කිය.

යෙසං ඛො අහං බ්‍රාහ්මණ ආසවානං අප්පහීණත්තා දෙවො භවෙය්‍යං, තෙ මෙ ආසවා පහීණා උච්ඡින්නමූලා තාලාවත්ථුකතා අනභාවකතා ආයතිං අනුප්පාදධම්මා. යෙසං ඛො අහං බ්‍රාහ්මණ ආසවානං අප්පහීණත්තා ගන්ධබ්බො භවෙය්‍යං -පෙ- යක්ඛො භවෙය්‍යං -පෙ- මනුස්සො භවෙය්‍යං, තෙ මෙ ආසවා පහීණා උච්ඡින්නමූලා තාලාවත්ථුකතා අනභාවකතා ආයතිං අනුප්පාදධම්මා.

සෙය්‍යථාපි බ්‍රාහ්මණ උප්පලං වා පදුමං වා පුණ්ඩරීකං වා උදකෙ ජාතං උදකෙ සංවඩ්ඪං උදකා අච්චුග්ගම්ම ඨාති අනුපලිත්තං උදකෙන. එවමෙව ඛො අහං බ්‍රාහ්මණ ලොකෙ ජාතො ලොකෙ සංවඩ්ඪො ලොකං අභිභුය්‍ය විහරාමි අනුපලිත්තො ලොකෙන. බුද්ධොති මං බ්‍රාහ්මණ ධාරෙහීති.

86. යෙන දෙවූපපත්‍යස්ස ගන්ධබ්බො වා විහඞ්ගමො,
යක්ඛත්තං යෙන ගච්ඡෙය්‍යං මනුස්සත්තඤ්ච අබ්බජෙ,[1]
තෙ මය්හං ආසවා ඛීණා විද්ධස්තා විනළීකතා.

87. පුණ්ඩරීකං යථා වග්ගු[2] තොයෙන නුපලිප්පති,
නුපලිත්තාම්හි[3] ලොකෙන තස්මා බුද්ධොස්මි බ්‍රාහ්මණාති.

## 4. 1. 4. 7.

## [ අපරිහානියසුත්තං ]

**[සාවත්ථිනිදානං]**

37. චතූහි භික්ඛවෙ ධම්මෙහි සමන්නාගතො භික්ඛු අභබ්බො පරිහානාය නිබ්බානස්සෙව සන්තිකෙ. කතමෙහි චතූහි?

ඉධ භික්ඛවෙ භික්ඛු සීලසම්පන්නො හොති, ඉන්ද්‍රියෙසු ගුත්තද්වාරො හොති, භොජනෙ මත්තඤ්ඤූ හොති, ජාගරියං අනුයුත්තො හොති.

කථඤ්ච භික්ඛවෙ භික්ඛු සීලසම්පන්නො හොති: ඉධ භික්ඛවෙ භික්ඛු සීලවා හොති, පාතිමොක්ඛසංවරසංවුතො විහරති, ආචාරගොචරසම්පන්නො අණුමත්තෙසු වජ්ජෙසු භයදස්සාවී සමාදාය සික්ඛති සික්ඛාපදෙසු. එවං ඛො භික්ඛවෙ භික්ඛු සීලසම්පන්නො හොති.

කථඤ්ච භික්ඛවෙ භික්ඛු ඉන්ද්‍රියෙසු ගුත්තද්වාරො හොති: ඉධ භික්ඛවෙ භික්ඛු චක්ඛුනා රූපං දිස්වා න නිමිත්තග්ගාහී හොති නානුබ්‍යඤ්ජනග්ගාහී යත්වාධිකරණමෙනං චක්ඛුන්ද්‍රියං අසංවුතං විහරන්තං අභිජ්ඣා දොමනස්සා පාපකා අකුසලා ධම්මා අන්වාස්සවෙය්‍යුං, තස්ස සංවරාය පටිපජ්ජති. රක්ඛති චක්ඛුන්ද්‍රියං. චක්ඛුන්ද්‍රියෙ සංවරං ආපජ්ජති

1. අබ්භජෙ - සහා. අණ්ඩජෙ - සීමු. 2. උග්ගං - සහා.
3. නුපලිප්පාමි - සහා. මජ්ඣං නුපලිම්පාමි - සා

Free Distribution www.aathaapi.org

බමුණ, මම යම් බඳු කාමාදි ආස්‍රවයන්ගේ අප්‍රහීණභාවය හේතු කොට ගෙණ දෙව් වෙම් නම් මාගේ ඒ ආස්‍රවයෝ ප්‍රහීණයහ. මුලුසුන්හ. මස්තකච්ඡින්න තාලයක් මෙන් අවස්තුකභාවයට පමුණුවන ලදහ. අභාවප්‍රාප්ත කරණ ලදහ. මතුයෙහි නූපදනා දහම් ඇතියහ. බමුණ, මම යම්බඳු ආස්‍රව කෙනකුන්ගේ අප්‍රහීණභාවය හේතු කොට ගන්ධර්ව වෙම් නම් - යක්ෂ වෙම් නම් - මිනුෂ්‍ය වෙම් නම් මාගේ ඒ ආස්‍රවයෝ ප්‍රහීණයහ. මුලුසුන්හ. මස්තකච්ඡින්නතාලයක් මෙන් අවස්තුකභාවයට පමුණුවන ලදහ. අභාවප්‍රාප්ත කරණ ලදහ. මතුයෙහි නූපදනා ස්වභාව ඇතියහ.

බමුණ, යම්සේ උපුලෙක් වේවයි, පියුමෙක් වේවයි, හෙළ පියුමෙක් වේවයි, දියෙහි උපන්නේ දියෙහි වැඩුනේ දිය පැනගෙන නැගී දියෙන් අනුපලිප්තව සිටුනේ ද, බමුණ, එපරිදි ම මම ලොව්හි උපනෙම්, ලොව්හි වැඩුනෙම්, ලොව මැඩ ගෙණ ලෝකයා විසින් අනුපලිප්තව වෙසෙමි. බමුණ මා බුදුහ යි දනුව.

86. යම් කාමාදි ආස්‍රව කෙනකුන් නිසා මට දෙව්ලොව උපන් වේ නම්, ආකාශචර ගන්ධර්ව වෙම් නම්, යම් ආස්‍රව කෙනකුන් නිසා යක්ඛවට යෙම් නම්, මිනිස් බවට හා යෙම් නම්, මාගේ ඒ ආස්‍රවයෝ ක්ෂීණයහ. විධ්වස්තයහ. පහ කළ නල (බැඳුම්) ඇතියහ.

87. සිත්කලු හෙළ පියුමෙක් යම්සේ දියෙන් නො ගැල්වේ ද, එසෙයින් ම ලොකයා විසින් උපලිප්ත නො වෙමි. බමුණ, එහෙයින් මම බුදුමි.

## 4. 1. 4. 7.

## [ අපරිහානිය සූත්‍රය ]

**[සැවැත් නිදනයි:]**

37. මහණෙනි, සතර කරුණෙකින් සමන්වාගත මහණ පරිහාණියට අභව්‍යය. නිවන් හමුයෙහි ම සිටුනේ ය. කවර සතර කරුණෙක යත්:

මහණෙනි, මෙසස්නෙහි මහණ ශීලසම්පන්න වෙයි, ඉන්ද්‍රියයෙහි පියූ දොර ඇතියේ වෙයි, භෝජනයෙහි පමණ දන්නේ වෙයි, නිදි වැරීමෙහි යෙදුනේ වෙයි.

මහණෙනි, කෙසේ නම් මහණ ශීලසම්පන්න වේ ද යත්: මහණෙනි, මෙසස්නෙහි මහණ සිල්වත් වෙයි, ප්‍රාතිමෝක්ෂසංවරයෙන් සංවෘත ව වෙසෙයි, ආචාරගෝචරසම්පන්න වෙයි, අණුමාත්‍ර වරදෙහිත් බිය දක්නා සුලු වෙයි, සමාදන් කොට ගෙණ සිකපදෙහි හික්මෙයි. මහණෙනි, මෙසේ මහණ ශීලසම්පන්න වෙයි.

මහණෙනි, මහණ කෙසේ නම් ඉන්ද්‍රියයෙහි පියූ දොර ඇතියේ වේ ද යත්: මහණෙනි, මෙසස්නෙහි මහණ ඇසින් රූ දක නිමිති නො ගන්නා සුලු වෙයි. අනුව්‍යඤ්ජන නො ගන්නා සුලු වෙයි. යමක් හේතු කොට ගෙණ චක්ෂුරින්ද්‍රියයෙහි අසංවෘත ව වසන කෙල මහණහු අභිධ්‍යා දෞර්මනස්‍ය සඞ්ඛ්‍යාත ලමු අකුසල් දහම්හු ලුහුබැඳ ගන්නාහු වෙත් ද, එය ඇවිරීම පිණිස පිළිපදනේ ය. චක්ෂුරින්ද්‍රියය රක්නේ ය. චක්ෂුරින්ද්‍රියයෙහි සංවරයට පැමිණේ.

සොතෙන සද්දං සුත්වා -පෙ- ඝානෙන ගන්ධං ඝායිත්වා -පෙ- ජිව්හාය රසං සායිත්වා -පෙ- කායෙන ඵොට්ඨබ්බං ඵුසිත්වා -පෙ- මනසා ධම්මං විඤ්ඤාය -පෙ- න නිමිත්තග්ගාහී හොති, නානුබ්‍යඤ්ජනග්ගාහී, යත්වාධිකරණමෙනං මනින්ද්‍රියං අසංවුතං විහරන්තං අභිජ්ඣා දොමනස්සා පාපකා අකුසලා ධම්මා අන්වාස්සවෙය්‍යුං තස්ස සංවරාය පටිපජ්ජති. රක්ඛති මනින්ද්‍රියං, මනින්ද්‍රියෙ සංවරං ආපජ්ජති. එවං ඛො භික්ඛවෙ භික්ඛු ඉන්ද්‍රියෙසු ගුත්තද්වාරො හොති.

කථඤ්ච භික්ඛවෙ භික්ඛු භොජනෙ මත්තඤ්ඤු හොති: ඉධ භික්ඛවෙ භික්ඛු පටිසඞ්ඛා යොනිසො ආහාරං ආහාරෙති: නෙව දවාය න මදාය න මණ්ඩනාය න විභූසනාය යාවදෙව ඉමස්ස කායස්ස ඨිතියා යාපනාය විහිංසූපරතියා බ්‍රහ්මචරියානුග්ගහාය. ඉති පුරාණඤ්ච වෙදනං පටිහඞ්ඛාමි නවඤ්ච වෙදනං න උප්පාදෙස්සාමි, යාත්‍රා ච මෙ භවිස්සති අනවජ්ජතා ච ඵාසුවිහාරො චාති. එවං ඛො භික්ඛවෙ භික්ඛු භොජනෙ මත්තඤ්ඤු හොති.

කථඤ්ච භික්ඛවෙ භික්ඛු ජාගරියං අනුයුත්තො හොති: ඉධ භික්ඛවෙ භික්ඛු දිවසං චඞ්කමෙන නිසජ්ජාය ආවරණීයෙහි ධම්මෙහි චිත්තං පරිසොධෙති, රත්තියා පඨමං යාමං චඞ්කමෙන නිසජ්ජාය ආවරණීයෙහි ධම්මෙහි චිත්තං පරිසොධෙති, රත්තියා මජ්ඣිමං යාමං දක්ඛිණෙන පස්සෙන සීහසෙය්‍යං කප්පෙති පාදෙ පාදං අච්චාධාය සතො සම්පජානො උට්ඨානසඤ්ඤං මනසි කරිත්වා රත්තියා පච්ඡිමං යාමං පච්චුට්ඨාය චඞ්කමෙන නිසජ්ජාය ආවරණීයෙහි ධම්මෙහි චිත්තං පරිසොධෙති. එවං ඛො භික්ඛවෙ භික්ඛු ජාගරියං අනුයුත්තො හොති.

ඉමෙහි ඛො භික්ඛවෙ චතූහි ධම්මෙහි සමන්නාගතො භික්ඛු අභබ්බො පරිහානාය. නිබ්බානස්සෙව සන්තිකෙති.

88. සීලෙ පතිට්ඨිතො භික්ඛු ඉන්ද්‍රියෙසු ච සංවුතො,
භොජනම්හි ච මත්තඤ්ඤු ජාගරියං අනුයුඤ්ජති.

89. එවං විහරමාතාපී[1] අහොරත්තමතන්දිතො,
භාවයං කුසලං ධම්මං යොගක්ඛෙමස්ස පත්තියා.

90. අප්පමාදරතො භික්ඛු පමාදෙ භයදස්සිවා,
අභබ්බො පරිහානාය නිබ්බානස්සෙව සන්තිකෙති.

## [ පතිලීනසුත්තං ]

### 4. 1. 4. 8.

38. පනුණ්ණපච්චෙකසච්චො භික්ඛවෙ භික්ඛු සමවයසට්ඨෙසනො[2] පස්සද්ධකායසඞ්ඛාරො පතිලීනොති වුච්චති.

1. විහරමානො පි - සිමු. විහාරී ආතාපි - මජසං.
2 සමවයසච්චෙසනො—සිමු:

කණින් හඬ අසා - නැහැයෙන් ගඳ අසා - දිවෙන් රස විඳ - කයින් පහස් පැහැස-සිතින් දහම් දැන නිමිති ගන්නා සුලු නො වේ. අනුව්‍යඤ්ජන ගන්නා සුලු නො වේ. යමක් හේතු කොට ගෙණ මනින්ද්‍රියයෙහි අසංවෘත ව වසන කෙලෙ මහණහු අභිධ්‍යාදෞර්මනස්‍ය සඞ්ඛ්‍යාත ලමු අකුසල් දහම්හු ලුහු බැඳ ගන්නාහු වෙත් ද එය ඇවිරීම පිණිස පිළිපදනේ ය. මනින්ද්‍රියය රක්-නේ ය. මනින්ද්‍රියයෙහි සංවරයට පැමිණේ. මහණෙනි, මෙසේ මහණ පියු දෙර ඇතියේ වෙයි.

මහණෙනි, කෙසේ නම් මහණ භෝජනයෙහි මාත්‍රඥ වේ ද යත්: මහණෙනි, මෙසස්නෙහි මහණ නුවණින් මෙනෙහි කොට අහර වළඳයි. කෙසේ ද: දවන පිණිස නො වෙයි, මද වැඩීමට නො වෙයි, මණ්ඩනයට නො වෙයි, විභූෂණයට නො වෙයි, මේ කරජකායයාගේ පැවැත්ම පිණිස ම වෙයි, යැපීම පිණිස ම වෙයි, විහිංසා සන්හිඳුවාලීම පිණිස ම වෙයි. මෙසේ මේ අහර නිසා පැරණි වේදනාව ද නසමි. අලුත් වේදනා ද නූපදවමි. මාගේ ජීවිතයාත්‍රාව ද වෙයි. අනවද්‍යතාව ද වෙයි. පහසු විහරණය ද වෙයි. (කියායි.) මහණෙනි, මෙසේ මහණ භෝජනයෙහි මාත්‍රඥ වේ.

මහණෙනි, කෙසේ නම් මහණ නිදිවැරීමෙහි යෙදුනේ වේ ද යත්: මහණෙනි, මේ සස්නෙහි මහණ දවස සක්මනින් හිඳීමෙන් ආවරණීය දහමින් සිත ශුද්ධ කෙරෙයි. රැය පළමු යම සක්මනින් හිඳීමෙන් ආවරණීය දහමින් සිත පිරිසිදු කෙරෙයි. රැය මැදුම් යම දකුණු ඇලයෙන් දකුණුපයෙහි වම්පය මදක් ඇද තබා සමෘතිමත් වූයේ නුවණින් දන්නේ 'නැගී සිටිමි' යන සංඥාව මෙනෙහි කොට ගෙණ සිංහශය්‍යා කෙරෙයි. රැය පැසිම් යම සක්ම-නින් හිඳීමෙන් ආවරණීය දහමින් සිත පිරිසිදු කෙරෙයි. මහණෙනි, මෙසේ මහණ නිදි වැරීමෙහි යෙදුනේ වෙයි.

මහණෙනි, මේ සතර දහමින් සමන්‍වාගත මහණ පරිහාණිය පිණිස අභව්‍ය වෙයි. නිවන් හමුයෙහි ම වෙයි.

88. ප්‍රාතිමොක්ෂශීලයෙහි පිහිටි ඉන්ද්‍රියයෙහි සංවර ඇති භෝජනයෙහි මාත්‍රඥ වූ මහණ නිදි වැරීමෙහි යෙදුනේ වේ ද,

89. මෙසේ වසන වැර ඇති දවරැ නො මැලි නිවන් වදනු සඳහා කුසල්දහම් වඩන-

90. අප්‍රමාදයෙහි ඇලුනු ප්‍රමාදයෙහි භය දක්නා සුලු ඒ මහණ පරි-හාණිය පිණිස අභව්‍ය වෙයි. නිවන් හමුයෙහි ම සිටුනේ ය.

## 4. 1. 4. 8.

## [ පතිලීන සූත්‍රය ]

38. මහණෙනි, (සත්‍යදර්ශන නම් මේ යයි වෙන වෙන ගත්වන බැවින්) ප්‍රත්‍යෙක සඞ්ඛ්‍යාත දෘෂ්ටිසත්‍යයන් පහ කළ මහණ මොනොවට මුහුටු හැම සෙවීම් ඇතියේ සන්හුන් කායසංස්කාර ඇතියේ එකලා බවට ගියේය යි කියනු ලැබේ.

කථඤ්ච භික්ඛවෙ භික්ඛු පනුණ්ණපච්චෙකසච්චො හොති? ඉධ භික්ඛවෙ භික්ඛුනො යානි තානි, පුථුසමණබ්‍රාහ්මණානං පුථුපච්චෙකසච්චානි සෙය්‍යථීදං: සස්සතො ලොකොති වා අසස්සතො ලොකොති වා අන්තවා ලොකොති වා අනන්තවා ලොකොති වා තං ජීවං තං සරීරන්ති වා අඤ්ඤං ජීවං අඤ්ඤං සරීරන්ති වා හොති තථාගතො පරම්මරණාති වා න හොති තථාගතො පරම්මරණාති වා හොති ච න ච හොති තථාගතො පරම්මරණාති වා නෙව හොති න න හොති තථාගතො පරම්මරණාති වා සබ්බානිස්ස තානි පනුණ්ණානි හොන්ති, චත්තානි, වන්තානි, මුත්තානි, පහීණානි පටිනිස්සට්ඨානි. එවං ඛො භික්ඛවෙ භික්ඛු පනුණ්ණපච්චෙකසච්චො හොති.

කථඤ්ච භික්ඛවෙ භික්ඛු සමවයසට්ඨෙසනො හොති? ඉධ භික්ඛවෙ භික්ඛුනො කාමෙසනා පහීණා හොති. භවෙසනා පහීණා හොති. බ්‍රහ්මචරියෙසනා පටිප්පස්සද්ධා. එවං ඛො භික්ඛවෙ භික්ඛු සමවයසට්ඨෙසනො හොති.

කථඤ්ච භික්ඛවෙ භික්ඛු පස්සද්ධකායසඞ්ඛාරො හොති? ඉධ භික්ඛවෙ භික්ඛු සුඛස්ස ච පහානා දුක්ඛස්ස ච පහානා පුබ්බෙව සොමනස්සදොමනස්සානං අත්ථඞ්ගමා අදුක්ඛං අසුඛං උපෙක්ඛාසතිපාරිසුද්ධිං චතුත්ථං ඣානං උපසම්පජ්ජ විහරති. එවං ඛො භික්ඛවෙ භික්ඛු පස්සද්ධකායසඞ්ඛාරො හොති.

කථඤ්ච භික්ඛවෙ භික්ඛු පටිලීනො හොති? ඉධ භික්ඛවෙ භික්ඛුනො අස්මිමානො පහීණො හොති. උච්ඡින්නමූලො, තාලාවත්ථුකතො, අනභාවකතො, ආයතිං අනුප්පාදධම්මො. එවං ඛො භික්ඛවෙ භික්ඛු පටිලීනො හොති.

පනුණ්ණපච්චෙකසච්චො භික්ඛවෙ භික්ඛු සමවයසට්ඨෙසනො පස්සද්ධකායසඞ්ඛාරො පටිලීනොති වුච්චතීති.

91. කාමෙසනා භවෙසනා බ්‍රහ්මචරියෙසනා සහ,
ඉති සච්චපරාමාසො දිට්ඨිට්ඨානා සමුස්සයා.

92. සබ්බරාගවිරත්තස්ස තණ්හක්ඛයවිමුත්තිනො,
එසනා පටිනිස්සට්ඨා දිට්ඨිට්ඨානා සමූහතා.

93. ස වෙ සන්තො සතො භික්ඛු පස්සද්ධො අපරාජිතො,
මානාභිසමයා බුද්ධො පටිලීනොති වුච්චතීති.

මහණෙනි, කෙසේ නම් මහණ ප්‍රත්‍යෙක සත්‍යයන් හළේ වේ ද යත්: මහණෙනි, බොහෝ මහණ බමුණන්ගේ යම් ඒ බොහෝ වූ වෙන් වෙන් කොට ගත් සත්‍යයෝ ඇත. ඒ කෙසේය යත්: ලෝකය ශාශ්වතය කියා හෝ, ලෝකය අශාශ්වතය කියා හෝ, ලෝකය අනන්ත ඇතියේය කියා හෝ, ලෝකය අනන්ත නැතියේය කියා හෝ, ඒ ම ජීවය ඒ ම ශරීරය කියා හෝ, ජීවය අනෙකෙක, ශරීරය අනෙකෙක කියා හෝ, සත්ත්වයා මරණින් මතුයෙහි වෙයි කියා හෝ, සත්ත්වයා මරණින් මතුයෙහි නො වෙයි කියා හෝ, සත්ත්වයා මරණින් මතුයෙහි වන්නේත් නොවන්නේත් වෙයි කියා හෝ, සත්ත්වයා මරණින් මතුයෙහි නො ම වෙයි නොවන්නේත් නො වෙයි කියා හෝ, දෘෂ්ටීහු වෙත් ද, මෙසස්නෙහි ඒ මහණහු විසින් එ හැම වාදයෝ හරණ ලද්දාහු වෙත්; ත්‍යක්ත වෙත්; වාන්ත වෙත්; මුදන ලද්දාහු වෙත්; ප්‍රහීණ වෙත්; බැහැර ලන ලද්දාහු වෙත්. මහණෙනි, මෙසේ මහණ ප්‍රනුදිතප්‍රත්‍යෙක-සත්‍ය නම් වෙයි.

මහණෙනි, කෙසේ නම් මහණ මොනොවට වුහුටු හැම සෙවීම් ඇතියේ වේ ද යත්: මහණෙනි, මෙසස්නෙහි මහණහට කාමෙෂණාව ප්‍රහීණ වෙයි. භවෙෂණාව ප්‍රහීණ වෙයි. බ්‍රහමචරී – එෂණාව ප්‍රතිප්‍රශ්‍රබ්ධ වෙයි. මහණෙනි, මෙසේ මහණ මොනොවට වුහුටු හැම සෙවීම් ඇත්තේ නම් වෙයි.

මහණෙනි, කෙසේ නම් මහණ සන්හුන් කායසංස්කාර ඇත්තේ වේද යත්: මහණෙනි, මෙසස්නෙහි මහණ සුඛයාගේ ද ප්‍රහාණයෙන් දුඃඛයාගේ ද ප්‍රහාණයෙන් කැලම් සෞමනස්‍යදෞර්මනස්‍ය දෙදෙනා අස්තයට යැමෙන් දුඃඛ නොවූත් සුඛ නොවූත් උපේක්‍ෂා ස්මෘතිපරිශුද්ධිය ඇති චතුර්ථධ්‍යානයට සමවැද වෙසෙයි. මහණෙනි, මෙසේ මහණ සන්හුන් කායසංස්කාර ඇත්තේ වෙයි.

මහණෙනි, කෙසේ නම් මහණ එකලා වූයේ වේ ද යත්: මහණෙනි, මෙසස්නෙහි මහණහට 'අස්මි' මානය ප්‍රහීණ වෙයි, මුලුසුන් වෙයි; තාලයක් සෙයින් අවස්තුක බව කරණ ලද්දේ වෙයි, අභාවය කරණ ලද්දේ වෙයි, මතුයෙහි නූපදනා ධර්මතා ඇතියේ වෙයි. මහණෙනි, මෙසේ මහණ එකලා වූයේ නම් වෙයි.

මහණෙනි, මහණ ප්‍රත්‍යෙක දෘෂ්ටිසත්‍යය හළේ, මොනොවට හළ හැම සෙවීම් ඇතියේ, සන්හුන් කායසංස්කාර ඇතියේ එකලා වූයේය යි කියනු ලැබේ.

91 – 92 සියලු රාගයා කෙරෙන් විරක්ත වූ අර්හත්ඵල විමුක්තියෙන් සමන්වාගත වූ මහණහු විසින් කාමෙසනාය, භවෙසනාය යන මේය හා බ්‍රහ්ම-චරියෙසනාය යන එසනාවෝ හරණ ලදහ. උස්ව නැඟ සිටුනා දෘෂ්ටීහු ද ඉතිසත්‍යපරාමර්ශය ද යන දෘෂ්ටිසත්‍යයෝ නසන ලදහ.

93. සන්හුන් කෙලෙසුන් ඇති ස්මෘතිමත් කාය – චිත්තප්‍රශ්‍රබ්ධි ඇති නොපරදවන ලද සිව්සස් දත් ඒ මහණ ඒකාන්තයෙන් මානයාගේ ප්‍රහාණාභි-සමයයෙන් "පතිලීන" යයි කියනු ලැබේ.

## 4. 1. 4. 9

## [ උජ්ජායසුත්තං ]

39. අථ ඛො **උජ්ජායො** බ්‍රාහ්මණො යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවතා සද්ධිං සම්මොදි. සම්මොදනීයං කථං සාරාණීයං වීතිසාරෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නො ඛො උජ්ජායො බ්‍රාහ්මණො භගවන්තං එතදවොච:

භවම්පි නො ගොතමො යඤ්ඤං වණ්ණෙතීති?

න ඛො අහං බ්‍රාහ්මණ සබ්බං යඤ්ඤං වණ්ණෙමි. න පනාහං බ්‍රාහ්මණ සබ්බං යඤ්ඤං න වණ්ණෙමි. යථාරූපෙ ඛො බ්‍රාහ්මණ යඤ්ඤෙ ගාවො හඤ්ඤන්ති, අජෙළකා හඤ්ඤන්ති, කුක්කුටසූකරා හඤ්ඤන්ති, විවිධා පාණා සඞ්ඝාතං ආපජ්ජන්ති, එවරූපං ඛො අහං බ්‍රාහ්මණ සාරම්භං යඤ්ඤං න වණ්ණෙමි. තං කිස්ස හෙතු? එවරූපං හි බ්‍රාහ්මණ සාරම්භං යඤ්ඤං න උපසඞ්කමන්ති අරහන්තො වා අරහත්තමග්ගං වා සමාපන්නා.

යථාරූපෙ ච ඛො බ්‍රාහ්මණ යඤ්ඤෙ න ගාවො හඤ්ඤන්ති, න අජෙළකා හඤ්ඤන්ති, න කුක්කුටසූකරා හඤ්ඤන්ති, න විවිධා පාණා සඞ්ඝාතං ආපජ්ජන්ති. එවරූපං ඛො අහං බ්‍රාහ්මණ නිරාරම්භං යඤ්ඤං වණ්ණෙමි යදිදං නිච්චදානං අනුකුලයඤ්ඤං. තං කිස්ස හෙතු: එවරූපං හි බ්‍රාහ්මණ නිරාරම්භං යඤ්ඤං උපසඞ්කමන්ති අරහන්තො වා අරහත්තමග්ගං වා සමාපන්නාති.

94. අස්සමෙධං පුරිසමෙධං සම්මාපාසං වාජපෙය්‍යං නිරග්ගළං,
මහායඤ්ඤා මහාරම්භා න තෙ හොන්ති මහප්ඵලා.

95. අජෙළකා ච ගාවො ච විවිධා යත්ථ හඤ්ඤරෙ,
න තං සම්මග්ගතා යඤ්ඤං උපයන්ති මහෙසිනො.

96. යං ච යඤ්ඤං[1] නිරාරම්භං යජන්ති අනුකුලං සදා,
අජෙළකා ච ගාවො ච විවිධා නෙත්ථ හඤ්ඤරෙ.

97. තං ච සම්මග්ගතා යඤ්ඤං උපයන්ති මහෙසිනො,
එතං යජෙථ මෙධාවී එසො යඤ්ඤො මහප්ඵලො.

98. එතං හි[2] යජමානස්ස සෙය්‍යො හොති න පාපියො,
යඤ්ඤො ච විපුලො හොති පසීදන්ති ච දෙවතාති.

1. යෙ ච යඤ්ඤෙ - ම.ඡ.සං. 2. එවං - සතා.

## 4. 1. 4. 9.

## [ උජ්ජාය සූත්‍රය ]

39. ඉක්බිති උජ්ජාය නම් බමුණු භාග්‍යවතුන් වහන්සේ කරා එළඹියේ ය. එළඹ භාග්‍යවතුන් වහන්සේ සමග සතුටු වී ය. තුස්තට නිසි (කලක්) සිහි කරනට නිසි කථාව කොට නිමවා එකත්පස්ව හුන්නේ ය. එකත්පස්ව හුන් උජ්ජාය නම් බමුණු භාග්‍යවතුන් වහන්සේට මෙපමණ සැළ කෙළේ ය.

භවත් ගෞතමයන් වහන්සේ ද යාගය වණන් හො සි?

බමුණ, මම හැම යාග නො වණමි. බමුණ, මම හැම යාග නො වණනෙම් නො ද වෙමි. බමුණ, යම් බඳු යාගයෙකදී ගෙරිහු නැසෙද් ද, එළු බැටළුවෝ නැසෙද් ද, කුකුළු හූරහු නැසෙද් ද, විවිධ ප්‍රාණීහු මරණයට පැමිණෙද් ද, බමුණ, මම මෙබඳු ප්‍රාණවධ (සමාරම්භ) සහිත යාගය නො වණමි. ඒ කවර හෙයින යත්? බමුණ, මෙබඳු සාරම්භයාගයට රහත්හු හෝ රහත්මගට පිළිපන්නාහු හෝ නො එළඹෙත් ද, එහෙයිනි.

බමුණ, යම්බඳු යාගයෙකදී ගෙරිහු නො නැසෙද් ද, එළු බැටළුවෝ නො නැසෙද් ද, කුකුළු හූරහු නො නැසෙද් ද, විවිධ ප්‍රාණීහු විනාශයට නො යෙද් ද, බමුණ, මම මේබඳු හිංසාරහිත යාගය වණමි. යම් නිත්‍යදාන-යෙක් කුලපිළිවෙළින් එන දානයෙක් ඇද් ද, එයයි, එය කවර හෙයින යත්? බමුණ, මෙබඳු හිංසා රහිත යාගයට රහත්හු හෝ රහත්මගට පිළිපන්නාහු හෝ එළඹෙති.

94. අස්සමෙධය, පුරිසමෙධය, සම්මාපාසය, වාජපෙය්‍යය, නිරග්ගලය, යන ප්‍රාණවධ සඞ්ඛ්‍යාත මහාරම්භ ඇති, මහායාගයෝ ඇත් ද, ඔහු මහත් ඵල නො වෙති.

95. යම් යාගයෙක එළු බැටළුවෝ ද ගෙරිහු දැයි විවිධ ප්‍රාණීහු නැසෙද් ද ඒ යාගය කරා සම්‍යග්ගත මහර්ෂිහු නො එළඹෙත්.

96. කුලපිළිවෙළින් එන ප්‍රාණසමාරම්භ රහිත යම් යාගයක් හැමකල්හි යාග කෙරෙත් ද, එළුබැටළුවෝ වෙත්වයි, ගෙරිහු වෙත්වයි, විවිධ ප්‍රාණීහු මෙහි ලා නො නැසෙද් ද,

97. ඒ යාගය කරා සම්‍යග්ගත මහර්ෂිහු එළඹෙත්. නුවණැතියේ තෙල යාගය යාග කරන්නේය. තෙල යාගය මහත් ඵලයි.

98. තෙල යාගය යාග කරන්නාහට විශෙෂයෙක් ම වේ. පාපයෙක් නො වේ. යාගය ද විපුල වේ. දෙවියෝ ද පහදිති.

## 4. 1. 4. 10

### [ උදායිසුත්තං ]

40. අථ ඛො **උදායී** බ්‍රාහ්මණො යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවතා - පෙ - එකමන්තං නිසින්නො ඛො උදායී බ්‍රාහ්මණො භගවන්තං එතදවොච:

භවම්පි නො ගොතමො යඤ්ඤං වණ්ණෙතීති?

න ඛො අහං බ්‍රාහ්මණ සබ්බං යඤ්ඤං වණ්ණෙමි. න පනාහං බ්‍රාහ්මණ සබ්බං යඤ්ඤං න වණ්ණෙමි. යථාරූපෙ ඛො බ්‍රාහ්මණ යඤ්ඤෙ ගාවො හඤ්ඤන්ති. අජෙළකා හඤ්ඤන්ති. කුක්කුටසූකරා හඤ්ඤන්ති. විවිධා පාණා සඞ්ඝාතං ආපජ්ජන්ති. එවරූපං ඛො අහං බ්‍රාහ්මණ සාරම්භං යඤ්ඤං න වණ්ණෙමි. තං කිස්ස හෙතු: එවරූපං හි බ්‍රාහ්මණ සාරම්භං යඤ්ඤං න උපසඞ්කමන්ති අරහන්තො වා අරහමග්ගං වා සමාපන්නා.

යථාරූපෙ ච ඛො බ්‍රාහ්මණ යඤ්ඤෙ නෙව ගාවො හඤ්ඤන්ති. න අජෙළකා හඤ්ඤන්ති. න කුක්කුටසූකරා හඤ්ඤන්ති. න විවිධා පාණා සඞ්ඝාතං ආපජ්ජන්ති එවරූපං ඛො අහං බ්‍රාහ්මණ නිරාරම්භං යඤ්ඤං වණ්ණෙමි යදිදං නිච්චදානං අනුකුලයඤ්ඤං. තං කිස්ස හෙතු: එවරූපං හි බ්‍රාහ්මණ නිරාරම්භං යඤ්ඤං උපසඞ්කමන්ති අරහන්තො වා අරහමග්ගං[1] වා සමාපන්නාති.

99. අභිසඞ්ඛතං නිරාරම්භං යඤ්ඤං කාලෙන කප්පියං,
තාදිසං උපසංයන්ති සඤ්ඤතා බ්‍රහ්මචාරයො.

100. විවත්තච්ඡදා[2] යෙ ලොකෙ වීතිවත්තා කුලං ගතිං,
යඤ්ඤ[3]මෙතං පසංසන්ති බුද්ධා පුඤ්ඤස්ස[4] කොවිදා

101. යඤ්ඤෙ වා යදි වා සද්ධෙ හුතං කත්වා යථාරහං,
පසන්නචිත්තො යජති සුඛෙත්තෙ බ්‍රහ්මචාරිසු.

102. සුහුතං සුයිට්ඨං සුප්පත්තං දක්ඛිණෙය්‍යෙසු යං කතං,
යඤ්ඤො ච විපුලො හොති පසීදන්ති ච දෙවතා.

103. එවං යජිත්වා මෙධාවී සද්ධො මුත්තෙන චෙතසා,
අබ්‍යාපජ්ඣං සුඛං ලොකං පණ්ඩිතො උපපජ්ජතීති.

**චක්කවග්ගො චතුත්ථො.**

**තස්සුද්දානං:**

චක්කං සඞ්ගහො සීහො පසාදෙ වස්සකාරෙණ පඤ්චමං,
ලොකෙ අපරිහානියො පතිලීනෙන උජ්ජායො උදායිනා තෙ දසාති.

1. අරහත්තමග්ගං වා - මජසං. 2. විවට්ටච්ඡදා - මජසං.
3. හවනං - සයා. 4. යඤ්ඤස්ස කොවිදා - මජසං.

## 4. 1. 4. 10.

### [ උදායී සූත්‍රය ]

40. එක්තිති උදායී නම් බමුණු භාග්‍යවතුන් වහන්සේ කරා එළඹියේ ය. එළඹ භාග්‍යවතුන් වහන්සේ සමග ... එකත්පස්ව හුන් උදායී බමුණු භාග්‍යවතුන් වහන්සේට මෙල සැළ කෙළේ ය.

භවත් ගෞතමයන් වහන්සේ ද යාග වණත් හො යි?

බමුණ, මම හැම යාග නො වණමි. බමුණ, මම හැම යාග නො වණ-නෙම් නො ද වෙමි. බමුණ, යම්බඳු යාගයෙකදී ගෙරිහු නැසෙද් ද, එළු බැටළුවෝ නැසෙද් ද, කුකුළු හුරහු නැසෙද් ද, විවිධ ප්‍රාණීහු මරණයට පැමිණෙද් ද, බමුණ, මම මෙබඳු ප්‍රාණවධ සඞ්ඛ්‍යාත මහකරණී ඇති යාගය නො වණමි. ඒ කවර හෙයින යත්? බමුණ, මෙබඳු සාරම්භයාගයට රහත්හු හෝ රහත්මඟට පිළිපන්නාහු හෝ නො එළඹෙත් ද එහෙයිනි.

බමුණ, යම්බඳු යාගයෙකදී ගෙරිහු නො නැසෙද් ද, එළු බැටළුවෝ නො නැසෙද් ද, කුකුළුහුරහු නො නැසෙද් ද, විවිධ ප්‍රාණීහු විනාශයට නො යෙද් ද, බමුණ, මම මෙබඳු නිරාරම්භ යාගය වණමි. යම් නිත්‍යදානයෙක් කුලපිළි-වෙළින් එන දානයෙක් ඇද්ද, එයයි. එය කවර හෙයින යත්? බමුණ, මෙබඳු නිරාරම්භ යාගයට රහත්හු හෝ රහත්මගට පිළිපන්නාහු හෝ එළඹෙති.

99. රැස් කළ, ප්‍රාණසමාරම්භ රහිත, කැප වූ, එබඳු දෙයධර්මයට නිසි කාලයෙහි සංයත වූ බ්‍රහ්මචාරීහු එළඹෙති.

100. ලෝකයෙහි කෙලෙස් සියත් පෙරළ වටකුල වටගයි ඉක්ම ගිය පුණ්‍යයෙහි කොවිද වූ යම් බුදු කෙනෙක් ඇද්ද, ඔහු මෙල යාගය පසසත්.

101. ප්‍රකෘතිදානයෙහි හෝ නොහොත් ශ්‍රාද්ධදාන (=මතකදාන) යෙහි නිසි පරිදි (හොම) පූජා කොට බ්‍රහ්මචාරී සඞ්ඛ්‍යාත මනා කෙනෙහි පහන් සිත් ඇතිව යාග කරන්නේ ය.

102. දක්ෂිණාහීයන් කෙරෙහි යමක් කරණ ලද ද, ඒ මොනොවට කළ පූජාවෙකි. මොනොවට කළ මඞ්ගලදානයෙකි. මොනොවට ලත් දායෙකි. යාගත් විපුල වෙයි. දෙවියෝත් පහදිති.

103. මනා නුවණ ඇති සැදැහැතියේ මුත්සිතින් මෙසේ යාග කොට ඒ පණ්ඩිත තෙම නිදුක් වූ සුව සහිත ලෝකයට එළඹෙයි.

චක්කවග්ගය සතරවැනි යි.

එහි උද්දානය:

චක්ක, සඞ්ග්‍රහ, සීහ, පසාද, වස්සකාර සූත්‍රය ද, දෙණ-ලොක, අපරිහානිය, පතිලීන, උජ්ජාය, උදායී ද යි ඒ දස සූත්‍රයෝ වෙති.

## 5. රොහිතස්සවග්ගො.

### 4. 1. 5. 1.

### [ සමාධිභාවනාසුත්තං ]

[සාවත්ථිනිදානං:]

41. චතස්සො ඉමා භික්ඛවෙ සමාධිභාවනා. කතමා චතස්සො?

අත්ථි භික්ඛවෙ සමාධිභාවනා භාවිතා බහුලීකතා දිට්ඨධම්මසුඛවිහාරාය සංවත්තති.

අත්ථි භික්ඛවෙ සමාධිභාවනා භාවිතා බහුලීකතා ඤාණදස්සනපටිලාභාය සංවත්තති.

අත්ථි භික්ඛවෙ සමාධිභාවනා භාවිතා බහුලීකතා සතිසම්පජඤ්ඤාය සංවත්තති.

අත්ථි භික්ඛවෙ සමාධිභාවනා භාවිතා බහුලීකතා ආසවානං ඛයාය සංවත්තති.

කතමා ච භික්ඛවෙ සමාධිභාවනා භාවිතා බහුලීකතා දිට්ඨධම්මසුඛවිහාරාය සංවත්තති:

ඉධ භික්ඛවෙ භික්ඛු විවිච්චෙව කාමෙහි - පෙ - චතුත්ථං ඣානං උපසම්පජ්ජ විහරති. අයං වුච්චති භික්ඛවෙ සමාධිභාවනා භාවිතා බහුලීකතා දිට්ඨධම්මසුඛවිහාරාය සංවත්තති.

කතමා ච භික්ඛවෙ සමාධිභාවනා භාවිතා බහුලීකතා ඤාණදස්සනපටිලාභාය සංවත්තති:

ඉධ භික්ඛවෙ භික්ඛු ආලොකසඤ්ඤං මනසි කරොති, දිවාසඤ්ඤං අධිට්ඨාති, යථා දිවා තථා රත්තිං, යථා රත්තිං තථා දිවා. ඉති විවටෙන චෙතසා අපරියොනද්ධෙන සප්පභාසං චිත්තං භාවෙති. අයං භික්ඛවෙ සමාධිභාවනා භාවිතා බහුලීකතා ඤාණදස්සනපටිලාභාය සංවත්තති.

කතමා ච භික්ඛවෙ සමාධිභාවනා භාවිතා බහුලීකතා සතිසම්පජඤ්ඤාය සංවත්තති:

ඉධ භික්ඛවෙ භික්ඛුනො විදිතා වෙදනා උප්පජ්ජන්ති. විදිතා උපට්ඨහන්ති. විදිතා අබ්භත්ථං ගච්ඡන්ති. විදිතා සඤ්ඤා -පෙ- විදිතා විතක්කා උප්පජ්ජන්ති විදිතා උපට්ඨහන්ති. විදිතා අබ්භත්ථං ගච්ඡන්ති. අයං භික්ඛවෙ සමාධිභාවනා භාවිතා බහුලීකතා සතිසම්පජඤ්ඤාය සංවත්තති.

කතමා ච භික්ඛවෙ සමාධිභාවනා භාවිතා බහුලීකතා ආසවානං ඛයාය සංවත්තති:

ඉධ භික්ඛවෙ භික්ඛු පඤ්චසුපාදානක්ඛන්ධෙසු උදයබ්බයානුපස්සී විහරති. ඉති රූපං, ඉති රූපස්ස සමුදයො, ඉති රූපස්ස අත්ථඞ්ගමො. ඉති වෙදනා, ඉති වෙදනාය සමුදයො, ඉති වෙදනාය අත්ථඞ්ගමො. ඉති සඤ්ඤා, ඉති සඤ්ඤාය සමුදයො, ඉති සඤ්ඤාය අත්ථඞ්ගමො. ඉති සංඛාරා, ඉති සංඛාරානං සමුදයො, ඉති සංඛාරානං අත්ථඞ්ගමො, ඉති විඤ්ඤාණං, ඉති විඤ්ඤාණස්ස සමුදයො, ඉති විඤ්ඤාණස්ස අත්ථඞ්ගමොති. අයං භික්ඛවෙ සමාධිභාවනා භාවිතා බහුලීකතා ආසවානං ඛයාය සංවත්තති.

# 5. රොහිතස්ස වග්ගය.

## 4. 1. 5. 1.

### [ සමාධිභාවනා සූත්‍රය ]

[සැවැත් නිදානයි:]

4. මහණෙනි, මේ සමාධිභාවනාවෝ සතරදෙනෙකි. කවර සතර දෙනෙකයත්:

මහණෙනි, වඩන ලද බිහිලි කරණ ලද සමාධිභාවනායෙක් දුටුධැම් සුවවෙහෙර පිණිස පවත්නේ වෙයි.

මහණෙනි, වඩන ලද බිහිලි කරණ ලද සමාධිභාවනායෙක් දිව්‍යචක්ෂුර්-ඥානදර්ශනප්‍රතිලාභය පිණිස පවත්නේ වෙයි.

මහණෙනි, වඩන ලද බිහිලි කරණ ලද සමාධිභාවනායෙක් ස්මෘතිසම්ප්‍ර-ඥානය පිණිස පවත්නේ වෙයි.

මහණෙනි, වඩනලද බිහිලි කරණ ලද සමාධිභාවනායෙක් ආශ්‍රවක්‍ෂය පිණිස පවත්නේ වෙයි.

මහණෙනි, වඩන ලද බිහිලි කරණ ලද දුටුධැම් සුවවෙහෙර පිණිස පවත්නා සමාධිභාවනා කවර?

මහණෙනි, මෙසස්නෙහි මහණ කාමයන් කෙරෙන් වෙන්ව ම ... චතුර්ථධ්‍යානයට සම්වැද වෙසෙයි. මහණෙනි, වඩන ලද බිහිලි කරණ ලද මේ සමාධිභාවනාව දෘෂ්ටධර්මසුඛවිහරණය පිණිස පවත්නී ය යි කියනු ලැබේ.

මහණෙනි, වඩන ලද බිහිලි කරණ ලද කවර සමාධිභාවනායෙක් ඥානදර්ශනප්‍රතිලාභය පිණිස පවත්නේ ද?

මහණෙනි, මෙසස්නෙහි මහණ ආලොකසංඥව මෙනෙහි කෙරෙයි. මෙසේ විවෘත වූ නො වැළඳුනු සිතින් දිවාසංඥව ඉටයි. දවහල් ආලොකසංඥව යම් පරිදි ද රැය ද එපරිදි ම ය. රැය යම් පරිදි ද දවහලත් එපරිදි ම ය. දිව්‍යචක්‍ෂුර්ඥානයෙන් ආලොක සහිත සිත වඩයි. මහණෙනි, භාවිත වූ බහුලීකෘත වූ මේ සමාධිභාවනාව ඥානදර්ශනප්‍රතිලාභය පිණිස පවත්නී ය!

මහණෙනි, භාවිත බහුලීකෘත කවර සමාධිභාවනායෙක් ස්මෘතිසම්ප්‍ර-ඥානය පිණිස පවත්නේ ද:

මහණෙනි, මෙ සස්නෙහි මහණහට වේදනාවෝ ප්‍රකටව උපදිත්. ප්‍රකටව වටහත්. ප්‍රකටව අස්නායට යෙත්. සංඥවෝ ප්‍රකටව විතර්කයෝ ප්‍රකටව උපදිත්. ප්‍රකටව වටහත්. ප්‍රකටව අස්නයට යෙත්. මහණෙනි, භාවිත බහුලීකෘත වූ මේ සමාධිභාවනාව ස්මෘතිසම්ප්‍රඥානය පිණිස පවත්නී ය.

මහණෙනි, භාවිත බහුලීකෘත කවර සමාධිභාවනායෙක් ආශ්‍රවක්‍ෂය පිණිස පවත්නේ ද:

මහණෙනි, මෙසස්නෙහි මහණ පස්වූ උපාදානස්කන්ධයෙහි උද - විය අනුව බලනුයේ වෙසෙයි: මෙසේ රූපය, මෙසේ රූපසමුදයය, මෙසේ රූපයාගේ අස්තඞ්ගමය. මෙසේ වෙදනාය, මෙසේ වෙදනාසමුදයය, මෙසේ වෙදනාවගේ අස්තඞ්ගමය. මෙසේ සංඥය, මෙසේ සංඥසමුදයය, මෙසේ සංඥවගේ අස්තඞ්ගමය. මෙසේ සංස්කාරය, මෙසේ සංස්කාරසමුදයය, මෙසේ සංස්කාරයන්ගේ අස්තඞ්ගමය. මෙසේ විඥනය, මෙසේ විඥනසමුදයය, මෙසේ විඥනයාගේ අස්තඞ්ගමය. කියා යි. මහණෙනි, භාවිත බහුලීකෘත මේ සමාධිභාවනාව ආශ්‍රවක්‍ෂය පිණිස පවත්නී ය.

ඉමා ඛො භික්ඛවෙ චතස්සො සමාධිභාවනා.

ඉදඤ්ච පන මෙතං භික්ඛවෙ සන්ධාය භාසිතං පාරායනෙ පුණ්ණක-පඤ්හෙ:

104 සඞ්ඛාය ලොකස්මිං පරොවරානි[1] යස්සිඤ්ජිතං නත්ථි කුහිඤ්චි ලොකෙ,
සන්තො විධූමො අනීඝො නිරාසො අතාරි සො ජාතිජරන්ති බ්‍රූමීති.

4. 1. 5 2.

[ පඤ්හබ්‍යාකරණ සුත්තං ]

42. චත්තාරිමානි භික්ඛවෙ පඤ්හබ්‍යාකරණානි. කතමානි චත්තාරි:

අත්ථි භික්ඛවෙ පඤ්හො එකංසබ්‍යාකරණීයො, අත්ථි භික්ඛවෙ පඤ්හො විභජ්ජ බ්‍යාකරණීයො, අත්ථි භික්ඛවෙ පඤ්හො පටිපුච්ඡා බ්‍යාකරණීයො, අත්ථි භික්ඛවෙ පඤ්හො ඨපනීයො.

ඉමානි ඛො භික්ඛවෙ චත්තාරි පඤ්හබ්‍යාකරණානීති.

105. එකංසවචනං එකං විභජ්ජ වචනාපරං,
තතියං පටිපුච්ඡෙය්‍ය චතුත්ථං පන ඨාපයෙ.

106. යො ච නෙසං තත්ථ තත්ථ ජානාති අනුධම්මතං,
චතුපඤ්හස්ස කුසලො ආහු භික්ඛුං තථාවිධං.

107. දුරාසදො දුප්පසහො ගම්භීරො දුප්පධංසියො[2]
අථො අත්ථෙ අනත්ථෙ ච උභයස්ස හොති කොවිදො.[3]

108. අනත්ථං පරිවජ්ජෙති අත්ථං ගණ්හාති පණ්ඩිතො,
අත්ථාභිසමයා ධීරො පණ්ඩිතොති පවුච්චතීති.

4. 1. 5. 3.

[ කොධගරුසුත්තං ]

43. චත්තාරො'මෙ භික්ඛවෙ පුග්ගලා සන්තො සංවිජ්ජමානා ලොකස්මිං. කතමෙ චත්තාරො:

කොධගරු න සද්ධම්මගරු, මක්ඛගරු න සද්ධම්මගරු, ලාභගරු න සද්ධම්මගරු, සක්කාරගරු න සද්ධම්මගරු.

ඉමෙ ඛො භික්ඛවෙ චත්තාරො පුග්ගලා සන්තො සංවිජ්ජමානා ලොකස්මිං.

චත්තාරො'මෙ භික්ඛවෙ පුග්ගලා සන්තො සංවිජ්ජමානා ලොකස්මිං. කතමෙ චත්තාරො:

සද්ධම්මගරු න කොධගරු, සද්ධම්මගරු න මක්ඛගරු, සද්ධම්මගරු න ලාභගරු, සද්ධම්මගරු න සක්කාරගරු.

ඉමෙ ඛො භික්ඛවෙ චත්තාරො පුග්ගලා සන්තො සංවිජ්ජමානා ලොකස්මින්ති.

---

1. පරොපරානි - මජසං. 2. දුප්පධංසයො, සීමු. 3. උභයත්ථස්ස කොවිදො - සයා, සං.

මහණෙනි, මේ සතර සමාධිභාවනාවෝ යි.

මහණෙනි, මා විසින් "පාරායනයෙහි පුණ්ණකප්‍රශ්නයෙහි" දී (සඞ්ඛාය ලොකස්මිං - යනාදි) තෙල ගයෙක් වදාරණ ලද ද, මේ-ඵලසමාපත්තිය සඳහා වදාරණ ලදී:

104. සත්ත්වලෝකයෙහි උත්තමාධමධර්මයන් නුවණින් දැන යමකුට සත්ත්වලෝකයෙහි කිසිදු සත්ත්වාදියෙක (කෙලෙස් විසින්) චලිතයෙක් නැද්ද, ශාන්ත වූ ක්‍රෝධධූම රහිත වූ නිදුක් වූ ආශාරහිත වූ හෙතෙම ජාතිජරා ඉක්ම සිටියේ ය යි කියමි.

## 4. 1. 5. 2.

## [ පඤ්හව්‍යාකරණ සූත්‍රය ]

42. මහණෙනි, මේ ප්‍රශ්නව්‍යාකරණයෝ සතර දෙනෙකි. කවර සතර දෙනෙක යත්:

මහණෙනි, ඒකාන්තයෙන් විසඳියයුතු ප්‍රශ්නයෙක් ඇත. මහණෙනි, බෙද විසඳිය යුතු ප්‍රශ්නයෙක් ඇත. මහණෙනි, පිළිවිස විසඳිය යුතු ප්‍රශ්නයෙක් ඇත. මහණෙනි, තබාලිය යුතු ප්‍රශ්නයෙක් ඇත.

මහණෙනි, මේ සතර ප්‍රශ්නව්‍යාකරණයෝ යි.

105. එක් පැණෙක් ඒකාන්තවචන යි. අනෙක විභජ්‍යවචන යි. තෙවැන්න පුළුවුස්නේ ය. සිවුවැන්න තබන්නේ ය.

106. යමෙක් ඒ ප්‍රශ්නයන් අතුරෙන් ඒ ඒ තැන අනුධර්මතා සඞ්ඛ්‍යාත විසඳීම දන්නේ ද, එබඳු මහණ සතර පැණ පිළිබඳව දක්ෂයෙකැයි කියත්.

107. නොලංවියහෙන, නොමැඩලියහෙන, ගැඹුරු නොමුඳවාලියහෙන චැලින් දෙවැදෑරුම් අර්ථානර්ථයෙහි දක්ෂ වූ,

108. පණ්ඩිත මහණ අනර්ථය හරණේ ය. අර්ථය ගන්නේ ය. අර්ථ-සමාගමයෙන් ධීර වූ ඒ මහණ පණ්ඩිතය යි කියනු ලැබේ.

## 4: 1. 5. 3.

## [ පඨම කොධගරු සූත්‍රය ]

43. මහණෙනි, ලෝකයෙහි මේ සතර පුද්ගල කෙනෙක් විද්‍යමානයහ. කවර සතර කෙනෙක යත්:

සද්ධර්මගරුක නොවන ක්‍රෝධගරුකය, සද්ධර්මගරුක නොවන මක්ඛගරුකය, සද්ධර්මගරුක නොවන ලාභගරුකය, සද්ධර්මගරුක නොවන සත්කාරගරුක යි.

මහණෙනි, ලෝකයෙහි මේ සතර පුද්ගල කෙනෙක් විද්‍යමානයහ.

මහණෙනි, ලෝකයෙහි මේ සතර පුද්ගල කෙනෙක් විද්‍යමානයහ. කවර සතර කෙනෙක යත්:

ක්‍රෝධගරුක නොවන සද්ධර්මගරුකය, මක්ඛගරුක නොවන සද්ධර්මගරුකය, ලාභගරුක නොවන සද්ධර්මගරුකය, සත්කාරගරුක නොවන සද්ධර්මගරුක යි.

මහණෙනි, ලෝකයෙහි මේ සතර පුද්ගල කෙනෙක් විද්‍යමානයහ.

109. කොධමක්ඛගරූ භික්ඛූ ලාභසක්කාරගාරවා,
න තෙ ධම්මෙ විරූහන්ති සම්මාසම්බුද්ධදෙසිතෙ.

110. යෙ ච සද්ධම්මගරුනො විහංසු විහරන්ති ච,
තෙ වෙ ධම්මෙ විරූහන්ති සම්මාසම්බුද්ධදෙසිතෙති.

### 4. 1. 5. 4.

### [ දුතියකොධගරුසුත්තං ]

44. චත්තාරො'මෙ භික්ඛවෙ අසද්ධම්මා. කතමෙ චත්තාරො?

කොධගරුතා න සද්ධම්මගරුතා, මක්ඛගරුතා න සද්ධම්මගරුතා, ලාභගරුතා න සද්ධම්මගරුතා, සක්කාරගරුතා න සද්ධම්මගරුතා.

ඉමෙ ඛො භික්ඛවෙ චත්තාරො අසද්ධම්මා.

චත්තාරො'මෙ භික්ඛවෙ සද්ධම්මා. කතමෙ චත්තාරො?

සද්ධම්මගරුතා න කොධගරුතා, සද්ධම්මගරුතා න මක්ඛගරුතා, සද්ධම්මගරුතා න ලාභගරුතා, සද්ධම්මගරුතා න සක්කාරගරුතා.

ඉමෙ ඛො භික්ඛවෙ චත්තාරො සද්ධම්මාති.

111. කොධමක්ඛගරූ භික්ඛූ ලාභසක්කාරගාරවා,
සුඛෙත්තෙ පූතිබීජංව සද්ධම්මෙ න විරූහති.

112. යෙ ච සද්ධම්මගරුනො විහංසු විහරන්ති ච,
තෙ වෙ ධම්මෙ විරූහන්ති සිනෙහමිවොසධාති.

### 4. 1. 5. 5

### [ පඨමරොහිතස්සසුත්තං ]

45. එකං සමයං භගවා **සාවත්ථියං** විහරති **ජෙතවනෙ** අනාථපිණ්ඩිකස්ස ආරාමෙ.

අථ ඛො **රොහිතස්සො** දෙවපුත්තො අභික්කන්තාය රත්තියා අභික්කන්තවණ්ණො කෙවලකප්පං ජෙතවනං ඔභාසෙත්වා යෙන භගවා තෙනුපසඞ්කමි, උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං අට්ඨාසි. එකමන්තං ඨිතො ඛො රොහිතස්සො දෙවපුත්තො භගවන්තං එතදවොච:

109. ලාභසත්කාර කෙරෙහි ගෞරව ඇති ක්‍රෝධය හා ගුණමකු බව ගරු කොට ඇති මහණ කෙනෙක් ඇද්ද, ඔහු සම්මාසම්බුදුරජුන් දෙසූ සද්ධර්මයෙහි නො වැඩෙත්.

110. සද්ධර්මගරුක වූ යම් භික්ෂු කෙනෙක් පෙර විසූහු ද, දැන් වෙසෙත් ද, ඔහු ඒකාන්තයෙන් සම්මාසම්බුදුන් දෙසූ දහමෙහි වැඩෙත්.

## 4. 1. 5. 4.

## [ දුතිය කොධගරු සූත්‍රය ]

44. මහණෙනි, මේ අසද්ධර්මයෝ සතර දෙනෙක. කවර සතර දෙනෙක යත්:

ක්‍රෝධයෙහි සගෞරව බව ඇත, සද්ධර්මයෙහි සගෞරව බව නැත. ගුණ මැකීමෙහි සගෞරව බව ඇත, සද්ධර්මයෙහි සගෞරව බව නැත. ලාභයෙහි සගෞරව බව ඇත, සද්ධර්මයෙහි සගෞරව බව නැත. සත්කාරයෙහි සගෞරව බව ඇත, සද්ධර්මයෙහි සගෞරව බව නැත.

මහණෙනි, මේ සතර අසද්ධර්මයෝය.

මහණෙනි මේ සද්ධර්මයෝ සතර දෙනෙක. කවර සතර දෙනෙක යත්:

සද්ධර්මයෙහි සගෞරව බව ඇත, ක්‍රෝධයෙහි සගෞරව බව නැත. සද්ධර්මයෙහි සගෞරව බව ඇත, මකුගුණෙහි සගෞරව බව නැත. සද්ධර්මයෙහි සගෞරව බව ඇත, ලාභයෙහි සගෞරව බව නැත. සද්ධර්මයෙහි සගෞරව බව ඇත, සත්කාරයෙහි සගෞරව බව නැත.

මහණෙනි, මේ සතර සද්ධර්මයෝය.

111. ලාභසත්කාරයෙහි ගෞරවය ඇති ක්‍රොධයෙහි හා ගුණමකු බවෙහි ගෞරවය ඇති මහණෙක් වේ ද, මනා කෙතෙක පූතිබීජයක් මෙන් සද්ධර්ම-ශාසනයෙහි නො වැඩෙයි.

112. සද්ධර්මය ගරු කොට ඇති යම් පැවිදි කෙනෙක් පෙර විසූහු ද, දැන් වෙසෙත් ද, ඒකාන්තයෙන් ඔහු ඔෂධජාතීහු පෑපිවීසෙනහය ලැබ වැඩෙත් ද, එපරිද්දෙන් සද්ධර්මයෙහි වැඩෙත්.

## 4. 1. 5. 5.

## [ පඨම රොහිතස්ස සූත්‍රය ]

45. එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහි ජේතවන නම් වූ අනේපිඬු සිටුහුගේ අරම්හි වැඩ වසන සේක.

එක්බිති රොහිතස්ස දෙව්පුත් රෑ බෙහෙවින් ඉක්ම ගිය කල්හි මනහර වර්ණයෙන් මුළු ජේතවනය එකලු කොට භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹි-යේය. එළඹ භාග්‍යවතුන් වහන්සේ වැඳ එකත්පසෙක සිටියේය. එකත්පසෙක සිටි රොහිතස්ස දෙව්පිත් භාග්‍යවතුන් වහන්සේට මෙල සැළ කෙළේ ය:

යත්ථ නු ඛො භන්තෙ න ජායති, න ජීයති, න මීයති, න චවති, න උපපජ්ජති, සක්කා නු ඛො භන්තෙ ගමනෙන ලොකස්ස අන්තං[1] ඤාතුං වා දට්ඨුං වා පාපුණිතුං වාති?

යත්ථ ඛො ආවුසො න ජායති, න ජීයති, න මීයති, න චවති, න උපපජ්ජති. නාහං තං ගමනෙන ලොකස්ස අන්තං ඤාතෙය්‍යං දට්ඨෙය්‍යං පත්තෙය්‍යන්ති වදාමි.

අච්ඡරියම්භන්තෙ, අබ්භුතම්භන්තෙ, යාව සුභාසිතං චිදම්භන්තෙන භගවතා, යත්ථ ඛො ආවුසො න ජායති න ජීයති න මීයති න චවති න උපපජ්ජති, නාහං තං ගමනෙන ලොකස්ස අන්තං ඤාතෙය්‍යං දට්ඨෙය්‍යං පත්තෙය්‍යන්ති වදාමීති.

භූතපුබ්බාහං භන්තෙ, රොහිතස්සො නාම ඉසි අහොසිං භොජපුත්තො ඉද්ධිමා වෙහාසඞ්ගමො. තස්ස මය්හං භන්තෙ එවරූපො ජවො අහොසි, සෙය්‍යථාපි නාම දළ්හධම්මො[2] ධනුග්ගහො සික්ඛිතො කතහත්ථො කතූපාසනො ලහුකෙන අසනෙන අප්පකසිරෙන තිරියං තාලච්ඡායං අතිපාතෙය්‍ය.

එවරූපො පදවීතිහාරො අහොසි, සෙය්‍යථාපි නාම පුරත්ථිමා සමුද්දා පච්ඡිමො සමුද්දො.

තස්ස මය්හං භන්තෙ එවරූපෙන ජවෙන සමන්නාගතස්ස එවරූපෙන ච පදවීතිහාරෙන, එවරූපං ඉච්ඡාගතං උප්පජ්ජි: අහං ගමනෙන ලොකස්ස අන්තං පාපුණිස්සාමීති.

සො ඛො අහං භන්තෙ අඤ්ඤත්‍රෙව අසිතපීතඛායිතසායිතා, අඤ්ඤත්‍ර උච්චාරපස්සාවකම්මා, අඤ්ඤත්‍ර නිද්දාකිලමථපටිවිනොදනා, වස්සසතායුකො වස්සසතජීවී වස්සසතං ගන්ත්වා අප්පත්වාව ලොකස්ස අන්තං අන්තරායෙව කාලකතො.

අච්ඡරියං භන්තෙ අබ්භුතං භන්තෙ යාව සුභාසිතං චිදම්භන්තෙන භගවතා, යත්ථ ඛො ආවුසො න ජායති න ජීයති න මීයති න චවති න උපපජ්ජති, නාහං තං ගමනෙන ලොකස්ස අන්තං ඤාතෙය්‍යං දට්ඨෙය්‍යං පත්තෙය්‍යන්ති වදාමීති.

යත්ථ ඛො ආවුසො න ජායති න ජීයති න මීයති න චවති න උපපජ්ජති, නාහං තං ගමනෙන ලොකස්ස අන්තං ඤාතෙය්‍යං දට්ඨෙය්‍යං පත්තෙය්‍යන්ති වදාමි. න චාහං ආවුසො අප්පත්වාව ලොකස්ස අන්තං දුක්ඛස්ස අන්තකිරියං වදාමි. අපි චාහං ආවුසො ඉමස්මිංයෙව බ්‍යාමමත්තෙ කළෙවරෙ සසඤ්ඤිම්හි සමනකෙ ලොකඤ්ච පඤ්ඤපෙමි. ලොකසමුදයඤ්ච ලොකනිරොධඤ්ච ලොකනිරොධගාමිනිඤ්ච පටිපදන්ති.

1. අන්තො - සීමු. 2. දළ්හධම්මා - මජසං

වහන්ස, යම් ම තැනෙක නූපදනේ ද, නො දිරන්නේ ද, නො මියන්නේ ද, නො සැවෙන්නේ ද, අපරාපර ප්‍රතිසන්ධි වශයෙන් නූපදනේ ද, වහන්ස, පියගමනින් ඒ ලෝකයාගේ කෙළවර දක්නට වේවයි දන්නට වේවයි, පැමිණෙන්නට වේවයි හැකි වේ ද?

ඇවත, යම් ම තැනෙක නූපදනේ ද නො දිරන්නේ ද නො මියන්නේ ද නො සැවෙන්නේ ද (අපරාපර ප්‍රතිසන්ධි වසින්) නූපදනේ ද, මම පියගමනින් ඒ ලෝකයාගේ ඒ කෙළවර දතයුතු ය යි හෝ දක්කයුතු යයි හෝ පැමිණිය යුතු ය යි හෝ නො කියමි.

වහන්ස, ආශ්චර්යය, වහන්ස, අද්භූතය, වහන්ස, භාග්‍යවතුන් වහන්සේ විසින් මෙ බස යාවත් සුභාෂිතය. (අත්‍යන්තයෙන් සුභාෂිතය) ඇවත, 'යම් ම තැනෙක නූපදනේ ද නො දිරනේ ද නොමියනේ ද නො සැවනේ ද (අපරාපර ප්‍රතිසන්ධි විසින්) නූපදනේ ද, මම පියගමනින් ඒ ලෝකයාගේ ඒ කෙළවර දතයුතු ය යි හෝ දක්ක යුතු ය යි හෝ පැමිණිය යුතුය යි හෝ නොකියමි'' යනුයි.

වහන්ස, පෙර වූ දනක් කියමි: මම භොජපුත්‍ර වූ රොහිතස්ස නම් ඍද්ධි ඇති ආකාශචාරී ඍෂියෙකිම් වීමි. වහන්ස, ඒ මට මෙබඳු ජවයෙක් විය. දෙළොස් වසක් තුළ දුනුකම්හි ශික්ෂිත, කෘතහස්ත, කළ උපාසනා ඇති, දෘඪධන්වත් වූ, ධනුර්ධරයෙක් ලඝුශරයෙකින් නිදුක් සේ තල්සෙය සරස විද පියා ඉක්මවා ද, එබඳු ජව ය යි.

පෙරදිග මුහුදින් පැළදිග මුහුද යම් පරිදි දුර වේ ද, එපරිදි දුර වූ පාදව්‍යතිහාරයෙක් (පියමාරු කිරීමක්) වීය.

වහන්ස, මෙබඳු ජවයෙන් සමන්‍වාගත, මෙබඳු පාදව්‍යතිහාරයෙන් යුත් ඒ මට මෙබඳු ඉච්ඡායෙක් උපන: 'මම පියගමනින් ලෝකයාගේ අන්තයට පැමිණෙමි' යනුයි.

වහන්ස, ඒ මම බිදීම් පීම් කෑම් ලෙවීම් හැර මල මූත්‍රිස හැර, නිද්‍රාක්ලමථ විනොදනා හැර වර්ෂශතායුෂ්ක වූයෙම් වර්ෂශතජීවී වූයෙම් සියක් හවුරුදු ගොස් ලෝකාන්තයට නො පැමිණ ම අතර ම කලුරිය කෙළෙමි.

වහන්ස, ආශ්චර්යය, වහන්ස, අද්භූතය, වහන්ස, භාග්‍යවතුන් වහන්සේ විසින් තෙල බස යාවත් සුභාෂිතය, 'ඇවත, යම් ම තැනෙක නූපදනේ ද, නො දිරනේ ද නො මියනේ ද නො සැවනේ ද (අපරාපර ප්‍රතිසන්ධි විසින්) නූපදනේ ද මම පියගමනින් ලෝකයාගේ ඒ කෙළවර දතයුතුය යි හෝ දක්ක යුතුය යි හෝ පැමිණිය යුතුය යි හෝ නො කියමි' යනුයි.

ඇවත, යම් ම තැනෙක නූපදනේ ද, නො දිරනේ ද, නො මියනේ ද නො සැවනේ ද (අපරාපර පිළිසඳ විසින්) නූපදනේ ද, පියගමනින් ලෝකයා-ගේ ඒ අන්තය දත යුතුය යි, දක්ක යුතුය යි, පැමිණිය යුතුය යි නො කියමි. ඇවැත්නි, මම සංස්කාර ලෝකයාගේ අන්තයට නො පැමිණ ම දුඃඛයාගේ කෙළවර කිරීම ද නො කියමි. ඇවැත්නි, වැලින් මම සසංඥ වූ සවිඥානක වූ ව්‍යාමමාත්‍ර වූ මේ ආත්මභාවයෙහි ම දුඃඛසත්‍යය ද සමුදයසත්‍යය ද නිරෝධ-සත්‍යය ද නිරෝධගාමිනී ප්‍රතිපත්තිය ද පණවමි.

113. ගමනෙන න පත්තබ්බො ලොකස්සන්තො කුදාචනං,
න ච අප්පත්වා ලොකන්තං දුක්ඛා අත්ථි පමොචනං.

114. තස්මා හවෙ ලොකවිදූ සුමෙධො ලොකන්තගූ වුසිතබ්‍රහ්මචරියො,
ලොකස්ස අන්තං සමිතාවී ඤත්වා නාසිංසති[1] ලොකමිමං පරඤ්චාති.

## 4. 1. 5. 6

### [ දුතියරොහිතස්සසුත්තං ]

46. අථ ඛො භගවා තස්සා රත්තියා අච්චයෙන භික්ඛූ ආමන්තෙසි: ඉමං භික්ඛවෙ රත්තිං රොහිතස්සො දෙවපුත්තො අභික්කන්තාය රත්තියා අභික්කන්තවණ්ණො කෙවලකප්පං ජෙතවනං ඔභාසෙත්වා යෙනාහං තෙනුපසඞ්කමි, උපසඞ්කමිත්වා මං අභිවාදෙත්වා එකමන්තං අට්ඨාසි, එකමන්තං ඨිතො ඛො භික්ඛවෙ රොහිතස්සො දෙවපුත්තො මං එතදවොච:

යත්ථ නු ඛො භන්තෙ න ජායති න ජීයති න මීයති න චවති න උපපජ්ජති. සක්කා නු ඛො සො භන්තෙ ගමනෙන ලොකස්ස අන්තං ඤාතුං වා දට්ඨුං වා පාපුණිතුං වාති.

එවං වුත්තෙ අහං භික්ඛවෙ රොහිතස්සං දෙවපුත්තං එතදවොචං: යත්ථ ඛො ආවුසො න ජායති න ජීයති න මීයති න චවති න උපපජ්ජති. නාහන්තං ගමනෙන ලොකස්ස අන්තං ඤාතය්‍යං දට්ඨය්‍යං පත්තය්‍යන්ති[2] වදාමීති.

එවං වුත්තෙ භික්ඛවෙ රොහිතස්සො දෙවපුත්තො මං එතදවොච: අච්ඡරියං භන්තෙ අබ්භුතං භන්තෙ යාව සුභාසිතං චිදං භන්තෙ භගවතා, යත්ථ ඛො ආවුසො න ජායති න ජීයති න මීයති න චවති න උපපජ්ජති. නාහන්තං ගමනෙන ලොකස්ස අන්තං ඤාතය්‍යං දට්ඨය්‍යං පත්තය්‍යන්ති වදාමීති.

භූතපුබ්බාහං භන්තෙ රොහිතස්සො නාම ඉසි අහොසිං භොජපුත්තො ඉද්ධිමා වෙහාසඞ්ගමො. තස්ස මය්හං භන්තෙ එවරූපො ජවො අහොසි: සෙය්‍යථාපි නාම දළ්හධම්මො[3] ධනුග්ගහො සික්ඛිතො කතහත්ථො කතූපාසනො ලහුකෙන අසනෙන අප්පකසිරෙන තිරියං තාලච්ඡායං අතිපාතෙය්‍ය.

එවරූපො පදවීතිහාරො අහොසි, සෙය්‍යථාපි නාම පුරත්ථිමා සමුද්දා පච්ඡිමො සමුද්දො. තස්ස මය්හං භන්තෙ එවරූපෙන ජවෙන සමන්නාගතස්ස එවරූපෙන ච පදවීතිහාරෙන, එවරූපං ඉච්ඡාගතං උප්පජ්ජි: අහං ගමනෙන ලොකස්සන්තං පාපුණිස්සාමීති.

සො ඛො අහං භන්තෙ අඤ්ඤත්‍රෙව අසිතපීතඛායිතසායිතා අඤ්ඤත්‍ර උච්චාරපස්සාවකම්මා අඤ්ඤත්‍ර නිද්දාකිලමථපටිවිනොදනා වස්සසතායුකො වස්සසතජීවී වස්සසතං ගන්ත්වා අප්පත්වාව ලොකස්ස අන්තං අන්තරායෙව[4] කාලකතො.

1 නාසිසති - මජසං. 2 ඤාතෙය්‍යං, දට්ඨෙය්‍යං පත්තෙය්‍යන්ති - සාමව.
3. දළ්හධම්මා - මජසං. 4 අන්තරා - සාමව. මජසං.

113. කිසි කලෙකදු පියගමනින් ලෝකාන්තය නො පැමිණිය හැකිය. නිවන් නො පැමිණ දුකින් මිදීමෙක් නැත.

114 එබැවින් ලෝකය දත්, සුන්දර ප්‍රඥා ඇති, නිවණට ගිය, මැස නිම කළ බඹසර ඇති, සන්සිඳුණු පව් ඇති, රහත් තෙම ඒකාන්තයෙන් ලෝකාන්තය දැන මෙ ලොව හා පරලොව හා නො පතන්නේ ය.

## 4. 1. 5. 6

## [ දුතිය රොහිතස්ස සුත්‍රය ]

46. එක්බිති භාග්‍යවතුන් වහන්සේ ඒ රැය ඇවෑමෙන් භික්ෂූන් ඇමතූසේක. මහණෙනි, මේ රැය රොහිතස්ස දෙව්පුත් රැය බෙහෙවින් ඉකුත් කල්හි (– මධ්‍යම රාත්‍රියෙහි) විශිෂ්ට ජවිවණී ඇත්තේ මුළු දෙව්රම බබුලුවා මා වෙත පැමිණියේය. පැමිණ මා සකසා වැඳ එකත්පස් ව සිටියේ ය. මහණෙනි, එකත්පස්ව සිටි රොහිතස්ස දෙව්පුත් මට මෙල සැලු කෙළේය:

වහන්ස, යම් ම තැනෙක නූපදනේ ද, නො දිරනේ ද, නො මියනේ ද, නො සැවනේ ද, (අපරාපර පිළිසඳ විසින්) නූපදනේ ද, වහන්ස, පියගමනින් ඒ ලෝකයාගේ එකෙළවර දන්නට වේවයි දක්නට වේවයි පැමිණෙන්නට වේවයි හැකි වේ ද?

මහණෙනි, මෙසේ කී කල්හි මම රොහිතස්ස දෙව්පුත් හට මෙසේ කීමි: ඇවත, යම් ම තැනෙක නූපදනේ ද, නොදිරනේ ද, නොමියනේ ද, නො සැවනේ ද, (අපරාපර පිළිසඳ විසින්) නූපදනේ ද, මම පියගමනින් ඒ ලෝකයාගේ කෙළවර දතයුතු යයි හෝ දක්ක යුතු ය යි හෝ පැමිණිය යුතු ය යි හෝ නොකියමි.

මහණෙනි, මෙසේ කී කල්හි රොහිතස්ස දෙව්පුත් මට මෙසේ කීය: වහන්ස, ආශ්චර්යය, වහන්ස, අද්භූතය. වහන්ස, භාග්‍යවතුන් වහන්සේ විසින් මෙ බස යාවත් සුභාෂිතය: 'ඇවත, යම් ම තැනෙක නූපදනේ ද, නො දිරනේ ද, නො මියනේ ද, නො සැවනේ ද (අපරාපර පිළිසඳ විසින්) නූපදනේ ද, මම පියගමනින් ඒ ලෝකයාගේ එකෙළවර දතයුතු ය යි හෝ දක්ක යුතුය යි හෝ පැමිණිය යුතුය යි හෝ නො කියමි' යනුයි.

වහන්ස, පෙර වූ දූයක් කියමි: මම භොජපුත්‍ර වූ රොහිතස්ස නම් ඉර්ධි ඇති, ආකාශචාරී සෘෂියෙකිම් වීමි. වහන්ස, ඒ මට මෙබඳු ජවයෙක් විය. දෘළ්හ ධන්වයා: දෙළොස් වසක් තුළ ශික්ෂිත, කෘතහස්ත, කෘතොපාසන, දෘඪධන්වන් වූ, ධනුර්ධරයෙක් ලඝුශරයෙකින් තිඳුක් යේ තල්සෙය සරස විදපියා ඉක්මවා ද, එබඳු ජව යි. පෙර දිග මුහුදින් පැළදිග මුහු ද යම් පරිදි දුර වේ ද, එපරිදි වූ පාදව්‍යතිහාරයෙක් විය. වහන්ස, මෙබඳු ජවයෙන් සමන්‍ව‍ාගත, මෙබඳු පාදව්‍යතිහාරයෙන් යුත් ඒ මට මෙබඳු ඉච්ඡායෙක් උපන: 'මම පියගමනින් ලොකයාගේ කෙළවරට පැමිණෙමි' යනුයි. වහන්ස, ඒ මම බිදීම්, පීම්, කෑම්, ලෙවීම් හැර මලමූ කිස හැර නිද්‍රාක්ලමථ විනෝදනා හැර, වර්ෂශතායුෂ්ක වූයෙමි, වර්ෂශතජීවී වූයෙම් සියක් හවුරුදු ගොස් ලෝකාන්තයට නො පැමිණ ම අතර ම කළුරිය කෙළෙමි.

4

අච්ඡරියං භන්තෙ, අබ්භුතං භන්තෙ, යාව සුභාසිතං චිදං භන්තෙ භගවතා යත්ථ ඛො ආවුසො න ජායති න ජීයති න මීයති න චවති න උපපජ්ජති නාහං තං ගමනෙන ලොකස්ස අන්තං ඤාතෙය්‍යං දට්ඨෙය්‍යං පත්තෙය්‍යන්ති වදාමීති.

එවං වුත්තෙ අහං භික්ඛවෙ රොහිතස්සං දෙවපුත්තං එතදවොචං: යත්ථ ඛො ආවුසො න ජායති න ජීයති න මීයති න චවති න උපපජ්ජති, නාහං තං ගමනෙන ලොකස්ස අන්තං ඤාතෙය්‍යං දට්ඨෙය්‍යං පත්තෙය්‍යන්ති වදාමීති, න චාහං ආවුසො අප්පත්වාව ලොකස්ස අන්තං දුක්ඛස්ස අන්තකිරියං වදාමි. අපි චාහං ආවුසො ඉමස්මිංයෙව බ්‍යාමමත්තෙ කලෙබරෙ සසඤ්ඤිම්හි සමනකෙ ලොකඤ්ච පඤ්ඤපෙමි ලොකසමුදයඤ්ච ලොකනිරොධඤ්ච ලොකනිරොධගාමිනිඤ්ච පටිපදන්ති.

115. ගමනෙන න පත්තබ්බො ලොකස්සන්තො කුදාචනං,
න ච අප්පත්වා ලොකන්තං දුක්ඛා අත්ථි පමොචනං.

116. තස්මා හවෙ ලොකවිදූ සුමෙධො ලොකන්තගූ වුසිතබ්‍රහ්මචරියො,
ලොකස්ස අන්තං සමිතාවි ඤත්වා නාසිංසති ලොකමිමං පරඤ්චාති.

## 4. 1. 5. 7

## [ සුවිදූරවිදූරසුත්තං ]

47. චත්තාරිමානි භික්ඛවෙ සුවිදූරවිදූරානි. කතමානි චත්තාරි?

නභං ච භික්ඛවෙ පඨවී ච, ඉදං පඨමං සුවිදූරවිදූරෙ. ඔරිමඤ්ච භික්ඛවෙ තීරං සමුද්දස්ස පාරිමඤ්ච තීරං, ඉදං දුතියං සුවිදූරවිදූරෙ. යතො ච භික්ඛවෙ වෙරොචනො අබ්භුදෙති, යත්ථ ච අත්ථමෙති, ඉදං තතියං සුවිදූරවිදූරෙ. සතඤ්ච භික්ඛවෙ ධම්මො අසතඤ්ච ධම්මො, ඉදං චතුත්ථං සුවිදූරවිදූරෙ. ඉමානි ඛො භික්ඛවෙ චත්තාරි සුවිදූරවිදූරානීති.

117. නභං ච දූරෙ පඨවී ච දූරෙ පාරං සමුද්දස්ස තදාහු දූරෙ,
යතො ච වෙරොචනො අබ්භුදෙති පභඞ්කරො යත්ථ ච අත්ථමෙති.

118. තතො හවෙ දූරතරං වදන්ති සතඤ්ච ධම්මං අසතඤ්ච ධම්මං,
අබ්‍යායිකො හොති සතං සමාගමො යාවම්පි[2] තිට්ඨෙය්‍ය
තථෙව හොති,
ඛිප්පං හි වෙති අසතං සමාගමො තස්මා සතං
ධම්මො අසබ්භි ආරකාති.

---

1. අත්ථං ගච්ඡති-සයා 2. යාවාපි-මජසං.

වහන්ස, ආශ්චර්යය, වහන්ස, අද්භූතය, වහන්ස, භාග්‍යවතුන් වහන්සේ විසින් තෙල බස යාවත් සුභාෂිතය: 'ඇවැත, යම් ම තැනෙක නූපදනේ ද, නො දිරනේ ද, නො මියනේ ද, නො සැවනේ ද, (අපරාපර පිළිසඳ විසින්) නූපදනේ ද, මම පියගමනින් ලෝකයාගේ එකෙළවර දතයුතු ය යි හෝ දක්ක යුතුය යි හෝ පැමිණිය යුතුය යි හෝ නො කියමි' යනුයි.

මහණෙනි, මෙ සේ කී කල්හි මම රෝහිතස්ස දෙව්පුත්හට තෙල කීමි: ඇවැත, යම් ම තැනෙක නූපදනේ ද, නො දිරනේ ද, නො මියනේ ද, නො සැවනේ ද, (අපරාපර පිළිසඳ විසින්) නූපදනේ ද, පියගමනින් ලෝකයාගේ ඒ කෙළවර දතයුතු ය යි, දක්ක යුතුය යි, පැමිණිය යුතුය යි නො කියමි. ඇවැත්නි, මම (සංසාර) ලොකයාගේ අන්තයට නොපැමිණ ම දුඃඛයාගේ කෙළවර කිරීම ද නො කියමි. ඇවැත්නි, වැලිත් මම සසංඥ වූ සචිත්තක වූ ව්‍යාමමාත්‍ර වූ මේ ආත්මභාවයෙහි ම දුඃඛසත්‍යය ද සමුදයසත්‍යය ද නිරොධසත්‍යය ද නිරොධගාමිනී ප්‍රතිපත්තිය ද පණවමි.

115. කිසි කලෙකදු පියගමනින් ලොකාන්තය නො පැමිණිය හැකිය. නිවන් නො පැමිණ දුකින් මිදීමෙක් නැත.

**116. එබැවින් ලොකය දත්, සුන්දර ප්‍රඥා ඇති, නිවණට ගිය, වැස නිම කළ මග බඹසර ඇති, සන්සිඳුණු පව් ඇති, රහත් තෙම ඒකාන්තයෙන් ලොකාන්තය දැන මෙලොව හා පරලොව හා නොපතනේ ය.**

## 4. I. 5. 7.

## ( සුවිදූරවිදූර සූත්‍රය )

47. මහණෙනි, මේ සුවිදූර-විදූරස්ථානයෝ සතර දෙනෙකි. කවර සතර දෙනෙක යත්:

**මහණෙනි, සුවිදූර - විදූරස්ථානයෙහි වන අහස හා පොළොව හා යනි මේ පළමුවැන්න යි. මහණෙනි, සුවිදූර - විදූරස්ථානයෙහි වන සමුද්‍රයාගේ මෙතෙර හා එතෙර හා යනි මේ දෙවැන්න යි.** මහණෙනි, යම් තැනෙක හිරු නැඟේ ද, යම් තැනෙක හිරු අස්තයට යේ ද, මේ තෙවැන්නයි. මහණෙනි, සුවිදූර- විදූරස්ථානයෙහි වන සත්පුරුෂධර්මය හා අසත්පුරුෂධර්මය හා යනි මේ සිවුවැන්නයි.

මහණෙනි, මේ සතර සුවිදූර - විදූරස්ථානයෝ යි.

117. අහස ද දුරෙහි වෙයි. පොළොව ද එයින් දුරෙහි වෙයි. සමුද්‍ර-යාගේ පරතෙරෙක් ඇද්ද එ ද දුරෙහිය යි කියත්. ප්‍රභාකර වූ හිරු යම් තැනෙක උදා වේ ද, යම් තැනෙක අස්තයට යේ ද (ඒ දෙතැන ද) දුරෙහි ය යි කියත්.

118. සද්ධර්මය ද අසද්ධර්මය ද එයට ද වඩා ඒකාන්තයෙන් දුරතරය යි කියත්. සත්සමාගමය ද වෙන්ව නොයන සවභාව ඇති වෙයි. යම් තාක් (යම්සේ) සිටුනේ ද එසේ ම සිටුනේ වෙයි. අසත්සමාගමය වහා අපගත වෙයි. එබැවින් සත්පුරුෂධර්මය අසත්පුරුෂයන් කෙරෙන් දුර වෙයි.

### 4. 1. 5. 8.

### [ විසාඛසුත්තං ]

48. එකං සමයං භගවා සාවත්ථියං විහරති ජේතවනෙ අනාථපිණ්ඩිකස්ස ආරාමෙ. තෙන ඛො පන සමයෙන ආයස්මා **විසාඛො** පඤ්චාලිපුත්තො[1] උපට්ඨානසාලායං භික්ඛූ ධම්මියා කථාය සන්දස්සෙති සමාදපෙති සමුත්තෙජෙති සම්පහංසෙති පොරියා වාචාය විස්සට්ඨාය අනෙලගලාය අත්ථස්ස විඤ්ඤාපනියා පරියාපන්නාය අනිස්සිතාය.

අථ ඛො භගවා සායන්හසමයං පටිසල්ලානා වුට්ඨිතො යෙනුපට්ඨානසාලා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා පඤ්ඤත්තෙ ආසනෙ නිසීදි. නිසජ්ජ ඛො භගවා භික්ඛූ ආමන්තෙසි: කො නු ඛො භික්ඛවෙ උපට්ඨානසාලායං භික්ඛූ ධම්මියා කථාය සන්දස්සෙති සමාදපෙති සමුත්තෙජෙති සම්පහංසෙති පොරියා වාචාය විස්සට්ඨාය අනෙලගලාය අත්ථස්ස විඤ්ඤාපනියා පරියාපන්නාය අනිස්සිතායාති.

ආයස්මා භන්තෙ විසාඛො පඤ්චාලිපුත්තො උපට්ඨානසාලායං භික්ඛූ ධම්මියා කථාය සන්දස්සෙති සමාදපෙති සමුත්තෙජෙති සම්පහංසෙති පොරියා වාචාය විස්සට්ඨාය අනෙලගලාය අත්ථස්ස විඤ්ඤාපනියා පරියාපන්නාය අනිස්සිතායාති.

අථ ඛො භගවා ආයස්මන්තං විසාඛං පඤ්චාලිපුත්තං එතදවොච: සාධු සාධු විසාඛ, සාධු ඛො ත්වං විසාඛ භික්ඛූ ධම්මියා කථාය සන්දස්සෙසි සමාදපෙසි සමුත්තෙජෙසි සම්පහංසෙසි පොරියා වාචාය විස්සට්ඨාය අනෙලගලාය අත්ථස්ස විඤ්ඤාපනියා පරියාපන්නාය අනිස්සිතායාති.

119. නාභාසමානං ජානන්ති මිස්සං බාලෙහි පණ්ඩිතං,
භාසමානඤ්ච ජානන්ති දෙසෙන්තං අමතං පදං.

120. භාසයෙ ජෝතයෙ ධම්මං පග්ගණ්හෙ ඉසිනං ධජං,
සුභාසිතධජා ඉසයො ධම්මො හි ඉසිනං ධජොති.

### 4. 1. 5. 9

### [ විපල්ලාසසුත්තං ]

49. චත්තාරො'මෙ භික්ඛවෙ සඤ්ඤාවිපල්ලාසා චිත්තවිපල්ලාසා දිට්ඨිවිපල්ලාසා. කතමෙ චත්තාරො?.

අනිච්චෙ භික්ඛවෙ නිච්චන්ති සඤ්ඤාවිපල්ලාසො චිත්තවිපල්ලාසො දිට්ඨිවිපල්ලාසො. දුක්ඛෙ භික්ඛවෙ සුඛන්ති සඤ්ඤාවිපල්ලාසො චිත්තවිපල්ලාසො දිට්ඨිවිපල්ලාසො. අනත්තනි භික්ඛවෙ අත්තාති සඤ්ඤාවිපල්ලාසො චිත්තවිපල්ලාසො දිට්ඨිවිපල්ලාසො. අසුභෙ භික්ඛවෙ සුභන්ති සඤ්ඤාවිපල්ලාසො චිත්තවිපල්ලාසො දිට්ඨිවිපල්ලාසො. ඉමෙ ඛො භික්ඛවෙ චත්තාරො සඤ්ඤාවිපල්ලාසා චිත්තවිපල්ලාසා දිට්ඨිවිපල්ලාසා.

1. පඤ්චාලපුත්තො. මජසං

## 4. 1. 5. 8.

## [ විසාඛ සූත්‍රය ]

48. එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ **සැවැත්නුවර** සමීපයෙහි වූ **ජේතවන** නම් අනේපිඬු සිටුහුගේ අරම්හි වැඩ වසන සේක. එසමයෙහි **පඤ්චාලී** බැමිණියගේ පුත් ආයුෂ්මත් **විසාඛ** තෙරණුවෝ උපස්ථාන ශාලායෙහිදී පිරිපුන් වචන ඇති, අපලිබුද්ධ, කෙළතොළ නො වූ හෙයින් නිදොස් වූ, අරුත් අඟවන, නිවන් ඇසුරු කළ, වට ඇසුරු නො කළ, දැහැමි කථායෙන් භික්ෂූන් කරුණු දක්වා බෙණෙයි. සමාදන් කරවයි. තෙද ගන්වා බෙණෙයි. පහදවයි.

එක්බිති භාග්‍යවතුන් වහන්සේ සවස් වේලෙහි පිළිසලනින් නැඟී සිටි සේක් උවටැන්හලට වැඩි සේක. එළඹ පැනවූ අස්නෙහි වැඩහුන් සේක. වැඩහිඳ භාග්‍යවතුන් වහන්සේ භික්ෂූන් ඇමතූ සේක: මහණෙනි, උපස්ථාන ශාලායෙහි දී කවරෙක් නම් පිරිපුන් වචන ඇති, නොපැකිල ගලාබස්නා හෙයින් විස්‍පෂ්ට වූ, කෙළතොළ නොවූ හෙයින් නිදොස් වූ, අරුත් අඟවන, නිවන් ඇසුරු කළ, වට ඇසුරු නො කළ, දැහැමි කථායෙන් භික්ෂූන් කරුණු දක්වා බෙණේ ද, සමාදන් කරවා ද, තෙද ගන්වා බෙණේ ද, පහදවා ලයි ද?

වහන්ස, පඤ්චාලී බැමිණිය පුත් ආයුෂ්මත් විසාඛතෙරණුවෝ උපස්ථානශාලායෙහි දී පිරිපුන් තෙපුල් ඇති, ගලා බස්නා හෙයින් විස්‍පෂ්ට වූ, කෙළතොළ නො වූ හෙයින් නිදොස් වූ, අරුත් අඟවන, නිවන් ඇසුරු කළ, වට ඇසුරු නොකළ, දැහැමි කථායෙන් භික්ෂූන් කරුණු දක්වා බෙණෙත්. සමාදන් කරවත්, තෙද ගන්වා බෙණෙත්, පහදවා ලත්.

එක්බිති භාග්‍යවතුන් වහන්සේ පඤ්චාලි බැමිණියගේ පුත් ආයුෂ්මත් විසාඛ තෙරුන්හට තෙල වදාළ සේක: "මැනව, මැනව, විසාඛයෙනි, විසාඛයෙනි, මැනව. තෙපි පිරිපුන් බස් ඇති, ගලාබස්නා වදන් ඇති, කෙළතොළ නො වූ හෙයින් නිදොස් වූ, අරුත් අඟවන, නිවන් ඇසුරු කළ, වට ඇසුරු නො කළ, දැහැමි කථායෙන් භික්ෂූන් කරුණු දක්වා බණව, සමාදන් කරව, තෙද ගන්වා බණව, පහදවා ලවයි වදාළහ.

119. බාලයන් හා මිශ්‍ර වූ ස ඇති, දැහැමි බස් නො බණන, පණ්ඩිතයා (පණ්ඩිතයෝ) නොදනිත්, නිර්වාණපදය (නවවිධලෝකොත්තරධර්මය) දෙසන, දැහැමි කථා බණන්නහු (පණ්ඩිතයෝ) දනිත්.

120. ධර්මය බණන්නේය, බබුළුවන්නේය. ඍෂිධ්වජය (ලොවුතුරුදහම) නගා බණන්නේය. ඍෂීහු සුභාෂිත ධ්වජ ඇතියහ. ධර්මය වනාහි ඍෂීන්ගේ ධ්වජ යි.

## 4. 1. 5. 9.

## [ විපල්ලාස සූත්‍රය ]

49. මහණෙනි, සංඥාවිපර්‍යාසයෝ චිත්තවිපර්‍යාසයෝ දෘෂ්ටිවිපර්‍යාසයෝ මොහු සතර දෙනෙකි. කවර සතර දෙනෙක යත්:

මහණෙනි, අනිත්‍යවස්තුයෙහි, 'මේ නිත්‍ය ය'යි ගන්නේ සංඥාවිපර්‍යාසයෙකි, චිත්තවිපර්‍යාසයෙකි, දෘෂ්ටිවිපර්‍යාසයෙකි. මහණෙනි, දුඃඛයෙහි 'මේ සුඛය'යි ගන්නේ සංඥාවිපර්‍යාසයෙකි, චිත්තවිපර්‍යාසයෙකි, දෘෂ්ටිවිපර්‍යාසයෙකි. මහණෙනි, අනාත්මයෙහි 'මේ ආත්මය' යි ගන්නේ සංඥාවිපර්‍යාසයෙකි, චිත්තවිපර්‍යාසයෙකි, දෘෂ්ටිවිපර්‍යාසයෙකි. මහණෙනි, අශුභයෙහි 'මේ ශුභය' යි ගන්නේ සංඥාවිපර්‍යාසයෙකි, චිත්තවිපර්‍යාසයෙකි, දෘෂ්ටිවිපර්‍යාසයෙකි. මහණෙනි, මොහු සතර දෙන සංඥාවිපර්‍යාස වෙති, චිත්තවිපර්‍යාස, දෘෂ්ටිවිපර්‍යාස ද වෙති.

චත්තාරො'මෙ භික්ඛවෙ න සඤ්ඤාවිපල්ලාසා න චිත්තවිපල්ලාසා න දිට්ඨිවිපල්ලාසා. කතමෙ චත්තාරො?

අනිච්චෙ භික්ඛවෙ අනිච්චන්ති න සඤ්ඤාවිපල්ලාසො න චිත්තවිපල්ලාසො න දිට්ඨිවිපල්ලාසො. දුක්ඛෙ භික්ඛවෙ දුක්ඛන්ති න සඤ්ඤාවිපල්ලාසො න චිත්තවිපල්ලාසො න දිට්ඨිවිපල්ලාසො. අනත්තනි භික්ඛවෙ අනත්තාති න සඤ්ඤාවිපල්ලාසො න චිත්තවිපල්ලාසො න දිට්ඨිවිපල්ලාසො. අසුභෙ භික්ඛවෙ අසුභන්ති න සඤ්ඤාවිපල්ලාසො න චිත්තවිපල්ලාසො න දිට්ඨිවිපල්ලාසො.

ඉමෙ ඛො භික්ඛවෙ චත්තාරො න සඤ්ඤාවිපල්ලාසා න චිත්තවිපල්ලාසා න දිට්ඨිවිපල්ලාසාති.

121. අනිච්චෙ නිච්චසඤ්ඤිනො දුක්ඛෙ ච සුඛසඤ්ඤිනො,
අනත්තනි ච අත්තාති අසුභෙ සුභසඤ්ඤිනො.

122. මිච්ඡාදිට්ඨිහතා සත්තා ඛිත්තචිත්තා විසඤ්ඤිනො,
තෙ යොගයුත්තා මාරස්ස අයොගක්ඛෙමිනො ජනා.

123. සත්තා ගච්ඡන්ති සංසාරං ජාතිමරණගාමිනො,
යදා ච බුද්ධා ලොකස්මිං උප්පජ්ජන්ති පභඞ්කරා.

124. තෙමං ධම්මං[1] පකාසෙන්ති දුක්ඛූපසමගාමිනං,
තෙසං සුත්වාන සප්පඤ්ඤා සචිත්තං පච්චලද්ධා තෙ.[2]

125. අනිච්චං අනිච්චතො දක්ඛුං දුක්ඛමද්දක්ඛු දුක්ඛතො,
අනත්තනි අනත්තාති අසුභං අසුභතද්දසුං,
සම්මාදිට්ඨිසමාදානා සබ්බං දුක්ඛං උපච්චගුන්ති.

## 4. 1. 5. 10.

### [ උපක්කිලෙසසුත්තං ]

50. චත්තාරො'මෙ භික්ඛවෙ චන්දිමසුරියානං උපක්කිලෙසා යෙහි උපක්කිලෙසෙහි උපක්කිලිට්ඨා චන්දිමසුරියා න තපන්ති න භාසන්ති න විරොචන්ති. කතමෙ චත්තාරො?

අබ්භා භික්ඛවෙ චන්දිමසුරියානං උපක්කිලෙසො යෙන උපක්කිලෙසෙන උපක්කිලිට්ඨා චන්දිමසුරියා න තපන්ති න භාසන්ති න විරොචන්ති. මහිකා[3] භික්ඛවෙ චන්දිමසුරියානං උපක්කිලෙසො යෙන උපක්කිලෙසෙන උපක්කිලිට්ඨා චන්දිමසුරියා න තපන්ති න භාසන්ති න විරොචන්ති. ධූමරජො[4] භික්ඛවෙ චන්දිමසුරියානං උපක්කිලෙසො යෙන උපක්කිලෙසෙන උපක්කිලිට්ඨා චන්දිමසුරියා න තපන්ති න භාසන්ති න විරොචන්ති. රාහු භික්ඛවෙ අසුරින්දො චන්දිමසුරියානං උපක්කිලෙසො යෙන උපක්කිලෙසෙන උපක්කිලිට්ඨා චන්දිමසුරියා න තපන්ති න භාසන්ති න විරොචන්ති. ඉමෙ ඛො භික්ඛවෙ චත්තාරො චන්දිමසුරියානං උපක්කිලෙසා යෙහි උපක්කිලෙසෙහි උපක්කිලිට්ඨා චන්දිමසුරියා න තපන්ති න භාසන්ති න විරොචන්ති.

---

1. තෙ ඉමං - මජසං  2. පච්චලද්ධා - මජසං පච්චලත්ථු-සී මු.  3. මහියා - සයා.
4. ධූමො රජො - මජසං

මහණෙනි, සංඥාවිපර්‍යාස නොවන, චිත්තවිපර්‍යාස නොවන, දෘෂ්ටිවිපර්‍යාස නොවන මොහු සතර දෙනෙකි. කවර සතර දෙනෙක යත්:

මහණෙනි, අනිත්‍යවස්තුයෙහි 'මේ අනිත්‍යය' යි ගන්නේ සංඥාවිපර්‍යාස නො වේ. චිත්තවිපර්‍යාස, දෘෂ්ටිවිපර්‍යාස ද නො වේ. මහණෙනි, දුඃඛයෙහි 'මේ දුඃඛය' යි ගන්නේ සංඥාවිපර්‍යාස නො වේ. චිත්තවිපර්‍යාස, දෘෂ්ටිවිපර්‍යාස ද නො වේ. මහණෙනි, අනාත්මයෙහි 'මේ අනාත්මය' යි ගන්නේ සංඥා-විපර්‍යාස නො වේ. චිත්තවිපර්‍යාස, දෘෂ්ටිවිපර්‍යාස ද නො වේ. මහණෙනි, අශුභයෙහි 'මේ අශුභය' යි ගන්නේ සංඥාවිපර්‍යාස නො වේ. චිත්තවිපර්‍යාස, දෘෂ්ටිවිපර්‍යාස ද නො වේ.

මහණෙනි, මොහු සතර දෙනා සංඥාවිපර්‍යාස නොවෙති, චිත්තවිපර්‍යාස, දෘෂ්ටිවිපර්‍යාස ද නො වෙත්.

121. අනිත්‍යවස්තුයෙහි (සංඥාවිපර්‍යාස වශයෙන්) නිත්‍ය සංඥා ඇති, දුඃඛයෙහි සුඛසංඥා ඇති, අනාත්මයෙහි ආත්මය යි දත් සංඥා ඇති, අශුභ-යෙහි ශුභසංඥා ඇති,

122. දෘෂ්ටිවිපර්‍යාසවශයෙන් මිථ්‍යාදෘෂ්ටියට වැටුනු (චිත්තවිපර්‍යාස වශ-යෙන්) වික්ෂිප්ත සිත් ඇති, (මෙසේ) විපරීතසංඥාදිය ගත්, යෝගයෙන් ක්‍ෂේමය නො ලත්, ජනසඞ්ඛ්‍යාත ඒ සත්ත්වයෝ මාරයාගේ යෝගයෙහි යුක්ත වූවාහු වෙත්.

123. ජාතිමරණ කරා යන සුලු ඒ සත්හු සසර ඇවිදිති. යම් කලෙක ලෝකයෙහි නැණ එළිය කරණ චතුස්සත්‍යබුද්ධයෝ පහළ වෙත් ද,

124. ඒ බුදුවරු දුක් සන්හිඳුවන සුලු මේ සිවුසස් දහම් පවසත්. ඒ ප්‍රාඥයෝ ඔවුන්ගේ දහම් අසා සවකීය චිත්තය (නො කිලිටි සිත) ලැබ,

125. අනිත්‍යය අනිත්‍ය විසින් දුටහ. දුක දුක් විසින් දුටහ. අනාත්-මය අනාත්ම විසින් දුටහ. අශුභය අශුභ විසින් දුටහ. මෙසේ සම්‍යග් දර්‍ශනය ගැණීමෙන් සියලු සසර දුක් ඉක්ම ගියහ.

## 4. 1. 5. 10.

## ( උපක්කිලෙස සුත්‍රය )

50. මහණෙනි, යම් උපක්ලේශයෙකින් කිලිටි වූ සඳහිරු දෙදෙනා නො-බබළත් ද, සඳහිරු දෙදෙනාගේ ඒ මේ උපක්ලේශයෝ සතර දෙනෙක. කවර සතර දෙනෙක යත්:

මහණෙනි, යම් උපක්ලේශයෙකින් කිලිටි වූ සඳහිරු දෙදෙනා නො බබ-ළත් ද, වලාකුළ සඳහිරු දෙදෙනාගේ ඒ උපක්ලේශය. මහණෙනි, යම් උපක්ලේශයෙකින් කිලිටි වූ සඳහිරු දෙදෙනා නො බබළත් ද, හිම සඳහිරු දෙදෙනාගේ ඒ උපක්ලේශය. මහණෙනි යම් උපක්ලේශයෙකින් කිලිටි වූ සඳහිරු දෙදෙනා නො බබළත් ද, ධූම-රජස් සඳහිරු දෙදෙනාගේ ඒ උපක්ලේශය. මහණෙනි, යම් උපක්ලේශයෙකින් කිලිටි වූ සඳහිරු දෙදෙනා නො බබළත් ද, රාහු අසුරේන්‍ද්‍ර සඳහිරු දෙදෙනාගේ ඒ උපක්ලේශය. මහණෙනි, යම් උපක්ලේශයෙකින් කිලිටි වූ සඳහිරු දෙදෙනා නො බබළත් ද, සඳහිරු දෙදෙනාගේ ඒ උපක්ලේශයෝ මේ සතර දෙනා වෙති.

එවමෙව ඛො භික්ඛවෙ චත්තාරො සමණබ්‍රාහ්මණානං උපක්කිලෙසා යෙහි උපක්කිලෙසෙහි උපක්කිලිට්ඨා එකෙ සමණබ්‍රාහ්මණා න තපන්ති න භාසන්ති න විරොචන්ති. කතමෙ චත්තාරො?

සන්ති භික්ඛවෙ එකෙ සමණබ්‍රාහ්මණා සුරං පිවන්ති මෙරයං, සුරාමෙරයපානා අප්පටිවිරතා. අයං භික්ඛවෙ පඨමො සමණබ්‍රාහ්මණානං උපක්කිලෙසො යෙන උපක්කිලෙසෙන උපක්කිලිට්ඨා එකෙ සමණබ්‍රාහ්මණා න තපන්ති න භාසන්ති න විරොචන්ති. සන්ති භික්ඛවෙ එකෙ සමණබ්‍රාහ්මණා මෙථුනං ධම්මං පටිසෙවන්ති මෙථුනස්මා ධම්මා අප්පටිවිරතා. අයං භික්ඛවෙ දුතියො සමණබ්‍රාහ්මණානං උපක්කිලෙසො යෙන උපක්කිලෙසෙන උපක්කිලිට්ඨා එකෙ සමණබ්‍රාහ්මණා න තපන්ති න භාසන්ති න විරොචන්ති. සන්ති භික්ඛවෙ එකෙ සමණබ්‍රාහ්මණා ජාතරූපරජතං සාදියන්ති ජාතරූපරජතපටිග්ගහණා අප්පටිවිරතා. අයං භික්ඛවෙ තතියො සමණබ්‍රාහ්මණානං උපක්කිලෙසො යෙන උපක්කිලෙසෙන උපක්කිලිට්ඨා එකෙ සමණබ්‍රාහ්මණා න තපන්ති න භාසන්ති න විරොචන්ති. සන්ති භික්ඛවෙ එකෙ සමණබ්‍රාහ්මණා මිච්ඡාජීවෙන ජීවන්ති මිච්ඡාජීවා අප්පටිවිරතා. අයං භික්ඛවෙ චතුත්ථො සමණබ්‍රාහ්මණානං උපක්කිලෙසො යෙන උපක්කිලෙසෙන උපක්කිලිට්ඨා එකෙ සමණබ්‍රාහ්මණා න තපන්ති න භාසන්ති න විරොචන්ති. ඉමෙ ඛො භික්ඛවෙ චත්තාරො සමණබ්‍රාහ්මණානං උපක්කිලෙසා යෙහි උපක්කිලෙසෙහි උපක්කිලිට්ඨා එකෙ සමණබ්‍රාහ්මණා න තපන්ති න භාසන්ති න විරොචන්තීති.

126. රාගදොසපරික්කිට්ඨා එකෙ සමණබ්‍රාහ්මණා,
අවිජ්ජානිවුතා පොසා පියරූපාභිනන්දිනො.

127. සුරං පිවන්ති මෙරයං පටිසෙවන්ති මෙථුනං,
රජතං ජාතරූපඤ්ච සාදියන්ති අවිද්දසු.

128. මිච්ඡාජීවෙන ජීවන්ති එකෙ සමණබ්‍රාහ්මණා,
එතෙ උපක්කිලෙසා වුත්තා බුද්ධෙනාදිච්චබන්ධුනා.

129. යෙහි උපක්කිලිට්ඨා[1] එකෙ සමණබ්‍රාහ්මණා,
න තපන්ති න භාසන්ති අද්ධුවා[2] සරජාමගා.

130. අන්ධකාරෙන ඔනද්ධා තණ්හාදාසා සනෙත්තිකා,
වඩ්ඪෙන්ති කටසිං ඝොරං ආදියන්ති පුනබ්භවන්ති.

රොහිතස්සවග්ගො පඤ්චමො.

**තස්සුද්දානං:**

සමාධි පඤ්හං ද්වෙ කොධා රොහිතස්සාපරෙ දුවෙ,
සුවිදූරවිසාඛා විපල්ලාසො උපක්කිලෙසෙන තෙ දසාති.

**පඨමො පණ්ණාසකො.**

1. යෙහි උපක්කිලෙසෙහි - මජසං. 2 අසුද්ධා සරජාමිගා - මජසං

මහණෙනි, එපරිද්දෙන් ම යම් උපක්ලේශයෙකින් කිලිටි වූ කිසි මහණ බමුණු කෙනෙක් නො බබළත් ද, මහණබමුණන්ගේ ඒ උපක්ලේශයෝ සතර දෙනෙකි. කවර සතර දෙනෙක යත්:

මහණෙනි, පස්වැදෑරුම් සුරාව හා සිවුවැදෑරුම් මෛරෙය බොන සුරා-මෛරෙය පානයෙන් නො වෙන් ව සිටුනා ඇතැම් මහණබමුණු කෙනෙක් ඇත. මහණෙනි, යම් උපක්ලේශයෙකින් කිලිටි වූ කිසි මහණබමුණු කෙනෙක් (ගුණාලෝකයෙන්) නො බබළත් ද, මහණබමුණන්ගේ මේ පළමුවන උපක්ලේශ යි. මහණෙනි, මෛථුනධර්මය සෙවුනා, මෛථුනධර්මයෙන් නො වෙන් ව සිටුනා ඇතැම් මහණබමුණු කෙනෙක් ඇත. මහණෙනි, යම් උපක්ලේශයෙකින් කිලිටි වූ කිසි මහණබමුණු කෙනෙක් (ගුණවිරොචන-යෙන්) නො බබළත් ද, මහණබමුණන්ගේ මේ දෙවන උපක්ලේශ යි. මහණෙනි, රන්රිදී පිළිගන්නා රන්රිදී පිළිගැනීමෙන් නො වෙන් ව සිටුනා කිසි මහණබමුණු කෙනෙක් ඇත. මහණෙනි, යම් උපක්ලේශයෙකින් කිලිටි වූ මහණබමුණු කෙනෙක් (ගුණප්‍රතාපයෙන්) නො බබළත් ද, මහණබමුණන්ගේ මේ තුන්වන උපක්ලේශ යි. මහණෙනි, මිථ්‍යාජීවයෙන් ජීවත් වන, මිථ්‍යාජීවයෙන් නො වෙන්ව සිටුනා කිසි මහණබමුණු කෙනෙක් ඇත. මහණෙනි, යම් උපක්ලේශයෙකින් කිලිටි වූ මහණබමුණෝ නො බබළත් ද, මහණබමුණන්ගේ මේ සතර වන උපක්ලේශ යි. මහණෙනි, යම් උපක්ලේශ-යෙකින් කිලිටි වූ මහණබමුණෝ නො බබළත් ද, මේ සතර මහණබමුණන්ගේ ඒ උපක්ලේශයෝ වෙති.

126. කිසි මහණබමුණු කෙනෙක් රාගද්වේෂයන් විසින් ඔබ මොබ අදනා ලදහ. ප්‍රිය රූපාරම්මණය ගෙණ එහි අභිනන්දනය කරණ සුළු ඒ පුරුෂයෝ අවිද්‍යායෙන් වැසුනාහ.

127. ඒ අන්ධබාලයෝ රාගමෙර බොත්. මෛවුන්දම් සෙවති. රන්රිදී ද පිළිගණිත්.

128 – 129. කිසි මහණබමුණු කෙනෙක් මිථ්‍යාජීවයෙන් ජීවත් වෙති. යම් උපක්ලේශයෙකින් කිලිටි වූ කිසි මහණබමුණු කෙනෙක් නාගවුරු නො වූවාහු වැහෙන කෙලෙස් රජස් ඇත්තාහු ගුණප්‍රතාපයෙන් නො බබළත් ද, ගුණඑළියෙන් නො දිලියෙත් ද, තුලුහු ඒ උපක්ලේශයහ යි ආදිත්‍යබන්ධු වූ සම්මාසම්බුදුන් විසින් වදාරණ ලදහ.

130 මෝහාන්ධකාරයෙන් වළඳනා ලද තෘෂ්ණාවට දාස වූ තෘෂ්ණායොත්‍ර සහිත ඔහු කැකුළු අත්බව වඩත්. පුනර්භවය නැවැත ගණිත්.

**රෝහිතස්ස වර්ගය පස්වැනි යි.**

**එහි උද්දානය:**

සමාධි හා ප්‍රශ්න යන සූත්‍ර දෙකය, ක්‍රොධ සූත්‍ර දෙකය, රෝහිතස්ස සූත්‍රය හා අන්‍ය වූ රෝහිතස්ස සූත්‍රය, සුවිදූර, විශාඛ සූත්‍ර දෙකය. විපල්ලාසසූත්‍රය හා උපක්කිලෙස සූත්‍රය ද යි. මහු දස දෙනෙකි.

**පඨම පණ්ණාසකය නිමි.**

## 2. දුතියො පණ්ණාසකො.

# 1. පුඤ්ඤාභිසන්දවග්ගො.

### 4. 2. 1. 1.

### [ පඨමපුඤ්ඤාභිසන්දසුත්තං ]

[ සාවත්ථිනිදානං: ]

1. චත්තාරො'මෙ භික්ඛවෙ පුඤ්ඤාභිසන්දා කුසලාභිසන්දා සුඛස්සාහාරා සොවග්ගිකා සුඛවිපාකා සග්ගසංවත්තනිකා ඉට්ඨාය කන්තාය මනාපාය හිතාය සුඛාය සංවත්තන්ති. කතමෙ චත්තාරො?

යස්ස භික්ඛවෙ භික්ඛු චීවරං පරිභුඤ්ජමානො අප්පමාණං චෙතොසමාධිං උපසම්පජ්ජ විහරති. අප්පමාණො තස්ස පුඤ්ඤාභිසන්දො කුසලාභිසන්දො සුඛස්සාහාරො සොවග්ගිකො සුඛවිපාකො සග්ගසංවත්තනිකො ඉට්ඨාය කන්තාය මනාපාය හිතාය සුඛාය සංවත්තති.

යස්ස භික්ඛවෙ භික්ඛු පිණ්ඩපාතං පරිභුඤ්ජමානො අප්පමාණං චෙතොසමාධිං උපසම්පජ්ජ විහරති, අප්පමාණො තස්ස පුඤ්ඤාභිසන්දො කුසලාභිසන්දො සුඛස්සාහාරො සොවග්ගිකො සුඛවිපාකො සග්ගසංවත්තනිකො ඉට්ඨාය කන්තාය මනාපාය හිතාය සුඛාය සංවත්තති.

යස්ස භික්ඛවෙ භික්ඛු සෙනාසනං පරිභුඤ්ජමානො අප්පමාණං චෙතොසමාධිං උපසම්පජ්ජ විහරති, අප්පමාණො තස්ස පුඤ්ඤාභිසන්දො කුසලාභිසන්දො සුඛස්සාහාරො සොවග්ගිකො සුඛවිපාකො සග්ගසංවත්තනිකො ඉට්ඨාය කන්තාය මනාපාය හිතාය සුඛාය සංවත්තති.

යස්ස භික්ඛවෙ භික්ඛු ගිලානපච්චයභෙසජ්ජපරික්ඛාරං පරිභුඤ්ජමානො අප්පමාණං චෙතොසමාධිං උපසම්පජ්ජ විහරති, අප්පමාණො තස්ස පුඤ්ඤාභිසන්දො කුසලාභිසන්දො සුඛස්සාහාරො සොවග්ගිකො සුඛවිපාකො සග්ගසංවත්තනිකො ඉට්ඨාය කන්තාය මනාපාය හිතාය සුඛාය සංවත්තති.

ඉමෙ ඛො භික්ඛවෙ චත්තාරො පුඤ්ඤාභිසන්දා කුසලාභිසන්දා සුඛස්සාහාරා සොවග්ගිකා සුඛවිපාකා සග්ගසංවත්තනිකා ඉට්ඨාය කන්තාය මනාපාය හිතාය සුඛාය සංවත්තන්ති.

ඉමෙහි ච පන භික්ඛවෙ චතූහි පුඤ්ඤාභිසන්දෙහි කුසලාභිසන්දෙහි සමන්නාගතස්ස අරියසාවකස්ස න සුකරං පුඤ්ඤස්ස පමාණං ගහෙතුං,[1] එත්තකො පුඤ්ඤාභිසන්දො කුසලාභිසන්දො සුඛස්සාහාරො සොවග්ගිකො සුඛවිපාකො සග්ගසංවත්තනිකො ඉට්ඨාය කන්තාය මනාපාය හිතාය සුඛාය සංවත්තතීති. අථ ඛො අසඞ්ඛෙය්‍යො අප්පමෙය්‍යො මහාපුඤ්ඤක්ඛන්ධොත්වෙව සඞ්ඛං ගච්ඡති.

1. ගණෙතුං, - ස්‍යා.

Free Distribution www.aathaapi.org

## 2. ද්විතීය පණ්ණාසකය

# 1 පුඤ්ඤාභිසන්ද වර්ගය

### 4. 2. 1. 1.

### [ ප්‍රථම පුඤ්ඤාභිසන්ද සූත්‍රය ]

**[සැවැත් නිදාන යි:]**

1. මහණෙනි, සුව එළවන, මොනොවට අග්‍ර රූපාදි සම්පත් ගෙණ දෙන, සුඛ විපාක ඇති, ස්වර්ගීය පිණිස පවත්නා, ඉෂ්ට බව පිණිස කාන්ත බව පිණිස මනවඩන පිණිස හිතය පිණිස සුඛය පිණිස පවත්නා, මේ පුණ්‍යප්‍රවාහයෝ කුශලප්‍රවාහයෝ (කුශලොපපත්තීහු) සතර දෙනෙකි. කවර සතර දෙනෙක යත්:

මහණෙනි, යම් දායකයකුගේ සිවුරු වළඳනා මහණෙක් අර්හත්ඵලසමාධියට සම්වැද වෙසේ ද, ඔහුට සුව එළවන මනා අග්‍ර රූපාදිසම්පත් දෙන සුඛ විපාක ඇති ස්වර්ගීය පිණිස පවත්නා ඉෂ්ට බව පිණිස කාන්ත බව පිණිස මනවඩන පිණිස හිතය පිණිස සුඛය පිණිස පවත්නා අප්‍රමාණ පුණ්‍යප්‍රවාහයෙක් කුශලප්‍රවාහයෙක් වෙයි.

මහණෙනි, යම් දායකයකුගේ පිඬුවා වළඳන මහණෙක් අර්හත්ඵල සමාධියට එළඹ වෙසේ ද, ඔහුට සුව එළවන අග්‍ර වූ රූපාදි සම්පත් ගෙණ දෙන සුඛවිපාක ඇති ස්වර්ගීය පිණිස පවත්නා ඉෂ්ට බව පිණිස කාන්ත බව පිණිස මනවඩන පිණිස හිතය පිණිස සුඛය පිණිස පවත්නා අප්‍රමාණ පුණ්‍යප්‍රවාහයෙක් කුශලප්‍රවාහයෙක් වෙයි.

මහණෙනි, යම් දායකයකුගේ සෙනසුන් වළඳ කරණ මහණෙක් අර්හත්ඵලසමාධියට එළඹ වෙසේ ද, ඔහුට සුව එළවන සවග්‍ර රූපාදිසම්පත් ගෙණ දෙන සුඛවිපාක ඇති ස්වර්ගීය පිණිස පවත්නා ඉෂ්ට බව පිණිස කාන්ත බව පිණිස මනවඩන පිණිස හිතය පිණිස සුඛය පිණිස පවත්නා අප්‍රමාණ පුණ්‍යප්‍රවාහයෙක් කුශලප්‍රවාහයෙක් වෙයි.

මහණෙනි, යම් දායකයකුගේ ගිලන්පස බෙහෙත් පිරිකර වළඳ කරණ මහණෙක් අර්හත්ඵලසමාධියට එළඹ වෙසේ ද, ඔහුට සුව එළවන සවග්‍ර රූපාදිසම්පත් ගෙණ දෙන සුඛවිපාක ඇති ස්වර්ගීය පිණිස පවත්නා ඉෂ්ට බව පිණිස කාන්ත බව පිණිස මනවඩන පිණිස හිතය පිණිස, සුඛය පිණිස පවත්නා අප්‍රමාණ පුණ්‍යප්‍රවාහයෙක් කුශලප්‍රවාහයෙක් වෙයි.

මහණෙනි, සුව එළවන සවග්‍ර රූපාදිසම්පත් ගෙණ දෙන සුඛවිපාක ඇති ස්වර්ගීය පිණිස පවත්නා ඉෂ්ට බව පිණිස කාන්ත බව පිණිස මනවඩන පිණිස හිතය පිණිස සුඛය පිණිස පවත්නා මේ සතර පුණ්‍යප්‍රවාහයෝ - කුශලප්‍රවාහයෝ යි.

මහණෙනි, මේ සතර පුණ්‍යප්‍රවාහයෙන් කුශලප්‍රවාහයෙන් සමන්වාගත ආර්‍ය්‍යශ්‍රාවකයාගේ පුණ්‍යප්‍රමාණය ගන්නට දුකර නො වේ. සුව එළවන සවග්‍ර රූපාදිසම්පත් ගෙණ දෙන සුඛවිපාක ඇති ස්වර්ගීය පිණිස පවත්නා ඉෂ්ට බව පිණිස කාන්ත බව පිණිස මනවඩන පිණිස හිතය පිණිස සුඛය පිණිස පවත්නා පුණ්‍යප්‍රවාහය කුශලප්‍රවාහය මෙතෙක කියා යි. වැලිත් අසංඛ්‍යෙය වූ අප්‍රමෙය වූ මහාපුණ්‍යස්කන්ධයෙක් ම ය යි ගණිනට යෙයි.

සෙය්‍යථාපි භික්ඛවෙ මහාසමුද්දෙ න සුකරං උදකස්ස පමාණං ගහෙතුං එත්තකානි උදකාළ්හකානීති වා එත්තකානි උදකාළ්හකසතානීති වා එත්තකානි උදකාළ්හකසහස්සානීති වා එත්තකානි උදකාළ්හකසතසහස්සානීති වා. අථ ඛො අසඞ්ඛෙය්‍යො අප්පමෙය්‍යො මහාඋදකක්ඛන්ධොත්වෙව සඞ්ඛං ගච්ඡති. එවමෙව ඛො භික්ඛවෙ ඉමෙහි චතූහි පුඤ්ඤාභිසන්දෙහි කුසලාභිසන්දෙහි සමන්නාගතස්ස අරියසාවකස්ස න සුකරං පුඤ්ඤස්ස පමාණං ගහෙතුං, එත්තකො පුඤ්ඤාභිසන්දො කුසලාභිසන්දො සුඛස්සාහාරො සොවග්ගිකො සුඛවිපාකො සග්ගසංවත්තනිකො ඉට්ඨාය කන්තාය මනාපාය හිතාය සුඛාය සංවත්තතීති. අථ ඛො අසඞ්ඛෙය්‍යො අප්පමෙය්‍යො මහාපුඤ්ඤක්ඛන්ධොත්වෙව සඞ්ඛං ගච්ඡතීති.

1. මහොදධිං අපරිමිතං මහාසරං බහුභෙරවං රතනගණානමාලයං[1],
නජ්ජො යථා නරගණසඞ්ඝසෙවිතා[2] පුථූ සවන්ති උපයන්ති
සාගරං.

2. එවං නරං අන්නදපානවත්ථදං සෙය්‍යානිසජ්ජත්ථරණස්ස දායකං,
පුඤ්ඤස්ස ධාරා උපයන්ති පණ්ඩිතං නජ්ජො යථා වාරිවහාව
සාගරන්ති.

## 4. 2. 1. 2.

## [ දුතියපුඤ්ඤාභිසන්දසුත්තං ]

2. චත්තාරො'මෙ භික්ඛවෙ පුඤ්ඤාභිසන්දා කුසලාභිසන්දා සුඛස්සාහාරා සොවග්ගිකා සුඛවිපාකා සග්ගසංවත්තනිකා ඉට්ඨාය කන්තාය මනාපාය හිතාය සුඛාය සංවත්තන්ති. කතමෙ චත්තාරො?

ඉධ භික්ඛවෙ අරියසාවකො බුද්ධෙ අවෙච්චප්පසාදෙන සමන්නාගතො හොති: ඉතිපි සො භගවා අරහං සම්මාසම්බුද්ධො විජ්ජාචරණසම්පන්නො සුගතො ලොකවිදූ අනුත්තරො පුරිසදම්මසාරථි සත්ථා දෙවමනුස්සානං බුද්ධො භගවාති. අයං භික්ඛවෙ පඨමො පුඤ්ඤාභිසන්දො කුසලාභිසන්දො සුඛස්සාහාරො සොවග්ගිකො සුඛවිපාකො සග්ගසංවත්තනිකො ඉට්ඨාය කන්තාය මනාපාය හිතාය සුඛාය සංවත්තති.

පුනචපරං භික්ඛවෙ අරියසාවකො ධම්මෙ අවෙච්චප්පසාදෙන සමන්නාගතො හොති: ස්වාක්ඛාතො භගවතා ධම්මො සන්දිට්ඨිකො අකාලිකො එහිපස්සිකො ඔපනයිකො පච්චත්තං වෙදිතබ්බො විඤ්ඤූහීති. අයං භික්ඛවෙ දුතියො පුඤ්ඤාභිසන්දො කුසලාභිසන්දො සුඛස්සාහාරො සොවග්ගිකො සුඛවිපාකො සග්ගසංවත්තනිකො ඉට්ඨාය කන්තාය මනාපාය හිතාය සුඛාය සංවත්තති.

1. රතනවරානමාලයං - මජසං 2. මච්ඡගණසඞ්ඝසෙවිතා - සහා. සං.

Free Distribution www.aathaapi.org

මහණෙනි, දියලහ මෙතෙකැ යි හෝ දියලහසියය මෙතෙකැ යි හෝ දියලහදහස් මෙතෙකැ යි හෝ දියලහසුවහස් මෙතෙකැ යි හෝ යම්සේ මහමුහුදෙහි දිය පමණ ගන්නට නො හැකි වේ ද, වැලිත් අසඞ්ඛෙය්‍යය වූ අප්‍රමේය වූ මහත් උදකස්කන්ධයෙක් ම යයි ගණනට යේ ද, මහණෙනි, එපරිදි ම මේ සතර පුණ්‍යප්‍රවාහයෙන් කුශලප්‍රවාහයෙන් සමන්විතගත ආය්‍යශ්‍රාවකයාගේ පුණ්‍යප්‍රමාණය ගන්නට නො හැකි වේ. සුව එළවන සවග්‍ර රූපාදි සම්පත් ගෙණ දෙන සුඛවිපාක ඇති ස්වර්ගීය පිණිස පවත්නා ඉෂ්ට බව පිණිස කාන්ත බව පිණිස මනවඩන පිණිස හිතය පිණිස සුඛය පිණිස පවත්නා පුණ්‍යප්‍රවාහය කුශලප්‍රවාහය මෙතෙක කියා සි. වැලිත් අසඞ්ඛෙය්‍යය වූ අප්‍රමෙය වූ මහත් පුණ්‍යස්කන්ධයෙක් ම ය යි ගණනට යෙයි.

1. පරිමිත රහිත වූ බිහිසුණු අරමුණු ඇති සත්රුවන්ගණට නිවෙස් වූ මහදියකඳ ඇති සයුරුම්හඳහනලාව කරු නරගණසමූහයා විසින් සෙවුනා ලද බොහෝ කොට ගලන නදීහු යම් සේ වැදගණිත් ද,

2. අන්නපාන වස්ත්‍ර දායක වූ ශය්‍යාභිෂ්ටාස්තරණ දායක වූ පණ්ඩිත මිනිසා කරු එපරිදි ම පුණ්‍යධාරුවෝ වැදගණිත්. දිය වහන නදීන් සයුර කරා වැදගන්නාක් සෙයිනි.

## 4. 2. 1. 2.

### [ දුතිය පුඤ්ඤාභිසන්ද සුත්‍රය ]

2. මහණෙනි, සුව එළවන, සවග්‍ර රූපාදි සම්පත් ගෙණ දෙන, සුඛවිපාක ඇති, ස්වර්ගීය පිණිස පවත්නා, ඉෂ්ට බව පිණිස කාන්ත බව පිණිස මනවඩනා පිණිස, හිතය පිණිස සුඛය පිණිස පවත්නා. මේ සතර පුණ්‍යප්‍රවාහ කෙතෙකි. කුශලප්‍රවාහ කෙතෙකි. කවර සතර කෙතෙක යත්:

මහණෙනි, මෙසස්නෙහි ආය්‍යශ්‍රාවක බුදුන් කෙරෙහි අවෙත්‍යප්‍රසාදයෙන් සමන්විතගත වෙයි. ඒ භගවත්හු මේ කරුණෙනුදු අර්හත්හ. සම්‍යක් සම්බුද්ධයහ. විද්‍යාචරණසම්පන්නයහ. සුගතයහ. ලොකවිද්හ. අනුත්තර පුරුෂදම්‍යසාරථියහ. දෙව්මිනිස්නට ශාස්තෘහ. සිවුසත් දත්හ. රාගාදීන් භග්න හෙයින් භගවත්හ යි කියා සි. මහණෙනි, සුව එළවන, සවග්‍ර රූපාදි සම්පත් ගෙණ දෙන, සුඛවිපාක ඇති, ස්වර්ගීය පිණිස පවත්නා, ඉෂ්ට බව පිණිස කාන්ත බව පිණිස මනවඩන පිණිස හිතය පිණිස සුඛය පිණිස පවත්නා, මේ පළමු වන පුණ්‍යප්‍රවාහය. කුශලප්‍රවාහ යි.

තවද මහණෙනි, ආය්‍යශ්‍රාවක ධර්මයෙහි අවෙත්‍යප්‍රසාදයෙන් සමන්විතගත වෙයි. භගවත්හු විසින් ධර්මය ස්වාඛ්‍යාතය, සාන්දෘෂ්ටිකය, අකාලිකය, එව බලව යන විධියට අර්හය, උපනයන්‍යාර්හය, නුවණැතියන් විසින් තමා කෙරෙහි ලා දතයුතුය කියා සි. මහණෙනි, සුව එළවන, සවග්‍ර රූපාදි සම්පත් ගෙණ දෙන, සුඛවිපාක ඇති, ස්වර්ගීය පිණිස පවත්නා, ඉෂ්ට බව පිණිස කාන්ත බව පිණිස මනවඩන පිණිස හිතය පිණිස සුඛය පිණිස පවත්නා, මේ දෙවන පුණ්‍යප්‍රවාහය. කුශලප්‍රවාහ යි.

පුනචපරං භික්ඛවෙ අරියසාවකො සඞ්ඝෙ අවෙච්චප්පසාදෙන සමන්නාගතො හොති: සුපටිපන්නො භගවතො සාවකසඞ්ඝො, උජුපටිපන්නො භගවතො සාවකසඞ්ඝො, ඤායපටිපන්නො භගවතො සාවකසඞ්ඝො, සාමීචිපටිපන්නො භගවතො සාවකසඞ්ඝො, යදිදං චත්තාරි පුරිසයුගානි, අට්ඨපුරිසපුග්ගලා. එස භගවතො සාවකසඞ්ඝො ආහුනෙය්‍යො පාහුනෙය්‍යො දක්ඛිණෙය්‍යො අඤ්ජලිකරණීයො අනුත්තරං පුඤ්ඤක්ඛෙත්තං ලොකස්සාති. අයං භික්ඛවෙ තතියො පුඤ්ඤාභිසන්දො කුසලාභිසන්දො සුඛස්සාහාරො සොවග්ගිකො සුඛවිපාකො සග්ගසංවත්තනිකො ඉට්ඨාය කන්තාය මනාපාය හිතාය සුඛාය සංවත්තති.

පුනචපරං භික්ඛවෙ අරියසාවකො අරියකන්තෙහි සීලෙහි සමන්නාගතො හොති අඛණ්ඩෙහි අච්ඡිද්දෙහි අසබලෙහි අකම්මාසෙහි භුජිස්සෙහි විඤ්ඤුප්පසත්ථෙහි අපරාමට්ඨෙහි සමාධිසංවත්තනිකෙහි. අයං භික්ඛවෙ චතුත්ථො පුඤ්ඤාභිසන්දො කුසලාභිසන්දො සුඛස්සාහාරො සොවග්ගිකො සුඛවිපාකො සග්ගසංවත්තනිකො ඉට්ඨාය කන්තාය මනාපාය හිතාය සුඛාය සංවත්තති.

ඉමෙ ඛො භික්ඛවෙ චත්තාරො පුඤ්ඤාභිසන්දා කුසලාභිසන්දා සුඛස්සාහාරා සොවග්ගිකා සුඛවිපාකා සග්ගසංවත්තනිකා ඉට්ඨාය කන්තාය මනාපාය හිතාය සුඛාය සංවත්තන්තීති.

3. යස්ස සද්ධා තථාගතෙ අචලා සුප්පතිට්ඨිතා,
සීලඤ්ච යස්ස කල්‍යාණං අරියකන්තං පසංසිතං.

4. සඞ්ඝෙ පසාදො යස්සත්ථි උජුභූතඤ්ච දස්සනං,
අදලිද්දොති තං ආහු අමොඝං තස්ස ජීවිතං.

5. තස්මා සද්ධඤ්ච සීලඤ්ච පසාදං ධම්මදස්සනං,
අනුයුඤ්ජෙථ මෙධාවී සරං බුද්ධාන සාසනන්ති.

## 4. 2. 1. 3.

## [ පඨමසංවාසසුත්තං ]

3. එකං සමයං භගවා අන්තරා ච මධුරං අන්තරා ච වෙරඤ්ජං අද්ධානමග්ගපටිපන්නො හොති. සම්බහුලාපි ඛො ගහපතී ච ගහපතානියො ච අන්තරා ච මධුරං අන්තරා ච වෙරඤ්ජං අද්ධානමග්ගපටිපන්නා හොන්ති. අථ ඛො භගවා මග්ගා ඔක්කම්ම අඤ්ඤතරස්මිං රුක්ඛමූලෙ නිසීදි*. අද්දසසුං[1] ඛො තෙ ගහපතී ච ගහපතානියො ච භගවන්තං අඤ්ඤතරස්මිං රුක්ඛමූලෙ නිසින්නං. දිස්වා යෙන භගවා තෙනුපසඞ්කමිංසු. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදිංසු. එකමන්තං නිසින්නෙ ඛො තෙ ගහපතී ච ගහපතානියො ච භගවා එතදවොච:

චත්තාරො'මෙ ගහපතයො සංවාසා. කතමෙ චත්තාරො?

ඡවො ඡවාය සද්ධිං සංවසති, ඡවො දෙවියා සද්ධිං සංවසති, දෙවො ඡවාය සද්ධිං සංවසති, දෙවො දෙවියා සද්ධිං සංවසති.

---

1. අද්දසංසු - ඡ.සං. * පඤ්ඤත්තෙ ආසනෙ - සාරත්ථ.

තවද මහණෙනි, ආර්‍ය්‍ය ශ්‍රාවක සඞ්ඝයා කෙරෙහි අවෙත්‍යප්‍රසාදයෙන් සමන්වාගත වෙයි. භගවත්හුගේ ශ්‍රාවකසඞ්ඝ සුප්‍රතිපන්නය, භගවත්හුගේ ශ්‍රාවකසඞ්ඝ ඍජුප්‍රතිපන්නය, භගවත්හුගේ ශ්‍රාවකසඞ්ඝ න්‍යායප්‍රතිපන්නය, භගවත්හුගේ ශ්‍රාවකසඞ්ඝ සාමීචි ප්‍රතිපන්නය. යම් සතර වැදෑරුම් පුරුෂ යුග කෙනෙක්, අෂ්ටපුරුෂ පුද්ගල කෙනෙක් ඇද්ද භගවත්හුගේ තෙල සවුසඟහු ඈර දෙන්නට නිසි අන්නපානප්‍රතිග්‍රහණයට නිසියහ, ආගන්තුක සත්කාරයට නිසිය හ, දක්ෂිණා ප්‍රතිග්‍රහණයට නිසියහ, ඇඳිලි බඳනට නිසියහ. ලෝකයාහට අනුත්තරපුණ්‍යක්ෂේත්‍රයහ කියා යි. මහණෙනි, සුව එළවන, ස්වර්ග රූපාදි සම්පත් ගෙණ දෙන, සුඛ විපාක ඇති, ස්වර්ගීය පිණිස පවත්නා, ඉෂ්ට බව පිණිස කාන්ත බව පිණිස මන වඩන පිණිස හිතය පිණිස සුඛය පිණිස පවත්නා, මේ තුන්වන පුණ්‍යප්‍රවාහය, කුශල ප්‍රවාහ යි.

තවද මහණෙනි, ආර්‍ය්‍යශ්‍රාවක අඛණ්ඩ වූ අච්ඡිද්‍ර වූ අශබල වූ අකල්මාෂ වූ භුජිස්‍ය වූ විඥප්‍රශස්ත වූ අපරාමෘෂ්ට වූ සමාධිය පිණිස පවත්නා ආර්‍ය්‍යකාන්තශීලයෙන් සමන්වාගත වෙයි. මහණෙනි, සුව එළවන, ස්වර්ග රූපාදි සම්පත් ගෙණ දෙන, සුඛවිපාක ඇති, ස්වර්ගීය පිණිස පවත්නා, ඉෂ්ට බව පිණිස කාන්ත බව පිණිස මන වඩන පිණිස හිතය පිණිස සුඛය පිණිස පවත්නා, මේ සතරවැනි පුණ්‍යප්‍රවාහය, කුශල ප්‍රවාහ යි.

මහණෙනි, සුව එළවන, ස්වර්ගරූපාදි සම්පත් ගෙණ දෙන, සුඛ විපාක ඇති, ස්වර්ගීය පිණිස පවත්නා, ඉෂ්ට බව පිණිස කාන්ත බව පිණිස මනවඩන පිණිස හිතය පිණිස, සුඛය පිණිස පවත්නා මේ සතර වැදෑරුම් පුණ්‍යධාරාය, කුශලධාරා යි.

3. යමක් හට තථාගතයන් වහන්සේ කෙරෙහි අචල වූ මොනවට පිහිටි සැදැහැ ඇද්ද, යමක් හට මාර්ගඵල සම්ප්‍රයුක්ත හෙයින් ආර්‍ය්‍යකාන්ත වූ එහෙයින් ම පසස්නා ලද කල්‍යාණ ශීලය ඇද්ද.

4. යමක් හට සඞ්ඝයා කෙරෙහි ප්‍රසාදය ඇද්ද, ඍජු වූ ධර්මදර්ශනය ඇද්ද, ඔහු නො දිළින්දහ යි කියත්. ඔහුගේ ජීවිතය අමොඝ යි.

5. එහෙයින් බුදුරජුන්ගේ අනුශාසනාය සිහි කරණ ප්‍රඥා බුද්ධි ඇතියා සැදැහ, සිල්ය, පැහැදීම්ය, දහම්දස්නය යන මෙහි යෙදෙන්නේ ය.

## 4. 2. 1. 3

## [ පඨම සංවාස සූත්‍රය ]

3. එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ මධුරා-වේරඤ්ජා දෙ පියෙස අතර අද්දන්මගට පිළිපන් සේක. බොහෝ ගෘහපතිහු ද ගෘහපති භාර්‍ය්‍යාවෝ ද, මධුරා - වේරඤ්ජා දෙපියෙස අතර අද්දන්මගට පිළිපන් හ. එක්බිති භාග්‍යවතුන් වහන්සේ මඟින් ඉක්ම එක්තරා රුක්මුලෙක වැඩහුන්හ. ඒ ගැහැවියෝ ද ගැහැවි දූහු ද එක්තරා රුක්මුලෙක වැඩහුන් බුදුන් දුටුහ. දැක බුදුන් වෙත එළඹියහ. එළඹ බුදුන් සකසා වැඳ එකත්පස්ව හුන්හ. භාග්‍යවතුන් වහන්සේ එකත්පස්ව හුන් ඒ ගැහැවියනුදු ගැහැවි දූනුදු බණවා තෙල වදාළහ.

ගැහැවියෙනි, මේ සතර සහවාස කෙනෙකි. කවර සතර කෙනෙක යත්:

(ගුණ නැතියෙන්) ලමු වූයේ (ගුණ නැතියෙන්) ලමු වූවක හා සමග වෙසෙයි. ලමු වූයේ (ගුණ සැපනින්) දෙවු වූවක හා සමග වෙසෙයි. (ගුණ සැපනින්) දෙව් වූයේ ලමු වූවක හා සමග වෙසෙයි. දෙව් වූයේ දෙවුවූවක හා සමග වෙසෙයි

කථඤ්ච ගහපතයො ඡවො ඡවාය සද්ධිං සංවසති: ඉධ ගහපතයො සාමිකො හොති පාණාතිපාතී අදින්නාදායී කාමෙසු මිච්ඡාචාරී මුසාවාදී සුරාමෙරයමජ්ජපමාදට්ඨායී දුස්සීලො පාපධම්මො. මච්ඡෙරමලපරියුට්ඨිතෙන චෙතසා අගාරං අජ්ඣාවසති, අක්කොසකපරිභාසකො සමණබ්‍රාහ්මණානං. භරියාපිස්ස හොති පාණාතිපාතිනී අදින්නාදායිනී කාමෙසු මිච්ඡාචාරිනී මුසාවාදිනී සුරාමෙරයමජ්ජපමාදට්ඨායිනී දුස්සීලා පාපධම්මා, මච්ඡෙරමලපරියුට්ඨිතෙන චෙතසා අගාරං අජ්ඣාවසති, අක්කොසිකපරිභාසිකා සමණබ්‍රාහ්මණානං. එවං ඛො ගහපතයො ඡවො ඡවාය සද්ධිං සංවසති.

කථඤ්ච ගහපතයො ඡවො දෙවියා සද්ධිං සංවසති: ඉධ ගහපතයො සාමිකො හොති පාණාතිපාතී -පෙ- සුරාමෙරයමජ්ජපමාදට්ඨායී දුස්සීලො පාපධම්මො. මච්ඡෙරමලපරියුට්ඨිතෙන චෙතසා අගාරං අජ්ඣාවසති. අක්කොසකපරිභාසකො සමණබ්‍රාහ්මණානං. භරියා ච ඛ්වස්ස හොති පාණාතිපාතා පටිවිරතා අදින්නාදානා පටිවිරතා කාමෙසු මිච්ඡාචාරා පටිවිරතා මුසාවාදා පටිවිරතා සුරාමෙරයමජ්ජපමාදට්ඨානා පටිවිරතා සීලවතී කල්‍යාණධම්මා, විගතමලමච්ඡෙරෙන චෙතසා අගාරං අජ්ඣාවසති, අනක්කොසිකපරිභාසිකා සමණබ්‍රාහ්මණානං. එවං ඛො ගහපතයො ඡවො දෙවියා සද්ධිං සංවසති.

කථඤ්ච ගහපතයො දෙවො ඡවාය සද්ධිං සංවසති: ඉධ ගහපතයො සාමිකො හොති පාණාතිපාතා පටිවිරතො අදින්නාදානා පටිවිරතො කාමෙසු මිච්ඡාචාරා පටිවිරතො මුසාවාදා පටිවිරතො සුරාමෙරයමජ්ජපමාදට්ඨානා පටිවිරතො සීලවා කල්‍යාණධම්මො, විගතමලමච්ඡෙරෙන චෙතසා අගාරං අජ්ඣාවසති, අනක්කොසකපරිභාසකො සමණබ්‍රාහ්මණානං. භරියා ච ඛ්වස්ස හොති පාණාතිපාතිනී -පෙ- සුරාමෙරයමජ්ජපමාදට්ඨායිනී දුස්සීලා පාපධම්මා, මච්ඡෙරමලපරියුට්ඨිතෙන චෙතසා අගාරං අජ්ඣාවසති, අක්කොසිකපරිභාසිකා සමණබ්‍රාහ්මණානං. එවං ඛො ගහපතයො දෙවො ඡවාය සද්ධිං සංවසති.

කථඤ්ච ගහපතයො දෙවො දෙවියා සද්ධිං සංවසති: ඉධ ගහපතයො සාමිකො හොති පාණාතිපාතා පටිවිරතො -පෙ- සුරාමෙරයමජ්ජපමාදට්ඨානා පටිවිරතො සීලවා කල්‍යාණධම්මො, විගතමලමච්ඡෙරෙන චෙතසා අගාරං අජ්ඣාවසති, අනක්කොසකපරිභාසකො සමණබ්‍රාහ්මණානං. භරියාපිස්ස හොති පාණාතිපාතා පටිවිරතා -පෙ- සුරාමෙරයමජ්ජපමාදට්ඨානා පටිවිරතා සීලවතී කල්‍යාණධම්මා; විගතමලමච්ඡෙරෙන චෙතසා අගාරං අජ්ඣාවසති, අනක්කොසිකපරිභාසිකා සමණබ්‍රාහ්මණානං. එවං ඛො ගහපතයො දෙවො දෙවියා සද්ධිං සංවසති. ඉමෙ ඛො ගහපතයො චත්තාරො සංවාසාති.

6. උභො ච හොන්ති දුස්සීලා කදරියා පරිභාසකා,
තෙ හොන්ති ජානිපතයො ඡවා සංවාසමාගතා.

ගැහැවියෙනි, කෙසේ ලමු වූයේ ලමු වූවක හා සමග වෙසේ ද? ගැහැවියෙනි, මෙ ලොව සැමියෙක් ප්‍රාණවධ කරන්නේ අසිනාදන් ගන්නේ, කාමයෙහි වරදවා හැසිරෙන්නේ, බොරු කියන්නේ, මිද පමා දෙකට කරුණු වූ රහමෙර බොන්නේ වෙයි. දුසිල් වූයේ පවිටු දහම් ඇතියේ වැළඳ ගත් මසුරු මල ඇති සිතින් ගිහිගෙයි වෙසෙයි. මහණ බමුණනට ආක්‍රොශ හා නිඤු බස් බණන්නේ වෙයි. ඔහුගේ භාර්‍යාව ද ප්‍රාණවධ කරන්නී, අයිනාදන් ගන්නී, කාමයෙහි මිසගසර ඇත්තී, බොරු කියන්නී, මිද පමා දෙකට කරුණු වූ රහමෙර බොන්නී වෙයි. දුසිල් වූවා, ලමුදහම් ඇත්තී, වැළඳ ගත් මසුරු මල ඇති සිතින් ගිහිගෙයි වෙසෙයි. මහණ බමුණනට ආක්‍රොශ හා නිඤු බස් බණන්නී වෙයි. ගැහැවියෙනි, මෙ පරිදි ලමු වූයේ ලමු වූවක හා එක්ව වෙසෙයි.

ගැහැවියෙනි, කෙසේ ලමු වූයේ දෙවු දුවක හා එක්ව වෙසේ ද? ගැහැවියෙනි, මෙලොව සැමියෙක් ප්‍රාණවධ කරන්නේ... මිද පමා දෙකට කරුණු වූ රහමෙර බොන්නේ වෙයි. දුසිල් වූයේ, ලමු දහම් ඇත්තේ, වැළඳගත් මසුරුමල ඇති සිතින් ගිහිගෙහි වෙසෙයි. මහණබමුණනට ආක්‍රොශ හා නින්දබස් බණන්නේ වෙයි. ඔහුගේ භාර්‍යාව ද ප්‍රාණවධයෙන් වැළකියා අසිනාදනින් වැළකියා, කාමයෙහි මිසහසරින් වැළකියා, මුසවායෙන් වැළකියා, මද පමා දෙකට කරුණු වූ රහමෙරින් වැළකියා වෙයි. සිල්වත් වූවා, කලණදහම් ඇත්තී, වැළඳ ගත් මසුරුමල නැති සිතින් ගිහිගෙයි වෙසෙයි මහණබමුණනට ආක්‍රොශ හා නින්ද බස් නො බණන්නී වෙයි. ගැහැවියෙනි, මෙ පරිදි ලමු වූ යේ දෙවුදුවක හා එක්ව වෙසෙයි.

ගැහැවියෙනි, කෙසේ දෙව් වූයේ ලමු වූවක හා එක්ව වෙසේ ද? ගැහැවියෙනි, මෙලොවෙහි සැමියෙක් ප්‍රාණවධයෙන් වැළකුනේ, අසිනාදනින් වැළකුනේ, කාමයෙහි මිසගසරින් වැළකුනේ, මුසාවාදයෙන් වැළකුනේ, මිදපමා දෙකට කරුණු වූ රහමෙරින් වැළකුනේ වෙයි. සිල්වත් වූයේ, කලණදහම් ඇත්තේ, පැහු මසුරුමල ඇති සිතින් ගිහිගෙහි වෙසෙයි. මහණ බමුණන්ට ආක්‍රොශ හා නින්ද බස් නො බණන්නේ වෙයි. ඔහුගේ භාර්‍යාව ද ප්‍රාණවධ කරන්නී ... මිද පමා දෙකට කරුණු වූ රහ මෙර බොන්නී වෙයි. දුසිල් වූවා, ලමු දහම් ඇත්තී, වැළඳ ගත් මසුරු මල ඇති සිතින් ගිහිගෙහි වෙසෙයි. මහණබමුණනට ආක්‍රොශ හා නින්ද බස් බණන්නී වෙයි. ගැහැවියෙනි, මෙ පරිදි දෙව් වූයේ ලමු වූවක හා එක් ව වෙසෙයි.

ගැහැවියෙනි, කෙසේ දෙව් වූයේ දෙවුදුවක හා සමග වෙසේ ද? ගැහැවියෙනි, මෙ ලොව සැමියෙක් ප්‍රාණවධයෙන් වැළකුනේ ... මද පමා දෙකට කරුණු වූ රහමෙරින් වැළකුනේ වෙයි. සිල්වත් වූයේ කලණ දහම් ඇත්තේ පැහු මසුරුමල ඇති සිතින් ගිහිගෙයි වෙසෙයි. මහණබමුණනට ආක්‍රොශ හා නින්ද බස් නො බණන්නේ වෙයි. ඔහුගේ භාර්‍යාව ද ප්‍රාණවධයෙන් වැළකියා මද පමා දෙකට කරුණු වූ රහමෙරින් වැළකියා වෙයි. සිල් වත් වූවා, කලණදහම් ඇත්තී, පැහු මසුරුමල ඇති සිතින් ගිහිගෙයි වෙසෙයි. මහණ බමුණනට ආක්‍රොශ හා නින්ද බස් නො බණන්නී වෙයි. ගැහැවියෙනි, මෙපරිදි දෙව් වූයේ දෙවුදුවක හා එක්ව වෙසෙයි. ගැහැවියෙනි, මේ සතර සහවාසයෝ යි. වූ

6 දෙදෙන ම දුසිල් වූවාහු කදමසුරු වූවාහු නින්ද පෙරදුරි බස් බණන්නාහු වෙත් ද, ඒ අඹුසැමි දෙදෙනා ලමු ව සහවාසයට ගියාහු වෙත්.

7. සාමිකො හොති දුස්සීලො කදරියො පරිභාසකො,
භරියා සීලවතී හොති වදඤ්ඤූ වීතමච්ඡරා;
සාපි දෙවී සංවසති ඡවෙන පතිනා සහ

8. සාමිකො සීලවා හොති වදඤ්ඤූ වීතමච්ඡරො,
භරියා හොති දුස්සීලා කදරියා පරිභාසිකා;
සාපි ඡවා සංවසති දෙවෙන පතිනා සහ.

9. උභො සද්ධා වදඤ්ඤූ ච සඤ්ඤතා ධම්මජීවිනො,
තෙ හොන්ති ජානිපතයො අඤ්ඤමඤ්ඤං පියංවදා.

10. අත්ථා සම්පචුරා හොන්ති ඵාසත්ථං[1] උපජායති,
අමිත්තා දුම්මනා හොන්ති උභින්නං සමසීලිනං.

11. ඉධ ධම්මං චරිත්වාන සමසීලබ්බතා උභො,
නන්දිනො දෙවලොකස්මිං මොදන්ති කාමකාමිනොති.

## 4. 2. 1. 4.

## (දුතියසංවාසසුත්තං)

4. චත්තාරො'මෙ භික්ඛවෙ සංවාසා. කතමෙ චත්තාරො?

ඡවො ඡවාය සද්ධිං සංවසති, ඡවො දෙවියා සද්ධිං සංවසති, දෙවො ඡවාය සද්ධිං සංවසති, දෙවො දෙවියා සද්ධිං සංවසති.

කථඤ්ච භික්ඛවෙ ඡවො ඡවාය සද්ධිං සංවසති? ඉධ භික්ඛවෙ සාමිකො හොති පාණාතිපාතී අදින්නාදායී කාමෙසු මිච්ඡාචාරී මුසාවාදී පිසුනාවාචො ඵරුසාවාචො සම්ඵප්පලාපී අභිජ්ඣාලු ව්‍යාපන්නචිත්තො මිච්ඡාදිට්ඨිකො දුස්සීලො පාපධම්මො මච්ඡෙරමලපරියුට්ඨිතෙන චෙතසා අගාරං අජ්ඣාවසති, අක්කොසකපරිභාසකො සමණබ්‍රාහ්මණානං. භරියාපිස්ස හොති පාණාතිපාතිනී අදින්නාදායිනී කාමෙසු මිච්ඡාචාරිනී මුසාවාදිනී පිසුනාවාචා ඵරුසාවාචා සම්ඵප්පලාපිනී අභිජ්ඣාලුනී ව්‍යාපන්නචිත්තා මිච්ඡාදිට්ඨිකා දුස්සීලා පාපධම්මා මච්ඡෙරමලපරියුට්ඨිතෙන චෙතසා අගාරං අජ්ඣාවසති. අක්කොසිකපරිභාසිකා සමණබ්‍රාහ්මණානං. එවං ඛො භික්ඛවෙ ඡවො ඡවාය සද්ධිං සංවසති.

කථඤ්ච භික්ඛවෙ ඡවො දෙවියා සද්ධිං සංවසති? ඉධ භික්ඛවෙ සාමිකො හොති පාණාතිපාතී -පෙ- මිච්ඡාදිට්ඨිකො පාපධම්මො දුස්සීලො, මච්ඡෙරමල-පරියුට්ඨිතෙන චෙතසා අගාරං අජ්ඣාවසති, අක්කොසකපරිභාසකො සමණ-බ්‍රාහ්මණානං. භරියා ච ඛ්වස්ස හොති පාණාතිපාතා පටිවිරතා අදින්නාදානා පටිවිරතා කාමෙසු මිච්ඡාචාරා පටිවිරතා මුසාවාදා පටිවිරතා පිසුනාවාචා පටිවිරතා ඵරුසාවාචා පටිවිරතා සම්ඵප්පලාපා පටිවිරතා අනභිජ්ඣාලුනී අව්‍යාපන්නචිත්තා සම්මාදිට්ඨිකා සීලවතී කල්‍යාණධම්මා, විගතමලමච්ඡෙරෙන චෙතසා අගාරං අජ්ඣාවසති. අනක්කොසිකපරිභාසිකා සමණබ්‍රාහ්මණානං. එවං ඛො භික්ඛවෙ ඡවො දෙවියා සද්ධිං සංවසති.

1. ඵාසුකං - මජසං., චාසත්ථං - PTS.

7. සැමි දුසිල් වෙයි, තද මසුරු වෙයි. නින්දා පෙරදැරි කොට බස් බණින්නේ වෙයි. බිරිය සිල්වත් වෙයි. දන්කලු වෙයි. පැහූ මසුරුමල ඇත්තී වෙයි. ඒ දේවිය ලමු සැමියා හා එක් ව වෙසෙයි.

8. සැමි සිල්වත් වෙයි, දන්කලු වෙයි, පැහූ මසුරු මල ඇති වෙයි. බිරිය දුසිල් වෙයි, තද මසුරු වෙයි. නින්දා පෙරදැරි බස් බණින්නී වෙයි. හෙ ද ලමු වූවා දෙවි වූ හිමියා හා එක් ව වෙසෙයි.

9. දෙදෙන ම සැදැහැති ව දන්කලු ව ශීල සංයම ඇති ව දැහැමි ව සිට දිවි වටිනාහු වෙත් ද, ඒ අඹුසැමිහු උනුනට ප්‍රියංවද වෙත්.

10. සම සිල් ඇති ඒ දෙදෙනාගේ අභිවෘද්ධිහු ප්‍රචුර වෙත්. උනුනට පහසු විහරණ වෙයි, අමිත්‍රයෝ දොම්ණසෙන් දුවුසිත් ඇති වෙත්.

11. මෙලොව සමානශීලව්‍රත ඇති ඒ දෙදෙන දහම් පුරා සතුටු වූවාහු දෙව්ලොව දී කාමසම්පත්ති කැමති වත්නාහු (විපාකමොදනායෙන්) මුදිත වෙත්.

## 4. 2. 1. 4.

## [ දුතිය සංවාස සූත්‍රය ]

මහණෙනි, මේ සංවාසයෝ සතර දෙනෙකි. කවර සතර දෙනෙක යත්:

ලමු වූයේ ලමු වූවක හා සමග වෙසෙයි. ලමු වූයේ දෙවිදුවක හා සමග වෙසෙයි. දෙවි වූයේ ලමු වූවක හා එක්ව වෙසෙයි. දෙවිවූයේ දෙවිදුවක හා එක්ව වෙසෙයි.

මහණෙනි, කෙසේ ලමු වූයේ ලමු වූවක හා සමග වෙසේ ද? මහණෙනි, මෙ ලොව සැමියෙක් ප්‍රාණවධ කරන්නේ, අයිනාදන් ගන්නේ, කාමයන්හි වරදවා හැසිරෙන්නේ, බොරු කියන්නේ, පෙහෙසුන් බස් ඇත්තේ, පරොස්-බස් ඇත්තේ, පලප් බස් ඇත්තේ, දැඩි ලොබ බහුල කොට ඇත්තේ, ව්‍යාපාද යුත් සිතැත්තේ, මිසදිටු වූයේ වෙයි. දුසිල් වූයේ, පවිටු දහම් ඇතියේ, වැළඳගත් මසුරු මලැති සිතින් ගිහිගෙයි වෙසෙයි. මහණ බමුණනට ආක්‍රොශ හා නින්දා පෙරදැරි බස් බණින්නේ වෙයි. ඔහුගේ භාර්‍යාව ද ප්‍රාණවධ කරන්නී, අයිනාදන් ගන්නී, කාමයෙහි වරදවා හැසිරෙන්නී, මුසවා බණින්නී, පෙහෙසුන් නෙපලන්නී, පරොස් බස් නෙපලන්නී, පලප්බස් දොඩන්නී, දැඩි-ලොබ බහුල කොට ඇත්තී, ව්‍යාපාදයට පත් සිතැත්තී, මිසදිටු ඇත්තී වෙයි. දුසිල් වූවා පවිටු දහම් ඇත්තී, වැළඳ ගත් මසුරුමල ඇති සිතින් ගිහිගෙයි වෙසෙයි. මහණබමුණනට ආක්‍රොශ හා නින්දා පෙරදැරි බස් බණින්නී වෙයි මහණෙනි, මෙ පරිදි ලමු වූයේ ලමු වූවක හා එක්ව වෙසෙයි.

මහණෙනි, කෙසේ ලමු වූයේ දෙවිදුවක හා සමග වෙසේ ද? මහණෙනි, මෙ ලොව සැමියෙක් ප්‍රාණවධ කරන්නේ, ... මිසදිටු වූයේ පවිටු දහම් ඇත්තේ වෙයි. දුසිල් වූයේ වැළඳගත් මසුරුමල ඇති සිතින් ගිහිගෙයි වෙසෙයි මහණ බමුණනට ආක්‍රොශ හා නින්දා පෙරදැරි බස් බණින්නේ වෙයි. ඔහුගේ බිරිය ප්‍රාණවධයෙන් වැළකියා, අයිනාදනින් වැළකියා, කාම-යෙහි මිථ්‍යාචාරයෙන් වැළකියා, මුසාවායෙන් වැළකියා, පෙහෙසුනෙන් වැළකියා පරොස් බසින් වැළකියා, පලපින් වැළකියා, බිහිලි දැඩි ලොබින් වැළකියා, ව්‍යාපාදයට නො ගිය සිතැත්තී සම්දිටු ඇත්තී වෙයි. සිල්වත් වූවා, කලණ දහම් ඇත්තී, පැහූ මසුරුමල ඇති සිතින් ගිහිගෙහි වුසු වෙයි. මහණ-බමුණනට ආක්‍රොශ හා නින්දා පෙරදැරි බස් නො බණින්නී වෙයි. මහණෙනි, මෙ පරිදි ලමු වූයේ දෙවිදුවක හා එක්ව වෙසෙයි.

කථඤ්ච භික්ඛවෙ දෙවො ඡවාය සද්ධිං සංවසති: ඉධ භික්ඛවෙ සාමිකො හොති පාණාතිපාතා පටිවිරතො අදින්නාදානා පටිවිරතො කාමෙසු මිච්ඡාචාරා පටිවිරතො මුසාවාදා පටිවිරතො පිසුනාවාචා පටිවිරතො ඵරුසාවාචා පටිවිරතො සම්ඵප්පලාපා පටිවිරතො අනභිජ්ඣාලු අබ්‍යාපන්නචිත්තො සම්මාදිට්ඨිකො සීලවා කල්‍යාණධම්මො. විගතමලමච්ඡෙරෙන චෙතසා අගාරං අජ්ඣාවසති අනක්කොසකපරිභාසකො සමණබ්‍රාහ්මණානං. භරියා ච ඛ්වස්ස හොති පාණාතිපාතිනී -පෙ- මිච්ඡාදිට්ඨිකා දුස්සීලා පාපධම්මා මච්ඡෙරමලපරියුට්ඨිතෙන චෙතසා අගාරං අජ්ඣාවසති අක්කොසිකපරිභාසිකා සමණබ්‍රාහ්මණානං. එවං ඛො භික්ඛවෙ දෙවො ඡවාය සද්ධිං සංවසති.

කථඤ්ච භික්ඛවෙ දෙවො දෙවියා සද්ධිං සංවසති: ඉධ භික්ඛවෙ සාමිකො හොති පාණාතිපාතා පටිවිරතො -පෙ- සම්මාදිට්ඨිකො සීලවා කල්‍යාණධම්මො විගතමලමච්ඡෙරෙන චෙතසා අගාරං අජ්ඣාවසති. අනක්කොසකපරිභාසකො සමණබ්‍රාහ්මණානං. භරියාපිස්ස හොති පාණාතිපාතා පටිවිරතා -පෙ- සම්මාදිට්ඨිකා සීලවතී කල්‍යාණධම්මා විගතමලමච්ඡෙරෙන චෙතසා අගාරං අජ්ඣාවසති. අනක්කොසිකපරිභාසිකා සමණබ්‍රාහ්මණානං. එවං ඛො භික්ඛවෙ දෙවො දෙවියා සද්ධිං සංවසති. ඉමෙ ඛො භික්ඛවෙ චත්තාරො සංවාසාති.

12. උභො ච හොන්ති දුස්සීලා කදරියා පරිභාසකා,
තෙ හොන්ති ජානිපතයො ඡවා සංවාසමාගතා.

13. සාමිකො හොති දුස්සීලො කදරියො පරිභාසකො,
භරියා සීලවතී හොති වදඤ්ඤූ වීතමච්ඡරා,
සාපි දෙවී සංවසති ඡවෙන පතිනා සහ.

14. සාමිකො සීලවා හොති වදඤ්ඤූ වීතමච්ඡරො,
භරියා හොති දුස්සීලා කදරියා පරිභාසිකා,
සාපි ඡවා සංවසති දෙවෙන පතිනා සහ.

15. උභො සද්ධා වදඤ්ඤූ ච සඤ්ඤතා ධම්මජීවිනො,
තෙ හොන්ති ජානිපතයො අඤ්ඤමඤ්ඤං පියංවදා.

16. අත්ථා සම්පචුරා හොන්ති ඵාසත්ථං උපජායති,
අමිත්තා දුම්මනා හොන්ති උභින්නං සමසීලිනං.

17. ඉධ ධම්මං චරිත්වාන සමසීලබ්බතා උභො,
නන්දිනො දෙවලොකස්මිං මොදන්ති කාමකාමිනොති.

## 4. 2. 1. 5.

## [පඨම (නකුල) සමජීවිසුත්තං]

5. එකං සමයං භගවා භග්ගෙසු විහරති සුංසුමාරගිරෙ[1] භෙසකළාවනෙ[2] මිගදායෙ. අථ ඛො භගවා පුබ්බණ්හසමයං නිවාසෙත්වා පත්තචීවරමාදාය යෙන නකුලපිතුනො ගහපතිස්ස නිවෙසනං තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා පඤ්ඤත්තෙ ආසනෙ නිසීදි.

1. සුසුමාරගිරෙ - මජසං 2. භෙසකළාවනෙ - මජසං

මහණෙනි, කෙසේ දෙව්වූයේ ලමුවූවක හා සමග වෙසේ ද? මහණෙනි, මෙලොව සැමියෙක් ප්‍රාණවධයෙන් වැළකුනේ, අසිනාදනින් වැළකුනේ, කාමයෙහි මිසහසරින් වැළකුනේ, මුසවායෙන් වැළකුනේ, පෙසුණුනින් වැළකුනේ, පරොස් බසින් වැළකුනේ, පලපින් වැළකුනේ, දැඩි ලොබ බිහිලී කොට නැත්තේ, ව්‍යාපාදයට නොපත් සිත් ඇත්තේ, සම්දිටු ඇත්තේ වෙයි. සිල්වත් වූයේ කලණ දහම් ඇත්තේ පැහූ මසුරුමල ඇති සිතින් ගිහිගෙයි වෙසේ. මහණබමුණනට ආක්‍රොශ හා නින්ද පෙරදූරි බස් නො බණින්නේ වෙයි. ඔහුගේ භාර්‍ය්‍යාව ප්‍රාණවධ කරන්නී, ... මිසදිටු ඇත්තී වෙයි. දුසිල් වූවා, පව්වූ දහම් ඇත්තී, වැළදගත් මසුරුමල ඇති සිතින් ගිහිගෙයි වෙසෙයි. මහණ බමුණනට ආක්‍රොශ හා නින්ද පෙර දූරි බස් බණන්නී වෙයි. මහණෙනි, මෙ පරිදි දෙව්වූයේ ලමුවූවක හා එක්ව වෙසෙයි.

මහණෙනි, කෙසේ දෙව්වූයේ දෙවුදුවක හා එක්ව වෙසේ ද? මහණෙනි, මෙලොව සැමියෙක් ප්‍රාණවධයෙන් වැළකුනේ ... සම්දිටු ඇත්තේ වෙයි. සිල්වත් වූයේ කලණ දහම් ඇත්තේ පැහූ මසුරුමල ඇති සිතින් ගිහිගෙයි වෙසෙයි. මහණ බමුණනට ආක්‍රොශ හා නින්ද පෙරදූරි බස් නො බණින්නේ වෙයි. ඔහුගේ බිරිය ද ප්‍රාණවධයෙන් වැළකීයා ... සම්දිටු ඇත්ති වෙයි. සිල්වත් වූවා කලණ දහම් ඇත්තී පැහූ මසුරුමල ඇති සිතින් ගිහිගෙයි වෙසෙයි. මහණ බමුණනට ආක්‍රොශ හා නින්ද පෙරදූරි බස් නොබණන්නී වෙයි. මහණෙනි, මෙපරිදි දෙව්වූයේ දෙව්දුවක හා එක්ව වෙසෙයි. මහණෙනි, මේ සතර සහවාසයෝ යි.

12. දෙමහල්ලෝ ම දුසිල් වූවාහු, තදමසුරු වූවාහු නින්දපෙරදූරි බස් බණන්නාහු වෙත් ද, ඒ අඹුසැමි දෙදෙනා ලමු ව සහවාසයට ගියාහු වෙත්.

13. සැමි දුසිල් වෙයි, තදමසුරු වෙයි, නින්ද පෙරදූරි කොට බණන්නේ වෙයි. බිරිය සිල්වත් වෙයි, දන්කලු වෙයි, පැහූ මසුරුමල ඇත්තී වෙයි. ඒ දෙවිය ලමු සැමියා හා එක්ව වෙසෙයි.

14. සැමි සිල්වත් වෙයි, දන්කලු වෙයි, පැහූ මසුරුමල ඇති වෙයි. බිරිය දුසිල් වෙයි, තදමසුරු වෙයි, නින්ද පෙරදූරි බස් බණන්නී වෙයි. හො ද ලමු වූවා දෙව් වූ හිමියා හා එක්ව වෙසෙයි.

15. දෙදෙන ම සැදැහැති ව, දන්කලු ව ශිලසංයම ඇති ව දහමින් සිට දිවිපවත්නාහු වෙත් ද, ඒ අඹුසැමිහු උනුනට ප්‍රියංවද වෙත්.

16. සමසිල් ඇති, ඒ දෙදෙනාගේ අභිවෘද්ධිහු ප්‍රචුර වෙත්. උනුනට පහසු විහරණ වෙයි. අමිත්‍රයෝ දොමනයෙන් දුමුසිත් ඇති වෙත්.

17. මෙලොව සමාන ශිලව්‍රත ඇති ඒ දෙදෙන දහම් පුරා සතුටු වූවාහු දෙව්ලොව දී කාමසම්පත් කැමැති වන්නාහු මුදිත වෙත්.

**4. 2. 1. 6.**

**[පඨම (නකුල) සමජීවී සූත්‍රය ]**

5. එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ භග්‍රරට සුංසුමාරගිරී නුවර භෙසකලාවන නම් (මිහිගස් ඇති) මුවලැව්හි වැඩ වෙසෙති. එක්බිති භාග්‍යවතුන් වහන්සේ පෙරවරුයෙහි හැඳ පෙරව පාසිවුරු ගෙණ නකුලපිතු ගැහැවියාගේ නිවෙස කරා එළඹියහ. එළඹ පැන් වූ අස්නෙහි වැඩහුන්හ.

අථ ඛො නකුලපිතා ච ගහපති නකුලමාතා ච ගහපතානී යෙන භගවා තෙනුපසඞ්කමිංසු. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදිංසු. එකමන්තං නිසින්නො ඛො නකුලපිතා ගහපති භගවන්තං එතදවොච:

යතො මෙ භන්තෙ නකුලමාතා ගහපතානී දහරස්සෙව දහරා ආනීතා, නාභිජානාමි නකුලමාතරං ගහපතානිං මනසාපි අතිචරිතා, කුතො පන කායෙන. ඉච්ඡෙය්‍යාම මයං භන්තෙ දිට්ඨෙ චෙව ධම්මෙ අඤ්ඤමඤ්ඤං පස්සිතුං අභිසම්පරායඤ්ච අඤ්ඤමඤ්ඤං පස්සිතුන්ති.

නකුලමාතාපි ඛො ගහපතානී භගවන්තං එතදවොච: යතොහං භන්තෙ නකුලපිතුනො ගහපතිස්ස දහරස්සෙව දහරා ආනීතා, නාභිජානාමි නකුලපිතරං ගහපතිං මනසාපි අතිචරිතා, කුතො පන කායෙන. ඉච්ඡෙය්‍යාම මයං භන්තෙ දිට්ඨෙ චෙව ධම්මෙ අඤ්ඤමඤ්ඤං පස්සිතුං, අභිසම්පරායඤ්ච අඤ්ඤමඤ්ඤං පස්සිතුන්ති.

ආකඞ්ඛෙය්‍යුං චෙ ගහපතයො උභො ජානිපතයො දිට්ඨෙ චෙව ධම්මෙ අඤ්ඤමඤ්ඤං පස්සිතුං අභිසම්පරායඤ්ච අඤ්ඤමඤ්ඤං පස්සිතුං. උභො ච අස්සු සමසද්ධා සමසීලා සමචාගා සමපඤ්ඤා, තෙ දිට්ඨෙ චෙව ධම්මෙ අඤ්ඤමඤ්ඤං පස්සන්ති අභිසම්පරායඤ්ච අඤ්ඤමඤ්ඤං පස්සන්තීති.

18. උභො සද්ධා වදඤ්ඤූ ච සඤ්ඤතා ධම්මජීවිනො,
තෙ හොන්ති ජානිපතයො අඤ්ඤමඤ්ඤං පියංවදා.

19. අත්ථා සම්පචුරා හොන්ති ඵාසත්ථං උපජායති,
අමිත්තා දුම්මනා හොන්ති උභින්නං සමසීලිනං.

20. ඉධ ධම්මං චරිත්වාන සමසීලබ්බතා උභො,
නන්දිනො දෙවලොකස්මිං මොදන්ති කාමකාමිනොති.

## 4. 2. 1. 6.

## [ දුතිය (නකුල) සමජීවිසුත්තං ]

6. ආකඞ්ඛෙය්‍යුං චෙ භික්ඛවෙ උභො ජානිපතයො දිට්ඨෙ චෙව ධම්මෙ අඤ්ඤමඤ්ඤං පස්සිතුං අභිසම්පරායඤ්ච අඤ්ඤමඤ්ඤං පස්සිතුං. උභො ච අස්සු සමසද්ධා සමසීලා සමචාගා සමපඤ්ඤා, තෙ දිට්ඨෙ චෙව ධම්මෙ අඤ්ඤමඤ්ඤං පස්සන්ති, අභිසම්පරායඤ්ච අඤ්ඤමඤ්ඤං පස්සන්තීති.

21. උභො සද්ධා වදඤ්ඤූ ච සඤ්ඤතා ධම්මජීවිනො,
තෙ හොන්ති ජානිපතයො අඤ්ඤමඤ්ඤං පියංවදා.

22. අත්ථා සම්පචුරා හොන්ති ඵාසත්ථං උපජායති,
අමිත්තා දුම්මනා හොන්ති උභින්නං සමසීලිනං.

23. ඉධ ධම්මං චරිත්වාන සමසීලබ්බතා උභො,
නන්දිනො දෙවලොකස්මිං මොදන්ති කාමකාමිනොති.

එක්බිති නකුලපිතු ගෘහපති හා නකුලමාතු ගෘහපතිනී හා දෙදෙන භාග්‍යවතුන් වහන්සේ කරා එළඹියහ. එළඹ භාග්‍යවතුන් වහන්සේ වැඳ එකත්පස්ව හුන්හ. එකත්පස්ව හුන් නකුලපිතු ගෙහෙවි භාග්‍යවතුන් වහන්සේට මෙසේ කියේය.

වහන්ස, යම් කලෙක තරුණවියෙහි සිටි මට තුරුණුවියෙහි සිටි නකුලමාතු ගෘහපතිනිය පරිනීත වූ ද, එතැන් සිට නකුලමාතු ගෘහපතිනිය සිතින් පවා ඉක්ම ගියෙම් නොදනිමි. කයින් වනාහි කියනු කිම! වහන්ස, අපි දෙදෙනමෝ මෙලොව්හිදු උනුන් දක්නට පරලොව්හි දු උනුන් දක්නට කැමැතියම්හ යනුයි.

නකුලමාතු ගෘහපතිනිය ද භාග්‍යවතුන් වහන්සේට මෙසේ කීය: වහන්ස, යම් කලෙක තරුණවියෙහි සිටි මම තරුණවියෙහි සිටි නකුලපිතු ගෘහපතිහට ගෙණෙන ලදුම් ද, නකුලපිතු ගෘහපතියා සිතින් පවා ඉක්ම ගියෙම් නොදනිමි. කයින් වනාහි කියනු කිම! වහන්ස, අපි දෙදෙනමෝ මෙලොව්හි ද උනුන් දක්නට පරලොව්හි දු උනුන් දක්නට කැමැතියම්හ යනුයි.

ගෘහපතිකුලවාසීයෙනි, ඉදින් අඹුසැමි දෙදෙන මෙලොව්හි ද උනුන් දක්නට පරලොව්හි ද උනුන් දක්නට කැමැති වන්නාහු නම් දෙදෙන ම සමසැදැහැ ඇතියාහු නම් සම සිල් ඇතියාහු නම් සමත්‍යාග ඇතියාහු නම් සමප්‍රඥා ඇතියාහු නම් ඔහු දෙදෙන මෙලොව්හි ද උනුන් දක්නාහ. පරලොව්හි දු උනුන් දක්නාහ.

18. දෙදෙන ම සැදැහැතිව, දන්කලු ව ශීලසංයම ඇතිව දහම්හි සිට දිවිවටනාහු වෙත් ද, ඒ අඹුසැමිහු උනුනට ප්‍රියංවද වෙති.

19. සමසිල් ඇති ඒ දෙදෙනාගේ අභිවෘද්ධීහු ප්‍රචුර වෙත්. උනුනට පහසු විහරණ වෙයි. අමිත්‍රයෝ දොම්නසයෙන් දුටුසිත් ඇති වෙත්.

20. මෙලොව සමාන ශීලව්‍රත ඇති ඒ දෙදෙන දහම් පුරා සතුටු වූවාහු දෙව්ලොව දී කාමසම්පත් කැමැති වන්නාහු මුදිත වෙත්.

## 4. 2. 1. 6

## [ දුතිය (නකුල) සමජීවි සූත්‍රය ]

6. මහණෙනි, ඉදින් අඹුසැමිහු දෙදෙනා මෙලොව්හිත් පරලොව්හිත් උනුන් දක්නට කැමැති වන්නාහු නම් දෙදෙන ම සම සැදැහැ සමසිල් සමත්‍යාග සමප්‍රඥා ඇතිවන්නාහුය. ඔහු දෙදෙන මෙලොව්හි ද පරලොව්හි ද උනුන් දක්නාහ.

21 දෙමිහල්ලෝ ම සැදැහැති ව, දන්කලු ව, ශීලසංයම ඇති ව දහම්හි සිට දිවිවටනාහු වෙත් ද, ඒ අඹුසැමිහු උනුනට ප්‍රියංවද වෙති.

22. සම සිල් ඇති ඒ දෙදෙනාගේ අභිවෘද්ධීහු ප්‍රචුර වෙත්. උනුනට පහසු විහරණ වෙයි. අමිත්‍රයෝ දොම්නසයෙන් දුටුසිත් ඇති වෙත්.

23. මෙලොව සමාන ශීලව්‍රත ඇති ඒ දෙදෙන දහම් පුරා සතුටු වූවාහු දෙව්ලොවදී කාමසම්පත් කැමැති වන්නාහු මුදිත වෙත්.

## 4. 2. 1. 7.

## [ සුප්පවාසාසුත්තං ]

7. එකං සමයං භගවා **කොලියෙසු** විහරති **සජ්ජනෙලං**[1] නාම කොලියානං නිගමො. අථ ඛො භගවා පුබ්බණ්හසමයං නිවාසෙත්වා පත්තචීවරමාදාය යෙන **සුප්පවාසාය** කොලියධීතාය නිවෙසනං තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා පඤ්ඤත්තෙ ආසනෙ නිසීදි.

අථ ඛො සුප්පවාසා කොලියධීතා භගවන්තං පණීතෙන ඛාදනීයෙන භොජනීයෙන සහත්ථා සන්තප්පෙසි, සම්පවාරෙසි. අථ ඛො සුප්පවාසා කොලියධීතා භගවන්තං භුත්තාවිං ඔනීතපත්තපාණිං එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නං ඛො සුප්පවාසං කොලියධීතරං භගවා එතදවොච:

භොජනං සුප්පවාසෙ දෙන්තී අරියසාවිකා පටිග්ගාහකානං චත්තාරි ඨානානි දෙති. කතමානි චත්තාරි?

ආයුං දෙති වණ්ණං දෙති සුඛං දෙති බලං දෙති. ආයුං ඛො පන දත්වා ආයුස්ස භාගිනී හොති. දිබ්බස්ස වා මානුසස්ස වා. වණ්ණං දත්වා වණ්ණස්ස භාගිනී හොති දිබ්බස්ස වා මානුසස්ස වා. සුඛං දත්වා සුඛස්ස භාගිනී හොති දිබ්බස්ස වා මානුසස්ස වා. බලං දත්වා බලස්ස භාගිනී හොති දිබ්බස්ස වා මානුසස්ස වා. භොජනං සුප්පවාසෙ දෙන්තී අරියසාවිකා පටිග්ගාහකානං ඉමානි චත්තාරි ඨානානි දෙතීති.

24. සුසඞ්ඛතං භොජනං යා දදාති සුචිං පණීතං[2] රසසා උපෙතං,
සා දක්ඛිණා උජ්ජුගතෙසු දින්නා චරණොපපන්නෙසු
මහග්ගතෙසු,
පුඤ්ඤෙන පුඤ්ඤං සංසන්දමානා මහප්ඵලා ලොකවිදූන වණ්ණිතා.

25. එතාදිසං යඤ්ඤමනුස්සරන්තා යෙ වෙදජාතා විචරන්ති ලොකෙ,
විනෙය්‍ය මච්ඡෙරමලං සමූලං අනින්දිතා සග්ගමුපෙන්ති ඨානන්ති.

## 4. 2. 1. 8.

## [ සුදත්ත අනාථපිණ්ඩික සුත්තං ]

[**සාවත්ථිනිදානං:**]

8. අථ ඛො **අනාථපිණ්ඩිකො** ගහපති යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නං ඛො අනාථපිණ්ඩිකං ගහපතිං භගවා එතදවොච:

භොජනං ගහපති දදමානො අරියසාවකො පටිග්ගාහකානං චත්තාරි ඨානානි දෙති. කතමානි චත්තාරි?

ආයුං දෙති, වණ්ණං දෙති, සුඛං දෙති, බලං දෙති. ආයුං ඛො පන දත්වා ආයුස්ස භාගී හොති දිබ්බස්ස වා මානුසස්ස වා. වණ්ණං දත්වා -පෙ- සුඛං දත්වා -පෙ- බලං දත්වා බලස්ස භාගී හොති දිබ්බස්ස වා මානුසස්ස වා. භොජනං ගහපති දදමානො අරියසාවකො පටිග්ගාහකානං ඉමානි චත්තාරි ඨානානි දෙතීති.

26. යො සඤ්ඤතානං පරදත්තභොජිනං කාලෙන සක්කච්ච
දදාති භොජනං,
චත්තාරි ඨානානි අනුප්පවෙච්ඡති ආයුඤ්ච වණ්ණඤ්ච සුඛං බලඤ්ච.

27. සො ආයුදායී බලදායී සුඛං වණ්ණං දදො නරො,*
දීඝායු යසවා හොති යත්ථ යත්ථූපපජ්ජතීති.

1. පජ්ජනීලං - මජ්සං. පජ්ජනෙලං - ස්‍යා. කං. 2. සුපණීතං - කං.

* සො ආයුදායී වණ්ණදායී සුඛබලදදො නරො - මජ්සං. සුඛං බලං දදො නරො - සාළුවි.

## 4. 2. 1. 7

## [සුප්පවාසා සූත්‍රය]

7. එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ කොළිය. දනව්වෙහි **සජ්ජනෙල** නම් කොලියරජකුලයන්ගේ නියම්ගම්හි වැඩ වෙසෙති. එක්බිති භාග්‍යවතුන් වහන්සේ පෙරවරුයෙහි හැඳ පෙරෙව පා සිවුරු ගෙණ **සුප්පාවාසා** නම් කොලියරාජදුහිතෘවගේ නිවෙසනය කරා වැඩිය හ. වැඩ පැන් වූ අස්නෙහි වැඩ හුන්හ.

එක්බිති සුප්පවාසා කොලිය රජදුව භාග්‍යවතුන් වහන්සේ ප්‍රණීත ඛාද්‍ය-භෝජ්‍යයෙන් සියතින් සතපා ලූ ය. මොනොවට පවරාලූය. එක්බිති සුප්පවාසා කොලිය රජදූ නිමිකළ වැළඳුම් ඇති, පාත්‍රයෙන් ඉවත් කළ අත් ඇති භාග්‍ය-වතුන් වහන්සේ දැක එකත්පස් ව හුන. භාග්‍යවතුන් වහන්සේ එකත්පස්ව හුන් සුප්පවාසා කොලිය රජදුවට මෙල වදාළහ:

සුප්පවාසාවෙනි, බොජුන් දෙන අරිසැවි ප්‍රතිග්‍රාහකයනට සතර කරුණක් දෙයි. කවර සතර කරුණෙක යත්:

ආයුෂ දේ, වර්‍ණය දේ, සුඛය දේ, බලය දේ, ආදත් දී දිව්‍ය වූ හෝ මානුෂ වූ හෝ ආයුෂයට හිමි වෙයි. වර්‍ණදත දී දිව්‍ය වූ හෝ මානුෂ වූ හෝ වර්‍ණයට හිමි වෙයි. සුඛදත දී දිව්‍ය වූ හෝ මානුෂ වූ හෝ සුඛයට හිමි වෙයි. බලදත දී දිව්‍ය වූ හෝ මානුෂ වූ හෝ බලයට හිමි වෙයි. සුප්පවාසාවෙනි, බොජුන් දෙන අරිසැවි ප්‍රතිග්‍රාහකයනට මේ සතර කරුණු දෙයි.

24 - 25 යම් අරිසැවියක් පවිත්‍ර ප්‍රණීත රසයෙන් යුත් බොජුන් මොනොවට සකස් කොට දේ ද, පසලොස් චරණධර්මයෙන් සමන්‍වාගත මහද්ගත වූ රහතුන් විෂයෙහි මහත්ඵල ඇති, බුදුන් විසින් වණන ලද, ඒ දක්‍ෂිණාව දෙන ලද ද, සිණෙන් පිණ සඳහා මෙබඳු දානය සිහි කරණ යම් අරිසැවි කෙනෙක් උපන් ප්‍රීති ඇතිව ලොකයෙහි වෙසෙත් ද, ඔහු මසුරු-මල මුලුසුන් කොටපියා අනින්‍දිත ව සගතැන් පැමිණෙත්.

## 4. 2. 1. 8

## [සුදත්ත (අනාථපිණ්ඩික) සූත්‍රය]

**[සැවැත් නිදානයි:]**

8. එක්බිති **අනේපිඬු** ගැහැවි භාග්‍යවතුන් වහන්සේ කරා එළඹියේ ය. එළඹ භාග්‍යවතුන් වහන්සේ වැඳ එකත්පස්ව හුන්නේ ය. එකත්පස්ව හුන් අනේපිඬු ගැහැවිහට භාග්‍යවතුන් වහන්සේ මෙල වදාළහ.

ගැහැවිය, බොජුන් දෙන අරිසවු පිළිගාවනට සතර කරුණක් දෙයි. කවර සතර කරුණෙක යත්:

ආයුෂ දෙයි, වර්‍ණය දෙයි, සුඛය දෙයි, බලය දෙයි. ආයුෂ දී දිව්‍ය වූ හෝ මානුෂ වූ හෝ ආයුෂයට හිමි වෙයි. වර්‍ණය දී ... සුඛය දී ... බලය දී දිව්‍ය වූ හෝ මානුෂ වූ හෝ බලයට හිමි වෙයි. ගැහැවියෙනි, බොජුන් දෙන අරිසවු පිළිගාවනට මේ සතර කරුණු දෙයි.

26. යමෙක් සංයත වූ පරා දුන් බොජුන් වළඳනවුනට නිසි කල්හි සකසා බොජුන් දේ ද, හේ ආයුෂය වර්‍ණය සුඛය බලය යි සතර කරුණු දෙයි.

27. ආයුදායක බලදායක සුඛදායක වර්‍ණදායක ඒ මිනිස් යම් යම් තැනෙක උපදනේ ද, එ හැම්තැන දීර්‍ඝායුෂ්‍ක වෙයි. මහාපරිවාර ද වෙයි.

## 4. 2. 1. 9.

### [ භොජනදායකසුත්තං ]

9. භොජනං භික්ඛවෙ දදමානො දායකො පටිග්ගාහකානං චත්තාරි ඨානානි දෙති. කතමානි චත්තාරි?

ආයුං දෙති, වණ්ණං දෙති, සුඛං දෙති, බලං දෙති. ආයුං ඛො පන දත්වා ආයුස්ස භාගී හොති දිබ්බස්ස වා මානුසස්ස වා. වණ්ණං දත්වා -පෙ- සුඛං දත්වා -පෙ- බලං දත්වා බලස්ස භාගී හොති දිබ්බස්ස වා මානුසස්ස වා. භොජනං භික්ඛවෙ දදමානො දායකො පටිග්ගාහකානං ඉමානි චත්තාරි ඨානානි දෙතීති.

28. යො සඤ්ඤතානං පරදත්තභොජිනං කාලෙන සක්කච්ච
දදාති භොජනං,
චත්තාරි ඨානානි අනුප්පවෙච්ඡති ආයුඤ්ච වණ්ණඤ්ච
සුඛං බලං ච.

29. සො ආයුදායී බලදායී සුඛං වණ්ණං දදො නරො,
දීඝායු යසවා හොති යත්ථ යත්ථූපපජ්ජතීති.

## 4. 2. 1. 10.

### [ ගිහිසාමීචිපටිපදාසුත්තං ]

10. අථ ඛො **අනාථපිණ්ඩිකො** ගහපති යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නං ඛො අනාථපිණ්ඩිකං ගහපතිං භගවා එතදවොච:

චතූහි ඛො ගහපති ධම්මෙහි සමන්නාගතො අරියසාවකො ගිහිසාමීචිපටිපදං පටිපන්නො හොති යසොපටිලාභිනිං සග්ගසංවත්තනිකං. කතමෙහි චතූහි?

ඉධ ගහපති අරියසාවකො භික්ඛුසඞ්ඝං පච්චුපට්ඨිතො හොති චීවරෙන. භික්ඛුසඞ්ඝං පච්චුපට්ඨිතො හොති පිණ්ඩපාතෙන, භික්ඛුසඞ්ඝං පච්චුපට්ඨිතො හොති සෙනාසනෙන, භික්ඛුසඞ්ඝං පච්චුපට්ඨිතො හොති ගිලානපච්චයභෙසජ්ජපරික්ඛාරෙන.

ඉමෙහි ඛො ගහපති චතූහි ධම්මෙහි සමන්නාගතො අරියසාවකො ගිහිසාමීචිපටිපදං පටිපන්නො හොති යසොපටිලාභිනිං සග්ගසංවත්තනිකන්ති.

30. ගිහිසාමීචිපටිපදං පටිපජ්ජන්ති පණ්ඩිතා,
සම්මග්ගතෙ සීලවන්තෙ චීවරෙන උපට්ඨිතා,
පිණ්ඩපාතසයනෙන ගිලානපච්චයෙන ච.

31. තෙසං දිවා ච රත්තො ච සදා පුඤ්ඤං පවඩ්ඪති,
සග්ගඤ්ච කමතිට්ඨානං කම්මං කත්වාන භද්දකන්ති.

**පුඤ්ඤාභිසන්දවග්ගො පඨමො.**

**තස්සුද්දානං:**

**ද්වෙ පුඤ්ඤාභිසන්දා ද්වෙ සංවාසා ද්වෙ ච** හොන්ති සමජීවිනො,
සුප්පවාසා සුදත්තො ච **භොජනං** ගිහිසාමීචිනාති.

## 4. 2. 1. 9

### [ භොජනදායක සූත්‍රය ]

9. මහණෙනි, බොජුන් දෙන දායක පිළිගාවනට සතර කරුණක් දෙයි. කවර සතර කරුණෙක යත්:

ආයුෂ දෙයි, වර්ණය දෙයි, සුඛය දෙයි, බලය දෙයි. ආයුෂ දී දිව්‍ය වූ හෝ මානුෂ වූ හෝ ආයුෂයට හිමි වෙයි. වර්ණය දී ... සුඛය දී ... බලය දී දිව්‍ය වූ හෝ මානුෂ වූ හෝ බලයට හිමි වෙයි. මහණෙනි, බොජුන් දෙන දායක පිළිගාවනට මේ සතර කරුණු දෙයි.

28. යමෙක් සංයත වූ පරදත් බොජුන් වළඳනවුනට නිසි කල්හි සකසා බොජුන් දේ ද, හේ ආයුෂය, වර්ණය, සුඛය, බලය යි සතර කරුණු දෙයි.

29. ආයුදායක, බලදායක, සුඛදායක, වර්ණදායක ඒ මිනිස් යම් යම් තැනක උපදනේ ද, එ සැම තැන දීර්ඝායුෂ්‍ය වෙයි. මහාපරිවාර ද වෙයි.

## 4. 2. 1. 10

### [ ගිහිසාමීචිපටිපදා සූත්‍රය ]

10. එක්බිති අනේපිඬු ගෘහපති භාග්‍යවතුන් වහන්සේ කරා එළඹියේ ය. එළඹ භාග්‍යවතුන් වහන්සේ සකසා වැඳ එකත්පස්ව හුන්නේ ය. එකත්පස්ව හුන් අනේපිඬු ගෘහපතිහට භාග්‍යවතුන් වහන්සේ තෙල මදාළහ.

ගෘහපතියෙනි, සතර කරුණෙකින් සමන්විතවූ ආර්‍ය්‍යශ්‍රාවක යශස් ප්‍රතිලාභයට හේතු වූ ස්වර්ගය පිණිස පවත්නා ගිහිසාමීචිපටිපදාවට පිළිපන්නේ වෙයි. කවර සතර කරුණෙකින යත්:

ගෘහපතියෙනි, මෙලොව ආර්‍ය්‍යශ්‍රාවකයෙක් සිවුරෙන් භික්ෂුසඟහු පුදනට එළඹ සිටියේ වෙයි. පිඬුවායෙන් භික්ෂුසඟහු පුදනට එළඹ සිටියේ වෙයි. සෙනසුනින් භික්ෂුසඟහු පුදනට එළඹ සිටියේ වෙයි. ගිලන්පස බෙහෙසත් පිරිකරින් භික්ෂුසඟහු පුදනට එළඹ සිටියේ වෙයි. ගෘහපතියෙනි, මේ සතර කරුණින් සමන්විතවූ ආර්‍ය්‍යශ්‍රාවක යශස් ගෙණ දෙන ස්වර්ගය පිණිස පවත්නා ගිහිසාමීචි ප්‍රතිපත්තියට පිළිපන්නේ වෙයි.

30. සම්‍යග්ගත සිල්වත් පිළිගාවන් සිවුරින් පිඬුවායෙන් යහනින් ගිලන්පසින් උපස්ථාන කරණ පණ්ඩිත ගිහියෝ ගිහිසාමීචි පිළිවෙත පිළිපදිත්.

31. ඔවුනට දවරු දෙක්හි හැමදිනා පින් වැඩෙයි. කල්‍යාණකර්ම කොට ස්වර්ගයට යෙති.

**පුණ්‍යාභිසන්දවර්ගය පළමුවැනි යි.**

එහි උද්දානය:

පුණ්‍යාභිසන්ද දෙකය, සංවාස දෙකය, සමජීවි දෙකය, සුප්පවාසාය, සුදත්තය, භොජනය, ගිහිසාමීචිය යි සූත්‍ර දශයෙකි.

# 2. පත්තකම්මවග්ගො.

## 4. 2. 2. 1.

## [ පත්තකම්මසුත්තං ]

[ **සාවත්ථිනිදානං** ]

11. අථ ඛො **අනාථපිණ්ඩිකො** ගහපති යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නං ඛො අනාථපිණ්ඩිකං ගහපතිං භගවා එතදවොච:

චත්තාරො'මෙ ගහපති ධම්මා ඉට්ඨා කන්තා මනාපා දුල්ලභා ලොකස්මිං. කතමෙ චත්තාරො?

භොගා මෙ උප්පජ්ජන්තු සහධම්මෙනාති, අයං පඨමො ධම්මො ඉට්ඨො කන්තො මනාපො දුල්ලභො ලොකස්මිං.

භොගෙ ලද්ධා සහධම්මෙන යසො මං අබ්භුග්ගච්ඡතු සහඤාතීහි සහඋපජ්ඣායෙහීති අයං දුතියො ධම්මො ඉට්ඨො කන්තො මනාපො දුල්ලභො ලොකස්මිං.

භොගෙ ලද්ධා සහධම්මෙන යසං ලද්ධා සහඤාතීහි සහඋපජ්ඣායෙහි චිරං ජීවාමි දීඝමද්ධායුං පාලෙමීති, අයං තතියො ධම්මො ඉට්ඨො කන්තො මනාපො දුල්ලභො ලොකස්මිං.

භොගෙ ලද්ධා සහධම්මෙන, යසං ලද්ධා සහඤාතීහි සහඋපජ්ඣායෙහි චිරං ජීවිත්වා දීඝමද්ධායුං පාලෙත්වා, කායස්ස භෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උපපජ්ජාමීති, අයං චතුත්ථො ධම්මො ඉට්ඨො කන්තො මනාපො දුල්ලභො ලොකස්මිං.

ඉමෙ ඛො ගහපති චත්තාරො ධම්මා ඉට්ඨා කන්තා මනාපා දුල්ලභා ලොකස්මිං.

ඉමෙසං ඛො ගහපති චතුන්නං ධම්මානං ඉට්ඨානං කන්තානං මනාපානං දුල්ලභානං ලොකස්මිං චත්තාරො ධම්මා පටිලාභාය සංවත්තන්ති. කතමෙ චත්තාරො?

සද්ධාසම්පදා සීලසම්පදා චාගසම්පදා පඤ්ඤාසම්පදා.

කතමා ච ගහපති සද්ධාසම්පදා? ඉධ ගහපති අරියසාවකො සද්ධො හොති, සද්දහති තථාගතස්ස බොධිං, ඉතිපි සො භගවා අරහං සම්මාසම්බුද්ධො විජ්ජාචරණසම්පන්නො සුගතො ලොකවිදූ අනුත්තරො පුරිසදම්මසාරථි සත්ථා දෙවමනුස්සානං බුද්ධො භගවාති. අයං වුච්චති ගහපති සද්ධාසම්පදා.

කතමා ච ගහපති සීලසම්පදා? ඉධ ගහපති අරියසාවකො පාණාතිපාතා පටිවිරතො හොති -පෙ- සුරාමෙරයමජ්ජපමාදට්ඨානා පටිවිරතො හොති. අයං වුච්චති ගහපති සීලසම්පදා.

# 2. පත්තකම්ම වග්ගය.

4. 2. 2. 1

## [ පත්තකම්ම සූත්‍රය ]

**[සැවැත් නිදානයි:]**

11. එකල්හි **අනේපිඬු** ගැහැවි භාග්‍යවතුන් වහන්සේ කරා එළඹියේ ය. එළඹ භාග්‍යවතුන් වහන්සේ සකසා වැඳ එකත්පසෙක හිඳ. එකත්පස් ව හුන් අනේපිඬුසිටුහට භාග්‍යවතුන් වහන්සේ තෙල වදාළ සේක:

ගැහැවිය, ලෝකයෙහි ඉෂ්ට වූ කාන්ත වූ මනාප වූ දුර්ලභ වූ මේ සතර දහම්හු ය. කවර සතර දහම්හු ය යත්:

'මට භෝගසම්පත්හු දහම් නො බිඳ ගෙණ උදාවෙත්වා' යි ලෝකයෙහි ඉෂ්ට, කාන්ත, මනාප, දුර්ලභ මේ පළමුවන දහම ය.

'දහම් නො බිඳ ගෙණ භොග සම්පත් ලැබ නෑයන් නො හැර සංදෘෂ්ට, සමභක්තායන් නො හැර මාගේ පිරිවර සැපත් නැගේවා'යි ලෝකයෙහි ඉෂ්ට, කාන්ත, මනාප, දුර්ලභ මේ දෙවන දහම ය.

'දහම් නො බිඳ භෝගයන් ලැබ නෑයන් නොහැර සංදෘෂ්ට සමභක්තායන් නො හැර පිරිවර සැපත් ලැබ කලක් ජීවත් වෙම්වා යි – දීර්ඝායුෂ රැක-ගණිම්වා' යි ලොකයෙහි ඉෂ්ට, කාන්ත, මනාප දුර්ලභ මේ තෙවන දහම ය.

'දහම් නො බිඳ භෝගයන් ලැබ නෑයන් නො හැර සංදෘෂ්ට සමභක්තායන් නො හැර පිරිවර සැපත් ලැබ කලක් ජීවත් ව දීර්ඝායුෂ රැක ගෙණ කාබුන් මරණින් මත්තෙහි සුගති සංඛ්‍යාත ස්වර්ගලොකයට එළඹෙම් වා' යි ලොකයෙහි ඉෂ්ට, කාන්ත, මනාප දුර්ලභ මේ සතර වන දහම ය.

ගැහැවිය, ලෝකයෙහි ඉෂ්ට, කාන්ත, මනාප දුර්ලභ මේ සතර දහම්හු යි.

ගෙහෙවිය, ඉෂ්ට, කාන්ත, මනාප, ලොකයෙහි දුර්ලභ මේ සතර ධර්මයන්ගේ ප්‍රතිලාභය පිණිස සතර දහම් කෙනෙක් ඇත. කවර සතර කෙනෙක යත්:

ශ්‍රද්ධාසම්පද ය, ශීලසම්පද ය, ත්‍යාගසම්පදය, ප්‍රඥාසම්පද යි.

ගෙහෙවිය, ශ්‍රද්ධාසම්පද නම් කවරය යත්: ගෙහෙවිය, මෙ ලොව අරිසවු සැදැහැ ඇත්තේ වෙයි. 'මෙකරුණිනුදු ඒ භාග්‍යවතුන් වහන්සේ අර්හත්හ, සම්‍යක් සම්බුද්ධයහ, විද්‍යාචරණ සම්පන්නයහ. සුගතයහ, ලොකවිදූහ, අනුත්තර පුරුෂදම්‍ය සාරථියහ. දෙව් මිනිස්නට ශාස්තෘයහ. බුද්ධයහ. භගවත් හ' යි තථාගතයන් වහන්සේගේ සම්‍යක් සම්බෝධිය හදහයි. ගෙහෙවිය, මේ ශ්‍රද්ධාසම්පද යි කියනු ලැබේ.

ගැහැවිය, ශිලසම්පද නම් කවරය යත්: ගැහැවිය, මෙ ලොව අරිසවු පණිවායෙන් දුරු වූයේ වෙයි. ... මද පමා දෙකට කරුණු වන රහමෙරින් දුරු වූයේ වෙයි. ගෙගෙවිය, මේ ශීලසම්පද යි කියනු ලැබේ.

කතමා ච ගහපති චාගසම්පදා? ඉධ ගහපති අරියසාවකො විගතමලමච්ඡෙරෙන චෙතසා අගාරං අජ්ඣාවසති, මුත්තචාගො පයතපාණී වොස්සග්ගරතො යාචයොගො දානසංවිභාගරතො. අයං වුච්චති ගහපති චාගසම්පදා.

කතමා ච ගහපති පඤ්ඤාසම්පදා: අභිජ්ඣාවිසමලොභාභිභූතෙන ගහපති චෙතසා විහරන්තො අකිච්චං කරොති කිච්චං අපරාධෙති, අකිච්චං කරොන්තො කිච්චං අපරාධෙන්තො යසා ච සුඛා ච ධංසති. බ්‍යාපාදාභිභූතෙන ගහපති චෙතසා විහරන්තො අකිච්චං කරොති කිච්චං අපරාධෙති. අකිච්චං කරොන්තො කිච්චං අපරාධෙන්තො යසා ච සුඛා ච ධංසති. ථීනමිද්ධාභිභූතෙන ගහපති චෙතසා විහරන්තො අකිච්චං කරොති, කිච්චං අපරාධෙති. අකිච්චං කරොන්තො කිච්චං අපරාධෙන්තො යසා ච සුඛා ච ධංසති. උද්ධච්චකුක්කුච්චාභිභූතෙන ගහපති චෙතසා විහරන්තො අකිච්චං කරොති, කිච්චං අපරාධෙති. අකිච්චං කරොන්තො කිච්චං අපරාධෙන්තො යසා ච සුඛා ච ධංසති. විචිකිච්ඡාභිභූතෙන ගහපති චෙතසා විහරන්තො අකිච්චං කරොති කිච්චං අපරාධෙති. අකිච්චං කරොන්තො කිච්චං අපරාධෙන්තො යසා ච සුඛා ච ධංසති.

ස ඛො සො ගහපති අරියසාවකො අභිජ්ඣාවිසමලොභො චිත්තස්ස උපක්කිලෙසොති ඉති විදිත්වා අභිජ්ඣාවිසමලොභං චිත්තස්ස උපක්කිලෙසං පජහති. බ්‍යාපාදො චිත්තස්ස උපක්කිලෙසොති ඉති විදිත්වා බ්‍යාපාදං චිත්තස්ස උපක්කිලෙසං පජහති. ථීනමිද්ධං චිත්තස්ස උපක්කිලෙසොති ඉති විදිත්වා ථීනමිද්ධං චිත්තස්ස උපක්කිලෙසං පජහති. උද්ධච්චකුක්කුච්චං චිත්තස්ස උපක්කිලෙසොති ඉති විදිත්වා උද්ධච්චකුක්කුච්චං චිත්තස්ස උපක්කිලෙසං පජහති. විචිකිච්ඡා චිත්තස්ස උපක්කිලෙසොති ඉති විදිත්වා විචිකිච්ඡං චිත්තස්ස උපක්කිලෙසං පජහති.

යතො ච ඛො ගහපති අරියසාවකස්ස අභිජ්ඣාවිසමලොභො චිත්තස්ස උපක්කිලෙසොති ඉති විදිත්වා අභිජ්ඣාවිසමලොභො චිත්තස්ස උපක්කිලෙසො පහීණො හොති, බ්‍යාපාදො චිත්තස්ස උපක්කිලෙසොති ඉති විදිත්වා බ්‍යාපාදො චිත්තස්ස උපක්කිලෙසො පහීණො හොති, ථීනමිද්ධං චිත්තස්ස උපක්කිලෙසොති ඉති විදිත්වා ථීනමිද්ධං චිත්තස්ස උපක්කිලෙසො පහීණො හොති, උද්ධච්චකුක්කුච්චං චිත්තස්ස උපක්කිලෙසොති ඉති විදිත්වා උද්ධච්චකුක්කුච්චං චිත්තස්ස උපකිලෙසො පහීණො හොති, විචිකිච්ඡා චිත්තස්ස උපක්කිලෙසොති ඉති විදිත්වා විචිකිච්ඡා චිත්තස්ස උපක්කිලෙසො පහීණො හොති. අයං වුච්චති ගහපති අරියසාවකො මහාපඤ්ඤො පුථුපඤ්ඤො ආපාථදසො පඤ්ඤාසම්පන්නො. අයං වුච්චති ගහපති පඤ්ඤාසම්පදා.

ඉමෙසං ඛො ගහපති චතුන්නං ධම්මානං ඉට්ඨානං කන්තානං මනාපානං දුල්ලභානං ලොකස්මිං ඉමෙ චත්තාරො ධම්මා පටිලාභාය සංවත්තන්ති.

**ගෙහෙවිය, ත්‍යාගසම්පද නම් කවරය යත්:** ගෙහෙවිය, මෙහිලාව **අරිසවු** පැහූ මසුරුමල ඇති සිතින් ගිහිගෙයි වෙසෙයි. වුහුවූවත්හි බැලුම් නැතියේ වෙයි. දෙන්නට දෙවූ අත් ඇතියේ වෙයි. පීමෙහි ඇලුනේ වෙයි, යදනට නිසිවූයේ වෙයි, දීම් බෙදීම් දෙක්හි ඇලුනේ වේ. ගැහැවිය, මේ ත්‍යාගසම්පද යි කියනු ලැබේ.

ගැහැවිය, ප්‍රඥාසම්පද නම් කවරය යත්: ගැහැවිය, අභිධ්‍යාවිෂමලෝභයෙන් මැඩුනු සිතින් වසනුයේ අකර්තව්‍යය කෙරෙයි, කර්තව්‍යය වළහයි, අකර්තව්‍යය කරණුයේ කර්තව්‍යය වළහනුයේ යශසිනුත් සුඛයෙනුත් පිරිහේ. ගැහැවිය, ව්‍යාපාදයෙන් මැඩුනු සිතින් වසනුයේ අකර්තව්‍යය කෙරෙයි, කර්තව්‍යය වළහයි. අකර්තව්‍යය කරණුයේ කර්තව්‍යය වළහනුයේ යශසිනුත් සුඛයෙනුත් පිරිහෙයි. ගැහැවිය, ස්ත්‍යානමිද්ධයෙන් මැඩුනු සිතින් වසනුයේ අකර්තව්‍යය කෙරෙයි, කර්තව්‍යය වළහයි. අකර්තව්‍යය කරණුයේ, කර්තව්‍යය වළහනුයේ යශසිනුත් සුඛයෙනුත් පිරිහෙයි. උද්ධච්චකුක්කුච්චයෙන් මැඩුනු සිතින් වසනුයේ අකර්තව්‍යය කෙරේ. කර්තව්‍යය වළහයි, අකර්තව්‍යය කරණුයේ කර්තව්‍යය වළහනුයේ යශසිනුත් සුඛයෙනුත් පිරිහෙයි. ගෙහෙවිය, විචිකිච්ඡායෙන් මැඩුනු සිතින් වසනුයේ අකර්තව්‍යය කෙරෙයි, කර්තව්‍යය වළහයි, අකර්තව්‍යය කරණුයේ කර්තව්‍යය වළහනුයේ යශසිනුත් සුඛයෙනුත් පිරිහෙයි.

ගැහැවිය, ඒ ආර්යශ්‍රාවක 'අභිධ්‍යාවිෂමලෝභය චිත්තයාගේ උපක්ලේශයෙක' යනු දැන චිත්තෝපක්ලේශයක් වූ අභිධ්‍යාවිෂමලෝභය හැර පියයි. 'ව්‍යාපාදය චිත්තයාගේ උපක්ලේශයෙක' යනු දැන චිත්තෝපක්ලේශයක් වූ ව්‍යාපාදය හැර පියයි, 'ස්ත්‍යානමිද්ධය චිත්තයාගේ උපක්ලේශයෙක' යනු දැන චිත්තෝපක්ලේශයක් වූ ස්ත්‍යානමිද්ධය හැර පියයි. 'ඖද්ධත්‍යකෞකෘත්‍යය චිත්තයාගේ උපක්ලේශයෙක' යනු දැන චිත්තෝපක්ලේශයක් වූ ඖද්ධත්‍යකෞකෘත්‍යය හැර පියයි. 'විචිකිත්සා චිත්තයාගේ උපක්ලේශයෙක' යනු දැන චිත්තෝපක්ලේශයක් වූ විචිකිත්සාව හැර පියයි.

ගෙහෙවිය, යම් කාලෙක සිට ආර්යශ්‍රාවකයාගේ අභිධ්‍යාවිෂමලෝභය චිත්තයාගේ උපක්ලේශයෙක යනු දැන චිත්තෝපක්ලේශයක් වූ අභිධ්‍යාවිෂමලෝභය ප්‍රහීණ වේ ද, ව්‍යාපාදය චිත්තයාගේ උපක්ලේශයෙක යනු දැන චිත්තෝපක්ලේශයක් වූ ව්‍යාපාදය ප්‍රහීණ වේ ද, ස්ත්‍යානමිද්ධය චිත්තයාගේ උපක්ලේශයෙක යනු දැන චිත්තෝපක්ලේශයක් වූ ස්ත්‍යානමිද්ධය ප්‍රහීණ වේ ද, ඖද්ධත්‍යකෞකෘත්‍යය චිත්තයාගේ උපක්ලේශයෙක යනු දැන චිත්තෝපක්ලේශයක් වූ ඖද්ධත්‍යකෞකෘත්‍යය ප්‍රහීණ වේ ද, විචිකිත්සාව චිත්තයාගේ උපක්ලේශයෙක යනු දැන චිත්තෝපක්ලේශයක් වූ විචිකිත්සාව ප්‍රහීණ වේ ද, ගැහැවිය, මේ ආර්යශ්‍රාවක මහාප්‍රාඥය යි ද පෘථුලප්‍රාඥය යි ද, ආපාථ දක්නේය යි ද ප්‍රඥාසම්පන්නය යි ද කියනු ලැබේ. ගෙහෙවිය, මේ ප්‍රඥාසම්පද යි කියනු ලැබේ.

ගෙහෙවිය, ලෝකයෙහි ඉෂ්ට, කාන්ත, මනාප දුර්ලභ මේ සතර දහමුන්ගේ ප්‍රතිලාභයට මේ සතර දහම් කෙනෙක් ඇත.

ස ඛො සො ගහපති අරියසාවකො උට්ඨානවීරියාධිගතෙහි භොගෙහි බාහාබලපරිචිතෙහි සෙදාවක්ඛිත්තෙහි ධම්මිකෙහි ධම්මලද්ධෙහි චත්තාරි කම්මානි කත්තා හොති. කතමානි චත්තාරි?

ඉධ ගහපති අරියසාවකො උට්ඨානවීරියාධිගතෙහි භොගෙහි බාහාබලපරිචිතෙහි සෙදාවක්ඛිත්තෙහි ධම්මිකෙහි ධම්මලද්ධෙහි අත්තානං සුඛෙති පීණෙති සම්මා සුඛං පරිහරති, මාතාපිතරො සුඛෙති පීණෙති සම්මා සුඛං පරිහරති. පුත්තදාරදාසකම්මකරපොරිසෙ සුඛෙති. පීණෙති සම්මා සුඛං පරිහරති. මිත්තාමච්චෙ සුඛෙති පීණෙති සම්මා සුඛං පරිහරති. ඉදමස්ස පඨමං ඨානගතං හොති පත්තගතං ආයතනසො පරිභුත්තං.

පුනචපරං ගහපති අරියසාවකො උට්ඨානවීරියාධිගතෙහි භොගෙහි බාහාබලපරිචිතෙහි සෙදාවක්ඛිත්තෙහි ධම්මිකෙහි ධම්මලද්ධෙහි යා තා හොන්ති ආපදා අග්ගිතො වා උදකතො වා රාජතො වා චොරතො වා අප්පියතො[1] දායාදතො වා. තථාරූපාසු ආපදාසු භොගෙහි පරියොධාය වත්තති, සොත්ථිං අත්තානං කරොති. ඉදමස්ස දුතියං ඨානගතං හොති පත්තගතං ආයතනසො පරිභුත්තං.

පුනචපරං ගහපති අරියසාවකො උට්ඨානවීරියාධිගතෙහි භොගෙහි බාහාබලපරිචිතෙහි සෙදාවක්ඛිත්තෙහි ධම්මිකෙහි ධම්මලද්ධෙහි පඤ්චබලිං කත්තා හොති: ඤාතිබලිං අතිථිබලිං පුබ්බපෙතබලිං රාජබලිං දෙවතාබලිං. ඉදමස්ස තතියං ඨානගතං හොති පත්තගතං ආයතනසො පරිභුත්තං.

පුනචපරං ගහපති අරියසාවකො උට්ඨානවීරියාධිගතෙහි භොගෙහි බාහාබලපරිචිතෙහි සෙදාවක්ඛිත්තෙහි ධම්මිකෙහි ධම්මලද්ධෙහි යෙ තෙ සමණබ්‍රාහ්මණා මදප්පමාදා පටිවිරතා ඛන්තිසොරච්චෙ නිවිට්ඨා. එකමත්තානං දමෙන්ති, එකමත්තානං සමෙන්ති, එකමත්තානං පරිනිබ්බාපෙන්ති. තථාරූපෙසු සමණබ්‍රාහ්මණෙසු උද්ධග්ගිකං දක්ඛිණං පතිට්ඨාපෙති සොවග්ගිකං සුඛවිපාකං සග්ගසංවත්තනිකං. ඉදමස්ස චතුත්ථං ඨානගතං හොති පත්තගතං ආයතනසො පරිභුත්තං.

ස ඛො සො ගහපති අරියසාවකො උට්ඨානවීරියාධිගතෙහි භොගෙහි බාහාබලපරිචිතෙහි සෙදාවක්ඛිත්තෙහි ධම්මිකෙහි ධම්මලද්ධෙහි ඉමානි චත්තාරි පත්තකම්මානි කත්තා හොති.

යස්ස කස්සචි ගහපති අඤ්ඤත්‍ර ඉමෙහි චතූහි පත්තකම්මෙහි භොගා පරික්ඛයං ගච්ඡන්ති. ඉමෙ වුච්චන්ති ගහපති භොගා අට්ඨානගතා අපත්තගතා අනායතනසො පරිභුත්තා.

යස්ස කස්සචි ගහපති ඉමෙහි චතූහි පත්තකම්මෙහි භොගා පරික්ඛයං ගච්ඡන්ති. ඉමෙ වුච්චන්ති ගහපති භොගා ඨානගතා පත්තගතා ආයතනසො පරිභුත්තාති.

1 අප්පියතො වා - මජ්ඣං

ගෘහපතිය, ඒ ආර්යශ්‍රාවක උත්ථානවීර්යයෙන් ලැබූ, බාහුබලයෙන් වැඩූ, වගුළ සෝදියෙන් ඉපැයූ, ධර්මයුක්ත වූ, දැහැමින් ලද, භෝගයෙන් සතර කමක් කරන්නේ වෙයි. කවර සතර කමෙක යත්:

ගෘහපතිය, මෙලොව ආර්යශ්‍රාවක උත්ථානවීර්යයෙන් ලැබූ, බාහුබලයෙන් වැඩූ, වගුළ සෝදියෙන් ලැබූ, ධර්මයුක්ත වූ, ධර්මයෙන් ලැබූ, භෝගයෙන් තමා සුඛිත කෙරේ. බලසම්පන්න කෙරෙයි. මොනොවට සැපසේ වැටෙයි. මවුපියන් සුඛිත කෙරෙයි. බලසම්පන්න කෙරෙයි. මොනොවට සැපසේ පරිහරණ කෙරෙයි. අඹුදරු දස්කම්කරු ජනා සුඛිත කෙරෙයි බලසම්පන්න කෙරෙයි. මොනොවට සැපසේ පරිහරණ කෙරෙයි. මිතුරුයහළුවන් සුඛිත කෙරෙයි. බලසම්පන්න කෙරෙයි. මොනොවට සැපසේ පරිහරණ කෙරෙයි. ඔහුගේ මේ පළමුවන කිස තැනට ගියේ වෙයි. යුක්තස්ථානගත වෙයි. කරුණු අනුව ම වැළඳුනේ වෙයි.

නැවද ගෘහපතිය, ආර්යශ්‍රාවක උත්ථානවීර්යයෙන් ලැබූ, බාහුබලයෙන් වැඩූ, වගුළ සෝදියෙන් ලත්, ධර්මයුක්ත, දැහැමින් ලත්, භෝගයෙන් ගින්නෙන් වේවයි, දියෙන් වේවයි, රජුන් කෙරෙන් වේවයි, සොරුන් කෙරෙන් වේවයි, අප්‍රිය දායාදයන් කෙරෙන් වේවයි යම් ඒ විපත් ඇත් ද, එබඳු විපත්හි එය ධනයෙන් වසාපියා වැටෙයි. ආත්මය ස්වස්ථ කෙරෙයි. ඔහුගේ මේ දෙවන කිස තැනට ගියේ වෙයි. යුක්තස්ථානගත වෙයි. කරුණු අනුව ම වැළඳුනේ වෙයි.

නැවද ගෘහපතිය, ආර්යශ්‍රාවක උත්ථානවීර්යයෙන් ලැබූ, බාහුබලයෙන් වැඩූ, වගුළ සෝදියෙන් ඉපැයූ, ධර්මයුක්ත වූ, දැහැමින් ලත්, භෝගයෙන් පස්බිලි කරන්නේ වෙයි. ඥාතිබලිය, අතිථිබලිය, පූර්වප්‍රේතබලිය, රාජබලිය, දේවතාබලි යි. ඔහුගේ මේ තෙවන කිස තැනට ගියේ වෙයි. යුක්තස්ථානගත වෙයි. කරුණු අනුව ම වැළඳුයේ වෙයි.

නැවද ගෘහපතිය, ආර්යශ්‍රාවක උත්ථානවීර්යයෙන් ලැබූ, බාහුබලයෙන් වැඩූ, වගුළ සෝදියෙන් ඉපැයූ, ධර්මයුක්ත වූ, දැහැමින් ලත්, භෝගයෙන් මදප්‍රමාදයෙන් වෙන්ව සිටුනා, ක්ෂාන්ති සුරතභාවයෙහි බැස සිටුනා, එක් ම ආත්මය දමනය කරණ, එක් ම ආත්මය කෙලෙස් සන්හිඳුවීමෙන් ශමනය කරණ, එක් ම ආත්මය ක්ලේශපරිනිර්වාණයෙන් නිවන, යම් මහණබමුණු කෙනෙක් ඇත් ද, එබඳු මහණබමුණන් විෂයයෙහි ඵලදානවශයෙන් ඌර්ධ්වග වූ, ස්වර්ගයට හිත වූ, සුඛවිපාක ඇති, ස්වර්ග දිව්‍යවර්ණාදිය උපදා කරණ, දක්ෂිණාව පිහිටුවයි. ඔහුගේ මේ සතරවන කිස තැනට ගියේ වෙයි. යුක්තස්ථානගත වෙයි. කරුණු අනුව ම වැළඳුනේ වේ.

ගෘහපතිය, ඒ ආර්යශ්‍රාවක උත්ථානවීර්යයෙන් ලැබූ බාහුබලයෙන් වැඩූ, වගුළ සෝදියෙන් ඉපැයූ, ධර්මයුක්ත වූ, ධර්මලබ්ධ වූ, භෝගයෙන් මේ සතර ප්‍රාප්ත (යෝග්‍ය) කර්ම කරන්නේ වෙයි.

ගෘහපතිය, යමෙක්හට මේ සතර ප්‍රාප්තකර්ම හැරපියා භෝගයෝ වනසට යෙත් ද, ගෘහපතිය, මේ භෝගයෝ අස්ථානගතයහයි ද අප්‍රාප්තගතයහ යි ද අනායතන පරිභුක්තයහ යි ද කියනු ලැබෙත්.

ගෘහපතිය, යමෙක්හට මේ සතර ප්‍රාප්ත කර්මයෙන් භෝගයෝ වනසට යෙත් ද, ගෘහපතිය, මේ භෝගයෝ ස්ථානගතයහ යි ද ප්‍රාප්තගතයහ යි ද ආයතන පරිභුක්තයහ යි ද කියනු ලැබෙත්.



Free Distribution www.aathaapi.org

32. භුත්තා භොගා භතා[1] භච්චා විතිණ්ණා ආපදාසු මෙ,
උද්ධග්ගා දක්ඛිණා දින්නා අථො පඤ්චබලී කතා.

33. උපට්ඨිතා සීලවන්තො සඤ්ඤතා බ්‍රහ්මචාරයො,
යදත්ථං භොගං ඉච්ඡෙය්‍ය පණ්ඩිතො ඝරමාවසං,
සො මෙ අත්ථො අනුප්පත්තො කතං අනනුතාපියං.

34. එතං අනුස්සරං මච්චො අරියධම්මෙ ඨිතො ඝරෙ,
ඉධ චෙව නං පසංසන්ති පෙච්ච සග්ගෙ ච මොදතීති.

## 4. 2 2. 2.

## [ අනණසුත්තං ]

12. අථ ඛො **අනාථපිණ්ඩිකො** ගහපති යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නං ඛො අනාථපිණ්ඩිකං ගහපතිං භගවා එතදවොච:

චත්තාරිමානි ගහපති සුඛානි අධිගමනීයානි ගිහිනා කාමභොගිනා කාලෙන කාලං සමයෙන සමයං උපාදාය. කතමානි චත්තාරි?

අත්ථිසුඛං භොගසුඛං අනණසුඛං[2] අනවජ්ජසුඛං.

කතමඤ්ච ගහපති අත්ථිසුඛං? ඉධ ගහපති කුලපුත්තස්ස භොගා හොන්ති උට්ඨානවිරියාධිගතා බාහාබලපරිචිතා සෙදාවක්ඛිත්තා ධම්මිකා ධම්මලද්ධා, සො භොගා මෙ අත්ථි උට්ඨානවිරියාධිගතා බාහාබලපරිචිතා සෙදාවක්ඛිත්තා ධම්මිකා ධම්මලද්ධාති අධිගච්ඡති සුඛං, අධිගච්ඡති සොමනස්සං. ඉදං වුච්චති ගහපති අත්ථිසුඛං.

කතමඤ්ච ගහපති භොගසුඛං? ඉධ ගහපති කුලපුත්තො උට්ඨානවිරියාධිගතෙහි භොගෙහි බාහාබලපරිචිතෙහි සෙදාවක්ඛිත්තෙහි ධම්මිකෙහි ධම්මලද්ධෙහි භොගෙ ච භුඤ්ජති, පුඤ්ඤානි ච කරොති. සො උට්ඨානවිරියාධිගතෙහි භොගෙහි බාහාබලපරිචිතෙහි සෙදාවක්ඛිත්තෙහි ධම්මිකෙහි ධම්මලද්ධෙහි භොගෙ ච භුඤ්ජාමි පුඤ්ඤානි ච කරොමීති අධිගච්ඡති සුඛං, අධිගච්ඡති සොමනස්සං. ඉදං වුච්චති ගහපති භොගසුඛං.

කතමඤ්ච ගහපති අනණසුඛං? ඉධ ගහපති කුලපුත්තො න කස්සචි කිඤ්චි ධාරෙති අප්පං වා බහුං වා. සො න කස්සචි කිඤ්චි ධාරෙමි අප්පං වා බහුං වාති අධිගච්ඡති සුඛං, අධිගච්ඡති සොමනස්සං. ඉදං වුච්චති ගහපති අනණසුඛං.

කතමඤ්ච ගහපති අනවජ්ජසුඛං? ඉධ ගහපති අරියසාවකො අනවජ්ජෙන කායකම්මෙන සමන්නාගතො හොති, අනවජ්ජෙන වචීකම්මෙන සමන්නාගතො හොති, අනවජ්ජෙන මනොකම්මෙන සමන්නාගතො හොති. සො අනවජ්ජෙනම්හි කායකම්මෙන සමන්නාගතො, අනවජ්ජෙන වචීකම්මෙන සමන්නාගතො, අනවජ්ජෙන මනොකම්මෙන සමන්නාගතොති අධිගච්ඡති සුඛං, අධිගච්ඡති සොමනස්සං. ඉදං වුච්චති ගහපති අනවජ්ජසුඛං.

1. භටා - ස්‍යා. කං. 2 ආනණ්‍යසුඛං - මජසං.

32. භොගයෝ වළඳන ලදහ. පෝෂණය කළ යුත්තෝ පෝෂණය කරණ ලදහ. විපත් පැමිණි කල මා විසින් භෝගයෝ යොදන ලදහ. ඌර්ධ්වග (මතුමත්තෙහි ඵල දෙන) දක්ෂිණාව දෙන ලදී. වැලි පස්වූ බලිහු කරණ ලදහ.

33. සංයත බ්‍රහ්මචාරී සිල්වත්හු උපස්ථාන කරණ ලදහ. ගිහිගෙහි වසන පණ්ඩිත තෙමේ යම් අර්ථයක් සඳහා භොග කැමති වන්නේ ද, මා විසින් ඒ අර්ථය ලබන ලදී, පසුතැවිලි නොවන කිස කරණ ලදී.

34. පඤ්චශීල ධර්මයෙහි සිටි මිනිසෙක් මේ සිහිකරන්නේ වේ ද, මෙලොවහිදු ඔහු පසසත්. පරලොව ගොස් ස්වර්ගයෙහිදු විපාක නන්දනායෙන් සතුටු වෙයි.

## 4. 2. 2. 2

## [ අනණ සූත්‍රය ]

12. **එකල්හි අනාථපිණ්ඩික** සිටු භාග්‍යවතුන් වහන්සේ කරු එළඹියේය. එළඹ භාග්‍යවතුන් වහන්සේ සකසා වැඳ එකත්පස්හි හිත. එකත්පස් ව හුන් අනේපිඬු සිටුහට භාග්‍යවතුන් වහන්සේ තෙල වදාළ සේක:

ගෘහපතිය, කාමභෝගී ගිහින් විසින් කලින් කල හේතුවිසින් ලැබිය යුතු මේ සුඛයෝ සතර දෙනෙකි. කවර සතර දෙනෙක යත්: අස්තිසුඛය, භොගසුඛය, අනණසුඛය, අනවද්‍ය සුඛ යි.

ගැහැවිය, අස්තිසුඛ නම් කවරේය යත්: ගැහැවිය, මෙ ලොව කුලපුත්‍රයකුට උත්ථාන වීර්යයෙන් ලැබූ බාහුබලයෙන් වඩා ගත් වගුළ සෝදියෙන් ඉපැයූ ධර්මයුක්ත වූ දැහැමින් ලත් භොගයෝ ඇත. හෙතෙම උත්ථානවීර්යයෙන් ලැබූ බාහුබලයෙන් වැඩූ හෙළු සෝදියෙන් ඉපැයූ ධර්මයුක්ත වූ ධර්මලබ්ධ වූ භොගයෝ මට ඇතැ යි සුඛය ලබයි. සෞමනස්‍යය ලබයි. ගැහැවිය, මේ අස්තිසුඛය යි කියනු ලැබේ.

ගැහැවිය, භෝගසුඛ නම් කවරේද යත්: ගැහැවිය, මේ ලොව කුලපුත්‍රයෙක් උත්ථාන වීර්යයෙන් ලැබූ බාහුබලයෙන් වඩා ගත් වගුළ සෝදියෙන් උපයාගත් ධර්මයුක්ත වූ ධර්මලබ්ධ වූ භොගයෙන් භොගයන් වළඳ කරයි. පින් ද කරයි. උත්ථාන වීර්යයෙන් ලැබූ බාහුබලයෙන් වඩාගත් වගුළ සෝදියෙන් ඉපැයූ ධාර්මික වූ ධර්මලබ්ධ වූ භොගයෙන් හේ භොගයන් ද වළඳමි යි පින් ද කෙරෙමි යි සුඛය විඳියි. සෞමනස්‍යය විඳියි. ගැහැවිය, මේ භොගසුඛය යි කියනු ලැබේ.

ගැහැවිය, අනණසුඛය කවරේ ය යත්: ගැහැවිය, මේ ලොව කුලපුත්‍රයෙක් කිසිවක්හට අල්ප වූ හෝ බොහෝ වූ හෝ කිසිදු ණයක් නො දරයි. හේ කිසිවක්හට අල්ප වූ හෝ බොහෝ වූ හෝ කිසිදු ණයක් නො දරමි යි සුඛය විඳියි. සෞමනස්‍යය ලබයි. ගැහැවිය, මේ අනණසුඛය යි කියනු ලැබේ.

ගැහැවිය, අනවද්‍යසුඛය නම් කවරේය යත්: ගැහැවිය, මේ ලොව ආර්‍ය්‍යශ්‍රාවක අනවද්‍ය කායකර්මයෙන් සමන්වාගත වෙයි. අනවද්‍ය වාක්කර්මයෙන් සමන්වාගත වෙයි. අනවද්‍ය මනඃකර්මයෙන් සමන්වාගත වෙයි. අනවද්‍ය කායකර්මයෙන් සමන්වාගතයෙමි යි අනවද්‍ය වාක්කර්මයෙන් සමන්වාගතයෙමි යි අනවද්‍ය මනඃකර්මයෙන් සමන්වාගතයෙමි යි සුව විඳුනේය. සොම්නස් විඳුනේය. ගැහැවිය, මේ අනවද්‍යසුඛය යි කියනු ලැබේ.

ඉමානි ඛො ගහපති චත්තාරි සුඛානි අධිගමනීයානි ගිහිනා කාමභොගිනා කාලෙන කාලං සමයෙන සමයං උපාදායාති.

35. අනණං සුඛං ඤත්වාන[1] අථො අත්ථිසුඛං සරෙ,
භුඤ්ජං භොගං සුඛං මච්චො තතො පඤ්ඤා විපස්සති.*

36. විපස්සමානො ජානාති උභො භාගෙ සුමෙධසො,
අනවජ්ජසුඛස්සෙතං කලං නාග්ඝති සොළසින්ති.

## 4. 2. 2. 3.

### [ සබ්‍රහ්මසුත්තං ]

13. සබ්‍රහ්මකානි භික්ඛවෙ තානි කුලානි යෙසං පුත්තානං මාතාපිතරො අජ්ඣාගාරෙ පූජිතා හොන්ති. සපුබ්බාචරියකානි භික්ඛවෙ තානි කුලානි යෙසං පුත්තානං මාතාපිතරො අජ්ඣාගාරෙ පූජිතා හොන්ති. සපුබ්බදෙවතානි භික්ඛවෙ තානි කුලානි යෙසං පුත්තානං මාතාපිතරො අජ්ඣාගාරෙ පූජිතා හොන්ති. සාහුනෙය්‍යකානි භික්ඛවෙ තානි කුලානි යෙසං පුත්තානං මාතාපිතරො අජ්ඣාගාරෙ පූජිතා හොන්ති.

බ්‍රහ්මාති භික්ඛවෙ මාතාපිතුන්නං[2] එතං අධිවචනං. පුබ්බාචරියාති භික්ඛවෙ මාතාපිතුන්නං එතං අධිවචනං. පුබ්බදෙවාති භික්ඛවෙ මාතාපිතුන්නං එතං අධිවචනං. ආහුනෙය්‍යාති භික්ඛවෙ මාතාපිතුන්නං එතං අධිවචනං. තං කිස්ස හෙතු?

බහුකාරා භික්ඛවෙ මාතාපිතරො පුත්තානං ආපාදකා පොසකා ඉමස්ස ලොකස්ස දස්සෙතාරොති.

37. බ්‍රහ්මාති මාතාපිතරො පුබ්බාචරියාති වුච්චරෙ,
ආහුනෙය්‍යා ච පුත්තානං පජාය අනුකම්පකා,
තස්මා හි නෙ නමස්සෙය්‍ය සක්කරෙය්‍යාථ පණ්ඩිතො.

38. අන්නෙන අථ පානෙන වත්ථෙන සයනෙන ච,
උච්ඡාදනෙන න්හාපනෙන පාදානං ධොවනෙන ච.

39. තාය නං පාරිචරියාය මාතාපිතූසු පණ්ඩිතා,
ඉධ චෙව නං පසංසන්ති පෙච්ච සග්ගෙ ච මොදතීති.

## 4. 2. 2. 4.

### [ නිරයසුත්තං ]

14. චතූහි භික්ඛවෙ ධම්මෙහි සමන්නාගතො යථාභතං නික්ඛිත්තො එවං නිරයෙ. කතමෙහි චතූහි?

පාණාතිපාතී හොති, අදින්නාදායී හොති, කාමෙසු මිච්ඡාචාරී හොති, මුසාවාදී හොති.

ඉමෙහි ඛො භික්ඛවෙ චතූහි ධම්මෙහි සමන්නාගතො යථාභතං නික්ඛිත්තො එවං නිරයෙති.

40. පාණාතිපාතො අදින්නාදානං මුසාවාදො ච වුච්චති,
පරදාරගමනඤ්චාපි නප්පසංසන්ති පණ්ඩිතාති.

---

1. අනවජ්ජසුඛං ඤත්වා - සීමු.

* ආනණ්‍යසුඛං ඤත්වාන අථො අත්ථිසුඛං සරං
භුඤ්ජං භොගසුඛං මච්චො තතො පඤ්ඤා විපස්සති - මජසං

2. මාතාපිතූනං - මජසං

ගෘහවිය, කාමභෝගී ගිහිහු විසින් කලින් කල පටන් ගෙණ මේ සතර සුඛයෝ අධිගන්තව්‍යයහ යි මදළහ.

35. අනණසුඛය දත මැලි අසන්සුඛය සිහි කරන්නේය. භොග සුඛය විළඳනා මිනිස් තෙම ඉක්බිති නුවණින් වෙසෙසා බලන්නේය.

36. සුන්දර ප්‍රඥ ඇති ඒ මිනිසා වෙසෙසින් බලන්නේ ඒ සුව දෙ කොටස දනී. තෙල (පළමු කොටස වූ අසන්සුඛාදී තුණ සතර වන කොටස වූ) අනවද්‍ය සුඛයාගේ සොළොස් වන කලාවට ද නො අගී.

## 4. 2. 2. 3

## [ සබ්‍රහ්ම සූත්‍රය ]

13. මහණෙනි, යම් පුත්‍ර කෙනකුන් විසින් මවුපියෝ ගෙහි දී පුදන ලද්දාහු වෙත් ද, ඒ කුලයෝ බ්‍රහ්ම සහිතයහ. මහණෙනි, යම් පුත්‍ර කෙනකුන් විසින් මවුපියෝ ගෙහි දී පූජිත වෙත් ද, ඒ කුලයෝ පූර්වාචාර්‍ය සහිතයහ. මහණෙනි, යම් පුත්‍ර කෙනකුන් විසින් මවුපියෝ ගෙහිදී පූජිත වෙත් ද, ඒ කුලයෝ පූර්වදේවතා සහිතයහ. මහණෙනි, යම් පුත්‍ර කෙනකුන් විසින් මවුපියෝ ගෙහි දී පූජ්‍ය වෙත් ද, ඒ කුලයෝ ආහුනෙය්‍ය සහිතයහ.

මහණෙනි, මවුපියනට 'බ්‍රහ්ම' යන මේ නමෙකි. මහණෙනි, මවුපියනට 'පූර්වාචාර්‍ය' යන මේ නමෙකි. මහණෙනි, මවුපියනට 'පූර්වදෙව' යන මේ නමෙකි. මහණෙනි, මවුපියනට, 'ආහුනෙය්‍ය' යන මේ නමෙකි. ඒ කවර හෙයින යත්:

මහණෙනි, මවුපියෝ පුතුනට (දරුවනට) බොහෝ උපකාර ඇතියහ. හදනුවහ. වඩනුවහ. මෙ ලොව දක්වනුවහ.

37-38. මවුපියෝ 'බ්‍රහ්මයහ' යි ද 'පූර්වාචාර්‍යයහ' යි ද කියනු ලැබෙත්. පුත්‍රයන් ගේ (ඈර දෙන්නට නිසි අන්නපාන ප්‍රතිග්‍රහණයට අගී වන බැවින්) ආහුනෙය්‍යයහ. පුත්‍රාදි ප්‍රජාවට අනුකම්පා කරණුවහ. එයින් ඔවුන් නමදනේ ය. මැලින් පණ්ඩිත පුත්‍ර තෙමේ අන්නපානයෙනුදු වස්ත්‍රශයනයෙනුදු ඇඟ ඉලීමෙනුදු නැහැවීමෙනුදු පා දෙවීමෙනුදු සත්කාර කරන්නේ ය.

39. මවුපියන් කෙරෙහි ලා කරණ ඒ මනාවතින් පඬිහු මෙ ලොවිහි ද ඔහු පසසත්. පරලොව ගොස් සවර්ගයෙහිදු (විපාක නන්දනායෙන්) සතුටු වෙයි

## 4. 2. 2. 4

## [ නිරය සූත්‍රය ]

14. මහණෙනි, කරුණු සතරෙකින් සමන්වාගත වූයේ ගෙණවුත් බහන ලද්දක් යම් සේ ද, එපරිදි නිරයෙහි නික්ෂිප්තය. කවර සතර කරුණෙක යත්:

පණිවා ඇත්තේ වෙයි. අයිතාදන් ගන්නේ වෙයි. කාමයෙහි මිසහසර ඇතියේ වෙයි. මුසවා ඇතියේ වෙයි.

මහණෙනි, මේ සතර කරුණෙන් සමන්වාගත වූයේ ගෙණවුත් බහන ලද්දක් සෙයින් නිරයෙහි නික්ෂිප්ත ය.

40. ප්‍රාණවධය, අදත්තාදානය, මෘෂාවාදය හා පරදාර ගමනය දැයි සතර කරුණෙක් කියනු ලැබේ. පඬිහු ඒ නොපසසත්.

## 4. 2. 2. 5.

## [ රූප (ප්පමාණ) සුත්තං ]

15. චත්තාරො'මෙ භික්ඛවෙ පුග්ගලා සන්තො සංවිජ්ජමානා ලොකස්මිං. කතමෙ චත්තාරො?

රූපප්පමාණො රූපප්පසන්නො, ඝොසප්පමාණො ඝොසප්පසන්නො, ලූඛප්පමාණො ලූඛප්පසන්නො, ධම්මප්පමාණො ධම්මප්පසන්නො.

ඉමෙ ඛො භික්ඛවෙ චත්තාරො පුග්ගලා සන්තො සංවිජ්ජමානා ලොකස්මින්ති.

41. යෙ ච රූපෙන පාමිංසු[1] යෙ ච ඝොසෙන අන්වගූ,
ඡන්දරාගවසූපෙතා න තෙ ජානන්ති තං ජනං.[2]

42. අජ්ඣත්තඤ්ච න ජානාති බහිද්ධා ච න පස්සති,
සමන්තාවරණො බාලො ස වෙ ඝොසෙන වුය්හති.

43. අජ්ඣත්තඤ්ච න ජානාති බහිද්ධා ච විපස්සති,
බහිද්ධා ඵලදස්සාවී සොපි ඝොසෙන වුය්හති.

44. අජ්ඣත්තඤ්ච පජානාති බහිද්ධා ච විපස්සති,
විනීවරණදස්සාවී න සො ඝොසෙන වුය්හති.

## 4. 2. 2. 6.

## [ සරාග (පුග්ගල) සුත්තං ]

16. චත්තාරො'මෙ භික්ඛවෙ පුග්ගලා සන්තො සංවිජ්ජමානා ලොකස්මිං. කතමෙ චත්තාරො? සරාගො, සදොසො, සමොහො, සමානො.

ඉමෙ ඛො භික්ඛවෙ චත්තාරො පුග්ගලා සන්තො සංවිජ්ජමානා ලොකස්මින්ති.

45. සාරත්තා රජනීයෙසු පියරූපාභිනන්දිනො,
මොහෙන අධමා[3] සත්තා බද්ධා වඩ්ඪන්ති බන්ධනං.

46. රාගජඤ්ච දොසජඤ්ච මොහජඤ්චාපවිද්දසූ,
කරොන්ති අකුසලං කම්මං සවිඝාතං දුක්ඛුද්‍රයං.

47. අවිජ්ජානිවුතා පොසා අන්ධභූතා අචක්ඛුකා,
යථා ධම්මා තථා සන්තා න තස්සොචන්ති[4] න මඤ්ඤරෙති

## 4. 2. 2. 7.

## [ අහි (මෙත්ත) සුත්තං ]*

17. එකං සමයං භගවා **සාවත්ථියං** විහරති **ජෙතවනෙ** අනාථපිණ්ඩිකස්ස ආරාමෙ. තෙන ඛො පන සමයෙන සාවත්ථියං අඤ්ඤතරො භික්ඛු අහිනා දට්ඨො කාලකතො හොති. අථ ඛො සම්බහුලා භික්ඛූ යෙන භගවා තෙනුපසඞ්කමිංසු. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදිංසු. එකමන්තං නිසින්නා ඛො තෙ භික්ඛූ භගවන්තං එතදවොචුං:

1 යෙ ච රූපප්පමාණිංසු - මජසං  2 නාභිජානාති තං ජනා - මජසං
3 ආවුතා - මජසං  4 න තස්සෙවන්ති - ස්‍යා, මජසං  * ඛන්ධපරිත්තං - චතුභාණවාරපාළි.

## 4. 2. 2. 5

## [ රූප (පමාණ) සූත්‍රය ]

15. මහණෙනි, මේ සතර පුද්ගල් කෙනෙක් ලෝකයෙහි විද්‍යමානයහ. කවර සතර කෙනෙක යත්:

රූපය ප්‍රමාණ කොට ඇති රූපප්‍රසන්නය, ගුණඝෝෂය ප්‍රමාණ කොට ඇති ඝෝෂප්‍රසන්නය, රූක්‍ෂප්‍රතිපත්ති ප්‍රමාණ කොට ඇති රූක්‍ෂප්‍රසන්නය, ධර්මය ප්‍රමාණ කොට ඇති ධර්මප්‍රසන්න යි.

මහණෙනි, මේ සතර පුද්ගලයෝ ලෝකයෙහි විද්‍යමානයහ.

41. යම් කෙනෙක් රූපයෙන් මැනගත්හු ද, යම් කෙනෙකුත් ඝොෂ-ප්‍රමාණයෙන් (පැහැදීම් විසින්) අනුගතවූහු ද, ඡන්දරාගවසයට වැටුනාහු, ඔහු ඒ අරී ජනයා නො හඳුනත්.

42. ආධ්‍යාත්මිකගුණය ද නො දනියි. බැහැරි පිළිවෙත් ද නො දකී. හාත්පසින් ඇවිරීම් ඇති ඒ අඥ තෙමේ ඒකාන්තයෙන් ඝොෂප්‍රමාණ-යෙන් ගෙණ යනු ලැබේ.

43. ආධ්‍යාත්මික ගුණ ද නො දත්තේ ය. බැහැරි පිළිවෙත් දක්නේ ය. බාහිර සත්කාරඵල දක්නා සුලු හෙ ද ඝෝෂප්‍රමාණයෙන් ගෙණ යනු ලැබේ.

44. ආධ්‍යාත්මිකගුණ ද දත්තේ ය. බැහැරි පිළිවෙත් ද දක්නේ ය. ප්‍රකට විසින් දක්නා හේ ඝොෂප්‍රමාණයෙන් ගෙණ යනු නො ලැබේ.

## 4. 2. 2. 6

## [ සරාග (පුග්ගල) සූත්‍රය ]

16. මහණෙනි, මේ සතර පුද්ගල් කෙනෙක් ලොකයෙහි ඇත. කවර සතර කෙනෙක යත්: රාග සහිත ය, ද්වේෂ සහිත ය, මෝහ සහිත ය, මාන සහිත යි.

මහණෙනි, මේ සතර පුද්ගල්හු ලෝකයෙහි විද්‍යමානයහ.

45. රජනීය රූපාදියෙහි සංරක්ත වූ ප්‍රියරූපය අභිනන්දනය කරණ සුලු මොහයෙන් අධම වූ එසින් බැඳුනු සත්වයෝ භවබන්ධනය වඩත්.

46. අවිද්වත් ජනයෝ රාගයෙන් උපන් ද්වෙෂයෙන් උපන් මොහයෙනු දු උපන් දුක්සහිත වූ මතුයෙහිත් දුක් වඩන අකුශලකර්ම කෙරෙත්.

47. අවිද්‍යායෙන් වටා ගත්, ප්‍රඥාචක්‍ෂුස් රහිත, එසින් ම අන්ධ වූ, පුරුෂයෝ රාගාදීන් තුබූ පරිද්දි ම එහි වැටුනාහු අපි මෙබඳු ස්වභාව ඇත්තම්හ යි නො සිතත් මය.

## 4. 2. 2. 7.

## [ අහි (මෙත්ත) සූත්‍රය ]

17. එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහි ජේතවන නම් අනේපිඬු සිටුහුගේ ආරාමයෙහි වැඩ වෙසෙති. එකල සැවැත් නුවර එක්තරා මහණෙක් සර්පයකු විසින් දෂ්ටව කළුරිය කෙළේ වෙයි. එසඳ බොහෝ භික්‍ෂූහු භාග්‍යවතුන් වහන්සේ කරා එළඹියහ. එළඹ භාග්‍ය-වතුන් වහන්සේ සකසා වැඳ එකත්පස්ව හුන්හ. එකත්පස්ව හුන් ඒ භික්‍ෂූහු භාග්‍යවතුන් වහන්සේට මෙපවත් සැළ කළහ:

ඉධ භන්තෙ සාවත්ථියං අඤ්ඤතරො භික්ඛු අහිනා දට්ඨො කාලකතොති.

න හ නූන[1] සො භික්ඛවෙ භික්ඛු චත්තාරි අහිරාජකුලානි මෙත්තෙන චිත්තෙන ඵරි. සචෙ හි සො භික්ඛවෙ භික්ඛු චත්තාරි අහිරාජකුලානි මෙත්තෙන චිත්තෙන ඵරෙය්‍ය, න හි සො භික්ඛවෙ භික්ඛු අහිනා දට්ඨො කාලං කරෙය්‍ය. කතමානි චත්තාරි අහිරාජකුලානි?

විරූපක්ඛං අහිරාජකුලං, එරාපථං අහිරාජකුලං, ඡබ්‍යාපුත්තං අහිරාජකුලං, කණ්හාගොතමකං අහිරාජකුලං.

න හ නූන සො භික්ඛවෙ භික්ඛු ඉමානි චත්තාරි අහිරාජකුලානි මෙත්තෙන චිත්තෙන ඵරි. සචෙ හි සො භික්ඛවෙ භික්ඛු ඉමානි චත්තාරි අහිරාජකුලානි මෙත්තෙන චිත්තෙන ඵරෙය්‍ය, න හි සො භික්ඛවෙ භික්ඛු අහිනා දට්ඨො කාලං කරෙය්‍ය.

අනුජානාමි භික්ඛවෙ ඉමානි චත්තාරි අහිරාජකුලානි මෙත්තෙන චිත්තෙන ඵරිතුං, අත්තගුත්තියා අත්තරක්ඛාය අත්තපරිත්තායාති.

48. විරූපක්ඛෙහි මෙ මෙත්තං මෙත්තං එරාපථෙහි මෙ,
ඡබ්‍යාපුත්තෙහි මෙ මෙත්තං මෙත්තං කණ්හාගොතමකෙහි ච.

49. අපාදකෙහි මෙ මෙත්තං මෙත්තං දිපාදකෙහි[2] මෙ,
චතුප්පදෙහි මෙ මෙත්තං මෙත්තං බහුප්පදෙහි මෙ.

50. මා මං අපාදකො හිංසි මා මං හිංසි දිපාදකො,
මා මං චතුප්පදො හිංසි මා මං හිංසි බහුප්පදො.

51. සබ්බෙ සත්තා සබ්බෙ පාණා සබ්බෙ භූතා ච කෙවලා,
සබ්බෙ භද්‍රානි පස්සන්තු මා කඤ්චි පාපමාගමා.

අප්පමාණො බුද්ධො අප්පමාණො ධම්මො. අප්පමාණො සඞ්ඝො. පමාණවන්තානි සිරිංසපානි[3] අහිවිච්ඡිකා සතපදී උණ්ණානාභී සරබූ මූසිකා. කතා මෙ රක්ඛා. කතා මෙ පරිත්තා. පටික්කමන්තු භූතානි. සො'හං නමො භගවතො. නමො සත්තන්නං සම්මාසම්බුද්ධානන්ති.

## 4. 2. 2. 8

## [ දෙවදත්තසුත්තං ]

18. එකං සමයං භගවා රාජගහෙ විහරති ගිජ්ඣකූටෙ පබ්බතෙ අචිරපක්කන්තෙ දෙවදත්තෙ. තත්‍ර ඛො භගවා දෙවදත්තං ආරබ්භ භික්ඛූ ආමන්තෙසි:

අත්තවධාය භික්ඛවෙ දෙවදත්තස්ස ලාභසක්කාරසිලොකො උදපාදි. පරාභවාය භික්ඛවෙ දෙවදත්තස්ස ලාභසක්කාරසිලොකො උදපාදි.

1. න යි නූන - මජසං. 2. ද්විපාදකෙහි - මජසං. 3. සරීසපානි - මජසං.

Free Distribution www.aathaapi.org

වහන්ස, මේ සැවැත්නුවර අන්‍යතර භික්ෂුවෙක් සර්පදෂ්ට ව කාලක්‍රියා කෙළේය යනුයි.

මහණෙනි, ඒකාන්තයෙන් ඒ මහණ සතර අහිරජකුල මෙත්සිතින් නො පැහැසීය. මහණෙනි, ඒ මහණ ඉදින් සතර අහිරජකුල මෙත්සිතින් පැහැසී නම්, මහණෙනි, ඒ මහණ සපුහු විසින් දෂ්ට ව කළුරිය නො කරන්නේ ම ය. කවර අහිරජකුල සතරෙක යත්:

විරූපක්ඛ අහිරජකුලය, ඒරාපථ අහිරාජකුලය, ඡබ්‍යාපුත්ත අහිරජ-කුලය, කණ්හාගොතමක අහිරජකුල යි.

මහණෙනි, ඒ මහණ ඒකාන්තයෙන් මේ සතර අහිරජකුල මෙත්සිතින් නොපැහැසී, මහණෙනි, ඒ මහණ මේ සතර අහිරජකුල මෙත්සිතින් පැහැසී නම්, මහණෙනි, ඒ මහණ සපුහු විසින් දෂ්ටව කළුරිය නො කරන්නේ ම ය. මහණෙනි, මේ සතර අහිරජකුල මෙත්සිතින් පහස්නට අනුදනිමි. තමාගේ ගුප්තිය පිණිසය, තමාගේ රකවල පිණිසය, තමාගේ පිරිත් පිණිස යි.

48. මාගේ මෛත්‍රිය විරූපක්ඛ අහිරජ කුලයන් හා වේවා. මාගේ මෛත්‍රිය ඒරාපථ අහිරජකුලයන් හා වේවා. මාගේ මෛත්‍රිය ඡබ්‍යාපුත්ත-අහිරජකුලයන් හා වේවා. මාගේ මෛත්‍රිය කණ්හාගොතමක අහිරජකුල-යන් හා වේවා.

49. මාගේ මෛත්‍රිය අපාදක සතුන් හා වේවා. මාගේ මෛත්‍රිය ද්විපා-දක සතුන් හා වේවා. මාගේ මෛත්‍රිය චතුෂ්පාදක සතුන් හා වේවා. මාගේ මෛත්‍රිය බහුප්පාදක සතුන් හා වේවා.

50. අපාදක සතෙක් තහමක් මා පෙළාවා. ද්විපාදක සතෙක් තහමක් මා පෙළාවා. චතුෂ්පාදක සතෙක් තහමක් මා පෙළාවා. බහුප්පාදක සතෙක් තහමක් මා පෙළාවා.

51. සියලු සත්ත්වයෝ, සියලු ප්‍රාණයෝ, සියලු භූතයෝ යන හැම භද්‍ර දූ දකිත්වා. කිසිවකු කරා අනිෂ්ටයෙක් නො එළඹේවා.

බුද්ධරත්නය ගුණවශයෙන් අප්‍රමාණ වෙයි. ධර්මරත්නය ගුණවශයෙන් අප්‍රමාණ වෙයි. සඞ්ඝරත්නය ගුණවශයෙන් අප්‍රමාණ වෙයි. අහිය, ගෝනුසුය, සියපාය, මකුළුය, ගෘහගොධා (හුනුනු) ය, මීය යන සිරිංසපජාතීහු ගුණ විසින් ප්‍රමාණවත්හ. මා විසින් රකවල් කරණ ලදී. මා විසින් පිරිත් කරණ ලදී. භූතයෝ බැස යෙත්වා. ඒ මම භාග්‍යවතුන් වහන්සේට නමස්කාරකෙරෙමි. සත් සම්බුදුවරුනට නමස්කාර කෙරෙමි.

## 4. 2. 2. 8.

## [ දෙවදත්ත සූත්‍රය ]

18. එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ දෙව්දතුන් (සඟුන් බිඳ) බැහැගිය නොබෝකල් ඇතිවත් ම රජගහ නුවර සමීපයෙහි ගිජ්ඣකූටපව්වෙහි වැඩ වෙසෙති. එසඳ භාග්‍යවතුන් වහන්සේ දෙව්දතුන් අරභයා භික්ෂූන් ඇමතූසේක:

මහණෙනි, ආත්මවධය පිණිස දෙවදත්තහට ලාභසත්කාර යශස් උදා වීය. මහණෙනි, පරාභවය පිණිස දෙව්දත්හට ලාභසත්කාර යශස් උදා වීය.

සෙය්‍යථාපි භික්ඛවෙ කදලී අත්තවධාය ඵලං දෙති, පරාභවාය ඵලං දෙති, එවමෙව ඛො භික්ඛවෙ අත්තවධාය දෙවදත්තස්ස ලාභසක්කාරසිලොකො උදපාදි පරාභවාය දෙවදත්තස්ස ලාභසක්කාරසිලොකො උදපාදි.

සෙය්‍යථාපි භික්ඛවෙ වෙළු අත්තවධාය ඵලං දෙති, පරාභවාය ඵලං දෙති, එවමෙව ඛො භික්ඛවෙ අත්තවධාය දෙවදත්තස්ස ලාභසක්කාරසිලොකො උදපාදි. පරාභවාය දෙවදත්තස්ස ලාභසක්කාරසිලොකො උදපාදි.

සෙය්‍යථාපි භික්ඛවෙ නළො අත්තවධාය ඵලං දෙති, පරාභවාය ඵලං දෙති, එවමෙව ඛො භික්ඛවෙ අත්තවධාය දෙවදත්තස්ස ලාභසක්කාරසිලොකො උදපාදි. පරාභවාය දෙවදත්තස්ස ලාභසක්කාරසිලොකො උදපාදි.

සෙය්‍යථාපි භික්ඛවෙ අස්සතරී අත්තවධාය ගබ්භං ගණ්හාති, එවමෙව ඛො භික්ඛවෙ අත්තවධාය දෙවදත්තස්ස ලාභසක්කාරසිලොකො උදපාදි පරාභවාය දෙවදත්තස්ස ලාභසක්කාරසිලොකො උදපාදීති.

52. ඵලං වෙ කදලිං හන්ති ඵලං වෙළුං ඵලං නළං,
සක්කාරො කාපුරිසං හන්ති ගබ්භො අස්සතරිං යථා'ති

### 4. 2. 2. 9.

### [ පධානසුත්තං ]

19. චත්තාරිමානි භික්ඛවෙ පධානානි. කතමානි චත්තාරි?

සංවරප්පධානං, පහාණප්පධානං, භාවනප්පධානං, අනුරක්ඛණප්පධානං.

කතමඤ්ච භික්ඛවෙ සංවරප්පධානං? ඉධ භික්ඛවෙ භික්ඛු අනුප්පන්නානං පාපකානං අකුසලානං ධම්මානං අනුප්පාදාය ඡන්දං ජනෙති වායමති විරියං ආරභති චිත්තං පග්ගණ්හාති පදහති. ඉදං වුච්චති භික්ඛවෙ සංවරප්පධානං.

කතමඤ්ච භික්ඛවෙ පහාණප්පධානං? ඉධ භික්ඛවෙ භික්ඛු උප්පන්නානං පාපකානං අකුසලානං ධම්මානං පහාණාය ඡන්දං ජනෙති වායමති විරියං ආරභති චිත්තං පග්ගණ්හාති පදහති. ඉදං වුච්චති භික්ඛවෙ පහාණප්පධානං.

කතමඤ්ච භික්ඛවෙ භාවනප්පධානං? ඉධ භික්ඛවෙ භික්ඛු අනුප්පන්නානං කුසලානං ධම්මානං උප්පාදාය ඡන්දං ජනෙති වායමති විරියං ආරභති චිත්තං පග්ගණ්හාති පදහති ඉදං වුච්චති භික්ඛවෙ භාවනප්පධානං.

මහණෙනි, යම්සේ කෙසෙල් ආත්මවධය පිණිස ඵල දේ ද, පිරිහීම පිණිස ඵල දේ ද, මහණෙනි, එපරිද්දෙන් ම ආත්මවධය පිණිස දෙව්දත්හට ලාභසත්කාර යශස් උදා විය පරාභවය පිණිස දෙව්දත්හට ලාභසත්කාර යශස් උදා විය.

මහණෙනි, යම්සේ හුණවනය ආත්මවධය පිණිස ඵල දේ ද, පරාභවය පිණිස ඵල දේ ද, මහණෙනි, එපරිද්දෙන් ම ආත්මවධය පිණිස දෙව්දත්හට ලාභසත්කාර යශස් උදා විය. පරාභවය පිණිස දෙව්දත්හට ලාභසත්කාර යශස් උදා විය.

මහණෙනි, යම්සේ රණහුණ ආත්මවධය පිණිස ඵල දේ ද, පරාභවය පිණිස ඵල දේ ද, මහණෙනි, එ පරිද්දෙන් ම ආත්මවධය පිණිස දෙව්දත්හට ලාභ සත්කාර යශස් උදා විය. පරාභවය පිණිස දෙව්දත්හට ලාභ සත්කාර යශස් උදා විය.

මහණෙනි, යම්සේ (වෙළඹ කුසැ ගැබ්බවාට ද) අශ්වතරිය ආත්මවධය පිණිස ගැබ් ගණී ද, මහණෙනි, එපරිද්දෙන් ම ආත්මවධය පිණිස දෙව්දත්හට ලාභ සත්කාර යශස් උදා විය. පරාභවය පිණිස දෙව්දත්හට ලාභසත්කාර යශස් උදා විය.

52. යම්සේ ඵලය කෙහෙල නසන්නේ ම වේ ද, ඵලය මහහුණ නසන්නේ ම වේ ද, ඵලය රණහුණ නසන්නේ ම වේ ද, ගැබ වෙළඹ නසන්නේ ම වේ ද, එපරි සත්කාරය කුපුරිස් නසා.

## 4. 2. 2. 9.

## [ පධාන සූත්‍රය ]

19. මහණෙනි, මේ ප්‍රධන් වීර්‍ය්‍යයෝ සතර දෙනෙකි. කවර සතර දෙනෙක යත්:

සංවර ප්‍රධන් වීර්‍ය්‍යය, ප්‍රහාණ ප්‍රධන් වීර්‍ය්‍යය. භාවනා ප්‍රධන් වීර්‍ය්‍යය, අනුරක්‍ෂණා ප්‍රධන් වීර්‍ය්‍යයි

මහණෙනි, සංවර ප්‍රධන් වීර්‍ය්‍යය කවරේය යත්: මහණෙනි, මෙසස්නෙහි මහණ නූපන් ලමු අකුසල දහමුන් නූපදනා සඳහා ඡන්‍දය උපදවයි, ව්‍යායාම කෙරෙයි, වීර්‍ය්‍යාරම්භ කෙරෙයි, සිත තිර කොට ගණියි. මහණෙනි, මේ සංවර ප්‍රධන් වීර්‍ය්‍ය යි කියනු ලැබේ.

මහණෙනි, ප්‍රහාණ ප්‍රධන් වීර්‍ය්‍යය නම් කවරේය යත්: මහණෙනි, මෙ සස්-නෙහි මහණ ලමු අකුසල දහමුන් දුරලනු සඳහා ඡන්‍දය උපදවයි, ව්‍යායාම කෙරෙයි, වීර්‍ය්‍යාරම්භ කෙරෙයි, සිත තිර කොට ගණියි. මහණෙනි, මේ ප්‍රහාණ ප්‍රධන් වීර්‍ය්‍ය යි කියනු ලැබේ.

මහණෙනි, භාවනා ප්‍රධන් වීර්‍ය්‍යය නම් කවරේය යත්: මහණෙනි, මෙ සස්නෙහි මහණ නූපන් කුසල් දහමුන් උපදනා සඳහා ඡන්‍දය උපදවයි, ව්‍යායාම කෙරේ, වීර්‍ය්‍යාරම්භ කෙරෙයි, සිත තිර කොට ගණියි. මහණෙනි, මේ භාවනා ප්‍රධන් වීර්‍ය්‍ය යි කියනු ලැබේ.

කතමඤ්ච භික්ඛවෙ අනුරක්ඛණප්පධානං? ඉධ භික්ඛවෙ භික්ඛු උප්පන්නානං කුසලානං ධම්මානං ඨිතියා අසම්මොසාය භිය්‍යොභාවාය වෙපුල්ලාය භාවනාය පාරිපූරියා ඡන්දං ජනෙති වායමති විරියං ආරභති චිත්තං පග්ගණ්හාති පදහති. ඉදං වුච්චති භික්ඛවෙ අනුරක්ඛණප්පධානං.

ඉමානි ඛො භික්ඛවෙ චත්තාරි පධානානීති.

53. සංවරො ච පහාණං ච භාවනා අනුරක්ඛණා,
එතෙ පධානා චත්තාරො දෙසිතාදිච්චබන්ධුනා,
යෙහි භික්ඛු ඉධාතාපී ඛයං දුක්ඛස්ස පාපුණෙති.

## 4. 2. 2. 10.

## [අධම්මිකසුත්තං]

20. යස්මිං භික්ඛවෙ සමයෙ රාජානො අධම්මිකා හොන්ති, රාජයුත්තාපි තස්මිං සමයෙ අධම්මිකා හොන්ති. රාජයුත්තෙසු අධම්මිකෙසු බ්‍රාහ්මණගහපතිකාපි තස්මිං සමයෙ අධම්මිකා හොන්ති. බ්‍රාහ්මණගහපතිකෙසු අධම්මිකෙසු නෙගමජානපදාපි තස්මිං සමයෙ අධම්මිකා හොන්ති. නෙගමජානපදෙසු අධම්මිකෙසු විසමං චන්දිමසුරියා පරිවත්තන්ති. විසමං චන්දිමසුරියෙසු පරිවත්තන්තෙසු විසමං නක්ඛත්තානි තාරකරූපානි පරිවත්තන්ති. විසමං නක්ඛත්තෙසු තාරකරූපෙසු පරිවත්තන්තෙසු විසමං රත්තින්දිවා පරිවත්තන්ති. විසමං රත්තින්දිවෙසු පරිවත්තන්තෙසු විසමං මාසද්ධමාසා පරිවත්තන්ති. විසමං මාසද්ධමාසෙසු පරිවත්තන්තෙසු විසමං උතුසංවච්ඡරා පරිවත්තන්ති. විසමං උතුසංවච්ඡරෙසු පරිවත්තන්තෙසු විසමං වාතා වායන්ති විසමා අපඤ්ජසා. විසමං වාතෙසු වායන්තෙසු විසමෙසු අපඤ්ජසෙසු දෙවතා පරිකුපිතා භවන්ති. දෙවතාසු පරිකුපිතාසු දෙවො න සම්මාධාරං අනුප්පවෙච්ඡති. දෙවෙ න සම්මා ධාරං අනුප්පවෙච්ඡන්තෙ විසමපාකීනි සස්සානි භවන්ති. විසමපාකීනි[1] භික්ඛවෙ සස්සානි මනුස්සා පරිභුඤ්ජන්තා අප්පායුකා ච හොන්ති. දුබ්බණ්ණා ච දුබ්බලා ච බව්හාබාධා ච.

යස්මිං භික්ඛවෙ සමයෙ රාජානො ධම්මිකා හොන්ති, රාජයුත්තාපි තස්මිං සමයෙ ධම්මිකා හොන්ති. රාජයුත්තෙසු ධම්මිකෙසු බ්‍රාහ්මණගහපතිකාපි තස්මිං සමයෙ ධම්මිකා හොන්ති. බ්‍රාහ්මණගහපතිකෙසු ධම්මිකෙසු නෙගමජානපදාපි තස්මිං සමයෙ ධම්මිකා හොන්ති. නෙගමජානපදෙසු ධම්මිකෙසු සමං චන්දිමසුරියා පරිවත්තන්ති. සමං චන්දිමසුරියෙසු පරිවත්තන්තෙසු සමං නක්ඛත්තානි තාරකරූපානි පරිවත්තන්ති. සමං නක්ඛත්තෙසු තාරකරූපෙසු පරිවත්තන්තෙසු සමං රත්තින්දිවා පරිවත්තන්ති. සමං රත්තින්දිවෙසු පරිවත්තන්තෙසු සමං මාසද්ධමාසා පරිවත්තන්ති. සමං මාසද්ධමාසෙසු පරිවත්තන්තෙසු සමං උතුසංවච්ඡරා පරිවත්තන්ති. සමං උතුසංවච්ඡරෙසු පරිවත්තන්තෙසු සමං[2] වාතා වායන්ති. සමා පඤ්ජසා. සමං[2] වාතෙසු වායන්තෙසු සමෙසු පඤ්ජසෙසු දෙවතා අපරිකුපිතා භවන්ති. දෙවතාසු අපරිකුපිතාසු දෙවො සම්මා ධාරං අනුප්පවෙච්ඡති. දෙවෙ සම්මා ධාරං අනුප්පවෙච්ඡන්තෙ සමපාකීනි සස්සානි භවන්ති. සමපාකීනි භික්ඛවෙ සස්සානි මනුස්සා පරිභුඤ්ජන්තා දීඝායුකා ච හොන්ති, වණ්ණවන්තො ච බලවන්තො ච අප්පාබාධා චා'ති.

1. විසමපාකානි - මජසං. 2 අභිසමං - සීමු

මහණෙනි, අනුරක්ෂණා ප්‍රධන් වීය්‍යීය නම් කවරේය යත්: මහණෙනි, මෙ සස්නෙහි මහණ උපන් කුසල් දහමුන්ගේ සිටීය සඳහා විනාශ නොවන බව සඳහා බොහෝ වන බව සඳහා විපුල වන බව සඳහා භාවනායෙන් පරිපූර්ණ වන බව සඳහා ඡන්දය උපදවයි. ව්‍යායාම කෙරෙයි, වීය්‍යීරම්භ කෙරෙයි, සිත තිර කොට ගණියි. මහණෙනි, මේ අනුරක්ෂණා ප්‍රධන් වීය්‍යී යි කියනු ලැබේ. මහණෙනි, මේ සතර ප්‍රධන් වීය්‍යීයෝ යි.

53. මෙසස්නෙහි කෙලෙස් තවන මහණෙක් යමෙකින් දුඃඛක්ෂයට පැමිණේ ද, ඔහුට සංවරය හා ප්‍රහාණය හා භාවනාව හා අනුරක්ෂණාව හා මේ සතර ප්‍රධන් වීය්‍යීයෝ ආදිත්‍යබන්ධු බුදුන් විසින් දෙසන ලදහ.

## 4. 2. 2. 10.

## [ අධම්මික සූත්‍රය ]

20. මහණෙනි, යම් කලෙක්හි රජදරුවෝ අධාර්මික වෙත් ද, එකල රාජපුරුෂයෝ ද අධාර්මික වෙති. රාජපුරුෂයන් අධාර්මික වූ කල බ්‍රාහ්මණ-ගෘහපතිහු ද අධාර්මික වෙති. බ්‍රාහ්මණගෘහපතීන් අධාර්මික වූ කල නිගම් ජනපද වාසීහු ද අධාර්මික වෙති. නිගම ජනපද වාසීන් අධාර්මික වූ කල චන්ද්‍රසූය්‍යීයෝ විෂම ව හැසිරෙත්. විෂම ව චන්ද්‍රසූය්‍යීයන් හැසිරෙනා කල නක්ෂත්‍රතාරකාරූපයෝ විෂම ව හැසිරෙත්. විෂම ව නක්ෂත්‍රතාරකාරූපයන් ප්‍රවෘත්ත වූ කල රාත්‍රින්දිවයෝ විෂම ව පවතිත්. විෂම ව රාත්‍රින්දිවයන් පවත්නා කල මාසාර්ධමාසයෝ විෂම ව පවතිත්. විෂම ව මාසාර්ධමාසයන් පවත්නා කල ඍතු සංවත්සරයෝ විෂම ව පවතිත්. විෂම ඍතු සංවත්-සරයන් පවත්නා කල දැඩි හෝ මඳ වූ, නො මග ගත් වාත විෂම ව හමති. දැඩි හෝ මඳ වූ, නො මග ගත් වාත විෂම ව හමන කල්හි දෙවතාවෝ ප්‍රකුපිත වෙත්. දෙවතාවන් ප්‍රකුපිත වූ කල මනා දහරින් වැසි නො වසිති. වැසි සම්‍යක් ධාරායෙන් නො වස්නා කල ශස්‍යයෝ විෂම ව පැසෙත්. මහණෙනි, විෂමපාකී ශස්‍යයන් වළඳ කරණ මිනිස්හු අල්පායුෂ්කා වෙත්. දුර්වර්ණ ද වෙත්. දුර්වල ද වෙත්. බොහෝ ආබාධ ඇති ද වෙත්.

මහණෙනි, යම් කලෙක රජදරුවෝ ධාර්මික වෙත් ද, එසමයෙහි රාජපුරුෂයෝ ද ධාර්මික වෙත්. රාජපුරුෂයන් ධාර්මික වූකල බ්‍රාහ්මණ ගෘහපතිහු ද ධාර්මික වෙත්. බ්‍රාහ්මණ ගෘහපතීන් ධාර්මික වූ කල නිගම් ජනපද වාසීහු ද ධාර්මික වෙත්. නිගම් ජනපද වාසීන් ධාර්මික වූ කල සඳහිරු දෙදෙනා සමව පවතිත්. සම ව සඳ හිරු දෙදෙනා පවත්නා කල නක්ෂත්‍ර තාරකාරූපයෝ සම ව පවතිත්. සම ව නක්ෂත්‍ර තාරකා රූපයන් පවත්නා කල දිවා රෑ සමව පවතී. සම ව දිවා රෑ පවත්නා කල මසඩමස් සම ව පවතියි. සම ව මසඩමස් පවත්නා කල ඍතු සංවත්සර සම ව පවතී. සම ව ඍතු සංවත්සර පවත්නා කල අවිෂම වූ නිසි මග ගත් වාතයෝ සම ව හමිත්. අවිෂම වූ නිසි මග ගත් වාත සම ව හමන කල දෙවතාවෝ ප්‍රකුපිත නො වෙත්. දෙවතාවන් ප්‍රකුපිත නොවූ කල වැසි සම්‍යක් ධාරායෙන් වස්නේ ය. වැසි සම්‍යක් ධාරායෙන් වස්නා කල ශස්‍ය ඵලයෝ සමපාකී වෙත්. මහණෙනි, මිනිස්හු සමපාකී ශස්‍ය ඵලයන් වළඳ කරන්නාහු දීර්ඝායුෂ්කා ද වෙති. වර්ණවත් ද වෙති. බලවත් ද වෙති. අල්පාබාධත් වෙති.

54. ගුන්නං චෙ තරමානානං ජිම්හං ගච්ඡති පුඞ්ගවො,
සබ්බා තා ජිම්හං ගච්ඡන්ති නෙත්තෙ ජිම්හං ගතෙ සති.

55. එවමෙව මනුස්සෙසු යො හොති සෙට්ඨසම්මතො,
සො චෙ අධම්මං චරති පගෙව ඉතරා පජා,
සබ්බං රට්ඨං දුඛං සෙති රාජා චෙ හොති අධම්මිකො.

56 ගුන්නං චෙ තරමානානං උජුං ගච්ඡති පුඞ්ගවො,
සබ්බා තා උජු ගච්ඡන්ති නෙත්තෙ උජුගතෙ සති.

57. එවමෙව මනුස්සෙසු යො හොති සෙට්ඨසම්මතො,
සො චෙව[1] ධම්මං චරති පගෙව ඉතරා පජා,
සබ්බං රට්ඨං සුඛං සෙති රාජා චෙ හොති ධම්මිකොති.

පත්තකම්මවග්ගො දුතියො.

**තස්සුද්දානං:**

පත්තකම්මං අනණෙයො සබ්‍රහ්මං නිරයො රූපෙන පඤ්චමං,
සරාග අහිතා දෙවදත්තො පධානං අධම්මිකෙන චා'ති.

1, සො සචෙ - සිංසං

54. තරණය කරණ ගොනුන් අතුරෙහි පුඞ්ගවයා කුටිල ව යේ නම් ඒ නායක ගවයා කුටිලව ගිය කල්හි සෙසු හැම ගවයෝ කුටිල ව යෙත්.

55. එපරිදි ම මිනිසුන් අතුරෙහි යම් මිනිසෙක් ශ්‍රෙෂ්ඨ සම්මත වේ නම් හෙ ම අධර්‍ම කෙරේ නම් ඉතිරි ප්‍රජාව කැලම ය. රජ නො දැහැමි වේ නම් මුළු රට දුඃඛිත වේ.

56. තරණය කරණ ගොනුන් අතුරෙහි පුඞ්ගවයා අකුටිල ව යේ නම් නායකයා ඍජු ව යත් ම එ හැම ගවයෝ ඍජුව යෙත්.

57. එපරිදි ම මිනිසුන් කෙරෙහි යම් මිනිසෙක් ශ්‍රෙෂ්ඨ සම්මත වේ ද, හෙ ද දහම් පුරා නම්, ඉතිරි ප්‍රජාව කැලම ය. රජ ධාර්මික වේ නම් මුළු රට සුඛිත වෙයි.

පත්තකම්ම වර්ගය දෙවැනි යි.

එහි උද්දානය:

පත්තකම්ම සූත්‍රය, අනණ සූත්‍රය, සබ්‍රහ්ම සූත්‍රය, නිරය සූත්‍රය, පඤ්චත රූප සූත්‍රය, සරාග අහි සූත්‍ර දෙකය, දෙවදත්ත සූත්‍රය, පධාන සූත්‍රය, අධම්මික සූත්‍රය සමග දශය යි.

# 3. අපණ්ණකවග්ගො

## 4. 2. 3. 1.

### [ පධාන-අපණ්ණකපටිපදාසුත්තං ]*

[සාවත්ථිනිදානං]

21. චතූහි භික්ඛවෙ ධම්මෙහි සමන්නාගතො භික්ඛු අපණ්ණකතං[1] පටිපදං පටිපන්නො හොති. යොනි චස්ස ආරද්ධා හොති. ආසවානං ඛයාය. කතමෙහි චතූහි?

ඉධ භික්ඛවෙ භික්ඛු සීලවා හොති, බහුස්සුතො හොති, ආරද්ධවිරියො හොති, පඤ්ඤවා හොති.

ඉමෙහි ඛො භික්ඛවෙ චතූහි ධම්මෙහි සමන්නාගතො භික්ඛු අපණ්ණකතං පටිපදං පටිපන්නො හොති, යොනි චස්ස ආරද්ධා හොති, ආසවානං ඛයායාති.

## 4. 2. 3. 2

### [ දිට්ඨි-අපණ්ණකපටිපදාසුත්තං ]

22. චතූහි භික්ඛවෙ ධම්මෙහි සමන්නාගතො භික්ඛු අපණ්ණකතං[1] පටිපදං පටිපන්නො හොති, යොනි චස්ස ආරද්ධා හොති ආසවානං ඛයාය. කතමෙහි චතූහි?

නෙක්ඛම්මවිතක්කෙන, අබ්‍යාපාදවිතක්කෙන, අවිහිංසාවිතක්කෙන, සම්මාදිට්ඨියා.

ඉමෙහි ඛො භික්ඛවෙ චතූහි ධම්මෙහි සමන්නාගතො භික්ඛු අපණ්ණකතං පටිපදං පටිපන්නො හොති, යොනි චස්ස ආරද්ධා හොති ආසවානං ඛයායාති.

## 4. 2. 3. 3

### [ අසප්පුරිස-වධුකාසුත්තං ]

23. චතූහි භික්ඛවෙ ධම්මෙහි සමන්නාගතො අසප්පුරිසො වෙදිතබ්බො. කතමෙහි චතූහි?

ඉධ භික්ඛවෙ අසප්පුරිසො යො හොති පරස්ස අවණ්ණො, තං අපුට්ඨොපි පාතුකරොති, කො පන වාදො පුට්ඨස්ස. පුට්ඨො ඛො පන පඤ්හාභිනීතො අහාපෙත්වා අලම්බෙත්වා[2] පරිපූරං විත්ථාරෙන පරස්ස අවණ්ණං භාසිතා හොති. වෙදිතබ්බමෙතං භික්ඛවෙ අසප්පුරිසො අයං භවන්ති.

පුනචපරං භික්ඛවෙ අසප්පුරිසො යො හොති පරස්ස වණ්ණො, තං පුට්ඨොපි න පාතුකරොති. කො පන වාදො අපුට්ඨස්ස. පුට්ඨො ඛො පන පඤ්හාභිනීතො හාපෙත්වා ලම්බෙත්වා අපරිපූරං අවිත්ථාරෙන පරස්ස වණ්ණං භාසිතා හොති. වෙදිතබ්බමෙතං භික්ඛවෙ අසප්පුරිසො අයං භවන්ති.

පුනචපරං භික්ඛවෙ අසප්පුරිසො යො හොති අත්තනො අවණ්ණො, තං පුට්ඨොපි න පාතුකරොති කො පන වාදො අපුට්ඨස්ස. පුට්ඨො ඛො පන පඤ්හාභිනීතො හාපෙත්වා ලම්බෙත්වා අපරිපූරං අවිත්ථාරෙන අත්තනො අවණ්ණං භාසිතා හොති. වෙදිතබ්බමෙතං භික්ඛවෙ අසප්පුරිසො අයං භවන්ති.

---

1 අපණ්ණකපටිපදං - මජසං 2 'අලම්බෙත්වා' අ. අලම්බිත්වා - මජසං

* උද්දානෙ 'ආරද්ධවිරියො'ති පදස්ස, 'සම්මාදිට්ඨියා'ති පදස්ස උපාදාය පධානසුත්තන්ති ච, දිට්ඨිසුත්තන්ති ච වුත්තං.

# 3. අපණ්ණක වර්ගය

## 4. 2. 3. 1.

## [ පධාන-අපණ්ණකපටිපදා සූත්‍රය ]

**[සැවැත්නිදානයි]**

21. මහණෙනි, සතර දහමෙකින් සමන්වාගත මහණ අවිරුද්ධ ප්‍රතිපදාවට පිළිපන්නේ වෙයි. ආශ්‍රවක්ෂය පිණිස කරුණු ද ඔහුට සම්පූර්ණ වෙයි. කවර සතර දහම්හ යත්:

මහණෙනි, මෙසස්නෙහි මහණ සිල්වත් වෙයි. බහුශ්‍රැත වෙයි. රුකුළු වැර ඇතියේ වෙයි. පැණැතියේ වෙයි.

මහණෙනි, මේ සතර දහමින් සමන්වාගත මහණ අවිරුද්ධ ප්‍රතිපදාවට පිළිපන්නේ වෙයි. ආශ්‍රවක්ෂය පිණිස ඔහු විසින් හේතු ද ආරබ්ධ වෙයි.

## 4. 2. 3. 2.

## [ දිවසි-අපණ්ණකපටිපදා සූත්‍රය ]

22. මහණෙනි, සතර දහමෙකින් සමන්වාගත මහණ අවිරුද්ධ ප්‍රතිපදාවට පිළිපන්නේ වෙයි. ආශ්‍රවක්ෂය පිණිස හේතු ද ඔහු විසින් ආරබ්ධ වෙයි. කවර සතර දහම්හ යත්:

නෛෂ්ක්‍රම්‍ය විතර්කයෙන, අව්‍යාපාද විතර්කයෙන, අවිහිංසා විතර්කයෙන, සම්‍යග්දෘෂ්ටියෙනැ යි.

මහණෙනි, මේ සතර දහමින් සමන්වාගත මහණ අවිරුද්ධ ප්‍රතිපදාවට පිළිපන්නේ වෙයි. ආශ්‍රවක්ෂය පිණිස හේතු ද ඔහු විසින් ආරබ්ධ වෙයි.

## 4. 2. 3. 3.

## [අසප්පුරිස-වධුකා සූත්‍රය]

23. මහණෙනි, සතර දහමෙකින් සමන්වාගත වූයේ අසත්පුරුෂය යි දතයුතු ය. කවර සතර දහම්හ යත්:

මහණෙනි, මෙලොව්හි අසත්පුරුෂ මෙරමාගේ යම් අගුණයෙක් ඇත් ද, එය නො පුළුවුස්නා ලද්දේත් පහළ කෙරෙයි. පුළුවුස්නා ලද්දහු පිළිබඳ ව කවර කථාය. පුළුවුස්නා ලද්දේ ප්‍රශ්න පිණිස එළවන ලදුව නො පිරිහෙළා නො වසා පරිපූර්ණ කොට විස්තර විසින් මෙරමාගේ නුගුණ කියනුයේ වෙයි. මහණෙනි, මේ භවත් අසත්පුරුෂය යි තෙල දත යුතුය.

තවද මහණෙනි, අසත්පුරුෂ මෙරමාගේ යම් ගුණයෙක් ඇත් ද, එය විචාරණ ලදුයේත් පාළ නො කෙරෙයි. නො විචාරණ ලද්දහු පිළිබඳ ව කවර කථාය. විචාරණ ලද්දේ ප්‍රශ්න පිණිස එළවන ලද්දේ පිරිහෙළා වසා අපරිපූර්ණ කොට, නො විතරින් මෙරමාගේ ගුණ කියනුයේ වෙයි. මහණෙනි, මේ භවත් අසත්පුරුෂය යි තෙල දත යුතුය.

තව ද මහණෙනි, අසත්පුරුෂ තමාගේ යම් අගුණයෙක් ඇත් ද, එය පුළුවුස්නා ලද්දේත් පාළ නො කෙරෙයි නුපුළුවුස්නා ලද්දහු පිළිබඳ ව කවර කථාය. පුළුවුස්නා ලද්දේ ප්‍රශ්නයට කැඳවන ලද්දේ පිරිහෙළා වසා අපරිපූර්ණ කොට නො විතර විසින් තමාගේ නුගුණ කියනුයේ වෙයි. මහණෙනි, මේ භවත් අසත්පුරුෂය යි තෙල දත යුතුය.

Free Distribution www.aathaapi.org

පුනචපරං භික්ඛවෙ අසප්පුරිසො යො හොති අත්තනො වණ්ණො, තං අපුට්ඨොපි පාතුකරොති, කො පන වාදෙ පුට්ඨස්ස. පුට්ඨො ඛො පන පඤ්හාභිනීතො අහාපෙත්වා අලම්බෙත්වා පරිපූරං විත්ථාරෙන අත්තනො වණ්ණං භාසිතා හොති. වෙදිතබ්බමෙතං භික්ඛවෙ අසප්පුරිසො අයං භවන්ති.

ඉමෙහි ඛො භික්ඛවෙ චතූහි ධම්මෙහි සමන්නාගතො අසප්පුරිසො වෙදිතබ්බො.

චතූහි භික්ඛවෙ ධම්මෙහි සමන්නාගතො සප්පුරිසො වෙදිතබ්බො. කතමෙහි චතූහි?

ඉධ භික්ඛවෙ සප්පුරිසො යො හොති පරස්ස අවණ්ණො, තං පුට්ඨොපි න පාතුකරොති, කො පන වාදෙ අපුට්ඨස්ස. පුට්ඨො ඛො පන පඤ්හාභිනීතො හාපෙත්වා ලම්බෙත්වා අපරිපූරං අවිත්ථාරෙන පරස්ස අවණ්ණං භාසිතා හොති. වෙදිතබ්බමෙතං භික්ඛවෙ සප්පුරිසො අයං භවන්ති.

පුනචපරං භික්ඛවෙ සප්පුරිසො යො හොති පරස්ස වණ්ණො, තං අපුට්ඨොපි පාතුකරොති, කො පන වාදෙ පුට්ඨස්ස. පුට්ඨො ඛො පන පඤ්හාභිනීතො අහාපෙත්වා අලම්බෙත්වා පරිපූරං විත්ථාරෙන පරස්ස වණ්ණං භාසිතා හොති. වෙදිතබ්බමෙතං භික්ඛවෙ සප්පුරිසො අයං භවන්ති.

පුනචපරං භික්ඛවෙ සප්පුරිසො යො හොති අත්තනො අවණ්ණො, තං අපුට්ඨොපි පාතුකරොති, කො පන වාදෙ පුට්ඨස්ස. පුට්ඨො ඛො පන පඤ්හාභිනීතො අහාපෙත්වා අලම්බෙත්වා පරිපූරං විත්ථාරෙන අත්තනො අවණ්ණං භාසිතා හොති. වෙදිතබ්බමෙතං භික්ඛවෙ සප්පුරිසො අයං භවන්ති.

පුනචපරං භික්ඛවෙ සප්පුරිසො යො හොති අත්තනො වණ්ණො, තං පුට්ඨොපි න පාතුකරොති, කො පන වාදෙ අපුට්ඨස්ස. පුට්ඨො ඛො පන පඤ්හාභිනීතො හාපෙත්වා ලම්බෙත්වා අපරිපූරං අවිත්ථාරෙන අත්තනො වණ්ණං භාසිතා හොති. වෙදිතබ්බමෙතං භික්ඛවෙ සප්පුරිසො අයං භවන්ති.

ඉමෙහි ඛො භික්ඛවෙ චතූහි ධම්මෙහි සමන්නාගතො සප්පුරිසො වෙදිතබ්බො.

සෙය්‍යථාපි භික්ඛවෙ වධුකා යඤ්ඤදෙව රත්තිං වා දිවසං[1] වා ආනීතා හොති. තාවදෙවස්සා තිබ්බං හිරොත්තප්පං පච්චුපට්ඨිතං හොති සස්සුයාපි සසුරෙපි සාමිකෙපි අන්තමසො දාසකම්මකරපොරිසෙසු. සා අපරෙන සමයෙන සංවාසමන්වාය විස්සාසමන්වාය සස්සුම්පි සසුරම්පි සාමිකම්පි එවමාහ: අපෙථ, කිං පන තුම්හෙ ජානාථාති.

1. දිවං වා - මජ්ඣං

තව ද මහණෙනි, අසත්පුරුෂ තමාගේ යම් ගුණයෙක් ඇත් ද, එය නො විචාරණ ලද්දේත් පහළ කෙරෙයි. විචාරණ ලද්දහු පිළිබඳ ව කවර කථාය. පුළුවුස්නා ලද්දේ ප්‍රශ්නයට පෙරට ගන්නා ලද්දේ නො පිරිහෙළා නො වසා පරිපූර්ණ කොට විස්තර විසින් තමාගේ ගුණ කියනුයේ වෙයි. මහණෙනි, මේ භවත් අසත්පුරුෂ ය යි තෙල දතයුතුය.

මහණෙනි, මේ සතර දහමින් සමන්වාගත වූයේ අසත්පුරුෂ යයි දතයුතුයි.

මහණෙනි, සතර දහම්හින් සමන්වාගත වූයේ සත්පුරුෂ ය යි දතයුතුය. කවර සතර දහම්හි යත්:

මහණෙනි, මෙ ලොව්හි සත්පුරුෂ මෙරමාගේ යම් අගුණයෙක් ඇත් ද, එය විචාරණ ලද්දේත් පහළ නො කෙරෙයි. නො විචාරණ ලද්දහු පිළිබඳ ව කවර කථාය. විචාරණ ලද්දේ ප්‍රශ්නයට පෙරට ගන්නා ලද්දේ පිරිහෙළා වසා අපරිපූර්ණ කොට නො විතර විසින් මෙරමාගේ නුගුණ කියනුයේ වෙයි. මහණෙනි, මේ භවත් සත්පුරුෂය යි තෙල දතයුතුය.

තව ද මහණෙනි, සත්පුරුෂ මෙරමාගේ යම් ගුණයෙක් ඇත් ද, එය නො විචාරණ ලද්දේත් පහළ කෙරෙයි. විචාරණ ලද්දහු පිළිබඳ ව කවර කථාය. විචාරණ ලද්දේ ප්‍රශ්නයට ඉදිරිපත් කරණ ලද්දේ නො පිරිහෙළා නො වසා පරිපූර්ණ කොට විස්තර විසින් මෙරමාගේ ගුණ කියනුයේ වෙයි. මහණෙනි, මේ භවත් සත්පුරුෂ ය යි තෙල දතයුතුය.

තවද මහණෙනි, සත්පුරුෂ තමාගේ යම් අගුණයෙක් ඇත් ද, එය නො විචාරණ ලදුවත් පහළ කෙරෙයි. විචාරණ ලද්දහු පිළිබඳව කවර කථාය. විචාරණ ලද්දේ ප්‍රශ්නයට නඟාගන්නා ලද්දේ නො පිරිහෙළා නො වසා පරිපූර්ණ කොට විස්තර විසින් තමාගේ අගුණ කියනුයේ වෙයි. මහණෙනි, මේ භවත් සත්පුරුෂය යි තෙල දතයුතුය.

තව ද මහණෙනි, සත්පුරුෂ තමාගේ යම් ගුණයෙක් ඇත් ද, එය විචාරණ ලද්දේත් පහළ නො කෙරෙයි. නො විචාරණ ලද්දහු පිළිබඳ ව කවර කථාය. විචාරණ ලද්දේ ප්‍රශ්නයට මතු කොට ගන්නා ලද්දේ පිරිහෙළා වසා අපරිපූර්ණ කොට නො විතර විසින් තමාගේ ගුණ කියනුයේ වෙයි. මහණෙනි, මේ භවත් සත්පුරුෂය යි තෙල දතයුතුය.

මහණෙනි, මේ සතර දහමින් සමන්වාගත වූයේ සත්පුරුෂ යයි දතයුතුයි.

මහණෙනි, යම් පරිදි වධූකාවක් (අලුත විවාපත් කතක්) යම් ම රැයෙක හෝ දවසෙක හෝ කැඳවා ගෙණෙන ලදු වූ ද, ඈ අලුත ඈයට නැන්දනියන් කෙරෙහි ද මයිලනුවන් කෙරෙහි ද සමුනන් කෙරෙහි ද යටත් පිරිසෙහිත් දස්කම්කරුපුරිස් කෙරෙහි ද තියුණු විලිබිය එළඹ සිටියේ වෙයි. ඕ පසුකල සයමාසයට ගොස් විශ්වාසයට ගොස් නැන්දනියනට ද මයිලනුවනට ද සමුනනට ද මෙසේත් කියයි: ඉවත යා, තෙපි කුමක් දන්නාව යි.

එවමෙව ඛො භික්ඛවෙ ඉධෙකච්චො භික්ඛු යඤ්ඤදෙව රත්තිං වා දිවසං වා අගාරස්මා අනගාරියං පබ්බජිතො හොති, තාවදෙවස්ස තිබ්බං තිරොක්ඛාපපං පච්චුපට්ඨිතං හොති භික්ඛුසු භික්ඛුනීසු උපාසකෙසු උපාසිකාසු අන්තමසො ආරාමිකසමණුද්දෙසෙසු. සො අපරෙන සමයෙන සංවාසමන්වාය විස්සාසමන්වාය ආචරියම්පි උපජ්ඣායම්පි එවමාහ: අපෙථ, කිං පන තුම්හෙ ජානාථාති.

තස්මාතිහ භික්ඛවෙ එවං සික්ඛිතබ්බං: අබ්භුතාගතවඩ්ඪකාසමෙන චෙතසා විහරිස්සාමාති. එවං හි වො භික්ඛවෙ සික්ඛිතබ්බන්ති.

4. 2. 3. 4.

[පඨමඅඞ්ගසුත්තං]

24. චත්තාරිමානි භික්ඛවෙ අඞ්ගානි. කතමානි චත්තාරි?

සීලඞ්ගං, සමාධඞ්ගං[1], පඤ්ඤඞ්ගං, විමුත්තඞ්ගං.

ඉමානි ඛො භික්ඛවෙ චත්තාරි අඞ්ගානීති.

4. 2. 3. 5

[දුතියඅඞ්ගසුත්තං]

25. චත්තාරිමානි භික්ඛවෙ අඞ්ගානි. කතමානි චත්තාරි?

රූපඞ්ගං, වෙදනඞ්ගං, සඤ්ඤඞ්ගං, භවඞ්ගං.

ඉමානි ඛො භික්ඛවෙ චත්තාරි අඞ්ගානීති.

4. 2. 3 6

[කුසිනාරසුත්තං]

26. එකං සමයං භගවා **කුසිනාරායං** විහරති **උපවත්තනෙ මල්ලානං සාලවනෙ**, අන්තරෙන යමකසාලානං පරිනිබ්බාණසමයෙ. තත්‍ර ඛො භගවා භික්ඛූ ආමන්තෙසි භික්ඛවොති. භදන්තෙති තෙ භික්ඛූ භගවතො පච්චස්සොසුං. භගවා එතදවොච:

සියා ඛො පන භික්ඛවෙ එකභික්ඛුස්සපි කඞ්ඛා වා විමති වා බුද්ධෙ වා ධම්මෙ වා සඞ්ඝෙ වා මග්ගෙ වා පටිපදාය වා, පුච්ඡථ භික්ඛවෙ, මා පච්ඡා විප්පටිසාරිනො අහුවත්ථ "සම්මුඛීභූතො නො සත්ථා අහොසි, නාසක්ඛිම්හ භගවන්තං සම්මුඛා පටිපුච්ඡිතුන්ති". එවං වුත්තෙ තෙ භික්ඛූ තුණ්හී අහෙසුං.

දුතියම්පි ඛො භගවා භික්ඛූ ආමන්තෙසි: සියා ඛො පන භික්ඛවෙ එකභික්ඛුස්සපි කඞ්ඛා වා විමති වා බුද්ධෙ වා ධම්මෙ වා සඞ්ඝෙ වා මග්ගෙ වා පටිපදාය වා, පුච්ඡථ භික්ඛවෙ, මා පච්ඡා විප්පටිසාරිනො "අහුවත්ථ සම්මුඛීභූතො නො සත්ථා අහොසි, නාසක්ඛිම්හා භගවන්තං සම්මුඛා පටිපුච්ඡිතුන්ති". දුතියම්පි ඛො තෙ භික්ඛූ තුණ්හී අහෙසුං.

---

1. සමාධිඞ්ගං - මජ්සං.

මහණෙනි, එපරිදි ම මෙසස්නෙහි සිටි මහණෙක් යම් ම රැයෙක වේවයි දවසෙක වේවයි ගිහිගෙන් නික්ම පැවිද්දට පැමිණියේ වේ ද, එකෙණෙහි ම ඔහට භික්ෂූන් කෙරෙහි භික්ෂුණීන් කෙරෙහි උපාසකයන් කෙරෙහි උපාසිකාවන් කෙරෙහි යටත් පිරිසෙයින් ආරාමික සාමණේරදෙසයන් කෙරෙහිත් තියුණු ගිරිඹතක් එළඹුනේ වෙයි. හේ මැත කාලයෙක සහවාසයට එළඹ විශ්වාසයට එළඹ ඇදුරනටත් උවදෑවනටත් මෙසේ ද කියයි: පහවව, තෙපි කුමක් දන්නාව යි.

මහණෙනි, එහෙයින් මෙසේ හික්මෙන්නේ ය. “අලුත ආ වඩුකාවකගේ සිතට බඳු සිතින් වසම්හ” යි. මහණෙනි, තොප මෙසේ ම හික්මෙන්නේ ය.

## 4. 2. 3. 4.

## [ප්‍රථමඅග්ග සූත්‍රය]

24. මහණෙනි, මේ අග්‍රයෝ සතර දෙනෙකි. කවර සතර දෙනෙක යත්:

ශීලාග්‍රය, සමාධ්‍යග්‍රය, ප්‍රඥාග්‍රය, විමුක්ත්‍යග්‍ර යි.

මහණෙනි, මේ සතර අග්‍රයෝ යි.

## 4. 2. 3. 5.

## [ ද්විතීයඅග්ග සූත්‍රය ]

25. මහණෙනි, මේ අග්‍රයෝ සතර දෙනෙකි. කවර සතර දෙනෙක යත්:

රූපාග්‍රය, වේදනාග්‍රය, සංඥාග්‍රය, භවාග්‍ර යි.

මහණෙනි, මේ සතර අග්‍රයෝ යි.

## 4. 2. 3. 6.

## [ කුසිනාරා සූත්‍රය ]

26. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ පිරිනිවන් වදනා සෙමෙහි **කුසිනාරා** නුවර **උපවත්තන** නම් වූ **මල්ලරජුන්ගේ** **සල්උයනෙහි** යමක-ශාලයන් අතර වැඩ වසන සේක. එකල්හි භාග්‍යවතුන් වහන්සේ ‘මහණෙනි’ යි භික්ෂූන් ඇමතූ සේක: ‘වහන්සැ’ යි ඒ භික්ෂූහු භාග්‍යවත්හට පිළිවදන් ඇස්වූහ. භාග්‍යවතුන් වහන්සේ තෙල වදාළ සේක:

මහණෙනි, එක් මහණක්හට දු බුදුන් කෙරෙහි වේවයි දහම් කෙරෙහි වේවයි සඟුන් කෙරෙහි වේවයි මාර්ගය කෙරෙහි වේවයි පිළිවෙත කෙරෙහි වේවයි විචිකිච්ඡායෙක් හෝ විමතියෙක් හෝ ඇත් ද, මහණෙනි, පුළුවුස්ව. “අපට ශාස්තෘන් වහන්සේ සම්මුඛ වූහ. හමුයෙහි ලා බුදුන් පුළුවුස්නට නොහැකිවූම්හ” යි පසුව විපිළිසර නොවා යි. මෙසේ වදාළ කල්හි ඒ මහණහු නිශ්ශබ්ද වූහු.

දෙවනවටත් භාග්‍යවතුන් වහන්සේ භික්ෂූන් ඇමතූ සේක: මහණෙනි, එක් මහණක්හටත් බුදුන් කෙරෙහි වේවයි, දහම් කෙරෙහි වේවයි, සඟුන් කෙරෙහි වේවයි, මාර්ගය කෙරෙහි වේවයි, පිළිවෙත කෙරෙහි වේවයි, විචිකිච්ඡායෙක් හෝ සැකයෙක් හෝ ඇත් ද, මහණෙනි, පුළුවුස්ව. “අපට ශාස්තෘන්වහන්සේ සම්මුඛ වූහ. හමුයෙහි දී බුදුන් පුළුවුස්නට නොහැකිවූම්හ” යි පසුව විපිළිසර නොවා යි. දෙවනවටත් ඒ මහණහු නිශ්ශබ්ද වූහු.

තතියම්පි ඛො භගවා භික්ඛූ ආමන්තෙසි: සියා ඛො පන භික්ඛවෙ එකභික්ඛුස්සපි කඞ්ඛා වා විමති වා බුද්ධෙ වා ධම්මෙ වා සඞ්ඝෙ වා මග්ගෙ වා පටිපදාය වා, පුච්ඡථ භික්ඛවෙ, මා පච්ඡා විප්පටිසාරිනො අහුවත්ථ "සම්මුඛීභූතො නො සත්ථා අහොසි, නාසක්ඛිම්හ භගවන්තං සම්මුඛා පටිපුච්ඡිතුන්ති". තතියම්පි ඛො තෙ භික්ඛූ තුණ්හී අහෙසුං.

අථ ඛො භගවා භික්ඛූ ආමන්තෙසි: සියා ඛො පන භික්ඛවෙ සත්ථුගාරවෙනාපි න පුච්ඡෙය්‍යාථ, සහායකොපි භික්ඛවෙ සහායකස්ස ආරොචෙතූති. එවං වුත්තෙ තෙ භික්ඛූ තුණ්හී අහෙසුං.

අථ ඛො ආයස්මා ආනන්දො භගවන්තං එතදවොච: අච්ඡරියං භන්තෙ, අබ්භුතං භන්තෙ. එවං පසන්නො අහං භන්තෙ ඉමස්මිං භික්ඛුසඞ්ඝෙ, නත්ථි ඉමස්මිං භික්ඛුසඞ්ඝෙ එකභික්ඛුස්සපි කඞ්ඛා වා විමති වා බුද්ධෙ වා ධම්මෙ වා සඞ්ඝෙ වා මග්ගෙ වා පටිපදාය වාති.

පසාදා ඛො ත්වං ආනන්ද වදෙසි. ඤාණමෙව[1] හෙත්ථ ආනන්ද තථාගතස්ස, නත්ථි ඉමස්මිං භික්ඛුසඞ්ඝෙ එකභික්ඛුස්සපි කඞ්ඛා වා විමති වා බුද්ධෙ වා ධම්මෙ වා සඞ්ඝෙ වා මග්ගෙ වා පටිපදාය වා.

ඉමෙසං හි ආනන්ද පඤ්චන්නං භික්ඛුසතානං යො පච්ඡිමකො භික්ඛු, සො සොතාපන්නො අවිනිපාතධම්මො නියතො සම්බොධිපරායණොති.

## 4. 2. 3. 7

## [ අචින්තෙය්‍යසුත්තං ]

**[සාවත්ථිනිදානං:]**

27. චත්තාරිමානි භික්ඛවෙ අචින්තෙය්‍යානි න චින්තෙතබ්බානි, යානි චින්තෙන්තො උම්මාදස්ස විඝාතස්ස භාගී අස්ස. කතමානි චත්තාරි?

බුද්ධානං භික්ඛවෙ බුද්ධවිසයො අචින්තෙය්‍යො න චින්තෙතබ්බො, යං චින්තෙන්තො උම්මාදස්ස විඝාතස්ස භාගී අස්ස.

ඣායිස්ස භික්ඛවෙ ඣානවිසයො අචින්තෙය්‍යො න චින්තෙතබ්බො, යං චින්තෙන්තො උම්මාදස්ස විඝාතස්ස භාගී අස්ස.

කම්මවිපාකො භික්ඛවෙ අචින්තෙය්‍යො න චින්තෙතබ්බො, යං චින්තෙන්තො උම්මාදස්ස විඝාතස්ස භාගී අස්ස.

ලොකචින්තා භික්ඛවෙ අචින්තෙය්‍යා න චින්තෙතබ්බා, යං චින්තෙන්තො උම්මාදස්ස විඝාතස්ස භාගී අස්ස.

ඉමානි ඛො භික්ඛවෙ චත්තාරි අචින්තෙය්‍යානි න චින්තෙතබ්බානි, යානි චින්තෙන්තො උම්මාදස්ස විඝාතස්ස භාගී අස්සාති.

1. ඤාතමෙව - සතච

තෙවනවටත් භාග්‍යවතුන් වහන්සේ භික්ෂූන් ඇමතූ සේක. මහණෙනි, එක් මහණක්හටත් බුදුන් කෙරෙහි වේවයි, දහම් කෙරෙහි වේවයි, සඟුන් කෙරෙහි වේවයි, මාර්ගය කෙරෙහි වේවයි, පිළිවෙත කෙරෙහි වේවයි, විචිකිච්ඡායෙක් හෝ විමතියෙක් හෝ ඇත් ද, මහණෙනි, පුළුවුස්ව 'ශාස්තෘන් වහන්සේ අපට සම්මුඛ වූහ. ගම්මුයෙහි දී බුදුන් පුළුවුස්නට නොහැකි වූම්හ'යි පසුව විපිළිසර නොවව යි. තෙවනවටත් ඒ භික්ෂූහු නිහඬ වූහ.

එක්බිති භාග්‍යවතුන් වහන්සේ භික්ෂූන් ඇමතූ සේක. මහණෙනි, ශාස්තෘගෞරවයෙනුත් නොපුළුවුස්නාහු නම්, මහණෙනි, යහළුවකු යහළුවකුට කියන්නේය යි වදාළහ. මෙසේ වදාළ කල්හිත් ඒ භික්ෂූහු නිශ්ශබ්ද වූහු.

එසඳ ආයුෂ්මත් ආනන්ද තෙරණුවෝ භාග්‍යවතුන් වහන්සේට මෙසේ සැළ කළහ: වහන්ස, ආශ්චර්යය, වහන්ස, අද්භූතය, වහන්ස, මම මේ භික්සඟුන් කෙරෙහි මෙසේ හදහමි. "මේ භික්සඟුන් කෙරෙහි එක් මහණක්හට ද බුදුන් කෙරෙහි වේවයි, දහම් කෙරෙහි වේවයි, සඟුන් කෙරෙහි වේවයි, මාර්ගය කෙරෙහි වේවයි, පිළිවෙත කෙරෙහි වේවයි, විචිකිච්ඡායෙක් හෝ විමතියෙක් හෝ නැතැ"යි.

ආනන්දය, තෝ සැදැහැයෙන් කියහි. ආනන්දය, මේ භික්සඟුන් කෙරෙහි එක් මහණක්හටත් බුදුන් කෙරෙහි වේවයි, දහම් කෙරෙහි වේවයි සඟුන් කෙරෙහි වේවයි, මාර්ගය කෙරෙහි වේවයි, පිළිවෙත කෙරෙහි වේවයි, විචිකිච්ඡායෙක් හෝ විමතියෙක් හෝ නැත යනු මෙහි තථාගතයන්ගේ ඥානය මැ වෙයි.

ආනන්දය, මේ පන්සියයක් භික්ෂූන් අතර යම් හැමට සග මහණෙක් ඇත් ද, හේ සෝවත් වෙයි. අවිනිපාතධර්ම ඇත. නියතය, සම්බෝධිපරායන යි.

### 4. 2. 3. 7.

### [අචින්තෙය්‍ය සූත්‍රය]

[සැවැත්නිදානයි:]

27. මහණෙනි, යම් කරුණු සිතනුයේ උම්තුබවට දුකට හිමි වේ ද, එබඳු වූ සිතන්නට නොයුතු එහෙයින් ම නොසිතියයුතු මේ සතර කරුණුය. කවර සතර කරුණුය යත්:

මහණෙනි, යම් කරුණක් සිතනුයේ උම්තුබවට දුකට හිමි වේ ද, එබඳු වූ බුදුවරුන් පිළිබඳ බුද්ධවිෂය සිතන්නට නොයුතුය. එහෙයින් ම නොසිතිය යුතුය.

මහණෙනි, යම් කරුණක් සිතනුයේ උම්තුබවට දුකට හිමි වේ ද, එබඳු වූ ධ්‍යායීහු පිළිබඳ ධ්‍යානවිෂය සිතන්නට නොයුතුය. එහෙයින් ම නොසිතිය යුතුය.

මහණෙනි, යම් කරුණක් සිතනුයේ උම්තුබවට දුකට හිමි වේ ද, එබඳු වූ කර්මවිපාකය සිතන්නට නොයුතුය. එහෙයින් ම නොසිතිය යුතුය.

මහණෙනි, යම් කරුණක් සිතනුයේ උම්තු බවට දුකට හිමි වේ ද, එබඳු වූ ලෝකචින්තාව සිතන්නට නොයුතුය. එහෙයින් ම නොසිතිය යුතුය.

මහණෙනි, යම් බඳු කරුණු සිතනුයේ උම්තු බවට දුකට හිමි වේ ද, එබඳු වූ සිතන්නට නොයුතු එහෙයින් ම නොසිතිය යුතු මේ සතර කරුණු යි.

## 4. 2. 3. 8.

## [දක්ඛිණාවිසුද්ධිසුත්තං]

28. චතස්සො ඉමා භික්ඛවෙ දක්ඛිණාවිසුද්ධියො. කතමා චතස්සො?

අත්ථි භික්ඛවෙ දක්ඛිණා දායකතො විසුජ්ඣති නො පටිග්ගාහකතො. අත්ථි භික්ඛවෙ දක්ඛිණා පටිග්ගාහකතො විසුජ්ඣති නො දායකතො. අත්ථි භික්ඛවෙ දක්ඛිණා නෙව දායකතො විසුජ්ඣති නො පටිග්ගාහකතො. අත්ථි භික්ඛවෙ දක්ඛිණා දායකතො චෙව විසුජ්ඣති පටිග්ගාහකතො ච.

කථඤ්ච භික්ඛවෙ දක්ඛිණා දායකතො විසුජ්ඣති නො පටිග්ගාහකතො? ඉධ භික්ඛවෙ දායකො හොති සීලවා කල්‍යාණධම්මො, පටිග්ගාහකා හොන්ති දුස්සීලා පාපධම්මා.[1] එවං ඛො භික්ඛවෙ දක්ඛිණා දායකතො විසුජ්ඣති නො පටිග්ගාහකතො.

කථඤ්ච භික්ඛවෙ දක්ඛිණා පටිග්ගාහකතො විසුජ්ඣති නො දායකතො? ඉධ භික්ඛවෙ දායකො හොති දුස්සීලො පාපධම්මො, පටිග්ගාහකා හොන්ති සීලවන්තො කල්‍යාණධම්මා. එවං ඛො භික්ඛවෙ දක්ඛිණා පටිග්ගාහකතො විසුජ්ඣති නො දායකතො.

කථඤ්ච භික්ඛවෙ දක්ඛිණා නෙව දායකතො විසුජ්ඣති නො පටිග්ගාහකතො? ඉධ භික්ඛවෙ දායකො හොති දුස්සීලො පාපධම්මො, පටිග්ගාහකාපි හොන්ති දුස්සීලා පාපධම්මා. එවං ඛො භික්ඛවෙ දක්ඛිණා නෙව දායකතො විසුජ්ඣති නො පටිග්ගාහකතො.

කථඤ්ච භික්ඛවෙ දක්ඛිණා දායකතො චෙව විසුජ්ඣති පටිග්ගාහකතො ච? ඉධ භික්ඛවෙ දායකො හොති සීලවා කල්‍යාණධම්මො, පටිග්ගාහකාපි හොන්ති සීලවන්තො කල්‍යාණධම්මා. එවං ඛො භික්ඛවෙ දක්ඛිණා දායකතො චෙව විසුජ්ඣති පටිග්ගාහකතො ච.

ඉමා ඛො භික්ඛවෙ චතස්සො දක්ඛිණාවිසුද්ධියොති.

## 4. 2. 3. 9.

## [වණිජ්ජාසුත්තං]

29. අථ ඛො ආයස්මා **සාරිපුත්තො** යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි, එකමන්තං නිසින්නො ඛො ආයස්මා සාරිපුත්තො භගවන්තං එතදවොච:

කො නු ඛො භන්තෙ හෙතු, කො පච්චයො, යෙන මිධෙකච්චස්ස තාදිසාව වණිජ්ජා පයුත්තා ඡෙදගාමිනී හොති? කො පන භන්තෙ හෙතු, කො පච්චයො යෙන මිධෙකච්චස්ස තාදිසාව වණිජ්ජා පයුත්තා න යථාධිප්පායං හොති?

1. පටිග්ගාහකො හොති දුස්සීලො පාපධම්මො - සයා

## 4. 2. 3. 8.

## [ දක්ඛිණාවිසුද්ධි සූත්‍රය ]

28. මහණෙනි, මේ දක්ෂිණා විශුද්ධීහු සතර දෙනයි. කවර සතර දෙනෙක යත්:

මහණෙනි, දායකයන් මිස පිළිගාවන් (ප්‍රතිග්‍රාහකයන්) කෙරෙන් පිරිසිදු නොවන දක්ෂිණාවෙක් ඇත. මහණෙනි, පිළිගාවන් මිස දායකයන් කෙරෙන් පිරිසිදු නොවන දක්ෂිණාවෙක් ඇත. මහණෙනි, දායකයන් කෙරෙන් වේවයි, පිළිගාවන් කෙරෙන් වේවයි පිරිසිදු නො වන දක්ෂිණාවෙක් ඇත. මහණෙනි, දායකයන් කෙරෙහුත් පිළිගාවන් කෙරෙහුත් පිරිසිදු වන දක්ෂිණාවෙක් ඇත.

මහණෙනි, කෙසේ නම් දායකයන් මිස පිළිගාවන් කෙරෙන් පිරිසිදු නො වන දක්ෂිණාව වේ ය යත්: මහණෙනි, මේ ලොව දායක සිල්වත් වෙයි. කලණ දහම් ඇත්තේ වෙයි. පිළිගාවෝ දුසිල් වෙත්, ලමු දහම ඇති වෙත්. මහණෙනි, මෙසේ දායකයන් මිස පිළිගාවන් කෙරෙන් පිරිසිදු නො වන දක්ෂිණාව වෙයි.

මහණෙනි, කෙසේ නම් පිළිගාවන් මිස දායකයන් කෙරෙන් පිරිසිදු නො වන දක්ෂිණාව වේ ය? මහණෙනි, මෙ ලොව දායක දුශ්ශීල වෙයි. පාපධර්මී වෙයි. පිළිගාවෝ සිල්වත් වෙති. කලණ දහම් ඇති වෙත්. මහ-ණෙනි, මෙසේ පිළිගාවන් මිස දායකයන් කෙරෙන් පිරිසිදු නොවන දක්ෂිණාව වේ.

මහණෙනි, කෙසේ නම් දායකයන් කෙරෙහුත් පිළිගාවන් කෙරෙහුත් පිරිසිදු නො වන දක්ෂිණාව වේ ය? මහණෙනි, මෙ ලොව්හි දායක දුශ්ශීල වෙයි ලමු දහම් ඇති වෙයි. පිළිගාවෝත් දුශ්ශීල වෙත්. ලමු දහම් ඇති වෙති. මහණෙනි, මෙසේ දායකයන් කෙරෙහුත් පිළිගාවන් කෙරෙහුත් පිරිසිදු නො වන දක්ෂිණාව වේ.

මහණෙනි, කෙසේ නම් දායකයන් කෙරෙහුත් පිළිගාවන් කෙරෙහුත් පිරිසිදු වන දක්ෂිණාව වේ ය? මහණෙනි, මෙ ලොව දායක සිල්වත් වෙයි, කලණ දහම් ඇති වෙයි. පිළිගාවෝත් සිල්වත් වෙති, කලණ දහම් ඇති වෙත් මහණෙනි, මෙසේ දායකයන් කෙරෙහුත් පිළිගාවන් කෙරෙහුත් පිරිසිදු වන දක්ෂිණාව වෙයි.

මහණෙනි, මේ දක්ෂිණා විශුද්ධීහු සතර දෙනා වෙති.

## 4. 2. 3. 9

## [ වණිජ්ජා සූත්‍රය ]

29. එකල ආයුෂ්මත් සැරියුත් තෙරණුවෝ භාග්‍යවතුන් වහන්සේ කරා එළඹියහ. එළඹ භාග්‍යවතුන් වහන්සේ සකසා වැඳ එකත්පස්ව හුන්හ. එකත්පස්ව හුන් ආයුෂ්මත් ශාරිපුත්‍ර ස්ථවිරයන් වහන්සේ භාග්‍යවතුන් වහන්සේට මෙතෙල කැළ සැලහ:

වහන්ස, යම් හෙයෙකින් මේ ලොව ඇතැමකු විසින් එවන් (ප්‍රසිද්ධ) වෙළෙණ්දමෙක් යොදන ලද්දේ ඡේදගාමී (බිඳෙනසුලු) වේ ද, එයට හේතු කවරේ ය, ප්‍රත්‍යය කවරේය? වහන්ස, යම් හෙයෙකින් මෙ ලොව ඇතැමකු විසින් එවන් වණිජ්ජාකර්මයෙක් පටන්ගත්තා ලද්දේ අදහස පරිද්දෙන් නො වේ ද, එයට හෙතු කවරේ ය, ප්‍රත්‍යය කවරේ ය?

කො නු ඛො භන්තෙ හෙතු, කො පච්චයො, යෙන මිධෙකච්චස්ස තාදිසාව වණිජ්ජා පයුත්තා යථාධිප්පායං හොති? කො පන භන්තෙ හෙතු, කො පච්චයො, යෙන මිධෙකච්චස්ස තාදිසාව වණිජ්ජා පයුත්තා පරාධිප්පායා හොතීති?

ඉධ සාරිපුත්ත එකච්චො සමණං වා බ්‍රාහ්මණං වා උපසඞ්කමිත්වා පවාරෙති: වද භන්තෙ පච්චයෙනාති. සො යෙන පවාරෙති, තං න දෙති. සො චෙ තතො චුතො ඉත්ථත්තං ආගච්ඡති. සො යඤ්ඤදෙව වණිජ්ජං පයොජෙති, සාස්ස හොති ඡෙදගාමිනී.

ඉධ පන සාරිපුත්ත එකච්චො සමණං වා බ්‍රාහ්මණං වා උපසඞ්කමිත්වා පවාරෙති: වද භන්තෙ පච්චයෙනාති. සො යෙන පවාරෙති. තං න යථාධිප්පායං දෙති, සො චෙ තතො චුතො ඉත්ථත්තං ආගච්ඡති, සො යඤ්ඤදෙව වණිජ්ජං පයොජෙති, සාස්ස හොති න යථාධිප්පායා.

ඉධ පන සාරිපුත්ත එකච්චො සමණං වා බ්‍රාහ්මණං වා උපසඞ්කමිත්වා පවාරෙති: වද භන්තෙ පච්චයෙනාති. සො යෙන පවාරෙති. තං යථාධිප්පායං දෙති. සො චෙ තතො චුතො ඉත්ථත්තං ආගච්ඡති. සො යඤ්ඤදෙව වණිජ්ජං පයොජෙති, සාස්ස හොති යථාධිප්පායා.

ඉධ පන සාරිපුත්ත එකච්චො සමණං වා බ්‍රාහ්මණං වා උපසඞ්කමිත්වා පවාරෙති: වද භන්තෙ පච්චයෙනාති. සො යෙන පවාරෙති, තං පරාධිප්පායං දෙති. සො චෙ තතො චුතො ඉත්ථත්තං ආගච්ඡති. සො යඤ්ඤදෙව වණිජ්ජං පයොජෙති, සාස්ස හොති පරාධිප්පායා.[1]

අයං ඛො සාරිපුත්ත හෙතු, අයං පච්චයො, යෙන මිධෙකච්චස්ස තාදිසාව වණිජ්ජා පයුත්තා ඡෙදගාමිනී හොති.

අයං පන සාරිපුත්ත හෙතු, අයං පච්චයො, යෙන මිධෙකච්චස්ස තාදිසාව වණිජ්ජා පයුත්තා න යථාධිප්පායා හොති.

අයං ඛො සාරිපුත්ත හෙතු, අයං පච්චයො, යෙන මිධෙකච්චස්ස තාදිසා වණිජ්ජා පයුත්තා යථාධිප්පායා හොති.

අයං පන සාරිපුත්ත හෙතු, අයං පච්චයො, යෙන මිධෙකච්චස්ස තාදිසාව වණිජ්ජා පයුත්තා පරාධිප්පායා හොතීති.

1. පරාධිප්පායං - මජසං. සීමු

ස්වාමීනි, යම් හෙයෙකින් මෙ ලොව ඇතැම්කු විසින් එවන් (ප්‍රසිද්ධ) වණික්කර්මයෙක් පටන් ගන්නා ලද්දේ අදහස් පරිදි වේ ද, එයට හේතු කවරේ ය? ප්‍රත්‍යය කවරේ ය? ස්වාමීනි, යම් හෙයෙකින් මෙ ලොව ඇතැම්කු විසින් එවන් වණික් කර්මයෙක් අරඹන ලද්දේ අභිප්‍රායයෙන් අධිකතර (ඵල ඇති) වේ ද, එයට හේතු කවරේ ය? ප්‍රත්‍යය කවරේ ය?

ශාරිපුත්‍රය, මෙ ලොව ඇතැමෙක් මහණකු කරා හෝ බමුණකු කරා හෝ එළඹ, 'ස්වාමීනි, ප්‍රත්‍යයෙන් දන්වන්නේ ය'යි පවරයි. හෙතෙම යමෙකින් පවරා ද ඒ නො දෙයි. හේ ඉන් සැව මේ මිනිස් බවට එ යි නම්, හේ යම් ම වණික්කර්මයක් අරඹා ද, ඔහුගේ ඒ කර්මය ඡේදගාමී වෙයි.

ශාරිපුත්‍රය, මෙ ලොව ඇතැමෙක් මහණකු කරා හෝ බමුණකු කරා හෝ එළඹ, 'ස්වාමීනි, ප්‍රත්‍යයෙන් බණව' යි පවරයි. හේ යමෙකින් පවරා නම් එය අදහස් පරිදි නොදෙයි. හේ ඉන් සැව මේ මිනිස් බවට ආ නම්, හේ යම් ම වෙළෙඳමක් අරඹා ද, ඔහුගේ ඒ වෙළෙඳම අදහස් පරිදි නො වේ.

ශාරිපුත්‍රය, මෙ ලොව ඇතැමෙක් මහණකු කරා හෝ බමුණකු කරා හෝ එළඹ, 'ස්වාමීනි, ප්‍රත්‍යයෙන් රැස්නෝ ය'යි පවරයි. හේ යමෙකින් පවරා නම් එය අදහස් පරිදි දෙයි. හේ ඉන් සැව මේ මිනිස් බවට පැමිණේ නම්, හේ යම් ම වණිජ්ජාවක් අරඹා ද, ඔහුගේ ඒ වණිජ්ජාව අදහස් පරිදි වේ.

ශාරිපුත්‍රය, මෙ ලොව ඇතැමෙක් මහණකු කරා හෝ බමුණකු කරා හෝ එළඹ, 'ස්වාමීනි, ප්‍රත්‍යයෙන් කියව' යි පවරයි. හේ යමෙකින් පවරා ද, එය අභිප්‍රායට වැඩිතරම් කොට දෙයි. හේ ඉන් සැව මේ මිනිස් බවට එළඹේ නම්, හේ යම් ම වාණිජ්‍යයක් කෙරේ නම්, ඔහුගේ ඒ වාණිජ්‍යය අභිප්‍රායයෙන් අධිකතර වෙයි.

ශාරිපුත්‍රය, යම් හෙයෙකින් මෙලොව ඇතැම්කු විසින් එවන් වණිජ්ජාවක් අරඹන ලද්දී ඡේදගාමිනී වේ ද, මේ එයට හේතුයි. මේ එයට ප්‍රත්‍යය යි.

ශාරිපුත්‍රය, යම් හෙයෙකින් මෙලොව ඇතැම්කු විසින් එවන් වණිජ්ජාවක් පටන් ගන්නා ලද්දී, අදහස් පරිදි නො වේ ද, මේ එයට හේතුයි මේ එයට ප්‍රත්‍යය යි.

ශාරිපුත්‍රය, මෙ ලොව ඇතැම්කු විසින් එවන් වණිජ්ජාවක් යොදන ලද්දී අදහස් තුබූ පරිදි වේ ද, මේ එයට හෙතුයි. මේ එයට ප්‍රත්‍යය යි.

ශාරිපුත්‍රය, යම් හෙයෙකින් මේලොව ඇතැම්කු විසින් එවන් වණිජ්ජාවක් ප්‍රයුක්ත වූවා අභිප්‍රායයෙන් අධිකතර ඵල වේ ද, මේ එයට හේතුයි. මේ එයට ප්‍රත්‍යය යි.

## 4. 2. 3. 10.

### [ කම්බොජසුත්තං ]

30. එකං සමයං භගවා කොසම්බියං විහරති ඝොසිතාරාමෙ. අථ ඛො ආයස්මා ආනන්දො යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නො ඛො ආයස්මා ආනන්දො භගවන්තං එතදවොච.

කො නු ඛො භන්තෙ හෙතු, කො පච්චයො, යෙන මාතුගාමො නෙව සභායං නිසීදති, න කම්මන්තං පයොජෙති, න කම්බොජං ගච්ඡතීති?

කොධනො ආනන්ද මාතුගාමො, ඉස්සුකී ආනන්ද මාතුගාමො, මච්ඡරී ආනන්ද මාතුගාමො, දුප්පඤ්ඤො ආනන්ද මාතුගාමො.

අයං ඛො ආනන්ද හෙතු, අයං පච්චයො, යෙන මාතුගාමො නෙව සභායං නිසීදති, න කම්මන්තං පයොජෙති, න කම්බොජං ගච්ඡතීති.

**අපණ්ණකවග්ගො තතියො.**

**තස්සුද්දානං:**

පධාන දිට්ඨි'සප්පුරිස - වධුකා ද්වෙ ච හොන්ති අග්ගානි,
කුසිනාරා අචින්තිතං දක්ඛිණාය වණිජ්ජ කම්බොජෙන වග්ගො'ති.

## 4. 2. 3. 10

### [ කාම්බෝජ සූත්‍රය ]

30. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ කොසැඹෑ නුවර ඝොෂිතාරාමයෙහි වැඩ වසන සේක. එකල ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් වහන්සේ භාග්‍යවතුන් වහන්සේ කරා එළඹියහ. එළඹ භාග්‍යවතුන් වහන්සේ සකසා වැඳ එකත්පස්ව හුන්හ. එකත්පස් ව හුන් ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් වහන්සේ භාග්‍යවතුන් වහන්සේට තෙල සැල කළහ:

වහන්ස, යම් හෙයෙකින් මාගම විනිශ්චය සභායෙහි නො හිඳී ද, කර්මාන්ත නො කෙරේ ද, පිටරට නො යේ ද, එයට හේතු කවරේ ය, එයට ප්‍රත්‍යය කවරේ ය?

ආනන්දය, මාගම ක්‍රෝධ සුලුය. ආනන්දය, මාගම ඊර්ෂ්‍යා ඇත්තියක. ආනන්දය, මාගම මසුරු ඇත්තියක. ආනන්දය, මාගම නුවණ නැත්තියක.

ආනන්දය, යම් හෙයෙකින් මාගම විනිශ්චය සභායෙහි නො හිඳී ද, කර්මාන්ත නො කෙරේ ද, පිටරට නො යේ ද, මේ එයට හේතුයි. මේ එයට ප්‍රත්‍යය යි.

**අපණ්ණක වර්ගය තෙවැනි යි.**

**එහි උද්දානය:**

පධාන - දිට්ඨි අපණ්ණක සූත්‍ර දෙකය, අසප්පුරිස - වධූකා සූත්‍රය, අග්ග සූත්‍ර දෙකය, කුසිනාරා සූත්‍රය, අචින්තෙය්‍ය සූත්‍රය, දක්ඛිණා සූත්‍රය, වණිජ්ජා සූත්‍රය, කම්බෝජ සූත්‍රයෙනැ යි වර්ගය වේ.

## 4. මචලවග්ගො

### 4. 2. 4. 1.

### [ පාණාතිපාතිසුත්තං ]

[සාවත්ථිනිදානං]

31. චතූහි භික්ඛවෙ ධම්මෙහි සමන්නාගතො යථාභතං නික්ඛිත්තො එවං නිරයෙ. කතමෙහි චතූහි?

පාණාතිපාතී හොති, අදින්නාදායී හොති, කාමේසු මිච්ඡාචාරී හොති, මුසාවාදී හොති.

ඉමෙහි ඛො භික්ඛවෙ චතූහි ධම්මෙහි සමන්නාගතො යථාභතං නික්ඛිත්තො එවං නිරයෙ.

චතූහි භික්ඛවෙ ධම්මෙහි සමන්නාගතො යථාභතං නික්ඛිත්තො එවං සග්ගෙ. කතමෙහි චතූහි?

පාණාතිපාතා පටිවිරතො හොති, අදින්නාදානා පටිවිරතො හොති, කාමේසු මිච්ඡාචාරා පටිවිරතො හොති, මුසාවාදා පටිවිරතො හොති.

ඉමෙහි ඛො භික්ඛවෙ චතූහි ධම්මෙහි සමන්නාගතො යථාභතං නික්ඛිත්තො එවං සග්ගෙ'ති.

### 4. 2. 4. 2.

### [ මුසාවාදීසුත්තං ]

32. චතූහි භික්ඛවෙ ධම්මෙහි සමන්නාගතො යථාභතං නික්ඛිත්තො එවං නිරයෙ. කතමෙහි චතූහි?

මුසාවාදී හොති, පිසුනාවාචො හොති, ඵරුසාවාචො හොති, සම්ඵප්පලාපී හොති.

ඉමෙහි ඛො භික්ඛවෙ චතූහි ධම්මෙහි සමන්නාගතො යථාභතං නික්ඛිත්තො එවං නිරයෙ.

චතූහි භික්ඛවෙ ධම්මෙහි සමන්නාගතො යථාභතං නික්ඛිත්තො එවං සග්ගෙ. කතමෙහි චතූහි?

මුසාවාදා පටිවිරතො හොති, පිසුනාවාචා පටිවිරතො හොති, ඵරුසාවාචා පටිවිරතො හොති, සම්ඵප්පලාපා පටිවිරතො හොති.

ඉමෙහි ඛො භික්ඛවෙ චතූහි ධම්මෙහි සමන්නාගතො යථාභතං නික්ඛිත්තො එවං සග්ගෙ'ති.

### 4. 2. 4. 3

### [ වණ්ණසුත්තං ]

33. චතූහි භික්ඛවෙ ධම්මෙහි සමන්නාගතො යථාභතං නික්ඛිත්තො එවං නිරයෙ. කතමෙහි චතූහි?

අනනුවිච්ච අපරියොගාහෙත්වා අවණ්ණාරහස්ස වණ්ණං භාසති. අනනුවිච්ච අපරියොගාහෙත්වා වණ්ණාරහස්ස අවණ්ණං භාසති. අනනුවිච්ච අපරියොගාහෙත්වා අප්පසාදනීයෙ ඨානෙ පසාදං උපදංසෙති. අනනුවිච්ච අපරියොගාහෙත්වා පසාදනීයෙ ඨානෙ අප්පසාදං උපදංසෙති.

Free Distribution www.aathaapi.org

# 4. මචලවග්ගය

## 4. 2. 4. 1.

### [ පාණාතිපාතී සූත්‍රය ]

[සැවැත්නිදානයි.]

31. මහණෙනි, සතර කරුණෙකින් සමන්වාගත පුද්ගල ගෙණවුත් බහන ලද්දක් සෙයින් නිරයෙහි නික්ෂිප්තය. කවර සතර කරුණෙන යත්:

පණිවා කරන්නේ වෙයි. අයිනාදන් ගන්නේ වෙයි. කාමයෙහි මිසඟනර ඇතියේ වෙයි. මුසවා බණන්නේ වෙයි.

මහණෙනි, මේ සතර කරුණින් සමන්වාගත වූයේ ගෙණවුත් බහන ලද්දක් සෙයින් නිරයෙහි බහන ලද්දේ වෙයි.

මහණෙනි, සතර කරුණෙකින් සමන්වාගත පුද්ගල ගෙණවුත් බහන ලද්දක් සෙයින් සවර්ගයෙහි නික්ෂිප්තය. කවර සතර කරුණෙන යත්:

පණිවායෙන් දුරුවූයේ වෙයි. අයිනාදනින් දුරුවූයේ වෙයි, කාමයෙහි මිසඟසරින් දුරු වූයේ වෙයි. මුසවායෙන් දුරුවූයේ වෙයි.

මහණෙනි, මේ සතර කරුණෙන් සමන්වාගත පුද්ගල ගෙණවුත් බහන ලද්දක් සෙයින් සවර්ගයෙහි බහා තබන ලද්දේ වෙයි.

## 4. 2. 4. 2.

### [ මුසාවාදී සූත්‍රය ]

32. මහණෙනි, සතර කරුණෙකින් සමන්වාගත පුද්ගල ගෙණවුත් බහන ලද්දක් පරිද්දෙන් නිරයෙහි නික්ෂිප්ත වෙයි කවර සතර කරුණෙන යත්:

මුසවා බණන සුලු වෙයි. පිසුණුබස් ඇතියේ වෙයි. කර්කශ බස් ඇතියේ වෙයිනි ඡපල ඇතියේ වෙයි.

මහණෙනි, මේ සතර කරුණෙන් සමන්වාගත පුද්ගල ගෙණවුත් බහා තබන ලද්දක් පරිද්දෙන් නිරයෙහි නික්ෂිප්තය.

මහණෙනි, සතර කරුණෙකින් සමන්වාගත පුද්ගල ගෙණවුත් බහන ලද්දක් පරිද්දෙන් සවර්ගයෙහි නික්ෂිප්තය. කවර සතර කරුණෙන යත්:

මුසවායෙන් දුරුවූයේ වෙයි පිසුනුබසින් දුරුවූයේ වෙයි. කැකුළු-බසින් දුරුවූයේ වෙයි. පලප්බසින් දුරුවූයේ වෙයි.

මහණෙනි, මේ සතර කරුණින් සමන්වාගත පුද්ගල ගෙණවුත් බහා තබන ලද්දක් පරිද්දෙන් සවර්ගයෙහි බැහුනේ වෙයි.

## 4. 2. 4. 3.

### [ වණ්ණ සූත්‍රය ]

33. මහණෙනි, සතර කරුණෙකින් සමන්වාගත පුද්ගල ගෙණැර තැබුවක් සෙයින් නිරයෙහි නික්ෂිප්තය. කවර සතර කරුණෙන යත්:

නො විමසා නො බැස ගෙණ වණ්නාහී නො වන්නහුගේ ගුණ කියයි. නො විමසා නො බැස ගෙණ වණ්නාහීයාගේ අගුණ කියයි. නො විමසා නො බැස ගෙණ නො පැහැදිය යුතු කරුණෙහි පහදියි. නොවිමසා නො බැසගෙණ පැහැදිය යුතු කරුණෙහි නො පහදියි.

ඉමෙහි ඛො භික්ඛවෙ චතූහි ධම්මෙහි සමන්නාගතො යථාභතං නික්ඛිත්තො එවං නිරයෙ.

චතූහි භික්ඛවෙ ධම්මෙහි සමන්නාගතො යථාභතං නික්ඛිත්තො එවං සග්ගෙ. කතමෙහි චතූහි?

අනුවිච්ච පරියොගාහෙත්වා අවණ්ණාරහස්ස අවණ්ණං භාසති. අනුවිච්ච පරියොගාහෙත්වා වණ්ණාරහස්ස වණ්ණං භාසති. අනුවිච්ච පරියොගාහෙත්වා අප්පසාදනීයෙ ඨානෙ අප්පසාදං උපදංසෙති. අනුවිච්ච පරියොගාහෙත්වා පසාදනීයෙ ඨානෙ පසාදං උපදංසෙති.

ඉමෙහි ඛො භික්ඛවෙ චතූහි ධම්මෙහි සමන්නාගතො යථාභතං නික්ඛිත්තො එවං සග්ගෙ'ති.

## 4. 2. 4. 4

### [ කොධගරුසුත්තං ]

34. චතූහි භික්ඛවෙ ධම්මෙහි සමන්නාගතො යථාභතං නික්ඛිත්තො එවං නිරයෙ. කතමෙහි චතූහි?

කොධගරු හොති න සද්ධම්මගරු, මක්ඛගරු හොති න සද්ධම්මගරු, ලාභගරු හොති න සද්ධම්මගරු, සක්කාරගරු හොති න සද්ධම්මගරු.

ඉමෙහි ඛො භික්ඛවෙ චතූහි ධම්මෙහි සමන්නාගතො යථාභතං නික්ඛිත්තො එවං නිරයෙ.

චතූහි භික්ඛවෙ ධම්මෙහි සමන්නාගතො යථාභතං නික්ඛිත්තො එවං සග්ගෙ. කතමෙහි චතූහි?

සද්ධම්මගරු හොති න කොධගරු, සද්ධම්මගරු හොති න මක්ඛගරු, සද්ධම්මගරු හොති න ලාභගරු, සද්ධම්මගරු හොති න සක්කාරගරු.

ඉමෙහි ඛො භික්ඛවෙ චතූහි ධම්මෙහි සමන්නාගතො යථාභතං නික්ඛිත්තො එවං සග්ගෙති.

මහණෙනි, මේ සතර කරුණින් සමන්විතවූ පුද්ගල ගෙණ ඇර තැබුවක් මෙන් නිරයෙහි බැහුනේ ය.

මහණෙනි, සතර කරුණෙකින් සමන්වාගත පුද්ගල ගෙණ ඇර තැබුවක් සෙයින් සවර්ගයෙහි නික්ෂිප්ත ය. කවර සතර කරුණෙක යත්:

විමසා බැස ගෙණ අවර්ණාර්හයාගේ අගුණ කියයි. විමසා බැස ගෙණ වර්ණාර්හයාගේ ගුණ කියයි. විමසා බැස ගෙණ නො පැහැදිය යුතු තැන නොපහදී. විමසා බැස ගෙණ පැහැදිය යුතු තැන පහදී.

මහණෙනි, මේ සතර කරුණෙන් සමන්වාගත පුද්ගල ගෙණැර තැබුවක් සෙයින් සවර්ගයෙහි නික්ෂිප්තය.

## 4. 2. 4. 4.

### [ ක්‍රොධගරු සූත්‍රය ]

34. මහණෙනි, සතර කරුණෙකින් සමන්වාගත පුද්ගල ගෙණැර තබන ලද්දක් සෙයින් නිරයෙහි නික්ෂිප්තය. කවර සතර කරුණෙක යත්:

ක්‍රොධගරුක වෙයි, සද්ධර්මගරුක නො වෙයි. ගුණමකුබව ගරු කොට ඇත්තේ වෙයි, සදහම් ගරු කොට නැත්තේ වෙයි. ලාභය ගරු කොට ඇත්තේ වෙයි, සද්ධර්මය ගරු කොට නැත්තේ වෙයි. සත්කාරය ගරු කොට ඇත්තේ වෙයි, සද්ධර්මය ගරු කොට නැත්තේ වෙයි.

මහණෙනි, මේ සතර කරුණෙන් සමන්වාගත පුද්ගල ගෙණ ඇර-තැබුවක් සෙයින් නිරයෙහි නික්ෂිප්ත ය.

මහණෙනි, සතර කරුණෙකින් සමන්වාගත පුද්ගල ගෙණ ඇර-තැබුවක් සෙයින් සවර්ගයෙහි නික්ෂිප්ත ය. කවර සතර කරුණෙක යත්:

සදහම් ගරු කොට වසන්නේ ක්‍රෝධය ගරු කොට නොවසන්නේ වෙයි. සදහම් ගරු කොට වසන්නේ ගුණමකු බව ගරු කොට නො වසන්නේ වෙයි. සදහම් ගරු කොට වසන්නේ ලාභය ගරු කොට නොවසන්නේ වෙයි. සදහම් ගරු කොට වසන්නේ සත්කාරය ගරු කොට නොවසන්නේ වෙයි.

මහණෙනි, මේ සතර කරුණින් සමන්වාගත පුද්ගල ගෙණ ඇරතැබුවක් සෙයින් සවර්ගයෙහි නික්ෂිප්තය.

**4. 2. 4. 5.**

## [ තමොතමපරායනසුත්තං ]

35 චත්තාරො'මෙ භික්ඛවෙ පුග්ගලා සන්තො සංවිජ්ජමානා ලොකස්මිං. කතමෙ චත්තාරො?

තමොතමපරායනො, තමොජොතිපරායනො, ජොතිතමපරායනො, ජොතිජොතිපරායනො.

කථඤ්ච භික්ඛවෙ පුග්ගලො තමො හොති තමපරායනො? ඉධ භික්ඛවෙ, එකච්චො පුග්ගලො නීචෙ කුලෙ පච්චාජාතො හොති චණ්ඩාලකුලෙ වා වෙණකුලෙ වා නෙසාදකුලෙ වා රථකාරකුලෙ වා පුක්කුසකුලෙ වා දලිද්දෙ අප්පන්නපානභොජනෙ කසිරවුත්තිකෙ යත්ථ කසිරෙන ඝාසච්ඡාදො ලබ්භති. සො ච හොති දුබ්බණ්ණො දුද්දසිකො ඔකොටිමකො බව්හාබාධො කාණො වා කුණී වා ඛඤ්ජො වා පක්ඛහතො වා, න ලාභී අන්නස්ස පානස්ස වත්ථස්ස යානස්ස මාලාගන්ධවිලෙපනස්ස සෙය්‍යාවසථපදීපෙය්‍යස්ස. සො කායෙන දුච්චරිතං චරති, වාචාය දුච්චරිතං චරති, මනසා දුච්චරිතං චරති. සො කායෙන දුච්චරිතං චරිත්වා වාචාය දුච්චරිතං චරිත්වා මනසා දුච්චරිතං චරිත්වා කායස්ස භෙදා පරම්මරණා අපායං දුග්ගතිං විනිපාතං නිරයං උපපජ්ජති. එවං ඛො භික්ඛවෙ පුග්ගලො තමො හොති තමපරායනො.

කථඤ්ච භික්ඛවෙ පුග්ගලො තමො හොති ජොතිපරායනො? ඉධ භික්ඛවෙ එකච්චො පුග්ගලො නීචෙ කුලෙ පච්චාජාතො හොති චණ්ඩාලකුලෙ වා වෙණකුලෙ වා නෙසාදකුලෙ වා රථකාරකුලෙ වා පුක්කුසකුලෙ වා දලිද්දෙ අප්පන්නපානභොජනෙ කසිරවුත්තිකෙ යත්ථ කසිරෙන ඝාසච්ඡාදො ලබ්භති. සො ච හොති දුබ්බණ්ණො දුද්දසිකො ඔකොටිමකො බව්හාබාධො කාණො වා කුණී වා ඛඤ්ජො වා පක්ඛහතො වා, න ලාභී අන්නස්ස පානස්ස වත්ථස්ස යානස්ස මාලාගන්ධවිලෙපනස්ස සෙය්‍යාවසථපදීපෙය්‍යස්ස. සො කායෙන සුචරිතං චරති, වාචාය සුචරිතං චරති, මනසා සුචරිතං චරති. සො කායෙන සුචරිතං චරිත්වා වාචාය සුචරිතං චරිත්වා මනසා සුචරිතං චරිත්වා කායස්ස භෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උපපජ්ජති. එවං ඛො භික්ඛවෙ පුග්ගලො තමො හොති ජොතිපරායනො.

කථඤ්ච භික්ඛවෙ පුග්ගලො ජොති හොති තමපරායනො? ඉධ භික්ඛවෙ එකච්චො පුග්ගලො උච්චෙ කුලෙ පච්චාජාතො හොති ඛත්තියමහාසාලකුලෙ වා බ්‍රාහ්මණමහාසාලකුලෙ වා ගහපතිමහාසාලකුලෙ වා අඩ්ඪෙ මහද්ධනෙ මහාභොගෙ පහූතජාතරූපරජතෙ පහූතවිත්තූපකරණෙ පහූතධනධඤ්ඤෙ. සො ච හොති අභිරූපො දස්සනීයො පාසාදිකො පරමාය වණ්ණපොක්ඛරතාය සමන්නාගතො. ලාභී අන්නස්ස පානස්ස වත්ථස්ස යානස්ස මාලාගන්ධවිලෙපනස්ස සෙය්‍යාවසථපදීපෙය්‍යස්ස. සො කායෙන දුච්චරිතං චරති, වාචාය දුච්චරිතං චරති, මනසා දුච්චරිතං චරති. සො කායෙන දුච්චරිතං චරිත්වා, වාචාය දුච්චරිතං චරිත්වා, මනසා දුච්චරිතං චරිත්වා, කායස්ස භෙදා පරම්මරණා අපායං දුග්ගතිං විනිපාතං නිරයං උපපජ්ජති. එවං ඛො භික්ඛවෙ පුග්ගලො ජොති හොති තමපරායනො.

## 4. 2. 4. 5.

### [ තමොතමපරායන සූත්‍රය ]

55. මහණෙනි, මේ පුද්ගලයෝ සතර දෙනෙක් ලෝකයෙහි විද්‍යමාන වෙති. කවර සතර දෙනෙකු යත්:

තමෝ තමපරායනය (අඳුරෙන් අඳුරට යන), තමොජෝතිපරායනය (අඳුරෙන් එළියට යන), ජෝති තමපරායනය (එළියෙන් අඳුරට යන), ජෝති ජෝතිපරායනය (එළියෙන් එළියට යන) - මේ පුද්ගලයෝ සතර දෙනය.

මහණෙනි, කෙසේ නම් පුද්ගල තමොතමපරායන වේද? මහණෙනි, මේ ලොව ඇතැම් පුද්ගලයෙක් දිළිඳු වූ අල්පාහාරපාන භොජන ඇති සහදුක් දිවි වැටුම් ඇති දුකින් ආහාර වස්ත්‍ර ලබන සැඩල් කුලයෙහි වේව යි, කුළුපොතු කුලයෙහි වේවයි, වැදි කුලෙහි වේවයි, සොම්මර කුලෙහි වේවයි, පුප්සඹු කුලෙහි වේවයි- නීච කුලයෙක උපන්නේ වෙයි. හෙද දුර්වර්ණ වෙයි. අමනාප දර්ශන වෙයි. ලකුණටක වෙයි. බහවාබාධ වෙයි කණ හෝ වෙයි. වක් අත්පා ඇත්තේ හෝ වෙයි. කොර හෝ වෙයි. පිළු හෝ වෙයි. අන්න පාන වස්ත්‍ර යාන මාලාගන්ධ විලෙපන ශය්‍යාවසථ ප්‍රදීපොපකරණ නොලබන සුළු වෙයි. හේ කයින් දුශ්චරිත කරන්නේ වෙයි. වචනයෙන් දුශ්චරිත කරන්නේ වෙයි. සිතින් දුශ්චරිත කරන්නේ වෙයි. හේ කයින් දුශ්චරිත කොට, වචනයෙන් දුශ්චරිත කොට, සිතින් දුශ්චරිත කොට, කාබුන් මරණින් මතුයෙහි සැපයෙන් පහ වූ නපුරු ගති ඇති විවශව පතිත වන නිරයට එළඹෙයි. මහණෙනි, මෙසේ පුද්ගල තමොතමපරායන වේ.

මහණෙනි, කෙසේ නම් පුද්ගල තමොජෝතිපරායන වේ ද? මහණෙනි, මෙලොව ඇතැම් පුද්ගලයෙක් දිළිඳු වූ අල්පාන්නපාන භෝජන ඇති සහදුක් දිවිවැටුම් ඇති දුකසේ ආහාර වස්ත්‍ර ලබන සැඩල් කුලෙහි වේවයි, කුළුපොතු කුලෙහි වේවයි, වැදිකුලෙහි වේවයි, සොම්මර කුලෙහි වේවයි, පුප්සඹුකුලෙහි වේවයි-නීචකුලයෙක උපන්නේ වෙයි. හෙ ද දුර්වර්ණ වෙයි. මින නොවඩන දකුම් ඇති වෙයි. ලකුණටක වෙයි. බව්හාබාධ වෙයි. කණ හෝ වෙයි. වක් අත්පා ඇත්තේ හෝ වෙයි. කොර හෝ වෙයි. පිළු හෝ වෙයි. අන්න පාන වස්ත්‍ර යාන මාලාගන්ධවිලෙපන ශය්‍යාවසථ ප්‍රදීපොපකරණ නොලබන සුළු වේ. හේ කයින් සුචරිත කෙරෙති. වචනයෙන් සුචරිත කෙරෙයි. සිතින් සුචරිත කෙරෙයි. හේ කයින් සුචරිත කොට වචනයෙන් සුචරිත කොට සිතින් සුචරිත කොට කාබුන් මරණින් මතුයෙහි ශෝභන ගති ඇති ස්වර්ගලෝකයට එළඹෙයි. මහණෙනි, මෙසේ පුද්ගල් තමොජෝතිපරායන වෙයි.

මහණෙනි, කෙසේ නම් පුද්ගල ජෝතිතමපරායන වේ ද? මහණෙනි, මේලොව ඇතැම් පුද්ගලයෙක් ආඪ්‍ය වූ මහධන ඇති මහත් භෝග ඇති බොහෝ රන්රිදී ඇති බොහෝ වස්තූපකරණ ඇති බොහෝ ධනධාන්‍ය ඇති ක්‍ෂත්‍රියමහසල්කුලෙහි වේවයි, බමුණුමහසල්කුලෙහි වේවයි, ගෘහපති මහසල් කුලෙහි වේවයි- උතුම් කුලෙහි උපන්නේ වෙයි. හෙ ද අභිරූප වෙයි. දර්ශනීය වෙයි. ප්‍රාසාදික වෙයි. උතුම් වර්ණසෞන්දර්යයෙන් සමන්වාගත වෙයි. අන්න පාන වස්ත්‍ර යාන මාලාගන්ධවිලෙපන ශයනාවසථ ප්‍රදීපොපකරණ ලබන සුළු වෙයි. හේ කයින් දුශ්චරිත කෙරෙයි. වචනයෙන් දුශ්චරිත කෙරෙයි. සිතින් දුශ්චරිත කෙරෙයි හේ කයින් දුශ්චරිත කොට වචනයෙන් දුශ්චරිත කොට සිතින් දුශ්චරිත කොට කාබුන් මරණින් මතුයෙහි සුවෙන් පහ වූ නපුරු ගති ඇති විවශව පතිත වන නිරයට එළඹෙයි. මහණෙනි, මෙසේ පුද්ගල ජෝතිතමපරායන වෙයි.

කථඤ්ච භික්ඛවෙ පුග්ගලො ජොති හොති ජොතිපරායනො? ඉධ භික්ඛවෙ එකච්චො පුග්ගලො උච්චෙ කුලෙ පච්චාජාතො හොති ඛත්තියමහාසාලකුලෙ වා බ්‍රාහ්මණමහාසාලකුලෙ වා ගහපතිමහාසාලකුලෙ වා අඩ්ඪෙ මහද්ධනෙ මහාභොගෙ පහූතජාතරූපරජතෙ පහූතවිත්තූපකරණෙ පහූතධනධඤ්ඤෙ. සො ච හොති අභිරූපො දස්සනීයො පාසාදිකො පරමාය වණ්ණපොක්ඛරතාය සමන්නාගතො, ලාභී අන්නස්ස පානස්ස වත්ථස්ස යානස්ස මාලාගන්ධවිලෙපනස්ස සෙය්‍යාවසථපදීපෙය්‍යස්ස. සො කායෙන සුචරිතං චරති, වාචාය සුචරිතං චරති, මනසා සුචරිතං චරති. සො කායෙන සුචරිතං චරිත්වා වාචාය සුචරිතං චරිත්වා මනසා සුචරිතං චරිත්වා කායස්ස භෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උපපජ්ජති. එවං ඛො භික්ඛවෙ පුග්ගලො ජොති හොති ජොතිපරායනො

ඉමෙ ඛො භික්ඛවෙ චත්තාරො පුග්ගලා සන්තො සංවිජ්ජමානා ලොකස්මින්ති.

## 4. 2. 4. 6

## [ ඔනතොනතසුත්තං ]

36. චත්තාරො'මෙ භික්ඛවෙ පුග්ගලා සන්තො සංවිජ්ජමානා ලොකස්මිං. කතමෙ චත්තාරො?

ඔනතොනතො, ඔනතුන්නතො, උන්නතොනතො, උන්නතුන්නතො.

කථඤ්ච භික්ඛවෙ පුග්ගලො ඔනතොනතො හොති? ඉධ භික්ඛවෙ එකච්චො පුග්ගලො නීචෙ කුලෙ පච්චාජාතො හොති චණ්ඩාලකුලෙ වා -පෙ- සො කායෙන දුච්චරිතං චරති, වාචාය දුච්චරිතං චරති, මනසා දුච්චරිතං චරති. සො කායෙන දුච්චරිතං චරිත්වා වාචාය දුච්චරිතං චරිත්වා මනසා දුච්චරිතං චරිත්වා කායස්ස භෙදා පරම්මරණා අපායං දුග්ගතිං විනිපාතං නිරයං උපපජ්ජති. එවං ඛො භික්ඛවෙ පුග්ගලො ඔනතොනතො හොති.

කථඤ්ච භික්ඛවෙ පුග්ගලො ඔනතුන්නතො හොති? ඉධ භික්ඛවෙ එකච්චො පුග්ගලො නීචෙ කුලෙ පච්චාජාතො හොති චණ්ඩාලකුලෙ වා -පෙ- සො කායෙන සුචරිතං චරති, වාචාය සුචරිතං චරති, මනසා සුචරිතං චරති. සො කායෙන සුචරිතං චරිත්වා වාචාය සුචරිතං චරිත්වා මනසා සුචරිතං චරිත්වා කායස්ස භෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උපපජ්ජති. එවං ඛො භික්ඛවෙ පුග්ගලො ඔනතුන්නතො හොති.

කථඤ්ච භික්ඛවෙ පුග්ගලො උන්නතොනතො හොති? ඉධ භික්ඛවෙ එකච්චො පුග්ගලො උච්චෙ කුලෙ පච්චාජාතො හොති ඛත්තියමහාසාලකුලෙ වා -පෙ- සො කායෙන දුච්චරිතං චරිත්වා වාචාය දුච්චරිතං චරිත්වා මනසා දුච්චරිතං චරිත්වා කායස්ස භෙදා පරම්මරණා අපායං දුග්ගතිං විනිපාතං නිරයං උපපජ්ජති. එවං ඛො භික්ඛවෙ පුග්ගලො උන්නතොනතො හොති.

කථඤ්ච භික්ඛවෙ පුග්ගලො උන්නතුන්නතො හොති? ඉධ භික්ඛවෙ එකච්චො පුග්ගලො උච්චෙ කුලෙ පච්චාජාතො හොති ඛත්තියමහාසාලකුලෙ වා -පෙ- සො කායෙන සුචරිතං චරිත්වා වාචාය සුචරිතං චරිත්වා මනසා සුචරිතං චරිත්වා කායස්ස භෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උපපජ්ජති. එවං ඛො භික්ඛවෙ පුග්ගලො උන්නතුන්නතො හොති

ඉමෙ ඛො භික්ඛවෙ චත්තාරො පුග්ගලා සන්තො සංවිජ්ජමානා ලොකස්මින්ති.

මහණෙනි, කෙසේ නම් පුද්ගල ජෝතිජෝතිපරායන වේ ද? මහණෙනි, මෙලොව ඇතැම් පුද්ගලයෙක් ආඪ්‍ය වූ මහත් ධන ඇති මහා භොග ඇති බොහෝ රන්රිදී ඇති බොහෝ වස්තූපකරණ ඇති, බොහෝ ධනධාන්‍ය ඇති කැත්මහසල් කුලෙහි වේවයි, බමුණුමහසල් කුලෙහි වේවයි, ගෙහෙවිමහසල් කුලෙහි වේවයි - උතුම් කුලයෙහි උපන්නේ වෙයි. හෙ ද අභිරූප වෙයි. දර්ශනීය වෙයි. ප්‍රාසාදික වෙයි. උතුම් වර්ණසෞන්දර්යයෙන් සමන්වාගත වෙයි. අන්න පාන වස්ත්‍ර යාන මාලාගන්ධ විලෙපන ශය්‍යාවසථ ප්‍රදීපොපකරණ ලබන සුලු වෙයි. හේ කයින් සුචරිත කරයි. වචනයෙන් සුචරිත කරයි. සිතින් සුචරිත කරයි. හේ කයින් සුචරිත කොට වචනයෙන් සුචරිත කොට, සිතින් සුචරිත කොට කාබුන් මරණින් මත්තෙහි ශෝභන ගති ඇති ස්වර්ගලොකයට එළඹෙයි. මහණෙනි, මෙසේ පුද්ගල ජෝති ජෝතිපරායන වෙයි.

මහණෙනි, මේ සතර පුද්ගලයෝ ලෝකයෙහි විද්‍යමාන වෙති.

4. 2. 4. 6.

[ ඔනතොනත සූත්‍රය ]

36. මහණෙනි, මේ පුද්ගලයෝ සතර දෙනෙක් ලෝකයෙහි විද්‍යමානයහ. කවර සතර දෙනෙක යත්:

(ඔනතොනත (නීච-නීච)ය, ඔනතුන්නත (නීච-උත්තම)ය, උන්නතොනත (උත්තම-නීච)ය, උන්නතුන්නත (උත්තම-උත්තම) යි.

මහණෙනි, කෙසේ නම් පුද්ගල ඔනතොනත වේ ද? මහණෙනි, මෙලොව ඇතැම් පුද්ගලයෙක් සැඩල් කුලයෙහි වේවයි... නීචකුලයෙක උපන්නේ වෙයි. හේ කයින් දුශ්චරිත කරයි. වචනයෙන් දුශ්චරිත කරයි. සිතින් දුශ්චරිත කරයි. හේ කයින් දුශ්චරිත කොට, වචනයෙන් දුශ්චරිත කොට, සිතින් දුශ්චරිත කොට, කාබුන් මරණින් මතුයෙහි සුවෙන් පහව ගිය තපුරු ගති ඇති, විවසව පතිතවන, නිරයට එළඹේ. මහණෙනි, මෙසේ පුද්ගල ඔනතොනත වේ.

මහණෙනි, කෙසේ නම් පුද්ගල ඔනතුන්නත වේ ද? මහණෙනි, මෙලොව ඇතැම් පුද්ගලයෙක් සැඩල්කුලෙහි වේවයි ... නීචකුලෙයක උපන්නේ වෙයි. හේ කයින් සුචරිත කරයි, වචනයෙන් සුචරිත කරයි, සිතින් සුචරිත කරයි. හේ කයින් සුචරිත කොට වචනයෙන් සුචරිත කොට, සිතින් සුචරිත කොට, කාබුන් මරණින් මතුයෙහි ශෝභන ගති ඇති ස්වර්ගලෝකයට එළඹේ. මහණෙනි, මෙසේ පුද්ගල ඔනතුන්නත වේ

මහණෙනි, කෙසේ නම් පුද්ගල උන්නතොනත වේ ද? මහණෙනි, මෙලොව ඇතැම් පුද්ගලයෙක් කැත්මහසල් කුලෙහි වේවයි, ... උතුම් කුලෙහි උපන්නේ වෙයි. හේ කයින් දුශ්චරිත කොට, වචනයෙන් දුශ්චරිත කොට, සිතින් දුශ්චරිත කොට, කාබුන් මරණින් මතුයෙහි සුවෙන් පහව ගිය තපුරු ගති ඇති විවසව පතිතවන නිරයට එළඹේ. මහණෙනි, මෙසේ පුද්ගල උන්නතොනත වේ.

මහණෙනි, කෙසේ නම් පුද්ගල උන්නතුන්නත වේ ද? මහණෙනි, මෙලොව ඇතැම් පුද්ගලයෙක් කැත්මහසල් කුලෙහි වේවයි ... උතුම් කුලෙහි උපන්නේ වෙයි හේ කයින් සුචරිත කොට, වචනයෙන් සුචරිත කොට, සිතින් සුචරිත කොට කාබුන් මරණින් මතුයෙහි ශෝභන ගති ඇති, ස්වර්ගලෝකයට එළඹේ. මහණෙනි, මෙසේ පුද්ගල උන්නතුන්නත වේ.

මහණෙනි, මේ සතර පුද්ගලයෝ ලෝකයෙහි විද්‍යමාන වෙති.

## 4. 2. 4. 7.

## [ සමණමචල - පුත්තසුත්තං ]

37. චත්තාරො'මෙ භික්ඛවෙ පුග්ගලා සන්තො සංවිජ්ජමානා ලොකස්මිං. කතමෙ චත්තාරො?

සමණමචලො, සමණපුණ්ඩරීකො, සමණපදුමො, සමණෙසු සමණසුඛුමාලො.

කථඤ්ච භික්ඛවෙ පුග්ගලො සමණමචලො හොති? ඉධ භික්ඛවෙ භික්ඛු සෙඛො හොති පටිපදො අනුත්තරං යොගක්ඛෙමං පත්ථයමානො විහරති. සෙය්‍යථාපි භික්ඛවෙ රඤ්ඤො ඛත්තියස්ස මුද්ධාවසිත්තස්ස ජෙට්ඨො පුත්තො ආභිසෙකො අනභිසිත්තො මචලප්පත්තො, එවමෙව ඛො භික්ඛවෙ භික්ඛු සෙඛො හොති පටිපදො අනුත්තරං යොගක්ඛෙමං පත්ථයමානො විහරති. එවං ඛො භික්ඛවෙ පුග්ගලො සමණමචලො හොති.

කථඤ්ච භික්ඛවෙ පුග්ගලො සමණපුණ්ඩරීකො හොති? ඉධ භික්ඛවෙ භික්ඛු ආසවානං ඛයා අනාසවං චෙතොවිමුත්තිං පඤ්ඤාවිමුත්තිං දිට්ඨෙව ධම්මෙ සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරති. නො ච ඛො අට්ඨ විමොක්ඛෙ කායෙන ඵුසිත්වා විහරති. එවං ඛො භික්ඛවෙ පුග්ගලො සමණපුණ්ඩරීකො හොති.

කථඤ්ච භික්ඛවෙ පුග්ගලො සමණපදුමො හොති? ඉධ භික්ඛවෙ භික්ඛු ආසවානං ඛයා අනාසවං චෙතොවිමුත්තිං පඤ්ඤාවිමුත්තිං දිට්ඨෙව ධම්මෙ සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරති. අට්ඨ ච විමොක්ඛෙ කායෙන ඵුසිත්වා විහරති. එවං ඛො භික්ඛවෙ පුග්ගලො සමණපදුමො හොති.

කථඤ්ච භික්ඛවෙ පුග්ගලො සමණෙසු සමණසුඛුමාලො හොති? ඉධ භික්ඛවෙ භික්ඛු යාචිතොව බහුලං චීවරං පරිභුඤ්ජති, අප්පං අයාචිතො. යාචිතොව බහුලං පිණ්ඩපාතං පරිභුඤ්ජති, අප්පං අයාචිතො. යාචිතොව බහුලං සෙනාසනං පරිභුඤ්ජති, අප්පං අයාචිතො. යාචිතොව බහුලං ගිලානපච්චයභෙසජ්ජපරික්ඛාරං පරිභුඤ්ජති, අප්පං අයාචිතො. යෙහි ඛො පන සබ්‍රහ්මචාරීහි සද්ධිං විහරති, ත්‍යාස්ස මනාපෙනෙව බහුලං කායකම්මෙන සමුදාචරන්ති, අප්පං අමනාපෙන. මනාපෙනෙව බහුලං වචීකම්මෙන සමුදාචරන්ති, අප්පං අමනාපෙන. මනාපෙනෙව බහුලං මනොකම්මෙන සමුදාචරන්ති, අප්පං අමනාපෙන. මනාපඤ්ඤෙව බහුලං උපහාරං උපහරන්ති, අප්පං අමනාපං. යානි ඛො පන තානි වෙදයිතානි පිත්තසමුට්ඨානානි වා සෙම්හසමුට්ඨානානි වා වාතසමුට්ඨානානි වා සන්නිපාතිකානි වා උතුපරිනාමජානි වා විසමපරිහාරජානි වා ඔපක්කමිකානි වා කම්මවිපාකජානි වා, තානස්ස[1] න බහුදෙව උප්පජ්ජන්ති. අප්පාබාධො හොති. චතුන්නං ඣානානං ආභිචෙතසිකානං දිට්ඨධම්මසුඛවිහාරානං නිකාමලාභී හොති අකිච්ඡලාභී අකසිරලාභී. ආසවානං ඛයා අනාසවං චෙතොවිමුත්තිං පඤ්ඤාවිමුත්තිං දිට්ඨෙව ධම්මෙ සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරති. එවං ඛො භික්ඛවෙ පුග්ගලො සමණෙසු සමණසුඛුමාලො හොති.

1. තානි එව න බහුදෙව - මජසං

## 4. 2. 4. 7.

## [සමණමචල - සුත්ත සූත්‍රය]

37. මහණෙනි, මේ සතර පුද්ගල කෙනෙක් ලෝකයෙහි විද්‍යමානයහ. කවර සතර කෙනෙක යත්:

ශ්‍රමණඅචල ය, ශ්‍රමණපුණ්ඩරීක ය, ශ්‍රමණපද්ම ය, ශ්‍රමණයන් කෙරෙහි ශ්‍රමණසුකුමාර යි.

මහණෙනි, කෙසේ පුද්ගල ශ්‍රමණාචල වේ ද? මහණෙනි, මෙසස්නෙහි මහණ ශෛක්‍ෂ වේ, පිළිපන්නේ වේ, අනුත්තර යොගක්‍ෂෙම සඞ්ඛ්‍යාත අර්හත්වය ඉස්නේ වෙසෙයි. මහණෙනි, යම්පරිදි මුදුනෙහි බිසෙස් කළ ක්‍ෂත්‍රියජාතිහුගේ දෙටුපුත් අභිෂෙකාර්හ වූයේ (එහෙත්) අනභිෂික්ත වූයේ (එහෙයින්) ම අචලප්‍රාප්ත වූයේ වේද, මහණෙනි, එපරිද්දෙන් ම මහණ නොනිම්-සිබඇතියේ වෙයි. පිළිපන්නේ වෙයි. අනුත්තර යෝගක්‍ෂෙමය ඉස්නේ වෙසෙයි. මහණෙනි, මෙසේ (නොඇලෙන ශෛක්‍ෂ) පුද්ගල ශ්‍රමණාචල වෙයි.

මහණෙනි, කෙසේ පුද්ගල ශ්‍රමණපුණ්ඩරීක වේ ද? මහණෙනි, මෙසස්නෙහි මහණ ආශ්‍රවක්‍ෂයයෙන් අනාශ්‍රව වූ චෙතොවිමුක්තිය හා ප්‍රඥාවිමුක්තිය හා දිට්ඨධර්මයෙහි ම තමා විසින් විශිෂ්ටඥානයෙන් දැන ප්‍රත්‍යක්‍ෂ කොට සම්වැද වෙසෙයි. අෂ්ටවිධ විමොක්‍ෂයන් නාමකායින් පැහැස ගෙණ නො වෙසෙයි. මහණෙනි, මෙසේ ධ්‍යානරහිත (ශුෂ්කවිදර්ශක රහත්) පුද්ගල ශ්‍රමණපුණ්ඩරීක වෙයි.

මහණෙනි, පුද්ගල කෙසේ ශ්‍රමණපද්ම වේ ද? මහණෙනි, මෙසස්නෙහි මහණ ආශ්‍රවක්‍ෂයයෙන් ආශ්‍රව රහිත වූ ඵලසමාධිය හා ඵලප්‍රඥාව හා දිට්ඨධර්මයෙහි ම තමා විසින් විශිෂ්ටඥානයෙන් දැන ප්‍රත්‍යක්‍ෂ කොට ගෙණ සම්වැද වෙසේ. අෂ්ටවිධ විමොක්‍ෂ ද නාමකායින් පැහැස වෙසේ. මහණෙනි, මෙසේ (ධ්‍යානසහිත විදර්ශකයෙන් රහත්) පුද්ගල ශ්‍රමණපද්ම වේ.

මහණෙනි, කෙසේ පුද්ගල ශ්‍රමණයන් කෙරෙහි ශ්‍රමණසුකුමාර වේ ද? මහණෙනි, මෙසස්නෙහි මහණ (දායකයන් විසින්) යදනා ලද්දේ ම සිවුරු බොහෝ කොට වළඳ කෙරෙයි. නො යදනා ලදුව අල්පයෙක. යදනා ලදුයේ ම පිඬුවා බොහෝ කොට වළඳ කෙරෙයි. නො යදනා ලදුව අල්පයෙක. යදනා ලදුයේ ම සෙනසුන් බොහෝ කොට වළඳ කෙරෙයි. නොයදනා ලදුයේ අල්පයෙක. යදනා ලදුයේ ම ගිලන්පස බෙහෙත් පිරිකර බොහෝ කොට වළඳ කෙරෙයි. නො යදනා ලදුයේ අල්පයෙක. යම් ම සබ්‍රහ්මචාරීන් හා වෙසේ ද, ඒ සබ්‍රහ්මචාරීහු ඔහුට මනවඩන කායකර්මයෙන් බොහෝසෙයින් පවතිත්. අමනාප කායකර්මයෙන් අල්පයෙක. මනවඩන වාක්කර්මයෙන් බහුල කොට පවතිත්. අමනාප වාක්කර්මයෙන් අල්පයෙක. ලගන්නා මනඃකර්මයෙන් බහුල කොට පවතිත්. අමනාප මනඃකර්මයෙන් අල්පයෙක. මනවඩන උපහාර බහුල කොට එළඹෙත්. අමනාප උපහාර අල්පයෙක. පිත්තසමුත්ථාන වෙත්වයි, ශ්ලේෂ්ම සමුත්ථාන වෙත්වයි, වාතසමුත්ථාන වෙත්වයි, සාන්නි-පාතික වෙත්වයි, ඍතුපරිණාමජ වෙත්වයි, විෂමපරිහාරජ වෙත්වයි, ඖපක්‍රමික වෙත්වයි, කර්මවිපාකජ වෙත්වයි යම් ම වේදනා කෙනෙක් ඇද්ද ඒ වේදනාවෝ ඔහුට බහුල කොට නූපදිත්. අල්පාබාධ වෙයි. විශුද්ධ චිත්තයෙහි යෙදුනු දෘෂ්ටධර්මසුඛවිහරණ ඇති සතර ධ්‍යානන් කැමැති සේ ලබන සුළු වෙයි. නිදුකින් ලබන සුළු වෙයි. විපුල කොට ලබන සුළු වෙයි. ආශ්‍රවක්‍ෂයයෙන් අනාශ්‍රව වූ චෙතොවිමුක්ති හා ප්‍රඥාවිමුක්ති හා දිට්ඨධර්මයෙහි ම තමා විසින් විශිෂ්ටඥානයෙන් දැන ප්‍රත්‍යක්‍ෂ කොට සම්වැද වෙසේ. මහණෙනි, මෙසේ පුහුල් මහණුන් කෙරෙහි ශ්‍රමණසුකුමාර වේ.

යං හි තං භික්ඛවෙ සම්මා වදමානො වදෙය්‍ය 'සමණෙසු සමණසුඛුමාලො'ති, මමෙව තං භික්ඛවෙ සම්මා වදමානො වදෙය්‍ය 'සමණෙසු සමණසුඛුමාලො'ති. අහං හි භික්ඛවෙ යාචිතොව බහුලං චීවරං පරිභුඤ්ජාමි, අප්පං අයාචිතො. යාචිතොව බහුලං පිණ්ඩපාතං පරිභුඤ්ජාමි, අප්පං අයාචිතො. යාචිතොව බහුලං සෙනාසනං පරිභුඤ්ජාමි, අප්පං අයාචිතො. යාචිතොව බහුලං ගිලානපච්චයභෙසජ්ජපරික්ඛාරං පරිභුඤ්ජාමි, අප්පං අයාචිතො. යෙහි ඛො පන භික්ඛූහි සද්ධිං විහරාමි, තෙ[1] මං මනාපෙනෙව බහුලං කායකම්මෙන සමුදාචරන්ති, අප්පං අමනාපෙන. මනාපෙනෙව බහුලං වචීකම්මෙන සමුදාචරන්ති, අප්පං අමනාපෙන. මනාපෙනෙව බහුලං මනොකම්මෙන සමුදාචරන්ති, අප්පං අමනාපෙන. මනාපංයෙව බහුලං උපහාරං උපහරන්ති, අප්පං අමනාපං. යානි පන[2] තානි වෙදයිතානි පිත්තසමුට්ඨානානි වා සෙම්හසමුට්ඨානානි වා වාතසමුට්ඨානානි වා සන්නිපාතිකානි වා උතුපරිණාමජානි වා විසමපරිහාරජානි වා ඔපක්කමිකානි වා කම්මවිපාකජානි වා, තානි මෙ න බහුදෙව උප්පජ්ජන්ති අප්පාබාධොහමස්මි. චතුන්නං ඛො පන ඣානානං ආභිචෙතසිකානං දිට්ඨධම්මසුඛවිහාරානං නිකාමලාභී අකිච්ඡලාභී අකසිරලාභී. ආසවානං ඛයා අනාසවං චෙතොවිමුත්තිං පඤ්ඤාවිමුත්තිං දිට්ඨෙව ධම්මෙ සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරාමි.

යං හි තං භික්ඛවෙ සම්මා වදමානො වදෙය්‍ය 'සමණෙසු සමණසුඛුමාලො'ති, මමෙව තං භික්ඛවෙ සම්මා වදමානො වදෙය්‍ය 'සමණෙසු සමණසුඛුමාලො'ති.

ඉමෙ ඛො භික්ඛවෙ චත්තාරො පුග්ගලා සන්තො සංවිජ්ජමානා ලොකස්මින්ති.

### 4. 2. 4. 8.

### [ සමණමචල - සඤ්ඤොජන සුත්තං ]

38. චත්තාරො'මෙ භික්ඛවෙ පුග්ගලා සන්තො සංවිජ්ජමානා ලොකස්මිං. කතමෙ චත්තාරො?

සමණමචලො, සමණපුණ්ඩරීකො, සමණපදුමො, සමණෙසු සමණසුඛුමාලො.

කථඤ්ච භික්ඛවෙ පුග්ගලො සමණමචලො හොති? ඉධ භික්ඛවෙ භික්ඛු තිණ්ණං සඤ්ඤොජනානං පරික්ඛයා සොතාපන්නො හොති අවිනිපාතධම්මො, නියතො සම්බොධිපරායනො. එවං ඛො භික්ඛවෙ පුග්ගලො සමණමචලො හොති.

කථඤ්ච භික්ඛවෙ පුග්ගලො සමණපුණ්ඩරීකො හොති? ඉධ භික්ඛවෙ භික්ඛු තිණ්ණං සඤ්ඤොජනානං පරික්ඛයා රාගදොසමොහානං තනුත්තා සකදාගාමී හොති, සකිදෙව ඉමං ලොකං ආගන්ත්වා දුක්ඛස්සන්තං කරොති. එවං ඛො භික්ඛවෙ පුග්ගලො සමණපුණ්ඩරීකො හොති.

කථඤ්ච භික්ඛවෙ පුග්ගලො සමණපදුමො හොති? ඉධ භික්ඛවෙ භික්ඛු පඤ්චන්නං ඔරම්භාගියානං සඤ්ඤොජනානං පරික්ඛයා ඔපපාතිකො හොති තත්ථ පරිනිබ්බායී අනාවත්තිධම්මො තස්මා ලොකා. එවං ඛො භික්ඛවෙ පුග්ගලො සමණපදුමො හොති.

---
1. ත මං - මජසං. 2. යානි ඛො - මජසං

මහණෙනි, සැබෑ කියනුවෙක් 'ශ්‍රමණයන් අතුරෙහි ශ්‍රමණසුකුමාර නම් මේ ය' යි යමකු ගෙණ බෙණේ ද, මහණෙනි, ඒ සබවස් කියනුයේ ශ්‍රමණයන් කෙරෙහි ශ්‍රමණසුකුමාර නම් මේ ය යි මා ම ගෙණ බණන්නේය. මහණෙනි, මම යාචිතව ම සිවුරු බහුල කොට වළඳ කෙරෙමි. අයාචිතව අල්පයෙක. යාචිතව ම පිඬුවා බහුල කොට වළඳ කෙරෙමි. අයාචිත ව අල්පයෙක. යාචිත ව ම සෙනසුන් බහුල කොට වළඳ කෙරෙමි. අයාචිතව අල්පයෙක. යාචිතව ම ගිලන්පස බෙහෙසත් පිරිකර බහුල කොට වළඳ කෙරෙමි. අයාචිතව අල්පයෙක. යම් මහණුන් හා වෙසෙම් ද, ඔහු මනවඩන කායකර්මයෙන් ම බහුල කොට මට පවතිත්. අමනාප සැටියෙන් අල්පයෙක. මනවඩන වාග්කර්මයෙන් ම බහුල කොට පවතිත්. අමනාප සැටියෙන් අල්පයෙක. මනවඩන මනඃ කර්මයෙන් ම බහුල කොට පවතිත්. අමනාප සැටියෙන් අල්පයෙක. මනවඩන්නා වූ ම උපහාර බහුල කොට එළවත්. අමනාප ද අල්පයෙක. පිත්තසමුට්ඨාන වේදනාවෝ වෙත්වයි, ශ්ලේෂ්මසමුට්ඨාන වෙත්වයි, වාතසමුට්ඨාන වෙත්වයි, සාන්නිපාතික වෙත්වයි, ඍතුපරිණාමජ වෙත්වයි, විෂමපරිහාරජ වෙත්වයි, ඖපක්‍රමික වෙත්වයි, කර්මවිපාකජ වෙත්වයි, යම් වේදනාවෝ ඇත් ද, ඔහු මට බොහෝ කොට ම නුපදීත්. මම අල්පාබාධයෙමි. චිත්තවිශුද්ධියෙහි යෙදුනු ඉහාත්ම සුඛවිහරණ ඇති සතර දහන් කැමැතිසේ ලබන සුලූයෙමි, නිදුකින් ලබන සුලූයෙමි, විපුල කොට ලබන සුලූයෙම් වෙමි, ආශ්‍රවක්ෂයයෙන් අනාශ්‍රව වූ චෙතොවිමුක්තිය හා ප්‍රඥාවිමුක්තිය හා දිට්ඨධම්මයෙහි ම තමා විසින් ම විශිෂ්ටඥානයෙන් දැන පසක් කොට සම්වැද වෙසෙමි.

මහණෙනි, මනා කොට බණනුවෙක් 'ශ්‍රමණයන් අතුරෙහි ශ්‍රමණසුකුමාර නම් මේ ය' යි යමකු ගෙණ බෙණේ ද, මහණෙනි, 'ශ්‍රමණයන් කෙරෙහි ශ්‍රමණසුකුමාර නම් මේ ය' යි මොනොවට බණනුයේ මා ම ගෙණ බණන්නේ ය.

මහණෙනි, මේ සතර පුද්ගලයෝ ලොකයෙහි විද්‍යමානයහ.

## 4. 2. 4. 8.

## [ සමණමචල-සංයෝජන සූත්‍රය ]

මහණෙනි, මේ පුද්ගලයෝ සතර දෙනෙක් ලෝකයෙහි විද්‍යමානයහ. කවර සතර දෙනෙක යත්:

ශ්‍රමණාචලය, ශ්‍රමණපුණ්ඩරීකය, ශ්‍රමණපද්මය, ශ්‍රමණයන් අතුරෙහි ශ්‍රමණසුකුමාර යි.

මහණෙනි, කෙසේ පුද්ගල ශ්‍රමණ අචල වේ ද? මහණෙනි, මෙසස්නෙහි මහණ තුන් සංයොජනයන් ක්ෂය කිරීමෙන් සෝවන් වූයේ අවිනිපාතධර්ම ඇත්තේ නියත වූයේ සම්බොධිපරායණ වූයේ වෙයි. මහණෙනි, මෙසේ පුද්ගල ශ්‍රමණාචල (=ශ්‍රොතාපන්න) වේ.

මහණෙනි, කෙසේ පුද්ගල ශ්‍රමණ පුණ්ඩරීක වේ ද? මහණෙනි, මෙසස්නෙහි මහණ තුන් සංයෝජනයන් ක්ෂය කිරීමෙන් රාගද්වේෂමෝහයන් තුනී කිරීමෙන් සකෘදාගාමී වෙයි. එක් වරෙක ම මෙලොවට අවුදු දුක් කෙළවර කෙරෙයි. මහණෙනි, මෙසේ පුද්ගල ශ්‍රමණ පුණ්ඩරීක (=සකෘදාගාමී) වේ.

මහණෙනි, කෙසේ පුද්ගල ශ්‍රමණ පද්ම වේ ද? මහණෙනි, මෙසස්නෙහි මහණ පස් වැදෑරුම් ඔරම්භාගීය සංයෝජනයන් ක්ෂය කිරීමෙන් ඖපපාතික වෙයි. එලොවින් වටාලා නො යන සවභාව ඇත්තේ එහි පිරිනිවන් පාන්නේ ය. මහණෙනි, මෙසේ පුද්ගල ශ්‍රමණ පද්ම (=අනාගාමී) වේ.

කථඤ්ච භික්ඛවෙ පුග්ගලො සමණෙසු සමණසුඛුමාලො හොති? ඉධ භික්ඛවෙ භික්ඛු ආසවානං ඛයා -පෙ- සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරති. එවං ඛො භික්ඛවෙ පුග්ගලො සමණෙසු සමණසුඛුමාලො හොති.

ඉමෙ ඛො භික්ඛවෙ චත්තාරො පුග්ගලා සන්තො සංවිජ්ජමානා ලොකස්මින්ති.

## 4. 2 4 9.

## [සමණමචල - දිට්ඨිසුත්තං]

39. චත්තාරොමෙ භික්ඛවෙ පුග්ගලා සන්තො සංවිජ්ජමානා ලොකස්මිං. කතමෙ චත්තාරො?

සමණමචලො, සමණපුණ්ඩරීකො, සමණපදුමො, සමණෙසු සමණ-සුඛුමාලො.

කථඤ්ච භික්ඛවෙ පුග්ගලො සමණමචලො හොති? ඉධ භික්ඛවෙ භික්ඛු සම්මාදිට්ඨිකො හොති, සම්මාසඞ්කප්පො හොති, සම්මාවාචො හොති, සම්මාකම්මන්තො හොති, සම්මාආජීවො හොති, සම්මාවායාමො හොති, සම්මාසති හොති, සම්මාසමාධි හොති. එවං ඛො භික්ඛවෙ පුග්ගලො සමණමචලො හොති.

කථඤ්ච භික්ඛවෙ පුග්ගලො සමණපුණ්ඩරීකො හොති? ඉධ භික්ඛවෙ භික්ඛු සම්මාදිට්ඨිකො හොති, සම්මාසඞ්කප්පො හොති, සම්මාවාචො හොති, සම්මාකම්මන්තො හොති, සම්මාආජීවො හොති, සම්මාවායාමො හොති, සම්මාසති හොති, සම්මාසමාධි හොති, සම්මාඤාණී හොති, සම්මාවිමුත්තී හොති. නො ච ඛො අට්ඨ විමොක්ඛෙ කායෙන ඵුසිත්වා විහරති. එවං ඛො භික්ඛවෙ පුග්ගලො සමණපුණ්ඩරීකො හොති

කථඤ්ච භික්ඛවෙ පුග්ගලො සමණපදුමො හොති? ඉධ භික්ඛවෙ භික්ඛු සම්මාදිට්ඨිකො හොති, -පෙ- සම්මාවිමුත්තී හොති, අට්ඨ ච විමොක්ඛෙ කායෙන ඵුසිත්වා විහරති. එවං ඛො භික්ඛවෙ පුග්ගලො සමණපදුමො හොති.

කථඤ්ච භික්ඛවෙ පුග්ගලො සමණෙසු සමණසුඛුමාලො හොති? ඉධ භික්ඛවෙ භික්ඛු යාචිතොව බහුලං චීවරං පරිභුඤ්ජති, අප්පං අයාචිතො -පෙ- යං හි තං භික්ඛවෙ සම්මාවදමානො වදෙය්‍ය 'සමණෙසු සමණසුඛුමා-ලො'ති මමෙව තං භික්ඛවෙ සම්මා වදමානො වදෙය්‍ය 'සමණෙසු සමණ-සුඛුමාලො'ති.

ඉමෙ ඛො භික්ඛවෙ චත්තාරො පුග්ගලා සන්තො සංවිජ්ජමානා ලොකස්මින්ති.

1. ඵුසිත්වා - මජ්ඣං.

මහණෙනි, කෙසේ පුද්ගල ශ්‍රමණයන් කෙරෙහි ශ්‍රමණසුකුමාර වේ ද? මහණෙනි, මෙසස්හෙහි මහණ ආස්‍රවක්ෂය කිරීමෙන් ... ප්‍රත්‍යක්ෂ කොට ගෙණ ඊට පැමිණ වෙසෙසි. මහණෙනි, මෙසේ පුද්ගල ශ්‍රමණයන් කෙරෙහි ශ්‍රමණසුකුමාර (=ක්ෂීණාස්‍රව) වේ.

මහණෙනි, මේ සතර පුද්ගලයෝ ලෝකයෙහි විද්‍යමානයහ.

## 4. 2. 4. 9.

## [සමණමචල - දිට්ඨි සූත්‍රය]

39. මහණෙනි, මේ සතර පුද්ගල කෙනෙක් ලෝකයෙහි විද්‍යමානය හ.

කවර සතර කෙනෙක යත්:

ශ්‍රමණාචලය, ශ්‍රමණපුණ්ඩරීකය, ශ්‍රමණපද්ම ය, ශ්‍රමණයන් කෙරෙහි ශ්‍රමණසුකුමාර යි.

මහණෙනි, කෙසේ පුද්ගල ශ්‍රමණාචල වේ ද? මහණෙනි, මෙසස්හෙහි මහණ සම්‍යග්දෘෂ්ටි ඇතියේ වෙයි. සම්‍යක්සඞ්කල්ප ඇතියේ වෙයි. සම්‍යග්-වචන ඇතියේ වෙයි. සම්‍යක්කර්මාන්ත ඇතියේ වෙයි. සම්‍යගාජීව ඇතියේ වෙයි. සම්‍යග්ව්‍යායාම ඇතියේ වෙයි. සම්‍යක්ස්මෘති ඇතියේ වෙයි. සම්‍යක්සමාධි ඇතියේ වෙයි. මහණෙනි, මෙසේ පුද්ගල ශ්‍රමණාචල වේ.

මහණෙනි, කෙසේ පුද්ගල ශ්‍රමණපුණ්ඩරීක වේ ද? මහණෙනි, මෙ සස්හෙහි මහණ සම්‍යග්දෘෂ්ටිය ඇතියේ වෙයි. සම්‍යක්සඞ්කල්ප ඇතියේ වෙයි. සම්‍යග්වචන ඇතියේ වෙයි. සම්‍යක් කර්මාන්ත ඇතියේ වෙයි. සම්‍යගාජීව ඇතියේ වෙයි. සම්‍යග්ව්‍යායාම ඇතියේ වෙයි. සම්‍යක්ස්මෘති ඇතියේ වෙයි. සම්‍යක් සමාධි ඇතියේ වෙයි. සම්‍යග්ඥාන ඇතියේ වෙයි. සම්‍යග්විමුක්ති ඇතියේ වෙයි. වැලිත් අෂ්ටවිධ විමොක්ෂයන් නාමකායින් පැහැසීම් නො කොට වෙසෙසි. මහණෙනි, මෙසේ පුද්ගල ශ්‍රමණපුණ්ඩරීක වේ.

මහණෙනි, කෙසේ පුද්ගල ශ්‍රමණපද්ම වේ ද? මහණෙනි, මෙ සස්හෙහි මහණ සම්‍යග්දෘෂ්ටි ඇත්තේ වෙයි. ... සම්‍යග්විමුක්ති ඇත්තේ වෙයි. අෂ්ටවිධ විමොක්ෂයන් නාමකායින් පැහැස ගෙණ වෙසෙසි. මහණෙනි, මෙසේ පුද්ගල ශ්‍රමණ පද්ම වේ.

මහණෙනි, කෙසේ පුද්ගල ශ්‍රමණයන් කෙරෙහි ශ්‍රමණසුකුමාර වේ ද? මහණෙනි, මෙ සස්හෙහි මහණ යදනා ලද්දේ ම සිවුරු බහුල කොට වළඳ කෙරේ, අයාචිත ව අල්පයෙක ... මහණෙනි, මොනොවට බණනුවෙක් 'ශ්‍රමණයන් අතුරෙහි ශ්‍රමණසුකුමාර නම් මෙ ය' යි යම් ම කෙනකුන් ගෙණ බෙණේ ද, මහණෙනි, ඒ මොනොවට බණනුයේ 'ශ්‍රමණයන් කෙරෙහි ශ්‍රමණසුකුමාර නම් මෙ ය' යි මා ම ගෙණ බණන්නේ ය.

මහණෙනි, මේ සතර පුද්ගලයෝ ලෝකයෙහි විද්‍යමානයහ.

## 4. 2. 4. 10.

## [සමණමචල - බඛසුත්තං]

40. චත්තාරො'මෙ භික්ඛවෙ පුග්ගලා සන්තො සංවිජ්ජමානා ලොකස්මිං. කතමෙ චත්තාරො?

සමණමචලො, සමණපුණ්ඩරීකො, සමණපදුමො, සමණෙසු සමණ-සුඛුමාලො.

කථඤ්ච භික්ඛවෙ පුග්ගලො සමණමචලො හොති? ඉධ භික්ඛවෙ භික්ඛු සෙඛො හොති අප්පත්තමානසො, අනුත්තරං යොගක්ඛෙමං පත්ථයමානො විහරති. එවං ඛො භික්ඛවෙ පුග්ගලො සමණමචලො හොති.

කථඤ්ච භික්ඛවෙ පුග්ගලො සමණපුණ්ඩරීකො හොති? ඉධ භික්ඛවෙ භික්ඛු පඤ්චසුපාදානක්ඛන්ධෙසු උදයබ්බයානුපස්සී විහරති: ඉති රූපං ඉති රූපස්ස සමුදයො, ඉති රූපස්ස අත්ථගමො. ඉති වෙදනා, ඉති වෙදනාය සමු-දයො, ඉති වෙදනාය අත්ථගමො. ඉති සඤ්ඤා ඉති සඤ්ඤාය සමුදයො, ඉති සඤ්ඤාය අත්ථගමො. ඉති සඞ්ඛාරා, ඉති සඞ්ඛාරානං සමුදයො, ඉති සඞ්ඛාරානං අත්ථගමො. ඉති විඤ්ඤාණං, ඉති විඤ්ඤාණස්ස සමුදයො, ඉති විඤ්ඤාණස්ස අත්ථගමොති. නො ච ඛො අට්ඨවිමොක්ඛෙ කායෙන ඵුසිත්වා[1] විහරති. එවං ඛො භික්ඛවෙ පුග්ගලො සමණපුණ්ඩරීකො හොති.

කථඤ්ච භික්ඛවෙ පුග්ගලො සමණපදුමො හොති? ඉධ භික්ඛවෙ භික්ඛු පඤ්චසුපාදානක්ඛන්ධෙසු උදයබ්බයානුපස්සී විහරති: ඉති රූපං, ඉති රූපස්ස සමුදයො, ඉති රූපස්ස අත්ථගමො. ඉති වෙදනා -පෙ- ඉති සඤ්ඤා -පෙ- ඉති සඞ්ඛාරා - ඉති විඤ්ඤාණං, ඉති විඤ්ඤාණස්ස සමුදයො, ඉති විඤ්ඤාණස්ස අත්ථගමොති. අට්ඨ ච විමොක්ඛෙ කායෙන ඵුසිත්වා විහරති. එවං ඛො භික්ඛවෙ පුග්ගලො සමණපදුමො හොති.

කථඤ්ච භික්ඛවෙ පුග්ගලො සමණෙසු සමණසුඛුමාලො හොති? ඉධ භික්ඛවෙ භික්ඛු යාචිතොව බහුලං චීවරං පරිභුඤ්ජති, අප්පං අයාචිතො. -පෙ- යං හි තං භික්ඛවෙ සම්මා වදමානො වදෙය්‍ය 'සමණෙසු සමණසුඛුමාලො'ති, මමෙව තං භික්ඛවෙ සම්මා වදමානො වදෙය්‍ය 'සමණෙසු සමණසුඛුමාලො'ති.

ඉමෙ ඛො භික්ඛවෙ චත්තාරො පුග්ගලා සන්තො සංවිජ්ජමානා ලොකස්මින්ති.

### මචලවග්ගො චතුත්ථො.

තස්සුද්දානං:

පාණාතිපාතො ච මුසා වණ්ණකොධතමොනතා,
පුත්තො සංයොජනං චෙව දිට්ඨිඛන්ධෙන තෙ දසාති.

---

1. ඵුසිත්වා - මජසං.

## 4. 2. 4. 10.

### [ සමණමචල - ඛන්ධ සූත්‍රය ]

40. මහණෙනි, මේ පුද්ගලයෝ සතර දෙනෙක් ලෝකයෙහි විද්‍යමානයහ. කවර සතර කෙනෙක යත්:

ශ්‍රමණාචලය, ශ්‍රමණපුණ්ඩරීකය, ශ්‍රමණපද්ම ය, ශ්‍රමණයන් කෙරෙහි ශ්‍රමණසුකුමාර යි.

මහණෙනි, කෙසේ පුද්ගල ශ්‍රමණාචල වේ ද? මහණෙනි, මෙසස්නෙහි මහණ ශෛක්‍ෂ වූයේ නො පත් රහත්ඵල ඇත්තේ අනුත්තරයෝගක්ෂේමය ඉස්මින් වෙසේ. මහණෙනි, මෙසේ පුද්ගල ශ්‍රමණාචල (=ප්‍රමාදවිහාරීශෛක්‍ෂ) වේ.

මහණෙනි, කෙසේ පුද්ගල ශ්‍රමණපුණ්ඩරීක වේ ද? මහණෙනි, මෙසස්නෙහි මහණ පඤ්චඋපාදානස්කන්ධයෙහි උදය-ව්‍යය දක්නා සුලු ව වෙසේ: රූපය මෙසේ ය, රූපයාගේ සමුදය මෙසේ ය, රූපයාගේ අස්තඞ්ගමය මෙසේ ය, වේදනා මෙසේ ය ... සංඥා මෙසේ ය ... සංස්කාර මෙසේ ය ... විඥාන මෙසේ ය, විඥානසමුදය මෙසේ ය, විඥාන අස්තඞ්ගමය මෙසේ ය කියා යි. අෂ්ටවිධ විමොක්‍ෂයන් නාමකයින් නො පැහැස ගෙණ වෙසෙයි. මහණෙනි, මෙසේ පුද්ගල ශ්‍රමණපුණ්ඩරීක (=අප්‍රමාදවිහාරීශෛක්‍ෂ) වේ.

මහණෙනි, කෙසේ පුද්ගල ශ්‍රමණපද්ම වේ ද? මහණෙනි, මෙසස්නෙහි මහණ පඤ්චොපාදානස්කන්ධයෙහි උදය - ව්‍යය දක්නා සුලුව වෙසෙයි: රූපය මෙසේ ය, රූපසමුදය මෙසේ ය, රූපයාගේ අස්තඞ්ගමය මෙසේ ය, වේදනා මෙසේ ය ... සංඥා මෙසේ ය ... සංස්කාර මෙසේ ය ... විඥාන මෙසේ ය, විඥානසමුදය මෙසේ ය, විඥාන අස්තඞ්ගමය මෙසේ ය කියා යි. අෂ්ටවිධවිමෝක්‍ෂයන් නාමකයින් පැහැස ගෙණ වෙසේ. මහණෙනි, මෙසේ පුද්ගල ශ්‍රමණපද්ම (=අෂ්ටවිමොක්‍ෂලාභිශෛක්‍ෂ) වේ.

මහණෙනි, කෙසේ පුද්ගල ශ්‍රමණයන් කෙරෙහි ශ්‍රමණසුකුමාර වේ ද? මහණෙනි, මෙසස්නෙහි මහණ යාචිත වූයේ ම සිවුරු බහුල කොට වළඳයි. අයාචිතව අල්පයෙක ... මහණෙනි, මොනොවට බණනුයේ 'ශ්‍රමණයන් කෙරෙහි ශ්‍රමණසුකුමාර (=සමිණාසුව) නම් මේ ය' යි යම් ම කෙනකුන් ගෙණ බණේ ද, මහණෙනි, මොනොවට බණනුයේ 'ශ්‍රමණයන් කෙරෙහි ශ්‍රමණසුකුමාර නම් මේ ය' යි මා ම ගෙණ බණන්නේය.

මහණෙනි, මේ සතර පුද්ගලයෝ ලෝකයෙහි විද්‍යමානයහ.

මචලවර්ගය සතරවැනි යි.

**එහි උද්දානය:**

පාණාතිපාතසූත්‍රය, මුසාවාදසූත්‍රය, වණ්ණසූත්‍රය, ක්‍රෝධසූත්‍රය, තමොතමපරායනසූත්‍රය, ඔනතසූත්‍රය, පුත්‍රසූත්‍රය, සංයොජනසූත්‍රය, දිට්ඨිසූත්‍රය, ඛන්ධසූත්‍රය යි සූත්‍ර දශයෙකි.

## 5. අසුරවග්ගො

### 4. 2. 5. 1.

### [අසුරසුත්තං]

**[සාවත්ථිනිදානං]**

41. චත්තාරො'මෙ භික්ඛවෙ පුග්ගලා සන්තො සංවිජ්ජමානා ලොකස්මිං.
කතමෙ චත්තාරො?

අසුරො අසුරපරිවාරො, අසුරො දෙවපරිවාරො, දෙවො අසුරපරිවාරො, දෙවො දෙවපරිවාරො.

කථඤ්ච භික්ඛවෙ පුග්ගලො අසුරො හොති අසුරපරිවාරො? ඉධ භික්ඛවෙ එකච්චො පුග්ගලො දුස්සීලො හොති පාපධම්මො. පරිසාපිස්ස දුස්සීලා හොති පාපධම්මා. එවං ඛො භික්ඛවෙ පුග්ගලො අසුරො හොති අසුරපරිවාරො.

කථඤ්ච භික්ඛවෙ පුග්ගලො අසුරො හොති දෙවපරිවාරො? ඉධ භික්ඛවෙ එකච්චො පුග්ගලො දුස්සීලො හොති පාපධම්මො. පරිසා ච ඛ්වස්ස හොති සීලවතී කල්‍යාණධම්මා. එවං ඛො භික්ඛවෙ පුග්ගලො අසුරො හොති දෙවපරිවාරො.

කථඤ්ච භික්ඛවෙ පුග්ගලො දෙවො හොති අසුරපරිවාරො? ඉධ භික්ඛවෙ එකච්චො පුග්ගලො සීලවා හොති කල්‍යාණධම්මො, පරිසා ච ඛ්වස්ස හොති දුස්සීලා පාපධම්මා. එවං ඛො භික්ඛවෙ පුග්ගලො දෙවො හොති අසුරපරිවාරො.

කථඤ්ච භික්ඛවෙ පුග්ගලො දෙවො හොති දෙවපරිවාරො? ඉධ භික්ඛවෙ එකච්චො පුග්ගලො සීලවා හොති කල්‍යාණධම්මො. පරිසාපිස්ස හොති සීලවතී කල්‍යාණධම්මා. එවං ඛො භික්ඛවෙ පුග්ගලො දෙවො හොති දෙවපරිවාරො.

ඉමෙ ඛො භික්ඛවෙ චත්තාරො පුග්ගලා සන්තො සංවිජ්ජමානා ලොකස්මින්ති.

### 4. 2. 5. 2.

### [පඨමසමාධිසුත්තං]

චත්තාරො'මෙ භික්ඛවෙ පුග්ගලා සන්තො සංවිජ්ජමානා ලොකස්මිං.
කතමෙ චත්තාරො?

ඉධ භික්ඛවෙ එකච්චො පුග්ගලො ලාභී හොති අජ්ඣත්තං චෙතොසමථස්ස, න ලාභී අධිපඤ්ඤාධම්මවිපස්සනාය.

ඉධ පන භික්ඛවෙ එකච්චො පුග්ගලො ලාභී හොති අධිපඤ්ඤාධම්මවිපස්සනාය, න ලාභී අජ්ඣත්තං චෙතොසමථස්ස.

# 5. අසුරවග්ගය

## 4. 2. 5. 1.

## [අසුර සූත්‍රය]

[සැවැත් නිදානයි]

41. මහණෙනි, මේ පුද්ගලයෝ සතර දෙනෙක් ලෝකයෙහි විද්‍යමානයහ. කවර සතර දෙනෙක යත්:

අසුරසදෘශ අසුරපරිවාරය, අසුරසදෘශ දෙවපරිවාරය, දෙවසදෘශ අසුරපරිවාරය, දෙවසදෘශ දෙවපරිවාර යි.

මහණෙනි, කෙසේ පුද්ගල අසුරසදෘශ අසුරපරිවාර වේ ද? මහණෙනි, මෙලොව ඇතැම් පුද්ගලයෙක් දුශ්ශීල වෙයි. ලමුදහම් ඇතියේ වෙයි. ඔහුගේ පිරිස ද දුශ්ශීල වෙයි. ලමුදහම් ඇතියේ වෙයි. මහණෙනි, මෙසේ පුද්ගල අසුරසදෘශ අසුරපරිවාර වේ.

මහණෙනි, කෙසේ පුද්ගල අසුරසදෘශ දෙවපරිවාර වේ ද? මහණෙනි, මෙලොව ඇතැම් පුද්ගලයෙක් දුශ්ශීල වෙයි. ලමුදහම් ඇතියේ වෙයි. වැලිත් ඔහුගේ පිරිස සිල්වත් වෙයි. කල්‍යාණදහම් ඇතියේ වෙයි. මහණෙනි, මෙසේ පුද්ගල අසුරසදෘශ දෙවපරිවාර වේ.

මහණෙනි, කෙසේ පුද්ගල දේවසදෘශ අසුරපරිවාර වේ ද? මහණෙනි, මෙලොව ඇතැම් පුද්ගලයෙක් සිල්වත් වෙයි. කල්‍යාණදහම් ඇතියේ වෙයි. වැලිත් ඔහුගේ පිරිස දුශ්ශීල වේ. ලමුදහම් ඇතියේ වේ. මහණෙනි, මෙසේ පුද්ගල දේවසදෘශ අසුරපරිවාර වේ.

මහණෙනි, කෙසේ පුද්ගල දේවසදෘශ දේවපරිවාර වේ ද? මහණෙනි, මෙලොව ඇතැම් පුද්ගලයෙක් සිල්වත් වෙයි. කල්‍යාණ දහම් ඇතියේ වෙයි. ඔහුගේ පිරිස ද සිල්වත් වෙයි. කල්‍යාණදහම් ඇතියේ වෙයි. මහණෙනි, මෙසේ පුද්ගල දේවසදෘශ දේවපරිවාර වේ

මහණෙනි, මේ සතරපුද්ගලයෝ ලෝකයෙහි විද්‍යමානයහ.

## 4. 2. 5. 2.

## [පඨමසමාධි සූත්‍රය]

42. මහණෙනි, මේ පුද්ගලයෝ සතර දෙනෙක් ලොකයෙහි විද්‍යමානයහ කවර සතර දෙනෙක යත්:

මහණෙනි, මෙලොව ඇතැම් පුද්ගලයෙක් තමා සතන්හි අජ්ඣාත්තචිත්ත-සමාධිය ලබනසුලු වෙයි. සංස්කාරපරිග්‍රාහකවිදර්ශනාඥානය නො ලබන සුලු වෙයි.

මහණෙනි, මෙලොව ඇතැම් පුද්ගලයෙක් සංස්කාරපරිග්‍රාහක විදර්ශනා-ඥානය ලබන සුලු වෙයි. තමා සතන්හි අජ්ඣාත්තචිත්තසමාධිය නො ලබන සුලු වෙයි.

ඉධ පන භික්ඛවෙ එකච්චො පුග්ගලො නෙව ලාභී හොති අජ්ඣත්තං චෙතොසමථස්ස, න ලාභී අධිපඤ්ඤාධම්මවිපස්සනාය.

ඉධ පන භික්ඛවෙ එකච්චො පුග්ගලො ලාභී චෙව හොති අජ්ඣත්තං චෙතොසමථස්ස, ලාභී ච අධිපඤ්ඤාධම්මවිපස්සනාය

ඉමෙ ඛො භික්ඛවෙ චත්තාරො පුග්ගලා සන්තො සංවිජ්ජමානා ලොකස්මින්ති.

## 4. 2. 5. 3.

## [ දුතියසමාධිසුත්තං ]

43. චත්තාරො'මෙ භික්ඛවෙ පුග්ගලා සන්තො සංවිජ්ජමානා ලොකස්මිං. කතමෙ චත්තාරො?

ඉධ භික්ඛවෙ එකච්චො පුග්ගලො ලාභී හොති අජ්ඣත්තං චෙතොසමථස්ස, න ලාභී අධිපඤ්ඤාධම්මවිපස්සනාය.

ඉධ පන භික්ඛවෙ එකච්චො පුග්ගලො ලාභී හොති අධිපඤ්ඤාධම්මවිපස්සනාය, න ලාභී අජ්ඣත්තං චෙතොසමථස්ස.

ඉධ පන භික්ඛවෙ එකච්චො පුග්ගලො නෙව ලාභී හොති අජ්ඣත්තං චෙතොසමථස්ස, න ලාභී අධිපඤ්ඤාධම්මවිපස්සනාය.

ඉධ පන භික්ඛවෙ එකච්චො පුග්ගලො ලාභී චෙව හොති අජ්ඣත්තං චෙතොසමථස්ස, ලාභී ච අධිපඤ්ඤාධම්මවිපස්සනාය.

තත්‍ර භික්ඛවෙ ය්වායං පුග්ගලො ලාභී හොති අජ්ඣත්තං චෙතොසමථස්ස, න ලාභී අධිපඤ්ඤාධම්මවිපස්සනාය, තෙන භික්ඛවෙ පුග්ගලෙන අජ්ඣත්තං චෙතොසමථෙ පතිට්ඨාය අධිපඤ්ඤාධම්මවිපස්සනාය යොගො කරණීයො. සො අපරෙන සමයෙන ලාභී චෙව හොති අජ්ඣත්තං චෙතොසමථස්ස, ලාභී ච අධිපඤ්ඤාධම්මවිපස්සනාය.

තත්‍ර භික්ඛවෙ ය්වායං පුග්ගලො ලාභී අධිපඤ්ඤාධම්මවිපස්සනාය, න ලාභී අජ්ඣත්තං චෙතොසමථස්ස. තෙන භික්ඛවෙ පුග්ගලෙන අධිපඤ්ඤාධම්මවිපස්සනාය පතිට්ඨාය අජ්ඣත්තං චෙතොසමථෙ යොගො කරණීයො. සො අපරෙන සමයෙන ලාභී චෙව හොති අධිපඤ්ඤාධම්මවිපස්සනාය, ලාභී ච අජ්ඣත්තං චෙතොසමථස්ස.

තත්‍ර භික්ඛවෙ ය්වායං පුග්ගලො නෙව ලාභී අජ්ඣත්තං චෙතොසමථස්ස, න ලාභී අධිපඤ්ඤාධම්මවිපස්සනාය. තෙන භික්ඛවෙ පුග්ගලෙන තෙසංයෙව කුසලානං ධම්මානං පටිලාභාය අධිමත්තො ඡන්දො ච වායාමො ච උස්සාහො ච උස්සොළ්හී ච අප්පටිවානී ච සති ච සම්පජඤ්ඤං ච කරණීයං.

මහණෙනි, මෙලොව ඇතැම් පුද්ගලයෙක් තමා කෙරෙහි අජ්ඣා-චිත්තසමාධිය නො ම ලබන සුළු වෙයි. සංස්කාරපරිග්‍රාහක විදර්ශනාඥානය ද නො ලබන සුළු වෙයි.

මහණෙනි, මෙලොව ඇතැම් පුද්ගලයෙක් තමා කෙරෙහි අජ්ඣා-චිත්තසමාධිය ද ලබන සුළු ම වෙයි. සංස්කාරපරිග්‍රාහක විදර්ශනාඥානය ද ලබන සුළු වෙයි.

මහණෙනි, මේ සතර පුද්ගලයෝ ලෝකයෙහි විද්‍යමානයහ.

## 4. 2. 5. 3.

## [ දුතියසමාධි සූත්‍රය ]

43. මහණෙනි, මේ පුද්ගලයෝ සතර දෙනෙක් ලෝකයෙහි විද්‍යමානයහ. කවර සතර දෙනෙක යත්:

මහණෙනි, මෙ සත්නෙහි ඇතැම් පුද්ගලයෙක් තමා කෙරෙහි අජ්ඣා-චිත්තසමාධිය ලබන සුළු වෙයි. සංස්කාරපරිග්‍රාහකවිදර්ශනාඥානය නො ලබන සුළු වෙයි.

මහණෙනි, මෙ සත්නෙහි ඇතැම් පුද්ගලයෙක් සංස්කාරපරිග්‍රාහක විදර්ශනාඥානය ලබන සුළු වෙයි. තමා කෙරෙහි අජ්ඣාචිත්තසමාධිය නො ලබන සුළු වෙයි.

මහණෙනි, මෙ සත්නෙහි ඇතැම් පුද්ගලයෙක් තමා කෙරෙහි අජ්ඣා-චිත්තසමාධිය නො ම ලබන සුළු වෙයි. සංස්කාරපරිග්‍රාහකවිදර්ශනාඥානය ද නො ලබන සුළු වෙයි.

මහණෙනි, මෙ සත්නෙහි ඇතැම් පුද්ගලයෙක් තමා කෙරෙහි අජ්ඣා-චිත්තසමාධිය ද ලබන සුළු ම වේ. සංස්කාරපරිග්‍රාහක විදර්ශනාඥානයත් ලබන සුළු වෙයි

මහණෙනි, ඒ පුද්ගලයන් කෙරෙහි යම් පුද්ගලයෙක් තමා තුළ අජ්ඣා-චිත්තසමාධිය ලබනුයේ සංස්කාරපරිග්‍රාහකවිදර්ශනාඥානය නො ලබනුයේ වේ ද, මහණෙනි, ඒ පුද්ගලයා විසින් තමා තුළ චිත්තසමථයෙහි පිහිටා සංස්කාරපරිග්‍රාහකවිදර්ශනාඥානයෙහි යුක්තප්‍රයුක්තතා සඞ්ඛ්‍යාත යොගය කටයුතුයි හේ පසුකලෙක තමා තුළ චිත්තසමථය ලබන සුළු වූයේත් සංස්කාරපරිග්‍රාහකවිදර්ශනාඥානය ලබන සුළු වූයේත් වෙයි.

මහණෙනි, ඒ පුද්ගලයන් කෙරෙහි යම් පුද්ගලයෙක් සංස්කාරපරිග්‍රාහක විදර්ශනාඥානය ලබනුයේ, තමා තුළ චිත්තසමථය නො ලබනුයේ වේ ද, මහණෙනි, ඒ පුද්ගලයා විසින් සංස්කාරපරිග්‍රාහක විදර්ශනාඥානයෙහි පිහිටා තමා තුළ චිත්තසමථයෙහි යොගය කළ යුතු ය. හේ පසුකාලයෙක සංස්කාර-පරිග්‍රාහක විදර්ශනාඥානය ලබනුයේත්, තමා තුළ චිත්තසමථය ලබනුයේත් වෙයි.

මහණෙනි, ඒ පුද්ගලයන් කෙරෙහි යම් පුද්ගලයෙක් තමා තුළ චිත්ත-සමථය නොම ලබනුයේත් සංස්කාරපරිග්‍රාහක විදර්ශනාඥානය නො ලබනු-යේත් වේ ද, මහණෙනි, ඒ පුද්ගලයා විසින් එ කුසල් දහම්හු ම ලබනු පිණිස අධිමාත්‍ර ඡන්දය ද ව්‍යායාමය ද උත්සාහය ද අභිකොත්සාහය ද නො නවත්නා වැර ද සිහිය ද සම්ප්‍රඥානය ද කළ යුතු ය.

සෙය්‍යථාපි භික්ඛවෙ ආදිත්තචෙලො වා ආදිත්තසීසො වා තස්ස තස්සෙව චෙලස්ස වා සීසස්ස වා නිබ්බාපනාය අධිමත්තං ඡන්දඤ්ච වායාමඤ්ච උස්සාහඤ්ච උස්සොළ්හිඤ්ච අප්පටිවානිඤ්ච සතිඤ්ච සම්පජඤ්ඤඤ්ච කරෙය්‍ය, එවමෙව ඛො භික්ඛවෙ තෙන පුග්ගලෙන තෙසංයෙව කුසලානං ධම්මානං පටිලාභාය අධිමත්තො ඡන්දො ච වායාමො ච උස්සාහො ච උස්සොළ්හී ච අප්පටිවානී ච සති ච සම්පජඤ්ඤඤ්ච කරණීයං. සො අපරෙන සමයෙන ලාභී චෙව හොති අජ්ඣත්තං චෙතොසමථස්ස, ලාභී ච අධිපඤ්ඤාධම්මවිපස්සනාය.

තත්‍ර භික්ඛවෙ යවායං පුග්ගලො ලාභී චෙව හොති අජ්ඣත්තං චෙතොසමථස්ස, ලාභී ච අධිපඤ්ඤාධම්මවිපස්සනාය, තෙන භික්ඛවෙ පුග්ගලෙන තෙසුයෙව කුසලෙසු ධම්මෙසු පතිට්ඨාය උත්තරිං ආසවානං ඛයාය යොගො කරණීයො.

ඉමෙ ඛො භික්ඛවෙ චත්තාරො පුග්ගලා සන්තො සංවිජ්ජමානා ලොකස්මින්ති.

## 4. 2. 5. 4.

## [ තතියසමාධිසුත්තං ]

44. චත්තාරො'මෙ භික්ඛවෙ පුග්ගලා සන්තො සංවිජ්ජමානා ලොකස්මිං. කතමෙ චත්තාරො?

ඉධ භික්ඛවෙ එකච්චො පුග්ගලො ලාභී හොති අජ්ඣත්තං චෙතොසමථස්ස, න ලාභී අධිපඤ්ඤාධම්මවිපස්සනාය.

ඉධ පන භික්ඛවෙ එකච්චො පුග්ගලො ලාභී හොති අධිපඤ්ඤාධම්මවිපස්සනාය, න ලාභී අජ්ඣත්තං චෙතොසමථස්ස.

ඉධ පන භික්ඛවෙ එකච්චො පුග්ගලො නෙව ලාභී හොති අජ්ඣත්තං චෙතොසමථස්ස, න ලාභී අධිපඤ්ඤාධම්මවිපස්සනාය.

ඉධ පන භික්ඛවෙ එකච්චො පුග්ගලො ලාභී චෙව හොති අජ්ඣත්තං චෙතොසමථස්ස, ලාභී ච අධිපඤ්ඤාධම්මවිපස්සනාය.

තත්‍ර භික්ඛවෙ යවායං පුග්ගලො ලාභී අජ්ඣත්තං චෙතොසමථස්ස, න ලාභී අධිපඤ්ඤාධම්මවිපස්සනාය, තෙන භික්ඛවෙ පුග්ගලෙන යවායං පුග්ගලො ලාභී අධිපඤ්ඤා ධම්මවිපස්සනාය, සො උපසඞ්කමිත්වා එවමස්ස වචනීයො: කථංනු ඛො ආවුසො සඞ්ඛාරා දට්ඨබ්බා? කථං සඞ්ඛාරා සම්මසිතබ්බා? කථං සඞ්ඛාරා විපස්සිතබ්බාති? තස්ස සො යථාදිට්ඨං යථාවිදිතං ව්‍යාකරොති: එවං ඛො ආවුසො සඞ්ඛාරා දට්ඨබ්බා, එවං සඞ්ඛාරා සම්මසිතබ්බා, එවං සඞ්ඛාරා විපස්සිතබ්බාති.

සො අපරෙන සමයෙන ලාභී චෙව හොති අජ්ඣත්තං චෙතොසමථස්ස, ලාභී ච අධිපඤ්ඤාධම්මවිපස්සනාය.

Free Distribution www.aathaapi.org

මහණෙනි, යම් පරිදි ඇවිළ ගත්තා වූ වස්ත්‍ර ඇතියෙක් වේ වයි, ඇවිළ ගත්තා වූ හිස ඇතියෙක් වේ වයි, ඒ ඒ පිළිය හෝ හිස හෝ නිවාලනු පිණිස අධිමාත්‍ර ඡන්දය ද ව්‍යායාමය ද උත්සාහය ද අධික වීර්‍ය්‍යය ද නො පසුබස්නා වැර ද සිහිය ද සම්ප්‍රඥතාව ද කරන්නේ වේ ද, මහණෙනි, එපරිදිම ඒ පුද්ගලයා විසින් ඒ කුසල් දහමුන් ම ලබනු පිණිස අධිමාත්‍ර වූ ඡන්දය ද ව්‍යායාමය ද උත්සාහය ද අධිකොත්සාහය ද නො පසුබස්නා වැර ද සිහිය ද සම්ප්‍රඥතාව ද කළ යුතු ය. හේ පසු කලෙක තමා තුළ චිත්තසමථය ලබන සුළු වූයේත් සංස්කාර පරිග්‍රාහක විදර්ශනාඥානය ලබන සුළු වූයේත් වෙයි.

මහණෙනි, ඒ පුද්ගලයන් කෙරෙහි යම් පුද්ගලයෙක් තමා තුළ චිත්ත-සමථය ලබන සුළු වූයේත් සංස්කාර පරිග්‍රාහක විදර්ශනාඥානය ලබන සුළු වූයේත් වේද, මහණෙනි, ඒ පුද්ගලයා විසින් ඒ කුසල් දහමුන් කෙරෙහි පිහිටා මතුයෙහි ආශ්‍රවයන් ක්‍ෂය කරණු පිණිස යොගය කළ යුතු ය.

මහණෙනි, මේ සතර පුද්ගලයෝ ලොකයෙහි විද්‍යමානයහ.

## 4. 2. 5. 4.

## [ තතියසමාධි සූත්‍රය ]

44. මහණෙනි, මේ පුද්ගලයෝ සතර දෙනෙක් ලොකයෙහි විද්‍යමානයහ. කවර සතර දෙනෙක යත්:

මහණෙනි, මෙ සස්නෙහි ඇතැම් පුද්ගලයෙක් තමා තුළ චිත්තසමථය ලබන සුළු වූයේ, සංස්කාරපරිග්‍රාහක විදර්ශනාඥානය නො ලබන සුළු වූයේ වෙයි.

මහණෙනි, මෙ සස්නෙහි ඇතැම් පුද්ගලයෙක් සංස්කාරපරිග්‍රාහක විදර්ශනාඥානය ලබන සුළු වූයේ, තමා තුළ චිත්තසමථය නො ලබන සුළු වූයේ වෙයි.

මහණෙනි, මෙ සස්නෙහි ඇතැම් පුද්ගලයෙක් තමා තුළ චිත්තසමථය නො ම ලබන සුළු වූයේ, සංස්කාරපරිග්‍රාහක විදර්ශනාඥානයත් නො ලබන සුළු වූයේ වෙයි.

මහණෙනි, මෙ සස්නෙහි ඇතැම් පුද්ගලයෙක් තමා තුළ චිත්තසමථය ලබන සුළු වූයේත්, සංස්කාරපරිග්‍රාහක විදර්ශනාඥානය ලබන සුළු වූයේත් වෙයි.

මහණෙනි, ඒ පුද්ගලයන් කෙරෙහි යම් පුද්ගලයෙක් තමා තුළ චිත්ත-සමථය ලබන සුළු වූයේ සංස්කාරපරිග්‍රාහකවිදර්ශනාඥානය නො ලබන සුළු වූයේ වේ ද, මහණෙනි, ඒ පුද්ගලයා විසින් යම් පුද්ගලයෙක් සංස්කාරපරිග්‍රා-හක විදර්ශනාඥානය ලබන සුළු වී නම්, ඔහු පැමිණ හේ මෙසේ කිය යුතු වෙයි: “ඇවැත, කෙසේ නම් සංස්කාරයෝ දක්‍යයුතු වෙත් ද? කෙසේ සංස්කාර-යෝ සිම්දිය යුතු වෙත් ද? කෙසේ සංස්කාරයෝ වෙසෙසින් බැලිය යුතු වෙත් ද?” උහුට හේ දුටුසැටිය දත් සැටිය පවසයි: “ඇවැත, සංස්කාරයෝ මෙසේ දක්‍යයුත්තාහ. සංස්කාරයෝ මෙසේ සිම්දිය යුත්තාහ. සංස්කාරයෝ මෙසේ වෙසෙසින් බැලිය යුත්තාහ”යි.

හේ පසු කලෙක තමා තුළ චිත්තසමථය ලබන සුළු වූයේත්, සංස්කාර පරිග්‍රාහකවිදර්ශනාඥානය ලබන සුළු වූයේත් වෙයි.

තත්‍ර භික්ඛවෙ ය්වායං පුග්ගලො ලාභී අධිපඤ්ඤාධම්මවිපස්සනාය, න ලාභී අජ්ඣත්තං චෙතොසමථස්ස, තෙන භික්ඛවෙ පුග්ගලෙන ය්වායං පුග්ගලො ලාභී අජ්ඣත්තං චෙතොසමථස්ස, සො උපසඞ්කමිත්වා එවමස්ස වචනීයො: "කථං නු ඛො ආවුසො චිත්තං සණ්ඨපෙතබ්බං? කථං චිත්තං සන්නිසාදෙතබ්බං? කථං චිත්තං එකොදි කාතබ්බං? කථං චිත්තං සමාදහාතබ්බන්ති?." තස්ස සො යථාදිට්ඨං යථාවිදිතං ව්‍යාකරොති: "එවං ඛො ආවුසො චිත්තං සණ්ඨපෙතබ්බං, එවං චිත්තං සන්නිසාදෙතබ්බං, එවං චිත්තං එකොදි කාතබ්බං, එවං චිත්තං සමාදහාතබ්බන්ති."

සො අපරෙන සමයෙන ලාභී චෙව හොති අධිපඤ්ඤාධම්මවිපස්සනාය, ලාභී ච අජ්ඣත්තං චෙතොසමථස්ස.

තත්‍ර භික්ඛවෙ ය්වායං පුග්ගලො නෙව ලාභී ච අජ්ඣත්තං චෙතොසමථස්ස, න ලාභී අධිපඤ්ඤාධම්මවිපස්සනාය, තෙන භික්ඛවෙ පුග්ගලෙන ය්වායං පුග්ගලො ලාභී චෙව අජ්ඣත්තං චෙතොසමථස්ස, ලාභී ච අධිපඤ්ඤාධම්මවිපස්සනාය. සො උපසඞ්කමිත්වා එවමස්ස වචනීයො: "කථං නු ඛො ආවුසො චිත්තං සණ්ඨපෙතබ්බං? කථං චිත්තං සන්නිසාදෙතබ්බං? කථං චිත්තං එකොදි කාතබ්බං? කථං චිත්තං සමාදහාතබ්බං? කථං සඞ්ඛාරා දට්ඨබ්බා? කථං සඞ්ඛාරා සම්මසිතබ්බා? කථං සඞ්ඛාරා විපස්සිතබ්බා?"ති. තස්ස සො යථාදිට්ඨං යථාවිදිතං ව්‍යාකරොති: "එවං ඛො ආවුසො චිත්තං සණ්ඨපෙතබ්බං, එවං චිත්තං සන්නිසාදෙතබ්බං, එවං චිත්තං එකොදි කාතබ්බං, එවං චිත්තං සමාදහාතබ්බං, එවං සඞ්ඛාරා දට්ඨබ්බා, එවං සඞ්ඛාරා සම්මසිතබ්බා, එවං සඞ්ඛාරා විපස්සිතබ්බා"ති.

සො අපරෙන සමයෙන ලාභී චෙව හොති අජ්ඣත්තං චෙතොසමථස්ස, ලාභී ච අධිපඤ්ඤාධම්මවිපස්සනාය.

තත්‍ර භික්ඛවෙ ය්වායං පුග්ගලො ලාභී චෙව හොති අජ්ඣත්තං චෙතොසමථස්ස, ලාභී ච අධිපඤ්ඤාධම්මවිපස්සනාය, තෙන භික්ඛවෙ පුග්ගලෙන තෙසු යෙව කුසලෙසු ධම්මෙසු පතිට්ඨාය උත්තරිං ආසවානං ඛයාය යොගො කරණීයො.

ඉමෙ ඛො භික්ඛවෙ චත්තාරො පුග්ගලා සන්තො සංවිජ්ජමානා ලොකස්මින්ති.

4. 2. 5. 6.

[ඡවාලාතසුත්තං]

45. චත්තාරො'මෙ[1] භික්ඛවෙ පුග්ගලා සන්තො සංවිජ්ජමානා ලොකස්මිං. කතමෙ චත්තාරො?

නෙවත්තහිතාය පටිපන්නො නො පරහිතාය. පරහිතාය පටිපන්නො නො අත්තහිතාය. අත්තහිතාය පටිපන්නො නො පරහිතාය. අත්තහිතාය ච පටිපන්නො පරහිතාය ච.

1. ඉමෙච - මජසං.

මහණෙනි, ඒ පුද්ගලයන් කෙරෙහි යම් පුද්ගලයෙක් සංස්කාරපරිග්‍රාහක විදර්ශනාඥානය ලබන සුලු වූයේ, තමා තුළ චිත්තසමථය නො ලබන සුලු වූයේ වේ ද, මහණෙනි, ඒ පුද්ගලයා විසින් යම් පුද්ගලයෙක් තමා තුළ චිත්තසමථය ලබන සුලු වී නම්, ලං ව සිට හේ මෙසේ කිය යුතු වෙයි: "ඇවත, කෙසේ නම් සිත සකසා තැබිය යුතු වේ ද? කෙසේ නම් සිත සංහිඳුවා ලිය යුතු ද? කෙසේ නම් සිත එකඟ කළ යුතු ද? කෙසේ සිත අරමුණෙහි තගා ලිය යුතු දැයි" කියා යි. ඔහුට හේ දුටු සැටිය දත් සැටිය පවසයි. "ඇවත, මෙසේ සිත මොනොවට පිහිටුවිය යුතු ය. මෙසේ සිත සංහිඳවිය යුතුය. මෙසේ සිත එකඟ කළ යුතු ය. මෙසේ සිත අරමුණෙහි තගා ලිය යුතු ය" කියා යි.

හේ පසු කලෙක සංස්කාරපරිග්‍රාහකවිදර්ශනාඥානය ලබන සුලු වූයේත් තමා තුළ චිත්තසමථය ලබන සුලු වූයේත් වෙයි.

මහණෙනි, ඒ පුද්ගලයන් කෙරෙහි යම් පුද්ගලයෙක් තමා තුළ චිත්තසමථය නො ම ලබන සුලු වූයේත්, සංස්කාරපරිග්‍රාහකවිදර්ශනාඥානය නො ලබන සුලු වූයේත් වේ ද, මහණෙනි, ඒ පුද්ගලයා විසින් යම් පුද්ගලයෙක් තමා තුළ චිත්තසමථය ලබන සුලු වූයේත් සංස්කාරපරිග්‍රාහකවිදර්ශනාඥානය ලබන සුලු වූයේත් වී නම්, ලං ව ගෙණ හේ මෙසේ කිය යුතු වෙයි: "ඇවැත්නි, කෙසේ නම් සිත මොනොවට පිහිටුවිය යුතු ද? කෙසේ නම් සිත සංහිඳුවා ලිය යුතු ද? කෙසේ නම් සිත එකඟ කළ යුතු ද? කෙසේ නම් සිත අරමුණෙහි තගා ලිය යුතු ද? කෙසේ නම් සංස්කාරයෝ දත යුතු වෙත් ද? කෙසේ නම් සංස්කාරයෝ සිම්දිය යුතු වෙත් ද? කෙසේ නම් සංස්කාරයෝ වෙසෙසින් බැලිය යුතු වෙත්ද"යි කියා යි. ඔහුට හේ දුටුසැටිය දත්සැටිය පවසයි: "ඇවත, මෙසේ සිත මොනොවට පිහිටුවිය යුතුය. මෙසේ සිත සංහිඳුවාලිය යුතුය. මෙසේ සිත එකඟ කළ යුතුය. මෙසේ සිත අරමුණෙහි තගා ලිය යුතුය. මෙසේ සංස්කාරයෝ දතයුතු වෙති. මෙසේ සංස්කාරයෝ සිම්දිය යුතු වෙති. මෙසේ සංස්කාරයෝ වෙසෙසින් බැලිය යුතු වෙති"යි කියා යි.

හේ පසුකලෙක චිත්තසමථය ලබන සුලු වූයේත් සංස්කාරපරිග්‍රාහකවිදර්ශනාඥානය ලබන සුලු වූයේත් වෙයි.

මහණෙනි, ඒ පුද්ගලයන් කෙරෙහි යම් පුද්ගලයෙක් තමා තුළ චිත්තසමථය ලබන සුලු වූයේත්, සංස්කාරපරිග්‍රාහකවිදර්ශනාඥානය ලබන සුලු වූයේත් වේ ද, මහණෙනි, ඒ පුද්ගලයා විසින් ඒ කුසල්දහම්හි ම පිහිටා මතුයෙහි ආශ්‍රවක්‍ෂය පිණිස යොගය කළ යුතු ය.

මහණෙනි, මේ සතර පුද්ගලයෝ ලෝකයෙහි විද්‍යමානයහ.

## 4. 2. 5. 5.

## [ ඡවාලාත සූත්‍රය ]

45. මහණෙනි, මේ පුද්ගලයෝ සතර දෙනෙක් ලෝකයෙහි විද්‍යමානයහ. කවර සතර දෙනෙක යත්:

තමාහට හිත පිණිස වේ වයි, මෙරමාහට හිත පිණිස වේව යි, නොපිළිපන්නේ ය. මෙරමාහට හිත පිණිස පිළිපන්නේ තමාට හිත පිණිස නො පිළිපන්නේ ය. තමාට හිත පිණිස පිළිපන්නේ මෙරමාහට හිත පිණිස නො පිළිපන්නේ ය. තමාහට හිත පිණිසත් මෙරමාහට හිත පිණිසත් පිළිපන්නේ ය.

සෙය්‍යථාපි භික්ඛවෙ ඡවාලාතං උභතො පදිත්තං මජ්ඣෙ ගූථගතං නෙව ගාමෙ කට්ඨත්ථං ඵරති න අරඤ්ඤෙ, තථූපමාහං භික්ඛවෙ ඉමං පුග්ගලං වදාමි ය්වායං පුග්ගලො නෙවත්තහිතාය පටිපන්නො නො පරහිතාය.

තත්‍ර භික්ඛවෙ ය්වායං පුග්ගලො පරහිතාය පටිපන්නො නො අත්තහිතාය, අයං ඉමෙසං ද්වින්නං පුග්ගලානං අභික්කන්තතරො ච පණීතතරො ච.

තත්‍ර භික්ඛවෙ ය්වායං පුග්ගලො අත්තහිතාය පටිපන්නො නො පරහිතාය, අයං ඉමෙසං තිණ්ණං පුග්ගලානං අභික්කන්තතරො ච පණීතතරො ච.

තත්‍ර භික්ඛවෙ ය්වායං පුග්ගලො අත්තහිතාය ච පටිපන්නො පරහිතාය ච, අයං ඉමෙසං චතුන්නං පුග්ගලානං අග්ගො ච සෙට්ඨො ච පාමොක්ඛො ච උත්තමො ච පවරො ච.

සෙය්‍යථාපි භික්ඛවෙ ගවා ඛීරං, ඛීරම්හා දධි, දධිම්හා නවනීතං, නවනීතම්හා සප්පි, සප්පිම්හා සප්පිමණ්ඩො, සප්පිමණ්ඩො තත්ථ අග්ගමක්ඛායති, එවමෙව ඛො භික්ඛවෙ ය්වායං පුග්ගලො අත්තහිතාය ච පටිපන්නො පරහිතාය ච, අයං ඉමෙසං චතුන්නං පුග්ගලානං අග්ගො ච සෙට්ඨො ච පාමොක්ඛො ච උත්තමො ච පවරො ච.

ඉමෙ ඛො භික්ඛවෙ චත්තාරො පුග්ගලා සන්තො සංවිජ්ජමානා ලොකස්මින්ති.

## 4. 2. 5. 6.

## [ රාගවිනයසුත්තං ]

46. චත්තාරො'මෙ භික්ඛවෙ පුග්ගලා සන්තො සංවිජ්ජමානා ලොකස්මිං. කතමෙ චත්තාරො?

අත්තහිතාය පටිපන්නො නො පරහිතාය. පරහිතාය පටිපන්නො නො අත්තහිතාය. නෙව අත්තහිතාය පටිපන්නො නො පරහිතාය. අත්තහිතාය ච පටිපන්නො පරහිතාය ච.

කථඤ්ච භික්ඛවෙ පුග්ගලො අත්තහිතාය පටිපන්නො නො පරහිතාය? ඉධ භික්ඛවෙ එකච්චො පුග්ගලො අත්තනා රාගවිනයාය පටිපන්නො හොති, නො පරං රාගවිනයාය සමාදපෙති. අත්තනා දොසවිනයාය පටිපන්නො හොති, නො පරං දොසවිනයාය සමාදපෙති. අත්තනා මොහවිනයාය පටිපන්නො හොති, නො පරං මොහවිනයාය සමාදපෙති. එවං ඛො භික්ඛවෙ පුග්ගලො අත්තහිතාය පටිපන්නො හොති නො පරහිතාය.

මහණෙනි, යම් පරිද්දෙකින් ඇඹුල් ගත්, මැද අශුචි වැකුණු කොහොලින් පෙණහෙල්ල ගමෙහි කාෂ්ටයෙන් කරණ කිස සිදු නො කෙරේ ද, අරණ්‍යයෙහි කාෂ්ටාර්ථය සිදු නො කෙරේ ද, යම් පුද්ගලයෙක් තමාට හිත පිණිස වේම යි, මෙරමාහට හිත පිණිස වේව යි නො පිළිපන්නේ වේ නම්, මහණෙනි, මේ පුද්ගලයා එබඳු කොට මම කියමි.

මහණෙනි, ඒ පුද්ගලයන් කෙරෙහි යම් පුද්ගලයෙක් මෙරමාහට හිත පිණිස පිළිපන්නේ තමාට හිත පිණිස නොපිළිපන්නේ වේ ද, මේ පුද්ගලයන් දෙදෙනා අතුරෙන් මෙ තෙම සුන්දරතර ද වෙයි. ප්‍රණීතතර ද වෙයි.

මහණෙනි, ඒ පුද්ගලයන් කෙරෙහි යම් පුද්ගලයෙක් තමාට හිත පිණිස පිළිපන්නේ මෙරමාහට හිත පිණිස නො පිළිපන්නේ වේ ද, මෙ තුන් පුද්ගලයන් අතුරෙන් මෙ තෙම සුන්දරතර වෙයි. ප්‍රණීතතර ද වෙයි.

මහණෙනි, ඒ පුද්ගලයන් කෙරෙහි යම් පුද්ගලයෙක් තමාට හිත පිණිස ද මෙරමාහට හිතපිණිස ද පිළිපන්නේ වේ නම්, මේ සතර පුද්ගලයන් අතුරෙන් මෙ තෙම අග්‍ර ද ශ්‍රෙෂ්ඨ ද ප්‍රමුඛ ද උත්තම ද ප්‍රවරද වෙයි.

මහණෙනි, යම් පරිද්දෙකින් කිරි ද, කිරියෙන් දීහි ද, දීහියෙන් වෙඬරු ද, වෙඬරුයෙන් ගී ද, ගීයෙන් ගීමඬ වේ ද, එහි ගීමඬ අග්‍රය යි කියනු ලැබේ ද, මහණෙනි, එපරිද්දෙන් ම යම් පුද්ගලයෙක් තමාට හිත පිණිසත් මෙරමාහට හිතපිණිසත් පිළිපන්නේ වේ නම්, හෙතෙම මේ සතර පුද්ගලයන් අතුරෙන් අග්‍ර ද ශ්‍රෙෂ්ඨ ද ප්‍රමුඛ ද උත්තම ද ප්‍රවර ද වේ.

මහණෙනි, මේ පුද්ගලයෝ සතර දෙන ලෝකයෙහි විද්‍යමාන වෙත්.

## 4. 2. 5. 6.

## [රාගවිනය සූත්‍රය]

46. මහණෙනි, මේ පුද්ගලයෝ සතර දෙනෙක් ලොකයෙහි විද්‍යමානයහ. කවර සතර දෙනෙක යත්:

තමාට හිත පිණිස පිළිපන්නේ මෙරමාහට හිත පිණිස නො පිළිපන්නේ ය. මෙරමාහට හිත පිණිස පිළිපන්නේ තමාට හිත පිණිස නො පිළිපන්නේ ය. තමාට හිත පිණිස නොපිළිපන්නේ ම මෙරමාහට හිත පිණිස ද නො පිළිපන්නේ ය. තමාට හිත පිණිසත් මෙරමාහට හිත පිණිසත් පිළිපන්නේ ය.

මහණෙනි, කෙසේ පුද්ගල තමාට හිත පිණිස පිළිපන්නේ මෙරමාහට හිත පිණිස නො පිළිපන්නේ වේ ද? මහණෙනි, මේ ලොව ඇතැම් පුද්ගලයෙක්, තෙමේ රාගවිනය පිණිස පිළිපන්නේ වෙයි, මෙරමා රාගවිනය පිණිස සමාදන් නො කරවයි. තෙමේ ද්වෙෂවිනය පිණිස පිළිපන්නේ වෙයි, මෙරමා ද්වෙෂවිනය පිණිස සමාදන් නො කරවයි. තෙමේ මොහවිනය පිණිස පිළිපන්නේ වෙයි, මෙරමා මොහවිනය පිණිස සමාදන් නො කරවයි. මහණෙනි, මෙසේ පුද්ගල තමාට හිත පිණිස පිළිපන්නේ මෙරමාහට හිත පිණිස නො පිළිපන්නේ වෙයි.

කථඤ්ච භික්ඛවෙ පුග්ගලො පරහිතාය පටිපන්නො හොති, නො අත්තහිතාය? ඉධ භික්ඛවෙ එකච්චො පුග්ගලො අත්තනා න රාගවිනයාය පටිපන්නො හොති, පරං රාගවිනයාය සමාදපෙති. අත්තනා න දොසවිනයාය පටිපන්නො හොති, පරං දොසවිනයාය සමාදපෙති. අත්තනා න මොහවිනයාය පටිපන්නො හොති, පරං මොහවිනයාය සමාදපෙති. එවං ඛො භික්ඛවෙ පුග්ගලො පරහිතාය පටිපන්නො හොති නො අත්තහිතාය.

කථඤ්ච භික්ඛවෙ පුග්ගලො නෙවත්තහිතාය පටිපන්නො හොති, නො පරහිතාය? ඉධ භික්ඛවෙ එකච්චො පුග්ගලො අත්තනා න රාගවිනයාය පටිපන්නො හොති, නො පරං රාගවිනයාය සමාදපෙති. අත්තනා න දොසවිනයාය පටිපන්නො හොති, නො පරං දොසවිනයාය සමාදපෙති. අත්තනා න මොහවිනයාය පටිපන්නො හොති, නො පරං මොහවිනයාය සමාදපෙති. එවං ඛො භික්ඛවෙ පුග්ගලො නෙවත්තහිතාය පටිපන්නො හොති නො පරහිතාය.

කථඤ්ච භික්ඛවෙ පුග්ගලො අත්තහිතාය ච පටිපන්නො හොති, පරහිතාය ච? ඉධ භික්ඛවෙ එකච්චො පුග්ගලො අත්තනා ච රාගවිනයාය පටිපන්නො හොති, පරඤ්ච රාගවිනයාය සමාදපෙති. අත්තනා ච දොසවිනයාය පටිපන්නො හොති, පරඤ්ච දොසවිනයාය සමාදපෙති. අත්තනා ච මොහවිනයාය පටිපන්නො හොති, පරඤ්ච මොහවිනයාය සමාදපෙති. එවං ඛො භික්ඛවෙ පුග්ගලො අත්තහිතාය ච පටිපන්නො හොති, පරහිතාය ච.

ඉමෙ ඛො භික්ඛවෙ චත්තාරො පුග්ගලා සන්තො සංවිජ්ජමානා ලොකස්මින්ති.

## 4. 2. 5. 7.

## [ ඛිප්පනිසන්තිසුත්තං ]

47. චත්තාරො'මෙ භික්ඛවෙ පුග්ගලා සන්තො සංවිජ්ජමානා ලොකස්මිං. කතමෙ චත්තාරො?

අත්තහිතාය පටිපන්නො නො පරහිතාය. පරහිතාය පටිපන්නො නො අත්තහිතාය. නෙවත්තහිතාය පටිපන්නො නො පරහිතාය. අත්තහිතාය ච පටිපන්නො පරහිතාය ච.

මහණෙනි, කෙසේ පුද්ගල මෙරමාහට හිත පිණිස පිළිපන්නේ තමාට හිත පිණිස නො පිළිපන්නේ වේ ද? මහණෙනි, මෙලොව ඇතැම් පුද්ගලයෙක් තෙමේ රාගවිනය පිණිස නො පිළිපන්නේ වෙයි, මෙරමා රාගවිනය පිණිස සමාදන් කරවයි. තෙමේ ද්වෙෂවිනය පිණිස නො පිළිපන්නේ වෙයි, මෙරමා ද්වෙෂවිනය පිණිස සමාදන් කරවයි. තෙමේ මොහවිනය පිණිස නො පිළිපන්නේ වෙයි, මෙරමා මොහවිනය පිණිස සමාදන් කරවයි. මහණෙනි, මෙසේ පුද්ගල මෙරමාහට හිත පිණිස පිළිපන්නේ තමාට හිත පිණිස නො පිළිපන්නේ වෙයි.

මහණෙනි, කෙසේ පුද්ගල තමාට හිත පිණිස නො පිළිපන්නේ ම මෙරමාහට හිත පිණිස ද නො පිළිපන්නේ වේ ද? මහණෙනි, මේ ලොව ඇතැම් පුද්ගලයෙක්, තෙමේ රාගවිනය පිණිස නො පිළිපන්නේ වෙයි, මෙරමා රාගවිනය පිණිස සමාදන් නො කරවයි. තෙමේ ද්වෙෂවිනය පිණිස නො පිළිපන්නේ වෙයි, මෙරමා ද්වෙෂවිනය පිණිස සමාදන් නො කරවයි. තෙමේ මොහවිනය පිණිස නො පිළිපන්නේ වෙයි, මෙරමා මොහවිනය පිණිස සමාදන් නො කරවයි. මහණෙනි, මෙසේ පුද්ගල තමාට හිත පිණිස නො පිළිපන්නේ ම මෙරමාහට හිත පිණිස ද නො පිළිපන්නේ වෙයි.

මහණෙනි, කෙසේ පුද්ගල තමාට හිත පිණිසත්, මෙරමාහට හිත පිණිසත් පිළිපන්නේ වේ ද

මහණෙනි, මේ ලොව ඇතැම් පුද්ගලයෙක් තෙමේත් රාගවිනය පිණිස පිළිපන්නේ වෙයි, මෙරමාත් රාගවිනය පිණිස සමාදන් කරවයි. තෙමේත් ද්වෙෂවිනය පිණිස පිළිපන්නේ වෙයි, මෙරමාත් ද්වෙෂවිනය පිණිස සමාදන් කරවයි. තෙමේත් මොහවිනය පිණිස පිළිපන්නේ වෙයි, මෙරමාත් මොහවිනය පිණිස සමාදන් කරවයි. මහණෙනි, මෙසේ පුද්ගල තමාට හිත පිණිසත් මෙරමාට හිත පිණිසත් පිළිපන්නේ වෙයි.

මහණෙනි, මේ සතර පුද්ගලයෝ ලෝකයෙහි විද්‍යමානයහ.

## 4. 2. 5. 7

## [ සිප්පනිසන්ති සූත්‍රය ]

47. මහණෙනි, මේ පුද්ගලයෝ සතර දෙනෙක් ලෝකයෙහි විද්‍යමානයහ. කවර සතර දෙනෙක යත්:

තමාට හිත පිණිස පිළිපන්නේ මෙරමාහට හිත පිණිස නො පිළිපන්නේ ය. මෙරමාහට හිත පිණිස පිළිපන්නේ තමාට හිත පිණිස නො පිළිපන්නේ ය. තමාට හිත පිණිස නො පිළිපන්නේ ම මෙරමාහට හිත පිණිස නො පිළිපන්නේ ය. තමාහට හිත පිණිසත් මෙරමාහට හිත පිණිසත් පිළිපන්නේ ය.

කථඤ්ච භික්ඛවෙ පුග්ගලො අත්තහිතාය පටිපන්නො හොති නො පරහිතාය? ඉධ භික්ඛවෙ එකච්චො පුග්ගලො ඛිප්පනිසන්ති ච හොති කුසලෙසු ධම්මෙසු. සුතානං ච ධම්මානං ධාරකජාතිකො හොති. ධතානං ච ධම්මානං අත්ථූපපරික්ඛී හොති. අත්ථමඤ්ඤාය ධම්මමඤ්ඤාය ධම්මානුධම්මපටිපන්නො හොති. නො ච කල්‍යාණවාචො හොති කල්‍යාණවාක්කරණො පොරියා වාචාය සමන්නාගතො විස්සට්ඨාය අනෙලගලාය අත්ථස්ස විඤ්ඤාපනියා. නො ච සන්දස්සකො සමාදපකො සමුත්තෙජකො සම්පහංසකො සබ්‍රහ්මචාරීනං. එවං ඛො භික්ඛවෙ පුග්ගලො අත්තහිතාය පටිපන්නො හොති නො පරහිතාය.

කථඤ්ච භික්ඛවෙ පුග්ගලො පරහිතාය පටිපන්නො හොති නො අත්තහිතාය? ඉධ භික්ඛවෙ එකච්චො පුග්ගලො න හෙව ඛො ඛිප්පනිසන්ති හොති කුසලෙසු ධම්මෙසු නො ච සුතානං ධම්මානං ධාරකජාතිකො හොති. නො ච ධතානං ධම්මානං අත්ථූපපරික්ඛී හොති. නො ච අත්ථමඤ්ඤාය ධම්මමඤ්ඤාය ධම්මානුධම්මපටිපන්නො හොති. කල්‍යාණවාචො ච හොති කල්‍යාණවාක්කරණො පොරියා වාචාය සමන්නාගතො විස්සට්ඨාය අනෙලගලාය අත්ථස්ස විඤ්ඤාපනියා. සන්දස්සකො ච හොති සමාදපකො සමුත්තෙජකො සම්පහංසකො සබ්‍රහ්මචාරීනං. එවං ඛො භික්ඛවෙ පුග්ගලො පරහිතාය පටිපන්නො හොති නො අත්තහිතාය.

කථඤ්ච භික්ඛවෙ පුග්ගලො නෙවත්තහිතාය පටිපන්නො හොති නො පරහිතාය? ඉධ භික්ඛවෙ එකච්චො පුග්ගලො න හෙව ඛො ඛිප්පනිසන්ති හොති කුසලෙසු ධම්මෙසු. නො ච සුතානං ධම්මානං ධාරකජාතිකො හොති. නො ච ධතානං ධම්මානං අත්ථූපපරික්ඛී හොති. නො ච අත්ථමඤ්ඤාය ධම්මමඤ්ඤාය ධම්මානුධම්මපටිපන්නො හොති. නො ච කල්‍යාණවාචො හොති කල්‍යාණවාක්කරණො පොරියා වාචාය සමන්නාගතො විස්සට්ඨාය අනෙලගලාය අත්ථස්ස විඤ්ඤාපනියා. නො ච සන්දස්සකො හොති සමාදපකො සමුත්තෙජකො සම්පහංසකො සබ්‍රහ්මචාරීනං. එවං ඛො භික්ඛවෙ පුග්ගලො නෙවත්තහිතාය පටිපන්නො හොති නො පරහිතාය.

කථඤ්ච භික්ඛවෙ පුග්ගලො අත්තහිතාය ච පටිපන්නො හොති පරහිතාය ච? ඉධ භික්ඛවෙ එකච්චො පුග්ගලො ඛිප්පනිසන්ති ච හොති කුසලෙසු ධම්මෙසු. සුතානඤ්ච ධම්මානං ධාරකජාතිකො හොති. ධතානඤ්ච ධම්මානං අත්ථූපපරික්ඛී හොති. අත්ථමඤ්ඤාය ධම්මමඤ්ඤාය ධම්මානුධම්මපටිපන්නො හොති. කල්‍යාණවාචො හොති කල්‍යාණවාක්කරණො. පොරියා වාචාය සමන්නාගතො විස්සට්ඨාය අනෙලගලාය අත්ථස්ස විඤ්ඤාපනියා. සන්දස්සකො ච හොති සමාදපකො සමුත්තෙජකො සම්පහංසකො සබ්‍රහ්මචාරීනං. එවං ඛො භික්ඛවෙ පුග්ගලො අත්තහිතාය ච පටිපන්නො හොති පරහිතාය ච.

ඉමෙ ඛො භික්ඛවෙ චත්තාරො පුග්ගලා සන්තො සංවිජ්ජමානා ලොකස්මින්ති.

මහණෙනි, කෙසේ පුද්ගල තමාට හිත පිණිස පිළිපන්නේ මෙරමාහට හිත පිණිස නො පිළිපන්නේ වේ ද? මහණෙනි, මේ ලොව ඇතැම් පුද්ගලයෙක් කුසල්දහම්හි ලා වහා දන්නට සමත් වූයේ වෙයි. ඇසූ දහම් දරණ සවභාව ඇත්තේ ද වෙයි. දරූ දහම් අරුත් විසින් පිරික්සනුයේ ද වෙයි. අටුවා දැන පෙළ දහම් දැන ධර්මානුධර්මයෙහි පිළිපන්නේ වෙයි. එසේ හොතුදු කලණවදන් නැත්තේ වෙයි. කල්‍යාණවචනඝොෂ නැත්තේ වෙයි. අපලිබුද්ධ, නිදොස්, අර්ථ දන්වන්නට සමත්, පිරිපුන් වචනයෙන් සමන්වාගත නො වෙයි. සබ්‍රම්සරුනට කරුණු විසින් නො දක්වන්නේ වෙයි. සමාදන් නො කරවන්නේ වෙයි. තෙද ගන්වන්නේ නො වෙයි. පහදවන්නේ නො වෙයි. මහණෙනි, මෙසේ පුද්ගල තමාට හිත පිණිස පිළිපන්නේ මෙරමාහට හිත පිණිස නොපිළිපන්නේ වෙයි.

මහණෙනි, කෙසේ පුද්ගල මෙරමාහට හිත පිණිස පිළිපන්නේ තමහට හිත පිණිස නො පිළිපන්නේ වේ ද? මහණෙනි, මෙලොව ඇතැම් පුද්ගලයෙක් කුසල්දහම්හි ලා වහා කත් රුකොට දන්නට සමත් වූයේ නො වෙයි. ඇසූ දහම් දරණ සවභාව ඇත්තේ ද නො වෙයි. ධැරූ දහම් අර්ථ විසින් පරීක්ෂා කොට ගන්නේ නො වෙයි. අටුවා දැන පෙළදහම් දැන ධර්මානුධර්මයට පිළිපන්නේ නො ද වෙයි. කල්‍යාණවචන ඇත්තේ වෙයි. කල්‍යාණවචන ඝොෂ ඇත්තේ වෙයි. අපලිබුද්ධ, නිදොස්, අරුත් විදුමන්නට සමත්, පිරිපුන් වචනයෙන් සමන්වාගත වෙයි. සබ්‍රම්සරුනට හෙතු දක්වා බණන්නේත්, ගුණයෙහි සමාදන් කරවන්නේත්, නිසාමනය කරවන්නේත්, පහදවන්නේත් වෙයි. මහණෙනි, මෙසේ පුද්ගල මෙරමාහට හිත පිණිස පිළිපන්නේ තමාට හිත පිණිස නො පිළිපන්නේ වෙයි.

මහණෙනි, කෙසේ නම් පුද්ගල තමාට හිත පිණිස නො පිළිපන්නේත් මෙරමාහට හිත පිණිස නො පිළිපන්නේත් වේ ද? මහණෙනි, මෙලොව ඇතැම් පුද්ගලයෙක් කුසල්දහම්හි ලා වහා කත් රුකොට දන්නට සමත් නො වෙයි. ඇසූ දහම් ධරණ සවභාව ඇත්තේත් නො වෙයි. දරූ දහම් අර්ථ විසින් පරීක්ෂා කොට ගන්නේත් නො වෙයි. අටුවා දැන පෙළදහම් දැන ධර්මානු-ධර්මයට පිළිපන්නේ නො ද වෙයි. කලණවදන් ඇත්තේත් නො වෙයි. කල්‍යාණවචනඝොෂ ඇත්තේත් නො වෙයි. අපලිබුද්ධ නිදොස් අර්ථය විදුමකට සමත් පරිපූර්ණවචනයෙන් සමන්වාගත නො වෙයි. සබ්‍රම්සරුනට කරුණු දක්වා බණන්නේත්, ගුණයෙහි සමාදන් කරවන්නේත්, තෙද ගන්වන්නේත්, පහදවන්නේත්, නො වෙයි. මහණෙනි, මෙසේ පුද්ගල තමාට හිත පිණිස නො පිළිපන්නේ ම මෙරමාහට හිත පිණිස නො පිළි-පන්නේ ද වෙයි.

මහණෙනි, කෙසේ පුද්ගල තමාට හිත පිණිස පිළිපන්නේත් මෙරමාහට හිත පිණිස පිළිපන්නේත් වේ ද? මහණෙනි, මෙලොව ඇතැම් පුද්ගලයෙක් කුසල්දහම්හි ලා වහා කත් රුකොට දන්නට සමත් වූයේ වෙයි. ඇසූ දහම් දරණ සවභාව ඇත්තේ වෙයි. දරූ දහම් අර්ථ විසින් පරීක්ෂාකොට ගන්නේ වෙයි. අටුවා දැන පෙළදහම් දැන ධර්මානුධර්මයට පිළිපන්නේ වෙයි. කලණබස් ඇතියේත්, කල්‍යාණවචනඝොෂා ඇතියේත් වෙයි. අපලිබුද්ධ නිදොස් අර්ථය. විදුවනට සමත් පරිපූර්ණවචනයෙන් සමන්වාගත වෙයි. සබ්‍රම්සරුනට හේතු දක්වා බණන්නේත්, සමාදන් කරවන්නේත්, තෙද ගන්වා බණන්නේත්, පහදවන්නේත් වේ. මහණෙනි, මෙසේ පුද්ගල තමාට හිත පිණිසත් මෙරමාහට හිත පිණිසත් පිළිපන්නේ වෙයි.

මහණෙනි, මේ පුද්ගලයෝ සතර දෙනෙක් ලෝකයෙහි විද්‍යමානයහ.

## 4. 2. 5. 8.

## [ අත්තහිතසුත්තං ]

48. චත්තාරෝ'මෙ භික්ඛවෙ පුග්ගලා සන්තො සංවිජ්ජමානා ලොකස්මිං. කතමෙ චත්තාරො?

අත්තහිතාය පටිපන්නො නො පරහිතාය පරහිතාය පටිපන්නො නො අත්තහිතාය. නෙව අත්තහිතාය ච පටිපන්නො නො පරහිතාය. අත්තහිතාය ච පටිපන්නො පරහිතාය ච.

ඉමෙ ඛො භික්ඛවෙ, චත්තාරො පුග්ගලා සන්තො සංවිජ්ජමානා ලොකස්මින්ති.

## 4. 2. 5. 9.

## [ සික්ඛාපදසුත්තං ]

49. චත්තාරෝ'මෙ භික්ඛවෙ පුග්ගලා සන්තො සංවිජ්ජමානා ලොකස්මිං. කතමෙ චත්තාරො?

අත්තහිතාය පටිපන්නො නො පරහිතාය. පරහිතාය පටිපන්නො නො අත්තහිතාය. නෙව අත්තහිතාය ච පටිපන්නො නො පරහිතාය. අත්තහිතාය ච පටිපන්නො පරහිතාය ච.

කථඤ්ච භික්ඛවෙ පුග්ගලො අත්තහිතාය පටිපන්නො හොති නො පරහිතාය? ඉධ භික්ඛවෙ එකච්චො පුග්ගලො අත්තනා පාණාතිපාතා පටිවිරතො හොති, නො ච පරං පාණාතිපාතා වෙරමණියා සමාදපෙති. අත්තනා අදින්නාදානා පටිවිරතො හොති, නො පරං අදින්නාදානා වෙරමණියා සමාදපෙති. අත්තනා කාමෙසු මිච්ඡාචාරා පටිවිරතො හොති, නො පරං කාමෙසු මිච්ඡාචාරා වෙරමණියා සමාදපෙති. අත්තනා මුසාවාදා පටිවිරතො හොති, නො පරං මුසාවාදා වෙරමණියා සමාදපෙති, අත්තනා සුරාමෙරයමජ්ජපමාදට්ඨානා පටිවිරතො හොති, නො පරං සුරාමෙරයමජ්ජපමාදට්ඨානා වෙරමණියා සමාදපෙති. එවං ඛො භික්ඛවෙ පුග්ගලො අත්තහිතාය පටිපන්නො හොති නො පරහිතාය.

කථඤ්ච භික්ඛවෙ පුග්ගලො පරහිතාය පටිපන්නො හොති නො අත්තහිතාය? ඉධ භික්ඛවෙ එකච්චො පුග්ගලො අත්තනා පාණාතිපාතා අප්පටිවිරතො හොති, පරං පාණාතිපාතා වෙරමණියා සමාදපෙති අත්තනා අදින්නාදානා අප්පටිවිරතො හොති, පරං අදින්නාදානා වෙරමණියා සමාදපෙති. අත්තනා කාමෙසු මිච්ඡාචාරා අප්පටිවිරතො හොති, පරං කාමෙසු මිච්ඡාචාරා වෙරමණියා සමාදපෙති. අත්තනා මුසාවාදා අප්පටිවිරතො හොති, පරං මුසාවාදා වෙරමණියා සමාදපෙති. අත්තනා සුරාමෙරයමජ්ජපමාදට්ඨානා අප්පටිවිරතො හොති, පරං සුරාමෙරයමජ්ජපමාදට්ඨානා වෙරමණියා සමාදපෙති.

---

නො පරං - මජසං.

4. 2. 5. 8.

[ අත්තහිත සූත්‍රය ]

48. මහණෙනි. මේ පුද්ගලයෝ සතර දෙනෙක් ලෝකයෙහි විද්‍යමානයහ. කවර සතර දෙනෙක යත්:

තමාට හිත පිණිස පිළිපන්නේ මෙරමාහට හිත පිණිස නො පිළිපන්නේ ය. මෙරමාහට හිත පිණිස පිළිපන්නේ තමාට හිත පිණිස නො පිළිපන්නේ ය. තමාට හිත පිණිස නො පිළිපන්නේ ම මෙරමාහට හිත පිණිසත් නො පිළිපන්නේ ය. තමාට හිත පිණිසත් මෙරමාහට හිත පිණිසත් පිළිපන්නේ ය.

මහණෙනි, මේ පුද්ගලයෝ සතර දෙනෙක් ලෝකයෙහි විද්‍යමානයහ.

4. 2. 5. 9.

[ සික්ඛාපදසූත්‍රය ]

49. මහණෙනි, මේ පුද්ගලයෝ සතර දෙනෙක් ලෝකයෙහිවිද්‍යමානයහ කවර සතර දෙනෙක යත්:

තමාට හිත පිණිස පිළිපන්නේ මෙරමාහට හිත පිණිස නො පිළිපන්නේ ය. මෙරමාහට හිත පිණිස පිළිපන්නේ තමාට හිත පිණිස නො පිළිපන්නේ ය. තමාට හිත පිණිස නො පිළිපන්නේ ම මෙරමාහට හිත පිණිසත් නො පිළිපන්නේ ය. තමාට හිත පිණිසත් මෙරමාහට හිත පිණිසත් පිළිපන්නේ ය.

මහණෙනි, කෙසේ පුද්ගල තමාට හිත පිණිස පිළිපන්නේ මෙරමාහට හිත පිණිස නො පිළිපන්නේ වේ ද? මහණෙනි, මෙලොව ඇතැම් පුද්ගලයෙක් තෙමේ පණිවායෙන් දුරුවූයේ වෙයි. මෙරමා පණිවායෙන් වළකනු සඳහා සමාදන් නො කරවයි. තෙමේ අයිනාදනින් දුරු වූයේ වෙයි. මෙරමා අයිනාදනින් වළකනු සඳහා සමාදන් නො කරවයි. තෙමේ කාමයෙහි මිසහසරින් දුරුවූයේ වෙයි. මෙරමා කාමයෙහි මිසහසරින් වළකනු සඳහා සමාදන් නො කරවයි. තෙමේ මුසවායෙන් දුරුවූයේ වෙයි. මෙරමා මුසවායෙන් වළකනු සඳහා සමාදන් නො කරවයි. තෙමේ මද පමා දෙකට කරුණු වූ රහමෙරින් දුරු වූයේ වෙයි. මෙරමා මද පමා දෙකට කරුණු වූ රහමෙරින් වළකනු සඳහා සමාදන් නො කරවයි මහණෙනි, මෙසේ පුද්ගල තමාට හිත පිණිස පිළිපන්නේ මෙරමාහට හිත පිණිස නො පිළිපන්නේ වෙයි.

මහණෙනි, කෙසේ පුද්ගල මෙරමාහට හිත පිණිස පිළිපන්නේ තමාට හිත පිණිස නො පිළිපන්නේ වේ ද? මහණෙනි, මෙලොව ඇතැම් පුද්ගලයෙක් තෙමේ පණිවායෙන් දුරු නො වූයේ වෙයි. මෙරමා පණිවායෙන් දුරුවනු පිණිස සමාදන් කරවයි. තෙමේ අයිනාදනින් දුරුවූයේ නො වෙයි. මෙරමා අයිනාදනින් දුරුවනු පිණිස සමාදන් කරවයි තෙමේ කාමයෙහි මිසහසරින් දුරුවූයේ නො වෙයි. මෙරමා කාමයෙහි මිසහසරින් දුරුවනු පිණිස සමාදන් කරවයි. තෙමේ මුසවායෙන් දුරුවූයේ නො වෙයි. මෙරමා මුසවායෙන් දුරුවනු පිණිස සමාදන් කරවයි. තෙමේ මද පමා දෙකට කරුණු වූ රහමෙරින් දුරු වූයේ නො වෙයි. මෙරමා මද පමා දෙකට කරුණු වූ රහමෙරින් දුරුවනු පිණිස සමාදන් කරවයි.

එවං ඛො භික්ඛවෙ පුග්ගලො පරහිතාය පටිපන්නො හොති නො අත්තහිතාය.

කථඤ්ච භික්ඛවෙ පුග්ගලො නෙවත්තහිතාය පටිපන්නො හොති නො පරහිතාය? ඉධ භික්ඛවෙ එකච්චො පුග්ගලො අත්තනා පාණාතිපාතා අප්පටිවිරතො හොති, නො පරං පාණාතිපාතා වෙරමණියා සමාදපෙති. -පෙ- අත්තනා සුරාමෙරයමජ්ජපමාදට්ඨානා අප්පටිවිරතො හොති, නො පරං සුරාමෙරයමජ්ජපමාදට්ඨානා වෙරමණියා සමාදපෙති. එවං ඛො භික්ඛවෙ පුග්ගලො නෙවත්තහිතාය පටිපන්නො හොති, නො පරහිතාය.

කථඤ්ච භික්ඛවෙ පුග්ගලො අත්තහිතාය ච පටිපන්නො හොති පරහිතාය ච? ඉධ භික්ඛවෙ එකච්චො පුග්ගලො අත්තනා ච පාණාතිපාතා පටිවිරතො හොති, පරඤ්ච පාණාතිපාතා වෙරමණියා සමාදපෙති. -පෙ- අත්තනා ච සුරාමෙරයමජ්ජපමාදට්ඨානා පටිවිරතො හොති, පරඤ්ච සුරාමෙරයමජ්ජපමාදට්ඨානා වෙරමණියා සමාදපෙති. එවං ඛො භික්ඛවෙ පුග්ගලො අත්තහිතාය ච පටිපන්නො හොති පරහිතාය ච.

ඉමෙ ඛො භික්ඛවෙ චත්තාරො පුග්ගලා සන්තො සංවිජ්ජමානා ලොකස්මින්ති.

### 4. 2. 5. 10.

### [ පොතලියසුත්තං ]

50. අථ ඛො **පොතලියො** පරිබ්බාජකො යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවතා සද්ධිං සම්මොදි. සම්මොදනීයං කථං සාරාණීයං[1] වීතිසාරෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නං ඛො පොතලියං පරිබ්බාජකං භගවා එතදවොච:

චත්තාරො'මෙ පොතලිය, පුග්ගලා සන්තො සංවිජ්ජමානා ලොකස්මිං. කතමෙ චත්තාරො?

ඉධ පොතලිය, එකච්චො පුග්ගලො අවණ්ණාරහස්ස අවණ්ණං භාසිතා හොති භූතං තච්ඡං කාලෙන, නො ච ඛො වණ්ණාරහස්ස වණ්ණං භාසිතා හොති භූතං තච්ඡං කාලෙන.

ඉධ පන පොතලිය, එකච්චො පුග්ගලො වණ්ණාරහස්ස වණ්ණං භාසිතා හොති භූතං තච්ඡං කාලෙන, නො ච ඛො අවණ්ණාරහස්ස අවණ්ණං භාසිතා හොති භූතං තච්ඡං කාලෙන.

ඉධ පන පොතලිය, එකච්චො පුග්ගලො නෙව අවණ්ණාරහස්ස අවණ්ණං භාසිතා හොති භූතං තච්ඡං කාලෙන, නොපි[2] වණ්ණාරහස්ස වණ්ණං භාසිතා හොති භූතං තච්ඡං කාලෙන.

---

1. සාරණීයං - මජ්ඣං  2. නොච - මජ්ඣං

මහණෙනි, මෙසේ පුද්ගල මෙරමාහට හිත පිණිස පිළිපන්නේ තමාට හිත පිණිස නො පිළිපන්නේ වෙයි.

මහණෙනි, කෙසේ පුද්ගල තමාට හිත පිණිස නො පිළිපන්නේ ම මෙරමාහට හිත පිණිස නො පිළිපන්නේත් වේ ද? මහණෙනි, මෙලොව ඇතැම් පුද්ගලයෙක් තෙමේ පණිවායෙන් දුරු නො වූයේ වෙයි, මෙරමා පණිවායෙන් දුරුවනු පිණිස සමාදන් නො කරවයි තෙමේ මද පමා දෙකට කරුණු වූ රහමෙරින් දුරු වූයේ නො වෙයි, මෙරමා මද පමා දෙකටකරුණු වූ රහමෙරින් දුරුවනු පිණිස සමාදන් නො කරවයි. මහණෙනි, මෙසේ පුද්ගල තමාට හිත පිණිස නො පිළිපන්නේ ම මෙරමාහට හිත පිණිසත් නො පිළිපන්නේ ය.

මහණෙනි, කෙසේ පුද්ගල තමාට හිත පිණිසත් මෙරමාහට හිත පිණිසත් පිළිපන්නේ වේ ද? මහණෙනි, මෙලොව ඇතැම් පුද්ගලයෙක් තෙමේත් පණිවායෙන් දුරු වූයේ වෙයි, මෙරමාත් පණිවායෙන් දුරුවනු පිණිස සමාදන් කරවයි ... තෙමේත් මද පමා දෙකට කරුණු වූ රහමෙරින් දුරු වූයේ වෙයි, මෙරමාත් මද පමා දෙකට කරුණු වූ රහමෙරින් දුරුවනු පිණිස සමාදන් කරවයි. මහණෙනි, මෙසේ පුද්ගල තමාට හිත පිණිසත් මෙරමා හට හිත පිණිසත් පිළිපන්නේ වෙයි.

මහණෙනි, මේ පුද්ගලයෝ සතරදෙන ලොකයෙහි විද්‍යමානයහ.

## 4. 2. 5. 10.

## [පොතලිය සූත්‍රය]

50. එසඳ පොතලිය පිරිවැජි භාග්‍යවතුන් වහන්සේ කරා එළඹියේ ය. එළඹ භාග්‍යවතුන් වහන්සේ සමග සතුටු විය. තුස්නට නිසි සිහිකරනුවට නිසි තෙපුල් කොට නිමවා එකත්පස් ව හිත. එකත්පස් ව හුන් පොතලිය පිරිවැජිහට භාග්‍යවතුන් වහන්සේ තෙල වදාළහ.

පොතලිය, මේ පුද්ගලයෝ සතර දෙනෙක් ලොකයෙහි විද්‍යමානයහ. කවර සතර දෙනෙක යත්:

පොතලිය, මෙ ලොව ඇතැම් පුද්ගලයෙක් යුක්තප්‍රාප්ත කාලයෙහි අවර්ණාර්හයාගේ විද්‍යමාන වූ තථ්‍ය වූ අවර්ණය කියන්නේ වේ. යුක්තප්‍රාප්ත කාලයෙහි වර්ණාර්හයාගේ විද්‍යමාන වූ තථ්‍ය වූ වර්ණය නො කියන්නේ වෙයි

පොතලිය, මෙලොව ඇතැම් පුද්ගලයෙක් නිසි කාලයෙහි වර්ණාර්හයාගේ භූත වූ තථ්‍ය වූ වර්ණය කියන්නේ වේ. නිසි කාලයෙහි අවර්ණාර්හයාගේ විද්‍යමාන වූ තථ්‍ය වූ අගුණ නො කියන්නේ වෙයි.

පොතලිය, මෙලොව ඇතැම් පුද්ගලයෙක් නිසි කාලයෙහි අවර්ණාර්හයාගේ විද්‍යමාන වූ තථ්‍ය වූ අගුණ, නො කියන්නේ වෙයි. නිසි කාලයෙහි වර්ණාර්හයාගේ විද්‍යමාන වූ තථ්‍ය වූ වර්ණය නො කියන්නේත් වෙයි.

ඉධ පන පොතලිය, එකච්චො පුග්ගලො අවණ්ණාරහස්ස ච අවණ්ණං භාසිතා හොති භූතං තච්ඡං කාලෙන, වණ්ණාරහස්ස ච වණ්ණං භාසිතා හොති භූතං තච්ඡං කාලෙන.

ඉමෙ ඛො පොතලිය, චත්තාරො පුග්ගලා සන්තො සංවිජ්ජමානා ලොකස්මිං.

ඉමෙසං ඛො පොතලිය, චතුන්නං පුග්ගලානං කතමො තෙ පුග්ගලො ඛමති අභික්කන්තතරො ච පණීතතරො චාති?

චත්තාරො'මෙ භො ගොතම, පුග්ගලා සන්තො සංවිජ්ජමානා ලොකස්මිං. කතමෙ චත්තාරො?

ඉධ භො ගොතම, එකච්චො පුග්ගලො අවණ්ණාරහස්ස අවණ්ණං භාසිතා හොති භූතං තච්ඡං කාලෙන, නො ච ඛො වණ්ණාරහස්ස වණ්ණං භාසිතා හොති භූතං තච්ඡං කාලෙන.

ඉධ පන භො ගොතම, එකච්චො පුග්ගලො වණ්ණාරහස්ස වණ්ණං භාසිතා හොති භූතං තච්ඡං කාලෙන, නො ච ඛො අවණ්ණාරහස්ස අවණ්ණං භාසිතා හොති භූතං තච්ඡං කාලෙන.

ඉධ පන භො ගොතම, එකච්චො පුග්ගලො නෙව අවණ්ණාරහස්ස අවණ්ණං භාසිතා හොති භූතං තච්ඡං කාලෙන, නොපි වණ්ණාරහස්ස ච වණ්ණං භාසිතා හොති භූතං තච්ඡං කාලෙන.

ඉධ පන භො ගොතම, එකච්චො පුග්ගලො අවණ්ණාරහස්ස ච අවණ්ණං භාසිතා හොති භූතං තච්ඡං කාලෙන, වණ්ණාරහස්ස ච වණ්ණං භාසිතා හොති භූතං තච්ඡං කාලෙන.

ඉමෙ ඛො භො ගොතම, චත්තාරො පුග්ගලා සන්තො සංවිජ්ජමානා ලොකස්මිං.

ඉමෙසං භො ගොතම, චතුන්නං පුග්ගලානං ය්වායං පුග්ගලො නෙව අවණ්ණාරහස්ස අවණ්ණං භාසිතා හොති භූතං තච්ඡං කාලෙන, නොපි වණ්ණාරහස්ස ච වණ්ණං භාසිතා හොති භූතං තච්ඡං කාලෙන. අයං මෙ පුග්ගලො ඛමති ඉමෙසං චතුන්නං පුග්ගලානං අභික්කන්තතරො ච පණීත-තරො ච. තං කිස්ස හෙතු? අභික්කන්තා හෙසා භො ගොතම යදිදං උපෙක්ඛාති.

චත්තාරො'මෙ පොතලිය, පුග්ගලා සන්තො සංවිජ්ජමානා ලොකස්මිං. කතමෙ චත්තාරො?

ඉධ පන පොතලිය එකච්චො පුග්ගලො අවණ්ණාරහස්ස අවණ්ණං භාසිතා හොති භූතං තච්ඡං කාලෙන. -පෙ- වණ්ණාරහස්ස ච වණ්ණං භාසිතා හොති භූතං තච්ඡං කාලෙන ඉමෙ ඛො පොතලිය චත්තාරො පුග්ගලා සන්තො සංවිජ්ජමානා ලොකස්මිං.

ඉමෙසං ඛො පොතලිය, චතුන්නං පුග්ගලානං ය්වායං පුග්ගලො අවණ්ණාරහස්ස ච අවණ්ණං භාසිතා හොති භූතං තච්ඡං කාලෙන, වණ්ණාරහස්ස ච වණ්ණං භාසිතා හොති භූතං තච්ඡං කාලෙන. අයං ඉමෙසං චතුන්නං පුග්ගලානං අභික්කන්තතරො ච පණීතතරො ච. තං කිස්ස හෙතු? අභික්කන්තා හෙසා පොතලිය යදිදං තත්ථ තත්ථ කාලඤ්ඤුතාති.

පෝතලිය, මෙලොව ඇතැම් පුද්ගලයෙක් නිසි කාලයෙහි අවර්ණාර්හයාගේ විද්‍යමාන වූ තථ්‍ය වූ අගුණ කියන්නේ වෙයි. නිසි කාලයෙහි වර්ණාර්හයාගේ විද්‍යමාන වූ තථ්‍ය වූ වර්ණය කියන්නේ වෙයි.

පෝතලිය, මේ සතර පුද්ගලයෝ ලෝකයෙහි විද්‍යමානයහ.

පෝතලිය, මේ සතර පුද්ගලයන් අතුරෙන් කවර පුද්ගලයෙක් කල්‍යාණ-තරය යි, උත්තමතරය යි, තට රුස්නේ ද?

භවත් ගෞතමයන් වහන්ස, මේ සතර පුද්ගල කොතෙක් ලෝකයෙහි විද්‍යමානයහ. කවර සතර කොතෙක යත්:

භවත් ගෞතමයන් වහන්ස, මෙලොව ඇතැම් පුද්ගලයෙක් නිසි කාලයෙහි අවර්ණාර්හයාගේ විද්‍යමාන වූ තථ්‍ය වූ අගුණ කියන්නේ වෙයි. නිසි කාලයෙහි වර්ණාර්හයාගේ විද්‍යමාන වූ තථ්‍ය වූ වර්ණය නො කියන්නේ වෙයි.

භවත් ගෞතමයන් වහන්ස, මෙලොව ඇතැම් පුද්ගලයෙක් නිසි කාලයෙහි වර්ණාර්හයාගේ භූත වූ තථ්‍ය වූ වර්ණය කියන්නේ ය. නිසි කාලයෙහි අවර්ණාර්හයාගේ භූත වූ තථ්‍ය වූ අවර්ණය නො කියන්නේ වෙයි.

භවත් ගෞතමයන් වහන්ස, මෙලොව ඇතැම් පුද්ගලයෙක් නිසි කාලයෙහි අවර්ණාර්හයාගේ භූත වූ තථ්‍ය වූ අවර්ණය නො කියන්නේ වෙයි. නිසි කාලයෙහි වර්ණාර්හයාගේ භූත වූ තථ්‍ය වූ වර්ණය නො කියන්නේත් වෙයි.

භවත් ගෞතමයන් වහන්ස, මෙලොව ඇතැම් පුද්ගලයෙක් නිසි කාල-යෙහි අවර්ණාර්හයාගේ විද්‍යමාන වූ තථ්‍ය වූ අගුණ කියන්නේ වෙයි. නිසි කාලයෙහි වර්ණාර්හයාගේ විද්‍යමාන වූ තථ්‍ය වූ වර්ණය කියන්නේත් වෙයි.

භවත් ගෞතමයන් වහන්ස, මේ පුද්ගලයෝ සතර දෙනෙක් ලෝකයෙහි විද්‍යමානයහ.

භවත් ගෞතමයන් වහන්ස, මේ සතර පුද්ගලන් අතුරින් යම් පුද්ගල-යෙක් යුක්තප්‍රාප්ත කාලයෙහි අවර්ණාර්හයාගේ විද්‍යමාන වූ තථ්‍ය වූ අවර්ණය නො කියන්නේ වේ ද, නිසි කාලයෙහි වර්ණාර්හයාගේ භූත වූ තථ්‍ය වූ වර්ණය නො කියන්නේ වේ ද, මේ පුද්ගල මේ සතර පුද්ගලන් අතුරින් කල්‍යාණ-තර යයි ද උත්තමතර යයි ද මට රුස්නේ ය, ඒ කවරහෙයින යත්: භවත් ගෞතමයන් වහන්ස, යම් මධ්‍යස්ථතායෙක් ඇද්ද, තෙල යුක්තතර ය.

පොතලිය, මේ පුද්ගලයෝ සතර දෙනෙක් ලොකයෙහි විද්‍යමානයහ. කවර සතර දෙනෙක යත්:

පොතලිය, මෙ ලොව ඇතැම් පුද්ගලයෙක් යුක්තප්‍රාප්ත කාලයෙහි අවර්ණාර්හයාගේ විද්‍යමානවූ තථ්‍යවූ අවර්ණය කියන්නේවේ .... යුක්තප්‍රාප්ත කාලයෙහි වර්ණාර්හයාගේ විද්‍යමාන වූ තථ්‍යවූ වර්ණය කියන්නේ වේ. පොතලිය, මේ සතර පුද්ගලයෝ ලොකයෙහි විද්‍යමානයහ.

පොතලිය, මේ සතර පුද්ගලයන් අතුරින් යම් පුද්ගලයෙක් නිසි කාලයෙහි අවර්ණාර්හයාගේ භූත වූ තථ්‍ය වූ අවර්ණය කියන්නේ වේ ද, නිසි කාලයෙහි වර්ණාර්හයාගේ විද්‍යමාන වූ සත්‍ය වූ වර්ණය කියන්නේ වේ ද, මෙ තෙම මේ සතර පුද්ගලන් අතුරින් කල්‍යාණතර ද උත්තමතර ද වෙයි. ඒ කවර හෙයින යත්: පොතලිය, ඒ ඒ කරුණෙහි කල් දන්නා බවෙක් ඇද්ද, තෙල කල්‍යාණතර වෙයි.

චත්තාරො'මෙ භො ගොතම පුග්ගලා සන්තො සංවිජ්ජමානා ලොකස්මිං. කතමෙ චත්තාරො?

ඉධ භො ගොතම එකච්චො පුග්ගලො අවණ්ණාරහස්ස–පෙ– වණ්ණා–රහස්ස ච වණ්ණං භාසිතා හොති භූතං තච්ඡං කාලෙන.

ඉමෙ ඛො භො ගොතම චත්තාරො පුග්ගලා සන්තො සංවිජ්ජමානා ලොකස්මිං.

ඉමෙසං භො ගොතම, චතුන්නං පුග්ගලානං ය්වායං පුග්ගලො අවණ්ණාරහස්ස ච අවණ්ණං භාසිතා භූතං තච්ඡං කාලෙන, වණ්ණාරහස්ස ච වණ්ණං භාසිතා භූතං තච්ඡං කාලෙන, අයං මෙ පුග්ගලො ඛමති ඉමෙසං චතුන්නං පුග්ගලානං අභික්කන්තතරො ච පණීතතරො ච. තං කිස්ස හෙතු? අභික්කන්තා හෙසා භො ගොතම යදිදං තත්ථ තත්ථ කාලඤ්ඤුතාති.

අභික්කන්තං භො ගොතම, අභික්කන්තං භො ගොතම. සෙය්‍යථාපි භො ගොතම, නික්කුජ්ජිතං වා උක්කුජ්ජෙය්‍ය, පටිච්ඡන්නං වා විවරෙය්‍ය, මූළ්හස්ස වා මග්ගං ආචික්ඛෙය්‍ය, අන්ධකාරෙ වා තෙලපජ්ජොතං ධාරෙය්‍ය චක්ඛුමන්තො රූපානි දක්ඛින්තීති, එවමෙව භොතා ගොතමෙන අනෙක–පරියායෙන ධම්මො පකාසිතො. එසාහං භගවන්තං ගොතමං සරණං ගච්ඡාමි ධම්මං ච භික්ඛුසඞ්ඝං ච. උපාසකං මං භවං ගොතමො ධාරෙතු අජ්ජතග්ගෙ පාණුපෙතං සරණං ගතන්ති.

**අසුරවග්ගො පඤ්චමො.**

**තස්සුද්දානං:–**

අසුරො තයො සමාධි ඡවාලාතෙන පඤ්චමං,
රාගානං සන්ති අත්තහිතාය සික්ඛපොතලිකෙන චා ති.

**දුතියො පණ්ණාසකො නිට්ඨිතො.**

භවත් ගෞතමයන් වහන්ස, මේ පුද්ගලයෝ සතර දෙනෙක් ලෝකයෙහි විද්‍යමානයහ. කවර සතර දෙනෙක යත්:

භවත් ගෞතමයන් වහන්ස, මෙලොව ඇතැම් පුද්ගලයෙක් යුක්තප්‍රාප්ත කාලයෙහි අවර්ණාර්හයාගේ ... යුක්තප්‍රාප්තකාලයෙහි වර්ණාර්හයාගේ විද්‍යමාන වූ තථ්‍ය වූ වර්ණය කියන්නේ වේ, භවත් ගෞතමයන් වහන්ස, මේ සතර පුද්ගලයෝ ලෝකයෙහි විද්‍යමානයහ.

භවත් ගෞතමයන් වහන්ස, මේ සතර පුද්ගලයන් අතුරින් යම් පුද්ගලයෙක් නිසි කාලයෙහි අවර්ණාර්හයාගේ විද්‍යමාන වූ සත්‍ය වූ අවර්ණය කියන්නේ වේ ද, නිසි කාලයෙහි වර්ණාර්හයාගේ විද්‍යමාන වූ සත්‍ය වූ වර්ණය කියන්නේ වේ ද, මේ පුද්ගල මේ සතර පුද්ගලයන් අතුරින් කල්‍යාණතර යයි ද, උත්තමතර යයි ද මට රුස්නේ ය. ඒ කවර හෙයින යත්: භවත් ගෞතමයන් වහන්ස, ඒ ඒ කරුණෙහි යම් මේ කල් දන්නා බවෙක් වේ ද, තෙල කල්‍යාණ ය.

භවත් ගෞතමයන් වහන්ස, ඉතලි. භවත් ගෞතමයන් වහන්ස, ඉතලි. භවත් ගෞතමයන් වහන්ස, යම් පරිදි යටිහුරු කළ දැයක් උඩුහුරු කරන්නේ වේ ද, පිළිසත් දැයක් විවර කරන්නේ හෝ වේ ද, මංමුළා වූවකුට මග පා කියන්නේ හෝ වේ ද, ඇස් ඇත්තෝ රූ දක්නාහ යි අඳුරුහෙි තෙල් පහනක් හෝ දල්වන්නේ වේ ද, එපරිදි ම භවත් ගෞතම-යන් වහන්සේ විසින් නන්නියරින් ධර්මය ප්‍රකාශිත ය. තෙල මම භගවත් ගෞතමයන් වහන්සේ හා ධර්මය හා භික්සඟුන් හා සරණ කොට යෙමි. භවත් ගෞතමයන් වහන්සේ මා දිවියෙන් සරණ ගිය උපාසකයකු කොට දරණ සේක් වා.

## අසුරවර්ගය පස්වනු.

එහි උද්දානය:

අසුර සූත්‍රය, සමාධිසූත්‍ර තුනය, පස්වන ඡවාලාත සූත්‍රය, රාගවිනය සූත්‍රය, ඛිප්පනිසන්ති සූත්‍රය, අත්තහිත සූත්‍රය, සික්ඛාපද සූත්‍රය, පොතලික (=පොතලිය) සූත්‍රය දැයි දසයෙකි.

## දෙවන පණ්ණාසකය නිමි.

---

### 3. තතියො පණ්ණාසකො

## 1. වලාහකවග්ගො

### 4. 3. 1. 1

### [පඨමවලාහකසුත්තං]

1. එකං සමයං භගවා **සාවත්ථියං** විහරති **ජේතවනෙ** අනාථපිණ්ඩිකස්ස ආරාමෙ. තත්‍ර ඛො භගවා භික්ඛූ ආමන්තෙසි භික්ඛවොති. භදන්තෙති තෙ භික්ඛූ භගවතො පච්චස්සොසුං. භගවා එතදවොච:

චත්තාරොමෙ භික්ඛවෙ වලාහකා. කතමෙ චත්තාරො?

ගජ්ජිතා නො වස්සිතා, වස්සිතා නො ගජ්ජිතා, නෙව ගජ්ජිතා නො වස්සිතා, ගජ්ජිතා ච වස්සිතා ච. ඉමෙ ඛො භික්ඛවෙ චත්තාරො වලාහකා.

එවමෙව ඛො භික්ඛවෙ චත්තාරො'මෙ වලාහකූපමා පුග්ගලා සන්තො සංවිජ්ජමානා ලොකස්මිං. කතමෙ චත්තාරො?

ගජ්ජිතා නො වස්සිතා, වස්සිතා නො ගජ්ජිතා, නෙව ගජ්ජිතා නො වස්සිතා, ගජ්ජිතා ච වස්සිතා ච.

කථඤ්ච භික්ඛවෙ පුග්ගලො ගජ්ජිතා හොති නො වස්සිතා? ඉධ භික්ඛවෙ එකච්චො පුග්ගලො භාසිතා හොති නො කත්තා. එවං ඛො භික්ඛවෙ පුග්ගලො ගජ්ජිතා හොති නො වස්සිතා. සෙය්‍යථාපි සො භික්ඛවෙ වලාහකො ගජ්ජිතා නො වස්සිතා, තථූපමාහං භික්ඛවෙ ඉමං පුග්ගලං වදාමි.

කථඤ්ච භික්ඛවෙ පුග්ගලො වස්සිතා හොති නො ගජ්ජිතා? ඉධ භික්ඛවෙ එකච්චො පුග්ගලො කත්තා හොති නො භාසිතා. එවං ඛො භික්ඛවෙ පුග්ගලො වස්සිතා හොති නො ගජ්ජිතා. සෙය්‍යථාපි සො භික්ඛවෙ වලාහකො වස්සිතා නො ගජ්ජිතා, තථූපමාහං භික්ඛවෙ ඉමං පුග්ගලං වදාමි.

කථඤ්ච භික්ඛවෙ පුග්ගලො නෙව ගජ්ජිතා හොති නො වස්සිතා? ඉධ භික්ඛවෙ එකච්චො පුග්ගලො නෙව භාසිතා හොති නො කත්තා. එවං ඛො භික්ඛවෙ පුග්ගලො නෙව ගජ්ජිතා හොති නො වස්සිතා. සෙය්‍යථාපි සො භික්ඛවෙ වලාහකො නෙව ගජ්ජිතා හොති නො වස්සිතා, තථූපමාහං භික්ඛවෙ ඉමං පුග්ගලං වදාමි.

3. තෙවන පණ්ණාසකය

# 1. වලාහක වර්ගය

## 4. 3. 1. 1.

### [ පඨමවලාහක සූත්‍රය ]

1. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර සමීපයෙහි ජේතවන නම් අනේපිඬු සිටුහුගේ ආරාමයෙහි වැඩවසන සේක. එකල්හි භාග්‍යවතුන් වහන්සේ මහණෙනි, යි භික්‍ෂූන් ඇමැතූ සේක. වහන්සැ යි ඒ භික්‍ෂූහු භාග්‍යවතුන් වහන්සේට පිළිවදන් ඇස්වූහ. භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළහ:

මහණෙනි, මේ වලාහකයෝ සතර දෙනෙකි. කවර සතර දෙනෙක යත්:

ගිගිරි ඇත්තේ නොවස්නේය. වස්නේ ගිගිරි නැත්තේය. ගිගිරි ද නැත්තේ වැසි ද නැත්තේ ය. ගිගිරි ද ඇත්තේ වැසි ද ඇත්තේ ය. මහණෙනි, මේ සතර වලාවෝ ය.

මහණෙනි, එපරිදි ම වලා බඳු මේ පුද්ගලයෝ සතර දෙනෙක් ලොකයෙහි විද්‍යමානයහ. කවර සතර දෙනෙක යත්:

ගිගිරි ඇත්තේ නොවස්නේය. වස්නේ ගිගිරි නැත්තේ ය. ගිගිරි ද නැත්තේ වැසි ද නැත්තේ ය. ගිගිරි ද ඇත්තේ වැසි ද ඇත්තේ යි.

මහණෙනි, කෙසේ පුද්ගල ගිගිරි ඇත්තේ නොවස්නේ වේ ද? මහණෙනි, මෙලොව ඇතැම් පුද්ගලයෙක් (මෙ ද මෙ ද කරමි යි) බණන්නේත් නො කරන්නේය මහණෙනි, මෙසේ පුද්ගල ගුගුරනුයේ නො වස්නේ නම් වෙයි. මහණෙනි, යම් පරිදි ඒ වලාහක ගිගිරි කරන්නේ නො වස්නේ වේ ද, මහණෙනි, මම මේ පුද්ගලයා එබඳු උපමා ඇත්තෙකැ යි කියමි.

මහණෙනි, කෙසේ පුද්ගල වර්‍ෂා කරන්නේ ගිගුරුම් නො කරන්නේ වේ ද? මහණෙනි, මෙ ලොව ඇතැම් පුද්ගලයෙක් (නො බැණ ම ඒ ඒ දය) කරන්නේ වෙයි. බණන්නේ නො වෙයි. මහණෙනි, මෙ පරිදි පුද්ගල වර්‍ෂා කරන්නේ ගිගුරුම් නො කරන්නේ නම් වෙයි. මහණෙනි, යම් පරිදි ඒ වලාහක වර්‍ෂා කරන්නේ ගිගිරි නො කරන්නේ වේ ද, මහණෙනි, මේ පුද්ගලයා මම එබඳු උපමා ඇති කොට කියමි.

මහණෙනි, කෙසේ පුද්ගල ගිගිරි නො කරන්නේත්, වර්‍ෂා නො කරන්නේත් වේ ද? මහණෙනි, මෙලොව ඇතැම් පුද්ගලයෙක් නො කියන්නේ ම නො කරන්නේත් වෙයි. මහණෙනි, මෙසේ පුද්ගල ගිගිරි නො කරන්නේ ම වර්‍ෂා නො කරන්නේ ද වෙයි. මහණෙනි, යම් පරිදි වලාහක ගිගිරි නො කරන්නේ ම වර්‍ෂා නො කරන්නේත් වේ ද, මහණෙනි, මම මේ පුද්ගලයා එබඳු උපමා ඇත්තෙකැ යි කියමි.

කථඤ්ච භික්ඛවෙ පුග්ගලො ගජ්ජිතා ච හොති වස්සිතා ච? ඉධ භික්ඛවෙ එකච්චො පුග්ගලො භාසිතා ච හොති කත්තා ච. එවං ඛො භික්ඛවෙ පුග්ගලො ගජ්ජිතා ච හොති වස්සිතා ච. සෙය්‍යථාපි සො භික්ඛවෙ වලාහකො ගජ්ජිතා ච වස්සිතා ච, තථූපමාහං භික්ඛවෙ ඉමං පුග්ගලං වදාමි.

ඉමෙ ඛො භික්ඛවෙ චත්තාරො වලාහකූපමා පුග්ගලා සන්තො සංවිජ්ජ-මානා ලොකස්මින්ති.

## 4. 3. 1. 2

## [දුතියවලාහකසුත්තං]

2. චත්තාරො'මෙ භික්ඛවෙ වලාහකා. කතමෙ චත්තාරො?

ගජ්ජිතා නො වස්සිතා, වස්සිතා නො ගජ්ජිතා, නෙව ගජ්ජිතා නො වස්සිතා, ගජ්ජිතා ච වස්සිතා ච. ඉමෙ ඛො භික්ඛවෙ චත්තාරො වලාහකා. එවමෙව ඛො භික්ඛවෙ චත්තාරො'මෙ වලාහකූපමා පුග්ගලා සන්තො සංවිජ්ජමානා ලොකස්මිං. කතමෙ චත්තාරො?

ගජ්ජිතා නො වස්සිතා, වස්සිතා නො ගජ්ජිතා, නෙව ගජ්ජිතා නො වස්සිතා, ගජ්ජිතා ච වස්සිතා ච.

කථඤ්ච භික්ඛවෙ පුග්ගලො ගජ්ජිතා හොති නො වස්සිතා? ඉධ භික්ඛවෙ එකච්චො පුග්ගලො ධම්මං පරියාපුණාති: සුත්තං ගෙය්‍යං වෙය්‍යාකරණං ගාථං උදානං ඉතිවුත්තකං ජාතකං අබ්භුතධම්මං වෙදල්ලං. සො ඉදං දුක්ඛන්ති යථාභූතං නප්පජානාති. අයං දුක්ඛසමුදයොති යථාභූතං නප්පජානාති. අයං දුක්ඛනිරොධොති යථාභූතං නප්පජානාති. අයං දුක්ඛ-නිරොධගාමිනී පටිපදාති යථාභූතං නප්පජානාති. එවං ඛො භික්ඛවෙ පුග්ගලො ගජ්ජිතා හොති නො වස්සිතා. සෙය්‍යථාපි සො භික්ඛවෙ වලාහකො ගජ්ජිතා නො වස්සිතා, තථූපමාහං භික්ඛවෙ ඉමං පුග්ගලං වදාමි.

කථඤ්ච භික්ඛවෙ පුග්ගලො වස්සිතා හොති නො ගජ්ජිතා? ඉධ භික්ඛවෙ එකච්චො පුග්ගලො නෙව ධම්මං පරියාපුණාති: සුත්තං ගෙය්‍යං වෙය්‍යාකරණං ගාථං උදානං ඉතිවුත්තකං ජාතකං අබ්භුතධම්මං වෙදල්ලං. සො ඉදං දුක්ඛන්ති යථාභූතං පජානාති -පෙ- අයං දුක්ඛනිරොධගාමිනී පටිපදාති යථාභූතං පජානාති. එවං ඛො භික්ඛවෙ පුග්ගලො වස්සිතා හොති නො ගජ්ජිතා. සෙය්‍යථාපි සො භික්ඛවෙ වලාහකො වස්සිතා නො ගජ්ජිතා, තථූපමාහං භික්ඛවෙ ඉමං පුග්ගලං වදාමි.

මහණෙනි, කෙසේ පුද්ගල ගුගුරන්නේත් වස්නේත් වේ ද? මහණෙනි, මෙලොව ඇතැම් පුද්ගලයෙක් බණන්නේත් කරන්නේත් වෙයි. මහණෙනි, මෙසේ පුද්ගල ගුගුරන්නේත් වස්නේත් වෙයි. මහණෙනි, යම් පරිදි ඒ වලාහක ගුගුරන්නේත් වස්නේත් වේ ද, මහණෙනි, මම මේ පුද්ගලයා එබඳු උපමා ඇති කොට කියමි.

මහණෙනි, මේ සතර වැදෑරුම් වලාහකූපම පුද්ගලයෝ ලොකයෙහි විද්‍යමානයහ.

## 4. 3. 1. 2.

## [දුතියවලාහක සූත්‍රය]

2. මහණෙනි, මේ වලාහකයෝ සතර දෙනෙකි. කවර සතර දෙනෙක යත්:

ගිගිරි කරන්නේ වැසි නො කරන්නේය. වැසි නො කරන්නේ ගිගිරි කරන්නේ ය. ගිගිරි නො කරන්නේ වැසි ද නො කරන්නේ ය. ගිගිරි කරන්නේ වැසි ද කරන්නේ යි. මහණෙනි, මේ සතර වලාහකයෝ ය.

මහණෙනි, එපරිදි ම මේ වලාහකූපම පුද්ගලයෝ සතර දෙනෙක් ලොකයෙහි විද්‍යමානය හ. කවර සතර දෙනෙක යත්:

ගිගිරි කරන්නේ වැසි නො කරන්නේ ය. වැසි කරන්නේ ගිගිරි නො කරන්නේ ය. ගිගිරි නො කරන්නේ ම වැසි ද නො කරන්නේ ය. ගිගිරි කරන්නේත් වැසි ද කරන්නේ යි.

මහණෙනි, කෙසේ පුද්ගල ගිගිරි කරන්නේ වැසි නො කරන්නේ වේ ද? මහණෙනි, මෙලොව ඇතැම් පුද්ගලයෙක් සූත්‍ර, ගෙය්‍ය, වෙය්‍යාකරණ, ගාථා, උදාන, ඉතිවුත්තක, ජාතක, අබ්භූතධම්ම, වෙදල්ල යන පෙළදහම් හදාරයි. හේ "මේ දුකැ"යි තත් වූ පරිදි නො දන්නේ ය. "මේ දුඃඛසමුදය"යි, තත් වූ පරිදි නො දන්නේ ය. "මේ දුඃඛනිරොධය"යි තත්වූ පරිදි නො දන්නේය. "මේ දුඃඛනිරොධගාමිනී ප්‍රතිපදාය" යි තත් වූ පරිදි නො දන්නේ ය. මහණෙනි, මෙසේ පුද්ගල ගිගිරි කරන්නේ වැසි නො කරන්නේ ය. මහණෙනි, යම් පරිදි වලාහක ගිගිරි කරන්නේ වැසි නො කරන්නේ වේ ද, මහණෙනි, මම මේ පුද්ගලයා එබඳු උපමා ඇත්තෙකැ යි කියමි.

මහණෙනි, කෙසේ පුද්ගල වැසි කරන්නේ ගිගිරි නො කරන්නේ වේ ද? මහණෙනි, මෙලොව ඇතැම් පුද්ගලයෙක් සූත්‍ර, ගෙය්‍ය, වෙය්‍යාකරණ, ගාථා, උදාන, ඉතිවුත්තක, ජාතක, අබ්භූතධම්ම, වෙදල්ල යන පෙළදහම් නොහදාරනුයේ වෙයි. හෙතෙම "මේ දුකැ" යි තත් වූ පරිදි දනී ... "මේ දුඃඛනිරොධගාමිනී ප්‍රතිපදාය" යි තත් වූ පරිදි දනී. මහණෙනි, මෙසේ පුද්ගල වැසි කරන්නේ ගිගිරි නො කරන්නේ වෙයි. මහණෙනි, යම් පරිදි ඒ වලාහක වැසි කරන්නේ ගිගිරි නො කරන්නේ වේ ද, මහණෙනි, මම මේ පුද්ගලයා එබඳු උපමා ඇත්තෙකැ යි කියමි.

කථඤ්ච භික්ඛවෙ පුග්ගලො නෙව ගජ්ජිතා හොති නො වස්සිතා? ඉධ භික්ඛවෙ එකච්චො පුග්ගලො ධම්මං න පරියාපුණාති: සුත්තං ගෙය්‍යං වෙය්‍යාකරණං ගාථං උදානං ඉතිවුත්තකං ජාතකං අබ්භුතධම්මං වෙදල්ලං. සො ඉදං දුක්ඛන්ති යථාභූතං නප්පජානාති -පෙ- අයං දුක්ඛනිරොධගාමිනී පටිපදාති යථාභූතං නප්පජානාති. එවං ඛො භික්ඛවෙ පුග්ගලො නෙව ගජ්ජිතා හොති නො වස්සිතා. සෙය්‍යථාපි සො භික්ඛවෙ වලාහකො නෙව ගජ්ජිතා නො වස්සිතා, තථූපමාහං භික්ඛවෙ ඉමං පුග්ගලං වදාමි.

කථඤ්ච භික්ඛවෙ පුග්ගලො ගජ්ජිතා ච හොති වස්සිතා ච? ඉධ භික්ඛවෙ එකච්චො පුග්ගලො ධම්මං පරියාපුණාති: සුත්තං ගෙය්‍යං වෙය්‍යාකරණං ගාථං උදානං ඉතිවුත්තකං ජාතකං අබ්භුතධම්මං වෙදල්ලං. සො ඉදං දුක්ඛන්ති යථාභූතං පජානාති -පෙ- අයං දුක්ඛනිරොධගාමිනී පටිපදාති යථාභූතං පජානාති. එවං ඛො භික්ඛවෙ පුග්ගලො ගජ්ජිතා ච හොති වස්සිතා ච. සෙය්‍යථාපි සො භික්ඛවෙ වලාහකො ගජ්ජිතා ච වස්සිතා ච, තථූපමාහං භික්ඛවෙ ඉමං පුග්ගලං වදාමි.

ඉමෙ ඛො භික්ඛවෙ චත්තාරො වලාහකූපමා පුග්ගලා සන්තො සංවිජ්ජමානා ලොකස්මින්ති.

4. 3. 1. 3

[කුම්භසුත්තං]

3. චත්තාරො'මෙ භික්ඛවෙ කුම්භා. කතමෙ චත්තාරො?

තුච්ඡො පිහිතො, පූරො විවටො, තුච්ඡො විවටො, පූරො පිහිතො. ඉමෙ ඛො චත්තාරො කුම්භා.

එවමෙව ඛො භික්ඛවෙ චත්තාරො'මෙ කුම්භූපමා පුග්ගලා සන්තො සංවිජ්ජමානා ලොකස්මිං. කතමෙ චත්තාරො?

තුච්ඡො පිහිතො, පූරො විවටො, තුච්ඡො විවටො, පූරො පිහිතො.

මහණෙනි, කෙසේ පුද්ගල ගිගිරි නො කරන්නේ ම වැසි නො කරන්නේ වේ ද? මහණෙනි, මෙලොව ඇතැම් පුද්ගලයෙක් සුත්ත, ගෙය්‍ය, වෙය්‍යාකරණ, ගාථා, උදාන, ඉතිවුත්තක, ජාතක, අබ්භුතධම්ම, වෙදල්ල, යන පෙළදහම් නොහදාරයි. හේ "මේ දුකැ" යි තත් වූ පරිදි නො දනී ... "මේ දුඃඛ-නිරොධගාමිනී ප්‍රතිපදාය ය" යි තත් වූ පරිදි නො දනී. මහණෙනි, මෙසේ පුද්ගල ගිගිරි නො කරන්නේ ම වැසි ද නො කරන්නේ ය. මහණෙනි, යම් පරිදි ඒ වලාහක ගිගිරි නො කරන්නේ ම වැසි ද නො කරන්නේ වේ ද, මහණෙනි, මම මේ පුද්ගලයා එබඳු උපමා ඇත්තෙකැ යි කියමි.

මහණෙනි, කෙසේ නම් පුද්ගල ගිගිරි කරන්නේත් වැසි කරන්නේත් වේ ද? මහණෙනි, මෙලොව ඇතැම් පුද්ගලයෙක් සුත්ත, ගෙය්‍ය, වෙය්‍යාකරණ, ගාථා, උදාන, ඉතිවුත්තක, ජාතක, අබ්භුතධම්ම, වෙදල්ල යන පෙළදහම් හදාරයි. හේ "මේ දුකැ" යි තත්වූ පරිදි දනී ... "මේ දුක්ඛනිරොධගාමිනී පටිපදා" යි තත් වූ පරිදි දනී. මහණෙනි, මෙසේ පුද්ගල ගිගිරි කරන්නේත් වැසි කරන්නේත් වෙයි. මහණෙනි, යම් පරිදි ඒ වලාහක ගුගුරන්නේත් වස්නේත් වේ ද, මහණෙනි, මම මේ පුද්ගලයා එබඳු උපමා ඇත්තෙකැ යි කියමි

මහණෙනි, මේ සතර වැදෑරුම් වලාහකූපම පුද්ගලයෝ ලෝකයෙහි විද්‍යමානයහ.

## 4. 3. 1. 3.

## [කුම්භ සූත්‍රය]

3. මහණෙනි, මේ කුම්භයෝ සතර දෙනෙකි. කවර සතර දෙනෙක යත්:

ඇතුළත හිස් වූ පිටත පියූ මූව ඇති එකෙක. ඇතුළත දිය පිරුණු නො පියූ මුව ඇති එකෙක. ඇතුළත හිස් වූ නො පියූ මූව ඇති එකෙක, ඇතුළත දිය පිරුණු පියූ මූව ඇති එකෙක. මේ සතර කුම්භයෝය.

මහණෙනි, එපරිදි ම මේ කුම්භොපම පුද්ගලයෝ සතර දෙනෙක් ලෝකයෙහි විද්‍යමානයහ. කවර සතර දෙනෙක යත්:

ඇතුළත හිස් වූ පියූ මූව ඇති එකෙක. ඇතුළත පිරුණු වළ කට ඇති එකෙක. ඇතුළත හිස් වූ වළ කට ඇති එකෙක. ඇතුළත පිරුණු පියූ කට ඇති එකෙක.

කථඤ්ච භික්ඛවෙ පුග්ගලො තුච්ඡො හොති පිහිතො? ඉධ භික්ඛවෙ එකච්චස්ස පුග්ගලස්ස පාසාදිකං හොති අභික්කන්තං පටික්කන්තං ආලොකිතං විලොකිතං සම්මිඤ්ජිතං පසාරිතං සඞ්ඝාටිපත්තචීවරධාරණං. සො ඉදං දුක්ඛන්ති යථාභූතං නප්පජානාති. අයං දුක්ඛසමුදයොති -පෙ- අයං දුක්ඛනිරොධොති -පෙ- අයං දුක්ඛනිරොධගාමිනී පටිපදාති යථාභූතං නප්පජානාති. එවං ඛො භික්ඛවෙ පුග්ගලො තුච්ඡො හොති පිහිතො. සෙය්‍යථාපි සො භික්ඛවෙ කුම්භො තුච්ඡො පිහිතො, තථූපමාහං භික්ඛවෙ ඉමං පුග්ගලං වදාමි.

කථඤ්ච භික්ඛවෙ පුග්ගලො පූරො හොති විවටො? ඉධ භික්ඛවෙ එකච්චස්ස පුග්ගලස්ස න පාසාදිකං හොති අභික්කන්තං පටික්කන්තං ආලොකිතං විලොකිතං සම්මිඤ්ජිතං පසාරිතං සඞ්ඝාටිපත්තචීවරධාරණං සො ඉදං දුක්ඛන්ති යථාභූතං පජානාති -පෙ- අයං දුක්ඛනිරොධගාමිනී පටිපදාති යථාභූතං පජානාති. එවං ඛො භික්ඛවෙ පුග්ගලො පූරො හොති විවටො. සෙය්‍යථාපි සො භික්ඛවෙ කුම්භො පූරො විවටො, තථූපමාහං භික්ඛවෙ ඉමං පුග්ගලං වදාමි.

කථඤ්ච භික්ඛවෙ පුග්ගලො තුච්ඡො හොති විවටො? ඉධ භික්ඛවෙ එකච්චස්ස පුග්ගලස්ස න පාසාදිකං හොති අභික්කන්තං පටික්කන්තං ආලොකිතං විලොකිතං සම්මිඤ්ජිතං පසාරිතං සඞ්ඝාටිපත්තචීවරධාරණං. සො ඉදං දුක්ඛන්ති යථාභූතං නප්පජානාති -පෙ- අයං දුක්ඛනිරොධගාමිනී පටිපදාති යථාභූතං නප්පජානාති. එවං ඛො භික්ඛවෙ පුග්ගලො තුච්ඡො හොති විවටො. සෙය්‍යථාපි සො භික්ඛවෙ කුම්භො තුච්ඡො විවටො, තථූපමාහං භික්ඛවෙ ඉමං පුග්ගලං වදාමි.

කථඤ්ච භික්ඛවෙ පුග්ගලො පූරො හොති පිහිතො? ඉධ භික්ඛවෙ එකච්චස්ස පුග්ගලස්ස පාසාදිකං හොති අභික්කන්තං පටික්කන්තං ආලොකිතං විලොකිතං සම්මිඤ්ජිතං පසාරිතං සඞ්ඝාටිපත්තචීවරධාරණං. සො ඉදං දුක්ඛන්ති යථාභූතං පජානාති -පෙ- අයං දුක්ඛනිරොධගාමිනී පටිපදාති යථාභූතං පජානාති. එවං ඛො භික්ඛවෙ පුග්ගලො පූරො හොති පිහිතො. සෙය්‍යථාපි සො භික්ඛවෙ කුම්භො පූරො පිහිතො, තථූපමාහං භික්ඛවෙ ඉමං පුග්ගලං වදාමි.

ඉමෙ ඛො භික්ඛවෙ චත්තාරො කුම්භූපමා පුග්ගලා සන්තො සංවිජ්ජමානා ලොකස්මින්ති.

මහණෙනි, කෙසේ පුද්ගල ඇතුළත හිස් වූයේ පියූ මුව ඇතියේ වේ ද? මහණෙනි, මෙ සස්නෙහි ඇතැම් පුද්ගලයකුගේ ඉදිරි යෑම, වටාලා ඊම, ඉදිරි බැලීම, ඔබමොබ බැලීම, අත්පා හැකිළීම, අත්පා දිග හැරීම, සඟළ පාසිවුරු ධැරීම ප්‍රසාද එළවන්නේ වෙයි. හේ "මේ දුකැ"යි තත්වූ පරිදි නො දනී "මේ දුක්ඛසමුදය"යි..."මේ දුක්ඛනිරොධය"යි... "මේ දුක්ඛනිරොධගාමිනී පටිපදා ය" යි තත් වූ පරිදි නො දනී. මහණෙනි, මෙසේ පුද්ගල ඇතුළත සිස් වූයේ පිටත පියූ මුව ඇතියේ වෙයි. මහණෙනි, යම් පරිදි ඒ කුම්භය ඇතුළත සිස් වූයේ පිටත පියූ මුව ඇතියේ වේ ද, මහණෙනි, මම මේ පුද්ගලයා එබඳු උපමා ඇතියෙකැ යි කියමි.

මහණෙනි, කෙසේ පුද්ගල ඇතුළත පිරුණේ පිටත වළ මුව ඇතියේ වේ ද? මහණෙනි, මෙසස්නෙහි ඇතැම් පුද්ගලයකුගේ ඉදිරි යෑම, පෙරළා ඊම, ඉදිරි බැලීම, ඔබමොබ බැලීම, අත්පා හැකිළීම, අත්පා දිග හැරීම, සඟළ පා සිවුරු ධැරීම ප්‍රසාද එළවන්නේ නො වෙයි. හේ "මේ දුකැ" යි තත්වූ පරිදි දනී ... "මේ දුඃඛනිරොධගාමිනී ප්‍රතිපදය"යි තත්වූ පරිදි දනී මහණෙනි, මෙසේ පුද්ගල ඇතුළත පිරුණේ පිටත විවෘත වූයේ වෙයි. මහණෙනි, යම් පරිදි ඒ කුම්භය ඇතුළත පිරුණේ පිටත විවෘත වූයේ වේ ද, මහණෙනි, මම මේ පුද්ගලයා එබඳු උපමා ඇතියෙකැයි කියමි.

මහණෙනි, කෙසේ පුද්ගල ඇතුළත සිස් වූයේ පිටත විවෘත වූයේ වේ ද? මහණෙනි, මෙසස්නෙහි ඇතැම් පුද්ගලයකුගේ ඉදිරි යෑම, පෙරළා ඊම, ඉදිරි බැලීම, ඔබමොබ බැලීම, අත්පා හැකිළීම, අත්පා දිගු කිරීම, සඟළ පාසිවුරු ධැරීම ප්‍රසාද එළවන්නේ නො වෙයි. හේ "මේ දුකැ"යි තත් වූ පරිදි නො දනී...."මේ දුඃඛනිරොධගාමිනී ප්‍රතිපදය"යි තත් වූ පරිදි නො දනී. මහණෙනි, මෙසේ පුද්ගල ඇතුළත සිස් වූයේ පිටත විවෘත වූයේ වෙයි. මහණෙනි, යම් පරිදි ඒ කුම්භය තෙමේ ඇතුළත හිස් වූයේ පිටත විවෘත වූයේ වේ ද, මහණෙනි, මම මේ පුද්ගල එබඳු උපමා ඇත්තෙකැ යි කියමි.

මහණෙනි, කෙසේ පුද්ගල ඇතුළත පිරුණේ පිටත පියූ මුව ඇතියේ වේ ද, මහණෙනි, මෙසස්නෙහි ඇතැම් පුද්ගලයකුගේ ඉදිරි යෑම, පෙරළා ඊම, ඉදිරි බැලීම, ඔබමොබ බැලීම, අත්පා හැකිළීම, අත්පා දිගු කිරීම, සඟළ පාසිවුරු ධැරීම ප්‍රසාද එළවන්නේ වෙයි. හේ 'මේ දුකැ'යි තත් වූ පරිදි දනී ... 'මේ දුඃඛනිරොධගාමිනී ප්‍රතිපදය'යි තත් වූ පරිදි දනී. මහණෙනි, මෙසේ පුද්ගල ඇතුළත පිරුණේ පිටත පියූ මුව ඇතියේ වෙයි. මහණෙනි, යම් පරිදි ඒ කුම්භය ඇතුළත පිරුණේ පිටත පියූ මුව ඇතියේ වේ ද, මහණෙනි, මම මේ පුද්ගලයා එබඳු උපමා ඇත්තෙකැ'යි කියමි.

මහණෙනි, මේ සතර වැදෑරුම් කුම්භොපම පුද්ගලයෝ ලොකයෙහි විද්‍යමානය හ.

## 4. 3. 1. 4.

## [ උදකරහදසුත්තං ]

4 චත්තාරො'මෙ භික්ඛවෙ උදකරහදා. කතමෙ චත්තාරො?

උත්තානො ගම්භීරොභාසො, ගම්භීරො උත්තානොභාසො, උත්තානො උත්තානොභාසො, ගම්භීරො ගම්භීරොභාසො. ඉමෙ ඛො භික්ඛවෙ චත්තාරො උදකරහදා.

එවමෙව ඛො භික්ඛවෙ චත්තාරො'මෙ උදකරහදූපමා පුග්ගලා සන්තො සංවිජ්ජමානා ලොකස්මිං. කතමෙ චත්තාරො?

උත්තානො ගම්භීරොභාසො, ගම්භීරො උත්තානොභාසො, උත්තානො උත්තානොභාසො, ගම්භීරො ගම්භීරොභාසො.

කථඤ්ච භික්ඛවෙ පුග්ගලො උත්තානො හොති ගම්භීරොභාසො? ඉධ භික්ඛවෙ එකච්චස්ස පුග්ගලස්ස පාසාදිකං හොති අභික්කන්තං පටික්කන්තං ආලොකිතං විලොකිතං සම්මිඤ්ජිතං පසාරිතං සඞ්ඝාටිපත්තචීවරධාරණං. සො ඉදං දුක්ඛන්ති යථාභූතං නප්පජානාති. අයං දුක්ඛසමුදයො -පෙ- අයං දුක්ඛනිරොධො -පෙ- අයං දුක්ඛනිරොධගාමිනී පටිපදාති යථාභූතං නප්පජානාති. එවං ඛො භික්ඛවෙ පුග්ගලො උත්තානො හොති ගම්භීරොභාසො. සෙය්‍යථාපි සො භික්ඛවෙ උදකරහදො උත්තානො ගම්භීරොභාසො, තථූපමාහං භික්ඛවෙ ඉමං පුග්ගලං වදාමි.

කථඤ්ච භික්ඛවෙ පුග්ගලො ගම්භීරො හොති උත්තානොභාසො? ඉධ භික්ඛවෙ එකච්චස්ස පුග්ගලස්ස න පාසාදිකං හොති අභික්කන්තං පටික්කන්තං ආලොකිතං විලොකිතං සම්මිඤ්ජිතං පසාරිතං සඞ්ඝාටිපත්තචීවරධාරණං. සො ඉදං දුක්ඛන්ති යථාභූතං පජානාති -පෙ- අයං දුක්ඛනිරොධගාමිනී පටිපදාති යථාභූතං පජානාති. එවං ඛො භික්ඛවෙ පුග්ගලො ගම්භීරො හොති උත්තානොභාසො. සෙය්‍යථාපි සො භික්ඛවෙ උදකරහදො ගම්භීරො උත්තානොභාසො, තථූපමාහං භික්ඛවෙ ඉමං පුග්ගලං වදාමි.

කථඤ්ච භික්ඛවෙ පුග්ගලො උත්තානො හොති උත්තානොභාසො? ඉධ භික්ඛවෙ එකච්චස්ස පුග්ගලස්ස න පාසාදිකං හොති අභික්කන්තං පටික්කන්තං ආලොකිතං විලොකිතං සම්මිඤ්ජිතං පසාරිතං සඞ්ඝාටිපත්තචීවරධාරණං. සො ඉදං දුක්ඛන්ති යථාභූතං නප්පජානාති -පෙ- අයං දුක්ඛනිරොධගාමිනී පටිපදාති යථාභූතං නප්පජානාති එවං ඛො භික්ඛවෙ පුග්ගලො උත්තානො හොති උත්තානොභාසො. සෙය්‍යථාපි සො භික්ඛවෙ උදකරහදො උත්තානො උත්තානොභාසො, තථූපමාහං භික්ඛවෙ ඉමං පුග්ගලං වදාමි.

Free Distribution www.aathaapi.org

4. 3. 1. 4.

## [උදකරහද සූත්‍රය]

4. මහණෙනි, මේ දිය පිරුණු දහතලාවෝ සතර දෙනෙකි. කවර සතර දෙනෙක යත්:

නො ගැඹුරු වූ (එහෙත්) ගැඹුරු සේ පැණෙන එකෙක, ගැඹුරු වූයේ නො ගැඹුරු සේ පැණෙන එකෙක. නො ගැඹුරු වූයේ නො ගැඹුරුයේ පැණෙන එකෙක. ගැඹුරු වූයේ ගැඹුරු සේ පැණෙන එකෙක. මහණෙනි, මේ සතර දිය පිරුණු දහතලාවෝ යි.

මහණෙනි, එපරිදි ම දහතලා බඳු පුද්ගලයෝ මේ සතර දෙනෙක් ලෝක යෙහි විද්‍යමානයහ. කවර සතර දෙනෙක යත්:

නො ගැඹුරු වූයේ ගැඹුරු සේ පැණෙන එකෙක. ගැඹුරු වූයේ නො ගැඹුරු සේ පැණෙන එකෙක. නො ගැඹුරු වූයේ නො ගැඹුරු සේ පැණෙන එකෙක. ගැඹුරු වූයේ ගැඹුරු සේ පැණෙන එකෙකැ.

මහණෙනි, කෙසේ පුද්ගල නො ගැඹුරු වූයේ ගැඹුරු සේ පැණෙන්නේ වේ ද? මහණෙනි, මෙසස්නෙහි ඇතැම් පුද්ගලයක්හුගේ ඉදිරි යෑම, පෙරළා ඊම, ඉදිරි බැලීම, වටා බැලීම, අත්පා හැකිලීම, අත්පා දිගු කිරීම, සඟළපා–සිවුරු දැරීම ප්‍රසාද එළවන්නේ වෙයි. හේ 'මේ දුකැ'යි තත් වූ පරිදි නො දනී "මේ දුක්ඛ සමුදය"යි ... "මේ දුක්ඛ නිරොධය"යි ... "මේ දුඃඛනිරොධගාමිනී ප්‍රතිපදය"යි තත් වූ පරිදි නො දනී. මහණෙනි, මෙසේ පුද්ගල නො ගැඹුරු වූයේ ගැඹුරු සේ පැණෙන්නේ වෙයි. මහණෙනි, යම් පරිදි හේ දහතලාව නො ගැඹුරු වූයේ ගැඹුරු සේ පැණේ ද, මහණෙනි, මම මේ පුද්ගලයා මෙබඳු උපමා ඇත්තෙකැ යි කියමි.

මහණෙනි, කෙසේ පුද්ගල ගැඹුරු වූයේ නො ගැඹුරුසේ පැණෙන්නේ වේ ද? මහණෙනි, මෙසස්නෙහි ඇතැම් පුද්ගලයක්හුගේ ඉදිරි යෑම, පෙරළා ඊම, ඉදිරි බැලීම, පසු බැලීම, අත්පා හැකිලීම, අත්පා දිගු කිරීම, සඟළපාසිවුරු දැරීම ප්‍රසාද එළවන්නේ නො වෙයි. හේ 'මේ දුකැ'යි තත් වූ පරිදි දනී. ... "මේ දුඃඛනිරොධගාමිනී පටිපදා" යි තත් වූ පරිදි දනී. මහණෙනි, මෙසේ පුද්ගල ගැඹුරු වූයේ නො ගැඹුරු සේ පැණෙන්නේ වෙයි. මහණෙනි, යම් පරිදි ඒ දහතලාව ගැඹුරු වූයේ නො ගැඹුරු සේ පැණෙන්නේ වේ ද, මහණෙනි, මම මේ පුද්ගලයා එබඳු උපමා ඇත්තෙකැ යි කියමි.

මහණෙනි, කෙසේ පුද්ගල නො ගැඹුරු වූයේ නො ගැඹුරු සේ පැණෙන්නේ වේ ද? මහණෙනි, මෙසස්නෙහි ඇතැම් පුද්ගලයක්හුගේ ඉදිරි යෑම, පෙරළා ඊම, ඉදිරි බැලීම, පසු බැලීම, අත්පා හැකිලීම, අත් පා දිගු හැරීම, සඟළපාසිවුරු දැරීම ප්‍රසාද එළවන්නේ නො වේ. හේ 'මේ දුකැ'යි තත් වූ පරිදි නො දනී ... මේ දුඃඛනිරොධගාමිනී ප්‍රතිපදා' යි තත් වූ පරිදි නො දනී. මහණෙනි, මෙසේ පුද්ගල නො ගැඹුරු වූයේ නො ගැඹුරු පැණුම් ඇත්තේ වෙයි. මහණෙනි, යම් සේ ඒ දහතලාව නො ගැඹුරු වූයේ නො ගැඹුරු සේ පැණුම් ඇත්තේ වේ ද, මහණෙනි, මම මේ පුතුලා එබඳු උපමා ඇත්තෙකැයි කියමි.

කථඤ්ච භික්ඛවෙ පුග්ගලො ගම්භීරො හොති ගම්භීරොභාසො? ඉධ භික්ඛවෙ එකච්චස්ස පුග්ගලස්ස පාසාදිකං හොති අභික්කන්තං පටික්කන්තං ආලොකිතං විලොකිතං සම්මිඤ්ජිතං පසාරිතං සඞ්ඝාටිපත්තචීවරධාරණං. සො ඉදං දුක්ඛන්ති යථාභූතං පජානාති -පෙ- අයං දුක්ඛනිරොධගාමිනී පටිපදාති යථාභූතං පජානාති. එවං ඛො භික්ඛවෙ පුග්ගලො ගම්භීරො හොති ගම්භීරොභාසො. සෙය්‍යථාපි සො භික්ඛවෙ උදකරහදො ගම්භීරො ගම්භීරොභාසො, තථූපමාහං භික්ඛවෙ ඉමං පුග්ගලං වදාමි.

ඉමෙ ඛො භික්ඛවෙ චත්තාරො උදකරහදූපමා පුග්ගලා සන්තො සංවිජ්ජමානා ලොකස්මින්ති.

## 4. 3. 1. 5.

## [අම්බසුත්තං]

5. චත්තාරිමානි භික්ඛවෙ අම්බානි. කතමානි චත්තාරි?

ආමං පක්කවණ්ණි, පක්කං ආමවණ්ණි, ආමං ආමවණ්ණි, පක්කං පක්කවණ්ණි. ඉමානි ඛො භික්ඛවෙ චත්තාරි අම්බානි.

එවමෙව ඛො භික්ඛවෙ චත්තාරො'මෙ අම්බූපමා[1] පුග්ගලා සන්තො සංවිජ්ජමානා ලොකස්මිං. කතමෙ චත්තාරො?

ආමො පක්කවණ්ණී, පක්කො ආමවණ්ණී, ආමො ආමවණ්ණී, පක්කො පක්කවණ්ණී.

කථඤ්ච භික්ඛවෙ පුග්ගලො ආමො හොති පක්කවණ්ණී? ඉධ භික්ඛවෙ එකච්චස්ස පුග්ගලස්ස පාසාදිකං හොති අභික්කන්තං පටික්කන්තං ආලොකිතං විලොකිතං සම්මිඤ්ජිතං පසාරිතං සඞ්ඝාටිපත්තචීවරධාරණං. සො ඉදං දුක්ඛන්ති යථාභූතං නප්පජානාති -පෙ- අයං දුක්ඛනිරොධගාමිනී පටිපදාති යථාභූතං නප්පජානාති. එවං ඛො භික්ඛවෙ පුග්ගලො ආමො හොති පක්කවණ්ණී. සෙය්‍යථාපි තං භික්ඛවෙ අම්බං ආමං පක්කවණ්ණි, තථූපමාහං භික්ඛවෙ ඉමං පුග්ගලං වදාමි.

කථඤ්ච භික්ඛවෙ පුග්ගලො පක්කො හොති ආමවණ්ණී? ඉධ භික්ඛවෙ එකච්චස්ස පුග්ගලස්ස න පාසාදිකං හොති අභික්කන්තං පටික්කන්තං ආලොකිතං විලොකිතං සම්මිඤ්ජිතං පසාරිතං සඞ්ඝාටිපත්තචීවරධාරණං. සො ඉදං දුක්ඛන්ති යථාභූතං පජානාති -පෙ- අයං දුක්ඛනිරොධගාමිනී පටිපදාති යථාභූතං පජානාති. එවං ඛො භික්ඛවෙ පුග්ගලො පක්කො හොති ආමවණ්ණී. සෙය්‍යථාපි තං භික්ඛවෙ අම්බං පක්කං ආමවණ්ණි, තථූපමාහං භික්ඛවෙ ඉමං පුග්ගලං වදාමි.

1. චත්තාරො අම්බූපමා - මජසං.

මහණෙනි, කෙසේ පුද්ගල ගැඹුරු වූයේ ගැඹුරු පැණුම් ඇත්තේ වේ ද? මහණෙනි, මෙසස්නෙහි ඇතැම් පුද්ගලයෙක්හුගේ ඉදිරි ගමන, පසු ගමන, ඉදිරි බැලීම, පසු බැලීම, ආකුඤ්චනය, ප්‍රසාරණය, සඟළපාසිවුරු දැරීම ප්‍රසාදජනක වෙයි. හේ 'මේ දුකැ'යි තත් වූ පරිදි දනී ... "මේ දුඃඛ-නිරෝගාමිනී ප්‍රතිපදා" යි තත් වූ පරිදි දනී. මහණෙනි, මෙසේ පුද්ගල ගැඹුරු වූයේ ගැඹුරු සේ පැණෙන්නේ වෙයි. මහණෙනි, යම්සේ ඒ දහතළාව ගැඹුරු වූයේ ගැඹුරු සේ පැණෙන්නේ වේ ද, මහණෙනි, මම මේ පුඟුලා එබඳු උපමා ඇත්තෙකැ යි කියමි.

මහණෙනි, දහතළා බඳු මේ සතර වැදෑරුම් පුද්ගලයෝ ලොකයෙහි විද්‍යමානයහ.

## 4. 3. 1. 5.

## [ අම්බ සුත්‍රය ]

5. මහණෙනි, මෙ අඹපල සතරෙකි. කවර සතරෙක යත්:

අමුවූයේ පැසුනුවන් එකෙක. පැසුනේ අමුවන් එකෙක. අමුවූයේ අමුවන් එකෙක. පැසුනේ පැසුනුවන් එකෙක. මහණෙනි, මේ සතර අඹපල යි.

මහණෙනි, එපරිදි ම ලොව්හි මෙ අඹ බඳු පුඟුලෝ සතර දෙනෙක් විද්‍යමානයහ. කවර සතර දෙනෙක යත්:

අමුවූයේ පැසුනුවන් එකෙක. පැසුනේ අමුවන් එකෙක. අමුවූයේ අමුවන් එකෙක. පැසුනේ පැසුනුවන් එකෙක.

මහණෙනි, කෙසේ පුද්ගල අමුවූයේ පැසුනුවන් වේ ද? මහණෙනි, මෙසස්නෙහි ඇතැම් පුද්ගලයෙක්හුගේ ඉදිරියෑම, පසුඊම, ඉදිරි බැලීම, අවට බැලීම, අත්පා හැකිලීම, අත්පා දිගුකිරීම, සඟළපාසිවුරු දැරීම යන මේ ප්‍රසාද එළවන්නේ වෙයි. හේ 'මේ දුකැ'යි තත් වූ පරිදි නො දනී ... "මේ දුඃඛනිරොධගාමිනී ප්‍රතිපදා" යි තත් වූ පරිදි නො දනී. මහණෙනි, මෙසේ පුද්ගල අමුවූයේ පැසුනුවන් වෙයි. මහණෙනි, යම් සේ ඒ අඹය අමු වූයේ පැසුනුවන් වෙ ද, මහණෙනි, මම මේ පුද්ගලයා එබඳු උපමා ඇතියෙකැ යි කියමි.

මහණෙනි, කෙසේ පුද්ගල පැසුනේ අමුවන් වේ ද? මහණෙනි, මෙසස්නෙහි ඇතැම් පුහුලෙක්හුගේ ගමන, ආගමන, ආලොකන, විලොකන, ආකුඤ්චන, ප්‍රසාරණ, සඞ්ඝාටිපාත්‍රචීවරධාරණ යන මේ ප්‍රාසාදික නො වේ. හේ 'මේ දුකැ'යි තත් වූ පරිදි දනී "මේ දුඃඛනිරොධගාමිනී ප්‍රතිපදා" යි තත් වූ පරිදි දනී. මෙසේ පුද්ගල පැසුනේ අමුවන් වෙයි. මහණෙනි, යම් පරිදි ඒ අඹපල පැසුනේ අමුවන් වේ ද, මහණෙනි, මම මේ පුද්ගලයා එබඳු උපමා ඇතියෙකැ යි කියමි.

කථඤ්ච භික්ඛවෙ පුග්ගලො ආමො හොති ආමවණ්ණී? ඉධ භික්ඛවෙ එකච්චස්ස පුග්ගලස්ස න පාසාදිකං හොති අභික්කන්තං පටික්කන්තං ආලොකිතං විලොකිතං සම්මිඤ්ජිතං පසාරිතං සඞ්ඝාටිපත්තචීවරධාරණං. සො ඉදං දුක්ඛන්ති යථාභූතං නප්පජානාති. -පෙ- අයං දුක්ඛනිරොධගාමිනී පටිපදාති යථාභූතං නප්පජානාති. එවං ඛො භික්ඛවෙ පුග්ගලො ආමො හොති ආමවණ්ණී. සෙය්‍යථාපි තං භික්ඛවෙ අම්බං ආමං ආමවණ්ණී, තථූපමාහං භික්ඛවෙ ඉමං පුග්ගලං වදාමි.

කථඤ්ච භික්ඛවෙ පුග්ගලො පක්කො හොති පක්කවණ්ණී? ඉධ භික්ඛවෙ එකච්චස්ස පුග්ගලස්ස පාසාදිකං හොති අභික්කන්තං පටික්කන්තං ආලොකිතං විලොකිතං සම්මිඤ්ජිතං පසාරිතං සඞ්ඝාටිපත්තචීවරධාරණං. සො ඉදං දුක්ඛන්ති යථාභූතං පජානාති -පෙ- අයං දුක්ඛනිරොධගාමිනී පටිපදාති යථාභූතං පජානාති. එවං ඛො භික්ඛවෙ පුග්ගලො පක්කො හොති පක්කවණ්ණී. සෙය්‍යථාපි තං භික්ඛවෙ අම්බං පක්කං පක්කවණ්ණී, තථූපමාහං භික්ඛවෙ ඉමං පුග්ගලං වදාමි.

ඉමෙ ඛො භික්ඛවෙ චත්තාරො අම්බූපමා පුග්ගලා සන්තො සංවිජ්ජමානා ලොකස්මින්ති.

4. 3. 1. 6*

4. 3. 1. 7.

[මූසිකාසුත්තං]

7. චතස්සො ඉමා භික්ඛවෙ මූසිකා. කතමා චතස්සො?

ගාධං කත්තා නො වසිතා, වසිතා නො ගාධං කත්තා, නෙව ගාධං කත්තා නො වසිතා, ගාධං කත්තා ච වසිතා ච ඉමා ඛො භික්ඛවෙ චතස්සො මූසිකා.

එවමෙව ඛො භික්ඛවෙ චත්තාරො'මෙ මූසිකූපමා පුග්ගලා සන්තො සංවිජ්ජමානා ලොකස්මිං කතමෙ චත්තාරො?

ගාධං කත්තා නො වසිතා, වසිතා නො ගාධං කත්තා, නෙව ගාධං කත්තා නො වසිතා, ගාධං කත්තා ච වසිතා ච.

කථඤ්ච භික්ඛවෙ පුග්ගලො ගාධං කත්තා හොති වසිතා? ඉධ භික්ඛවෙ එකච්චො පුග්ගලො ධම්මං පරියාපුණාති: සුත්තං ගෙය්‍යං වෙය්‍යාකරණං ගාථං උදානං ඉතිවුත්තකං ජාතකං අබ්භූතධම්මං වෙදල්ලං. සො ඉදං දුක්ඛන්ති යථාභූතං නප්පජානාති -පෙ- අයං දුක්ඛනිරොධගාමිනී පටිපදාති යථාභූතං නප්පජානාති. එවං ඛො භික්ඛවෙ පුග්ගලො ගාධං කත්තා හොති නො වසිතා. සෙය්‍යථාපි සා භික්ඛවෙ මූසිකා ගාධං කත්තා නො වසිතා, තථූපමාහං භික්ඛවෙ ඉමං පුග්ගලං වදාමි.

* 'ජටාසං උත්තානත්ථමෙවාති'-අට්ඨකථායං දිස්සති. පාළියම්පන ජටාසං සුත්තං න දිස්සති.

මහණෙනි, කෙසේ පුද්ගල අමුවූයේ අමුවත් වේ ද? මහණෙනි, මෙසස්-නෙහි ඇතැම් පුඟුලෙක්හුගේ අභික්‍රමණ, ප්‍රතික්‍රමණ, ආලෝකන, විලෝකන, ආකුඤ්චන, ප්‍රසාරණ, සඞ්ඝාටිපාත්‍රචීවරධාරණ යන මේ ප්‍රාසාදික නොවේ. හේ 'මේ දුකැ'යි තත් වූ පරිදි නොදනී ... 'මේ දුඃඛනිරොධගාමිනී ප්‍රතිපද'යි තත් වූ පරිදි නො දනී. මහණෙනි, මෙසේ පුද්ගල අමුවූයේ අමුවත් වෙයි. මහණෙනි, යම් පරිදි ඒ අඹපල අමුවූයේ අමුවත් වේ ද, මහණෙනි, මම මේ පුද්ගලයා එබඳු උපමා ඇතියෙකැ යි කියමි.

මහණෙනි, කෙසේ පුද්ගල පැසුනේ පැසුනුවත් වේ ද? මහණෙනි, මෙසස්නෙහි ඇතැම් පුද්ගලයකුගේ ඉදිරියෑම, පසුබෑම, ආලොකන, විලොකන, හැකිළීම්, දිගු හැරීම්, සඟළ පා සිවුරු දැරීම් ප්‍රසාද එලවත්නේ වෙයි. හේ 'මේ දුකැ' යි තත් වූ පරිදි දනී ... මේ දුඃඛනිරොධගාමිනී ප්‍රතිපද"යි තත් වූ පරිදි දනී. මහණෙනි, මෙසේ පුද්ගල පැසුනේ පැසුනුවත් වේ. මහණෙනි, යම් සේ ඒ අඹය පැසුනේ පැසුනුවත් වේ ද, මහණෙනි මම මේ පුද්ගලයා එබඳු උපමා ඇතියෙකැ යි කියමි.

මහණෙනි, අඹ බඳු මේ සතර වැදෑරුම් පුඟුලෝ ලොවෙහි විද්‍යමානය හ.

4. 3. 1. 6.

4. 3. 1. 7.

[ මූසිකා සූත්‍රය ]

7 මහණෙනි, මේ මූෂිකාවෝ සතර දෙනෙකි. කවර සතර දෙනෙක යත්:

බිල කරන්නී වාස නො කරන්නී ය, වාස කරන්නී බිල නො කරන්නී ය, බිල නො කරන්නී ම වාස නො කරන්නී ය, බිල කරන්නීත් වාස ද කරන්නී ය. මහණෙනි, මේ සතර මූෂිකාවෝ ය.

මහණෙනි, එපරිදි ම මේ මූෂිකොපම පුද්ගලයෝ සතර දෙනෙක් ලෝකයෙහි විද්‍යමානය හ. කවර සතර දෙනෙක යත්:

බිල කරන්නේ වාස නො කරන්නේ ය, වාස කරන්නේ බිල නො කරන්නේ ය, බිල නො කරන්නේ ම වාස ද නො කරන්නේ ය, බිල කරන්නේ ත් වාස ද කරන්නේ යි.

මහණෙනි, කෙසේ පුද්ගල බිල කරන්නේ වාස නො කරන්නේ වේ ද? මහණෙනි, මෙසස්නෙහි ඇතැම් පුද්ගලයෙක් සූත්‍ර, ගෙය්‍ය, වෙය්‍යාකරණ, ගාථා, උදාන, ඉතිවුත්තක, ජාතක, අබ්භූතධම්ම, වෙදල්ල යන පෙළදහම් හදාරයි. හේ 'මේ දුකැ'යි තත් වූ පරිදි නොදනී ... "මේ දුක්ඛ-නිරොධගාමිනී පටිපදාය" යි තත් වූ පරිදි නො දනී. මහණෙනි, මෙසේ පුද්ගල බිල කරන්නේ වාස නොකරන්නේ වෙයි. මහණෙනි, යම් පරිදි ඒ මූෂිකාව බිල කරන්නී, වාස නොකරන්නී වේ ද, මහණෙනි, මම මේ පුද්ගලයා එබඳු උපමා ඇතියෙකැ යි කියමි.

කථඤ්ච භික්ඛවෙ පුග්ගලො වසිතා හොති නො ගාධං කත්තා? ඉධ භික්ඛවෙ එකච්චො පුග්ගලො ධම්මං න පරියාපුණාති සුත්තං ගෙය්‍යං වෙය්‍යාකරණං ගාථං උදානං ඉතිවුත්තකං ජාතකං අබ්භුතධම්මං වෙදල්ලං. සො ඉදං දුක්ඛන්ති යථාභූතං පජානාති -පෙ- අයං දුක්ඛනිරොධගාමිනී පටිපදාති යථාභූතං පජානාති. එවං ඛො භික්ඛවෙ පුග්ගලො වසිතා හොති නො ගාධං කත්තා. සෙය්‍යථාපි සා භික්ඛවෙ මූසිකා වසිතා නො ගාධං කත්තා. තථූපමාහං භික්ඛවෙ ඉමං පුග්ගලං වදාමි.

කථඤ්ච භික්ඛවෙ පුග්ගලො නෙව ගාධං කත්තා හොති නො වසිතා? ඉධ භික්ඛවෙ එකච්චො පුග්ගලො ධම්මං න පරියාපුණාති සුත්තං ගෙය්‍යං වෙය්‍යාකරණං ගාථං උදානං ඉතිවුත්තකං ජාතකං අබ්භුතධම්මං වෙදල්ලං. සො ඉදං දුක්ඛන්ති යථාභූතං නප්පජානාති -පෙ- අයං දුක්ඛනිරොධගාමිනී පටිපදාති යථාභූතං නප්පජානාති. එවං ඛො භික්ඛවෙ පුග්ගලො නෙව ගාධං කත්තා හොති නො වසිතා. සෙය්‍යථාපි සා භික්ඛවෙ මූසිකා නෙව ගාධං කත්තා නො වසිතා, තථූපමාහං භික්ඛවෙ ඉමං පුග්ගලං වදාමි.

කථඤ්ච භික්ඛවෙ පුග්ගලො ගාධං කත්තා ච හොති වසිතා ච? ඉධ භික්ඛවෙ එකච්චො පුග්ගලො ධම්මං පරියාපුණාති සුත්තං ගෙය්‍යං වෙය්‍යාකරණං ගාථං උදානං ඉතිවුත්තකං ජාතකං අබ්භුතධම්මං වෙදල්ලං. සො ඉදං දුක්ඛන්ති යථාභූතං පජානාති -පෙ- අයං දුක්ඛනිරොධගාමිනී පටිපදාති යථාභූතං පජානාති. එවං ඛො භික්ඛවෙ පුග්ගලො ගාධං කත්තා ච හොති වසිතා ච. සෙය්‍යථාපි සා භික්ඛවෙ මූසිකා ගාධං කත්තා ච වසිතා ච තථූපමාහං භික්ඛවෙ ඉමං පුග්ගලං වදාමි.

ඉමෙ ඛො භික්ඛවෙ චත්තාරො මූසිකූපමා පුග්ගලා සන්තො සංවිජ්ජමානා ලොකස්මින්ති.

## 4. 3. 1. 8.

## [බලිවද්දසුත්තං]

8. චත්තාරො'මෙ භික්ඛවෙ බලිවද්දා. කතමෙ චත්තාරො?

සගවචණ්ඩො නො පරගවචණ්ඩො, පරගවචණ්ඩො නො සගවචණ්ඩො, සගවචණ්ඩො ච පරගවචණ්ඩො ච, නෙව සගවචණ්ඩො නො පරගවචණ්ඩො. ඉමෙ ඛො භික්ඛවෙ චත්තාරො බලිවද්දා.

එවමෙව ඛො භික්ඛවෙ චත්තාරො'මෙ බලිවද්දූපමා පුග්ගලා සන්තො සංවිජ්ජමානා ලොකස්මිං.

මහණෙනි, කෙසේ පුද්ගල වාස කරන්නේ බිල නොකරන්නේ වේ ද? මහණෙනි, මෙසස්නෙහි ඇතැම් පුද්ගලයෙක් සුත්ත, ගෙය්‍ය, වෙය්‍යා-කරණ, ගාථා, උදාන, ඉතිවුත්තක, ජාතක, අබ්භුතධම්ම, වෙදල්ල, යන පෙළදහම් නො හදාරයි. හේ 'මේ දුකැ'යි තත් වූ පරිදි දනී ... "මේ දුක්ඛ-නිරෝධගාමිනී පටිපදාය" යි තත් වූ පරිදි දනී. මහණෙනි, මෙසේ පුද්ගල වාස කරන්නේ බිල නොකරන්නේ ය. මහණෙනි, යම් පරිදි ඒ මූෂිකාව වාස කරන්නී බිල නො කරන්නී වේ ද, මහණෙනි, මම මේ පුද්ගලයා එබඳු උපමා ඇතියෙකැ යි කියමි.

මහණෙනි, කෙසේ පුද්ගල බිල නොකරන්නේ ම වාස නොකරන්නේත් වේ ද? මහණෙනි, මෙසස්නෙහි ඇතැම් පුද්ගලයෙක් සුත්ත, ගෙය්‍ය, වෙය්‍යා-කරණ, ගාථා, උදාන, ඉතිවුත්තක, ජාතක, අබ්භුතධම්ම, වෙදල්ල යන පෙළදහම් නො හදාරයි හේ 'මේ දුකැ'යි තත් වූ පරිදි නොදනී ... "මේ දුක්ඛනිරෝධගාමිනී පටිපදා" යි තත් වූ පරිදි නො දනී. මහණෙනි, මෙසේ පුද්ගල බිල නොකරන්නේ ම වාසත් නො කරන්නේ ය. මහණෙනි, යම් පරිදි ඒ මූෂිකාව බිල නොකරන්නී වාස නො කරන්නීවේ ද, මහණෙනි, මම මේ පුද්ගලයා එබඳු උපමා ඇතියෙකැ යි කියමි.

මහණෙනි, කෙසේ පුද්ගල බිල කරන්නේත් වාස කරන්නේත් වේ ද? මහණෙනි, මෙසස්නෙහි ඇතැම් පුද්ගලයෙක් සුත්ත, ගෙය්‍ය, වෙය්‍යා-කරණ, ගාථා, උදාන, ඉතිවුත්තක, ජාතක, අබ්භුතධම්ම, වෙදල්ල යන පෙළදහම් හදාරයි. හේ 'මේ දුකැ'යි තත් වූ පරිදි දනී ... "මේ දුක්ඛනිරෝධ-ගාමිනී පටිපදා' යි තත් වූ පරිදි දනී. මහණෙනි, මෙසේ පුද්ගල බිල කරන්නේත් වාස කරන්නේත් වෙයි. මහණෙනි, යම් පරිදි ඒ මූෂිකාව බිල කරන්නීත් වාස කරන්නීත් වේ ද, මහණෙනි, මම මේ පුද්ගලයා එබඳු උපමා ඇතියෙකැ යි කියමි.

මහණෙනි, මූෂිකොපම මේ සතර පුද්ගලයෝ ලෝකයෙහි විද්‍යමානයහ.

## 4. 3. 1. 8.

## [බලීවද්ද සූත්‍රය]

8. මහණෙනි, මේ බලීවද්දියෝ සතර දෙනෙකි. කවර සතර දෙනෙක යත්:

සිය ගෙරිනට සැඩ වූයේ අන් ගෙරිනට සැඩ නොවූයේ ය, අන් ගෙරිනට සැඩ වූයේ සිය ගෙරිනට සැඩ නොවූයේ ය, සිය ගෙරිනට සැඩ වූයේත් අන් ගෙරිනට ද සැඩ වූයේ ය, සිය ගෙරිනට සැඩ නොවූයේ ම අන් ගෙරිනට ද සැඩ නොවූයේ ය. මහණෙනි, මේ සතර බලීවද්දියෝයි.

මහණෙනි, එපරිදි ම බලීවද්දූපම වූ මේ පුද්ගලයෝ සතර දෙනෙක් ලෝකයෙහි විද්‍යමානය හ.

කතමෙ චත්තාරො? සගවචණ්ඩො නො පරගවචණ්ඩො, පරගවචණ්ඩො නො සගවචණ්ඩො, සගවචණ්ඩො ච පරගවචණ්ඩො ච, නෙව සගවචණ්ඩො නො පරගවචණ්ඩො.

කථඤ්ච භික්ඛවෙ පුග්ගලො සගවචණ්ඩො හොති නො පරගවචණ්ඩො? ඉධ භික්ඛවෙ එකච්චො පුග්ගලො සකං පරිසං[1] උබ්බෙජෙතා හොති, නො පරපරිසං. එවං ඛො භික්ඛවෙ පුග්ගලො සගවචණ්ඩො හොති නො පරගවචණ්ඩො. සෙය්‍යථාපි සො භික්ඛවෙ බලිවද්දො සගවචණ්ඩො නො පරගවචණ්ඩො, තථූපමාහං භික්ඛවෙ ඉමං පුග්ගලං වදාමි.

කථඤ්ච භික්ඛවෙ පුග්ගලො පරගවචණ්ඩො හොති නො සගවචණ්ඩො? ඉධ භික්ඛවෙ එකච්චො පුග්ගලො පරපරිසං උබ්බෙජෙතා හොති නො සකපරිසං. එවං ඛො භික්ඛවෙ පුග්ගලො පරගවචණ්ඩො හොති නො සගවචණ්ඩො. සෙය්‍යථාපි සො භික්ඛවෙ බලිවද්දො පරගවචණ්ඩො නො සගවචණ්ඩො, තථූපමාහං භික්ඛවෙ ඉමං පුග්ගලං වදාමි.

කථඤ්ච භික්ඛවෙ පුග්ගලො සගවචණ්ඩො ච හොති පරගවචණ්ඩො? ඉධ භික්ඛවෙ එකච්චො පුග්ගලො සකපරිසඤ්ච උබ්බෙජෙතා හොති පරපරිසඤ්ච. එවං ඛො භික්ඛවෙ පුග්ගලො සගවචණ්ඩො ච හොති පරගවචණ්ඩො ච. සෙය්‍යථාපි සො භික්ඛවෙ බලිවද්දො සගවචණ්ඩො ච පරගවචණ්ඩො ච, තථූපමාහං භික්ඛවෙ ඉමං පුග්ගලං වදාමි.

කථඤ්ච භික්ඛවෙ පුග්ගලො නෙව සගවචණ්ඩො හොති නො පරගවචණ්ඩො? ඉධ භික්ඛවෙ එකච්චො පුග්ගලො නෙව සකපරිසං උබ්බෙජෙතා හොති නො පරපරිසං. එවං ඛො භික්ඛවෙ පුග්ගලො නෙව සගවචණ්ඩො හොති නො පරගවචණ්ඩො. සෙය්‍යථාපි සො භික්ඛවෙ බලිවද්දො නෙව සගවචණ්ඩො නො පරගවචණ්ඩො, තථූපමාහං භික්ඛවෙ ඉමං පුග්ගලං වදාමි.

ඉමෙ ඛො භික්ඛවෙ චත්තාරො බලිවද්දූපමා පුග්ගලා සන්තො සංවිජ්ජමානා ලොකස්මින්ති.

1. සකපරිසං - මජසං. සං.

කවර සතර දෙනෙක යත්: සඞ්ගව චණ්ඩ වූයේ පරගවච්චණ්ඩ නොවූයේය. පරගවච්චණ්ඩවූයේ සඞ්ගවච්චණ්ඩ නොවූයේ ය. සඞ්ගවච්චණ්ඩ වූයේ පරගවච්චණ්ඩ ද වූයේය සඞ්ගවච්චණ්ඩ නොවූයේ ම පරගවච්චණ්ඩ ද නොවූයේ යි.

මහණෙනි, කෙසේ පුද්ගල සඞ්ගවච්චණ්ඩ වූයේ පරගවච්චණ්ඩ නොවූයේ වේ ද? මහණෙනි, මේ ලොව ඇතැම් පුද්ගලයෙක් සිය පිරිස සටා උද්වෙග (බියපත්) කරන්නේ වෙයි. පරපිරිස නොගටන්නේ වෙයි මහණෙනි, මෙසේ පුද්ගල සඞ්ගවච්චණ්ඩ වූයේ පරගවච්චණ්ඩ නොවූයේ ය. මහණෙනි, යම් පරිදි ඒ ගොන් සඞ්ගවච්චණ්ඩ ව පරගවච්චණ්ඩ නොවූයේ වේ ද, මහණෙනි, මම මේ පුද්ගලයා එබඳු උපමා ඇතියෙකැ යි කියමි:

මහණෙනි, කෙසේ පුද්ගල පරගවච්චණ්ඩ වූයේ සඞ්ගවච්චණ්ඩ නොවූයේ වේ ද? මහණෙනි, මෙලොව ඇතැම් පුද්ගලයෙක් පරපෂිද් සටා උද්වෙග කරන්නේ වෙයි. සිය පිරිස නොගටන්නේ වෙයි. මහණෙනි, මෙසේ පුද්ගල පරගවච්චණ්ඩ වූයේ සඞ්ගවච්චණ්ඩ නොවූයේ වෙයි. මහණෙනි, යම් පරිදි ඒ ගොන් පරගවච්චණ්ඩ ව සඞ්ගවච්චණ්ඩ නොවූයේ වේ ද, මහණෙනි, මම මේ පුද්ගලයා එබඳු උපමා ඇතියෙකැ යි කියමි.

මහණෙනි, කෙසේ පුද්ගල සඞ්ගවච්චණ්ඩ වූයේත් පරගවච්චණ්ඩ වූයේත් වේ ද? මහණෙනි, මෙලොව ඇතැම් පුද්ගලයෙක් සිය පිරිස සටා උද්වෙග කරන්නේ වෙයි. පරපෂිද් සටන්නේත් වෙයි. මහණෙනි, මෙසේ පුද්ගල සඞ්ගවච්චණ්ඩ වූයේත් පරගවච්චණ්ඩ වූයේත් වෙයි. මහණෙනි, යම් පරිදි ඒ ගොන් සඞ්ගවච්චණ්ඩ වූයේත් පරගවච්චණ්ඩ වූයේත් වේ ද, මහණෙනි, මම මේ පුද්ගලයා එබඳු උපමා ඇතියෙකැ යි කියමි.

මහණෙනි, කෙසේ පුද්ගල සඞ්ගවච්චණ්ඩ නොවූයේ ම පරගවච්චණ්ඩ නොවූයේත් වේ ද? මහණෙනි, මෙලොව ඇතැම් පුද්ගලයෙක් සවකීය පෂිද් සටා උද්වෙග කරන්නේත් නොවෙයි. පරපෂිද් සටන්නේත් නොවෙයි මහණෙනි, මෙසේ පුද්ගල සඞ්ගවච්චණ්ඩ නොවූයේත් පරගවච්චණ්ඩ නොවූයේ ද වෙයි. මහණෙනි, යම් පරිදි ඒ ගොන් සඞ්ගවච්චණ්ඩ නොවූයේ ම පරගවච්චණ්ඩ නොවූයේත් වේ ද, මහණෙනි, මම මේ පුද්ගලයා එබඳු උපමා ඇතියෙකැ යි කියමි.

මහණෙනි, බලීවද්දූපම මේ සතර පුද්ගලයෝ ලෝකයෙහි විද්‍යමානයහ.

## 4. 3. 1. 9.

## [ රුක්ඛසුත්තං ]

9. චත්තාරො'මෙ භික්ඛවෙ රුක්ඛා. කතමෙ චත්තාරො?

ඵෙග්ගු ඵෙග්ගුපරිවාරො, ඵෙග්ගු සාරපරිවාරො, සාරො ඵෙග්ගුපරිවාරො, සාරො සාරපරිවාරො. ඉමෙ ඛො භික්ඛවෙ චත්තාරො රුක්ඛා.

එවමෙව ඛො භික්ඛවෙ චත්තාරො'මෙ රුක්ඛූපමා පුග්ගලා සන්තො සංවිජ්ජමානා ලොකස්මිං. කතමෙ චත්තාරො?

ඵෙග්ගු ඵෙග්ගුපරිවාරො, ඵෙග්ගු සාරපරිවාරො, සාරො ඵෙග්ගුපරිවාරො, සාරො සාරපරිවාරො.

කථඤ්ච භික්ඛවෙ පුග්ගලො ඵෙග්ගු හොති ඵෙග්ගුපරිවාරො? ඉධ භික්ඛවෙ එකච්චො පුග්ගලො දුස්සීලො හොති පාපධම්මො. පරිසාපිස්ස හොති දුස්සීලා පාපධම්මා. එවං ඛො භික්ඛවෙ පුග්ගලො ඵෙග්ගු හොති ඵෙග්ගුපරිවාරො. සෙය්‍යථාපි සො භික්ඛවෙ රුක්ඛො ඵෙග්ගු ඵෙග්ගුපරිවාරො, තථූපමාහං භික්ඛවෙ ඉමං පුග්ගලං වදාමි.

කථඤ්ච භික්ඛවෙ පුග්ගලො ඵෙග්ගු හොති සාරපරිවාරො? ඉධ භික්ඛවෙ එකච්චො පුග්ගලො දුස්සීලො හොති පාපධම්මො, පරිසා ච ඛ්වස්ස හොති සීලවතී කල්‍යාණධම්මා. එවං ඛො භික්ඛවෙ පුග්ගලො ඵෙග්ගු හොති සාරපරිවාරො. සෙය්‍යථාපි සො භික්ඛවෙ රුක්ඛො ඵෙග්ගු සාරපරිවාරො, තථූපමාහං භික්ඛවෙ ඉමං පුග්ගලං වදාමි.

කථඤ්ච භික්ඛවෙ පුග්ගලො සාරො හොති ඵෙග්ගුපරිවාරො? ඉධ භික්ඛවෙ එකච්චො පුග්ගලො සීලවා හොති කල්‍යාණධම්මො. පරිසා ච ඛ්වස්ස හොති දුස්සීලා පාපධම්මා. එවං ඛො භික්ඛවෙ පුග්ගලො සාරො හොති ඵෙග්ගුපරිවාරො. සෙය්‍යථාපි සො භික්ඛවෙ රුක්ඛො සාරො හොති ඵෙග්ගුපරිවාරො, තථූපමාහං භික්ඛවෙ ඉමං පුග්ගලං වදාමි.

කථඤ්ච භික්ඛවෙ පුග්ගලො සාරො හොති සාරපරිවාරො? ඉධ භික්ඛවෙ එකච්චො පුග්ගලො සීලවා හොති කල්‍යාණධම්මො. පරිසාපිස්ස හොති සීලවතී කල්‍යාණධම්මා. එවං ඛො භික්ඛවෙ පුග්ගලො සාරො හොති සාරපරිවාරො. සෙය්‍යථාපි සො භික්ඛවෙ රුක්ඛො සාරො සාරපරිවාරො, තථූපමාහං භික්ඛවෙ ඉමං පුග්ගලං වදාමි.

ඉමෙ ඛො භික්ඛවෙ චත්තාරො රුක්ඛූපමා පුග්ගලා සන්තො සංවිජ්ජමානා ලොකස්මින්ති.

## 4. 3. 1. 9.

## [රුක්ඛ සූත්‍රය]

9. මහණෙනි, මේ වෘක්ෂයෝ සතර දෙනෙකි. කවර සතර දෙනෙක යත්:

නිසරු රුක් පිරිවර කොට ඇති නිසරු රුකෙක. හරරුක් පිරිවර කොට ඇති නිසරු රුකෙක. නිසරු රුක් පිරිවර කොට ඇති හරරුකෙක. හරරුක් පිරිවර කොට ඇති හරරුකෙක. මහණෙනි, මේ වෘක්ෂයෝ සතර දෙන යි.

මහණෙනි, එපරිදි ම රුක්බඳු මේ පුද්ගලයෝ සතර දෙනෙක් ලෝකයෙහි විද්‍යමානයහ. කවර සතර දෙනෙක යත්:

එලගු පරිවාර කොට ඇති එලගු පුද්ගලය, සාර පරිවාර කොට ඇති එලගු පුද්ගලය, එලගුපරිවාර කොට ඇති සාර පුද්ගලය, සාර පරිවාර කොට ඇති සාර පුද්ගල යි.

මහණෙනි, කෙසේ පුද්ගල එලගුපරිවාර කොට ඇති එලගු පුද්ගල වේ ද? මහණෙනි, මෙ ලොව්හි ඇතැම් පුද්ගලයෙක් දුශ්ශීල වෙයි, ලමුදහම් ඇති වෙයි. ඔහු පිරිස ද දුශ්ශීල වෙයි, ලමුදහම් ඇති වෙයි. මහණෙනි, මෙසේ පුද්ගල එලගුපරිවාර කොට ඇති එලගු පුද්ගල නම් වෙයි. මහණෙනි, යම් පරිදි ඒ වෘක්ෂය එලගුපරිවාර කොට ඇති එලගුවෘක්ෂයෙක් වේ ද, මහණෙනි, මම මේ පුද්ගලයා එබඳු උපමා ඇතියෙකැ යි කියමි.

මහණෙනි, කෙසේ පුද්ගල සාරපරිවාර කොට ඇති එලගු පුද්ගල වේ ද? මහණෙනි, මෙලොව ඇතැම් පුද්ගලයෙක් දුශ්ශීල වෙයි, ලමුදහම් ඇති වෙයි. උහුගේ පිරිස සිල්වත් වෙයි, කල්‍යාණදහම් ඇති වෙයි. මහණෙනි, මෙසේ පුද්ගල සාර පරිවාර කොට ඇති එලගු පුද්ගල වෙයි. මහණෙනි, යම් පරිදි ඒ වෘක්ෂය සාරපරිවාර කොට ඇති එලගුවෘක්ෂ වේ ද, මහණෙනි, මම මේ පුද්ගලයා එබඳු උපමා ඇතියෙකැ යි කියමි.

මහණෙනි, කෙසේ පුද්ගල එලගුපරිවාර කොට ඇති සාර පුද්ගල වේ ද? මහණෙනි, මෙලොව ඇතැම් පුද්ගලයෙක් සිල්වත් වෙයි, කල්‍යාණදහම් ඇති වෙයි. ඔහුගේ පිරිස දුශ්ශීල වෙයි, ලමුදහම් ඇති වෙයි. මහණෙනි, මෙසේ පුද්ගල එලගුපරිවාර කොට ඇති සාර පුද්ගල වෙයි. මහණෙනි, යම් පරිදි ඒ වෘක්ෂය, එලගුපරිවාර කොට ඇති සාරවෘක්ෂයෙක් වේ ද, මහණෙනි, මම මේ පුද්ගලයා එබඳු උපමා ඇතියෙකැ යි කියමි.

මහණෙනි, කෙසේ පුද්ගල සාරපරිවාර කොට ඇති සාර පුද්ගල වේ ද ? මහණෙනි, මෙලොව ඇතැම් පුද්ගලයෙක් සිල්වත් වෙයි, කල්‍යාණදහම් ඇති වෙයි. ඔහුගේ පිරිස ද සිල්වත් වෙයි, කල්‍යාණදහම් ඇති වෙයි. මහණෙනි, මෙසේ පුද්ගල සාරපරිවාර කොට ඇති සාර පුද්ගල වෙයි. මහණෙනි, යම් පරිදි ඒ වෘක්ෂය සාරපරිවාර කොට ඇති සාරවෘක්ෂ වේ ද, මහණෙනි, මම මේ පුද්ගලයා එබඳු උපමා ඇතියෙකැ යි කියමි.

මහණෙනි, වෘක්ෂෝපම මේ සතර පුද්ගලයෝ ලෝකයෙහි විද්‍යමානයහ.

## 4. 3. 1. 10.

### [ආසිවිසසුත්තං]

10. චත්තාරො'මෙ භික්ඛවෙ ආසිවිසා. කතමෙ චත්තාරො?

ආගතවිසො න ඝොරවිසො, ඝොරවිසො න ආගතවිසො, ආගතවිසො ච ඝොරවිසො ච, නෙවාගතවිසො න ඝොරවිසො. ඉමෙ ඛො භික්ඛවෙ චත්තාරො ආසිවිසා.

එවමෙව ඛො භික්ඛවෙ චත්තාරො'මෙ ආසිවිසූපමා පුග්ගලා සන්තො සංවිජ්ජමානා ලොකස්මිං. කතමෙ චත්තාරො?

ආගතවිසො න ඝොරවිසො, ඝොරවිසො න ආගතවිසො, ආගතවිසො ච ඝොරවිසො ච, නෙව ආගතවිසො න ඝොරවිසො.

කථඤ්ච භික්ඛවෙ පුග්ගලො ආගතවිසො හොති න ඝොරවිසො? ඉධ භික්ඛවෙ එකච්චො පුග්ගලො අභිණ්හං කුජ්ඣති. සො ච ඛ්වස්ස කොධො න දීඝරත්තං අනුසෙති. එවං ඛො භික්ඛවෙ පුග්ගලො ආගතවිසො හොති න ඝොරවිසො. සෙය්‍යථාපි සො භික්ඛවෙ ආසිවිසො ආගතවිසො න ඝොරවිසො, තථූපමාහං භික්ඛවෙ ඉමං පුග්ගලං වදාමි.

කථඤ්ච භික්ඛවෙ පුග්ගලො ඝොරවිසො හොති න ආගතවිසො? ඉධ භික්ඛවෙ එකච්චො පුග්ගලො න හෙව ඛො අභිණ්හං කුජ්ඣති. සො ච ඛ්වස්ස කොධො දීඝරත්තං අනුසෙති. එවං ඛො භික්ඛවෙ පුග්ගලො ඝොරවිසො හොති න ආගතවිසො. සෙය්‍යථාපි සො භික්ඛවෙ ආසිවිසො ඝොරවිසො න ආගතවිසො, තථූපමාහං භික්ඛවෙ ඉමං පුග්ගලං වදාමි.

කථඤ්ච භික්ඛවෙ පුග්ගලො ආගතවිසො ච හොති ඝොරවිසො ච? ඉධ භික්ඛවෙ එකච්චො පුග්ගලො අභිණ්හං කුජ්ඣති. සො ච ඛ්වස්ස කොධො දීඝරත්තං අනුසෙති. එවං ඛො භික්ඛවෙ පුග්ගලො ආගතවිසො ච හොති ඝොරවිසො ච. සෙය්‍යථාපි සො භික්ඛවෙ ආසිවිසො ආගතවිසො ච ඝොරවිසො ච, තථූපමාහං භික්ඛවෙ ඉමං පුග්ගලං වදාමි.

කථඤ්ච භික්ඛවෙ පුග්ගලො නෙවාගතවිසො හොති න ඝොරවිසො? ඉධ භික්ඛවෙ එකච්චො පුග්ගලො න හෙව ඛො අභිණ්හං කුජ්ඣති. සො ච ඛ්වස්ස කොධො න දීඝරත්තං අනුසෙති. එවං ඛො භික්ඛවෙ පුග්ගලො නෙවාගතවිසො න ඝොරවිසො, සෙය්‍යථාපි සො භික්ඛවෙ ආසිවිසො නෙවාගතවිසො න ඝොරවිසො, තථූපමාහං භික්ඛවෙ ඉමං පුග්ගලං වදාමි.

ඉමෙ ඛො භික්ඛවෙ චත්තාරො ආසිවිසූපමා පුග්ගලා සන්තො සංවිජ්ජමානා ලොකස්මින්ති.

**වලාහකවග්ගො පඨමො.**

**තස්සුද්දානං:**

ද්වෙ වලාහකා ච කුම්භා උදකරහදා ද්වෙ හොන්ති - අම්බානි මූසිකා බලීවද්දා රුක්ඛා ආසිවිසෙන තෙ දසාති.*

* එත්ථ පි සුත්තානමෙකං ඌනං.

## 4. 3. 1. 10.

## [ ආශීවිෂ සූත්‍රය ]

10. මහණෙනි, මේ ආශීවිෂයෝ සතර දෙනෙකි. කවර සතර දෙනෙක යත්:

පැමිණි (එවෙලෙහි) විස ඇතියේ කැකුළු (පවත්නා) විස නැතියේ ය. පැමිණි විස නැතියේ කැකුළුවිස ඇතියේ ය. පැමිණි විස ඇතියේ කැකුළු විස ද ඇතියේ ය. පැමිණි විස නැතියේ ම කැකුළුවිස ද නැතියේ යි. මහණෙනි, මේ සතර ආශීවිෂයෝ ය.

මහණෙනි, එපරිදි ම ආශීවිෂෝපම මේ සතර පුද්ගලයෝ ලෝකයෙහි විද්‍යමානයහ. කවර සතර දෙනෙක යත්:

පැමිණි විස ඇතියේ කැකුළු විස නැතියේ ය. පැමිණි විස නැතියේ කැකුළු විස ඇතියේ ය. පැමිණි විස ඇතියේත් කැකුළු විස ද ඇතියේ ය. පැමිණි විස නැතියේ ම කැකුළු විස ද නැතියේ යි.

මහණෙනි, කෙසේ පුද්ගල පැමිණි විස ඇතියේ කැකුළු විස නැතියේ වේ ද? මහණෙනි, මෙලොව ඇතැම් පුද්ගලයෙක් නිතොර කිපෙයි. උහුගේ ඒ ක්‍රෝධය දීර්ඝරාත්‍රයෙහි ලුහුබැඳ නො වැටෙයි. මහණෙනි, මෙසේ පුද්ගල පැමිණි විස ඇතියේ කැකුළුවිස නැතියේ නම් වෙයි. මහණෙනි, යම් පරිදි ඒ ආශීවිෂයා පැමිණි විෂ ඇතියේ කැකුළු විස නැතියේ වේ ද, මහණෙනි, මම මේ පුද්ගලයා එබඳුඋපමා ඇතියෙකැ යි කියමි.

මහණෙනි, කෙසේ පුද්ගල පැමිණි විස නැතියේ කැකුළු විස ඇතියේ වේ ද? මහණෙනි, මෙලොව ඇතැම් පුද්ගලයෙක් නිතොර නො ම කිපේ. උහුගේ ඒ ක්‍රෝධය දීර්ඝරාත්‍රයෙහි ලුහුබැඳ වැටෙයි. මහණෙනි, මෙසේ පුද්ගල පැමිණි විස නැතියේ කැකුළු විස ඇතියේ නම් වෙයි. මහණෙනි, යම් පරිදි ඒ ආශීවිෂයා පැමිණි විස නැතියේ කැකුළු විස ඇතියේ වේ ද, මහණෙනි, මම මේ පුද්ගලයා එබඳු උපමා ඇතියෙකැ යි කියමි.

මහණෙනි, කෙසේ පුද්ගල පැමිණි විස ඇතියේත් කැකුළු විස ඇතියේත් වේ ද: මහණෙනි, මෙලොව ඇතැම් පුද්ගලයෙක් නිතොර කිපෙයි. උහුගේ ඒ ක්‍රෝධය දීර්ඝරාත්‍රයෙහි ලුහුබැඳ වැටෙයි. මහණෙනි, මෙසේ පුද්ගල පැමිණි විස ඇතියේත් කැකුළු විස ඇතියේත් වෙයි. මහණෙනි, යම් පරිදි ඒ ආශීවිෂයා පැමිණි විස ඇතියේත් කැකුළු විස ඇතියේත් වේ ද, මහණෙනි, මම මේ පුද්ගලයා එබඳු උපමා ඇතියෙකැ යි කියමි.

මහණෙනි, කෙසේ පුද්ගල පැමිණි විස නැතියේ ම කැකුළු විස නැතියේත් වේ ද? මහණෙනි, මෙලොව ඇතැම් පුද්ගලයෙක් නිතොර නො ම කිපෙයි. ඔහුගේ ඒ ක්‍රෝධය ද දීර්ඝරාත්‍රයෙහි ලුහුබැඳ නො වැටෙයි. මහණෙනි, මේ පුද්ගල පැමිණි විස නැතියේ ම කැකුළු විස නැතියේ ද වෙයි. මහණෙනි, යම් පරිදි ඒ ආශීවිෂයා පැමිණි විස නැතියේ ම කැකුළු විස නැතියේත් වේ ද, මහණෙනි, මම මේ පුද්ගලයා එබඳු උපමා ඇතියෙකැ යි කියමි.

මහණෙනි, ආශීවිෂෝපම මේ සතර පුද්ගලයෝ ලෝකයෙහි විද්‍යමානයහ.

**වලාහකවර්ගය පළමුවැන්නයි.**

**එහි උද්දානය:**

වලාහක දෙකය, කුම්භ-උදකරහද යන දෙකය, අම්බ, මූසික, රුක්ඛ, බලිවද්ද, ආසිවිස යන ඒ සූත්‍ර දසයෙහි. (දසයෙන් එක් සූත්‍රයෙක් මෙහි නැත.)

# 2. කෙසිවග්ගො

## 4. 3. 2. 1.

### [ කෙසිසුත්තං ]

**[සාමක්ඛිනිදානං]**

11. අථ ඛො කෙසි අස්සදම්මසාරථි යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නං ඛො කෙසිං අස්සදම්මසාරථිං භගවා එතදවොච:

ත්වං ච ඛ්වාසි,[1] කෙසි, සඤ්ඤාතො[2] අස්සදම්මසාරථි. කථං පන ත්වං කෙසි, අස්සදම්මං විනෙසීති?

අහං ඛො භන්තෙ අස්සදම්මං සණ්හෙනපි විනෙමි, ඵරුසෙනපි විනෙමි, සණ්හඵරුසෙනපි විනෙමීති.

සචෙ තෙ කෙසි, අස්සදම්මො සණ්හෙනපි විනයං න උපෙති, ඵරුසෙනපි විනයං න උපෙති, සණ්හඵරුසෙනපි විනයං න උපෙති, කින්ති නං කරොසීති?

සචෙ මෙ භන්තෙ අස්සදම්මො සණ්හෙනපි විනයං න උපෙති, ඵරුසෙනපි විනයං න උපෙති, සණ්හඵරුසෙනපි විනයං න උපෙති, හනාමි නං භන්තෙ. තං කිස්ස හෙතු? මා මෙ ආචරියකුලස්ස අවණ්ණො අහොසීති.

භගවා පන භන්තෙ අනුත්තරො පුරිසදම්මසාරථි, කථං පන භන්තෙ භගවා පුරිසදම්මං විනෙතීති[3]?

අහං ඛො කෙසි, පුරිසදම්මං සණ්හෙනපි විනෙමි, ඵරුසෙනපි විනෙමි සණ්හඵරුසෙනපි විනෙමි. තත්‍රිදං කෙසි, සණ්හස්මිං: ඉති කායසුචරිතං, ඉති කායසුචරිතස්ස විපාකො. ඉති වචීසුචරිතං, ඉති වචීසුචරිතස්ස විපාකො. ඉති මනොසුචරිතං, ඉති මනොසුචරිතස්ස විපාකො. ඉති දෙවා, ඉති මනුස්සා.

තත්‍රිදං කෙසි, ඵරුසස්මිං: ඉති කායදුච්චරිතං, ඉති කායදුච්චරිතස්ස විපාකො. ඉති වචීදුච්චරිතං, ඉති වචීදුච්චරිතස්ස විපාකො. ඉති මනොදුච්චරිතං ඉති මනොදුච්චරිතස්ස විපාකො. ඉති නිරයො, ඉති තිරච්ඡානයොනි, ඉති පෙත්තිවිසයො.

තත්‍රිදං කෙසි, සණ්හඵරුසස්මිං. ඉති කායසුචරිතං, ඉති කායසුචරිතස්ස විපාකො. ඉති කායදුච්චරිතං, ඉති කායදුච්චරිතස්ස විපාකො. ඉති වචීසුචරිතං, ඉති වචීසුචරිතස්ස විපාකො. ඉති වචීදුච්චරිතං, ඉති වචීදුච්චරිතස්ස විපාකො. ඉති මනොසුචරිතං, ඉති මනොසුචරිතස්ස විපාකො. ඉති මනොදුච්චරිතං, ඉති මනොදුච්චරිතස්ස විපාකො. ඉති දෙවා, ඉති මනුස්සා. ඉති නිරයො, ඉති තිරච්ඡානයොනි, ඉති පෙත්තිවිසයොති.

---

1. ත්වං ඛොසි - මජසං.
2. පඤ්ඤාතො මජසං.
3. දමෙතීති - අට්ඨකථා

# 2. කේසි වර්ගය

### 4. 3. 2. 1

### [ කේසි සූත්‍රය ]

**[සැවැත්නිදානයි]**

11. එසඳ **කේසි** නම් අස්දම්සැරි භාග්‍යවතුන් වහන්සේ කරා එළඹියේ ය. එළඹ භාග්‍යවතුන් වහන්සේ සකසා වැඳ එකත්පසෙක හින. එකත්පස් ව හුන් කෙසි නම් අස්දම්සැරිහට භාග්‍යවතුන් වහන්සේ තෙල වදාළ සේක:

කේසිය, තෝ ප්‍රසිද්ධ අස්දම්සැරියෙහි. කෙසිය, තෝ කෙසේ නම් තහඹු අසු විනය(දම)නය කෙරෙහි?

වහන්ස, මම තහඹු අසු ශ්ලක්ෂණයෙනුදු (මුදුබැව්නුදු) විනයනය කෙරෙමි, පරුෂයෙනුදු විනයනය කෙරෙමි, ශ්ලක්ෂණ-පරුෂයෙනුදු විනයනය කෙරෙමි.

කේසිය, ඉදින් තාගේ අශ්වදම්‍යයා ශ්ලක්ෂණයෙනුදු විනයට නොයේ නම්, පරුෂයෙනුදු විනයට නොයේ නම්, ශ්ලක්ෂණපරුෂයෙනුදු විනයට නොයේ නම්, ඔහුට කුම් කෙරෙහි?

වහන්ස, ඉදින් මාගේ අශ්වදම්‍යයා ශ්ලක්ෂණයෙනුදු විනයට නොයේ නම්, පරුෂයෙනුදු විනයට නොයේ නම්, ශ්ලක්ෂණපරුෂයෙනුදු විනයට නොයේ නම්, වහන්ස, මම උහු මරමි. ඒ කවර හෙයින යත්: මාගේ ඇදුරුකුලයට නහමක් අකීර්ති වේවයි.

වහන්ස, භාග්‍යවතුන් වහන්සේ අනුත්තර පුරුෂදම්‍යසාරථී දූය. වහන්ස, භාග්‍යවතුන් වහන්සේ පුරුෂදම්‍යයා කෙසේ විනයනය කරණ සේක් ද?

කේසිය, මම පුරුෂදම්‍යයා ශ්ලක්ෂණයෙනුදු විනයනය කෙරෙමි, පරුෂයෙනුදු විනයනය කෙරෙමි, ශ්ලක්ෂණපරුෂයෙනුදු විනයනය කෙරෙමි. කේසිය, එහි මේ ශ්ලක්ෂණභාවය වෙයි: කායසුචරිතය මෙබඳු වෙයි, කායසුචරිතයාගේ විපාකය මෙබඳු වෙයි. වචීසුචරිතය මෙබඳු වෙයි, වචීසුචරිතයාගේ විපාකය මෙබඳු වෙයි. මනඃසුචරිතය මෙබඳු වෙයි, මනඃසුචරිතයාගේ විපාකය මෙබඳු වෙයි. දෙවියෝ මෙබන්දහ. මනුෂ්‍යයෝ මෙබන්දහයි මෙසේ දක්වමි.

කේසිය, එහි මේ පරුෂභාවය වෙයි: කායදුශ්චරිතය මෙසේ ය, කායදුශ්චරිතයාගේ විපාක මෙසේ ය. වාග්දුශ්චරිතය මෙසේ ය, වාග්දුශ්චරිතයාගේ විපාක මෙසේ ය. මනෝදුශ්චරිතය මෙසේ ය, මනෝදුශ්චරිතයාගේ විපාක මෙසේ ය. නිරය මෙසේ ය. තිරශ්චීනයෝනි මෙසේ ය, ප්‍රේතවිෂය මෙසේ ය යනුයි.

කේසිය, එහි මේ ශ්ලක්ෂණපරුෂභාවය මේ: කායසුචරිතය මෙසේ ය, කායසුචරිතයාගේ විපාක මෙසේ ය. කායදුශ්චරිතය මෙසේ ය, කායදුශ්චරිතයාගේ විපාක මෙසේ ය. වචීසුචරිතය මෙසේ ය, වචීසුචරිතයාගේ විපාක මෙසේ ය. වචීදුශ්චරිතය මෙසේ ය, වචීදුශ්චරිතයාගේ විපාක මෙසේ ය. මනඃසුචරිතය මෙසේ ය, මනඃසුචරිතයාගේ විපාක මෙසේ ය. මනෝදුශ්චරිතය මෙසේ ය, මනෝදුශ්චරිතයාගේ විපාක මෙසේ ය. දෙවියෝ මෙබන්දහ. මනුෂ්‍යයෝ මෙබන්දහ. නිරය මෙබඳුය. තිරශ්චීනයෝනි මෙබඳුය. ප්‍රේතවිෂය මෙබඳුය යනුයි.

සචෙ තෙ භන්තෙ පුරිසදම්මො සණ්හෙන විනයං න උපෙති, ඵරුසෙන විනයං න උපෙති, සණ්හඵරුසෙන විනයං න උපෙති, කින්ති නං භගවා කරොතීති?

සචෙ මෙ කෙසි, පුරිසදම්මො සණ්හෙන විනයං න උපෙති, ඵරුසෙන විනයං න උපෙති, සණ්හඵරුසෙන විනයං න උපෙති, හනාමි නං කෙසීති.

න ඛො භන්තෙ භගවතො පාණාතිපාතො කප්පති. අථ ච පන භගවා එවමාහ: හනාමි නං කෙසීති.

සච්චං කෙසි, න තථාගතස්ස පාණාතිපාතො කප්පති. අපි ච සො පුරිසදම්මො සණ්හෙන විනයං න උපෙති, ඵරුසෙන විනයං න උපෙති, සණ්හඵරුසෙන විනයං න උපෙති, න තථාගතො වත්තබ්බං අනුසාසිතබ්බං මඤ්ඤති. නපි විඤ්ඤූ සබ්‍රහ්මචාරී වත්තබ්බං අනුසාසිතබ්බං මඤ්ඤන්ති. වධො හෙස කෙසි, අරියස්ස විනයෙ යං න තථාගතො වත්තබ්බං අනුසාසිතබ්බං මඤ්ඤති. නපි විඤ්ඤූ සබ්‍රහ්මචාරී වත්තබ්බං අනුසාසිතබ්බං මඤ්ඤන්තීති

සො හි නූන භන්තෙ සුවධො හොති යං න තථාගතො වත්තබ්බං අනුසාසිතබ්බං මඤ්ඤති. නපි විඤ්ඤූ සබ්‍රහ්මචාරී වත්තබ්බං අනුසාසිතබ්බං මඤ්ඤන්තීති.

අභික්කන්තං භන්තෙ, අභික්කන්තං -පෙ- උපාසකං මං භන්තෙ භගවා ධාරෙතු අජ්ජතග්ගෙ පාණුපෙතං සරණං ගතන්ති.

## 4. 3. 2. 2.

## [ අස්සාජානීය-ජව සුත්තං ]

12. චතූහි භික්ඛවෙ අඞ්ගෙහි සමන්නාගතො රඤ්ඤො භද්‍රො අස්සාජානීයො රාජාරහො හොති රාජභොග්ගො. රඤ්ඤො අඞ්ගන්තෙව සඞ්ඛං ගච්ඡති.

කතමෙහි චතූහි? අජ්ජවෙන, ජවෙන, ඛන්තියා, සොරච්චෙන.

ඉමෙහි ඛො භික්ඛවෙ චතූහි අඞ්ගෙහි සමන්නාගතො රඤ්ඤො භද්‍රො අස්සාජානීයො රාජාරහො හොති රාජභොග්ගො. රඤ්ඤො අඞ්ගන්තෙව සඞ්ඛං ගච්ඡති.

එවමෙව ඛො භික්ඛවෙ චතූහි ධම්මෙහි සමන්නාගතො භික්ඛු ආහුනෙය්‍යො හොති පාහුණෙය්‍යො, දක්ඛිණෙය්‍යො, අඤ්ජලිකරණීයො අනුත්තරං පුඤ්ඤක්ඛෙත්තං ලොකස්ස.

කතමෙහි චතූහි? අජ්ජවෙන ජවෙන ඛන්තියා සොරච්චෙන.

ඉමෙහි ඛො භික්ඛවෙ චතූහි ධම්මෙහි සමන්නාගතො භික්ඛු ආහුනෙය්‍යො හොති -පෙ- අනුත්තරං පුඤ්ඤක්ඛෙත්තං ලොකස්සාති.

වහන්ස, ඉදින් භගවත්හුගේ පුරුෂදම්‍ය ශලක්ෂණයෙනුදු විනයට නොයේ නම්, පරුෂයෙනුදු විනයට නොයේ නම්, ශලක්ෂණපරුෂයෙනුදු විනයට නොයේ නම්, භාග්‍යවතුන් වහන්සේ ඔහුට කුම් කෙරෙති හෝ යි?

කේශිය, ඉදින් මාගේ පුරුෂදම්‍යයා ශලක්ෂණයෙනුදු විනයට නොයේ නම්, පරුෂයෙනුදු විනයට නොයේ නම්, ශලක්ෂණපරුෂයෙනුදු විනයට නොයේ නම්, කේසිය, ඔහු නස්මි.

වහන්ස, භගවත්හට පණිවා නො කැප ම ය. එතෙකුදු වුව, භාග්‍යවතුන් වහන්සේ 'කේශිය, ඔහු නස්මි'යි මෙසේ වදාරණ්ද ය.

සැබැව කේසිය, තථාගතයනට පණිවා නොසරුප් වෙයි. වැලිදු, ඒ පුරුෂදම්‍යයා ශලක්ෂණයෙනුදු විනයට නොයේ නම්, පරුෂයෙනුදු විනයට නොයේ නම්, ශලක්ෂණපරුෂයෙනුදු විනයට නොයේ නම්, තථාගතයෝ ඔහු කියයුතු කොට අනුශාසනා කළයුතු කොට නොසිතත්. නුවණැති සබ්‍රම්සරහුදු ඔහු කියයුතු කොට අනුශාසනා කටයුතු කොට නොසිතත්. කේසිය, තථාගතයන් වහන්සේ යමකු කියයුතු කොට අනුශාසනා කටයුතු කොට නොසිතත් ද, නුවණැති සබ්‍රම්සරහුදු කියයුතු කොට අනුශාසනා කළයුතු කොට නොසිතත් ද, ආර්‍යවිනයයෙහි තෙල වධයෙක් මැ ය.

වහන්ස, තථාගතයන් වහන්සේ යමකු කියයුතු කොට අනුශාසනා කළයුතු කොට නොසිතන සේක් ද, නුවණැති සබ්‍රම්සරහුදු, කියයුතු කොට අනුශාසනා කළයුතු කොට නොසිතත් ද, හේ එකැහින් මහත් වධයෙක.

වහන්ස, ඉතා මැනව, ඉතා මැනව ... වහන්ස, භාග්‍යවතුන් වහන්සේ මා අදපටන්ගෙන දිවිහිම්යෙන් සරණ ගිය උවසකු කොට ධරණ සේක්වා.

4. 3. 2. 2

[ අශ්වාජානීය-ජව සූත්‍රය ]

12. මහණෙනි, රජුගේ භද්‍ර අශ්වාජානීය සතර අඟෙකින් සමන්වාගත වූයේ රජුට නිසි වෙයි. රජු විසින් උපභෝග කටයුතු වෙයි. රාජාඞ්ගයෙක් ම යයි ගණනට යෙයි.

කවර සතර අඟෙකින යත්: ඍජුබැවින, පද ජවයෙන, අධිවාසනායෙන, සුරතභාවයෙනැ යි.

මහණෙනි, රජුගේ භද්‍ර අශ්වාජානීය මේ සතර අඟින් සමන්වාගත වූයේ රජුට නිසි වූයේ වෙයි. රජු විසින් උපභෝග කටයුතු වෙයි. රාජාඞ්ගයෙක් ම යයි ගණනට යෙයි.

මහණෙනි, එපරිදි ම සතර අඟෙකින් සමන්වාගත මහණ ආහුනෙය්‍ය වෙයි, පාහුණෙය්‍ය වෙයි, දක්ඛිණෙය්‍ය වෙයි, අඤ්ජලිකරණීය වෙයි, ලෝකයට අනුත්තර පුණ්‍යක්ෂෙත්‍ර වෙයි.

කවර සතර අඟෙකින යත්: ඍජුබැවින, ක්ෂණජවයෙන, ඉවසීමෙන, සුරතභාවයෙනැ යි.

මහණෙනි, මේ සතර අඟින් සමන්වාගත මහණ ආහුනෙය්‍ය වෙයි ... ලෝකයට අනුත්තර පුණ්‍යක්ෂෙත්‍ර වෙයි.

## 4. 3. 2. 3.

## [අස්සාජානීය-පතොදසුත්තං]

13. චත්තාරොමෙ භික්ඛවෙ භද්‍රා අස්සාජානීයා සන්තො සංවිජ්ජමානා ලොකස්මිං. කතමෙ චත්තාරො?

ඉධ භික්ඛවෙ එකච්චො භද්‍රො අස්සාජානීයො පතොදච්ඡායං දිස්වා සංවිජ්ජති සංවෙගං ආපජ්ජති: "කිංනු ඛො මං අජ්ජ අස්සදම්මසාරථි කාරණං කාරෙස්සති, කිමස්සාහං පතිකරොමී"ති. එව රූපොපි භික්ඛවෙ ඉධෙකච්චො භද්‍රො අස්සාජානීයො හොති. අයං භික්ඛවෙ පඨමො භද්‍රො අස්සාජානීයො සන්තො සංවිජ්ජමානො ලොකස්මිං.

පුන ච පරං භික්ඛවෙ ඉධෙකච්චො භද්‍රො අස්සාජානීයො නහෙව ඛො පතොදච්ඡායං දිස්වා සංවිජ්ජති සංවෙගං ආපජ්ජති, අපි ච ඛො ලොමවෙධවිද්ධො සංවිජ්ජති සංවෙගං ආපජ්ජති: "කිංනු ඛො මං අජ්ජ අස්සදම්මසාරථි කාරණං කාරෙස්සති, කිමස්සාහං පතිකරොමී"ති. එවරූපොපි භික්ඛවෙ ඉධෙකච්චො භද්‍රො අස්සාජානීයො හොති. අයං භික්ඛවෙ දුතියො භද්‍රො අස්සාජානීයො සන්තො සංවිජ්ජමානො ලොකස්මිං.

පුන ච පරං භික්ඛවෙ ඉධෙකච්චො භද්‍රො අස්සාජානීයො නහෙව ඛො පතොදච්ඡායං දිස්වා සංවිජ්ජති සංවෙගං ආපජ්ජති, නපි ලොමවෙධවිද්ධො සංවිජ්ජති සංවෙගං ආපජ්ජති. අපි ච ඛො චම්මවෙධවිද්ධො සංවිජ්ජති සංවෙගං ආපජ්ජති: "කිංනු ඛො මං අජ්ජ අස්සදම්මසාරථි කාරණං කාරෙස්සති, කිමස්සාහං පතිකරොමී"ති. එවරූපොපි භික්ඛවෙ ඉධෙකච්චො භද්‍රො අස්සා-ජානීයො හොති. අයං භික්ඛවෙ තතියො භද්‍රො අස්සාජානීයො සන්තො සංවිජ්ජමානො ලොකස්මිං.

පුන ච පරං භික්ඛවෙ ඉධෙකච්චො භද්‍රො අස්සාජානීයො නහෙව ඛො පතොදච්ඡායං දිස්වා සංවිජ්ජති සංවෙගං ආපජ්ජති, නපි ලොමවෙධවිද්ධො සංවිජ්ජති සංවෙගං ආපජ්ජති, නපි චම්මවෙධවිද්ධො සංවිජ්ජති සංවෙගං ආපජ්ජති. අපි ච ඛො අට්ඨිවෙධවිද්ධො සංවිජ්ජති සංවෙගං ආපජ්ජති: "කිංනු ඛො මං අජ්ජ අස්සදම්මසාරථි කාරණං කාරෙස්සති, කිමස්සාහං පතිකරොමී"ති. එවරූපොපි භික්ඛවෙ ඉධෙකච්චො භද්‍රො අස්සාජානීයො හොති. අයං භික්ඛවෙ චතුත්ථො භද්‍රො අස්සාජානීයො සන්තො සංවිජ්ජමානො ලොකස්මිං.

ඉමෙ ඛො භික්ඛවෙ චත්තාරො භද්‍රා අස්සාජානීයා සන්තො සංවිජ්ජමානා ලොකස්මිං.

එවමෙව ඛො භික්ඛවෙ චත්තාරොමෙ භද්‍රා පුරිසාජානීයා සන්තො සංවිජ්ජ-මානා ලොකස්මිං. කතමෙ චත්තාරො?

## 4. 3. 2. 3.

## [ අස්සාජානීය-පතෝද සූත්‍රය ]

13. මහණෙනි, මේ භද්‍ර අශ්වාජානීයයෝ සතර දෙනෙක් ලෝකයෙහි විද්‍යමානයහ. කවර සතර දෙනෙක යත්:

මහණෙනි, මේ ලෝකයෙහි ඇතැම් භද්‍ර අශ්වාජානීයයෙක් කැඟිටිසෙය දැක සංවෙග (ජව) උපදවයි, වෙගයට පැමිණෙයි: “දැන් අස්දම්සැරි මට කවර දඬුවමක් කරන්නේ ද? මම ඔහුට කිනම් දෑ කෙරෙම් දෑ”යි. මහණෙනි, මෙබඳු වූ ද ඇතැම් භද්‍ර අශ්වජානීයයෙක් මෙලොව වෙයි. මහණෙනි, මේ පළමුවන භද්‍ර අශ්වාජානීය ලොකයෙහි විද්‍යමාන වෙයි.

තවද මහණෙනි, මෙලොව ඇතැම් භද්‍ර අශ්වාජානීයයෙක් කැඟිටිසෙය දැක සංවෙග නොම උපදවයි, වෙගයට නො පැමිණේම ය. වැළිත් ලොම්කූපයෙහි ගිකැඟිටින් විදුනා ලද්දේ වෙග උපදවයි, වෙගයට පැමිණෙයි: “දැන් අස්දම්සැරි මට කිනම් දඬුවමක් කරන්නේ ද? මම ඔහුට කිනම් දෑ කෙරෙම් දෑ?”යි. මහණෙනි, මෙබඳු වූ ද ඇතැම් භද්‍ර අශ්වාජානීයයෙක් මෙලොව ඇත. මහණෙනි, මේ දෙවන භද්‍ර අශ්වාජානීය ලොකයෙහි විද්‍යමාන වෙයි.

තවද මහණෙනි, මෙලොව ඇතැම් භද්‍ර අශ්වාජානීයයෙක් කැඟිටිසෙය දැක සංවෙග නො ම උපදවයි. වෙගයට නො ද පැමිණෙයි. ලොම්කූපයෙහි විත් පහරින් විදුනා ලද්දේත් සංවේග නුපදවයි. වෙගයට නො ද පැමිණෙයි. වැළිත් සමෙහි විත්පහරින් විදුනා ලද්දේ සංවෙග උපදවයි, වෙගයට පැමිණෙයි: “දැන් අස්දම්සැරි මට කිනම් කාරණාවක් කරන්නේ ද? මම ඔහුට කිනම් දෑ කෙරෙම් දෑ”යි. මහණෙනි, මෙබඳු වූ ද ඇතැම් භද්‍ර අශ්වාජානීයයෙක් මෙලොව වෙයි. මහණෙනි, මේ තුන්වන භද්‍ර අශ්වාජනීය ලෝකයෙහි විද්‍යමාන වෙයි.

තවද මහණෙනි, මෙලොව ඇතැම් භද්‍ර අශ්වාජානීයයෙක් කැඟිටිසෙය දැක සංවෙග නො ම උපදවයි. වෙගයට නො පැමිණෙයි. ලෝම කූපයෙහි විත් පහරින් විදුනා ලද්දේ සංවේග නො ම උපදවයි. වෙගයට නො පැමිණෙයි. චර්මයෙහි විත් පහරින් විදුනා ලද්දේ සංවෙග නො උපදවයි. වෙගයට නො පැමිණෙයි. වැළිත් ඇට බිඳුනා විත් පහරින් විදුනා ලද්දේ සංවේග උපදවයි, වේගයට පැමිණෙයි, “දැන් අස්දම්සැරි මට කවර කරුණක් කරන්නේ ද? මම ඔහුට කිනම් දෑ කෙරෙම් දෑ”යි. මහණෙනි, මෙබඳු වූ ද ඇතැම් භද්‍ර අශ්වාජානීයයෙක් මෙලොව විද්‍යමාන වෙයි. මහණෙනි, මේ සතරවන භද්‍ර අශ්වාජානීය ලෝකයෙහි විද්‍යමානය.

මහණෙනි, මේ භද්‍රඅශ්වාජානීයයෝ සතර දෙන ලෝකයෙහි විද්‍යමානය හ.

මහණෙනි, එපරිදි ම භද්‍ර වූ මේ පුරුෂාජානීයයෝ සතර දෙනෙක් ලොකයෙහි විද්‍යමානය හ. කවර සතර දෙනෙක යත්:

ඉධ භික්ඛවෙ එකච්චො භද්‍රො පුරිසාජානීයො සුණාති අමුකස්මිං නාම ගාමෙ වා නිගමෙ වා ඉත්ථී වා පුරිසො වා දුක්ඛිතො වා කාලකතො වාති. සො තෙන සංවිජ්ජති සංවෙගං ආපජ්ජති. සංවිග්ගො යොනිසො පදහති. පහිතත්තො කායෙන චෙව පරමසච්චං සච්ඡිකරොති, පඤ්ඤාය ච අතිවිජ්ඣ පස්සති. සෙය්‍යථාපි සො භික්ඛවෙ භද්‍රො අස්සාජානීයො පතොදච්ඡායං දිස්වා සංවිජ්ජති සංවෙගං ආපජ්ජති, තථූපමාහං භික්ඛවෙ ඉමං භද්‍රං පුරිසාජානීයං වදාමි. එවරූපොපි භික්ඛවෙ ඉධෙකච්චො භද්‍රො පුරිසාජානීයො හොති. අයං භික්ඛවෙ පඨමො භද්‍රො පුරිසාජානීයො සන්තො සංවිජ්ජමානො ලොකස්මිං.

පුන ච පරං භික්ඛවෙ ඉධෙකච්චො භද්‍රො පුරිසාජානීයො න හෙව ඛො සුණාති අමුකස්මිං නාම ගාමෙ වා නිගමෙ වා ඉත්ථී වා පුරිසො වා දුක්ඛිතො වා කාලකතො වාති. අපි ච ඛො සාමං පස්සති ඉත්ථිං වා පුරිසං වා දුක්ඛිතං වා කාලකතං වා. සො තෙන සංවිජ්ජති සංවෙගං ආපජ්ජති. සංවිග්ගො යොනිසො පදහති. පහිතත්තො කායෙන චෙව පරමසච්චං සච්ඡිකරොති, පඤ්ඤාය ච අතිවිජ්ඣ පස්සති. සෙය්‍යථාපි සො භික්ඛවෙ භද්‍රො අස්සාජානීයො ලොමවෙධවිද්ධො සංවිජ්ජති සංවෙගං ආපජ්ජති, තථූපමාහං භික්ඛවෙ ඉමං භද්‍රං පුරිසාජානීයං වදාමි. එවරූපොපි භික්ඛවෙ ඉධෙකච්චො භද්‍රො පුරිසාජානීයො හොති. අයං භික්ඛවෙ දුතියො භද්‍රො පුරිසාජානීයො සන්තො සංවිජ්ජමානො ලොකස්මිං.

පුන ච පරං භික්ඛවෙ ඉධෙකච්චො භද්‍රො පුරිසාජානීයො න හෙව ඛො සුණාති අමුකස්මිං නාම ගාමෙ වා නිගමෙ වා ඉත්ථී වා පුරිසො වා දුක්ඛිතො වා කාලකතො වාති, නපි සාමං පස්සති ඉත්ථිං වා පුරිසං වා දුක්ඛිතං වා කාලකතං වා. අපි ච ඛ්වස්ස ඤාති වා සාලොහිතො වා දුක්ඛිතො වා හොති කාලකතො වා. සො තෙන සංවිජ්ජති සංවෙගං ආපජ්ජති. සංවිග්ගො යොනිසො පදහති. පහිතත්තො කායෙන චෙව පරමසච්චං සච්ඡිකරොති, පඤ්ඤාය ච අතිවිජ්ඣ පස්සති. සෙය්‍යථාපි සො භික්ඛවෙ භද්‍රො අස්සාජානීයො චම්මවෙධවිද්ධො සංවිජ්ජති සංවෙගං ආපජ්ජති, තථූපමාහං භික්ඛවෙ ඉමං භද්‍රං පුරිසාජානීයං වදාමි, එවරූපොපි භික්ඛවෙ ඉධෙකච්චො භද්‍රො පුරිසාජානීයො හොති. අයං භික්ඛවෙ තතියො භද්‍රො පුරිසාජානීයො සන්තො සංවිජ්ජමානො ලොකස්මිං.

පුන ච පරං භික්ඛවෙ ඉධෙකච්චො භද්‍රො පුරිසාජානීයො න හෙව ඛො සුණාති අමුකස්මිං නාම ගාමෙ වා නිගමෙ වා ඉත්ථී වා පුරිසො වා දුක්ඛිතො වා කාලකතො වාති. නපි සාමං පස්සති ඉත්ථිං වා පුරිසං වා දුක්ඛිතං වා කාලකතං වා. නපිස්ස ඤාති වා සාලොහිතො වා දුක්ඛිතො වා හොති කාලකතො වා. අපි ච ඛො සාමඤ්ඤෙව ඵුට්ඨො හොති සාරීරිකාහි වෙදනාහි දුක්ඛාහි තිබ්බාහි ඛරාහි කටුකාහි අසාතාහි අමනාපාහි පාණහරාහි. සො තෙන සංවිජ්ජති, සංවෙගං ආපජ්ජති, සංවිග්ගො යොනිසො පදහති. පහිතත්තො කායෙන චෙව පරමසච්චං සච්ඡිකරොති, පඤ්ඤාය ච අතිවිජ්ඣ පස්සති. සෙය්‍යථාපි සො භික්ඛවෙ භද්‍රො අස්සාජානීයො අට්ඨිවෙධවිද්ධො සංවිජ්ජති සංවෙගං ආපජ්ජති, තථූපමාහං භික්ඛවෙ ඉමං භද්‍රං පුරිසාජානීයං වදාමි. එවරූපොපි භික්ඛවෙ ඉධෙකච්චො භද්‍රො පුරිසාජානීයො හොති. අයං භික්ඛවෙ චතුත්ථො භද්‍රො පුරිසාජානීයො සන්තො සංවිජ්ජමානො ලොකස්මිං.

ඉමෙ ඛො භික්ඛවෙ චත්තාරො භද්‍රා පුරිසාජානීයා සන්තො සංවිජ්ජමානා ලොකස්මින්ති.

Free Distribution www.aathaapi.org

මහණෙනි, මෙලොව ඇතැම් භද්‍ර පුරුෂාජානීයයෙක් අසෝ ගම්හි හෝ නියම්ගම්හි හෝ ස්ත්‍රියක හෝ පුරුෂයෙක් හෝ දුඃඛිත වේවයි, කලුරිය කෙළේ වේවයි අසා ද, හෙ එයින් සංවේග (මනාවීර්‍ය්‍ය) කෙරෙයි, සංවේගයට පැමිණෙයි. උපන් සංවේග ඇත්තේ, නිවන් කරා ගිය සිත් ඇත්තේ නුවණින් ප්‍රධන් වීර්‍ය්‍ය කෙරෙයි. නාමකායිනුත් නිවන් දක්නේ විදර්ශනා සහිත මාර්ග ප්‍රඥයෙන් ද විනිවිද දකියි. මහණෙනි, යම් පරිදි ඒ භද්‍ර ආශ්වාජානීය කැඟිටිසෙය දුක සංවෙග කෙරේද, වෙගයට පැමිණේ ද, මහණෙනි, මේ භද්‍ර පුරුෂාජානීයයා එබඳුහ යි මම කියමි. මහණෙනි, මෙලොව මෙබඳු වූත් ඇතැම් භද්‍ර පුරුෂාජානීයයෙක් වෙයි. මහණෙනි, මේ පළමුවන භද්‍ර පුරුෂාජානීයයා ලොකයෙහි විද්‍යමාන වේ.

තවද මහණෙනි, මෙලොව ඇතැම් භද්‍ර පුරුෂාජානීයයෙක් අසෝ ගමෙහි හෝ නියම්ගමෙහි හෝ ස්ත්‍රියක හෝ පුරුෂයෙක් හෝ දුඃඛිත වේවයි, කලුරිය කෙළේ වේවයි තො ම අසා ද, වැලිත් දුඃඛිත වූ හෝ කලුරිය කළා වූ හෝ ස්ත්‍රියක හෝ පුරුෂයකු හෝ තෙමේ දක්නේ ය. හේ එයින් සංවේග කෙරේ. සංවේගයට පැමිණේ සංවේග ඇතියේ නිවන් කරා ගිය සිත් ඇත්තේ නුවණින් ප්‍රධන් වීර්‍ය්‍ය කෙරේ. නාමකායිනුත් නිර්‍වාණය පසක් කරන්නේ විදර්ශනා සහිත මාර්ගප්‍රඥයෙන් ද විනිවිද දකී මහණෙනි, යම් පරිද් ඒ භද්‍ර අශ්වාජානීය ලෝමයෙහි විත් පහරින් විදුනා ලද්දේ වේග දනවා ද, වේගයට පැමිණේ ද, මහණෙනි, මම මේ භද්‍ර පුරුෂාජානීයයා එබඳුහ යි කියමි. මහණෙනි, මෙබඳු වූත් ඇතැම් භද්‍ර පුරුෂාජානීයයෙක් මෙලොව්හි වෙයි. මහණෙනි, මේ දෙවන භද්‍ර පුරුෂාජානීයයා ලෝකයෙහි විද්‍යමාන වේ.

තවද මහණෙනි, මෙලොව ඇතැම් භද්‍ර පුරුෂාජානීයයෙක් අසෝ ගමෙහි හෝ නියම්ගමෙහි හෝ ස්ත්‍රියක හෝ පුරුෂයෙක් හෝ දුඃඛිත වේවයි, කලුරිය කෙළේ වේවයි තො ම අසා ද, දුඃඛිත වූ හෝ කලුරිය කළාවූ හෝ ස්ත්‍රියක හෝ පුරුෂයකු හෝ තෙමේත් නො දකී ද, වැලිත් ඔහුගේ නෑයෙක් හෝ සහලේ නෑයෙක් හෝ දුඃඛිත වූයේ හෝ කලුරිය කෙළේ හෝ වේ ද, හෙ එයින් සංවේග කෙරෙයි. සංවේගයට පැමිණෙයි, සංවේගයට පැමිණියේ නිවණට ගිය සිතැත්තේ නුවණින් ප්‍රධන් වීර්‍ය්‍ය කෙරෙයි. නාමකායිනුත් නිවන් ප්‍රත්‍යක්‍ෂ කරණුයේ විදර්ශනා සහිත මාර්ගප්‍රඥයෙන් විනිවිද දකී. මහණෙනි, යම් පරිදි ඒ භද්‍ර අශ්වාජානීය තෙමේ ලොමෙහි විත් පහරින් විදුනා ලදුයේ සංවේග දනවා ද, වේගයට පැමිණේ ද, මහණෙනි, මම මේ භද්‍ර පුරුෂාජානීයයා එබඳුහ යි කියමි. මහණෙනි, මෙබඳු වූත් ඇතැම් භද්‍ර පුරුෂාජානීයයෙක් මෙලොව්හි වෙයි. මහණෙනි, මේ තුන්වන භද්‍ර පුරුෂාජානීයයා ලෝකයෙහි විද්‍යමාන වෙයි.

තවද මහණෙනි, මෙලොව ඇතැම් පුරුෂාජානීයයෙක් අසෝ ගමෙහි හෝ නියම්ගමෙහි හෝ ස්ත්‍රියක හෝ පුරුෂයෙක් හෝ දුඃඛිත වේවයි. කලුරිය කෙළේ වේවයි තො ම අසා ද, දුඃඛිත වූ හෝ කලුරිය කළා වූ හෝ ස්ත්‍රියක හෝ පුරුෂයකු හෝ තෙමේත් නො දක්නේ ද, ඔහුගේ නෑයෙක් හෝ සහලේ නෑයෙක් හෝ දුඃඛිත වූයේ හෝ කලුරිය කෙළේ හෝ නො වේ ද, වැලිත් තෙමේ ම දුක් වූ තීව්‍ර වූ බර වූ කටුක වූ අමිධුර වූ අමනොහර වූ ප්‍රාණහර වූ ශාරීරිකවේදනායෙන් පහස්නා ලද්දේ වෙයි. හේ එයින් සංවේග කෙරේ. සංවේගයට පැමිණේ. සංවෙගයට පැමිණියේ නිවණට ගිය සිතැත්තේ නුවණින් ප්‍රධන් වීර්‍ය්‍ය කෙරේ. නාමකායිනුත් නිවන් ප්‍රත්‍යක්‍ෂ කරණුයේ විදර්ශනා සහිත ප්‍රඥයෙනුත් විනිවිද දකී. මහණෙනි, යම් පරිදි ඒ භද්‍ර අශ්වාජානීය ඇට බිඳුනා විත් පහරින් විදුනා ලද්දේ සංවේග දනවා ද, වේගයට පැමිණේ ද, මහණෙනි, මම මේ භද්‍ර පුරුෂාජානීයයා එබඳු හ යි කියමි. මහණෙනි, මෙබඳු වූත් ඇතැම් භද්‍ර පුරුෂාජානීයයෙක් මෙලොව්හි වෙයි. මහණෙනි, මේ භද්‍ර වූ සතරවන පුරුෂාජානීයයා ලෝකයෙහි විද්‍යමාන වේ.

මහණෙනි, මේ සතර පුරුෂාජානීයයෝ ලෝකයෙහි විද්‍යමානයහ.

## 4. 3. 2. 4.

## [නාගසුත්තං]

14. චතූහි භික්ඛවෙ අඞ්ගෙහි සමන්නාගතො රඤ්ඤො නාගො රාජාරහො හොති රාජභොග්ගො. රඤ්ඤො අඞ්ගන්තෙව සඞ්ඛං ගච්ඡති. කතමෙහි චතූහි?

ඉධ භික්ඛවෙ රඤ්ඤො නාගො සොතා ච හොති හන්තා ච ඛන්තා ච ගන්තා ච.

කථඤ්ච භික්ඛවෙ රඤ්ඤො නාගො සොතා හොති, ඉධ භික්ඛවෙ රඤ්ඤො නාගො යමෙතං හත්ථිදම්මසාරථී කාරණං කාරෙති යදි වා කතපුබ්බං යදි වා අකතපුබ්බං, තං අට්ඨිකත්වා[1] මනසි කත්වා සබ්බං චෙතසො[2] සමන්නාහරිත්වා ඔහිතසොතො සුණාති. එවං ඛො භික්ඛවෙ රඤ්ඤො නාගො සොතා හොති.

කථඤ්ච භික්ඛවෙ රඤ්ඤො නාගො හන්තා හොති? ඉධ භික්ඛවෙ රඤ්ඤො නාගො සඞ්ගාමගතො හත්ථිම්පි හනති[3] හත්ථාරූහම්පි හනති[3] අස්සම්පි හනති අස්සාරූහම්පි හනති රථම්පි හනති රථිකම්පි හනති පත්තිකම්පි හනති. එවං ඛො භික්ඛවෙ රඤ්ඤො නාගො හන්තා හොති.

කථඤ්ච භික්ඛවෙ රඤ්ඤො නාගො ඛන්තා හොති? ඉධ භික්ඛවෙ රඤ්ඤො නාගො සඞ්ගාමගතො ඛමො හොති සත්තිප්පහාරානං උසුප්පහාරානං[4] අසිප්පහාරානං ඵරසුප්පහාරානං භෙරිපණවසඞ්ඛතිණවනින්නාදසද්දානං. එවං ඛො භික්ඛවෙ, රඤ්ඤො නාගො ඛන්තා හොති.

කථඤ්ච භික්ඛවෙ රඤ්ඤො නාගො ගන්තා හොති? ඉධ භික්ඛවෙ රඤ්ඤො නාගො යමෙතං හත්ථිදම්මසාරථි දිසං පෙසෙති යදි වා ගතපුබ්බං යදි වා අගතපුබ්බං, තං ඛිප්පඤ්ඤෙව[5] ගන්තා හොති. එවං ඛො භික්ඛවෙ රඤ්ඤො නාගො ගන්තා හොති.

ඉමෙහි ඛො භික්ඛවෙ චතූහි අඞ්ගෙහි සමන්නාගතො රඤ්ඤො නාගො රාජාරහො හොති රාජභොග්ගො. රඤ්ඤො අඞ්ගන්තෙව සඞ්ඛං ගච්ඡති.

එවමෙව ඛො භික්ඛවෙ චතූහි ධම්මෙහි සමන්නාගතො භික්ඛු ආහුනෙය්‍යො හොති පාහුනෙය්‍යො, දක්ඛිණෙය්‍යො, අඤ්ජලිකරණීයො, අනුත්තරං පුඤ්ඤක්ඛෙත්තං ලොකස්ස.

කතමෙහි චතූහි? ඉධ භික්ඛවෙ භික්ඛු සොතා ච හොති හන්තා ච ඛන්තා ච ගන්තා ච.

කථඤ්ච භික්ඛවෙ භික්ඛු සොතා හොති? ඉධ භික්ඛවෙ භික්ඛු තථාගතප්පවෙදිතෙ ධම්මවිනයෙ දෙසියමානෙ අට්ඨිකත්වා මනසි කත්වා සබ්බං චෙතසො[2] සමන්නාහරිත්වා ඔහිතසොතො ධම්මං සුණාති, එවං ඛො භික්ඛවෙ භික්ඛු සොතා හොති.

1. අට්ඨිං කත්වා - මජ්සං. 2. සබ්බචෙතසා - මජ්සං. 3. ආහනති - මජ්සං.
4. අසිප්පහාරානං උසුප්පහාරානං - මජ්සං. 5. ඛිප්පමෙව - මජ්සං.

## 4. 3. 2. 4.

## [ නාග සූත්‍රය ]

14. මහණෙනි, සතර කරුණෙකින් සමන්වාගත රජුගේ ඇත් රජාණී වේ රජුහු විසින් වළඳ කළයුතු වේ. රජාවයවයෙක් ම ය යි ගණනට යෙයි. කවර සතර කරුණෙක යත්:

මහණෙනි, මෙලොව රජුගේ ඇත් අසනුයේ ද වෙයි. නසනුයේ ද, ඉවසනුයේ ද, යනුයේ ද වෙයි.

මහණෙනි, කෙසේ රජුගේ ඇත් අසනුයේ වේ ද? මහණෙනි, මෙලොව රජුගේ ඇත් කළවිරූ වේවයි, නො කළවිරූ වේවයි, යම් කම්කටුලු හස්තිදම්‍යසාරථි තුඩුන් ලවා කරවා ද, එය අර්ථි ව මෙනෙහි කොට සියල්ල සිතට සමන්නා ගෙන රැකළ කන් ඇති ව අසා ද, මහණෙනි, මෙසේ රජුගේ ඇත් අසනුයේ නම් වෙයි.

මහණෙනි, කෙසේ රජුගේ ඇත් නසනුයේ වේ ද? මහණෙනි, මෙලොව රජුගේ ඇත් සඞ්ග්‍රාමශීර්ෂයට ගියේ ඇතුදු නසයි. ඇතරුවා ද නසයි. අසුදු නසයි. අසරුවා ද නසයි. රිය ද නසයි. රිය නැගී යොධ ද නසයි. පාබල ද නසයි. මහණෙනි, මෙසේ රජුගේ ඇත් නසනුයේ නම් වේ.

මහණෙනි, කෙසේ රජුගේ ඇත් ඉවසනුයේ වේ ද? මහණෙනි, මෙලොව රජුගේ ඇත් සඞ්ග්‍රාමශීර්ෂයට ගියේ සිරිය පහර, හී පහර, කඩු පහර, පොරෝ පහර, බෙර පණාබෙර සක් දෙණ්ඩිම් යන නිනාද ශබ්ද ඉවසයි. මහණෙනි, මෙසේ රජුගේ ඇත් ඉවසනුයේ නම් වේ.

මහණෙනි, කෙසේ රජුගේ ඇත් යනුයේ වේ ද? මහණෙනි, මෙලොව රජුගේ ඇත් ගිය විරූ දිග වේවයි නොගිය විරූ දිග වේවයි, යම් දිගකට ඇත්දමසැරි මෙහෙයා ද, එදිගට වහා ම යනුයේ වෙයි. මහණෙනි, මෙසේ රජුගේ ඇත් යනුයේ නම් වේ.

මහණෙනි, මේ සතර කරුණින් සමන්වාගත වූ රජුගේ ඇත් රජුට නිසි වූයේ රජු විසින් වළඳ කටයුතු වූයේ වෙයි. රජාවයවයෙක් ම ය යි ගණනට යෙයි.

මහණෙනි, එපරිද්දෙම සතර කරුණෙකින් සමන්වාගත මහණ ආහුනෙය්‍ය වේ. පාහුණෙය්‍ය වේ. දක්ඛිණෙය්‍ය වේ. අඤ්ජලිකරණීය වේ. ලෝකයාට අනුත්තර පුණ්‍යක්ෂෙත්‍ර වෙයි.

කවර සතර කරුණෙක යත්: මහණෙනි, මෙසස්නෙහි මහණ අසනුයේ ද, නසනුයේ ද, ඉවසනුයේ ද, යනුයේ ද වෙයි.

මහණෙනි, කෙසේ මහණ අසනුයේ වේ ද? මහණෙනි, මෙසස්නෙහි මහණ තථාගතයන් විසින් වදාරණ ලද ධර්ම විනය දෙසනු ලබන කල්හි අර්ථිව මෙනෙහි කොට සියල්ල සිතට සමන්නා ගෙණ රැකළ කන් ඇතිව ඒ දහම් අසයි. මහණෙනි, මෙසේ මහණ අසනුයේ නම් වෙයි.

කථඤ්ච භික්ඛවෙ භික්ඛු හන්තා හොති? ඉධ භික්ඛවෙ භික්ඛු උප්පන්නං කාමවිතක්කං නාධිවාසෙති පජහති විනොදෙති[1] ව්‍යන්තීකරොති අනභාවං ගමෙති. උප්පන්නං ව්‍යාපාදවිතක්කං -පෙ- උප්පන්නං විහිංසාවිතක්කං -පෙ- උප්පන්නුප්පන්නෙ පාපකෙ අකුසලෙ ධම්මෙ නාධිවාසෙති පජහති විනොදෙති ව්‍යන්තීකරොති අනභාවං ගමෙති. එවං ඛො භික්ඛවෙ භික්ඛු හන්තා හොති.

කථඤ්ච භික්ඛවෙ භික්ඛු ඛන්තා හොති? ඉධ භික්ඛවෙ භික්ඛු ඛමො හොති සීතස්ස උණ්හස්ස ජිඝච්ඡාය පිපාසාය ඩංසමකසවාතාතපසිරිංසපසම්ඵස්සානං දුරුත්තානං දුරාගතානං වචනපථානං, උප්පන්නානං සාරීරිකානං වෙදනානං දුක්ඛානං තිබ්බානං ඛරානං කටුකානං අසාතානං අමනාපානං පාණහරානං අධිවාසිකජාතිකො හොති. එවං ඛො භික්ඛවෙ භික්ඛු ඛන්තා හොති.

කථඤ්ච භික්ඛවෙ භික්ඛු ගන්තා හොති? ඉධ භික්ඛවෙ භික්ඛු යා දිසා අගතපුබ්බා ඉමිනා දීඝෙන අද්ධුනා යදිදං සබ්බසඞ්ඛාරසමථො සබ්බූපධිපටිනිස්සග්ගො තණ්හක්ඛයො විරාගො නිරොධො නිබ්බානං, තං ඛිප්පඤ්ඤෙව ගන්තා හොති. එවං ඛො භික්ඛවෙ භික්ඛු ගන්තා හොති.

ඉමෙහි ඛො භික්ඛවෙ චතූහි ධම්මෙහි සමන්නාගතො භික්ඛු ආහුනෙය්‍යො හොති -පෙ- අනුත්තරං පුඤ්ඤක්ඛෙත්තං ලොකස්සාති.

## 4. 3. 2. 5.

## [ඨානසුත්තං]

15. චත්තාරිමානි භික්ඛවෙ ඨානානි. කතමානි චත්තාරි?

අත්ථි භික්ඛවෙ ඨානං අමනාපං කාතුං, තඤ්ච කයිරමානං අනත්ථාය සංවත්තති. අත්ථි භික්ඛවෙ ඨානං අමනාපං කාතුං, තඤ්ච කයිරමානං අත්ථාය සංවත්තති. අත්ථි භික්ඛවෙ ඨානං මනාපං කාතුං, තඤ්ච කයිරමානං අනත්ථාය සංවත්තති. අත්ථි භික්ඛවෙ ඨානං මනාපං කාතුං, තඤ්ච කයිරමානං අත්ථාය සංවත්තති.

තත්‍ර භික්ඛවෙ යමිදං ඨානං අමනාපං කාතුං, තඤ්ච කයිරමානං අනත්ථාය සංවත්තති, ඉදං භික්ඛවෙ ඨානං උභයෙනෙව න කත්තබ්බං මඤ්ඤති. යම්පිදං ඨානං අමනාපං කාතුං, ඉමිනාපි තං න කාතබ්බං මඤ්ඤති. යම්පිදං ඨානං කයිරමානං අනත්ථාය සංවත්තති, ඉමිනාපි න කාතබ්බං මඤ්ඤති. ඉදං භික්ඛවෙ ඨානං උභයෙනෙව න කාතබ්බං මඤ්ඤති.

තත්‍ර භික්ඛවෙ යමිදං ඨානං අමනාපං කාතුං, තඤ්ච කයිරමානං අත්ථාය සංවත්තති, ඉමස්මිං භික්ඛවෙ ඨානෙ බාලො ච පණ්ඩිතො ච වෙදිතබ්බො පුරිසත්ථාමෙ පුරිසවිරියෙ පුරිසපරක්කමෙ. න භික්ඛවෙ බාලො ඉති පටිසඤ්චික්ඛති, ‘කිඤ්චාපි ඛො ඉදං ඨානං අමනාපං කාතුං, අථ චරහිදං ඨානං කයිරමානං අත්ථාය සංවත්තතී’ති. සො තං ඨානං න කරොති. තස්ස තං ඨානං අකයිරමානං අනත්ථාය සංවත්තති. පණ්ඩිතො ච ඛො භික්ඛවෙ ඉති පටිසඤ්චික්ඛති: ‘කිඤ්චාපි ඛො ඉදං ඨානං අමනාපං කාතුං, අථ චරහිදං ඨානං කයිරමානං අත්ථාය සංවත්තතී’ති. සො තං ඨානං කරොති. තස්ස තං ඨානං කයිරමානං අත්ථාය සංවත්තතීති.

---

1. විනොදෙති හනති - මජසං.

මහණෙනි, කෙසේ මහණ තසනුයේ වේ ද? මහණෙනි, මෙසස්නෙහි මහණ උපන් කාමවිතර්කය සිත්හි නො වස්වයි. හැර පියයි. බැහැරි කෙරෙයි. විගතාන්ත කෙරෙයි. අභාවයට පමුණුවයි. උපන් ව්‍යාපාදවිතර්කය... උපන් විහිංසාවිතර්කය ... උපනුපන් ලමු අකුසල දහම් සිත්හි නො වස්වයි. හැර පියයි. බැහැරි කෙරෙයි. විගතාන්ත කෙරෙයි. අභාවයට පමුණුවයි. මහණෙනි, මෙසේ මහණ තසනුයේ නම් වේ.

මහණෙනි, කෙසේ මහණ ඉවසනුයේ වේ ද? මහණෙනි, මෙසස්නෙහි මහණ ශීතය, උෂ්ණය, බඩසය, පවස, මැසිමදුරු, වා - අව්, දිග් දෑ යන මොවුන්ගේ පහස් ඉවසන්නේ වෙයි. නපුරු කොට කී නපුරු කොට පැමිණි වචනපථයන් ද දුක් ඇති තීව්‍ර වූ ඛර වූ කටුක වූ අමධුර වූ අමනාප වූ ප්‍රාණහර වූ උපන් ශාරීරික වෙදනා ඉවසන ප්‍රකෘති ඇත්තේ වෙයි. මහණෙනි, මෙසේ මහණ ඉවසනුයේ නම් වෙයි.

මහණෙනි, කෙසේ මහණ යනුයේ නම් වේ ද? මහණෙනි, මෙසස්නෙහි මහණ සියලු උපධීන්ගෙන් වෙන් වූ තෘෂ්ණාක්ෂය වූ විරාග වූ නිරෝධ වූ සර්වසංස්කාරශමථය යි කියන ලද යම් මේ නිවන් නමැති, මේ දිඝී කාලයෙහි නො ගිය විරූ දිගෙක් ඇද්ද, එදිග වහා ම යනුයේ වෙයි. මහණෙනි, මෙසේ මහණ යනුයේ නම් වේ.

මහණෙනි, මේ සතර කරුණින් සමන්විත මහණ ආහුනෙය්‍ය වේ. ... ලෝකයාගේ අනුත්තර පුණ්‍යක්ෂෙත්‍රය වෙයි.

## 4. 3. 2. 5.

## [ඨාන සූත්‍රය]

15. මහණෙනි, මේ කාරණයෝ සතර දෙනෙකි. කවර සතර දෙනෙක යත්:

මහණෙනි, කරුණෙක් ඇත. කරන්නට අමනාප ය. එ ද කරණු ලබන්නේ අනර්ථයට වැටේ. මහණෙනි, කරුණෙක් ඇත. කරන්නට අමනාප ය. එ ද කරණු ලබන්නේ අර්ථයට වැටේ. මහණෙනි, කරුණෙක් ඇත. කරන්නට මනාප ය. එ ද කරණු ලබන්නේ අනර්ථයට වැටේ. මහණෙනි, කරුණෙක් ඇත. කරන්නට මනාප ය. එ ද කරණු ලබන්නේ අර්ථයට වැටේ.

මහණෙනි, එහි කරන්නට අමනාප වූ යම් මේ කරුණෙක් ඇද්ද, එ ද කරණු ලබන්නේ අනර්ථයට වැටේ ද, මහණෙනි, මෙ කරුණ දෙපරිද්දෙ ම නො කටයුතු කොට හඟනේය. මේ කරුණෙක් කරන්නට අමනාප වේ ද, මෙසිනුත් එය නො කටයුතු කොට හඟනේය. යම් මේ කරුණෙක් කරණු ලබන්නේ අනර්ථයට වැටේ ද, මෙසිනුත් නො කටයුතු කොට හඟනේය. මහණෙනි, මෙ කරුණ දෙපරිද්දෙ ම නො කටයුතු කොට හඟනේය.

මහණෙනි, එහි කරන්නට අමනාප යම් ඒ කරුණෙක් ඇද්ද, එ ද කරණු ලබන්නේ අර්ථයට වැටේ ද, මහණෙනි, මෙ කරුණෙහි පුරුෂයාගේ ඥානශක්තියෙහි, පුරුෂයාගේ ඥානවීර්යයෙහි, පුරුෂයාගේ ඥානපරාක්‍රමයෙහි ලා බාලයා ද පණ්ඩිතයා ද දත යුතු යි. මහණෙනි, බාල තෙමේ මෙසේ නොසලකයි: 'මෙ කරුණ කරන්නට අමනාපය. වැලිත් මෙ කරුණ කරණු ලබන්නේ අර්ථයට වැටේ' යයි. හෙතෙම එකරුණ නො කෙරෙයි. ඔහුට නො කරණු ලබන එකරුණ අනර්ථයට වැටෙයි. මහණෙනි, පණ්ඩිත තෙමේ මෙසේ සලකයි: 'මෙකරුණ කරන්නට අමනාපය. වැලිත් මෙකරුණ කරණු ලබන්නේ අර්ථයට වැටේය' යි හෙතෙම එ කරුණ කෙරෙයි. ඔහුට එකරුණ කරණු ලබන්නේ අර්ථයට වැටෙයි.

තත්‍ර භික්ඛවෙ යමිදං ඨානං මනාපං කාතුං, තඤ්ච කයිරමානං අනත්ථාය සංවත්තති. ඉමස්මිම්පි භික්ඛවෙ ඨානෙ බාලො ච පණ්ඩිතො ච වෙදිතබ්බො පුරිසත්ථාමෙ පුරිසවිරියෙ පුරිසපරක්කමෙ. න භික්ඛවෙ බාලො ඉති පටිසංචික්ඛති: 'කිඤ්චාපි ඛො ඉදං ඨානං මනාපං කාතුං, අථ චරහිදං ඨානං කයිරමානං අනත්ථාය සංවත්තතී'ති. සො තං ඨානං කරොති. තස්ස තං ඨානං කයිරමානං අනත්ථාය සංවත්තති. පණ්ඩිතො ච ඛො භික්ඛවෙ ඉති පටිසංචික්ඛති: 'කිඤ්චාපි ඛො ඉදං ඨානං මනාපං කාතුං, අථ චරහිදං ඨානං කයිරමානං අනත්ථාය සංවත්තතී'ති. සො තං ඨානං න කරොති. තස්ස තං ඨානං අකයිරමානං අත්ථාය සංවත්තති.

තත්‍ර භික්ඛවෙ යමිදං ඨානං මනාපං කාතුං, තඤ්ච කයිරමානං අත්ථාය සංවත්තති, ඉදං භික්ඛවෙ ඨානං උභයෙනෙව කත්තබ්බං මඤ්ඤති. යම්පිදං ඨානං මනාපං කාතුං, ඉමිනාපි තං කත්තබ්බං මඤ්ඤති. යම්පිදං ඨානං කයිරමානං අත්ථාය සංවත්තති, ඉමිනාපි තං කත්තබ්බං මඤ්ඤති. ඉදං භික්ඛවෙ ඨානං උභයෙනෙව කත්තබ්බං මඤ්ඤති.

ඉමානි ඛො භික්ඛවෙ චත්තාරි ඨානානීති.

## 4. 3. 2. 6.

## [අප්පමාදසුත්තං]

16. චතූහි භික්ඛවෙ ඨානෙහි අප්පමාදො කරණීයො. කතමෙහි චතූහි?

කායදුච්චරිතං භික්ඛවෙ පජහථ. කායසුචරිතං භාවෙථ. තත්ථ ච මා පමාදත්ථ. වචීදුච්චරිතං භික්ඛවෙ පජහථ. වචීසුචරිතං භාවෙථ. තත්ථ ච මා පමාදත්ථ. මනොදුච්චරිතං භික්ඛවෙ පජහථ. මනොසුචරිතං භාවෙථ. තත්ථ ච මා පමාදත්ථ. මිච්ඡාදිට්ඨිං භික්ඛවෙ පජහථ. සම්මාදිට්ඨිං භාවෙථ. තත්ථ ච මා පමාදත්ථ.

යතො ඛො භික්ඛවෙ භික්ඛුනො කායදුච්චරිතං පහීනං හොති, කායසුචරිතං භාවිතං. වචීදුච්චරිතං පහීනං හොති, වචීසුචරිතං භාවිතං. මනොදුච්චරිතං පහීනං හොති, මනොසුචරිතං භාවිතං. මිච්ඡාදිට්ඨි පහීනා හොති, සම්මාදිට්ඨි භාවිතා. සො න භායති සම්පරායිකස්ස මරණස්සාති.

Free Distribution www.aathaapi.org

මහණෙනි, එහි කරන්නට මනාප වූ යම් කරුණෙක් වේ ද, එ ද කරණු ලබන්නේ අනර්ථයට වැටේ ද, මහණෙනි, මේ කරුණෙහි දී පුරුෂයාගේ ශුතශක්තියෙහි, පුරුෂයාගේ ශුතවීර්‍ය්‍යයෙහි, පුරුෂයාගේ ශුතපරාක්‍රමයෙහි ලා බාලයා ද පණ්ඩිතයා ද දත යුතු ය. මහණෙනි, බාල මෙසේ නො සලකයි: 'මේ කරුණ කරන්නට මනාපය. වැලිත් මෙකරුණ කරණු ලබන්නේ අනර්ථයට වැටේය'යි. හෙතෙම එකරුණ කෙරෙයි. ඔහුට එකරුණ කරණු ලබන්නේ අනර්ථයට වැටේ. මහණෙනි, පණ්ඩිත තෙමේ මෙසේ සලකයි: 'මේ කරුණ කරන්නට මනාපය. වැලිත් මෙකරුණ කරණු ලබන්නේ අනර්ථයට වැටේය' යි. හෙතෙම එ කරුණ නො කෙරෙයි. ඔහුට එකරුණ නො කරණු ලබන්නේ අර්ථයට වැටෙයි.

මහණෙනි, එහි කරන්නට මනාප යම් ඒ කරුණෙක් ඇද්ද, එ ද කරණු ලබන්නේ අර්ථයට වැටේ ද, මහණෙනි, මේ කරුණ දෙපරිදි ම කළයුතු කොට හඟී. යම් මේ කරුණෙක් කරන්නට කැමති වේ ද, මෙසිනුත් එය කළයුතු කොට හඟී. යම් මේ කරුණෙක් කරණු ලබන්නේ අර්ථයට වැටේ ද, මෙසිනුත් එය කළයුතු කොට හඟී. මහණෙනි, මේ කරුණ දෙපරිදි ම කළයුතු කොට හඟී.

මහණෙනි, මේ සතර කරුණු යි.

## 4. 3. 2. 6.

## [අප්පමාද සුත්‍රය]

16. මහණෙනි, සතර කරුණෙකින් අප්‍රමාදය කළ යුතුය. කවර සතර කරුණෙක යත්:

මහණෙනි, කායදුශ්චරිතය හැර පියව. කාය සුචරිතය වඩව. එහිදු නහමක් පමා වව. මහණෙනි, වාග්දුශ්චරිතය හැර පියව. වාක්සුචරිතය වඩව. එහිදු නහමක් පමා වව. මහණෙනි, මනොදුශ්චරිතය හැර පියව. මනෘසුචරිතය වඩව, එහිදු නහමක් පමා වව. මහණෙනි, මිථ්‍යාදිට්ඨි හැර පියව. සම්දිට්ඨි වඩව. එහි දු නහමක් පමා වව

මහණෙනි, යම් කලෙක මහණහට කායදුශ්චරිතය ප්‍රහීණ වේ ද, කායසුචරිතය භාවිත වේ ද, වාග්දුශ්චරිතය ප්‍රහීණ වේ ද, වාක්සුචරිතය භාවිත වේ ද, මනෝදුශ්චරිතය ප්‍රහීණ වේ ද, මනස්සුචරිතය භාවිත වේ ද, මිථ්‍යාදිට්ඨි ප්‍රහීණ වේ ද, සම්දිට්ඨි භාවිත වේ ද, හෙතෙම සම්පරායික මරණයට බියපත් නො වෙයි.

## 4. 3. 2. 7.

## [ආරක්ඛසුත්තං]

17. චතූසු භික්ඛවෙ ඨානෙසු අත්තරූපෙන අප්පමාදො සතිචෙතසො ආරක්ඛො කරණීයො. කතමෙසු චතූසු?

මා මෙ රජනීයෙසු ධම්මෙසු චිත්තං රජ්ජීති අත්තරූපෙන අප්පමාදො සතිචෙතසො ආරක්ඛො කරණීයො.

මා මෙ දොසනීයෙසු ධම්මෙසු චිත්තං දුස්සීති අත්තරූපෙන අප්පමාදො සතිචෙතසො ආරක්ඛො කරණීයො.

මා මෙ මොහනීයෙසු ධම්මෙසු චිත්තං මුය්හීති අත්තරූපෙන අප්පමාදො සතිචෙතසො ආරක්ඛො කරණීයො.

මා මෙ මදනීයෙසු ධම්මෙසු චිත්තං මජ්ජීති අත්තරූපෙන අප්පමාදො සතිචෙතසො ආරක්ඛො කරණීයො.

යතො ඛො භික්ඛවෙ භික්ඛුනො රජනීයෙසු ධම්මෙසු චිත්තං න රජ්ජති වීතරාගත්තා, දොසනීයෙසු ධම්මෙසු චිත්තං න දුස්සති වීතදොසත්තා, මොහනීයෙසු ධම්මෙසු චිත්තං න මුය්හති වීතමොහත්තා, මදනීයෙසු ධම්මෙසු චිත්තං න මජ්ජති වීතමදත්තා, සො න ඡම්භති, න කම්පති, න වෙධති, න සන්තාසං ආපජ්ජති. න ච පන සමණවචනහෙතුපි ගච්ඡතීති.

## 4. 3. 2. 8.

## [සංවෙජනීයසුත්තං]

18. චත්තාරිමානි භික්ඛවෙ සද්ධස්ස කුලපුත්තස්ස දස්සනීයානි සංවෙජනීයානි ඨානානි. කතමානි චත්තාරි?

ඉධ තථාගතො ජාතොති භික්ඛවෙ සද්ධස්ස කුලපුත්තස්ස දස්සනීයං සංවෙජනීයං ඨානං.

ඉධ තථාගතො අනුත්තරං සම්මාසම්බොධිං අභිසම්බුද්ධොති භික්ඛවෙ සද්ධස්ස කුලපුත්තස්ස දස්සනීයං සංවෙජනීයං ඨානං.

ඉධ තථාගතො අනුත්තරං ධම්මචක්කං පවත්තෙසීති භික්ඛවෙ සද්ධස්ස කුලපුත්තස්ස දස්සනීයං සංවෙජනීයං ඨානං.

ඉධ තථාගතො අනුපාදිසෙසාය නිබ්බානධාතුයා පරිනිබ්බුතොති භික්ඛවෙ සද්ධස්ස කුලපුත්තස්ස දස්සනීයං සංවෙජනීයං ඨානං.

ඉමානි ඛො භික්ඛවෙ චත්තාරි සද්ධස්ස කුලපුත්තස්ස දස්සනීයානි සංවෙජනීයානි ඨානානීති.

### 4. 3. 2. 7.

### [ආරක්ඛ සූත්‍රය]

17. මහණෙනි, සතර තැනෙක තමාට නිසි සැටියෙන් (හිත-කැමැත්තෙන්) අප්‍රමාදය-සමෘති සම්ප්‍රයුක්ත චිත්ත යාගේ ආරක්ෂාව කළයුතුය. කවර සතර තැනෙක යත්:

සිත් ඇලීමට කරුණු වූ දහම්හි මාගේ සිත නහමක් ඇලේව යි තමහට නිසි සැටියෙන් අප්‍රමාදය - සමෘති සම්ප්‍රයුක්ත චිත්තයාගේ ආරක්ෂාව කළයුතු ය.

ද්වේෂයට කරුණු වූ දහම්හි මාගේ සිත නහමක් දූෂිත වේව යි තමාට නිසි සැටියෙන් අප්‍රමාදය - සමෘති සම්ප්‍රයුක්ත චිත්තයාගේ ආරක්ෂාව කළයුතු ය.

මෝහනයට කරුණු වූ දහම්හි මාගේ සිත නහමක් මුළා වේව යි තමාට නිසි සැටියෙන් අප්‍රමාදය - සමෘති සම්ප්‍රයුක්ත චිත්තයාගේ ආරක්ෂාව කළයුතු ය.

මදයට කරුණු වූ දහම්හි මාගේ සිත නහමක් මත් වේව යි තමහට නිසි සැටියෙන් අප්‍රමාදය - සමෘති සම්ප්‍රයුක්ත චිත්තයාගේ ආරක්ෂාව කළයුතු ය.

මහණෙනි, යම් දිනෙක පටන් මහණ මහණහුගේ සිත වීතරාග බැවින් රජනයට කරුණු වූ දහම්හි නො ඇලේ ද, වීතද්වේෂ බැවින් ද්වේෂයට කරුණු වූ දහම්හි සිත දූෂිත නො වේ ද, මෝහයට කරුණු වූ දහම්හි පැහු මෝහ ඇති බැවින් සිත නහමක් මුළා වේ ද, මදයට කරුණු වූ දහම්හි පැහු මද ඇති බැවින් සිත නහමක් මත් වේ ද, හෙතෙම තැති නො ගණී, නො සැලේ, නො වෙවුලයි. සන්ත්‍රාසයට නො යෙයි. පරවාදී ශ්‍රමණයන්ගේ වචන හෙතුවෙන් ද මිසදිටුවට නො යේ මැ යි.

### 4. 3. 2. 8.

### [සංවේජනීය සූත්‍රය]

18. මහණෙනි, සැදැහැති කුලපුතකු විසින් දැක්කයුතු, සංවෙග කටයුතු, මේ ස්ථානයෝ සතරෙක. කවර සතරෙක යත්:

මහණෙනි, මෙහි තථාගතයන් වහන්සේ උපන්හ යි සැදැහැති කුලපුතකු විසින් දැක්කයුතු සංවේග කටයුතු ස්ථාන යි.

මහණෙනි, මෙහි තථාගතයන් වහන්සේ අනුත්තර සම්‍යක්සම්බෝධිය අවබෝධ කළහ යි සැදැහැති කුලපුතකු විසින් දැක්කයුතු සංවේග කටයුතු ස්ථාන යි.

මහණෙනි, මෙහි තථාගතයන් වහන්සේ අනුත්තර ධර්මචක්‍රය පැවැත්වූහ යි සැදැහැති කුලපුතකු විසින් දැක්කයුතු සංවෙග කටයුතු ස්ථාන යි.

මහණෙනි, මෙහි තථාගතයන් වහන්සේ අනුපාදිශේෂ පරිනිර්වාණධාතුවෙන් පිරිනිවියහ යි සැදැහැති කුලපුතකු විසින් දැක්කයුතු සංවෙග කටයුතු ස්ථාන යි.

මහණෙනි, සැදැහැති කුලපුතකු විසින් දැක්කයුතු සංවෙග කටයුතු මේ සතර ස්ථානයෝ යි.

### 4. 3. 2. 9.

### [භයසුත්තං]

19. චත්තාරිමානි භික්ඛවෙ භයානි. කතමානි චත්තාරි? ජාතිභයං ජරාභයං ව්‍යාධිභයං මරණභයං.

ඉමානි ඛො භික්ඛවෙ චත්තාරි භයානීති.

### 4. 3. 2. 10.

### [දුතියභයසුත්තං]

20. චත්තාරිමානි භික්ඛවෙ භයානි. කතමානි චත්තාරි? අග්ගිභයං උදකභයං රාජභයං චොරභයං.

ඉමානි ඛො භික්ඛවෙ චත්තාරි භයානීති.

**කෙසිවග්ගො දුතියො.***

## 3. භයවග්ගො

### 4. 3. 3. 1.

### [භයසුත්තං]

**[සාවත්ථිනිදානං]**

21. චත්තාරිමානි භික්ඛවෙ භයානි. කතමානි චත්තාරි? අත්තානුවාදභයං පරානුවාදභයං දණ්ඩභයං දුග්ගතිභයං.

කතමඤ්ච භික්ඛවෙ අත්තානුවාදභයං? ඉධ භික්ඛවෙ එකච්චො ඉති පටිසඤ්චික්ඛති: 'අහං චෙව ඛො පන කායෙන දුච්චරිතං චරෙය්‍යං, වාචාය දුච්චරිතං චරෙය්‍යං, මනසා දුච්චරිතං චරෙය්‍යං, කිඤ්ච තං මං[1] අත්තා සීලතො න උපවදෙය්‍යා'ති. සො අත්තානුවාදභයස්ස භීතො කායදුච්චරිතං පහාය කායසුචරිතං භාවෙති. වචීදුච්චරිතං පහාය වචීසුචරිතං භාවෙති. මනොදුච්චරිතං පහාය මනොසුචරිතං භාවෙති. සුද්ධං අත්තානං පරිහරති. ඉදං වුච්චති භික්ඛවෙ අත්තානුවාදභයං.

කතමඤ්ච භික්ඛවෙ පරානුවාදභයං? ඉධ භික්ඛවෙ එකච්චො ඉති පටිසඤ්චික්ඛති: අහඤ්චෙව ඛො පන කායෙන දුච්චරිතං චරෙය්‍යං, වාචාය දුච්චරිතං චරෙය්‍යං, මනසා දුච්චරිතං චරෙය්‍යං, කිඤ්ච තං මං[1] පරෙ සීලතො න උපවදෙය්‍යුන්ති. සො පරානුවාදභයස්ස භීතො කායදුච්චරිතං පහාය කායසුචරිතං භාවෙති. වචීදුච්චරිතං පහාය වචීසුචරිතං භාවෙති. මනොදුච්චරිතං පහාය මනොසුචරිතං භාවෙති. සුද්ධං අත්තානං පරිහරති. ඉදං වුච්චති භික්ඛවෙ පරානුවාදභයං.

---

*තස්සුද්දානං: කෙසී ජවො පතොදො ච නාගො ඨානෙන පඤ්චමී
අප්පමාදො ච ආරක්ඛො සංවෙජනීයඤ්ච දෙව භයානීයි - මජසං.

1. සං. මං. - මජසං.

4. 3. 2. 9.

[භය සූත්‍රය]

19. මහණෙනි, මේ සතර භීතීහු වෙති. කවර සතරක යත්: ජාතිභය ය. ජරාභය ය. ව්‍යාධිභය ය. මරණභය යි.

මහණෙනි, මේ සතරභීතිහු යි.

4. 3. 2. 10.

[දුතිය භය සූත්‍රය]

20. මහණෙනි, මේ සතර භීතීහු වෙති. කවර සතරක යත්: අග්නි-භය ය. උදකභය ය. රාජභය ය. චෞරභය යි.

මහණෙනි, මේ සතර භීතීහු යි.

කෙසිවර්ගය දෙවැනි යි.

# 3. භයවර්ගය

4. 3. 3. 1.

[භය සූත්‍රය]

[සැවැත්නිදානයි]

21. මහණෙනි, මේ සතර භීතීහු වෙති. කවර සතරක යත්: ආත්මානු-වාදභය ය. පරානුවාදභය ය. දණ්ඩභය ය. දුර්ගතිභය යි.

මහණෙනි, ආත්මානුවාදභය නම් කවරේද යත්: මහණෙනි, මෙලොව ඇතැම් එකෙක් මෙසේ සලකයි: 'මම ද කයින් දුශ්චරිත කෙරෙම් නම්' වචනයෙන් දුශ්චරිත කෙරෙම් නම්, සිතින් දුශ්චරිත කෙරෙම් නම්, කිම, තෙමේ ඒ මට සීලයෙන් උපවාද නො කරන්නේ වේ ද?, හේ ආත්මානුවාදභයට බියපත් වූයේ කායදුශ්චරිතය හැරපියා කායසුචරිතය වඩයි .වාග්දුශ්චරිතය හැරපියා වාක්සුචරිතය වඩයි. මනෝදුශ්චරිතය හැරපියා මනඃසුචරිතය වඩයි. ශුද්ධ වූ ආත්මයක් පරිහරණය කෙරේ. මහණෙනි, මේ ආත්මානුවාදභය යි කියනු ලැබේ.

මහණෙනි, පරානුවාදභය නම් කවරේය යත්: මහණෙනි, මෙලොව ඇතැමෙක් මෙසේ සලකයි: 'මම වැලිත් කයින් දුශ්චරිත කෙරෙම් නම්, වචනයෙන් දුශ්චරිත කෙරෙම් නම්, සිතින් දුශ්චරිත කෙරෙම් නම්, කිම, පරහු ඒ මට ශීලයෙන් උපවාද නො කරන්නාහු වෙත් ද?, හේ පරානුවාද භයට බියපත් වූයේ කායදුශ්චරිතය හැරපියා කායසුචරිතය වඩයි. වාග්දුශ්චරිතය හැරපියා වාක්සුචරිතය වඩයි. මනොදුශ්චරිතය හැරපියා මනඃසුචරිතය වඩයි. ශුද්ධ වූ ආත්මයක් පරිහරණය කෙරේ. මහණෙනි, මේ පරානුවාදභය යි කියනු ලැබේ.

කතමඤ්ච භික්ඛවෙ දණ්ඩභයං? ඉධ භික්ඛවෙ එකච්චො පස්සති චොරං ආගුචාරිං රාජානො ගහෙත්වා විවිධා කම්මකාරණා[1] කාරෙන්තෙ - කසාහිපි තාළෙන්තෙ, වෙත්තෙහිපි තාළෙන්තෙ, අඩ්ඪදණ්ඩකෙහිපි තාළෙන්තෙ, හත්ථම්පි ඡින්දන්තෙ, පාදම්පි ඡින්දන්තෙ, හත්ථපාදම්පි ඡින්දන්තෙ, කණ්ණම්පි ඡින්දන්තෙ, නාසම්පි ඡින්දන්තෙ, කණ්ණනාසම්පි ඡින්දන්තෙ, බිලඞ්ගථාලිකම්පි කරොන්තෙ, සඞ්ඛමුණ්ඩිකම්පි කරොන්තෙ, රාහුමුඛම්පි කරොන්තෙ, ජොතිමාලිකම්පි කරොන්තෙ, හත්ථපජ්ජොතිකම්පි කරොන්තෙ, එරකවත්තිකම්පි කරොන්තෙ, චීරකවාසිකම්පි කරොන්තෙ, එණෙය්‍යකම්පි කරොන්තෙ, බලිසමංසිකම්පි කරොන්තෙ, කහාපණකම්පි කරොන්තෙ, ඛාරාපතච්ඡිකම්පි කරොන්තෙ, පලිඝපරිවත්තිකම්පි කරොන්තෙ, පලාලපීඨකම්පි කරොන්තෙ, තත්තෙනපි තෙලෙන ඔසිඤ්චන්තෙ, සුනඛෙහිපි ඛාදාපෙන්තෙ, ජීවන්තම්පි සූලෙ උත්තාසෙන්තෙ, අසිනාපි සීසං ඡින්දන්තෙ

තස්ස එවං හොති: "යථාරූපානං ඛො පාපකානං කම්මානං හෙතු චොරං ආගුචාරිං රාජානො ගහෙත්වා විවිධා කම්මකාරණා කාරෙන්ති: කසාහිපි තාළෙන්ති -පෙ- අසිනාපි සීසං ඡින්දන්ති. අහං චෙව ඛො පන එවරූපං පාපකං කම්මං කරෙය්‍යං, මම්පි රාජානො ගහෙත්වා එවරූපා විවිධා කම්මකාරණා කාරෙය්‍යුං: කසාහිපි තාළෙය්‍යුං, වෙත්තෙහිපි තාළෙය්‍යුං, අඩ්ඪදණ්ඩකෙහිපි තාළෙය්‍යුං, හත්ථම්පි ඡින්දෙය්‍යුං, පාදම්පි ඡින්දෙය්‍යුං, හත්ථපාදම්පි ඡින්දෙය්‍යුං, කණ්ණම්පි ඡින්දෙය්‍යුං, නාසම්පි ඡින්දෙය්‍යුං, කණ්ණනාසම්පි ඡින්දෙය්‍යුං, බිලඞ්ගථාලිකම්පි කරෙය්‍යුං, සඞ්ඛමුණ්ඩිකම්පි කරෙය්‍යුං, රාහුමුඛම්පි කරෙය්‍යුං, ජොතිමාලිකම්පි කරෙය්‍යුං, හත්ථපජ්ජොතිකම්පි කරෙය්‍යුං, එරකවත්තිකම්පි කරෙය්‍යුං, චීරකවාසිකම්පි කරෙය්‍යුං, එණෙය්‍යකම්පි කරෙය්‍යුං, බලිසමංසිකම්පි කරෙය්‍යුං, කහාපණකම්පි කරෙය්‍යුං, ඛාරාපතච්ඡිකම්පි කරෙය්‍යුං, පලිඝපරිවත්තිකම්පි කරෙය්‍යුං, පලාලපීඨකම්පි කරෙය්‍යුං, තත්තෙනපි තෙලෙන ඔසිඤ්චෙය්‍යුං, සුනඛෙහිපි ඛාදාපෙය්‍යුං, ජීවන්තම්පි සූලෙ උත්තාසෙය්‍යුං, අසිනාපි සීසං ඡින්දෙය්‍යු"න්ති. සො දණ්ඩභයස්ස භීතො න පරෙසං පාභතං පලුම්පන්තො චරති. ඉදං වුච්චති භික්ඛවෙ දණ්ඩභයං.

කතමඤ්ච භික්ඛවෙ දුග්ගතිභයං? ඉධ භික්ඛවෙ එකච්චො ඉති පටිසංචික්ඛති: කායදුච්චරිතස්ස ඛො පාපකො විපාකො අභිසම්පරායං. වචීදුච්චරිතස්ස පාපකො විපාකො අභිසම්පරායං. මනොදුච්චරිතස්ස පාපකො විපාකො අභිසම්පරායං අහං චෙව ඛො පන කායෙන දුච්චරිතං චරෙය්‍යං, වාචාය දුච්චරිතං චරෙය්‍යං. මනසා දුච්චරිතං චරෙය්‍යං, කිඤ්ච තං යාහං න කායස්ස භෙදා පරම්මරණා අපායං දුග්ගතිං විනිපාතං නිරයං උපපජ්ජෙය්‍යන්ති. සො දුග්ගතිභයස්ස භීතො කායදුච්චරිතං පහාය කායසුචරිතං භාවෙති. වචීදුච්චරිතං පහාය වචීසුචරිතං භාවෙති. මනොදුච්චරිතං පහාය මනොසුචරිතං භාවෙති. සුද්ධං අත්තානං පරිහරති. ඉදං වුච්චති භික්ඛවෙ දුග්ගතිභයං

ඉමානි ඛො භික්ඛවෙ චත්තාරි භයානීති.

---

1 කම්මකාරණා - මජසං.

Free Distribution www.aathaapi.org

මහණෙනි, දණ්ඩභය නම් කවරේ ද යත්: මහණෙනි, මෙ ලොව ඇතැමෙක් අපරාධකාරී සොරකු දකී. රජදරුවෝ තෙල සොරු ගෙණ විවිධ වූ කම්කටොලු කරත් - කස වැලින් ද තළත් ද, වේවැලිනුදු තළත් ද, අඩදඬු-යෙනුදු තළත් ද, අතුදු සිඳිත් ද, පාත් සිඳිත් ද, අත්පාත් සිඳිත් ද, කනුදු සිඳිත් ද, නාසාත් සිඳිත් ද, කන් නාසාත් සිඳිත් ද, බිලඞ්ගථාලික නම් වධයත් කෙරෙත් ද. සඞ්ඛමුණ්ඩික නම් වධයත් කෙරෙත් ද, රාහුමුඛ නම් වධයත් කෙරෙත් ද, ජෝතිමාලික නම් වධයත් කෙරෙත් ද, හත්ථපජ්ජෝතික නම් වධයත් කෙරෙත් ද, එරකවත්තික නම් වධයත් කෙරෙත් ද, චීරකවාසික නම් වධයත් කෙරෙත් ද, එණෙය්‍යක නම් වධයත් කෙරෙත් ද, බලිසමංසික නම් වධයත් කෙරෙත් ද, කහාපණක නම් වධයත් කෙරෙත් ද, ඛාරාපතච්ඡික නම් වධයත් කෙරෙත් ද, පලිඝපරිවත්තික නම් වධයත් කෙරෙත් ද, පලාල-පීඨක නම් වධයත් කෙරෙත් ද, කකියන තෙලිනුත් ඉසිත් ද, සුනඛයන් ලවාත් කවත් ද, දිවිස් හුලෙහි හිඳුවත් ද, කඩුවෙනුදු හිස සිඳිත් ද, (මෙබඳු දඬුවම් ලබන සොරුයි)

ඔහුට මෙබඳු සිතෙක් වෙයි: "යම්බඳු පාපකම් හේතුයෙන් අපරාධකාරී සොරකු ගෙණ රජදරුවෝ විවිධ කම්කටොලු කරත් ද, කසවැලිනුදු තළත් ද... කඩුවෙනුත් හිස සිඳිත් ද, මම ද මෙබඳු පාපකම් කෙරෙම් නම් රජ දරුවෝ මසිත් ගෙණ මෙ බඳු විවිධ කම්කටොලු කරන්නාහු ය: කසවැලිනුදු තළන්නාහු ය. වේවැලිනුදු තළන්නාහු ය. අඩදඬුයෙනුදු තළන්නාහු ය. අතුදු සිඳින්නාහු ය. පාත් සිඳින්නාහු ය. අත් පාත් සිඳින්නාහු ය කනුදු සිඳින් නාහු ය. නාසාත් සිඳින්නාහු ය. කන් නාසාත් සිඳින්නාහු ය. බිලඞ්ගථාලික නම් වධයත් කරන්නාහු ය. සඞ්ඛමුණ්ඩික නම් වධයත් කරන්නාහු ය. රාහුමුඛ නම් වධයත් කරන්නාහු ය. ජෝතිමාලික නම් වධයත් කරන්නාහු ය. හත්ථපජ්ජෝතික නම් වධයත් කරන්නාහු ය. එරකවත්තික නම් වධයත් කරන්නාහු ය. චීරකවාසික නම් වධයත් කරන්නාහු ය. එණෙය්‍යක නම් වධයත් කරන්නාහු ය. බලිසමංසික නම් වධයත් කරන්-නාහු ය. කහාපණක නම් වධයත් කරන්නාහු ය. ඛාරාපතච්ඡික නම් වධයත් කරන්නාහු ය. පලිඝපරිවත්තික නම් වධයත් කරන්නාහු ය. පලාලපීඨක නම් වධයත් කරන්නාහු ය. කකියන තෙලිනුත් ඉසින්නාහු ය. සුනඛයන් ලවාත් කවන්නාහු ය. දිවිස් හුල තබන්නාහු ය. කඩුවෙනුත් හිස සිඳින්නාහු ය"යි. හෙ දණ්ඩභයට බිය වූයේ මෙරමා අයත් වස්තුව පැහැර ගණිමින් නො හැසිරෙයි. මහණෙනි, මේ දණ්ඩභය යි කියනු ලැබේ.

මහණෙනි, දුර්ගතිභය නම් කවරේ ද යත්: මහණෙනි, මෙ ලොව ඇතැමෙක් මෙ සේ සලකයි: කායදුශ්චරිතයාගේ පරලොව ලමු විපාකයෙක. වචීදුශ්චරිතයාගේ පරලොව ලමු විපාකයෙක. මනෝදුශ්චරිතයාගේ පරලොව ලමු විපාකයෙක. මම ද වැලිත් කයින් දුශ්චරිත කෙරෙම් නම්, වචනයෙන් දුශ්චරිත කෙරෙම් නම්, සිතින් දුශ්චරිත කෙරෙම් නම්, කිම, ඒ හේතුවෙන් යම් බඳු මම කාබුත් මරණින් මතුයෙහි සැපයෙන් පහව සිටි, නපුරු ගති ඇති, විවශ ව පතිත වන නිරයෙහි නූපදින්නෙම් වේ ද යි. හෙතෙම දුර්ගතිභයට බිය වූයේ කායදුශ්චරිතය හැර පියා කාය-සුචරිතය වඩයි. වචීදුශ්චරිතය හැරපියා වාක්සුචරිතය වඩයි. මනෝදුශ්චරි-තය හැරපියා මනස්සුචරිතය වඩයි. ශුද්ධාත්මභාවයක් පරිහරණය කෙරෙයි. මහණෙනි, මේ දුර්ගතිභය යි කියනු ලැබේ.

මහණෙනි, මේ සතර භීතිහු යි.

## 4. 3. 3. 2.

## [උදකොරොහභයසුත්තං]

22. චත්තාරිමානි භික්ඛවෙ භයානි උදකොරොහන්තස්ස පාටිකඞ්ඛිතබ්බානි. කතමානි චත්තාරි? ඌමිභයං, කුම්භීලභයං, ආවට්ටභයං, සුසුකාභයං ඉමානි ඛො භික්ඛවෙ චත්තාරි භයානි උදකොරොහන්තස්ස පාටිකඞ්ඛිතබ්බානි.

එවමෙව ඛො භික්ඛවෙ ඉධෙකච්චස්ස කුලපුත්තස්ස ඉමස්මිං ධම්මවිනයෙ සද්ධා අගාරස්මා අනගාරියං පබ්බජිතො චත්තාරිමානි භයානි පාටිකඞ්ඛිතබ්බානි. කතමානි චත්තාරි? ඌමිභයං, කුම්භීලභයං, ආවට්ටභයං, සුසුකාභයං.

කතමඤ්ච භික්ඛවෙ ඌමිභයං? ඉධ භික්ඛවෙ එකච්චො කුලපුත්තො සද්ධා අගාරස්මා අනගාරියං පබ්බජිතො හොති "ඔතිණ්ණොම්හි ජාතියා ජරා, මරණෙන, සොකෙහි පරිදෙවෙහි දුක්ඛෙහි දොමනස්සෙහි උපායාසෙහි, දුක්ඛොතිණ්ණො දුක්ඛපරෙතො, අප්පෙවනාම ඉමස්ස කෙවලස්ස දුක්ඛක්ඛන්ධස්ස අන්තකිරියා පඤ්ඤායෙථා"ති.

තමෙනං තථා පබ්බජිතං සමානං සබ්‍රහ්මචාරී ඔවදන්ති අනුසාසන්ති: "එවං තෙ අභික්කමිතබ්බං. එවං තෙ පටික්කමිතබ්බං. එවං තෙ ආලොකෙතබ්බං. එවං තෙ විලොකෙතබ්බං. එවං තෙ සම්මිඤ්ජිතබ්බං. එවං තෙ පසාරිතබ්බං. එවං තෙ සඞ්ඝාටිපත්තචීවරං ධාරෙතබ්බන්ති."

තස්ස එවං හොති: "මයං ඛො පුබ්බෙ අගාරියභූතා සමානා අඤ්ඤෙ ඔවදම්පි අනුසාසාම්පි. ඉමෙ පනම්හාකං පුත්තමත්තා මඤ්ඤෙ, නත්තමත්තා මඤ්ඤෙ, ඔවදිතබ්බං අනුසාසිතබ්බං මඤ්ඤන්තී"ති. සො කුපිතො අනත්තමනො සික්ඛං පච්චක්ඛාය හීනායාවත්තති. අයං වුච්චති භික්ඛවෙ භික්ඛු ඌමිභයස්ස භීතො සික්ඛං පච්චක්ඛාය හීනායාවත්තො. ඌමිභයන්ති ඛො භික්ඛවෙ කොධුපායාසස්සෙතං අධිවචනං. ඉදං වුච්චති භික්ඛවෙ ඌමිභයං.

කතමඤ්ච භික්ඛවෙ කුම්භීලභයං: ඉධ භික්ඛවෙ එකච්චො කුලපුත්තො සද්ධා අගාරස්මා අනගාරියං පබ්බජිතො හොති "ඔතිණ්ණොම්හි ජාතියා ජරා[1]මරණෙන, සොකෙහි පරිදෙවෙහි දුක්ඛෙහි දොමනස්සෙහි උපායාසෙහි, දුක්ඛොතිණ්ණො දුක්ඛපරෙතො, අප්පෙවනාම ඉමස්ස කෙවලස්ස දුක්ඛක්ඛන්ධස්ස අන්තකිරියා පඤ්ඤායෙථා"ති.

---
1. ජරාය - මජසං

## 4. 3. 3. 2.

## [උදකොරොහභය සූත්‍රය]

22 මහණෙනි, දියට බස්නහුට මේ භීතීහු සතර දෙනෙක් කැමැති විය යුත්තාහ. කවර සතර දෙනෙක යත්: රළ බිය, කිඹුල් බිය, සුළි බිය, සැඩමස් බිය යි. මහණෙනි, දියට බස්නහුව මේ සතර භීතීහු කැමැති විය යුත්තාහ.

මහණෙනි, එපරිද්දෙන් ම සැදැහැයෙන් ගිහිගෙන් නික්ම මේ ශාසනයෙහි පැවිදි වන ඇතැම් කුලපුත්‍රයකුට මේ සතර භීතීහු කැමැති විය යුත්තාහ කවර සතර භීතීහු ය යත්: ඌර්මිභය, කුම්භීලභය, ආවර්තභය, සුසුකාභය යි

මහණෙනි, ඌර්මිභය නම් කවරේ ය යත්: මහණෙනි, "ජාතිවිසිනුදු ජරාමරණවිසිනුදු ශෝකපරිදේවදුඃඛදෞර්මනස්‍ය උපායාසවිසිනුදු අවතීර්ණයෙමි. දුකට බටුයෙමි. දුක්විසින් මැඩුනෙම් වෙමි. මේ කේවලදුඃඛස්කන්ධයාගේ අවසන් කිරීම පැණේ නම් මනා නම් නු"යි මෙ ලොව ඇතැම් කුලපුත්‍රයෙක් සැදැහැයෙන් ගිහිගෙන් නික්ම පැවිද්දට පැමිණියේ වෙයි.

එසේ පැවිදි වූ තෙල මුහුට සබ්‍රහ්මචාරී අවවාද කෙරෙත්, අනුශාසනා කෙරෙත්: "තොප විසින් මෙසේ පෙරට යා යුතුය. තොප විසින් මෙසේ වටාලා ආ යුතුය. තොප විසින් මෙසේ ඉදිරි බැලිය යුතුය, තොප විසින් මෙසේ හාත්පස බැලිය යුතුය. තොප විසින් මෙසේ අත් පා හක්කුළු යුතුය. තොප විසින් මෙසේ අත්පා දිගු කළ යුතුය. තොප විසින් මෙසේ සඟළ පාසිවුරු දැරිය යුතුය" කියා යි.

ඔහුට මෙබඳු සිතෙක් වෙයි: "පෙර අපි ගිහි වූවමෝ සෙස්සනට අවවාදත් කරමෝ වම්හ, අනුශාසනාත් කරමෝ වම්හ. මොහු වනාහි අපගේ පුත්‍රමාත්‍රයන් බන්දහ, මුණුපුරන් බන්දහ. (එහෙත් අප) අවවාද කළ යුතු කොට අනුශාසනා කළ යුතු කොට හඟිති" යි. හේ කිපියේ නොසතුටු සිත් ඇතියේ ශික්ෂාප්‍රත්‍යාඛ්‍යාන කොට ගිහිගෙට පෙරලා වැටෙයි. මහණෙනි, මේ මහණ ඌර්මිභයෙන් බිය වූයේ ශික්ෂාව හැර ගිහිගෙට පෙරලා වැටුනේ ය යි කියනු ලැබේ. මහණෙනි, ඌර්මිභය යනු ක්‍රෝධ-උපායාසයට තෙල නාමෙකි. මහණෙනි, මේ ඌර්මිභය යි කියනු ලැබේ.

මහණෙනි කුම්භීලභය නම් කවරේ ය යත්: මහණෙනි, මෙ ලොව ඇතැම් කුලපුත්‍රයෙක් "ජාතිවිසින් ජරාමරණවිසින් ශෝකපරිදේව දුඃඛදෞර්මනස්‍ය-විසින් අවතීර්ණයෙමි. දුකට බටුයෙමි. දුක්විසින් මැඩුනෙම් වෙමි. මේ කෙවල-දුඃඛස්කන්ධයාගේ අවසන් කිරීම පැණේ නම් මනා නම් නු" යි සැදැහැයෙන් ගිහිගෙන් නික්ම පැවිද්දට පැමිණියේ වෙයි.

තමෙනං තථා පබ්බජිතං සමානං සබ්‍රහ්මචාරී ඔවදන්ති අනුසාසන්ති: "ඉදං තෙ ඛාදිතබ්බං, ඉදං තෙ න ඛාදිතබ්බං, ඉදං තෙ භුඤ්ජිතබ්බං, ඉදං තෙ න භුඤ්ජිතබ්බං, ඉදං තෙ සායිතබ්බං, ඉදං තෙ න සායිතබ්බං, ඉදං තෙ පාතබ්බං, ඉදං තෙ න පාතබ්බං. කප්පියං තෙ ඛාදිතබ්බං, අකප්පියං තෙ න ඛාදිතබ්බං, කප්පියං තෙ භුඤ්ජිතබ්බං, අකප්පියං තෙ න භුඤ්ජිතබ්බං, කප්පියං තෙ සායිතබ්බං, අකප්පියං තෙ න සායිතබ්බං, කප්පියං තෙ පාතබ්බං, අකප්පියං තෙ න පාතබ්බං, කාලෙ තෙ පාතබ්බං, විකාලෙ තෙ න පාතබ්බං, කාලෙ තෙ ඛාදිතබ්බං. විකාලෙ තෙ න ඛාදිතබ්බං, කාලෙ තෙ භුඤ්ජිතබ්බං, විකාලෙ තෙ න භුඤ්ජිතබ්බං, කාලෙ තෙ සායිතබ්බං, විකාලෙ තෙ න සායිතබ්බන්ති."

තස්ස එවං හොති: "මයං ඛො පුබ්බෙ අගාරියභූතා සමානා යං ඉච්ඡාම තං ඛාදාම, යං න ඉච්ඡාම තං න ඛාදාම, යං ඉච්ඡාම තං භුඤ්ජාම, යං න ඉච්ඡාම තං න භුඤ්ජාම, යං ඉච්ඡාම තං සායාම. යං න ඉච්ඡාම න තං සායාම, යං ඉච්ඡාම තං පිබාම, යං න ඉච්ඡාම තං න පිබාම, කප්පියම්පි ඛාදාම, අකප්පියම්පි ඛාදාම, කප්පියම්පි භුඤ්ජාම, අකප්පියම්පි භුඤ්ජාම, කප්පියම්පි සායාම, අකප්පියම්පි සායාම, කප්පියම්පි පිබාම, අකප්පියම්පි පිබාම, කාලෙපි ඛාදාම, විකාලෙපි ඛාදාම, කාලෙපි භුඤ්ජාම, විකාලෙපි භුඤ්ජාම, කාලෙපි සායාම, විකාලෙපි සායාම, කාලෙපි පිබාම, විකාලෙපි පිබාම. යම්පි නො සද්ධා ගහපතිකා දිවා විකාලෙ පණීතං ඛාදනීයං වා භොජනීයං වා දෙන්ති, තත්‍රාපිමෙ මුඛාවරණං මඤ්ඤෙ කරොන්තී"ති. සො කුපිතො අනත්තමනො සික්ඛං පච්චක්ඛාය හීනායාවත්තති. අයං වුච්චති භික්ඛවෙ භික්ඛු කුම්භීලභයස්ස භීතො සික්ඛං පච්චක්ඛාය හීනායාවත්තො. කුම්භීල-භයන්ති ඛො භික්ඛවෙ ඔදරිකත්තස්සෙතං අධිවචනං. ඉදං වුච්චති භික්ඛවෙ කුම්භීලභයං.

කතමඤ්ච භික්ඛවෙ ආවට්ටභයං? ඉධ භික්ඛවෙ එකච්චො කුලපුත්තො සද්ධා අගාරස්මා අනගාරියං පබ්බජිතො හොති "ඔතිණ්ණොම්හි ජාතියා ජරාමරණෙන, සොකෙහි පරිදෙවෙහි දුක්ඛෙහි දොමනස්සෙහි උපායාසෙහි, දුක්ඛොතිණ්ණො දුක්ඛපරෙතො. අප්පෙව නාම ඉමස්ස කෙවලස්ස දුක්ඛක්ඛන්ධස්ස අන්තකිරියා පඤ්ඤායෙථා"ති. සො එවං පබ්බජිතො සමානො පුබ්බණ්හසමයං නිවාසෙත්වා පත්තචීවරං ආදාය ගාමං වා නිගමං වා පිණ්ඩාය පවිසති අරක්ඛිතෙනෙව කායෙන අරක්ඛිතාය වාචාය අරක්ඛිතෙන චිත්තෙන අනුපට්ඨිතාය සතියා අසංවුතෙහි ඉන්ද්‍රියෙහි. සො තත්ථ පස්සති ගහපතිං වා ගහපතිපුත්තං වා පඤ්චහි කාමගුණෙහි සමප්පිතං සමඞ්ගිභූතං පරිචාරය-මානං. තස්ස එවං හොති: "මයං ඛො පුබ්බෙ අගාරියභූතා සමානා පඤ්චහි කාමගුණෙහි සමප්පිතා සමඞ්ගිභූතා පරිචාරිම්හ. සංවිජ්ජන්ති ඛො පන මෙ කුලෙ භොගා, සක්කා භොගෙ ච භුඤ්ජිතුං පුඤ්ඤානි ච කාතුං. යන්නූනාහං සික්ඛං පච්චක්ඛාය හීනායාවත්තිත්වා භොගෙ ච භුඤ්ජෙය්‍යං පුඤ්ඤානි ච කරෙය්‍යන්ති." සො සික්ඛං පච්චක්ඛාය හීනායාවත්තති. අයං වුච්චති භික්ඛවෙ භික්ඛු ආවට්ටභයස්ස භීතො සික්ඛං පච්චක්ඛාය හීනායාවත්තො. ආවට්ටභයන්ති ඛො භික්ඛවෙ පඤ්චන්නෙතං කාමගුණානං අධිවචනං. ඉදං වුච්චති භික්ඛවෙ ආවට්ටභයං.

එසේ පැවිදි වූ තෙල මුහුට සබ්‍රහ්මචරු අවවාද කරත්, අනුශාසනා කරත්. "මේ තොප විසින් කෑ යුතුය, මේ තොප විසින් නො කෑ යුතුය, මේ තොප විසින් බිදිය යුතුය, මේ තොප විසින් නො බිදිය යුතුය, මේ තොප විසින් ආස්වාද කළ යුතුය, මේ තොප විසින් ආස්වාද නො කළ යුතුය, මේ තොප විසින් පිය යුතුය. මේ තොප විසින් නො පිය යුතුය, තොප විසින් කැප දෑ කෑ යුතුය, තොප විසින් නො කැප දෑ නො කෑ යුතුය, තොප විසින් කැප දෑ බිදිය යුතුය, තොප විසින් නො කැප දෑ නො බිදිය යුතුය, තොප විසින් කැප දෑ ආස්වාද කට යුතුය, තොප විසින් නො කැප දෑ ආස්වාද නො කට යුතුය, තොප විසින් කැප දෑ පිය යුතුය, තොප විසින් නො කැප දෑ නො පිය යුතුය, තොප විසින් නිසි කාලයෙහි පිය යුතුය, තොප විසින් විකාලයෙහි නො පිය යුතුය, තොප විසින් කාලයෙහි කෑ යුතුය, තොප විසින් විකාලයෙහි නො කෑ යුතුය, තොප විසින් කාලයෙහි බිදිය යුතුය, තොප විසින් විකාලයෙහි නො බිදිය යුතුය, තොප විසින් කාලයෙහි ආස්වාද කට යුතුය, තොප විසින් විකාලයෙහි ආස්වාද නො කට යුතුය" කියා යි

ඔහුට මේ බඳු සිතෙක් වෙයි: "අපි පෙර ගිහි වූවමෝ යමක් කැමැත්තමෝ නම් එය කම්හ යමක් නො කැමැත්තමෝ නම් එය නො කම්හ යමක් කැමැත්තමෝ නම් එය බිදිම්හ. යමක් නො කැමැත්තමෝ නම් එය නො බිදිම්හ යමක් කැමැත්තමෝ නම් එය ආස්වාද කරම්හ. යමක් නො කැමැත්තමෝ නම් එය ආස්වාද නො කරම්හ යමක් කැමැත්තමෝ නම් එය බොම්හ යමක් නො කැමැත්තමෝ නම් එය නො බොම්හ. කැප දෑ ද කම්හ අකැප දෑ ද කම්හ කැප දෑ ද බිදිම්හ. අකැප දෑ ද, බිදිම්හ. කැප දෑ ද ආස්වාද කරම්හ. අකැප දෑ ද ආස්වාද කරම්හ. කැප දෑ ද බොම්හ අකැප දෑ ද බොම්හ. කාලයෙහි ද කම්හ. විකාලයෙහි ද කම්හ. කාලයෙහි ද බිදිම්හ, විකාලයෙහි ද බිදිම්හ, කාලයෙහි ද ආස්වාද කරම්හ විකාලයෙහි ද ආස්වාද කරම්හ, කාලයෙහි ද බොම්හ, විකාලයෙහි ද බොම්හ. සැදැහැති ගෙහෙවිහු දවල විකාලයෙහිත් අපට යම් පිණි ඛාද්‍යයක් හෝ භොජ්‍යයක් දෙත් ද, එහිත් මොහු මුඛාවරණ කරණවුත් බන්දත" යි හෙ කිපියේ නො සතුටු සිත් ඇතියේ ශික්ෂාප්‍රත්‍යාඛ්‍යානය කොට ගිහිගෙට පෙරළා වැටෙයි. මහණෙනි, මෙම්බඳු කුම්භීලභයෙන් බිය වූයේ ශික්ෂාව හැර පියා ගිහිගෙට පෙරළා වැටිනැ යි කියනු ලැබේ. මහණෙනි, කුම්භීලභය යනු ඖදරභාවයට (බොහෝ කනුවට) තෙල නමෙකි. මහණෙනි, මේ කුම්භීලභය යි කියනු ලැබේ

මහණෙනි, ආවට්ටභය නම් කවරේ ද යත්: මහණෙනි, මේ ලොව ඇතැම් කුලපුත්‍රයෙක් "ජාතිවිසින් ජරාමරණවිසින් ශෝකපරිදෙවදුඃඛදෞර්මනස්‍ය උපායාසවිසින් අවතීර්ණයෙමි. දුකට බටුයෙමි. දුක්විසින් පෙළුනෙමි. මේ කේවලදුඃඛස්කන්ධයාගේ කෙළවර කිරීම පැණේ නම් මනා නම් නු" යි සැදැහැයෙන් ගිහිගෙන් නික්ම පැවිද්දට වැදුනේ වෙයි. හේ මෙසේ පැවිදි වූයේ පෙරවරු හැද පෙරව පා සිවුරු ගෙණ ගමට හෝ නියම්ගමට හෝ නො රැකි වූ ම කයින් නො රැකි වචනයෙන් නො රැකි සිතින් නො එළඹ සිටි සිහියෙන් අසංවෘත ඉන්ද්‍රියයෙන් පිඩු පිණිස පිවිසෙයි. හේ එහි දී පස්කම්ගුණෙන් සමර්පිත සමඞ්ගීත ඉඳුරන් පිණවන ගොවියකු හෝ ගොවියා පුතකු හෝ දක්නේ ය. ඔහුට මෙ බඳු සිතෙක් වෙයි: අපි පෙර ගිහි වූවමෝ පස්කම් ගුණයෙන් සමර්පිත ව සමඞ්ගීත ව ඉඳුරන් පිණවූම්හ. මාගේ කුලයෙහි භෝගයෝ විද්‍යමානයහ භෝගයන් වළඳන්නට ද පින් කරන්නට ද හැකිය ශික්ෂාප්‍රත්‍යාඛ්‍යානය කොට ගිහිගෙට වැටී භෝගයන් වළඳම් නම් පින් ද කෙරෙම් නම් මැනැව" කියා යි. හෙ ශික්ෂාව හැර පියා ගිහිගෙට වටාලා වැටෙයි මහණෙනි, මේ මහණ ආවට්ටභයෙන් බිය වූයේ ශික්ෂාව හැර ගිහිගෙට වැටිනැ යි කියනු ලැබේ මහණෙනි, ආවට්ටභය යනු පස්කම් ගුණයට තෙල නමෙකි. මහණෙනි, මේ ආවට්ටභය යි කියනු ලැබේ.

කතමඤ්ච භික්ඛවෙ සුසුකාභයං? ඉධ භික්ඛවෙ එකච්චො කුලපුත්තො සද්ධා අගාරස්මා අනගාරියං පබ්බජිතො හොති "ඔතිණ්ණොම්හි ජාතියා ජරාමරණෙන, සොකෙහි පරිදෙවෙහි දුක්ඛෙහි දොමනස්සෙහි උපායාසෙහි, දුක්ඛොතිණ්ණො දුක්ඛපරෙතො. අප්පෙවනාම ඉමස්ස කෙවලස්ස දුක්ඛක්ඛන්ධස්ස අන්තකිරියා පඤ්ඤායෙථා"ති. සො එවං පබ්බජිතො සමානො පුබ්බණ්හසමයං නිවාසෙත්වා පත්තචීවරං ආදාය ගාමං වා නිගමං වා පිණ්ඩාය පවිසති අරක්ඛිතෙනෙව කායෙන අරක්ඛිතාය වාචාය අරක්ඛිතෙන චිත්තෙන අනුපට්ඨිතාය සතියා අසංවුතෙහි ඉන්ද්‍රියෙහි. සො තත්ථ පස්සති මාතුගාමං දුන්නිවත්ථං වා දුප්පාරුතං වා. තස්ස මාතුගාමං දිස්වා දුන්නිවත්ථං වා දුප්පාරුතං වා රාගො චිත්තං අනුද්ධංසෙති. සො රාගානුද්ධංසෙන චිත්තෙන සික්ඛං පච්චක්ඛාය හීනායාවත්තති. අයං වුච්චති භික්ඛවෙ භික්ඛු සුසුකාභයස්ස භීතො සික්ඛං පච්චක්ඛාය හීනායාවත්තො. සුසුකාභයන්ති ඛො භික්ඛවෙ මාතුගාමස්සෙතං අධිවචනං. ඉදං වුච්චති භික්ඛවෙ සුසුකාභයං.

ඉමානි ඛො භික්ඛවෙ චත්තාරි භයානි ඉධෙකච්චස්ස කුලපුත්තස්ස ඉමස්මිං ධම්මවිනයෙ සද්ධා අගාරස්මා අනගාරියං පබ්බජිතස්ස පාටිකඞ්ඛිතබ්බානීති.

## 4. 3. 3. 3.

## [පුග්ගලසුත්තං]

23. චත්තාරොමෙ භික්ඛවෙ පුග්ගලා සන්තො සංවිජ්ජමානා ලොකස්මිං. කතමෙ චත්තාරො?

ඉධ භික්ඛවෙ එකච්චො පුග්ගලො විවිච්චෙව කාමෙහි විවිච්ච අකුසලෙහි ධම්මෙහි සවිතක්කං සවිචාරං විවෙකජං පීතිසුඛං පඨමං ඣානං උපසම්පජ්ජ විහරති. සො තදස්සාදෙති. තන්නිකාමෙති. තෙන ච විත්තිං ආපජ්ජති. තත්ථ ඨිතො තදධිමුත්තො තබ්බහුලවිහාරී අපරිහීනො කාලං කුරුමානො බ්‍රහ්මකායිකානං දෙවානං සහව්‍යතං උපපජ්ජති. බ්‍රහ්මකායිකානං භික්ඛවෙ දෙවානං කප්පො ආයුප්පමාණං. තත්ථ පුථුජ්ජනො යාවතායුකං ඨත්වා යාවතකං තෙසං දෙවානං ආයුප්පමාණං තං සබ්බං ඛෙපෙත්වා නිරයම්පි ගච්ඡති. තිරච්ඡානයොනිම්පි ගච්ඡති. පෙත්තිවිසයම්පි ගච්ඡති. භගවතො පන සාවකො තත්ථ යාවතායුකං ඨත්වා යාවතකං තෙසං දෙවානං ආයුප්පමාණං තං සබ්බං ඛෙපෙත්වා තස්මිංයෙව භවෙ පරිනිබ්බායති. අයං ඛො භික්ඛවෙ විසෙසො, අයං අධිප්පායො, ඉදං නානාකරණං සුතවතො අරියසාවකස්ස අස්සුතවතා පුථුජ්ජනෙන යදිදං ගතියා උපපත්තියා සති.

මහණෙනි, සුසුකාභය නම් කවරේ ද යත්: මහණෙනි, මෙ ලොව ඇතැම් කුලපුත්‍රයෙක් "ජාතිවිසින් ජරාමරණවිසින් ශෝකපරිදේවදුඃඛදෞර්මනස්‍ය-උපායාසවිසින් අවතීර්ණ වෙමි, දුකට බටුයෙමි, දුක්විසින් පෙළුනෙමි. මේ කෙවල දුඃඛස්කන්ධයාගේ අවසානය පැණේ නම් මනා නම් නු"යි සැදැහැයෙන් ගිහිගෙන් නික්ම පැවිද්දට වැදුනේ වෙයි.

හේ මෙසේ පැවිදි වූයේ පෙරවරු හැඳ පෙරව පාසිවුරු ගෙණ ගමට හෝ නියම්ගමට නො රැක ගත් කයින්, නො රැක ගත් වචනයෙන්, නො රැක ගත් සිතින් නො එළඹ සිටි සිහියෙන් අසංවෘත ඉන්ද්‍රියයෙන් යුක්ත ව පිඬු පිණිස පිවිසෙයි. හේ එහි දී වසඩක් නොවසා හැඳගත් වසඩක් නොවසා පෙරව ගත් මාගමක් දක්නේ ය. වසඩක් නොවසා හැඳි වසඩක් නොවසා පෙරවි මාගම දැක්මෙන් ඔහුගේ සිත රාගය පුන පුනා පෙළයි. හේ රාගයා විසින් පෙළුනු සිතින් ශික්ෂාව හැර ගිහිගෙට වැටෙයි. මහණෙනි, මේ මහණ සුසුකාභයින් බිය වූයේ ශික්ෂාව හැර ගිහිගෙට වැටිනැ යි කියනු ලැබේ. මහණෙනි, සුසුකාභය යනු මාගමට තෙල නමෙකි. මහණෙනි, මේ සුසුකාභය යි කියනු ලැබේ.

මහණෙනි, මේ සතර භීතීහු සැදැහැයෙන් ගිහිගෙන් නික්ම මෙසස්නෙහි පැවිද්දට පැමිණි කුලපුත්‍රයා විසින් කැමැති විය යුත්තාහ.

4. 3. 3. 3.

[පුග්ගල සුත්‍රය]

23. මහණෙනි, මේ පුද්ගලයෝ සතර දෙනෙක් ලෝකයෙහි විද්‍යමානයහ. කවර සතර දෙනෙක යත්:

මහණෙනි, මෙ ලොව ඇතැම් පුද්ගලයෙක් කාමයෙන් වෙන් ව අකුසලදහමින් වෙන් ව, විතර්ක සහිත විචාර සහිත විවේකයෙන් උපන් ප්‍රීති සුඛය ඇති ප්‍රථමධ්‍යානයට පැමිණ වෙසෙයි හේ ඒ ධ්‍යානය සුඛා-ස්වාදයෙන් ආස්වාද කෙරෙයි. ඒ ධ්‍යානය පතයි. ඒ ධ්‍යානයෙන් ම තුෂ්ටියට පැමිණෙයි එහි සිටියේ එහි අධිමුක්ත වූයේ ඒ ධ්‍යානයෙන් බෙහෙවින් වසන්නේ එයින් නො පිරිහුනේ කලුරිය කරමින් බ්‍රහ්මකායික දෙවියන්ගේ සහභාවයට පැමිණෙයි. මහණෙනි, බ්‍රහ්මකායික දෙවියන්ගේ ආයුඃප්‍රමාණය කල්පයෙකි. එහි පුහුදුන් තෙමේ ආයු ඇති තාක් සිට ඒ දෙවියන්ගේ ආයුඃප්‍රමාණය යම් පමණ වේ ද එ හැම ගෙවා නිරයට ද යෙයි. තිරිසන්-යෝනියට ද යෙයි. ප්‍රේතවිෂයට ද යෙයි. භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රාවක වනාහි එහි ආයු තාක් සිට ඒ දෙවියන්ගේ ආයුඃප්‍රමාණය යම් පමණ වේ ද එ හැම ගෙවා ඒ රූපභාවයෙහි ම පිරිනිවන් පානේ ය. මහණෙනි, ගතිය හා උපපත්තිය හා ඇති කල්හි අශ්‍රැතවත් පෘථග්ජනයා හා ශ්‍රැතවත් ආර්‍යශ්‍රාවකයාගේ මේ විශේෂ යි. මේ අධිකප්‍රයෝගයි. මේ වෙනස යි.

පුන ච පරං භික්ඛවෙ ඉධෙකච්චො පුග්ගලො විතක්කවිචාරානං වූපසමා අජ්ඣත්තං සම්පසාදනං චෙතසො එකොදිභාවං අවිතක්කං අවිචාරං සමාධිජං පීතිසුඛං දුතියං ඣානං උපසම්පජ්ජ විහරති. සො තදස්සාදෙති. තන්නිකාමෙති. තෙන ච විත්තිං ආපජ්ජති. තත්ථ ඨිතො තදධිමුත්තො තබ්බහුලවිහාරී අපරිහීනො කාලං කුරුමානො ආභස්සරානං දෙවානං සහබ්‍යතං උපපජ්ජති. ආභස්සරානං භික්ඛවෙ දෙවානං ද්වෙ කප්පා ආයුප්පමාණං. තත්ථ පුථුජ්ජනො යාවතායුකං ඨත්වා යාවතකං තෙසං දෙවානං ආයුප්පමාණං තං සබ්බං ඛෙපෙත්වා නිරයම්පි ගච්ඡති තිරච්ඡානයොනිම්පි ගච්ඡති පෙත්තිවිසයම්පි ගච්ඡති. භගවතො පන සාවකො තත්ථ යාවතායුකං ඨත්වා යාවතකං තෙසං දෙවානං ආයුප්පමාණං තං සබ්බං ඛෙපෙත්වා තස්මිං යෙව භවෙ පරිනිබ්බායති. අයං ඛො භික්ඛවෙ විසෙසො. අයං අධිප්පායො. ඉදං නානාකරණං සුතවතො අරියසාවකස්ස අස්සුතවතා පුථුජ්ජනෙන යදිදං ගතියා උපපත්තියා සති.

පුන ච පරං භික්ඛවෙ ඉධෙකච්චො පුග්ගලො පීතියා ච විරාගා උපෙක්ඛකො ච විහරති සතො ච සම්පජානො සුඛං ච කායෙන පටිසංවෙදෙති. යං තං අරියා ආචික්ඛන්ති උපෙක්ඛකො සතිමා සුඛවිහාරීති තතියං ඣානං උපසම්පජ්ජ විහරති. සො .තදස්සාදෙති තන්නිකාමෙති තෙන ච විත්තිං ආපජ්ජති. තත්ථ ඨිතො තදධිමුත්තො තබ්බහුලවිහාරී අපරිහීනො කාලං කුරුමානො සුභකිණ්හානං දෙවානං සහබ්‍යතං උපපජ්ජති. සුභකිණ්හානං භික්ඛවෙ දෙවානං චත්තාරො කප්පා ආයුප්පමාණං. තත්ථ පුථුජ්ජනො යාවතායුකං ඨත්වා යාවතකං තෙසං දෙවානං ආයුප්පමාණං තං සබ්බං ඛෙපෙත්වා නිරයම්පි ගච්ඡති තිරච්ඡානයොනිම්පි ගච්ඡති පෙත්තිවිසයම්පි ගච්ඡති. භගවතො පන සාවකො තත්ථ යාවතායුකං ඨත්වා යාවතකං තෙසං දෙවානං ආයුප්පමාණං තං සබ්බං ඛෙපෙත්වා තස්මිං යෙව භවෙ පරිනිබ්බායති. අයං ඛො භික්ඛවෙ විසෙසො, අයං අධිප්පායො, ඉදං නානාකරණං සුතවතො අරියසාවකස්ස අස්සුතවතා පුථුජ්ජනෙන යදිදං ගතියා උපපත්තියා සති

පුන ච පරං භික්ඛවෙ ඉධෙකච්චො පුග්ගලො සුඛස්ස ච පහාණා දුක්ඛස්ස ච පහාණා පුබ්බෙව සොමනස්සදොමනස්සානං අත්ථඞ්ගමා අදුක්ඛං අසුඛං උපෙක්ඛා-සතිපාරිසුද්ධිං චතුත්ථං ඣානං උපසම්පජ්ජ විහරති. සො තදස්සාදෙති. තන්නිකාමෙති. තෙන ච විත්තිං ආපජ්ජති. තත්ථ ඨිතො තදධිමුත්තො තබ්බහුලවිහාරී අපරිහීනො කාලං කුරුමානො වෙහප්ඵලානං දෙවානං සහබ්‍යතං උපපජ්ජති. වෙහප්ඵලානං භික්ඛවෙ දෙවානං පඤ්චකප්පසතානි ආයුප්පමාණං තත්ථ පුථුජ්ජනො යාවතායුකං ඨත්වා යාවතකං තෙසං දෙවානං ආයුප්පමාණං තං සබ්බං ඛෙපෙත්වා නිරයම්පි ගච්ඡති. තිරච්ඡානයොනිම්පි ගච්ඡති පෙත්තිවිසයම්පි ගච්ඡති. භගවතො පන සාවකො තත්ථ යාවතායුකං ඨත්වා යාවතකං තෙසං දෙවානං ආයුප්පමාණං තං සබ්බං ඛෙපෙත්වා තස්මිං යෙව භවෙ පරිනිබ්බායති. -

තවද මහණෙනි, මේ ලොව ඇතැම් පුද්ගලයෙක් විතර්ක විචාර සංසිඳුවාලීමෙන් තමා තුළ පැහැදීම් කරණ, සිත පිළිබඳ එකඟ බව ඇති විතර්ක විචාර නැති, සමාධියෙන් උපන් ප්‍රීතිසුඛ ඇති, ද්විතීයධ්‍යානය උපයා වෙසෙයි. හේ ඒ දැහැන සුඛාස්වාදයෙන් ආස්වාද කෙරෙයි. ඒ දැහැන පතයි. ඒ දැහැනින් තුෂ්ටියට පැමිණෙයි. එහි සිටියේ ඒ දැහැනෙහි අධිමුක්ත වූයේ ඒ දැහැනින් බහුල විහරණ ඇතියේ, නො පිරිහුනේ කලුරිය කරමින් ආභාස්වර දෙවියන්ගේ සහභාවයට පැමිණෙයි. මහණෙනි, ආභාස්වර දෙවියන්ගේ ආයුඃප්‍රමාණය දෙ කපෙකි. එහි පෘථග්ජන ආයු ඇතිතාක් සිට ඒ දෙවියන්ගේ ආයුඃප්‍රමාණය යම් පමණ වේ ද එ හැම ගෙවා නිරයට ද යෙයි. තිරිසන් යොනට ද යෙයි. ප්‍රේතවිෂයට ද යෙයි. භාග්‍යතුවත් වහන්සේගේ ශ්‍රාවක වනාහි එහි ආයු ඇති තාක් සිට ඒ දෙවියන්ගේ ආයුඃප්‍රමාණය යම් පමණ වේ ද එ හැම ගෙවා ඒ භවයෙහි ම පිරිනිවෙයි. මහණෙනි, ගතිය හා උපපත්තිය හා ඇතිකල්හි අශ්‍රැතවත් පෘථග්ජනයා හා ශ්‍රැතවත් ආර්‍යශ්‍රාවකයාගේ මේ විශෙෂ යි. මේ අධිකප්‍රයොග යි. මේ වෙනසයි.

තව ද මහණෙනි, මේ ලොව ඇතැම් පුද්ගලයෙක් ප්‍රීතිවිරාගයෙන් උපේක්ෂක වූයේ සමෘතිමත් වූයේ කාවණින් දත්තේ වාස කෙරෙයි. සුඛය ද නාමකයින් විඳ ගණී. යම් දැහැන් ලද්දවකු උපෙක්ෂක ය, සමෘතිමත් ය, සුඛවිහාරී ය යි ආර්‍යයෝ කියත් ද, ඒ තුන්වන දැහැනට එළඹ වෙසෙයි. හේ ඒ දැහැන සුඛාස්වාදයෙන් ආස්වාද කෙරෙයි. ඒ දැහැන පතයි. එයින් තුෂ්ටියට පැමිණෙයි. එහි සිටියේ ඒ දැහැනෙහි අධිමුක්ත වූයේ ඒ දැහැනින් බහුල විහරණ ඇත්තේ නො පිරිහුනේ කලුරිය කරමින් ශුභකෘත්ස්න දෙවියන්ගේ සහභාවයට එළඹෙයි. මහණෙනි, ශුභකෘත්ස්න දෙවියන්ගේ ආයුඃප්‍රමාණය සතර කල්පයෙකි. එහි පෘථග්ජන ආයු ඇති තාක් සිට ඒ දෙවියන්ගේ ආයුඃප්‍රමාණය යම් පමණ වේ ද එ හැම ගෙවා නිරයට ද යෙයි. තිරිසන්යොනට ද යෙයි. ප්‍රේතවිෂයට ද යෙයි. භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රාවක වනාහි එහි ආයු ඇති තාක් සිට ඒ දෙවියන්ගේ ආයුඃ-ප්‍රමාණය යම් පමණ වේ ද එ හැම ගෙවා ඒ භවයෙහි ම පිරිනිවෙයි. මහණෙනි, ගතිය හා උපපත්තිය හා ඇති කල්හි අශ්‍රැතවත් පෘථග්ජනයා හා ශ්‍රැතවත් ආර්‍යශ්‍රාවකයාගේ මේ විශේෂ යි. මේ අධිකප්‍රයොගයි, මේ වෙනස යි.

තව ද මහණෙනි, මේ ලොව ඇතැම් පුද්ගලයෙක් සුඛයාගේ ද ප්‍රහාණියෙන් දුඃඛයාගේ ද ප්‍රහාණියෙන් කැලම සොම්නස් දොම්නසුන් අස්තඞ්ගම ව යාමෙන් දුක් නැති, සුව නැති, උපෙක්ෂාස්මෘති පාරිශුද්ධි ඇති චතුර්ථධ්‍යානයට එළඹ වෙසෙයි. හේ ඒ ධ්‍යානය සුඛාස්වාද විසින් ආස්වාද කෙරෙයි. ඒ දැහැන පතයි. ඒ දැහැනින් තුෂ්ටියට පැමිණෙයි. එහි සිටියේ ඒ දැහැනෙහි අධිමුක්ත වූයේ ඒ දැහැනෙන් බහුල විහරණ ඇත්තේ නො පිරි-හුනේ කලුරිය කරමින් වෘහත්ඵල දෙවියන්ගේ සහභාවයට එළඹෙයි. මහණෙනි, වෘහත්ඵල දෙවියන්ගේ ආයුඃප්‍රමාණය පන්සිය කපෙයි. එහි පෘථග්ජන ආයු ඇති තාක් සිට ඒ දෙවියන්ගේ ආයුඃප්‍රමාණය යම් පමණ වේ ද එ හැම ගෙවා නිරයට ද යෙයි, තිරිසන්යොනට ද යෙයි. ප්‍රෙතවිෂයට ද යෙයි. භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රාවක වනාහි එහි ආයු ඇති තාක් සිට ඒ දෙවියන්ගේ ආයුඃප්‍රමාණය යම් පමණ වේ ද ඒ හැම ගෙවා ඒ භවයෙහි ම පිරිනිවෙයි.

අයං ඛො භික්ඛවෙ විසෙසො, අයං අධිප්පායො, ඉදං නානාකරණං සුතවතො අරියසාවකස්ස අස්සුතවතා පුථුජ්ජනෙන යදිදං ගතියා උපපත්තියා සති.

ඉමෙ ඛො භික්ඛවෙ චත්තාරො පුග්ගලා සන්තො සංවිජ්ජමානා ලොකස්මින්ති.

## 4. 3. 3. 4.

## [දුතියපුග්ගලසුත්තං]

24. චත්තාරොමෙ භික්ඛවෙ පුග්ගලා සන්තො සංවිජ්ජමානා ලොකස්මිං. කතමෙ චත්තාරො?

ඉධ භික්ඛවෙ එකච්චො පුග්ගලො විවිච්චෙව කාමෙහි -පෙ- පඨමං ඣානං උපසම්පජ්ජ විහරති. සො යදෙව තත්ථ හොති රූපගතං වෙදනාගතං සඤ්ඤාගතං සඞ්ඛාරගතං විඤ්ඤාණගතං, තෙ ධම්මෙ අනිච්චතො දුක්ඛතො රොගතො ගණ්ඩතො සල්ලතො අඝතො ආබාධතො පරතො පලොකතො සුඤ්ඤතො අනත්තතො සමනුපස්සති. සො කායස්ස භෙදා පරම්මරණා සුද්ධාවාසානං දෙවානං සහව්‍යතං උපපජ්ජති. අයං භික්ඛවෙ උපපත්ති අසාධාරණා පුථුජ්ජනෙහි.

පුන ච පරං භික්ඛවෙ ඉධෙකච්චො පුග්ගලො විතක්කවිචාරානං වූපසමා -පෙ- දුතියං ඣානං -පෙ- තතියං ඣානං -පෙ- චතුත්ථං ඣානං උපසම්පජ්ජ විහරති. සො යදෙව තත්ථ හොති රූපගතං වෙදනාගතං සඤ්ඤාගතං සඞ්ඛාරගතං විඤ්ඤාණගතං, තෙ ධම්මෙ අනිච්චතො දුක්ඛතො රොගතො ගණ්ඩතො සල්ලතො අඝතො ආබාධතො පරතො පලොකතො සුඤ්ඤතො අනත්තතො සමනුපස්සති. සො කායස්ස භෙදා පරම්මරණා සුද්ධාවාසානං දෙවානං සහව්‍යතං උපපජ්ජති. අයං භික්ඛවෙ උපපත්ති අසාධාරණා පුථුජ්ජනෙහි.

ඉමෙ ඛො භික්ඛවෙ චත්තාරො පුග්ගලා සන්තො සංවිජ්ජමානා ලොකස්මින්ති.

## 4. 3. 3. 5.

## [තතියපුග්ගලසුත්තං]

25. චත්තාරොමෙ භික්ඛවෙ පුග්ගලා සන්තො සංවිජ්ජමානා ලොකස්මිං. කතමෙ චත්තාරො?

ඉධ භික්ඛවෙ එකච්චො පුග්ගලො මෙත්තාසහගතෙන චෙතසා එකං දිසං ඵරිත්වා විහරති- තථා දුතියං- තථා තතියං- තථා චතුත්ථං, ඉති උද්ධමධො තිරියං සබ්බධි සබ්බත්තතාය සබ්බාවන්තං ලොකං මෙත්තාසහගතෙන චෙතසා විපුලෙන මහග්ගතෙන අප්පමාණෙන අවෙරෙන අබ්‍යාපජ්ඣෙන ඵරිත්වා විහරති. සො තදස්සාදෙති තං නිකාමෙති තෙන ච විත්තිං ආපජ්ජති. තත්ථ ඨිතො තදධිමුත්තො තබ්බහුලවිහාරී අපරිහීනො කාලං කුරුමානො බ්‍රහ්මකායිකානං දෙවානං සහව්‍යතං උපපජ්ජති. බ්‍රහ්මකායිකානං භික්ඛවෙ දෙවානං කප්පො ආයුප්පමාණං. තත්ථ පුථුජ්ජනො යාවතායුකං ඨත්වා යාවතකං තෙසං දෙවානං ආයුප්පමාණං තං සබ්බං ඛෙපෙත්වා නිරයම්පි ගච්ඡති. තිරච්ඡානයොනිම්පි ගච්ඡති. පෙත්තිවිසයම්පි ගච්ඡති. -

මහණෙනි, ගතිය උපපත්තිය ඇති කල්හි අශ්‍රැතවත් පෘථග්ජනයා හා ශ්‍රැතවත් ආර්‍යශ්‍රාවකයාගේ මේ විශෙෂ යි. මේ අධිකප්‍රයොග යි. මේ වෙනස යි.

මහණෙනි, මේ සතර පුද්ගලයෝ ලොකයෙහි විද්‍යමානයහ.

4. 3. 3. 4.

[දුතියපුග්ගල සුත්‍රය]

24. මහණෙනි, මේ පුද්ගලයෝ සතර දෙනෙක් ලෝකයෙහි විද්‍යමානයහ. කවර සතර දෙනෙක යත්:

මහණෙනි, මෙ ලොව ඇතැම් පුද්ගලයෙක් කාමයෙන් වෙන් ව ම ... පළමුවන ධ්‍යානයට ඇවිඇවිත් සමවැද වෙසෙසි. හේ එහි යම් ම රූපයෙක් ඇත් ද, වෙදනාවෙක්, සංඥයෙක්, සංස්කාරයෙක්, විඥනයෙක් ඇත් ද, ඒ දහම් අනිත්‍ය විසින් දුඃඛ විසින් රොග විසින් ගණ්ඩ විසින් ශල්‍ය විසින් අඝ විසින් ආබාධ විසින් පරයතන විසින් විනාශ විසින් ශුන්‍ය විසින් අනාත්ම විසින් දක්නේ ය. හේ කාබුත් මරණින් මතුයෙහි ශුද්ධාවාස දෙවියන්ගේ සහභාවයට යෙසි. මහණෙනි, මේ උපපත්තිය පුහුදුන් හා අසාධාරණ යි.

තව ද මහණෙනි, මෙ ලොව ඇතැම් පුද්ගලයෙක් විතර්ක විචාරයන් සංහිඳීමෙන් ... දෙවන ධ්‍යානයට .... තෙවන ධ්‍යානයට ... සතරවන ධ්‍යානයට සමවැද වෙසෙසි. හේ එහි යම් ම රූපයෙක්, වෙදනාවෙක්, සංඥයෙක්, සංස්කාරයෙක්, විඥනයෙක් ඇත් ද, ඒ දහම් අනිත්‍ය විසින් දුඃඛ විසින් රොග විසින් ගණ්ඩ විසින් ශල්‍ය විසින් අඝ විසින් ආබාධ විසින් පරයතන විසින් විනාශ විසින් ශුන්‍ය විසින් අනාත්ම විසින් දක්නේ ය. හේ කාබුත් මරණින් මතුයෙහි ශුද්ධාවාස දෙවියන්ගේ සහවාසයට එළඹෙසි. මහණෙනි, මේ උපපත්තිය පුහුදුනන් හා අසාධාරණ යි.

මහණෙනි, මේ පුද්ගලයෝ සතර දෙන ලෝකයෙහි විද්‍යමාන වෙත්.

4. 3. 3. 5.

[තතියපුග්ගල සුත්‍රය]

25. මහණෙනි, මේ පුද්ගලයෝ සතර දෙනෙක් ලෝකයෙහි විද්‍යමාන වෙත්. කවර සතර දෙනෙක යත්:

මහණෙනි, මෙලොව ඇතැම් පුද්ගලයෙක් මෛත්‍රී සහගත සිතින් එක් දිගක් පැහැස වෙසෙසි. එසෙයින් දෙවන දිග ද එසෙයින් තෙවන දිග ද එසෙයින් සතරවන දිග දැයි මෙසේ උඩ යට සරස හැම තැන සර්වසත්ත්වයන් කෙරෙහි ආත්මසමතායෙන් මුළු ලෝ විපුල වූ මහද්ගත වූ අප්‍රමාණ වූ අවෛර වූ ව්‍යාබාධ (දෙම්නස්) රහිත වූ මෛත්‍රීසහගිය සිතින් පැහැස වෙසෙසි. හේ ධ්‍යාන සුඛානුභව විසින් ආස්වාද කෙරෙයි. ඒ ධ්‍යානය කැමැති වෙයි ඒ ධ්‍යානයෙන් තුෂ්ටියට පැමිණෙයි. එහි සිටියේ ඒ ධ්‍යානයෙහි අධිමුක්ත වූයේ ඒ ධ්‍යානයෙන් බහුල විහරණ ඇතියේ නො පිරිහුනේ කලුරිය කරමින් බ්‍රහ්මකායික දෙවියන්ගේ සහභාවයට එළඹෙසි. මහණෙනි, බ්‍රහ්මකායික දෙවියන්ගේ ආයුඃප්‍රමාණය කල්පයෙකි. එහි පෘථග්ජන ආයු ඇතිතාක් සිට ඒ දෙවියන්ගේ ආයුඃප්‍රමාණය යම් පමණ වේ ද, එතැ ම ගෙවා නිරයට ද යෙයි. තිරිසන් යොනට ද යෙයි. ප්‍රෙතවිෂයට ද යෙයි. –

භගවතො පන සාවකො තත්ථ යාවතායුකං ඨත්වා යාවතකං තෙසං දෙවානං ආයුප්පමාණං තං සබ්බං ඛෙපෙත්වා තස්මිං යෙව භවෙ පරිනිබ්බායති. අයං ඛො භික්ඛවෙ විසෙසො අයං අධිප්පායො ඉදං නානාකරණං සුතවතො අරියසාවකස්ස අස්සුතවතා පුථුජ්ජනෙන යදිදං ගතියා උපපත්තියා සති.

පුන ච පරං භික්ඛවෙ ඉධෙකච්චො පුග්ගලො කරුණාසහගතෙන චෙතසා -පෙ- ආභස්සරානං දෙවානං සහව්‍යතං උපපජ්ජති. ආභස්සරානං භික්ඛවෙ දෙවානං ද්වෙ කප්පා ආයුප්පමාණං -පෙ- මුදිතාසහගතෙන චෙතසා -පෙ- සුභකිණ්හානං දෙවානං සහව්‍යතං උපපජ්ජති. සුභකිණ්හානං භික්ඛවෙ දෙවානං චත්තාරො කප්පා ආයුප්පමාණං -පෙ- *උපෙක්ඛාසහගතෙන චෙතසා එකං දිසං ඵරිත්වා විහරති, තථා දුතියං- තථා තතියං- තථා චතුත්ථිං- ඉති උද්ධමධො තිරියං සබ්බධි සබ්බත්තතාය සබ්බාවන්තං ලොකං උපෙක්ඛා-සහගතෙන චෙතසා විපුලෙන මහග්ගතෙන අප්පමාණෙන අවෙරෙන අබ්‍යාපජ්ඣෙන ඵරිත්වා විහරති. සො තදස්සාදෙති තං නිකාමෙති තෙන ච විත්තිං ආපජ්ජති. තත්ථ ඨිතො තදධිමුත්තො තබ්බහුලවිහාරී අපරිහීනො කාලං කුරුමානො වෙහප්ඵලානං දෙවානං සහව්‍යතං උපපජ්ජති. වෙහප්ඵලානං භික්ඛවෙ දෙවානං පඤ්චකප්පසතානි ආයුප්පමාණං. තත්ථ පුථුජ්ජනො යාවතායුකං ඨත්වා යාවතකං තෙසං දෙවානං ආයුප්පමාණං තං සබ්බං ඛෙපෙත්වා නිරයම්පි ගච්ඡති. තිරච්ඡානයොනිම්පි ගච්ඡති. පෙත්ති-විසයම්පි ගච්ඡති. භගවතො පන සාවකො තත්ථ යාවතායුකං ඨත්වා යාවතකං තෙසං දෙවානං ආයුප්පමාණං තං සබ්බං ඛෙපෙත්වා තස්මිං යෙව භවෙ පරිනිබ්බායති. අයං ඛො භික්ඛවෙ විසෙසො, අයං අධිප්පායො. ඉදං නානාකරණං සුතවතො අරියසාවකස්ස අස්සුතවතා පුථුජ්ජනෙන යදිදං ගතියා උපපත්තියා සති.

ඉමෙ ඛො භික්ඛවෙ චත්තාරො පුග්ගලා සන්තො සංවිජ්ජමානා ලොකස්මින්ති.

## 4. 3. 3. 6.

## [චතුත්ථපුග්ගලසුත්තං]

26. චත්තාරොමෙ භික්ඛවෙ පුග්ගලා සන්තො සංවිජ්ජමානා ලොකස්මිං. කතමෙ චත්තාරො?

ඉධ භික්ඛවෙ එකච්චො පුග්ගලො මෙත්තාසහගතෙන චෙතසා එකං දිසං ඵරිත්වා විහරති. තථා දුතියං- තථා තතියං- තථා චතුත්ථිං- ඉති උද්ධමධො තිරියං සබ්බධි සබ්බත්තතාය සබ්බාවන්තං ලොකං මෙත්තාසහගතෙන චෙතසා විපුලෙන මහග්ගතෙන අප්පමාණෙන අවෙරෙන අබ්‍යාපජ්ඣෙන ඵරිත්වා විහරති. සො යදෙව තත්ථ හොති රූපගතං වෙදනාගතං සඤ්ඤාගතං සඞ්ඛාරගතං විඤ්ඤාණගතං, තෙ ධම්මෙ අනිච්චතො දුක්ඛතො රොගතො ගණ්ඩතො සල්ලතො අඝතො ආබාධතො පරතො පලොකතො සුඤ්ඤතො අනත්තතො සමනුපස්සති සො කායස්ස භෙදා පරම්මරණා සුද්ධාවාසානං දෙවානං සහව්‍යතං උපපජ්ජති. අයං ඛො භික්ඛවෙ උපපත්ති අසාධාරණා පුථුජ්ජනෙහි.

* ඉමස්ස සුත්තපදෙසස්ස පෙය්‍යාලඤ්ඤෙවානි 'සී මු, මජසං' පොත්ථකෙසු අවසානපතිතානි දිස්සන්ති. ස්‍යාමපොත්ථකෙ සුත්තං සම්පුණ්ණමෙව දිස්සති

Free Distribution www.aathaapi.org

භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රාවක වනාහි එහි ආයු ඇතිතාක් සිට ඒ දෙවියන්ගේ ආයුඃප්‍රමාණය යම් පමණ වේ ද එ හැම ගෙවා ඒ භවයෙහි ම පිරිනිවෙයි. මහණෙනි, ගතිය හා උපපත්තිය හා ඇති තාක් අශ්‍රැතවත් පෘථග්ජනයා හා ශ්‍රැතවත් ආර්‍ය්‍යශ්‍රාවකයාගේ මේ විශේෂ යි. මේ අධිකප්‍රයෝග යි. මේ වෙනස යි.

නමද මහණෙනි, මෙලොව ඇතැම් පුද්ගලයෙක් කරුණා සහගත සිතින්...ආභාස්වර දෙවියන්ගේ සහභාවයට එළඹෙයි. මහණෙනි, ආභාස්වර දෙවියන්ගේ ආයුඃප්‍රමාණය කල්ප දෙකෙකි. ... මුදිතා සහගත සිතින් ... ශුභකෘත්ස්න දෙවියන්ගේ සහභාවයට එළඹෙයි. මහණෙනි, ශුභකෘත්ස්න දෙවියන්ගේ ආයුඃප්‍රමාණය සතර කල්පයෙකි. ... උපේක්‍ෂා සහගත සිතින් එක් දිගක් පැහැස වෙසෙයි. එසෙයින් දෙවන දිග ද එසෙයින් තෙවන දිග ද එසෙයින් සතර වන දිග ද මෙසේ උඩ යට සරස හැම තැන සර්‍වසත්ත්වයන් කෙරෙහි ආත්මසමතායෙන් මුළු ලෝ විපුල වූ මහද්ගත වූ අප්‍රමාණ වූ අවෛර වූ ව්‍යාබාධ රහිත උපේක්‍ෂා සහගත සිතින් පැහැස වෙසෙයි. හේ එය සුඛානුභව විසින් ආස්වාද කෙරෙයි. ඒ දැහැන පතයි. ඒ දැහැනින් තුෂ්ටියට පැමිණෙයි එහි සිටියේ එහි අධිමුක්ත වූයේ ඒ දැහැනින් බහුල විහරණ ඇත්තේ නො පිරිහුණේ කලුරිය කරමින් වෘහත්ඵල දෙවියන්ගේ සහභාවයට එළඹෙයි. මහණෙනි, වෘහත්ඵල දෙවියන්ගේ ආයුඃප්‍රමාණය පඤ්චකල්ප ශතයෙකි එහි පෘථග්ජන ආයු ඇති තාක් සිට ඒ දෙවියන්ගේ ආයුඃප්‍රමාණය යම් පමණ වේ ද ඒ හැම ගෙවා නිරයට ද යෙයි. තිරිසන්යො-නට ද යෙයි ප්‍රෙත විෂයට ද යෙයි භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රාවක වනාහි එහි ආයු ඇති තාක් සිට ඒ දෙවියන්ගේ ආයුඃප්‍රමාණය යම් පමණ වේ ද එ හැම ගෙවා ඒ භවයෙහි ම පිරිනිවෙයි. මහණෙනි, ගතිය හා උපපත්තිය හා ඇති කල්හි අශ්‍රැතවත් පෘථග්ජනයා හා ශ්‍රැතවත් ආර්‍ය්‍යශ්‍රාවකයාගේ මේ විශෙෂ යි. මේ අධිකප්‍රයෝගයි. මේ වෙනස යි.

මහණෙනි, මේ පුද්ගලයෝ සතර දෙන ලෝකයෙහි විද්‍යමානයහ.

## 4 3. 3. 6.

## [මහුත්පුග්ගලසුත්‍රය]

26 .මහණෙනි, මේ පුද්ගලයෝ සතර දෙනෙක් ලෝකයෙහි විද්‍යමානයහ. කවර සතර දෙනෙක යත්:

මහණෙනි, මේ ලොව ඇතැම් පුද්ගලයෙක් මෛත්‍රීසහගත සිතින් එක් දිගක් පැහැස වෙසෙයි. එසෙයින් දෙවන දිග ද එසේයින් තෙවන දිග ද එසෙයින් සිවුවන දිග ද මෙසේ උඩ යට සරස හැම තැන සර්‍වසත්ත්වයන් කෙරෙහි ආත්මසමතායෙන් මුළු ලොව විපුල වූ මහද්ගත වූ අප්‍රමාණ වූ අවෛර වූ ව්‍යාබාධ රහිත වූ මෛත් සහගිය සිතින් පැහැස වෙසෙයි. හේ යම් ම එහි රූපයෙක්, වෙදනායෙක්, සංඥයෙක්, සංස්කාරයෙක්, විඥනයෙක් වේ ද, ඒ ධර්‍මයන් අනිත්‍ය විසින්, රොග විසින්, ගඩ විසින්, අස විසින්, ආබාධ විසින්, පරයත්ත විසින්, විනාශ විසින්, ශූන්‍ය විසින්, අනාත්ම විසින්, නුවණින් දක්නේ ය. හේ කාබුන් මරණින් මතු සුද්ධාවාස දෙවියන්ගේ සහභාවයට පැමිණෙයි. මහණෙනි, මේ උපපත්තිය පෘථග්ජනයන් හා අසාධාරණ යි.

පුන ච පරං භික්ඛවෙ ඉධෙකච්චො පුග්ගලො කරුණාසහගතෙන චෙතසා -පෙ- මුදිතාසහගතෙන චෙතසා -පෙ- උපෙක්ඛාසහගතෙන චෙතසා එකං දිසං ඵරිත්වා විහරති. තථා දුතියං- තථා තතියං- තථා චතුත්ථං- ඉති උද්ධමධො තිරියං සබ්බධි සබ්බත්තතාය සබ්බාවන්තං ලොකං උපෙක්ඛා-සහගතෙන චෙතසා විපුලෙන මහග්ගතෙන අප්පමාණෙන අවෙරෙන අබ්‍යාපජ්ඣෙන ඵරිත්වා විහරති. සො යදෙව තත්ථ හොති රූපගතං වෙදනාගතං සඤ්ඤාගතං සඞ්ඛාරගතං විඤ්ඤාණගතං තෙ ධම්මෙ අනිච්චතො දුක්ඛතො රොගතො ගණ්ඩතො සල්ලතො අඝතො ආබාධතො පරතො පලොකතො සුඤ්ඤතො අනත්තතො සමනුපස්සති. සො කායස්ස භෙදා පරම්මරණා සුද්ධාවාසානං දෙවානං සහබ්‍යතං උපපජ්ජති. අයං භික්ඛවෙ උපපත්ති අසාධාරණා පුථුජ්ජනෙහි.

ඉමෙ ඛො භික්ඛවෙ චත්තාරො පුග්ගලා සන්තො සංවිජ්ජමානා ලොකස්මින්ති.

## 4. 3. 3. 7.

## [තථාගත අච්ඡරියසුත්තං]

27. තථාගතස්ස භික්ඛවෙ අරහතො සම්මාසම්බුද්ධස්ස පාතුභාවා චත්තාරො අච්ඡරියා අබ්භුතා ධම්මා පාතුභවන්ති. කතමෙ චත්තාරො?

යදා භික්ඛවෙ බොධිසත්තො තුසිතා කායා චවිත්වා සතො සම්පජානො මාතුකුච්ඡිං ඔක්කමති, අථ සදෙවකෙ ලොකෙ සමාරකෙ සබ්‍රහ්මකෙ, සස්සමණ-බ්‍රාහ්මණියා පජාය සදෙවමනුස්සාය අප්පමාණො උළාරො ඔභාසො පාතුභවති අතික්කම්මෙව දෙවානං දෙවානුභාවං. යාපි තා ලොකන්තරිකා අඝා අසංවුතා අන්ධකාරා අන්ධකාරතිමිසා යත්ථිමෙසං චන්දිමසූරියානං එවං මහිද්ධි-කානං එවං මහානුභාවානං ආභා නානුභොන්ති, තත්ථපි අප්පමාණො උළාරො ඔභාසො පාතුභවති අතික්කම්මෙව දෙවානං දෙවානුභාවං. යෙපි තත්ථ සත්තා උපපන්නා තෙපි තෙනොභාසෙන අඤ්ඤමඤ්ඤං සඤ්ජානන්ති ''අඤ්ඤෙපි කිර භො සන්ති සත්තා ඉධූපපන්නා''ති.

තථාගතස්ස භික්ඛවෙ අරහතො සම්මාසම්බුද්ධස්ස පාතුභාවා අයං පඨමො අච්ඡරියො අබ්භුතො ධම්මො පාතුභවති.

පුන ච පරං භික්ඛවෙ යදා බොධිසත්තො සතො සම්පජානො මාතුකුච්ඡිම්හා නික්ඛමති, අථ සදෙවකෙ ලොකෙ සමාරකෙ සබ්‍රහ්මකෙ, සස්සමණබ්‍රාහ්මණියා පජාය සදෙවමනුස්සාය අප්පමාණො උළාරො ඔභාසො පාතුභවති. අතික්කම්මෙව දෙවානං දෙවානුභාවං. යාපි තා ලොකන්තරිකා අඝා අසංවුතා අන්ධකාරා අන්ධකාරතිමිසා යත්ථිමෙසං චන්දිමසූරියානං එවං මහිද්ධිකානං එවං මහානුභාවානං ආභා නානුභොන්ති, තත්ථපි අප්පමාණො උළාරො ඔභාසො පාතුභවති අතික්කම්මෙව දෙවානං දෙවානුභාවං. යෙපි තත්ථ සත්තා උපපන්නා, තෙපි තෙනොභාසෙන අඤ්ඤමඤ්ඤං සඤ්ජානන්ති ''අඤ්ඤෙපි කිර භො සන්ති සත්තා ඉධූපපන්නා''ති.

Free Distribution www.aathaapi.org

තවද මහණෙනි, මෙලොව ඇතැම් පුද්ගලයෙක් කරුණා සහගියසිතින් ... මුදිතා සහගියසිතින් ... උපේක්ෂා සහගිය සිතින් එක් දිගක් පැතිර වෙසෙයි. එසෙයින් දෙවෙනි දිග ද එසෙයින් තෙවන දිග ද එසෙයින් සිවුවන දිග ද මෙසේ උඩ යට සරස සැම තැන සර්වසත්ත්වයන් කෙරෙහි ආත්මසමතායෙන් මුළු ලෝ විපුල වූ, මහද්ගත වූ, අප්‍රමාණ වූ, අවෛර වූ, ව්‍යාබාධ රහිත වූ, උපේක්ෂා සහගත සිතින් පැතිර වෙසේ. හේ එහි යම් ම රූපයෙක්, වේදනායෙක්, සංඥායෙක්, සංස්කාරයෙක්, විඥානයෙක් වේ ද ඒ ධර්මයන් අනිත්‍ය වශයෙන්, දුඃඛ වශයෙන්, රෝග වශයෙන්, ගණ්ඩ වශයෙන්, ශල්‍ය වශයෙන්, අඝ වශයෙන්, පරායත්ත වශයෙන්, විනාශ වශයෙන්, ශූන්‍ය වශයෙන්, අනාත්ම වශයෙන් නුවණින් දක්නේ ය. හේ කාබුන් මරණින් මතු සුද්ධාවාස දෙවියන්ගේ සහවාසයට පැමිණෙයි. මහණෙනි, මේ උපපත්තිය පුහුදුනන් හා අසාධාරණ යි.

මහණෙනි, මේ සතර පුද්ගලයෝ ලොව්හි විද්‍යමානයහ.

4. 3. 3. 7.

## [තථාගත අච්ඡරිය සූත්‍රය]

27. මහණෙනි, අතීත් සම්‍යක් සම්බුද්ධ තථාගතයන් වහන්සේගේ පහළ වීමෙන් සතර ආශ්චර්‍ය්‍ය අද්භූත ධර්ම කෙනෙක් පහළ වෙත්. කවර සතර කෙනෙක යත්:

මහණෙනි, යම් කලෙක බෝසත් තුසීදෙව්ලොවින් සැව සිහි නුවණින් යෙදී මවුකුස පිළිසිඳ ගත්තේ වේ ද, එසඳ පඤ්චකාමාවචර දෙවියන් සහිත, සවන කාමාවචර දෙවියන් සහිත බ්‍රහ්මයන් සහිත ලෝකයෙහි, ශ්‍රමණ බ්‍රාහ්මණයන් සහිත සෙසු දෙව් මිනිසුන් සහිත සත්ත්වාබ්‍යප්‍රජායෙහි දෙවියන්ගේ දේවානුභාවය ඉක්ම සිටි විපුල වූ අවභාසයෙක් පහළ වෙයි. යම් තීරයෙක මෙබඳු මහත් සෘද්ධි ඇති, මෙබඳු මහත් අනුභාව ඇති මේ සඳහිරු දෙදෙනාගේ රශ්මීහු නො වැද ගණිත් ද, වළ දෙර ඇති, අසංවෘත වූ,අඳුරු වූ, ගණඳුරු ඇති (චක්ෂුර්විඥාන වළහන) යම් ඒ ලෝකාන්තරිකයෝ ඇද්ද, එහි ද දෙවියන්ගේ දේවානුභාවය ඉක්ම සිටි විපුල අවභාසයෙක් පහළ වේ. එහි යම් සත්ත්ව කෙනෙක් උපන්හු ද, ඔහුත් ඒ අවභාසයෙන් "භවත්නි, අන්‍ය වූත් සත්ත්වයෝ මෙහි පහළවූවාහු ඇති"යි උනුන් හඳුනා ගණිත්.

මහණෙනි, අතීත් සම්‍යක් සම්බුද්ධ තථාගතයන් වහන්සේගේ පහළ වීමෙන් මේ පළමු වැනි ආශ්චර්‍ය්‍ය අද්භූත ධර්මය පහළ වෙයි.

තවද මහණෙනි, යම් කලෙක බෝසත් සිහි නුවණින් යුක්ත ව මවු කුසින් බිහි වේ ද, එසඳ පඤ්චකාමාවචර දෙවියන් සහිත, සවන කාමාවචර දෙවියන් සහිත බඹුන් සහිත ලෝකයෙහි ශ්‍රමණ බ්‍රාහ්මණයන් සහිත සෙසු දෙව්මිනිසුන් සහිත සත්ත්වාබ්‍යප්‍රජායෙහි දෙවියන්ගේ දේවානුභාවය ඉක්ම සිටි විපුල අවභාසයෙක් පහළ වෙයි. යම් තැනෙක මෙබඳු මහත් සෘද්ධි ඇති මෙබඳු මහත් අනුභාව ඇති, මේ සඳහිරු දෙදෙනාගේ කාන්තීහු නො වැද ගණිත් ද, එබඳු වූ වළදෙර ඇති, අසංවෘත වූ, අඳුරු වූ, ගණඳුරින් ඇස් මුවහ කළ යම් ඒ ලෝකාන්තරිකයෝ ඇද්ද, එහි ද දෙවියන්ගේ දෙවානුභාව ඉක්ම සිටි විපුල අවභාසයෙක් පහළ වේ එහි යම් සත්හු උපන්හු ද ඔහුදු ඒ අවභාසයෙන් "භවත්නි, අන්‍ය වූත් සත්ත්වයෝ මෙහි උපන්නාහු ඇති"යි උනුන් හඳුනා ගණිත්.

තථාගතස්ස භික්ඛවෙ අරහතො සම්මාසම්බුද්ධස්ස පාතුභාවා අයං දුතියො අච්ඡරියො අබ්භුතො ධම්මො පාතුභවති.

පුන ච පරං භික්ඛවෙ යදා තථාගතො අනුත්තරං සම්මාසම්බොධිං අභිසම්බුජ්ඣති, අථ සදෙවකෙ ලොකෙ සමාරකෙ සබ්‍රහ්මකෙ, සස්සමණ-බ්‍රාහ්මණියා පජාය සදෙවමනුස්සාය අප්පමාණො උළාරො ඔභාසො පාතුභවති අතික්කම්මෙව දෙවානං දෙවානුභාවං. යාපි තා ලොකන්තරිකා අඝා අසංවුතා අන්ධකාරා අන්ධකාරතිමිසා යත්ථිමෙසං චන්දිමසූරියානං එවං මහිද්ධිකානං එවං මහානුභාවානං ආභා නානුභොන්ති, තත්ථපි අප්පමාණො උළාරො ඔභාසො පාතුභවති අතික්කම්මෙව දෙවානං දෙවානුභාවං. යෙපි තත්ථ සත්තා උපපන්නා තෙපි තෙනොභාසෙන අඤ්ඤමඤ්ඤං සඤ්ජානන්ති. "අඤ්ඤෙපි කිර භො සන්ති සත්තා ඉධූපපන්නා"ති.

තථාගතස්ස භික්ඛවෙ අරහතො සම්මාසම්බුද්ධස්ස පාතුභාවා අයං තතියො අච්ඡරියො අබ්භුතො ධම්මො පාතුභවති.

පුන ච පරං භික්ඛවෙ යදා තථාගතො අනුත්තරං ධම්මචක්කං පවත්තෙති, අථ සදෙවකෙ ලොකෙ සමාරකෙ සබ්‍රහ්මකෙ, සස්සමණබ්‍රාහ්මණියා පජාය සදෙවමනුස්සාය අප්පමාණො උළාරො ඔභාසො පාතුභවති අතික්කම්මෙව දෙවානං දෙවානුභාවං. යාපි තා ලොකන්තරිකා අඝා අසංවුතා අන්ධකාරා අන්ධකාරතිමිසා යත්ථිමෙසං චන්දිමසූරියානං එවං මහිද්ධිකානං එවං මහානුභාවානං ආභා නානුභොන්ති, තත්ථපි අප්පමාණො උළාරො ඔභාසො පාතුභවති අතික්කම්මෙව දෙවානං දෙවානුභාවං. යෙපි තත්ථ සත්තා උපපන්නා තෙපි තෙනොභාසෙන අඤ්ඤමඤ්ඤං සඤ්ජානන්ති "අඤ්ඤෙපි කිර භො සන්ති සත්තා ඉධූපපන්නා"ති.

තථාගතස්ස භික්ඛවෙ අරහතො සම්මාසම්බුද්ධස්ස පාතුභාවා අයං චතුත්ථො අච්ඡරියො අබ්භුතො ධම්මො පාතුභවති.

තථාගතස්ස භික්ඛවෙ අරහතො සම්මාසම්බුද්ධස්ස පාතුභාවා ඉමෙ චත්තාරො අච්ඡරියා අබ්භුතා ධම්මා පාතුභවන්තීති.

## 4. 3. 3. 8.

## [දුතියතථාගතඅච්ඡරියසුත්තං]

28. තථාගතස්ස භික්ඛවෙ අරහතො සම්මාසම්බුද්ධස්ස පාතුභාවා චත්තාරො අච්ඡරියා අබ්භුතා ධම්මා පාතුභවන්ති. කතමෙ චත්තාරො?

ආලයාරාමා භික්ඛවෙ පජා ආලයරතා ආලයසම්මුදිතා. සා තථාගතෙන අනාලයෙ ධම්මෙ දෙසියමානෙ සුස්සූසති. සොතං ඔදහති. අඤ්ඤාචිත්තං උපට්ඨාපෙති.

තථාගතස්ස භික්ඛවෙ අරහතො සම්මාසම්බුද්ධස්ස පාතුභාවා අයං පඨමො අච්ඡරියො අබ්භුතො ධම්මො පාතුභවති.

Free Distribution www.aathaapi.org

මහණෙනි, අර්හත් සම්‍යක් සම්බුද්ධ තථාගතයන් වහන්සේගේ පහළ වීමෙන් මේ දෙවැනි ආශ්චර්‍ය්‍ය අද්භූත ධර්මය පහළ වෙයි.

තවද මහණෙනි, යම් කලෙක තථාගතයන් වහන්සේ අනුත්තර සම්‍යක් සම්බෝධිය අවබෝධ කරණ සේක් ද, එසඳ සදේවක සමාරක සබ්‍රහ්මක ලෝකයෙහි සශ්‍රමණබ්‍රාහ්මණ සදෙවමනුෂ්‍ය ප්‍රජායෙහි දෙවියන්ගේ දෙවානුභාවය ඉක්ම සිටි විපුල අවභාසයෙක් පහළ වෙයි. යම් තැනෙක මෙබඳු මහත් සෘද්ධි ඇති, මෙබඳු මහත් අනුභාව ඇති, මේ සඳහිරු දෙදෙනාගේ කාන්තිහු නොවැද ගණ්ත් ද, එබඳු වූ වළදෙර ඇති, අසංවෘත වූ, අඳුරු වූ, ගණඳුරින් ඇස් මුවහ කළ යම් ඒ ලෝකාන්තරිකයෝ ඇද්ද එහිදු දෙවියන්ගේ දේවානුභාවය ඉක්ම සිටි විපුල අවභාසයෙක් පහළ වෙයි. එහි යම් සත්හු උපන්හු ද, ඔහුත් ඒ අවභාසයෙන් "භවත්නි, අන්‍යසත්ත්වයෝත් මෙහි උපන්හු ඇති"යි උනුන් හඳුනා ගණිත්.

මහණෙනි, අර්හත් සම්‍යක් සම්බුද්ධ තථාගතයන් වහන්සේගේ පහළ වීමෙන් මේ තෙවන ආශ්චර්‍ය්‍ය අද්භූත ධර්මය පහළ වේ.

තවද මහණෙනි, යම් කලෙක තථාගතයන් වහන්සේ අනුත්තර ධර්මචක්‍රය පවත්වන සේක් ද, එසඳ සදෙවක සමාරක සබ්‍රහ්මක ලොකයෙහි, සශ්‍රමණබ්‍රාහ්මණ සදෙවමනුෂ්‍ය සත්ත්වාබ්‍ය ප්‍රජායෙහි දෙවියන්ගේ දෙවානුභාවය ඉක්ම සිටි විපුල අවභාසයෙක් පහළ වෙයි. යම් තැනෙක මෙසේ මහත් සෘද්ධි ඇති මෙසේ මහත් අනුභාව ඇති මේ සඳහිරු දෙදෙනාගේ කාන්තිහු නො වැද ගණිත් ද, වළදෙර ඇති, අසංවෘත වූ, අඳුරු වූ, ගණඳුරින් මුවහ කළ ඇස් ඇති යම් ලෝකාන්තරිකයෝ ඇද්ද, එහිදු දෙවියන්ගේ දේවානුභාව ඉක්ම සිටි විපුල අවභාසයෙක් පහළ වෙයි. එහි යම් සත්ත්ව කෙනෙක් උපන්හු ද, ඔහුත් ඒ අවභාසයෙන් "භවත්නි, අන්‍ය වූත් සත්ත්වයෝ මෙහි උපන්නාහු ඇති"යි උනුන් හඳුනා ගණිත්.

මහණෙනි, අර්හත් සම්‍යක් සම්බුද්ධ තථාගතයන් වහන්සේගේ පහළ වීමෙන් මේ සතර වැනි ආශ්චර්‍ය්‍ය අද්භූත ධර්මය පහළ වෙයි.

මහණෙනි, අර්හත් සම්‍යක් සම්බුද්ධ තථාගතයන් වහන්සේගේ පහළ වීමෙන් මේ සතර ආශ්චර්‍ය්‍ය අද්භූත ධර්මයෝ පහළ වෙත්.

## 4. 3. 3. 8.

## [දුතියතථාගතඅච්ඡරිය සූත්‍රය]

28. මහණෙනි, අර්හත් සම්‍යක් සම්බුද්ධ තථාගතයන් වහන්සේගේ පහළ වීමෙන් මේ සතර ආශ්චර්‍ය්‍ය අද්භූත ධර්ම කෙනෙක් පහළ වෙත්. කවර සතර ධර්ම කෙනෙක යත්:

මහණෙනි, ප්‍රජා තොමෝ ආලය ආරාම කොට ඇත්තී (පඤ්චකාම ගුණ) ආලයෙහි ඇලුනී වෙයි. ආලයෙහි ප්‍රමුදිත වෙයි. ඒ ප්‍රජාව තථාගතයන් වහන්සේ විසින් විවට ඇසුරු කළ අපිදහම් දෙසනු ලබන කල්හි අසනු කැමැති වෙයි. කන් රුකොට තබයි. දතහනු පිණිස සිත එළවයි.

මහණෙනි, අර්හත් සම්‍යක් සම්බුද්ධ තථාගතයන් වහන්සේගේ පහළ වීමෙන් මේ පළමුවන ආශ්චර්‍ය්‍ය අද්භූත ධර්මය පහළ වෙයි.

මානාරාමා භික්ඛවෙ පජා මානරතා මානසම්මුදිතා. සා තථාගතෙන මානවිනයෙ ධම්මෙ දෙසියමානෙ සුස්සූසති. සොතං ඔදහති. අඤ්ඤාචිත්තං උපට්ඨපෙති.

තථාගතස්ස භික්ඛවෙ අරහතො සම්මාසම්බුද්ධස්ස පාතුභාවා අයං දුතියො අච්ඡරියො අබ්භුතො ධම්මො පාතුභවති.

අනුපසමාරාමා භික්ඛවෙ පජා අනුපසමරතා අනුපසමසම්මුදිතා. සා තථාගතෙන ඔපසමිකෙ ධම්මෙ දෙසියමානෙ සුස්සූසති. සොතං ඔදහති. අඤ්ඤාචිත්තං උපට්ඨපෙති.

තථාගතස්ස භික්ඛවෙ අරහතො සම්මාසම්බුද්ධස්ස පාතුභාවා අයං තතියො අච්ඡරියො අබ්භුතො ධම්මො පාතුභවති.

අවිජ්ජාගතා භික්ඛවෙ පජා අණ්ඩභූතා[1] පරියොනද්ධා. සා තථාගතෙන අවිජ්ජාවිනයෙ ධම්මෙ දෙසියමානෙ සුස්සූසති. සොතං ඔදහති. අඤ්ඤාචිත්තං උපට්ඨපෙති.

තථාගතස්ස භික්ඛවෙ අරහතො සම්මාසම්බුද්ධස්ස පාතුභාවා අයං චතුත්ථො අච්ඡරියො අබ්භුතො ධම්මො පාතුභවති.

තථාගතස්ස භික්ඛවෙ අරහතො සම්මා සම්බුද්ධස්ස පාතුභාවා ඉමෙ චත්තාරො අච්ඡරියා අබ්භුතා ධම්මා පාතුභවන්තීති.

## 4. 3. 3. 9.

## [ආනන්දච්ඡරියසුත්තං]

29. චත්තාරොමෙ භික්ඛවෙ අච්ඡරියා අබ්භුතා ධම්මා ආනන්දෙ. කතමෙ චත්තාරො?

සචෙ භික්ඛවෙ භික්ඛුපරිසා ආනන්දං දස්සනාය උපසඞ්කමති, දස්සනෙන සා අත්තමනා හොති. තත්‍ර චෙ ආනන්දො ධම්මං භාසති, භාසිතෙනපි සා අත්තමනා හොති. අතිත්තාව භික්ඛවෙ භික්ඛුපරිසා හොති. අථ ආනන්දො තුණ්හී භවති.

සචෙ භික්ඛවෙ භික්ඛුනීපරිසා ආනන්දං දස්සනාය උපසඞ්කමති, දස්සනෙන සා අත්තමනා හොති. තත්‍ර චෙ ආනන්දො ධම්මං භාසති, භාසිතෙනපි සා අත්තමනා හොති. අතිත්තාව භික්ඛවෙ භික්ඛුනීපරිසා හොති. අථ ආනන්දො තුණ්හී භවති.

සචෙ භික්ඛවෙ උපාසකපරිසා ආනන්දං දස්සනාය උපසඞ්කමති, දස්සනෙන සා අත්තමනා හොති. තත්‍ර චෙ ආනන්දො ධම්මං භාසති, භාසිතෙනපි සා අත්තමනා හොති. අතිත්තාව භික්ඛවෙ උපාසකපරිසා හොති. අථ ආනන්දො තුණ්හී භවති.

සචෙ භික්ඛවෙ උපාසිකාපරිසා ආනන්දං දස්සනාය උපසඞ්කමති, දස්සනෙන සා අත්තමනා හොති. තත්‍ර චෙ ආනන්දො ධම්මං භාසති, භාසිතෙනපි සා අත්තමනා හොති. අතිත්තාව භික්ඛවෙ උපාසිකාපරිසා හොති. අථ ආනන්දො තුණ්හී භවති.

ඉමෙ ඛො භික්ඛවෙ චත්තාරො අච්ඡරියා අබ්භුතා ධම්මා ආනන්දෙති.

1. අණ්ඩභූතා - සීමු.

මහණෙනි, ප්‍රජාව මානය ආරාම කොට ඇත්තී මානයෙහි ඇලුනී මානයෙහි ප්‍රමුදිත වූවා වෙයි. ඒ ප්‍රජාව තථාගතයන් වහන්සේ විසින් මානවිනයකර ධර්මය දෙසනු ලබන කල්හි අසනු කැමැති වෙයි. කන් රැකොට තබයි. දැනගනු පිණිස සිත් එළවයි.

මහණෙනි, අතීත් සම්‍යක් සම්බුද්ධ තථාගතයන් වහන්සේගේ පහළ වීමෙන් මේ දෙවන ආශ්චර්‍ය්‍ය අද්භූත ධර්මය පහළ වෙයි.

මහණෙනි, ප්‍රජාව අනුපශමය ආරාම කොට ඇත්තී අනුපශමයෙහි ඇලුනී අනුපශමයෙහි ප්‍රමුදිත වෙයි. ඒ ප්‍රජාව තථාගතයන් වහන්සේ විසින් උපශමකර ධර්මය දෙසනු ලබන කල්හි අසනු කැමැති වෙයි. කන් රැකොට තබයි. දැනගන්නා සිත් එළවයි.

මහණෙනි, අතීත් සම්‍යක් සම්බුද්ධ තථාගතයන් වහන්සේගේ පහළ වීමෙන් මේ තුන්වැනි ආශ්චර්‍ය්‍ය අද්භූත ධර්මය පහළ වෙයි.

මහණෙනි, ප්‍රජාව අවිද්‍යායෙන් සමන්නාගතය. අවිද්‍යායෙන් වෙළුදනා ලද්දයෙන් අන්ධභූතය. හාත්පස වෙළුදනා ලද්ද ය. ඒ ප්‍රජාව තථාගතයන් වහන්සේ විසින් අවිද්‍යාවිනය ඇසුරු කළ ධර්මය දෙසනු ලබන කල්හි අසනු කැමැති වෙයි. කන් රැකොට තබයි දැනගන්නා සිත් එළවයි.

මහණෙනි, අතීත් සම්‍යක් සම්බුද්ධ තථාගතයන් වහන්සේගේ පහළ වීමෙන් මේ සතර වැනි ආශ්චර්‍ය්‍ය අද්භූත ධර්මය පහළ වෙයි.

මහණෙනි, අතීත් සම්‍යක් සම්බුද්ධ තථාගතයන් වහන්සේගේ පහළ වීමෙන් මේ සතර ආශ්චර්‍ය්‍ය අද්භූත ධර්මයෝ පහළ වෙත්.

## 4. 3. 3. 9.

## [ආනන්දචඡරිය සූත්‍රය]

29. මහණෙනි, ආනන්දයන් කෙරෙහි මේ සතර ආශ්චර්‍ය්‍ය අද්භූත ධර්ම කෙනෙක් ඇත. කවර සතර කෙනෙක යත්:

මහණෙනි, ඉදින් භික්ෂුපර්ෂද් ආනන්දයන් දක්නට එළඹේ ද, දැක්මෙන් ම ඒ පිරිස සතුටු වෙයි. ඉදින් ඒ පිරිස්හි ආනන්දයෝ දහම් දෙසත් ද, ඒ පිරිස භාෂිතයෙනුදු සතුටු වෙයි. මහණෙනි, භික්ෂුපර්ෂද් අතෘප්ත ම වෙයි. එසේ වත් ම ආනන්දයෝ නිශ්ශබ්ද වෙති.

මහණෙනි, ඉදින් භික්ෂුණීපර්ෂද් ආනන්දයන් දක්නට එළඹේ ද, දැක්මෙන් ම ඒ පිරිස සතුටු වෙයි. ඉදින් ඒ පිරිස්හි ආනන්දයෝ දහම් දෙසත් ද, ඒ පිරිස දෙසීමෙනුදු සතුටු වෙයි. මහණෙනි, භික්ෂුණීපර්ෂද් අතෘප්ත ම වෙයි. එසේ වත් ම ආනන්දයෝ නිශ්ශබ්ද වෙති.

මහණෙනි, ඉදින් උපාසකපර්ෂද් ආනන්දයන් දක්නට එළඹේ ද, දැක්මෙන් ම ඒ පිරිස සතුටු වෙයි. ඒ පිරිස්හි ඉදින් ආනන්දයෝ දහම් දෙසත් ද, එපිරිස දෙසීමෙනුදු සතුටු වෙයි මහණෙනි, උපාසකපර්ෂද් අතෘප්ත ම වෙයි. එසේ වත් ම ආනන්දයෝ නිශ්ශබ්ද වෙති.

මහණෙනි, ඉදින් උපාසිකාපර්ෂද් ආනන්දයන් දක්නට එළඹේ ද, දැක්මෙන් ම ඒ පිරිස සතුටු වෙයි. ඒ පිරිස්හි ඉදින් ආනන්දයෝ දහම් දෙසත් ද, ඒ පිරිස දෙසීමෙනුදු සතුටු වෙයි. මහණෙනි, උපාසිකාපර්ෂද් අතෘප්ත ම වෙයි. එසේ වත් ම ආනන්දයෝ නිශ්ශබ්ද වෙති.

මහණෙනි, මේ සතර ආශ්චර්‍ය්‍ය අද්භූත ධර්මයෝ ආනන්දයන් කෙරෙහි පහළ වෙති.

## 4. 3. 3. 10

## [චක්කවත්තිඅච්ඡරියසුත්තං]

30. චත්තාරොමෙ භික්ඛවෙ අච්ඡරියා අබ්භුතා ධම්මා රඤ්ඤො චක්කවත්තිම්හි. කතමෙ චත්තාරො?

සචෙ භික්ඛවෙ ඛත්තියපරිසා රාජානං චක්කවත්තිං දස්සනාය උපසඞ්කමන්ති. දස්සනෙන සා අත්තමනා හොති. තත්ථ[1] චෙ රාජා චක්කවත්ති භාසති, භාසිතෙනපි සා අත්තමනා හොති. අතිත්තාව භික්ඛවෙ ඛත්තියපරිසා හොති. අථ රාජා චක්කවත්ති තුණ්හී භවති.

සචෙ භික්ඛවෙ බ්‍රාහ්මණපරිසා රාජානං චක්කවත්තිං දස්සනාය උපසඞ්කමන්ති, දස්සනෙන සා අත්තමනා හොති. තත්ථ චෙ රාජා චක්කවත්ති භාසති, භාසිතෙනපි සා අත්තමනා හොති. අතිත්තාව භික්ඛවෙ බ්‍රාහ්මණපරිසා හොති. අථ රාජා චක්කවත්ති තුණ්හී භවති.

සචෙ භික්ඛවෙ ගහපතිපරිසා රාජානං චක්කවත්තිං දස්සනාය උපසඞ්කමන්ති. දස්සනෙන සා අත්තමනා හොති. තත්ථ චෙ රාජා චක්කවත්ති භාසති, භාසිතෙනපි සා අත්තමනා හොති. අතිත්තාව භික්ඛවෙ ගහපතිපරිසා හොති. අථ රාජා චක්කවත්ති තුණ්හී භවති

සචෙ භික්ඛවෙ සමණපරිසා රාජානං චක්කවත්තිං දස්සනාය උපසඞ්කමන්ති දස්සනෙන සා අත්තමනා හොති. තත්ථ චෙ රාජා චක්කවත්ති භාසති, භාසිතෙනපි සා අත්තමනා හොති. අතිත්තාව භික්ඛවෙ සමණපරිසා හොති. අථ රාජා චක්කවත්ති තුණ්හී භවති.

ඉමෙ ඛො භික්ඛවෙ චත්තාරො අච්ඡරියා අබ්භුතා ධම්මා රඤ්ඤො චක්කවත්තිම්හි.

එවමෙව ඛො භික්ඛවෙ චත්තාරො අච්ඡරියා අබ්භුතා ධම්මා ආනන්දෙ. කතමෙ චත්තාරො?

සචෙ භික්ඛවෙ භික්ඛුපරිසා ආනන්දං දස්සනාය උපසඞ්කමන්ති, දස්සනෙන සා අත්තමනා හොති. තත්ථ චෙ ආනන්දො ධම්මං භාසති, භාසිතෙනපි සා අත්තමනා හොති. අතිත්තාව භික්ඛවෙ භික්ඛුපරිසා හොති. අථ ආනන්දො තුණ්හී භවති,

සචෙ භික්ඛවෙ භික්ඛුනීපරිසා -පෙ- සචෙ භික්ඛවෙ උපාසකපරිසා -පෙ- සචෙ භික්ඛවෙ උපාසිකාපරිසා ආනන්දං දස්සනාය උපසඞ්කමන්ති, දස්සනෙන සා අත්තමනා හොති. තත්ථ චෙ ආනන්දො ධම්මං භාසති, භාසිතෙනපි සා අත්තමනා හොති. අතිත්තාව භික්ඛවෙ උපාසිකාපරිසා හොති. අථ ආනන්දො තුණ්හී භවති.

ඉමෙ ඛො භික්ඛවෙ චත්තාරො අච්ඡරියා අබ්භුතා ධම්මා ආනන්දෙති.

භයවග්ගො තතියො.*

---

1. තත්‍ර - මජසං.

* තස්සුද්දානං: අත්තානුවාද ඌමී ච - ද්වෙ ච ඨානා ද්වෙ ච භොවාදී
මෙත්තා ද්වෙ ච අච්ඡරියා - අපරා ච තථා දුවෙති.

## 4. 3. 3. 10.

## [චක්කවත්තිඅච්ඡරිය සූත්‍රය]

30. මහණෙනි, සක්විතිරජහු කෙරෙහි මේ සතර ආශ්චය්‍ය්‍ය අද්භූත ධර්‍ම කෙනෙක් ඇත. කවර සතර ධර්‍ම කෙනෙක යත්:

මහණෙනි, ඉදින් කැත්පිරිස් සක්විති රජු දක්නට එළඹේ ද, දැක්මෙන් ම එ පිරිස සතුටු වෙයි. ඉදින් එ පිරිස්හි සක්විතිරජ බෙණේ නම්, බිණීමෙනුදු එ පිරිස සතුටු වෙයි. මහණෙනි, ක්‍ෂත්‍රියපර්ෂද් අතෘප්ත ම වෙයි. එසේ වත් ම සක්විතිරජ නිශ්‍ශබ්ද වෙයි.

මහණෙනි, ඉදින් බමුණුපිරිස් සක්විතිරජු දක්නට එළඹේ ද, දැක්මෙන් ම එපිරිස සතුටු වෙයි. එ පිරිස්හි සක්විතිරජ ඉදින් බෙණේ නම්, බිණීමෙනුදු එ පිරිස සතුටු වෙයි. මහණෙනි, බ්‍රාහමණපර්ෂද් අතෘප්ත ම වෙයි. එසේ වත් ම සක්විතිරජ නිශ්‍ශබ්ද වෙයි.

මහණෙනි, ඉදින් ගෙහෙවිපිරිස් සක්විතිරජු දක්නට එළඹේ ද, දැක්මෙන් ම එ පිරිස සතුටු වෙයි. එ පිරිස්හි සක්විතිරජ ඉදින් බෙණේ නම්, බිණීමෙනුදු එ පිරිස සතුටු වෙයි. මහණෙනි, ගෘහපතිපර්ෂද් අතෘප්ත ම වෙයි. එසේ වත් ම සක්විතිරජ නිශ්‍ශබ්ද වෙයි.

මහණෙනි, ඉදින් මහණපිරිස් සක්විතිරජු දක්නට එළඹේ ද, දැක්මෙන් ම එ පිරිස සතුටු වෙයි. එ පිරිස්හි ඉදින් සක්විතිරජ බෙණේ නම්, බිණීමෙනුදු එ පිරිස සතුටු වෙයි. මහණෙනි, ශ්‍රමණපර්ෂද් අතෘප්ත ම වෙයි. එසේ වත් ම සක්විතිරජ නිශ්‍ශබ්ද වෙයි.

මහණෙනි, සක්විතිරජු කෙරෙහි මේ සතර ආශ්චය්‍ය්‍ය අද්භූත ධර්‍ම කෙනෙක් ඇත.

මහණෙනි, එ පරිද්දි ම ආනන්දයන් කෙරෙහි සතර ආශ්චය්‍ය්‍ය අද්භූත ධර්‍ම කෙනෙක් ඇත. කවර සතර ධර්‍ම කෙනෙක යත්:

මහණෙනි, ඉදින් මහණ පිරිස් ආනන්දයන් දක්නට එළඹේ ද, දැක්මෙන් ම එ පිරිස සතුටු වෙයි. එ පිරිස්හි ඉදින් ආනන්දයෝ දහම් දෙසත් ද, දෙසීමෙනුදු එ පිරිස සතුටු වෙයි. මහණෙනි, මහණපිරිස් අතෘප්ත මවෙයි. එසේ වත් ම ආනන්දයෝ නිශ්‍ශබ්ද වෙති

මහණෙනි, ඉදින් මෙහෙණපිරිස් ... මහණෙනි, ඉදින් උවසුපිරිස් ... මහණෙනි, ඉදින් උවැසි පිරිස් ආනන්දයන් දක්නට එළඹේ ද, දැක්මෙන් ම එ පිරිස සතුටු වෙයි. එ පිරිස්හි ඉදින් ආනන්දයෝ දහම් බෙණෙත් නම්, බිණීමෙනුදු එ පිරිස සතුටු වෙයි. මහණෙනි, උපාසිකාපර්ෂද් අතෘප්ත ම වෙයි. එසේ වත් ම ආනන්දයෝ නිශ්‍ශබ්ද වෙති.

මහණෙනි, ආනන්දයන් කෙරෙහි මේ සතර ආශ්චය්‍ය්‍ය අද්භූත ධර්‍ම කෙනෙක් ඇත.

භයවග්ගය තෙවැනි යි.



Free Distribution www.aathaapi.org

# 4. පුග්ගලවග්ගො

## 4 3. 4 1

## [සංයොජනපුග්ගලසුත්තං]

**[සාවත්ථිනිදානං]**

31. චත්තාරොමෙ භික්ඛවෙ පුග්ගලා සන්තො සංවිජ්ජමානා ලොකස්මිං. කතමෙ චත්තාරො?

ඉධ භික්ඛවෙ එකච්චස්ස පුග්ගලස්ස ඔරම්භාගියානි සංයොජනානි අප්පහීනානි හොන්ති. උප්පත්තිපටිලාභියානි සංයොජනානි අප්පහීනානි හොන්ති. භවපටිලාභියානි සංයොජනානි අප්පහීනානි හොන්ති.

ඉධ පන භික්ඛවෙ එකච්චස්ස පුග්ගලස්ස ඔරම්භාගියානි සංයොජනානි පහීනානි හොන්ති. උප්පත්තිපටිලාභියානි සංයොජනානි අප්පහීනානි හොන්ති. භවපටිලාභියානි සංයොජනානි අප්පහීනානි හොන්ති.

ඉධ පන භික්ඛවෙ එකච්චස්ස පුග්ගලස්ස ඔරම්භාගියානි සංයොජනානි පහීනානි හොන්ති. උප්පත්තිපටිලාභියානි සංයොජනානි පහීනානි හොන්ති. භවපටිලාභියානි සංයොජනානි අප්පහීනානි හොන්ති.

ඉධ පන භික්ඛවෙ එකච්චස්ස පුග්ගලස්ස ඔරම්භාගියානි සංයොජනානි පහීනානි හොන්ති. උප්පත්තිපටිලාභියානි සංයොජනානි පහීනානි හොන්ති. භවපටිලාභියානි සංයොජනානි පහීනානි හොන්ති.

කතමස්ස භික්ඛවෙ පුග්ගලස්ස ඔරම්භාගියානි සංයොජනානි අප්පහීනානි, උප්පත්තිපටිලාභියානි සංයොජනානි අප්පහීනානි, භවපටිලාභියානි සංයොජනානි අප්පහීනානි? සකදාගාමිස්ස[1], ඉමස්ස ඛො භික්ඛවෙ පුග්ගලස්ස ඔරම්භාගියානි සංයොජනානි අප්පහීනානි. උප්පත්තිපටිලාභියානි සංයොජනානි අප්පහීනානි. භවපටිලාභියානි සංයොජනානි අප්පහීනානි.

කතමස්ස භික්ඛවෙ පුග්ගලස්ස ඔරම්භාගියානි සංයොජනානි පහීනානි, උප්පත්තිපටිලාභියානි සංයොජනානි අප්පහීනානි, භවපටිලාභියානි සංයොජනානි අප්පහීනානි? උද්ධංසොතස්ස අකනිට්ඨගාමිනො. ඉමස්ස ඛො භික්ඛවෙ පුග්ගලස්ස ඔරම්භාගියානි සංයොජනානි පහීනානි. උප්පත්තිපටිලාභියානි සංයොජනානි අප්පහීනානි. භවපටිලාභියානි සංයොජනානි අප්පහීනානි.

කතමස්ස භික්ඛවෙ පුග්ගලස්ස ඔරම්භාගියානි සංයොජනානි පහීනානි, උප්පත්තිපටිලාභියානි සංයොජනානි පහීනානි, භවපටිලාභියානි සංයොජනානි අප්පහීනානි? අන්තරාපරිනිබ්බායිස්ස. ඉමස්ස ඛො භික්ඛවෙ පුග්ගලස්ස ඔරම්භාගියානි සංයොජනානි පහීනානි. උප්පත්තිපටිලාභියානි සංයොජනානි පහීනානි. භවපටිලාභියානි සංයොජනානි අප්පහීනානි.

1. සකදාගාමිකස්ස - සීමු

# 4. පුග්ගල වග්ගය

## 4. 3. 4. 1.

## [ සංයෝජනපුග්ගල සූත්‍රය ]

[සැවැත්නිදානයි]

31. මහණෙනි, මේ පුද්ගලයෝ සතර දෙනෙක් ලෝකයෙහි විද්‍යමානයහ. කවර සතර දෙනෙක යත්:

මහණෙනි, මෙලොව ඇතැම් පුද්ගලයකුට ඔරම්භාගිය සංයෝජනයෝ අප්‍රහීණ වෙත්. අතනතරෙතපපත්ති ප්‍රතිලාභයට හෙතු වූ සංයෝජනයෝ අප්‍රහීණ වෙත්. උපපත්ති භවප්‍රතිලාභයට හෙතු වූ සංයෝජනයෝ අප්‍රහීණ වෙත්.

මහණෙනි, මෙලොව ඇතැම් පුද්ගලයකුට ඔරම්භාගිය සංයෝජනයෝ ප්‍රහීණ වෙත්. අනතුරු උත්පත්තිය පිණිස හෙතු වූ සංයෝජනයෝ අප්‍රහීණ වෙත්. උපපත්ති භවය පිණිස හෙතු වූ සංයෝජනයෝ අප්‍රහීණ වෙත්.

මහණෙනි, මෙලොව ඇතැම් පුද්ගලයකුට ඔරම්භාගිය සංයෝජනයෝ ප්‍රහීණ වෙත්. අනනතරෙතපපත්තිප්‍රතිලාභයට හෙතු වූ සංයෝජනයෝ ප්‍රහීණ වෙත්. උපපත්තිභවප්‍රතිලාභයට හෙතු වූ සංයෝජනයෝ අප්‍රහීණ වෙත්.

මහණෙනි, මෙලොව ඇතැම් පුද්ගලයකුට ඔරම්භාගිය සංයෝජනයෝ ප්‍රහීණ වෙත්. අනනතරෙතපපත්තිප්‍රතිලාභයට හෙතු වූ සංයෝජනයෝ ප්‍රහීණ වෙත්. උපපත්තිභවප්‍රතිලාභයට හෙතු වූ සංයෝජනයෝ ප්‍රහීණ වෙත්.

මහණෙනි, කවර පුද්ගලයකුට ඔරම්භාගිය සංයෝජනයෝ අප්‍රහීණ වෙත් ද, අනනතරෙතපපත්තිප්‍රතිලාභයට හෙතු වූ සංයෝජනයෝ අප්‍රහීණ වෙත් ද, උපපත්තිභවප්‍රතිලාභයට හෙතු වූ සංයෝජනයෝ අප්‍රහීණ වෙත් ද? සකෘදාගාමීහට ය. මහණෙනි, මේ සකෘදාගාමී පුද්ගලයාහට ඔරම්භාගිය සංයෝජනයෝ අප්‍රහීණ වෙත්. (ඔහුට ඉතිරි ඔරම්භාගිය සංයෝජන සඳහා කියූ සේය.) අනනතරෙතපපත්තිප්‍රතිලාභයට හෙතු වූ සංයෝජනයෝ අප්‍රහීණ වෙත්. උපපත්තිභවප්‍රතිලාභයට හෙතු වූ සංයෝජනයෝ අප්‍රහීණ වෙත්.

මහණෙනි, කවර පුද්ගලයකුට ඔරම්භාගිය සංයෝජනයෝ ප්‍රහීණ වෙත් ද? අනනතරෙතපපත්තිප්‍රතිලාභයට හෙතු වූ සංයෝජනයෝ අප්‍රහීණ වෙත් ද, උපපත්තිභවප්‍රතිලාභයට හෙතු වූ සංයෝජනයෝ අප්‍රහීණ වෙත් ද? උද්ධංසොත අකනිට්ඨගාමීහට ය. මහණෙනි, මේ උද්ධංසොත අකනිට්ඨගාමී පුද්ගලයාහට ඔරම්භාගිය සංයෝජනයෝ ප්‍රහීණ වෙත්. අනනතරෙතපපත්ති-ප්‍රතිලාභයට හෙතු වූ සංයෝජනයෝ අප්‍රහීණ වෙත්. උපපත්තිභවප්‍රතිලාභයට හෙතු වූ සංයෝජනයෝ අප්‍රහීණ වෙත්.

මහණෙනි, කවර පුද්ගලයකුට ඔරම්භාගිය සංයෝජනයෝ ප්‍රහීණ වෙත් ද, අනනතරෙතපපත්තිප්‍රතිලාභයට හෙතු වූ සංයෝජනයෝ ප්‍රහීණ වෙත් ද උපපත්තිභවප්‍රතිලාභයට හෙතු වූ සංයෝජනයෝ අප්‍රහීණ වෙත් ද? අනතරාපරිනිබ්බායීහට ය. මහණෙනි, මේ අනතරාපරිනිබ්බායී පුද්ගලයාහට ඔරම්භාගිය සංයෝජනයෝ ප්‍රහීණ වෙත්. අනනතරෙතපපත්තිප්‍රතිලාභයට හෙතු වූ සංයෝජනයෝ ප්‍රහීණ වෙත්. උපපත්තිභවප්‍රතිලාභයට හෙතු වූ සංයෝජනයෝ අප්‍රහීණ වෙත්.

කතමස්ස භික්ඛවෙ පුග්ගලස්ස ඔරම්භාගියානි සංයොජනානි පහීණානි, උප්පත්තිපටිලාභියානි සංයොජනානි පහීණානි, භවපටිලාභියානි සංයොජනානි පහීණානි? අරහතො. ඉමස්ස ඛො භික්ඛවෙ පුග්ගලස්ස ඔරම්භාගියානි සංයොජනානි පහීණානි. උප්පත්තිපටිලාභියානි සංයොජනානි පහීණානි. භවපටිලාභියානි සංයොජනානි පහීණානි.

ඉමෙ ඛො භික්ඛවෙ චත්තාරො පුග්ගලා සන්තො සංවිජ්ජමානා ලොකස්මින්ති.

### 4 3 4 2.

### [ පටිභානපුග්ගලසුත්තං ]

32. චත්තාරොමෙ භික්ඛවෙ පුග්ගලා සන්තො සංවිජ්ජමානා ලොකස්මිං. කතමෙ චත්තාරො?

යුත්තපටිභානො[1] න මුත්තපටිභානො, මුත්තපටිභානො න යුත්තපටිභානො, යුත්තපටිභානො ච මුත්තපටිභානො ච, නෙව යුත්තපටිභානො නෙව මුත්තපටිභානො.

ඉමෙ ඛො භික්ඛවෙ චත්තාරො පුග්ගලා සන්තො සංවිජ්ජමානා ලොකස්මින්ති.

### 4. 3. 4. 3.

### [ නෙය්‍යපුග්ගලසුත්තං ]

33. චත්තාරොමෙ භික්ඛවෙ පුග්ගලා සන්තො සංවිජ්ජමානා ලොකස්මිං. කතමෙ චත්තාරො?

උග්ඝටිතඤ්ඤු, විපඤ්චිතඤ්ඤු, නෙය්‍යො, පදපරමො.

ඉමෙ ඛො භික්ඛවෙ චත්තාරො පුග්ගලා සන්තො සංවිජ්ජමානා ලොකස්මින්ති.

### 4. 3. 4. 4.

### [ ඵලූපජීවිපුග්ගලසුත්තං ]

34. චත්තාරොමෙ භික්ඛවෙ පුග්ගලා සන්තො සංවිජ්ජමානා ලොකස්මිං. කතමෙ චත්තාරො?

උට්ඨානඵලූපජීවී[2] න කම්මඵලූපජීවී, කම්මඵලූපජීවී න උට්ඨානඵලූපජීවී, උට්ඨානඵලූපජීවී ච කම්මඵලූපජීවී ච, නෙවුට්ඨානඵලූපජීවී නෙව කම්මඵලූපජීවී.

ඉමෙ ඛො භික්ඛවෙ චත්තාරො පුග්ගලා සන්තො සංවිජ්ජමානා ලොකස්මින්ති.

---
1 යුත්තපටිභානො න මුත්තපටිභානො - මජසං  2 උට්ඨානඵලූපජීවී චෙව - මජසං

මහණෙනි, කවර පුද්ගලයකුට ඔරම්භාගීය සංයෝජනයෝ ප්‍රහීණ වෙත් ද, අනන්තරෙතපපත්තිප්‍රතිලාභයට හෙතු වූ සංයෝජනයෝ ප්‍රහීණ වෙත් ද, උපපත්තිභවප්‍රතිලාභයට හෙතු වූ සංයෝජනයෝ ප්‍රහීණ වෙත් ද? අහීත්හට ය. මහණෙනි, අහීත් පුද්ගලයාහට ඔරම්භාගීය සංයෝජනයෝ ප්‍රහීණ වෙත්. අනන්තරෙතපපත්තිප්‍රතිලාභයට හේතු වූ සංයෝජනයෝ ප්‍රහීණ වෙත්. උපපත්තිභවප්‍රතිලාභයට හේතු වූ සංයෝජනයෝ ප්‍රහීණ වෙත්.

මහණෙනි, ලෝකයෙහි මේ සතර පුද්ගලයෝ විද්‍යමානයහ.

## 4. 3. 4. 2.

## [ පටිභානපුග්ගල සුත්‍රය ]

32. මහණෙනි, ලෝකයෙහි මේ පුද්ගලයෝ සතර දෙනෙක් විද්‍යමානයහ. කවර සතර දෙනෙක යත්:

අර්ථයුක්තප්‍රතිභාන (වැටහීම්) ඇත්තේ, වහා අවුල් මුදා බණන ප්‍රතිභාන නැත්තේ ය. අවුල් මුදා බණන ප්‍රතිභාන ඇත්තේ, අර්ථයුක්ත ප්‍රතිභාන නැත්තේ ය. අවුල් මුදා බණන ප්‍රතිභාන ද ඇත්තේ, අර්ථ යුක්ත ප්‍රතිභාන ද ඇත්තේ ය. අර්ථයුක්ත ප්‍රතිභාන නැත්තේ අවුල් මුදා බණන ප්‍රතිභාන ද නැත්තේ ය.

මහණෙනි, ලෝකයෙහි මේ සතර පුද්ගලයෝ විද්‍යමානයහ

## 4. 3. 4. 3

## [නෙය්‍යපුග්ගල සුත්‍රය]

33. මහණෙනි, ලෝකයෙහි මේ පුද්ගලයෝ සතර දෙනෙක් විද්‍යමානයහ, කවර සතර දෙනෙක යත්:

උද්ඝටිතඥ ය, විපඤ්චිතඥ ය. නෙය්‍ය ය, පදපරම යි.

මහණෙනි, ලොකයෙහි මේ පුද්ගලයෝ සතර දෙන විද්‍යමානයහ.

## 4. 3. 4. 4

## [ උට්ඨානඵලූපජීවීපුග්ගල සුත්‍රය]

34. මහණෙනි, ලෝකයෙහි මේ පුද්ගලයෝ සතර දෙනෙක් විද්‍යමානයහ කවර සතර දෙනෙක යත්?

උට්ඨානවීර්‍ය්‍යඵලයෙන් ජීවත් වනසුලු කර්මඵලයෙන් ජීවත් නොවනසුලු පුද්ගල ය, කර්මඵලයෙන් ජීවත් වනසුලු උට්ඨානවීර්‍ය්‍යඵලයෙන් ජීවත් නොවනසුලු පුද්ගල ය, උට්ඨානවීර්‍ය්‍යඵලයෙනුදු ජීවත් වනසුලු කර්මඵලයෙනුදු ජීවත් වනසුලු පුද්ගල ය, උට්ඨානවීර්‍ය්‍යඵලයෙන් ජීවත් නො වනසුලු කර්මඵලයෙනුදු ජීවත් නොවනසුලු පුද්ගල යි.

මහණෙනි, ලෝකයෙහි මේ පුද්ගලයෝ සතර දෙන විද්‍යමානයහ.

## 4. 3. 4. 5.

## [ වජ්ජපුග්ගලසුත්තං ]

35. චත්තාරොමෙ භික්ඛවෙ පුග්ගලා සන්තො සංවිජ්ජමානා ලොකස්මිං. කතමෙ චත්තාරො?

සාවජ්ජො, වජ්ජබහුලො, අප්පවජ්ජො, අනවජ්ජො.

කථඤ්ච භික්ඛවෙ පුග්ගලො සාවජ්ජො හොති? ඉධ භික්ඛවෙ එකච්චො පුග්ගලො සාවජ්ජෙන කායකම්මෙන සමන්නාගතො හොති, සාවජ්ජෙන වචීකම්මෙන සමන්නාගතො හොති, සාවජ්ජෙන මනොකම්මෙන සමන්නාගතො හොති. එවං ඛො භික්ඛවෙ පුග්ගලො සාවජ්ජො හොති.

කථඤ්ච භික්ඛවෙ පුග්ගලො වජ්ජබහුලො හොති? ඉධ භික්ඛවෙ එකච්චො පුග්ගලො සාවජ්ජෙන බහුලං කායකම්මෙන සමන්නාගතො හොති, අප්පං අනවජ්ජෙන. සාවජ්ජෙන බහුලං වචීකම්මෙන සමන්නාගතො හොති, අප්පං අනවජ්ජෙන. සාවජ්ජෙන බහුලං මනොකම්මෙන සමන්නාගතො හොති, අප්පං අනවජ්ජෙන. එවං ඛො භික්ඛවෙ පුග්ගලො වජ්ජබහුලො හොති.

කථඤ්ච භික්ඛවෙ පුග්ගලො අප්පවජ්ජො හොති? ඉධ භික්ඛවෙ එකච්චො පුග්ගලො අනවජ්ජෙන බහුලං කායකම්මෙන සමන්නාගතො හොති, අප්පං සාවජ්ජෙන. අනවජ්ජෙන බහුලං වචීකම්මෙන සමන්නාගතො හොති, අප්පං සාවජ්ජෙන. අනවජ්ජෙන බහුලං මනොකම්මෙන සමන්නාගතො හොති, අප්පං සාවජ්ජෙන. එවං ඛො භික්ඛවෙ පුග්ගලො අප්පවජ්ජො හොති.

කථඤ්ච භික්ඛවෙ පුග්ගලො අනවජ්ජො හොති? ඉධ භික්ඛවෙ එකච්චො පුග්ගලො අනවජ්ජෙන කායකම්මෙන සමන්නාගතො හොති, අනවජ්ජෙන වචීකම්මෙන සමන්නාගතො හොති, අනවජ්ජෙන මනොකම්මෙන සමන්නාගතො හොති. එවං ඛො භික්ඛවෙ පුග්ගලො අනවජ්ජො හොති.

ඉමෙ ඛො භික්ඛවෙ චත්තාරො පුග්ගලා සන්තො සංවිජ්ජමානා ලොකස්මින්ති.

## 4 3 4 6

## [ පරිපූරකාරීපුග්ගලසුත්තං ]

36. චත්තාරොමෙ භික්ඛවෙ පුග්ගලා සන්තො සංවිජ්ජමානා ලොකස්මිං. කතමෙ චත්තාරො?

ඉධ භික්ඛවෙ එකච්චො පුග්ගලො සීලෙසු න පරිපූරකාරී හොති, සමාධිස්මිං න පරිපූරකාරී, පඤ්ඤාය න පරිපූරකාරී. ඉධ පන භික්ඛවෙ එකච්චො පුග්ගලො සීලෙසු පරිපූරකාරී හොති, සමාධිස්මිං න පරිපූරකාරී, පඤ්ඤාය න පරිපූරකාරී. ඉධ පන භික්ඛවෙ එකච්චො පුග්ගලො සීලෙසු පරිපූරකාරී හොති, සමාධිස්මිං පරිපූරකාරී, පඤ්ඤාය න පරිපූරකාරී. ඉධ පන භික්ඛවෙ එකච්චො පුග්ගලො සීලෙසු පරිපූරකාරී හොති, සමාධිස්මිං පරිපූරකාරී, පඤ්ඤාය පරිපූරකාරී.

ඉමෙ ඛො භික්ඛවෙ චත්තාරො පුග්ගලා සන්තො සංවිජ්ජමානා ලොකස්මින්ති.

4. 3. 4. 5.

## [ වජ්ජපුග්ගල සූත්‍රය ]

35. මහණෙනි, ලෝකයෙහි මේ පුද්ගලයෝ සතර දෙනෙක් විද්‍යමානයහ. කවර සතර දෙනෙක යත්:

සාවද්‍යය, වද්‍යබහුලය, අල්පවද්‍යය, අනවද්‍ය යි.

මහණෙනි, කෙසේ පුද්ගල සාවද්‍ය වේ ද? මහණෙනි, මෙලොව ඇතැම් පුද්ගලයෙක් සාවද්‍ය කායකර්මයෙන් සමන්නාගත වෙයි. සාවද්‍ය වාක්කර්මයෙන් සමන්නාගත වෙයි. සාවද්‍ය මනඃකර්මයෙන් සමන්නාගත වෙයි මහණෙනි, මෙසේ පුද්ගල සාවද්‍ය වෙයි.

මහණෙනි, කෙසේ පුද්ගල වද්‍යබහුල වේ ද? මහණෙනි, මෙලොව ඇතැම් පුද්ගලයෙක් බොහෝසෙයින් සාවද්‍ය කායකර්මයෙන් සමන්නාගත වෙයි, අනවද්‍ය කායකර්මයෙන් අල්ප කොට ය බොහෝසෙයින් සාවද්‍ය වාක්කර්මයෙන් සමන්නාගත වෙයි, අනවද්‍යවාක්කර්මයෙන් අල්ප කොට ය. බොහෝසූයෙන් සාවද්‍ය මනඃකර්මයෙන් සමන්නාගත වෙයි, අනවද්‍ය මනඃකර්මයෙන් අල්පකොට ය. මහණෙනි, මෙසේ පුද්ගල වද්‍යබහුල වෙයි.

මහණෙනි, කෙසේ පුද්ගල අල්පවද්‍ය වේ ද? මහණෙනි, මෙලොව ඇතැම් පුද්ගලයෙක් අනවද්‍ය කායකර්මයෙන් බහුලකොට සමන්නාගත වෙයි. සාවද්‍ය කායකර්මයෙන් අල්ප කොට ය. අනවද්‍ය වාක්කර්මයෙන් බහුල කොට සමන්නාගත වෙයි. සාවද්‍ය වාක්කර්මයෙන් අල්ප කොට ය. අනවද්‍ය මනඃකර්ම-යෙන් බහුල කොට සමන්නාගත වෙයි. සාවද්‍ය මනඃකර්මයෙන් අල්ප කොට ය. මහණෙනි, මෙසේ පුද්ගල අල්පවද්‍ය වෙයි.

මහණෙනි, කෙසේ පුද්ගල අනවද්‍ය වේ ද? මහණෙනි, මෙලොව ඇතැම් පුද්ගලයෙක් අනවද්‍ය කායකර්මයෙන් සමන්නාගත වෙයි. අනවද්‍ය වාක්කර්මයෙන් සමන්නාගත වෙයි. අනවද්‍ය මනඃකර්මයෙන් සමන්නාගත වෙයි. මහණෙනි, මෙසේ පුද්ගල අනවද්‍ය වේ.

මහණෙනි, මේ සතර පුද්ගලයෝ ලෝකයෙහි විද්‍යමානයහ.

4. 3. 4. 6.

## [ පරිපූරකාරීපුග්ගල සූත්‍රය ]

36 මහණෙනි, ලෝකයෙහි මේ පුද්ගලයෝ සතර දෙනෙක් විද්‍යමානයහ. කවර සතර දෙනෙක යත්?

මහණෙනි, මෙලොව ඇතැම් පුද්ගලයෙක් ශීලයෙහි පරිපූරකාරී නො වේ. සමාධියෙහි පරිපූරකාරී නො වේ. ප්‍රඥයෙහි පරිපූරකාරී නො වේ. මහණෙනි, මෙලොව ඇතැම් පුද්ගලයෙක් ශීලයෙහි පරිපූරකාරී වේ. සමාධියෙහි පරිපූරකාරී නො වේ. ප්‍රඥයෙහි පරිපූරකාරී නො වේ. මහණෙනි, මෙලොව ඇතැම් පුද්ගලයෙක් ශීලයෙහි පරිපූරකාරී වේ. සමාධියෙහි පරිපූරකාරී වේ. ප්‍රඥයෙහි පරිපූරකාරී නො වේ. මහණෙනි, මෙලොව ඇතැම් පුද්ගලයෙක් ශීලයෙහි පරිපූරකාරී වේ. සමාධියෙහි පරිපූරකාරී වේ. ප්‍රඥයෙහි පරිපූර-කාරී වේ

මහණෙනි, මේ සතර පුද්ගලයෝ ලෝකයෙහි විද්‍යමානයහ.

## 4. 3. 4. 7

### [ ගරුපුග්ගලසුත්තං ]

37. චත්තාරොමෙ භික්ඛවෙ පුග්ගලා සන්තො සංවිජ්ජමානා ලොකස්මිං. කතමෙ චත්තාරො?

ඉධ භික්ඛවෙ එකච්චො පුග්ගලො න සීලගරු හොති න සීලාධිපතෙය්‍යො. න සමාධිගරු හොති න සමාධාධිපතෙය්‍යො. න පඤ්ඤාගරු හොති න පඤ්ඤාධිපතෙය්‍යො.

ඉධ පන භික්ඛවෙ එකච්චො පුග්ගලො සීලගරු හොති සීලාධිපතෙය්‍යො. න සමාධිගරු හොති න සමාධාධිපතෙය්‍යො. න පඤ්ඤාගරු හොති න පඤ්ඤාධිපතෙය්‍යො.

ඉධ පන භික්ඛවෙ එකච්චො පුග්ගලො සීලගරු හොති සීලාධිපතෙය්‍යො. සමාධිගරු හොති සමාධාධිපතෙය්‍යො න පඤ්ඤාගරු හොති න පඤ්ඤාධිපතෙය්‍යො.

ඉධ පන භික්ඛවෙ එකච්චො පුග්ගලො සීලගරු හොති සීලාධිපතෙය්‍යො. සමාධිගරු හොති සමාධාධිපතෙය්‍යො. පඤ්ඤාගරු හොති පඤ්ඤාධිපතෙය්‍යො.

ඉමෙ ඛො භික්ඛවෙ චත්තාරො පුග්ගලා සන්තො සංවිජ්ජමානා ලොකස්මින්ති.

## 4. 3. 4. 8

### [ නිකට්ඨපුග්ගලසුත්තං ]

38. චත්තාරොමෙ භික්ඛවෙ පුග්ගලා සන්තො සංවිජ්ජමානා ලොකස්මිං. කතමෙ චත්තාරො?

නිකට්ඨකායො අනිකට්ඨචිත්තො. අනිකට්ඨකායො නිකට්ඨචිත්තො. අනිකට්ඨකායො ච අනිකට්ඨචිත්තො ච. නිකට්ඨකායො ච නිකට්ඨචිත්තො ච.

කථඤ්ච භික්ඛවෙ පුග්ගලො නිකට්ඨකායො හොති අනිකට්ඨචිත්තො? ඉධ භික්ඛවෙ එකච්චො පුග්ගලො අරඤ්ඤෙ වනපත්ථානි[1] පන්තානි සෙනාසනානි පටිසෙවති. සො තත්ථ කාමවිතක්කම්පි විතක්කෙති, ව්‍යාපාද-විතක්කම්පි විතක්කෙති, විහිංසාවිතක්කම්පි විතක්කෙති. එවං ඛො භික්ඛවෙ පුග්ගලො නිකට්ඨකායො හොති අනිකට්ඨචිත්තො.

කථඤ්ච භික්ඛවෙ පුග්ගලො අනිකට්ඨකායො හොති නිකට්ඨචිත්තො: ඉධ භික්ඛවෙ එකච්චො පුග්ගලො න හෙව ඛො අරඤ්ඤෙ වනපත්ථානි පන්තානි සෙනාසනානි පටිසෙවති. සො තත්ථ නෙක්ඛම්මවිතක්කම්පි විතක්කෙති, අබ්‍යාපාදවිතක්කම්පි විතක්කෙති, අවිහිංසාවිතක්කම්පි විතක්කෙති. එවං ඛො භික්ඛවෙ පුග්ගලො අනිකට්ඨකායො හොති නිකට්ඨචිත්තො.

---

1 අරඤ්ඤවනපත්ථානි, මජසං.

## 4. 3. 4. 7.

## [ ගරුපුග්ගල සූත්‍රය ]

37. මහණෙනි, මේ පුද්ගලයෝ සතර දෙනෙක් ලෝකයෙහි විද්‍යමානයහ කවර සතර දෙනෙක යත්:

මහණෙනි, මෙලොව ඇතැම් පුද්ගලයෙක් ශීලගරුක නො වේ, ශීලය අධිපති කොට ඇත්තේ ද නො වේ. සමාධිගරුක නො වේ, සමාධිය අධිපති කොට ඇත්තේ ද නො වේ. ප්‍රඥගරුක නො වේ, ප්‍රඥව අධිපති කොට ඇත්තේ ද නො වේ.

මහණෙනි, මෙලොව ඇතැම් පුද්ගලයෙක් ශීලගරුක වේ, ශීලය අධිපති කොට ඇත්තේ ද වේ. සමාධිගරුක නො වේ, සමාධිය අධිපති කොට ඇත්තේ ද නො වේ. ප්‍රඥගරුක නො වේ, ප්‍රඥව අධිපති කොට ඇත්තේ ද නො වේ.

මහණෙනි, මෙලොව ඇතැම් පුද්ගලයෙක් ශීලගරුක වේ, ශීලය අධිපති කොට ඇත්තේ වේ සමාධිගරුක වේ, සමාධිය අධිපති කොට ඇත්තේ ද වේ. ප්‍රඥගරුක නො වේ, ප්‍රඥව අධිපති කොට ඇත්තේ ද නො වේ

මහණෙනි, මෙලොව ඇතැම් පුද්ගලයෙක් ශීලගරුක වේ, ශීලය අධිපති කොට ඇත්තේ වේ. සමාධිගරුක වේ, සමාධිය අධිපති කොට ඇත්තේ වේ. ප්‍රඥගරුක වේ, ප්‍රඥව අධිපති කොට ඇත්තේ වේ.

මහණෙනි, මේ පුද්ගලයෝ සතර දෙනෙක් ලෝකයෙහි විද්‍යමානයහ.

## 4. 3. 4. 8.

## [ නිකට්ඨපුග්ගල සූත්‍රය ]

38. මහණෙනි, මේ පුද්ගලයෝ සතර දෙනෙක් ලෝකයෙහි විද්‍යමානයහ. කවර සතර දෙනෙක යත්:

(වෙනෙන්) ඇද ගත් කය ඇත්තේ (වනයට) වැද ගත් සිත් ඇත්තේ ය. වැද ගත් කය ඇත්තේ ඇද ගත් සිත් ඇත්තේ ය. වැද ගත් කය ඇත්තේ වැද ගත් සිත් ද ඇත්තේ ය ඇද ගත් කය ඇත්තේ ඇද ගත් සිත් ද ඇත්තේ ය.

මහණෙනි, කෙසේ පුද්ගල ඇද ගත් කය ඇත්තේ වැද ගත් සිත් ඇත්තේ වේ ද? මහණෙනි, මෙලොව ඇතැම් පුද්ගලයෙක් අරණ්‍ය සෙනසුන් ද, වනප්‍රස්ථයන් ද, ගැඹුරු වල් සෙනසුන් ද, සෙවුනේ ය. හේ එහි ලා කාමවිතර්කය ද විතර්කණය කෙරේ. ව්‍යාපාදවිතර්කය ද විතර්කණය කෙරේ. විහිංසාවිතර්කය ද විතර්කණය කෙරේ. මහණෙනි, මෙසේ පුද්ගල ඇදගත්, කය ඇත්තේ වැද ගත් සිත් ඇත්තේ වේ

මහණෙනි, කෙසේ පුද්ගල වැද ගත් කය ඇත්තේ ඇද ගත් සිත් ඇත්තේ වේ ද ? මහණෙනි, මෙලොව ඇතැම් පුද්ගලයෙක් අරණ්‍යයන් ද, වනප්‍රස්ථයන් ද, ගැඹුරු වල් සෙනසුන් ද නො ම සෙවුනේ ය හේ එහි නෙක්ඛම්ම විතර්කය ද, විතර්කණය කෙරෙයි, අව්‍යාපාද විතර්කය ද විතර්කණය කෙරෙයි, අවිහිංසා විතර්කය ද විතර්කණය කෙරෙයි. මහණෙනි, මෙසේ පුද්ගල වැද ගත් කය ඇත්තේ ඇද ගත් සිත් ඇත්තේ වෙයි.

කථඤ්ච භික්ඛවෙ පුග්ගලො අනිකට්ඨකායො ච හොති අනිකට්ඨචිත්තො ච? ඉධ භික්ඛවෙ එකච්චො පුග්ගලො න හෙව ඛො අරඤ්ඤෙ වනපත්ථානි[1] පන්තානි සෙනාසනානි පටිසෙවති. සො තත්ථ කාමවිතක්කම්පි විතක්කෙති, බ්‍යාපාදවිතක්කම්පි විතක්කෙති, විහිංසාවිතක්කම්පි විතක්කෙති. එවං ඛො භික්ඛවෙ පුග්ගලො අනිකට්ඨකායො ච හොති අනිකට්ඨචිත්තො ච.

කථඤ්ච භික්ඛවෙ පුග්ගලො නිකට්ඨකායො ච හොති නිකට්ඨචිත්තො ච? ඉධ භික්ඛවෙ එකච්චො පුග්ගලො අරඤ්ඤෙ වනපත්ථානි පන්තානි සෙනාසනානි පටිසෙවති. සො තත්ථ නෙක්ඛම්මවිතක්කම්පි විතක්කෙති, අබ්‍යාපාදවිතක්කම්පි විතක්කෙති, අවිහිංසාවිතක්කම්පි විතක්කෙති. එවං ඛො භික්ඛවෙ පුග්ගලො නිකට්ඨකායො ච හොති නිකට්ඨචිත්තො ච.

ඉමෙ ඛො භික්ඛවෙ චත්තාරො පුග්ගලා සන්තො සංවිජ්ජමානා ලොකස්මින්ති.

4. 3. 4, 9.

[ ධම්මකථිකසුත්තං ]

39. චත්තාරොමෙ භික්ඛවෙ ධම්මකථිකා. කතමෙ චත්තාරො?

ඉධ භික්ඛවෙ එකච්චො ධම්මකථිකො අප්පං ච භාසති අසහිතඤ්ච, පරිසා ච[2] න කුසලා හොති සහිතාසහිතස්ස. එවරූපො භික්ඛවෙ ධම්මකථිකො එවරූපාය පරිසාය ධම්මකථිකොත්වෙව සඞ්ඛං ගච්ඡති.

ඉධ පන භික්ඛවෙ එකච්චො ධම්මකථිකො අප්පඤ්ච භාසති සහිතඤ්ච, පරිසා ච කුසලා හොති සහිතාසහිතස්ස. එවරූපො භික්ඛවෙ ධම්මකථිකො එවරූපාය පරිසාය ධම්මකථිකොත්වෙව සඞ්ඛං ගච්ඡති.

ඉධ පන භික්ඛවෙ එකච්චො ධම්මකථිකො බහුඤ්ච භාසති අසහිතඤ්ච, පරිසා ච න කුසලා හොති සහිතාසහිතස්ස. එවරූපො භික්ඛවෙ ධම්මකථිකො එවරූපාය පරිසාය ධම්මකථිකොත්වෙව සඞ්ඛං ගච්ඡති.

ඉධ පන භික්ඛවෙ එකච්චො ධම්මකථිකො බහුඤ්ච භාසති සහිතඤ්ච, පරිසා ච[2] කුසලා හොති සහිතාසහිතස්ස එවරූපො භික්ඛවෙ ධම්මකථිකො එවරූපාය පරිසාය ධම්මකථිකොත්වෙව සඞ්ඛං ගච්ඡති.

ඉමෙ ඛො භික්ඛවෙ චත්තාරො ධම්මකථිකාති.

1 අරඤ්ඤවනපත්ථානි - මජසං. 2 පරිසාචස්ස - මජසං.

Free Distribution www.aathaapi.org

මහණෙනි, කෙසේ පුද්ගල වැද ගත් කය ඇත්තේ වැද ගත් සිත් ද ඇත්තේ වේ ද? මහණෙනි, මෙලොව ඇතැම් පුද්ගලයෙක් අරණ්‍යයන් ද වනප්‍රස්ථයන් ද, ගැඹුරු වන සෙනසුන් ද නොම සෙවුනේ ය. හේ එහි කාමවිතර්කය ද විතර්කණය කෙරෙයි. ව්‍යාපාදවිතර්කය ද විතර්කණය කෙරෙයි. විහිංසාවිතර්කය ද විතර්කණය කෙරෙයි. මහණෙනි, මෙසේ පුද්ගල වැද ගත් කය ඇත්තේ වැද ගත් සිත් ද ඇත්තේ ය.

මහණෙනි, කෙසේ පුද්ගල ඇද ගත් කය ඇත්තේ ඇද ගත් සිත් ඇත්තේ වේ ද? මහණෙනි, මෙලොව ඇතැම් පුද්ගලයෙක් අරණ්‍යයන් ද වනප්‍රස්ථයන් ද ගැඹුරු වන සෙනසුන් ද සෙවුනේ ය. හේ එහි නෙක්ඛම්මවිතර්කය ද විතර්කණය කෙරේ. අව්‍යාපාදවිතර්කය ද විතර්කණය කෙරේ. අවිහිංසාවිතර්කය ද විතර්කණය කෙරේ. මහණෙනි, මෙසේ පුද්ගල ඇද ගත් කය ඇත්තේ ඇද ගත් සිත් ඇත්තේ ද වෙයි.

මහණෙනි, මේ පුද්ගලයෝ සතර දෙන ලෝකයෙහි විද්‍යමානයහ.

## 4. 3. 4. 9.

## [ ධම්මකථික සූත්‍රය ]

39. මහණෙනි. මේ ධර්මකථිකයෝ සතර දෙනෙකි. කවර සතර දෙනෙක යත්:

මහණෙනි, මෙලොව ඇතැම් ධර්මකථිකයෙක් අල්ප කොට ද අර්ථයෙන් අසංයුක්ත කොට ද බෙණේ. පිරිස ද අර්ථනිඃශ්‍රිත වූ හෝ අනිඃශ්‍රිත වූ හෝ බසට අදක්‍ෂ වේ. මහණෙනි, මෙබඳු ධර්මකථික මෙබඳු අදක්‍ෂ පිරිසෙහි "ධර්මකථිකයෙක් ම ය"යි ගණනට යේ.

මහණෙනි, මෙලොව ඇතැම් ධර්මකථිකයෙක් අල්ප කොට ද අර්ථ සංයුක්ත කොට ද බෙණේ. පිරිස ද අර්ථනිඃශ්‍රිත වූ හෝ අනිඃශ්‍රිත වූ බසට දක්‍ෂ වේ. මහණෙනි, මෙබඳු ධර්මකථික මෙබඳු දක්‍ෂපිරිසෙහි "ධර්මකථිකයෙක් ම ය" යි ගණනට යේ.

මහණෙනි, මෙලොව ඇතැම් ධර්මකථිකයෙක් බොහෝ කොට ද අර්ථයෙන් අසංයුක්ත කොට ද බෙණේ. පිරිස ද අර්ථනිඃශ්‍රිත වූ හෝ අනිඃශ්‍රිත වූ බසට දක්‍ෂ නො වේ. මහණෙනි, මෙබඳු ධර්මකථික මෙබඳු අදක්‍ෂ පිරිසෙහි 'ධර්මකථිකයෙක් ම ය' යි ගණනට යේ.

මහණෙනි, මෙලොව ඇතැම් ධර්මකථිකයෙක් බොහෝ කොට ද අර්ථ සංයුක්ත කොට ද බෙණේ. පිරිස ද අර්ථනිඃශ්‍රිත වූ හෝ අනිඃශ්‍රිත වූ බසට දක්‍ෂ වේ. මහණෙනි, මෙබඳු ධර්මකථික මෙබඳු දක්‍ෂ පිරිසෙහි "ධර්මකථිකයෙක් ම ය" යි ගණනට යේ.

මහණෙනි, මේ සතර ධර්මකථිකයෝ යි.

4. 3. 4. 10.

[ වාදීසුත්තං ]

40. චත්තාරොමෙ භික්ඛවෙ වාදී. කතමෙ චත්තාරො?

අත්ථි භික්ඛවෙ වාදී අත්ථතො පරියාදානං ගච්ඡති නො ව්‍යඤ්ජනතො. අත්ථි භික්ඛවෙ වාදී ව්‍යඤ්ජනතො පරියාදානං ගච්ඡති නො අත්ථතො. අත්ථි භික්ඛවෙ වාදී අත්ථතො ච ව්‍යඤ්ජනතො ච පරියාදානං ගච්ඡති. අත්ථි භික්ඛවෙ වාදී නෙවත්ථතො නො බ්‍යඤ්ජනතො පරියාදානං ගච්ඡති

ඉමෙ ඛො භික්ඛවෙ චත්තාරො වාදී. අට්ඨානමෙතං භික්ඛවෙ අනවකාසො, යං චතූහි පටිසම්භිදාහි සමන්නාගතො භික්ඛු අත්ථතො ච ව්‍යඤ්ජනතො ච පරියාදානං ගච්ඡෙය්‍යාති.

පුග්ගලවග්ගො චතුත්ථො. *

## 5. ආභාවග්ගො

4. 3. 5. 1.

[ ආභාසුත්තං ]

[සාවත්ථිනිදානං]

41. චතස්සො ඉමා භික්ඛවෙ ආභා. කතමා චතස්සො?

චන්දාභා, සූරියාභා, අග්ගාභා, පඤ්ඤාභා.

ඉමා ඛො භික්ඛවෙ චතස්සො ආභා. එතදග්ගං භික්ඛවෙ ඉමාසං චතස්සන්නං ආභානං යදිදං පඤ්ඤාභාති.

4. 3. 5. 2.

[ පභාසුත්තං ]

42. චතස්සො ඉමා භික්ඛවෙ පභා. කතමා චතස්සො?

චන්දප්පභා, සූරියප්පභා, අග්ගිප්පභා, පඤ්ඤාප්පභා.

ඉමා ඛො භික්ඛවෙ චතස්සො පභා. එතදග්ගං භික්ඛවෙ ඉමාසං චතස්සන්නං පභානං යදිදං පඤ්ඤාප්පභාති

තස්සුද්දානං: සංයොජනං පටිභානො - උග්ඝටිතඤ්ඤු උට්ඨානං
සාවජ්ජො ද්වෙ ච සීලානි - නිකට්ඨ ධම්මවාදී චාති - මජ්ඣං.

4. 3. 4. 10.

[ වාදී සූත්‍රය ]

40. මහණෙනි, මේ වාදීහු සතර දෙනෙකි. කවර සතර දෙනෙක යත්?

මහණෙනි, අර්ථ විසින් අවසන් කොට ගැණුම්වට යන ව්‍යඤ්ජන විසින් නොයන වාදී කෙනෙක් ඇත. මහණෙනි, ව්‍යඤ්ජන විසින් පරික්‍ෂයට යන අර්ථ විසින් නොයන වාදී කෙනෙක් ඇත. මහණෙනි, අර්ථ විසිනුදු ව්‍යඤ්ජන විසිනුදු පරික්‍ෂයට යන වාදී කෙනෙක් ඇත. මහණෙනි, අර්ථ විසිනුදු ව්‍යඤ්ජන විසිනුදු පරික්‍ෂයට නොයන වාදී කෙනෙක් ඇත.

මහණෙනි, මේ වාදීහු සතර දෙන යැ. මහණෙනි, සිවුපිළිසැඹියාවෙන් සමන්‍වාගත මහණ අර්ථ විසිනුත් ව්‍යඤ්ජන විසිනුත් පරික්‍ෂයට යේ ය යන තෙල වත්කට අකාරණ ය, අනවකාශ ය. (නො යත්තේ ම ය.)

පුද්ගලවර්ගය සිවුවැනි යි.

## 5. ආභා වර්ගය.

4. 3. 5. 1.

[ ආභා සූත්‍රය ]

(සැවැත්නිදානයි)

41. මහණෙනි, මේ ආභාවෝ (විහිදෙන රශ්මිහු) සතර දෙනෙකි. කවර සතර දෙනෙක යත්:

චන්‍ද්‍රාභා ය, සූර්‍ය්‍යාභා ය, අග්න්‍යාභා ය, ප්‍රඥාභා යි.

මහණෙනි, මේ ආභාවෝ සතර දෙන වෙති. මහණෙනි, මේ සතර ආභාවන් කෙරෙහි ප්‍රඥාභායෙක් ඇද්ද, තෙල අග්‍ර යි.

4. 3. 5. 2.

[ පභා සූත්‍රය ]

42. මහණෙනි, මේ ප්‍රභාවෝ (දීප්ත රශ්මිහු) සතර දෙනෙකි. කවර සතර දෙනෙක යත්:

චන්‍ද්‍රප්‍රභා ය, සූර්‍ය්‍යප්‍රභා ය, අග්නිප්‍රභා ය, ප්‍රඥාප්‍රභා යි.

මහණෙනි, මේ ප්‍රභාවෝ සතර දෙන වෙති. මහණෙනි, මේ සතර ප්‍රභාවන් කෙරෙහි ප්‍රඥාප්‍රභායෙක් ඇද්ද, තෙල අග්‍ර යි.

4. 3. 5. 3.

[ ආලොකසුත්තං ]

43. චත්තාරොමෙ භික්ඛවෙ ආලොකා. කතමෙ චත්තාරො

චන්දාලොකො, සුරියාලොකො, අග්ගාලොකො, පඤ්ඤාලොකො.

ඉමෙ ඛො භික්ඛවෙ චත්තාරො ආලොකා. එතදග්ගං භික්ඛවෙ ඉමෙසං චතුන්නං ආලොකානං යදිදං පඤ්ඤාලොකොති

4. 3. 5. 4.

[ ඔභාසසුත්තං ]

44. චත්තාරොමෙ භික්ඛවෙ ඔභාසා. කතමෙ චත්තාරො?

චන්දොභාසො, සුරියොභාසො, අග්ගොභාසො, පඤ්ඤොභාසො.

ඉමෙ ඛො භික්ඛවෙ චත්තාරො ඔභාසා. එතදග්ගං භික්ඛවෙ ඉමෙසං චතුන්නං ඔභාසානං යදිදං පඤ්ඤොභාසොති.

4. 3. 5. 5.

[ පජ්ජොතසුත්තං ]

45. චත්තාරොමෙ භික්ඛවෙ පජ්ජොතා. කතමෙ චත්තාරො?

චන්දපජ්ජොතො, සුරියපජ්ජොතො, අග්ගිපජ්ජොතො, පඤ්ඤා-පජ්ජොතො

ඉමෙ ඛො භික්ඛවෙ චත්තාරො පජ්ජොතා. එතදග්ගං භික්ඛවෙ ඉමෙසං චතුන්නං පජ්ජොතානං යදිදං පඤ්ඤාපජ්ජොතොති.

4. 3. 5. 6.

[ කාලසුත්තං ]

46. චත්තාරොමෙ භික්ඛවෙ කාලා. කතමෙ චත්තාරො?

කාලෙන ධම්මස්සවණං, කාලෙන ධම්මසාකච්ඡා, කාලෙන සමථො, කාලෙන විපස්සනා.

ඉමෙ ඛො භික්ඛවෙ චත්තාරො කාලාති.

## 4. 3. 5. 3.

### [ ආලොක සූත්‍රය ]

43. මහණෙනි, මේ ආලොකයෝ සතර දෙනෙකි. කවර සතර දෙනෙක යත්:

චන්ද්‍රාලොක ය, සූර්‍ය්‍යාලොක ය, අග්න්‍යාලොක ය, ප්‍රඥාලොක යි. මහණෙනි, මේ ආලොකයෝ සතර දෙන වෙති. මහණෙනි, මේ සතර ආලොකයන් කෙරෙහි ප්‍රඥාලොකයෙක් ඇද්ද, තෙල අග්‍ර යි.

## 4. 3. 5. 4.

### [ ඕභාස සූත්‍රය ]

44. මහණෙනි, මේ අවභාසයෝ (බබලන්නෝ) සතර දෙනෙකි. කවර සතර දෙනෙක යත්:

චන්ද්‍රාවභාස ය, සූර්‍ය්‍යාවභාස ය, අග්න්‍යවභාස ය, ප්‍රඥාවභාස යි.

මහණෙනි, මේ අවභාසයෝ සතර දෙන වෙති. මහණෙනි, මේ සතර අවභාසයන් කෙරෙහි ප්‍රඥාවභාසයෙක් ඇද්ද, තෙල අග්‍ර යි.

## 4. 3. 5. 5.

### [ පජ්ජොත සූත්‍රය ]

45. මහණෙනි, මේ ප්‍රද්‍යෝතයෝ (ප්‍රභාසවරයෝ) සතර දෙනෙකි. කවර සතර දෙනෙක යත්:

චන්ද්‍රප්‍රද්‍යෝත ය, සූර්‍ය්‍යප්‍රද්‍යෝත ය, අග්නිප්‍රද්‍යෝත ය, ප්‍රඥාප්‍රද්‍යෝත යි. මහණෙනි, මේ ප්‍රද්‍යෝතයෝ සතර දෙන වෙති. මහණෙනි, මේ සතර ප්‍රද්‍යෝතයන් කෙරෙහි ප්‍රඥාප්‍රද්‍යෝතයෙක් ඇද්ද, තෙල අග්‍ර යි.

## 4. 3. 5. 6.

### [ කාල සූත්‍රය ]

46. මහණෙනි, මේ කාලයෝ සතර දෙනෙකි. කවර සතර දෙනෙක යත්:

නිසි කාලයෙහි ධර්මශ්‍රවණ ය, නිසි කාලයෙහි ධර්මසාකච්ඡා ය, නිසි කාලයෙහි සමථ ය, නිසි කාලයෙහි විදර්ශනා යි.

මහණෙනි, මේ කාලයෝ සතර දෙන වෙති.

### 4. 3. 5. 7.

### [ දුතියකාලසුත්තං ]

47. චත්තාරොමෙ භික්ඛවෙ කාලා සම්මා භාවියමානා සම්මා අනුපරිවත්තියමානා අනුපුබ්බෙන ආසවානං ඛයං පාපෙන්ති. කතමෙ චත්තාරො?

කාලෙන ධම්මස්සවණං, කාලෙන ධම්මසාකච්ඡා, කාලෙන සමථො,[1] කාලෙන විපස්සනා.

ඉමෙ ඛො භික්ඛවෙ චත්තාරො කාලා සම්මා භාවියමානා සම්මා අනුපරිවත්තියමානා අනුපුබ්බෙන ආසවානං ඛයං පාපෙන්ති.

සෙය්‍යථාපි භික්ඛවෙ උපරිපබ්බතෙ ථුල්ලඵුසිතකෙ දෙවෙ වස්සන්තෙ තං උදකං යථා නින්නං පවත්තමානං පබ්බතකන්දරපදරසාඛා පරිපූරෙති. පබ්බතකන්දරපදරසාඛා පරිපූරා කුසුබ්භෙ[2] පරිපූරෙන්ති. කුසුබ්භා[2] පරිපූරා මහාසොබ්භෙ පරිපූරෙන්ති. මහාසොබ්භා පරිපූරා කුන්නදියො පරිපූරෙන්ති. කුන්නදියො පරිපූරා මහානදියො පරිපූරෙන්ති. මහානදියො පරිපූරා සමුද්දං[3] සාගරං පරිපූරෙන්ති. එවමෙව ඛො භික්ඛවෙ ඉමෙ චත්තාරො කාලා සම්මා භාවියමානා සම්මා අනුපරිවත්තියමානා අනුපුබ්බෙන ආසවානං ඛයං පාපෙන්තීති.

### 4. 3. 5. 8

### [ වචීදුච්චරිතසුත්තං ]

48. චත්තාරිමානි භික්ඛවෙ වචීදුච්චරිතානි. කතමානි චත්තාරි?
මුසාවාදො, පිසුණාවාචා, ඵරුසාවාචා, සම්ඵප්පලාපො.
ඉමානි ඛො භික්ඛවෙ චත්තාරි වචීදුච්චරිතානි.

### 4. 3. 5. 9.

### [ වචීසුචරිතසුත්තං ]

49. චත්තාරිමානි භික්ඛවෙ වචීසුචරිතානි. කතමානි චත්තාරි?
සච්චවාචා, අපිසුණවාචා[4], සණ්හවාචා[4], මන්තාභාසා.
ඉමානි ඛො භික්ඛවෙ චත්තාරි වචීසුචරිතානීති.

### 4. 3. 5. 10.

### [ සාරසුත්තං ]

50. චත්තාරොමෙ භික්ඛවෙ සාරා. කතමෙ චත්තාරො?
සීලසාරො, සමාධිසාරො, පඤ්ඤාසාරො, විමුත්තිසාරො.
ඉමෙ ඛො භික්ඛවෙ චත්තාරො සාරාති.

**ආභාවග්ගො පඤ්චමො.***

**තතියො පණ්ණාසකො.**

---

1. සම්මසනා - මජ්සං. 2. කුසොබ්භෙ - මජ්සං. 3. සමුද්ද සාගරං - සතා - සං.
4. අපිසුණාවාචා, සණ්හාවාචා.

* තස්සුද්දානං: ආභා පභා ච ආලොකා - ඔභාසා චෙව පජ්ජොතා
ද්වෙ කාලා චරිතා ද්වෙ ච - හොන්ති සාරෙන තෙ දසාති - මජ්සං.

Free Distribution www.aathaapi.org

## 4. 3. 5. 7.

## [ දුතියකාල සූත්‍රය ]

47. මහණෙනි, මේ කාලයෝ (කුශල ධර්මයෝ) සතර දෙනෙක් මොනොවට වඩනු ලබන්නාහු මැනවින් වටාලා කරණු ලබන්නාහු ක්‍රමයෙන් ආශ්‍රවක්ෂයට පමුණුවත්. කවර සතර දෙනෙක යත්:

නිසි කාලයෙහි ධර්මශ්‍රවණ ය, නිසි කාලයෙහි ධර්මසාකච්ඡා ය, නිසි කාලයෙහි ශමථ ය, නිසි කාලයෙහි විදර්ශනා යි.

මහණෙනි, මේ කුශල ධර්මයෝ සතර දෙනා මැනවින් වඩනු ලබන්නාහු, මැනවින් වටාලා කරණු ලබන්නාහු පිළිවෙළින් අර්හත්ත්වයට පමුණුවත්.

මහණෙනි, යම් පරිදි පර්වතය මත දළ බිඳු ඇති වැසි වසිත් ම ඒ දිය වල තැන් තුබූ සැපියෙන් වැටෙමින් පව්කඳුරු පැළිවලත් පුරවයි. පිරිසිඵ පව්කඳුරු පැළිවලදහු කුඩා ගෙබනු පුරවත්. පරිපූර්ණ කුඩා ගෙබනු මහගෙබ පුරවත්. පිරුණු මහගෙබනු කුඩා ගංගෝ පුරවත්. පිරුණු කුඩා ගංගෝ මහනදීන් පුරවත්. පිරුණු මහානදීහු සමුද්‍රසාගරය පුරවත්.

මහණෙනි, එ පරිදි ඒ මේ සතර කුසලධර්මයෝ මැනැවින් වඩනු ලබන්නාහු, මැනැවින් වටාලා කරණු ලබන්නාහු පිළිවෙළින් අර්හත්ත්වයට පමුණුවත්.

## 4. 3. 5. 8.

## [ වචීදුශ්චරිත සූත්‍රය ]

48. මහණෙනි, මේ වාග්දුශ්චරිතයෝ සතර දෙනෙකි. කවර සතර දෙනෙක යත්:

මෘෂාවාද ය, පිශුනවාක්‍ය ය, පරුෂවාක්‍ය ය, සම්ඵප්‍රලාප යි.

මහණෙනි, මේ සතර වාග්දුශ්චරිතයෝ යි.

## 4. 3. 5. 9.

## [ වචීසුචරිත සූත්‍රය ]

49. මහණෙනි, මේ සතර වාක්සුචරිතයෝ යි. කවර සතරෙක යත්:

සත්‍යවචන ය, අපිශුනවචන ය, මොළොක් වචන ය, නුවණින් පිරිසිඳ කළ කථා යි.

මහණෙනි, මේ සතර වාක්සුචරිතයෝ යි.

## 4. 3. 5. 10.

## [ සාර සූත්‍රය ]

50. මහණෙනි, මේ සාරයෝ සතර දෙනෙකි. කවර සතර දෙනෙක යත්:

ශීලසාර ය, සමාධිසාර ය, ප්‍රඥාසාර ය, විමුක්තිසාර යි.

මහණෙනි, මේ සතර සාරයෝ යි.

**ආභාධවර්ගය පස්වැනි යි.**

**තෙවන පණ්ණාසකය යි.**

## 4. චතුත්ථො පණ්ණාසකො.

# 1. ඉන්ද්‍රියවග්ගො.

### 4. 4. 1. 1.

### [ ඉන්ද්‍රියසුත්තං ]

[සාවත්ථිනිදානං]

1. චත්තාරිමානි භික්ඛවෙ ඉන්ද්‍රියානි. කතමානි චත්තාරි?

සද්ධින්ද්‍රියං, විරියින්ද්‍රියං, සතින්ද්‍රියං, සමාධින්ද්‍රියං.

ඉමානි ඛො භික්ඛවෙ චත්තාරි ඉන්ද්‍රියානීති.

### 4. 4. 1. 2.

### [ බලසුත්තං ]

2. චත්තාරිමානි භික්ඛවෙ බලානි. කතමානි චත්තාරි?

සද්ධාබලං, විරියබලං, සතිබලං, සමාධිබලං.

ඉමානි ඛො භික්ඛවෙ චත්තාරි බලානීති.

### 4. 4. 1. 3.

### [ දුතියබලසුත්තං ]

3. චත්තාරිමානි භික්ඛවෙ බලානි. කතමානි චත්තාරි?

පඤ්ඤාබලං, විරියබලං, අනවජ්ජබලං, සංගාහබලං.

ඉමානි ඛො භික්ඛවෙ චත්තාරි බලානීති.

### 4. 4. 1. 4.

### [ තතියබලසුත්තං ]

4. චත්තාරිමානි භික්ඛවෙ බලානි. කතමානි චත්තාරි?

සතිබලං, සමාධිබලං, අනවජ්ජබලං, සංගාහබලං.

ඉමානි ඛො භික්ඛවෙ චත්තාරි බලානීති.

### 4 සිවුවැනි පණ්ණාසකය.

# 1. ඉන්ද්‍රිය වග්ගය.

### 4. 4. 1. 1.

### [ ඉන්ද්‍රිය සූත්‍රය ]

[සැවැත් නිදානයි.]

1. මහණෙනි, මේ ඉන්ද්‍රියයෝ සතර දෙනෙකි. කවර සතර දෙනෙක යත්:

ශ්‍රද්ධෙන්ද්‍රිය ය, වීර්‍ය්‍යෙන්ද්‍රිය ය, ස්මෘතීන්ද්‍රිය ය, සමාධීන්ද්‍රිය යි.

මහණෙනි, මේ සතර ඉන්ද්‍රියයෝ යි.

### 4. 4. 1. 2.

### [ බල සූත්‍රය ]

2. මහණෙනි, මේ බලයෝ සතර දෙනෙකි. කවර සතර දෙනෙක යත්:

ශ්‍රද්ධාබල ය, වීර්‍ය්‍යබල ය, ස්මෘතිබල ය, සමාධිබල යි.

මහණෙනි, මේ සතර බලයෝ යි.

### 4. 4. 1. 3.

### [ දෙවැනි බල සූත්‍රය ]

3. මහණෙනි, මේ බලයෝ සතර දෙනෙකි. කවර සතර දෙනෙක යත්:

ප්‍රඥාබල ය, වීර්‍ය්‍යබල ය, අනවද්‍යබල ය, සඞ්ග්‍රාහබල යි.

මහණෙනි, මේ සතර බලයෝ යි.

### 4. 4. 1. 4.

### [ තෙවැනි බල සූත්‍රය ]

4. මහණෙනි, මේ බලයෝ සතර දෙනෙකි. කවර සතර දෙනෙක යත්:

ස්මෘතිබල ය, සමාධිබල ය, අනවද්‍යබල ය, සඞ්ග්‍රාහබල යි.

මහණෙනි, මේ සතර බලයෝ යි.

## 4. 4. 1. 5.

## [ චතුක්ක බලසුත්තං ]

5. චත්තාරිමානි භික්ඛවෙ බලානි. කතමානි චත්තාරි?

පටිසඞ්ඛානබලං, භාවනාබලං, අනවජ්ජබලං, සඞ්ගාහබලං.

ඉමානි ඛො භික්ඛවෙ චත්තාරි බලානීති.

## 4. 4. 1. 6.

## [ අසඞ්ඛෙය්‍ය සුත්තං ]

6. චත්තාරිමානි භික්ඛවෙ කප්පස්ස අසඞ්ඛෙය්‍යානි. කතමානි චත්තාරි?

යදා භික්ඛවෙ කප්පො සංවට්ටති, තං න සුකරං සඞ්ඛාතුං එත්තකානි වස්සානීති වා එත්තකානි වස්සසතානීති වා එත්තකානි වස්සසහස්සානීති වා එත්තකානි වස්සසතසහස්සානීති වා.

යදා භික්ඛවෙ කප්පො සංවට්ටො තිට්ඨති, තං න සුකරං සඞ්ඛාතුං එත්තකානි වස්සානීති වා එත්තකානි වස්සසතානීති වා එත්තකානි වස්සසහස්සානීති වා එත්තකානි වස්සසතසහස්සානීති වා.

යදා භික්ඛවෙ කප්පො විවට්ටති. තං න සුකරං සඞ්ඛාතුං එත්තකානි වස්සානීති වා එත්තකානි වස්සසතානීති වා එත්තකානි වස්සසහස්සානීති වා එත්තකානි වස්සසතසහස්සානීති වා.

යදා භික්ඛවෙ කප්පො විවට්ටො තිට්ඨති. තං න සුකරං සඞ්ඛාතුං එත්තකානි වස්සානීති වා එත්තකානි වස්සසතානීති වා එත්තකානි වස්සසහස්සානීති වා එත්තකානි වස්සසතසහස්සානීති වා.

ඉමානි ඛො භික්ඛවෙ චත්තාරි කප්පස්ස අසඞ්ඛෙය්‍යානීති.

## 4. 4. 1. 7.

## [ රොග සුත්තං ]

7. ද්වෙමෙ භික්ඛවෙ රොගා. කතමෙ ද්වෙ?

කායිකො ච රොගො. චෙතසිකො ච රොගො.

දිස්සන්ති භික්ඛවෙ සත්තා කායිකෙන රොගෙන එකම්පි වස්සං ආරොග්‍යං පටිජානමානා. ද්වෙපි වස්සානි ආරොග්‍යං පටිජානමානා. තීණිපි වස්සානි ආරොග්‍යං පටිජානමානා. චත්තාරිපි වස්සානි ආරොග්‍යං පටිජානමානා. පඤ්චපි වස්සානි ආරොග්‍යං පටිජානමානා. දසපි වස්සානි ආරොග්‍යං පටිජානමානා. වීසතිම්පි වස්සානි ආරොග්‍යං පටිජානමානා. තිංසම්පි වස්සානි ආරොග්‍යං පටිජානමානා. චත්තාරීසම්පි වස්සානි ආරොග්‍යං පටිජානමානා. පඤ්ඤාසම්පි වස්සානි ආරොග්‍යං පටිජානමානා. වස්සසතම්පි ආරොග්‍යං පටිජානමානා

## 4. 4. 1. 5.

### [ සිවුවැනි බල සූත්‍රය ]

5. මහණෙනි, මේ බලයෝ සතර දෙනෙකි. කවර සතර දෙනෙක යත්:

ප්‍රතිසඞ්ඛ්‍යානබල ය, භාවනාබල ය, අනවද්‍යබල ය, සඞ්ග්‍රාහබල යි.

මහණෙනි, මේ සතර බලයෝ යි.

## 4. 4. 1. 6.

### [ අසඞ්ඛෙය්‍ය සූත්‍රය ]

6. මහණෙනි, මේ කල්පයෙ පිළිබඳ සතර අසඞ්ඛෙය්‍ය කොතෙක් වෙති. කවර සතර කොතෙක යත්:

මහණෙනි, යම් කලෙක්හි කප නස්නේ ද, මෙතෙක් වර්ෂ කෙතෙක කියා හෝ මෙතෙක් වර්ෂශතයෙක කියා හෝ මෙතෙක් වර්ෂසහස්‍රයෙක කියා හෝ මෙතෙක් වර්ෂශතසහස්‍රයෙක කියා හෝ එය ගණනට සුකර නො වේ.

මහණෙනි, යම් කලෙක කප සංවර්ත ව සිටුනේ ද, වර්ෂ මෙතෙකා යි කියා හෝ වර්ෂශත මෙතෙකැ යි කියා හෝ වර්ෂසහස්‍ර මෙතෙකැ යි කියා හෝ වර්ෂශතසහස්‍ර මෙතෙකැයි කියා හෝ එය ගණනට සුකර නො වේ.

මහණෙනි, යම් කලෙක කප වැඩේ ද, වර්ෂ මෙතෙකැ යි හෝ වර්ෂශත මෙතෙකැ යි හෝ වර්ෂසහස්‍ර මෙතෙකැ යි හෝ වර්ෂශතසහස්‍ර මෙතෙකැ යි හෝ එය ගණනට සුකර නො වේ.

මහණෙනි, යම් කලෙක කප විවර්ත ව සිටුනේ ද, මෙතෙක් වර්ෂයැ යි හෝ මෙතෙක් වර්ෂශතය යි හෝ මෙතෙක් වර්ෂසහස්‍රය යි හෝ මෙතෙක් වර්ෂ ශතසහස්‍රය යි හෝ එය ගණනට සුකර නො වේ

මහණෙනි, මේ කල්පයාගේ සතර අසඞ්ඛෙය්‍යයෝ යි.

## 4. 4. 1. 7.

### [ රොග සූත්‍රය ]

7. මහණෙනි, මේ රොගයෝ දෙදෙනෙකි. කවර දෙදෙනෙක යත්:

කායිකරොගය හා චෛතසිකරොග යි.

මහණෙනි, කායිකරෝගයෙන් එක් හවුරුද්දක්හුදු ආරොග්‍යය පිළිණ කරණ, හවුරුදු දෙකක්හුදු ආරොග්‍යය පිළිණ කරණ, හවුරුදු තුණක්හුදු ආරොග්‍යය පිළිණ කරණ, හවුරුදු සතරක්හුදු ආරොග්‍යය පිළිණ කරණ, හවුරුදු පසක්හුදු ආරොග්‍යය පිළිණ කරණ, හවුරුදු දසයක්හුදු ආරොග්‍යය පිළිණ කරණ, හවුරුදු විස්සක්හුදු ආරොග්‍යය පිළිණ කරණ, හවුරුදු තිසක්හුදු ආරොග්‍යය පිළිණ කරණ, හවුරුදු සතළිසක්හුදු ආරොග්‍යය පිළිණ කරණ, හවුරුදු පණසක්හුදු ආරොග්‍යය පිළිණ කරණ, හවුරුදු සියයක්හුදු ආරොග්‍යය පිළිණ කරණ සත්හු පැණෙති.

තෙ භික්ඛවෙ සත්තා දුල්ලභා[1] ලොකස්මිං යෙ චෙතසිකෙන රොගෙන මුහුත්තම්පි ආරොග්‍යං පටිජානන්ති, අඤ්ඤත්‍ර ඛීණාසවෙහි.

චත්තාරොමෙ භික්ඛවෙ පබ්බජිතස්ස රොගා. කතමෙ චත්තාරො?

ඉධ භික්ඛවෙ භික්ඛු මහිච්ඡො හොති විඝාතවා අසන්තුට්ඨො ඉතරීතරචීවර-පිණ්ඩපාතසෙනාසනගිලානපච්චයභෙසජ්ජපරික්ඛාරෙන. සො මහිච්ඡො සමානො විඝාතවා අසන්තුට්ඨො ඉතරීතරචීවරපිණ්ඩපාතසෙනාසනගිලාන-පච්චයභෙසජ්ජපරික්ඛාරෙන පාපිකං ඉච්ඡං පනිදහති අනවඤ්ඤපටිලාභාය[2], ලාභසක්කාරසිලොකපටිලාභාය. සො උට්ඨහති ඝටෙති වායමති අනවඤ්ඤ-පටිලාභාය, ලාභසක්කාරසිලොකපටිලාභාය. සො සඞ්ඛාය කුලානි උපසඞ්කමති, සඞ්ඛාය නිසීදති, සඞ්ඛාය ධම්මං භාසති, සඞ්ඛාය උච්චාරපස්සාවං සන්ධාරෙති. ඉමෙ ඛො භික්ඛවෙ චත්තාරො පබ්බජිතස්ස රොගා.

තස්මාතිහ භික්ඛවෙ එවං සික්ඛිතබ්බං: න මහිච්ඡා භවිස්සාම විඝාතවන්තො අසන්තුට්ඨා ඉතරීතරචීවරපිණ්ඩපාතසෙනාසනගිලානපච්චය-භෙසජ්ජපරික්ඛාරෙන, න පාපිකං ඉච්ඡං පනිදහිස්සාම අනවඤ්ඤපටිලාභාය, ලාභසක්කාරසිලොකපටිලාභාය, න උට්ඨහිස්සාම න ඝටිස්සාම න වායමිස්සාම අනවඤ්ඤපටිලාභාය ලාභසක්කාරසිලොකපටිලාභාය. න ඛමා භවිස්සාම සීතස්ස උණ්හස්ස ජිඝච්ඡාය පිපාසාය ඩංසමකසවාතාතපසිරිංස[3]පසම්ඵස්සානං දුරුත්තානං දුරාගතානං වචනපථානං උප්පන්නානං සාරීරිකානං වෙදනානං දුක්ඛානං තිබ්බානං ඛරානං කටුකානං අසාතානං අමනාපානං පාණහරානං අධිවාසිකජාතිකා භවිස්සාමාති. එවං හි වො භික්ඛවෙ සික්ඛිතබ්බන්ති.

## 4. 4. 1. 8.

## [ පරිහානිසුත්තං ]

8. තත්‍ර ඛො ආයස්මා සාරිපුත්තො භික්ඛූ ආමන්තෙසි ආවුසො භික්ඛවොති. ආවුසොති ඛො තෙ භික්ඛූ ආයස්මතො සාරිපුත්තස්ස පච්චස්සොසුං. ආයස්මා සාරිපුත්තො එතදවොච:

යො හි කොචි ආවුසො භික්ඛු වා භික්ඛුනී වා චත්තාරො ධම්මෙ අත්තනි සමනුපස්සති, නිට්ඨමෙත්ථ ගන්තබ්බං පරිහායාමි කුසලෙහි ධම්මෙහි. පරිහාන-මෙතං වුත්තං භගවතා. කතමෙ චත්තාරො?

රාගවෙපුල්ලතා[4], දොසවෙපුල්ලතං, මොහවෙපුල්ලතං, ගම්භීරෙසු ඛො පනස්ස ඨානාඨානෙසු පඤ්ඤාචක්ඛුං න කමති.

---

1. සුදුල්ලභා - මජසං. 2 අනවඤ්ඤප්පටිලාභාය - මජසං 3. සරීසප - මජසං.
4. රාගවෙපුල්ලත්තං - මජසං.

මහණෙනි, යම් සත්ත්ව කෙනෙක් චෛතසික රෝගයෙන් ආරෝග්‍යය පිළිණ කෙරෙත් ද, ඒ සත්ත්වයෝ ලෝකයෙහි දුර්ලභ වෙති. රහතුන් හැර යි.

මහණෙනි, පැවිද්දහුට මේ රොගයෝ සතර දෙනෙකි. කවර සතර දෙනෙක යත්:

මහණෙනි, මෙසස්නෙහි මහණ මහෙච්ඡ වෙයි. එයින් දුක් ඇතියේ වෙයි. යම් ම කිසි පිඬුවා සෙනසුන් ගිලන්පස බෙහෙසත් පිරිකරෙකින් සතුටු නො වෙයි. හේ මහෙච්ඡ වූයේ එයින් දුක් ඇතියේ යම් ම කිසි සිවුරු පිඬුවා සෙනසුන් ගිලන්පස බෙහෙසත් පිරිකරෙකින් අසතුටු වූයේ අවඥ නොලබනු සඳහා ලාභසත්කාරකීර්ති ලබනු සඳහා ලමු කැමැත්තක් පිහිටුවයි. හේ අවඥ නොලබනු පිණිස ලාභසත්කාර කීර්ති ලබනු පිණිස උත්‍ථානවීර්‍ය්‍යය කෙරෙයි. ඝටනා කෙරෙයි. ව්‍යායාම කෙරෙයි. (මෙසෙයින් මහදනා මා හඳුනා ගනිතියි) හේ අපෙක්‍ෂා කොට කුලත්කරු එළඹෙයි. අපෙක්‍ෂා කොට හිඳියි. අපෙක්‍ෂා කොට දහම් දෙසයි. අපෙක්‍ෂා කොට මලමූත්‍රවේගධාරණය කෙරෙයි. මහණෙනි, පැවිද්දහුගේ මේ සතර රොගයෝ යි.

මහණෙනි, එහෙයින් මෙසේ හික්මිය යුතු ය: "මහෙච්ඡ නො වම්හ. එයින් දුක් ඇතියමෝ නො වම්හ. යම් ම කිසි සිවුරු පිඬුවා සෙනසුන් ගිලන්පස බෙහෙසත් පිරිකරෙකින් නොසතුටු වූවමෝ නො වම්හ. අවඥ නොලබන පිණිස ලාභසත්කාරකීර්ති ලබනු පිණිස ලමු ඉච්ඡාවක් නො තබම්හ. අවඥ නොලබන පිණිස, ලාභසත්කාරකීර්ති ලබනු පිණිස, උත්‍ථාන-වීර්‍ය්‍යය නො කරම්හ. ඝටනා නො කරම්හ. ශීතය, උෂ්ණය, බඩසය, පවස, මැසි මදුරු වා අව් දිග්දැහැ යන මොවුන්ගේ පහස් ඉවසන්නමෝ නො වම්හ. නපුරු කොට කී නපුරු කොට ආ වචන ඉවසන්නමෝ නො වම්හ. දුක් වූ තීව්‍ර වූ ඛර වූ කටුක වූ අමධුර වූ අමනාප වූ ප්‍රාණහර වූ උපන් ශාරීරික-වේදනා ඉවසන සැහැවි ඇත්තමෝ නො වම්හ" කියා යි. මහණෙනි, තොප විසින් මෙසේ හික්මිය යුතු ය.

## 4. 4. 1. 8.

### [ පරිහාණි සූත්‍රය ]

8. එකල්හි ආයුෂ්මත් ශාරීපුත්‍රස්ථවිරයන් වහන්සේ 'ඇවැත් මහණෙනි'යි කියා භික්‍ෂූන් ඇමතූහ. 'ඇවැත්නි' යි ඒ භික්‍ෂූහු ආයුෂ්මත් ශාරිපුත්‍ර-ස්ථවිරයන් වහන්සේට පිළිවදන් ඇස්වූහ. ආයුෂ්මත් ශාරීපුත්‍රස්ථවිරයන් වහන්සේ මෙය ප්‍රකාශ කළහ:

ඇවැත්නි, යම් කිසි මහණෙක් හෝ මෙහෙණක් හෝ සතර දහම් තමා කෙරෙහි දක්නේ ද, "කුසල දහමින් පිරිහෙමි"යි මෙහි ලා නිශ්චයට යා යුතුයි. භාග්‍යවතුන් වහන්සේ විසින් "මෙය පිරිහිනෙකැ" යි වදාරණ ලදී. කවර සතර දහම්හුය යත්:

රාගවෛපුල්‍ය ය, ද්වේෂවෛපුල්‍ය ය, මෝහවෛපුල්‍ය ය, ඔහුගේ පැණැස ගැඹුරු ස්ථාන අස්ථානයෙහි (කාරණාකාරණයෙහි) නො වැදගණී නම් එද යන සතර යි.

යො හි කොචි ආවුසො භික්ඛු වා භික්ඛුනී වා ඉමෙ චත්තාරො ධම්මෙ අත්තනි සමනුපස්සති, නිට්ඨමෙත්ථ ගන්තබ්බං පරිහායාමි කුසලෙහි ධම්මෙහි, පරිහානමෙතං වුත්තං භගවතා.

යො හි කොචි ආවුසො භික්ඛු වා භික්ඛුනී වා චත්තාරො ධම්මෙ අත්තනි සමනුපස්සති, නිට්ඨමෙත්ථ ගන්තබ්බං න පරිහායාමි කුසලෙහි ධම්මෙහි, අපරිහානමෙතං වුත්තං භගවතා. කතමෙ චත්තාරො?

රාගතනුත්තං, දොසතනුත්තං, මොහතනුත්තං, ගම්භීරෙසු ඛො පනස්ස ඨානාඨානෙසු පඤ්ඤාචක්ඛුං කමති.

යො හි කොචි ආවුසො භික්ඛු වා භික්ඛුනී වා ඉමෙ චත්තාරො ධම්මෙ අත්තනි සමනුපස්සති, නිට්ඨමෙත්ථ ගන්තබ්බං අපරිහායාමි කුසලෙහි ධම්මෙහි. අපරිහානමෙතං වුත්තං භගවතාති.

## 4. 4. 1 9.

## [භික්ඛුනීසුත්තං]

9. එකං සමයං ආයස්මා ආනන්දො කොසම්බියං විහරති ඝොසිතාරාමෙ. අථ ඛො අඤ්ඤතරා භික්ඛුනී අඤ්ඤතරං පුරිසං ආමන්තෙසි: එහි ත්වං අම්භො පුරිස, යෙන අය්‍යො ආනන්දො තෙනුපසඞ්කම, උපසඞ්කමිත්වා මම වචනෙන අය්‍යස්ස ආනන්දස්ස පාදෙ සිරසා වන්ද, ඉත්ථන්නාමා භන්තෙ භික්ඛුනී ආබාධිකිනී දුක්ඛිතා බාළ්හගිලානා, සා අය්‍යස්ස ආනන්දස්ස පාදෙ සිරසා වන්දතීති එවං ච වදෙහි: සාධු කිර භන්තෙ අය්‍යො ආනන්දො යෙන භික්ඛුනූපස්සයො යෙන සා භික්ඛුනී තෙනුපසඞ්කමතු අනුකම්පං උපාදායාති.

එවං අය්‍යෙති ඛො සො පුරිසො තස්සා භික්ඛුනියා පටිස්සුත්වා යෙනායස්මා ආනන්දො තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා ආයස්මන්තං ආනන්දං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නො ඛො සො පුරිසො ආයස්මන්තං ආනන්දං එතදවොච:

ඉත්ථන්නාමා භන්තෙ භික්ඛුනී ආබාධිකිනී දුක්ඛිතා බාළ්හගිලානා, සා ආයස්මතො ආනන්දස්ස පාදෙ සිරසා වන්දති, එවං ච වදෙති: සාධු කිර භන්තෙ ආයස්මා ආනන්දො යෙන භික්ඛුනූපස්සයො යෙන සා භික්ඛුනී තෙනුපසඞ්කමතු අනුකම්පං උපාදායාති.

අධිවාසෙසි ඛො ආයස්මා ආනන්දො තුණ්හීභාවෙන. අථ ඛො ආයස්මා ආනන්දො නිවාසෙත්වා පත්තචීවරං ආදාය යෙන භික්ඛුනූපස්සයො තෙනුප-සඞ්කමි. අද්දසා ඛො සා භික්ඛුනී ආයස්මන්තං ආනන්දං දූරතොව ආගච්ඡන්තං. දිස්වා සසීසං පාරුපිත්වා මඤ්චකෙ නිපජ්ජි. අථ ඛො ආයස්මා ආනන්දො යෙන සා භික්ඛුනී තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා පඤ්ඤත්තෙ ආසනෙ නිසීදි. නිසජ්ජ ඛො ආයස්මා ආනන්දො තං භික්ඛුනිං එතදවොච:

ආහාරසම්භූතො අයං භගිනි කායො. ආහාරං නිස්සාය ආහාරො පහාතබ්බො. තණ්හාසම්භූතො අයං භගිනි[1] කායො තණ්හං නිස්සාය තණ්හා පහාතබ්බා. මානසම්භූතො අයං භගිනි කායො. මානං නිස්සාය මානො පහාතබ්බො. මෙථුනසම්භූතො අයං භගිනි කායො මෙථුනෙ ච සෙතුඝාතො[2] වුත්තො භගවතා.

---

1. ඉධ භගිනි - මජසං,
2. මෙථුනො පහාතබ්බො මෙථුනෙ සෙතුඝාතො'' ති - ස්‍යා

ඇවැත්නි, යම් කිසි මහණෙක් හෝ මෙහෙණක් හෝ මේ සතර දහම් තමා කෙරෙහි දක්නේ ද, "කුසල දහමින් පිරිහෙමි"යි මෙහි නිශ්චයට යා යුතුයි. භාග්‍යවතුන් වහන්සේ විසින් 'තෙල පිරිහීමෙකැ' යි වදාරණ ලදි.

ඇවැත්නි, යම් කිසි මහණෙක් හෝ මෙහෙණක් හෝ සතර දහම් තමා කෙරෙහි දක්නේ ද, 'කුසලදහමින් නො පිරිහෙමි" යි මෙහි නිශ්චයට යා යුතුය. භාග්‍යවතුන් වහන්සේ විසින් 'තෙල නොපිරිහීමෙකැ'යි වදාරණ ලදි. කවර සතර දෙනෙක යත්:

රාගයාගේ තුනීබව ය, ද්වෙෂයාගේ තුනීබව ය, මොහයාගේ තුනීබව ය, ඔහුගේ පැණැස ගැඹුරු කාරණාකාරණයෙහි වැදගණී ද එයයි.
ඇවැත්නි, යම් කිසි මහණෙක් හෝ මෙහෙණක් හෝ මේ සතර දහම් තමා කෙරෙහි දක්නේ ද, 'කුසලදහමින් නො පිරිහෙමි'යි මෙහි නිශ්චයට යා යුතුයි. භාග්‍යවතුන් වහන්සේ විසින් 'තෙල නො පිරිහීමෙකැ' යි වදාරණ ලදි.

## 4, 4. 1. 9.

## [ භික්ඛුනී සූත්‍රය ]

9. එක් කලෙක ආයුෂ්මත් අනඳ තෙරණුවෝ කොසඹෑනුවර ඝොෂිතාරාමයෙහි වැඩවෙසෙති. එසඳ එක්තරා මෙහෙණක් එක්තරා පුරුෂයකු ඇමතූ ය. "එම්බා පුරුෂය, තෝ මෙහි එව, ආයසී ආනඳ තෙරණුවන් කරා එළඹෙව, මාගේ වචනයෙන් අනඳහිමියන් පා හිසින් වඳුව, වහන්ස, මෙනම් මෙහෙණ හටගත් ආබාධ ඇති ව දුඃඛිත ව දැඩි ගිලන් ව වෙසේ. ඕ අනඳ හිමියන්ගේ පාදයන් සිරසින් වඳී." කියා යි. "වහන්ස, අනඳහිමිහු මෙහෙණවර කරා, එ මෙහෙණ කරා, අනුකම්පා කොට එළඹෙත යේක් නම් මැනැවැ" යි ද මෙසේත් කියව.

'ආයසීමෙනි, එසේය' යි කියා එ පුරිස් එ මෙහෙණට පිළිවදත් අස්වා ආයුෂමත් අනඳ තෙරණුවන් කරා එළඹියේ ය. එළඹ ආයුෂමත් අනඳ තෙරුන් සකසා වැඳ එකත්පස්ව හිඳ. එකත්පස්ව හුන් එපුරිස් ආයුෂමත් අනඳ තෙරුන්ට තෙල කී:

"වහන්ස, මෙනම් මෙහෙණ හටගත් ආබාධ ඇති ව දුඃඛිත ව දැඩි ගිලන් ව වෙසේ, ඕ ආයුෂමත් අනඳ තෙරුන්ගේ පාදයන් සිරසින් වඳී. මෙසේ ද කියයි: "වහන්ස, ආයුෂමත් අනඳ තෙරණුවෝ මෙහෙණවර කරා ඒ මෙහෙණ කරා අනුකම්පා කොට එළඹෙත යේක් නම් මැනව" කියා යි.

ආයුෂමත් ආනන්ද තෙරණුවෝ තුෂ්ණීම්භාවයෙන් ඉවසූහ ඉක්බිති ආයුෂමත් අනඳ තෙරණුවෝ හැඳ පෙරෙව පාසිවුරු ගෙණ මෙහෙණවර කරා එළඹියහ ඒ මෙහෙණ ආයුෂමත් අනඳ තෙරණුවන් එනුවන් දුරදීම දුටු දක හිස වසා පෙරෙව ගෙණ ඇඳෙහි හොතු ඉක්බිති ආයුෂමත් අනඳ තෙරණුවෝ ඒ මෙහෙණ කරා එළඹියහ. එළඹ පැන් වූ අස්නෙහි හුන්හ. හිඳ ආයුෂමත් අනඳ තෙරණුවෝ ඒ මෙහෙණට තෙල කීහ:

බුහුතණියනි, මේ කය ආහාරයෙන් වැඩීන. අහර නිසා කම්හාරය ප්‍රහාතව්‍ය වෙයි. බුහුතණියනි, මේ කය තෘෂ්ණායෙන් වැඩිත තෘෂ්ණාව නිසා පුර්වතෘෂ්ණාව ප්‍රහාතව්‍ය වෙයි. බුහුතණියනි, මේ කය මානයෙන් වැඩිත. මානය නිසා පූර්මානය ප්‍රහාතව්‍ය වෙයි. බුහුතණියනි, මේ කය මෛථුනයෙන් වැඩිත භාග්‍යවතුන් වහන්සේ විසින් මෛථුනයෙහි හෙතු නැස්ම වදාරණ ලදි.

"ආහාරසම්භූතො අයං භගිනි කායො, ආහාරං නිස්සාය ආහාරො පහාතබ්බො"ති ඉති ඛො පනෙතං වුත්තං. කිඤ්චෙතං පටිච්ච වුත්තං? ඉධ පන භගිනි භික්ඛු පටිසඞ්ඛා යොනිසො ආහාරං ආහාරෙති: නෙව දවාය න මදාය න මණ්ඩනාය න විභූසනාය යාවදෙව ඉමස්ස කායස්ස ඨිතියා යාපනාය විහිංසූපරතියා බ්‍රහ්මචරියානුග්ගහාය, ඉති පුරාණං ච වෙදනං පටිහඞ්ඛාමි, නවං ච වෙදනං න උප්පාදෙස්සාමි, යාත්‍රා ච මෙ භවිස්සති අනවජ්ජතා ච ඵාසුවිහාරො චාති. සො අපරෙන සමයෙන ආහාරං නිස්සාය ආහාරං පජහති. "ආහාරසම්භූතො අයං භගිනි කායො, ආහාරං නිස්සාය ආහාරො පහාතබ්බො"ති ඉති යං තං වුත්තං, ඉදමෙතං පටිච්ච වුත්තං.

"තණ්හාසම්භූතො අයං භගිනි කායො, තණ්හං නිස්සාය තණ්හා පහාතබ්බා"ති ඉති ඛො පනෙතං[1] වුත්තං. කිඤ්චෙතං පටිච්ච වුත්තං? ඉධ භගිනි භික්ඛු සුණාති ඉත්ථන්නාමො කිර භික්ඛු ආසවානං ඛයා අනාසවං චෙතොවිමුත්තිං පඤ්ඤාවිමුත්තිං දිට්ඨෙව ධම්මෙ සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරතීති. තස්ස එවං හොති: කුදාස්සු නාම අහම්පි ආසවානං ඛයා -පෙ- සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරිස්සාමීති. සො අපරෙන සමයෙන තණ්හං නිස්සාය තණ්හං පජහති, "තණ්හාසම්භූතො අයං භගිනි කායො, තණ්හං නිස්සාය තණ්හා පහාතබ්බා"ති ඉති යං තං වුත්තං, ඉදමෙතං පටිච්ච වුත්තං.

"මානසම්භූතො අයං භගිනි කායො, මානං නිස්සාය මානො පහාතබ්බො"ති. ඉති ඛො පනෙතං වුත්තං. කිඤ්චෙතං පටිච්ච වුත්තං? ඉධ භගිනි භික්ඛු සුණාති ඉත්ථන්නාමො කිර භික්ඛු ආසවානං ඛයා අනාසවං චෙතොවිමුත්තිං පඤ්ඤාවිමුත්තිං දිට්ඨෙව ධම්මෙ සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරතීති. තස්ස එවං හොති: සො හි නාම ආයස්මා ආසවානං ඛයා අනාසවං චෙතොවිමුත්තිං පඤ්ඤාවිමුත්තිං දිට්ඨෙව ධම්මෙ සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරති, කිමඞ්ගපනාහන්ති. සො අපරෙන සමයෙන මානං නිස්සාය මානං පජහති. "මානසම්භූතො අයං භගිනි කායො, මානං නිස්සාය මානො පහාතබ්බො"ති, ඉති යං තං වුත්තං ඉදමෙතං පටිච්ච වුත්තං.

"මෙථුනසම්භූතො අයං භගිනි කායො, මෙථුනෙ ච සෙතුඝාතො වුත්තො භගවතා"ති.

අථ ඛො සා භික්ඛුනී මඤ්චා උට්ඨහිත්වා එකංසං උත්තරාසඞ්ගං කරිත්වා ආයස්මතො ආනන්දස්ස පාදෙසු සිරසා නිපතිත්වා ආයස්මන්තං ආනන්දං එතදවොච: අච්චයො මං භන්තෙ අච්චගමා යථාබාලං යථාමූළ්හං යථා-අකුසලං යාහං එවමකාසිං. තස්සා මෙ භන්තෙ අය්‍යො ආනන්දො අච්චයං අච්චයතො පතිගණ්හාතු ආයතිං සංවරායාති

තග්ඝ ත්වං භගිනි අච්චයො අච්චගමා යථාබාලං යථාමූළ්හං යථාඅකුසලං යා ත්වං එවමකාසි. යතො ච ඛො ත්වං භගිනි අච්චයං අච්චයතො දිස්වා යථා-ධම්මං පටිකරොසි, තං තෙ මයං පතිගණ්හාම. වුද්ධි හෙසා භගිනි අරියස්ස විනයෙ යා අච්චයං අච්චයතො දිස්වා යථාධම්මං පටිකරොති ආයතිං සංවරං ආපජ්ජතීති.

1 ඉති යං තං - සීමු.

“බුහුනණියෙනි, මේ කය ආහාරයෙන් වැඩින. ආහාරය නිසා ආහාරය පහ කළ යුතුය” යි මෙසේ තෙල බස කියන ලද. තෙල බස කුමක් පිණිස කීයු ද යත්: “බුහුනණියෙනි, මෙසස්නෙහි මහණ නුවණින් සලකා අහර වළඳ කෙරෙයි. දවය පිණිස නො වේ. මදය පිණිස නො වේ. මණ්ඩනය පිණිස නො වේ, විභූෂණය පිණිස නො වේ මේ කරජකායයාගේ සපිතිය පිණිස ම වෙයි. යැපීම පිණිස ම වෙයි. විහිංසා නස්නා පිණිස ම වෙයි. බඹසරට අනුගුරක් පිණිස ම වෙයි. මෙසේ පුරාණවේදනාත් නස්මි. නව්‍යවේදනාත් නූපදවමි. මාගේ ජීවිතයාත්‍රාව ද වෙයි. අවද්‍යතා ද ඵාසුවිහරණය ද වෙයි. හේ පසු කලෙක අහර නිසා අහර හැර පියයි. “බුහුනණියෙනි, මේ කය අහරින් වැඩින, අහර නිසා අහර හැරපිය යුතුය” යි යම් බසෙක් කියන ලද නම් මෙය තෙල අරුත් සඳහා කියන ලදි.

“බුහුනණියෙනි, මේ කය තෘෂ්ණායෙන් වැඩින. තෘෂ්ණාව නිසා තෘෂ්ණාව හැරපිය යුතුය යි” මෙසේ තෙල බස කියන ලද්. තෙල බස කුමක් පිණිස කියන ලද්ද: “බුහුනණියෙනි, මෙසස්නෙහි මහණෙක් ආස්‍රවක්ෂයයෙන් අනාස්‍රව වූ චෙතොවිමුක්තිය හා ප්‍රඥාවිමුක්තිය දිට්ඨධර්මයෙහි ම තෙමේ විශිෂ්ට-ඥානයෙන් දැන ප්‍රත්‍යක්ෂ කොට ඊට එළඹ වෙසේ ලු” යි අසා ද, ඔහුට මෙබඳු සිතෙක් වෙයි: ‘කවරදා නම් මමත් ආස්‍රවක්ෂය කිරීමෙන් ... ප්‍රත්‍යක්ෂ කොට ඊට එළඹ වෙසෙම් දෝ හෝ” යි කියා යි. හේ පසුකලෙක තෘෂ්ණාව නිසා තෘෂ්ණාව හැරපියයි. “බුහුනණියෙනි, මේ කය තෘෂ්ණායෙන් වැඩින. තෘෂ්ණාව නිසා තෘෂ්ණාව පහ කළයුතුය” යි මෙසේ යම් ඒ බසෙක් කියන ලද නම් මෙබස් තෙල අරුත් සඳහා කියන ලදි.

“බුහුනණියෙනි, මේ කය මානයෙන් වැඩින. මානය නිසා මානය පහ කළයුතුය” යි මෙසේ තෙල බස කියන ලද. තෙල බස කුමක් පිණිස කියන ලද යත්: “බුහුනණියෙනි, මෙසස්නෙහි මහණෙක් මෙනම් මහණ ආස්‍රවක්ෂයයෙන් අනාස්‍රව වූ චෛතසිකවිමුක්තිය හා ප්‍රඥාවිමුක්තිය දෘෂ්ටධර්මයෙහි ම තෙමේ විශිෂ්ටඥානයෙන් දැන ප්‍රත්‍යක්ෂ කොට ඊට පැමිණ වෙසේ ලු” යි අසා ද, ඔහුට මෙබඳු සිතෙක් වෙයි: ඒ ආයුෂ්මත් වනාහි ආස්‍රවක්ෂයයෙන් අනාස්‍රව වූ චෙතොවිමුක්තිය හා ප්‍රඥාවිමුක්තිය මෙලොවිහි ම තෙමේ විශිෂ්ටඥානයෙන් දැන ප්‍රත්‍යක්ෂ කොට ඊට පැමිණ වෙසෙයි. මම වැළිත් කියනු කිම” යි කියා යි. හේ පසු කලෙක මානය නිසා මානය හැර පියයි, “බුහුනණියෙනි, මේ කය මානයෙන් වැඩින. මානය නිසා මානය පහ කළ යුතුය” යි මෙසේ යම් ඒ බසෙක් කියන ලද නම් මෙබස් තෙල අරුත් පිණිස කියන ලදී.”

“බුහුනණියෙනි, මේ කය මෛථුනයෙන් වැඩින. භාග්‍යවතුන් වහන්සේ විසින් මෛථුනයෙහි සේතුඝාතය වදාරණ ලදී.

එසඳ ඒ මෙහෙණ හැඳෙන් නැඟී උත්තරාසඞ්ගය එකස් කොට ආයුෂ්මත් අනඳ තෙරණුවන්ගේ පාමුල හිසින් වැටී ආයුෂ්මත් අනඳ තෙරුන්ට තෙල බස් කීවුය: “වහන්ස, යම් බඳු මම මෙසේ කෙළෙම් වේ ද, බාල වූ පරිදි මූළ්‍හා වූ පරිදි අකුසල් වූ පරිදි ඒ වරද මා ඉක්ම ගියේ ය. වහන්ස, ආනන්ද හිමිහු ඒ මාගේ වරද වරද විසින් ආයතිසංවරය සඳහා පිළිගන්නා සේක්වා.

බුහුනණියෙනි, යම් තෝ මෙසේ කෙළෙහි නම් එබැවින් බාල වූ පරිදි මූළ්‍හා වූ පරිදි අකුසල් වූ පරිදි ඒ වරද නී ඉක්ම ගියේ ය බුහුනණියෙනි, යම් හෙයෙකින් තෝ වරද වරද විසින් දැක දහම් වූ පරිදි ප්‍රතික්‍රියා කෙරෙහි ද, නීගේ ඒ වරද අපි පිළිගණුම්හ. බුහුනණියෙනි, යමෙක් වරද වරද විසින් දැක දහම් පරිදි ප්‍රතික්‍රියා කෙරේ ද, මතු සංවරයට එළඹේ ද, තෙල ප්‍රතික්‍රියාව ආර්‍යවිනයයෙහි අභිවෘද්ධියෙක් මැයි.

## 4. 4. 1. 10.

## [සුගතවිනයසුත්තං]

10. සුගතො වා භික්ඛවෙ ලොකෙ තිට්ඨමානො සුගතවිනයො වා තදස්ස බහුජනහිතාය බහුජනසුඛාය ලොකානුකම්පාය අත්ථාය හිතාය සුඛාය දෙවමනුස්සානං.

කතමො ච භික්ඛවෙ සුගතො? ඉධ භික්ඛවෙ තථාගතො ලොකෙ උප්පජ්ජති අරහං සම්මාසම්බුද්ධො විජ්ජාචරණසම්පන්නො සුගතො ලොකවිදූ අනුත්තරො පුරිසදම්මසාරථී සත්ථා දෙවමනුස්සානං බුද්ධො භගවා. අයං භික්ඛවෙ සුගතො.

කතමො ච භික්ඛවෙ සුගතවිනයො? සො ධම්මං දෙසෙති ආදිකල්‍යාණං මජ්ඣෙකල්‍යාණං පරියොසානකල්‍යාණං සාත්ථං සබ්‍යඤ්ජනං කෙවලපරිපුණ්ණං පරිසුද්ධං බ්‍රහ්මචරියං පකාසෙති. අයං භික්ඛවෙ සුගතවිනයො

එවං සුගතො වා භික්ඛවෙ ලොකෙ තිට්ඨමානො සුගතවිනයො වා තදස්ස බහුජනහිතාය බහුජනසුඛාය ලොකානුකම්පාය අත්ථාය හිතාය සුඛාය දෙව-මනුස්සානන්ති.

චත්තාරොමෙ භික්ඛවෙ ධම්මා සද්ධම්මස්ස සම්මොසාය අන්තරධානාය සංවත්තන්ති. කතමෙ චත්තාරො?

ඉධ භික්ඛවෙ භික්ඛූ දුග්ගහිතං සුත්තන්තං පරියාපුණන්ති දුන්නික්ඛිත්තෙහි පදබ්‍යඤ්ජනෙහි. දුන්නික්ඛිත්තස්ස භික්ඛවෙ පදබ්‍යඤ්ජනස්ස අත්ථො'පි දුන්නයො හොති. අයං භික්ඛවෙ පඨමො ධම්මො සද්ධම්මස්ස සම්මොසාය අන්තරධානාය සංවත්තති.

පුන ච පරං භික්ඛවෙ භික්ඛූ දුබ්බචා හොන්ති දොවචස්සකරණෙහි ධම්මෙහි සමන්නාගතා අක්ඛමා අප්පදක්ඛිණග්ගාහිනො අනුසාසනිං. අයං භික්ඛවෙ දුතියො ධම්මො සද්ධම්මස්ස සම්මොසාය අන්තරධානාය සංවත්තති.

පුන ච පරං භික්ඛවෙ යෙ තෙ භික්ඛූ බහුස්සුතා ආගතාගමා ධම්මධරා විනයධරා මාතිකාධරා. තෙ න සක්කච්චං සුත්තන්තං පරං වාචෙන්ති තෙසං අච්චයෙන ඡින්නමූලකො සුත්තන්තො හොති, අප්පටිසරණො. අයං භික්ඛවෙ තතියො ධම්මො සද්ධම්මස්ස සම්මොසාය අන්තරධානාය සංවත්තති.

## 4. 4. 1. 10.

## [ සුගතවිනය සූත්‍රය ]

10. මහණෙනි, සුගතයන් වහන්සේ වෙත්ව යි සුගතවිනය වේව යි ලෝකයෙහි පවත්තේ වේ නම් ඒ බොහෝ දෙනාට හිත පිණිස, බොහෝ දෙනාට සුඛ පිණිස, ලොවට අනුකම්පා පිණිස, දෙව් මිනිස්නට අර්ථ පිණිස, හිත පිණිස සුඛ පිණිස වෙයි. මහණෙනි, සුගතයන් වහන්සේ නම් කවරහුය යත්:

මහණෙනි, මෙ ලොව අර්හත්, සම්‍යක් සම්බුද්ධ, විද්‍යාචරණ සම්පන්න, සුගත, ලොකවිදූ, අනුත්තර පුරුෂදම්‍යසාරථී, දෙව් මිනිස්නට අනුශාසක, චතුස්-සත්‍යාවබොධ කළ, භාග්‍යවත්, තථාගතයන් වහන්සේ පහළ වන සේක. මහණෙනි, මේ සුගතයෝ නම් වෙති.

මහණෙනි, සුගතවිනය නම් කවරේ ය යත්: උන්වහන්සේ ආදිකල්‍යාණ කොට මධ්‍යකල්‍යාණ කොට පර්‍යවසාන කල්‍යාණ කොට සාර්ථ කොට සව්‍යඤ්ජන කොට කෙවල පරිපූර්ණ කොට දහම් දෙසනසේක. පරිශුද්ධ බ්‍රහ්මචර්‍යය දෙසන සේක. මහණෙනි, මේ සුගතවිනය නම් වේ.

මහණෙනි, මෙසේ සුගතයන් වහන්සේ වෙත්ව යි සුගත විනය වේව යි ලොව්හි සිටුනේ වේ නම් ඒ බොහෝ දෙනාට හිත පිණිස බොහෝ දෙනාට සුව පිණිස ලොවට අනුකම්පා පිණිස දෙව් මිනිස්නට අර්ථ පිණිස, හිත පිණිස සුව පිණිස වෙයි.

මහණෙනි, මේ සතර ධර්ම කෙනෙක් ශාසනයාගේ ප්‍රමොෂය (විනාශය) අන්තර්ධානය පිණිස වැටෙත්. කවර සතර කෙනෙක යත්:

මහණෙනි, මේ සස්නෙහි මහණහු වරදවා ගත් සූත්‍රාන්ත වරදවා ලූ පදව්‍යඤ්ජනයෙන් පිරිවහත්. මහණෙනි, වරදවා ලූ පදව්‍යඤ්ජනයාගේ අර්ථය ද දුර්නය වෙයි. මහණෙනි, මේ පළමුවන දහම් ශාසනයාගේ ප්‍රමොෂය පිණිස අන්තර්ධානය පිණිස වැටෙයි.

නවද මහණෙනි, මහණහු දුර්වචක (ඔවා නොගන්නෝ) වෙති. දෞර්වචස්‍යකරණ ධර්මයෙන් සමන්‍විගත වෙත්. අක්‍ෂම (ක්‍ෂමා නැත්තෝ) වෙත්. අනුසස්න ප්‍රදක්ෂිණා (ගෞරව) පූර්වක ව නොගන්නාහු වෙත්. මහණෙනි, මේ දෙවන දහම් ශාසනයාගේ ප්‍රමොෂය පිණිස අන්තර්ධානය පිණිස වැටෙයි.

නව ද මහණෙනි, යම් ඒ මහණහු බහුශ්‍රැත වෙත් ද, උගත් ආගම ඇති වෙත් ද, ධර්මධර වෙත් ද, විනයධර වෙත් ද, මාතෘකාධර වෙත් ද, ඔහු සකස් කොට සූත්‍රාන්ත පරා ලවා වාචනාමාර්ගයෙන් නො හදාරවත්. උන්ගේ ඇවෑමෙන් සූත්‍රාන්ත මුලුසුන් වෙයි. පිළිසරණ නැති වෙයි. මහණෙනි, මේ තෙවන දහම් ශාසනයාගේ ප්‍රමොෂය පිණිස අන්තර්ධානය පිණිස වැටෙයි.

පුන ච පරං භික්ඛවෙ ථෙරා භික්ඛූ බාහුලිකා හොන්ති සාථලිකා ඔක්කමනෙ පුබ්බඞ්ගමා පවිවෙකෙ නික්ඛිත්තධුරා. න විරියං ආරභන්ති අප්පත්තස්ස පත්තියා අනධිගතස්ස අධිගමාය අසච්ඡිකතස්ස සච්ඡිකිරියාය. තෙසං පච්ඡිමා ජනතා දිට්ඨානුගතිං ආපජ්ජති. සාපි හොති සාථලිකා බාහුලිකා ඔක්කමනෙ පුබ්බඞ්ගමා පවිවෙකෙ නික්ඛිත්තධුරා. න විරියං ආරභති අප්පත්තස්ස පත්තියා අනධිගතස්ස අධිගමාය අසච්ඡිකතස්ස සච්ඡිකිරියාය. අයං භික්ඛවෙ චතුත්ථො ධම්මො සද්ධම්මස්ස සම්මොසාය අන්තරධානාය සංවත්තති.

ඉමෙ ඛො භික්ඛවෙ චත්තාරො ධම්මා සද්ධම්මස්ස සම්මොසාය අන්තරධානාය සංවත්තන්තීති.

චත්තාරො මෙ භික්ඛවෙ ධම්මා සද්ධම්මස්ස ඨිතියා අසම්මොසාය අනන්තරධානාය සංවත්තන්ති. කතමෙ චත්තාරො?

ඉධ භික්ඛවෙ භික්ඛූ සුග්ගහිතං සුත්තන්තං පරියාපුණන්ති සුනික්ඛිත්තෙහි පදබ්‍යඤ්ජනෙහි. සුනික්ඛිත්තස්ස භික්ඛවෙ පදබ්‍යඤ්ජනස්ස අත්ථොපි සුනයො හොති. අයං භික්ඛවෙ පඨමො ධම්මො සද්ධම්මස්ස ඨිතියා අසම්මොසාය අනන්තරධානාය සංවත්තති.

පුන ච පරං භික්ඛවෙ භික්ඛූ සුබ්බචා හොන්ති සොවචස්සකරණෙහි ධම්මෙහි සමන්නාගතා ඛමා පදක්ඛිණග්ගාහිනො අනුසාසනිං. අයං භික්ඛවෙ දුතියො ධම්මො සද්ධම්මස්ස ඨිතියා අසම්මොසාය අනන්තරධානාය සංවත්තති.

පුන ච පරං භික්ඛවෙ යෙ තෙ භික්ඛූ බහුස්සුතා ආගතාගමා ධම්මධරා විනයධරා මාතිකාධරා. තෙ සක්කච්චං සුත්තන්තං පරං වාචෙන්ති. තෙසං අච්චයෙන නච්ඡින්නමූලකො සුත්තන්තො හොති සප්පටිසරණො. අයං භික්ඛවෙ තතියො ධම්මො සද්ධම්මස්ස ඨිතියා අසම්මොසාය අනන්තරධානාය සංවත්තති.

පුන ච පරං භික්ඛවෙ ථෙරා භික්ඛූ න බාහුලිකා හොන්ති න සාථලිකා ඔක්කමනෙ නික්ඛිත්තධුරා පවිවෙකෙ පුබ්බඞ්ගමා. විරියං ආරභන්ති අප්පත්තස්ස පත්තියා අනධිගතස්ස අධිගමාය අසච්ඡිකතස්ස සච්ඡිකිරියාය. තෙසං පච්ඡිමා ජනතා දිට්ඨානුගතිං ආපජ්ජති. සාපි හොති න බාහුලිකා න සාථලිකා ඔක්කමනෙ නික්ඛිත්තධුරා පවිවෙකෙ පුබ්බඞ්ගමා. විරියං ආරභති අප්පත්තස්ස පත්තියා අනධිගතස්ස අධිගමාය අසච්ඡිකතස්ස සච්ඡිකිරියාය. අයං භික්ඛවෙ චතුත්ථො ධම්මො සද්ධම්මස්ස ඨිතියා අසම්මොසාය අනන්තරධානාය සංවත්තති.

ඉමෙ ඛො භික්ඛවෙ චත්තාරො ධම්මා සද්ධම්මස්ස ඨිතියා අසම්මොසාය අනන්තරධානාය සංවත්තන්තීති.

**ඉන්ද්‍රියවග්ගො පඨමො.**

---

තස්සුද්දානං:- ඉන්ද්‍රියානි සද්ධා පඤ්ඤා - සතිසංඛාන පඤ්චමං
කප්පා රොගා පරිහානි - භික්ඛුනී සුගතෙන චාති

Free Distribution www.aathaapi.org

තවද මහණෙනි, ස්ථවිර භික්ෂූහු බහුල පස පිණ්ඩපිළිපන්හු වෙත්. ශික්ෂා-ශාසනය ලිහිල් කොට ගණිත්. පඤ්චනීවරණ පූරණයෙහි පෙරදූරි වෙත් ප්‍රවිවේකයෙහි (භාවනායෙහි) හළ වැර ඇති වෙත්. නොපැමිණි ඵලයාගේ පැමිණීම පිණිස නොලත් ඵලයාගේ ලැබීම පිණිස පසක් නොකළ ඵලයාගේ පසක් කිරීම පිණිස වීය්‍ය්‍යාරම්භ නො කෙරත්. පශ්චිම ජනතාව ඔවුන්ගේ දෘෂ්ටානුගතියට (ඔවුන් අනුව යාමට) පැමිණේ. ඒ ජනතාව ද බාහුලික සාථලික වේ. නීවරණ දහම්හි පෙරගැමි වෙයි. ප්‍රවිවේකයෙහි හළ වැර ඇති වෙයි. නොලත් පල ලබනු සඳහා නොවිඳි පල විඳිනු සඳහා පසක් නොකළ පල පසක් කරණු සඳහා වැර ඇරඹිලි නො කෙරෙයි. මහණෙනි, මේ සතරවන දහම සසුන් නස්නා සඳහා අතුරුදහන් සඳහා වැටෙයි.

මහණෙනි, මෙ සතර ධර්මයෝ ශාසනයාගේ ප්‍රමොෂය පිණිස අනන්තර්ධානය පිණිස වැටෙත්.

මහණෙනි, මේ සතර ධර්ම කෙනෙක් ශාසනයාගේ ස්ථිතිය පිණිස අසම්මෝෂය පිණිස අතුරුදන් නොවීම පිණිස වැටෙත්. කවර සතර ධර්ම කෙනෙක යත්:

මහණෙනි, මෙසස්නෙහි මහණහු මොනොවට උගන්නා ලද සූත්‍රාන්ත මොනොවට උගත් පදව්‍යඤ්ජනයෙන් පිරිවහත්. මහණෙනි, මොනොවට තබන ලද පදව්‍යඤ්ජනයාගේ අර්ථය ද සුගම වෙයි. මහණෙනි, මේ පළමුවන දහම ශාසනයාගේ ස්ථිතිය පිණිස අසම්මෝෂය (පැවැත්ම) පිණිස අතුරුදන් නොවීම පිණිස වැටෙයි.

තවද මහණෙනි, මහණහු සුවච වෙති. සුවච බව කරණ දහම්හ් සමන්වාගත වෙත්. ක්ෂම වෙත්. අනුසස්න ප්‍රදක්ෂිණාපූර්වකව ගන්නාහු වෙත්. මහණෙනි, මේ දෙවන දහම ශාසනයාගේ ස්ථිතිය පිණිස අසම්මෝෂය පිණිස අතුරුදන් නොවීම පිණිස වැටෙයි.

තවද මහණෙනි, යම් ඒ මහණහු බහුශ්‍රැත වෙත් ද, උගත් ආගම ඇති වෙත්ද, ධර්මධර වෙත් ද, විනයධර වෙත් ද, මාතෘකාධර වෙත් ද, ඔහු සකස් කොට පරු ලවා වාචනාමාර්ගයෙන් සූත්‍රාන්ත හදාරවත්. ඔවුන්ගේ ඇවෑමෙන් සූත්‍රාන්ත මුලුසුන් නො වෙයි. පිළිසරණ ඇත්තේ වෙයි. මහණෙනි, මේ තෙවන දහම ශාසනයාගේ ස්ථිතිය පිණිස, අසම්මෝෂය පිණිස, අතුරුදන් නොවීම පිණිස වැටෙයි.

තවද මහණෙනි, ස්ථවිර භික්ෂූහු ප්‍රත්‍යයබාහුල්‍යය නැත්තෝ වෙත්. ශික්ෂාශාසනය ලිහිල් කොට නො ගණිත් පඤ්චනීවරණයන්හි බැහැර ධූර ඇත්තෝ වෙත්. ප්‍රවිවේකයෙහි පූර්වඞ්ගම වෙති. අප්‍රාප්තඵලයාගේ ප්‍රාප්තිය පිණිස අනධිගතඵලයාගේ අධිගමය පිණිස අසාක්ෂාත්කෘතඵලයාගේ සාක්ෂාත්කාරය පිණිස වීය්‍ය්‍යාරම්භ කෙරෙත්. පශ්චිම ජනතාව ඔවුන්ගේ දෘෂ්ටානුගතියට පැමිණේ. ඒ ජනතාව ද බාහුලික නො වේ. සාථලික නො වේ. නීවරණ දහම්හි බැහැර කළ ධූර ඇති වෙයි. ප්‍රවිවේකයෙහි පෙරගැමි වෙයි. නොලත් ඵල ලබනු සඳහා නොවිඳි ඵල විඳිනු සඳහා පසක් නොකළ ඵල පසක් කරණු සඳහා වැර ඇරඹිලි කෙරෙයි. මහණෙනි, මේ සතර වන දහම සසුන් පැවැත්ම සඳහා නො නස්නා සඳහා අතුරුදන් නොවීම සඳහා වැටෙයි.

මහණෙනි, මේ සතර ධර්මයෝ ශාසනයාගේ ස්ථිතිය පිණිස අසම්මෝෂය පිණිස අතුරුදන් නොවීම පිණිස වැටෙත්.

**ඉන්ද්‍රියවර්ගය පළමුවැනි යි.**

# 2. පටිපදාවග්ගො

## 4. 4. 2. 1

## [ පටිපදාසුත්තං ]

**[සාවත්ථිනිදානං]**

11. චතස්සො ඉමා භික්ඛවෙ පටිපදා, කතමා චතස්සො?

දුක්ඛාපටිපදා දන්ධාභිඤ්ඤා, දුක්ඛාපටිපදා ඛිප්පාභිඤ්ඤා, සුඛාපටිපදා දන්ධාභිඤ්ඤා, සුඛාපටිපදා ඛිප්පාභිඤ්ඤා. ඉමා ඛො භික්ඛවෙ චතස්සො පටිපදාති.

## 4. 4. 2. 2.

## [ දුතියපටිපදාසුත්තං ]

12. චතස්සො ඉමා භික්ඛවෙ පටිපදා. කතමා චතස්සො?

දුක්ඛාපටිපදා දන්ධාභිඤ්ඤා, දුක්ඛාපටිපදා ඛිප්පාභිඤ්ඤා, සුඛාපටිපදා දන්ධාභිඤ්ඤා, සුඛාපටිපදා ඛිප්පාභිඤ්ඤා,

කතමා ච භික්ඛවෙ දුක්ඛාපටිපදා දන්ධාභිඤ්ඤා? ඉධ භික්ඛවෙ එකච්චො පකතියාපි තිබ්බරාගජාතිකො හොති. අභික්ඛණං රාගජං දුක්ඛං දොමනස්සං පටිසංවෙදෙති. පකතියාපි තිබ්බදොසජාතිකො හොති. අභික්ඛණං දොසජං දුක්ඛං දොමනස්සං පටිසංවෙදෙති. පකතියාපි තිබ්බමොහජාතිකො හොති. අභික්ඛණං මොහජං දුක්ඛං දොමනස්සං පටිසංවෙදෙති. තස්සිමානි පඤ්චින්ද්‍රියානි මුදූනි පාතුභවන්ති: සද්ධින්ද්‍රියං විරියින්ද්‍රියං සතින්ද්‍රියං සමාධින්ද්‍රියං පඤ්ඤින්ද්‍රියං. සො ච ඉමෙසං පඤ්චන්නං ඉන්ද්‍රියානං මුදුත්තා දන්ධං ආනන්තරියං පාපුණාති ආසවානං ඛයාය. අයං වුච්චති භික්ඛවෙ දුක්ඛාපටිපදා දන්ධාභිඤ්ඤා.

කතමා ච භික්ඛවෙ දුක්ඛාපටිපදා ඛිප්පාභිඤ්ඤා? ඉධ භික්ඛවෙ එකච්චො පකතියාපි තිබ්බරාගජාතිකො හොති. අභික්ඛණං රාගජං දුක්ඛං දොමනස්සං පටිසංවෙදෙති. පකතියාපි තිබ්බදොසජාතිකො හොති. අභික්ඛණං දොසජං දුක්ඛං දොමනස්සං පටිසංවෙදෙති. පකතියාපි තිබ්බමොහජාතිකො හොති. අභික්ඛණං මොහජං දුක්ඛං දොමනස්සං පටිසංවෙදෙති. තස්සිමානි පඤ්චින්ද්‍රියානි අධිමත්තානි පාතුභවන්ති: සද්ධින්ද්‍රියං විරියින්ද්‍රියං සතින්ද්‍රියං සමාධින්ද්‍රියං පඤ්ඤින්ද්‍රියං. සො ඉමෙසං පඤ්චන්නං ඉන්ද්‍රියානං අධිමත්තත්තා ඛිප්පං ආනන්තරියං පාපුණාති ආසවානං ඛයාය. අයං වුච්චති භික්ඛවෙ දුක්ඛාපටිපදා ඛිප්පාභිඤ්ඤා.

## 2. ප්‍රතිපදා වර්ගය

### 4. 4. 2. 1.

### [ ප්‍රතිපදා සූත්‍රය ]

[සැවැත්නිදාන යි]

11. මහණෙනි, මේ ප්‍රතිපත් සතරෙකි. කවර සතරෙක යත්:

දුක් වූ පිළිවෙත් ඇති දන්ධ (ගුරුබැවින් ලැසි) වූ අභිඥා (අවබෝධ) ඇති එකෙක. දුක් වූ පිළිවෙත් ඇති ක්ෂිප්‍ර (ශීඝ්‍ර) වූ අභිඥා ඇති එකෙක. සුවපිළිවෙත් ඇති දන්ධ වූ අභිඥා ඇති එකෙක. සුවපිළිවෙත් ඇති ක්ෂිප්‍ර වූ අභිඥා ඇති එකෙක. මහණෙනි, මේ ප්‍රතිපත් සතර යි.

### 4. 4. 2. 2

### [ දෙවැනි ප්‍රතිපදා සූත්‍රය ]

12. මහණෙනි, මේ ප්‍රතිපත් සතරෙකි. කවර සතරෙක යත්:

දුක් වූ පිළිවෙත් ඇති ලැසි අභිඥා ඇති එකෙක. දුක් වූ පිළිවෙත් ඇති ශීඝ්‍ර අභිඥා ඇති එකෙක. සුව පිළිවෙත් ඇති ලැසි අභිඥා ඇති එකෙක. සුව පිළිවෙත් ඇති ශීඝ්‍රාභිඥා ඇති එකෙක.

මහණෙනි, දුක් පිළිවෙත් ඇති දන්ධාභිඥා නම් කවර ? මහණෙනි, මෙසස්නෙහි ඇතැමෙක් සැහැවින් ම තීව්‍ර (තියුණු) රාග ඇති වෙයි. නිතර රාගයෙන් හටගත් දුක් දොම්නස් විඳියි. සැහැවින් ම තීව්‍ර ද්වෙෂ ඇති වෙයි. නිතර ද්වෙෂයෙන් හටගත් දුක් දොම්නස් විඳියි. සැහැවින් ම තීව්‍ර මොහ ඇති වෙයි. නිතර මොහයෙන් හටගත් දුක් දොම්නස් විඳියි. ඔහුට ශ්‍රද්ධෙන්ද්‍රිය ය වීර්‍ය්‍යෙන්ද්‍රිය ය ස්මෘතීන්ද්‍රිය ය සමාධීන්ද්‍රිය ය ප්‍රඥෙන්ද්‍රිය ය යන මේ පඤ්චෙන්ද්‍රියයෝ මෘදු වූවාහු පහළ වෙත්. හෙ ද මේ පඤ්චෙන්ද්‍රිය-යන්ගේ මෘදුභාවයෙන් ආස්‍රවක්ෂය පිණිස ආනන්තරික (අතර නැති එකක්ෂණික) මාර්ගසමාධියට ලැසි ව පැමිණේ. මහණෙනි, මේ දුක් වූ පිළිවෙත් ඇති ලැසි අභිඥා යි කියනු ලැබේ.

මහණෙනි, දුක් වූ පිළිවෙත් ඇති ශීඝ්‍ර අභිඥා නම් කවර ? මහණෙනි, මෙ සස්නෙහි ඇතැමෙක් සැහැවින් ම තීව්‍ර රාගප්‍රකෘතික වෙයි. නිතර රාගයෙන් උපන් දුක් දොම්නස් විඳියි. සැහැවින් ම තීව්‍ර ද්වෙෂප්‍රකෘතික වෙයි. නිතර ද්වෙෂයෙන් හටගත් දුක් දොම්නස් විඳියි. සැහැවින් ම තීව්‍ර මෝහප්‍රකෘතික වෙයි. නිතර මෝහයෙන් හටගත් දුක් දොම්නස් විඳියි. ඔහුට ශ්‍රද්ධෙන්ද්‍රිය ය, වීර්‍ය්‍යෙන්ද්‍රිය ය, ස්මෘතීන්ද්‍රිය ය, සමාධීන්ද්‍රිය ය, ප්‍රඥෙන්ද්‍රිය ය යන මේ පඤ්චෙන්ද්‍රියයෝ අධිමාත්‍ර වූවාහු පහළ වෙත්. හේ මේ පඤ්චෙන්ද්‍රියයන්ගේ අධිමාත්‍රතායෙන් ආස්‍රවක්ෂය පිණිස ආනන්තරික මාර්ගසමාධියට ශීඝ්‍ර ව පැමිණේ. මහණෙනි, මේ දුක්පිළිවෙත් ඇති ක්ෂිප්‍රාභිඥා යි කියනු ලැබේ.

කතමා ච භික්ඛවෙ සුඛාපටිපදා දන්ධාභිඤ්ඤා? ඉධ භික්ඛවෙ එකච්චො පකතියාපි න තිබ්බරාගජාතිකො හොති. නාභික්ඛණං රාගජං දුක්ඛං දොමනස්සං පටිසංවෙදෙති. පකතියාපි න තිබ්බදොසජාතිකො හොති. නාභික්ඛණං දොසජං දුක්ඛං දොමනස්සං පටිසංවෙදෙති. පකතියාපි න තිබ්බමොහජාතිකො හොති. නාභික්ඛණං මොහජං දුක්ඛං දොමනස්සං පටිසං-වෙදෙති. තස්සිමානි පඤ්චින්ද්‍රියානි මුදූනි පාතුභවන්ති: සද්ධින්ද්‍රියං -පෙ- පඤ්ඤින්ද්‍රියං. සො ඉමෙසං පඤ්චන්නං ඉන්ද්‍රියානං මුදුත්තා දන්ධං ආනන්තරියං පාපුණාති ආසවානං ඛයාය. අයං වුච්චති භික්ඛවෙ සුඛාපටිපදා දන්ධාභිඤ්ඤා.

කතමා ච භික්ඛවෙ සුඛාපටිපදා ඛිප්පාභිඤ්ඤා? ඉධ භික්ඛවෙ එකච්චො පුග්ගලො පකතියාපි න තිබ්බරාගජාතිකො හොති. නාභික්ඛණං රාගජං දුක්ඛං දොමනස්සං පටිසංවෙදෙති. පකතියාපි න තිබ්බදොසජාතිකො හොති. නාභික්ඛණං දොසජං දුක්ඛං දොමනස්සං පටිසංවෙදෙති, පකතියාපි න තිබ්බමොහජාතිකො හොති. නාභික්ඛණං මොහජං දුක්ඛං දොමනස්සං පටිසං-වෙදෙති. තස්සිමානි පඤ්චින්ද්‍රියානි අධිමත්තානි පාතුභවන්ති: සද්ධින්ද්‍රියං විරියින්ද්‍රියං සතින්ද්‍රියං සමාධින්ද්‍රියං පඤ්ඤින්ද්‍රියං. සො ඉමෙසං පඤ්චන්නං ඉන්ද්‍රියානං අධිමත්තත්තා ඛිප්පං ආනන්තරියං පාපුණාති ආසවානං ඛයාය. අයං වුච්චති භික්ඛවෙ සුඛාපටිපදා ඛිප්පාභිඤ්ඤා

ඉමා ඛො භික්ඛවෙ චතස්සො පටිපදාති.

## 4. 4. 2. 3.

## [තතියපටිපදාසුත්තං]

13. චතස්සො ඉමා භික්ඛවෙ පටිපදා. කතමා චතස්සො?

දුක්ඛාපටිපදා දන්ධාභිඤ්ඤා, දුක්ඛාපටිපදා ඛිප්පාභිඤ්ඤා, සුඛාපටිපදා දන්ධාභිඤ්ඤා, සුඛාපටිපදා ඛිප්පාභිඤ්ඤා.

කතමා ච භික්ඛවෙ දුක්ඛාපටිපදා දන්ධාභිඤ්ඤා? ඉධ භික්ඛවෙ භික්ඛු අසුභානුපස්සී කායෙ විහරති ආහාරෙ පටික්කූලසඤ්ඤී සබ්බලොකෙ අනභිරතසඤ්ඤී සබ්බසඞ්ඛාරෙසු අනිච්චානුපස්සී. මරණසඤ්ඤා ඛො පනස්ස අජ්ඣත්තං සූපට්ඨිතා හොති. සො ඉමානි පඤ්ච සෙඛබලානි උපනිස්සාය විහරති: සද්ධාබලං හිරිබලං ඔත්තප්පබලං විරියබලං පඤ්ඤාබලං. තස්සිමානි පඤ්චින්ද්‍රියානි මුදූනි පාතුභවන්ති: සද්ධින්ද්‍රියං විරියින්ද්‍රියං සතින්ද්‍රියං සමාධින්ද්‍රියං පඤ්ඤින්ද්‍රියං. සො ඉමෙසං පඤ්චන්නං ඉන්ද්‍රියානං මුදුත්තා දන්ධං ආනන්තරියං පාපුණාති ආසවානං ඛයාය. අයං වුච්චති භික්ඛවෙ දුක්ඛාපටිපදා දන්ධාභිඤ්ඤා.

මහණෙනි, සුව පිළිවෙත් ඇති ලැසි අභිඥ නම් කවර? මහණෙනි, මෙසස්නෙහි ඇතැමෙක් සැහැවින් ම තීව්‍ර රාගප්‍රකෘතික නො වෙයි. නිතර රාගයෙන් හටගත් දුක් දෙම්නස් නො විඳියි. සැහැවින් ම තීව්‍ර ද්වෙෂප්‍රකෘතික නො වෙයි. නිතර ද්වෙෂයෙන් හටගත් දුක් දෙම්නස් නො විඳියි. සැහැවින් ම තීව්‍ර මොහප්‍රකෘතික නො වෙයි. නිතර මොහයෙන් හටගත් දුක් දෙම්නස් නො විඳියි. ඔහුට ශ්‍රද්ධෙන්ද්‍රිය ය.... ප්‍රඥෙන්ද්‍රිය ය යන මේ පඤ්චෙන්ද්‍රියයෝ මෘදු වූවාහු පහළ වෙති. හේ මේ පඤ්චෙන්ද්‍රියයන්ගේ මෘදුතායෙන් ආශ්‍රවක්ෂය පිණිස ආනන්තරික මාර්ගසමාධියට ලැසි ව පැමිණේ. මහණෙනි, මේ සුව පිළිවෙත් ඇති ලැසි අභිඥ යි කියනු ලැබේ.

මහණෙනි, සුව පිළිවෙත් ඇති ශීඝ්‍ර අභිඥ නම් කවර? මහණෙනි, මෙසස්නෙහි ඇතැම් පුද්ගලෙක් සැහැවින් ම තීව්‍ර රාගප්‍රකෘතික නො වෙයි. නිතර රාගයෙන් හටගත් දුක් දෙම්නස් නො විඳියි. සැහැවින් ම තීව්‍ර ද්වෙෂප්‍රකෘතික නො වෙයි. නිතර ද්වෙෂයෙන් හටගත් දුක් දෙම්නස් නො විඳියි. සැහැවින් ම තීව්‍ර මොහප්‍රකෘතික නො වෙයි. නිතර මොහයෙන් හටගත් දුක් දෙම්නස් නො විඳියි. ඔහුට ශ්‍රද්ධෙන්ද්‍රිය ය වීර්‍යෙන්ද්‍රිය ය ස්මෘතීන්ද්‍රිය ය සමාධීන්ද්‍රිය ය ප්‍රඥෙන්ද්‍රිය ය යන මේ පඤ්චෙන්ද්‍රියයෝ අධිමාත්‍ර වූවාහු පහළ වෙත්. හේ මේ පඤ්චෙන්ද්‍රියයන්ගේ අධිමාත්‍රතායෙන් ආශ්‍රවක්ෂය පිණිස ආනන්තරික මාර්ගසමාධියට වහා පැමිණේ. මහණෙනි, මේ සුව පිළිවෙත් ඇති ශීඝ්‍ර අභිඥ යි කියනු ලැබේ

මහණෙනි, මේ සතර ප්‍රතිපත් ය.

## 4 4 2. 3.

## [ තෙවැනි ප්‍රතිපද සූත්‍රය ]

13. මහණෙනි, මේ ප්‍රතිපත් සතරෙකි. කවර සතරෙක යත්:

දුක්ඛාපටිපදා දන්ධාභිඤ්ඤා ය, දුක්ඛාපටිපදා ඛිප්පාභිඤ්ඤා ය, සුඛාපටිපදා දන්ධාභිඤ්ඤා ය, සුඛාපටිපදා ඛිප්පාභිඤ්ඤා යි.

මහණෙනි, දුක්ඛාපටිපදා දන්ධාභිඤ්ඤා කවර? මහණෙනි, මෙසස්නෙහි මහණ තමාගේ කරජකායයෙහි අශුභානුදර්ශී වූයේ කවලීකාරාහාරයෙහි පිළිකුල් යි යන සංඥ ඇත්තේ, මුළුලොවෙහි උකටලී සංඥ ඇත්තේ, සියලු සංස්කාරයන් විෂයයෙහි අනිත්‍යානුදර්ශී වූයේ වෙසෙසි. ඔහුගේ සිත්හි මරණසංඥව මැනවින් එළඹ සිටියේ වෙයි. හේ ශ්‍රද්ධාබල ය, හ්‍රීබල ය, අපත්‍රපාබල ය, වීර්‍යබල ය, ප්‍රඥබල ය ද යි මේ පස්වූ ශෛක්‍ෂබලයන් ඇසුරු කොට වෙසෙසි. ඔහුට මේ ශ්‍රද්ධෙන්ද්‍රිය ය, වීර්‍යෙන්ද්‍රිය ය, ස්මෘතීන්ද්‍රිය ය, සමාධීන්ද්‍රිය ය ප්‍රඥෙන්ද්‍රිය ය යන මේ පඤ්චෙන්ද්‍රියයෝ මෘදු වූවාහු පහළ වෙති. හේ මේ පඤ්චෙන්ද්‍රියයන්ගේ මෘදු බැවින් ආශ්‍රවක්ෂය පිණිස ආනන්තරික මාර්ගසමාධියට ලැසි ව පැමිණේ. මහණෙනි, මේ දුක්ඛාපටිපදා දන්ධාභිඤ්ඤා යි කියනු ලැබේ.

කතමා ච භික්ඛවෙ දුක්ඛාපටිපදා ඛිප්පාභිඤ්ඤා? ඉධ භික්ඛවෙ භික්ඛු අසුභානුපස්සී කායෙ විහරති ආහාරෙ පටික්කූලසඤ්ඤී සබ්බලොකෙ අනභිරතසඤ්ඤී සබ්බසඞ්ඛාරෙසු අනිච්චානුපස්සී. මරණසඤ්ඤා ඛො පනස්ස අජ්ඣත්තං සූපට්ඨිතා හොති. සො ඉමානි පඤ්ච සෙඛබලානි උපනිස්සාය විහරති: සද්ධාබලං හිරිබලං ඔත්තප්පබලං විරියබලං පඤ්ඤාබලං. තස්සිමානි පඤ්චින්ද්‍රියානි අධිමත්තානි පාතුභවන්ති: සද්ධින්ද්‍රියං විරියින්ද්‍රියං සතින්ද්‍රියං සමාධින්ද්‍රියං පඤ්ඤින්ද්‍රියං. සො ඉමෙසං පඤ්චන්නං ඉන්ද්‍රියානං අධිමත්තත්තා ඛිප්පං ආනන්තරියං පාපුණාති ආසවානං ඛයාය. අයං වුච්චති භික්ඛවෙ දුක්ඛාපටිපදා ඛිප්පාභිඤ්ඤා

කතමා ච භික්ඛවෙ සුඛාපටිපදා දන්ධාභිඤ්ඤා? ඉධ භික්ඛවෙ භික්ඛු විවිච්චෙව කාමෙහි විවිච්ච අකුසලෙහි ධම්මෙහි සවිතක්කං සවිචාරං විවෙකජං පීතිසුඛං පඨමං ඣානං උපසම්පජ්ජ විහරති. විතක්කවිචාරානං වූපසමා අජ්ඣත්තං සම්පසාදනං චෙතසො එකොදීභාවං අවිතක්කං අවිචාරං සමාධිජං පීතිසුඛං දුතියං ඣානං උපසම්පජ්ජ විහරති. පීතියා ච විරාගා උපෙක්ඛකො ච විහරති සතො ච සම්පජානො, සුඛඤ්ච කායෙන පටිසංවෙදෙති යං තං අරියා ආචික්ඛන්ති 'උපෙක්ඛකො සතිමා සුඛවිහාරී'ති තතියං ඣානං උපසම්පජ්ජ විහරති. සුඛස්ස ච පහානා දුක්ඛස්ස ච පහානා පුබ්බෙව සොමනස්ස-දොමනස්සානං අත්ථඞ්ගමා අදුක්ඛං අසුඛං උපෙක්ඛාසතිපාරිසුද්ධිං චතුත්ථං ඣානං උපසම්පජ්ජ විහරති. සො ඉමානි පඤ්ච සෙඛබලානි උපනිස්සාය විහරති: සද්ධාබලං හිරිබලං ඔත්තප්පබලං විරියබලං පඤ්ඤාබලං. තස්සිමානි පඤ්චින්ද්‍රියානි මුදූනි පාතුභවන්ති: සද්ධින්ද්‍රියං විරියින්ද්‍රියං සතින්ද්‍රියං සමාධින්ද්‍රියං පඤ්ඤින්ද්‍රියං. සො ඉමෙසං පඤ්චන්නං ඉන්ද්‍රියානං මුදුත්තා දන්ධං ආනන්තරියං පාපුණාති ආසවානං ඛයාය. අයං වුච්චති භික්ඛවෙ සුඛාපටිපදා දන්ධාභිඤ්ඤා.

කතමා ච භික්ඛවෙ සුඛාපටිපදා ඛිප්පාභිඤ්ඤා? ඉධ භික්ඛවෙ භික්ඛු විවිච්චෙව කාමෙහි විවිච්ච අකුසලෙහි ධම්මෙහි සවිතක්කං සවිචාරං විවෙකජං පීතිසුඛං පඨමං ඣානං උපසම්පජ්ජ විහරති -පෙ- දුතියං ඣානං. -පෙ- තතියං ඣානං -පෙ- චතුත්ථං ඣානං උපසම්පජ්ජ විහරති. සො ඉමානි පඤ්ච සෙඛබලානි උපනිස්සාය විහරති: සද්ධාබලං හිරිබලං ඔත්තප්පබලං විරියබලං පඤ්ඤාබලං. තස්සිමානි පඤ්චින්ද්‍රියානි අධිමත්තානි පාතුභවන්ති: සද්ධින්ද්‍රියං විරියින්ද්‍රියං සතින්ද්‍රියං සමාධින්ද්‍රියං පඤ්ඤින්ද්‍රියං. සො ඉමෙසං පඤ්චන්නං ඉන්ද්‍රියානං අධිමත්තත්තා ඛිප්පං ආනන්තරියං පාපුණාති ආසවානං ඛයාය. අයං වුච්චති භික්ඛවෙ සුඛාපටිපදා ඛිප්පාභිඤ්ඤා.

ඉමා ඛො භික්ඛවෙ චතස්සො පටිපදාති.

මහණෙනි, දුක්ඛාපටිපදා ඛිප්පාභිඤ්ඤා නම් කවර? මහණෙනි, මෙසස්නෙහි මහණ කයෙහි අශුභයන් නුවණින් දක්නාසුලු වූයේ, ආහාරෙහි පිළිකුල් සංඥා ඇත්තේ, සව්ලොවෙහි උකටලී සංඥා ඇත්තේ, සව්සංස්කාරයන් විෂයයෙහි අනිත්‍යය නුවණින් බලනසුලු වූයේ වෙසෙසි. ඔහුගේ සිත්හි මරණසංඥාව මොනොවට එළඹ සිටියේ වෙයි. හේ ශ්‍රද්ධාබල ය, හ්‍රීබල ය, අපත්‍රපාබල ය, වීර්‍ය්‍යබල ය, ප්‍රඥාබල ය දැයි මේ පඤ්ච ශෛක්ෂබලයන් ඇසුරු කොට වෙසෙසි. ඔහුට ශ්‍රද්ධෙන්ද්‍රිය ය, වීර්‍ය්‍යෙන්ද්‍රිය ය, ස්මෘතීන්ද්‍රිය ය, සමාධීන්ද්‍රිය ය ප්‍රඥෙන්ද්‍රිය ය යන මේ පඤ්චෙන්ද්‍රියයෝ අධිමාත්‍ර වූවාහු පහළ වෙති. හේ මේ පඤ්චෙන්ද්‍රියයන්ගේ අධිමාත්‍රතායෙන් ආස්‍රවක්ෂය පිණිස ආනන්තරික-මාර්ගසමාධියට ශීඝ්‍ර ව පැමිණේ. මහණෙනි, මේ දුක්ඛාපටිපදා ඛිප්පාභිඤ්ඤා යි කියනු ලැබේ.

මහණෙනි, සුඛාපටිපදා දන්ධාභිඤ්ඤා නම් කවර? මහණෙනි, මෙසස්නෙහි මහණ කාමයන්ගෙන් වෙන් ව ම අකුසල් දහමින් වෙන් ව ම විතර්ක සහිත වූ විචාර සහිත වූ විවේකයෙන් උපන් ප්‍රීති හා සුඛ ඇති ප්‍රථමධ්‍යානයට පැමිණ වෙසේ. විතර්කවිචාරයන්ගේ ව්‍යුපශමයෙන් ආධ්‍යාත්මයෙහි පැහැදීම ඇති සිතෙහි එකඟබව ඇති විතර්ක රහිත වූ විචාර රහිත වූ සමාධියෙන් උපන් ප්‍රීතිසුඛ ඇති ද්විතීයධ්‍යානයට පැමිණ වෙසේ. ප්‍රීතියගේ ද විරාගයෙන් උපෙක්ෂා ඇත්තේ ස්මෘතිමත් වූයේ සම්‍යක් ප්‍රඥා ඇත්තේ වෙසෙසි. කයින් සුව ද විඳියි. 'උපෙක්ෂා ඇතියේ ස්මෘතිමත් වූයේ සුඛවිහාරියෙකි' යි ආර්‍ය්‍යයෝ යම් ඒ පුද්ගලයා පවසත් ද, ඒ තෘතීයධ්‍යානයට පැමිණ වෙසෙසි. සුඛයාගේ ප්‍රහාණයෙන් ද දුඃඛයාගේ ප්‍රහාණයෙන් ද කැල ම සොම්නස්දොම්නස් දෙක නැතිවී යාමෙන් අදුඃඛ වූ අසුඛ වූ උපෙක්ෂාවිසින් කළ ස්මෘතිපාරිශුද්ධි ඇති චතුර්ථධ්‍යානයට පැමිණ වෙසේ. හේ මේ ශ්‍රද්ධාබල, හ්‍රීබල, අපත්‍රපාබල, වීර්‍ය්‍යබල, ප්‍රඥාබල දැයි පඤ්ච ශෛක්ෂබලයන් ඇසුරු කොට වෙසෙසි. ඔහුට ශ්‍රද්ධෙන්ද්‍රිය ය, වීර්‍ය්‍යෙන්ද්‍රිය ය ස්මෘතීන්ද්‍රිය ය, සමාධීන්ද්‍රිය ය, ප්‍රඥෙන්ද්‍රිය ය යන මේ පඤ්චෙන්ද්‍රියයෝ මෘදු වූවාහු පහළ වෙත්. හේ මේ පඤ්චෙන්ද්‍රිය-යන්ගේ මෘදුබවයෙන් ආස්‍රවක්ෂය පිණිස ආනන්තරික මාර්ගසමාධියට ලැසි ව පැමිණේ මහණෙනි, මේ සුඛාපටිපදා දන්ධාභිඤ්ඤා යි කියනු ලැබේ.

මහණෙනි, සුඛාපටිපදා ඛිප්පාභිඤ්ඤා නම් කවර? මහණෙනි, මෙසස්නෙහි මහණ කාමයන්ගෙන් වෙන් ව ම අකුසල්දහමින් වෙන් ව ම සවිතර්ක වූ සවිචාර වූ විවේකයෙන් උපන් ප්‍රීති හා සුඛ ඇති ප්‍රථමධ්‍යානයට පැමිණ වෙසේ. ද්විතියධ්‍යානයට... තෘතීයධ්‍යානයට... චතුර්ථධ්‍යානයට පැමිණ වෙසේ. හේ සද්ධාබල, හිරිබල, ඔත්තප්පබල, විරියබල, පඤ්ඤාබල යන මේ පඤ්ච ශෛක්ෂබලයන් ඇසුරු කොට වෙසේ. ඔහුට සද්ධින්ද්‍රිය, විරියින්ද්‍රිය, සතින්ද්‍රිය, සමාධින්ද්‍රිය, පඤ්ඤින්ද්‍රිය යන මේ පඤ්චෙන්ද්‍රියයෝ අධිමාත්‍ර ව පහළ වෙත්. හේ මේ පඤ්චෙන්ද්‍රියයන්ගේ අධිමාත්‍රතායෙන් ආස්‍රවක්ෂය පිණිස ආනන්තරික මාර්ගසමාධියට ශීඝ්‍ර ව පැමිණේ. මහණෙනි, මේ සුඛාපටිපදා ඛිප්පාභිඤ්ඤා යි කියනු ලැබේ.

මහණෙනි, මේ සතර ප්‍රතිපදාවෝ වෙති.

Free Distribution www.aathaapi.org

## 4. 4. 2. 4.

## [ චතුත්ථපටිපදාසුත්තං ]

14. චතස්සො ඉමා භික්ඛවෙ පටිපදා. කතමා චතස්සො?

අක්ඛමා පටිපදා, ඛමා පටිපදා, දමා පටිපදා, සමා පටිපදා.

කතමා ච භික්ඛවෙ අක්ඛමා පටිපදා? ඉධ භික්ඛවෙ එකච්චො පුග්ගලො අක්කොසන්තං පච්චක්කොසති. රොසන්තං පටිරොසති. භණ්ඩන්තං පටිභණ්ඩති. අයං වුච්චති භික්ඛවෙ අක්ඛමා පටිපදා.

කතමා ච භික්ඛවෙ ඛමා පටිපදා? ඉධ භික්ඛවෙ එකච්චො පුග්ගලො අක්කොසන්තං න පච්චක්කොසති. රොසන්තං න පටිරොසති. භණ්ඩන්තං න පටිභණ්ඩති. අයං වුච්චති භික්ඛවෙ ඛමා පටිපදා.

කතමා ච භික්ඛවෙ දමා පටිපදා? ඉධ භික්ඛවෙ භික්ඛු චක්ඛුනා රූපං දිස්වා න නිමිත්තග්ගාහී හොති, නානුබ්‍යඤ්ජනග්ගාහී. යත්වාධිකරණමෙනං චක්ඛුන්ද්‍රියං අසංවුතං විහරන්තං අභිජ්ඣා දොමනස්සා පාපකා අකුසලා ධම්මා අන්වාස්සවෙය්‍යුං, තස්ස සංවරාය පටිපජ්ජති. රක්ඛති චක්ඛුන්ද්‍රියං. චක්ඛුන්ද්‍රියෙ සංවරං ආපජ්ජති. සොතෙන සද්දං සුත්වා -පෙ- ඝානෙන ගන්ධං ඝායිත්වා-පෙ- ජිව්හාය රසං සායිත්වා-පෙ-කායෙන ඵොට්ඨබ්බං ඵුසිත්වා -පෙ- මනසා ධම්මං විඤ්ඤාය න නිමිත්තග්ගාහී හොති, නානුබ්‍යඤ්ජනග්ගාහී. යත්වාධිකරණමෙනං මනින්ද්‍රියං අසංවුතං විහරන්තං අභිජ්ඣා දොමනස්සා පාපකා අකුසලා ධම්මා අන්වාස්සවෙය්‍යුං, තස්ස සංවරාය පටිපජ්ජති. රක්ඛති මනින්ද්‍රියං. මනින්ද්‍රියෙ සංවරං ආපජ්ජති. අයං වුච්චති භික්ඛවෙ දමා පටිපදා.

කතමා ච භික්ඛවෙ සමා පටිපදා? ඉධ භික්ඛවෙ භික්ඛු උප්පන්නං කාමවිතක්කං නාධිවාසෙති පජහති විනොදෙති සමෙති බ්‍යන්තීකරොති අනභාවං ගමෙති. උප්පන්නං බ්‍යාපාදවිතක්කං -පෙ- උප්පන්නං විහිංසා-විතක්කං -පෙ- උප්පන්නුප්පන්නෙ පාපකෙ අකුසලෙ ධම්මෙ නාධිවාසෙති පජහති විනොදෙති සමෙති ව්‍යන්තීකරොති අනභාවං ගමෙති. අයං වුච්චති භික්ඛවෙ සමා පටිපදා.

ඉමා ඛො භික්ඛවෙ චතස්සො පටිපදාති.

## 4. 4. 2. 4.

## [ සිවුවැනි ප්‍රතිපදා සූත්‍රය ]

14. මහණෙනි, මේ ප්‍රතිපදාවෝ සතර දෙනෙකි. කවර සතර දෙනෙක යත්:

අනධිවාසනා (නො ඉවසීම්) සඞ්ඛ්‍යාත අක්ඛමා පටිපදා ය, අධිවාසනා (ඉවසීම්) සඞ්ඛ්‍යාත ඛමා පටිපදා ය, (ඉන්ද්‍රියදමන සඞ්ඛ්‍යාත) දමා පටිපදා ය, (අකුශලවිතර්කයන්ගේ ව්‍යපශම සඞ්ඛ්‍යාත) සමා පටිපදා යි.

මහණෙනි, අක්ඛමා පටිපදා නම් කවර යත්: මහණෙනි, මෙලොව ඇතැම් පුද්ගලයෙක් ආක්‍රොෂ කරන්නහුට පෙරළා ආක්‍රොෂ කෙරෙයි. සටන්නහුට පෙරළා සටයි. පහර දෙන්නහුට පෙරළා පහර දෙයි. මහණෙනි, මේ අක්ඛමා පටිපදා නමි.

මහණෙනි, ඛමා පටිපදා නම් කවර ? මහණෙනි, මෙලොව ඇතැම් පුද්ගලයෙක් ආක්‍රොෂ කරන්නහුට වටාලා ආක්‍රොෂ නො කෙරෙයි. සටන්නහුට වටාලා නො සටයි. පහර දෙන්නහුට වටාලා නො ම පහර දෙයි. මහණෙනි, මේ ඛමා පටිපදා නමි.

මහණෙනි, දමා පටිපදා නම් කවර ? මහණෙනි, මෙසස්නෙහි මහණෙක් ඇසින් රූ දැක නිමිත්තග්‍රාහී නො වෙයි. අනුව්‍යඤ්ජනග්‍රාහී නො ද වෙයි. යම් හෙයෙකින් චක්ෂුරින්ද්‍රිය අසංවෘත කොට වසන තෙල මහණහු අභිධ්‍යා දෞර්මනස්‍ය සඞ්ඛ්‍යාත ලාමු දහම්හු ලුහුබැඳ එද්ද, එහි සංවරය පිණිස පිළිපදී. චක්ෂුරින්ද්‍රිය රකියි. චක්ෂුරින්ද්‍රියයෙහි සංවරයට පැමිණේ. කණින් ශබ්ද අසා ... නැහැයෙන් ගඳ අසා ... දිවෙන් රස විඳ ... කයින් පහස පැහැසැ ... සිතින් දහම් දැන නිමිත්තග්‍රාහී නො වේ. අනුව්‍යඤ්ජනග්‍රාහී නො ද වේ. යම් හෙයෙකින් මනින්ද්‍රිය ය අසංවෘත කොට වසන තෙල මහණහු අභිධ්‍යා දෞර්මනස්‍ය සඞ්ඛ්‍යාත ලාමු දහම්හු ලුහුබැඳ එද්ද, එහි සංවරය පිණිස පිළිපදී. මනින්ද්‍රියය රක්නේ මනින්ද්‍රියයෙහි සංවරයට පැමිණේ. මහණෙනි, මේ දමා පටිපදා යී කියනු ලැබේ.

මහණෙනි, සමා පටිපදා නම් කවර ? මහණෙනි, මෙසස්නෙහි මහණෙක් උපන් කාමවිතර්ක සිත්හි නො වසවයි, දුරු කෙරේ, බැහැර කෙරේ, සමනය කෙරේ, පිරිසිඳ ලයි, අභාවයට පමුණුව යි. උපන් ව්‍යාපාද-විතර්කය ... උපන් විහිංසාවිතර්කය ... උපනුපන් ලාමු අකුසලදහම් සිත්හි නො වසවයි, දුරු කෙරේ, බැහැර කෙරේ, සමනය කෙරේ, විගතාන්ත කෙරේ, අනභාවයට පමුණුවයි. 'මහණෙනි, මේ සමා පටිපදා යි කියනු ලැබේ.

මහණෙනි, මේ සතර ප්‍රතිපදාවෝ යි.

## 4. 4. 2. 5.

### [ පඤ්චමපටිපදාසුත්තං ]

15. චතස්සො ඉමා භික්ඛවෙ පටිපදා. කතමා චතස්සො? අක්ඛමා පටිපදා, ඛමා පටිපදා, දමා පටිපදා, සමා පටිපදා.

කතමා ච භික්ඛවෙ අක්ඛමා පටිපදා? ඉධ භික්ඛවෙ එකච්චො අක්ඛමො හොති සීතස්ස උණ්හස්ස ජිඝච්ඡාය පිපාසාය ඩංසමකසවාතාතප-සිරිංසපසම්ඵස්සානං. දුරුත්තානං දුරාගතානං වචනපථානං, උප්පන්නානං සාරීරිකානං වෙදනානං දුක්ඛානං තිබ්බානං ඛරානං කටුකානං අසාතානං අමනාපානං පාණහරානං අනධිවාසිකජාතිකො හොති. අයං වුච්චති භික්ඛවෙ අක්ඛමා පටිපදා.

කතමා ච භික්ඛවෙ ඛමා පටිපදා? ඉධ භික්ඛවෙ එකච්චො ඛමො හොති සීතස්ස උණ්හස්ස -පෙ- අධිවාසිකජාතිකො හොති. අයං වුච්චති භික්ඛවෙ ඛමා පටිපදා.

කතමා ච භික්ඛවෙ දමා පටිපදා? ඉධ භික්ඛවෙ භික්ඛු චක්ඛුනා රූපං දිස්වා න නිමිත්තග්ගාහී හොති -පෙ- සොතෙන සද්දං සුත්වා -පෙ- ඝානෙන ගන්ධං ඝායිත්වා -පෙ- ජිව්හාය රසං සායිත්වා -පෙ- කායෙන ඵොට්ඨබ්බං ඵුසිත්වා -පෙ- මනසා ධම්මං විඤ්ඤාය න නිමිත්තග්ගාහී හොති නානුබ්‍යඤ්ජ-නග්ගාහී. යත්වාධිකරණමෙනං මනින්ද්‍රියං අසංවුතං විහරන්තං අභිජ්ඣා දොමනස්සා පාපකා අකුසලා ධම්මා අන්වාස්සවෙය්‍යුං තස්ස සංවරාය පටිපජ්ජති. රක්ඛති මනින්ද්‍රියං. මනින්ද්‍රියෙ සංවරං ආපජ්ජති. අයං වුච්චති භික්ඛවෙ දමා පටිපදා.

කතමා ච භික්ඛවෙ සමා පටිපදා? ඉධ භික්ඛවෙ භික්ඛු උප්පන්නං කාමවිතක්කං නාධිවාසෙති පජහති විනොදෙති සමෙති බ්‍යන්තීකරොති අනභාවං ගමෙති. උප්පන්නං බ්‍යාපාදවිතක්කං -පෙ- උප්පන්නං විහිංසා-විතක්කං -පෙ- උප්පන්නුප්පන්නෙ පාපකෙ අකුසලෙ ධම්මෙ නාධිවාසෙති පජහති විනොදෙති සමෙති බ්‍යන්තීකරොති අනභාවං ගමෙති. අයං වුච්චති භික්ඛවෙ සමා පටිපදා.

ඉමා ඛො භික්ඛවෙ චතස්සො පටිපදාති.

## 4. 4. 2. 6.

### [ ඡට්ඨපටිපදාසුත්තං ]

16. චතස්සො ඉමා භික්ඛවෙ පටිපදා. කතමා චතස්සො?

දුක්ඛාපටිපදා දන්ධාභිඤ්ඤා, දුක්ඛාපටිපදා ඛිප්පාභිඤ්ඤා, සුඛාපටිපදා දන්ධාභිඤ්ඤා, සුඛාපටිපදා ඛිප්පාභිඤ්ඤා.

## 4. 4. 2. 5.

### [ පස්වැනි ප්‍රතිපදා සූත්‍රය ]

15. මහණෙනි, මේ ප්‍රතිපදාවෝ සතර දෙනෙකි. කවර සතර දෙනෙක යත්:

අක්ඛමා පටිපදා ය, ඛමා පටිපදා ය, දමා පටිපදා ය, සමා පටිපදා යි.

මහණෙනි, අක්ඛමා පටිපදා නම් කවර ? මහණෙනි, මෙලොව ඇතැම් පුද්ගලයෙක් ශීත උෂ්ණ බඩසය පවස මැසි මදුරු වා අව් දිග්දඟැ යන මොවුන්ගේ පහස් නොඉවසන්නේ වෙයි. නපුරු කොට කීණු නපුරු කොට පැමිණි වචනයන් ද, දුක් වූ තීව්‍ර වූ ඛර වූ කටුක වූ අමධුර වූ අමනාප වූ ප්‍රාණහර වූ ශරීරසන්නිශ්‍රිත වේදනාවන් නොඉවසන සැහැවි ඇත්තේ වෙයි. මහණෙනි, මේ අක්ඛමා පටිපදා ය යි කියනු ලැබේ.

මහණෙනි, ඛමා පටිපදා නම් කවර ? මහණෙනි, මෙලොව ඇතැම් පුද්ගලයෙක් ශීතය උෂ්ණය ඉවසන්නේ වෙයි. ... ඉවසන සැහැවි ඇත්තේ වෙයි. මහණෙනි, මේ ඛමා පටිපදා ය යි කියනු ලැබේ.

මහණෙනි, දමා පටිපදා නම් කවර ? මහණෙනි, මෙසස්නෙහි මහණෙක් ඇසින් රූ දැක නිමිති නොගන්නාසුලු වෙයි... කණින් ශබ්ද අසා .. නැහැයෙන් ගඳ අසා ... දිවින් රස විඳ ... කයින් පහස වැද .. සිතින් දහම් දැන නිමිති නොගන්නාසුලු වෙයි. අනුව්‍යඤ්ජන නොගන්නාසුලු වෙයි. යම් හෙයෙකින් මනින්ද්‍රිය අසංවෘත කොට වසන තෙල මහණහු අභිධ්‍යාදෞර්මනස්‍ය සඞ්ඛ්‍යාත පාපක අකුශලධර්මයෝ ලුහුබැඳ ගණිත් ද, එහි සංවරය පිණිස පිළිපදී. මනින්ද්‍රිය රක්නේ මනින්ද්‍රියයෙහි සංවරයට පැමිණේ. මහණෙනි, මේ දමා පටිපදාය යි කියනු ලැබේ.

මහණෙනි, සමා පටිපදා නම් කවර ? මහණෙනි, මෙසස්නෙහි මහණෙක් උපන් කාමවිතර්ක නො ඉවසයි, දුරු කෙරේ, විනොදනය කෙරේ, සංසිඳුවයි, පිරිසිඳලයි, අනභාවයට පමුණුවයි. උපන් ව්‍යාපාද විතර්ක ... උපන් විහිංසාවිතර්ක .. උපනුපන් ලමු අකුසල දහම් නො ඉවසයි, දුරු කෙරේ, බැහැර කෙරේ, සංහිඳුවයි, විගතාන්ත කෙරේයි, අභාවයට යවයි. මහණෙනි, මේ සමා පටිපදා ය යි කියනු ලැබේ.

මහණෙනි, මේ සතර ප්‍රතිපදාවෝ යි.

## 4. 4. 2. 6.

### [ සවැනි ප්‍රතිපදා සූත්‍රය ]

16. මහණෙනි, මේ ප්‍රතිපදාවෝ සතර දෙනෙකි. කවර සතර දෙනෙක යත්:

දුක් වූ ප්‍රතිපදා ඇති ලැසි වූ අභිඥා ඇති එකෙක, දුක් වූ ප්‍රතිපදා ඇති ශීඝ්‍ර වූ අභිඥා ඇති එකෙක, සුඛ වූ ප්‍රතිපදා ඇති ලැසි අභිඥා ඇති එකෙක, සුඛ ප්‍රතිපදා ඇති ශීඝ්‍ර වූ අභිඥා ඇති එකෙක.

තත්‍ර භික්ඛවෙ යායං පටිපදා දුක්ඛා දන්ධාභිඤ්ඤා, අයං භික්ඛවෙ පටිපදා උභයෙනෙව හීනා අක්ඛායති. යම්පායං පටිපදා දුක්ඛා, ඉමිනාපයං හීනා අක්ඛායති. යම්පායං පටිපදා දන්ධා, ඉමිනාපයං හීනා අක්ඛායති. අයං භික්ඛවෙ පටිපදා උභයෙනෙව හීනා අක්ඛායති.

තත්‍ර භික්ඛවෙ යායං පටිපදා දුක්ඛා ඛිප්පාභිඤ්ඤා, අයං භික්ඛවෙ පටිපදා දුක්ඛත්තා හීනා අක්ඛායති.

තත්‍ර භික්ඛවෙ යායං පටිපදා සුඛා දන්ධාභිඤ්ඤා, අයං භික්ඛවෙ පටිපදා දන්ධත්තා හීනා අක්ඛායති.

තත්‍ර භික්ඛවෙ යායං පටිපදා සුඛා ඛිප්පාභිඤ්ඤා, අයං භික්ඛවෙ පටිපදා උභයෙනෙව පණීතා අක්ඛායති. යම්පායං පටිපදා සුඛා, ඉමිනාපයං පණීතා අක්ඛායති. යම්පායං පටිපදා ඛිප්පා, ඉමිනාපයං පණීතා අක්ඛායති. අයං භික්ඛවෙ පටිපදා උභයෙනෙව පණීතා අක්ඛායති.

ඉමා ඛො භික්ඛවෙ චතස්සො පටිපදාති.

## 4. 4. 2. 7.

## [ මොග්ගල්ලානපටිපදාසුත්තං ]

17. අථ ඛො ආයස්මා **සාරිපුත්තො** යෙනායස්මා **මහාමොග්ගල්ලානො** තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා ආයස්මතා මහාමොග්ගල්ලානෙන සද්ධිං සම්මොදි. සම්මොදනීයං කථං සාරාණීයං වීතිසාරෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නො ඛො ආයස්මා සාරිපුත්තො ආයස්මන්තං මහා-මොග්ගල්ලානං එතදවොච:

චතස්සො ඉමා ආවුසො මොග්ගල්ලාන පටිපදා. කතමා චතස්සො?

දුක්ඛාපටිපදා දන්ධාභිඤ්ඤා, දුක්ඛාපටිපදා ඛිප්පාභිඤ්ඤා, සුඛාපටිපදා දන්ධාභිඤ්ඤා, සුඛාපටිපදා ඛිප්පාභිඤ්ඤා. ඉමා ඛො ආවුසො චතස්සො පටිපදා.

ඉමාසං ආවුසො චතස්සන්නං පටිපදානං කතමං තෙ පටිපදං ආගම්ම ආසවෙහි චිත්තං විමුත්තන්ති?

චතස්සො ඉමා ආවුසො සාරිපුත්ත පටිපදා. කතමා චතස්සො?

දුක්ඛාපටිපදා දන්ධාභිඤ්ඤා, දුක්ඛාපටිපදා ඛිප්පාභිඤ්ඤා, සුඛාපටිපදා දන්ධාභිඤ්ඤා, සුඛාපටිපදා ඛිප්පාභිඤ්ඤා. ඉමා ඛො ආවුසො චතස්සො පටිපදා.

ඉමාසං ආවුසො චතස්සන්නං පටිපදානං යායං පටිපදා දුක්ඛා ඛිප්පා-භිඤ්ඤා, ඉමං මෙ පටිපදං ආගම්ම අනුපාදාය ආසවෙහි චිත්තං විමුත්තන්ති.

මහණෙනි, එහි ලා යම් මේ දුක් වූ දන්ධාභිඥ වූ ප්‍රතිපදාවක් වේ ද, මේ ප්‍රතිපදාව දෙපසින් ම හීන ය යි කියනු ලැබේ. යම් මේ ප්‍රතිපදාවක් දුක් වේ ද, මෙයිනුදු මේ ප්‍රතිපදාව හීන ය යි කියනු ලැබේ. යම් මේ ප්‍රතිපදාවක් දන්ධාභිඥ වේ ද, මෙයිනුදු මේ ප්‍රතිපදාව හීන ය යි කියනු ලැබේ. මහණෙනි, මේ ප්‍රතිපදාව මෙසේ දෙපසින් ම හීන ය යි කියනු ලැබේ.

මහණෙනි, එහි ලා දුක් වූ ඛිප්‍රාභිඥ වූ යම් මේ ප්‍රතිපදාවක් ඇද් ද, මහණෙනි, මේ ප්‍රතිපදාව දුක් බැවින් හීනය යි කියනු ලැබේ.

මහණෙනි, එහි ලා සුව වූ දන්ධාභිඥ වූ යම් මේ ප්‍රතිපදාවක් ඇද් ද, මහණෙනි, මේ ප්‍රතිපදාව දන්ධ බැවින් හීනය යි කියනු ලැබේ.

මහණෙනි, එහි ලා සුව වූ ඛිප්‍රාභිඥ වූ යම් මේ ප්‍රතිපදාවක් වේ ද, මේ ප්‍රතිපදාව දෙපසින් ම ප්‍රණීතය යි කියනු ලැබේ. යම් මේ ප්‍රතිපදාවක් සුව වේ ද, මෙයිනුදු මේ ප්‍රතිපදාව ප්‍රණීත ය යි කියනු ලැබේ. යම් මේ ප්‍රතිපදාවක් ඛිප්‍රාභිඥ වේ ද මෙයිනුදු මේ ප්‍රතිපදාව ප්‍රණීත ය යි කියනු ලැබේ. මහණෙනි, මෙසේ මේ ප්‍රතිපදාව දෙපසින් ම ප්‍රණීත ය යි කියනු ලැබේ.

මහණෙනි, මේ සතර ප්‍රතිපදාවෝ යි.

## 4. 4 2. 7.

## [ මොග්ගල්ලානසම්පද සූත්‍රය ]

17. එසඳ ආයුෂ්මත් සැරියුත් තෙරණුවෝ ආයුෂ්මත් මහමුගලන් තෙරණුවන් කරා එළඹියහ. එළඹ ආයුෂ්මත් මහමුගලන් තෙරණුවන් හා සතුටු වූහ සතුටට හේතු වූ සම්මරණීය වූ කථා කොට නිමවා එකත්පස්ව හුන්හ. එකත්පස් ව හුන් ආයුෂ්මත් සැරියුත් තෙරණුවෝ ආයුෂ්මත් මහමුගලන් තෙරණුවන්ට මෙය කීහ:

ඇවැත් මුගලනෙනි, මේ ප්‍රතිපදාවෝ සතර දෙනෙකි. කවර සතර දෙනෙක යත්:

දුක්ඛාපටිපදා දන්ධාභිඤ්ඤා ය, දුක්ඛාපටිපදා ඛිප්පාභිඤ්ඤා ය, සුඛාපටිපදා දන්ධාභිඤ්ඤා ය, සුඛාපටිපදා ඛිප්පාභිඤ්ඤා යි. ඇවැත්නි, මේ සතර ප්‍රතිපදාවෝ යි.

ඇවැත්නි, මේ සතර ප්‍රතිපදාවන් අතුරෙන් කවර ප්‍රතිපදාවකට පැමිණ තොපගේ සිත උපාදාන විසින් නො ගෙණ ආස්‍රවයන් කෙරෙන් මිදිනි ද?

ඇවැත් ශාරීපුත්‍රයෙනි, මේ ප්‍රතිපදාවෝ සතර දෙනෙකි. කවර සතර දෙනෙක යත්:

දුක්ඛාපටිපදා දන්ධාභිඤ්ඤා ය, දුක්ඛාපටිපදා ඛිප්පාභිඤ්ඤා ය, සුඛාපටිපදා දන්ධාභිඤ්ඤා ය, සුඛාපටිපදා ඛිප්පාභිඤ්ඤා යි. ඇවැත්නි, මේ සතර ප්‍රතිපදාවෝ යි.

ඇවැත්නි, මේ සතර ප්‍රතිපදාවන් අතුරෙන් තො සරස් ව ප්‍රතිවෙධ ගන්නා යම් මේ දුක් වූ ප්‍රතිපදාවක් වේ ද, ඛිප්‍රාභිඥ මේ ප්‍රතිපදාවට පැමිණ මාගේ සිත උපාදාන විසින් නො ගෙණ ආස්‍රවයන් කෙරෙන් මිදීන.

## 4. 4. 2. 8.

### [ සාරිපුත්තපටිපදාසුත්තං ]

18. අථ ඛො ආයස්මා **මහාමොග්ගල්ලානො** යෙනායස්මා **සාරිපුත්තො** තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා ආයස්මතා සාරිපුත්තෙන සද්ධිං සම්මොදි. සම්මොදනීයං කථං සාරාණීයං වීතිසාරෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නො ඛො ආයස්මා මහාමොග්ගල්ලානො ආයස්මන්තං සාරිපුත්තං එතදවොච:

චතස්සො ඉමා ආවුසො සාරිපුත්ත පටිපදා. කතමා චතස්සො:

දුක්ඛා පටිපදා දන්ධාභිඤ්ඤා, දුක්ඛා පටිපදා ඛිප්පාභිඤ්ඤා, සුඛා පටිපදා දන්ධාභිඤ්ඤා, සුඛා පටිපදා ඛිප්පාභිඤ්ඤා. ඉමා ඛො ආවුසො සාරිපුත්ත චතස්සො පටිපදා.

ඉමාසං ඛො ආවුසො චතස්සන්නං පටිපදානං කතමං තෙ පටිපදං ආගම්ම අනුපාදාය ආසවෙහි චිත්තං විමුත්තන්ති?

චතස්සො ඉමා ආවුසො මොග්ගල්ලාන පටිපදා. කතමා චතස්සො:

දුක්ඛා පටිපදා දන්ධාභිඤ්ඤා, දුක්ඛා පටිපදා ඛිප්පාභිඤ්ඤා, සුඛා පටිපදා දන්ධාභිඤ්ඤා, සුඛා පටිපදා ඛිප්පාභිඤ්ඤා. ඉමා ඛො ආවුසො චතස්සො පටිපදා.

ඉමාසං ඛො ආවුසො චතස්සන්නං පටිපදානං යායං පටිපදා සුඛා ඛිප්පාභිඤ්ඤා. ඉමං මෙ පටිපදං ආගම්ම අනුපාදාය ආසවෙහි චිත්තං විමුත්තන්ති.

## 4. 4. 2. 9.

### [ කිලෙසපරිනිබ්බානසුත්තං ]

19. චත්තාරොමෙ භික්ඛවෙ පුග්ගලා සන්තො සංවිජ්ජමානා ලොකස්මිං. කතමෙ චත්තාරො?

ඉධ භික්ඛවෙ එකච්චො පුග්ගලො දිට්ඨෙව ධම්මෙ සසඞ්ඛාරපරිනිබ්බායී හොති. ඉධ පන භික්ඛවෙ එකච්චො පුග්ගලො කායස්ස භෙදා සසඞ්ඛාරපරිනිබ්බායී හොති. ඉධ පන භික්ඛවෙ එකච්චො පුග්ගලො දිට්ඨෙව ධම්මෙ අසඞ්ඛාරපරිනිබ්බායී හොති. ඉධ පන භික්ඛවෙ එකච්චො පුග්ගලො කායස්ස භෙදා අසඞ්ඛාරපරිනිබ්බායී හොති.

## 4. 4 2. 8.

## [ සාරිපුත්තපටිපදා සූත්‍රය ]

18. එසඳ ආයුෂ්මත් **මහමුගලන්** තෙරණුවෝ ආයුෂ්මත් **සැරියුත්** තෙරණුවන් කරා එළඹියහ. එළඹ ආයුෂ්මත් සැරියුත් තෙරණුවන් හා සතුටු වූහ. සමෝදනයට හේතු වූ සාරාණීය වූ කථාව නිමවා එකත්පස්ව හුන්හ. එකත්පස්ව හුන් ආයුෂ්මත් මහමුගලන් තෙරණුවෝ ආයුෂ්මත් සැරියුත් තෙරණුවන්ට තෙල කීහ:

ඇවැත් ශාරීපුත්‍රයෙනි, මේ ප්‍රතිපදාවෝ සතර දෙනෙක. කවර සතර දෙනෙක යත්:

දුක්ඛා පටිපදා දන්ධාභිඤ්ඤා ය, දුක්ඛා පටිපදා ඛිප්පාභිඤ්ඤා ය, සුඛා පටිපදා දන්ධාභිඤ්ඤා ය, සුඛා පටිපදා ඛිප්පාභිඤ්ඤා යි. ඇවැත් ශාරීපුත්‍රයෙනි, මේ සතර ප්‍රතිපදාවෝ යි.

ඇවැත්නි, මේ සතර ප්‍රතිපදාවන් අතුරෙන් කවර ප්‍රතිපදාවකට පැමිණ තොපගේ සිත උපාදාන විසින් නො ගෙණ ආස්‍රවයන් කෙරෙන් මිදිනි ද ?

ඇවැත් මෞද්ගල්‍යායනයෙනි, මේ ප්‍රතිපදාවෝ සතර දෙනෙක. කවර සතර දෙනෙක යත්:

දුක්ඛා පටිපදා දන්ධාභිඤ්ඤා ය, දුක්ඛා පටිපදා ඛිප්පාභිඤ්ඤා ය, සුඛා පටිපදා දන්ධාභිඤ්ඤා ය. සුඛා පටිපදා ඛිප්පාභිඤ්ඤා යි. ඇවැත්නි, මේ සතර ප්‍රතිපදාවෝ යි.

ඇවැත්නි, මේ සතර ප්‍රතිපදාවන් අතුරෙන් යම් ඒ ප්‍රතිපදාවක් සුඛ වේ ද, ක්ෂිප්‍රාභිඥ වේ ද, මේ ප්‍රතිපදාවට පැමිණ මාගේ සිත උපාදාන විසින් නො ගෙණ ආස්‍රවයන් කෙරෙන් මිදිත.

## 4. 4. 2. 9

## [ කිලෙස පරිනිබ්බානසුත්‍රය ]

19. මහණෙනි, මේ පුද්ගලයෝ සතර දෙනෙක් ලෝකයෙහි විද්‍යමානයහ. කවර සතර දෙනෙක යත්:

මහණෙනි, මෙලොව ඇතැම් පුද්ගලයෙක් මෙලොව්හි ම සසංඛාර-පරිනිබ්බායි වෙයි. මහණෙනි, මෙලොව ඇතැම් පුද්ගලයෙක් කායභේදයෙන් මතුයෙහි සසංඛාරපරිනිබ්බායී වෙයි. මහණෙනි, මෙලොව ඇතැම් පුද්ගලයෙක් මෙලොව්හි ම අසංඛාරපරිනිබ්බායී වෙයි. මහණෙනි, මෙලොව ඇතැම් පුද්ගලයෙක් කායභේදයෙන් මතුයෙහි අසංඛාරපරිනිබ්බායී වෙයි

කථඤ්ච භික්ඛවෙ පුග්ගලො දිට්ඨෙව ධම්මෙ සසඞ්ඛාරපරිනිබ්බායී හොති? ඉධ භික්ඛවෙ භික්ඛු අසුභානුපස්සී කායෙ විහරති. ආහාරෙ පටික්කූලසඤ්ඤී. සබ්බලොකෙ අනභිරතසඤ්ඤී.[1] සබ්බසඞ්ඛාරෙසු අනිච්චානුපස්සී. මරණසඤ්ඤා ඛො පනස්ස අජ්ඣත්තං සූපට්ඨිතා හොති. සො ඉමානි පඤ්චසෙඛබලානි උපනිස්සාය විහරති: සද්ධාබලං හිරිබලං ඔත්තප්පබලං විරියබලං පඤ්ඤාබලං. තස්සිමානි පඤ්චින්ද්‍රියානි අධිමත්තානි පාතුභවන්ති: සද්ධින්ද්‍රියං විරියින්ද්‍රියං සතින්ද්‍රියං සමාධින්ද්‍රියං පඤ්ඤින්ද්‍රියං. සො ඉමෙසං පඤ්චන්නං ඉන්ද්‍රියානං අධිමත්තත්තා දිට්ඨෙව ධම්මෙ සසඞ්ඛාරපරිනිබ්බායී හොති. එවං ඛො භික්ඛවෙ පුග්ගලො දිට්ඨෙව ධම්මෙ සසඞ්ඛාරපරිනිබ්බායී හොති.

කථඤ්ච භික්ඛවෙ පුග්ගලො කායස්ස භෙදා සසඞ්ඛාරපරිනිබ්බායී හොති? ඉධ භික්ඛවෙ භික්ඛු අසුභානුපස්සී කායෙ විහරති. ආහාරෙ පටික්කූලසඤ්ඤී. සබ්බලොකෙ අනභිරතසඤ්ඤී. සබ්බසඞ්ඛාරෙසු අනිච්චානුපස්සී. මරණසඤ්ඤා ඛො පනස්ස අජ්ඣත්තං සූපට්ඨිතා හොති. සො ඉමානි පඤ්චසෙඛබලානි උපනිස්සාය විහරති: සද්ධාබලං හිරිබලං ඔත්තප්පබලං විරියබලං පඤ්ඤාබලං. තස්සිමානි පඤ්චින්ද්‍රියානි මුදූනි පාතුභවන්ති: සද්ධින්ද්‍රියං විරියින්ද්‍රියං සතින්ද්‍රියං සමාධින්ද්‍රියං පඤ්ඤින්ද්‍රියං. සො ඉමෙසං පඤ්චන්නං ඉන්ද්‍රියානං මුදුත්තා කායස්ස භෙදා සසඞ්ඛාරපරිනිබ්බායී හොති. එවං ඛො භික්ඛවෙ පුග්ගලො කායස්ස භෙදා සසඞ්ඛාරපරිනිබ්බායී හොති.

කථඤ්ච භික්ඛවෙ පුග්ගලො දිට්ඨෙව ධම්මෙ අසඞ්ඛාරපරිනිබ්බායී හොති? ඉධ භික්ඛවෙ භික්ඛු විවිච්චෙව කාමෙහි -පෙ- චතුත්ථං ඣානං උපසම්පජ්ජ විහරති. සො ඉමානි පඤ්චසෙඛබලානි උපනිස්සාය විහරති: සද්ධාබලං හිරිබලං ඔත්තප්පබලං විරියබලං පඤ්ඤාබලං. තස්සිමානි පඤ්චින්ද්‍රියානි අධිමත්තානි පාතුභවන්ති: සද්ධින්ද්‍රියං විරියින්ද්‍රියං සතින්ද්‍රියං සමාධින්ද්‍රියං පඤ්ඤින්ද්‍රියං. සො ඉමෙසං පඤ්චන්නං ඉන්ද්‍රියානං අධිමත්තත්තා දිට්ඨෙව ධම්මෙ අසඞ්ඛාරපරිනිබ්බායී හොති. එවං ඛො භික්ඛවෙ පුග්ගලො දිට්ඨෙව ධම්මෙ අසඞ්ඛාරපරිනිබ්බායී හොති.

කථඤ්ච භික්ඛවෙ පුග්ගලො කායස්ස භෙදා අසඞ්ඛාරපරිනිබ්බායී හොති? ඉධ භික්ඛවෙ භික්ඛු විවිච්චෙව කාමෙහි -පෙ- චතුත්ථං ඣානං උපසම්පජ්ජ විහරති. සො ඉමානි පඤ්චසෙඛබලානි උපනිස්සාය විහරති: සද්ධාබලං හිරිබලං ඔත්තප්පබලං විරියබලං පඤ්ඤාබලං. තස්සිමානි පඤ්චින්ද්‍රියානි මුදූනි පාතුභවන්ති: සද්ධින්ද්‍රියං විරියින්ද්‍රියං සතින්ද්‍රියං සමාධින්ද්‍රියං පඤ්ඤින්ද්‍රියං. සො ඉමෙසං පඤ්චන්නං ඉන්ද්‍රියානං මුදුත්තා කායස්ස භෙදා අසඞ්ඛාරපරිනිබ්බායී හොති. එවං ඛො භික්ඛවෙ පුග්ගලො කායස්ස භෙදා අසඞ්ඛාරපරිනිබ්බායී හොති.

ඉමෙ ඛො භික්ඛවෙ චත්තාරො පුග්ගලා සන්තො සංවිජ්ජමානා ලොකස්මින්ති.

---

1. අනභිරතිසඤ්ඤී - මජසං.

Free Distribution www.aathaapi.org

මහණෙනි, කෙසේ පුද්ගල මෙලොව ම සසඞ්ඛාරපරිනිබ්බායී වේ ද? මහණෙනි, මෙ සස්නෙහි මහණ කයෙහි අශුභය නුවණින් දක්නේ ආහාරයෙහි පිළිකුල් සංඥ ඇත්තේ සියලු ලෝකයෙහි අනභිරතසංඥ ඇත්තේ සියලු සංස්කාරයෙහි අනිත්‍යය නුවණින් දක්නාසුලු වූයේ වෙසෙයි. ඔහුගේ සිත්හි මරණ සංඥව මැනවින් එළඹ සිටිනී වෙයි. හේ මේ පසැවසෙඛබලයන් ඇසුරු කොට වෙසෙයි: ශ්‍රද්ධාබල ය, හ්‍රීබල ය, අපත්‍රපාබල ය, වීර්‍ය්‍යබල ය, ප්‍රඥබල යි. ඔහුට මේ පසෙඞ්ද්‍රියයෝ අධිමාත්‍ර ව පහළවෙත්: ශ්‍රද්ධෙන්ද්‍රිය ය, වීර්‍ය්‍යෙන්ද්‍රිය ය, සමෘතීන්ද්‍රිය ය, සමාධීන්ද්‍රිය ය, ප්‍රඥෙන්ද්‍රිය යි. හේ මේ පසිඳුරන් අධිමාත්‍ර ව ඇතියෙන් මෙලොව ම සසඞ්ඛාර-පරිනිබ්බායී වෙයි. මහණෙනි, මෙසේ පුද්ගල මෙලොව ම සසඞ්ඛාර-පරිනිබ්බායී වෙයි.

මහණෙනි, කෙසේ පුද්ගල කායභේදයෙන් මතුයෙහි සසඞ්ඛාරපරිනිබ්බායී වේ ද? මහණෙනි, මෙසස්නෙහි මහණ කයෙහි අශුභය නුවණින් දක්නාසුලු වූයේ ආහාරයෙහි පිළිකුල් සත් ඇතියේ මුළුලොව නොඇලුනු සත් ඇතියේ සව්සකරෙහි අනිස නුවණින් දක්නාසුලු වූයේ වෙසෙයි. ඔහුට මරණසංඥව සිත තුළ සුපසැටිත වෙයි. හේ මේ පසැවශෛක්‍ෂබලයන් උපනිඃශ්‍රය කොට ගෙණ වෙසෙයි: ශ්‍රද්ධාබල ය, හ්‍රීබල ය, අපත්‍රපාබල ය, වීර්‍ය්‍යබල ය, ප්‍රඥබල යි. ඔහුට මේ පසෙඞ්න්ද්‍රියයෝ මෘදු ව වටහත්: ශ්‍රද්ධෙන්ද්‍රිය ය, වීර්‍ය්‍යෙන් ද්‍රිය ය, සමෘතීන්ද්‍රිය ය, සමාධීන්ද්‍රිය ය, ප්‍රඥෙන්ද්‍රිය යි. හේ මේ පසිඳුරන්ගේ මොළොක් බැවින් කායභේදයෙන් මතුයෙහි සසඞ්ඛාරපරිනිබ්බායී වෙයි. මහණෙනි, මෙසේ පුද්ගල කායභේදයෙන් සසඞ්ඛාරපරිනිබ්බායී වෙයි.

මහණෙනි, කෙසේ පුද්ගල මෙලොව ම අසඞ්ඛාරපරිනිබ්බායී වේ ද? මහණෙනි, මෙසස්නෙහි මහණ කාමයෙන් වෙන්ව ම ... චතුර්ථධ්‍යානයට පැමිණ වෙසෙයි හේ මේ පසැවශෛක්‍ෂබලයන් ඇසුරු කොට ගෙණ වෙසෙයි: ශ්‍රද්ධාබල ය, හ්‍රීබල ය, අපත්‍රපාබල ය, වීර්‍ය්‍යබල ය, ප්‍රඥබල යි ඔහුට මේ පසෙඞ්න්ද්‍රියයෝ අධිමාත්‍ර ව පහළ වෙත්: ශ්‍රද්ධෙන්ද්‍රිය ය, වීර්‍ය්‍යෙන්ද්‍රිය ය, සමෘතීන්ද්‍රිය ය, සමාධීන්ද්‍රිය ය, ප්‍රඥෙන්ද්‍රිය යි. හේ මේ පසිඳුරන් අධිමාත්‍ර බැවින් දිට්ඨධම්මයෙහි ම අසඞ්ඛාරපරිනිබ්බායී වේ. මහණෙනි, මෙසේ පුද්ගල ඉහාත්මයෙහි ම අසඞ්ඛාරපරිනිබ්බායී වෙයි.

මහණෙනි, කෙසේ පුද්ගල කායභේදයෙන් අසඞ්ඛාරපරිනිබ්බායී වේ ද? මහණෙනි, මෙසස්නෙහි මහණ කාමයෙන් වෙන්ව ම ... චතුර්ථධ්‍යානයට එළඹ වෙසෙයි. හේ මේ පසැවශෛක්‍ෂබලයන් ඇසුරු කොට ගෙණ වෙසෙයි: ශ්‍රද්ධාබල ය, හ්‍රීබල ය, අපත්‍රපාබල ය, වීර්‍ය්‍යබල ය, ප්‍රඥබල යි. ඔහුට මේ ප්‍රසෙඞ්න්ද්‍රියයෝ මෘදු ව පහළ වෙත්: ශ්‍රද්ධෙන්ද්‍රිය ය, වීර්‍ය්‍යෙන්ද්‍රිය ය, සමෘතීන්ද්‍රිය ය, සමාධීන්ද්‍රිය ය, ප්‍රඥෙන්ද්‍රිය යි. හේ මේ පසිඳුරන් මොළොක් බැවින් කායභේදයෙන් මතුයෙහි අසඞ්ඛාරපරිනිබ්බායී වෙයි. මහණෙනි, මෙසේ පුද්ගල කායභේදයෙන් මතුයෙහි අසඞ්ඛාරපරිනිබ්බායී වෙයි.

මහණෙනි, මේ පුද්ගලයෝ සතර දෙන ලෝකයෙහි විද්‍යමානයහ.

## 4. 4. 2. 10.

## [ අරහත්තපත්තිසුත්තං ]

20. එකං සමයං ආයස්මා **ආනන්දො කොසම්බියං** විහරති **ඝොසිතාරාමෙ.** තත්‍ර ඛො ආයස්මා ආනන්දො භික්ඛූ ආමන්තෙසි; ආවුසො භික්ඛවොති. ආවුසොති ඛො තෙ භික්ඛූ ආයස්මතො ආනන්දස්ස පච්චස්සොසුං. ආයස්මා ආනන්දො එතදවොච:

යො හි කොචි ආවුසො භික්ඛු වා භික්ඛුනී වා මම සන්තිකෙ අරහත්තප්පත්තිං ව්‍යාකරොති. සබ්බො සො චතූහි මග්ගෙහි, එතෙසං වා අඤ්ඤතරෙන. කතමෙහි චතූහි?

ඉධ ආවුසො භික්ඛු සමථපුබ්බඞ්ගමං විපස්සනං භාවෙති, තස්ස සමථපුබ්බඞ්ගමං විපස්සනං භාවයතො මග්ගො සඤ්ජායති. සො තං මග්ගං ආසෙවති භාවෙති බහුලීකරොති. තස්ස තං මග්ගං ආසෙවතො භාවයතො බහුලීකරොතො සඤ්ඤොජනා පහීයන්ති. අනුසයා ව්‍යන්තීහොන්ති.

පුන ච පරං ආවුසො භික්ඛු විපස්සනාපුබ්බඞ්ගමං සමථං භාවෙති, තස්ස විපස්සනාපුබ්බඞ්ගමං සමථං භාවයතො මග්ගො සඤ්ජායති. සො තං මග්ගං ආසෙවති භාවෙති බහුලීකරොති. තස්ස තං මග්ගං ආසෙවතො භාවයතො බහුලීකරොතො සඤ්ඤොජනා පහීයන්ති. අනුසයා ව්‍යන්තීහොන්ති.

පුන ච පරං අවුසො භික්ඛු සමථවිපස්සනං යුගනද්ධං භාවෙති. තස්ස සමථවිපස්සනං යුගනද්ධං භාවයතො මග්ගො සඤ්ජායති. සො තං මග්ගං ආසෙවති භාවෙති බහුලීකරොති. තස්ස තං මග්ගං ආසෙවතො භාවයතො බහුලීකරොතො සඤ්ඤොජනා පහීයන්ති. අනුසයා ව්‍යන්තීහොන්ති.

පුන ච පරං ආවුසො භික්ඛුනො ධම්මුද්ධච්චවිග්ගහීතං මානසං හොති. සො ආවුසො සමයො යන්තං චිත්තං අජ්ඣත්තංයෙව සන්තිට්ඨති සන්නිසීදති එකොදිභොති සමාධියති. තස්ස මග්ගො සඤ්ජායති. සො තං මග්ගං ආසෙවති භාවෙති බහුලීකරොති. තස්ස තං මග්ගං ආසෙවතො භාවයතො බහුලීකරොතො සඤ්ඤොජනා පහීයන්ති. අනුසයා ව්‍යන්තීහොන්ති.

යො හි කොචි ආවුසො භික්ඛු වා භික්ඛුනී වා මම සන්තිකෙ අරහත්තප්පත්තිං ව්‍යාකරොති, සබ්බො සො ඉමෙහි චතූහි මග්ගෙහි, එතෙසං වා අඤ්ඤතරෙනාති.

**පටිපදාවග්ගො දුතියො.**

## 4. 4. 2. 10

## [ අරහත්තපත්ති සූත්‍රය ]

20. එක්කලෙක ආයුෂ්මත් අනඳ තෙරණුවෝ කොසඹෑනුවර ඝෝෂිතාරාමයෙහි වැඩ වෙසෙති. එකල්හි ආයුෂ්මත් අනඳ තෙරණුවෝ “ඇවැත් මහණෙනි” යි භික්ෂූන් ඇමතූහ. ‘ඇවැත්නි’ යි ඒ භික්ෂූහු ආයුෂ්මත් අනඳ තෙරණුවන්ට පිළිවදන් ඇස්වූහ. ආයුෂ්මත් අනඳ තෙරණුවෝ තෙල ප්‍රකාශ කළහ:

ඇවැත්නි, යම් කිසි මහණෙක් හෝ වේවයි මෙහෙණක් හෝ වේවයි මා කෙරෙහි අර්හත්ත්වප්‍රාප්තිය පවසා ද, ඒ හැම සතර මගින් හෝ මොවුන් අතුරෙන් එක්තරු එකෙකින් හෝ වෙයි. කවර සතර මගින යත්:

ඇවැත්නි, මේසස්නෙහි මහණ සමථ පූර්වඞ්ගම කොට විවසුන් හවයි. සමථපූර්වඞ්ගම කොට විවසුන් වඩන උහුට ප්‍රථම ලෝකෝත්තර මාර්ගය උපදනේ ය. හේ එමග සෙවුනේ ය. වඩනේ ය. බහුල විසින් කරන්නේ ය. එමග සෙවුනා වඩනා බහුල විසින් කරණ ඔහට සංයෝජනයෝ ප්‍රහීණ වෙත්. අනුශයයෝ විගතාන්ත වෙත්.

තවද ඇවැත්නි, මහණ විදර්ශනා පූර්වඞ්ගම කොට සමථය වඩයි. විදර්ශනාපූර්වඞ්ගම කොට සමථය වඩන උහුට මාර්ගය උපදී. හේ එමග සෙවුනේ ය. වඩනේ ය. බහුල විසින් කරන්නේ ය. එමග සෙවුනා වඩනා බහුල විසින් කරණ ඔහට සංයෝජනයෝ ප්‍රහීණ වෙත්. අනුශයයෝ විගතාන්ත වෙත්.

තවද ඇවැත්නි, මහණ සමථ විදර්ශනා යුගනද්ධ කොට ගෙණ වඩයි. සමථ විදර්ශනා යුගනද්ධ කොට ගෙණ වඩන ඔහුට මාර්ගය උපදනේ ය. හේ එමග සෙවුනේ ය. වඩනේ ය. බහුල විසින් කරන්නේ ය. එමග සෙවුනා වඩනා බහුල විසින් කරණ ඔහට සංයෝජනයෝ ප්‍රහීණ වෙත්. අනුශයයෝ විගතාන්ත වෙත්.

තවද ඇවැත්නි, මහණහට සමථ විදර්ශනා ධර්මයෙහි දශෝපක්ලේශ සඞ්ඛ්‍යාත උද්ධතභාවයෙන් පෙළා ගත් අධිමානය වෙයි. ඇවැත්නි, යම් කලෙක ඒ විදර්ශනාවීථියට බැසගත් සිත ගොචර සඞ්ඛ්‍යාත ආධ්‍යාත්ම ආලම්බනයෙහි ම පිහිටා ද, සන්හිඳී ද, එකඟ වේ ද, සමාහිත වේ ද, එබඳු කාලයෙක් වෙයි. ඔහුට මාර්ගය උපදී. හේ එමග සෙවුනේ ය. වඩනේ ය. බහුල විසින් කරන්නේ ය. එමග සෙවුනා වඩනා බහුල විසින් කරණ ඔහට සංයෝජනයෝ ප්‍රහීණ වෙත්. අනුශයයෝ විගතාන්ත වෙත්.

ඇවැත්නි, යම් කිසි මහණෙක් වේවයි මෙහෙණක් වේවයි මා කෙරෙහි අර්හත්ත්වප්‍රාප්තිය පවසා ද, ඒ හැම මේ සතර මගින් හෝ මොවුනතුරෙන් එක්තරු එකෙකින් හෝ පවසත්.

**ප්‍රතිපදවර්ගය දෙවැනි යි.**

## 3. සඤ්චෙතනියවග්ගො

### 4. 4. 3 1.

### [ සඤ්චෙතනාසුත්තං ]

[සාවත්ථියං]

21. කායෙ වා භික්ඛවෙ සති කායසඤ්චෙතනාහෙතු උප්පජ්ජති අජ්ඣත්තං සුඛදුක්ඛං. වාචාය වා භික්ඛවෙ සති වචීසඤ්චෙතනාහෙතු උප්පජ්ජති අජ්ඣත්තං සුඛදුක්ඛං. මනෙ වා භික්ඛවෙ සති මනොසඤ්චෙතනාහෙතු උප්පජ්ජති අජ්ඣත්තං සුඛදුක්ඛං. අවිජ්ජාපච්චයා ච.

සාමං වා තං භික්ඛවෙ කායසඞ්ඛාරං අභිසඞ්ඛරොති, යං පච්චයාස්ස තං උප්පජ්ජති අජ්ඣත්තං සුඛදුක්ඛං. පරෙ වාස්ස තං භික්ඛවෙ කායසඞ්ඛාරං අභිසඞ්ඛරොන්ති, යං පච්චයාස්ස තං උප්පජ්ජති අජ්ඣත්තං සුඛදුක්ඛං. සම්පජානො වා තං භික්ඛවෙ කායසඞ්ඛාරං අභිසඞ්ඛරොති, යං පච්චයාස්ස තං උප්පජ්ජති අජ්ඣත්තං සුඛදුක්ඛං. අසම්පජානො වා තං භික්ඛවෙ කායසඞ්ඛාරං අභිසඞ්ඛරොති, යං පච්චයාස්ස තං උප්පජ්ජති අජ්ඣත්තං සුඛදුක්ඛං.

සාමං වා තං භික්ඛවෙ වචීසඞ්ඛාරං අභිසඞ්ඛරොති, යං පච්චයාස්ස තං උප්පජ්ජති අජ්ඣත්තං සුඛදුක්ඛං. පරෙ වාස්ස තං භික්ඛවෙ වචීසඞ්ඛාරං අභිසඞ්ඛරොන්ති, යං පච්චයාස්ස තං උප්පජ්ජති අජ්ඣත්තං සුඛදුක්ඛං. සම්පජානො වා තං භික්ඛවෙ වචීසඞ්ඛාරං අභිසඞ්ඛරොති, යං පච්චයාස්ස තං උප්පජ්ජති අජ්ඣත්තං සුඛදුක්ඛං. අසම්පජානො වා තං භික්ඛවෙ වචීසඞ්ඛාරං අභිසඞ්ඛරොති, යං පච්චයාස්ස තං උප්පජ්ජති අජ්ඣත්තං සුඛදුක්ඛං

සාමං වා තං භික්ඛවෙ මනොසඞ්ඛාරං අභිසඞ්ඛරොති, යං පච්චයාස්ස තං උප්පජ්ජති අජ්ඣත්තං සුඛදුක්ඛං. පරෙ වාස්ස තං භික්ඛවෙ මනොසඞ්ඛාරං අභිසඞ්ඛරොන්ති, යං පච්චයාස්ස තං උප්පජ්ජති අජ්ඣත්තං සුඛදුක්ඛං. සම්පජානො වා තං භික්ඛවෙ මනොසඞ්ඛාරං අභිසඞ්ඛරොති, යං පච්චයාස්ස තං උප්පජ්ජති අජ්ඣත්තං සුඛදුක්ඛං. අසම්පජානො වා තං භික්ඛවෙ මනොසඞ්ඛාරං අභිසඞ්ඛරොති, යං පච්චයාස්ස තං උප්පජ්ජති අජ්ඣත්තං සුඛදුක්ඛං

ඉමෙසු භික්ඛවෙ ධම්මෙසු අවිජ්ජා අනුපතිතා. අවිජ්ජායත්වෙව අසෙසවිරාගනිරොධා සො කායො න හොති, යං පච්චයාස්ස තං උප්පජ්ජති අජ්ඣත්තං සුඛදුක්ඛං. සා වාචා න හොති, යං පච්චයාස්ස තං උප්පජ්ජති අජ්ඣත්තං සුඛදුක්ඛං. සො මනො න හොති, යං පච්චයාස්ස තං උප්පජ්ජති අජ්ඣත්තං සුඛදුක්ඛං-

# 3. සඤ්චේතනිය වර්ගය

## 4. 4. 3. 1

## [සඤ්චේතනා සූත්‍රය]

### [සැවැත්නිදානයි]

21. මහණෙනි, කායවිඥප්තිය ඇතිවිට ම කායද්වාරයෙහි පැවැති කුශලාකුශල සඞ්ඛ්‍යාත චිංශත් සඤ්චේතනා හේතුයෙන් තමා තුළ සුව දුක් උපදනේ ය. මහණෙනි, වාග්විඥප්තිය ඇතිවිට ම වාග්ද්වාරයෙහි පැවැති කුශලාකුශල සඤ්චේතනා හේතුයෙන් තමා තුළ සුව දුක් උපදනේ ය. මහණෙනි, මනොද්වාරයෙහි පැවැති කුශලාකුශල සඤ්චේතනා හේතුයෙන් තමා තුළ සුව දුක් උපදනේ ය. අවිද්‍යා ප්‍රත්‍යයෙන් ම උපදි යි.

මහණෙනි, යමක් ප්‍රත්‍යය කොට ගෙණ ඔහට තමා තුළ සුව දුක් උපදනේ ද, තෙමේ ම හෝ ඒ කායසංස්කාර අභිසංස්කරණය කෙරෙයි. මහණෙනි, යම් කාරණයෙකින් තමා තුළ ඒ සුව දුක් ඔහට උපදනේ ද, පරහු හෝ ඒ කායසංස්කාරය අභිසංස්කාරණය කෙරෙත්. (ඔහු ලවා කරවත්.) මහණෙනි, යම් කාරණයෙකින් ඔහට තමා තුළ ඒ සුවදුක් උපදනේ ද, දන්නේ (කුසලාකුසල විපාක දැන) හෝ ඒ කායසංස්කාරය අභිසංස්කාරණය කෙරේ. මහණෙනි, යම් කාරණයෙකින් ඔහට තමා තුළ ඒ සුවදුක් උපදනේ ද, නො දන්නේ හෝ ඒ කායසංස්කාරය අභිසංස්කාරණය කෙරේ.

මහණෙනි, යම් කාරණයෙකින් ඔහට තමා තුළ ඒ සුවදුක් උපදනේ ද, තෙමේ හෝ ඒ වචීසංස්කාර අභිසංස්කාරණය කෙරේ. මහණෙනි, යම් කාරණයෙකින් ඔහට තමා තුළ ඒ සුවදුක් උපදනේ ද, පරහු හෝ ඒ වචී-සංස්කාර අභිසංස්කාරණය කෙරෙත්. මහණෙනි, යම් කාරණයෙකින් ඔහට තමා තුළ ඒ සුවදුක් උපදනේ ද, දන්නේ හෝ ඒ වචීසංස්කාර අභිසංස්කාරණය කෙරෙයි. මහණෙනි, යම් කාරණයෙකින් ඔහට තමා තුළ ඒ සුව දුක් උපදනේ ද, නො දන්නේ හෝ ඒ වචීසංස්කාර අභිසංස්කාරණය කෙරෙයි.

මහණෙනි, යම් කාරණයෙකින් ඔහට තමා තුළ ඒ සුවදුක් උපදනේ ද, තෙමේ හෝ ඒ මනඃසංස්කාර අභිසංස්කාරණය කෙරේ. මහණෙනි, යම් කාරණයෙකින් ඔහට තමා තුළ ඒ සුවදුක් උපදනේ ද, පරහු හෝ ඒ මනඃසංස්කාර අභිසංස්කාරණය කෙරෙත්. මහණෙනි, යම් කාරණයෙකින් ඔහට තමා තුළ ඒ සුවදුක් උපදනේ ද, දන්නේ හෝ ඒ මනඃසංස්කාර අභිසංස්කාරණය කෙරේ. මහණෙනි, යම් කාරණයෙකින් ඔහට තමා තුළ ඒ සුවදුක් උපදනේ ද, නො දන්නේ හෝ ඒ මනඃසංස්කාර අභිසංස්කාරණය කෙරේ

මහණෙනි, මේ චෙතනාධර්මයෙහි අවිද්‍යාව සහජාත උපනිඃශ්‍රය වශයෙන් ලුහුබැඳුනු ය. යම් කාරණයෙකින් ඔහුට තමා තුළ ඒ සුවදුක් උපදනේ ද, අවිද්‍යාවගේ ම නිඃශෙෂ විරාගයෙන් හා නිරොධයෙන් ඒ කායවිඥප්තිය නො වේ. යම් කාරණයෙකින් ඔහට තමා තුළ ඒ සුවදුක් උපදනේ ද, ඒ වාග්විඥප්තිය ද නො වෙයි. යම් කාරණයෙකින් ඔහට තමා තුළ ඒ සුවදුක් උපදනේ ද, ඒ මනොද්වාරය නො වේ. -

ඛෙත්තං තං න හොති, වත්ථුං තං න හොති, ආයතනං තං න හොති, අධිකරණං තං න හොති, යං පච්චයාස්ස තං උප්පජ්ජති අජ්ඣත්තං සුඛදුක්ඛන්ති.

චත්තාරොමෙ භික්ඛවෙ අත්තභාවපටිලාභා. කතමෙ චත්තාරො?

අත්ථි භික්ඛවෙ අත්තභාවපටිලාභො, යස්මිං අත්තභාවපටිලාභෙ අත්තසඤ්චෙතනා කමති නො පරසඤ්චෙතනා. අත්ථි භික්ඛවෙ අත්තභාව-පටිලාභො, යස්මිං අත්තභාවපටිලාභෙ පරසඤ්චෙතනා කමති නො අත්තසඤ්චෙතනා. අත්ථි භික්ඛවෙ අත්තභාවපටිලාභො, යස්මිං අත්තභාවපටි-ලාභෙ අත්තසඤ්චෙතනා ච කමති පරසඤ්චෙතනා ච. අත්ථි භික්ඛවෙ අත්තභාවපටිලාභො, යස්මිං අත්තභාවපටිලාභෙ නෙව අත්තසඤ්චෙතනා කමති නො පරසඤ්චෙතනා. ඉමෙ ඛො භික්ඛවෙ චත්තාරො අත්තභාව-පටිලාභාති.

එවං වුත්තෙ ආයස්මා **සාරිපුත්තො** භගවන්තං එතදවොච: ඉමස්ස ඛො අහං භන්තෙ භගවතා සංඛිත්තෙන භාසිතස්ස එවං විත්ථාරෙන අත්ථං ආජානාමි:

තත්‍ර භන්තෙ ය්වායං අත්තභාවපටිලාභො, යස්මිං අත්තභාවපටිලාභෙ අත්තසඤ්චෙතනා කමති නො පරසඤ්චෙතනා. අත්තසඤ්චෙතනාහෙතු තෙසං සත්තානං තම්හා කායා චුති හොති.

තත්‍ර භන්තෙ ය්වායං අත්තභාවපටිලාභො, යස්මිං අත්තභාවපටිලාභෙ පරසඤ්චෙතනා කමති නො අත්තසඤ්චෙතනා. පරසඤ්චෙතනාහෙතු තෙසං සත්තානං තම්හා කායා චුති හොති.

තත්‍ර භන්තෙ ය්වායං අත්තභාවපටිලාභො, යස්මිං අත්තභාවපටිලාභෙ අත්තසඤ්චෙතනා ච කමති පරසඤ්චෙතනා ච. අත්තසඤ්චෙතනා ච පරසඤ්චෙතනා ච හෙතු තෙසං සත්තානං තම්හා කායා චුති හොති

තත්‍ර භන්තෙ ය්වායං අත්තභාවපටිලාභො, යස්මිං අත්තභාවපටිලාභෙ නෙව අත්තසඤ්චෙතනා කමති නො පරසඤ්චෙතනා. කතමෙ තෙන දෙවා දට්ඨබ්බාති? "නෙවසඤ්ඤානාසඤ්ඤායතනූපගා සාරිපුත්ත දෙවා තෙන දට්ඨබ්බා"ති.

කො නු ඛො භන්තෙ හෙතු කො පච්චයො යෙන මිධෙකච්චෙ සත්තා තම්හා කායා චුතා ආගාමිනො හොන්ති ආගන්තාරො ඉත්ථත්තං? කො පන භන්තෙ හෙතු කො පච්චයො යෙන මිධෙකච්චෙ සත්තා තම්හා කායා චුතා අනාගාමිනො හොන්ති අනාගන්තාරො ඉත්ථත්තන්ති?

ඉධ සාරිපුත්ත එකච්චස්ස පුග්ගලස්ස ඔරම්භාගියානි සඤ්ඤොජනානි අප්පහීනානි හොන්ති. සො දිට්ඨෙව ධම්මෙ නෙවසඤ්ඤානාසඤ්ඤායතනං උපසම්පජ්ජ විහරති. සො තදස්සාදෙති, තන්නිකාමෙති, තෙන ච විත්තිං ආපජ්ජති. තත්ථ ඨිතො තදධිමුත්තො තබ්බහුලවිහාරී, අපරිහීනො කාලං කුරුමානො නෙවසඤ්ඤානාසඤ්ඤායතනූපගානං දෙවානං සහව්‍යතං උපපජ්ජති. සො තතො චුතො ආගාමී හොති ආගන්තා ඉත්ථත්තං.

යම් කාරණයෙකින් ඔහුට තමා තුළ ඒ සුවදුක් උපදනේ ද, ඒ ක්ෂෙත්‍රය නො වේ. ඒ වස්තුව නො වෙයි. ඒ ආයතනය නො වෙයි. ඒ අධිකරණය නො වෙයි.

මහණෙනි, මේ ආත්මභාවප්‍රතිලාභයෝ සතර දෙනෙකි. කවර සතර දෙනක යත්:

මහණෙනි, යම් ආත්මභාවප්‍රතිලාභයෙක ආත්මසඤ්චෙතනාව මිස පරසඤ්චෙතනාව නො පවත්නී ද, එබඳු අත්මභාවප්‍රතිලාභයෙක් ඇත. මහණෙනි, යම් ආත්මභාවප්‍රතිලාභයෙක පරසඤ්චෙතනාව මිස ආත්ම-සඤ්චෙතනාව නො පවත්නී ද, එබඳු ආත්මභාවප්‍රතිලාභයෙක් ඇත. මහණෙනි, යම් ආත්මභාවප්‍රතිලාභයෙක ආත්මසඤ්චෙතනාව හා පරසඤ්චෙ-තනාව හා පවතී ද, එබඳු ආත්මභාවප්‍රතිලාභයෙක් ඇත. මහණෙනි, යම් ආත්මභාවප්‍රතිලාභයෙක ආත්මසඤ්චෙතනාව හා පරසඤ්චෙතනාව හා නො පවත්නී ද, එබඳු ආත්මභාවප්‍රතිලාභයෙක් ඇත. මහණෙනි, මේ ආත්මභාවප්‍රතිලාභයෝ සතර දෙන ය.

මෙසේ වදාළ කල්හි ආයුෂ්මත් සැරියුත් තෙරණුවෝ භාග්‍යවතුන්-වහන්සේට මෙපවත් සැළ කළහ: වහන්ස, භාග්‍යවතුන් වහන්සේ විසින් සැකෙවින් වදාළ මේ භාෂිතයාගේ විස්තර විසින් අර්ථය මෙසේ දනිමි.

වහන්ස, යම් ආත්මභාවයෙක ආත්මසඤ්චෙතනාව මිස පරසඤ්චෙතනාව නැද්ද, එබඳු යම් ආත්මභාවප්‍රතිලාභයෙක් වේ ද, ආත්මසඤ්චෙතනා හේතුවෙන් ඒ සත්ත්වයන්ගේ ඒ කයින් ච්‍යුතිය වෙයි.

වහන්ස, යම් ආත්මභාවප්‍රතිලාභයෙක පරසඤ්චෙතනාව මිස ආත්ම-සඤ්චෙතනාව නැද්ද, එබඳු යම් ආත්මභාවප්‍රතිලාභයෙක් වේ ද, එහි පරසඤ්චෙතනා හේතුවෙන් ඒ සත්ත්වයන්ගේ ඒ කයින් ච්‍යුතිය වේ.

වහන්ස, යම් ආත්මභාවප්‍රතිලාභයෙක ආත්මසඤ්චෙතනාව හා පරසඤ්චෙතනාව හා ඇද්ද, එබඳු යම් ආත්මභාවප්‍රතිලාභයෙක් වේ ද, එහි ආත්මසඤ්චෙතනා හා පරසඤ්චෙතනා හේතුවෙන් ඒ සත්ත්වයන්ගේ ඒ කයින් ච්‍යුතිය වේ.

වහන්ස, යම් ආත්මභාවප්‍රතිලාභයෙක ආත්මසඤ්චෙතනාව හෝ පරසඤ්චෙතනාව හෝ නැද්ද, එබඳු යම් ආත්මභාවප්‍රතිලාභයෙක් වේ ද, එයින් කවර දෙවියෝ දක්‍යුත්තාහු වෙත් ද? "ශාරිපුත්‍රය, එයින් නෙවසඤ්ඤානාසඤ්ඤායතනූපග දෙවියෝ දක්‍යුත්තාහ."

වහන්ස, යම් හෙයෙකින් මෙලොව ඇතැම් සත්ත්ව කෙනෙක් ඒ කයින් ච්‍යුතව එනසුලු වෙත් ද, මේ බවට (මේ කාමාවචර පඤ්චස්කන්ධභාවයට) එත් ද, ඊට හෙතු කවරේ ය, ප්‍රත්‍යය කවරේ ය? වහන්ස, මෙලොව ඇතැම් සත්ත්ව කෙනෙක් ඒ කයින් ච්‍යුතව නො එනසුලු වෙත් ද, මේ බවට නො පැමිණෙන සැහැවි ඇති වෙත් ද, ඊට හේතු කවරේ ය, ඊට ප්‍රත්‍යය කවරේ ය?

ශාරිපුත්‍රය, මෙලොව ඇතැම් පුද්ගලයකුට ඔරම්භාගිය සංයොජනයෝ අප්‍රහීණ වෙත්. හේ දිට්ඨධම්මයෙහි ම නෙවසඤ්ඤානාසඤ්ඤායතනයට එළඹ වෙසෙයි. හේ ඒ ආස්වාද කෙරෙයි. ඒ කැමැති වෙයි. එයින් ප්‍රීතියට පැමිණෙයි. එහි සිටියේ එහි අධිමුක්ත වූයේ ඒ ධ්‍යානයෙන් බහුල විසින් විහරණ ඇත්තේ නො පිරිහුනේ කලුරිය කරමින් නේවසඤ්ඤානාසඤ්ඤා-යතනූපග දෙවියන්ගේ සහභාවයට පැමිණේ. හේ එයින් ච්‍යුත වූයේ එනසුලු වූයේ මේ පඤ්චස්කන්ධභාවයට එළඹෙන සැ හැවි ඇත්තේ වෙයි.

ඉධ පන සාරිපුත්ත එකච්චස්ස පුග්ගලස්ස ඔරම්භාගියානි සඤ්ඤොජනානි පහීනානි හොන්ති. සො දිට්ඨෙව ධම්මෙ නෙවසඤ්ඤානාසඤ්ඤායතනං උපසම්පජ්ජ විහරති. සො තදස්සාදෙති. තන්නිකාමෙති. තෙන ච විත්තිං ආපජ්ජති. තත්ථ ඨිතො තදධිමුත්තො තබ්බහුලවිහාරී අපරිහීනො කාලංකුරුමානො නෙවසඤ්ඤානාසඤ්ඤායතනූපගානං දෙවානං සහබ්‍යතං උපපජ්ජති. සො තතො චුතො අනාගාමී හොති අනාගන්තා ඉත්ථත්තං.

අයං ඛො සාරිපුත්ත හෙතු අයං පච්චයො, යෙන මිධෙකච්චෙ සත්තා තම්හා කායා චුතා ආගාමිනො හොන්ති ආගන්තාරො ඉත්ථත්තං. අයං පන සාරිපුත්ත හෙතු අයං පච්චයො, යෙනමිධෙකච්චෙ සත්තා තම්හා කායා චුතා අනාගාමිනො හොන්ති අනාගන්තාරො ඉත්ථත්තන්ති.

## 4. 4. 3. 2

## [ සාරිපුත්ත - පටිසම්භිදසුත්තං ]

22. තත්‍ර ඛො ආයස්මා **සාරිපුත්තො** භික්ඛූ ආමන්තෙසි, ආවුසො භික්ඛවොති. ආවුසොති ඛො තෙ භික්ඛූ ආයස්මතො සාරිපුත්තස්ස පච්චස්සොසුං. ආයස්මා සාරිපුත්තො එතදවොච:

අඩ්ඪමාසූපසම්පන්නෙන මෙ ආවුසො අත්ථපටිසම්භිදා සච්ඡිකතා ඔධිසො ව්‍යඤ්ජනසො. තමහං අනෙකපරියායෙන ආචික්ඛාමි දෙසෙමි පඤ්ඤපෙමි පට්ඨපෙමි විවරාමි විභජාමි උත්තානී කරොමි. යස්ස ඛො පනස්ස කඞ්ඛා වා විමති වා සො මං පඤ්හෙන, අහං වෙය්‍යාකරණෙන. සම්මුඛීභූතො නො සත්ථා, යො නො ධම්මානං සුකුසලො.

අඩ්ඪමාසූපසම්පන්නෙන මෙ ආවුසො ධම්මපටිසම්භිදා සච්ඡිකතා ඔධිසො ව්‍යඤ්ජනසො, තමහං අනෙකපරියායෙන ආචික්ඛාමි දෙසෙමි පඤ්ඤපෙමි පට්ඨපෙමි විවරාමි විභජාමි උත්තානී කරොමි. යස්ස ඛො පනස්ස කඞ්ඛා වා විමති වා සො මං පඤ්හෙන, අහං වෙය්‍යාකරණෙන. සම්මුඛීභූතො නො සත්ථා, යො නො ධම්මානං සුකුසලොති.

අඩ්ඪමාසූපසම්පන්නෙන මෙ ආවුසො නිරුත්තිපටිසම්භිදා සච්ඡිකතා ඔධිසො ව්‍යඤ්ජනසො. තමහං අනෙකපරියායෙන ආචික්ඛාමි දෙසෙමි පඤ්ඤපෙමි පට්ඨපෙමි විවරාමි විභජාමි උත්තානී කරොමි.-

ශාරිපුත්‍රය, මෙලොව ඇතැම් පුද්ගලයකුට ඔරම්භාගිය සංයෝජනයෝ ප්‍රහීණ වෙත්. හේ ශූන්‍යාත්මයෙහි ම නේවසඤ්ඤානාසඤ්ඤායතනයට එළඹ වෙසෙයි. හේ එය ආස්වාද කෙරෙයි. ඒ කැමැති වෙයි. එයින් ප්‍රීතියට පැමිණෙයි එහි සිටියේ එහි අධිමුක්ත වූයේ ඒ ධ්‍යානයෙන් බහුල වියින් විහරණ ඇත්තේ නො පිරිහුනේ කළුරිය කරමින් නෙවසඤ්ඤානාසඤ්ඤායතනූපග දෙවියන්ගේ සහභාවයට පැමිණේ. හේ එයින් චුතව නො එනසුළු වූයේ මේ කාමාවචර භාවයට නො එන සැහැවි ඇත්තේ වෙයි.

ශාරිපුත්‍රය, යම් හෙයෙකින් මෙලොව ඇතැම් සත්ත්ව කෙනෙක් ඒ කයින් චුතව එනසුළු වූවාහු මේ කම්වැජරි පස්කඳ බවට එළඹෙන සැහැවි ඇත්තාහු වෙත් ද, මේ එයට හෙතු යි. මේ එයට ප්‍රත්‍යය යි ශාරිපුත්‍රය, යම් හෙයෙකින් මෙලොව ඇතැම් සත්ත්ව කෙනෙක් ඒ කයින් චුතව නො එනසුළු වූවාහු මේ කම්වැජරි පස්කඳ බවට නො එළඹෙන සැහැවි ඇත්තාහු වෙත් ද, මේ එයට හෙතු යි. මේ එයට ප්‍රත්‍යය යි.

## 4. 4. 3 2.

## [ සාරිපුත්ත - පටිසම්භිද සූත්‍රය ]

22. එකල ආයුෂ්මත් **සැරියුත්** තෙරණුවෝ "ඇවැත් මහණෙනි, යි භික්ෂූන් බණවාලූහ. ඇවැත්නි, යි ඒ භික්ෂූහු ආයුෂ්මත් සැරියුත් තෙරණුවන්ට පිළිවදන් දුන්හ. ආයුෂ්මත් සැරියුත් තෙරණුවෝ මෙය වදාළහ:

ඇවැත්නි, උපසපත් අඩමස් ඇති මා විසින් කරුණු විසින් අකුරු විසින් අර්ථප්‍රතිසම්භිදාව ප්‍රත්‍යක්ෂ කරණ ලදී. මම එය නන් නියරින් කියමි. පළකොට කියමි. දන්වමි. පවත්වා කියමි. හෙළි කොට කියමි. විභාග කොට කියමි. නොගැඹුරු (නොමුවහ) කොට කියමි. යමක්හට සැකයෙක් හෝ විමතියෙක් හෝ වේ ද, හේ මා කරා ප්‍රශ්නයෙන් එළඹේවා. මම ප්‍රශ්නව්‍යාකරණයෙන් ඔහු සිත් ගණිමි. යම් ශාස්තෘ කෙනෙක් අපගේ දහම් පිළිබඳ අතිශයකෘතහස්ත වූහු නම්, ඒ ශාස්තෲහු ද අපට සම්මුඛීභූතයහ.

ඇවැත්නි, උපසපත් අඩමස් ඇති මා විසින් ධර්මප්‍රතිසම්භිදාව කරුණු විසින් අකුරු විසින් සාක්ෂාත්කෘත ය. මම එය නොයෙක් කරුණින් කියමි. දෙසමි. දන්වමි. තබමි. විවරණ කරමි. විභාග කෙරෙමි. නොගැඹුරු කෙරෙමි. යමක්හට කාඞ්ක්ෂායෙක් හෝ විමතියෙක් හෝ වේ ද, හේ මා කරා ප්‍රශ්නයෙන් එළඹේවා, මම ප්‍රශ්නව්‍යාකරණයෙන් ඔහු සිත් ගණිමි. යම් ශාස්තෘවරයෙක් අපගේ දහම් පිළිබඳව අතිශයින් නිපුණ වී ද, ඒ ශාස්තෘවරයා අපට සම්මුඛීභූත ය.

ඇවැත්නි, උපසපන් අඩමස් ඇති මා විසින් නිරුක්තිප්‍රතිසම්භිදාව කරුණු විසින් අකුරු විසින් ප්‍රත්‍යක්ෂ කරණ ලදී. මම එය නන් ආරෙන් කියමි දෙසමි. දන්වමි. තබමි. විවරණ කෙරෙමි. බෙදමි. ප්‍රකට කෙරෙමි-

යස්ස ඛො පනස්ස කඞ්ඛා වා විමති වා සො මං පඤ්හෙන, අහං වෙය්‍යාකරණෙන. සම්මුඛීභූතො නො සත්ථා, යො නො ධම්මානං සුකුසලොති.

අඩ්ඪමාසූපසම්පන්නෙන මෙ ආවුසො පටිභානපටිසම්භිදා සච්ඡිකතා ඔධිසො ව්‍යඤ්ජනසො. තමහං අනෙකපරියායෙන ආචික්ඛාමි දෙසෙමි පඤ්ඤපෙමි පට්ඨපෙමි විවරාමි විභජාමි උත්තානී කරොමි. යස්ස ඛො පනස්ස කඞ්ඛා වා විමති වා සො මං පඤ්හෙන, අහං වෙය්‍යාකරණෙන. සම්මුඛීභූතො නො සත්ථා, යො නො ධම්මානං සුකුසලොති.

## 4. 4. 3. 3.

## [ මහාකොට්ඨිතසුත්තං ]

23. අථ ඛො ආයස්මා **මහාකොට්ඨිතො** යෙනායස්මා **සාරිපුත්තො** තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා ආයස්මතා සාරිපුත්තෙන සද්ධිං සම්මොදි. සම්මොදනීයං කථං සාරාණීයං වීතිසාරෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නො ඛො ආයස්මා මහාකොට්ඨිතො ආයස්මන්තං සාරිපුත්තං එතදවොච:

ඡන්නං ආවුසො ඵස්සායතනානං අසෙසවිරාගනිරොධා අත්ථඤ්ඤං කිඤ්චීති? මා හෙවං ආවුසො. ඡන්නං ආවුසො ඵස්සායතනානං අසෙසවිරාගනිරොධා නත්ථඤ්ඤං කිඤ්චීති? මා හෙවං ආවුසො. ඡන්නං ආවුසො ඵස්සායතනානං අසෙසවිරාගනිරොධා අත්ථි ච නත්ථි චඤ්ඤං කිඤ්චීති? මා හෙවං ආවුසො. ඡන්නං ආවුසො ඵස්සායතනානං අසෙසවිරාගනිරොධා නෙවත්ථි නො නත්ථඤ්ඤං කිඤ්චීති? මා හෙවං ආවුසො

ඡන්නං ආවුසො ඵස්සායතනානං අසෙසවිරාගනිරොධා අත්ථඤ්ඤං කිඤ්චීති ඉති පුට්ඨො සමානො මා හෙවං ආවුසොති වදෙසි. ඡන්නං ආවුසො ඵස්සායතනානං අසෙසවිරාගනිරොධා නත්ථඤ්ඤං කිඤ්චීති ඉති පුට්ඨො සමානො මා හෙවං ආවුසොති වදෙසි. ඡන්නං ආවුසො ඵස්සායතනානං අසෙසවිරාගනිරොධා අත්ථි ච නත්ථි චඤ්ඤං කිඤ්චීති ඉති පුට්ඨො සමානො මා හෙවං ආවුසොති වදෙසි. ඡන්නං ආවුසො ඵස්සායතනානං අසෙසවිරාගනිරොධා නෙවත්ථි නො නත්ථඤ්ඤං කිඤ්චීති ඉති පුට්ඨො සමානො මා හෙවං ආවුසොති වදෙසි. යථා කථම්පනාවුසො ඉමස්ස භාසිතස්ස අත්ථො දට්ඨබ්බොති?

යම්කිසිවකුට සැකයෙක් හෝ විමතියෙක් හෝ වේ ද හේ මා කරා ප්‍රශ්නයෙන් එළඹේවා. මම ප්‍රශ්නව්‍යාකරණයෙන් ඔහු සිත් ගණිමි යම් ශාස්තෘ කෙනෙක් අපගේ දහම් පිළිබඳව අතිශය දක්ෂ වූහු ද, ඒ ශාස්තෘහු අපට සම්මුඛීභූතයහ.

ඇවැත්නි, උපසපන් අබමස් ඇති මා විසින් ප්‍රතිභාණ ප්‍රතිසම්භිදාව කරුණු විසින් අකුරු විසින් ප්‍රත්‍යක්ෂ කරණ ලද්දී. මම එය නොයෙක් කරුණින් කියමි. දෙසමි. පණවමි. පවත්වා ලමි. විවරණ කරමි. බෙදලමි. ප්‍රකට කෙරෙමි. යම්කිසිවකුට සැකයෙක් හෝ විමතියෙක් හෝ වේ ද, හේ මා කරා ප්‍රශ්නයෙන් එළඹේවා. මම ප්‍රශ්නව්‍යාකරණයෙන් සිත් ගණිමි. යම් ශාස්තෘවරයෙක් අපගේ දහම් පිළිබඳව අතිශය සමර්ථ වී ද, ඒ ශාස්තෘවරයා අපට සම්මුඛීභූත ය.

## 4. 4. 3. 3

### [ මහාකොට්ඨිත සූත්‍රය ]

23. එසඳ ආයුෂ්මත් මහාකොට්ඨිත තෙරණුවෝ ආයුෂ්මත් සැරියුත් තෙරණුවන් කරා එළඹියහ. එළඹ ආයුෂ්මත් සැරියුත් තෙරණුවන් හා සතුටු වූහ. සතුටු විය යුතු සිහි කටයුතු කථාව නිමවා එකත්පස්ව හුන්හ. එකත්පස් ව හුන් ආයුෂ්මත් මහාකොට්ඨිත තෙරණුවෝ ආයුෂ්මත් සැරියුත් තෙරණුවන්ට මෙලෙ කීහ:

ඇවැත්නි, සවැදෑරුම් ස්පර්ශායතනයන්ගේ නිරවශේෂ විරාගය හා නිරෝධයෙන් ශේෂ වූ අන්කිසි දෑයෙක් (-කෙලශයෙක් ඇද්ද? ඇවැත්නි, "එසේ නො කියව." ඇවැත්නි, සවැදෑරුම් ස්පර්ශායතනයන්ගේ නිශ්ශේෂ විරාගය හා නිරෝධයෙන් මතුයෙහි අන්කිසි දෑයෙක් (-කෙලශයෙක්) නැද්ද? ඇවැත්නි, "එසේ නො කියව." ඇවැත්නි, සවැදෑරුම් ස්පර්ශායතනයන්ගේ නිශ්ශේෂ විරාගය හා නිරෝධයෙන් මතුයෙහි අන්කිසි දෑයෙක් ඇත්තේ හෝ නැත්තේ හෝ වේ ද? "ඇවැත්නි, එසේ නො කියව." ඇවැත්නි, සැවැදෑරුම් ස්පර්ශායතනයන්ගේ නිශ්ශේෂ විරාගය හා නිරෝධයෙන් මතුයෙහි අන්කිසි දෑයෙක් නො ම ඇතියේ හෝ නො ම නැතියේ හෝ වේ ද? ඇවැත්නි, "එසේ නො කියව."

ඇවැත්නි, සවැදෑරුම් ස්පර්ශායතනයන්ගේ අශේෂ විරාගය හා නිරෝධයෙන් මතුයෙහි අන්කිසි දෑයෙක් ඇද්ද යි මෙසේ පුළුවුස්නා ලද්දෙහි "ඇවැත, එසේ නො කියව" යි කියහි. ඇවැත්නි, සවැදෑරුම් ස්පර්ශායතනයන්ගේ අශේෂ විරාගය හා නිරෝධයෙන් මතුයෙහි අන්කිසි දෑයෙක් නැද්ද යි මෙසේ පුළුවුස්නා ලද්දෙහි "ඇවැත, එසේ නොකියව" යි කියහි. ඇවැත්නි, සවැදෑරුම් ස්පර්ශායතනයන්ගේ අශේෂ විරාගය හා නිරෝධයෙන් මතුයෙහි අන්කිසි දෑයෙක් ඇත්තේ හෝ නැත්තේ හෝ වේ ද යි මෙසේ පුළුවුස්නා ලද්දෙහි "ඇවැත්නි, එසේ නො කියව" යි කියහි. ඇවැත්නි, සවැදෑරුම් ස්පර්ශායතනයන්ගේ අශේෂ විරාගය හා නිරෝධයෙන් මතුයෙහි අන්කිසි දෑයෙක් නො ම ඇද්ද නො ම නැද්ද යි මෙසේ පුළුවුස්නා ලද්දෙහි "ඇවැත්නි, එසේ නො කියව"යි කියහි. ඇවැත්නි, කෙසේ නම් මේ භාෂිතයාගේ අර්ථ දතයුතු වේ ද?

ඡන්නං ආවුසො ඵස්සායතනානං අසෙසවිරාගනිරොධා අත්ථඤ්ඤං කිඤ්චීති ඉති වදං අප්පපඤ්චං පපඤ්චෙති. ඡන්නං ආවුසො ඵස්සායතනානං අසෙසවිරාගනිරොධා නත්ථඤ්ඤං කිඤ්චීති ඉති වදං අප්පපඤ්චං පපඤ්චෙති. ඡන්නං ආවුසො ඵස්සායතනානං අසෙසවිරාගනිරොධා අත්ථි ච නත්ථි චඤ්ඤං කිඤ්චීති ඉති වදං අප්පපඤ්චං පපඤ්චෙති ඡන්නං. ආවුසො ඵස්සායතනානං අසෙසවිරාගනිරොධා නෙවත්ථි නො නත්ථඤ්ඤං කිඤ්චීති ඉති වදං අප්පපඤ්චං පපඤ්චෙති.

යාවතා ආවුසො ඡන්නං ඵස්සායතනානං ගති තාවතා පපඤ්චස්ස ගති. යාවතා පපඤ්චස්ස ගති, තාවතා ඡන්නං ඵස්සායතනානං ගති. ඡන්නං ආවුසො ඵස්සායතනානං අසෙසවිරාගනිරොධා පපඤ්චනිරොධො, පපඤ්චනිරොධා පපඤ්චවූපසමොති.

## 4. 4. 3. 4.

## [ ආනන්දසුත්තං ]

24. අථ ඛො ආයස්මා **ආනන්දො** යෙනායස්මා **මහාකොට්ඨිතො** තෙනුප-සඞ්කමි. උපසඞ්කමිත්වා ආයස්මතා මහාකොට්ඨිතෙන සද්ධිං සම්මොදි. සම්මොදනීයං කථං සාරාණීයං වීතිසාරෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නො ඛො ආයස්මා ආනන්දො ආයස්මන්තං මහාකොට්ඨිතං එතදවොච:

ඡන්නං ආවුසො ඵස්සායතනානං අසෙසවිරාගනිරොධා අත්ථඤ්ඤං කිඤ්චීති? මාහෙවං ආවුසො. ඡන්නං ආවුසො ඵස්සායතනානං අසෙසවිරාග-නිරොධා නත්ථඤ්ඤං කිඤ්චීති? මාහෙවං ආවුසො. ඡන්නං ආවුසො ඵස්සායතනානං අසෙසවිරාගනිරොධා අත්ථි ච නත්ථි චඤ්ඤං කිඤ්චීති? මාහෙවං ආවුසො. ඡන්නං ආවුසො ඵස්සායතනානං අසෙසවිරාගනිරොධා නෙවත්ථි නො නත්ථඤ්ඤං කිඤ්චීති? මාහෙවං ආවුසො.

ඡන්නං ආවුසො ඵස්සායතනානං අසෙසවිරාගනිරොධා අත්ථඤ්ඤං කිඤ්චීති ඉති පුට්ඨො සමානො මාහෙවං ආවුසොති වදෙසි. ඡන්නං ආවුසො ඵස්සායතනානං අසෙසවිරාගනිරොධා නත්ථඤ්ඤං කිඤ්චීති ඉති පුට්ඨො සමානො මාහෙවං ආවුසොති වදෙසි. ඡන්නං ආවුසො ඵස්සායතනානං අසෙසවිරාගනිරොධා අත්ථි ච නත්ථි චඤ්ඤං කිඤ්චීති ඉති පුට්ඨො සමානො මාහෙවං ආවුසොති වදෙසි. ඡන්නං ආවුසො ඵස්සායතනානං අසෙසවිරාගනිරොධා නෙවත්ථි නො නත්ථඤ්ඤං කිඤ්චීති ඉති පුට්ඨො සමානො මාහෙවං ආවුසොති වදෙසි. යථාකථම්පනාවුසො ඉමස්ස භාසිතස්ස අත්ථො දට්ඨබ්බොති?

ඇවැත්නි, සවැදෑරුම් ස්පර්ශායතනයන්ගේ අශේෂ විරාගය හා නිරෝධයෙන් මතුයෙහි අන්කිසි දෑයෙක් ඇතැ යි මෙසේ කියනුයේ, ප්‍රපඤ්චය (තණ්හා මාන දිට්ඨි විසින් විස්තර) නො කටයුතු තැන ප්‍රපඤ්ච කෙරෙයි. ඇවැත්නි, සවැදෑරුම් ස්පර්ශායතනයන්ගේ අශේෂ විරාගය හා නිරෝධයෙන් මතුයෙහි අන්කිසි දෑයෙක් නැතැ යි මෙසේ කියනුයේ, ප්‍රපඤ්චය නො කටයුතු තැන ප්‍රපඤ්ච කෙරෙයි. ඇවැත්නි, සවැදෑරුම් ස්පර්ශායතනයන්ගේ අශේෂ විරාගය හා නිරෝධයෙන් මතුයෙහි අන්කිසි දෑයෙක් ඇත්තේ හෝ නැත්තේ හෝ යි කියනුයේ, ප්‍රපඤ්චය නොකටයුතු තැන ප්‍රපඤ්ච කෙරෙයි. ඇවැත්නි, සවැදෑරුම් ස්පර්ශායතනයන්ගේ අශේෂවිරාගය හා නිරෝධයෙන් මතුයෙහි අන්කිසි දෑයෙක් ඇත්තේත් නො වෙයි, නැත්තේත් නො වෙයි. මෙසේ කියනුයේ, ප්‍රපඤ්චය නො කටයුතු තැන ප්‍රපඤ්ච කෙරෙයි.

ඇවැත්නි, සවැදෑරුම් ස්පර්ශායතනයන්ගේ ගතිය (විෂය) යම්තාක් වේ ද, ඒ තාක් ප්‍රපඤ්චයාගේ (තෘෂ්ණාදෘෂ්ටිමාන) ගතිය වෙයි. ප්‍රපඤ්චයාගේ ගතිය යම්තාක් වේ ද, සවැදෑරුම් ස්පර්ශායතනයන්ගේ ගතිය ද එතෙක් ම ය. ඇවැත්නි, සවැදෑරුම් ස්පර්ශායතනයන්ගේ අශේෂ විරාග නිරෝධයෙන් ප්‍රපඤ්චනිරෝධය වෙයි. ප්‍රපඤ්ච නිරෝධයෙන් ප්‍රපඤ්ච ව්‍යුපශමය වෙයි.

## 4. 4. 3. 4

## [ ආනන්ද සූත්‍රය ]

24. එසඳ ආයුෂ්මත් **ආනන්ද** තෙරණුවෝ ආයුෂ්මත් **මහාකොට්ඨිත** තෙරණුවන් කරා එළැඹියහ. එළඹ ආයුෂ්මත් මහාකොට්ඨිත තෙරණුවන් හා සතුටු වූහ. සතුටු විය යුතු සිහි කටයුතු කථාව කොට නිමවා එකත්පස් ව හුන්හ. එකත්පස්ව හුන් ආයුෂ්මත් ආනන්ද තෙරණුවෝ ආයුෂ්මත් මහාකොට්ඨිත තෙරණුවන්ට තෙල කීහ:

ඇවැත්නි, සවැදෑරුම් ස්පර්ශායතනයන්ගේ නිරවශේෂ විරාගය හා නිරෝධයෙන් මතුයෙහි අන්කිසි දෑයෙක් ඇද්ද? ඇවැත්නි, එසේ නො කියව." ඇවැත්නි, සවැදෑරුම් ස්පර්ශායතනයන්ගේ විරාගය හා නිරෝධයෙන් මතුයෙහි අන්කිසි දෑයෙක් නැද්ද? "ඇවැත්නි, එසේ නො කියව." ඇවැත්නි, සවැදෑරුම් ස්පර්ශායතනයන්ගේ විරාගය හා නිරෝධයෙන් මතුයෙහි යම් කිසි දෑයෙක් ඇත්තේ හෝ නැත්තේ හෝ වේ ද? "ඇවැත්නි, එසේ නො කියව." ඇවැත්නි, සවැදෑරුම් ස්පර්ශායතනයන්ගේ නිශ්ශේෂ විරාගය හා නිරෝධයෙන් මතුයෙහි අන්කිසි දෑයෙක් නො ම ඇතියේ හෝ නො ම නැතියේ හෝ වේ ද? "ඇවැත්නි, එසේ නො කියව."

ඇවැත්නි, සවැදෑරුම් ස්පර්ශායතනයන්ගේ අශේෂ විරාගය හා නිරෝධයෙන් මතුයෙහි අන්කිසි දෑයෙක් ඇද්දැ යි මෙසේ පුළුවුස්නා ලද්දෙහි "ඇවැත, එසේ නො කියව" යි කියහි. ඇවැත්නි, සවැදෑරුම් ස්පර්ශායතනයන්ගේ අශේෂ විරාගය හා නිරෝධයෙන් මතුයෙහි යම්කිසි දෑයෙක් නැද්දැ යි මෙසේ පුළුවුස්නා ලද්දෙහි "ඇවැත, එසේ නො කියව" යි කියහි. ඇවැත්නි, සවැදෑරුම් ස්පර්ශායතනයන්ගේ අශේෂ විරාගය හා නිරෝධයෙන් මතුයෙහි අන් කිසි දෑයෙක් ඇත්තේ හෝ නැත්තේ හෝ වේදැ යි මෙසේ පුළුවුස්නා ලද්දෙහි "ඇවැත්නි, එසේ නො කියව" යි කියහි. ඇවැත්නි, සවැදෑරුම් ස්පර්ශායතනයන්ගේ අශේෂ විරාගය හා නිරෝධයෙන් මත්තෙහි අන්කිසි දෑයෙක් නො ම ඇද්දැ නො ම නැද්දැ යි මෙසේ පුළුවුස්නා ලද්දෙහි ඇවැත්නි, එසේ නොකියව" යි කියහි. ඇවැත්නි, කෙසේ නම් මේ භාෂිතයාගේ අර්ථය දතයුතු වේ ද?

ඡන්නං ආවුසො ඵස්සායතනානං අසෙසවිරාගනිරොධා අඤ්ඤං කිඤ්චීති ඉති වදං අප්පපඤ්චං පපඤ්චෙති. ඡන්නං ආවුසො ඵස්සායතනානං අසෙසවිරාගනිරොධා නත්ථඤ්ඤං කිඤ්චීති ඉති වදං අප්පපඤ්චං පපඤ්චෙති. ඡන්නං ආවුසො ඵස්සායතනානං අසෙසවිරාගනිරොධා අත්ථි ච නත්ථි චඤ්ඤං කිඤ්චීති ඉති වදං අප්පපඤ්චං පපඤ්චෙති. ඡන්නං ආවුසො ඵස්සායතනානං අසෙසවිරාගනිරොධා නෙවත්ථි නො නත්ථඤ්ඤං කිඤ්චීති ඉති වදං අප්පපඤ්චං පපඤ්චෙති

යාවතා ආවුසො ඡන්නං ඵස්සායතනානං ගති, තාවතා පපඤ්චස්ස ගති. යාවතා පපඤ්චස්ස ගති, තාවතා ඡන්නං ඵස්සායතනානං ගති. ඡන්නං ආවුසො ඵස්සායතනානං අසෙසවිරාගනිරොධා පපඤ්චනිරොධො. පපඤ්චනිරොධා පපඤ්චවූපසමොති

## 4. 4. 3. 5.

## [ උපවාණසුත්තං ]

25. අථ ඛො ආයස්මා **උපවාණො** යෙනායස්මා **සාරිපුත්තො** තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා ආයස්මතා සාරිපුත්තෙන සද්ධිං සම්මොදි. සම්මොදනීයං කථං සාරාණීයං වීතිසාරෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නො ඛො ආයස්මා උපවාණො ආයස්මන්තං සාරිපුත්තං එතදවොච:

කින්නු ඛො ආවුසො සාරිපුත්ත විජ්ජායන්තකරො හොතීති? නො හිදං ආවුසො. කිම්පනාවුසො සාරිපුත්ත චරණෙනන්තකරො හොතීති? නො හිදං ආවුසො. කින්නු ඛො ආවුසො සාරිපුත්ත විජ්ජාචරණෙනන්තකරො හොතීති? නො හිදං ආවුසො. කිම්පනාවුසො සාරිපුත්ත අඤ්ඤත්‍ර විජ්ජාචරණෙනන්තකරො හොතීති? නො හිදං ආවුසො.

කින්නු ඛො ආවුසො සාරිපුත්ත විජ්ජායන්තකරො හොතීති ඉති පුට්ඨො සමානො නො හිදං ආවුසොති වදෙසි. කිම්පනාවුසො සාරිපුත්ත චරණෙනන්තකරො හොතීති ඉති පුට්ඨො සමානො නො හිදං ආවුසොති වදෙසි. කිම්පනාවුසො සාරිපුත්ත විජ්ජාචරණෙනන්තකරො හොතීති ඉති පුට්ඨො සමානො නො හිදං ආවුසොති වදෙසි. කිම්පනාවුසො සාරිපුත්ත අඤ්ඤත්‍ර විජ්ජාචරණෙනන්තකරො හොතීති ඉති පුට්ඨො සමානො නො හිදං ආවුසොති වදෙසි. යථාකථම්පනාවුසො අන්තකරො හොතීති?

ඇවැත්නි, සවැදෑරුම් ස්පර්ශායතනයන්ගේ අශේෂ විරාගය හා නිරෝධයෙන් මතුයෙහි අන්කිසි දෑයෙක් ඇතැයි මෙසේ කියනුයේ, ප්‍රපඤ්ච නො කටයුතු තැන ප්‍රපඤ්ච කෙරෙයි. ඇවැත්නි, සවැදෑරුම් ස්පර්ශායතනයන්ගේ අශේෂ-විරාගය හා නිරෝධයෙන් මතුයෙහි අන්කිසි දෑයෙක් නැතැ යි මෙසේ කියනුයේ, ප්‍රපඤ්ච නො කටයුතු තැන ප්‍රපඤ්ච කෙරෙයි. ඇවැත්නි, සවැදෑරුම් ස්පර්ශායතනයන්ගේ අශේෂ විරාගය හා නිරෝධයෙන් මතුයෙහි අන්කිසි දෑයෙක් ඇත්තේ හෝ නැත්තේ හෝ යි මෙසේ කියනුයේ' ප්‍රපඤ්ච නො කටයුතු තැන ප්‍රපඤ්ච කෙරෙයි ඇවැත්නි, සවැදෑරුම් ස්පර්ශායතනයන්ගේ අශේෂ විරාගය හා නිරෝධයෙන් මතුයෙහි අන්කිසි දෑයෙක් ඇත්තේ හෝ වෙයි, නැත්තේ හෝ වෙයි, මෙසේ කියනුයේ, ප්‍රපඤ්ච නො කටයුතු තැන ප්‍රපඤ්ච කෙරෙයි.

ඇවැත්නි, සවැදෑරුම් ස්පර්ශායතනයන්ගේ ගතිය යම්තාක් වේ ද, ඒතාක් ප්‍රපඤ්චයාගේ ගතිය වෙයි. ප්‍රපඤ්චයාගේ ගතිය යම් තාක් වේ ද, සවැදෑරුම් ස්පර්ශායතනයන්ගේ ගතිය ද එතෙක් ම ය. ඇවැත්නි, සවැදෑරුම් ස්පර්ශායතනයන්ගේ අශේෂ විරාගය හා නිරෝධයෙන් ප්‍රපඤ්චනිරෝධය වෙයි. ප්‍රපඤ්චනිරෝධයෙන් ප්‍රපඤ්ච නිවීම වෙයි.

## 4. 4. 3. 5.

## [ උපවාන සූත්‍රය ]

25. එසඳ ආයුෂ්මත් උපවාන තෙරණුවෝ ආයුෂ්මත් ශාරීපුත්‍ර තෙරණුවන් වෙත එළැඹියහ. එළඹ ආයුෂ්මත් සැරියුත් තෙරණුවන් හා සමග සතුටු වූහ. සතුටු වියයුතු සිහි කටයුතු කථා කොට නිමවා එකත්පස් ව හුන්හ. එකත්පස් ව හුන් ආයුෂ්මත් උපවාන තෙරණුවෝ ආයුෂ්මත් සැරියුත් තෙරණුවන්ට තෙල කීහ:

කිම ඇවැත්නි, ශාරීපුත්‍රයෙනි, විද්‍යායෙන් සසරවට කෙළවර කරන්නේ වේ ද? "ඇවැත්නි, මෙය නො වේ." කිම, ඇවැත් ශාරීපුත්‍රයෙනි, චරණයෙන් වටදුක් කෙළවර කරන්නේ වේ ද? "ඇවැත්නි, මෙ ද නො වේ'. කිම ඇවැත් ශාරීපුත්‍රයෙනි, විද්‍යාචරණ දෙකින් වටදුක් කෙළවර කරන්නේ වේ ද? "ඇවැත්නි, මෙ ද නො වේ." කිම ඇවැත් ශාරීපුත්‍රයෙනි, විද්‍යාචරණ හැර වටදුක් කෙළවර කරන්නේ වේ ද? "ඇවැත්නි, මෙ ද නො වේ."

කිම ඇවැත් ශාරීපුත්‍රයෙනි, විද්‍යායෙන් වටදුක් කෙළවර කරන්නේ වේ දැ යි මෙසේ පුළුවුස්නා ලද්දෙහි "ඇවැත්නි, මෙය නො වෙති" යි බෙණෙහි. කිම ඇවැත් ශාරීපුත්‍රයෙනි, චරණයෙන් වටදුක් කෙළවර කරන්නේ වේ දැ යි මෙසේ පුළුවස්නා ලද්දෙහි "ඇවැත්නි, මෙය නො වෙති"යි බෙණෙහි. කිම ඇවැත් ශාරීපුත්‍රයෙනි, විද්‍යාචරණ දෙකින් වටදුක් කෙළවර කරන්නේ වේ දැ' යි මෙසේ පුළුවුස්නා ලද්දෙහි "ඇවැත්නි, මෙය නො වෙති"යි බෙණෙහි. කිම ඇවැත් ශාරීපුත්‍රයෙනි, විද්‍යාචරණ විනා වටදුක් කෙළවර කරන්නේ වේ දැ යි මෙසේ පුළුවුස්නා ලද්දෙහි 'ඇවැත්නි, මෙය නො වෙති' යි බෙණෙහි. ඇවැත්නි, කෙසේ වටදුක් කෙළවර කරන්නේ වේ ද?

විජ්ජාය වෙ ආවුසො අන්තකරො අභවිස්ස, සඋපාදානොව සමානො අන්තකරො අභවිස්ස. චරණෙන වෙ ආවුසො අන්තකරො අභවිස්ස, සඋපාදානොව සමානො අන්තකරො අභවිස්ස. විජ්ජාචරණෙන වෙ ආවුසො. අන්තකරො අභවිස්ස, සඋපාදානොව සමානො අන්තකරො අභවිස්ස. අඤ්ඤත්‍ර විජ්ජාචරණෙන වෙ ආවුසො අන්තකරො අභවිස්ස, පුථුජ්ජනො අන්තකරො අභවිස්ස. පුථුජ්ජනො හි ආවුසො අඤ්ඤත්‍ර විජ්ජාචරණෙන. චරණවිපන්නො ඛො ආවුසො යථාභූතං න ජානාති න පස්සති. චරණසම්පන්නො යථාභූතං ජානාති පස්සති. යථාභූතං ජානං පස්සං අන්තකරො හොතීති.

## 4. 4. 3. 6.

## [ ආයාචමානසුත්තං ]

26. සද්ධො භික්ඛවෙ භික්ඛු එවං සම්මා ආයාචමානො ආයාචෙය්‍ය: තාදිසො හොමි යාදිසා **සාරිපුත්තමොග්ගල්ලානා**ති. එසා භික්ඛවෙ තුලා, එතං පමාණං මම සාවකානං භික්ඛූනං යදිදං සාරිපුත්තමොග්ගල්ලානා.

සද්ධා භික්ඛවෙ භික්ඛුනී එවං සම්මා ආයාචමානා ආයාචෙය්‍ය: තාදිසා හොමි යාදිසා **ඛෙමා** ච භික්ඛුනී **උප්පලවණ්ණා** චාති. එසා භික්ඛවෙ තුලා, එතං පමාණං මම සාවිකානං භික්ඛුනීනං යදිදං ඛෙමා ච භික්ඛුනී උප්පලවණ්ණා ච.

සද්ධො භික්ඛවෙ උපාසකො එවං සම්මා ආයාචමානො ආයාචෙය්‍ය: තාදිසො හොමි යාදිසො **චිත්තො** ච ගහපති **හත්ථකො** ච **ආළවකො**ති. එසා භික්ඛවෙ තුලා, එතං පමාණං මම සාවකානං උපාසකානං යදිදං චිත්තො ච ගහපති හත්ථකො ච ආළවකො.

සද්ධා භික්ඛවෙ උපාසිකා එවං සම්මා ආයාචමානා ආයාචෙය්‍ය: තාදිසා හොමි යාදිසා **ඛුජ්ජුත්තරා** ච උපාසිකා **වෙළුකණ්ටකියා** ච **නන්දමාතා**ති. එසා භික්ඛවෙ තුලා, එතං පමාණං මම සාවිකානං උපාසිකානං යදිදං ඛුජ්ජුත්තරා ච උපාසිකා වෙළුකණ්ටකියා ච නන්දමාතාති.

## 4. 4. 3. 7.

## [ රාහුලසුත්තං ]

27. අථ ඛො ආයස්මා **රාහුලො** යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නං ඛො ආයස්මන්තං රාහුලං භගවා එතදවොච;

ඇවැත්නි, ඉදින් විද්‍යායෙන් වටදුක් කෙළවර කරන්නේ වී නම් උපාදාන සහිත වූයේ ම වටදුක් කෙළවර කරන්නේ වෙයි. ඇවැත්නි, ඉදින් චරණයෙන් වටදුක් කෙළවර කරන්නේ වී නම්, උපාදාන සහිත වූයේ ම කෙළවර කරන්නේ වෙයි. ඇවැත්නි, ඉදින් විද්‍යාචරණ දෙකින් කෙළවර කරන්නේ වී නම් උපාදාන සහිත වූයේ ම කෙළවර කරන්නේ වෙයි. ඇවැත්නි, ඉදින් විද්‍යාචරණ මිස කෙළවර කරන්නේ වී නම්, පුහුදුන් තෙමේ කෙළවර කරන්නේ වෙයි. ඇවැත්නි, පුහුදුන් විද්‍යාචරණයෙන් වෙන් ව සිටුනේ ය. ඇවැත්නි, චරණ නැත්තේ තත් වූ පරිදි නො දන්නේ ය. නො දක්නේ ය. පිරිපුන් චරණ ඇත්තේ යථාස්වභාවය දන්නේ ය. දක්නේ ය. තත් වූ සැටියෙන් දන්නේ දක්නේ වටදුක් කෙළවර කරන්නේ වෙයි.

## 4. 4. 3. 6.

## [ ආයාචමාන සූත්‍රය ]

26. මහණෙනි, සැදැහැති මහණ මොනවට ආයාචනා කරණුයේ මෙසේ ආයාචනා කරන්නේ ය: “**සැරියුත් මුගලන්හු** යම් බඳු වෙත් ද, එබඳු වෙම්වා” යි. මහණෙනි, යම් සැරියුත් මුගලන්හු දෙදෙනෙක් වෙත් ද, මාගේ ශ්‍රාවක භික්ෂූනට තෙල තුලා වෙයි. තෙල ප්‍රමාණ වෙයි.

මහණෙනි, සැදැහැති මෙහෙණ මොනවට පතන්නී, මෙසේ ප්‍රාර්ථනා කරන්නී ය: “**ඛේමා** මෙහෙණ හා **උප්පලවණ්ණා** මෙහෙණ හා දෙදෙන යම් බඳු වෙත් ද, එබඳු වෙම්වා” යි. මහණෙනි, යම් ඛේමා මෙහෙණ හා උප්පලවණ්ණා මෙහෙණ හා දෙදෙන වෙත් ද, මාගේ ශ්‍රාවක භික්ෂුණීනට තෙල තුලා වෙයි. තෙල ප්‍රමාණ වෙයි.

මහණෙනි, සැදැහැති උවසු මොනොවට ප්‍රාර්ථනා කරණුයේ මෙසේ ප්‍රාර්ථනා කරන්නේ ය: “**චිත්තගහපති** හා **හත්ථක ආළවක** හා දෙදෙන යම්බඳු වේ ද, එබඳු වෙම්වා” යි. මහණෙනි, යම් චිත්තගහපති හා හත්ථක-ආළවක හා දෙදෙන වෙත් ද, මාගේ සවු උවසුනට තෙල තුලා වෙයි. තෙල ප්‍රමාණ වෙයි.

මහණෙනි, සැදැහැති උවැසිය මොනොවට ආයාචනා කරන්නී මෙසේ ආයාචනා කරන්නී ය: “**ඛුජ්ජුත්තරා** උවැසිය හා **වෙළුකණ්ටකිය නන්දමාතාව** හා දෙදෙන යම් බඳු වෙත් ද, එබඳු වෙම්වා” යි. මහණෙනි, යම් ඛුජ්ජුත්තරා උවැසිය හා වෙළුකණ්ටකිය නන්දමාතාව හා දෙදෙන වෙත් ද, මාගේ සැව් උවැසියනට තෙල තුලාවෙයි. තෙල ප්‍රමාණ වෙයි.

## 4. 4. 3. 7

## [ රාහුල සූත්‍රය ]

27. එකල ආයුෂ්මත් **රහල්** තෙරණුවෝ භාග්‍යවතුන් වහන්සේ කරා එළඹියහ. එළඹ භාග්‍යවතුන් වහන්සේ සකසා වැඳ එකත්පස් ව හුන්හ. එකත්පස් ව හුන් ආයුෂ්මත් රහල් තෙරණුවන්ට භාග්‍යවතුන් වහන්සේ තෙල වදාළහ:

යා ච රාහුල අජ්ඣත්තිකා පඨවිධාතු යා ච බාහිරා පඨවිධාතු, පඨවිධාතුරෙවෙසා. තං "නෙතං මම, නෙසොහමස්මි, න මෙසො අත්තා"ති, එවමෙතං යථාභූතං සම්මප්පඤ්ඤාය දට්ඨබ්බං. එවමෙතං යථාභූතං සම්මප්පඤ්ඤාය දිස්වා පඨවිධාතුයා නිබ්බින්දති. පඨවිධාතුයා චිත්තං විරාජෙති.

යා ච රාහුල අජ්ඣත්තිකා ආපොධාතු යා ච බාහිරා ආපොධාතු, ආපොධාතුරෙවෙසා. තං "නෙතං මම නෙසො හමස්මි, න මෙසො අත්තා"ති, එවමෙතං යථාභූතං සම්මප්පඤ්ඤාය දට්ඨබ්බං. එවමෙතං යථාභූතං සම්මප්පඤ්ඤාය දිස්වා ආපොධාතුයා නිබ්බින්දති. ආපොධාතුයා චිත්තං විරාජෙති.

යා ච රාහුල අජ්ඣත්තිකා තෙජොධාතු යා ච බාහිරා තෙජොධාතු, තෙජොධාතුරෙවෙසා. තං "නෙතං මම, නෙසොහමස්මි, න මෙ සො අත්තා"ති, එවමෙතං යථාභූතං සම්මප්පඤ්ඤාය දට්ඨබ්බං. එවමෙතං යථාභූතං සම්මප්පඤ්ඤාය දිස්වා තෙජොධාතුයා නිබ්බින්දති තෙජොධාතුයා චිත්තං විරාජෙති.

යා ච රාහුල අජ්ඣත්තිකා වායොධාතු යා ච බාහිරා වායොධාතු, වායොධාතුරෙවෙසා. තං "නෙතං මම, නෙසොහමස්මි, න මෙ සො අත්තා"ති, එවමෙතං යථාභූතං සම්මප්පඤ්ඤාය දට්ඨබ්බං. එවමෙතං යථාභූතං සම්මප්පඤ්ඤාය දිස්වා වායොධාතුයා නිබ්බින්දති. වායොධාතුයා චිත්තං විරාජෙති.

යතො ඛො රාහුල භික්ඛු ඉමාසු චතූසු ධාතූසු නෙව අත්තානං න අත්තනියං සමනුපස්සති. අයං වුච්චති රාහුල භික්ඛු අච්ඡෙච්ඡි තණ්හං, වාවත්තයි සංයොජනං, සම්මා මානාභිසමයා අන්තමකාසි දුක්ඛස්සාති.

### 4. 4. 3. 8.

### [ චෙතොවිමුත්තිසුත්තං ]

28. චත්තාරොමෙ භික්ඛවෙ පුග්ගලා සන්තො සංවිජ්ජමානා ලොකස්මිං. කතමෙ චත්තාරො:

ඉධ භික්ඛවෙ භික්ඛු අඤ්ඤතරං සන්තං චෙතොවිමුත්තිං උපසම්පජ්ජ විහරති. සො සක්කායනිරොධං මනසි කරොති. තස්ස සක්කායනිරොධං මනසි කරොතො සක්කායනිරොධෙ චිත්තං න පක්ඛන්දති, නප්පසීදති, න සන්තිට්ඨති නාධිමුච්චති.

රාහුලය, ආධ්‍යාත්මික යම් පෘථිවිධාතුයෙක් ඇද්ද, යම් බාහිරපෘථිවි ධාතුයෙක් ඇද්ද, තෙල පෘථිවිධාතු ම වෙයි. “තෙල පෘථිවිධාතු මා ගැත්තේ නො වෙයි. මම පෘථිවිධාතුයෙම් නො වෙමි. තෙල මාගේ ආත්ම නො වෙයි” කියා ඒ පෘථිවිධාතුව මෙසේ තත් වූ පරිදි සම්‍යක් ප්‍රඥායෙන් දතයුතු ය. මෙසේ තෙල පෘථිවිධාතුව තත් වූ පරිදි සම්‍යක් ප්‍රඥායෙන් දැක පෘථිවි-ධාතුයෙහි උකැටි වෙයි. පෘථිවිධාතුයෙහි සිත් නො අලවයි.

රාහුලය, යම් ආධ්‍යාත්මික අබ්ධාතුයෙක් ඇද්ද, යම් ඉන්ද්‍රියබද්ධයෙන්-බැහැරි අබ්ධාතුයෙක් ඇද්ද, තෙල අබ්ධාතු ම වෙයි. “තෙල මා ගැත්තේ නො වේ. මා අබ්ධාතුයෙම් නො වෙමි. තෙල මාගේ ආත්ම නො වේ. තෙල මෙසේ ය”යි එය තත් වූ පරිදි සම්‍යක් ප්‍රඥායෙන් දතයුතු ය. මෙසෙයින් තෙල තත් වූ පරිදි සම්‍යක් ප්‍රඥායෙන් දැක අබ්ධාතුයෙහි උකැටි වෙයි. අබ්ධාතුයෙහි සිත නො අලවයි.

රාහුලය, යම් ආධ්‍යාත්මික තේජෝධාතුයෙක් වේ ද, යම් බාහිර තේජෝධාතුයෙක් වේ ද, තෙල තේජෝධාතු ම වෙයි. “තෙල මා ගැත්තේ නො වේ. ‘මම තේජෝධාතුයෙම් නො වෙමි’ තෙල මාගේ ආත්ම නො වේ තෙල මෙසේය”යි එය තත් වූ පරිදි සම්‍යක් ප්‍රඥායෙන් දතයුතු ය. මෙසෙයින් තෙල තත් වූ පරිදි සම්‍යක් ප්‍රඥායෙන් දැක තේජෝධාතුයෙහි උකැටි වෙයි. තේජෝධාතුයෙහි සිත නො අලවයි.

රාහුලය, යම් ආධ්‍යාත්මික වායෝධාතුයෙක් ඇද්ද, යම් බාහිර වායෝ-ධාතුයෙක් ඇද්ද, තෙල වායෝධාතු ම වෙයි. “තෙල මා ගැත්තේ නො වේ. මම වායෝධාතුයෙම් නො වෙමි. තෙල මාගේ ආතම නො වේ. තෙල මෙසේ ය” යි එය තත් වූ පරිදි සම්‍යක් ප්‍රඥායෙන් දැක්ක යුතුයි. මෙසෙයින් තෙල තත් වූ පරිදි සම්‍යක් ප්‍රඥායෙන් දැක වායෝධාතුයෙහි උකැටි වෙයි. වායෝධාතුයෙහි සිත නො අලවයි.

රාහුලය, යම් කලෙක පටන් ගෙණ මහණ මේ සතර ධාතූන් කෙරෙහි ලා ආත්මය නො දක්නේ ම වේ ද, ආත්මයට අයිති දෑයක් හෝ නො දක්නේ ම වේ ද, රාහුලය, මේ මහණ තෘෂ්ණාව සිඳපීය යි ද, දස සංයෝජන උපුටා හළහ යි ද, මානයාගේ ප්‍රහාණාභිසමයෙන් වටදුක් මොනොවට කෙළවර කළහ යි ද කියනු ලැබේ.

## 4. 4. 3. 8

## [ චෙතොවිමුත්තිසූත්‍රය ]

28. මහණෙනි, මේ පුද්ගලයෝ සතර දෙනෙක් ලොකයෙහි විද්‍යමානයහ. කවර සතර දෙනෙක යත්:

මහණෙනි, මෙසස්නෙහි මහණ අන්‍යතර ශාන්ත චේතෝවිමුක්තියකට වැද ගෙණ වාස කෙරේ. හේ සත්කායනිරෝධය (වට පිළිබඳ නිවන) මෙනෙහි කෙරේ. සත්කායනිරෝධය මෙනෙහි කරණ ඔහට සත්කාය-නිරෝධයෙහි ලා සිත අරමුණු විසින් නො වදනේ ය. නො පහදනේ ය. මොනොවට නො සිටුනේ ය. නිශ්චය කොටගෙණ නො සිටුනේ ය.

L!

තස්ස ඛො එතං භික්ඛවෙ භික්ඛුනො න සක්කායනිරොධො පාටිකඞ්ඛො.

සෙය්‍යථාපි භික්ඛවෙ පුරිසො ලසගතෙන[1] හත්ථෙන සාඛං ගණ්හෙය්‍ය, තස්ස සො හත්ථො සජ්ජෙය්‍යපි ගණ්හෙය්‍යපි බජ්ඣෙය්‍යපි. එවමෙව ඛො භික්ඛවෙ භික්ඛු අඤ්ඤතරං සන්තං චෙතොවිමුත්තිං උපසම්පජ්ජ විහරති. සො සක්කායනිරොධං මනසි කරොති. තස්ස සක්කායනිරොධං මනසි කරොතො සක්කායනිරොධෙ චිත්තං න පක්ඛන්දති නප්පසීදති න සන්තිට්ඨති නාධිමුච්චති. තස්ස ඛො එතං භික්ඛවෙ භික්ඛුනො න සක්කායනිරොධො පාටිකඞ්ඛො.

ඉධ පන භික්ඛවෙ භික්ඛු අඤ්ඤතරං සන්තං චෙතොවිමුත්තිං උපසම්පජ්ජ විහරති, සො සක්කායනිරොධං මනසි කරොති. තස්ස සක්කායනිරොධං මනසි කරොතො සක්කායනිරොධෙ චිත්තං පක්ඛන්දති පසීදති සන්තිට්ඨති අධිමුච්චති. තස්ස ඛො එතං භික්ඛවෙ භික්ඛුනො සක්කායනිරොධො පාටිකඞ්ඛො.

සෙය්‍යථාපි භික්ඛවෙ පුරිසො සුද්ධෙන හත්ථෙන සාඛං ගණ්හෙය්‍ය, තස්ස සො හත්ථො නෙව සජ්ජෙය්‍ය න ගණ්හෙය්‍ය න බජ්ඣෙය්‍ය. එවමෙව ඛො භික්ඛවෙ භික්ඛු අඤ්ඤතරං සන්තං චෙතොවිමුත්තිං උපසම්පජ්ජ විහරති. සො සක්කායනිරොධං මනසි කරොති. තස්ස සක්කායනිරොධං මනසි කරොතො සක්කායනිරොධෙ චිත්තං පක්ඛන්දති පසීදති සන්තිට්ඨති අධිමුච්චති. තස්ස ඛො එතං භික්ඛවෙ භික්ඛුනො සක්කායනිරොධො පාටිකඞ්ඛො.

ඉධ පන භික්ඛවෙ භික්ඛු අඤ්ඤතරං සන්තං චෙතොවිමුත්තිං උපසම්පජ්ජ විහරති. සො අවිජ්ජාප්පභෙදං මනසි කරොති. තස්ස අවිජ්ජාප්පභෙදං මනසි කරොතො අවිජ්ජාප්පභෙදෙ චිත්තං න පක්ඛන්දති න ප්පසීදති න සන්තිට්ඨති නාධිමුච්චති. තස්ස ඛො එතං භික්ඛවෙ භික්ඛුනො න අවිජ්ජාප්පභෙදො පාටිකඞ්ඛො

සෙය්‍යථාපි භික්ඛවෙ ජම්බාලී අනෙකවස්සගණිකා, තස්සා පුරිසො යානි චෙව ආයමුඛානි තානි පිදහෙය්‍ය, යානි ච අපායමුඛානි තානි විවරෙය්‍ය, දෙවො ච සම්මාධාරං නානුප්පවෙච්ඡෙය්‍ය, එවං හි තස්සා භික්ඛවෙ ජම්බාලියා න පාලිප්පභෙදො[2] පාටිකඞ්ඛො. එවමෙව ඛො භික්ඛවෙ භික්ඛු අඤ්ඤතරං සන්තං චෙතොවිමුත්තිං උපසම්පජ්ජ විහරති. සො අවිජ්ජාප්පභෙදං මනසි කරොති. තස්ස අවිජ්ජාප්පභෙදං මනසි කරොතො අවිජ්ජාප්පභෙදෙ චිත්තං න පක්ඛන්දති නප්පසීදති න සන්තිට්ඨති නාධිමුච්චති. තස්ස ඛො එතං භික්ඛවෙ භික්ඛුනො න අවිජ්ජාප්පභෙදො පාටිකඞ්ඛො.

ඉධ පන භික්ඛවෙ භික්ඛු අඤ්ඤතරං සන්තං චෙතොවිමුත්තිං උපසම්පජ්ජ විහරති. සො අවිජ්ජාප්පභෙදං මනසි කරොති. තස්ස අවිජ්ජාප්පභෙදං මනසි කරොතො අවිජ්ජාප්පභෙදෙ චිත්තං පක්ඛන්දති පසීදති සන්තිට්ඨති අධිමුච්චති. තස්ස ඛො එතං භික්ඛවෙ භික්ඛුනො අවිජ්ජාප්පභෙදො පාටිකඞ්ඛො

1. ලෙපගතෙන - මජසං. 2. ආලිප්පභෙදො, සීමු.

මහණෙනි, ඒ මහණහට සත්කාය නිරෝධය නො කැමති විය යුතුය.

මහණෙනි, යම් පරිදි පුරුෂයෙක් ලභ ගැල්වූ අතින් ශාඛාවක් ගන්නේ වේ ද, උහුගේ ඒ අත ලගන්නේත් වෙයි. හැදගන්නේත් වෙයි. සා වදනේත් වෙයි. මහණෙනි, එපරිදි ම මහණ අන්‍යතර ශාන්ත චෙතොවිමුක්තියකට පැමිණ වෙසේ. හේ සත්කාය නිරෝධය මෙනෙහි කෙරේ. සත්කාය නිරෝධය මෙනෙහි කරණ ඔහුට සත්කාය නිරෝධයෙහි ලා සිත අරමුණු විසින් නො පැන ගණී. නො පහදී. මොනොවට නො-සිටී. නො බැස ගණී. මහණෙනි, ඒ මහණහට සත්කාය නිරෝධය නොකැමැති විය යුතුය.

මහණෙනි, මෙ සස්නෙහි මහණ අන්‍යතර ශාන්ත චෙතොවිමුක්තියකට එළඹ වාස කෙරෙයි. හේ සත්කාය නිරෝධය මෙනෙහි කෙරෙයි. සත්කාය නිරෝධය මෙනෙහි කරණ ඔහට සත්කාය නිරෝධයෙහි ලා සිත අරමුණු විසින් වැද ගණී. පහදී. මොනොවට සිටී. නිශ්චය කොට ගණී. මහණෙනි, ඒ මහණහට සත්කාය නිරෝධය කැමති විය යුතුය.

මහණෙනි, යම් පරිදි පුරුෂයෙක් ධෞතහස්තයෙන් ශාඛාවක් ගන්නේ වේ ද, උහුගේ ඒ අත නො ම ලගනේ ය. නො ඇදගන්නේ ය, නොසා-ගන්නේ ය. මහණෙනි, මෙ පරිදි ම මහණ අන්‍යතර ශාන්ත චෙතො-විමුක්තියකට එළඹ වෙසේ. හේ සත්කාය නිරෝධය මෙනෙහි කෙරේ, සත්කාය නිරෝධය මෙනෙහි කරණ ඔහට සත්කාය නිරෝධයෙහි ලා සිත අරමුණු විසින් පැනගණී. පහදී. මොනොවට සිටී. නිශ්චය කොට ගණී. මහණෙනි, ඒ මහණහට සත්කායනිරෝධය කැමැති විය යුතුය.

මහණෙනි, මෙ සස්නෙහි මහණ අන්‍යතර ශාන්ත චෙතොවිමුක්තියකට එළඹ වාස කෙරෙයි. හේ අවිද්‍යා බිඳුම් කැමැති රහත්බව මෙනෙහි කෙරෙහි. අවිද්‍යා භෙදය මෙනෙහි කරණ ඔහට අවිද්‍යාභෙදයෙහි ලා සිත අරමුණු විසින් නොපැන ගණී. නො පහදී. මොනොවට නො සිටී. අධිමුක්ත නො වේ. මහණෙනි, ඒ මහණහට අවිද්‍යාභේදය නො කැමැති විය යුතුය.

මහණෙනි, යම් පරිදි නොඑක් වස් ගණන් ඇති ගවරවළෙක් වේ ද, පුරුෂයෙක් ඒ වළෙහි යම් දිය වදනා සිඳු කදුරු ඇත් ද, ඒ වසයි. දිය බැස යන සිදුරු ඇද් ද, ඒ විවර කෙරෙයි. මෙසය ද මොනවට දහර නො වස්වයි. මහණෙනි, මෙසේ වත් ම ඒ ගවරවළෙහි මියර බිඳලීම කැමැති නො විය යුතුය. මහණෙනි, එ පරිදි ම මහණ අන්‍යතර ශාන්ත චෙතොවිමුක්තියකට පැමිණ වෙසේ. හේ අවිද්‍ය බිඳලීම මෙනෙහි කෙරේ. අවිද්‍ය බිඳුම් මෙනෙහි කරණ ඔහට අවිද්‍යා බිඳලීමෙහි ලා සිත අරමුණු විසින් නො පැන ගණී. නො පහදී. මොනොවට නො සිටී. නිශ්චය නො ලබයි. මහණෙනි, ඒ මහණහට අර්හත්වය නො කැමති විය යුතුය.

මහණෙනි, මෙ සස්නෙහි මහණ අන්‍යතර ශාන්ත චෙතොවිමුක්තියකට පැමිණ වාස කෙරෙයි. හේ අවිද්‍යාව බිඳලීම මෙනෙහි කෙරෙයි. අවිද්‍යාව බිඳලීම මෙනෙහි කරණ ඔහුට අවිද්‍යාව බිඳලීමෙහි ලා සිත අරමුණු විසින් පැන ගණී. පහදී. මොනවට සිටී. නිශ්චය කොට ගණී. මහණෙනි, ඒ මහණහට අවිද්‍යාව බිඳලීම කැමති විය යුතුයි.

සෙය්‍යථාපි භික්ඛවෙ ජම්බාලි අනෙකවස්සගණිකා, තස්සා පුරිසො යානි චෙව ආයමුඛානි තානි විවරෙය්‍ය, යානි ච අපායමුඛානි තානි පිදහෙය්‍ය, දෙවො ච සම්මාධාරං අනුප්පවෙච්ඡෙය්‍ය. එවං හි තස්සා භික්ඛවෙ ජම්බාලියා පාලිප්පභෙදො පාටිකඞ්ඛො. එවමෙව ඛො භික්ඛවෙ භික්ඛු අඤ්ඤතරං සන්තං චෙතොවිමුත්තිං උපසම්පජ්ජ විහරති. සො අවිජ්ජාප්පභෙදං මනසි කරොති. තස්ස අවිජ්ජාප්පභෙදං මනසි කරොතො අවිජ්ජාප්පභෙදෙ චිත්තං පක්ඛන්දති පසීදති සන්තිට්ඨති අධිමුච්චති. තස්ස ඛො එතං භික්ඛවෙ භික්ඛුනො අවිජ්ජාප්පභෙදො පාටිකඞ්ඛො.

ඉමෙ ඛො භික්ඛවෙ චත්තාරො පුග්ගලා සන්තො සංවිජ්ජමානා ලොකස්මින්ති.

4. 4 3. 9.

[ පරිනිබ්බානහෙතු සුත්තං ]

29. අථ ඛො ආයස්මා **ආනන්දො**, යෙනායස්මා **සාරිපුත්තො** තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා ආයස්මතා සාරිපුත්තෙන සද්ධිං සම්මොදි. සම්මොදනීයං කථං සාරාණීයං වීතිසාරෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නො ඛො ආයස්මා ආනන්දො ආයස්මන්තං සාරිපුත්තං එතදවොච:

කො නු ඛො ආවුසො සාරිපුත්ත හෙතු කො පච්චයො යෙනමිධෙකච්චෙ සත්තා දිට්ඨෙව ධම්මෙ න පරිනිබ්බායන්තීති?

ඉධාවුසො ආනන්ද සත්තා ඉමා හානභාගියා සඤ්ඤාති යථාභූතං නප්පජානන්ති. ඉමා ඨිතිභාගියා සඤ්ඤාති යථාභූතං නප්පජානන්ති. ඉමා විසෙසභාගියා සඤ්ඤාති යථාභූතං නප්පජානන්ති. ඉමා නිබ්බෙධභාගියා සඤ්ඤාති යථාභූතං නප්පජානන්ති. අයං ඛො ආවුසො ආනන්ද හෙතු අයං පච්චයො යෙන මිධෙකච්චෙ සත්තා දිට්ඨෙව ධම්මෙ න පරිනිබ්බායන්තීති.

කො පනාවුසො සාරිපුත්ත හෙතු කො පච්චයො යෙන මිධෙකච්චෙ සත්තා දිට්ඨෙව ධම්මෙ පරිනිබ්බායන්තීති?

ඉධාවුසො ආනන්ද සත්තා ඉමා හානභාගියා සඤ්ඤාති යථාභූතං පජානන්ති. ඉමා ඨිතිභාගියා සඤ්ඤාති යථාභූතං පජානන්ති. ඉමා විසෙසභාගියා සඤ්ඤාති යථාභූතං පජානන්ති. ඉමා නිබ්බෙධභාගියා සඤ්ඤාති යථාභූතං පජානන්ති. අයං ඛො ආවුසො ආනන්ද හෙතු අයං පච්චයො යෙන මිධෙකච්චෙ සත්තා දිට්ඨෙව ධම්මෙ පරිනිබ්බායන්තීති.

මහණෙනි, යම් පරිදි අනේවස් ගණන් ඇති ගවර වළෙක් වේ ද, ඒ වළෙහි පුරුෂයෙක් යම් ආයමුඛ ඇත් නම් ඒ විවර කෙරෙයි. යම් අපායමුඛ ඇත් නම් ඒ වසයි. මෙඝය ද මොනවට දහර වස්වයි. මහණෙනි, මෙසේ ඒ ගවර වළෙහි දියර බිඳලීම කැමැති විය යුතුයි. මහණෙනි, එපරිදි ම මහණ අන්‍යතර ශාන්ත චෙතොවිමුක්තියකට එළඹ වෙසේ. හේ අවිද්‍යාභෙදය මෙනෙහි කෙරේ. අවිද්‍යාභෙදය මෙනෙහි කරණ ඔහට අවිද්‍යාභෙදයෙහි ලා සිත අරමුණ විසින් පැන ගණී. පහදී. මොනොවට සිටී. නිශ්චය කොට ගණී. මහණෙනි, ඒ මහණහට අවිද්‍යාභෙද සඞ්ඛ්‍යාත අර්හත්ත්වය කැමැති විය යුතුය.

මහණෙනි, ලොකයෙහි මේ සතර පුද්ගලයෝ විද්‍යමානයහ.

## 4. 4. 3. 9.

## [ පරිනිබ්බානහෙතු සූත්‍රය ]

29. එකල ආයුෂ්මත් **ආනන්ද** තෙරණුවෝ ආයුෂ්මත් **සැරියුත්** තෙරණුවන් කරා එළඹියහ. එළඹ ආයුෂ්මත් සැරියුත් තෙරණුවන් සමග සතුටු වූහ. සම්මොදනයට කරුණු වූ සිහි කරණුවට නිසි වූ කථාව කොට නිමවා එකත්පසෙක හුන්හ. එකත්පස්ව හුන් ආයුෂ්මත් ආනන්ද තෙරණුවෝ ආයුෂ්මත් සැරියුත් තෙරණුවන්ට තෙල කීහ:

ඇවැත, ශාරීපුත්‍රයෙනි, මෙලොව ඇතැම් සත්ත්ව කෙනෙක් ඉහාත්මයෙහි ම නො පිරිනිවෙත් ද, එයට හෙතු කවරේ ය? එයට ප්‍රත්‍යය කවරේ ය?.

ඇවැත, ආනන්දයෙනි, මෙලොව සත්හු 'මොහු හානභාගීය සංඥහ' යි යථාභූතය නො දනිත්. 'මොහු ස්ථිතිභාගීය සංඥහ'යි යථාභූතය නො දනිත් ද. 'මොහු විශෙෂභාගීය සංඥහ' යි යථාභූතය නොදනිත්. 'මොහු නිර්වේදභාගීයසංඥහ' යි යථාභූතය නොදනිත් 'ඇවැත, ආනන්දයෙනි, යම් හෙයෙකින් මෙලොව ඇතැම් සත්ත්ව කෙනෙක් ඉහාත්මයෙහි ම නො පිරි-නිවෙත් ද, මේ එයට හෙතු යි. මේ එයට ප්‍රත්‍යය යි.

ඇවැත, ශාරීපුත්‍රයෙනි, යම් හෙයෙකින් මෙලොව ඇතැම් සත්ත්ව කෙනෙක් ඉහාත්මයෙහි ම පිරිනිවෙත් ද, එයට හේතු කවරේ ය? එයට ප්‍රත්‍යය කවරේ ය?

ඇවැත, ආනන්දයෙනි, මෙලොව සත්හු 'මොහු හානභාගීය සංඥහ' යි යථාභූතය දනිත්. 'මොහු ස්ථිතිභාගීයසංඥහ' යි යථාභූතය දනිත්. 'මොහු විශෙෂභාගීය සංඥහ' යි යථාභූතය දනිත්. 'මොහු නිර්වේදභාගීය සංඥහ යි' යථාභූතය දනිත්. ඇවැත, ආනන්දයෙනි, යම් හෙයෙකින් මෙලොව ඇතැම් සත්ත්ව කෙනෙක් ඉහාත්මයෙහි ම පිරිනිවෙත් ද, මේ එයට හෙතු යි. මේ එයට ප්‍රත්‍යය යි.

## 4. 4. 3. 10.

## [ මහාපදෙසදෙසනාසුත්තං ]

30. එකං සමයං භගවා **භොගනගරෙ** විහරති **ආනන්දචෙතියෙ**. තත්‍ර ඛො භගවා භික්ඛූ ආමන්තෙසි භික්ඛවොති. භදන්තෙති තෙ භික්ඛූ භගවතො පච්චස්සොසුං. භගවා එතදවොච:

චත්තාරොමෙ භික්ඛවෙ මහාපදෙසෙ දෙසෙස්සාමි. තං සුණාථ සාධුකං මනසි කරොථ භාසිස්සාමීති. එවං භන්තෙති ඛො තෙ භික්ඛූ භගවතො පච්චස්සොසුං. භගවා එතදවොච:

කතමෙ ච භික්ඛවෙ චත්තාරො මහාපදෙසා?

ඉධ භික්ඛවෙ භික්ඛු එවං වදෙය්‍ය: "සම්මුඛා මෙතං ආවුසො භගවතො සුතං සම්මුඛා පටිග්ගහිතං අයං ධම්මො අයං විනයො ඉදං සත්ථුසාසන"න්ති.

තස්ස භික්ඛවෙ භික්ඛුනො භාසිතං නෙව අභිනන්දිතබ්බං. න පටික්කොසි-තබ්බං, අනභිනන්දිත්වා අප්පටික්කොසිත්වා තානි පදබ්‍යඤ්ජනානි සාධුකං උග්ගහෙත්වා සුත්තෙ ඔතාරෙතබ්බානි. විනයෙ සන්දස්සෙතබ්බානි. තානි චෙ සුත්තෙ ඔතාරියමානානි විනයෙ සන්දස්සියමානානි න චෙව සුත්තෙ ඔතරන්ති න විනයෙ සන්දිස්සන්ති, නිට්ඨමෙත්ථ ගන්තබ්බං: අද්ධා ඉදං න චෙව තස්ස භගවතො වචනං අරහතො සම්මාසම්බුද්ධස්ස. ඉමස්ස ච භික්ඛුනො දුග්ගහිතන්ති ඉති ඉදං භික්ඛවෙ ඡඩ්ඩෙය්‍යාථ.

ඉධ පන භික්ඛවෙ භික්ඛු එවං වදෙය්‍ය: "සම්මුඛා මෙතං ආවුසො භගවතො සුතං සම්මුඛා පටිග්ගහිතං අයං ධම්මො අයං විනයො ඉදං සත්ථුසාසන"න්ති.

තස්ස භික්ඛවෙ භික්ඛුනො භාසිතං නෙව අභිනන්දිතබ්බං න පටික්කොසිතබ්බං. අනභිනන්දිත්වා අප්පටික්කොසිත්වා තානි පදබ්‍යඤ්ජනානි සාධුකං උග්ගහෙත්වා සුත්තෙ ඔතාරෙතබ්බානි. විනයෙ සන්දස්සෙතබ්බානි. තානි චෙ සුත්තෙ ඔතාරියමානානි විනයෙ සන්දස්සියමානානි සුත්තෙ චෙව ඔතරන්ති විනයෙ ච සන්දිස්සන්ති, නිට්ඨමෙත්ථ ගන්තබ්බං: අද්ධා ඉදං තස්ස භගවතො වචනං අරහතො සම්මාසම්බුද්ධස්ස. ඉමස්ස ච භික්ඛුනො සුග්ගහිතන්ති. ඉමං භික්ඛවෙ පඨමං මහාපදෙසං ධාරෙය්‍යාථ.

ඉධ පන භික්ඛවෙ භික්ඛු එවං වදෙය්‍ය: "අමුකස්මිං නාම ආවාසෙ සඞ්ඝො විහරති සථෙරො සපාමොක්ඛො. තස්ස මෙ සඞ්ඝස්ස සම්මුඛා සුතං සම්මුඛා පටිග්ගහිතං අයං ධම්මො අයං විනයො ඉදං සත්ථුසාසන"න්ති.

## 4. 4. 3. 10

## [ මහාපදෙසදෙසනා සූත්‍රය ]

30. එක් සමයෙක භාග්‍යවතුන් වහන්සේ භොගනගරයෙහි ආනන්ද චෛත්‍යයෙහි, වැඩ වසන සේක. එහි දී භාග්‍යවතුන් වහන්සේ 'මහණෙනි, යි භික්ෂූන් බැණවූ සේක. 'වහන්ස' යි ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට පිළිවදන් දුන්හ. භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක:

මහණෙනි, මේ සතර මහා අපදෙසයන් දෙසමි. ඒ අසව්, මෙනෙහි කරව්, කියමි යි වදාළහ. වහන්ස, එසේ ය යි ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට ප්‍රතිවචන දුන්හු. භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක:

මහණෙනි, සතර මහාපදෙසයෝ කවරහ?

මහණෙනි, මෙසස්නෙහි මහණ මෙසේ බණන්නේ ය: "ඇවැත්නි, මා විසින් මෙය භාග්‍යවතුන් වහන්සේ හමුයෙහි අසන ලදී, හමුයෙහි පිළිගන්නා ලදී: මේ ය ධර්ම ය, මේ ය විනය, මේ ය ශාස්තෘශාසනය" කියා යි.

මහණෙනි, ඒ මහණහුගේ භාෂිතය අභිනන්දනය නො කටයුතු ය. පිළිකෙසි නො කටයුතුය. අභිනන්දනය නොකොට පිළිකෙසි නොකොට ඒ පදසඞ්ඛ්‍යාත ව්‍යඤ්ජනයෝ මොනොවට ඉගෙණ සූත්‍රයෙහි බහා ලියයුතු වෙති. විනයෙහි ලා සැසඳිය යුතු වෙති. ඉදින් ඒ පදව්‍යඤ්ජනයෝ සූත්‍රයෙහි බහනු ලබන්නාහු, විනයෙහි ලා සසඳනු ලබන්නාහු, සූත්‍රයෙහි නො බැස ගණිත් ද, විනයෙහි ලා නො සසැඳෙත් ද, මෙහි ලා මෙසේ නිශ්චයට යා යුතුය: 'එකාන්තයෙන් මෙය අර්හත් සම්‍යක් සම්බුද්ධ භාග්‍යවතුන් වහන්සේගේ වචන නො වෙයි. මේ මහණහු විසින් වරදවා ගන්නා ලද්දෙකැ' යි. මහණෙනි, මෙසේ මේ භාෂිතය හැර පියව.

මහණෙනි, මෙසස්නෙහි මහණ මෙසේ බණන්නේ ය. "ඇවැත්නි, මා විසින් මෙය බුදුන් හමුයෙහි අසන ලදි, හමුයෙහි පිළිගන්නා ලදි: මේ ය ධර්මය, මේ ය විනය, මේ ය ශාස්තෘ ශාසනය" කියා යි.

මහණෙනි, ඒ මහණහුගේ භාෂිතය සතුටින් නො පිළිගතයුතු ය. පිළිකෙසි නො කටයුතුය. සතුටින් නො පිළිගෙණ පිළිකෙසි නොකොට ඒ පදව්‍යඤ්ජන මොනොවට උගෙණ සූත්‍රයෙහි බැහිය යුතු ය. විනයෙහි ලා සැසඳිය යුතුය. ඉදින් ඒ පදව්‍යඤ්ජන සූත්‍රයෙහි බහන ලද්දේ, විනයෙහි ලා සසඳන ලද්දේ සූත්‍රයෙහිත් වැටේ ද, විනයෙහිත් සසැඳේ ද, මෙහි ලා නිශ්චයට යා යුතු ය: 'එකාන්තයෙන් මෙය අර්හත් සම්‍යක් සම්බුද්ධ ඒ භාග්‍යවතුන් වහන්සේගේ වචන ය. මේ භික්ෂූහු විසිනුත් මොනොවට උගන්නා ලදැ' යි කියා ය. මහණෙනි, මේ පළමුවන මහාපදෙසය (=මහාප්‍රමාණය) ධරව.

මහණෙනි, මෙසස්නෙහි මහණ මෙසේ බණන්නේ ය "අසෝ ආවාස-යෙහි තෙරුන් සියෝ ප්‍රමුඛයන් සියෝ සඟහු වෙසෙති. මා විසින් ඒ සඟුන් හමුයෙහි අසන ලදී, හමුයෙහි පිළිගන්නා ලදී: මේ ය ධර්මය, මේ ය විනය, මේ ය ශාස්තෘ ශාසනය" කියා යි.

තස්ස භික්ඛවෙ භික්ඛුනො භාසිතං නෙව අභිනන්දිතබ්බං. න පටික්කොසිතබ්බං. අනභිනන්දිත්වා අප්පටික්කොසිත්වා තානි පදබ්‍යඤ්ජනානි. සාධුකං උග්ගහෙත්වා සුත්තෙ ඔතාරෙතබ්බානි. විනයෙ සන්දස්සෙතබ්බානි. තානි චෙ සුත්තෙ ඔතාරියමානානි විනයෙ සන්දස්සියමානානි න චෙව සුත්තෙ ඔතරන්ති, න විනයෙ සන්දිස්සන්ති, නිට්ඨමෙත්ථ ගන්තබ්බං: අද්ධා ඉදං න චෙව තස්ස භගවතො වචනං අරහතො සම්මාසම්බුද්ධස්ස. තස්ස ච සඞ්ඝස්ස දුග්ගහිතන්ති. ඉති හිදං[1] භික්ඛවෙ ඡඩ්ඩෙය්‍යාථ.

ඉධ පන භික්ඛවෙ භික්ඛු එවං වදෙය්‍ය: "අමුකස්මිං නාම ආවාසෙ සඞ්ඝො විහරති සථෙරො සපාමොක්ඛො. තස්ස මෙ සඞ්ඝස්ස සම්මුඛා සුතං සම්මුඛා පටිග්ගහිතං අයං ධම්මො අයං විනයො ඉදං සත්ථුසාසනන්ති."

තස්ස භික්ඛවෙ භික්ඛුනො භාසිතං නෙව අභිනන්දිතබ්බං. න පටික්කොසිතබ්බං. අනභිනන්දිත්වා අප්පටික්කොසිත්වා තානි පදබ්‍යඤ්ජනානි සාධුකං උග්ගහෙත්වා සුත්තෙ ඔතාරෙතබ්බානි. විනයෙ සන්දස්සෙතබ්බානි. තානි චෙ සුත්තෙ ඔතාරියමානානි විනයෙ සන්දස්සියමානානි සුත්තෙ චෙව ඔතරන්ති, විනයෙ ච සන්දිස්සන්ති, නිට්ඨමෙත්ථ ගන්තබ්බං: අද්ධා ඉදං තස්ස භගවතො වචනං අරහතො සම්මාසම්බුද්ධස්ස. තස්ස ච සඞ්ඝස්ස සුග්ගහිතන්ති. ඉදං භික්ඛවෙ දුතියං මහාපදෙසං ධාරෙය්‍යාථ.

ඉධ පන භික්ඛවෙ භික්ඛු එවං වදෙය්‍ය: "අමුකස්මිං නාම ආවාසෙ සම්බහුලා ථෙරා භික්ඛූ විහරන්ති බහුස්සුතා ආගතාගමා ධම්මධරා විනයධරා මාතිකාධරා. තෙසං මෙ ථෙරානං සම්මුඛා සුතං සම්මුඛා පටිග්ගහිතං අයං ධම්මො අයං විනයො ඉදං සත්ථුසාසනන්"ති.

තස්ස භික්ඛවෙ භික්ඛුනො භාසිතං නෙව අභිනන්දිතබ්බං. න පටික්කොසිතබ්බං. අනභිනන්දිත්වා අප්පටික්කොසිත්වා තානි පදබ්‍යඤ්ජනානි සාධුකං උග්ගහෙත්වා සුත්තෙ ඔතාරෙතබ්බානි. විනයෙ සන්දස්සෙතබ්බානි. තානි චෙ සුත්තෙ ඔතාරියමානානි විනයෙ සන්දස්සියමානානි න චෙව සුත්තෙ ඔතරන්ති, න විනයෙ සන්දිස්සන්ති, නිට්ඨමෙත්ථ ගන්තබ්බං: අද්ධා ඉදං න චෙව තස්ස භගවතො වචනං අරහතො සම්මාසම්බුද්ධස්ස. තෙසඤ්ච ථෙරානං දුග්ගහිතන්ති. ඉති හිදං භික්ඛවෙ ඡඩ්ඩෙය්‍යාථ.

1. ඉතිහෙතං - මජසං.

මහණෙනි, ඒ මහණහුගේ භාෂිතය අභිනන්දනා නො කටයුතු ය. පටික්කොසනා නො කටයුතු ය. අභිනන්දනා නො කොට පටික්කොසනා නො කොට ඒ පදව්‍යඤ්ජන මොනොවට උගෙණ සූත්‍රයෙහි හෙළිය යුතු ය. විනයයෙහි ලා සසැඳිය යුතු ය. ඒ පදව්‍යඤ්ජන සූත්‍රයෙහි බහනු ලබන්නේ, විනයයෙහි සසඳනු ලබන්නේ, ඉදින් සූත්‍රයෙහි නො බස්නේ නම්, විනයෙහි ලා නොසැසැඳේ නම්, මෙහි ලා මෙසේ නිශ්චයට යායුතු ය: 'ඒකාන්තයෙන් මෙය අර්හත් සම්‍යක් සම්බුද්ධ ඒ භාග්‍යවතුන් වහන්සේගේ භාෂිත නො වේ. ඒ සඟුන් විසින් වරදවා ගන්නා ලද වෙයි' කියා යි. මහණෙනි, මෙසේ මෙය හැරපියව.

මහණෙනි, මෙ සස්නෙහි මහණ මෙසේ බණන්නේ ය: "අසෝ ආවාසයෙහි තෙරුන් සියෝ ප්‍රමුඛයන් සියෝ සඟහු වෙසෙත්. මා විසින් ඒ සඟුන්ගේ හමුයෙහි අසන ලදී. හමුයෙහි පිළිගන්නා ලදි: 'මේ ය ධර්මය, මේ ය විනය, මේය ශාස්තෘශාසනය" කියා යි.

මහණෙනි, ඒ මහණහුගේ භාෂිතය අභිනන්දනා නො කටයුතු ය. පටික්කොසනා නො කට යුතු ය. අභිනන්දනා නො කොට පටික්කොසනා නොකොට ඒ පදව්‍යඤ්ජන මොනොවට උගෙණ සූත්‍රයෙහි බහාලිය යුතු ය. විනයෙහි ලා සසඳ ලියයුතු ය. ඉදින් ඒ පදව්‍යඤ්ජන සූත්‍රයෙහි බහනු ලබන්නේ, විනයෙහි ලා සසඳනු ලබන්නේ, සූත්‍රයෙහිත් බස්නේ ද, විනයෙහිත් සසඳ ලබා ද, මෙහි ලා මෙසේ නිශ්චයට යායුතු යි: 'ඒකාන්තයෙන් මෙය අර්හත් සම්‍යක් සම්බුද්ධ ඒ භාග්‍යවතුන් වහන්සේගේ භාෂිත වෙයි. ඒ සඟුන් විසින් මොනොවට ගන්නා ලද්දේ ය' කියා යි. මහණෙනි, මේ දෙවන මහාපදෙසය ධරව.

මහණෙනි, මෙසස්නෙහි මහණ මෙසේ බණන්නේ ය:"අසෝ ආවාසයෙහි බහුශ්‍රැත වූ ආගතාගම ඇති ධර්මධර විනයධර මාතෘකාධර සම්බහුල තෙර මහණහු වෙසෙති. මා විසින් ඒ තෙරුන්ගේ හමුයෙහි අසන ලදී, හමුයෙහි පිළිගන්නා ලදී. මේ ය ධර්මය, මේ ය විනය, මේ ය ශාස්තෘශාසනය" කියා යි.

මහණෙනි, ඒ මහණහුගේ භාෂිතය අභිනන්දනා නො කටයුතු ය. පටික්කොසනා නො කටයුතු ය. අභිනන්දනා නොකොට පටික්කොසනා නොකොට ඒ පදව්‍යඤ්ජන මොනොවට ඉගෙණ සූත්‍රයෙහි බැහිය යුතු ය. විනයෙහි සසැඳිය යුතු ය. ඉදින් ඒ පදව්‍යඤ්ජන සූත්‍රයෙහි නගනු ලබන්නේ, විනයෙහි සසඳනු ලබන්නේ, සූත්‍රයෙහි බැස නො ගණී ද, 'විනයෙහි ලා සසඳ නොගණී ද, මෙහි ලා නිශ්චයට යා යුතු යි: 'ඒකාන්තයෙන් මේ භාෂිතය අර්හත් සම්‍යක් සම්බුද්ධ ඒ භාග්‍යවතුන් වහන්සේගේ භාෂිත නො වේ. ඒ තෙරවරුන් විසිනුත් වරදවා ගන්නා ලද' කියා යි. මහණෙනි, මෙසේ මෙය හැරපියව.

ඉධ පන භික්ඛවෙ භික්ඛු එවං වදෙය්‍ය: "අමුකස්මිං නාම ආවාසෙ සම්බහුලා ථෙරා භික්ඛූ විහරන්ති බහුස්සුතා ආගතාගමා ධම්මධරා විනයධරා මාතිකාධරා. තෙසං. මෙ ථෙරානං සම්මුඛා සුතං සම්මුඛා පටිග්ගහිතං අයං ධම්මො අයං විනයො ඉදං සත්ථුසාසන"න්ති.

තස්ස භික්ඛවෙ භික්ඛුනො භාසිතං නෙව අභිනන්දිතබ්බං. න පටික්කොසිතබ්බං. අනභිනන්දිත්වා අප්පටික්කොසිත්වා තානි පදබ්‍යඤ්ජනානි සාධුකං උග්ගහෙත්වා සුත්තෙ ඔතාරෙතබ්බානි. විනයෙ සන්දස්සෙතබ්බානි. තානි චෙ සුත්තෙ ඔතාරියමානානි විනයෙ සන්දස්සියමානානි සුත්තෙ චෙව ඔතරන්ති, විනයෙ ච සන්දිස්සන්ති, නිට්ඨමෙත්ථ ගන්තබ්බං: 'අද්ධා ඉදං තස්ස භගවතො වචනං අරහතො සම්මාසම්බුද්ධස්ස. තෙසඤ්ච ථෙරානං සුග්ගහිත'න්ති. ඉදං භික්ඛවෙ තතියං මහාපදෙසං ධාරෙය්‍යාථ.

ඉධ පන භික්ඛවෙ භික්ඛු එවං වදෙය්‍ය: "අමුකස්මිං නාම ආවාසෙ එකො ථෙරො භික්ඛු විහරති බහුස්සුතො ආගතාගමො ධම්මධරො විනයධරො මාතිකාධරො. තස්ස මෙ ථෙරස්ස සම්මුඛා සුතං සම්මුඛා පටිග්ගහිතං අයං ධම්මො අයං විනයො ඉදං සත්ථුසාසන"න්ති.

තස්ස භික්ඛවෙ භික්ඛුනො භාසිතං නෙව අභිනන්දිතබ්බං. න පටික්කොසිතබ්බං. අනභිනන්දිත්වා අප්පටික්කොසිත්වා තානි පදබ්‍යඤ්ජනානි සාධුකං උග්ගහෙත්වා සුත්තෙ ඔතාරෙතබ්බානි. විනයෙ සන්දස්සෙතබ්බානි. තානි චෙ සුත්තෙ ඔතාරියමානානි විනයෙ සන්දස්සියමානානි න චෙව සුත්තෙ ඔතරන්ති, න විනයෙ සන්දිස්සන්ති, නිට්ඨමෙත්ථ ගන්තබ්බං: 'අද්ධා ඉදං න චෙව තස්ස භගවතො වචනං අරහතො සම්මාසම්බුද්ධස්ස. තස්ස ච ථෙරස්ස දුග්ගහිත'න්ති. ඉති හිදං භික්ඛවෙ ඡඩ්ඩෙය්‍යාථ.

ඉධ පන භික්ඛවෙ භික්ඛු එවං වදෙය්‍ය: "අමුකස්මිං නාම ආවාසෙ එකො ථෙරො භික්ඛු විහරති බහුස්සුතො ආගතාගමො ධම්මධරො විනයධරො මාතිකාධරො. තස්ස මෙ ථෙරස්ස සම්මුඛා සුතං සම්මුඛා පටිග්ගහිතං අයං ධම්මො අයං විනයො ඉදං සත්ථුසාසන"න්ති.

තස්ස භික්ඛවෙ භික්ඛුනො භාසිතං නෙව අභිනන්දිතබ්බං. න පටික්කොසිතබ්බං. අනභිනන්දිත්වා අප්පටික්කොසිත්වා තානි පදබ්‍යඤ්ජනානි සාධුකං උග්ගහෙත්වා සුත්තෙ ඔතාරෙතබ්බානි. විනයෙ සන්දස්සෙතබ්බානි තානි චෙ සුත්තෙ ඔතාරියමානානි විනයෙ සන්දස්සියමානානි සුත්තෙ චෙව ඔතරන්ති, විනයෙ ච සන්දිස්සන්ති, නිට්ඨමෙත්ථ ගන්තබ්බං: 'අද්ධා ඉදං තස්ස භගවතො වචනං අරහතො සම්මාසම්බුද්ධස්ස, තස්ස ච ථෙරස්ස සුග්ගහිත'න්ති. ඉදං භික්ඛවෙ චතුත්ථං මහාපදෙසං ධාරෙය්‍යාථ.

ඉමෙ ඛො භික්ඛවෙ චත්තාරො මහාපදෙසාති.

**සඤ්චෙතනියවග්ගො තතියො** *

* තස්සුද්දානං :- චෙතනා විභත්ති කොට්ඨිතො
ආනන්දෙ උපවාන පඤ්චමං
ආයාචන රාහුල ජම්බාලි
නිබ්බානං මහාපදෙසකාති.

මහණෙනි, මෙසස්නෙහි මහණ මෙසේ බණන්නේ ය: අසෝ ආවාසයෙහි, බහුශ්‍රැත වූ ආගතාගම ඇති ධර්මධර විනයධර මාතෘකාධර සම්බහුල තෙර මහණහු ඇත. මා විසින් ඒ තෙරුන් හමුයෙහි අසන ලද, හමුයෙහි පිළිගන්නා ලද: මේය ධර්මය, මේය විනය මේය ශාස්තෲශාසනය කියා යි.

මහණෙනි, ඒ මහණහුගේ භාෂිතය අභිනන්දනා නො කට යුතුය. පටික්කොශනා නො කටයුතු ය. අභිනන්දනා නොකොට පටික්කොශනා නොකොට ඒ පදව්‍යඤ්ජන මොනොවට ඉගෙණ සූත්‍රයෙහි තැබිය යුතු ය. විනයෙහි ලා සසැඳිය යුතු ය. ඉදින් මේ පදව්‍යඤ්ජන සූත්‍රයෙහි තබනු ලබන්නේ, විනයයෙහි ලා සසඳනු ලබන්නේ, සූත්‍රයෙහිත් බැස ගණී නම් විනයයෙහිත් සසඳ ලබා නම්, මෙහි ලා නිශ්චයට යා යුතු යි: 'ඒකාන්තයෙන් මේ භාෂිතය අර්හත් සම්‍යක් සම්බුද්ධ ඒ භාග්‍යවතුන් වහන්සේගේ භාෂිත යි. ඒ තෙරුන් විසිනුත් මොනොවට ගන්නා ලද ය කියා යි. මහණෙනි, මේ තුන්වන මහාපදේශය ධරව.

මහණෙනි, මෙසස්නෙහි මහණ මෙසේ බණන්නේ ය: අසෝ ආවාසයෙහි බහුශ්‍රැත වූ ආගතාගම ඇති ධර්මධර විනයධර මාතෘකාධර එක් තෙර කෙනෙක් වෙසෙති. මා විසින් ඒ තෙරුන්ගේ හමුයෙහි අසන ලදි, හමුයෙහි පිළිගන්නා ලදි: මේය ධර්මය, මේ ය විනය, මේ ය ශාස්තෲශාසනය කියා යි

මහණෙනි, ඒ මහණහුගේ භාෂිතය අභිනන්දනා නො කටයුතු ය. පටික්කොශනා නො කටයුතු ය. අභිනන්දනා නො කොට පටික්කොශනා නො කොට ඒ පදව්‍යඤ්ජන මොනොවට ඉගෙණ සූත්‍රයෙහි තැබිය යුතු ය. විනයෙහි සසැඳිය යුතු ය. ඉදින් ඒ පදව්‍යඤ්ජන සූත්‍රයෙහි තබනු ලබන්නේ විනයෙහිලා සසඳනු ලබන්නේ, සූත්‍රයෙහිත් බැස නො ගණී නම් විනයෙහිත් සසඳ නො ගණී නම්, මෙහි ලා නිශ්චයට යා යුතු ය: ඒකාන්තයෙන් මේ භාෂිතය අර්හත් සම්‍යක් සම්බුද්ධ ඒ භාග්‍යවතුන් වහන්සේගේ භාෂිත නො වේ. ඒ තෙරුන් විසිනුත් වරදවා ගන්නා ලද කියා යි. මහණෙනි, මෙසේ මේය හැරපියව.

මහණෙනි, මෙසස්නෙහි මහණ මෙසේ බණන්නේ ය: අසෝ ආවාසයෙහි බහුශ්‍රැත වූ ආගතාගම ඇති ධර්මධර විනයධර මාතෘකාධර එක් ස්ථවිර භික්ෂු කෙනෙක් වෙසෙති. මා විසින් ඒ තෙරුන් හමුයෙහි අසන ලදි, හමුයෙහි පිළිගන්නා ලදි: මේ ය ධර්මය, මේ ය විනය, මේ ය ශාස්තෲශාසනය කියා යි.

මහණෙනි, ඒ භික්ෂුහුගේ භාෂිතය අභිනන්දනා නො කටයුතු යි. පටික්කොශනා නො කටයුතු යි. අභිනන්දනා නො කොට පටික්කොශනා නො කොට ඒ පදව්‍යඤ්ජන මනා කොට ඉගෙණ සූත්‍රයෙහි තැබිය යුතු ය. විනයෙහි ලා සසැඳිය යුතු ය. ඉදින් ඒ පදව්‍යඤ්ජන සූත්‍රයෙහි තබනු ලබන්නේ, විනයයෙහිලා සසඳනු ලබන්නේ, සූත්‍රයෙහිත් බැස සිටුනේ ද විනයයෙහිත් සසැඳ සිටුනේ ද, මෙහි ලා නිශ්චයට යායුතු ය: ඒකාන්තයෙන් මේ භාෂිතය අර්හත් සම්‍යක් සම්බුද්ධ ඒ භාග්‍යවතුන් වහන්සේගේ භාෂිත යි. ඒ තෙරුන් විසිනුත් මොනොවට ගන්නා ලද කියා යි. මහණෙනි, මේ සතරවෙනි මහාපදේසය ධරව.

මහණෙනි, මේ සතර මහාපදේසයෝ යි.

**සඤ්චේතනියවර්ගය තුන්වෙනි යි.**

# 4. බ්‍රාහ්මණවග්ගො

## 4. 4. 4. 1.

## [ යොධාජීවසුත්තං ]

**[සාවත්ථිනිදානං]**

31. චතූහි භික්ඛවෙ අඞ්ගෙහි සමන්නාගතො යොධාජීවො රාජාරහො හොති රාජභොග්ගො රඤ්ඤො අඞ්ගන්තෙව සඞ්ඛං ගච්ඡති. කතමෙහි චතූහි?

ඉධ භික්ඛවෙ යොධාජීවො ඨානකුසලො ච හොති, දූරෙ පාතී ච, අක්ඛණවෙධී ච, මහතො ච කායස්ස පදාලෙතා. ඉමෙහි ඛො භික්ඛවෙ චතූහි අඞ්ගෙහි සමන්නාගතො යොධාජීවො රාජාරහො හොති රාජභොග්ගො රඤ්ඤො අඞ්ගන්තෙව සඞ්ඛං ගච්ඡති.

එවමෙව ඛො භික්ඛවෙ චතූහි ධම්මෙහි සමන්නාගතො භික්ඛු ආහුනෙය්‍යො හොති පාහුනෙය්‍යො, දක්ඛිණෙය්‍යො, අඤ්ජලිකරණීයො, අනුත්තරං පුඤ්ඤක්ඛෙත්තං ලොකස්ස. කතමෙහි චතූහි: ඉධ භික්ඛවෙ භික්ඛු ඨානකුසලො ච හොති, දූරෙ පාතී ච, අක්ඛණවෙධී ච, මහතො ච කායස්ස පදාලෙතා.

කථඤ්ච භික්ඛවෙ භික්ඛු ඨානකුසලො හොති? ඉධ භික්ඛවෙ භික්ඛු සීලවා හොති -පෙ- සමාදාය සික්ඛති සික්ඛාපදෙසු. එවං ඛො භික්ඛවෙ භික්ඛු ඨානකුසලො හොති.

කථඤ්ච භික්ඛවෙ භික්ඛු දූරෙ පාතී හොති? ඉධ භික්ඛවෙ භික්ඛු යං කිඤ්චි රූපං අතීතානාගතපච්චුප්පන්නං අජ්ඣත්තං වා බහිද්ධා වා ඔළාරිකං වා සුඛුමං වා හීනං වා පණීතං වා යං දූරෙ සන්තිකෙ වා, සබ්බං රූපං නෙතං මම, නෙසොහමස්මි, න මෙ සො අත්තාති, එවමෙතං යථාභූතං සම්මප්පඤ්ඤාය පස්සති. යා කාචි වෙදනා -පෙ- යා කාචි සඤ්ඤා -පෙ- යෙ කෙචි සඞ්ඛාරා -පෙ- යං කිඤ්චි විඤ්ඤාණං අතීතානාගත-පච්චුප්පන්නං අජ්ඣත්තං වා බහිද්ධා වා ඔළාරිකං වා සුඛුමං වා හීනං වා පණීතං වා යං දූරෙ සන්තිකෙ වා, සබ්බං විඤ්ඤාණං නෙතං මම, නෙසොහමස්මි, න මෙසො අත්තාති. එවමෙතං යථාභූතං සම්මප්පඤ්ඤාය පස්සති. එවං ඛො භික්ඛවෙ භික්ඛු දූරෙ පාතී හොති.

කථඤ්ච භික්ඛවෙ භික්ඛු අක්ඛණවෙධී හොති? ඉධ භික්ඛවෙ භික්ඛු ඉදං දුක්ඛන්ති යථාභූතං පජානාති, අයං දුක්ඛසමුදයො'ති යථාභූතං පජානාති, අයං දුක්ඛනිරොධො'ති යථාභූතං පජානාති, අයං දුක්ඛනිරොධගාමිනී පටිපදා'ති යථාභූතං පජානාති. එවං ඛො භික්ඛවෙ භික්ඛු අක්ඛණවෙධී හොති.

Free Distribution www.aathaapi.org

# 4. බ්‍රාහ්මණ වර්ගය

## 4. 4. 4. 1.

## [ යොධාජීව සූත්‍රය ]

[ සැවැත්නිදාන යි ]

31. මහණෙනි, සතර අඟෙකින් සමන්වාගත යොධාජීව රජුන් විසින් වළඳ කටයුතු වූයේ රජාංගී වෙයි. රජාංගයෙක් මැයැ යි ගණනට යෙයි. කවර සතරෙකින යත්:

මහණෙනි, මෙලොව යොධාජීව විද්‍යා තැනෙහි දක්ෂ වූයේ වේ ද, දුර හෙළනසුලු වූයේ ද, අතුණු එළියෙන් විදුනේ වේ ද, මහත් සෙන්මුළු බිඳලනුයේ වේ ද, මහණෙනි, මේ සතර අඟින් සමන්වාගත යොධාජීව රජහු විසින් වළඳනා ලදුයේ රජාංගී වෙයි. රජුගේ අවයවයෙක් ය යි ගණනට යෙ යි.

මහණෙනි, එපරිදි ම සතර දහමෙකින් සමන්වාගත මහණ ආහුනෙය්‍ය, පාහුණෙය්‍ය ය, දක්ඛිණෙය්‍ය, අඤ්ජලිකරණීය වෙයි. ලෝකයට අනුත්තර පුණ්‍යක්ෂෙත්‍ර වෙයි. කවර සතර දහමෙක යත්: මහණෙනි, මෙසස්නෙහි මහණ 'ඨානකුසල' වූයේත් 'දූරෙපාතී' වූයේත් 'අක්ඛණවෙධී' වූයේත් මහත් කායවිදරණය' කරන්නේත්. වෙයි.

මහණෙනි, කෙසේ නම් මහණ 'ඨාන කුසල' වේ ද,? මහණෙනි, මෙසස්නෙහි මහණ සිල්වත් වෙයි. ශික්ෂාපද විෂයයෙහි සමාදානය කොට හික්මෙයි. මහණෙනි, මෙසේ මහණ 'ඨාන කුසල' වෙයි.

මහණෙනි, කෙසේ මහණ දූරෙ පාතී වේ ද? මහණෙනි, මෙ සස්නෙහි මහණ අතීතානාගත ප්‍රත්‍යුත්පන්න වේවයි ඉන්ද්‍රියබද්ධ වේවයි අනින්ද්‍රිය බද්ධ වේවයි ඖදාරික වේවයි සියුම් වේවයි හීන වේවයි ප්‍රණීත වේවයි යමෙක් දුරෙහි වේවයි ළඟ වේවයි, යම් කිසි රූපායතනයෙක් ඇත් ද, තෙල එ හැම රූප මා ගැත්තේ නො වෙයි. මම තෙල රූපයෙම් නො වෙම්. තෙල රූප මාගේ විසිය වැටෙන්නේ නො වෙයි. මෙසේ තෙල යථාභූතය සම්‍යක් ප්‍රඥායෙන් දක්නේ වේ ද, යම් කිසි වෙදනාවෙක් ඇත් ද ... යම් කිසි සංඥායෙක් ඇත් ද ... යම් කිසි සංස්කාරයෝ ඇත් ද ... අතීතානාගත ප්‍රත්‍යුත්පන්න වේවයි ආධ්‍යාත්මික වේවයි බාහිර වේවයි දළ වේවයි සියුම් වේවයි හීන වේවයි ප්‍රණීත වේවයි යමක් දුරෙහි වේවයි ළඟ වේවයි යම් කිසි විඥානයෙක් ඇත් ද, තෙල හැම විඥානය මා ගැත්තේ නො වෙයි මම තෙල විඥානයෙම් නොවෙම්. තෙල විඥානය මාගේ විසිය වැටෙන්නේ නො වෙයි මෙසේ මේ යථාභූතය සම්‍යක් ප්‍රඥායෙන් දක්නේ ද, මහණෙනි, මෙසේ මහණ 'දූරෙපාතී' වෙයි.

මහණෙනි, කෙසේ මහණ 'අක්ඛණවෙධී' වේ ද? මහණෙනි, මෙසස්නෙහි මහණ මේ දුකැ යි තත් වූ පරිදි දනී ද, මේ දුක් උපදනා හේතු යි තත්වූ පරි දි දනී ද, මේ දුක් නැසීමැ යි තත්වූ පරිදි දනී ද, මේ දුක් නැසීමට පමුණුවන පිළිවෙතැ යි තත් වූ පරිදි දනී ද, මහණෙනි, මෙසේ මහණ අක්ඛණවෙධී වෙයි.

කථඤ්ච භික්ඛවෙ භික්ඛු මහතො ච කායස්ස පදාලෙතා හොති? ඉධ භික්ඛවෙ භික්ඛු මහන්තං අවිජ්ජාක්ඛන්ධං පදාලෙති. එවං ඛො භික්ඛවෙ භික්ඛු මහතො කායස්ස පදාලෙතා හොති.

ඉමෙහි ඛො භික්ඛවෙ චතූහි ධම්මෙහි සමන්නාගතො භික්ඛු ආහුනෙය්‍යො හොති -පෙ- අනුත්තරං පුඤ්ඤක්ඛෙත්තං ලොකස්සාති

## 4. 4. 4. 2.

## [ පාටිභොගසුත්තං ]

32. චතුන්නං භික්ඛවෙ ධම්මානං නත්ථි කොචි පාටිභොගො සමණො වා බ්‍රාහ්මණො වා දෙවො වා මාරො වා බ්‍රහ්මා වා කොචි වා ලොකස්මිං. කතමෙසං චතුන්නං?

ජරාධම්මං මා ජීරීති නත්ථි කොචි පාටිභොගො සමණො වා බ්‍රාහ්මණො වා දෙවො වා මාරො වා බ්‍රහ්මා වා කොචි වා ලොකස්මිං.

ව්‍යාධිධම්මං මා ව්‍යාධීයීති නත්ථි කොචි පාටිභොගො සමණො වා බ්‍රාහ්මණො වා දෙවො වා මාරො වා බ්‍රහ්මා වා කොචි වා ලොකස්මිං.

මරණධම්මං මා මීයීති නත්ථි කොචි පාටිභොගො සමණො වා බ්‍රාහ්මණො වා දෙවො වා මාරො වා බ්‍රහ්මා වා කොචි වා ලොකස්මිං.

යානි ඛො පන තානි පාපකානි කම්මානි සංකිලෙසිකානි පොනොභවිකානි සදරානි දුක්ඛවිපාකානි ආයතිං ජාතිජරාමරණිකානි. තෙසං විපාකො මා නිබ්බත්තීති නත්ථි කොචි පාටිභොගො සමණො වා බ්‍රාහ්මණො වා දෙවො වා මාරො වා බ්‍රහ්මා වා කොචි වා ලොකස්මිං.

ඉමෙසං ඛො භික්ඛවෙ චතුන්නං ධම්මානං නත්ථි කොචි පාටිභොගො සමණො වා බ්‍රාහ්මණො වා දෙවො වා මාරො වා බ්‍රහ්මා වා කොචි වා **ලොකස්මින්ති.**

## 4. 4. 4. 3

## [ වස්සකාරසුත්තං ]

33. එකං සමයං භගවා **රාජගහෙ** විහරති වෙළුවනෙ **කලන්දකනිවාපෙ**. අථ ඛො **වස්සකාරො** බ්‍රාහ්මණො මගධමහාමත්තො යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවතා සද්ධිං සම්මොදි සම්මොදනීයං කථං සාරණීයං වීතිසාරෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නො ඛො වස්සකාරො බ්‍රාහ්මණො මගධමහාමත්තො භගවන්තං එතදවොච:

අහං හි භො ගොතම එවංවාදී එවංදිට්ඨී: "යො කොචි දිට්ඨං භාසති 'එවං මෙ දිට්ඨන්ති' නත්ථි තතො දොසො, යො කොචි සුතං භාසති 'එවං මෙ සුතන්ති' නත්ථි තතො දොසො, යො කොචි මුතං භාසති 'එවං මෙ මුතන්ති' නත්ථි තතො දොසො, යො කොචි විඤ්ඤාතං භාසති 'එවං මෙ විඤ්ඤාතන්ති' නත්ථි තතො දොසොති"

මහණෙනි, කෙසේ මහණ මහත් වූ කය බිඳලන්නේ වේ ද? මහණෙනි, මේ සස්නෙහි මහණ මහත් වූ අවිද්‍යාස්කන්ධය පළයි. මහණෙනි, මෙසේ මහත් කය පළන්නේ වේ.

මහණෙනි, මේ සතර දහමින් සමන්වාගත මහණ ආහුනෙය්‍ය වෙයි... ලෝකයට අනුත්තර පුණ්‍යක්ෂෙත්‍ර වෙයි.

## 4. 4. 4 2

### [ පාටිභොග සූත්‍රය ]

32. මහණෙනි, දහමුන් සතර දෙනකුන්ට මහණ වේවයි, බමුණු වේවයි, දෙව් වේවයි, මර වේවයි, බඹ වේවයි, ලොව කිසිවෙක් වේවයි ඇප වූ කිසිවෙක් නැත. කවර සතර දෙනකුට ය යත්:

'ජරාධර්‍මය තහමක් දිරව'යි මහණ වේවයි, බමුණු වේවයි, දෙව් වේවයි' මර වේවයි, බඹ වේවයි, ලොව කිසිවෙක් වේවයි ඇප වූ කිසිවෙක් නැත.

'ව්‍යාධිධර්‍මය තහමක් පෙළෙව'යි මහණ වේවයි, බමුණු වේවයි, දෙව් වේවයි, මර වේවයි, බඹ වේවයි, ලොව කිසි වෙක් වේවයි ඇප වූ කිසිවෙක් නැත.

'මරණධර්‍මය තහමක් මියේව'යි, මහණ වේවයි, බමුණු වේවයි, දෙව් වේවයි, මර වේවයි, බඹ වේවයි, ලොව කිසිවෙක් වේවයි ඇප වූ කිසිවෙක් නැත.

'කෙලෙසුන් කරණ, පුනර්භවය ගෙණ දෙන, දරථ සහිත, දුඃඛවිපාක ඇති, මතුයෙහි ජාතිජරාමරණ එළවන යම් පාපකර්‍මයෝ ඇත් ද, උන්ගේ විපාකය තහමක් උපදී ව'යි මහණ වේවයි, බමුණු වේවයි, දෙව් වේවයි, මර වේවයි, බඹ වේවයි, ලොව කිසිවෙක් වේවයි ඇප වූ කිසිවෙක් නැත

මහණෙනි, මේ සතර දහමුනට ශ්‍රමණයෙක් වේවයි, බ්‍රාහ්මණයෙක් වේවයි, දෙවියෙක් වේවයි, මාරයෙක් වේවයි, බ්‍රහ්මයෙක් වේවයි, ලොව අනෙකෙක් වේවයි ඇප වූ කිසිවෙක් නැත

## 4. 4. 4. 3.

### [ වස්සකාර සූත්‍රය ]

33. එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ **රජගහනුවර කලන්දකනිවාප** නම් වූ වේළුවනාරාමයෙහි වැඩ වෙසෙති. එක්බිති මගධමහාමාත්‍ර වූ **වස්සකාර** බමුණු භාග්‍යවතුන් වහන්සේ කරා එළඹියේ ය. එළඹ භාග්‍යවතුන් වහන්සේ සමග සතුටු විය. සමෙමාදනීය වූ සාරාණීය වූ කථාව කොට නිමවා එකත්පස්ව හින. එකත්පස්ව හුන් මගධ මහාමාත්‍ර වස්සකාර බමුණු භාග්‍යවතුන් වහන්සේට මෙල සැල කෙළේ ය:

නවස් ගෞතමයන් වහන්ස, "යම් කිසිවෙක් 'මා විසින් මෙසේ දක්නා ලද්දැ'යි දුටු දෑ බෙණේ නම් එහි දෙසෙක් නැත. 'මා විසින් මෙසේ අසන ලද්දැ' යි යම් කිසිවෙක් ඇසූ දෑ බෙණේ නම් එහි දෙසෙක් නැත. 'මා විසින් මෙසේ ස්පර්ශ කරණ ලද්දැ'යි යම් කිසිවෙක් ස්පර්ශ කරණ ලද්ද බෙණේ නම් එහි දෙසෙක් නැත.'මා විසින් මෙසේ දන්නා ලද්දැ'යි යම් කිසිවෙක් දැනගත් දෑ බෙණේ නම් එහි දෙසෙක් නැතැ යි මම මෙබඳු වාද ඇතියෙමි. මෙබඳු දෘෂ්ටි ඇතියෙමි."

නාහං බ්‍රාහ්මණ සබ්බං දිට්ඨං භාසිතබ්බන්ති වදාමි. න පනාහං බ්‍රාහ්මණ සබ්බං දිට්ඨං න භාසිතබ්බන්ති වදාමි. නාහං බ්‍රාහ්මණ සබ්බං සුතං භාසිතබ්බන්ති වදාමි. න පනාහං බ්‍රාහ්මණ සබ්බං සුතං න භාසිතබ්බන්ති වදාමි. නාහං බ්‍රාහ්මණ සබ්බං මුතං භාසිතබ්බන්ති වදාමි. න පනාහං බ්‍රාහ්මණ සබ්බං මුතං න භාසිතබ්බන්ති වදාමි. නාහං බ්‍රාහ්මණ සබ්බං විඤ්ඤාතං භාසිතබ්බන්ති වදාමි. න පනාහං බ්‍රාහ්මණ සබ්බං විඤ්ඤාතං න භාසිතබ්බන්ති වදාමි.

යං හි බ්‍රාහ්මණ දිට්ඨං භාසතො අකුසලා ධම්මා අභිවඩ්ඪන්ති, කුසලා ධම්මා පරිහායන්ති, එවරූපං දිට්ඨං න භාසිතබ්බන්ති වදාමි. යං ච ඛ්වාස්ස බ්‍රාහ්මණ දිට්ඨං භාසතො අකුසලා ධම්මා පරිහායන්ති, කුසලා ධම්මා අභිවඩ්ඪන්ති, එවරූපං දිට්ඨං භාසිතබ්බන්ති වදාමි.

යං හි බ්‍රාහ්මණ සුතං භාසතො අකුසලා ධම්මා අභිවඩ්ඪන්ති, කුසලා ධම්මා පරිහායන්ති, එවරූපං සුතං න භාසිතබ්බන්ති වදාමි. යං ච ඛ්වාස්ස බ්‍රාහ්මණ සුතං භාසතො අකුසලා ධම්මා පරිහායන්ති, කුසලා ධම්මා අභිවඩ්ඪන්ති, එවරූපං සුතං භාසිතබ්බන්ති වදාමි.

යං හි බ්‍රාහ්මණ මුතං භාසතො අකුසලා ධම්මා අභිවඩ්ඪන්ති, කුසලා ධම්මා පරිහායන්ති, එවරූපං මුතං න භාසිතබ්බන්ති වදාමි. යං ච ඛ්වාස්ස බ්‍රාහ්මණ මුතං භාසතො අකුසලා ධම්මා පරිහායන්ති. කුසලා ධම්මා අභිවඩ්ඪන්ති, එවරූපං මුතං භාසිතබ්බන්ති වදාමි.

යං හි බ්‍රාහ්මණ විඤ්ඤාතං භාසතො අකුසලා ධම්මා අභිවඩ්ඪන්ති, කුසලා ධම්මා පරිහායන්ති, එවරූපං විඤ්ඤාතං න භාසිතබ්බන්ති වදාමි. යං ච ඛ්වාස්ස බ්‍රාහ්මණ විඤ්ඤාතං භාසතො අකුසලා ධම්මා පරිහායන්ති, කුසලා ධම්මා අභිවඩ්ඪන්ති, එවරූපං විඤ්ඤාතං භාසිතබ්බන්ති වදාමීති.

අථ ඛො වස්සකාරො බ්‍රාහ්මණො මගධමහාමත්තො භගවතො භාසිතං අභිනන්දිත්වා උට්ඨායාසනා පක්කාමීති.

### 4. 4. 4. 4.

### [ජාණුස්සොණිසුත්තං]

**[සාවත්ථිනිදානං]**

34. **අථ ඛො ජාණුස්සොණි** බ්‍රාහ්මණො යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවතා සද්ධිං සම්මොදි. සම්මොදනීයං කථං සාරාණීයං වීතිසාරෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නො ඛො ජාණුස්සොණි බ්‍රාහ්මණො භගවන්තං එතදවොච:

අහං හි භො ගොතම එවංවාදී එවංදිට්ඨී: "නත්ථි යො සො මරණධම්මො සමානො න භායති. න සන්තාසං ආපජ්ජති මරණස්සා"ති.

අත්ථි බ්‍රාහ්මණ මරණධම්මො සමානො භායති, සන්තාසං ආපජ්ජති මරණස්ස. අත්ථි පන බ්‍රාහ්මණ මරණධම්මො සමානො න භායති, න සන්තාසං ආපජ්ජති මරණස්ස.

Free Distribution www.aathaapi.org

බමුණ, මම දුටු හැම කියයුතුය යි නොකියමි. බමුණ, මම දුටු හැම නො කියයුතුය යි නො ද කියමි. බමුණ, මම ඇසූ හැම කියයුතුය යි නො ම කියමි. බමුණ, මම ඇසූ හැම නො කියයුතුය යි නො ද කියමි. බමුණ, මම හැම (ඵොට්ඨබ්බ ගන්ධරස සඞ්ඛ්‍යාතමුතය) කියයුතුය යි නො ම කියමි. බමුණ, මම හැම මුතය නොකියයුතුය යි නො ද කියමි. බමුණ, මම හැම විඥතය (ධම්මාරම්මණ) කියයුතුය යි නො ම කියමි. බමුණ, මම හැම විඥතය නොකියයුතුය යි නො ද කියමි.

බමුණ, දුටු යමක් කියන්නහුට අකුසල්දහම්හු වැඩෙත් ද, කුසල්දහම්හු පිරිහෙත් ද, මෙබඳු දුටු දය නොකියයුතුය යි කියමි. බමුණ, යම් දුටු දයක් කියන්නහුට අකුසල්දහම්හු පිරිහෙත් ද, කුසල්දහම්හු වැඩෙත් ද, මෙබඳු දුටු දය කියයුතුය යි කියමි.

බමුණ, යම් ඇසූ දයක් කියන්නහුට අකුසල්දහම්හු වැඩෙත් ද, කුසල්-දහම්හු පිරිහෙත් ද, මෙබඳු ඇසූ දය නො කියයුතුය යි කියමි බමුණ, යම් ඇසූ දයක් බණන්නහුට අකුසල්දහම්හු පිරිහෙත් ද කුසල්දහම්හු වැඩෙත් ද, මෙබඳු ඇසූ දය කිය යුතුය යි කියමි.

බමුණ, යම් මුතයක් බණන්නහුට අකුසල්දහම්හු වැඩෙත් ද, කුසල්-දහම්හු පිරිහෙත් ද, මෙබඳු මුතය නො කියයුතුය යි කියමි. බමුණ, යම් මුතයක් බණන්නහුට අකුසල්දහම්හු පිරිහෙත් ද, කුසල්දහම්හු වැඩෙත් ද, මෙබඳු මුතය කිය යුතුය යි කියමි.

බමුණ, යම් විඥතයක් බණන්නහුට අකුසල්දහම්හු වැඩෙත් ද, කුසල්-දහම්හු පිරිහෙත් ද, මෙබඳු විඥතය නොකියයුතුය යි කියමි. බමුණ, යම් විඥතයක් බණන්නහුට අකුසල්දහම්හු පිරිහෙත් ද, කුසල්දහම්හු වැඩෙත් ද, මෙබඳු විඥතය කියයුතුය යි කියමි.

එකල්හි මගධමහාමාත්‍ය වස්සකාර බමුණු භාග්‍යවතුන් වහන්සේගේ භාෂිතය අභිනන්දනය කොට හුනස්නෙන් නැඟී ගියේ ය.

### 4. 4. 4. 4.

### [ ජාණුස්සොණි සූත්‍රය ]

[සැවැත්නිදනයි]

34. එකල ජාණුස්සොණි බමුණු භාග්‍යවතුන් වහන්සේ කරා එළඹියේ ය. එළඹ භාග්‍යවතුන් වහන්සේ සමග සතුටු විය. සමෙමාදනීයවූ සාරාණීය වූ කථාව කොට නිමවා එකත්පස් ව හිඳ. එකත්පස් ව හුන් ජාණුස්සොණි බමුණු භාග්‍යවතුන් වහන්සේට මෙල සැල කෙළේ ය:

භවත් ගෞතමයෙනි, "මම මෙබඳු වාද ඇතියෙමි මෙබඳු දිටු ඇතියෙමි. මරණසැහැවි ඇතිව මරණයට නොබානා සන්ත්‍රාසයට නොවදනා යමෙක් නැත" යනුයි.

බමුණ, මරණසැහැවි ඇතිව මරණයට බානා සන්ත්‍රාසයට පැමිණෙන යමෙක් ඇත. බමුණ, මරණසැහැවි ඇත ද මරණයට නොබානා සන්ත්‍රාසයට නොවදිනා යමෙක් ද ඇත.

කතමො ච බ්‍රාහ්මණ මරණධම්මො සමානො භායති, සන්තාසං ආපජ්ජති මරණස්ස?

ඉධ බ්‍රාහ්මණ එකච්චො කාමෙසු අවීතරාගො හොති අවිගතච්ඡන්දො අවිගතපෙමො අවිගතපිපාසො අවිගතපරිළාහො අවිගතතණ්හො, තමෙතඤ්ඤතරො ගාළ්හො රොගාතඞ්කො ඵුසති. තස්සඤ්ඤතරෙන ගාළ්හෙන රොගාතඞ්කෙන ඵුට්ඨස්ස එවං හොති: පියා වත මං කාමා ජහිස්සන්ති, පියෙ චාහං කාමෙ ජහිස්සාමීති. සො සොචති කිලමති පරිදෙවති උරත්තාළිං කන්දති. සම්මොහං ආපජ්ජති. අයං ඛො බ්‍රාහ්මණ මරණධම්මො සමානො භායති, සන්තාසං ආපජ්ජති මරණස්ස

පුන ච පරං බ්‍රාහ්මණ ඉධෙකච්චො කායෙ අවීතරාගො හොති අවිගතච්ඡන්දො අවිගතපෙමො අවිගතපිපාසො අවිගතපරිළාහො අවිගතතණ්හො. තමෙතඤ්ඤතරො ගාළ්හො රොගාතඞ්කො ඵුසති. තස්සඤ්ඤතරෙන ගාළ්හෙන රොගාතඞ්කෙන ඵුට්ඨස්ස එවං හොති: පියො වත මං කායො ජහිස්සති. පියං චාහං කායං ජහිස්සාමීති. සො සොචති කිලමති පරිදෙවති උරත්තාළිං කන්දති සම්මොහං ආපජ්ජති. අයම්පි ඛො බ්‍රාහ්මණ මරණධම්මො සමානො භායති, සන්තාසං ආපජ්ජති මරණස්ස.

පුන ච පරං බ්‍රාහ්මණ ඉධෙකච්චො අකතකල්‍යාණො හොති අකතකුසලො අකතභීරුත්තාණො, කතපාපො කතලුද්දො කතකිබ්බිසො. තමෙතඤ්ඤතරො ගාළ්හො රොගාතඞ්කො ඵුසති. තස්සඤ්ඤතරෙන ගාළ්හෙන රොගාතඞ්කෙන ඵුට්ඨස්ස එවං හොති: අකතං වත මෙ කල්‍යාණං, අකතං කුසලං, අකතං භීරුත්තාණං, කතං පාපං, කතං ලුද්දං, කතං කිබ්බිසං. යාවතා භො අකතකල්‍යාණානං අකතකුසලානං අකතභීරුත්තාණානං කතපාපානං කතලුද්දානං කතකිබ්බිසානං ගති, තං ගතිං පෙච්ච ගච්ඡාමීති. සො සොචති කිලමති පරිදෙවති උරත්තාළිං කන්දති සම්මොහං ආපජ්ජති. අයම්පි ඛො බ්‍රාහ්මණ මරණධම්මො සමානො භායති, සන්තාසං ආපජ්ජති මරණස්ස.

පුන ච පරං බ්‍රාහ්මණ ඉධෙකච්චො කඞ්ඛී හොති වෙචිකිච්ඡී අනිට්ඨඞ්ගතො සද්ධම්මෙ. තමෙතඤ්ඤතරො ගාළ්හො රොගාතඞ්කො ඵුසති. තස්සඤ්ඤතරෙන ගාළ්හෙන රොගාතඞ්කෙන ඵුට්ඨස්ස එවං හොති: කඞ්ඛී වතම්හි වෙචිකිච්ඡී අනිට්ඨඞ්ගතො සද්ධම්මෙ'ති සො සොචති කිලමති පරිදෙවති උරත්තාළිං කන්දති සම්මොහං ආපජ්ජති. අයම්පි ඛො බ්‍රාහ්මණ මරණධම්මො සමානො භායති, සන්තාසං ආපජ්ජති මරණස්ස.

ඉමෙ ඛො බ්‍රාහ්මණ, චත්තාරො මරණධම්මා සමානා භායන්ති සන්තාසං ආපජ්ජන්ති මරණස්ස.

බමුණ, මරණසෑහැවි ඇතියේ මරණයට බානා, සන්ත්‍රාසයට වදනා පුද්ගල කවරේ ද යත්:

බමුණ, මෙලොව කිසිවෙක් කාමයෙහි අවීතරාග වූයේ අවිගත ඡන්ද ඇතියේ අවිගතප්‍රේම ඇතියේ අවිගතපිපාසා ඇතියේ අවිගතපරිළාහ ඇතියේ අවිගත තෘෂ්ණා ඇතියේ වෙයි. එක්තරා ගාඪරෝගාතඞ්කයෙක් තුලුත් සපයී කෙරේ. කිසියම් ගාඪරෝගාතඞ්කයෙකින් පැහැසුනු ඔහුට මෙබඳු සිතෙක් වෙයි: "ප්‍රිය වූ කාමසම්පත්හු එකාන්තයෙන් මා හැරපියත්. වැලි මම ද ප්‍රිය කාමසම්පත් හැරපියමි." කියා යි. හේ සෝස්නේ වෙයි. කලානත වෙයි. වලප්නේ වෙයි. ලෙහි අත් පැහැරැ පැහැරැ හඬයි. සම්මෝහයට පැමිණෙයි. බමුණ, මේ වනාහි මරණසෑහැවි ඇතියේ මරණයට බානේ නම් වෙයි සන්ත්‍රාසයට වදනේ නම් වෙයි.

තවද බමුණ, මෙලොව කිසිවෙක් කයෙහි නොපැහූ රාග ඇතියේ නොපැහූ ඡන්ද ඇතියේ නොපැහූ ප්‍රේම ඇතියේ නොපැහූ පිපාසා ඇතියේ නොපැහූ පරිළාහ ඇතියේ නොපැහූ තෘෂ්ණා ඇතියේ වෙයි. එක්තරා ගාඪ වූ රෝගයෙක් තුලුත් සපයී කෙරෙයි. එක්තරා ගාඪ-රෝගයෙකින් පහස්නා ලද ඔහුට මෙබඳු සිතෙක් වෙයි: ප්‍රිය වූ කය එකාන්තයෙන් මා හැරපියයි. වැලි මම ද ප්‍රිය වූ කය හැරපියමි කියා යි. හේ සෝස්නේ වෙයි. කලානත වන්නේ වෙයි. පරිදෙවනා කරන්නුයේ වෙයි අතින් ලය පැහැර පැහැර හඬනුයේ වෙයි. සම්මෝහයට වදනේ වෙයි. බමුණ, මෙසේත් මරණසෑහැවි ඇතියේ මරණයට බානේ නම් වෙයි. සන්ත්‍රාසයට වදනේ නම් වෙයි.

තවද බමුණ, මෙලොව කිසිවෙක් පින්කම් නොකෙළේ වෙයි. කුසල් නොකෙළේ වෙයි. බියට පරිත්‍රාණ නොකෙළේ වෙයි. පව් කෙළේ වෙයි. කැකුළුකම් කෙළේ වෙයි. කිලිටිකම් කෙළේ වෙයි. එක්තරා ගාඪ වූ රෝගයෙක් තුලුත් පැහැස සිටී. එක්තරා ගාඪරෝගයෙකින් සමන්වාගත වූ ඔහුට මෙබඳු සිතෙක් වෙයි: මා විසින් එකාන්තයෙන් කල්‍යාණයෙක් නොකරණ ලදී. කුසලයෙක් නොකරණ ලදී. බියට පරිත්‍රාණයෙක් නොකරණ ලදී. පාපයෙක් කරණ ලදී. කැකුළුකමෙක් කරණ ලදී. කිලිටිකමෙක් කරණ ලදී. භවත්නි, කල්‍යාණයත් නොකළ කුසලයත් නොකළ බියට පරිත්‍රාණ නොකළ පව් කළ කැකුළුකම් කළ කිලිටිකම් කළ ඇත්තන්ගේ යම් ගතියෙක් වේ ද, පරලොව ඒ ගතියට යෙමි යි හේ සෝස්නේ වෙයි. කලානත වන්නේ වෙයි. පරිදේවනා කරන්නේ වෙයි. අතින් ලය පැහැරැ පැහැරැ හඬන්නේ වෙයි. මූලාවට වදනේ වෙයි. බමුණ, මේ ද මරණසෑහැවි ඇතියේ මරණයට බානේ නම් වෙයි සන්ත්‍රාසයට වදනේ නම් වෙයි.

තවද බමුණ, මෙලොව කිසිවෙක් බුද්ධාදීන් කෙරෙහි සැක ඇතියේ වෙයි. විචිකිච්ඡා ඇතියේ වෙයි ශාසන සද්ධර්මයෙහි නිෂ්ඨාගත වූයේ නො වෙයි. එක්තරා ගාඪරෝගයෙක් තුලුත් පැහැසැ සිටී. එක්තරා ගාඪරෝගයෙකින් සමන්වාගත ඔහුට මෙබඳු සිතෙක් වෙයි. බුද්ධාදීන් කෙරෙහි සැක ඇතියෙම් වෙමි. විචිකිච්ඡා ඇතියෙම් වෙමි. ශාසනසද්ධර්ම-යෙහි නිෂ්ඨාගත වූයෙම් ද නො වෙමියි. හේ සෝස්නේ වෙයි. කලානත වන්නේ වෙයි. පරිදෙවනා කරන්නේ වෙයි. අතින් ලය පැහැර පැහැර හඬනේ වෙයි මූලාවට වදනේ වෙයි. බමුණ, මේ ද මරණසෑහැවි ඇතියේ මරණයට බානේ නම් වෙයි සන්ත්‍රාසයට වදනේ නම් වෙයි.

බමුණ, මේ සතර දෙනා මරණසෑහැවි ඇත්තාහු මරණයට බති. සන්ත්‍රාසයට පැමිණෙත්.

කතමො ච බ්‍රාහ්මණ මරණධම්මො සමානො න භායති, න සන්තාසං ආපජ්ජති මරණස්ස?

ඉධ බ්‍රාහ්මණ එකච්චො කාමෙසු වීතරාගො හොති විගතච්ඡන්දො විගතපෙමො විගතපිපාසො විගතපරිළාහො විගතතණ්හො. තමෙනඤ්ඤතරො ගාළ්හො රොගාතඞ්කො ඵුසති. තස්සඤ්ඤතරෙන ගාළ්හෙන රොගාතඞ්කෙන ඵුට්ඨස්ස න එවං හොති: පියා වත මං කාමා ජහිස්සන්ති, පියෙ චාහං කාමෙ ජහිස්සාමීති. සො න සොචති න කිලමති න පරිදෙවති න උරත්තාළිං කන්දති න සම්මොහං ආපජ්ජති. අයං ඛො බ්‍රාහ්මණ මරණධම්මො සමානො න භායති න සන්තාසං ආපජ්ජති මරණස්ස.

පුන ච පරං බ්‍රාහ්මණ ඉධෙකච්චො කායෙ වීතරාගො හොති විගතච්ඡන්දො විගතපෙමො විගතපිපාසො විගතපරිළාහො විගතතණ්හො. තමෙනඤ්ඤතරො ගාළ්හො රොගාතඞ්කො ඵුසති. තස්සඤ්ඤතරෙන ගාළ්හෙන රොගාතඞ්කෙන ඵුට්ඨස්ස න එවං හොති: පියො වත මං කායො ජහිස්සති, පියං චාහං කායං ජහිස්සාමීති. සො න සොචති න කිලමති න පරිදෙවති න උරත්තාළිං කන්දති න සම්මොහං ආපජ්ජති. අයම්පි ඛො බ්‍රාහ්මණ මරණධම්මො සමානො න භායති, න සන්තාසං ආපජ්ජති මරණස්ස.

පුන ච පරං බ්‍රාහ්මණ ඉධෙකච්චො අකතපාපො හොති අකතලුද්දො අකතකිබ්බිසො. කතකල්‍යාණො හොති කතකුසලො කතභීරුත්තාණො. තමෙනඤ්ඤතරො ගාළ්හො රොගාතඞ්කො ඵුසති. තස්සඤ්ඤතරෙන ගාළ්හෙන රොගාතඞ්කෙන ඵුට්ඨස්ස එවං හොති: අකතං වත මෙ පාපං, අකතං ලුද්දං, අකතං කිබ්බිසං, කතං කල්‍යාණං, කතං කුසලං, කතං භීරුත්තාණං. යාවතා භො අකතපාපානං අකතලුද්දානං අකතකිබ්බිසානං කතකල්‍යාණානං කතකුසලානං කතභීරුත්තාණානං ගති තං ගතිං පෙච්ච ගච්ඡාමීති. සො න සොචති න කිලමති න පරිදෙවති න උරත්තාළිං කන්දති න සම්මොහං ආපජ්ජති. අයම්පි ඛො බ්‍රාහ්මණ මරණධම්මො සමානො න භායති න සන්තාසං ආපජ්ජති මරණස්ස.

පුන ච පරං බ්‍රාහ්මණ ඉධෙකච්චො අකඞ්ඛී හොති අවෙචිකිච්ඡී නිට්ඨංගතො සද්ධම්මෙ. තමෙනඤ්ඤතරො ගාළ්හො රොගාතඞ්කො ඵුසති. තස්සඤ්ඤතරෙන ගාළ්හෙන රොගාතඞ්කෙන ඵුට්ඨස්ස එවං හොති: අකඞ්ඛී වතම්හි අවෙචිකිච්ඡී නිට්ඨංගතො සද්ධම්මෙති. සො න සොචති න කිලමති න පරිදෙවති න උරත්තාළිං කන්දති න සම්මොහං ආපජ්ජති. අයම්පි ඛො බ්‍රාහ්මණ මරණධම්මො සමානො න භායති, න සන්තාසං ආපජ්ජති මරණස්ස.

බමුණ, කවරෙක් තම් මරණසැහැවි ඇතියේ මරණයට නොබාතේ වේ ද? සන්ත්‍රාසයට නො වදුනේ වේ ද?

බමුණ, මෙලොව කිසිවෙක් කාමයෙහි වීතරාග වූයේ විගතච්ඡන්ද වූයේ විගතප්‍රෙම වූයේ විගතපිපාස වූයේ විගතපරිදාහ වූයේ විගතතෘෂ්ණා වූයේ වෙයි. එක්තරා දැඩි රොගයෙක් තුලුන් පැහැසැ ගෙණ සිටි. එක්තරා දළ රොගයෙකින් යුක්ත වූ ඔහුට මෙබඳු සිතෙක් නො වේ. "ප්‍රිය වූ කාමසම්පත්හු එකැතින් මා හැරපියති. වැලි මමත් ප්‍රිය වූ කාමසම්පතුත් හැරපියමි" කියා යි. හේ සොච්නේ නො වෙයි. කලාන්ත වන්නේ නො වේ. පරිදෙවනා කරන්නේ නො වේ. අතින් ලය පැහැර පැහැර හඬනේ නො වේ. මුලාවට වදනේ නො වේ. බමුණ, මේ වනාහි මරණසැහැවි ඇතියේ මරණයට නොබානේ, සන්ත්‍රාසයට නො වදුනේ නම් වේ.

තවද බමුණ, මෙලොව ඇතැමෙක් කයෙහි පහව ගිය රාග ඇත්තේ පහව ගිය ඡන්ද ඇත්තේ පහව ගිය ප්‍රෙම ඇත්තේ පහව ගිය පවස ඇත්තේ පහව ගිය පරිදාහ ඇත්තේ පහව ගිය තෘෂ්ණා ඇත්තේ වෙයි. එක්තරා දළරොගයෙක් මොහු පැහැසැ ගණී, එක්තරා දළ රොගයෙකින් යුක්ත වූ ඔහුට මෙබඳු සිත් නො වෙයි. "ප්‍රිය වූ කය එකැතින් මා හැරපියයි, වැලි මමත් ප්‍රිය වූ කය හැරපියමි" කියා යි. හේ සොචනා නො කෙරේ. කිලමනා නො කෙරේ. පරිදෙවනා නො කෙරේ. අතින් ලය පැහැරු පැහැරු නො හඬයි. මුලාවට නො වදියි. බමුණ, මෙ ද මරණසැහැවි ඇතියේ මරණයට නො බානේ ය, සන්ත්‍රාසයට නො වදුනේ ය.

තවද බමුණ, මෙලොව කිසිවෙක් පව් නො කෙළේ කැකුළුකම් නො කෙළේ කිලිටිකම් නො කෙළේ වෙයි. කලණ දෑ කෙළේ කුසල් කෙළේ බියට පරිත්‍රාණ කෙළේ වේ. එක්තරා දළරොගයෙක් තුලුන් පැහැසැ ගණී. එක්තරා දළරොගයෙකින් සමන්වාගත වූ ඔහුට මෙබඳු සිතෙක් වෙයි: මා විසින් එකැතින් පව් නො කරණ ලදි. කැකුළුකම් නො කරණ ලදි. කිලිටිකම් නො කරණ ලදි. කලණකම් කරණ ලදි. කුසල් කරණ ලදි. බියට රකවල් කරණ ලදි හවත්නි, පව් නො කළ කැකුළුකම් නො කළ කිලිටිකම් නො කළ කලණකම් කළ කුසල් කළ බියට රකවරණ කළ ඇත්තන්ගේ යම් ගතියෙක් ඇද්ද, පරලොව ඒ ගතියට යෙමි. හේ ශොක නො කෙරෙයි. කලාන්ත නො වෙයි. නො වලපි. අතින් ලය පැහැර පැහැර නො හඬයි, මුලාවට නො පැමිණෙයි. බමුණ, මෙ ද මරණසැහැවි ඇතියේ මරණයට නො බානේ නම් වෙයි. සන්ත්‍රාසයට නො වදුනේ නම් වෙයි.

තවද බමුණ, මෙලොව කිසිවෙක් බුද්ධාදීන් කෙරෙහි සැක නැතියේ වෙයි විචිකිච්ඡා නැතියේ වෙයි. ශාසන සද්ධර්මයෙහි (උද්ග්‍රහපරිප්‍රශ්නාදීන්) නිෂ්ඨාවට ගියේ වෙයි. එක්තරා දළරොගයෙක් තුලුන් පැහැසැ ගණී. එක්තරා දළරොගයෙකින් යුක්ත වූ ඔහුට මෙබඳු සිතෙක් වෙයි: මම බුද්ධාදීන් කෙරෙහි සැක නැතියෙමි. විචිකිච්ඡා නැතියෙමි. ශාසනසද්ධර්මයෙහි (උද්ග්‍රහණාදීන්) නිෂ්ඨාවට ගියෙම් වෙම් කියා යි. හේ ශෝක නො කෙරෙයි. කලාන්ත නො වෙයි. පරිදේවනා නො කෙරෙයි. අතින් ලය පහරමින් නො හඬයි. මුලාවට නො පැමිණෙයි. බමුණ, මෙ ද මරණසැහැවි ඇතියේ මරණයට නො බානේ සතැඹිලියට නො පැමිණුනේ නම් වෙයි.

ඉමෙ ඛො බ්‍රාහ්මණ චත්තාරො මරණධම්මා සමානා න භායන්ති, න සන්තාසං ආපජ්ජන්ති මරණස්සාති.

අභික්කන්තං භො ගොතම -පෙ- උපාසකං මං භවං ගොතමො ධාරෙතු අජ්ජතග්ගෙ පාණුපෙතං සරණං ගතන්ති.

## 4. 4. 4. 5

## [ චතුකොටිකසුඤ්ඤතා සුත්තං ]

35. එකං සමයං භගවා **රාජගහෙ** විහරති **ගිජ්ඣකූටෙ** පබ්බතෙ. තෙන ඛො පන සමයෙන **සම්බහුලා** අභිඤ්ඤාතා අභිඤ්ඤාතා පරිබ්බාජකා **සප්පිනිකා** තීරෙ පරිබ්බාජකාරාමෙ පටිවසන්ති. සෙය්‍යථීදං: **අන්නභාරො වරධරො සකුලුදායී** ච පරිබ්බාජකො අඤ්ඤෙ ච අභිඤ්ඤාතා අභිඤ්ඤාතා පරිබ්බාජකා. අථ ඛො භගවා සායන්හසමයං පටිසල්ලානා වුට්ඨිතො යෙන සප්පිනිකාතීරෙ පරිබ්බාජකාරාමො තෙනුපසඞ්කමි.

තෙන ඛො පන සමයෙන තෙසං අඤ්ඤතිත්ථියානං පරිබ්බාජකානං සන්නිසින්නානං සන්නිපතිතානං අයමන්තරා කථා උදපාදි: ඉතිපි බ්‍රාහ්මණසච්චානි, ඉතිපි බ්‍රාහ්මණසච්චානීති.

අථ ඛො භගවා යෙන තෙ පරිබ්බාජකා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා පඤ්ඤත්තෙ ආසනෙ නිසීදි. නිසජ්ජ ඛො භගවා තෙ පරිබ්බාජකෙ එතදවොච: කාය නුත්ථ පරිබ්බාජකා එතරහි කථාය සන්නිසින්නා, කා ච පන වො අන්තරා කථා විප්පකතාති.

ඉධ භො ගොතම අම්හාකං සන්නිසින්නානං සන්නිපතිතානං අයමන්තරා කථා උදපාදි: ඉතිපි බ්‍රාහ්මණසච්චානි, ඉතිපි බ්‍රාහ්මණසච්චානීති.

චත්තාරිමානි පරිබ්බාජකා බ්‍රාහ්මණසච්චානි මයා සයං අභිඤ්ඤා සච්ඡිකත්වා පවෙදිතානි. කතමානි චත්තාරි?

ඉධ පරිබ්බාජකා බ්‍රාහ්මණො එවමාහ: සබ්බෙ පාණා අවජ්ඣාති. ඉති වදං බ්‍රාහ්මණො සච්චං ආහ, නො මුසා. සො තෙන න සමණොති මඤ්ඤති. න බ්‍රාහ්මණොති මඤ්ඤති න සෙය්‍යොහමස්මීති මඤ්ඤති. න සදිසොහමස්මීති මඤ්ඤති. න හීනොහමස්මීති මඤ්ඤති. අපි ච යදෙව තත්ථ සච්චං, තදභිඤ්ඤාය පාණානං යෙව අනුද්දයාය අනුකම්පාය පටිපන්නො හොති.

පුන ච පරං පරිබ්බාජකා බ්‍රාහ්මණො එවමාහ: සබ්බෙ කාමා අනිච්චා දුක්ඛා විපරිණාමධම්මාති. ඉති වදං බ්‍රාහ්මණො සච්චං ආහ, නො මුසා. සො තෙන න සමණො'ති මඤ්ඤති, න බ්‍රාහ්මණො'ති මඤ්ඤති. න සෙය්‍යො-හමස්මීති, මඤ්ඤති. න සදිසොහමස්මීති මඤ්ඤති. න හීනොහමස්මීති මඤ්ඤති. අපි ච යදෙව තත්ථ සච්චං, තදභිඤ්ඤාය කාමානං යෙව නිබ්බිදාය විරාගාය නිරොධාය පටිපන්නො හොති.

බමුණ, මේ සතර දෙනා මරණ සැහැවී ඇත්තාහු මරණයට නො බිති. සන්ත්‍රාසයට නො පැමිණෙත්.

භවත් ගෞතමයන් වහන්ස, ඉතා මැනව ... භවත් ගෞතමයන් වහන්සේ මා අද පටන්ගෙණ දිවි හිමි කොට සරණ ගිය උපාසකයකු කොට දරණ සේක්වා.

**4. 4. 4. 5.**

**[ චතුකොටික සුඤ්ඤතා සූත්‍රය ]**

35. **එක් කලෙක** භාග්‍යවතුන් වහන්සේ **රජගහ** නුවර **ගිජ්ඣකූට** පර්වතයෙහි වසනසේක. එසමයෙහි අතිප්‍රසිද්ධ බොහෝ පිරිවැජියෝ **සප්පිනිකා** හෝ තෙර පිරිවැජ්අරම්හි වෙසෙත්. ඔහු කවරහ යත්: **අන්නභාරය, වරධරය, සකුලුදායී** පරිබ්‍රාජකයි. අනෙක් ප්‍රසිද්ධ ප්‍රසිද්ධ පිරිවැජියෝ ද වෙත්. එකල්හි භාග්‍යවතුන් වහන්සේ සවස් වේලෙහි පිළිසලනින් නැගී සිටිසේක් සප්පිනිකා හෝ තෙර පිරිවැජිඅරම කරා වැඩි සේක.

එසමයෙහි රැස්ව හුන් මුළුදුන් ඒ අන්‍යතොටු පිරිවැජියන්ගේ මේ අතුරු කථාව පහළ විය. "බ්‍රාහමණසත්‍යයෝ මෙසේ ද වෙත්, බ්‍රාහමණ සත්‍යයෝ මෙසේද වෙත්" යි කියා යි.

එක්බිති භාග්‍යවතුන් වහන්සේ ඒ පිරිවැජියන් කරා එළඹියහ. එළඹ පැන් වූ අස්නෙහි වැඩ හුන්හ. භාග්‍යවතුන් වහන්සේ වැඩ හිඳ ඒ පිරිවැජි-යනට මෙසේ වදාළ සේක: පිරිවැජියෙනි, දැන් කිනම් අතුරු කථායෙකින් රැස්ව හුන්නාහු ද? තොපගේ කිනම් අතුරු කථායෙක් අඩහළ වී ද? කියා යි.

භවත් ගෞතමයෙනි, මෙහි රැස්ව හුන් මුළුදුන් අපගේ මේ අතුරු කථාව පහළ විය. "බ්‍රාහමණසත්‍යයෝ මෙසේ ද වෙති. බ්‍රාහමණසත්‍යයෝ මෙසේ ද වෙති" කියා යි.

පිරිවැජියෙනි, මා, තමා විසින් ම විශිෂ්ට ඥානයෙන් දැන ප්‍රත්‍යක්ෂ කොට ප්‍රකාශ කරණ ලද මේ සතර බ්‍රාහමණසත්‍ය කෙනෙක් ඇත. කවර සතර කෙනෙක යත්:

පිරිවැජියෙනි, මෙලොව ක්ෂීණාස්‍රව බ්‍රාහමණ මෙසේ කියයි: "සියලු ප්‍රාණීහු අවධ්‍යයෝ" ය කියා යි. මෙසේ බණනා බමුණු සැබවක් කියයි. මුසා නො කියයි. හේ ඒ සැබව නිසාමෙන් 'මම ශ්‍රමණයෙමි'යි (මඤ්ඤනා විසින්) නො හඟියි. 'මම බ්‍රාහමණයෙමි' යි (මඤ්ඤනා විසින්) නො හඟියි. 'මම ශ්‍රේෂ්ඨයෙමි'යි නො හඟියි. "මම සදෘශයෙමි'යි නො හඟියි. 'මම හීනයෙමි' යි නො හඟියි. තවද එහි යම් ම සැබවෙක් ඇද්ද, ඒ විශිෂ්ටඥානයෙන් දැන ප්‍රාණයන් පිළිබඳ වූ ම දයාවට අනුකම්පාවට පිළිපන්නේ වෙයි.

තවද පිරිවැජියෙනි, බමුණු මෙසේ කියයි: "සියලු කාමයෝ අනිත්‍යය හ. දුක්හ. පෙරලෙන සැහැවි ඇතියහ'යි. මෙසේ බණනා බමුණු සැබවක් කියයි. මුසා නො කියයි. හේ ඒ සැබව නිසාමෙන් "මම ශ්‍රමණයෙමි"යි මඤ්ඤනා වශයෙන් නො හඟියි. 'මම බ්‍රාහමණයෙමි'යි මඤ්ඤනා වශයෙන් නො හඟියි. 'මම ශ්‍රේෂ්ඨයෙමි'යි නො හඟියි. 'මම සදෘශයෙමි'යි නො හඟියි 'මම හීනයෙමි'යි නො හඟියි. වැළිත් යම් ම එහි සැබවෙක් ඇද්ද, හේ මෙසසින් දැන කාමයන්ගේ ම නිර්වේදය පිණිස විරාගය පිණිස නිරෝධය පිණිස පිළිපන්නේ වෙයි.

පුන ච පරං පරිබ්බාජකා බ්‍රාහ්මණො එවමාහ: සබ්බෙ භවා අනිච්චා දුක්ඛා විපරිණාමධම්මාති. ඉති වදං බ්‍රාහ්මණො සච්චං ආහ, නො මුසා. සො තෙන න සමණො'ති මඤ්ඤති. න බ්‍රාහ්මණො'ති මඤ්ඤති. න සෙය්‍යොහමස්මීති මඤ්ඤති. න සදිසොහමස්මීති මඤ්ඤති. න හීනොහමස්මීති මඤ්ඤති. අපි ච යදෙව තත්ථ සච්චං, තදභිඤ්ඤාය භවානං යෙව නිබ්බිදාය විරාගාය නිරොධාය පටිපන්නො හොති.

පුන ච පරං පරිබ්බාජකා බ්‍රාහ්මණො එවමාහ: නාහං ක්වචන, කස්සචි කිඤ්චනතස්මිං, න ච මම ක්වචන, කත්ථචි කිඤ්චනතත්ථීති. ඉති වදං බ්‍රාහ්මණො සච්චං ආහ, නො මුසා. සො තෙන න සමණො'ති මඤ්ඤති. න බ්‍රාහ්මණොති මඤ්ඤති. න සෙය්‍යොහමස්මීති මඤ්ඤති. න සදිසොහමස්මීති මඤ්ඤති. න හීනොහමස්මීති මඤ්ඤති. අපි ච යදෙව තත්ථ සච්චං, තදභිඤ්ඤාය ආකිඤ්චඤ්ඤංයෙව පටිපදං පටිපන්නො හොති.

ඉමානි ඛො පරිබ්බාජකා චත්තාරි බ්‍රාහ්මණසච්චානි මයා සයං අභිඤ්ඤා සච්ඡිකත්වා පවෙදිතානීති.

## 4. 4. 4. 6

## [ බහුස්සුතසුත්තං ]

**[සාවත්ථිනිදානං]**

36. අථ ඛො අඤ්ඤතරො භික්ඛු යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නො ඛො සො භික්ඛු භගවන්තං එතදවොච:

කෙන නු ඛො භන්තෙ ලොකො නීයති, කෙන ලොකො පරිකිස්සති, කස්ස ච උප්පන්නස්ස වසං ගච්ඡතීති?

සාධු සාධු භික්ඛු, භද්දකො තෙ භික්ඛු උම්මඟ්ගො, භද්දකං පටිභානං, කල්‍යාණී පරිපුච්ඡා. එවං හි ත්වං භික්ඛු පරිපුච්ඡසි: කෙන නු ඛො භන්තෙ ලොකො නීයති, කෙන ලොකො පරිකිස්සති, කස්ස ච උප්පන්නස්ස වසං ගච්ඡතීති. එවං භන්තෙ.

චිත්තෙන ඛො භික්ඛු ලොකො නීයති, චිත්තෙන පරිකිස්සති, චිත්තස්ස උප්පන්නස්ස වසං ගච්ඡති.

සාධු භන්තෙති ඛො සො භික්ඛු භගවතො භාසිතං අභිනන්දිත්වා අනුමො-දිත්වා භගවන්තං උත්තරිං පඤ්හං ආපුච්ඡි: බහුස්සුතො ධම්මධරො, බහුස්සුතො ධම්මධරොති වුච්චති. කිත්තාවතා නු ඛො භන්තෙ බහුස්සුතො ධම්මධරො හොතීති. ?

සාධු සාධු භික්ඛු, භද්දකො තෙ භික්ඛු උම්මඟ්ගො, භද්දකං පටිභානං, කල්‍යාණී පරිපුච්ඡා. එවං හි ත්වං භික්ඛු පුච්ඡසි: බහුස්සුතො ධම්මධරො, බහුස්සුතො ධම්මධරොති භන්තෙ වුච්චති, කිත්තාවතා නු ඛො භන්තෙ බහුස්සුතො ධම්මධරො හොතීති. එවං භන්තෙ.

තවද පිරිවැජියෙනි, බමුණු මෙසේ කියයි: 'සියලු භවයෝ අනිත්‍යයහ දුක්හ. පෙරලෙන සැභාවී ඇතියහ යි මෙසේ බණනා බමුණු සැබවක් කියයි. මුසා නො කියයි. හේ ඒ සබා බිණීමෙන්, 'මම ශ්‍රමණයෙමි' යි නො හඟියි. 'මම බ්‍රාහ්මණයෙමි'යි නොහඟියි. මම ශ්‍රේෂ්ඨයෙමි' යි නො හඟියි. 'මම සදෘශයෙමි'යි නො හඟියි. "මම හීනයෙමි'යි නො හඟියි. වැලිත් යම් ම එහි සැබවෙක් ඇද්ද, එය වෙසෙසින් දැන භවයන්ගේ ම නිර්වේදය පිණිස විරාගය පිණිස නිරොධය පිණිස පිළිපන්නේ වෙයි.

තවද පිරිවැජියෙනි, බමුණු මෙසේ කියයි. "මම කිසිතැනෙක ආත්ම විසින් නො වෙමි. (මාගේ ආත්මය) කිසිවෙක්හුගේ කිඤ්චන භාවයෙහි ලාත් නො දක්මි. පරුගේ ආත්මයත් කිසි තැනෙක නො දක්මි. කිසි තැනෙක පරුගේ ආත්මය මාගේ කිඤ්චන භාවයෙහිත් ලා නොදක්මි"යි මෙසේ චතුකොටික සුඤ්ඤතා බණනා බමුණු සැබවක් කියයි. මුසා නො කියයි. හේ ඒ සැබවින් 'ශ්‍රමණයෙමි' යි නො හඟියි. 'බ්‍රාහ්මණයෙමි යි' නො හඟියි. 'මම ශ්‍රේෂ්ඨයෙමි' යි නො හඟියි. 'මම සදෘශයෙමි' යි නො හඟියි 'මම හීනයෙමි' යි නො හඟියි. වැලිත් යම් ම එහි සැබවෙක් ඇද්ද, එය වෙසෙසින් දැන අකිඤ්චනභාව සඞ්ඛ්‍යාත ප්‍රතිපදාවට ම පිළිපන්නේ වෙයි.

පිරිවැජියෙනි, මේ සිවුවැදෑරුම් (සතරාකාර) බ්‍රාහ්මණසත්‍යයෝ තමා විසින් ම විශිෂ්ට ඥානයෙන් දැන ප්‍රත්‍යක්ෂ කොට මා විසින් ප්‍රකාශ කරණ ලදහ.

## 4. 4. 4. 6

## [ බහුස්සුත සූත්‍රය ]

[ සැවැත්නිදාන යි ]

36. එසඳ එක්තරා මහණෙක් භාග්‍යවතුන් වහන්සේ කරා එළඹියේ ය. එළඹ භාග්‍යවතුන් වහන්සේ සකසා වැඳ එකත්පස්ව හිඳ. එකත්පස් ව හුන් ඒ මහණ භාග්‍යවතුන් වහන්සේට මෙපවත් සැළ කෙළේ ය.

වහන්ස, කවරකු විසින් ලෝකය ගෙණයනු ලැබේ ද? අදනා ලැබේ ද? උපන් කවරක්හුගේ වසයට යේ ද? කියා යි.

මහණ, මැනව, මැනව, මහණ තාගේ ප්‍රඥාගම්න මැනවි, ප්‍රතිභානය මැනව, පරිපෘච්ඡාව කල්‍යාණය. "වහන්ස, කවරක්හු විසින් ලෝකය ගෙණ යනු ලැබේ ද? කවරක්හු විසින් ලෝකය අදනා ලැබේ ද? උපන් කවරක්හුගේ වසයට යේ දැ" යි මහණ තෝ මෙසේ විචාරන්නෙහි නො වේ ද? වහන්ස, එසේ ය.

මහණ, සිත විසින් ලෝකය ගෙණානු ලැබේ. සිත විසින් අදනා ලැබේ. උපන් චිත්තයාගේ වසයට යෙයි.

'වහන්ස, මැනවැ' යි ඒ මහණ භාග්‍යවතුන් වහන්සේගේ භාෂිතය සතුටින් පිළිගෙණ අනුමෝදන්ව භාග්‍යවතුන් වහන්සේ වෙතින් මතුයෙහිත් ප්‍රශ්න පිළිවිසී: වහන්ස, 'බහුශ්‍රැතය ධර්මධරය, බහුශ්‍රැතය ධර්මධරය' යි කියනු ලැබේ. වහන්ස, 'කොපමණෙකින් බහුශ්‍රැතය ධර්මධර ය' යි කියනු ලැබේ ද?

මහණ, මැනව, මැනව, මහණ තාගේ ප්‍රඥාගමනය මැනවි, ප්‍රතිභානය මැනව, පරිපෘච්ඡාව කල්‍යාණය. "වහන්ස, බහුශ්‍රැතය ධර්මධරය, බහුශ්‍රැතය' ධර්මධරය යි කියනු ලැබේ. වහන්ස, කොප මණෙකින් බහුශ්‍රැතය ධර්මධරය කියනු ලැබේ" දැ යි මහණ තෝ මෙසේ විචාරන්නෙහි නො වේ ද? වහන්ස, එසේ ය.

බහූ ඛො භික්ඛු මයා ධම්මා දෙසිතා: සුත්තං ගෙය්‍යං වෙය්‍යාකරණං ගාථා උදානං ඉතිවුත්තකං ජාතකං අබ්භුතධම්මං වෙදල්ලං. චතුප්පදාය චෙපි භික්ඛු ගාථාය අත්ථමඤ්ඤාය ධම්මමඤ්ඤාය ධම්මානුධම්මපටිපන්නො හොති, බහුස්සුතො ධම්මධරොති අලං වචනායාති.

සාධු භන්තෙති ඛො සො භික්ඛු භගවතො භාසිතං අභිනන්දිත්වා අනුමොදිත්වා භගවන්තං උත්තරිං පඤ්හං ආපුච්ඡි: සුතවා නිබ්බෙධිකපඤ්ඤො, සුතවා නිබ්බෙධිකපඤ්ඤොති භන්තෙ වුච්චති. කිත්තාවතා නු ඛො භන්තෙ සුතවා නිබ්බෙධිකපඤ්ඤො හොතීති?

සාධු සාධු භික්ඛු, භද්දකො ඛො තෙ භික්ඛු උම්මග්ගො, භද්දකං පටිභාණං, කල්‍යාණී පරිපුච්ඡා. එවං හි ත්වං භික්ඛු පුච්ඡසි: සුතවා නිබ්බෙධිකපඤ්ඤො, සුතවා නිබ්බෙධිකපඤ්ඤොති භන්තෙ වුච්චති. කිත්තාවතා නු ඛො භන්තෙ සුතවා නිබ්බෙධිකපඤ්ඤො හොතීති? එවං භන්තෙ.

ඉධ භික්ඛු භික්ඛුනො ඉදං දුක්ඛන්ති සුතං හොති, පඤ්ඤාය චස්ස අත්ථං අතිවිජ්ඣ පස්සති. අයං දුක්ඛසමුදයො'ති සුතං හොති, පඤ්ඤාය චස්ස අත්ථං අතිවිජ්ඣ පස්සති. අයං දුක්ඛනිරොධො'ති සුතං හොති, පඤ්ඤාය චස්ස අත්ථං අතිවිජ්ඣ පස්සති. අයං දුක්ඛනිරොධගාමිනී පටිපදා'ති සුතං හොති, පඤ්ඤාය චස්ස අත්ථං අතිවිජ්ඣ පස්සති. එවං ඛො භික්ඛු සුතවා නිබ්බෙධිකපඤ්ඤො හොතීති.

සාධු භන්තෙ'ති ඛො සො භික්ඛු භගවතො භාසිතං අභිනන්දිත්වා අනුමොදිත්වා භගවන්තං උත්තරිං පඤ්හං ආපුච්ඡි: පණ්ඩිතො මහාපඤ්ඤො, පණ්ඩිතො මහාපඤ්ඤො'ති භන්තෙ වුච්චති. කිත්තාවතා නු ඛො භන්තෙ පණ්ඩිතො මහාපඤ්ඤො හොතීති?

සාධු සාධු භික්ඛු භද්දකො ඛො තෙ භික්ඛු උම්මග්ගො, භද්දකං පටිභානං, කල්‍යාණී පරිපුච්ඡා. එවං හි ත්වං භික්ඛු පුච්ඡසි: පණ්ඩිතො මහාපඤ්ඤො, පණ්ඩිතො මහාපඤ්ඤො'ති භන්තෙ වුච්චති, කිත්තාවතා නු ඛො භන්තෙ පණ්ඩිතො මහාපඤ්ඤො හොතීති? එවං භන්තෙ.

ඉධ භික්ඛු පණ්ඩිතො මහාපඤ්ඤො නෙවත්තව්‍යාබාධාය චෙතෙති, න පරව්‍යාබාධාය චෙතෙති, න උභයව්‍යාබාධාය චෙතෙති. අත්තහිතං පරහිතං උභයහිතං සබ්බලොකහිතමෙව චින්තයමානො චින්තෙති. එවං ඛො භික්ඛු පණ්ඩිතො මහාපඤ්ඤො හොතීති.

### 4. 4. 4. 7

### [**දුතියවස්සකාරසුත්තං**]

37. එකං සමයං භගවා **රාජගහෙ** විහරති වෙළුවනෙ **කලන්දකනිවාපෙ**. අථ ඛො **වස්සකාරො** බ්‍රාහ්මණො මගධමහාමත්තො යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවතා සද්ධිං සම්මොදි. සම්මොදනීයං කථං සාරාණීයං වීතිසාරෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නො ඛො වස්සකාරො බ්‍රාහ්මණො මගධමහාමත්තො භගවන්තං එතදවොච:

මහණ, මා විසින් සුත්ත, ගෙය්‍ය, වෙය්‍යාකරණ, ගාථා, උදාන, ඉතිවුත්තක, ජාතක, අබ්භුතධම්ම, වෙදල්ල ය යි බොහෝ දහම්හු දෙසන ලද්හ. මහණ, සිවුපැදි ගාථායෙක්හි ද අරුත් දැන පෙළ දැන ධර්මානුධර්මප්‍රතිපන්නාව වේ ද, 'බහුශ්‍රැතය, ධර්මධරය' යි කියන්නට තිසි වෙයි.

වහන්ස, මැනවැ යි ඒ මහණ භාග්‍යවතුන් වහන්සේගේ භාෂිතය සතුටින් පිළිගෙණ අනුමෝදන් ව භාග්‍යවතුන් වහන්සේ අතින් මතුයෙහිත් පැණ පිළිවිසී: 'වහන්ස, ශ්‍රැතවත්ය, කෙලෙස් නිඃශේෂයෙන් ම බිඳ ලන නුවණැත්තෙක, ශ්‍රැතවත්ය, කෙලෙස් නිඃශෙෂයෙන් ම බිඳ ලන නුවණැත්තෙකැ' යි කියනු ලැබේ. වහන්ස, කෙපමණෙකින් ශ්‍රැතවත් නිර්වේධකප්‍රඥ ඇත්තේ වේ ද?

මහණ, මැනව, මැනව, මහණ, තාගේ ඥනගතිය මැනව, වර්හනු මැනව, පිළිවිසුම් හද්‍රය. "ශ්‍රැතවත්ය, නිර්වේධකප්‍රඥ ඇත්තේය, ශ්‍රැතවත්ය නිර්වේධකප්‍රඥ ඇත්තේය" යි කියනු ලැබේ. වහන්ස, කෙපමණෙකින් ශ්‍රැතවත් නිර්වේධකප්‍රඥ ඇත්තෝ වේ දැ' යි මහණ, තෝ මෙසේ විචාරත්තෙහි තො වේ ද? වහන්ස, එසේ ය.

මහණ, මෙසස්නෙහි මහණනු විසින් 'මේ දුකැ'යි අසන ලද්දේ වෙයි. ඔහුගේ මාර්ගප්‍රඥයෙන් අර්ථය ඔවිද දක්නේ ය. "මේ දුඃඛසමුදය යි" අසන ලද්දේ වෙයි. ඔහුගේ මග නැණිනුදු බිදලා දකී. "මේ දුඃඛනිරොධය"යි අසන ලද්දේ වෙයි. ඔහුගේ මගනැණිනුදු අර්ථය බිඳපියා දකියි. "මේ දුඃඛනිරොධ-ගාමිනී ප්‍රතිපදය" යි අසන ලද්දේ වෙයි. ඔහුගේ මග නැණිනුත් අර්ථය විනිවිද දකියි. මහණ මෙසේ 'ශ්‍රැතවත් නිර්වේධකප්‍රඥ ඇත්තෝ වේ ය' යි.

වහන්ස, මැනැවැ යි ඒ මහණ භාග්‍යවතුන් වහන්සේගේ භාෂිතය අභිනන්දනා කොට අනුමෝව භාග්‍යවතුන් වහන්සේ අතින් මතුයෙහිත් ප්‍රශ්න පිළිවිසී: "වහන්ස, පණ්ඩිතය මහාප්‍රාඥය, පණ්ඩිතය මහාප්‍රාඥය" යි කියනු ලැබේ. වහන්ස, කිපමණෙකින් පණ්ඩිත මහාප්‍රාඥ වේ ද?

මහණ, මැනව, මැනව, තාගේ ප්‍රඥගතිය භද්‍රය, ප්‍රතිභානය භද්‍රය, පිළිවිසුම කල්‍යාණය. මහණ, "පණ්ඩිතය මහාප්‍රාඥය, පණ්ඩිතය මහා-ප්‍රාඥය" යි කියනු ලැබේ. 'වහන්ස, කිපමණෙකින් පණ්ඩිත මහාප්‍රාඥ වේ දැ' යි තෝ මෙසේ අසන්නෙහි තො වේ ද? වහන්ස, එසේ ය.

මහණ, මෙලොව පණ්ඩිත මහාප්‍රාඥ ආත්මව්‍යාබාධය පිණිස නොසිත යි. පරව්‍යාබාධය පිණිස නොසිතයි. උභයව්‍යාබාධය පිණිස නොසිත යි. සිතන්නේ ද ආත්මහිතය, පරහිතය, උභයහිතය. මෙසේ සර්වලොකහිතය ම සිතයි. මහණ, මෙසේ පණ්ඩිත මහාප්‍රාඥ නම් වේ.

## 4. 4. 4. 7.

## [ දුතියවස්සකාර සූත්‍රය ]

37. එක්සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ රජගහනුවර කලන්දකනිවාප නම් වූ වේළුවනාරාමයෙහි වැඩවසන සේක. එක්බිති මගධමහාමාත්‍ය වූ වස්සකාර බමුණු භාග්‍යවතුන් වහන්සේ කරා එළඹියේ ය. එළඹ භාග්‍යවතුන් වහන්සේ සමඟ සතුටු විය. සමෙමොදනීය වූ සාරාණීය වූ කථාව නිමවා එකත්පස්ව හිඳ. එකත්පස්ව හුන් මගධමහාමාත්‍ය වස්සකාර බමුණු භාග්‍යවතුන් වහන්සේට මෙතෙල සැළ කෙළේ ය:

ජානෙය්‍ය නු බො භො ගොතම අසප්පුරිසො අසප්පුරිසං 'අසප්පුරිසො අයං භවන්ති'?

අට්ඨානං බො එතං බ්‍රාහ්මණ අනවකාසො යං අසප්පුරිසො අසප්පුරිසං ජානෙය්‍ය 'අසප්පුරිසො අයං භවන්ති'

ජානෙය්‍ය පන භො ගොතම අසප්පුරිසො සප්පුරිසං 'සප්පුරිසො අයං භවන්ති'?

එතම්පි බො බ්‍රාහ්මණ අට්ඨානං අනවකාසො යං අසප්පුරිසො සප්පුරිසං ජානෙය්‍ය 'සප්පුරිසො අයං භවන්ති'

ජානෙය්‍ය, පන භො ගොතම සප්පුරිසො සප්පුරිසං 'සප්පුරිසො අයං භවන්ති'?

ඨානං බො එතං බ්‍රාහ්මණ විජ්ජති, යං සප්පුරිසො සප්පුරිසං ජානෙය්‍ය 'සප්පුරිසො අයං භවන්ති'

ජානෙය්‍ය පන භො ගොතම සප්පුරිසො අසප්පුරිසං 'අසප්පුරිසො අයං භවන්ති'?

එතම්පි බො බ්‍රාහ්මණ ඨානං විජ්ජති, යං සප්පුරිසො අසප්පුරිසං ජානෙය්‍ය 'අසප්පුරිසො අයං භවන්ති'.

අච්ඡරියං භො ගොතම, අබ්භුතං භො ගොතම, යාව සුභාසිතං චිදං භොතා ගොතමෙන: ''අට්ඨානං බො එතං බ්‍රාහ්මණ අනවකාසො යං අසප්පුරිසො අසප්පුරිසං ජානෙය්‍ය 'අසප්පුරිසො අයං භවන්ති.' එතම්පි බො බ්‍රාහ්මණ අට්ඨානං අනවකාසො, යං අසප්පුරිසො සප්පුරිසං ජානෙය්‍ය 'සප්පුරිසො අයං භවන්ති.' ඨානං බො එතං බ්‍රාහ්මණ විජ්ජති යං සප්පුරිසො සප්පුරිසං ජානෙය්‍ය 'සප්පුරිසො අයං භවන්ති.' එතම්පි බො බ්‍රාහ්මණ ඨානං විජ්ජති, යං සප්පුරිසො අසප්පුරිසං ජානෙය්‍ය' අසප්පුරිසො අයං භවන්ති.'

එකමිදං භො ගොතම සමයං **තොදෙය්‍යස්ස** බ්‍රාහ්මණස්ස පරිසතිං පරූපාරම්භං වත්තෙන්ති: බාලො අයං රාජා **එළෙය්‍යො** යො සමණෙ **රාමපුත්තෙ** අභිප්පසන්නො, සමණෙ ච පන රාමපුත්තෙ එවරූපං පරම-නිපච්චාකාරං කරොති: යදිදං අභිවාදනං පච්චුට්ඨානං අඤ්ජලිකම්මං සාමීචි-කම්මන්ති. ඉමෙපි රඤ්ඤො **එළෙය්‍යස්ස** පරිහාරකා බාලා, **යමකො මොග්ගල්ලො උග්ගො නාවින්දකී ගන්ධබ්බො අග්ගිවෙස්සො**, යෙ සමණෙ රාමපුත්තෙ අභිප්පසන්නා, සමණෙ ච පන රාමපුත්තෙ එවරූපං පරම-නිපච්චාකාරං කරොන්ති: යදිදං අභිවාදනං පච්චුට්ඨානං අඤ්ජලිකම්මං සාමීචිකම්මන්ති.

භවත් ගෞතමයන් වහන්ස, 'මේ භවත් අසත්පුරුෂය' යි අසත්පුරුෂයෙක් අසත්පුරුෂයකු දන්නේ වේ ද?

බමුණ, 'මේ භවත් අසත්පුරුෂය' යි අසත්පුරුෂයෙක් අසත්පුරුෂයකු දන්නේ ය යන මෙය නොවකසුලු ය. එන්නට අවකාශ ද නැත.

භවත් ගෞතමයන් වහන්ස, 'මේ භවත් සත්පුරුෂය' යි අසත්පුරුෂයෙක් සත්පුරුෂයකු දන්නේ වේ ද?

බමුණ 'මේ භවත් සත්පුරුෂය' යි අසත්පුරුෂයෙක් සත්පුරුෂයකු දන්නේ ය යන මෙ ද නොවනසුලු ය. එන්නට අවකාශ ද නැත.

භවත් ගෞතමයන් වහන්ස, 'මේ භවත් සත්පුරුෂය' යි සත්පුරුෂයෙක් සත්පුරුෂයකු දැනගන්නේ වේ ද?

බමුණ, 'මේ භවත් සත්පුරුෂය' යි සත්පුරුෂයෙක් සත්පුරුෂයකු දැනගන්නේ ය යන මෙය වනසුලු ය.

භවත් ගෞතමයන් වහන්ස, 'මේ භවත් අසත්පුරුෂය' යි සත්පුරුෂයෙක් අසත්පුරුෂයකු දැනගන්නේ වේ ද?

බමුණ, මේ භවත් අසත්පුරුෂය' යි සත්පුරුෂයෙක් අසත්පුරුෂයකු දැනගන්නේ ය යන මෙ ද වනසුලු වෙයි.

භවත් ගෞතමයන් වහන්ස, ආශ්චර්යය, භවත් ගෞතමයන් වහන්ස අද්භූතය, භවත් ගෞතමයන් වහන්සේ විසින් මෙය යාවත් සුභාෂිතය (පරමසුභාෂිතයි). ''බමුණ'' 'මේ භවත් අසත්පුරුෂය'යි අසත්පුරුෂයෙක් අසත්පුරුෂයකු දැනගන්නේ ය යන මේ අකාරණය, එන්නට අවකාශ නැතැයි ද, 'මේ භවත් සත්පුරුෂය' යි අසත්පුරුෂයෙක් සත්පුරුෂයකු දැනගන්නේ ය යන මෙ ද අහේතුකය, අනවකාශය යි ද, බමුණ, 'මේ භවත් සත්පුරුෂය' යි සත්පුරුෂයෙක් සත්පුරුෂයකු දැනගන්නේ ය යන මෙය වනසුලු වෙයි ද, බමුණ, 'මේ භවත් අසත්පුරුෂය' යි සත්පුරුෂයෙක් අසත්පුරුෂයකු දැනගන්නේ ය යන මෙ ද වනසුලු වේ ය'' යනුයි.

භවත් ගෞතමයන් වහන්ස, එක්සමයක තුදි ගම්වැසි තෝදෙය්‍ය බ්‍රාහ්මණයාගේ මුළුදුන් පිරිසෙහි මෙබඳු මෙරමා ගැරහීමක් බෙණෙත්: ''රාමපුත්‍ර වූ (උද්‍රක) ශ්‍රමණයා කෙරෙහි පහන්, රාමපුත්‍රශ්‍රමණයා කෙරෙහි අභිවාදන ප්‍රත්‍යුත්ථාන අඤ්ජලිකම් සාමීචිකම් යන මෙබඳු පරමනිපත්‍යකාරයෙක් (අත්‍යන්තයෙන් යටත් පැවතුම්) කරණ මේ එළෙය්‍ය රජ බාලයෙක. රාමපුත්‍රශ්‍රමණයා කෙරෙහි පහන්, රාමපුත්‍රශ්‍රමණයා කෙරෙහි අභිවාදන ප්‍රත්‍යුත්ථාන අඤ්ජලිකම් සාමීචිකම් යන මෙබඳු පරමනිපත්‍යකාරය කරණ යමකය, මොග්ගල්ලය, උග්ගය, නාවින්දකිය, ගන්ධබ්බය, අග්ගිවෙස්සය, යන මේ එළෙය්‍ය රජුගේ පරිවාරකයෝ ද බාලයෝ''ය කියා යි.

තථාසුදං තොදෙය්‍යො බ්‍රාහ්මණො ඉමිනා නයෙන නෙති: තං කිං මඤ්ඤන්ති භොන්තො පණ්ඩිතො රාජා එලෙය්‍යො කරණීයාධිකරණීයෙසු වචනීයාධිවචනීයෙසු අලමත්ථදසතරෙහි අලමත්ථදසතරොති.

එවං භො, පණ්ඩිතො රාජා එලෙය්‍යො කරණීයාධිකරණීයෙසු වචනීයාධිවචනීයෙසු අලමත්ථදසතරෙහි අලමත්ථදසතරොති.

යස්මා ච ඛො භොන්තො සමණො රාමපුත්තො රඤ්ඤො එලෙය්‍යෙන පණ්ඩිතෙන පණ්ඩිතතරො කරණීයාධිකරණීයෙසු වචනීයාධිවචනීයෙසු අලමත්ථදසතරෙන අලමත්ථදසතරො, තස්මා රාජා එලෙය්‍යො සමණෙ රාමපුත්තෙ අභිප්පසන්නො, සමණෙ ච පන රාමපුත්තෙ එවරූපං පරමනිපච්චකාරං කරොති: යදිදං අභිවාදනං පච්චුට්ඨානං අඤ්ජලිකම්මං සාමීචිකම්මං.

තං කිං මඤ්ඤන්ති භොන්තො, පණ්ඩිතා රඤ්ඤො එලෙය්‍යස්ස පරිහාරකා, යමකො මොග්ගල්ලො උග්ගො නාවින්දකී ගන්ධබ්බො අග්ගිවෙස්සො, කරණීයාධිකරණීයෙසු වචනීයාධිවචනීයෙසු අලමත්ථදසතරෙහි අලමත්ථදසතරාති.

එවං භො. පණ්ඩිතා රඤ්ඤො එලෙය්‍යස්ස පරිහාරකා, යමකො මොග්ගල්ලො උග්ගො නාවින්දකී ගන්ධබ්බො අග්ගිවෙස්සො, කරණීයාධිකරණීයෙසු වචනීයාධිවචනීයෙසු අලමත්ථදසතරෙහි අලමත්ථදසතරාති.

යස්මා ඛො භො, සමණො රාමපුත්තො රඤ්ඤො එලෙය්‍යස්ස පරිහාරකෙහි පණ්ඩිතෙහි පණ්ඩිතතරො කරණීයාධිකරණීයෙසු වචනීයාධිවචනීයෙසු අලමත්ථදසතරෙහි අලමත්ථදසතරො. තස්මා රඤ්ඤො එලෙය්‍යස්ස පරිහාරකා සමණෙ රාමපුත්තෙ අභිප්පසන්නා සමණෙ ච පන රාමපුත්තෙ එවරූපං පරමනිපච්චකාරං කරොන්ති: යදිදං අභිවාදනං පච්චුට්ඨානං අඤ්ජලිකම්මං සාමීචිකම්මන්ති.

අච්ඡරියං භො ගොතම අබ්භුතං භො ගොතම යාව සුභාසිතමිදං භොතා ගොතමෙන: “අට්ඨානං ඛො එතං බ්‍රාහ්මණ අනවකාසො, යං අසප්පුරිසො අසප්පුරිසං ජානෙය්‍ය අසප්පුරිසො අයං භවන්ති. එතම්පි ඛො බ්‍රාහ්මණ අට්ඨානං අනවකාසො යං අසප්පුරිසො සප්පුරිසං ජානෙය්‍ය සප්පුරිසො අයං භවන්ති, ඨානං ඛො පනෙතං බ්‍රාහ්මණ විජ්ජති, යං සප්පුරිසො සප්පුරිසං ජානෙය්‍ය සප්පුරිසො අයං භවන්ති. එතම්පි ඛො බ්‍රාහ්මණ ඨානං විජ්ජති යං සප්පුරිසො අසප්පුරිසං ජානෙය්‍ය අසප්පුරිසො අයං භවන්ති.”

හන්ද චදානි මයං භො ගොතම ගච්ඡාම, බහුකිච්චා මයං බහුකරණීයාති.

යස්සදානි ත්වං බ්‍රාහ්මණ කාලං මඤ්ඤසීති.

අථ ඛො වස්සකාරො බ්‍රාහ්මණො මගධමහාමත්තො භගවතො භාසිතං අභිනන්දිත්වා අනුමොදිත්වා උට්ඨායාසනා පක්කාමීති.

Free Distribution www.aathaapi.org

තොදෙය්‍ය බමුණු (සියපිරිස හුන්) ඔවුන් මේ ක්‍රමයෙන් ගඳුන්වයි: "භවත්නි, ඒ කිම හඟින් ද, කළයුතු කිස හා අතිරේක කිසෙහි, කියයුත්ත හා අතිරේක ව කියයුත්තෙහි එලෙය්‍යරජ පණ්ඩිත වේ ද, ජේකයන් අතුරෙන් ජේක වේ ද?

භවත්නි, එසේ ය. කළයුතු කිස හා අතිරේක කිසෙහි, කියයුත්ත හා අතිරේකව කියයුත්තෙහි එලෙය්‍යරජ පණ්ඩිත ය. ජේකයන් අතුරෙනුත් ජේකය.

භවත්නි, යම් හෙයෙකින් ශ්‍රමණරාමපුත්‍ර පණ්ඩිත එලෙය්‍ය රජුට වඩා කටයුතු කිස හා අතිරේක කිසෙහි, කියයුත්ත හා අතිරේක කියයුත්තෙහි පණ්ඩිතතර වේ ද, ජේකරජුට වඩා ජේක වේ ද, එහෙයින් එලෙය්‍ය රජ ශ්‍රමණ රාමපුත්‍රයා කෙරෙහි පැහැදුනේ ශ්‍රමණ රාමපුත්‍රයා කෙරෙහි අභිවාදන ප්‍රත්‍යුපස්ථාන අඤ්ජලිකර්ම සාමීචිකර්ම යන මෙබඳු පරමනිපච්චකාරය කෙරෙයි.

භවත්නි, ඒ කිම හඟිද්ද, යමකය, මොග්ගල්ලය, උග්ගය, නාවින්දකිය, ගන්ධබ්බය, අග්ගිවෙස්සය යන එලෙය්‍ය රජුගේ පරිවාරකයෝ කළයුතු කිස හා ඉතිරි කිසෙහි, කියයුත්ත හා ඉතිරි ව කියයුත්තෙහි පණ්ඩිත වෙත් ද, ජේකයනට වඩා ජේක වෙත් ද?

භවත්නි, එසේය. යමකය, මොග්ගල්ලය, උග්ගය, නාවින්දකිය, ගන්ධබ්බය, අග්ගිවෙස්සය යන එලෙය්‍ය රජුගේ පරිවාරකයෝ කළයුතු කිස හා ඉතිරි ව කළයුතු කිසෙහි, කියයුත්ත හා ඉතිරි ව කියයුත්තෙහි පණ්ඩිතයහ. ජේකයනට වඩා ජේකයහ.

භවත්නි, යම් හෙයෙකින් ශ්‍රමණ රාමපුත්‍ර එලෙය්‍ය රජුගේ පණ්ඩිත පරිවාරකයනට වඩා කළයුතු කිස හා ඉතිරි ව කළයුතු කිසෙහි, කියයුත්ත හා ඉතිරි ව කියයුත්තෙහි පණ්ඩිතතර වේ ද, ජේකපරිවාරකයනට වඩා ජේකතර වේ ද, එහෙයින් එලෙය්‍යරජුගේ පරිවාරකයෝ ශ්‍රමණ රාමපුත්‍රයා කෙරෙහි වෙසෙසින් පැහැදුනාහ. ශ්‍රමණ රාමපුත්‍රයා කෙරෙහි අභිවාදන ප්‍රත්‍යුපස්ථාන අඤ්ජලිකර්ම සාමීචිකර්ම යන මෙබඳු පරම නිපච්චකාරය කෙරෙත්.

භවත් ගෞතමයන් වහන්ස, ආශ්චර්යයෙකි. භවත් ගෞතමයන් වහන්ස, අද්භූතයෙකි. භවත් ගෞතමයන් වහන්සේ විසින් තෙල පරම-සුභාෂිත වෙයි: "බමුණ, මේ භවත් අසත්පුරුෂය' යි අසත්පුරුෂයෙක් අසත්පුරුෂයකු දන්නේය යන මේකාරණ නොවනසුලු ය, එත්නට අවකාශ නැත යනු ද, 'මේ භවත් සත්පුරුෂය' යි අසත්පුරුෂයෙක් සත්පුරුෂයකු දන්නේ ය යන මේකාරණ ද අකාරණය එත්නට අනවකාශය' යි ද, 'මේ භවත් සත්පුරුෂය' යි සත්පුරුෂයෙක් සත්පුරුෂයකු දන්නේ ය යන මේකාරණ සහේතුක වේ ය යි ද, 'මේ භවත් අසත්පුරුෂය' යි සත්පුරුෂයෙක් අසත්පුරුෂයකු දන්නේ ය යන මේකාරණ ද සහෙතුකය" යි යන භාෂිත යි.

භවත් ගෞතමයන් වහන්ස, දැන් කලී අපි යම්හ. අපි බොහෝ කිස ඇත්තම්හ. බොහෝ කටයුතු ඇතියම්හ.

බමුණ, දැන් කලී තෝ යමකට කල් දනැ යි වදාළහ.

එක්බිති මගධ මහාමාත්‍ය වූ වස්සකාර බමුණු භාග්‍යවතුන් වහන්සේගේ භාෂිතය සතුටින් පිළිගෙණ අනුමෝදන් ව හුනස්නෙන් නැඟී ගියේ ය.

## 4. 4. 4. 8

## [උපකසුත්තං]

38. එකං සමයං භගවා **රාජගහෙ** විහරති ගිජ්ඣකූටෙ පබ්බතෙ. අථ ඛො **උපකො** මණ්ඩිකාපුත්තො යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නො ඛො උපකො මණ්ඩිකාපුත්තො භගවන්තං එතදවොච:

අහං හි භන්තෙ එවංවාදී එවංදිට්ඨී: යො කො චි පරූපාරම්භං වදෙති. පරූපාරම්භං වදෙන්තො සබ්බො සො[1] න උපපාදෙති[2], අනුපපාදෙන්තො ගාරය්හො හොති උපවජ්ජොති.

පරූපාරම්භං චෙ උපක වදෙති, පරූපාරම්භං වදෙන්තො න උපපාදෙති, අනුපපාදෙන්තො ගාරය්හො හොති උපවජ්ජො. ත්වං ඛො උපක පරූපාරම්භං වදෙසි. පරූපාරම්භං වදෙන්තො න උපපාදෙසි. අනුපපාදෙන්තො ගාරය්හො හොසි උපවජ්ජොති.

සෙය්‍යථාපි භන්තෙ උම්මුජ්ජමානකං යෙව මහතා පාසෙන බන්ධෙය්‍ය, එවමෙව ඛො අහං භන්තෙ උම්මුජ්ජමානකො යෙව භගවතා මහතා වාදපාසෙන බද්ධො’ති.

ඉදං අකුසලන්ති ඛො උපක මයා පඤ්ඤත්තං. තත්ථ අපරිමාණා පදා, අපරිමාණා බ්‍යඤ්ජනා, අපරිමාණා තථාගතස්ස ධම්මදෙසනා ඉතිපිදං අකුසලන්ති.

තං ඛො පනිදං අකුසලං පහාතබ්බන්ති ඛො උපක මයා පඤ්ඤත්තං. තත්ථ අපරිමාණා පදා, අපරිමාණා බ්‍යඤ්ජනා, අපරිමාණා තථාගතස්ස ධම්මදෙසනා ඉතිපිදං අකුසලං පහාතබ්බන්ති.

ඉදං කුසලන්ති ඛො උපක මයා පඤ්ඤත්තං. තත්ථ අපරිමාණා පදා, අපරිමාණා බ්‍යඤ්ජනා, අපරිමාණා තථාගතස්ස ධම්මදෙසනා ඉතිපිදං කුසලන්ති.

තං ඛො පනිදං කුසලං භාවෙතබ්බන්ති ඛො උපක මයා පඤ්ඤත්තං. තත්ථ අපරිමාණා පදා අපරිමාණා බ්‍යඤ්ජනා, අපරිමාණා තථාගතස්ස ධම්මදෙසනා ඉතිපිදං කුසලං භාවෙතබ්බන්ති.

අථ ඛො උපකො මණ්ඩිකාපුත්තො භගවතො භාසිතං අභිනන්දිත්වා අනුමොදිත්වා උට්ඨායාසනා භගවන්තං අභිවාදෙත්වා පදක්ඛිණං කත්වා යෙන රාජා මාගධො **අජාතසත්තු** වෙදෙහිපුත්තො තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා යාවතකො අහොසි භගවතා සද්ධිං කථාසල්ලාපො. තං සබ්බං රඤ්ඤො මාගධස්ස අජාතසත්තුස්ස වෙදෙහිපුත්තස්ස ආරොචෙසි.

එවං වුත්තෙ රාජා මාගධො අජාතසත්තු වෙදෙහිපුත්තො කුපිතො අනත්තමනො උපකං මණ්ඩිකාපුත්තං එතදවොච: යාවධංසී වායං ලොණකාරකදාරකො, යාවමුඛරො යාවපගබ්භො, යත්‍ර හි නාම තං භගවන්තං අරහන්තං සම්මාසම්බුද්ධං ආසාදෙතබ්බං මඤ්ඤිස්සති අපෙහි ත්වං උපක, විනස්ස, මා ත්වං අද්දසන්ති.

1. සබ්බෙසං, 2. උප්පාදෙති, 3. විනායං - මජසං

## 4. 4. 4. 8.

## [උපක සූත්‍රය]

38. එක් සමයෙක භාග්‍යවතුන් වහන්සේ **රජගහ** නුවර **ගිජ්ඣකූට** පව්වෙහි වැඩවසන සේක. එක්බිති **මණ්ඩිකාපුත්‍ර උපක** භාග්‍යවතුන් වහන්සේ කරා එළඹියේ ය. එළඹ භාග්‍යවතුන් වහන්සේ සකසා වැඳ එකත්පස්ව හින. එකත්පස්ව හුන් මණ්ඩිකාපුත්‍ර උපක භාග්‍යවතුන් වහන්සේට තෙල සැළ කෙළේ ය:

වහන්ස, "මම යම් කිසිවෙක් පරගර්හා කියා ද, පරගර්හා කියන්නේ, එ හැම (කුසල්) සිදු නො කෙරේ, නොහොත් උපපාදනය (තම වචනය නිසි කිරීම) නො කෙරේ. උපපාදනය නො කරණුයේ, ගර්හණීය වේ. උපවාද කටයුතු ද වෙයි" යන මෙබඳු වාද ඇතියෙම්, මෙබඳු දෘෂ්ටි ඇතියෙම් වෙමි.

"උපකය, ඉදින් පරගර්හා කෙරේ නම්, පරගර්හා කරණුයේ උපපාදනා නො කෙරේ නම්, උපපාදනා නො කරණුයේ ගර්හණීය වේ නම්, උපවාද කටයුතු වේ නම්, උපකය, තෝ පරගර්හා කෙරෙහි. පරගර්හා කරමින් උපපාදනා නො කෙරෙහි. උපපාදනා නො කරන්නෙහි ගර්හණීය වෙහි. උපවාද කටයුත්තෙහි ය" යි භාග්‍යවතුන් වහන්සේ වදාළහ.

වහන්ස, යම්සේ ඉල්පෙන්නා හා ම මහත් මළබැඳුමෙන් බඳනේ ද, වහන්ස, එපරිදි ම මම ඉල්පෙනුයෙම් ම භාග්‍යවතුන් වහන්සේ විසින් මහත් වාදපාශයෙන් බඳනා ලද්දෙම්.

උපකය, මා විසින් 'මේ අකුසලැ' යි පණවන ලදි. ඒ පැණවීමෙහි අපරිමාණ පදයෝ ය. අපරිමාණ ව්‍යඤ්ජනයෝ ය. 'මෙසේත් මේ අකුශලය' යන මෙහි තථාගතයන්ගේ අප්‍රමාණ ධර්මදේශනාවෝ ය.

උපකය, 'ඒ අකුශලය ප්‍රහාතව්‍යය' යි මා විසින් පණවන ලදි. ඒ පැණවීමෙහි පදයෝ අපරිමාණයහ. ව්‍යඤ්ජනයෝ අපරිමාණයහ. 'මෙසේත් මේ අකුශලය ප්‍රහාතව්‍යය' යන මෙහි තථාගතයන්ගේ ධර්මදේශනා අප්‍රමාණය.

උපකය, 'මේ කුසලැ' යි මා විසින් පණවන ලදි. ඒ පැණවීමෙහි පදයෝ අපරිමාණයහ. ව්‍යඤ්ජනයෝ අපරිමාණයහ. 'මෙසේත් මේ කුශලය' යි යන මෙහි තථාගතයන්ගේ ධර්මදේශනා අප්‍රමාණය.

උපකය, 'ඒ කුශලය භාවිතව්‍යය' යි මා විසින් පණවන ලදි. ඒ පැණවීමෙහි පදයෝ අපරිමාණයහ. ව්‍යඤ්ජනයෝ අපරිමාණයහ. 'මෙසේත් මේ කුශලය භාවිතව්‍යය' යන මෙහි තථාගතයන්ගේ ධර්මදේශනා අප්‍රමාණයි.

ඉක්බිති මණ්ඩිකාපුත්‍ර උපක භාග්‍යවතුන් වහන්සේගේ භාෂිතය සතුටින් පිළිගෙණ අනුමෝදන්ව හුනස්නෙන් නැගී භාග්‍යවතුන් වහන්සේ සකසා වැඳ පැදකුණු කොට වෛදේහීපුත්‍ර වූ මගධාධිශ්වර **අජාසත්** රජු කරා එළඹියේ ය. එළඹ භාග්‍යවතුන් වහන්සේ සමග යම් පමණ කථාසල්ලාප වී ද, එහැම වෛදේහිපුත්‍ර මගධාධිශ්වර අජාසත් රජහට කීයේ ය.

මෙසේ කී කල්හි වෛදේහිපුත්‍ර වූ මගධාධිශ්වර අජාසත් රජ කුපිත ව නොගත් සිත් ඇතිව මණ්ඩිකාපුත්‍ර උපකයාට මෙසේ කීය: "මේ ලොණකාර ගම්දරුවා පරමධෘෂ්ට ඇත්තෙක (=අත්‍යර්ථියෙන් හැටෙන්නෙක), ඉතා දෙඩමලුය. අතිශයින් ප්‍රගල්භය. භගවත් අර්හත් ඒ සම්මා සම්බුද්ධරජුන් හැටියයුත්තකු කොට සිතී ද එනෙයිනි. උපකය, තෝ පහව යා. නස. තා නොදකිම්වා."



Free Distribution www.aathaapi.org

## 4. 4. 4. 9.

## [ සච්ඡිකරණීය සුත්තං ]

**[සාවත්ථිනිදානං]**

39. චත්තාරොමෙ භික්ඛවෙ සච්ඡිකරණීයා ධම්මා. කතමෙ චත්තාරො?

අත්ථි භික්ඛවෙ ධම්මා කායෙන සච්ඡිකරණීයා. අත්ථි භික්ඛවෙ ධම්මා සතියා සච්ඡිකරණීයා. අත්ථි භික්ඛවෙ ධම්මා චක්ඛුනා සච්ඡිකරණීයා. අත්ථි භික්ඛවෙ ධම්මා පඤ්ඤාය සච්ඡිකරණීයා.

කතමෙ ච භික්ඛවෙ ධම්මා කායෙන සච්ඡිකරණීයා. අට්ඨ විමොක්ඛා භික්ඛවෙ කායෙන සච්ඡිකරණීයා.

කතමෙ ච භික්ඛවෙ ධම්මා සතියා සච්ඡිකරණීයා? පුබ්බෙනිවාසො භික්ඛවෙ සතියා සච්ඡිකරණීයො.

කතමෙ ච භික්ඛවෙ ධම්මා චක්ඛුනා සච්ඡිකරණීයා? සත්තානං චුතූපපාතො භික්ඛවෙ චක්ඛුනා සච්ඡිකරණීයො.

කතමෙ ච භික්ඛවෙ ධම්මා පඤ්ඤාය සච්ඡිකරණීයා? ආසවානං ඛයො භික්ඛවෙ පඤ්ඤාය සච්ඡිකරණීයො.

ඉමෙ ඛො භික්ඛවෙ චත්තාරො සච්ඡිකරණීයා ධම්මාති.

## 4. 4. 4. 10

## [ භික්ඛුසඞ්ඝසොභන සුත්තං ]

40. එකං සමයං භගවා **සාවත්ථියං** විහරති **පුබ්බාරාමෙ** මිගාරමාතුපාසාදෙ. තෙන ඛො පන සමයෙන භගවා තදහුපොසථෙ භික්ඛුසඞ්ඝපරිවුතො නිසින්නො හොති. අථ ඛො භගවා තුණ්හීභූතං තුණ්හීභූතං භික්ඛුසඞ්ඝං අනුවිලොකෙත්වා භික්ඛූ ආමන්තෙසි:

අපලාපායං භික්ඛවෙ පරිසා, නිප්පලාපායං භික්ඛවෙ පරිසා සුද්ධා සාරෙ පතිට්ඨිතා. තථාරූපො අයං භික්ඛවෙ භික්ඛුසඞ්ඝො. තථාරූපායං භික්ඛවෙ පරිසා යථාරූපා පරිසා දුල්ලභා දස්සනායපි ලොකස්මිං. තථාරූපො අයං භික්ඛවෙ භික්ඛුසඞ්ඝො. තථාරූපායං භික්ඛවෙ පරිසා ආහුනෙය්‍යා පාහු-ණෙය්‍යා දක්ඛිණෙය්‍යා අඤ්ජලිකරණීයා අනුත්තරං පුඤ්ඤක්ඛෙත්තං ලොකස්ස. තථාරූපො අයං භික්ඛවෙ භික්ඛුසඞ්ඝො.

4. 4. 4. 9.

[සච්ඡිකරණීය සූත්‍රය]

[සැවැත් නිදානයි]

39. මහණෙනි, මේ සාක්ෂාත් (ප්‍රත්‍යක්ෂ) කළයුතු දහම්හු සතර දෙනෙක. කවර සතර දෙනෙක යත්:

මහණෙනි, නාමකායින් ප්‍රත්‍යක්ෂ කළයුතු ධර්මයෝ ඇත. ස්මෘතියෙන් ප්‍රත්‍යක්ෂ කළයුතු ධර්මයෝ ඇත. දිව්‍යචක්ෂුසින් ප්‍රත්‍යක්ෂ කළයුතු ධර්මයෝ ඇත. ධ්‍යානප්‍රඥායෙන් ප්‍රත්‍යක්ෂ කළයුතු ධර්මයෝ ඇත.

මහණෙනි, නාමකායින් ප්‍රත්‍යක්ෂ කළයුතු ධර්මයෝ කවරහ? මහණෙනි, අෂ්ටවිමොක්ෂයෝ නාමකායින් ප්‍රත්‍යක්ෂ කළයුතු වෙති.

මහණෙනි, ස්මෘතියෙන් ප්‍රත්‍යක්ෂ කළයුතු ධර්මයෝ කවරහ? මහණෙනි, පූර්වේනිවාසය ස්මෘතියෙන් ප්‍රත්‍යක්ෂ කළයුතු ය.

මහණෙනි, දිව්‍යචක්ෂුසින් ප්‍රත්‍යක්ෂ කළයුතු ධර්මයෝ කවරහු ද? මහණෙනි, සත්ත්වයන්ගේ චුතූපපාතය දිවැසින් ප්‍රත්‍යක්ෂ කළයුතු ය.

මහණෙනි, ප්‍රඥායෙන් ප්‍රත්‍යක්ෂ කළයුතු ධර්මයෝ කවරහ? මහණෙනි, ආශ්‍රවක්ෂය ප්‍රඥායෙන් ප්‍රත්‍යක්ෂ කළයුතු ය.

මහණෙනි, මේ සතර දහම්හු සාක්ෂාත් කළයුත්තෝ යි.

4. 4. 4. 10.

[භික්ඛුසඞ්ඝ පොසථ සූත්‍රය]

40. එක්සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර මිගාරමාතෘ පාය නම් වූ පූර්වාරාමයෙහි වැඩවසන සේක. එසමයෙහි භාග්‍යවතුන් වහන්සේ එදවස් පොහොයෙහි භික්ෂුසඞ්ඝයා විසින් පිරිවරණ ලද්දුව හුන්සේක් වෙති. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ නිහඬ නිහඬව හුන් භික්ෂූන් බලා භික්ෂූන් ඇමතූ සේක:

මහණෙනි, මේ පිරිස ප්‍රලාපරහිතය. මහණෙනි, මේ පිරිස නිෂ්ප්‍රලාපය, නිර්මලය, ශීලාදි සාරයෙහි පිහිටියේ. මහණෙනි, මේ භික්ෂුසඞ්ඝ එබඳුය. මහණෙනි, යම්බඳු පිරිසක් ලෝකයෙහි දක්නට සොයා දුර්ලභ වේ ද, මේ පිරිස එබඳුය: මහණෙනි, මේ භික්ෂුසඞ්ඝ එබඳුය. මහණෙනි, මේ පිරිස එබඳුය: ආහුණෙය්‍යය, පාහුණෙය්‍යය, දක්ඛිණෙය්‍යය, අඤ්ජලිකරණීයය, ලෝකයාට අනුත්තර පුණ්‍යක්ෂේත්‍රය. මහණෙනි, මේ භික්ෂුසඞ්ඝ එබඳුය.

තථාරූපායං භික්ඛවෙ පරිසා යථාරූපායං පරිසා අප්පම්පි දින්නං බහුං හොති, බහුං දින්නං බහුතරං. තථාරූපො අයං භික්ඛවෙ භික්ඛුසඞ්ඝො. තථාරූපායං භික්ඛවෙ පරිසා යථාරූපං පරිසං අලං යොජනගණනානිපි දස්සනාය ගන්තුං අපිපුටංසෙනාපි. තථාරූපො අයං භික්ඛවෙ භික්ඛුසඞ්ඝො.

සන්ති භික්ඛවෙ භික්ඛූ ඉමස්මිං භික්ඛුසඞ්ඝෙ දෙවප්පත්තා විහරන්ති. සන්ති භික්ඛවෙ භික්ඛූ ඉමස්මිං භික්ඛුසඞ්ඝෙ බ්‍රහ්මප්පත්තා විහරන්ති. සන්ති භික්ඛවෙ භික්ඛූ ඉමස්මිං භික්ඛුසඞ්ඝෙ ආනෙඤ්ජප්පත්තා විහරන්ති. සන්ති භික්ඛවෙ භික්ඛූ ඉමස්මිං භික්ඛුසඞ්ඝෙ අරියප්පත්තා විහරන්ති.

කථං ච භික්ඛවෙ භික්ඛු දෙවප්පත්තො හොති? ඉධ භික්ඛවෙ භික්ඛු විවිච්චෙව කාමෙහි -පෙ- පඨමං ඣානං උපසම්පජ්ජ විහරති -පෙ- දුතියං ඣානං -පෙ- තතියං ඣානං -පෙ- චතුත්ථං ඣානං උපසම්පජ්ජ විහරති. එවං ඛො භික්ඛවෙ භික්ඛු දෙවප්පත්තො හොති.

කථං ච භික්ඛවෙ භික්ඛු බ්‍රහ්මප්පත්තො හොති? ඉධ භික්ඛවෙ භික්ඛු මෙත්තාසහගතෙන චෙතසා එකං දිසං ඵරිත්වා විහරති. තථා දුතියං -පෙ- තථා තතියං -පෙ- තථා චතුත්ථිං -පෙ- ඉති උද්ධමධො තිරියං සබ්බධි සබ්බත්තතාය සබ්බාවන්තං ලොකං මෙත්තාසහගතෙන චෙතසා විපුලෙන මහග්ගතෙන අප්පමාණෙන අවෙරෙන අබ්‍යාපජ්ඣෙන ඵරිත්වා විහරති. කරුණාසහගතෙන චෙතසා -පෙ- මුදිතාසහගතෙන චෙතසා -පෙ- උපෙක්ඛාසහගතෙන චෙතසා එකං දිසං ඵරිත්වා විහරති. තථා දුතියං -පෙ- තථා තතියං -පෙ- තථා චතුත්ථිං -පෙ- ඉති උද්ධමධො තිරියං සබ්බධි සබ්බත්තතාය සබ්බාවන්තං ලොකං උපෙක්ඛාසහගතෙන චෙතසා විපුලෙන මහග්ගතෙන අප්පමාණෙන අවෙරෙන අබ්‍යාපජ්ඣෙන ඵරිත්වා විහරති. එවං ඛො භික්ඛවෙ භික්ඛු බ්‍රහ්මප්පත්තො හොති.

කථං ච භික්ඛවෙ භික්ඛු ආනෙඤ්ජප්පත්තො හොති? ඉධ භික්ඛවෙ භික්ඛු සබ්බසො රූපසඤ්ඤානං සමතික්කමා පටිඝසඤ්ඤානං අත්ථඞ්ගමා නානත්තසඤ්ඤානං අමනසිකාරා අනන්තො ආකාසොති ආකාසානඤ්චායතනං උපසම්පජ්ජ විහරති. සබ්බසො ආකාසානඤ්චායතනං සමතික්කම්ම අනන්තං විඤ්ඤාණන්ති විඤ්ඤාණඤ්චායතනං උපසම්පජ්ජ විහරති. සබ්බසො විඤ්ඤාණඤ්චායතනං සමතික්කම්ම නත්ථි කිඤ්චීති ආකිඤ්චඤ්ඤායතනං උපසම්පජ්ජ විහරති. සබ්බසො ආකිඤ්චඤ්ඤායතනං සමතික්කම්ම නෙවසඤ්ඤානාසඤ්ඤායතනං උපසම්පජ්ජ විහරති. එවං ඛො භික්ඛවෙ භික්ඛු ආනෙඤ්ජප්පත්තො හොති.

කථං ච භික්ඛවෙ භික්ඛු අරියප්පත්තො හොති? ඉධ භික්ඛවෙ භික්ඛු ඉදං දුක්ඛන්ති යථාභූතං පජානාති. අයං දුක්ඛසමුදයොති යථාභූතං පජානාති. අයං දුක්ඛනිරොධොති. යථාභූතං පජානාති. අයං දුක්ඛනිරොධගාමිනී පටිපදාති යථාභූතං පජානාති. එවං ඛො භික්ඛවෙ භික්ඛු අරියප්පත්තො හොතීති.

## බ්‍රාහ්මණවග්ගො[1] චතුත්ථො.*

---

1. යොධාජීවවග්ගො - සීමු; ස්‍යා.

* තස්සුද්දානං - යොධා පාටිභොගසුතං අභයං බ්‍රාහ්මණසච්චෙන පඤ්චමං. උම්මග්ග වස්සකාරො උපකො සච්ඡිකිරියා ච උපොසථෙනාති - මජසං.

මහණෙනි, යම්බඳු මේ පිරිසෙක් ඇද්ද, අල්ප කොට දෙන ලද්ද විපාක විසින් බොහෝ වේ ද, බොහෝ කොට දෙන ලද්ද විපාක විසින් බහුතර වේ ද, මේ පිරිස් එබඳුය. මහණෙනි, මේ භික්ෂුසඞ්ඝ තෙමේ එබඳුය. මහණෙනි, යම් පිරිසක් අස්ගිලා මාගෝපකරණපුට ගෙණද යොදුන් ගණනුත් දක්නට යනු පිණිස නිසි වේ ද, මේ පිරිස එබඳුය. මහණෙනි, මේ භික්ෂුසඞ්ඝ තෙමේ එබඳුය.

මහණෙනි, මේ භික්ෂුසඞ්ඝයා කෙරෙහි දිව්‍යවිහාරප්‍රාප්තව වසන භික්ෂූහු ඇත. මහණෙනි, මේ භික්ෂුසඞ්ඝයා කෙරෙහි බ්‍රහ්මවිහාරප්‍රාප්තව වසන භික්ෂූහු ඇත. මහණෙනි, මේ භික්ෂුසඞ්ඝයා කෙරෙහි නිශ්චලප්‍රාප්තව වසන භික්ෂූහු ඇත. මහණෙනි, මේ භික්ෂුසඞ්ඝයා කෙරෙහි ආර්‍ය්‍යභාවප්‍රාප්තව වසන භික්ෂූහු ඇත.

මහණෙනි, කෙසේ නම් මහණ දේවප්‍රාප්ත වේ ද? මහණෙනි, මෙසස්නෙහි මහණ කාමයෙන් වෙන්ව ... පළමුවන ධ්‍යානයට එළඹ වෙසෙයි ... දෙවන ධ්‍යානයට ... තෙවන ධ්‍යානයට ... සිවුවන ධ්‍යානයට එළඹ වෙසෙයි. මහණෙනි, මෙසේ මහණ දේවප්‍රාප්ත වෙයි.

මහණෙනි, කෙසේ නම් මහණ බ්‍රහ්මප්‍රාප්ත වේ ද? මහණෙනි, මෙසස්නෙහි මහණ මෛත්‍රීසහගත සිතින් එක් දිගක් පැහැසැ වෙසෙයි. එසේ දෙවන දිග ද ... එසේ තුන්වන දිග ද ... එසේ සතරවන දිග ද .. මෙසේ උඩ යට සරස හැම තැන සර්වාත්මභාවයෙන් මුළුලොව විපුල වූ මහද්ගත වූ අප්‍රමාණ වූ අවෛර වූ අව්‍යාබාධ වූ මෛත්‍රීසහගත සිතින් පැහැසැ වෙසෙයි. කරුණාසහගත සිතින් ... මුදිතාසහගත සිතින් ... උපෙක්ෂාසහගත සිතින් එක් දිගක් පැහැස වෙසෙයි. එසේ දෙවන දිග ද ... එසේ තුන්වන දිග ද ... එසේ සතරවන දිග ද ... මෙසේ උඩ යට සරස හැම තැන සර්වාත්මසමතායෙන් මුළුලොව විපුල වූ මහද්ගත වූ අප්‍රමාණ වූ අවෛර වූ ව්‍යාබාධ රහිත වූ උපෙක්ෂාසහගත සිතින් පැහැසැ වෙසෙයි. මහණෙනි, මෙසේ මහණ බ්‍රහ්මප්‍රාප්ත වෙයි.

මහණෙනි, කෙසේ නම් මහණ නිශ්චලප්‍රාප්ත වේ ද? මහණෙනි, මෙසස්නෙහි මහණ සර්වප්‍රකාරයෙන් රූපසංඥාවන්ගේ සමතික්‍රමයෙන් ප්‍රතිඝසංඥාවන්ගේ අස්තඞ්ගමයෙන් නානාත්වසංඥාවන්ගේ නොමෙනෙහි කිරීමෙන් "ආකාශය අනන්තය" යි ආකාශානන්ත්‍යායතනයට එළඹ වෙසෙයි. සර්වප්‍රකාරයෙන් ආකාසානඤ්චායතනය සමතික්‍රමණය කොට "විඥානය අනන්තය" යි විඥානානන්ත්‍යායතනයට එළඹ වෙසෙයි. සර්වප්‍රකාරයෙන් විඥානානන්ත්‍යායතනය සමතික්‍රමණය කොට "කිසිත් නැත" යි ආකිඤ්චන්‍යායතනයට එළඹ වෙසෙයි. ආකිඤ්චන්‍යායතනය සමතික්‍රමණය කොට නෛවසංඥානාසංඥායතනයට එළඹ වෙසෙයි. මහණෙනි, මෙසේ මහණ නිශ්චලප්‍රාප්ත වෙයි.

මහණෙනි, කෙසේ නම් මහණ ආර්‍ය්‍යභාවප්‍රාප්ත වේ ද? මහණෙනි, මෙසස්නෙහි මහණ මේ දුකැයි තත් වූ පරිදි දනී. මේ දුක් උපදින හේතු යයි තත් වූ පරිදි දනී. මේ දුඃඛනිරොධ යයි තත් වූ පරිදි දනී. මේ දුඃඛනිරොධගාමිනී ප්‍රතිපදාය යි තත් වූ පරිදි දනී. මහණෙනි, මෙසේ මහණ ආර්‍ය්‍යභාවප්‍රාප්ත වේ.

බ්‍රාහ්මණ වර්ගය සිවුවැනි යි.

# 5. මහාවග්ගො

## 4. 4. 5. 1.

## [සොතානුගතසුත්තං]

[සාවත්ථිනිදානං]

41. සොතානුගතානං[1] භික්ඛවෙ ධම්මානං වචසා පරිචිතානං මනසානුපෙක්ඛිතානං දිට්ඨියා සුප්පටිවිද්ධානං චත්තාරො ආනිසංසා පාටිකඞ්ඛා. කතමෙ චත්තාරො?

ඉධ භික්ඛවෙ භික්ඛු ධම්මං පරියාපුණාති: සුත්තං ගෙය්‍යං වෙය්‍යාකරණං ගාථා[2] උදානං ඉතිවුත්තකං ජාතකං අබ්භුතධම්මං වෙදල්ලං. තස්ස තෙ ධම්මා සොතානුගතා[1] හොන්ති වචසා පරිචිතා මනසානුපෙක්ඛිතා දිට්ඨියා සුප්පටිවිද්ධා. සො මුට්ඨස්සති කාලං කුරුමානො අඤ්ඤතරං දෙවනිකායං උපපජ්ජති, තස්ස තත්ථ සුඛිනො ධම්මපදා පිලපන්ති[3] දන්ධො භික්ඛවෙ සතුප්පාදො. අථ සො සත්තො ඛිප්පං යෙව විසෙසගාමී හොති. සොතානුගතානං භික්ඛවෙ ධම්මානං වචසා පරිචිතානං මනසානුපෙක්ඛිතානං දිට්ඨියා සුප්පටිවිද්ධානං අයං පඨමො ආනිසංසො පාටිකඞ්ඛො.

පුන ච පරං භික්ඛවෙ භික්ඛු ධම්මං පරියාපුණාති: සුත්තං ගෙය්‍යං වෙය්‍යාකරණං ගාථා උදානං ඉතිවුත්තකං ජාතකං අබ්භුතධම්මං වෙදල්ලං. තස්ස තෙ ධම්මා සොතානුගතා හොන්ති වචසා පරිචිතා මනසානුපෙක්ඛිතා දිට්ඨියා සුප්පටිවිද්ධා. සො මුට්ඨස්සති කාලං කුරුමානො අඤ්ඤතරං දෙවනිකායං උපපජ්ජති. තස්ස තත්ථ න හෙව ඛො සුඛිනො ධම්මපදා පිලපන්ති. අපි ච ඛො භික්ඛු ඉද්ධිමා චෙතොවසිප්පත්තො දෙවපරිසායං ධම්මං දෙසෙති. තස්ස එවං හොති: අයං වා සො ධම්මවිනයො යත්ථාහං පුබ්බෙ බ්‍රහ්මචරියං අචරි'න්ති. දන්ධො භික්ඛවෙ සතුප්පාදො. අථ සො සත්තො ඛිප්පං යෙව විසෙසගාමී හොති.

සෙය්‍යථාපි භික්ඛවෙ පුරිසො කුසලො භෙරිසද්දස්ස. සො අද්ධානමග්ග පටිපන්නො භෙරිසද්දං සුණෙය්‍ය, තස්ස න හෙව ඛො අස්ස කඞ්ඛා වා විමති වා භෙරිසද්දො නු ඛො න නු ඛො භෙරිසද්දොති. අථ ඛො භෙරිසද්දොත්වෙව නිට්ඨං ගච්ඡෙය්‍ය. එවමෙව ඛො භික්ඛවෙ භික්ඛු ධම්මං පරියාපුණාති: සුත්තං ගෙය්‍යං වෙය්‍යාකරණං ගාථා උදානං ඉතිවුත්තකං ජාතකං අබ්භුතධම්මං වෙදල්ලං. තස්ස තෙ ධම්මා සොතානුගතා හොන්ති. වචසා පරිචිතා මනසානුපෙක්ඛිතා දිට්ඨියා සුප්පටිවිද්ධා. සො මුට්ඨස්සති කාලං කුරුමානො අඤ්ඤතරං දෙවනිකායං උපපජ්ජති. තස්ස තත්ථ න හෙව ඛො සුඛිනො ධම්මපදා පිලපන්ති. අපි ච ඛො භික්ඛු ඉද්ධිමා චෙතොවසිප්පත්තො දෙවපරිසායං ධම්මං දෙසෙති. තස්ස එවං හොති: අයං වා සො ධම්මවිනයො යත්ථාහං පුබ්බෙ බ්‍රහ්මචරියං අචරින්ති. දන්ධො භික්ඛවෙ සතුප්පාදො. අථ සො සත්තො ඛිප්පං යෙව විසෙසගාමී හොති. සොතානුගතානං භික්ඛවෙ ධම්මානං වචසා පරිචිතානං මනසානුපෙක්ඛිතානං දිට්ඨියා සුප්පටිවිද්ධානං අයං දුතියො ආනිසංසො පාටිකඞ්ඛො.

1. සොතානුගතානං - මජසං. 2. ගාථං - මජසං. 3. පලවන්ති - මජසං.

# 5. මහා වර්ගය

## 4. 4. 5 1.

## [ ශ්‍රොතානුගත සූත්‍රය ]

[සැවැත් නිදානයි]

41. මහණෙනි, වචනයෙන් පුරුදු කළ සිතින් පිරික්සා බැලූ නුවණින් මොනවට ප්‍රතිවේධ කළ පගන්කන් රැකොට නුවණ කණින් ව්‍යවස්ථා කළ ධර්මයන්ගේ අනුසස් සතර දෙනෙක් කැමැති විය යුත්තාහ කවර සතර දෙනෙක යත්:

මහණෙනි, මෙ සස්නෙහි මහණ සූත්‍ර, ගෙය්‍ය, වෙය්‍යාකරණ, ගාථා, උදාන, ඉතිවුත්තක, ජාතක, අබ්භූතධම්ම, වෙදල්ල යන දහම් පුහුණු කරයි. ඔහු විසින් ඒ දහම්හු කණින් අසා ධරණ ලද්දාහු වචනයෙන් පුරුදු කරණ ලද්දාහු සිතින් විමසන ලද්දාහු නුවණින් අවබොධ කරණ ලද්දාහු වෙත්. හේ මුෂිතසම්‍යෘතිව කලුරිය කරන්නේ අන්‍යතර දේවනිකායකට එලඹෙයි. එහි සුඛිත වූ ඔහුට ධර්මපදයෝ වැටහෙත්. මහණෙනි, බුද්ධවචනානුස්මෘති සිහිය ඉපැද්ම ගුරු වෙයි වැලි ඒ සත්ත්වයා වහා ම විශෙෂගාමී වෙයි. මහණෙනි, කණින් අසා දරණ ලද වචනයෙන් පුරුදු කරණ ලද සිතින් පරීක්‍ෂා කරණ ලද ප්‍රඥයෙන් අවබොධ කරණලද ධර්මයන්ගේ මේ පළමුවන ආනිසංසය කැමැති විය යුතුය.

තව ද මහණෙනි, මහණ සූත්‍ර, ගෙය්‍ය, වෙය්‍යාකරණ, ගාථා, උදාන, ඉතිවුත්තක, ජාතක, අබ්භූතධම්ම, වෙදල්ල යන දහම් පුහුණු කරයි. ඔහු විසින් ඒ දහම්හු කණින් අසා ධරණ ලද්දාහු වචනයෙන් පුරුදු කරණ ලද්දාහු සිතින් පරීක්‍ෂා කරණ ලද්දාහු ප්‍රඥයෙන් අවබොධ කරණ ලද්දාහු වෙත්. හේ මූළා සිහි ඇතිව කලුරිය කරන්නේ අන්‍යතර දේවනිකායකට එළඹෙයි. එහි සුඛිත වූ ඔහුට ධර්මපදයෝ නො වැටහෙත්. වැලිත් ඍද්ධිමත් වූයේ චෙතොවශිප්‍රාප්ත වූයේ දෙව්පිරිස්හි දහම් දෙසයි. ඔහුට මෙබඳු සිතෙක් වෙයි: මම පෙර අත්බව යම් සස්නෙක බඹසරවස් පිරීම් ද, මේ ඒ ධර්මවිනය කියා ය. මහණෙනි, සම්‍යෘති උත්පත්තිය ලැසි ය. වැලි ඒ සත්ත්ව තෙමේ වහා විශේෂගාමී වෙයි.

මහණෙනි, යම් පරිදි පුරුෂයෙක් බෙරහඬෙහි දක්‍ෂ වූයේ වේ ද, හේ අදත්මගට පිළිපන්නේ බෙරහඬ අසයි. බෙරහඬෙක් වේ දෝ හෝ බෙරහඬෙක් නො වේ දෝ හෝ සි සැකයෙක් හෝ විමතියෙක් හෝ නො වෙයි. වැලිත් බෙරහඬෙක් ම ය සි නියමයට යෙයි. මහණෙනි, එපරිදි ම මහණ, සූත්‍ර, ගෙය්‍ය, වෙය්‍යාකරණ, ගාථා, උදාන, ඉතිවුත්තක, ජාතක, අබ්භූතධම්ම, වෙදල්ල යන දහම් පුහුණු කෙරෙයි. ඔහු විසින් ඒ දහම්හු කණින් අසා ධරණ ලද්දාහු වචනයෙන් පුරුදු කරණ ලද්දාහු සිතින් පිරියෙස්නා ලද්දාහු නුවණින් අවබෝධ කරණ ලද්දාහු වෙත්. හේ සිහි මුළාව කලුරිය කරන්නේ එක්තරා දේවනිකායකට එළඹේ. එහි සුඛිතව වසන ඔහුට ධර්මපදයෝ නො වැටහෙත්. වැලිත් මහණෙක් ඍද්ධිමත් වූයේ චෙතොවශිප්‍රාප්ත වූයේ දෙව්පිරිස්හි දහම් දෙසයි. ඔහුට මෙබඳු සිතෙක් වෙයි: පෙර අත්බව මම යම් සස්නෙක බඹසර පිරීම් ද, මේ ඒ දහම් විනය කියා සි. මහණෙනි, ස්මෘති උත්පත්තිය දඬිය. වැලි ඒ සත්ත්ව තෙමේ වහා ම විශේෂගාමී වෙයි. මහණෙනි, කණින් අසා ධරණ ලද වචනයෙන් පුරුදු කරණ ලද සිතින් පිරියෙස්ලි කරණ ලද ප්‍රඥයෙන් අවබෝධ කරණ ලද ධර්මයන්ගේ මේ දෙවන ආනිසංසය කැමැති විය යුතු ය

පුන ච පරං භික්ඛවෙ භික්ඛු ධම්මං පරියාපුණාති: සුත්තං ගෙය්‍යං වෙය්‍යාකරණං ගාථං උදානං ඉතිවුත්තකං ජාතකං අබ්භුතධම්මං වෙදල්ලං. තස්ස තෙ ධම්මා සොතානුගතා හොන්ති වචසා පරිචිතා මනසානුපෙක්ඛිතා දිට්ඨියා සුප්පටිවිද්ධා. සො මුට්ඨස්සති කාලං කුරුමානො අඤ්ඤතරං දෙවනිකායං උපපජ්ජති. තස්ස තත්ථ න හෙව ඛො සුඛිනො ධම්මපදාපිලපන්ති. නපි භික්ඛු ඉද්ධිමා චෙතොවසිප්පත්තො දෙවපරිසායං ධම්මං දෙසෙති. අපි ච ඛො දෙවපුත්තො දෙවපරිසායං ධම්මං දෙසෙති. තස්ස එවං හොති: අයං වා සො ධම්මවිනයො යත්ථාහං පුබ්බෙ බ්‍රහ්මචරියං අචරින්ති. දන්ධො භික්ඛවෙ සතුප්පාදො. අථ සො සත්තො ඛිප්පං යෙව විසෙසගාමී හොති.

සෙය්‍යථාපි භික්ඛවෙ පුරිසො කුසලො සඞ්ඛසද්දස්ස. සො අද්ධානමග්ගපටිපන්නො සඞ්ඛසද්දං සුණෙය්‍ය, තස්ස න හෙව ඛො අස්ස කඞ්ඛා වා විමති වා සඞ්ඛසද්දො නු ඛො න නු ඛො සඞ්ඛසද්දොති. අථ ඛො සඞ්ඛසද්දොත්වෙව නිට්ඨං ගච්ඡෙය්‍ය. එවමෙව ඛො භික්ඛවෙ භික්ඛු ධම්මං පරියාපුණාති: සුත්තං ගෙය්‍යං වෙය්‍යාකරණං ගාථං උදානං ඉතිවුත්තකං ජාතකං අබ්භුතධම්මං වෙදල්ලං. තස්ස තෙ ධම්මා සොතානුගතා හොන්ති වචසා පරිචිතා මනසානුපෙක්ඛිතා දිට්ඨියා සුප්පටිවිද්ධා. සො මුට්ඨස්සති කාලං කුරුමානො අඤ්ඤතරං දෙවනිකායං උපපජ්ජති. තස්ස තත්ථ න හෙව ඛො සුඛිනො ධම්මපදාපිලපන්ති. න පි භික්ඛු ඉද්ධිමා චෙතොවසිප්පත්තො දෙවපරිසායං ධම්මං දෙසෙති, අපි ච ඛො දෙවපුත්තො දෙවපරිසායං ධම්මං දෙසෙති. තස්ස එවං හොති: අයං වා සො ධම්මවිනයො යත්ථාහං පුබ්බෙ බ්‍රහ්මචරියං අචරින්ති. දන්ධො භික්ඛවෙ සතුප්පාදො. අථ සො සත්තො ඛිප්පං යෙව විසෙසගාමී හොති. සොතානුගතානං භික්ඛවෙ ධම්මානං වචසා පරිචිතානං මනසානුපෙක්ඛිතානං දිට්ඨියා සුප්පටිවිද්ධානං අයං තතියො ආනිසංසො පාටිකඞ්ඛො.

පුන ච පරං භික්ඛවෙ භික්ඛු ධම්මං පරියාපුණාති: සුත්තං ගෙය්‍යං වෙය්‍යාකරණං ගාථං උදානං ඉතිවුත්තකං ජාතකං අබ්භුතධම්මං වෙදල්ලං. තස්ස තෙ ධම්මා සොතානුගතා හොන්ති වචසා පරිචිතා මනසානුපෙක්ඛිතා දිට්ඨියා සුප්පටිවිද්ධා. සො මුට්ඨස්සති කාලං කුරුමානො අඤ්ඤතරං දෙවනිකායං උපපජ්ජති. තස්ස තත්ථ න හෙව ඛො සුඛිනො ධම්මපදාපිලපන්ති. න පි භික්ඛු ඉද්ධිමා චෙතොවසිප්පත්තො දෙවපරිසායං ධම්මං දෙසෙති. නපි දෙවපුත්තො දෙවපරිසායං ධම්මං දෙසෙති. අපි ච ඛො ඔපපාතිකො ඔපපාතිකං සාරෙති: සරසි ත්වං මාරිස යත්ථ මයං පුබ්බෙ බ්‍රහ්මචරියං අචරිම්හාති. සො එවමාහ: සරාමි මාරිස සරාමි මාරිසාති. දන්ධො භික්ඛවෙ සතුප්පාදො. අථ සො සත්තො ඛිප්පං යෙව විසෙසගාමී හොති.

තව ද මහණෙනි, මහණ සුත්ත, ගෙය්‍ය, වෙය්‍යාකරණ, ගාථා, උදාන, ඉතිවුත්තක, ජාතක, අබ්භූතධම්ම, වෙදල්ල යන දහම් පුහුණු කෙරෙයි. ඔහු විසින් ඒ දහම්හු කණින් අසා ධරණ ලද්දාහු වචනයෙන් පුරුදු කරණ ලද්දාහු සිතින් විමසන ලද්දාහු ප්‍රඥායෙන් පසක් කරණ ලද්දාහු වෙත්. හේ සිහි මුළා වූයේ කළුරිය කරන්නේ එක්තරා දේව-නිකායකට එළඹේ. එහි සුඛිතව වසන ඔහුට ධර්මපදයෝ නො ම වටහත්. මහණෙක් ඍද්ධිමත් වූයේ චෙතොවශීප්‍රාප්ත වූයේ දෙව්පිරිස්හි දහම් නො ම දෙසයි. වැලිත් (ධර්මකථික) දෙව්පුතෙක් දෙව්පිරිස්හි දහම් දෙසයි. ඔහුට මෙබඳු සිතෙක් වෙයි: පෙර අත්බව මම යම් සස්නෙක බඹසර පිරීම් ද, ඒ මේ ධර්මවිනය කියා යි. මහණෙනි, සමෘති උත්පත්තිය දන්ධ ය. වැලි ඒ සත්ත්ව තෙමේ වහා ම විශෙෂගාමී වෙයි.

මහණෙනි, යම් පරිදි පුරුෂයෙක් සක්හඬෙහි දක්ෂ වූයේ වේ ද, හේ අදන්මගට පිළිපන්නේ සක්හඬ අසයි. සක්හඬ දෝ හෝ සක්හඬ නො වේ දෝ හෝ යි සැකයෙක් හෝ විමතියෙක් හෝ ඔහුට නො වෙයි. වැලිත් සක්හඬෙක් ම ය යි නිශ්චයට යෙයි. මහණෙනි, එපරිදි ම මහණ තෙමේ සුත්ත, ගෙය්‍ය, වෙය්‍යාකරණ, ගාථා, උදාන, ඉතිවුත්තක, ජාතක, අබ්භූතධම්ම, වෙදල්ල යන දහම් පුහුණු කෙරෙයි. ඔහු විසින් ඒ දහම්හු කණින් අසා ධරණ ලද්දාහු වචනයෙන් පුරුදු කරණ ලද්දාහු සිතින් විමසන ලද්දාහු ප්‍රඥායෙන් පසක් කරණ ලද්දාහු වෙත්. හේ සිහි මුළා වූයේ කළුරිය කරන්නේ එක්තරා දෙවනිකායකට එළඹෙයි. එහි සුඛිතව වසන ඔහුට ධර්මපදයෝ නො වටහත්. මහණෙක් ඍද්ධිමත් වූයේ චෙතොවශීප්‍රාප්ත වූයේ දෙව්පිරිස්හි දහම් නො දෙසයි. වැලිත් දෙව්පිණෙක් දෙව්පිරිස්හි දහම් දෙසයි. ඔහුට මෙබඳු සිතෙක් වෙයි: පෙර අත්බව මම යම් සස්නෙක බඹසර පිරීම් ද, මේ ඒ ධර්මවිනය කියා යි. මහණෙනි, සමෘති උත්පත්තිය ගුරු ය. වැලිත් ඒ සත්ත්ව තෙමේ වහා ම විශේෂගාමී වෙයි. කණින් අසා ධරණ ලද වචනයෙන් පුරුදු කරණ ලද සිතින් විමසන ලද නුවණින් අවබොධ කරණ ලද ධර්මයන්ගේ මේ තුන්වන ආනිසංසය කැමැති විය යුතුය.

තවද මහණෙනි, මහණ සුත්ත, ගෙය්‍ය, වෙය්‍යාකරණ, ගාථා, උදාන, ඉතිවුත්තක, ජාතක, අබ්භූතධම්ම, වෙදල්ල යන දහම් පුහුණු කෙරෙයි. ඔහු විසින් ඒ දහම්හු කණින් අසා ධරණ ලද්දාහු වචනයෙන් පුරුදු කරණ ලද්දාහු සිතින් විමසන ලද්දාහු ප්‍රඥායෙන් අවබෝධ කරණ ලද්දාහු වෙත්. හේ සිහි මුළා වූයේ කළුරිය කරන්නේ එක්තරා දේවනිකායකට එළඹෙයි. එහි සුඛිතව වසන ඔහුට ධර්මපදයෝ නො වටහත්. මහණෙක් ඍද්ධිමත් වූයේ චෙතොවශීප්‍රාප්ත වූයේ දෙව් පිරිස්හි දහම් නො දෙසයි. දේවපුත්‍රයෙක් ද දෙව්පිරිස්හි දහම් නො දෙසයි. වැලිත් (පළමු උපන්) ඖපපාතිකයෙක් ඒ (පසුව උපන්) ඖපපාතිකයා සිහිපත් කරවයි: "නිදුකාණෙනි, යම් සස්නෙක පෙර අපි බඹසර වුසුම්හයි නො සිහි කෙරෙහි ද"? හේ මෙසේ කියයි: "නිදුකාණෙනි, සිහි කරමි. නිදුකාණෙනි සිහිකරමි." මහණෙනි, සමෘති උත්පත්තිය දන්ධ ය. වැලිත් ඒ සත්ත්ව තෙමේ වහා ම විශේෂගාමී වෙයි.

සෙය්‍යථාපි භික්ඛවෙ ද්වෙ සහායකා සහපංසුකීළිකා, තෙ කදාචි කරහචි අඤ්ඤමඤ්ඤං සමාගච්ඡෙය්‍යුං, තමෙනං සහායකො සහායකං එවං වදෙය්‍ය: ඉතිපි සම්ම සරසීති. සො එවං වදෙය්‍ය: සරාමි සම්ම. ඉදම්පි සම්ම සරසීති. සො එවං වදෙය්‍ය: සරාමි සම්මාති. එවමෙව ඛො භික්ඛවෙ භික්ඛු ධම්මං පරියාපුණාති: සුත්තං ගෙය්‍යං වෙය්‍යාකරණං ගාථා උදානං ඉතිවුත්තකං ජාතකං අබ්භුතධම්මං වෙදල්ලං. තස්ස තෙ ධම්මා සොතානුධතා හොන්ති වචසා පරිචිතා මනසානුපෙක්ඛිතා දිට්ඨියා සුප්පටිවිද්ධා. සො මුට්ඨස්සති කාලං කුරුමානො අඤ්ඤතරං දෙවනිකායං උප්පජ්ජති. තස්ස තත්ථ සුඛිනො ධම්මපදා පිලපන්ති. තපි භික්ඛු ඉද්ධිමා චෙතොවසිප්පත්තො දෙවපරිසායං ධම්මං දෙසෙති. තපි දෙවපුත්තො දෙවපරිසායං ධම්මං දෙසෙති. අපි ච ඛො ඔපපාතිකො ඔපපාතිකං සාරෙති: සරසි ත්වං මාරිස, යත්ථ මයං පුබ්බෙ බ්‍රහ්මචරියං අචරිම්හාති. සො එවමාහ: සරාමි මාරිසාති. දන්ධො භික්ඛවෙ සතුප්පාදො. අථ සො සත්තො ඛිප්පංයෙව විසෙසගාමී හොති සොතානුධතානං භික්ඛවෙ ධම්මානං වචසා පරිචිතානං මනසානුපෙක්ඛිතානං දිට්ඨියා සුප්පටිවිද්ධානං අයං චතුත්ථො ආනිසංසො පාටිකඞ්ඛො.

සොතානුධතානං භික්ඛවෙ ධම්මානං වචසා පරිචිතානං මනසානුපෙක්ඛිතානං දිට්ඨියා සුප්පටිවිද්ධානං ඉමෙ චත්තාරො ආනිසංසා පාටිකඞ්ඛාති.

### 4. 4. 5. 2.

### [ ඨානසුත්තං ]

42. චත්තාරිමානි භික්ඛවෙ ඨානානි චතූහි ඨානෙහි වෙදිතබ්බානි. කතමානි චත්තාරි?

සංවාසෙන භික්ඛවෙ සීලං වෙදිතබ්බං, තඤ්ච ඛො දීඝෙන අද්ධුනා න ඉත්තරං. මනසිකරොතා නො අමනසිකාරා. පඤ්ඤවතා නො දුප්පඤ්ඤෙන.

සංවොහාරෙන භික්ඛවෙ සොචෙය්‍යං වෙදිතබ්බං. තඤ්ච ඛො දීඝෙන අද්ධුනා න ඉත්තරං, මනසිකරොතා නො අමනසිකාරා. පඤ්ඤවතා නො දුප්පඤ්ඤෙන.

ආපදාසු භික්ඛවෙ ථාමො වෙදිතබ්බො. සො ච ඛො දීඝෙන අද්ධුනා න ඉත්තරං. මනසිකරොතා නො අමනසිකාරා. පඤ්ඤවතා නො දුප්පඤ්ඤෙන.

සාකච්ඡාය භික්ඛවෙ පඤ්ඤා වෙදිතබ්බා. සා ච ඛො දීඝෙන අද්ධුනා න ඉත්තරං. මනසිකරොතා නො අමනසිකාරා. පඤ්ඤවතා නො දුප්පඤ්ඤෙන

මහණෙනි, යම් පරිදි එක්ව පස්කෙළි කෙළිත යහළුවෝ වෙත් නම්, ඔහු යම්ම දිනෙක අතත්මත එකතු වෙත් නම්, යහළුවෙක් ඒ ඉතිරි යහළුවාට මෙසේ කියන්නේ ය: "යහළුව, මෙසේත් සිහි කෙරෙහි ද? යහළුව, මෙයත් සිහි කෙරෙහිදැ" යි. හේ මෙසේ කියයි: 'යහළුව, සිහි කරමි. යහළුව, සිහි කරමි" යි. මහණෙනි, එපරිදි ම මහණ තෙමේ සූත්‍ර, ගෙය්‍ය, වෙය්‍යාකරණ, ගාථා, උදාන, ඉතිවුත්තක, ජාතක, අබ්භූතධම්ම, වෙදල්ල දහම් පුහුණු කෙරෙයි. ඔහු විසින් ඒ දහම්හු කණින් අසා ධරණ ලද්දහු වචනයෙන් පුරුදු කරණ ලද්දහු සිතින් විමසන ලද්දහු ප්‍රඥයෙන් අවබොධ කරණ ලද්දහු වෙත්. හේ සිහි මුළා වූයේ කලුරිය කරන්නේ එක්තරා දෙවනිකායකට එළඹෙයි. එහි සුඛිතව වසන ඔහට ධර්මපදයෝ නො වටහත්. සෘද්ධිමත් වූ චෙතොවශීප්‍රාප්ත වූ රහත්මහණෙක් දෙව්-පිරිස්හි දහම් නො දෙසයි. දෙවපුත්‍රයෙක් හෝ දෙව්පිරිස්හි දහම් නො දෙසයි. වැලිත් ඕපපාතිකයෙක් ඒ ඕපපාතිකයා සිහි කරවයි: "පෙර අත්බව අපි යම් සස්නෙක බඹසර වුසුම්හු ද, යහළුව, ඒ නෝ සිහි කෙරෙහිදැයි. හේ මෙසේ කියයි: "නිදුකාණෙනි, සිහි කරමි" යි. මහණෙනි, සමෘති උත්පාදය දන්ධ ය. වැලිත් ඒ සත්ත්ව වහා විශෙෂගාමී වෙයි. මහණෙනි, කණින් අසා දරණ ලද වචනයෙන් පුරුදු කරණ ලද සිතින් විමසන ලද ප්‍රඥයෙන් අවබොධ කරණ ලද ධර්මයන්ගේ මේ සතරවන ආනිසංසය කැමැති විය යුතු ය.

මහණෙනි, කණින් අසා දරණ ලද වචනයෙන් පුරුදු කරණ ලද, සිතින් විමසන ලද, ප්‍රඥයෙන් අවබොධ කරණ ලද ධර්මයන්ගේ මේ සතර ආනිසංසයෝ කැමැති විය යුත්තාහ,

### 4. 4. 5. 2

### [ ඨාන සූත්‍රය ]

2. මහණෙනි, මේ සතර කරුණු සතර කරුණෙකින් දත යුතුය. කවර සතර කරුණුය යත්:

මහණෙනි, එක්ව විසීමෙන් සීලය දතයුතු යි. හෙ ද දීර්ඝකාලයෙකිනි. මඳකලෙකින් නොවේ. මෙනෙහි කරන්නහු විසින් දත හැකි ය. නො මෙනෙහි කිරීමෙන් නො දත හැකි ය. නුවණැත්තහු මිස නුවණ නැත්තහු විසින් නො දත හැකි ය.

මහණෙනි, සංව්‍යවහාරයෙන් (=සංලාපයෙන්) පිරිසිදු බව දතයුතු ය. එ ද දීර්ඝකාලයෙකිනි. මඳ කලෙකින් නොවේ. මෙනෙහි කරන්නහු විසින් දත හැකිය. නො මෙනෙහි කිරීමෙන් නො දත හැකි ය. නුවණැත්තහු මිස නුවණ නැත්තහු විසින් නො දත හැකි ය.

මහණෙනි, විපත්හිදී ථාමය දතයුතු ය. එ ද දීර්ඝකාලයෙකිනි. මඳ කලෙකින් නොවේ. මෙනෙහි කරන්නහු විසින් දත හැකිය. නො මෙනෙහි කිරීමෙන් නො දත හැකිය. නුවණැත්තහු මිස නුවණ නැත්තහු විසින් නො දත හැකි ය.

මහණෙනි, සාකච්ඡායෙන් ප්‍රඥව දතයුතුය. එ ද දීර්ඝකාලයෙකිනි. මඳ කලෙකින් නොවේ. මෙනෙහි කරන්නහු විසින් දත හැකිය. නොමෙනෙහි කිරීමෙන් නොදත හැකිය. නුවණැත්තහු මිස නුවණ නැත්තහු විසින් නොදත හැකිය.

සංවාසෙන භික්ඛවෙ සීලං වෙදිතබ්බං. තඤ්ච ඛො දීඝෙන අද්ධුනා න ඉත්තරං. මනසිකරොතා නො අමනසිකාරා. පඤ්ඤවතා නො දුප්පඤ්ඤෙනාති ඉති ඛො පනෙතං වුත්තං, කිඤ්චෙතං පටිච්ච වුත්තං?

ඉධ භික්ඛවෙ පුග්ගලො පුග්ගලෙන සද්ධිං වසමානො එවං ජානාති: දීඝරත්තං ඛො අයමායස්මා ඛණ්ඩකාරී ඡිද්දකාරී සබලකාරී කම්මාසකාරී න සන්තතකාරී න සන්තතවුත්ති සීලෙසු. දුස්සීලො අයමායස්මා. නායමායස්මා සීලවාති.

ඉධ පන භික්ඛවෙ පුග්ගලො පුග්ගලෙන සද්ධිං වසමානො එවං ජානාති: දීඝරත්තං ඛො අයමායස්මා අඛණ්ඩකාරී අච්ඡිද්දකාරී අසබලකාරී අකම්මාසකාරී සන්තතකාරී සන්තතවුත්ති සීලෙසු. සීලවා අයමායස්මා. නායමායස්මා දුස්සීලොති.

සංවාසෙන භික්ඛවෙ සීලං වෙදිතබ්බං, තඤ්ච ඛො දීඝෙන අද්ධුනා න ඉත්තරං, මනසිකරොතා නො අමනසිකාරා. පඤ්ඤවතා නො දුප්පඤ්ඤෙනාති ඉති යන්තං වුත්තං, ඉදමෙතං පටිච්ච වුත්තං.

සංවොහාරෙන භික්ඛවෙ සොචෙය්‍යං වෙදිතබ්බං. තඤ්ච ඛො දීඝෙන අද්ධුනා න ඉත්තරං. මනසිකරොතා නො අමනසිකාරා, පඤ්ඤවතා නො දුප්පඤ්ඤෙනාති ඉති ඛො පනෙතං වුත්තං, කිඤ්චෙතං පටිච්ච වුත්තං?

ඉධ භික්ඛවෙ පුග්ගලො පුග්ගලෙන සද්ධිං සංවොහාරමානො එවං ජානාති: අඤ්ඤථා ඛො අයමායස්මා එකෙන එකො වොහරති, අඤ්ඤථා ද්වීහි, අඤ්ඤථා තීහි, අඤ්ඤථා සම්බහුලෙහි. වොක්කමති අයමායස්මා පුරිමවොහාරා පච්ඡිමවොහාරං. අපරිසුද්ධවොහාරො අයමායස්මා, නායමායස්මා පරිසුද්ධවොහාරොති.

ඉධ පන භික්ඛවෙ පුග්ගලො පුග්ගලෙන සද්ධිං සංවොහාරමානො එවං ජානාති: යථෙව ඛො අයමායස්මා එකෙන එකො වොහරති, තථා ද්වීහි, තථා තීහි, තථා සම්බහුලෙහි. නායමායස්මා වොක්කමති පුරිමවොහාරා පච්ඡිමවොහාරං. පරිසුද්ධවොහාරො අයමායස්මා, න අපරිසුද්ධවොහාරොති.

සංවොහාරෙන භික්ඛවෙ සොචෙය්‍යං වෙදිතබ්බං, තඤ්ච ඛො දීඝෙන අද්ධුනා න ඉත්තරං, මනසිකරොතා නො අමනසිකාරා, පඤ්ඤවතා නො දුප්පඤ්ඤෙනාති ඉති යන්තං වුත්තං, ඉදමෙතං පටිච්ච වුත්තං.

මහණෙනි, එක්ව විසීමෙන් ශීලය දතයුතුය. හෙ ද දීර්ඝකාලයෙකිනි. මඳ කලෙකින් නොවේ. මෙනෙහි කරන්නහු විසින් දත හැකිය. නොමෙනෙහි කිරීමෙන් නොදත හැකිය. නුවණැත්තහු මිස නුවණ නැත්තහු විසින් නොදත හැකිය යි මෙසේ තෙල බසෙක් කියන ලද ද, තෙල කුමක් පිණිස කියන ලද ද යත්:

මහණෙනි, මෙලොව පුද්ගලයෙක් අන් පුද්ගලයකු හා එකතුව වසන්නේ මෙසේ දනී: මේ ආයුෂ්මත් දීර්ඝකාලයෙක සිට ශීලයෙහි ඛණ්ඩකාරී ය. ඡිද්‍රකාරී ය ශබලකාරී ය. කල්මාෂකාරී ය, සතතකාරී නොවේ. සතතවෘත්ති නො වේ. මේ ආයුෂ්මත් දුශ්ශීල ය, මේ ආයුෂ්මත් සිල්වත් නො වේ ය යි කියා යි.

මහණෙනි, මෙලොව පුද්ගලයෙක් අන් පුද්ගලයකු හා වසන්නේ මෙසේ දනී: මේ ආයුෂ්මත් දීර්ඝකාලයක සිට ශීලයෙහි අඛණ්ඩකාරී ය, අඡිද්‍රකාරී ය, අශබලකාරී ය, අකල්මාෂකාරී ය, සතතකාරී ය, සතතවෘත්තිය, මේ ආයුෂ්මත් සිල්වත් ය, මේ ආයුෂ්මත් දුශ්ශීල නො වේ.

මහණෙනි, එක්ව විසීමෙන් ශීලය දතයුතුය. එ ද දීර්ඝකාලයෙකිනි. මඳ කලෙකින් නොවේ. මෙනෙහි කරන්නහු විසින් දත හැකිය. නොමෙනෙහි කිරීමෙන් නොදත හැකිය. නුවණැත්තහු මිස නුවණ නැත්තහු විසින් නොදත හැකිය යි මෙසේ යම් බසෙක් කියන ලද ද, මේ බස තෙල පිණිස කියන ලදි.

මහණෙනි, සංව්‍යවහාරයෙන් පිරිසිදුබව දතයුතුය. එ ද දීර්ඝකාලයෙකිනි. මඳ කලෙකින් නො වේ. මෙනෙහි කරන්නහු විසින් දත හැකිය. නොමෙනෙහි කිරීමෙන් නොදත හැකිය. නුවණැත්තහු මිස නුවණ නැත්තහු විසින් නොදත හැකිය යි මෙසේ යම් බසෙක් කියන ලද ද, මෙ බස කුමක් පිණිස කියන ලද ද?

මහණෙනි, මෙලොව පුද්ගලයෙක් පුද්ගලයකු සමග සංව්‍යවහාර කරන්නේ මෙසේ දනී: මේ ආයුෂ්මත් එකලාව සිට අනෙකකු හා අන් සැටියකින් බෙණේ. දෙදෙනකු හා අන් සැටියෙකින් බෙණේ. තුන් දෙනකු හා අන් සැටියෙකින් බෙණේ. බොහෝ දෙනා හා අන් සැටියෙකින් බෙණේ. මේ ආයුෂ්මත් පුරිම ව්‍යවහාරයෙන් පශ්චිම ව්‍යවහාරය පැණ යේ. මේ ආයුෂ්මත් නොපිරිසිදු ව්‍යවහාර ඇත්තෙකි· මේ ආයුෂ්මත් පිරිසිදු ව්‍යවහාර නැත්තෙකැ යි.

මහණෙනි, මෙලොව පුද්ගලයෙක් අන් පුද්ගලයකු හා කථා කරන්නේ මෙසේ දනියි: යම් පරිදි මේ ආයුෂ්මත් එකලාව සිට අනෙකකු හා බෙණේ ද, දෙදෙනකු හාත් තුන් දෙනෙකු හාත් බොහෝ දෙනකු හාත් එසේ ම බෙණේ. මෙ ආයුෂ්මත් පුරිම ව්‍යවහාරයෙන් පශ්චිම ව්‍යවහාරය නො ද ලැගැ යෙයි. මෙ ආයුෂ්මත් පරිශුද්ධ ව්‍යවහාර ඇතියෙකි. මෙ ආයුෂ්මත් අපරිශුද්ධ ව්‍යවහාර ඇතියේ නො වේ ය යි.

මහණෙනි, සංව්‍යවහාරයෙන් ශුචිභාවය දතයුතු ය. එ ද දීර්ඝකාලයෙනිනි. මඳ කලෙකින් නො වේ. මෙනෙහි කරන්නහු විසින් දත හැකිය. නො මෙනෙහි කිරීමෙන් නොදත හැකිය. පැණැතියහු මිස නුවණනැතියහු විසින් නොදත හැකි ය යි මෙසෙයින් යම් මැ බසෙක් කියන ලද නම්, තෙල මෙ පිණිස කියන ලදි.

ආපදසු භික්ඛවෙ ථාමො වෙදිතබ්බො, සො ච ඛො දීඝෙන අද්ධුනා න ඉත්තරං, මනසිකරොතා නො අමනසිකාරා. පඤ්ඤවතා නො දුප්පඤ්ඤෙනාති ඉති ඛො පනෙතං වුත්තං, කිඤ්චෙතං පටිච්ච වුත්තං?

ඉධ භික්ඛවෙ එකච්චො ඤාතිව්‍යසනෙන වා ඵුට්ඨො සමානො භොගව්‍යසනෙන වා ඵුට්ඨො සමානො රොගව්‍යසනෙන වා ඵුට්ඨො සමානො න ඉති පටිසඤ්චික්ඛති: තථාභූතො ඛො අයං ලොකසන්නිවාසො තථාභූතො අත්තභාවපටිලාභො, යථාභූතෙ ලොකසන්නිවාසෙ යථාභූතෙ අත්තභාවපටිලාභෙ අට්ඨ ලොකධම්මා ලොකං අනුපරිවත්තන්ති, ලොකො ච අට්ඨ ලොකධම්මෙ අනුපරිවත්තති: ලාභො ච අලාභො ච අයසො ච යසො ච නින්දා ච පසංසා ච සුඛඤ්ච දුක්ඛඤ්චාති. සො ඤාතිව්‍යසනෙන වා ඵුට්ඨො සමානො භොගව්‍යසනෙන වා ඵුට්ඨො සමානො රොගව්‍යසනෙන වා ඵුට්ඨො සමානො සොචති කිලමති පරිදෙවති උරත්තාළිං කන්දති සම්මොහං ආපජ්ජති. ඉධ පන භික්ඛවෙ එකච්චො ඤාතිව්‍යසනෙන වා ඵුට්ඨො සමානො භොගව්‍යසනෙන වා ඵුට්ඨො සමානො රොගව්‍යසනෙන වා ඵුට්ඨො සමානො ඉති පටිසඤ්චික්ඛති: තථාභූතො ඛො අයං ලොකසන්නිවාසො තථාභූතො අත්තභාවපටිලාභො, යථාභූතෙ ලොකසන්නිවාසෙ යථාභූතෙ අත්තභාවපටිලාභෙ අට්ඨ ලොකධම්මා ලොකං අනුපරිවත්තන්ති, ලොකො ච අට්ඨ ලොකධම්මෙ අනුපරිවත්තති: ලාභො ච අලාභො ච අයසො ච යසො ච නින්දා ච පසංසා ච සුඛඤ්ච දුක්ඛඤ්චාති. සො ඤාතිව්‍යසනෙන වා ඵුට්ඨො සමානො භොගව්‍යසනෙන වා ඵුට්ඨො සමානො රොගව්‍යසනෙන වා ඵුට්ඨො සමානො න සොචති න කිලමති න පරිදෙවති, න උරත්තාළිං කන්දති, න සම්මොහං ආපජ්ජති. ආපදසු භික්ඛවෙ ථාමො වෙදිතබ්බො, සො ච ඛො දීඝෙන අද්ධුනා න ඉත්තරං. මනසිකරොතා නො අමනසිකාරා, පඤ්ඤවතා නො දුප්පඤ්ඤෙනාති ඉති යන්තං වුත්තං ඉදමෙතං පටිච්ච වුත්තං.

සාකච්ඡාය භික්ඛවෙ පඤ්ඤා වෙදිතබ්බා, සා ච ඛො දීඝෙන අද්ධුනා න ඉත්තරං, මනසිකරොතා නො අමනසිකාරා, පඤ්ඤවතා නො දුප්පඤ්ඤෙනාති ඉති ඛො පනෙතං වුත්තං, කිඤ්චෙතං පටිච්ච වුත්තං?

ඉධ භික්ඛවෙ පුග්ගලො පුග්ගලෙන සද්ධිං සාකච්ඡායමානො එවං ජානාති: යථා ඛො ඉමස්ස ආයස්මතො උම්මග්ගො, යථා ච අභිනීහාරො, යථා පඤ්හාසමුදාචාරො, දුප්පඤ්ඤො අයමායස්මා නායමායස්මා පඤ්ඤවා. තං කිස්ස හෙතු: තථා හි අයමායස්මා න චෙව ගම්භීරං අත්ථපදං උදාහරති සන්තං පණීතං අතක්කාවචරං නිපුණං පණ්ඩිතවෙදනීයං, යඤ්ච අයමායස්මා ධම්මං භාසති, තස්ස ච න පටිබලො සඞ්ඛිත්තෙන වා විත්ථාරෙන වා අත්ථං ආචික්ඛිතුං දෙසෙතුං පඤ්ඤාපෙතුං පට්ඨපෙතුං විවරිතුං විභජිතුං උත්තානීකාතුං, දුප්පඤ්ඤො අයමායස්මා නායමායස්මා පඤ්ඤවා.

මහණෙනි, ආපත්හි දී ස්ථාමය දතයුතු ය. එ ද දිගුකලෙකින, මඳ කලෙකින් නොවේ මෙනෙහි කරන්නහු විසින් දතහැකි ය. මෙනෙහි නො කිරීමෙන් නොදත හැකිය. පැණැතියහු විසින් වන්මුත් පැණ නැතියහු විසින් නො දත හැකි ය යි මෙසෙයින් තෙල යමක් කියන ලද නම්, තෙල කුමක් නිසා කියන ලදිය යත්:

මහණෙනි, මෙ ලොව්හි ඇතැමෙක් ඥාතිව්‍යසනයෙන් හෝ පහස්නා-ලදුයේ ම, භොගව්‍යසනයෙන් හෝ පහස්නා ලදුයේ ම, රොගව්‍යසනයෙන් හෝ පහස්නා ලදුයේ මෙසේ නුවණින් කල්පනා නො කෙරෙයි: යම්බඳු වූ ම ලොකසන්නිවාසයෙක්හි යම්බඳු වූ ම ආත්මභාවප්‍රතිලාභයෙක්හි අටලෝදහම්හු ලොව ලුහුබඳනාහු නම්, ලොකයා ද ලාභය, අලාභය, අයසය, යසය, නින්දාය, ප්‍රශංසාය, සුඛය, දුක්ඛයැ යි යන අටලෝදහම් අනුව වැටේ නම්, මේ ලොකසන්නිවාසය එබඳු වෙයි. මෙ ආත්මභාවප්‍රතිලාභය එබඳු වේ ය යි. හෙ ඥාතිව්‍යසනයෙන් වේවයි පහස්නා ලදුයේ ම, භොගව්‍යසනයෙන් වේවයි පහස්නා ලදුයේම, රොගව්‍යසනයෙන් වේවයි පහස්නා ලදුයේ ම ශොක කරයි. ක්ලාන්ත වෙයි. වලප්නේ ය. ලෙහි අත් පැහැර පැහැර හඬනේ ය. සිහි මුළාවට පැමිණෙයි. මහණෙනි, මෙ ලොව්හි ඇතැමෙක් ඥාතිව්‍යසනයෙන් හෝ පහස්නාලදුයේ ම, භොගව්‍යසනයෙන් හෝ පහස්නා ලදුයේ ම රොගව්‍යසනයෙන් හෝ පහස්නා ලදුයේ ම මෙසේ නුවණින් සලකයි: "යම්බඳු ලොකසන්නිවාසයෙක්හි යම්බඳු ආත්මභාවප්‍රතිලාභයෙක්හි ලාභය අලාභය, යසය; අයසය, නින්දාය, ප්‍රශංසාය, සුඛය, දුක්ඛය යන අෂ්ටලොක ධර්මයෝ ලොව ලුහුබඳනාහු නම්, ලොකයාත් අටලෝදම් අනුව වැටේ නම්, ලොකසන්නිවාසය එබඳු වූයෙක. මේ ආත්මභාවප්‍රතිලාභයත් එබඳු වූයෙකැ" යි. හේ ඥාතිව්‍යසනයෙන් හෝ පහස්නා ලදුයේ ම භොගව්‍යසන-යෙන් හෝ පහස්නා ලදුයේ ම රොගව්‍යසනයෙන් හෝ පහස්නා ලදුයේ ම ශොක නො කරයි, ක්ලාන්ත නො වෙයි, නො වලප්නේ ය. ලෙහි අත් පැහැර නො හඬනේ ය. සිහි මුළාවට නො යෙයි. මහණෙනි, "ආපද්හි දී ස්ථාමය දතයුතු ය. එ ද වනාහි දීර්ඝකාලයෙකින. මඳ කලෙකින් නො වේ. මෙනෙහි කරන්නහු විසින් දත හැකිය. නොමෙනෙහි කිරීමෙන් නො දත හැකිය. නුවණැතියහු විසින් වන්මුත් නුවණනැතියහු විසින් නො දත හැකියැ" යි මෙසෙයින් යමක් කියන ලද නම්, මෙය තෙල කාරණ සඳහා කියන ලදී.

මහණෙනි, සාකච්ඡායෙන් ප්‍රඥාව දතයුතු. එ ද වනාහි දිගුකලෙකින. මඳ කලෙකින් නො වේ. මෙනෙහි කරන්නහු විසින් දත හැක. නොමෙනෙහි කිරීමෙන් නො දත හැකිය. පැණවත්හු විසින් වන්මුත් නොපැණවත්හු විසින් නො දත හැකි ය යි මෙසෙයින් තෙල යමක් කියන ලද නම්, තෙල කුමක් පිණිස කියන ලදිය යත්:

මහණෙනි, මෙ ලොව්හි පුද්ගලයෙක් පුද්ගලයකු හා සාකච්ඡා කරණුයේ මෙසේ දන්නේ ය: මෙ ආයුෂ්මත්හුගේ (පැන පිළිබඳ) උන්මාගීය යම්බඳු වේ නම් ප්‍රශ්නාභිනීහාරය යම්බඳු වේ නම් ප්‍රශ්නපෘච්ඡාව යම්බඳු වේ නම් (එහයින්) මෙ ආයුෂ්මත් දුෂ්ප්‍රාඥ වෙයි. මෙ ආයුෂ්මත් ප්‍රඥාවත් නො වෙයි. ඒ කවර හෙයින යත්: යම් පරිදි මේ ආයුෂ්මත් ශාන්ත වූ, ප්‍රණීත වූ, අතර්කාවචර වූ, නිපුණ වූ පණ්ඩිතයන් විසින් දතයුතු වූ ගම්භීර වූ අර්ථපදයකුදු නො කියා නම්, මෙ ආයුෂ්මත් යම් දහමකුදු දෙසා නම් එ ධර්මයාගේ ද සංක්ෂිප්ත විසින් වේවයි විස්තරවිසින් වේවයි අර්ථය කියන්නට, දෙසන්නට පණවන්නට එළවන්නට විවෘත කරණුවට බෙදනුවට අරුත් පැහැදිලි කරණුවට නො ද පටිබලවේ නම්, එසෙයින් ම මෙ ආයුෂ්මත් දුෂ්ප්‍රාඥය, මෙ ආයුෂ්මත් ප්‍රඥාවත් නො වේ.

සෙය්‍යථාපි භික්ඛවෙ චක්ඛුමා පුරිසො උදකරහදස්ස තීරෙ ඨිතො පස්සෙය්‍ය පරිත්තං මච්ඡං උම්මුජ්ජමානං, තස්ස එවමස්ස: යථා ඛො ඉමස්ස මච්ඡස්ස උම්මග්ගො යථා ච ඌමිඝාතො යථා ච වෙගායිතත්තං, පරිත්තො අයං මච්ඡො, නායං මච්ඡො මහන්තොති. එවමෙව ඛො භික්ඛවෙ පුග්ගලො පුග්ගලෙන සද්ධිං සාකච්ඡායමානො එවං ජානාති: යථා ඛො ඉමස්ස ආයස්මතො උම්මග්ගො යථා ච අභිනීහාරො යථා ච පඤ්හසමුදාචාරො, දුප්පඤ්ඤො අයමායස්මා, නායමායස්මා පඤ්ඤවා. තං කිස්ස හෙතු: තථා හි අයමායස්මා න චෙව ගම්භීරං අත්ථපදං උදාහරති සන්තං පණීතං අතක්කාවචරං නිපුණං පණ්ඩිතවෙදනීයං. යඤ්ච අයමායස්මා ධම්මං භාසති, තස්ස න පටිබලො සඞ්ඛිත්තෙන වා විත්ථාරෙන වා අත්ථං ආචික්ඛිතුං දෙසෙතුං පඤ්ඤපෙතුං පට්ඨපෙතුං විවරිතුං විභජිතුං උත්තානීකාතුං. දුප්පඤ්ඤො අයමායස්මා, නායමායස්මා පඤ්ඤවාති.

ඉධ භික්ඛවෙ පුග්ගලො පුග්ගලෙන සද්ධිං සාකච්ඡායමානො එවං ජානාති: යථා ඛො ඉමස්ස ආයස්මතො උම්මග්ගො යථා ච අභිනීහාරො යථා ච පඤ්හසමුදාචාරො, පඤ්ඤවා අයමායස්මා, නායමායස්මා දුප්පඤ්ඤො. තං කිස්ස හෙතු: තථා හි අයමායස්මා ගම්භීරං චෙව අත්ථපදං උදාහරති සන්තං පණීතං අතක්කාවචරං නිපුණං පණ්ඩිතවෙදනීයං, යඤ්ච අයමායස්මා ධම්මං භාසති, තස්ස ච පටිබලො සඞ්ඛිත්තෙන වා විත්ථාරෙන වා අත්ථං ආචික්ඛිතුං. දෙසෙතුං පඤ්ඤපෙතුං පට්ඨපෙතුං විවරිතුං විභජිතුං උත්තානීකාතුං, පඤ්ඤවා අයමායස්මා, නායමායස්මා දුප්පඤ්ඤො

සෙය්‍යථාපි භික්ඛවෙ පුරිසො උදකරහදස්ස තීරෙ ඨිතො පස්සෙය්‍ය මහන්තං මච්ඡං උම්මුජ්ජමානං, තස්ස එවමස්ස: යථා ඛො ඉමස්ස මච්ඡස්ස උම්මග්ගො යථා ච ඌමිඝාතො යථා ච වෙගායිතත්තං, මහන්තො අයං මච්ඡො, නායං මච්ඡො පරිත්තොති. එවමෙව ඛො භික්ඛවෙ පුග්ගලො පුග්ගලෙන සද්ධිං සාකච්ඡායමානො එවං ජානාති: යථා ඛො ඉමස්ස ආයස්මතො උම්මග්ගො යථා ච අභිනීහාරො යථා ච පඤ්හසමුදාචාරො, පඤ්ඤවා අයමායස්මා, නායමායස්මා දුප්පඤ්ඤො තං කිස්ස හෙතු: තථා හි අයමායස්මා ගම්භීරං චෙව අත්ථපදං උදාහරති සන්තං පණීතං අතක්කාවචරං නිපුණං පණ්ඩිත-වෙදනීයං, යං ච අයමායස්මා ධම්මං භාසති, තස්ස ච පටිබලො සඞ්ඛිත්තෙන වා විත්ථාරෙන වා අත්ථං ආචික්ඛිතුං දෙසෙතුං පඤ්ඤපෙතුං පට්ඨපෙතුං විවරිතුං විභජිතුං උත්තානීකාතුං. පඤ්ඤවා අයමායස්මා, නායමායස්මා දුප්පඤ්ඤොති සාකච්ඡාය භික්ඛවෙ පඤ්ඤා වෙදිතබ්බා. සා ච ඛො දීඝෙන අද්ධුනා න ඉත්තරං, මනසිකරොතා නො අමනසිකාරා, පඤ්ඤවතා නො දුප්පඤ්ඤෙනාති ඉති යන්තං වුත්තං, ඉදමෙතං පටිච්ච වුත්තං

ඉමානි ඛො භික්ඛවෙ චත්තාරි ඨානානි, ඉමෙහි චතූහි ඨානෙහි වෙදිතබ්බානීති.

මහණෙනි, යම් පරිදි චක්ෂුෂ්මත් පුරුෂයෙක් දියවිල් තෙරෙක සිටියේ දිය බිඳ නගින කුඩමසකු දක්නේ නම්, ඔහට මෙබඳු සිතෙක් වෙයි: "මෙ මස්හුගේ උන්මාගීයත් යම් පරිදි වේ නම්, ඌර්මිඝාතයත් යම් පරිදි වේ නම්, යම් පරිදි වෙගාසිතබවෙකුදු වේ නම්, එපරිද්දෙන් මෙ කුඩාමසෙක, මෙ මස් මහත් නොවේ ය" යි. මහණෙනි, එපරිද්දෙන් ම පුද්ගලයෙක් පුද්ගලයකු හා සාකච්ඡා කරණුයේ මෙසේ දැනගන්නේ ය: මෙ ආයුෂ්මත්හුගේ උන්මාගීය යම්බඳු වේ නම්, ප්‍රශ්නාභිනීහාරයත් යම්බඳු වේ නම්, ප්‍රශ්නසමුදාචාරයත් යම්බඳු වේ නම්, (එපරිද්දෙන්) මෙ ආයුෂ්මත් දුෂ්ප්‍රාඥය, මෙ ආයුෂ්මත් ප්‍රඥාවත් නො වෙයි. ඒ කවර හෙයින යත්: මෙ ආයුෂ්මත් ශාන්ත, ප්‍රණීත, අතර්කාවචර, නිපුණ, පණ්ඩිතවෙදනීය ගම්භිරාර්ථපදත් නො කියන්නේ ය. මෙ ආයුෂ්මත් යම් ධර්මයක් කියා නම්, එ ධර්මයාගේ අර්ථය සංක්ෂිප්ත විසින් හෝ විස්තර විසින් හෝ කියන්නට දෙසන්නට පණවන්නට එළවන්නට විවරණ කරන්නට බෙදන්නට උත්තානීකරන්නට ප්‍රතිබල නොවේ. එහෙයින් ම මෙ ආයුෂ්මත් දුෂ්ප්‍රාඥය, මෙ ආයුෂ්මත් ප්‍රඥාවත් නොවේය" යි.

මහණෙනි, මෙ ලොවැති පුද්ගලයෙක් පුද්ගලයකු හා සාකච්ඡා කරණුයේ මෙසේ දැනගන්නේ ය: "මෙ ආයුෂ්මත්හුගේ උන්මාගීය යම්බඳු වේ නම්, අභිනීහාරයත් යම්බඳු වේ නම්, ප්‍රශ්න ව්‍යවහාරයත් යම්බඳු වේ නම්, එපරිද්-දෙන් මෙ ආයුෂ්මත් ප්‍රඥාවත්ය, මෙ ආයුෂ්මත් දුෂ්ප්‍රාඥ නො වේ. එ කවර හෙයින යත්: මේ ආයුෂ්මත් ශාන්ත වූ ප්‍රණීත වූ අතර්කාවචර වූ නිපුණ වූ පණ්ඩිත වෙදනීය වූ ගම්භීරාර්ථපද උදාහරණ කරණේ ය. මෙ ආයුෂ්මත් යම් ධර්මයක් දෙසා නම්, එ ධර්මයාගේ අර්ථය ද සංක්ෂිප්ත වශයෙන් හෝ විස්තර වශයෙන් හෝ කියන්නට දෙසන්නට පණවන්නට එළවන්නට උත්තානී කරණට ප්‍රතිබල වෙයි. මෙ ආයුෂ්මත් ප්‍රඥාවත්ය, මේ ආයුෂ්මත් දුෂ්ප්‍රාඥ නොවේ"යි.

මහණෙනි, යම් පරිදි චක්ෂුෂ්මත් පුරුෂයෙක් දියවිල් හිඹුරෙක්හි හිටියේ දිය බිඳ මතුවන මහමසකු දක්නේවේ ද, ඔහට මෙබඳු සිතෙක් වෙයි: මෙමස්හුගේ උන්මාගීය යම්බඳු වේ නම්, ඌර්මිඝාතයත් යම්බඳු වේ නම්, වෙගසිතබවයත් යම්බඳු වේ නම් එපරිදි මේ මස් මහත් වෙයි. මෙ කුඩා මසෙක් නොවන්නේ යයි. මහණෙනි, එසෙයින් පුද්ගලයෙක් පුද්ගලයකු හා සාකච්ඡා කරණුයේ මෙසේ දැනගන්නේ ය: "මෙ ආයුෂ්මත්හුගේ උන්මාගීය යම්බඳු වේ ද, අභිනීහාරයත් යම්බඳු වේ ද, ප්‍රශ්න සමුදාචාරයත් යම්බඳු වේ ද, (එලෙසින්) මෙ ආයුෂ්මත් ප්‍රඥාවත්ය, මෙ ආයුෂ්මත් දුෂ්ප්‍රාඥ නො වේ. ඒ කවර හෙයින යත්: යම් පරිද්දෙකින් මෙ ආයුෂ්මත් ශාන්ත වූ ප්‍රණීත වූ අතර්කාවචර වූ නිපුණ වූ පණ්ඩිත වෙදනීය වූ ගම්භීර වූ අර්ථපදත් උදාහරණ කරයි මෙ ආයුෂ්මත් යම් ධර්මයක් දෙසා නම්, එ ධර්මයාගේ අර්ථය සංක්ෂෙපයෙන් හෝ විස්තර විසින් හෝ කියනුවට දෙසනුවට පණවනුවට එළවනුවට විවෘත කරණුවට බෙදනුවට උත්තානී කරණයට ප්‍රතිබල වෙයි. එසෙයින් මේ ආයුෂ්මත් ප්‍රඥාවත්ය, මෙ ආයුෂ්මත් දුෂ්ප්‍රාඥ නො වේ"යි. මහණෙනි, සාකච්ඡායෙන් ප්‍රඥාව දතයුතුය. එ ද වනාහි දිගුකලෙකින. මඳ කලෙකින් නො වේ මෙනෙහි කරන්නහු විසින් දත හැකිය මෙනෙහි කරන්නහු විසින් වත් මුත් නොමෙනෙහි කිරීමෙන් නො දත හැකිය. ප්‍රඥාවත්හු විසින් වත්මුත් ප්‍රඥනැත්තහු විසින් නො දත හැකිය. මෙසෙයින් යමක් කියන ලද නම්, තෙල මෙ පිණිස කියන ලදි.

මහණෙනි, මෙ සතර කරුණු මෙකරුණු සතරින් දතයුතු යි.

ඨාන සූත්‍රය දෙවැනි යි.

## 4. 4. 5. 3

### [භද්දියසුත්තං]

43. එකං සමයං භගවා වෙසාලියං විහරති මහාවනෙ කූටාගාරසාලායං. අථ ඛො භද්දියො ලිච්ඡවි යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නො ඛො භද්දියො ලිච්ඡවි භගවන්තං එතදවොච:

සුතං මෙතං භන්තෙ: මායාවී සමණො ගොතමො ආවට්ටනිමායං[1] ජානාති, යාය අඤ්ඤතිත්ථියානං සාවකෙ ආවට්ටෙතීති. යෙ තෙ භන්තෙ එවමාහංසු: "මායාවී සමණො ගොතමො ආවට්ටනිමායං ජානාති, යාය අඤ්ඤතිත්ථියානං සාවකෙ ආවට්ටෙතී"ති. කච්චි තෙ භන්තෙ භගවතො වුත්තවාදිනො, න ච භගවන්තං අභූතෙන අබ්භාචික්ඛන්ති, ධම්මස්ස චානුධම්මං බ්‍යාකරොන්ති, න ච කොචි සහධම්මිකො වාදානුපාතො ගාරය්හං ඨානං ආගච්ඡති? අනබ්භක්ඛාතුකාමා හි මයං භන්තෙ භගවන්තන්ති.

එථ තුම්හෙ භද්දිය, මා අනුස්සවෙන, මා පරම්පරාය, මා ඉතිකිරාය, මා පිටකසම්පදානෙන, මා තක්කහෙතු, මා නයහෙතු, මා ආකාරපරිවිතක්කෙන, මා දිට්ඨිනිජ්ඣානක්ඛන්තියා, මා භබ්බරූපතාය, මා සමණො නො ගරූති. යදා තුම්හෙ භද්දිය අත්තනාව ජානෙය්‍යාථ, ඉමෙ ධම්මා අකුසලා, ඉමෙ ධම්මා සාවජ්ජා, ඉමෙ ධම්මා විඤ්ඤුගරහිතා, ඉමෙ ධම්මා සමත්තා සමාදින්නා අහිතාය දුක්ඛාය සංවත්තන්තීති. අථ තුම්හෙ භද්දිය පජහෙය්‍යාථ

තං කිං මඤ්ඤථ භද්දිය, ලොභො පුරිසස්ස අජ්ඣත්තං උප්පජ්ජමානො උප්පජ්ජති හිතාය වා අහිතාය වාති? අහිතාය භන්තෙ. ලුද්ධො පනායං භද්දිය, පුරිසපුග්ගලො ලොභෙන අභිභූතො පරියාදින්නචිත්තො පාණම්පි හනති, අදින්නම්පි ආදියති, පරදාරම්පි ගච්ඡති, මුසාපි භණති, පරම්පි තථත්තාය සමාදපෙති. යං ස හොති දීඝරත්තං අහිතාය දුක්ඛායාති? එවං භන්තෙ.

තං කිං මඤ්ඤථ භද්දිය, දොසො පුරිසස්ස -පෙ- මොහො පුරිසස්ස -පෙ- සාරම්භො පුරිසස්ස අජ්ඣත්තං උප්පජ්ජමානො උප්පජ්ජති හිතාය වා අහිතාය වාති? "අහිතාය භන්තෙ." සාරම්භො පනායං භද්දිය, පුරිසපුග්ගලො සාරම්භෙන අභිභූතො පරියාදින්නචිත්තො පාණම්පි හනති, අදින්නම්පි ආදියති, පරදාරම්පි ගච්ඡති, මුසාපි භණති, පරම්පි තථත්තාය සමාදපෙති. යං ස හොති දීඝරත්තං අහිතාය දුක්ඛායාති? එවං භන්තෙ.

1 ආවට්ටනිං මායං - මජසං.

## 4. 4 5. 3.

## [ භද්දිය සූත්‍රය ]

43. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ **වෛශාලියෙහි මහාවනයෙහි** වූ **කූටාගාර** ශාලාවෙහි වැඩ වසන සේක. එකල්හි භද්දිය ලිච්ඡවි භාග්‍යවතුන් වහන්සේ කරා එළඹියේ ය. එළඹ භාග්‍යවතුන් වහන්සේ සකසා වැඳ එකත්පස්ව හිඳ. එකත්පස්ව හුන් භද්දිය ලිච්ඡවි භාග්‍යවතුන් වහන්සේට තෙල සැළ කෙළේ ය:

වහන්ස, මායාවී ශ්‍රමණභවත් ගෞතමයෝ යම් මායායෙකින් අන්‍යතීර්ථක-යන්ගේ ශ්‍රාවකයන් ආවර්තනය කරත් නම්, එබඳු ආවර්තනීමායාවක් දන්නාහ''යි යන තෙල කරුණ මා විසින් අසන ලද. වහන්ස, යම් ම කෙනෙක් ''මායාවී ශ්‍රමණ භවත් ගෞතමයෝ යම් මායායෙකින් අන්‍යතීර්ථකයන්ගේ ශ්‍රාවකයන් ආවර්තනය කරත් නම්, එබඳු ආවර්තනීමායාවක් දන්නාහයි'' මෙසේ කීහු නම්, වහන්ස, කිම, ඔහු භාග්‍යවතුන් වහන්සේ විසින් වදාරණ ලද දෑ කියන්නාහු ද, භාග්‍යවතුන් වහන්සේට අභූතයෙන් අභ්‍යාඛ්‍යාන නො කරන්නාහු ද, ධර්මයට අනුකාරණයක් පවසන්නාහු ද, කිසි වාදානුවාදයෙක් කරුණු සහිත වූයේ විඥයන් විසින් ගැරහිය යුතු කරුණකට නො ද ඒ ද? වහන්ස, අපි භාග්‍යවතුන් වහන්සේට අභ්‍යාඛ්‍යාන නොකරනු කැමැතියම්හ''යි.

භද්දියෙනි, තෙපි එව, අනුශ්‍රව කථායෙනුදු මාගේ කථාව නහමක් ගණුව, පරම්පර කථායෙනුදු නහමක් ගණුව, ''තෙල මෙසේ වීලැ''යි ද නහමක් ගණුව, අපගේ පෙළ හා යෙදෙතී ද නහමක් ගණුව, තර්කග්‍රාහයෙනුදු නහමක් ගණුව, නයග්‍රාහයෙනුදු නහමක් ගණුව, ආකාර පරිවිතර්කයෙනුදු නහමක් ගණුව, අප සිතා ඉවසා ගත් දෘෂ්ටිය හා සැසැඳෙතැයි ද නහමක් ගණුව, (මෙතෙම් පූජ්‍යයෙකැයි) භව්‍ය රූපතායෙනුදු නහමක් ගණුව, 'මෙ මහණ අපට ගුරුහ'යි ද නහමක් ගණුව. භද්දියයෙනි, 'මෙ දහම්හු අකුසල්හ. මෙ දහම්හු වරද සහිතයහ. මෙ දහම්හු නුවණැත්තන් විසින් ගර්හිතයහ. මෙ දහම්හු සපුරණ ලද්දාහු සමාදන් කොට ගන්නා ලද්දාහු අහිත පිණිස, දුක් පිණිස, පවත්නාහ' යි තෙපි යම් කලෙක තුමූ ම දන්නහු නම්, භද්දියෙනි, එකල්හි තෙපි එය දුරු කරව.

භද්දියෙනි, 'එ කිමැ'යි සිතවු ද? ලෝභය පුරුෂයාගේ සිත තුළ උප-දනුයේ ඔහුට හිත පිණිස හෝ අහිත පිණිස උපදනේ දැ?යි, ඇසූසේක. වහන්ස, අහිත පිණිස වේය'යි කීය. භද්දියෙනි, ලුබ්ධ වූ මෙ පුරුෂ පුද්ගල ලෝභයෙන් මඩනා ලදුයේ ලෝභයෙන් ගන්නාලද සිත් ඇතියේ යමක් ඔහට බොහෝ කලක් අවැඩ පිණිස, දුක් පිණිස වේ නම්, එබඳු පණිවා ද කෙරෙයි, අයිනාදන් ද ගණී, පරඹුන් කරා ද යේ, මුසවා ද බෙණේ, මෙරමාත් එබව පිණිස සමාදන් කරවයි? එසේය, වහන්සැ යි.

භද්දියෙනි, 'එකිමැ'යි හඟිවු ද? ද්වේෂය පුරුෂයාගේ .. මෝහය පුරුෂයාගේ .... සාරම්භය පුරුෂයාගේ සිත තුළ උපදනුයේ හිත පිණිස හෝ අහිත පිණිස හෝ උපදනේ දැ? යි. වහන්ස, අහිත පිණිස වේ යයි භද්දියෙනි, සාරම්භයෙන් යුත් මෙ පුරුෂ පුද්ගල සාරම්භයෙන් මඩනා ලදුයේ (සාරම්භයෙන්) ගන්නාලද සිත් ඇතියේ යමක් ඔහට දීර්ඝරාත්‍රයෙහි අහිත පිණිස, දුක් පිණිස වේ නම්, එබඳු පණිවා ද කෙරේ. අයිනාදන් ද ගණී, පරඹුන් කරා ද යේ. මුසවා ද බෙණේ. මෙරමාත් එබව පිණිස සමාදන් කරවයිද? වහන්ස, එසේය.

තං කිං මඤ්ඤථ භද්දිය, ඉමෙ ධම්මා කුසලා වා අකුසලා වාති? "අකුසලා භන්තෙ." සාවජ්ජා වා අනවජ්ජා වාති? "සාවජ්ජා භන්තෙ." විඤ්ඤුගරහිතා වා විඤ්ඤුප්පසත්ථා වාති? "විඤ්ඤුගරහිතා භන්තෙ." සමත්තා සමාදින්නා අහිතාය දුක්ඛාය සංවත්තන්ති, නො වා කථං වා එත්ථ හොතීති? "සමත්තා භන්තෙ සමාදින්නා අහිතාය දුක්ඛාය සංවත්තන්ති. එවං නො එත්ථ හොතී"ති.

ඉති ඛො භද්දිය, යං තං අවොචුම්හ: එථ තුම්හෙ භද්දිය, මා අනුස්සවෙන මා පරම්පරාය, මා ඉතිකිරාය, -පෙ- ඉමෙ ධම්මා අකුසලා ඉමෙ ධම්මා සාවජ්ජා ඉමෙ ධම්මා විඤ්ඤුගරහිතා ඉමෙ ධම්මා සමත්තා සමාදින්නා අහිතාය දුක්ඛාය සංවත්තන්ති. අථ තුම්හෙ භද්දිය, පජහෙය්‍යාථාති ඉති යන්තං වුත්තං, ඉදමෙතං පටිච්ච වුත්තං.

එථ තුම්හෙ භද්දිය, මා අනුස්සවෙන මා පරම්පරාය මා ඉතිකිරාය මා පිටකසම්පදානෙන මා තක්කහෙතු මා නයහෙතු මා ආකාරපරිවිතක්කෙන මා දිට්ඨිනිජ්ඣානක්ඛන්තියා මා භබ්බරූපතාය මා සමණො නො ගරූති. යදා තුම්හෙ භද්දිය, අත්තනාව ජානෙය්‍යාථ: ඉමෙ ධම්මා කුසලා, ඉමෙ ධම්මා අනවජ්ජා, ඉමෙ ධම්මා විඤ්ඤුප්පසත්ථා, ඉමෙ ධම්මා සමත්තා සමාදින්නා හිතාය සුඛාය සංවත්තන්තීති අථ තුම්හෙ භද්දිය, උපසම්පජ්ජ විහරෙය්‍යාථ.

තං කිං මඤ්ඤථ භද්දිය,. අලොභො පුරිසස්ස අජ්ඣත්තං උප්පජ්ජමානො උප්පජ්ජති හිතාය වා අහිතාය වාති ? "හිතාය භන්තෙ." අලුද්ධො පනායං භද්දිය, පුරිසපුග්ගලො ලොභෙන අනභිභූතො අපරියාදින්නචිත්තො නෙව පාණං හනති. න අදින්නං ආදියති. න පරදාරං ගච්ඡති. න මුසා භණති. පරම්පි තථත්තාය සමාදපෙති. යං ස හොති දීඝරත්තං හිතාය සුඛායාති? "එවං භන්තෙ."

තං කිං මඤ්ඤථ භද්දිය, අදොසො පුරිසස්ස -පෙ- අමොහො පුරිසස්ස -පෙ- අසාරම්භො පුරිසස්ස අජ්ඣත්තං උප්පජ්ජමානො උප්පජ්ජති හිතාය වා අහිතාය වාති? "හිතාය භන්තෙ." අසාරම්භො පනායං භද්දිය, පුරිස-පුග්ගලො සාරම්භෙන අනභිභූතො අපරියාදින්නචිත්තො නෙව පාණං හනති. න අදින්නං ආදියති. න පරදාරං ගච්ඡති. න මුසා භණති. පරම්පි තථත්තාය සමාදපෙති. යං ස හොති දීඝරත්තං හිතාය සුඛාය සංවත්තතීති. ? "එවම්භන්තෙ"

භද්දියයෙනි, එ කිමැ'යි සිතවු ද, මෙදහම්හු කුසල් හෝ අකුසල් වෙත් ද? වහන්ස, අකුසල්හ යි. සාවද්‍ය හෝ වෙත්ද, අනවද්‍ය හෝ වෙත් දැයි? වහන්ස, සාවද්‍යයහ යි. නුවණැත්තන් විසින් ගර්හිත වෙත් ද, විඥයන් විසින් ප්‍රශස්ත වෙත් දැ යි? වහන්ස, විඥයන් විසින් ගර්හිතයහ යි. පිරිපුන් කොට ගත්තා ලද්දාහු සමාදන් කොට ගත්තා ලද්දාහු අහිත පිණිස දුක් පිණිස පවතිත් ද? නොහොත් නො පවතිත් ද? මෙහිලා තොපට කෙසේ අදහස් වේ ද? වහන්ස, පිරිපුන් කොට ගත්තා ලද්දාහු සමාදන් කොට ගත්තා ලද්දාහු අහිත පිණිස, දුක් පිණිස පවත්නාහ. මෙහිලා අපට මෙසේ අදහස් වේය යි.

භද්දියයෙනි, යම් ඒ බසක් කීමෝ ද, ''භද්දියෙනි, තෙපි එව, අනුශ්‍රවකථායෙනුදු නහමක් ගණුව, පරම්පරා කථායෙනුදු නහමක් ගණුව, තෙල මෙසේ වීලැයි ද නො ගණුව ... මෙ දහම්හු අකුසල්හ, මෙ දහම්හු සාවද්‍යයහ, මෙ දහම්හු විඥයන් විසින් ගර්හිතයහ, මෙ දහම්හු පිරිපුන් කොට ගත්තා ලද්දාහු සමාදන් කොට ගත්තා ලද්දාහු අහිත පිණිස, දුක් පිණිස පවත්නාහු නම්, භද්දියෙනි, එකල්හි තෙපි එය දුරු කරව''යි, මෙසේ යමක් කියන ලද නම්, තෙල මේ පිණිස කියන ලදි.

භද්දියයෙනි, තෙපි එව, අනුශ්‍රවකථායෙනුදු නහමක් ගණුව, පරම්පරා කථායෙනුදු නහමක් ගණුව 'මෙසේ වීලැ'යි ද නහමක් ගණුව, අපගේ පෙළ හා යෙදේති'යි ද නහමක් ගණුව, තර්කග්‍රාහයෙනුදු නහමක් ගණුව, නයග්‍රාහයෙනුදු නහමක් ගණුව, ආකාරපරිවිතර්කයෙනුදු නහමක් ගණුව, අප සිතා ඉවසා ගත් දෘෂ්ටිය හා සැසැඳෙතැ'යි ද නහමක් ගණුව, භව්‍ය රූපතායෙනුදු නහමක් ගණුව. මෙ මහණ අපට ගුරුහ'යි නහමක් ගණුව. භද්දියයෙනි, යම් කලෙක තෙපි ''මෙ දහම්හු කුසල්හ, මෙ දහම්හු අනවද්‍යයහ, මෙ දහම්හු නුවණැතියන් විසින් පසස්නා ලදහ, මෙ දහම්හු මොනොවට ගත්තා ලද්දාහු මොනොවට සමාදන් කොට ගත්තා ලද්දාහු හිතයට සුවයට වැටෙති''යි තුමූ ම දන්නහු ද, භද්දියය, එ සඳ තෙපි එ දහම් උපයා වසව.

භද්දියය, එ කිමැයි සිතවු ද? අලෝභය පුරුෂයා සිත උපදනේ හිත පිණිස හෝ අහිත පිණිස හෝ උපදනේ වේ ද? වහන්ස, හිත පිණිස උපදනේ ය. භද්දිය ය, අලුබ්ධ වූ මේ පුරුෂපුද්ගල ලෝභයෙන් නො මඩනා ලදුයේ නොගත් සිතැතියේ පරපණ නො නස්නේ වේ ද, අයිනාදන් නො ගන්නේ වේ ද, විරඹු කරා නො යන්නේ වේ ද, මුසවා නො බණන්නේ වේ ද, යම් ක්‍රියායෙක් ඔහට දීර්ඝරාත්‍රයෙහි හිතයට සුවයට වැටේ ද, එ බව පිණිස මෙරමාත් සමාදන් කරවන්නේ වේ ද? වහන්ස, එසේ ය.

භද්දියය, එ කුමැයි හඟිවු ද? අද්වේෂය පුරුෂයා සිත .... අමෝහය පුරුෂයා සිත... අසාරම්භය පුරුෂයා සිත උපදනේ හිත පිණිස හෝ අහිත පිණිස හෝ උපදනේ වේ ද? වහන්ස, හිත පිණිස ය. භද්දියය, සාරම්භ රහිත මේ පුරුෂ පුද්ගල සාරම්භයා විසින් නො මඩනා ලදුයේ නොගත් සිතැතියේ පරපණ නො නස්නේ වේ ද, අයිනාදන් නො ගන්නේ වේ ද, විරඹු කරා නොයන්නේ වේ ද, මුසවා නො බණන්නේ වේ ද, යම් ක්‍රියායෙක් ඔහට දීර්ඝරාත්‍රයෙහි හිතයට සුවයට වැටේ ද, එ බව පිණිස මෙරමාත් සමාදන් කරවන්නේ වේ ද? වහන්ස, එසේය.

තං කිං මඤ්ඤථ භද්දිය, ඉමෙ ධම්මා කුසලා වා අකුසලා වාති? "කුසලා භන්තෙ" සාවජ්ජා වා අනවජ්ජා වාති? අනවජ්ජා භන්තෙ. විඤ්ඤුගරහිතා වා විඤ්ඤුප්පසත්ථා වාති? "විඤ්ඤුප්පසත්ථා භන්තෙ" සමත්තා සමාදින්නා හිතාය සුඛාය සංවත්තන්ති, නො වා කථං වා එත්ථ හොතීති? සමත්තා භන්තෙ සමාදින්නා හිතාය සුඛාය සංවත්තන්ති. එවං නො එත්ථ හොතී"ති.

ඉති ඛො භද්දිය, යං තං අවොචුම්හ "එථ තුම්හෙ භද්දිය, මා අනුස්සවෙන මා පරම්පරාය මා ඉතිකිරාය මා පිටකසම්පදානෙන මා තක්කහෙතු මා නයහෙතු මා ආකාරපරිවිතක්කෙන මා දිට්ඨිනිජ්ඣානක්ඛන්තියා මා භබ්බරූපතාය මා සමණො නො ගරූති." යදා තුම්හෙ භද්දිය, "අත්තනාව ජානෙය්‍යාථ ඉමෙ ධම්මා අනවජ්ජා ඉමෙ ධම්මා විඤ්ඤුප්පසත්ථා ඉමෙ ධම්මා සමත්තා සමාදින්නා හිතාය සුඛාය සංවත්තන්තීති". අථ තුම්හෙ භද්දිය, උපසම්පජ්ජ විහරෙය්‍යාථා"ති ඉති යං තං වුත්තං ඉදමෙතං පටිච්ච වුත්තං.

යෙ ඛො තෙ භද්දිය, ලොකෙ සන්තො සප්පුරිසා, තෙ සාවකං එවං සමාදපෙන්ති: එහි ත්වං අම්භො පුරිස, ලොභං විනෙය්‍ය විනෙය්‍ය විහරාහි, ලොභං විනෙය්‍ය විනෙය්‍ය විහරන්තො න ලොභජං කම්මං කරිස්සසි, කායෙන වාචා මනසා. දොසං විනෙය්‍ය විනෙය්‍ය විහරාහි, දොසං විනෙය්‍ය විනෙය්‍ය විහරන්තො න දොසජං කම්මං කරිස්සසි කායෙන වාචා මනසා. මොහං විනෙය්‍ය විනෙය්‍ය විහරාහි, මොහං විනෙය්‍ය විනෙය්‍ය විහරන්තො න මොහජං කම්මං කරිස්සසි කායෙන වාචා මනසා. සාරම්භං විනෙය්‍ය විනෙය්‍ය විහරාහි, සාරම්භං විනෙය්‍ය විනෙය්‍ය විහරන්තො න සාරම්භජං කම්මං කරිස්සසි කායෙන වාචා මනසාති.

එවං වුත්තෙ භද්දියො ලිච්ඡවි භගවන්තං එතදවොච: අභික්කන්තං භන්තෙ -පෙ- උපාසකං මං භන්තෙ භගවා ධාරෙතු අජ්ජතග්ගෙ පාණුපෙතං සරණං ගතන්ති.

අපි නු තාහං භද්දිය, එවං අවචං: "එහි මෙ ත්වං භද්දිය සාවකො හොහි අහං සත්ථා භවිස්සාමී"ති. නො හෙතං භන්තෙ. එවංවාදිං ඛො මං භද්දිය එවමක්ඛායිං එකෙ සමණබ්‍රාහ්මණා අසතා තුච්ඡා මුසා අභූතෙන අබ්භාචික්ඛන්ති: මායාවී සමණො ගොතමො ආවට්ටනිං මායං ජානාති යාය අඤ්ඤතිත්ථියානං සාවකෙ ආවට්ටෙතීති.

භද්දිකා භන්තෙ ආවට්ටනී මායා. කල්‍යාණී භන්තෙ ආවට්ටනී මායා. පියා මෙ භන්තෙ ඤාතිසාලොහිතා ඉමාය ආවට්ටනියා ආවට්ටෙය්‍යුං. පියානම්පි මෙ අස්ස ඤාතිසාලොහිතානං දීඝරත්තං හිතාය සුඛාය. සබ්බෙ චෙපි භන්තෙ ඛත්තියා ඉමාය ආවට්ටනියා ආවට්ටෙය්‍යුං, සබ්බෙසම්පස්ස ඛත්තියානං දීඝරත්තං හිතාය සුඛාය. සබ්බෙ චෙපි භන්තෙ බ්‍රාහ්මණා -පෙ- වෙස්සා -පෙ- සුද්දා ඉමාය ආවට්ටනියා ආවට්ටෙය්‍යුං, සබ්බෙසම්පස්ස සුද්දානං දීඝරත්තං හිතාය සුඛායාති.

භද්දිය ය, එ කුමැයි හඟිහු ද? මේ දහම්හු කුසල හෝ අකුසල හෝ වෙද්ද? වහන්ස, කුසල්හ. සාවද්‍ය හෝ අනවද්‍ය හෝ වෙද් ද? වහන්ස, අනවද්‍යයහ. විඥයන් විසින් ගර්හිත හෝ ප්‍රශස්ත හෝ වෙද් ද? වහන්ස, විඥයන් විසින් ප්‍රශස්තයහ. මොනොවට ගන්නා ලද්දාහු මොනොවට සමාදන් කරණ ලද්දාහු හිතයට සුඛයට වැටෙද් ද? නො වැටෙන්නාහු හෝ වෙද්ද? මෙහි ලා කෙබඳු අදහස් හෝ වේ ද? වහන්ස, මොනොවට ගත් මොනොවට සමාදන් කළ එ දහම්හු හිතයට සුඛයට වැටෙති. මෙහි ලා අපට මෙබඳු සිත් වෙයි.

භද්දියය, මෙසේ යම් එ බසක් කියුමෝ ද, "භද්දියයෙනි, තෙපි එවූ. අනුශ්‍රවකථායෙනුදු නහමක් ගණුව, පරම්පරාකථායෙනුදු නහමක් ගණුව, තෙල මෙසේ වීලැයි ද නො ගණුව, අපගේ පෙළ හා යෙදෙති යි ද නහමක් ගණුව, තර්කග්‍රාහයෙනුදු නහමක් ගණුව, නයග්‍රාහයෙනුදු නහමක් ගණුව, ආකාරපරිවිතර්කයෙනුදු නහමක් ගණුව, අප සිතා ඉවසා ගත් දෘෂ්ටිය හා සැසැඳෙතැයි ද නහමක් ගණුව, භව්‍යරූපතායෙනුදු නහමක් ගණුව, මෙ මහණ අපට ගුරුය යි ද නහමක් ගණුව. භද්දියයෙනි, යම් කලෙක තෙපි "මෙ දහම්හු කුසල්හ. මේ දහම්හු අනවද්‍යයහ මේ දහම්හු නුවණැතියන් විසින් පසස්නා ලදහ. මෙ දහම්හු මොනවට ගන්නා ලද්දාහු මොනොවට සමාදන් කොට ගන්නා ලද්දාහු හිතයට සුඛයට වැටෙති" යි තුඹූ ම දන්නාහු ද, භද්දිය ය, එ සඳ තෙපි එ දහම් උපයා වසව යි. මෙසේ යම් බසෙක් කියන ලද ද. මේ තෙල පිණිස කියන ලදී.

භද්දිය ය, ලොකයෙහි යම් සත්පුරුෂ කෙනෙක් ඇද්ද, ඔහු සව්වා මෙසේ සමාදන් කරවත්: "එම්බා පුරුෂය, තෝ එව, ලෝභය පුන පුනා දුරු කොට වසව, ලෝභය පුන පුනා දුරු කරණුයෙහි කයින් වචසින් මනසින් ලොභජකම් නො කරන්නෙහි ය. ද්වේෂය පුන පුනා දුරු කොට වසව, ද්වෙෂය පුන පුනා දුරු කොට වසනුයෙහි කයින් වචසින් මනසින් ද්වෙෂජකම් නො කරන්නෙහි ය. මොහය පුන පුනා දුරු කොට වසව, මොහය පුන පුනා දුරු කොට වසනුයෙහි කයින් වචසින් මනසින් මොහජකම් නො කරන්-නෙහි ය. සාරම්භය පුන පුනා දුරු කොට වසව, සාරම්භය පුන පුනා දුරු කොට වසනුයෙහි කයින් වචසින් සාරම්භජකම් නො කරන්නෙහි ය.

මෙසේ වදාළ කල්හි භද්දිය ලිච්ඡවි භාග්‍යවතුන් වහන්සේට තෙල සැළ කෙළේ ය: "වහන්ස, ඉතා මැනව වහන්ස, භාග්‍යවතුන් වහන්සේ මා අද පටන් ගෙණ දිවිහිම් කොට සරණ ගිය උවසුවකු කොට දරන්නේ මැනවැ"යි.

"භද්දිය ය, එව තෝ මාගේ සව්වා, මම ශාස්තෘ වෙමි"යි තට මම මෙසේ කීයෙම්" වේ ද? වහන්ස, තෙල බස නො වී ම ය. භද්දිය ය, මෙබඳු වාද ඇති මෙසේ බණනා මට, ඇතැම් මහණ බමුණෝ අසත් තුච්ඡ මෘෂාභූත අභූතයෙන් අභ්‍යාඛ්‍යාන කෙරෙත්: "ශ්‍රමණ ගෞතමයෝ මායාවීහ. යම් මායායෙකින් අන්තොටු සවුවන් ආවර්තනය කොට ගණිත් ද, එබඳු ආවර්තනීමායා දනිති" යි.

වහන්ස, ආවර්තනීමායා භද්‍රය, වහන්ස, ආවර්තනීමායා කල්‍යාණය. වහන්ස, මාගේ ප්‍රිය වූ නෑසහලේනැයෝ මේ ආවර්තනීමායායෙන් ආවර්තිත වෙද්ද, මාගේ ප්‍රිය වූ නෑ - සහලේ නෑයනට දීර්ඝරාත්‍රයෙහි හිතසුඛ පිණිස වෙයි වහන්ස, හැම ක්‍ෂත්‍රියෝ මේ ආවර්තනීමායායෙන් ආවර්තිත වෙද්ද එහැම ක්‍ෂත්‍රියනට දීර්ඝරාත්‍රයෙහි හිතසුඛ පිණිස වෙයි. වහන්ස, හැම බමුණෝ ද ... වෛශ්‍යයෝ ද ... ශුද්‍රයෝ ද මේ ආවර්තනීමායායෙන් ආවර්තිත වෙද්ද එ හැම ශුද්‍රයනට දීර්ඝරාත්‍රයෙහි හිතසුඛ පිණිස වෙයි.

එවමෙතං භද්දිය, එවමෙතං භද්දිය, සබ්බෙ චෙපි භද්දිය, ඛත්තියා ආවට්ටෙය්‍යුං අකුසලධම්මප්පහානාය කුසලධම්මූපසම්පදාය, සබ්බෙසම්පස්ස ඛත්තියානං දීඝරත්තං හිතාය සුඛාය. සබ්බෙ චෙපි භද්දිය බ්‍රාහ්මණා -පෙ- වෙස්සා -පෙ- සුද්දා ආවට්ටෙය්‍යුං අකුසලධම්මප්පහානාය කුසලධම්මූපසම්පදාය, සබ්බෙසම්පස්ස සුද්දානං දීඝරත්තං හිතාය සුඛාය. සදෙවකො චෙපි භද්දිය ලොකො සමාරකො සබ්‍රහ්මකො, සස්සමණබ්‍රාහ්මණී පජා සදෙවමනුස්සා ආවට්ටෙය්‍යුං අකුසල-ධම්මප්පහානාය කුසලධම්මූපසම්පදාය, සදෙවකස්ස ලොකස්ස සමාරකස්ස සබ්‍රහ්මකස්ස සස්සමණබ්‍රාහ්මණියා පජාය සදෙවමනුස්සාය දීඝරත්තං හිතාය සුඛාය. ඉමෙ චෙපි භද්දිය මහාසාලා ඉමාය ආවට්ටනියා ආවට්ටෙය්‍යුං අකුසල-ධම්මප්පහානාය කුසලධම්මූපසම්පදාය. ඉමෙසම්පස්ස මහාසාලානං දීඝරත්තං හිතාය සුඛාය සචෙ චෙතෙය්‍යුං. කො පන වාදො මනුස්සභූතස්සාති

## 4. 4. 5. 4

### [ සාපුගියසුත්තං ]

44. එකං සමයං ආයස්මා **ආනන්දො කොලියෙසු** විහරති **සාපුගං නාම**[1] කොලියානං නිගමො. අථ ඛො සම්බහුලා සාපුගියා කොලියපුත්තා යෙන ආයස්මා **ආනන්දො** තෙනුපසඞ්කමිංසු. උපසඞ්කමිත්වා ආයස්මන්තං ආනන්දං අභිවාදෙත්වා එකමන්තං නිසීදිංසු. එකමන්තං නිසින්නෙ ඛො සාපුගියෙ කොලියපුත්තෙ ආයස්මා ආනන්දො එතදවොච:

චත්තාරිමානි **බ්‍යග්ඝපජ්ජා** පාරිසුද්ධිපධානියඞ්ගානි තෙන භගවතා ජානතා පස්සතා අරහතා සම්මාසම්බුද්ධෙන සම්මදක්ඛාතානි සත්තානං විසුද්ධියා සොකපරිද්දවානං සමතික්කමාය දුක්ඛදොමනස්සානං අත්ථඞ්ගමාය ඤායස්ස අධිගමාය නිබ්බානස්ස සච්ඡිකිරියාය. කතමානි චත්තාරි ?.

සීලපාරිසුද්ධිපධානියඞ්ගං චිත්තපාරිසුද්ධිපධානියඞ්ගං දිට්ඨිපාරිසුද්ධි-පධානියඞ්ගං විමුත්තිපාරිසුද්ධිපධානියඞ්ගං.

කතමඤ්ච බ්‍යග්ඝපජ්ජා සීලපාරිසුද්ධිපධානියඞ්ගං? ඉධ බ්‍යග්ඝපජ්ජා භික්ඛු සීලවා හොති -පෙ- සමාදාය සික්ඛති සික්ඛාපදෙසු. අයං වුච්චති බ්‍යග්ඝපජ්ජා සීලපාරිසුද්ධි. ඉති එවරූපිං සීලපාරිසුද්ධිං අපරිපූරිං වා පරිපූරෙස්සාමි, පරිපූරිං වා තත්ථ තත්ථ පඤ්ඤාය අනුග්ගහෙස්සාමීති, යො තත්ථ ඡන්දො ච වායාමො ච උස්සාහො ච උස්සොළ්හී ච අප්පටිවානී ච සති ච සම්පජඤ්ඤං ච. ඉදං වුච්චති බ්‍යග්ඝපජ්ජා සීලපාරිසුද්ධිපධානියඞ්ගං.

කතමඤ්ච බ්‍යග්ඝපජ්ජා චිත්තපාරිසුද්ධිපධානියඞ්ගං? ඉධ බ්‍යග්ඝපජ්ජා භික්ඛු විවිච්චෙව කාමෙහි -පෙ- [පඨමං ඣානං -පෙ- දුතියං ඣානං -පෙ- තතියං ඣානං -පෙ-] චතුත්ථං ඣානං උපසම්පජ්ජ විහරති. අයං වුච්චති බ්‍යග්ඝපජ්ජා චිත්තපාරිසුද්ධි. ඉති එවරූපිං චිත්තපාරිසුද්ධිං අපරිපූරිං වා පරිපූරෙස්සාමි, පරිපූරිං වා තත්ථ තත්ථ පඤ්ඤාය අනුග්ගහෙස්සාමීති. යො තත්ථ ඡන්දො ච වායාමො ච උස්සාහො ච උස්සොළ්හී ච අප්පටිවානී ච සති ච සම්පජඤ්ඤං ච. ඉදං වුච්චති බ්‍යග්ඝපජ්ජා චිත්තපාරිසුද්ධිපධානියඞ්ගං.

1. සාමුගං නාම, මජසං

භද්දිය ය, තෙල එසේ ම ය. භද්දියය, තෙල එසේ ම ය. භද්දියය, හැම ක්ෂත්‍රියෝ අකුශලධර්මප්‍රහාණය පිණිස කුශලධර්මප්‍රතිලාභය පිණිස ආවර්තිත වෙත් නම් හැම ක්ෂත්‍රියනට දීර්ඝරාත්‍රයෙහි හිතසුඛ පිණිස වෙයි. භද්දියය, හැම බමුණෝ ද ... වෛශ්‍යයෝ ද ... ශුද්‍රයෝ ද අකුශලධර්ම-ප්‍රහාණය පිණිස කුශලධර්මප්‍රතිලාභය පිණිස මේ ආවර්තනීමායායෙන් ආවර්තිත වෙද්ද, එ හැම ශුද්‍රයනට දීර්ඝරාත්‍රයෙහි හිතසුඛ පිණිස වෙයි. භද්දියය, දෙවියන් සහිත මරුන් සහිත බඹුන් සහිත ලොකය, මහණ බමුණන් සහිත දෙවිමිනිසුන් සහිත සත්ත්වප්‍රජා තොමෝ අකුශලධර්මප්‍රහාණය පිණිස කුශලධර්මප්‍රතිලාභය පිණිස ආවර්තිත වේ නම් මරුන් සහිත බඹුන් සහිත සදෙවක ලොකයාගේ, මහණබමුණන් සහිත දෙවිමිනිසුන් සහිත සත්ත්වප්‍රජාවගේ දීර්ඝරාත්‍රයෙහි හිත පිණිස සුඛ පිණිස වන්නේ ය. භද්දියය, මේ මහාසාලවෘක්ෂයෝ ද අකුශලධර්මප්‍රහාණය පිණිස කුශලධර්මප්‍රතිලාභය පිණිස මේ ආවර්තනීමායායෙන් ආවර්තිත වෙත් ද, ඉදින් සිතන්නාහු නම් මේ මහාසාලවෘක්ෂයනට පවා දීර්ඝරාත්‍රයෙහි හිතසුව පිණිස වන්නේ ය. මිනුෂ්‍ය වූවක්හට කියනු ම කිම සි.

## 4. 4. 5. 4.

## [සාපුගිය සූත්‍රය]

44 එක් සමයෙක්හි ආයුෂ්මත් ආනන්ද තෙරණුවෝ **කොළිය** දනව්හි **සාපුග** නම් කොළිය නියම්ගම්හි වැඩ වසන්නාහ. එකල්හි බොහෝ සාපුගිය කොළිය පුත්‍රයෝ ආයුෂ්මත් ආනන්ද තෙරුන් කරා එළඹියහ. එළඹ ආයුෂ්මත් ආනන්ද තෙරුන් වැඳ එකත්පස්ව හුන්හ. එකත්පසෙක හුන් සාපුගිය කොළිය පුත්‍රයනට ආයුෂ්මත් ආනන්ද තෙරණුවෝ තෙල කීහ.

ව්‍යග්ඝපජ්ජයෙනි, යථාර්ථ දන්නා වූ යථාර්ථ දක්නා වූ අර්හත් සම්‍යක් සම්බුද්ධ වූ ඒ භාග්‍යවතුන් වහන්සේ විසින් මොනවට පවසන ලද සත්ත්ව-යන්ගේ විශුද්ධිය පිණිස වූ ශොකපරිදෙවයන්ගේ සමතික්‍රමයට, දුක් දොම්-නස් දුරලනුවට න්‍යායාධිගමයට නිර්වාණ සාක්ෂාත්කාරයට මේ සතර පාරි-සුද්ධි පධානියඞ්ග කොතෙකි. කවර සතර කොතෙක යත්:

සීලපාරිසුද්ධිපධානියඞ්ගය, චිත්තපාරිසුද්ධිපධානියඞ්ගය, දිට්ඨිපාරිසුද්ධි පධානියඞ්ගය, විමුක්තිපාරිසුද්ධිපධානියඞ්ග යි.

ව්‍යග්ඝපජ්ජයෙනි, සීලපාරිසුද්ධිපධානියඞ්ගය කවරේ යත්: ව්‍යග්ඝ-පජ්ජයෙනි, මේ සස්නෙහි මහණ සිල්වත් වෙයි. ... ශික්ෂා පදයන්හි සමාදන් කොට ගෙණ හික්මෙයි. ව්‍යග්ඝපජ්ජයෙනි, මේ ශීලපාරිශුද්ධි යයි කියනු ලැබේ. මෙසේ අපරිපූර්ණ වූ හෝ මෙ බඳු ශීලපාරිශුද්ධිය පුරන්නෙමි, පරිපූර්ණ වූ හෝ ශීලපාරිශුද්ධිය එ එ කරුණෙහි විදර්ශනාප්‍රඥා-යෙන් අනුගන්නෙමි යි එහි යම් ඡන්දයෙක් හා යම් ව්‍යායාමයෙක් හා යම් උත්සාහයෙක් හා යම් උත්සොළ්හියෙක් හා අප්‍රතිවානියෙක් හා ස්මෘතියෙක් හා සම්‍යක් ප්‍රඥායෙක් හා වේ නම්, ව්‍යග්ඝපජ්ජයෙනි, මේ ශීලපාරිශුද්ධිපධානියඞ්ග යි කියනු ලැබේ.

ව්‍යග්ඝපජ්ජයෙනි, චිත්තපාරිශුද්ධිපධානියඞ්ගය හා කවරෙ යත්: ව්‍යග්ඝපජ්ජයෙනි, මෙ සස්නෙහි මහණ කාමයෙන් වෙන්ව ම ... [ප්‍රථමධ්‍යානයට ... ද්විතීයධ්‍යානයට ... තෘතීයධ්‍යානයට ...] චතුර්ථධ්‍යානයට එළඹ වෙසෙයි. ව්‍යග්ඝපජ්ජයෙනි, මේ චිත්තපාරිශුද්ධි යි කියනු ලැබේ. මෙසේ අපරිපූර්ණ වූ හෝ මෙ බඳු චිත්තපාරිශුද්ධිය පුරන්නෙමි යි පරිපූර්ණ වූ හෝ චිත්තපාරිශුද්ධිය එ එ කරුණෙහි විවසුන් නුවණින් අනුගන්නෙමි යි එහි යම් ඡන්දයෙක් හා ව්‍යායාමයෙක් හා උත්සාහයෙක් හා උස්සොළ්හියෙක් හා අප්‍රතිවානියෙක් හා ස්මෘතියෙක් හා සම්‍යක් ප්‍රඥායෙක් හා වේ නම් ව්‍යග්ඝ-පජ්ජයෙනි, මේ චිත්තපාරිශුද්ධිපධානියඞ්ග යි කියනු ලැබේ.

කතමඤ්ච බ්‍යග්ඝපජ්ජා දිට්ඨිපාරිසුද්ධිපධානියඞ්ගං? ඉධ බ්‍යග්ඝපජ්ජා භික්ඛු ඉදං දුක්ඛන්ති යථාභූතං පජානාති -පෙ- අයං දුක්ඛසමුදයොති -පෙ- අයං දුක්ඛනිරොධොති -පෙ- අයං දුක්ඛනිරොධගාමිනී පටිපදාති යථාභූතං පජානාති. අයං වුච්චති බ්‍යග්ඝපජ්ජා දිට්ඨිපාරිසුද්ධි. ඉති එවරූපිං දිට්ඨිපාරිසුද්ධිං අපරිපූරිං වා පරිපූරෙස්සාමි පරිපූරිං වා තත්ථ තත්ථ පඤ්ඤාය අනුග්ගහෙස්සාමීති යො තත්ථ ඡන්දො ච වායාමො ච උස්සාහො ච උස්සොළ්හි ච අප්පටිවානී ච සති ච සම්පජඤ්ඤඤ්ච. ඉදං වුච්චති බ්‍යග්ඝපජ්ජා දිට්ඨිපාරිසුද්ධිපධානියඞ්ගං.

කතමඤ්ච බ්‍යග්ඝපජ්ජා විමුත්තිපාරිසුද්ධිපධානියඞ්ගං? ස ඛො සො බ්‍යග්ඝපජ්ජා අරියසාවකො ඉමිනා ච සීලපාරිසුද්ධිපධානියඞ්ගෙන සමන්නාගතො ඉමිනා ච චිත්තපාරිසුද්ධිපධානියඞ්ගෙන සමන්නාගතො ඉමිනා ච දිට්ඨිපාරිසුද්ධිපධානියඞ්ගෙන සමන්නාගතො රජනීයෙසු ධම්මෙසු චිත්තං විරාජෙති, විමොචනීයෙසු ධම්මෙසු චිත්තං විමොචෙති, සො රජනීයෙසු ධම්මෙසු චිත්තං විරාජෙත්වා විමොචනීයෙසු ධම්මෙසු චිත්තං විමොචෙත්වා සම්මා විමුත්තිං ඵුසති. අයං වුච්චති බ්‍යග්ඝපජ්ජා විමුත්තිපාරිසුද්ධි. ඉති එවරූපිං විමුත්තිපාරිසුද්ධිං අපරිපූරිං වා පරිපූරෙස්සාමි පරිපූරිං වා තත්ථ තත්ථ පඤ්ඤාය අනුග්ගහෙස්සාමීති යො තත්ථ ඡන්දො ච වායාමො ච උස්සාහො ච උස්සොළ්හි ච අප්පටිවානී ච සති ච සම්පජඤ්ඤඤ්ච. ඉදං වුච්චති බ්‍යග්ඝපජ්ජා විමුත්තිපාරිසුද්ධිපධානියඞ්ගං.

ඉමානි ඛො බ්‍යග්ඝපජ්ජා චත්තාරි පාරිසුද්ධිපධානියඞ්ගානි, තෙන භගවතා ජානතා පස්සතා අරහතා සම්මාසම්බුද්ධෙන සම්මදක්ඛාතානි සත්තානං විසුද්ධියා සොකපරිද්දවානං සමතික්කමාය දුක්ඛදොමනස්සානං අත්ථඞ්ගමාය ඤායස්ස අධිගමාය නිබ්බානස්ස සච්ඡිකිරියායාති.

## 4. 4. 5. 5.

## [ වප්පසුත්තං ]

45. එකං සමයං භගවා **සක්කෙසු** විහරති **කපිලවත්ථුස්මිං නිග්‍රොධාරාමෙ**. අථ ඛො **වප්පො** සක්කො නිගණ්ඨසාවකො යෙන ආයස්මා **මහාමොග්ගල්ලානො** තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා ආයස්මන්තං මහාමොග්ගල්ලානං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නං ඛො වප්පං සක්කං නිගණ්ඨසාවකං ආයස්මා මහාමොග්ගල්ලානො එතදවොච:

ඉධස්ස වප්ප කායෙන සංවුතො වාචාය සංවුතො මනසා සංවුතො අවිජ්ජාවිරාගා විජ්ජුප්පාදා. පස්සසි නො ත්වං වප්ප තං ඨානං යතොනිදානං පුරිසං දුක්ඛවෙදනීයා ආසවා අස්සවෙය්‍යුං අභිසම්පරායන්ති? පස්සාමහං භන්තෙ තං ඨානං: ඉධස්ස භන්තෙ පුබ්බෙ පාපකම්මං කතං අවිපක්කවිපාකං තතොනිදානං පුරිසං දුක්ඛවෙදනීයා ආසවා අස්සවෙය්‍යුං අභිසම්පරායන්ති.

ව්‍යග්ඝපජ්ජයෙනි, දිට්ඨිපාරිසුද්ධි පධානියඞ්ගය කවරේ යත්: ව්‍යග්ඝපජ්ජයෙනි, මේ සස්නෙහි මහණ මෙ දුකැයි යථාභූතය දන්නේ ය ... මේ දුක්ඛසමුදය යි ... මේ දුක්ඛනිරොධයයි ... මෙ දුඃඛනිරොධගාමිනී ප්‍රතිපත්ති ය යි යථා භූතය දන්නේ ය. ව්‍යග්ඝපජ්ජයෙනි, මෙ දිට්ඨි-පාරිසුද්ධි යි කියනු ලැබේ. මෙසේ අපරිපූර්ණවූ හෝ මෙබඳු දිට්ඨිපාරිසුද්ධිය පුරන්නෙ මි යි පරිපූර්ණවූ හෝ දිට්ඨිපාරිසුද්ධිය ඒ ඒ කරුණෙහි විවසුන් නුවණින් අනුගන්නෙමි යි එහි යම් ඡන්දයෙක් හා ව්‍යායාමයෙක් හා උත්සාහයෙක් උත්සොලිහියෙක් හා අප්‍රතිවානියෙක් හා ස්මෘතියෙක් හා සම්ප්‍රජන්‍යයෙක් හා වේ නම්, ව්‍යග්ඝපජ්ජයෙනි, මෙ දිට්ඨිපාරිසුද්ධි පධානියඞ්ග යි කියනු ලැබේ.

ව්‍යග්ඝපජ්ජයෙනි, විමුත්ති පාරිසුද්ධිපධානියඞ්ගය හා කවරේ යත්: ව්‍යග්ඝපජ්ජයෙනි, එම අරිසවූ මෙ සීලපාරිශුද්ධිපධානියඞ්ගයෙන් හා සමන්වා-ගත වූයේ මෙ චිත්තපාරිශුද්ධිපධානියඞ්ගයෙන් හා සමන්වාගත වූයේ මෙ දිට්ඨිපාරිසුද්ධි පධානියඞ්ගයෙන් හා සමන්වාගත වූයේ රාගයට කරුණුවූ ඉෂ්ටාලම්බනයන් නිමිති කොට සිත වෙන් කොට ලයි. විමොචනීය ආලම්බන-යන් නිමිති කොට සිත මුදලයි. හෙ රජනීය ධර්මයන්හි සිත වෙන් කොට ලා විමොචනීය ධර්මයන්හි සිත මුදවා සම්‍යක් හෙතුයෙන් අර්හත්ඵල විමුක්තිය (නැණපහසින්) පහස්නේ ය. ව්‍යග්ඝපජ්ජයෙනි, මෙ විමුත්තිපාරිසුද්ධිය යි කියනු ලැබේ. මෙසේ අපරිපූර්ණ වූ හෝ මෙ බඳු විමුක්තිපාරිශුද්ධිය පුරන්නෙමි, පරිපූර්ණ වූ හෝ විමුක්තිපාරිශුද්ධිය ඒ ඒ තන්හි ප්‍රඥායෙන් අනුගන්නෙමි යි එහි යම් ඡන්දයෙක් හා ව්‍යායාමයෙක් හා උත්සාහයෙක් හා උත්සොලිහියෙක් හා අප්‍රතිවානියෙක් හා ස්මෘතියෙක් හා සම්ප්‍රජන්‍යයෙක් හා වේ නම් ව්‍යග්ඝපජ්ජයෙනි, මෙ විමුක්තිපාරිශුද්ධිපධානියඞ්ග යි කියනු ලැබේ.

ව්‍යග්ඝපජ්ජයෙනි, සියල්ල දන්නා, සියල්ල දක්නා අර්හත් සම්‍යක් සම්බුද්ධ ඒ භාග්‍යවතුන් වහන්සේ විසින් සත්ත්වයන්ගේ විශුද්ධිය පිණිස ශොකපරිදෙවයන්ගේ සමතික්‍රමය පිණිස දුක්දොම්නසුන්ගේ අස්තගමය පිණිස න්‍යායයාගේ අධිගමය පිණිස නිර්වාණයාගේ සාක්ෂාත්කාරය පිණිස මොනොවට පවසන ලද මෙ සතර පාරිශුද්ධි පධානියඞ්ග යි.

## 4. 4. 5. 5.

## [**වප්පසුත්‍රය**]

45. එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ **ශාක්‍යජනපදයෙහි කිඹුල්වත්** පුර අසල **න්‍යග්‍රොධාරාමයෙහි** වැඩ වෙසෙති. එකල්හි නුවටසවු **වප්ප** ශාක්‍ය ආයුෂ්මත් **මහමුගලන්** තෙරණුවන් කරා එළඹියේ ය. එළඹ ආයුෂ්මත් මහමුගලන් තෙරණුවන් වැඳ එකත්පස්ව හින. එකත්පසෙක හුන් නුවටසවු වප්ප ශාක්‍යහට ආයුෂ්මත් මහමුගලන් තෙරණුවෝ තෙල කීහ.

වප්පයෙනි, අවිද්‍යා විරාගයෙන් මාගීවිද්‍යා උපාදයෙන් මෙ සස්නෙහි [මහණ] කයින් සංවෘත වූයේ වචනයෙන් සංවෘත වූයේ සිතින් සංවෘත වූයේ වෙයි. වප්පයෙනි, යමක් නිදාන කොට දුඃඛවෙදනාවට ප්‍රත්‍යය වූ ආශ්‍රවයෝ පුරුෂයා පරලොවෙහි අනුබද්ධනාහු නම් ඒ කරුණ තො දක්නෙහිදැයි? වහන්ස, ඒ කරුණ මම් දක්නෙමි: වහන්ස, මෙ ලොවෙහි නො පැසුනු විපාක ඇති පෙර කළ පාපකර්මයෙක් වන්නේ ය. ඒ හේතුයෙන් දුකට ප්‍රත්‍යය වූ ආශ්‍රවයෝ පුරුෂයා පරලොවෙහි ලුහුබඳනාහු යි.

අයඤ්ච බො පනායස්මතො මහාමොග්ගල්ලානස්ස වප්පෙන සක්කෙන නිගණ්ඨසාවකෙන සද්ධිං කථා විප්පකතා හොති. අථ බො භගවා සායන්හසමයං පටිසල්ලානා වුට්ඨිතො යෙනුපට්ඨානසාලා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා පඤ්ඤත්තෙ ආසනෙ නිසීදි. නිසජ්ජ බො භගවා ආයස්මන්තං මහාමොග්ගල්ලානං එතදවොච: කාය නුත්ථ මොග්ගල්ලාන එතරහි කථාය සන්නිසින්නා කා ච පන වො අන්තරා කථා විප්පකතාති.

ඉධාහං භන්තෙ වප්පං සක්කං නිගණ්ඨසාවකං එතදවොචං: ඉධස්ස වප්ප කායෙන සංවුතො වාචාය සංවුතො මනසා සංවුතො අවිජ්ජාවිරාගා විජ්ජුප්පාදා. පස්සසි නො ත්වං වප්ප තං ඨානං යතො නිදානං පුරිසං දුක්ඛවෙදනීයා ආසවා අස්සවෙය්‍යුං අභිසම්පරායන්ති? එවං වුත්තෙ භන්තෙ වප්පො සක්කො නිගණ්ඨසාවකො මං එතදවොච: පස්සාමහං භන්තෙ තං ඨානං: ඉධස්ස භන්තෙ පුබ්බෙ පාපකම්මං කතං අවිපක්කවිපාකං තතො නිදානං පුරිසං දුක්ඛවෙදනීයා ආසවා අස්සවෙය්‍යුං අභිසම්පරායන්ති. අයං බො භන්තෙ වප්පෙන සක්කෙන නිගණ්ඨසාවකෙන සද්ධිං කථා විප්පකතා, අථ භගවා අනුප්පත්තොති

අථ බො භගවා වප්පං සක්කං නිගණ්ඨසාවකං එතදවොච: සචෙ බො මෙ ත්වං වප්ප අනුඤ්ඤෙය්‍යඤ්චෙව අනුජානෙය්‍යාසි, පටික්කොසිතබ්බඤ්ච පටික්කොසෙය්‍යාසි, යස්ස ච මෙ භාසිතස්ස අත්ථං න ජානෙය්‍යාසි, මමෙවෙත්ථ උත්තරිං පටිපුච්ඡෙය්‍යාසි: ඉදං භන්තෙ කථං, ඉමස්ස කො අත්ථොති සියා නො එත්ථ කථාසල්ලාපොති.

අනුඤ්ඤෙය්‍යං චෙවාහං භන්තෙ භගවතො අනුජානිස්සාමි. පටික්කොසිතබ්බඤ්ච පටික්කොසිස්සාමි. යස්ස චාහං භගවතො භාසිතස්ස අත්ථං න ජානිස්සාමි, භගවන්තං යෙවෙත්ථ උත්තරිං පටිපුච්ඡිස්සාමි: ඉදං භන්තෙ කථං ඉමස්ස ක්වත්ථොති? හොතු නො එත්ථ කථාසල්ලාපොති.

තං කිං මඤ්ඤසි වප්ප, යෙ කායසමාරම්භපච්චයා උප්පජ්ජන්ති ආසවා විඝාතපරිළාහා කායසමාරම්භා පටිවිරතස්ස එවංස තෙ ආසවා විඝාතපරිළාහා න හොන්ති. සො නවඤ්ච කම්මං න කරොති. පුරාණඤ්ච කම්මං ඵුස්ස ඵුස්ස බ්‍යන්තී කරොති. සන්දිට්ඨිකා නිජ්ජරා අකාලිකා එහිපස්සිකා ඔපනයිකා පච්චත්තං වෙදිතබ්බා විඤ්ඤූහීති. පස්සසි නො ත්වං වප්ප තං ඨානං යතො නිදානං පුරිසං දුක්ඛවෙදනීයා ආසවා අස්සවෙය්‍යුං අභිසම්පරායන්ති? නො හෙතං භන්තෙ.

තං කිං මඤ්ඤසි වප්ප, යෙ වචීසමාරම්භපච්චයා උප්පජ්ජන්ති ආසවා විඝාතපරිළාහා. වචීසමාරම්භා පටිවිරතස්ස එවංස තෙ ආසවා විඝාතපරිළාහා න හොන්ති, සො නවඤ්ච කම්මං න කරොති. පුරාණඤ්ච කම්මං ඵුස්ස ඵුස්ස බ්‍යන්තීකරොති. සන්දිට්ඨිකා නිජ්ජරා අකාලිකා එහිපස්සිකා ඔපනයිකා පච්චත්තං වෙදිතබ්බා විඤ්ඤූහීති. පස්සසි නො ත්වං වප්ප තං ඨානං යතො නිදානං පුරිසං දුක්ඛවෙදනීයා ආසවා අස්සවෙය්‍යුං අභිසම්පරායන්ති? නො හෙතං භන්තෙ.

ආයුෂ්මත් මහමුගලන් තෙරණුවන්ගේ නුවට සවු වප්ප ශාක්‍යයා සමග වූ මෙ කථාව ද අඩාළ කරණ ලද වෙයි. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ සවස් වේලෙහි පිළිසලනින් නැගී සිටියාහු උපස්ථාන ශාලාව කරා එළඹි සේක. එළඹ පැනවූ ආසනයෙහි වැඩහුන් සේක. වැඩ හිඳ භාග්‍යවතුන් වහන්සේ ආයුෂ්මත් මගමුගලන් තෙරණුවන්හට තෙල වදාළ සේක: මොග්ගල්ලානයෙනි, දැන් තෙපි කවර කථායෙකින් හුන්නාහු ද, නොපවිසිත් කවර අතුරු කථායෙකුත් අඩාල කරණ ලද දැ යි.

වහන්ස, මෙහි මම නුවට සවු වප්ප ශාක්‍යහට තෙල කීමි: වප්පයෙනි, මෙහි (මහණ) අවිද්‍යා විරාගයෙන් විද්‍යා - උත්පාදයෙන් කයින් සංවෘත වූයේ වචනයෙන් සංවෘත වූයේ මනසින් සංවෘත වූයේ වෙයි. වප්පයෙනි, යම් හෙතුයෙකින් දුඃඛවෙදනීය ආශ්‍රවයෝ අභිසම්පරායෙහි පුරුෂයා ලුහුබඳනාහු නම් තෝ එකරුණ දත්හිදැ"යි. වහන්ස, මෙසේ කියූ කල්හි නුවටසවු වප්පශාක්‍ය මට තෙල කීයේ ය: "වහන්ස, තෙල කරුණ මම දන්මි වහන්ස, නො පැසුනු විපාක ඇති පෙර කළ පාපකර්මයෙක් වන්නේ ය. එ හෙතුයෙන් අභිසම්පරායෙහි දුඃඛවෙදනීය ආශ්‍රවයෝ පුරුෂයා ලුහුබඳනාහයි. වහන්ස, නුවටසවු වප්ප ශාක්‍ය සමග අඩාළ කළ කථාව මේ වෙයි එකල්හි භාග්‍යවතුන් වහන්සේ අනුප්‍රාප්තයහ යි.

ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ නුවටසවු වප්ප ශාක්‍යයාට තෙල වදාළහ: වප්පයෙනි, ඉදින් තෝ මට අනුඥා කටයුත්තක් ම අනුදන්නෙහි නම් ප්‍රතික්‍රොශ කටයුත්තක් ප්‍රතික්‍රොශ කරන්නෙහි නම් මාගේ යම් ම භාෂිතයෙක අරුත් නො දන්හි නම් තෙල කරුණෙහි මින්නෙහි මා ම පුළුවුස්නෙහි නම් "වහන්ස, මෙ කෙසේය, මෙහි අර්ථ කවරැ?"යි මෙහි ලා අපගේ කථා සල්ලාපයෙක් වන්නේ යයි.

වහන්ස, භාග්‍යවතුන් වහන්සේගේ අනුඥා කටයුත්තක් ම මම් අනුදන්නෙමි. ප්‍රතික්‍රොශ කටයුත්තක් ම ප්‍රතික්‍රොශ කෙරෙමි. භාග්‍යවතුන් වහන්සේගේ යම් ම භාෂිතයකත් අර්ථය නො දනිම් නම් එහි ලා මතුයෙහිදු භාග්‍යවතුන් වහන්සේ ම පුළුවුස්නෙම් "වහන්ස, මෙ කෙසේ ය, මෙහි අරුත් කවරැ?" යි. මෙහි ලා අපගේ කථාසල්ලාපයෙක් වේව යි.

වප්පයෙනි, එ කිමැයි සිතව, කායකර්මප්‍රත්‍යය කොට ඇති විඝාතපරිදාහ-කර වූ යම් ආශ්‍රව කෙනෙක් වෙත් නම් කායකර්මාන්තප්‍රත්‍යයෙන් විරත වූ ඔහට විඝාතපරිදාහකර වූ එ ආශ්‍රවයෝ නොවෙත් නම් හේ අභිනව කර්ම ද නො කෙරේ නම් පුරාතන කර්මය ද පැහැසැ පැහැසැ විගතාන්ත කෙරේ නම් කෙලෙස් දිරවන ප්‍රතිපත් සාන්දෘෂ්ටික වූවා අකාලික වූවා 'එව, බලව' යනුවට නිසි වූවා උපනයනාශී වූවා විඥයන් විසින් ප්‍රත්‍යාත්මයෙහි ලා වෙදිතව්‍ය වෙයි. වප්පය, තෝ යම් හෙයෙකින් දුඃඛවෙදනීය වූ ආශ්‍රවයෝ අභිසම්පරා-යෙහි පුරුෂයා ලුහුබඳනාහු නම් එබඳු කරුණක් දක්නෙහි දැ? යි වහන්ස, තෙල නැත්මැ යි.

වප්පය, වාක්කර්මප්‍රත්‍යයෙන් දුක් හා කායික චෛතසිකපරිදාහය ඇති-කරණ යම් ආශ්‍රව කෙනෙක් උපදනාහු නම් වාක්කර්මයෙන් වැළකී ඔහට දුඃඛපරිදාහ ඇතිකරණ එම ආශ්‍රවයෝ මෙ පරිද්දෙන් නොවන්නාහු නම් හෙ අභිනවකර්ම නො කෙරේ නම් පැරණි කර්ම ද පැහැසැ පැහැස විගතාන්ත කෙරේ නම් කෙලෙස් දිරවන ප්‍රතිපත් සාන්දෘෂ්ටික වූවා අකාලික වූවා එව බලව යන විධානයට නිසි වූවා උපනයනාශී වූවා විඥයන් විසින් ප්‍රත්‍යාත්ම-යෙහි ලා දතයුතු වෙ යි. වප්ප, තෝ යම් කරුණෙකින් දුඃඛවෙදනීය ආශ්‍රවයෝ පරලොවහි ලුහුබඳනාහු නම් එ කරුණ දක්හි දැ? යි වහන්ස, තෙල නො වේ ම ය.

තං කිං මඤ්ඤසි වප්ප, යෙ මනොසමාරම්භපච්චයා උප්පජ්ජන්ති ආසවා විඝාතපරිළාහා මනොසමාරම්භා පටිවිරතස්ස එවංස තෙ ආසවා විඝාතපරිළාහා න හොන්ති. සො නවඤ්ච කම්මං න කරොති. පුරාණඤ්ච කම්මං ඵුස්ස ඵුස්ස බ්‍යන්තීකරොති. සන්දිට්ඨිකා නිජ්ජරා අකාලිකා එහිපස්සිකා ඔපනයිකා පච්චත්තං වෙදිතබ්බා විඤ්ඤූහීති. පස්සසි නො ත්වං වප්ප තං ඨානං යතොනිදානං පුරිසං දුක්ඛවෙදනීයා ආසවා අස්සවෙය්‍යුං අභිසම්පරායන්ති? නො හෙතං භන්තෙ.

තං කිං මඤ්ඤසි වප්ප, යෙ අවිජ්ජාපච්චයා උප්පජ්ජන්ති ආසවා විඝාතපරිළාහා. අවිජ්ජාවිරාගා විජ්ජුප්පාදා එවංස තෙ ආසවා විඝාතපරිළාහා න හොන්ති. සො නවඤ්ච කම්මං න කරොති. පුරාණඤ්ච කම්මං ඵුස්ස ඵුස්ස බ්‍යන්තීකරොති සන්දිට්ඨිකා නිජ්ජරා අකාලිකා එහිපස්සිකා ඔපනයිකා පච්චත්තං වෙදිතබ්බා විඤ්ඤූහීති. පස්සසි නො ත්වං වප්ප තං ඨානං යතොනිදානං පුරිසං දුක්ඛවෙදනීයා ආසවා අස්සවෙය්‍යුං අභිසම්පරායන්ති? නො හෙතං භන්තෙ

එවං සම්මා විමුත්තචිත්තස්ස ඛො වප්ප භික්ඛුනො ඡ සතතවිහාරා අධිගතා හොන්ති. සො චක්ඛුනා රූපං දිස්වා නෙව සුමනො හොති, න දුම්මනො උපෙක්ඛකො විහරති සතො සම්පජානො. සොතෙන සද්දං සුත්වා -පෙ- ඝානෙන ගන්ධං ඝායිත්වා - පෙ - ජිව්හාය රසං සායිත්වා -පෙ- කායෙන ඵොට්ඨබ්බං ඵුසිත්වා - පෙ - මනසා ධම්මං විඤ්ඤාය නෙව සුමනො හොති න දුම්මනො උපෙක්ඛකො විහරති සතො සම්පජානො. සො කායපරියන්තිකං වෙදනං වෙදියමානො කායපරියන්තිකං වෙදනං වෙදියාමීති පජානාති. ජීවිතපරියන්තිකං වෙදනං වෙදියමානො ජීවිතපරියන්තිකං වෙදනං වෙදියාමීති පජානාති. කායස්ස භෙදා උද්ධං ජීවිතපරියාදානා ඉධෙව සබ්බවෙදයිතානි අනභිනන්දිතානි සීතීභවිස්සන්තීති පජානාති.

සෙය්‍යථාපි වප්ප ථූණං පටිච්ච ඡායා පඤ්ඤායති. අථ පුරිසො ආගච්ඡෙය්‍ය කුද්දාලපිටකං[1] ආදාය. සො තං ථූණං මූලෙ ඡින්දෙය්‍ය. මූලෙ ඡෙත්වා[2] පලිඛණෙය්‍ය. පලිඛණිත්වා මූලානි උද්ධරෙය්‍ය, අන්තමසො උසීරනාළි[3] මත්තානිපි. සො තං ථූණං ඛණ්ඩාඛණ්ඩිකං ඡින්දෙය්‍ය, ඛණ්ඩාඛණ්ඩිකං ඡෙත්වා[2] ඵාලෙය්‍ය. ඵාලෙත්වා සකලිකං සකලිකං කරෙය්‍ය. සකලිකං සකලිකං කරිත්වා[4] වාතාතපෙ විසොසෙය්‍ය. වාතාතපෙ විසොසෙත්වා අග්ගිනා ඩහෙය්‍ය. අග්ගිනා ඩහිත්වා[5] මසිං කරෙය්‍ය. මසිං කරිත්වා මහාවාතෙ වා ඔපුනෙය්‍ය. නදියා වා සීඝසොතාය පවාහෙය්‍ය. එවං හිස්ස වප්ප යා ථූණං පටිච්ච ඡායා, සා උච්ඡින්නමූලා තාලාවත්ථුකතා අනභාවකතා ආයතිං අනුප්පාදධම්මා.

එවමෙව ඛො වප්ප එවං සම්මා විමුත්තචිත්තස්ස භික්ඛුනො ඡ සතතවිහාරා අධිගතා හොන්ති: සො චක්ඛුනා රූපං දිස්වා නෙව සුමනො හොති, න දුම්මනො. උපෙක්ඛකො විහරති සතො සම්පජානො. සොතෙන සද්දං සුත්වා -පෙ- ඝානෙන ගන්ධං ඝායිත්වා -පෙ- ජිව්හාය රසං සායිත්වා -පෙ- කායෙන ඵොට්ඨබ්බං ඵුසිත්වා - පෙ - මනසා ධම්මං විඤ්ඤාය නෙව සුමනො හොති, න දුම්මනො. උපෙක්ඛකො විහරති සතො සම්පජානො. සො කායපරියන්තිකං වෙදනං වෙදියමානො කායපරියන්තිකං වෙදනං වෙදියාමීති පජානාති. ජීවිතපරියන්තිකං වෙදනං වෙදියමානො ජීවිතපරියන්තිකං වෙදනං වෙදියාමීති පජානාති කායස්ස භෙදා උද්ධං ජීවිතපරියාදානා ඉධෙව සබ්බවෙදයිතානි අනභිනන්දිතානි සීතීභවිස්සන්තීති පජානාතීති.

1 කුද්දලපිටකං - මජසං. 2. මූලෙ ඡින්දිත්වා - මජසං. 3. උසීරනාළිමත්තානිපි - මජසං. 4. කත්වා - මජසං. 5 ඩහිත්වා - මජසං.

වප්පය, මිථ්‍යාකර්මප්‍රත්‍යයෙන් දුඃඛපරිදාහ ඇතිකරණ යම් ආශ්‍රව කෙනෙක් උපදින් නම් මිථ්‍යාකර්මප්‍රත්‍යයෙන් වැළකියහුට විඝාතපරිදාහකර වූ මේ ආශ්‍රවයෝ වෙසෙසින් නොවන්නාහු නම් එ අභිනව කර්මන් නො කෙරේ නම් පැරණි කර්මන් පැහැසැ පැහැසැ විගතානන්ත කෙරේ නම් නිර්ජර ප්‍රතිපත් සාන්දෘෂ්ටික වූවා අකාලික වූවා එව බලව යන විධානයට නිසි වූවා උපනය- නාගී වූවා විඥයන් විසින් ප්‍රත්‍යාත්මයෙහිලා දතයුතු වෙයි. වප්පය, තෝ යම් කාරණෙකින් දුඃඛවෙදනීය ආශ්‍රවයෝ පරලොවිහිදී පුරුෂයා අනුබඳනාහු නම් එ කාරණු දක්හි දැයි? වහන්ස, නෙල නො වේ මැයි.

වප්පය, එ කිමැයි සිතව්, අවිද්‍යාප්‍රත්‍යයෙන් විඝාතපරිදාහකර යම් ආශ්‍රව- කෙනෙක් උපදනාහු නම් අවිද්‍යාවිරාගයෙන් විද්‍යා-උත්පාදයෙන් විඝාත පරිදාහකර එ ආශ්‍රවයෝ මෙ සෙයින් ඔහට නො වෙත් නම් හෙ අභිනව කර්මන් නො කෙරේ නම් පුරාතන කර්මන් පැහැසැ පැහැසැ විගතානන්ත කෙරේ නම් නිර්ජර ප්‍රතිපත් සාන්දෘෂ්ටික වූවා අකාලික වූවා එහි, පස්ස, යන විධියට නිසි වූවා උපනයනාගී වූවා විඥයන් විසින් තමන් තුළ ලා දතයුතු වූවා වෙයි. වප්පය, යම් කාරණයකින් දුඃඛවෙදනීය ආශ්‍රවයෝ පරලොවහි දී පුරුෂයා අනුබඳනාහු නම් එබඳු කාරණක් දක්හි දැයි? වහන්ස, නෙල නැත් මැ යි.

වප්පය, මෙසේ සම්‍යක් හෙතුයෙන් විමුක්තචිත්ත ඇති මහණහු විසින් ෂට් සතතවිහාර කෙනෙක් අධිගත වෙත්. හෙ චක්ෂුර්විඥානයෙන් රූපා- යතනයක් දැක සතුටු සිත් ඇතියේ නො මැ වෙයි. නො සතුටු සිත් ඇතියේ නො මැ වෙයි. ස්මෘති ඇතියේ සම්‍යක් ප්‍රඥා ඇතියේ උපෙක්ෂකව වෙසෙයි. ශ්‍රොත්‍රවිඥානයෙන් ශබ්දායතනයක් අසා. ඝ්‍රාණවිඥානයෙන් ගන්ධායතනයක් ඉව්සා...ජිහ්වාවිඥානයෙන් රසායතනයක් විඳ.. කායවිඥානයෙන් ස්ප්‍රෂ්ටව්‍යා- යතනයක් පැහැසැ...මනොවිඥානයෙන් ධර්මායතනයක් දැන නො ම සතුටු වෙයි, නො ම අසතුටු වෙයි. සිහි ඇතියේ මනා නුවණ ඇතියේ උපෙක්ෂකව වෙසෙයි. කායපරිවර්තිතා වූ (පඤ්චද්වාරික) වෙදනාව විඳිනුයේ කාය- පර්යන්තිකා වෙදනාව විඳිමි යි දන්නේ ය. ජීවිතපර්යන්තිකා වූ වෙදනාව විඳිනුයේ ජීවිතපර්යන්තිකා වෙදනාව විඳිමි යි දන්නේ ය. කරජකායයාගේ භෙදයෙන් ජීවිතක්ෂයයාගේ මතුයෙහි ඉහාත්මයෙහි ම හැම වෙදයිතයෙන් අනභිනන්දිත වූවාහු සිහිල් වන්නාහ යි දනිත්.

වප්පය, රුක නිසා සෙය යම්සේ පැනේ නම් ඉක්බිති පුරුෂයෙක් හුදලු හා පැසගෙණ එයි, හෙ එ රුක මුල්හි සිඳුනේ ය. මුල්හි සිඳ වටා කණනේ ය. වටා කැණ යටින් පිරිසෙසින් සුවඳගොට මුල් පමණ වූ ද මුල් උදුරනේ ය. හේ එ රුක කඩ - කඩ කොට සිඳුනේ ය. කඩ - කඩ කොට සිඳ පළනේ ය. පළා කැබැලි - කැබැලි කොට ගින්නෙන් දවන්නේ ය. ගින්නෙන් දවා හළු කරනේ ය. හළු කොට මහ සුළඟෙහි පොළා හරනේ ය සැඩදිය පහර ඇති නදියෙක හෝ පා කොට හරනේ ය. වප්පය, මෙසේ රුක නිසා යම් සෙයක් උදුරුන් මුල් ඇතියා තාලාවසතුකෘත වූවා අනභාවකෘත වූවා මතුයෙහි නො උපදනා සැහැවි ඇතිවූවා වේ ද,

වප්පය, එ සෙයින් ම මෙසේ සම්‍යක් විමුක්තචිත්ත ඇති භික්ෂුහු විසින් ෂට් සතතවිහාරයෝ අධිගත වෙත්. හෙ ඇසින් රූවක් දැක සොම්නස් ඇතියේ නොම වෙයි. දොම්නස් ඇතියේ නොම වෙයි. සිහි ඇතියේ මනා නුවණ ඇතියේ උපෙක්ෂකව වෙසෙයි. කණින් ශබ්දයක් අසා... නැහැයෙන් ගඳක් ඉව්සා ... දිවෙන් රසක් විඳ .... කයින් පැහැසිය යුත්තක් පැහැසැ ... මනසින් දහමක් දැන සොම්නස් ඇතියේ නොම වෙයි. දොම්නස් ඇතියේ නො ම වෙයි. සිහි ඇතියේ නුවණ ඇතියේ උපෙක්ෂකව වෙසෙයි, හෙ කායපර්යන්තිකා වෙදනා විඳිමින් කායපර්යන්තිකා වෙදනා විඳිමි යි දන්නේ ය. ජීවිතපර්යන්තිකා වෙදනා විඳිමින් ජීවිතපර්යන්තිකා වෙදනා විඳිමි යි දන්නේ ය කායභෙදයෙන් ජීවිතක්ෂයයෙන් මතුයෙහි මෙ අත්- බව්හි ම හැම වෙදයිතයෝ අනභිනන්දිත වූවාහු සිහිල් වන්නාහ යි දන්නේ යි.

එවං වුත්තෙ වප්පො සක්කො නිගණ්ඨසාවකො භගවන්තං එතදවොච: සෙය්‍යථාපි භන්තෙ පුරිසො උදයත්ථිකො අස්සපණියං පොසෙය්‍ය, සො උදයඤ්චෙව න ලභෙය්‍ය, උත්තරිං ච කිලමථස්ස විඝාතස්ස භාගී අස්ස. එවමෙව ඛො අහං භන්තෙ උදයත්ථිකො බාලෙ නිගණ්ඨෙ පයිරුපාසිං. සොහං[1] උදයඤ්චෙව නාධිගච්ඡිං[2] උත්තරිඤ්ච කිලමථස්ස විඝාතස්ස භාගී අහොසිං. එසාහං භන්තෙ අජ්ජතග්ගෙ යො මෙ බාලෙසු නිගණ්ඨෙසු පසාදො, තං මහාවාතෙ වා ඔපුනාමි, නදියා වා සීඝසොතාය පවාහෙමි. අභික්කන්තං භන්තෙ -පෙ- උපාසකං මං භන්තෙ භගවා ධාරෙතු අජ්ජතග්ගෙ පාණුපෙතං සරණං ගතන්ති.

## 4. 4. 5. 6.

### [ සාළ්හසුත්තං ]

46. එකං සමයං භගවා **වෙසාලියං** විහරති මහාවනෙ **කූටාගාරසාලායං**. අථ ඛො **සාළ්හො** ච ලිච්ඡවි **අභයො** ච ලිච්ඡවි යෙන භගවා තෙනුපසඞ්කමිංසු. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදිංසු. එකමන්තං නිසින්නො ඛො සාළ්හො ලිච්ඡවි භගවන්තං එතදවොච: සන්ති භන්තෙ එකෙ සමණබ්‍රාහ්මණා ද්වයෙන ඔඝස්ස නිත්ථරණං පඤ්ඤපෙන්ති සීලවිසුද්ධිහෙතු ච තපොජිගුච්ඡාහෙතු ච. ඉධ භන්තෙ භගවා කිමාහාති?

සීලවිසුද්ධිං ඛො අහං සාළ්හා අඤ්ඤතරං සාමඤ්ඤඞ්ගන්ති වදාමි. යෙ තෙ සාළ්හා සමණබ්‍රාහ්මණා තපොජිගුච්ඡාවාද තපොජිගුච්ඡාසාරා තපොජිගුච්ඡං අල්ලීනා විහරන්ති, අභබ්බා තෙ ඔඝස්ස නිත්ථරණාය. යෙපි තෙ සාළ්හා සමණබ්‍රාහ්මණා අපරිසුද්ධකායසමාචාරා අපරිසුද්ධවචීසමාචාරා අපරිසුද්ධමනොසමාචාරා අපරිසුද්ධාජීවා, අභබ්බා තෙ ඤාණදස්සනාය අනුත්තරාය සම්බොධාය.

සෙය්‍යථාපි සාළ්හා පුරිසො නදිං තරිතුකාමො තිණ්හං කුඨාරිං ආදාය වනං පවිසෙය්‍ය, සො තත්ථ පස්සෙය්‍ය මහතිං සාලලට්ඨිං උජුං නවං අකුක්කුකජාතං,[3] තමෙනං මූලෙ ඡින්දෙය්‍ය, මූලෙ ඡෙත්වා අග්ගෙ ඡින්දෙය්‍ය, අග්ගෙ ඡෙත්වා සාඛාපලාසං සුවිසොධිතං විසොධෙය්‍ය, සාඛාපලාසං සුවිසොධිතං විසොධෙත්වා කුඨාරීහි තච්ඡෙය්‍ය, කුඨාරීහි තච්ඡෙත්වා වාසීහි තච්ඡෙය්‍ය, වාසීහි තච්ඡෙත්වා ලෙඛනියා ලිඛෙය්‍ය, ලෙඛනියා ලිඛිත්වා පාසාණගුළෙන ධොපෙය්‍ය[4] පාසාණගුළෙන ධොපෙත්වා නදිං පතාරෙය්‍ය. තං කිං මඤ්ඤසි සාළ්හා භබ්බො නු ඛො සො පුරිසො නදිං තරිතුන්ති "නො හෙතං භන්තෙ". තං කිස්ස හෙතු? අසු හි භන්තෙ සාලලට්ඨි බහිද්ධා සුපරිකම්මකතා අන්තො අවිසුද්ධා. තස්සෙතං පාටිකඞ්ඛං: සාලලට්ඨි සංසීදිස්සති, පුරිසො අනයබ්‍යසනං ආපජ්ජිස්සතීති.

---

1. ස්වාහං - මජසං. 2. නාධිගච්ඡිං, මජසං. 3. අකුක්කුච්චජාතං - මජසං. අකුක්කුච්චකජාතං - සතා 4. ධොවෙය්‍ය - මජසං.

මෙසේ වදාළ කල්හි නුවටසවූ වප්ප ශාක්‍ය භග්‍යවතුන් වහන්සේට තෙල සැළ කෙළේ ය: වහන්ස, යම් පරිදි උදයාර්ථී වූ පුරුෂයෙක් අශ්වපණ්‍ය-යක් පුස්නේ නම් හේ ලාභ ද නො ලබන්නේ ය. මතුයෙහිත් කලම්පථයට දුඃඛයට භාගී වන්නේ ය. වහන්ස, එ පරිදි ම මම් උදයාර්ථියෙමි බාලනුවටුන් ඇසුරු කෙළෙමි. එ මම් උදයකුදු නො ලදිමි. මතුයෙහිත් කලම්පථයට දුඃඛයට භාගී වීමි. වහන්ස, තෙල මම් අද පටන් කොට මාගේ බාලනුවටුන් කෙරෙහි යම් සම්ප්‍රසාදයෙක් වී නම් එය මහසුළඟෙහි හෝ පොළා හරනෙමි. සැඩ දියපහර ඇති නදියෙක හෝ පා කොට හරනෙමි. වහන්ස, ඉතා කාන්ත යි. වහන්ස, ... භාග්‍යවතුන් වහන්සේ මා අදින් මතුයෙහි දිවිහිමියෙන් සරණගිය උපාසක කොට ධරණ සේක්වා !

## 4. 4. 5. 6

## [ සාළ්හ සූත්‍රය ]

46. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ **විසල්පුර** මහවෙනෙහි වූ කූටාගාරශාලායෙහි වසන සේක. එකල **සාළ්හලිච්ඡවී** ද **අභයලිච්ඡවී** ද භාග්‍යවතුන් වහන්සේ කරා එළඹියහ. එළඹ භාග්‍යවතුන් වහන්සේ වැඳ එකත්පසෙක හුන්හ. එකත්පසෙක හුන් සාළ්හලිච්ඡවී භාග්‍යවතුන් වහන්සේට තෙල කරුණ සැළ කෙළේය: වහන්ස, දෙ කොටසෙකින් චතුරොඝනිස්තරණය පණවන ඇතැම් මහණබමුණෝ ඇත. සීලවිසුද්ධි-හේතුයෙන, තපොජිගුච්ඡාහෙතුයෙන යි. වහන්ස, මෙ කරුණෙහි ලා භාග්‍යවතුන් වහන්සේ කුමක් වදාරණ සේක්ද ?

සාළ්හයෙනි, මම් ශිලවිශුද්ධිය අන්‍යතර ශ්‍රමණධර්ම කොටස්හසෙකැ යි කියමි, සාළ්හයෙනි, තපොජුගුප්සාවාද ඇති තපොජුගුප්සාව සාරය කොට ඇති තපොජුගුප්සායෙහි ඇලුනු යම් ඒ මහණබමුණු කෙනෙක් වෙත් නම් ඔහු චතුරොඝනිස්තරණයට අභව්‍ය වෙති. සාළ්හයෙනි, අපරිශුද්ධකාය-කර්මාන්ත ඇති අපරිශුද්ධවාක්කර්මාන්ත ඇති අපරිශුද්ධමනඃකර්මාන්ත ඇති අපරිශුද්ධආජීවය ඇති යම් ඒ මහණබමුණු කෙනෙක් වෙත් නම් මාර්ගඥාන-සඞ්ඛ්‍යාත දර්ශනයට අනුත්තරසම්බොධිසඞ්ඛ්‍යාත අභීත්ඛයට ඔහු අභව්‍ය වෙති.

සාළ්හයෙනි, යම් පරිදි නදියක් තරණය කරණු කැමැති පුරුෂයෙක් තියුණු පොරොවක් ගෙණ වලට වදනේ නෙ එහි මහත්, වූ ඍජු වූ තරුණ වූ (අකුක්කුච්චකජාතකං-) නොදුත විසයුතු කුකුස් ඇති* සල් රුකක් දක්නේ ය. තෙල රුක මුල්හි සිඳුනේ ය. මුල්හි සිඳ අග්හි සිඳුනේ ය. අග්හි සිඳ අතු පතර සුවිසොධිත කොට පිරිසිදු කරණේ ය. අතුපතර සුවිසොධිතයේ පිරිසුදු කොට පොරොවෙන් සස්නේ ය. පොරොවෙන් සැස වෑයෙන් සස්නේ ය. වෑයෙන් සැස ලියනසැතින් ලියනේ ය. ලියන සැතින් ලියා වහණගුලින් ගටනේ ය. වහණගුලින් ගටා නදී තරණයට වෑයම් කරන්නේ ය. සාළ්හයෙනි, එ කිමැ යි සිතවු දෑ එ පුරිස් නදිය තරණට භව්‍ය වේ දෝ යි? වහන්ස තෙල නොවේ මැ යි. ඒ කවර හෙයින යත්: වහන්ස, අසෝ සල්යට පිටත මනා පිරියම් කරණ ලදුයේ ඇතුළත අවිශුද්ධ වෙයි. ඔහු විසින් තෙල කැමති විය යුතු: සල්යට ගිළෙන්නේ ය. පුරුෂයා අනයව්‍යසනයට පැමිණේ ය යි.

---

* පෙළෙහි "අකුක්කුකජාතකං" යනු පමිාදනෙහි එහි ආඬො ලිපිය (සත්‍ය: පාඨය) ශුද්ධයෙන් සැලකන්නේය.



Free Distribution www.aathaapi.org

එවමෙව ඛො සාළ්හා යෙ තෙ සමණබ්‍රාහ්මණා තපොජිගුච්ඡාවාදා තපොජිගුච්ඡාසාරා තපොජිගුච්ඡං අල්ලීනා විහරන්ති, අභබ්බා තෙ ඔඝස්ස නිත්ථරණාය. යෙපි තෙ සාළ්හා සමණබ්‍රාහ්මණා අපරිසුද්ධකායසමාචාරා අපරිසුද්ධවචීසමාචාරා අපරිසුද්ධමනොසමාචාරා අපරිසුද්ධාජීවා, අභබ්බා තෙ ඤාණදස්සනාය අනුත්තරාය සම්බොධාය.

යෙ ච ඛො තෙ සාළ්හා සමණබ්‍රාහ්මණා න තපොජිගුච්ඡාවාදා න තපොජිගුච්ඡාසාරා න තපොජිගුච්ඡං අල්ලීනා විහරන්ති, භබ්බා තෙ ඔඝස්ස නිත්ථරණාය. යෙපි තෙ සාළ්හා සමණබ්‍රාහ්මණා පරිසුද්ධකායසමාචාරා පරිසුද්ධවචීසමාචාරා පරිසුද්ධමනොසමාචාරා පරිසුද්ධාජීවා, භබ්බා තෙ ඤාණදස්සනාය අනුත්තරාය සම්බොධාය.

සෙය්‍යථාපි සාළ්හා පුරිසො නදිං තරිතුකාමො තිණ්හං කුඨාරිං ආදාය වනං පවිසෙය්‍ය, සො තත්ථ පස්සෙය්‍ය මහතිං සාලලට්ඨිං උජුං නවං අකුක්කුච්චකජාතං* තමෙනං මූලෙ ඡින්දෙය්‍ය, මූලෙ ඡෙත්වා අග්ගෙ ඡින්දෙය්‍ය, අග්ගෙ ඡෙත්වා සාඛාපලාසං සුවිසොධිතං විසොධෙය්‍ය, සාඛාපලාසං සුවිසොධිතං විසොධෙත්වා කුඨාරීහි තච්ඡෙය්‍ය, කුඨාරීහි තච්ඡෙත්වා වාසීහි තච්ඡෙය්‍ය, වාසීහි තච්ඡෙත්වා නිඛාදනං ආදාය අන්තො සුවිසොධිතං විසොධෙය්‍ය, අන්තො සුවිසොධිතං විසොධෙත්වා ලෙඛනියා ලිඛෙය්‍ය, ලෙඛනියා ලිඛිත්වා පාසාණගුළෙන ධොපෙය්‍ය, පාසාණගුළෙන ධොපෙත්වා නාවං කරෙය්‍ය, නාවං කරිත්වා පියාරිත්තං බන්ධෙය්‍ය, පියාරිත්තං බන්ධිත්වා නදිං පතාරෙය්‍ය, තං කිං මඤ්ඤථ සාළ්හා භබ්බො නු ඛො සො පුරිසො නදිං තරිතුන්ති? එවං භන්තෙ. තං කිස්ස හෙතු? අසු හි භන්තෙ සාලලට්ඨි බහිද්ධා සුපරිකම්මකතා අන්තො සුසුද්ධා නාවා කතා, පියාරිත්තං බද්ධං. තස්සෙතං පාටිකඞ්ඛං: නාවා න සංසීදිස්සති. පුරිසො සොත්ථිනා පාරං ගමිස්සතීති.

එවමෙව ඛො සාළ්හා යෙ තෙ සමණබ්‍රාහ්මණා න තපොජිගුච්ඡාවාදා න තපොජිගුච්ඡාසාරා න තපොජිගුච්ඡං අල්ලීනා විහරන්ති, භබ්බා තෙ ඔඝස්ස නිත්ථරණාය. යෙපි තෙ සාළ්හා සමණබ්‍රාහ්මණා පරිසුද්ධකායසමාචාරා පරිසුද්ධවචීසමාචාරා පරිසුද්ධමනොසමාචාරා පරිසුද්ධාජීවා, භබ්බා තෙ ඤාණදස්සනාය අනුත්තරාය සම්බොධාය.

සෙය්‍යථාපි සාළ්හා යොධාජීවො බහූනි චෙපි කණ්ඩචිත්තකානි ජානාති, අථ ඛො සො තීහි ඨානෙහි රාජාරහො හොති රාජභොග්ගො. රඤ්ඤො අඞ්ගන්ත්වෙව සඞ්ඛං ගච්ඡති. කතමෙහි තීහි? දූරෙපාතී ච, අක්ඛණවෙධී ච, මහතො ච කායස්ස පදාලෙතා.

සෙය්‍යථාපි සාළ්හා යොධාජීවො දූරෙපාතී, එවමෙව ඛො සාළ්හා අරියසාවකො සම්මාසමාධි හොති. සම්මාසමාධි සාළ්හා අරියසාවකො යං කිඤ්චි රූපං අතීතානාගතපච්චුප්පන්නං අජ්ඣත්තං වා බහිද්ධා වා ඔළාරිකං වා සුඛුමං වා හීනං වා පණීතං වා යං දූරෙ සන්තිකෙ වා සබ්බං රූපං නෙතං මම නෙසොහමස්මි, න මෙසො අත්තාති, එවමෙතං යථාභූතං සම්මප්පඤ්ඤාය පස්සති යා කාචි වෙදනා -පෙ- යා කාචි සඤ්ඤා -පෙ- යෙ කෙචි සඞ්ඛාරා -පෙ- යං කිඤ්චි විඤ්ඤාණං අතීතානාගතපච්චුප්පන්නං අජ්ඣත්තං වා බහිද්ධා වා ඔළාරිකං වා සුඛුමං වා හීනං වා පණීතං වා යං දූරෙ සන්තිකෙ වා සබ්බං විඤ්ඤාණං නෙතං මම, නෙසොහමස්මි, න මෙසො අත්තාති එවමෙතං යථාභූතං සම්මප්පඤ්ඤාය පස්සති

* 'උජුං නවං අකුක්කුච්චකජාතං'ති මරම්මපොත්ථකෙ දිස්සති, [illegible]

සාළ්හයෙනි, එපරිදි ම තපොජිගුප්සාවාද කියන තපොජිගුප්සාව හර කොට ගත් තපොජිගුප්සායෙහි ඇලුනු යම් ඒ මහණ බමුණු කෙනෙක් වෙසෙත් නම් ඔහු ඔඝනිස්තරණයට අභව්‍ය වෙති. සාළ්හයෙනි, අපරිශුද්ධ කායසමාචාර ඇති අපරිශුද්ධ වචීසමාචාර ඇති අපරිශුද්ධමනඃසමාචාර ඇති අපරිශුද්ධාජීව ඇති යම් ඒ මහණ බමුණු කෙනෙක් වෙත් නම් ඔහු ඥානදර්ශනයට අනුත්තර සම්බෝධියට අභව්‍ය වෙත්.

සාළ්හයෙනි, තපොජිගුප්සාවාද නො කියන තපොජිගුප්සා හර කොට නො ගත් තපොජිගුප්සායෙහි නො ඇලී යම් එ මහණ බමුණු කෙනෙක් වෙසෙත් නම් ඔහු ඔඝනිස්තරණයට භව්‍ය වෙති. සාළ්හයෙනි, පරිශුද්ධ කායසමාචාර ඇති පරිශුද්ධ වචීසමාචාර ඇති පරිශුද්ධමනඃසමාචාර ඇති පරිශුද්ධාජීව ඇති යම් එ මහණ බමුණු කෙනෙක් වෙත් නම් ඔහු ඥානදර්ශනයට අනුත්තර සම්බෝධියට භව්‍ය වෙති.

සාළ්හයෙනි, යම් පරිදි නදී තරණයට රිසි පුරිස් තියුණු පොරෝ ගෙණ වනයට වදනේ වේ ද, හේ එ වෙනෙහි මහත් වූ සෘජු වූ තරුණ වූ නො දුනම්ය යුතු කුකුස් ඇති (නිසැක) සල්රුකක් දක්නේ ය. තෙල රුක මුල්හි සිඳුනේ ය. මුල්හි සිඳ අග්හි සිඳුනේ ය. අග්හි සිඳ අතුපතර සුවිසොධිතසේ පිරිසිදු කරණේ ය. අතුපතර සුවිසොධිත සෙ පිරිසිදු කොට පොරොවෙන් සස්නේ ය. පොරොවෙන් සැස වෑයෙන් සස්නේ ය. වෑයෙන් සැස නියනක් ගෙණ ඇතුළත සුවිසෝධිත කොට පිරිසිදු කරණේ ය. ඇතුළත සුවිසොධිත සේ පිරිසිදු කොට නියනෙන් ලියනේ ය. නියනින් ලියා වහණගුළින් ගටනේ ය. වහණගුළින් ගටා හොරුවක් කරණේ ය. හොරුවක් කොට පලුපත් හා රිටි බඳනේ ය. පලුපත් හා රිටි බැඳ නදිය තරණේ ය. සාළ්හයෙනි, ඒ කිමැයි හඟිහු ද, එ පුරිස් නදීතරණයට භව්‍ය වේ දැ යි? වහන්ස, තෙල එසේ ය. එ කවර හෙයින යත්: වහන්ස, අසෝ සල්යට බැහැර සුපිරියම් කරණ ලදුයේ ඇතුළත මොනොවට ශුද්ධ වූයේ කළ හොරුවක් වූයේ පලුපත් හා රිටි බඳනා ලදුයේ වෙයි. ඔහු විසින් තෙල කැමැති වියයුතු: හොරුව නො ගිලෙන්නේ ය. පුරිස් නිරුපද්‍රවයෙන් එතෙර යන්නේ ය යි.

සාළ්හයෙනි, එපරිද්දෙන්ම තපෝජිගුප්සාවාද නොකියන තපොජිගුප්සා හර කොට ඇති තපොජිගුප්සාවට නො ඇලුනු යම් ඒ මහණ බමුණු කෙනෙක් වෙසෙත් නම් ඔහු ඔඝනිස්තරණයට භව්‍යයහ. සාළ්හයෙනි, එ මහණ බමුණෝ පිරිසිදු කායසමාචාර ඇතියාහු පිරිසිදු වාක්සමාචාර ඇතියාහු පිරිසිදු මනඃසමාචාර ඇතියාහු පිරිසිදු ආජීව ඇතියාහු වෙති. ඔහු ඥානදර්ශනයට අනුත්තරසම්බෝධියට භව්‍යයහ.

සාළ්හයෙනි, යම් පරිදි යෝධාජීවයෙක් නොයෙක් කාණ්ඩ (සර) චිත්‍ර දන්නේ ය. වැලිදු හේ තුන් කරුණෙකින් ම රාජාර්හ වෙයි. රාජභොග්‍ය වෙයි. රජුගේ අඞ්ගයෙකැයි යන සංඛ්‍යාවට ම යෙයි. කවර තුණෙකින. යත්: දුර හී හෙළන සුලු ද වෙයි. විදුලි එළියෙන් විදුනේත් වෙයි. මහත් කය බිඳ හෙළනුයෙත් වෙයි.

සාළ්හයෙනි, යම් සෙයෙකින් යොධාජීව දුර හී විදිනසුලු වේ ද, සාළ්හයෙනි, එ පරිදි ම අරිසවු සම්‍යක් සමාධි ඇතියේ වෙයි. සාළ්හයෙනි, සම්‍යක් සමාධි ඇති අරිසවු අතීතානාගත ප්‍රත්‍යුත්පන්න වේවයි, ආධ්‍යාත්මික වේවයි, බාහිර වේවයි, ඖදාරික වේවයි, සූක්ෂම වේවයි, හීන වේවයි, ප්‍රණීත වේවයි, යම් රූපයෙක් දුරෙහි වේවයි, ළඟමෙහි වේවයි, යම් කිසි රූපයෙක් වේ නම් එ හැම රූපය තෙල මා ගැන්නේ නො වෙයි, මම් තෙල රූපයෙම් නො වෙම්, තෙල මාගේ ආත්ම ද නො වෙයි. මෙසේ තෙල සම්‍යක් ප්‍රඥයෙන් තත්වූ පරිදි දක්නේ ය. යම් කිසි වෙදනායෙක් යම් කිසි සංඥයෙක් .... යම් කිසි සංස්කාරයෙක් .... යම් කිසි විඥානයෙක් අතීත අනාගත ප්‍රත්‍යුත්පන්න වේවයි, ආධ්‍යාත්මික වේවයි, බාහිර වේවයි, ඖදාරික වේවයි, සූක්ෂම වේවයි, හීන වේවයි, ප්‍රණීත වේවයි, යමක් දුරෙහි වේවයි, ළඟමෙහි වේවයි, එ හැම විඥාන තෙල මා ගැන්නේ නො වේ, මම් තෙල විඥානයෙම් නො වෙම්, තෙල මාගේ ආත්ම ද නො වේ යි. මෙසේ තෙල යථාභූතය සම්‍යක් ප්‍රඥයෙන් දක්නේ ය.

සෙය්‍යථාපි සාළ්හා යොධාජීවො අක්ඛණවෙධී, එවමෙව ඛො සාළ්හා අරියසාවකො සම්මාදිට්ඨි හොති. සම්මාදිට්ඨි සාළ්හා අරියසාවකො 'ඉදං දුක්ඛ'න්ති යථාභූතං පජානාති -පෙ- 'අයං දුක්ඛසමුදයො'ති -පෙ- 'අයං දුක්ඛනිරොධො'ති -පෙ- 'අයං දුක්ඛනිරොධගාමිනී පටිපදා'ති යථාභූතං පජානාති.

සෙය්‍යථාපි සාළ්හා යොධාජීවො මහතො කායස්ස පදාලෙතා, එවමෙව ඛො සාළ්හා අරියසාවකො සම්මාවිමුත්ති හොති. සම්මාවිමුත්ති සාළ්හා අරියසාවකො මහන්තං අවිජ්ජාක්ඛන්ධං පදාලෙතීති.

## 4. 4. 5. 7.

## මල්ලිකාසුත්තං

47. එකං සමයං භගවා **සාවත්ථියං** විහරති **ජෙතවනෙ අනාථපිණ්ඩිකස්ස** ආරාමෙ. අථ ඛො **මල්ලිකා** දෙවී යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නා ඛො මල්ලිකා දෙවී භගවන්තං එතදවොච:

කො නු ඛො භන්තෙ හෙතු කො පච්චයො, යෙන මිධෙකච්චො මාතුගාමො දුබ්බණ්ණා ච හොති දුරූපා සුපාපිකා දස්සනාය, දලිද්දා ච හොති අප්පස්සකා අප්පභොගා අප්පෙසක්ඛා ච?

කො පන භන්තෙ හෙතු කො පච්චයො, යෙන මිධෙකච්චො මාතුගාමො දුබ්බණ්ණා ච හොති දුරූපා සුපාපිකා දස්සනාය, අඩ්ඪා ච හොති මහද්ධනා මහාභොගා මහෙසක්ඛා ච?

කො නු ඛො භන්තෙ හෙතු කො පච්චයො, යෙන මිධෙකච්චො මාතුගාමො අභිරූපා හොති දස්සනීයා පාසාදිකා පරමාය වණ්ණපොක්ඛරතාය සමන්නාගතා, දලිද්දා ච හොති අප්පස්සකා අප්පභොගා අප්පෙසක්ඛා ච?

කො පන භන්තෙ හෙතු කො පච්චයො, යෙන මිධෙකච්චො මාතුගාමො අභිරූපා ච හොති දස්සනීයා පාසාදිකා පරමාය වණ්ණපොක්ඛරතාය සමන්නාගතා, අඩ්ඪා ච හොති මහද්ධනා මහාභොගා මහෙසක්ඛා චාති?

ඉධ මල්ලිකෙ එකච්චො මාතුගාමො කොධනා හොති උපායාසබහුලා අප්පම්පි වුත්තා සමානා අභිසජ්ජති කුප්පති බ්‍යාපජ්ජති පතිට්ඨීයති. කොපඤ්ච දොසඤ්ච අප්පච්චයඤ්ච පාතුකරොති. සා හොති න දාතා සමණස්ස වා බ්‍රාහ්මණස්ස වා අන්නං පානං වත්ථං යානං මාලාගන්ධවිලෙපනං සෙය්‍යාවසථපදීපෙය්‍යං, ඉස්සාමනිකා ඛො පන හොති පරලාභසක්කාරගරුකාරමානනවන්දනපූජනාසු ඉස්සති උපදුස්සති ඉස්සං බන්ධති. සා චෙ තතො චුතා ඉත්ථත්තං ආගච්ඡති. සා යත්ථ යත්ථ පච්චාජායති, දුබ්බණ්ණා ච හොති දුරූපා ච සුපාපිකා දස්සනාය, දලිද්දා ච හොති අප්පස්සකා අප්පභොගා අප්පෙසක්ඛා ච.

සාළ්හයෙනි, යම් පරිද්දෙකින් යෝධාජීව විදුලි එළියෙන් විදින පුද්ගලයේ නම් සාළ්හයෙනි, එ පරිදි ම ආර්යශ්‍රාවක සම්‍යක් දෘෂ්ටි ඇත්තේ වෙයි. සාළ්හයෙනි, සම්‍යක් දෘෂ්ටි ඇති ආර්යශ්‍රාවක 'මේ පඤ්චස්කන්ධ දුකැ'යි .... 'මේ තෘෂ්ණාව දුඃඛ සමුදය'යි 'මේ තෘෂ්ණා විරාගය දුඃඛ නිරෝධය'යි ... 'මේ ආර්යඅෂ්ටාඞ්ගිකමාර්ගය දුඃඛනිරෝධගාමිනී ප්‍රතිපත්'යි යථාභූතය දනී.

සාළ්හයෙනි, යම් පරිදි යෝධාජීව මහත්කාය බිඳුනා පුද්ගලයේ නම්, සාළ්හයෙනි, එපරිදි ම ආර්යශ්‍රාවක සම්‍යක් විමුක්ති ඇත්තේ වෙයි. සාළ්හයෙනි, සම්‍යක් විමුක්ති ඇති ආර්යශ්‍රාවක මහත් වූ අවිද්‍යාස්කන්ධය බිඳුනේ යි.

## 4. 4. 5. 7.

## [ මල්ලිකා සූත්‍රය ]

47. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ **සැවැත්** නුවර **ජේතවනයෙහි අනේපිඬු** සිටුහුගේ අරම්හි වසන සේක. එකල්හි **මල්ලිකා** දේවී භාග්‍යවතුන් වහන්සේ කරා එළඹියා. එළඹ භාග්‍යවතුන් වහන්සේ වඳා එකත්පස්ව හුනු. එකත්පස්ව හුන් මල්ලිකා දේවිය භාග්‍යවතුන් වහන්සේට මෙය සැළ කළා:

"වහන්ස, මෙ ලොව්හි ඇතැම් මාගමක් යම් හෙයෙකින් දුර්වර්ණ හා විරූපිණී හා දක්නට අතිශය ලාමක හා වේ නම්, දිළිඳු වූවා නමා ස්තු අල්පධනධාන්‍ය ඇතියා අල්පභොග ඇතියා අල්පේශාක්‍ය වූවා ද වේ නම් එයට හේතු කවරේ ය? ප්‍රත්‍යය කවරේ ය?

වහන්ස, මෙ ලොව්හි ඇතැම් මාගමක් දුර්වර්ණ හා දුරූපිණී හා දක්නට ඉතා ලමු වූවා, ආඪ්‍ය ද මහත් ධන ඇත්තී ද මහත් භොග ඇත්තී ද මහෙශාක්‍ය ද වේ නම් එයට හෙතු කවරේ ය? ප්‍රත්‍යය කවරේ ය?

වහන්ස, මෙ ලොව්හි ඇතැම් මාගමක් විශිෂ්ට රූ ඇත්තී දර්ශනීය වූවා දුටුවන් පහදවන්නී උතුම් වර්ණසෞන්දර්යයෙන් සමන්වාගත වූවා, දිළිඳු ද වූවා අල්පසවක වූවා අල්පභොග වූවා අල්පේශාක්‍ය ද වූවා නම් එයට හේතු කවරේ ය? ප්‍රත්‍යය කවරේ ය?

වහන්ස, යම් හෙයෙකින් මෙ ලොව්හි ඇතැම් මාගමක් අභිරූප ඇත්තී දර්ශනීය වූවා ප්‍රසාද එළවන්නී උත්තම වර්ණසෞන්දර්යයෙන් සමන්වාගත වූවා, ආඪ්‍ය වූවා මහත් ධන හා මහත් භෝග ද ඇත්තී මහෙශාක්‍ය ද වේ නම් එයට හේතු කවරේ ය? ප්‍රත්‍යය කවරේ ය?

මල්ලිකාවෙනි, මෙ ලොව්හි ඇතැම් මාගමක් උපායාස බහුල කොට ඇත්තී කිපෙනසුලු වෙයි මඳකුදු කියන ලද්දී ම ගැටෙයි කිපෙයි. ප්‍රකෘතිය හරණේ යි. තද වෙයි. කෝපයත් ද්වේෂයත් අප්‍රීතියත් පහළ කෙරෙයි. ඕ මහණකුට බමුණකුට වේවයි අහර පැන් වස්ත්‍ර යාන මල් ගඳ විලෙවුන් ශය්‍යා ආවාස ප්‍රදීපොපකරණ නො දෙන්නී වෙයි. ඊර්ෂ්‍යායෙන් යුත් සිත් ඇත්තී වෙයි. මෙරමාගේ ලාභසත්කාර ගුරුකාර මානන වන්දන පූජායෙහි ඊර්ෂ්‍යා කෙරෙයි. ද්වේෂ කෙරෙයි. ඊර්ෂ්‍යා බඳියි. ඕ ඉදින් ඉන් ච්‍යුත වූවා ඉගාත්මභාවයට ඒ නම් ඕ යම් ම තැනෙක උපදී නම් දුර්වර්ණ ද වෙයි. දුරූපිණී ද වෙයි. දක්නට ඉතා ලමු ද වෙයි අල්පසවක වූවා අල්පභොග වූවා අල්පේශාක්‍ය ද වූවා දිළිඳු ද වෙයි.

ඉධ පන මල්ලිකෙ එකච්චො මාතුගාමො කොධනා හොති උපායාසබහුලා අප්පම්පි වුත්තා සමානා අභිසජ්ජති කුප්පති බ්‍යාපජ්ජති පතිත්ථීයති. කොපඤ්ච දොසඤ්ච අප්පච්චයඤ්ච පාතුකරොති. සා දාතා හොති සමණස්ස වා බ්‍රාහ්මණස්ස වා අන්නං පානං වත්ථං යානං මාලාගන්ධවිලෙපනං සෙය්‍යාවසථපදීපෙය්‍යං. අනිස්සාමනිකා ඛො පන හොති පරලාභසක්කාරගරුකාරමානනවන්දනපූජනාසු. න ඉස්සති න උපදුස්සති න ඉස්සං බන්ධති. සා චෙ තතො චුතා ඉත්ථත්තං ආගච්ඡති, සා යත්ථ යත්ථ පච්චාජායති, දුබ්බණ්ණා ච හොති දුරූපා සුපාපිකා දස්සනාය. අඩ්ඪා ච හොති මහද්ධනා මහාභොගා මහෙසක්ඛා ච.

ඉධ පන මල්ලිකෙ එකච්චො මාතුගාමො අක්කොධනා හොති අනුපායාසබහුලා බහුම්පි වුත්තා සමානා නාභිසජ්ජති න කුප්පති න බ්‍යාපජ්ජති න පතිත්ථීයති. න කොපඤ්ච දොසඤ්ච අප්පච්චයඤ්ච පාතුකරොති. සා න දාතා හොති සමණස්ස වා බ්‍රාහ්මණස්ස වා අන්නං පානං වත්ථං යානං මාලාගන්ධවිලෙපනං සෙය්‍යාවසථපදීපෙය්‍යං. ඉස්සාමනිකා ඛො පන හොති පරලාභසක්කාරගරුකාරමානනවන්දනපූජනාසු ඉස්සති උපදුස්සති ඉස්සං බන්ධති. සා චෙ තතො චුතා ඉත්ථත්තං ආගච්ඡති, සා යත්ථ යත්ථ පච්චාජායති, අභිරූපා ච හොති දස්සනීයා පාසාදිකා පරමාය වණ්ණපොක්ඛරතාය සමන්නාගතා. දළිද්දා ච හොති අප්පස්සකා අප්පභොගා අප්පෙසක්ඛා ච.

ඉධ පන මල්ලිකෙ එකච්චො මාතුගාමො අක්කොධනා හොති අනුපායාසබහුලා බහුම්පි වුත්තා සමානා නාභිසජ්ජති න කුප්පති න බ්‍යාපජ්ජති න පතිත්ථීයති. න කොපඤ්ච දොසඤ්ච අප්පච්චයඤ්ච පාතුකරොති. සා දාතා හොති සමණස්ස වා බ්‍රාහ්මණස්ස වා අන්නං පානං වත්ථං යානං මාලාගන්ධවිලෙපනං සෙය්‍යාවසථපදීපෙය්‍යං. අනිස්සාමනිකා ඛො පන හොති පරලාභසක්කාරගරුකාරමානනවන්දනපූජනාසු. න ඉස්සති න උපදුස්සති න ඉස්සං බන්ධති. සා චෙ තතො චුතා ඉත්ථත්තං ආගච්ඡති, සා යත්ථ යත්ථ පච්චාජායති අභිරූපා ච හොති දස්සනීයා පාසාදිකා පරමාය වණ්ණපොක්ඛරතාය සමන්නාගතා. අඩ්ඪා ච හොති මහද්ධනා මහාභොගා මහෙසක්ඛා ච.

අයං ඛො මල්ලිකෙ හෙතු අයං පච්චයො යෙන මිධෙකච්චො මාතුගාමො දුබ්බණ්ණා ච හොති දුරූපා සුපාපිකා දස්සනාය, දළිද්දා ච හොති අප්පස්සකා, අප්පභොගා අප්පෙසක්ඛා ච.

අයං පන මල්ලිකෙ හෙතු අයං පච්චයො යෙන මිධෙකච්චො මාතුගාමො දුබ්බණ්ණා ච හොති දුරූපා සුපාපිකා දස්සනාය, අඩ්ඪා ච හොති මහද්ධනා මහාභොගා මහෙසක්ඛා ච.

අයං ඛො මල්ලිකෙ හෙතු අයං පච්චයො යෙන මිධෙකච්චො මාතුගාමො අභිරූපා ච හොති දස්සනීයා පාසාදිකා පරමාය වණ්ණපොක්ඛරතාය සමන්නාගතා දළිද්දා ච හොති අප්පස්සකා අප්පභොගා අප්පෙසක්ඛා ච

මල්ලිකාවෙනි, මේ ලොව්හි ඇතැම් මාගමක් උපායාස බහුල කොට ඇත්තී කිපෙනසුලු වෙයි. මඳකුදු කියන ලද්දීම ලැගෙයි. කිපෙයි. සැහැවි හරියි. කොවින් තද වෙයි. කෝප හා ද්වේෂ හා අප්‍රත්‍යය හා පාළු කෙරෙයි ඕ මහණකුට වේවයි බමුණකුට වේවයි ආහාර පාන වස්ත්‍ර යාන මල් ගඳ විලෙවුන් ශයන්‍යා ආවසථ හා ප්‍රදීපොපකරණ දෙනු වෙයි මෙරමාගේ ලාභ සත්කාර ගුරුකාර මානන වන්දන පූජනායෙහි ඊර්ෂ්‍යායෙන් තොර සිත් ඇත්තී ඊර්ෂ්‍යා නො කරයි. ද්වේෂ නො කරයි. ඊර්ෂ්‍යා නො බඳියි. ඉදින් ඕ ඉතො ච්‍යුත වූවා මේ අත්බවට ඒ නම්, ඕ යම් ම තැනෙක උපදී නම්, දුර්වර්ණී ද වෙයි. දුරූපිණී ද වෙයි. දක්නට ඉතා ලමු ද වෙයි. මහත් ධන මහා භොග ඇත්තී ආඪ්‍ය ද වෙයි. මහෙශාක්‍ය ද වෙයි.

මල්ලිකාවෙනි, මේ ලොව්හි ඇතැම් මාගමක් උපායාස බහුල කොට නැත්තී නො කිපෙනසුලු වෙයි. බොහෝ කොට කියන ලද තමුදු නො-ලැගෙයි. නො කිපෙයි. සැහැවි නො හරියි. කොවින් තද නො වෙයි. කෝප හා ද්වේෂ හා අප්‍රත්‍යය හා පාළු නො කෙරෙයි. ඕ මහණකුට වේවයි බමුණකුට වේවයි අන්නපාන වස්ත්‍රයාන මාලාගන්ධ විලෙපන ශයන්‍යා ආවසථ හා ප්‍රදීපොප-කරණ නො දෙනු වෙයි. මෙරමාගේ ලාභ සත්කාර ගුරුකාර මානන වන්දන පූජනායෙහි ඉසිමත් ඇත්තී ඊර්ෂ්‍යා කෙරෙයි ද්වේෂ කෙරෙයි. ඊර්ෂ්‍යා බඳියි. ඕ ඉදින් එයින් ච්‍යුත වූවා මේ අත්බවට ඒ නම්, ඕ යම් ම තැනෙක උපදිනී නම්, අභිරූප ඇති වෙයි. දර්ශනීය වෙයි. පහදවන්නී වෙයි. උත්තම වර්ණසෞන්දර්යයෙන් සමන්වාගත වෙයි. අල්පසවක වූවා අල්පභොග වූවා දිළිඳු ද වෙයි. අල්පෙශාක්‍ය ද වෙයි.

මල්ලිකාවෙනි, මේ ලොව්හි ඇතැම් මාගමක් උපායාස බහුල කොට නැත්තී නො කිපෙනසුලු වෙයි. බොහෝ කොට කියන ලද ද නො ලැගෙයි. නො කිපෙයි සැහැවි නො හරියි කොවින් නො තද වෙයි. කෝප හා ද්වේෂ හා අප්‍රත්‍යය හා පාළු නො කෙරෙයි. ඕ මහණකුට වේවයි බමුණකුට වේවයි අන්නපාන වස්ත්‍ර යාන මාලාගන්ධ විලෙපන ශයන්‍යා ආවසථ හා ප්‍රදීපෙය දෙයි. පරලාභ සත්කාර ගුරුකාර මානන වන්දන පූජනායෙහි ඊර්ෂ්‍යායෙන් නො වැඹුනු සිත් ඇත්තී ඊර්ෂ්‍යා නො කරයි. ද්වේෂ නො කරයි. ඊර්ෂ්‍යා නො බඳියි. ඕ ඉදින් එයින් ච්‍යුත වූවා ඉත්ථත්වභාවයට ඒ නම්, ඕ යම් ම තැනෙක උපදිනී නම්, අභිරූපිණී වෙයි. දර්ශනීය වෙයි. ප්‍රාසාදිකා වෙයි. උතුම් වර්ණසෞන්දර්යයෙන් සමන්වාගත වෙයි. මහත් ධන මහත්භෝග ඇත්තී ආඪ්‍ය වෙයි. මහේශාක්‍ය වෙයි.

මල්ලිකාවෙනි, යම් හෙයෙකින් මේ ලොව්හි ඇතැම් මාගමක් දුර්වර්ණී ද දුරූපිණී ද දර්ශනයට ඉතා ලමු ද වේ නම්, අල්පසවක අල්පභොග වූවා දිළිඳු ද වේ නම්, අල්පෙශාක්‍ය ද වේ නම්, මේ එයට හේතු යි, මේ එයට ප්‍රත්‍යය යි

මල්ලිකාවෙනි, යම් හෙයෙකින් මේ ලොව්හි ඇතැම් මාගමක් දුර්වර්ණී ද දුරූපිණී ද දර්ශනයට ඉතා ලමු ද වේ නම්, මහත් ධන මහත් භොග ඇත්තී ආඪ්‍ය ද වේ නම්, මහෙසැකි ද වේ නම්, මේ එයට හේතු යි. මේ එයට ප්‍රත්‍යය යි.

මල්ලිකාවෙනි, යම් හෙයෙකින් මේ ලොව්හි ඇතැම් මාගමක් අභිරූප දර්ශනීය ප්‍රාසාදිකා වූවා උත්තම වර්ණසෞන්දර්යයෙන් සමන්වාගත වේ නම්, අල්පසවක අල්පභොග වූවා දිළිඳු ද අල්පෙශාක්‍ය ද වේ නම්, මේ එයට හේතු යි මේ එයට ප්‍රත්‍යය යි

අයං පන මල්ලිකෙ හෙතු අයං පච්චයො යෙන මිධෙකච්චො මාතුගාමො අභිරූපා ච හොති දස්සනීයා පාසාදිකා පරමාය වණ්ණපොක්ඛරතාය සමන්නාගතා, අඩ්ඪා ච හොති මහද්ධනා මහාභොගා මහෙසක්ඛා චාති.

එවං වුත්තෙ මල්ලිකා දෙවී භගවන්තං එතදවොච: යා නූනාහං භන්තෙ අඤ්ඤං ජාතිං කොධනා අහොසිං උපායාසබහුලා, අප්පම්පි වුත්තා සමානා අභිසජ්ජිං කුප්පිං බ්‍යාපජ්ජිං පතිත්ථියිං, කොපඤ්ච දොසඤ්ච අප්පච්චයඤ්ච පාත්වාකාසිං, සාහං භන්තෙ එතරහි දුබ්බණ්ණා දුරූපා සුපාපිකා දස්සනාය.

යා නූනාහං භන්තෙ අඤ්ඤං ජාතිං අදාසිං සමණස්ස වා බ්‍රාහ්මණස්ස වා අන්නං පානං වත්ථං යානං මාලාගන්ධවිලෙපනං සෙය්‍යාවසථපදීපෙය්‍යං, සාහං භන්තෙ එතරහි අඩ්ඪා ච මහද්ධනා මහාභොගා.

යා නූනාහං භන්තෙ අඤ්ඤං ජාතිං අනිස්සාමනිකා අහොසිං පරලාභසක්කාරගරුකාරමානනවන්දනපූජනාසු, න ඉස්සිං න උපදුස්සිං න ඉස්සං බන්ධිං, සාහං භන්තෙ එතරහි මහෙසක්ඛා. සන්ති ඛො පන භන්තෙ, ඉමස්මිං රාජකුලෙ ඛත්තියකඤ්ඤාපි බ්‍රාහ්මණකඤ්ඤාපි ගහපතිකඤ්ඤාපි. තාසාහං ඉස්සරාධිපච්චං කාරෙමි.

එසාහං භන්තෙ අජ්ජතග්ගෙ අක්කොධනා භවිස්සාමි අනුපායාසබහුලා. බහුම්පි වුත්තා සමානා නාභිසජ්ජිස්සාමි න කුප්පිස්සාමි න ව්‍යාපජ්ජිස්සාමි න පතිත්ථියිස්සාමි. න කොපඤ්ච දොසඤ්ච අප්පච්චයඤ්ච පාතුකරිස්සාමි. දස්සාමි සමණස්ස බ්‍රාහ්මණස්ස අන්නං පානං වත්ථං යානං මාලාගන්ධවිලෙපනං. සෙය්‍යාවසථපදීපෙය්‍යං. අනිස්සාමනිකා භවිස්සාමි පරලාභසක්කාරගරුකාරමානනවන්දනපූජනාසු. න ඉස්සිස්සාමි න උපදුස්සිස්සාමි, න ඉස්සං බන්ධිස්සාමි.

අභික්කන්තං භන්තෙ අභික්කන්තං භන්තෙ -පෙ- උපාසිකං මං භන්තෙ භගවා ධාරෙතු අජ්ජතග්ගෙ පාණුපෙතං සරණං ගතන්ති.

## 4. 4. 5 8

### [ තපසුත්තං ]

48. චත්තාරොමෙ භික්ඛවෙ පුග්ගලා සන්තො සංවිජ්ජමානා ලොකස්මිං. කතමෙ චත්තාරො?

ඉධ භික්ඛවෙ එකච්චො පුග්ගලො අත්තන්තපො හොති අත්තපරිතාපනානුයොගමනුයුත්තො. ඉධ පන භික්ඛවෙ එකච්චො පුග්ගලො පරන්තපො හොති පරපරිතාපනානුයොගමනුයුත්තො. ඉධ පන භික්ඛවෙ එකච්චො පුග්ගලො අත්තන්තපො ච හොති අත්තපරිතාපනානුයොගමනුයුත්තො, පරන්තපො ච හොති පරපරිතාපනානුයොගමනුයුත්තො. ඉධ පන භික්ඛවෙ එකච්චො පුග්ගලො නෙව අත්තන්තපො හොති න අත්තපරිතාපනානුයොගමනුයුත්තො, න පරන්තපො හොති න පරපරිතාපනානුයොගමනුයුත්තො සො අනත්තන්තපො අපරන්තපො දිට්ඨෙව ධම්මෙ නිච්ඡාතො නිබ්බුතො සීතීභූතො සුඛපටිසංවෙදී බ්‍රහ්මභූතෙන අත්තනා විහරති.

මල්ලිකාවෙනි, යම් හෙයෙකින් මෙ ලොව්හි ඇතැම් මාගමක් අභිරූප දර්ශනීය ප්‍රාසාදික වූවා උත්තම වර්ණපෞෂ්කල්‍යයෙන් සමන්‍වාගත වේ නම්, මහත් ධන මහාභොග ඇත්තී ආඪ්‍ය ද වේ නම්, මහෙශාක්‍යා ද වේ නම්, මෙ එයට හේතු යි. මෙ එයට ප්‍රත්‍යය වේ.

මෙසේ වදාළ කල්හි මල්ලිකාදේවී භාග්‍යවතුන් වහන්සේට මෙසේ සැළ කළා යැ: වහන්ස, යම් බඳු මම් එකැතියෙන් අන් ද්‍රයෙක්හි උපායාස බහුල කොට ඇතියෙම් කිපෙනසුලු වූමු ද, මඳ කොට ද කියනලද්දෙම් ම ලැගියමු ද, කිපියමු ද, සැහැවි හළමු ද, තද වූ මුද, කොප හා ද්වෙෂ හා අප්‍රත්‍යය හා පාළ කළමු ද, වහන්ස, එ මම් මෙ කල දුර්වර්ණ වූයෙම් දුරුපිණි වූයෙම් දර්ශනයට ඉතා ලමු වෙමි.

වහන්ස, යම් බඳු මම් අන්‍යජාතියෙක්හි එකැතියෙන් මහණකුට වේවයි බමුණකුට වේවයි ආහාර පාන වස්ත්‍ර යාන මාලා ගන්ධ විලෙපන ශය්‍යා ආවසථ ප්‍රදීප උපකරණ දිනිමු ද, වහන්ස, එ මම් මෙ කල ආඪ්‍ය වූයෙම් මහත් ධන මහත් භොග ඇතියමු

වහන්ස, යම් බඳු මම ඒකාන්තයෙන් අන්‍යජාතියෙක පරලාභ සත්කාර ගුරුකාර මානන වන්දන පූජනායෙහි ඊර්ෂ්‍යා රහිත සිත් ඇතියෙම් ඊර්ෂ්‍යා නො කෙළෙම් උපද්වෙෂ නො කෙළෙම් ඊර්ෂ්‍යා නො බැඳියෙම් ද, වහන්ස, එ මම් මෙ කල මහෙශාක්‍යයමු. වහන්ස, මෙ රජකුලෙහි ක්‍ෂත්‍රිය කන්‍යාවෝ ද බ්‍රාහ්මණ කන්‍යාවෝ ද ගෘහපති කන්‍යාවෝ ද ඇත. වහන්ස, ඔවුනට මම ඓශ්වර්‍ය්‍ය හා ආධිපත්‍යය කරවමි.

වහන්ස, මෙල මම් අද පටන් කොට උපායාස බහුල කොට නැතියෙම් නො කිපෙනසුලු වන්නෙමි. බොහෝ කොටත් කියන ලද්දෙම් ම නො ලැගෙන්නෙමි. නො කිපෙන්නෙමි. සැහැවි නො හරින්නෙමි. තද නො වන්නෙමි. කෝපය ද්වෙෂය අප්‍රත්‍යය පහළ නො කරන්නෙමි. මහණකුට වේවයි බමුණකුට වේවයි ආහාර පාන වස්ත්‍ර යාන මල් ගඳ විලෙවුන් ශය්‍යා ආවසථ ප්‍රදීපය දෙන්නෙමි. පරලාභ සත්කාර ගුරුකාර වන්දන මානන පූජනායෙහි ඊර්ෂ්‍යා නැති සිතැතියෙම් වන්නෙමි. ඊර්ෂ්‍යා නො කරන්නෙමි. උපද්වෙෂ නො කරන්නෙමි. ඉසි නො බඳනෙමි.

වහන්ස, ඉතා මැනැවි, වහන්ස, ඉතා මැනැවි. ... වහන්ස, අද පටන් මා දිවිහිමි කොට සරණ ගිය උවැසියක කොට ධරණ සේක්වා යි.

## 4. 4. 5. 8.

## [ තප සූත්‍රය ]

48 මහණෙනි, ලොව විද්‍යමාන මෙ පුඟුල්හු සතර දෙනෙකි. කවර සතර දෙනෙක යත්:

මහණෙනි, මෙ ලොව්හි ඇතැම් පුහුලෙක් ආත්ම පරිතාපනානුයොගයෙහි යෙදුනේ අත්තන්තප වෙයි. මහණෙනි, මෙ ලොව්හි ඇතැම් පුහුලෙක් පරපරිතාපනානුයොගයෙහි යෙදුනේ පරන්තප වෙයි. මහණෙනි, මෙ ලොව්හි ඇතැම් පුහුලෙක් ආත්මපරිතාපනානුයොගයෙහි යෙදුනේ අත්තන්තප ද වෙයි, පරපරිතාපනානුයොගයෙහි යෙදුනේ පරන්තප ද වෙයි. මහණෙනි, මෙ ලොව්හි ඇතැම් පුහුලෙක් ආත්මපරිතාපනානු-යොගයෙහි නො ම යෙදුනේ අත්තන්තප නො වෙයි, පරපරිතාපනානු-යොගයෙහි නො ම යෙදුනේ පරන්තප නො ම වෙයි. හේ අත්තන්තප නො වූයේ පරන්තප නො වූයේ ඉහාත්මයෙහි ම නිෂ්තෘෂ්ණ වූයේ කෙලෙස් නිවුණින් පිරිනිවියේ සිහිල් වූයේ (ධ්‍යානමාර්ගඵලනිර්වාණ සඞ්ඛ්‍යාත) සුව විඳිනාසුලුයේ ශ්‍රෙෂ්ඨ සිතින් වෙසෙයි.

කථඤ්ච භික්ඛවෙ පුග්ගලො අත්තන්තපො හොති, අත්තපරිතාපනානුයොගමනුයුත්තො?

ඉධ භික්ඛවෙ එකච්චො පුග්ගලො අචෙලකො හොති මුත්තාචාරො හත්ථාපලෙඛනො න එහිභදන්තිකො න තිට්ඨභදන්තිකො නාභිහටං න උද්දිස්සකටං න නිමන්තනං සාදියති.

සො න කුම්භිමුඛා පතිග්ගණ්හාති, න ඛළොපිමුඛා පතිග්ගණ්හාති, න එළකමන්තරං න දණ්ඩමන්තරං න මුසලමන්තරං න ද්වින්නං භුඤ්ජමානානං න ගබ්භිනියා න පායමානාය න පුරිසන්තරගතාය න සඞ්කිත්තීසු න යත්ථ සා උපට්ඨිතො හොති, න යත්ථ මක්ඛිකා සණ්ඩසණ්ඩචාරිණී, න මච්ඡං න මංසං, න සුරං න මෙරයං න ථුසොදකං පිවති.

සො එකාගාරිකො වා හොති එකාලොපිකො. ද්වාගාරිකො වා හොති ද්වාලොපිකො. සත්තාගාරිකො වා හොති සත්තාලොපිකො. එකිස්සා පි දත්තියා යාපෙති, ද්විහිපි දත්තීහි යාපෙති, සත්තහිපි දත්තීහි යාපෙති. එකාහිකම්පි ආහාරං ආහාරෙති, ද්වාහිකම්පි ආහාරං ආහාරෙති, සත්තාහිකම්පි ආහාරං ආහාරෙති. ඉති එවරූපං අද්ධමාසිකම්පි පරියායභත්තභොජනානුයොගමනුයුත්තො විහරති.

සො සාකභක්ඛොපි හොති, සාමාකභක්ඛොපි හොති, නීවාරභක්ඛොපි හොති, දද්දුලභක්ඛොපි හොති, හටභක්ඛොපි හොති, කණභක්ඛොපි හොති, ආචාමභක්ඛොපි හොති, පිඤ්ඤාකභක්ඛොපි හොති, තිණභක්ඛොපි හොති, ගොමයභක්ඛොපි හොති. වනමූලඵලාහාරො යාපෙති පවත්තඵලභොජී

සො සාණානිපි ධාරෙති, මසාණානිපි ධාරෙති, ඡවදුස්සානිපි ධාරෙති, පංසුකූලානිපි ධාරෙති, තිරීටානිපි ධාරෙති, අජිනම්පි ධාරෙති, අජිනක්ඛිපම්පි ධාරෙති, කුසචීරම්පි ධාරෙති, වාකචීරම්පි ධාරෙති, ඵලකචීරම්පි ධාරෙති, කෙසකම්බලම්පි ධාරෙති, වාලකම්බලම්පි ධාරෙති, උලූකපක්ඛම්පි ධාරෙති.

කෙසමස්සුලොචකො හොති කෙසමස්සුලොචනානුයොගමනුයුත්තො. උබ්භට්ඨකොපි හොති ආසනපටික්ඛිත්තො. උක්කුටිකොපි හොති උක්කුටිකප්පධානමනුයුත්තො. කණ්ටකාපස්සයිකොපි හොති, කණ්ටකාපස්සයෙ සෙය්‍යං කප්පෙති. සායතතියකම්පි උදකොරොහනානුයොගමනුයුත්තො විහරති. ඉති එවරූපං අනෙකවිහිතං කායස්ස ආතාපනපරිතාපනානුයොගමනුයුත්තො විහරති.

එවං ඛො භික්ඛවෙ පුග්ගලො අත්තන්තපො හොති අත්තපරිතාපනානුයොගමනුයුත්තො.

මහණෙනි, පුද්ගල කෙසේ ආත්මපරිතාපනානුයෝගයෙහි යෙදුනේ අත්තන්තප වේද යත්:

මහණෙනි, මෙ ලොව්හි ඇතැම් පුග්ගලෙක් සෙලූ වෙයි හළ ආචාර ඇතියේ වෙයි. පිඬු නිමි කල අත ලෙව්නේ වෙයි. 'එව, වහන්සැ'යි කී කල නො එනු සිල් කොට ඇතියේ වෙයි. 'සිටුව, වහන්සැ යි කී කල නො සිටිනු සිල් කොට ඇතියේ වෙයි. පළමු එළ වූ අහර නො පිළිගන්නේ වෙයි. උදෙසා කළ අහර නො පිළිගන්නේ වෙයි. නිමන්ත්‍රණ නො පිළිගන්නේ වෙයි.

හේ කළඹුවෙන් උදුරා දුන් අහර නො පිළිගන්නේ වෙයි. හේ සැළ මූවිත් උදුරා දුන් අහර නො පිළිගන්නේ වෙයි. එළිපත අතර කොට දෙන අහර නො පිළිගන්නේ වෙයි. දඬු අතර කොට දෙන අහර නො පිළිගන්නේ වෙයි. මොහොල් අතර කොට දෙන අහර නො පිළිගන්නේ වෙයි. වළඳන දෙදෙනකුන් අතුරින් එකකු නැගී දෙන අහර නො පිළිගන්නේ වෙයි. ගුබිලිය දෙන අහර නො පිළිගන්නේ වෙයි. කිරිපොවන්නිය දෙන අහර නො පිළිගන්නේ වෙයි. පුරුෂාන්තරගත ස්ත්‍රිය දෙන අහර නො පිළිගන්නේ වෙයි. සමාදන් කොට පිසූකල දෙන අහර නො පිළිගන්නේ වෙයි. යම් තැනෙක බලු එළඹ සිටියේ නම් එහි දෙන අහර නො පිළිගන්නේ වෙයි. යම් තැනෙක මැසිමුළු ගල ගලව හැසිරෙත් නම් එහි දෙන අහර නො පිළිගන්නේ වෙයි. මත්ස්‍ය නො පිළිගන්නේ වෙයි. මාංශ නො පිළිගන්නේ වෙයි. රහ නො බොන්නේ ය. මෙර නො බොන්නේ ය. සෞවීර නො බොන්නේ ය.

හේ එක් ගෙයෙකින් පිඬු ලැබ නවත්නේ හෝ වෙයි. එක් ආලෝපයෙකින් යැපෙන්නේ හෝ වෙයි. දෙගෙයෙකින් පිඬු ලැබ නවත්නේ හෝ වෙයි. ආලෝප දෙකෙකින් යැපෙන්නේ හෝ වෙයි. සත්ගෙයෙකින් පිඬු ලැබ නවත්නේ හෝ වෙයි. ආලෝප සතෙකින් යැපෙන්නේ හෝ වෙයි. එක් දත්තෙකිනුදු යැපෙයි. දෙ දත්තෙකිනුදු යැපෙයි. සත්දත්තෙකිනුදු යැපෙයි. එක් දවසක් අතර කොට ගන්නාඅහර ද වළඳයි. දෙදවසක් අතර කොට ගන්නා අහර ද වළඳයි සත් දවසක් අතර කොට ගන්නා අහර ද වළඳයි. මෙසේ මෙබඳු අඩමසක් අතර කොට ගන්නා අහර ද යි වාරභක්තභොජනයෙහි යෙදුනේ වෙසෙයි.

හේ පලා වළඳන්නේ හෝ වෙයි. හේ බඩහමු වළඳන්නේ හෝ වෙයි. හුරුහැල් වළඳන්නේ හෝ වෙයි. සම්කඩ වළඳන්නේ හෝ වෙයි. ලාහටු වළඳන්නේ හෝ වෙයි. කුඩු වළඳන්නේ හෝ වෙයි. දඹුබත් වළඳන්නේ හෝ වෙයි. පුන්නකු වළඳන්නේ හෝ වෙයි. ගොම වළඳන්නේ හෝ වෙයි. වැටුනු ඵල වළඳනසුලු වූයේ වනමූලඵල ආහාර කොට ඇතියේ ද යැපෙයි.
හේ හණ වැහැරි ද දරයි මුසු හණ වැහැරි ද දරයි. මිනියෙන් හළ පිළී ද දරයි. පහුල් පිළී ද දරයි. රුක්සුඹුළු ද දරයි. අඳුන් මුවසම් ද දරයි. ඛුර සහිත අඳුන් මුවසම් ද දරයි. කුසවැහැරි ද දරයි. වාකචීරය ද දරයි. ඵලකචීරය ද දරයි. කෙසකම්බල ද දරයි. වාලකම්බල ද දරයි. මහමුහුනු පියාපතුදු දරයි.

හිසකේ රවුළු උදුරා ලීමෙහි යෙදුනේ හිසකේ රවුළු උදුරනුයේ ද වෙයි. අසුන් පිළිකෙව් කෙළේ උඩුහුරුව සිටුනේ වෙයි. උලුළුයෙන් තවුස් වැර වැඩීමෙහි යෙදුනේ උලුළුයෙන් සිටුනේ ද වෙයි. කටු ඇතිරියෙහි හොත්තේ ද වෙයි. කටුඇතිරියෙහි සයනය ද කෙරෙයි. සවස තුන්වනු කොට තෙවරක් උදකාවගාහයෙහි යෙදුනේ වෙසෙයි. මෙසේ මෙ බඳු අනේකප්‍රකාර වූ කය පිළිබඳ ආතාපන පරිතාපනානුයෝගයෙහි යෙදුනේ වෙසෙයි.

මහණෙනි, මෙසේ පුද්ගල ආත්මපරිතාපනානුයෝගයෙහි යෙදුනේ අත්තන්තප වෙයි.

Free Distribution www.aathaapi.org

කථඤ්ච භික්ඛවෙ පුග්ගලො පරන්තපො හොති පරපරිතාපනානුයොගමනුයුත්තො? ඉධ භික්ඛවෙ එකච්චො පුග්ගලො ඔරබ්භිකො හොති සූකරිකො සාකුන්තිකො මාගවිකො ලුද්දො මච්ඡඝාතකො චොරො චොරඝාතකො බන්ධනාගාරිකො, යෙ වා පනඤ්ඤෙපි කෙචි කුරූරකම්මන්තා. එවං ඛො භික්ඛවෙ පුග්ගලො පරන්තපො හොති පරපරිතාපනානුයොගමනුයුත්තො.

කථඤ්ච භික්ඛවෙ පුග්ගලො අත්තන්තපො ච හොති අත්තපරිතාපනානුයොගමනුයුත්තො, පරන්තපො ච හොති පරපරිතාපනානුයොගමනුයුත්තො?

ඉධ භික්ඛවෙ එකච්චො පුග්ගලො රාජා වා හොති ඛත්තියො මුද්ධාවසිත්තො බ්‍රාහ්මණො වා මහාසාලො, සො පුරත්ථිමෙන නගරස්ස නවං සන්ථාගාරං කාරාපෙත්වා කෙසමස්සුං ඔහාරෙත්වා ඛරාජිනං නිවාසෙත්වා සප්පිතෙලෙන කායං අබ්භඤ්ජිත්වා මිගවිසාණෙන පිට්ඨිං කණ්ඩුවමානො සන්ථාගාරං පවිසති සද්ධිං මහෙසියා බ්‍රාහ්මණෙන ච පුරොහිතෙන.

සො තත්ථ[1] අනන්තරහිතාය භූමියා හරිතුපලිත්තාය සෙය්‍යං කප්පෙති. එකිස්සා ගාවියා සරූපවච්ඡාය යං එකස්මිං ථනෙ ඛීරං හොති, තෙන රාජා යාපෙති. යං දුතියස්මිං ථනෙ ඛීරං හොති, තෙන මහෙසී යාපෙති. යං තතියස්මිං ථනෙ ඛීරං හොති, තෙන බ්‍රාහ්මණො පුරොහිතො යාපෙති. යං චතුත්ථස්මිං ථනෙ ඛීරං හොති, තෙන අග්ගිං ජුහන්ති. අවසෙසෙන වච්ඡකො යාපෙති. සො එවමාහ: එත්තකා උසභා හඤ්ඤන්තු යඤ්ඤත්ථාය. එත්තකා වච්ඡතරා හඤ්ඤන්තු යඤ්ඤත්ථාය. එත්තකා වච්ඡතරියො හඤ්ඤන්තු යඤ්ඤත්ථාය, එත්තකා අජා හඤ්ඤන්තු යඤ්ඤත්ථාය එත්තකා උරබ්භා හඤ්ඤන්තු යඤ්ඤත්ථාය. එත්තකා රුක්ඛා ඡිජ්ජන්තු යූපත්ථාය. එත්තකා දබ්බා ලූයන්තු බරිහිසත්ථායාති. යෙපිස්ස තෙ හොන්ති දාසාති වා පෙස්සාති වා කම්මකරාති වා, තෙපි දණ්ඩතජ්ජිතා භයතජ්ජිතා අස්සුමුඛා රුදමානා පරිකම්මානි කරොන්ති.

එවං ඛො භික්ඛවෙ පුග්ගලො අත්තන්තපො ච හොති අත්තපරිතාපනානුයොගමනුයුත්තො. පරන්තපො ච හොති පරපරිතාපනානුයොගමනුයුත්තො.

කථඤ්ච භික්ඛවෙ පුග්ගලො නෙවත්තන්තපො හොති න අත්තපරිතාපනානුයොගමනුයුත්තො, න පරන්තපො හොති න පරපරිතාපනානුයොගමනුයුත්තො, සො අනත්තන්තපො අපරන්තපො දිට්ඨෙව ධම්මෙ නිච්ඡාතො නිබ්බුතො සීතීභූතො සුඛපටිසංවෙදී බ්‍රහ්මභූතෙන අත්තනා විහරති?

ඉධ භික්ඛවෙ තථාගතො ලොකෙ උප්පජ්ජති අරහං සම්මාසම්බුද්ධො විජ්ජාචරණසම්පන්නො සුගතො ලොකවිදූ අනුත්තරො පුරිසදම්මසාරථි සත්ථා දෙවමනුස්සානං බුද්ධො භගවා. සො ඉමං ලොකං සදෙවකං සමාරකං සබ්‍රහ්මකං, සස්සමණබ්‍රාහ්මණිං පජං සදෙවමනුස්සං සයං අභිඤ්ඤා සච්ඡිකත්වා පවෙදෙති. සො ධම්මං දෙසෙති ආදිකල්‍යාණං මජ්ඣෙකල්‍යාණං පරියොසානකල්‍යාණං සාත්ථං සබ්‍යඤ්ජනං කෙවලපරිපුණ්ණං පරිසුද්ධං, බ්‍රහ්මචරියං පකාසෙති.

1. අනන්තරහිතාය, අට්ඨ.

Free Distribution www.aathaapi.org

මහණෙනි, කෙසේ නම් පුද්ගල පරපරිතාපනානුයෝගයෙහි යෙදුනේ පරන්තප වේ ද යත්: මහණෙනි, මෙ ලොව්හි ඇතැම් පුහුලෙක් තිරෙළුවන් මරා දිවි වැටුම් ඇතියේ හෝ වෙයි. හුරන් මරා දිවි වැටුම් ඇතියේ හෝ වෙයි. ළිහිණින් මරා දිවි මැටුම් ඇතියේ හෝ වෙයි. රෞද්‍ර වූ මුව වැදි හෝ වෙයි. මත්ස්‍ය ඝාතක වෙයි. සොර වෙයි. සොරුන් මරණේ වෙයි. බන්ධනාගාර ඇතියේ හෝ වෙයි. යම් බඳු අන්‍ය වූ ද කිසියම් කුරිරු කර්මාන්ත කරණුයේ වෙයි. මහණෙනි, මෙසේ පුද්ගල පරපරිතාපනානු-යෝගයෙහි යෙදුනේ පරන්තප වෙයි.

මහණෙනි, කෙසේ නම් පුද්ගල ආත්මපරිතාපනානුයෝගයෙහි යෙදුනේ අත්තන්තප වේ ද යත්, පරපරිතාපනානුයෝගයෙහි යෙදුනේ පරන්තප වේ ද යත්:

මහණෙනි, මෙ ලොව්හි ඇතැම් පුහුලෙක් මූර්ධාභිෂික්ත ක්ෂත්‍රිය රජෙක් හෝ මහාසාර බ්‍රාහ්මණයෙක් හෝ වෙයි. හේ නුවර පෙර දිග්හි අභිනව සන්ථාගාරයක් කරවා කේශ්වුළු බහවා රළු අඳුන් දිවිසම් හැඳ ගිහි තෙලෙන් කය අභ්‍යඤ්ජන කොට මුවහගින් පිට කසනුයේ මෙහෙසිය හා පුරෝහිත බමුණු හා සන්ථාගාරයට පිවිසෙයි.

හේ එහි ගොම පිරිබඩ කළ තො අතුළ බිම්හි ශය්‍යා කෙරෙයි. සරූප වසු ඇති එක් දෙනකගේ එක් තනෙක යම් කිරෙක් වේ නම් එයින් රජ යැපෙයි, දෙවන තනෙහි යම් කිරෙක් වේ නම් එයින් මෙහෙසිය යැපෙයි. තෙවන තනෙහි යම් කිරෙක් වේ නම් එයින් පුරෝහිත බ්‍රාහ්මණ යැපෙයි. සතරවන තනෙහි යම් කිරෙක් වේ නම් එයින් ගිනි පුදත්. අවශෙෂයෙන් වස්සා යැපෙයි. හේ මෙසේ කියයි: යඥ පිණිස මෙතෙක් වෘෂභයෝ නසනු ලැබෙත්වා, මෙතෙක් තරුණ වස්සෝ යඥ පිණිස නසනු ලැබෙත්වා, මෙතෙක් තරුණ වැස්සියෝ යඥ පිණිස නසනු ලැබෙත්වා, යාගාවාටස්තම්භ සඳහා මෙතෙක් රුක්හු සිඳිනු ලැබෙත්වා, පිරිකෙව් කරණු හා යාග බිම අතුරණු හා පිණිස මෙතෙක් ඉලූප්තණ සිඳිනු ලැබෙවා. දස්හ යි හෝ ප්‍රෙෂ්‍ය-හ යි හෝ කම්කරුහ යි හෝ ඔහුගේ යම් ම කෙනෙක් වෙත් නම් ඔහු ද දඬුවමින් තැති ගත්තාහු බියෙන් තැති ගත්තාහු කඳුළු වැකි මුව ඇත්තාහු හඬනාහු පිරියම් කරත්.

මහණෙනි, මේසේ පුද්ගල ආත්මපරිතාපනානුයෝග යෙහි යෙදුනේ අත්තන්තපද වෙයි. පරපරිතාපනානුයෝගයෙහි යෙදුනේ පරන්තප ද වෙයි.

මහණෙනි, කෙසේ නම් පුහුල් ආත්මපරිතාපනානුයෝගයෙහි නො යෙදුනේ අත්තන්තප නො වේය යත්: පරපරිතාපනානුයොගයෙහි නො යෙදුනේ පරන්තප නො වේය යත්: හෙ ආත්මන්තප නො වූයේ පරන්තප නො වූයේ දිටුදහමියෙහි ම තෘෂ්ණා නැතියේ කෙලෙස් නිවණින් පිරිනිවියේ සිහිල් වූයේ සුව විඳිනා සුලුයේ ශ්‍රෙෂ්ඨ සිතින් වාසය කෙරේය යත්:

මහණෙනි, මෙ ලොව්හි අර්හත් වූ සම්‍යක් සම්බුද්ධ වූ විද්‍යාචරණ සම්පන්න වූ සුගත වූ ලොකවිදූ වූ අනුත්තර පුරුෂදම්‍යසාරථි වූ දෙව්මිනිස්නට ශාස්තෘ වූ බුද්ධ වූ භාග්‍යවත් වූ තථාගතයන් වහන්සේ ලොව උපදනාහ. උන් වහන්සේ දෙවියන් සහිත මරුන් සහිත බඹුන් සහිත මෙ ලොව, මහණ බමුණන් සහිත දෙව්මිනිසුන් සහිත ප්‍රජාව තුමූ ම විශිෂ්ටඥානයෙන් දැන සාක්ෂාත් කොට දැනගන්නාහ. උන් වහන්සේ ආදි කල්‍යාණ කොට මධ්‍ය කල්‍යාණ කොට පර්‍යවසාන කල්‍යාණ කොට සාර්ථ කොට සව්‍යඤ්ජන කොට කේවල පරිපූර්ණ කොට පරිශුද්ධ කොට ධර්මය දෙසන්නාහ. බ්‍රහ්මචර්‍ය්‍යය ප්‍රකාශ කරන්නාහ.

තං ධම්මං සුණාති ගහපති වා ගහපතිපුත්තො වා අඤ්ඤතරස්මිං වා කුලෙ පච්චාජාතො. සො තං ධම්මං සුත්වා තථාගතෙ සද්ධං පටිලභති. සො තෙන සද්ධාපටිලාභෙන සමන්නාගතො ඉති පටිසඤ්චික්ඛති: සම්බාධො ඝරාවාසො රජාපථො අබ්භොකාසො පබ්බජ්ජා, නයිදං සුකරං අගාරං අජ්ඣාවසතා එකන්තපරිපුණ්ණං එකන්තපරිසුද්ධං සඞ්ඛලිඛිතං බ්‍රහ්මචරියං චරිතුං. යන්නූනාහං කෙසමස්සුං ඔහාරෙත්වා කාසායානි වත්ථානි අච්ඡාදෙත්වා අගාරස්මා අනගාරියං පබ්බජෙය්‍යන්ති.

සො අපරෙන සමයෙන අප්පං වා භොගක්ඛන්ධං පහාය මහන්තං වා භොගක්ඛන්ධං පහාය අප්පං වා ඤාතිපරිවට්ටං පහාය මහන්තං වා ඤාති-පරිවට්ටං පහාය කෙසමස්සුං ඔහාරෙත්වා කාසායානි වත්ථානි අච්ඡාදෙත්වා අගාරස්මා අනගාරියං පබ්බජති.

සො එවං පබ්බජිතො සමානො භික්ඛූනං සික්ඛාසාජීවසමාපන්නො පාණාතිපාතං පහාය පාණාතිපාතා පටිවිරතො හොති, නිහිතදණ්ඩො නිහිතසත්ථො ලජ්ජී දයාපන්නො සබ්බපාණභූතහිතානුකම්පී විහරති. අදින්නාදානං පහාය අදින්නාදානා පටිවිරතො හොති, දින්නාදායී දින්නපාටිකඞ්ඛී අථෙනෙන සුචිභූතෙන අත්තනා විහරති. අබ්‍රහ්මචරියං පහාය බ්‍රහ්මචාරී හොති ආරාචාරී විරතො මෙථුනා ගාමධම්මා. මුසාවාදං පහාය මුසාවාදා පටිවිරතො හොති සච්චවාදී සච්චසන්ධො ථෙතො පච්චයිකො අවිසංවාදකො ලොකස්ස. පිසුණං වාචං පහාය පිසුණාවාචා පටිවිරතො හොති: ඉතො සුත්වා න අමුත්‍ර අක්ඛාතා ඉමෙසං භෙදාය, අමුත්‍ර වා සුත්වා න ඉමෙසං අක්ඛාතා අමූසං භෙදාය, ඉති භින්නානං වා සන්ධාතා සහිතානං වා අනුප්පදාතා සමග්ගාරාමො සමග්ගරතො සමග්ගනන්දී සමග්ගකරණිං වාචං භාසිතා හොති. ඵරුසං වාචං පහාය ඵරුසාවාචා පටිවිරතො හොති: යා සා වාචා නෙලා කණ්ණසුඛා පෙමනීයා හදයඞ්ගමා පොරී බහුජනකන්තා බහුජනමනාපා, තථාරූපිං වාචං භාසිතා හොති. සම්ඵප්පලාපං පහාය සම්ඵප්පලාපා පටිවිරතො හොති: කාලවාදී භූතවාදී අත්ථවාදී ධම්මවාදී විනයවාදී නිධානවතිං වාචං භාසිතා හොති කාලෙන සාපදෙසං පරියන්තවතිං අත්ථසංහිතං.

සො බීජගාමභූතගාමසමාරම්භා පටිවිරතො හොති, එකභත්තිකො හොති රත්තූපරතො විරතො විකාලභොජනා. නච්චගීතවාදිතවිසූකදස්සනා පටිවිරතො හොති. මාලාගන්ධවිලෙපනධාරණමණ්ඩනවිභූසනට්ඨානා පටි-විරතො හොති! උච්චාසයනමහාසයනා පටිවිරතො හොති. ජාතරූපරජත-පටිග්ගහණා පටිවිරතො හොති. ආමකධඤ්ඤපටිග්ගහණා පටිවිරතො හොති. ආමකමංසපටිග්ගහණා පටිවිරතො හොති ඉත්ථිකුමාරිකාපටිග්ගහණා පටිවිරතො හොති. දාසිදාසපටිග්ගහණා පටිවිරතො හොති. අජෙළක-පටිග්ගහණා පටිවිරතො හොති කුක්කුටසූකරපටිග්ගහණා පටිවිරතො හොති. හත්ථිගවාස්සවළවාපටිග්ගහණා පටිවිරතො හොති. ඛෙත්තවත්ථුපටිග්ගහණා පටිවිරතො හොති, දූතෙය්‍යපහිණගමනානුයොගා පටිවිරතො හොති. කයවික්කයා පටිවිරතො හොති. තුලාකූටකංසකූටමානකූටා පටිවිරතො හොති. උක්කොටනවඤ්චනනිකතිසාචියොගා පටිවිරතො හොති. ඡෙදන-වධබන්ධනවිපරාමොසආලොපසහසාකාරා පටිවිරතො හොති.

ගෙහෙවියෙක් වේවයි, ගෙහෙවි පුතෙක් වේවයි, අන්‍යතර කුලයෙක උපන්නෙක් වේවයි එ ධර්මය අසන්නේ ය. හේ එ දහම් අසා තථාගතයන් කෙරෙහි ශ්‍රද්ධා ප්‍රතිලාභ කෙරෙයි. හේ එ ශ්‍රද්ධාප්‍රතිලාභයෙන් සමන්වාගත වූයේ මෙසේ නුවණින් සිතයි: "ඝරවාසය සම්බාධයෙක. කෙලෙස් දූහුලියට මගෙක. පැවිද්ද අභ්‍යවකාශයෙක. ගිහිගෙහි වසන්නහු විසින් එකාන්ත-පරිපූර්ණ වූ එකාන්තපරිශුද්ධ වූ ලියු සකක් සේ පිරිසිදු මෙ බඹසර සරනට සුකර නො වෙයි. එකාන්තයෙන් මම් කෙහෙරවුළු බහා කහවත් හැද ගෙන් නික්ම පැවිද්දට වදිම් නම් මැනැවැ"යි.

හේ පසුකල්හි අල්ප වූ හෝ භොගස්කන්ධය හැර මහත්වූ හෝ භෝග-ස්කන්ධය හැර අල්ප වූ හෝ ඥාතිපරිවර්තය හැර මහත් වූ හෝ ඥාතිපරිවර්තය හැර කෙස්මස් බහා කහවත් හැද ගෙන් නික්ම පැවිද්දට පැමිණෙයි.

හේ මෙසේ පැවිදි වූයේ ම භික්ෂූන්ගේ ශික්ෂාසාජීවයට පැමිණියේ පණිවා හැර පණිවායෙන් වැළැකියේ වෙයි. බහා තැබූ දඬු ඇත්තේ බහා තැබූ අවි ඇත්තේ ලජ්ජා ඇතියේ දයාපත් වූයේ සර්වප්‍රාණභූතයන් කෙරෙහි හිතානු-කම්පී ව වෙසෙයි. අයිනාදන් හැර අයිනාදනින් වැළකියේ දුන් දෑ ගන්නා සුලුයේ දුන් දෑ කැමැති වනුයේ වෙයි. නො සොර වූ පිවිතුරු සිතින් වෙසෙයි. අබ්‍රම්භර හැරපියා බ්‍රහ්මචාරී වූයේ. දුරුව වෙසෙනුයේ ග්‍රාම්‍යධර්ම වූ මෛථුනයෙන් වැළැක්කේ වෙයි. මුසාව හැර මුසාවායෙන් වැළැකියේ සත්‍යවාදී වූයේ සත්‍ය-සන්ධාන ඇතියේ ස්ථිරකථා ඇතියේ හැදැහිය යුතු කථා ඇතියේ ලොකයා නුළු නො කරණුයේ වෙයි. පිසුනු බස් හැර පිසුනු බසින් වැළැකියේ, මොවුන්ගේ හෙදය පිණිස මෙ තන්හි අසා එතන්හි නො කියනුයේ, ඔවුන්ගේ හෙදය පිණිස එතන්හි හෝ අසා මොවුනට නො කියනුයේ වෙයි. මෙසේ භින්න වූවන් සමගි කරණුයේ සමගි වූවනට අනුබල දෙනුයේ හෝ සමගියෙහි ඇලුම් ඇතියේ සමග්‍රරත වූයේ සමගියෙන් සතුටුවන සුල්ලේ සමග කරණ වදන් කියනුයේ ද වෙයි. පරොස්බස් හැර පියා පරොස් බසින් වැළැකියේ වෙයි. යම් එ බණෙක් නිදොස් වේ නම් කණට සුව එළවා නම් පෙම් දනවා නම් හෘදයග්‍රාහී වේ නම් පෞර වේ නම් බොහෝ දෙනාට කාන්ත වේ නම් බොහෝ දෙනාට මනාප වේ නම් එබඳු බස් කියනුයේ වෙයි. සම්ඵප්‍රලාප හැර සම්ඵප්‍රලාපයෙන් වැළැකියේ කල්හි බණනසුලුයේ සැබවක් ම බණන සුලුයේ අර්ථය ම බණන සුලුයේ ධර්ම බණනසුලු වූයේ විනය බණන සුලුයේ සිත්හි නිදහනව තිසි, තිසි කල්හි කරුණු සහිත කොට පිරිසිඳුම් ඇති කොට අර්ථසංහිත කොට බස් තෙපලනුයේ වෙයි.

හේ බීජගාම භූතගාම විකෝපනයෙන් වැළැකියේ වෙයි. (ප්‍රාතරාශ-භක්ත සංඛ්‍යාත ) එක්බතක් ඇතියේ, රාත්‍රිභෝජනයෙන් වැළැකියේ විකාල භෝජනයෙන් අපගත වෙයි. නැටුම්, ගැයුම්, වැයුම් විසුළු දස්නෙන් වැළැ-කියේ වෙයි. මල්ගඳ විලෙවුන් දරුම් සැදුම් සැරැහුම් යන කරුණෙන් වැළැකියේ වෙයි. උසසුන් මහස්නෙන් වැළැකියේ වෙයි. ජාතරූපරජතයන් පිළිගැන්මෙන් වැළැකියේ වෙයි. අමුධාන්‍ය පිළිගැන්මෙන් වැළැකියේ වෙයි. අමුමස් පිළිගැන්මෙන් වැළැකියේ වෙයි. සත්‍රීන් හා කුමාරිකාවන් පිළිගැන් මෙන් වැළැකියේ වෙයි. දසිදසුන් පිළිගැන්මෙන් වැළැකියේ වෙයි. එළු තිරෙළුවන් පිළිගැන්මෙන් වැළැකියේ වෙයි. කුකුළන් හා හූරන් පිළිගැන් මෙන් වැළැකියේ වෙයි. ඇත්, ගව, අසුන් හා වෙළෙඹුන් පිළිගැණීමෙන් වැළකියේ වෙයි කෙත්වත් පිළිගැන්මෙන් වැළැකියේ වෙයි. දූතකම් හා පණිවුඩ පණත් ගෙණ යාමෙහි යෙදුමෙන් වැළැකියේ වෙයි. ක්‍රය වික්‍රය දෙකින් වැළැකියේ වෙයි. තුලාකූට, කංසකූට, මානකූටයෙන් වැළැකියේ වෙයි. උකොචන, වඤ්චන, නිකති යන කුටිලයොගයෙන් වැළැකියේ වෙයි. ඡෙදනය, වධය, බන්ධනය, මං පැහැරීම ය, වොලොගැන්ම ය, සැහැසිකම් ය යන මෙයින් වැළැකියේ වෙයි.

සො සන්තුට්ඨො හොති කායපරිහාරිකෙන චීවරෙන කුච්ඡිපරිහාරිකෙන පිණ්ඩපාතෙන. සො යෙන යෙනෙව පක්කමති. සමාදායෙව පක්කමති, සෙය්‍යථාපි නාම පක්ඛී සකුණො, යෙන යෙනෙව ඩෙති. සපත්තභාරොව ඩෙති. එවමෙව භික්ඛු සන්තුට්ඨො හොති කායපරිහාරිකෙන චීවරෙන කුච්ඡිපරිහාරිකෙන පිණ්ඩපාතෙන. සො යෙන යෙනෙව පක්කමති සමාදායෙව පක්කමති. සො ඉමිනා අරියෙන සීලක්ඛන්ධෙන සමන්නාගතො අජ්ඣත්තං අනවජ්ජසුඛං පටිසංවෙදෙති

සො චක්ඛුනා රූපං දිස්වා න නිමිත්තග්ගාහී හොති නානුබ්‍යඤ්ජනග්ගාහී, යත්වාධිකරණමෙනං චක්ඛුන්ද්‍රියං අසංවුතං විහරන්තං අභිජ්ඣා දොමනස්සා පාපකා අකුසලා ධම්මා අන්වාස්සවෙය්‍යුං, තස්ස සංවරාය පටිපජ්ජති. රක්ඛති චක්ඛුන්ද්‍රියං චක්ඛුන්ද්‍රියෙ සංවරං ආපජ්ජති. සොතෙන සද්දං සුත්වා -පෙ- ඝාණෙන ගන්ධං ඝායිත්වා -පෙ- ජිව්හාය රසං සායිත්වා -පෙ- කායෙන ඵොට්ඨබ්බං ඵුසිත්වා -පෙ- මනසා ධම්මං විඤ්ඤාය න නිමිත්තග්ගාහී හොති නානුබ්‍යඤ්ජනග්ගාහී, යත්වාධිකරණමෙනං මනින්ද්‍රියං අසංවුතං විහරන්තං අභිජ්ඣා දොමනස්සා පාපකා අකුසලා ධම්මා අන්වාස්සවෙය්‍යුං තස්ස සංවරාය පටිපජ්ජති. රක්ඛති මනින්ද්‍රියං මනින්ද්‍රියෙ සංවරං ආපජ්ජති. සො ඉමිනා අරියෙන ඉන්ද්‍රියසංවරෙන සමන්නාගතො අජ්ඣත්තං අබ්‍යාසෙකසුඛං පටිසංවෙදෙති.

සො අභික්කන්තෙ පටික්කන්තෙ සම්පජානකාරී හොති ආලොකිතෙ විලොකිතෙ සම්පජානකාරී හොති. සම්මිඤ්ජිතෙ පසාරිතෙ සම්පජානකාරී හොති සඞ්ඝාටිපත්තචීවරධාරණෙ සම්පජානකාරී හොති. අසිතෙ පීතෙ ඛායිතෙ සායිතෙ සම්පජානකාරී හොති. උච්චාරපස්සාවකම්මෙ සම්පජානකාරී හොති. ගතෙ ඨිතෙ නිසින්නෙ සුත්තෙ ජාගරිතෙ භාසිතෙ තුණ්හීභාවෙ සම්පජානකාරී හොති

සො ඉමිනා ච අරියෙන සීලක්ඛන්ධෙන සමන්නාගතො ඉමිනා ච අරියෙන ඉන්ද්‍රියසංවරෙන සමන්නාගතො ඉමිනා ච අරියෙන සතිසම්පජඤ්ඤෙන සමන්නාගතො විවිත්තං සෙනාසනං භජති අරඤ්ඤං රුක්ඛමූලං පබ්බතං කන්දරං ගිරිගුහං සුසානං වනපත්ථං අබ්භොකාසං පලාලපුඤ්ජං.

සො පච්ඡාභත්තං පිණ්ඩපාතපටික්කන්තො නිසීදති පල්ලඞ්කං ආභුජිත්වා උජුං කායං පණිධාය පරිමුඛං සතිං උපට්ඨපෙත්වා. සො අභිජ්ඣං ලොකෙ පහාය විගතාභිජ්ඣෙන චෙතසා විහරති, අභිජ්ඣාය චිත්තං පරිසොධෙති. බ්‍යාපාදපදොසං පහාය අබ්‍යාපන්නචිත්තො විහරති, සබ්බපාණභූතහිතානුකම්පී, බ්‍යාපාදපදොසා චිත්තං පරිසොධෙති. ථීනමිද්ධං පහාය විගතථීනමිද්ධො විහරති ආලොකසඤ්ඤී සතො සම්පජානො, ථීනමිද්ධා චිත්තං පරිසොධෙති. උද්ධච්චකුක්කුච්චං පහාය අනුද්ධතො විහරති අජ්ඣත්තං වූපසන්තචිත්තො උද්ධච්චකුක්කුච්චා චිත්තං පරිසොධෙති. විචිකිච්ඡං පහාය තිණ්ණවිචිකිච්ඡො. විහරති අකථංකථී කුසලෙසු ධම්මෙසු, විචිකිච්ඡාය චිත්තං පරිසොධෙති. සො ඉමෙ පඤ්චනීවරණෙ පහාය චෙතසො උපක්කිලෙසෙ පඤ්ඤාය දුබ්බලීකරණෙ විවිච්චෙව කාමෙහි -පෙ- පඨමං ඣානං -පෙ- දුතියං ඣානං -පෙ- තතියං ඣානං -පෙ- චතුත්ථං ඣානං උපසම්පජ්ජ විහරති.

හේ කායපාරිහාරිකචීවරයෙන් සතුටු වෙයි. කුක්ෂිපාරිහාරික පිණ්ඩපාත-යෙන් සතුටු වෙයි. හෙ යම් මැ දිගෙක්හි යේ නම්, යම් සෙයෙකින් පක්ෂිශකුණි යම් මැ දිගෙක යේ නම්, පත්‍රභාර ඇතිව ම යේ ද එසෙයින් රැගෙණ ම යෙයි. මෙපරිදි මහණ කායපාරිහාරික චීවරයෙන් කුක්ෂි පාරිහාරික පිණ්ඩපාතයෙන් සතුටු වෙයි. හේ යම් මැ දිගෙක යේ නම් අටපිරිකර මතු රැගෙණ ම යෙයි. හෙ මෙ ආර්‍ය්‍ය ශීලස්කන්ධයෙන් සමන්‍වාගත වූයේ අධ්‍යාත්මයෙහි නිරවද්‍ය සුඛ විඳුනේ ය.

හෙ ඇසින් රූපයක් දැක නිමිති නොගන්නාසුලුයේ අනුව්‍යඤ්ජන් නොගන්නා සුලුයේ වෙයි යම් හේතුයෙකින් චක්ෂුරින්ද්‍රිය අසංවෘත කොට වසන තෙල පුගුල්හු කරා ලාමක අකුශලධර්ම වන අභිධ්‍යා දෞර්මනස්‍යයෝ ලුහු බදනාහු නම්, එ අවුරණුවට පිළිපදනේය. චක්ෂුරින්ද්‍රියය රක්නේ ය චක්ෂුරින්ද්‍රිය-යෙහි සංවරයට පැමිණෙයි. ශ්‍රොත්‍රයෙන් ශබ්දය අසා .... ඝ්‍රාණයෙන් ගන්ධය අසා .... ජිහ්වායෙන් රස විඳ ... කයින් ස්ප්‍රෂ්ටව්‍යයක් පැහැස .. මනසින් ධර්මායතනයක් දැන නිමිති නොගන්නා සුලුයේ අනුව්‍යඤ්ජන් නොගන්නා සුලුයේ වෙයි. යම් කරුණෙකින් මනින්ද්‍රියය අසංවෘත කොට වසන තෙල පුගුල්හු කරා අභිධ්‍යා දෞර්මනස්‍ය සංඛ්‍යාත ලාමක අකුශල ධර්මයෝ ලුහුබඳනාහු නම්, එ අවුරණුවට පිළිපදනේ ය. මනින්ද්‍රියය රක්නේ ය. මනින්ද්‍රියයෙහි සංවරයට පැමිණෙයි. හෙ මෙ ආර්‍ය්‍ය ඉන්ද්‍රිය සංවරයෙන් සමන්‍වාගත වූයේ අධ්‍යාත්මයෙහි (කෙලෙසුන් විසින් අනාමිශ්‍රවූ) අව්‍යාසේක සුඛය විඳුනේ ය.

හේ ඉදිරිගමනෙහි හා ප්‍රත්‍යාගමනෙහි සම්පජානකාරී වෙයි. ඉදිරි බැලුම් හා දිගනුදික් බැලුම්හි සම්පජානකාරී වෙයි. අත්පා හැකුළුම් හා දිගු කිරීමෙහි සම්පජානකාරී වෙයි. සඟළ පාසිවුරු දැරුම්හි සම්පජානකාරී වෙයි. අසිත, පීත, ඛායිත හා සායිතයෙහි සම්පජානකාරී වෙයි. සුලුවටත් මහවටත් කම්හි සම්පජානකාරී වෙයි. ගමනෙහි, සිටුමෙහි හිඳුමෙහි නිදියෙහි නිදි වැරුම්හි, කථායෙහි තුෂ්ණීම්භාවයෙහි සම්පජානකාරී වෙයි.

හෙ මෙ ආර්‍ය්‍ය ශීලස්කන්ධයෙන් සමන්‍වාගත වූයේ මෙ ආර්‍ය්‍ය ඉන්ද්‍රිය-සංවරයෙන් සමන්‍වාගත වූයේ මෙ ආර්‍ය්‍ය ස්මෘතිසම්ප්‍රජන්‍යයෙන් සමන්‍වාගත වූයේ අරණ්‍යය, රුක්මුල්ය, පර්වතය, කන්දරාය, ගිරිගුහාය, සොහොනය, වනපෙතය, අබවස්ය, පිදුරු කිළිය යන විවික්තශයනාසනයක් බෙජෙයි.

හෙ පසුබත්හි පිඬුවායෙන් පෙරළා ආයේ පලක් බැඳ උඩුකය සෘජු කොට පිහිටුවා සිහි පරිමුඛ කොට එළවා හිඳුනේ ය. හෙ පඤ්චෝපාදානස්-කන්ධලෝකයෙහි අභිධ්‍යාව දුරු කොට පහ වූ අභිධ්‍යා ඇති සිතින් අභිධ්‍යායෙන් සිත පිරිසිඳු කෙරෙයි. ව්‍යාපාද සඞ්ඛ්‍යාත ප්‍රද්වේෂය දුරු කොට ව්‍යාපාදයෙන් තොර වූ සිතැත්තේ සර්වප්‍රාණ භූතයන් කෙරෙහි හිතානුකම්පා ඇතියේ ව්‍යාපාද ප්‍රද්වේෂයෙන් සිත පිරිසිඳු කෙරෙයි. ස්ත්‍යානමිද්ධය දුරු කොට පහ වූ ස්ත්‍යාන මිද්ධ ඇතියේ (විගතනීවරණයෙන්) ආලෝකසංඥ ඇතියේ ස්මෘති ඇතියේ සම්‍යක් ප්‍රඥ ඇතියේ ස්ත්‍යානමිද්ධයෙන් සිත පිරිසිඳු කෙරෙයි. ඖද්ධත්‍යය හා කෞකෘත්‍යය දුරු කොට උද්ධතභාවය නැතියේ අධ්‍යාත්මයෙහි මොනොවට සන්හුන් සිතැතියේ වාස කරයි. උද්ධච්ච කුක්කුච්චයෙන් සිත පිරිසිඳු කෙරෙයි. විචිකිත්සා දුරු කොට තරණය කළ විචිකිච්ඡා ඇතියේ කුශලධර්මයෙහි කථංකථීභාව නැතියේ වාස කරයි විචිකිච්ඡා යෙන් සිත පිරිසිඳු කෙරෙයි. හේ චිත්තයාගේ උපක්ලේශවූ ප්‍රඥාව දුර්වල කරණ මෙ පඤ්ච නීවරණයන් දුරු කොට කාමයන්ගෙන් වෙන් ව ම . ප්‍රථම ධ්‍යානයට . ද්විතීය ධ්‍යානයට .... තෘතීය ධ්‍යානයට ... චතුර්ථධ්‍යානයට එළඹ වාස කරයි.

සො එවං සමාහිතෙ චිත්තෙ පරිසුද්ධෙ පරියොදාතෙ අනඞ්ගණෙ විගතූපක්කිලෙසෙ මුදුභූතෙ කම්මනියෙ ඨිතෙ ආනෙඤ්ජප්පත්තෙ පුබ්බෙනිවාසානුස්සතිඤාණාය -පෙ- සත්තානං චුතූපපාතඤාණාය -පෙ- ආසවානං ඛයඤාණාය චිත්තං අභිනින්නාමෙති. සො ඉදං දුක්ඛන්ති යථාභූතං පජානාති, අයං දුක්ඛසමුදයොති යථාභූතං පජානාති, අයං දුක්ඛනිරොධොති යථාභූතං පජානාති, අයං දුක්ඛනිරොධගාමිනී පටිපදාති යථාභූතං පජානාති. ඉමෙ ආසවාති යථාභූතං පජානාති. අයං ආසවසමුදයොති යථාභූතං පජානාති, අයං ආසවනිරොධොති යථාභූතං පජානාති, අයං ආසවනිරොධගාමිනී පටිපදාති යථාභූතං පජානාති.

තස්ස එවං ජානතො එවං පස්සතො කාමාසවාපි චිත්තං විමුච්චති, භවාසවාපි චිත්තං විමුච්චති, අවිජ්ජාසවාපි චිත්තං විමුච්චති, විමුත්තස්මිං විමුත්තමිති ඤාණං හොති. ඛීණා ජාති වුසිතං බ්‍රහ්මචරියං කතං කරණීයං නාපරං ඉත්ථත්තායාති පජානාති.

එවං ඛො භික්ඛවෙ පුග්ගලො නෙව අත්තන්තපො හොති න අත්තපරිතාපනානුයොගමනුයුත්තො, න පරන්තපො හොති න පරපරිතාපනානුයොගමනුයුත්තො. සො අනත්තන්තපො අපරන්තපො දිට්ඨෙව ධම්මෙ නිච්ඡාතො නිබ්බුතො සීතිභූතො සුඛපටිසංවෙදී බ්‍රහ්මභූතෙන අත්තනා විහරති.

ඉමෙ ඛො භික්ඛවෙ චත්තාරො පුග්ගලා සන්තො සංවිජ්ජමානා ලොකස්මින්ති.

## 4. 4. 5. 9.

## [ තණ්හාජාලිනීසුත්තං ]

49. තණ්හං වො භික්ඛවෙ දෙසිස්සාමි ජාලිනිං සරිතං විසටං විසත්තිකං, යාය අයං ලොකො උද්ධස්තො පරියොනද්ධො තන්තාකුලකජාතො ගුලාගුණ්ඨිකජාතො මුඤ්ජබබ්බජභූතො අපායං දුග්ගතිං විනිපාතං සංසාරං නාතිවත්තති. තං සුණාථ සාධුකං මනසි කරොථ. භාසිස්සාමී'ති. එවං භන්තෙති ඛො තෙ භික්ඛූ භගවතො පච්චස්සොසුං. භගවා එතදවොච:

කතමා ච සා භික්ඛවෙ තණ්හා ජාලිනී සරිතා විසටා විසත්තිකා, යාය අයං ලොකො උද්ධස්තො පරියොනද්ධො තන්තාකුලකජාතො ගුලාගුණ්ඨිකජාතො මුඤ්ජබබ්බජභූතො අපායං දුග්ගතිං විනිපාතං සංසාරං නාතිවත්තති?.

අට්ඨාරස ඛො පනිමානි භික්ඛවෙ තණ්හාවිචරිතානි අජ්ඣත්තිකස්ස උපාදාය, අට්ඨාරසතණ්හාවිචරිතානි බාහිරස්ස උපාදාය.

හේ මෙ සෙයින් සමාධිගත වූ. සිත පිරිසිදු වූ කල්හි පර්‍ය්‍යවදාත වත් ම අඞ්ගණ රහිත වත් ම උපක්ලේශයන් විගත වත් ම මෘදු වත් ම කර්මන්‍ය වත් ම ස්ථිත වත් ම නො සැලෙනබවට පත් වත් ම පූර්වේනිවාසානුස්මෘති-ඥානය සඳහා ... සත්ත්වයන්ගේ ච්‍යුතූත්පාත ඥානය සඳහා .... ආශ්‍රවයන්ගේ ක්ෂයඥානය සඳහා සිත නතු කෙරෙයි. හේ මෙ දුකැයි යථාභූතය දන්නේ ය. මෙ දුඃඛසමුදයය යි යථාභූතය දන්නේ ය. මෙ දුඃඛනිරොධ ය යි යථාභූතය දන්නේ ය. මෙ දුඃඛනිරොධගාමිනී ප්‍රතිපද් ය යි යථාභූතය දන්නේ ය. මෙ ආශ්‍රවයෝ යි යථාභූතය දන්නේ ය. මෙ ආශ්‍රවසමුදය යි යථාභූතය දන්නේ ය. මෙ ආශ්‍රවනිරොධ ය යි යථාභූතය දන්නේ ය. මෙ ආශ්‍රවනිරොධගාමිනී ප්‍රතිපද් ය යි යථාභූතය දන්නේ ය.

මෙ සෙයින් දන්නා ඔහුගේ චිත්තය කාමාශ්‍රවයෙනුදු මිදෙයි. භවාශ්‍රවයෙනුදු චිත්තය මිදෙයි. අවිද්‍යාශ්‍රවයෙනුදු චිත්තය මිදෙයි. විමුක්ත වත් ම විමුක්තය යන ඥානය වෙයි: ''ජාතිය ක්ෂීණ විය. බ්‍රහ්මචර්‍ය්‍යය වසන ලදී. සිවුමඟ කරණී කරණ ලදී මෙබව සඳහා අන් කිසක් නැතැ'' යි දන්නේ ය.

මහණෙනි, මෙසෙයින් පුද්ගල නො ම ආත්මන්තප වෙයි නො ම ආත්මපරිතාපනානුයෝගයෙහි යෙදුනේ වෙයි. නො ම පරන්තප වෙයි. නො ම පරපරිතාපනානුයෝගයෙහි යෙදුනේ වෙයි. හෙ අත්තන්තප නො වූයේ පරන්තප නො වූයේ ඉහාත්මයෙහි ම තෘෂ්ණා නැතියේ පිරිනිවියේ සිහිල් වූයේ ධ්‍යානමාර්ගඵල නිර්වාණසුඛ විඳිනුයේ ශ්‍රෙෂ්ඨචිත්තයෙන් වාස කරයි.

මහණෙනි, ලෝකයෙහි විද්‍යමාන වන මෙ පුද්ගලයෝ සතර දෙනෙක යි.

## 4. 4. 5. 9.

## [ තණ්හාජාලිනී සූත්‍රය ]

49 මහණෙනි, යම් තෘෂ්ණායෙකින් මෙ ලෝවැසි, මතුයෙහි වළඳනා ලදුයේ, වටා වෙළුනේ, හූ කැටියක් සෙයින් අවුල් වූයේ, පෙහෙරහුගෙඩි වැනි වූයේ, මුඳුතණ බබුස්තණ වැනි වූයේ, සැපයෙන් පහව සිටි තපුරු ගති ඇති විවසව පතිත වන සංසාරය ඉක්ම නො සිටුනේ වේ ද, දැල් බඳු, විහිද සිටුනා, විසර්පිත, ඒ ඒ අරමුණෙහි ලගනා, තෘෂ්ණාව තොපට දෙසමි. එ අසව මොනවට මෙනෙහි කරව. කියන්නෙමි යි, වහන්ස, එසේ යැ යි ඒ මහණහු භගවත්හට පිළිවදන් ඇස්වූහ. භාග්‍යවතුන් වහන්සේ තෙල වදාළ සේක:

මහණෙනි, යම් තෘෂ්ණායෙකින් මෙ ලෝවැසි, මතුයෙහි වළඳනා ලදුයේ වටා වෙළුනේ හූ කැටියක් සෙයින් අවුල් වූයේ පෙහෙරහුගෙඩි වැනි වූයේ මුඳුතණ බබුස්තණ වැනි වූයේ සැපයෙන් පහව සිටි තපුරු ගති ඇති විවසව පතිත වන සංසාරය ඉක්ම නො සිටුනේ වේ ද, දැල්බඳු, විහිද සිටුනා, විසර්පිත ඒ ඒ අරමුණෙහි ලගනා, ඒ තෘෂ්ණා නම් කවර?

මහණෙනි, ආධ්‍යාත්මික පස්කඳ ගෙණ තෘෂ්ණාවිචරිතයෝ මේ අටළොස් දෙනෙකි. බාහිර පස්කඳ ගෙණ තෘෂ්ණාවිචරිතයෝ මේ අටළොස් දෙනෙකි

කතමානි අට්ඨාරස තණ්හාවිචරිතානි අජ්ඣත්තිකස්ස උපාදාය? අස්මීති භික්ඛවෙ සති ඉත්ථස්මීති හොති, එවමස්මීති හොති, අඤ්ඤථාස්මීති හොති, අසස්මීති හොති, සතස්මීති හොති, සන්ති හොති, ඉත්ථං සන්ති හොති, එවං සන්ති හොති, අඤ්ඤථා සන්ති හොති, අපිහ සන්ති හොති, අපි ඉත්ථං සන්ති හොති, අපි එවං සන්ති හොති, අපි අඤ්ඤථා සන්ති හොති, භවිස්සන්ති හොති, ඉත්ථං භවිස්සන්ති හොති, එවං භවිස්සන්ති හොති, අඤ්ඤථා භවිස්සන්ති හොති. ඉමානි අට්ඨාරස තණ්හාවිචරිතානි අජ්ඣත්තිකස්ස උපාදාය.

කතමානි අට්ඨාරස තණ්හාවිචරිතානි බාහිරස්ස උපාදාය? ඉමිනා අස්මීති භික්ඛවෙ සති ඉමිනා ඉත්ථස්මීති හොති, ඉමිනා එවස්මීති හොති, ඉමිනා අඤ්ඤථාස්මීති හොති, ඉමිනා අසස්මීති හොති, ඉමිනා සතස්මීති හොති, ඉමිනා සන්ති හොති, ඉමිනා ඉත්ථං සන්ති හොති, ඉමිනා එවං සන්ති හොති, ඉමිනා අඤ්ඤථා සන්ති හොති, ඉමිනා අපිහ සන්ති හොති, ඉමිනා අපි ඉත්ථං සන්ති හොති, ඉමිනා අපි එවං සන්ති හොති, ඉමිනා අපි අඤ්ඤථා සන්ති හොති, ඉමිනා භවිස්සන්ති හොති, ඉමිනා ඉත්ථං භවිස්සන්ති හොති, ඉමිනා එවං භවිස්සන්ති හොති, ඉමිනා අඤ්ඤථා භවිස්සන්ති හොති. ඉමානි අට්ඨාරස තණ්හාවිචරිතානි බාහිරස්ස උපාදාය.

ඉති අට්ඨාරස තණ්හාවිචරිතානි අජ්ඣත්තිකස්ස උපාදාය. අට්ඨාරස තණ්හාවිචරිතානි බාහිරස්ස උපාදාය. ඉමානි වුච්චන්ති භික්ඛවෙ ඡත්තිංස තණ්හාවිචරිතානි. ඉති එවරූපානි අතීතානි ඡත්තිංස තණ්හාවිචරිතානි, අනාගතානි ඡත්තිංස තණ්හාවිචරිතානි, පච්චුප්පන්නානි ඡත්තිංස තණ්හාවිචරිතානි, අට්ඨ ච තණ්හාවිචරිතානි සතං හොති

අයං ඛො සා භික්ඛවෙ තණ්හාජාලිනී සරිතා විසටා විසත්තිකා, යාය අයං ලොකො උද්ධස්තො පරියොනද්ධො තන්තාකුලකජාතො ගුලාගුණ්ඨිකජාතො මුඤ්ජබබ්බජභූතො අපායං දුග්ගතිං විනිපාතං සංසාරං නාතිවත්තතීති.

ආධ්‍යාත්මික පස්කඳ ගෙණ තෘෂ්ණාවිචරිතයෝ අටළොස්දෙනා කවරහ යත්: මහණෙනි, (ආධ්‍යාත්මික පස්කඳ ගෙණ තෘෂ්ණාමාන දෘෂ්ටිවශයෙන් සමූහග්‍රාහය වේ නුයි) 'මම' යෑ සි (වෙන් කොට) ගැණුම ඇති කල්හි (ක්‍ෂත්‍රියාදීන් කෙරෙහි) ''මෙබඳු ප්‍රකාර ඇත්තෙමි'' සි වෙයි. (ක්‍ෂත්‍රියාදීන් කෙරෙහි සම විසින් ගෙණ) 'මෙසේ වෙමි'යි වෙයි. (ක්‍ෂත්‍රියාදීන් කෙරෙහි අසම විසින් ගෙණ) 'අන් ප්‍රකාර ඇතියෙමි'යි වෙයි 'නිත්‍යයෙමි'යි වෙයි. 'අනිත්‍යයෙමි'යි වෙයි. (සංශයපරිවිතර්කවශයෙන්) 'වෙම් දෝ හෝ' වෙයි. 'මෙබඳු ප්‍රකාරයෙන් වෙම් දෝ හෝ'යි 'මෙසේ වෙම් දෝ හෝ'යි වෙයි. 'අන් සැටියෙකින් වෙම් දෝ හෝ'යි වෙයි. 'මම වියහෙම් දෝ හෝ'යි 'මම මෙබඳු ප්‍රකාර ඇති විය හෙම් දෝ හෝ'යි වෙයි. 'මම මෙසේ වියහෙම් දෝ හෝ'යි වෙයි. 'මම අන් සැටියකින් වියහෙම් දෝ හෝ'යි වෙයි. (අනාගතවශයෙන්) වෙමි'යි වෙයි. 'මෙබඳු ප්‍රකාර ඇතියෙම් වෙමි' යි වෙයි. 'මෙසේ වෙමි'යි වෙයි. 'අන් සැටියකින් වෙමි'යි වෙයි. ආධ්‍යාත්මික පස්කඳ ගෙණ මේ තෘෂ්ණා විචරිතයෝ අටළොස් දෙනහ.

බාහිර පස්කඳ ගෙණ තෘෂ්ණාවිචරිතයෝ අටළොස් දෙන කවරහ යත්? මහණෙනි, මේ රූපාදීන් 'මම' යෑසි වෙන් කොට ගැණුම ඇති කල්හි මේ රූපාදීන් 'මෙබඳු, ප්‍රකාර ඇතියෙමි'යි වෙයි. මේ රූපාදීන් 'මෙසේ වෙමි'යි වෙයි මේ රූපාදීන් 'අන් සැටියකින් වෙමි'යි වෙයි. මේ රූපාදීන් 'නිත්‍යයෙමි'යි වෙයි. මේ රූපාදීන් 'අනිත්‍යයෙමි'යි වෙයි. (සංශයවිතර්කවශයෙන්) මේ රූපාදීන් 'වෙම් දෝ හෝ යි'වෙයි. මේ රූපාදීන් 'මෙබඳු ප්‍රකාරයෙන් වෙම් දෝ හෝ යි වෙයි. මේ රූපාදීන් 'මෙසේ වෙම් දෝ හෝ'යි වෙයි. මේ රූපාදීන් 'අන්සැටියෙකින් වෙම් දෝ හෝ'යි වෙයි. මේ රූපාදීන් 'මම වියහෙම් දෝ හෝ'යි වෙයි. මේ රූපාදීන් 'මම මෙබඳු ප්‍රකාර ඇතිවියහෙම් දෝ හෝ'යි වෙයි. මේ රූපාදීන් 'මම මෙසේ වියහෙම් දෝ හෝ' යි වෙයි. මේ රූපාදීන් 'මම අන් සැටියෙකින් වියහෙම් දෝ හෝ'යි වෙයි. (අනාගතවශයෙන්) මේ රූපාදීන් 'වෙමි' යි වෙයි. මේ රූපාදීන් 'මෙ බඳු ප්‍රකාර ඇතියෙම් වෙමි'යි වෙයි. මේ රූපාදීන් 'මෙසේ වෙමි'යි වෙයි. මේ රූපාදීන් 'අන් සැටියෙකින් වෙමි'යි වෙයි. බාහිර පස්කඳ ගෙණ මේ තෘෂ්ණා විචරිතයෝ අටළොස් දෙනහ.

මෙසෙයින් ආධ්‍යාත්මික පස්කඳ ගෙණ තෘෂ්ණාවිචරිතයෝ අටළොස් දෙනෙක. බාහිර පස්කඳ ගෙණ තෘෂ්ණාවිචරිතයෝ අටළොස් දෙනෙකැයි මහණෙනි, මොහු සතිස් තෘෂ්ණාවිචරිතයහ යි කියනු ලැබේ. මෙසේ මෙබඳු අතීත තෘෂ්ණාවිචරතයෝ සතිසෙක. අනාගත තෘෂ්ණාවිචරිතයෝ සතිසෙක. ප්‍රත්‍යුත්පන්න තෘෂ්ණාවිචරිතයෝ සතිසෙකැයි (මෙ හැම ගොත්) තෘෂ්ණාවිචරිත අටතුරාසියෙක් වෙයි.

මහණෙනි, යම් තෘෂ්ණායෙකින් මෙ ලෝවැසි, මතුයෙහි වෙළඳතාලදූයේ වටා වෙළුනේ හූ කැටියක් සෙයින් අවුල් වූයේ පෙහෙර හූ ගෙඩි වැනි වූයේ මුදුතණ බබුස්තණ වැනි වූයේ සැපයෙන් පහව සිටි නපුරු ගති ඇති විවසව පතිත වන සංසාරය ඉක්ම නො සිටුනේ වේ ද, දූල්බඳු, විහිද සිටුනා, විසඹිත්‍ය ඒ ඒ අරමුණෙහි ලගනා මෝ ඒ තෘෂ්ණා ය.

## 4. 4. 5. 10

## [ පෙම-දොසසුත්තං ]

50. චත්තාරිමානි භික්ඛවෙ ජායන්ති. කතමානි චත්තාරි? පෙමා පෙමං ජායති. පෙමා දොසො ජායති. දොසා පෙමං ජායති. දොසා දොසො ජායති

කථඤ්ච භික්ඛවෙ පෙමා පෙමං ජායති? ඉධ භික්ඛවෙ පුග්ගලො පුග්ගලස්ස ඉට්ඨො හොති කන්තො මනාපො, තං පරෙ ඉට්ඨෙන කන්තෙන මනාපෙන සමුදාචරන්ති. තස්ස එවං හොති: යො ඛො මායං පුග්ගලො ඉට්ඨො කන්තො මනාපො, තං පරෙ ඉට්ඨෙන කන්තෙන මනාපෙන සමුදාචරන්තීති සො තෙසු පෙමං ජනෙති එවං ඛො භික්ඛවෙ පෙමා පෙමං ජායති.

කථඤ්ච භික්ඛවෙ පෙමා දොසො ජායති? ඉධ භික්ඛවෙ පුග්ගලො පුග්ගලස්ස ඉට්ඨො හොති කන්තො මනාපො. තං පරෙ අනිට්ඨෙන අකන්තෙන අමනාපෙන සමුදාචරන්ති. තස්ස එවං හොති: යො ඛො මායං පුග්ගලො ඉට්ඨො කන්තො මනාපො, තං පරෙ අනිට්ඨෙන අකන්තෙන අමනාපෙන සමුදාචරන්තීති සො තෙසු දොසං ජනෙති. එවං ඛො භික්ඛවෙ පෙමා දොසො ජායති.

කථඤ්ච භික්ඛවෙ දොසා පෙමං ජායති? ඉධ භික්ඛවෙ පුග්ගලො පුග්ගලස්ස අනිට්ඨො හොති අකන්තො අමනාපො. තං පරෙ අනිට්ඨෙන අකන්තෙන අමනාපෙන සමුදාචරන්ති. තස්ස එවං හොති: යො ඛො මායං පුග්ගලො අනිට්ඨො අකන්තො අමනාපො, තං පරෙ අනිට්ඨෙන අකන්තෙන අමනාපෙන සමුදාචරන්තීති සො තෙසු පෙමං ජනෙති. එවං ඛො භික්ඛවෙ දොසා පෙමං ජායති.

කථඤ්ච භික්ඛවෙ දොසා දොසො ජායති? ඉධ භික්ඛවෙ පුග්ගලො පුග්ගලස්ස අනිට්ඨො හොති අකන්තො අමනාපො තං පරෙ ඉට්ඨෙන කන්තෙන මනාපෙන සමුදාචරන්ති. තස්ස එවං හොති: යො ඛො මායං පුග්ගලො අනිට්ඨො අකන්තො අමනාපො, තං පරෙ ඉට්ඨෙන කන්තෙන මනාපෙන සමුදාචරන්තීති, සො තෙසු දොසං ජනෙති. එවං ඛො භික්ඛවෙ දොසා දොසො ජායති. ඉමානි ඛො භික්ඛවෙ චත්තාරි ජායන්ති.

යස්මිං භික්ඛවෙ සමයෙ භික්ඛු විවිච්චෙව කාමෙහි -පෙ- පඨමං ඣානං උපසම්පජ්ජ විහරති, යං පිස්ස පෙමා පෙමං ජායති, තම්පිස්ස තස්මිං සමයෙ න හොති. යොපිස්ස පෙමා දොසො ජායති, සොපිස්ස තස්මිං සමයෙ න හොති. යම්පිස්ස දොසා පෙමං ජායති, තම්පිස්ස තස්මිං සමයෙ න හොති. යොපිස්ස දොසා දොසො ජායති, සොපිස්ස තස්මිං සමයෙ න හොති.

## 4. 4. 5. 10

## [ප්‍රේම – ද්වේෂ සූත්‍රය]

50. මහණෙනි, මොහු සතර දෙනෙක් උපදනාහු ය. කවර සතර දෙනෙක යත්: ප්‍රේමහේතුයෙන් ප්‍රේමය උපදනේ ය. ප්‍රේමහේතුයෙන් ද්වේෂය උපදනේ ය. ද්වේෂහෙතුයෙන් ප්‍රේමය උපදනේ ය. ද්වේෂහේතුයෙන් ද්වේෂය උපදනේ ය.

මහණෙනි, කෙසේ ප්‍රේමහේතුයෙන් ප්‍රේමය උපදනේය යත්: මහණෙනි, මෙලොව පුද්ගලයෙක් පුද්ගලයක්හට ඉෂ්ට වූයේ කාන්ත වූයේ මනාප වූයේ වෙයි. පරහු උහු ඉෂ්ට කාන්ත මනාප වචනයෙන් බෙණෙත්. ඔහට මේ බඳු සිතෙක් වෙයි: යම් මේ පුද්ගලයෙක් මට ඉෂ්ට කාන්ත මනාප වේ ද, පරහු ඔහු ඉෂ්ට කාන්ත මනාප බසින් බෙණෙත් යයි හේ ඔවුන් කෙරෙහි පෙම් උපදවයි. මහණෙනි, මෙ සෙයින් ප්‍රේමහේතුයෙන් ප්‍රේමය උපදනේ ය.

මහණෙනි, කෙසේ ප්‍රේමහේතුයෙන් ද්වේෂය උපදනේ ය යත්: මහණෙනි, මෙ ලොව පුද්ගලයෙක් පුද්ගලයක්හට ඉෂ්ට ද කාන්ත ද මනාප ද වෙයි. පරහු උහු අනිෂ්ට අකාන්ත අමනාප වශයෙන් බෙණෙත්. ඔහට මෙවන් සිතෙක් වෙයි: යම් මෙ පුද්ගලයෙක් මට ඉෂ්ට කාන්ත මනාප වේ ද, පරහු ඔහු අනිෂ්ට අකාන්ත අමනාප බසින් බෙණෙති යි හෙ ඔවුන් කෙරෙහි ද්වේෂය උපදවයි. මහණෙනි, මෙ සෙයින් ප්‍රේමහේතුයෙන් ද්වේෂය උපදනේ ය.

මහණෙනි, කෙසේ ද්වේෂහේතුයෙන් ප්‍රේමය උපදනේය යත්: මහණෙනි, මෙ ලොව පුද්ගලයෙක් පුද්ගලයක්හට අනිෂ්ට ද අකාන්ත ද අමනාප ද වෙයි. පරහු උහු අනිෂ්ට අකාන්ත අමනාප බසින් බෙණෙත්. ඔහට මෙවන් සිතෙක් වෙයි: යම් මෙ පුද්ගලයෙක් මට අනිෂ්ට අකාන්ත අමනාප වේ ද, පරහු උහු අනිෂ්ට අකාන්ත අමනාප බසින් බෙණෙති යි හෙ ඔවුන් කෙරෙහි පෙම් උපදවයි. මහණෙනි, මේසෙයින් ද්වේෂහේතුයෙන් ප්‍රේමය උපදනේ ය.

මහණෙනි, කෙසේ ද්වේෂහේතුයෙන් ද්වේෂය උපදනේ ය යත්: මහණෙනි, මේ ලොව පුද්ගලයෙක් පුද්ගලයක්හට අනිෂ්ට ද අකාන්ත ද අමනාප ද වෙයි. පරහු උහු ඉෂ්ට කාන්ත මනාප බසින් බෙණෙත්. ඔහට මෙවන් සිතෙක් වෙයි: යම් මෙ පුද්ගලයෙක් මට අනිෂ්ටත් අකාන්තත් අමනාපත් වේ ද, පරහු ඔහු ඉෂ්ට කාන්ත මනාප බසින් බෙණෙති යි හේ ඔවුන් කෙරෙහි ද්වේෂය උපදවයි. මහණෙනි, මෙ සෙයින් ද්වේෂහේතුයෙන් ද්වේෂය උපදනේ ය. මහණෙනි, මෙ සතර දෙනා උපදිති.

මහණෙනි, යම් කාලෙක මහණ කාමයෙන් වෙන්ව ම ... ප්‍රථමධ්‍යානය උපයා වෙසේ ද, ඔහට ප්‍රේමහේතුයෙන් යම් ප්‍රේමයෙක් උපදනේ ද, එකල ඔහට එ ද නො වේ. ඔහට මෙ ප්‍රේමහේතුයෙන් යම් ද්වේෂයෙක් උපදනේ ද එකල ඔහට එ ද නො වෙයි. ඔහට ද්වේෂහේතුයෙන් යම් ප්‍රේමයෙක් උපදනේ ද එකල ඔහට එ ද නො වෙයි. ඔහට ද්වේෂහේතුයෙන් යම් ද්වේෂයෙක් උපදනේ ද එකල ඔහට එ ද නො වේ.

යස්මිං භික්ඛවෙ සමයෙ භික්ඛු විතක්කවිචාරානං වූපසමා -පෙ- දුතියං ඣානං -පෙ- තතියං ඣානං -පෙ- චතුත්ථං ඣානං උපසම්පජ්ජ විහරති, යම්පිස්ස පෙමා පෙමං ජායති. තම්පිස්ස තස්මිං සමයෙ න හොති. යොපිස්ස පෙමා දොසො ජායති, සොපිස්ස තස්මිං සමයෙ න හොති. යම්පිස්ස දොසා පෙමං ජායති, තම්පිස්ස තස්මිං සමයෙ න හොති. යොපිස්ස දොසා දොසො ජායති, සොපිස්ස තස්මිං සමයෙ න හොති.

යස්මිං භික්ඛවෙ සමයෙ භික්ඛු ආසවානං ඛයා අනාසවං චෙතොවිමුත්තිං පඤ්ඤාවිමුත්තිං දිට්ඨෙව ධම්මෙ සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරති, යම්පිස්ස පෙමා පෙමං ජායති, තම්පිස්ස පහීණං හොති උච්ඡින්නමූලං තාලාවත්ථුකතං අනභාවකතං ආයතිං අනුප්පාදධම්මං. යොපිස්ස පෙමා දොසො ජායති සොපිස්ස පහීණො හොති, උච්ඡින්නමූලො තාලාවත්ථුකතො අනභාවකතො ආයතිං අනුප්පාදධම්මො. යම්පිස්ස දොසා පෙමං ජායති,ති තම්පිස්ස පහීණං හොති, උච්ඡින්නමූලං තාලාවත්ථුකතං අනභාවකතං ආය අනුප්පාදධම්මං. යොපිස්ස දොසා දොසො ජායති, සොපිස්ස පහීණො හොති උච්ඡින්නමූලො තාලාවත්ථුකතො අනභාවකතො ආයතිං අනුප්පාදධම්මො.

අයං වුච්චති භික්ඛවෙ භික්ඛු නෙවුස්සෙනෙති න පටිස්සෙනෙති න ධූපායති න පජ්ජලති න අපජ්ඣායති.

කථඤ්ච භික්ඛවෙ භික්ඛු උස්සෙනෙති? ඉධ භික්ඛවෙ භික්ඛු රූපං අත්තතො සමනුපස්සති, රූපවන්තං වා අත්තානං, අත්තනි වා රූපං, රූපස්මිං වා අත්තානං. වෙදනං අත්තතො සමනුපස්සති, වෙදනාවන්තං වා අත්තානං අත්තනි වා වෙදනං, වෙදනාය වා අත්තානං. සඤ්ඤං අත්තතො සමනුපස්සති, සඤ්ඤාවන්තං වා අත්තානං, අත්තනි වා සඤ්ඤං, සඤ්ඤාය වා අත්තානං. සංඛාරෙ අත්තතො සමනුපස්සති, සංඛාරවන්තං වා අත්තානං, අත්තනි වා සංඛාරෙ, සංඛාරෙසු වා අත්තානං. විඤ්ඤාණං අත්තතො සමනුපස්සති, විඤ්ඤාණවන්තං වා අත්තානං, අත්තනි වා විඤ්ඤාණං, විඤ්ඤාණස්මිං වා අත්තානං. එවං ඛො භික්ඛවෙ භික්ඛු උස්සෙනෙති.

මහණෙනි, යම් කලෙක මහණ විතර්කවිචාරයන්ගේ ව්‍යුපශමයෙන් ... ද්විතීයධ්‍යානය ... තෘතීයධ්‍යානය ... චතුර්ථධ්‍යානය උපයා වෙසේ ද, ඔහට ප්‍රේමහේතුයෙන් යම් ප්‍රේමයෙක් උපදනේ ද, එකල ඔහට එ ද නො වෙයි. ඔහට ප්‍රේමහෙතුයෙන් යම් ද්වේෂයෙක් උපදනේ ද, එකල ඔහට එ ද නො වෙයි. ඔහට ද්වේෂහෙතුයෙන් යම් ප්‍රේමයෙක් උපදනේ ද, එකල ඔහට එ ද නො වෙයි. ඔහට ද්වෂහෙතුයෙන් යම් ද්වෙෂයෙක් උපදනේ ද එකල ඔහට එ ද නො වෙයි.

මහණෙනි, යම් කලෙක මහණ ආස්‍රවක්‍ෂයයෙන් අනාස්‍රව වූ චෙතොවිමුක්ති හා ප්‍රඥාවිමුක්ති දිට්ඨධම්මයෙහි ම තමා විසින් මෙසෙසින් දැන පසක් කොට උපයා ගෙණ වෙසේ ද, ඔහට ප්‍රේමහේතුයෙන් යම් ප්‍රේමයෙක් උපදනේ ද, ඔහට එ ද ප්‍රහීණ වෙයි. උදුරන් මුල් වෙයි. මුදුන් සුන් තලක් සෙයින් අවසතුක වෙයි. කළ අභාභාව ඇතියේ වෙයි. මතුයෙහි නො උපදනා සැහැවි ඇතියේ වෙයි. ඔහට ප්‍රේමහේතුයෙන් යම් ද්වේෂයෙක් උපදනේ ද, ඔහට එ ද ප්‍රහීණ වෙයි. උදුරන් මුල් වෙයි. මුදුන් සුන් තලක් සෙයින් අවසතුක වෙයි. කළ අභාභාව ඇතියේ වෙයි. මතුයෙහි නො උපදනා සැහැවි ඇතියේ වෙයි. ඔහට ද්වේෂහේතුයෙන් යම් ප්‍රේමයෙක් උපදනේ ද ඔහට එ ද ප්‍රහීණ වෙයි. උදුරන් මුල් වෙයි. මුදුන්සුන් තලක් සෙයින් අවසතුක වෙයි. කළ අභාභාව ඇතියේ වෙයි. මතුයෙහි නො උපදනා සැහැවි ඇතියේ වෙයි. ඔහට ද්වේෂහේතුයෙන් යම් ද්වේෂයෙක් උපදනේ ද, එ ද ඔහට ප්‍රහීණ වෙයි. උදුරන්මුල් වෙයි. මුදුන්සුන් තලක් සෙයින් අවසතුක වෙයි. කළ අභාභාව ඇතියේ වෙයි. මතුයෙහි නො උපදනා සැහැවි ඇතියේ වෙයි.

මහණෙනි, මෙ මහණ (දෘෂ්ටි විසින්) නොම හුවන්නේ යයි, (ප්‍රතිවිරුද්ධව කලහ විග්‍රහ විසින්) නො හුවන්නේ යයි, (තෘෂ්ණා විචරිත විසින්) නො දුවන්නේය යි, (බාහිර පස්කඳ ගෙණ තෘෂ්ණාවිචරිත විසින්) නො දිලෙන්නේ ය යි, (අස්මිමාන විසින්) වෙන් කොට නො හහනේ ය යි කියනු ලැබේ.

මහණෙනි, කෙසෙසින් (දෘෂ්ටි විසින්) හුවන්නේ ය යත්: මහණෙනි, මෙ සස්නෙහි මහණ රූපය ආත්ම විසින් දක්නේ ය. ආත්මය රූපවත් කොට හෝ රූපය ආත්මයෙහි ලා හෝ ආත්මය රූපයෙහි ලා හෝ දක්නේ ය. වෙදනාව ආත්ම විසින් දක්නේ ය. ආත්මය වේදනාවත් කොට හෝ වේදනාව ආත්මයෙහි ලා හෝ ආත්මය වේදනායෙහි ලා හෝ දක්නේ ය. සංඥාව ආත්ම විසින් දක්නේ ය. ආත්මය සංඥාවත් කොට හෝ සංඥාව ආත්මයෙහි ලා හෝ ආත්මය සංඥායෙහි ලා හෝ දක්නේ ය. සංස්කාරයන් ආත්ම විසින් දක්නේ ය. ආත්මය සංස්කාරවත් කොට හෝ සංස්කාරයන් ආත්මයෙහි ලා හෝ ආත්මය සංස්කාරයෙහි ලා හෝ දක්නේ ය. විඥානය ආත්ම විසින් දක්නේ ය. ආත්මය විඥානවත් කොට හෝ විඥානය ආත්මයෙහි ලා හෝ ආත්මය විඥානයෙහි ලා හෝ දක්නේ ය. මහණෙනි, මෙ සෙසින් මහණ දෘෂ්ටි විසින් හුවන්නේ ය.

කථඤ්ච භික්ඛවෙ භික්ඛු න උස්සෙනෙති? ඉධ භික්ඛවෙ භික්ඛු න රූපං අත්තතො සමනුපස්සති, න රූපවන්තං වා අත්තානං, න අත්තනි වා රූපං, න රූපස්මිං වා අත්තානං. න වෙදනං අත්තතො සමනුපස්සති, න වෙදනාවන්තං වා අත්තානං, න අත්තනි වා වෙදනං, න වෙදනාය වා අත්තානං. න සඤ්ඤං අත්තතො සමනුපස්සති, න සඤ්ඤාවන්තං වා අත්තානං, න අත්තනි වා සඤ්ඤං, න සඤ්ඤාය වා අත්තානං. න සංඛාරෙ අත්තතො සමනුපස්සති, න සංඛාරවන්තං වා අත්තානං, න අත්තනි වා සංඛාරෙ, න සංඛාරෙසු වා අත්තානං. න විඤ්ඤාණං අත්තතො සමනුපස්සති, න විඤ්ඤාණවන්තං වා අත්තානං, න අත්තනි වා විඤ්ඤාණං, න විඤ්ඤාණස්මිං වා අත්තානං. එවං ඛො භික්ඛවෙ භික්ඛු න උස්සෙනෙති.

කථඤ්ච භික්ඛවෙ භික්ඛු පටිසෙනෙති? ඉධ භික්ඛවෙ භික්ඛු අක්කොසන්තං පච්චක්කොසති, රොසන්තං පටිරොසති, භණ්ඩන්තං පටිභණ්ඩති. එවං ඛො භික්ඛවෙ භික්ඛු පටිසෙනෙති.

කථඤ්ච භික්ඛවෙ භික්ඛු න පටිසෙනෙති? ඉධ භික්ඛවෙ භික්ඛු අක්කොසන්තං න පච්චක්කොසති, රොසන්තං න පටිරොසති, භණ්ඩන්තං න පටිභණ්ඩති. එවං ඛො භික්ඛවෙ භික්ඛු න පටිසෙනෙති.

කථඤ්ච භික්ඛවෙ භික්ඛු ධූපායති? අස්මීති භික්ඛවෙ සති ඉත්ථස්මීති හොති, එවංස්මීති හොති, අඤ්ඤථාස්මීති හොති, අසස්මීති හොති, සතස්මීති හොති, සන්ති හොති, ඉත්ථං සන්ති හොති, එවං සන්ති හොති, අඤ්ඤථා සන්ති හොති, අපිහ සන්ති හොති, අපි ඉත්ථං සන්ති හොති, අපි එවං සන්ති හොති, අපි අඤ්ඤථා සන්ති හොති, භවිස්සන්ති හොති, ඉත්ථං භවිස්සන්ති හොති, එවං භවිස්සන්ති හොති, අඤ්ඤථා භවිස්සන්ති හොති. එවං ඛො භික්ඛවෙ භික්ඛු ධූපායති.

කථඤ්ච භික්ඛවෙ භික්ඛු න ධූපායති? අස්මීති භික්ඛවෙ අසති ඉත්ථස්මීති න හොති, අඤ්ඤථස්මීති න හොති, අසස්මීති න හොති, සතස්මීති න හොති, සන්ති න හොති, ඉත්ථං සන්ති න හොති, එවං සන්ති න හොති, අඤ්ඤථා සන්ති න හොති, අපිහ සන්ති න හොති, අපි ඉත්ථං සන්ති න හොති, අපි එවං සන්ති න හොති, අපි අඤ්ඤථා සන්ති න හොති, භවිස්සන්ති න හොති, ඉත්ථං භවිස්සන්ති න හොති, එවං භවිස්සන්ති න හොති, අඤ්ඤථා භවිස්සන්ති න හොති. එවං ඛො භික්ඛවෙ භික්ඛු න ධූපායති.

මහණෙනි, කෙසෙසින් මහණ නො හුවන්නේ ය යත්: මහණෙනි, මෙ සස්නෙහි මහණ රූපය ආත්ම විසින් නො දක්නේ ය. ආත්මය රූපවත් කොට හෝ නො දක්නේ ය. රූපය ආත්මයෙහි ලා හෝ නො දක්නේ ය. ආත්මය රූපයෙහි ලා හෝ නො දක්නේ ය. වේදනා ආත්ම විසින් නො දක්නේ ය. ආත්මය වේදනාවත් කොට හෝ නො දක්නේ ය. වේදනාව ආත්මයෙහි ලා හෝ නො දක්නේ ය. ආත්මය වේදනායෙහි ලා හෝ නො දක්නේ ය. සංඥව ආත්ම විසින් නො දක්නේ ය. ආත්මය සංඥවත් කොට හෝ නො දක්නේ ය. සංඥව ආත්මයෙහි ලා හෝ නො දක්නේ ය. ආත්මය සංඥයෙහි ලා හෝ නො දක්නේ ය. සංස්කාරයන් ආත්ම විසින් නො දක්නේ ය. ආත්මය සංස්කාරවත් කොට නො දක්නේ ය. සංස්කාරයන් ආත්මයෙහි ලා හෝ නො දක්නේ ය. ආත්මය සංස්කාරයෙහි ලා හෝ නො දක්නේ ය. විඤනය ආත්ම විසින් නො දක්නේ ය. ආත්මය විඤනවත් කොට හෝ නො දක්නේ ය. විඤනය ආත්මයෙහි ලා හෝ නො දක්නේ ය. ආත්මය විඤනයෙහි ලා හෝ නො දක්නේ ය. මහණෙනි, මෙ සෙසින් මහණ නො හුවන්නේ ය.

මහණෙනි, කෙසෙසින් මහණ ප්‍රතිවිරුද්ධ විසින් හුවන්නේ ය යත්: මහණෙනි, මෙ සස්නෙහි මහණ අකෙස්ලි කරණහුට පෙරලා අකෙස්ලි කෙරෙයි. රොස්නහුට පෙරලා රොස්නේ වෙයි. ඔබර කරන්නහුට පෙරලා ඔබර කෙරෙයි මහණෙනි, මෙ සෙසින් මහණ විරුද්ධ විසින් හුවන්නේ ය.

මහණෙනි, කිසෙසින් මහණ විරුද්ධ විසින් නො හුවන්නේ ය යත්: මහණෙනි, මෙ සස්නෙහි මහණ අකෙස්ලි කරණහුට පෙරලා අකෙස්ලි නො කරණේ වේ ද, රොස්නහුට පෙරලා නො රොස්නේ වේ ද, කලහ කරන්නහුට පෙරලා කලහ නො කරන්නේ වේ ද, මහණෙනි, මෙ සෙසින් මහණ විරුද්ධ විසින් නො හුවන්නේ ය.

මහණෙනි, කිසෙසින් මහණ දුමන්නේ ය යත්: මහණෙනි, 'මම'ය යන්න ඇති වත් ම 'මෙ ප්‍රකාරයෙන් වෙමි'යි වෙයි. 'මෙබඳු වෙමි'යි වෙයි. 'අන් පරිදි වෙමි'යි වෙයි. 'නිත්‍යයෙමි'යි වෙයි. 'අනිත්‍යයෙමි'යි වෙයි. 'වෙම් දෙ හෝ' යි වෙයි. 'මේ ප්‍රකාරයෙන් වෙම් දෙ හෝ' යි වෙයි. මෙබඳු වෙම් දෙ හෝ' යි වෙයි. 'අන් පරිදි වෙම් දෝ හෝ' යි වෙයි. 'මම වෙම්ව' යි වෙයි. 'මම මෙ ප්‍රකාරයෙන් වෙම්ව'යි වෙයි. 'මම මෙබඳු වෙම්ව'යි වෙයි. 'අන් පරිදි වෙම්ව' යි වෙයි. 'මතු වෙම්ව' යි වෙයි. 'මේ ප්‍රකාරයෙන් වෙම්ව' යි වෙයි. 'මෙබඳු වෙම්ව' යි වෙයි 'අන් පරිදි වෙම්ව' යි වෙයි. මහණෙනි, මෙසෙසින් මහණ දුමන්නේ ය.

මහණෙනි, කිසෙසින් මහණ නො දුමන්නේ ය යත්: මහණෙනි, 'මම'ය යන්න නැතිවත් ම 'මෙ ප්‍රකාරයෙන් වෙමි'යි නො වෙයි. 'මෙබඳු වෙමි'යි නො වෙයි. 'අන් පරිදි වෙමි'යි නො වෙයි. 'නිත්‍යයෙමි'යි නො වෙයි. 'අනිත්‍යයෙමි'යි නො වෙ'යි. 'වෙම් දෙ හෝ'යි නො වෙයි. 'මෙ ප්‍රකාරයෙන් වෙම් දෝ හෝ'යි නො වෙයි. 'මෙබඳු වෙම් දෝ හෝ'යි නො වෙයි. 'අන් පරිදි වෙම් දෝ හෝ'යි නො වෙයි. 'මම වෙම්ව'යි නො වෙයි 'මම මෙ ප්‍රකාරයෙන් වෙම්ව'යි නො වෙයි. 'මම මෙබඳු වෙම්ව'යි නො වෙයි. 'අන් පරිදි වෙම්ව'යි නො වෙයි. 'මතු වෙම්ව'යි නො වෙයි 'මෙ ප්‍රකාරයෙන් වෙම්ව'යි නො වෙයි මෙබඳු වෙම්ව'යි නොවෙයි. 'අන් පරිදි වෙම්ව'යි නොවෙයි. මහණෙනි, මෙසෙසින් මහණ නො දුමන්නේ ය.

කථඤ්ච භික්ඛවෙ භික්ඛු පජ්ජලති? ඉමිනා අස්මීති භික්ඛවෙ සති ඉමිනා ඉත්ථස්මීති හොති, ඉමිනා එවම්ස්මීති හොති ඉමිනා අඤ්ඤථස්මීති හොති, ඉමිනා අසස්මීති හොති, ඉමිනා සතස්මීති හොති, ඉමිනා සන්ති හොති, ඉමිනා ඉත්ථං සන්ති හොති, ඉමිනා එවං සන්ති හොති, ඉමිනා අඤ්ඤථා සන්ති හොති, ඉමිනා අපිහ සන්ති හොති, ඉමිනා අපි ඉත්ථං සන්ති හොති, ඉමිනා අපි එවං සන්ති හොති, ඉමිනා අපි අඤ්ඤථා සන්ති හොති, ඉමිනා භවිස්සන්ති හොති, ඉමිනා ඉත්ථං භවිස්සන්ති හොති, ඉමිනා එවං භවිස්සන්ති හොති, ඉමිනා අඤ්ඤථා භවිස්සන්ති හොති. එවං ඛො. භික්ඛවෙ භික්ඛු පජ්ජලති.

කථඤ්ච භික්ඛවෙ භික්ඛු න පජ්ජලති? ඉමිනා අස්මීති භික්ඛවෙ අසති ඉමිනා ඉත්ථස්මීති න හොති, ඉමිනා එවම්ස්මීති න හොති, ඉමිනා අඤ්ඤථස්මීති න හොති, ඉමිනා අසස්මීති න හොති, ඉමිනා සතස්මීති න හොති, ඉමිනා සන්ති න හොති, ඉමිනා ඉත්ථං සන්ති න හොති, ඉමිනා එවං සන්ති න හොති, ඉමිනා අඤ්ඤථා සන්ති න හොති, ඉමිනා අපිහ සන්ති න හොති, ඉමිනා අපි ඉත්ථං සන්ති න හොති, ඉමිනා අපි එවං සන්ති න හොති ඉමිනා අපි අඤ්ඤථා සන්ති න හොති, ඉමිනා භවිස්සන්ති න හොති, ඉමිනා ඉත්ථං භවිස්සන්ති න හොති, ඉමිනා එවං භවිස්සන්ති න හොති, ඉමිනා අඤ්ඤථා භවිස්සන්ති න හොති. එවං ඛො භික්ඛවෙ භික්ඛු න පජ්ජලති.

කථඤ්ච භික්ඛවෙ භික්ඛු අපජ්ඣායති? ඉධ භික්ඛවෙ භික්ඛුනො අස්මිමානො පහීණො න හොති -පෙ- [ආයතිං උප්පාදධම්මො.] එවං භික්ඛවෙ භික්ඛු අපජ්ඣායති

කථඤ්ච භික්ඛවෙ භික්ඛු න අපජ්ඣායති? ඉධ භික්ඛවෙ භික්ඛුනො අස්මිමානො පහීණො හොති, උච්ඡින්නමූලො තාලාවත්ථුකතො අනභාවකතො ආයතිං අනුප්පාදධම්මො. එවං ඛො භික්ඛවෙ භික්ඛු න අපජ්ඣායතීති.

මහාවග්ගො පඤ්චමො.*

මහාපණ්ණාසකො චතුත්ථො.

---

*තණ්හුද්දෙසනං: මජ්ස.

"සොතානුගතං ඨානං භද්දිය සාමුග වප්පසාළ්හා ච
මල්ලික අත්තන්තපො තණ්හා පෙමෙන ච දසා තෙති."

මහණෙනි, කිසෙයින් මහණ (තෘෂ්ණාවිචරිත විසින්) දුල්නේ ය යත්: මෙබඳු රූපාදියෙන් 'වෙමි'යි ඇති වත් ම, මෙ රූපාදියෙන් 'මේ ප්‍රකාරයෙන් වෙමි'යි වෙයි. මෙ රූපාදියෙන් 'මෙබඳු වෙමි'යි වෙයි. මෙ රූපාදියෙන් 'අන් පරිදි වෙමි'යි වෙයි. මෙ රූපාදියෙන් 'නිත්‍යයෙමි'යි වෙයි මෙ රූපාදියෙන් 'අනිත්‍යයෙමි' යි වෙයි. මෙ රූපාදියෙන් 'වෙම් දෝ හෝ' යි වෙයි. මෙ රූපාදියෙන් 'මෙ ප්‍රකාරයෙන් වෙම් දෝ හෝ'යි වෙයි. මෙ රූපාදියෙන් 'මෙබඳු වෙම් දෝ හෝ' යි වෙයි. මෙ රූපාදියෙන් 'අන් පරිදි වෙම් දෝ හෝ' යි වෙයි. මෙ රූපාදියෙන් 'වෙම්ව'යි (ප්‍රාර්ථනා විසින්) වෙයි. මෙ රූපාදියෙන් 'මෙ ප්‍රකාරයෙන් වෙම්ව'යි වෙයි. මෙ රූපාදියෙන් 'මෙබඳු වෙම්ව' යි වෙයි. මෙ රූපාදියෙන් 'අන් පරිදි වෙම්ව' යි වෙයි. මෙ රූපාදියෙන් 'මතු වෙම්ව'යි වෙයි. මේ රූපාදියෙන් 'මෙ ප්‍රකාරයෙන් වෙම්ව'යි වෙයි. මෙ රූපාදියෙන් 'මෙබඳු වෙම්ව'යි වෙයි. මෙ රූපාදියෙන් 'අන් පරිදි වෙම්ව'යි වෙයි. මහණෙනි, මෙ සෙයින් මහණ දුල්නේ ය.

මහණෙනි, කිසෙයින් මහණ නො දුල්නේය යත්: මෙ රූපාදියෙන් 'මම' ය යන්න නැතිවත් ම, මෙ රූපාදියෙන් 'මෙ ප්‍රකාරයෙන් වෙමි'යි නො වෙයි. මෙ රූපාදියෙන් 'මේබඳු වෙමි'යි නො වෙයි. මෙ රූපාදියෙන් 'අන්පරිදි වෙමි'යි නො වෙයි. මෙ රූපාදියෙන් 'නිත්‍යයෙමි'යි නො වෙයි. මෙ රූපාදියෙන් 'අනිත්‍යයෙමි'යි නො වෙයි. මෙ රූපාදියෙන් 'වෙම් දෝ හෝ'යි නො වෙයි. මෙ රූපාදියෙන් 'මෙ ප්‍රකාරයෙන් වෙම් දෝ හෝ'යි නො වෙයි. මෙ රූපාදියෙන් 'මෙබඳු වෙම් දෝ හෝ'යි නො වෙයි. මෙ රූපාදියෙන් අන්පරිදි 'වෙම් දෝ හෝ'යි නො වෙයි. මෙ රූපාදියෙන් 'වෙම්ව'යි ප්‍රාර්ථනා විසින් නො වෙයි. මේ රූපාදියෙන් 'මේ ප්‍රකාරයෙන් වෙම්ව'යි නො වෙයි. 'මෙබඳු වෙම්ව'යි නො වෙයි. මෙ රූපාදියෙන් 'අන්පරිදි වෙම්ව'යි නො වෙයි මෙ රූපාදියෙන් 'මතු වෙම්ව'යි නො වෙයි. මෙ රූපාදියෙන් 'මෙ ප්‍රකාරයෙන් වෙම්ව'යි නො වෙයි. මෙ රූපාදියෙන් 'මෙබඳු වෙම්ව'යි නො වෙයි. මෙ රූපාදියෙන් 'අන් පරිදි වෙම්ව'යි නො වෙයි මහණෙනි, මෙ සෙයින් මහණ නො දුල්නේ ය.

මහණෙනි, කිසෙයින් මහණ ලමු කොට සිතනේ ය යත්: මහණෙනි, මෙ සස්නෙහි මහණහුගේ අස්මිමානය ප්‍රහීණ නො වෙයි ... මතු උපදනා සැහැවි ඇතියේ වෙයි. මහණෙනි, මෙ සෙයින් මහණ ලමු කොට සිතනේ ය.

මහණෙනි, කිසෙයින් මහණ ලමු කොට නො සිතනේ ය යත්: මහණෙනි, මෙ සස්නෙහි මහණහුගේ අස්මිමානය ප්‍රහීණ වූයේ උදුහුන්මුල් ඇතියේ මුඳුන් සුන් තලක් සෙයින් අවස්තුක කරණ ලද්දේ අනභාවකෘත වූයේ මතු නො උපදනා සැහැවි ඇතියේ වෙයි. මහණෙනි, මෙ සෙයින් මහණ ලමු-කොට නො සිතනේ ය.

මහාවර්ගය පස්වැනි යි.

මහාපණ්ණාසකය සතරවැනි යි.

## 5. පඤ්චම මහාපණ්ණාසකො

## 1. සප්පුරිසවග්ගො.

### 4. 5. 1. 1

### [සප්පුරිසසුත්තං]

[සාවත්ථිනිදානං]

1. අසප්පුරිසඤ්ච වො භික්ඛවෙ දෙසිස්සාමි අසප්පුරිසෙන අසප්පුරිසතරඤ්ච, සප්පුරිසඤ්ච සප්පුරිසෙන සප්පුරිසතරඤ්ච. තං සුණාථ සාධුකං මනසි කරොථ භාසිස්සාමීති. එවං භන්තෙ'ති ඛො තෙ භික්ඛූ භගවතො පච්චස්සොසුං. භගවා එතදවොච:

කතමො ච භික්ඛවෙ අසප්පුරිසො? ඉධ භික්ඛවෙ එකච්චො පාණාතිපාතී හොති, අදින්නාදායී හොති, කාමෙසු මිච්ඡාචාරී හොති, මුසාවාදී හොති, සුරාමෙරයමජ්ජපමාදට්ඨායී හොති. අයං වුච්චති භික්ඛවෙ අසප්පුරිසො.

කතමො ච භික්ඛවෙ අසප්පුරිසෙන අසප්පුරිසතරො? ඉධ භික්ඛවෙ එකච්චො අත්තනා ච පාණාතිපාතී හොති, පරඤ්ච පාණාතිපාතෙ සමාදපෙති. අත්තනා ච අදින්නාදායී හොති, පරඤ්ච අදින්නාදානෙ සමාදපෙති. අත්තනා ච කාමෙසු මිච්ඡාචාරී හොති, පරඤ්ච කාමෙසු මිච්ඡාචාරෙ සමාදපෙති. අත්තනා මුසාවාදී හොති, පරඤ්ච මුසාවාදෙ සමාදපෙති. අත්තනා ච සුරාමෙරයමජ්ජපමාදට්ඨායී හොති, පරඤ්ච සුරාමෙරයමජ්ජපමාදට්ඨානෙ සමාදපෙති. අයං වුච්චති භික්ඛවෙ අසප්පුරිසෙන අසප්පුරිසතරො.

කතමො ච භික්ඛවෙ සප්පුරිසො? ඉධ භික්ඛවෙ එකච්චො පාණාතිපාතා පටිවිරතො හොති, අදින්නාදානා පටිවිරතො හොති, කාමෙසු මිච්ඡාචාරා පටිවිරතො හොති, මුසාවාදා පටිවිරතො හොති, සුරාමෙරයමජ්ජපමාදට්ඨානා පටිවිරතො හොති. අයං වුච්චති භික්ඛවෙ සප්පුරිසො.

කතමො ච භික්ඛවෙ සප්පුරිසෙන සප්පුරිසතරො? ඉධ භික්ඛවෙ එකච්චො අත්තනා ච පාණාතිපාතා පටිවිරතො හොති, පරඤ්ච පාණාතිපාතා වෙරමණියා සමාදපෙති. අත්තනා ච අදින්නාදානා පටිවිරතො හොති, පරඤ්ච අදින්නාදානා වෙරමණියා සමාදපෙති. අත්තනා ච කාමෙසු මිච්ඡාචාරා පටිවිරතො හොති, පරඤ්ච කාමෙසු මිච්ඡාචාරා වෙරමණියා සමාදපෙති. අත්තනා ච මුසාවාදා පටිවිරතො හොති, පරඤ්ච මුසාවාදා වෙරමණියා සමාදපෙති. අත්තනා ච සුරාමෙරයමජ්ජපමාදට්ඨානා පටිවිරතො හොති, පරඤ්ච සුරාමෙරයමජ්ජපමාදට්ඨානා වෙරමණියා සමාදපෙති. අයං වුච්චති භික්ඛවෙ සප්පුරිසෙන සප්පුරිසතරොති.

## 5. පඤ්චම මහාපණ්ණාසකය

# 1. සප්පුරිස වග්ගය

## 4. 5. 1. 1

## [ සප්පුරිස සුත්‍රය ]

[සැවැත්නිදානයි:]

1. මහණෙනි, තොපට අසත්පුරුෂයා හා අසත්පුරුෂයාට වැඩිසිටි අසත්පුරුෂතරයා හා සත්පුරුෂයා හා සත්පුරුෂයාට වැඩිසිටි සත්පුරුෂතරයා හා දෙසමි. ඒ අසව, මනා කොට මෙනෙහි කරව, කියමි යි වදාළහ. 'එසේ ය වහන්ස' යි ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට පිළිවදන් දුන්හු. භාග්‍යවතුන් වහන්සේ මෙය සූත්‍රය වදාළහ:

මහණෙනි, අසත්පුරුෂ කවරේ ය? මහණෙනි, මෙලොව ඇතැම් පුද්ගලයෙක් පණිවා කරන්නේ වෙයි. අයිනාදන් ගන්නේ වෙයි. කාමයෙහි මිසහසර ඇතියේ වෙයි. මුසවා කියන්නේ වෙයි. මද පමා දෙකට කරුණු වූ රහමෙර පීමෙහි සිටුනාසුලු වෙයි. මහණෙනි, මේ අසත්පුරුෂය යි කියනු ලැබේ.

මහණෙනි, අසත්පුරුෂයාට වැඩිසිටි අසත්පුරුෂතර කවරේ ය? මහණෙනි, මෙලොව ඇතැම් පුද්ගලයෙක් තෙමේත් පණිවා කරන්නේ වෙයි. මෙරමාත් පණිවායෙහි සමාදන් කරවයි. තෙමේත් අයිනාදන් ගන්නේ වෙයි. මෙරමාත් අයිනාදනෙහි සමාදන් කරවයි. තෙමේත් කාමයෙහි මිසහසර ඇතියේ වෙයි. මෙරමාත් කාමයෙහි මිසහසරෙහි සමාදන් කරවයි. තෙමේත් මුසවා කියන්නේ වෙයි. මෙරමාත් මුසවායෙහි සමාදන් කරවයි. තෙමේත් මද පමා දෙකට කරුණු වූ රහමෙර පීමෙහි සිටුනාසුලු වෙයි. මෙරමාත් මද පමා දෙකට කරුණු වූ රහමෙර පීමෙහි සමාදන් කරවයි. මහණෙනි, මේ අසත්පුරුෂයාට වැඩිසිටි අසත්පුරුෂතරය යි කියනු ලැබේ.

මහණෙනි, සත්පුරුෂ කවරේ ය? මහණෙනි, මෙලොව ඇතැම් පුද්ගලයෙක් පණිවායෙන් දුරු වූයේ වෙයි. අයිනාදනින් දුරු වූයේ වෙයි. කාමයෙහි මිසහසරින් දුරු වූයේ වෙයි. මුසවායෙන් දුරු වූයේ වෙයි. මද පමා දෙකට කරුණු වූ රහමෙරින් දුරු වූයේ වෙයි. මහණෙනි, මේ සත්පුරුෂය යි කියනු ලැබේ.

මහණෙනි, සත්පුරුෂයාට වැඩිසිටි සත්පුරුෂතර කවරේ ය? මහණෙනි, මෙලොව ඇතැම් පුද්ගලයෙක් තෙමේත් පණිවායෙන් දුරු වූයේ වෙයි. මෙරමාත් පණිවායෙන් දුරු වීමෙහි සමාදන් කරවයි. තෙමේත් අයිනාදනින් දුරු වූයේ වෙයි. මෙරමාත් අයිනාදනින් දුරු වීමෙහි සමාදන් කරවයි. තෙමේත් කාමයෙහි මිසහසරින් දුරු වූයේ වෙයි. මෙරමාත් කාමයෙහි මිසහසරින් දුරු වීමෙහි සමාදන් කරවයි. තෙමේත් මුසවායෙන් දුරු වූයේ වෙයි. මෙරමාත් මුසවායෙන් දුරු වීමෙහි සමාදන් කරවයි. තෙමේත් මද පමා දෙකට කරුණු වූ රහමෙරින් දුරු වූයේ වෙයි. මෙරමාත් මද පමා දෙකට කරුණු වූ රහමෙර පීමෙන් දුරු වීමෙහි සමාදන් කරවයි. මහණෙනි, මේ සත්පුරුෂයාට වැඩිසිටි සත්පුරුෂතරය යි කියනු ලැබේ.

## 4. 5. 1. 2

## [ දුතිය සප්පුරිසසුත්තං ]

2. අසප්පුරිසඤ්ච වො භික්ඛවෙ දෙසිස්සාමි අසප්පුරිසෙන අසප්පුරිසතරඤ්ච, සප්පුරිසඤ්ච සප්පුරිසෙන සප්පුරිසතරඤ්ච. තං සුණාථ -පෙ-

කතමො ච භික්ඛවෙ අසප්පුරිසො? ඉධ භික්ඛවෙ එකච්චො අස්සද්ධො හොති, අහිරිකො හොති, අනොත්තප්පී හොති, අප්පස්සුතො හොති, කුසීතො හොති, මුට්ඨස්සති හොති, දුප්පඤ්ඤො හොති. අයං වුච්චති භික්ඛවෙ අසප්පුරිසො.

කතමො ච භික්ඛවෙ අසප්පුරිසෙන අසප්පුරිසතරො? ඉධ භික්ඛවෙ එකච්චො අත්තනා ච අස්සද්ධො හොති, පරඤ්ච අස්සද්ධියෙ සමාදපෙති. අත්තනා ච අහිරිකො හොති, පරඤ්ච අහිරිකතාය සමාදපෙති. අත්තනා ච අනොත්තප්පී හොති, පරඤ්ච අනොත්තප්පෙ සමාදපෙති. අත්තනා ච අප්පස්සුතො හොති, පරඤ්ච අප්පස්සුතෙ සමාදපෙති. අත්තනා ච කුසීතො හොති, පරඤ්ච කොසජ්ජෙ සමාදපෙති. අත්තනා ච මුට්ඨස්සති හොති, පරඤ්ච මුට්ඨස්සච්චෙ සමාදපෙති. අත්තනා ච දුප්පඤ්ඤො හොති, පරඤ්ච දුප්පඤ්ඤතාය සමාදපෙති. අයං වුච්චති භික්ඛවෙ අසප්පුරිසෙන අසප්පුරිසතරො.

කතමො ච භික්ඛවෙ සප්පුරිසො? ඉධ භික්ඛවෙ එකච්චො සද්ධො හොති, හිරිමා හොති, ඔත්තප්පී හොති, බහුස්සුතො හොති, ආරද්ධවිරියො හොති, සතිමා හොති, පඤ්ඤවා හොති. අයං වුච්චති භික්ඛවෙ සප්පුරිසො.

කතමො ච භික්ඛවෙ සප්පුරිසෙන සප්පුරිසතරො? ඉධ භික්ඛවෙ එකච්චො අත්තනා ච සද්ධාසම්පන්නො හොති, පරඤ්ච සද්ධාසම්පදාය සමාදපෙති. අත්තනා ච හිරිමා හොති, පරඤ්ච හිරිමතාය සමාදපෙති. අත්තනා ච ඔත්තප්පී හොති, පරඤ්ච ඔත්තප්පෙ සමාදපෙති. අත්තනා ච බහුස්සුතො හොති, පරඤ්ච බාහුසච්චෙ සමාදපෙති. අත්තනා ච ආරද්ධවිරියො හොති, පරඤ්ච විරියාරම්භෙ සමාදපෙති. අත්තනා ච උපට්ඨිතසති හොති, පරඤ්ච සතිපට්ඨානෙ සමාදපෙති. අත්තනා ච පඤ්ඤාසම්පන්නො හොති, පරඤ්ච පඤ්ඤාසම්පදාය සමාදපෙති. අයං වුච්චති භික්ඛවෙ සප්පුරිසෙන සප්පුරිසතරොති.

## 4. 5. 1. 3

## [ තතිය සප්පුරිසසුත්තං ]

3. අසප්පුරිසඤ්ච වො භික්ඛවෙ දෙසිස්සාමි, අසප්පුරිසෙන අසප්පුරිසතරඤ්ච, සප්පුරිසඤ්ච සප්පුරිසෙන සප්පුරිසතරඤ්ච. තං සුණාථ -පෙ-

## 4. 5. 1. 2.

## [ දෙවන සප්පුරිස සූත්‍රය ]

2. මහණෙනි, තොපට අසත්පුරුෂයා හා අසත්පුරුෂයාට වැඩිසිටි අසත්පුරුෂතරයා හා සත්පුරුෂයා හා සත්පුරුෂයාට වැඩිසිටි සත්පුරුෂතරයා හා දෙසමි. එය අසව ...

මහණෙනි, අසත්පුරුෂ කවරේ ය? මහණෙනි, මෙලොව ඇතැම් පුද්ගලයෙක් සැදැහැ නැත්තේ ය. ලජ්ජා නැත්තේ ය. පවට බිය නැත්තේ ය. අල්පශ්‍රැත ය. කුසීත ය. මුළාවූ සිහි ඇතියේ ය. දුෂ්ප්‍රාඥ ය. මහණෙනි, මේ අසත්පුරුෂය යි කියනු ලැබේ.

මහණෙනි, අසත්පුරුෂයාට වැඩිසිටි අසත්පුරුෂතර කවරේ ය? මහණෙනි, මෙලොව ඇතැම් පුද්ගලයෙක් තෙමේත් සැදැහැ නැත්තේ ය. මෙරමා ද සැදැහැ නැතිසෙයෙහි සමාදන් කරවයි. තෙමේ ද පවට ලජ්ජා නැත්තේ ය. මෙරමා ද ලජ්ජානැතිසෙයෙහි සමාදන් කරවයි. තෙමේ ද පවට බිය නැත්තේ ය. මෙරමා ද පවට බියනැතිසෙයෙහි සමාදන් කරවයි. තෙමේ ද අල්පශ්‍රැත ය. මෙරමා ද අල්පශ්‍රැතබව්හි සමාදන් කරවයි. තෙමේ ද කුසීත ය. මෙරමා ද කුසීතබව්හි සමාදන් කරවයි. තෙමේ ද මුළාවූ සිහි ඇත්තේ ය. මෙරමා ද මුළාවූ සිහිඇතිසෙයෙහි සමාදන් කරවයි. තෙමේ ද දුෂ්ප්‍රාඥ ය. මෙරමා ද දුෂ්ප්‍රාඥබව්හි සමාදන් කරවයි. මහණෙනි, මේ අසත්පුරුෂයාට වැඩිසිටි අසත්පුරුෂතරය යි කියනු ලැබේ.

මහණෙනි, සත්පුරුෂ කවරේ ය? මහණෙනි, මෙලොව ඇතැම් පුද්ගලයෙක් සැදැහැ ඇතියේ වෙයි. පවට ලජ්ජා ඇතියේ වෙයි. පවට බිය ඇතියේ වෙයි. බහුශ්‍රැත වෙයි. රුකුලවැර ඇතියේ වෙයි. සිහි ඇතියේ වෙයි. පැණවත් වෙයි. මහණෙනි, මේ සත්පුරුෂය යි කියනු ලැබේ.

මහණෙනි, සත්පුරුෂයාට වැඩිසිටි සත්පුරුෂතර කවරේ ය? මහණෙනි, මෙලොව ඇතැම් පුද්ගලයෙක් තෙමේත් ශ්‍රද්ධාසම්පන්න වෙයි. මෙරමාත් ශ්‍රද්ධාසම්පත්තියෙහි සමාදන් කරවයි. තෙමේත් පවට ලජ්ජා ඇතියේ වෙයි. මෙරමා ද පවට ලජ්ජා ඇතිබව්හි සමාදන් කරවයි. තෙමේ ද පවට බිය ඇත්තේ වෙයි. මෙරමා ද පවට බියඇතිබව්හි සමාදන් කරවයි. තෙමේ ද බහුශ්‍රැත වෙයි. මෙරමා ද බහුශ්‍රැත බව්හි සමාදන් කරවයි. තෙමේ ද ඇරඹූ වැර ඇතියේ වෙයි. මෙරමා ද වැර ඇරඹුම්හි සමාදන් කරවයි. තෙමේ ද එළඹ සිටි සිහි ඇත්තේ වෙයි. මෙරමා ද සිහිවටන්හි සමාදන් කරවයි. තෙමේ ද ප්‍රඥාසම්පන්න වෙයි. මෙරමා ද ප්‍රඥාසම්පත්තියෙහි සමාදන් කරවයි. මහණෙනි, මේ සත්පුරුෂයාට වැඩිසිටි සත්පුරුෂතරය යි කියනු ලැබේ.

## 4. 5. 1. 3.

## [ තෙවන සප්පුරිස සූත්‍රය ]

3 මහණෙනි, තොපට අසත්පුරුෂයා හා අසත්පුරුෂයාට වැඩි සිටි අසත්පුරුෂතරයා හා, සත්පුරුෂයා හා සත්පුරුෂයාට වැඩි සිටි සත්පුරුෂතරයා හා දෙසමි. එය අසව...



Free Distribution www.aathaapi.org

කතමො ච භික්ඛවෙ අසප්පුරිසො? ඉධ භික්ඛවෙ එකච්චො පාණාතිපාතී හොති අදින්නාදායී හොති. කාමෙසු මිච්ඡාචාරී හොති මුසාවාදී හොති. පිසුණාවාචො හොති. ඵරුසාවාචො හොති සම්ඵප්පලාපී හොති. අයං වුච්චති භික්ඛවෙ අසප්පුරිසො.

කතමො ච භික්ඛවෙ අසප්පුරිසෙන අසප්පුරිසතරො? ඉධ භික්ඛවෙ එකච්චො අත්තනා ච පාණාතිපාතී හොති, පරඤ්ච පාණාතිපාතෙ සමාදපෙති. අත්තනා ච අදින්නාදායී හොති, පරඤ්ච අදින්නාදානෙ සමාදපෙති අත්තනා ච කාමෙසු මිච්ඡාචාරී හොති, පරඤ්ච කාමෙසු මිච්ඡාචාරෙ සමාදපෙති. අත්තනා ච මුසාවාදී හොති, පරඤ්ච මුසාවාදෙ සමාදපෙති අත්තනා ච පිසුණාවාචො හොති, පරඤ්ච පිසුණාය වාචාය සමාදපෙති. අත්තනා ච ඵරුසාවාචො හොති, පරඤ්ච ඵරුසාය වාචාය සමාදපෙති. අත්තනා ච සම්ඵප්පලාපී හොති, පරඤ්ච සම්ඵප්පලාපෙ සමාදපෙති. අයං වුච්චති භික්ඛවෙ අසප්පුරිසෙන අසප්පුරිසතරො.

කතමො ච භික්ඛවෙ සප්පුරිසො? ඉධ භික්ඛවෙ එකච්චො පාණාතිපාතා පටිවිරතො හොති. අදින්නාදානා පටිවිරතො හොති. කාමෙසු මිච්ඡාචාරා පටිවිරතො හොති. මුසාවාදා පටිවිරතො හොති. පිසුණාවාචා පටිවිරතො හොති. ඵරුසාවාචා පටිවිරතො හොති සම්ඵප්පලාපා පටිවිරතො හොති. අයං වුච්චති භික්ඛවෙ සප්පුරිසො

කතමො ච භික්ඛවෙ සප්පුරිසෙන සප්පුරිසතරො? ඉධ භික්ඛවෙ එකච්චො අත්තනා ච පාණාතිපාතා පටිවිරතො හොති, පරඤ්ච පාණාතිපාතා වෙරමණියා සමාදපෙති. අත්තනා ච අදින්නාදානා පටිවිරතො හොති, පරඤ්ච අදින්නාදානා වෙරමණියා සමාදපෙති. -පෙ- අත්තනා ච පිසුණාවාචා පටිවිරතො හොති, පරඤ්ච පිසුණාවාචා වෙරමණියා සමාදපෙති. අත්තනා ච ඵරුසාවාචා පටිවිරතො හොති, පරඤ්ච ඵරුසාවාචා වෙමරණියා සමාදපෙති අත්තනා ච සම්ඵප්පලාපා පටිවිරතො හොති, පරඤ්ච සම්ඵප්පලාපා වෙරමණියා සමාදපෙති. අයං වුච්චති භික්ඛවෙ සප්පුරිසෙන සප්පුරිසතරොති.

## 4. 5. 1. 4

## [ චතුත්ථ සප්පුරිස සුත්තං ]

4. අසප්පුරිසඤ්ච වො භික්ඛවෙ දෙසිස්සාමි අසප්පුරිසෙන අසප්පුරිසතරඤ්ච සප්පුරිසඤ්ච සප්පුරිසෙන සප්පුරිසතරඤ්ච. තං සුණාථ -පෙ-

කතමො ච භික්ඛවෙ අසප්පුරිසො? ඉධ භික්ඛවෙ එකච්චො පාණාතිපාතී හොති-පෙ- අභිජ්ඣාලු හොති. බ්‍යාපන්නචිත්තො හොති මිච්ඡාදිට්ඨිකො හොති. අයං වුච්චති භික්ඛවෙ අසප්පුරිසො.

මහණෙනි, අසත්පුරුෂ කවරේය ? මහණෙනි මෙලොව ඇතැමෙක් පණිවා කරන්නේ වෙයි. අයිතාදන් ගන්නේ වෙයි. කාමයෙහි මිසහසර ඇතියේ වෙයි. මුසවා බණන්නේ වෙයි. පිසුනුබස් ඇතියේ වෙයි. පරොස්බස් ඇතියේ වෙයි. පලප් ඇතියේ වෙයි. මහණෙනි, මේ අසත්පුරුෂයයි කියනු ලැබේ.

මහණෙනි, අසත්පුරුෂයාට වැඩි සිටි අසත්පුරුෂතර කවරේ ය? මහණෙනි, මෙලොව ඇතැමෙක් තෙමේ ද පණිවා කරන්නේ වෙයි. මෙරමා ද පණිවායෙහි සමාදන් කරවයි. තෙමේ ද අයිතාදන් ගන්නේ වෙයි. මෙරමා ද අයිතාදන්හි සමාදන් කරවයි. තෙමේ ද කාමයෙහි මිසහසර ඇතියේ වෙයි. මෙරමා ද කාමයෙහි මිස්හසරෙහි ලා සමාදන් කරවයි. තෙමේ ද මුසවා බණන්නේ වෙයි. මෙරමා ද මුසවායෙහි සමාදන් කරවයි. තෙමේ ද පිසුනුබස් ඇතියේ වෙයි. මෙරමා ද පිසුනුබස්හි සමාදන් කරවයි. තෙමේ ද පරොස් බස් ඇතියේ වෙයි. මෙරමා ද පරොස් බස්හි සමාදන් කරවයි. තෙමේ ද පලප් ඇතියේ වෙයි. මෙරමා ද පලප්හි සමාදන් කරවයි. මහණෙනි, මේ අසත්පුරුෂයාට වැඩි සිටි අසත්පුරුෂතරය යි කියනු ලැබේ.

මහණෙනි, සත්පුරුෂ කවරේ ය? මහණෙනි, මෙලොව ඇතැමෙක් පණිවායෙන් දුරු වූයේ වෙයි. අයිතාදනින් දුරුවූයේ වෙයි. කාමයෙහි මිසහසරින් දුරුවූයේ වෙයි. මුසවායෙන් දුරුවූයේ වෙයි. පිසුනුබසින් දුරු වූයේ වෙයි. පරොස්බසින් දුරුවූයේ වෙයි. පලපින් දුරු වූයේ වෙයි. මහණෙනි, මේ සත්පුරුෂය යි කියනු ලැබේ.

මහණෙනි, සත්පුරුෂයාට වැඩි සිටි සත්පුරුෂතර කවරේ ය? මහණෙනි, මෙලොව ඇතැම් පුද්ගලයෙක් තෙමේ පණිවායෙන් දුරු වූයේ වෙයි. මෙරමා ද පණිවායෙන් දුරු වීමෙහි සමාදන් කරවයි. තෙමේ ද අයිතාදනින් දුරු වූයේ වෙයි. මෙරමා ද අයිතාදනින් දුරු වීමෙහි සමාදන් කරවයි ... තෙමේ ද පිසුනු බසින් දුරු වූයේ වෙයි. මෙරමා ද පිසුනු බසින් දුරු වීමෙහි සමාදන් කරවයි. තෙමේ ද පරොස් බසින් දුරු වූයේ වෙයි. මෙරමා ද පරොස් බසින් දුරු වීමෙහි සමාදන් කරව යි. තෙමේ ද පලපින් දුරු වූයේ වෙයි. මෙරමා ද පලපින් දුරු වීමෙහි සමාදන් කරවයි. මහණෙනි, මේ සත්පුරුෂයාට වැඩි සිටි සත්පුරුෂතරය යි කියනු ලැබේ.

## 4. 6. 1. 4.

## [ සිවුවන සප්පුරිස සූත්‍රය ]

4. මහණෙනි, තොපට අසත්පුරුෂයා හා අසත්පුරුෂයාට වැඩි සිටි අසත්පුරුෂතරයා හා සත්පුරුෂයා හා සත්පුරුෂයාට වැඩි සිටි සත්පුරුෂතරයා හා දෙසමි. එ අසව ...

මහණෙනි, අසත්පුරුෂ කවරේ ය? මහණෙනි, මෙලොව ඇතැම් පුද්ගලයෙක් පණිවා කරන්නේ වෙයි ... අභිධ්‍යා බහුල වෙයි. ව්‍යාපාදයට පැමිණි සිතැත්තේ වෙයි. මිසදිටු ඇත්තේ වෙයි. මහණෙනි, මේ අසත්පුරුෂය යි කියනු ලැබේ.

කතමො ච භික්ඛවෙ අසප්පුරිසෙන අසප්පුරිසතරො? ඉධ භික්ඛවෙ එකච්චො අත්තනා ච පාණාතිපාති හොති. පරඤ්ච පාණාතිපාතෙ සමාදපෙති. -පෙ- අත්තනා ච අභිජ්ඣාලු හොති, පරඤ්ච අභිජ්ඣාය සමාදපෙති. අත්තනා ච බ්‍යාපන්නචිත්තො හොති, පරඤ්ච බ්‍යාපාදෙ සමාදපෙති. අත්තනා ච මිච්ඡාදිට්ඨිකො හොති, පරඤ්ච මිච්ඡාදිට්ඨියා සමාදපෙති. අයං වුච්චති භික්ඛවෙ අසප්පුරිසෙන අසප්පුරිසතරො.

කතමො ච භික්ඛවෙ සප්පුරිසො? ඉධ භික්ඛවෙ එකච්චො පාණාතිපාතා පටිවිරතො හොති -පෙ- අනභිජ්ඣාලු හොති. අබ්‍යාපන්නචිත්තො හොති. සම්මාදිට්ඨිකො හොති. අයං වුච්චති භික්ඛවෙ සප්පුරිසො.

කතමො ච භික්ඛවෙ සප්පුරිසෙන සප්පුරිසතරො? ඉධ භික්ඛවෙ එකච්චො අත්තනා ච පාණාතිපාතා පටිවිරතො හොති. පරඤ්ච පාණාතිපාතා වෙරමණියා සමාදපෙති. -පෙ- අත්තනා ච අනභිජ්ඣාලු හොති, පරඤ්ච අනභිජ්ඣාය සමාදපෙති. අත්තනා ච අබ්‍යාපන්නචිත්තො හොති. පරඤ්ච අබ්‍යාපාදෙ සමාදපෙති. අත්තනා ච සම්මාදිට්ඨිකො හොති. පරඤ්ච සම්මාදිට්ඨියා සමාදපෙති. අයං වුච්චති භික්ඛවෙ සප්පුරිසෙන සප්පුරිසතරොති.

## 4. 6. 1. 5

## [ පඤ්චම සප්පුරිස සුත්තං ]

5. අසප්පුරිසඤ්ච වො භික්ඛවෙ දෙසිස්සාමි අසප්පුරිසෙන අසප්පුරිසතරඤ්ච සප්පුරිසඤ්ච සප්පුරිසෙන සප්පුරිසතරඤ්ච. තං සුණාථ -පෙ-

කතමො ච භික්ඛවෙ අසප්පුරිසො? ඉධ භික්ඛවෙ එකච්චො මිච්ඡාදිට්ඨිකො හොති. මිච්ඡාසඞ්කප්පො හොති. මිච්ඡාවාචො හොති. මිච්ඡාකම්මන්තො හොති. මිච්ඡාආජීවො හොති. මිච්ඡාවායාමො හොති. මිච්ඡාසති හොති. මිච්ඡාසමාධි හොති. අයං වුච්චති භික්ඛවෙ අසප්පුරිසො.

කතමො ච භික්ඛවෙ අසප්පුරිසෙන අසප්පුරිසතරො? ඉධ භික්ඛවෙ එකච්චො අත්තනා ච මිච්ඡාදිට්ඨිකො හොති. පරඤ්ච මිච්ඡාදිට්ඨියා සමාදපෙති අත්තනා ච මිච්ඡාසඞ්කප්පො හොති. පරඤ්ච මිච්ඡාසඞ්කප්පෙ සමාදපෙති. අත්තනා ච මිච්ඡාවාචො හොති. පරඤ්ච මිච්ඡාවාචාය සමාදපෙති. අත්තනා ච මිච්ඡාකම්මන්තො හොති. පරඤ්ච මිච්ඡාකම්මන්තෙ සමාදපෙති. අත්තනා ච මිච්ඡාආජීවො හොති. පරඤ්ච මිච්ඡාආජීවෙ සමාදපෙති. අත්තනා ච මිච්ඡාවායාමො හොති. පරඤ්ච මිච්ඡාවායාමෙ සමාදපෙති. අත්තනා ච මිච්ඡාසති හොති. පරඤ්ච මිච්ඡාසතියා සමාදපෙති. අත්තනා ච මිච්ඡාසමාධි හොති. පරඤ්ච මිච්ඡාසමාධිම්හි සමාදපෙති අයං වුච්චති භික්ඛවෙ අසප්පුරිසෙන අසප්පුරිසතරො.

මහණෙනි, අසත්පුරුෂයාට වැඩි සිටි අසත්පුරුෂතර කවරේ ය? මහණෙනි, මෙලොව ඇතැම් පුද්ගලයෙක් තෙමේත් පණිවා කරන්නේ වෙයි. මෙරමාත් පණිවා කිරීමෙහි සමාදන් කරවයි...තෙමේත් අභිධ්‍යාබහුල වෙයි. මෙරමාත් අභිධ්‍යායෙහි සමාදන් කරවයි. තෙමේත් ව්‍යාපාද ඇත්තේ වෙයි. මෙරමාත් ව්‍යාපාදයෙහි සමාදන් කරවයි. තෙමේත් මිසදිටු ඇත්තේ වෙයි. මෙරමාත් මිසදිටුයෙහි සමාදන් කරවයි. මහණෙනි, මේ අසත්පුරුෂයාට වැඩි සිටි අසත්පුරුෂතරය යි කියනු ලැබේ.

මහණෙනි, සත්පුරුෂ කවරේ ය? මහණෙනි, මෙලොව ඇතැම් පුද්ගලයෙක් පණිවායෙන් දුරු වූයේ වෙයි...අභිධ්‍යාබහුල කොට නැත්තේ වෙයි. ව්‍යාපාද රහිත සිතැත්තේ වෙයි. සම්‍යග්දෘෂ්ටික වෙයි. මහණෙනි, මේ සත්පුරුෂය යි කියනු ලැබේ.

මහණෙනි, සත්පුරුෂයාට වැඩි සිටි සත්පුරුෂතර කවරේ ය? මහණෙනි, මෙලොව ඇතැම් පුද්ගලයෙක් තෙමේත් පණිවායෙන් දුරු වූයේ වෙයි. මෙරමාත් පණිවායෙන් දුරු වීමෙහි සමාදන් කරවයි...තෙමේත් අභිධ්‍යාබහුල කොට නැත්තේ වෙයි. මෙරමාත් අභිධ්‍යායෙහි සමාදන් නොකරවයි. තෙමේත් අව්‍යාපාද සිතැත්තේ වෙයි. මෙරමාත් අව්‍යාපාදයෙහි සමාදන් කරවයි. තෙමේත් සම්‍යග්දෘෂ්ටික වෙයි. මෙරමාත් සම්‍යග්-දෘෂ්ටියෙහි සමාදන් කරවයි. මහණෙනි, මේ සත්පුරුෂයාට වැඩි සිටි සත්පුරුෂතරය යි කියනු ලැබේ.

## 4. 5. 1. 5.

## [ පඤ්චම සප්පුරිස සුත්‍රය ]

5. මහණෙනි, තොපට අසත්පුරුෂයා හා අසත්පුරුෂයාට වැඩිසිටි අසත්පුරුෂතරයා හා සත්පුරුෂයා හා සත්පුරුෂයාට වැඩි සිටි සත්පුරුෂතරයා හා දෙසමි. ඒ අසව...

මහණෙනි, අසත්පුරුෂ කවරේ ය? මහණෙනි, මෙලොව ඇතැම් පුද්ගලයෙක් මිසදිටු ඇතියේ වෙයි. මිථ්‍යාසඞ්කල්ප ඇතියේ වෙයි. මිථ්‍යාවාක් ඇතියේ වෙයි. මිථ්‍යාකර්මාන්ත ඇතියේ වෙයි. මිථ්‍යා ආජීව ඇතියේ වෙයි. මිථ්‍යාව්‍යායාම ඇතියේ වෙයි. මිථ්‍යාස්මෘති ඇතියේ වෙයි. මිථ්‍යාසමාධි ඇතියේ වෙයි. මහණෙනි, මේ අසත්පුරුෂය යි කියනු ලැබේ.

මහණෙනි, අසත්පුරුෂයාට වැඩි සිටි අසත්පුරුෂතර කවරේ ය? මහණෙනි, මෙලොව ඇතැම් පුද්ගලයෙක් තෙමේත් මිථ්‍යාදෘෂ්ටික වෙයි. මෙරමාත් මිථ්‍යාදෘෂ්ටියෙහි සමාදන් කරවයි. තෙමේත් මිථ්‍යාසඞ්කල්ප ඇතියේ වෙයි. මෙරමාත් මිථ්‍යාසඞ්කල්පයෙහි සමාදන් කරවයි. තෙමේත් මිථ්‍යාවාක් ඇත්තේ වෙයි. මෙරමාත් මිථ්‍යාවචනයෙහි සමාදන් කරවයි. තෙමේත් මිථ්‍යාකර්මාන්ත ඇත්තේ වෙයි. මෙරමාත් මිථ්‍යාකර්මාන්තයෙහි සමාදන් කරවයි. තෙමේත් මිථ්‍යාආජීව ඇත්තේ වෙයි. මෙරමාත් මිථ්‍යා ආජීවයෙහි සමාදන් කරවයි. තෙමේත් මිථ්‍යාව්‍යායාම ඇත්තේ වෙයි. මෙරමාත් මිථ්‍යාව්‍යායාමයෙහි සමාදන් කරවයි. තෙමේත් මිථ්‍යාස්මෘති ඇත්තේ වෙයි. මෙරමාත් මිථ්‍යාස්මෘතියෙහි සමාදන් කරවයි. තෙමේත් මිථ්‍යාසමාධි ඇත්තේ වෙයි. මෙරමාත් මිථ්‍යාසමාධියෙහි සමාදන් කරවයි. මහණෙනි, මේ අසත්පුරුෂයාට වැඩි සිටි අසත්පුරුෂතරය යි කියනු ලැබේ.

කතමො ච භික්ඛවෙ සප්පුරිසො? ඉධ භික්ඛවෙ එකච්චො සම්මාදිට්ඨිකො හොති. සම්මාසඞ්කප්පො හොති. සම්මාවාචො හොති. සම්මාකම්මන්තො හොති. සම්මාආජීවො හොති. සම්මාවායාමො හොති. සම්මාසති හොති. සම්මාසමාධි හොති. අයං වුච්චති භික්ඛවෙ සප්පුරිසො.

කතමො ච භික්ඛවෙ සප්පුරිසෙන සප්පුරිසතරො? ඉධ භික්ඛවෙ එකච්චො, සම්මාදිට්ඨිකො හොති, පරඤ්ච සම්මාදිට්ඨියා සමාදපෙති අත්තනා ච සම්මාසඞ්කප්පො හොති, පරඤ්ච සම්මාසඞ්කප්පෙ සමාදපෙති. අත්තනා ච සම්මාවාචො හොති, පරඤ්ච සම්මාවාචාය සමාදපෙති. අත්තනා ච සම්මාකම්මන්තො හොති, පරඤ්ච සම්මාකම්මන්තෙ සමාදපෙති. අත්තනා ච සම්මාආජීවො හොති, පරඤ්ච සම්මාආජීවෙ සමාදපෙති. අත්තනා ච සම්මාවායාමො හොති, පරඤ්ච සම්මාවායාමෙ සමාදපෙති. අත්තනා ච සම්මාසති හොති, පරඤ්ච සම්මාසතියා සමාදපෙති. අත්තනා ච සම්මාසමාධි හොති, පරඤ්ච සම්මාසමාධිම්හි සමාදපෙති. අයං වුච්චති භික්ඛවෙ සප්පුරිසෙන සප්පුරිසතරොති.

## 4. 5. 1. 6

## [ ඡට්ඨ සප්පුරිස සුත්තං ]

6. අසප්පුරිසඤ්ච වො භික්ඛවෙ දෙසිස්සාමි අසප්පුරිසෙන අසප්පුරිසතරඤ්ච සප්පුරිසඤ්ච සප්පුරිසෙන සප්පුරිසතරඤ්ච. තං සුණාථ -පෙ-

කතමො ච භික්ඛවෙ අසප්පුරිසො? ඉධ භික්ඛවෙ එකච්චො මිච්ඡාදිට්ඨිකො හොති -පෙ- මිච්ඡාඤාණී හොති. මිච්ඡාවිමුත්ති හොති. අයං වුච්චති භික්ඛවෙ අසප්පුරිසො.

කතමො ච භික්ඛවෙ අසප්පුරිසෙන අසප්පුරිසතරො? ඉධ භික්ඛවෙ එකච්චො අත්තනා ච මිච්ඡාදිට්ඨිකො හොති, පරඤ්ච මිච්ඡාදිට්ඨියා සමාදපෙති. -පෙ- අත්තනා ච මිච්ඡාඤාණී හොති, පරඤ්ච මිච්ඡාඤාණෙ සමාදපෙති. අත්තනා ච මිච්ඡාවිමුත්ති හොති, පරඤ්ච මිච්ඡාවිමුත්තියා සමාදපෙති. අයං වුච්චති භික්ඛවෙ අසප්පුරිසෙන අසප්පුරිසතරො.

කතමො ච භික්ඛවෙ සප්පුරිසො? ඉධ භික්ඛවෙ එකච්චො සම්මාදිට්ඨිකො හොති -පෙ- සම්මාඤාණී හොති. සම්මාවිමුත්ති හොති. අයං වුච්චති භික්ඛවෙ සප්පුරිසො.

කතමො ච භික්ඛවෙ සප්පුරිසෙන සප්පුරිසතරො? ඉධ භික්ඛවෙ එකච්චො අත්තනා ච සම්මාදිට්ඨිකො හොති, පරඤ්ච සම්මාදිට්ඨියා සමාදපෙති -පෙ- අත්තනා ච සම්මාඤාණී හොති, පරඤ්ච සම්මාඤාණෙ සමාදපෙති. අත්තනා ච සම්මාවිමුත්ති හොති, පරඤ්ච සම්මාවිමුත්තියා සමාදපෙති. අයං වුච්චති භික්ඛවෙ සප්පුරිසෙන සප්පුරිසතරොති.

මහණෙනි, සත්පුරුෂ කවරේ ය? මහණෙනි, මෙලොව ඇතැම් පුද්ගලයෙක් සම්‍යග්දෘෂ්ටික වෙයි. සම්‍යක්සඞ්කල්ප ඇතියේ වෙයි. සම්‍යග් වචන ඇතියේ වෙයි. සම්‍යක්කර්‍මාන්ත ඇතියේ වෙයි. සම්‍යග් ආජීව ඇතියේ වෙයි. සම්‍යග්ව්‍යායාම ඇතියේ වෙයි. සම්‍යක්සමෘති ඇතියේ වෙයි. සම්‍යක්සමාධි ඇතියේ වෙයි. මහණෙනි, මේ සත්පුරුෂය යි කියනු ලැබේ.

මහණෙනි, සත්පුරුෂයාට වැඩි සිටි සත්පුරුෂතර කවරේ ය? මහණෙනි, මෙලොව ඇතැම් පුද්ගලයෙක් තෙමේත් සම්‍යග්දෘෂ්ටික වේ. මෙරමාත් සම්‍යග්දෘෂ්ටියෙහි සමාදන් කරවයි තෙමේත් සම්‍යක්සඞ්කල්ප ඇතියේ වෙයි. මෙරමාත් සම්‍යක්සඞ්කල්පයෙහි සමාදන් කරවයි. තෙමේත් සම්‍යග් වචන ඇතියේ වෙයි. මෙරමාත් සම්‍යග් වචනයෙහි සමාදන් කරවයි. තෙමේත් සම්‍යක් කර්‍මාන්ත ඇතියේ වෙයි. මෙරමාත් සම්‍යක්කර්‍මාන්තයෙහි සමාදන් කරවයි. තෙමේත් සම්‍යග් ආජීව ඇතියේ වෙයි. මෙරමාත් සම්‍යග් ආජීවයෙහි සමාදන් කරවයි. තෙමේත් සම්‍යග් ව්‍යායාම ඇතියේ වෙයි. මෙරමාත් සම්‍යග්ව්‍යායාමයෙහි සමාදන් කරවයි. තෙමේත් සම්‍යක් සමෘති ඇත්තේ වෙයි. මෙරමාත් සම්‍යක් සමෘතියෙහි සමාදන් කරවන්නේ වෙයි. තෙමේත් සම්‍යක් සමාධි ඇත්තේ වෙයි. මෙරමාත් සම්‍යක් සමාධියෙහි සමාදන් කරවයි. මහණෙනි, මේ සත්පුරුෂයාට වැඩි සිටි සත්පුරුෂතරය යි කියනු ලැබේ.

### 4. 5. 1. 6.

### [ සචන සපපුරිස සුත්‍රය ]

6. මහණෙනි, තොපට අසත්පුරුෂයා හා අසත්පුරුෂයාට වැඩි සිටි අසත්පුරුෂතරයා හා සත්පුරුෂයා හා සත්පුරුෂයාට වැඩි සිටි සත්පුරුෂතරයා හා දෙසමි. ඒ අසව...

මහණෙනි, අසත්පුරුෂ කවරේ ය? මහණෙනි, මෙලොව ඇතැම් පුද්ගලයෙක් මිථ්‍යාදෘෂ්ටික වෙයි ... මිථ්‍යාඥාන ඇත්තේ වෙයි. මිථ්‍යාවිමුක්ති ඇත්තේ වෙයි. මහණෙනි, මේ අසත්පුරුෂය යි කියනු ලැබේ.

මහණෙනි, අසත්පුරුෂයාට වැඩි සිටි අසත්පුරුෂතර කවරේ ය? මහණෙනි, මෙලොව ඇතැම් පුද්ගලයෙක් තෙමේත් මිසදිටු වෙයි. මෙරමාත් මිසදිටුයෙහි සමාදන් කරවයි ... තෙමේත් මිථ්‍යාඥාන ඇත්තේ වෙයි. මෙරමාත් මිථ්‍යාඥානයෙහි සමාදන් කරවයි. තෙමේත් මිථ්‍යාවිමුක්ති ඇත්තේ වෙයි. මෙරමාත් මිථ්‍යාවිමුක්තියෙහි සමාදන් කරවයි. මහණෙනි, මේ අසත්පුරුෂයාට වැඩිසිටි අසත්පුරුෂතරය යි කියනු ලැබේ.

මහණෙනි, සත්පුරුෂ කවරේ ය? මහණෙනි, මෙලොව ඇතැම් පුද්ගලයෙක් සම්‍යග් දෘෂ්ටික වෙයි...සම්‍යග්ඥාන ඇත්තේ වෙයි. සම්‍යග් විමුක්ති ඇත්තේ වෙයි. මහණෙනි, මේ සත්පුරුෂය යි කියනු ලැබේ.

මහණෙනි, සත්පුරුෂයාට වැඩිසිටි සත්පුරුෂතර කවරේ ය? මහණෙනි, මෙලොව ඇතැම් පුද්ගලයෙක් තෙමේත් සම්‍යග් දෘෂ්ටික වෙයි. මෙරමාත් සම්‍යග් දෘෂ්ටියෙහි සමාදන් කරවයි ... තෙමේත් සම්‍යග් ඥාන ඇත්තේ වෙයි මෙරමාත් සම්‍යග්ඥානයෙහි සමාදන් කරවයි. තෙමේත් සම්‍යග් විමුක්ති ඇත්තේ වෙයි. මෙරමාත් සම්‍යග් විමුක්තියෙහි සමාදන් කරවයි. මහණෙනි, මේ සත්පුරුෂයාට වැඩිසිටි සත්පුරුෂතරය යි කියනු ලැබේ.

## 4. 5. 1. 7

## [ පඨම පාප - කල්‍යාණ සුත්තං ]

7. පාපඤ්ච වො භික්ඛවෙ දෙසිස්සාමි පාපෙන පාපතරඤ්ච කල්‍යාණඤ්ච කල්‍යාණෙන කල්‍යාණතරඤ්ච. තං සුණාථ -පෙ- භගවා එතදවොච:

කතමො ච භික්ඛවෙ පාපො? ඉධ භික්ඛවෙ එකච්චො පාණාතිපාතී හොති. -පෙ- මිච්ඡාදිට්ඨිකො හොති. අයං වුච්චති භික්ඛවෙ පාපො.

කතමො ච භික්ඛවෙ පාපෙන පාපතරො? ඉධ භික්ඛවෙ එකච්චො අත්තනා ච පාණාතිපාතී හොති, පරඤ්ච පාණාතිපාතෙ සමාදපෙති -පෙ- අත්තනා ච මිච්ඡාදිට්ඨිකො හොති, පරඤ්ච මිච්ඡාදිට්ඨියා සමාදපෙති. අයං වුච්චති භික්ඛවෙ පාපෙන පාපතරො.

කතමො ච භික්ඛවෙ කල්‍යාණො? ඉධ භික්ඛවෙ එකච්චො පාණාතිපාතා පටිවිරතො හොති -පෙ- සම්මාදිට්ඨිකො හොති. අයං වුච්චති භික්ඛවෙ කල්‍යාණො.

කතමො ච භික්ඛවෙ කල්‍යාණෙන කල්‍යාණතරො? ඉධ භික්ඛවෙ එකච්චො අත්තනා ච පාණාතිපාතා පටිවිරතො හොති, පරඤ්ච පාණාතිපාතා වෙරමණියා සමාදපෙති -පෙ- අත්තනා ච සම්මාදිට්ඨිකො හොති, පරඤ්ච සම්මාදිට්ඨියා සමාදපෙති. අයං වුච්චති භික්ඛවෙ කල්‍යාණෙන කල්‍යාණතරොති.

## 4. 5. 1. 8

## [ දුතිය පාප - කල්‍යාණ සුත්තං ]

8. පාපඤ්ච වො භික්ඛවෙ දෙසිස්සාමි පාපෙන පාපතරඤ්ච කල්‍යාණඤ්ච කල්‍යාණෙන කල්‍යාණතරඤ්ච. තං සුණාථ -පෙ-

කතමො ච භික්ඛවෙ පාපො? ඉධ භික්ඛවෙ එකච්චො මිච්ඡාදිට්ඨිකො හොති -පෙ- මිච්ඡාඤාණී හොති. මිච්ඡාවිමුත්ති හොති. අයං වුච්චති භික්ඛවෙ පාපො.

කතමො ච භික්ඛවෙ පාපෙන පාපතරො? ඉධ භික්ඛවෙ එකච්චො අත්තනා ච මිච්ඡාදිට්ඨිකො හොති, පරඤ්ච මිච්ඡාදිට්ඨියා සමාදපෙති -පෙ- අත්තනා ච මිච්ඡාඤාණී හොති, පරඤ්ච මිච්ඡාඤාණෙ සමාදපෙති. අත්තනා ච මිච්ඡාවිමුත්ති හොති, පරඤ්ච මිච්ඡාවිමුත්තියා සමාදපෙති. අයං වුච්චති භික්ඛවෙ පාපෙන පාපතරො.

කතමො ච භික්ඛවෙ කල්‍යාණො? ඉධ භික්ඛවෙ එකච්චො සම්මාදිට්ඨිකො හොති -පෙ- සම්මාඤාණී හොති. සම්මාවිමුත්ති හොති. අයං වුච්චති භික්ඛවෙ කල්‍යාණො.

## 4. 5. 1. 7.

## [ පළමුවන පාප - කල්‍යාණ සූත්‍රය ]

7. මහණෙනි, පාපයාත් පාපයාට වැඩිසිටි පාපතරයාත් කල්‍යාණයාත් කල්‍යාණයාට වැඩිසිටි කල්‍යාණතරයාත් දෙසමි. ඒ අසව ... භාග්‍යවතුන් වහන්සේ තෙල වදාළහ:

මහණෙනි, පාප නම් කවරේ ය? මහණෙනි, මෙලොව ඇතැම් පුද්ගලයෙක් පණීවා ඇත්තේ වෙයි ... මිසදිටුහු ඇත්තේ වෙයි. මහණෙනි, මේ පාප යි කියනු ලැබේ.

මහණෙනි, පාපයා කෙරෙන් වැඩි සිටි පාපතර නම් කවරේ ය? මහණෙනි, මෙලොව ඇතැම් පුද්ගලයෙක් තෙමේත් පණීවා කරන්නේ වෙයි. මෙරමාත් පණීවායෙහි සමාදන් කරවයි ... තෙමේත් මිසදිටු ඇත්තේ වෙයි. මෙරමාත් මිසදිටුයෙහි සමාදන් කරවයි මහණෙනි, මේ පාපයා කෙරෙන් වැඩිසිටි පාපතර යි කියනු ලැබේ.

මහණෙනි, කල්‍යාණ (භද්‍ර) කවරේ ද මහණෙනි, මෙලොව ඇතැම් පුද්ගලයෙක් පණීවායෙන් දුරුවූයේ වෙයි... සම්‍යග් දෘෂ්ටික වෙයි. මහණෙනි, මේ කල්‍යාණය යි කියනු ලැබේ.

මහණෙනි, කල්‍යාණයාට වැඩි සිටි කල්‍යාණතර කවරේ ය? මහණෙනි, මෙලොව ඇතැම් පුද්ගලයෙක් තෙමේත් පණීවායෙන් දුරුවූයේ වෙයි. මෙරමාත් පණීවායෙන් දුරු වීමෙහි සමාදන් කරවයි ... තෙමේත් සම්‍යග් දෘෂ්ටික වෙයි. මෙරමාත් සම්‍යග් දෘෂ්ටියෙහි සමාදන් කරවයි. මහණෙනි, මේ කල්‍යාණයාට වැඩි සිටි කල්‍යාණතරය යි කියනු ලැබේ.

## 4. 5. 1 8.

## [ දෙවන පාප - කල්‍යාණසූත්‍රය ]

8. මහණෙනි, පාපයා ද පාපයාට වැඩිසිටි පාපතරයා ද කල්‍යාණයා ද කල්‍යාණයාට වැඩි සිටි කල්‍යාණතරයා ද දෙසමි. ඒ අසව...

මහණෙනි, පාප කවරේ ය? මහණෙනි, මෙලොව ඇතැම් පුද්ගලයෙක් මිසදිටු වේ ... මිථ්‍යාඥාන ඇතියේ වේ. මිථ්‍යාවිමුක්ති ඇතියේ වේ. මහණෙනි, මේ පාප යි කියනු ලැබේ.

මහණෙනි, පාපයාට වැඩිසිටි පාපතර කවරේය? මහණෙනි, මෙලොව ඇතැම් පුද්ගලයෙක් තෙමේත් මිථ්‍යාදෘෂ්ටික වෙයි. මෙරමාත් මිථ්‍යාදෘෂ්ටියෙහි සමාදන් කරවයි ... තෙමේත් මිථ්‍යාඥාන ඇත්තේ වෙයි. මෙරමාත් මිථ්‍යාඥානයෙහි සමාදන් කරවයි. තෙමේත් මිථ්‍යාවිමුක්ති ඇත්තේ වෙයි. මෙරමාත් මිථ්‍යාවිමුක්තියෙහි සමාදන් කරවන්නේ වෙයි. මහණෙනි, මේ පාපයා කෙරෙන් වැඩිසිටි පාපතරය යි කියනු ලැබේ.

මහණෙනි, කල්‍යාණ නම් කවරේ ය? මහණෙනි, මෙලොව ඇතැම් පුද්ගලයෙක් සම්‍යග්දෘෂ්ටික වේ ... සම්‍යග් ඥාන ඇත්තේ වෙයි. සම්‍යග් විමුක්තිඇත්තේ වෙයි. මහණෙනි, මේ කල්‍යාණය යි කියනු ලැබේ.

කතමො ච භික්ඛවෙ කල්‍යාණෙන කල්‍යාණතරො? ඉධ භික්ඛවෙ එකච්චො අත්තනා ච සම්මාදිට්ඨිකො හොති. පරඤ්ච සම්මාදිට්ඨියා සමාදපෙති. -පෙ- අත්තනා ච සම්මාඤාණී හොති. පරඤ්ච සම්මාඤාණෙ සමාදපෙති. අත්තනා ච සම්මාවිමුත්ති හොති. පරඤ්ච සම්මාවිමුත්තියා සමාදපෙති. අයං වුච්චති භික්ඛවෙ කල්‍යාණෙන කල්‍යාණතරොති.

## 4. 5. 1. 9.

## [ පඨම පාපධම්ම - කල්‍යාණ ධම්ම සුත්තං ]

9. පාපධම්මඤ්ච වො භික්ඛවෙ දෙසිස්සාමි පාපධම්මෙන පාපධම්මතරඤ්ච කල්‍යාණධම්මඤ්ච කල්‍යාණධම්මෙන කල්‍යාණධම්මතරඤ්ච. තං සුණාථ -පෙ-

කතමො ච භික්ඛවෙ පාපධම්මො? ඉධ භික්ඛවෙ එකච්චො පාණාතිපාතී හොති -පෙ- මිච්ඡාදිට්ඨිකො හොති. අයං වුච්චති භික්ඛවෙ පාපධම්මො.

කතමො ච භික්ඛවෙ පාපධම්මතරො? ඉධ භික්ඛවෙ, එකච්චො අත්තනා ච පාණාතිපාතී හොති, පරඤ්ච පාණාතිපාතෙ සමාදපෙති. -පෙ- අත්තනා ච මිච්ඡාදිට්ඨිකො හොති, පරඤ්ච මිච්ඡාදිට්ඨියා සමාදපෙති. අයං වුච්චති භික්ඛවෙ පාපධම්මෙන පාපධම්මතරො.

කතමො ච භික්ඛවෙ කල්‍යාණධම්මො? ඉධ භික්ඛවෙ එකච්චො පාණාතිපාතා පටිවිරතො හොති. -පෙ- සම්මාදිට්ඨිකො හොති. අයං වුච්චති භික්ඛවෙ කල්‍යාණධම්මො.

කතමො ච භික්ඛවෙ කල්‍යාණධම්මෙන කල්‍යාණධම්මතරො? ඉධ භික්ඛවෙ එකච්චො අත්තනා ච පාණාතිපාතා පටිවිරතො හොති, පරඤ්ච පාණාතිපාතා වෙරමණියා සමාදපෙති -පෙ- අත්තනා ච සම්මාදිට්ඨිකො හොති, පරඤ්ච සම්මාදිට්ඨියා සමාදපෙති. අයං වුච්චති භික්ඛවෙ කල්‍යාණධම්මෙන කල්‍යාණධම්මතරොති.

## 4. 5. 1. 10

## [ දුතිය පාපධම්ම - කල්‍යාණධම්ම සුත්තං ]

10. පාපධම්මඤ්ච වො භික්ඛවෙ දෙසිස්සාමි පාපධම්මෙන පාපධම්මතරඤ්ච කල්‍යාණධම්මඤ්ච කල්‍යාණධම්මෙන කල්‍යාණධම්මතරඤ්ච. තං සුණාථ -පෙ-

කතමො ච භික්ඛවෙ පාපධම්මො? ඉධ භික්ඛවෙ එකච්චො මිච්ඡාදිට්ඨිකො හොති -පෙ- මිච්ඡාඤාණී හොති. මිච්ඡාවිමුත්ති හොති. අයං වුච්චති භික්ඛවෙ පාපධම්මො.

මහණෙනි, කල්‍යාණයාට වඩා කල්‍යාණතර කවරේ ය? මහණෙනි, මෙලොව ඇතැම් පුද්ගලයෙක් තෙමේත් සම්‍යග් දෘෂ්ටික වෙයි. මෙරමාත් සම්‍යග් දෘෂ්ටියෙහි සමාදන් කරවයි ... තෙමේත් සම්‍යග් ඥාන ඇත්තේ වෙයි. මෙරමාත් සම්‍යග් ඥානයෙහි සමාදන් කරවයි. තෙමේත් සම්‍යග් විමුක්ති ඇත්තේ වෙයි. මෙරමාත් සම්‍යග් විමුක්තියෙහි සමාදන් කරවයි. මහණෙනි, මේ කල්‍යාණයාට වඩා කල්‍යාණතරය යි කියනු ලැබේ.

## 4. 5. 1. 9.

### [ පළමුවන පාපධම්ම - කල්‍යාණධම්ම සූත්‍රය ]

9. මහණෙනි, පාපධර්මියා ද පාපධර්මියාට වැඩිසිටි පාපධර්මිතරයා ද කල්‍යාණධර්මියා ද කල්‍යාණධර්මියාට වැඩිසිටි කල්‍යාණධර්මිතරයා ද දෙසමි. ඒ අසව ...

මහණෙනි, පාපධර්මී තම් කවරේය? මහණෙනි, මෙලොව ඇතැම් පුද්ගලයෙක් පණිවා කරන්නේ වෙයි ... මිථ්‍යාදෘෂ්ටික වෙයි. මහණෙනි, මේ පාපධර්මීය යි කියනු ලැබේ.

මහණෙනි, පාපධර්මියා කෙරෙන් වැඩිසිටි පාපධර්මීතර කවරේ ය? මහණෙනි, මෙලොව ඇතැම් පුද්ගලයෙක් තෙමේත් පණිවා කරන්නේ වෙයි. මෙරමාත් පණිවා කිරීමෙහි සමාදන් කරවයි ... තෙමේත් මිථ්‍යාදෘෂ්ටික වෙයි. මෙරමාත් මිථ්‍යාදෘෂ්ටියෙහි සමාදන් කරවයි. මහණෙනි, මේ පාපධර්මියාට වඩා පාපධර්මීතරය යි කියනු ලැබේ.

මහණෙනි, කල්‍යාණධර්මී තම් කවරේ ය? මහණෙනි, මෙලොව ඇතැම් පුද්ගලයෙක් පණිවායෙන් දුරුවූයේ වෙයි .... සම්‍යග්දෘෂ්ටික වෙයි. මහණෙනි, මේ කල්‍යාණධර්මීය යි කියනු ලැබේ.

මහණෙනි, කල්‍යාණධර්මියාට වැඩි සිටි කල්‍යාණධර්මීතර කවරේ ය? මහණෙනි, මෙලොව ඇතැම් පුද්ගලයෙක් තෙමේත් පණිවායෙන් දුරුවූයේ වෙයි. මෙරමාත් පණිවායෙන් දුරු වීමෙහි සමාදන් කරවයි ... තෙමේත් සම්‍යග් දෘෂ්ටික වෙයි. මෙරමාත් සම්‍යග් දෘෂ්ටියෙහි සමාදන් කරවයි. මහණෙනි, මේ කල්‍යාණධර්මියාට වඩා කල්‍යාණධර්මීතරය යි කියනු ලැබේ.

## 4. 5. 1. 10.

### [ දෙවන පාපධම්ම - කල්‍යාණධම්ම සූත්‍රය ]

10 මහණෙනි, පාපධර්මියා ද පාපධර්මියාට වැඩිසිටි පාපධර්මීතරයා ද කල්‍යාණධර්මියා ද කල්‍යාණධර්මියාට වැඩිසිටි කල්‍යාණධර්මීතරයා ද දෙසමි. ඒ අසව ...

මහණෙනි, පාපධර්මී කවරේ ය? මහණෙනි, මෙලොව ඇතැම් පුද්ගලයෙක් මිථ්‍යාදෘෂ්ටික වෙයි ... මිථ්‍යාඥාන ඇත්තේ වෙයි. මිථ්‍යාවිමුක්ති ඇත්තේ වෙයි. මහණෙනි, මේ පාපධර්මීය යි කියනු ලැබේ.

කතමො ච භික්ඛවෙ පාපධම්මෙන පාපධම්මතරො? ඉධ භික්ඛවෙ එකච්චො අත්තනා ච මිච්ඡාදිට්ඨිකො හොති, පරඤ්ච මිච්ඡාදිට්ඨියා සමාදපෙති -පෙ- අත්තනා ච මිච්ඡාඤාණී හොති, පරඤ්ච මිච්ඡාඤාණෙ සමාදපෙති අත්තනා ච මිච්ඡාවිමුත්තී හොති, පරඤ්ච මිච්ඡාවිමුත්තියා සමාදපෙති. අයං වුච්චති භික්ඛවෙ පාපධම්මෙන පාපධම්මතරො.

කතමො ච භික්ඛවෙ කල්‍යාණධම්මො? ඉධ භික්ඛවෙ එකච්චො සම්මාදිට්ඨිකො හොති -පෙ- සම්මාඤාණී හොති. සම්මාවිමුත්ති හොති. අයං වුච්චති භික්ඛවෙ කල්‍යාණධම්මො.

කතමො ච භික්ඛවෙ කල්‍යාණධම්මෙන කල්‍යාණධම්මතරො? ඉධ භික්ඛවෙ එකච්චො අත්තනා ච සම්මාදිට්ඨිකො හොති, පරඤ්ච සම්මාදිට්ඨියා සමාදපෙති. -පෙ- අත්තනා ච සම්මාඤාණී හොති, පරඤ්ච සම්මාඤාණෙ සමාදපෙති. අත්තනා ච සම්මාවිමුත්තී හොති, පරඤ්ච සම්මාවිමුත්තියා සමාදපෙති. අයං වුච්චති භික්ඛවෙ කල්‍යාණධම්මෙන කල්‍යාණධම්මතරොති.

**සප්පුරිසවග්ගො පඨමො.***

---

* **තස්සුද්දානං:**

සික්ඛාපදඤ්ච අස්සද්ධං සත්තකම්මං අථො ච දසකම්මං
අට්ඨඞ්ගිකඤ්ච දසමග්ගං ද්වෙ පාපධම්මා අපරෙ ද්වෙති. - මජ්ඣං.

මහණෙනි, පාපධර්මයාට වැඩි සිටි පාපධර්මතරයා කවරේ ද? මහණෙනි, මෙලොව ඇතැම් පුද්ගලයෙක් තෙමේත් මිථ්‍යාදෘෂ්ටික වෙයි. මෙරමාත් මිථ්‍යාදෘෂ්ටියෙහි සමාදන් කරවයි ... තෙමේත් මිථ්‍යාඥාන ඇත්තේ වෙයි. මෙරමාත් මිථ්‍යාඥානයෙහි සමාදන් කරවයි. තෙමේත් මිථ්‍යාවිමුක්ති ඇත්තේ වෙයි. මෙරමාත් මිථ්‍යාවිමුක්තියෙහි සමාදන් කරවයි. මහණෙනි, මේ පාපධර්මයාට වඩා පාපධර්මතරය යි කියනු ලැබේ.

මහණෙනි, කල්‍යාණධර්ම නම් කවරේ ද? මහණෙනි, මෙලොව ඇතැම් පුද්ගලයෙක් සම්‍යග්දෘෂ්ටික වෙයි. ... සම්‍යග්ඥාන ඇත්තේ වෙයි. සම්‍යග් විමුක්ති ඇත්තේ වෙයි. මහණෙනි, මේ කල්‍යාණධර්මය යි කියනු ලැබේ.

මහණෙනි, කල්‍යාණධර්මයාට වැඩි සිටි කල්‍යාණධර්මතර කවරේ ද? මහණෙනි, මෙලොව ඇතැම් පුද්ගලයෙක් තෙමේත් සම්‍යග්දෘෂ්ටික වෙයි. මෙරමාත් සම්‍යග්දෘෂ්ටියෙහි සමාදන් කරවයි ... තෙමේත් සම්‍යග්ඥාන ඇත්තේ වෙයි. මෙරමාත් සම්‍යග්ඥානයෙහි සමාදන් කරවයි. තෙමේත් සම්‍යග්විමුක්ති ඇත්තේ වෙයි. මෙරමාත් සම්‍යග්විමුක්තියෙහි සමාදන් කරවයි. මහණෙනි, මේ කල්‍යාණධර්මයාට වඩා කල්‍යාණධර්මතරය යි කියනු ලැබේ.

**සත්පුරුෂ වර්ගය පළමුවැනි යි.**

# 2. පරිසසොභනවග්ගො

## 4. 5. 2. 1.

### [ පරිසසොභනසුත්තං ]

[සාවත්ථිනිදානං]

11. චත්තාරො'මෙ භික්ඛවෙ පරිසදූසනා. කතමෙ චත්තාරො?

භික්ඛු භික්ඛවෙ දුස්සීලො පාපධම්මො පරිසදූසනො. භික්ඛුනී භික්ඛවෙ දුස්සීලා පාපධම්මා පරිසදූසනා. උපාසකො භික්ඛවෙ දුස්සීලො පාපධම්මො පරිසදූසනො. උපාසිකා භික්ඛවෙ දුස්සීලා පාපධම්මා පරිසදූසනා. ඉමෙ ඛො භික්ඛවෙ චත්තාරො පරිසදූසනාති.

චත්තාරොමෙ භික්ඛවෙ පරිසසොභනා. කතමෙ චත්තාරො?

භික්ඛු භික්ඛවෙ සීලවා කල්‍යාණධම්මො පරිසසොභනො. භික්ඛුනී භික්ඛවෙ සීලවතී කල්‍යාණධම්මා පරිසසොභනා. උපාසකො භික්ඛවෙ සීලවා කල්‍යාණධම්මො පරිසසොභනො උපාසිකා භික්ඛවෙ සීලවතී කල්‍යාණධම්මා පරිසසොභනා. ඉමෙ ඛො භික්ඛවෙ චත්තාරො පරිසසොභනාති.

## 4. 5. 2. 2.

### [ පඨම නිරය සග්ගනික්ඛිත්තසුත්තං ]

12. චතූහි භික්ඛවෙ ධම්මෙහි සමන්නාගතො යථාභතං නික්ඛිත්තො එවං නිරයෙ. කතමෙහි චතූහි?

කායදුච්චරිතෙන, වචීදුච්චරිතෙන, මනොදුච්චරිතෙන, මිච්ඡාදිට්ඨියා. ඉමෙහි ඛො භික්ඛවෙ චතූහි ධම්මෙහි සමන්නාගතො යථාභතං නික්ඛිත්තො එවං නිරයෙති

චතූහි භික්ඛවෙ ධම්මෙහි සමන්නාගතො යථාභතං නික්ඛිත්තො එවං සග්ගෙ. කතමෙහි චතූහි?

කායසුචරිතෙන, වචීසුචරිතෙන, මනොසුචරිතෙන, සම්මාදිට්ඨියා, ඉමෙහි ඛො භික්ඛවෙ චතූහි ධම්මෙහි සමන්නාගතො යථාභතං නික්ඛිත්තො එවං සග්ගෙති.

## 2. පරිසසොභන වර්‍ගය

### 4. 5. 2. 1.

### [ පරිසසොභන සූත්‍රය ]

[සැඞැක්නිදනයි]

11 මහණෙනි, මේ පරිසදූසනයෝ සතර දෙනෙකි. කවර සතර දෙනෙක යත්:

මහණෙනි, දුශ්ශීල වූ පාපධර්‍ම වූ මහණ පිරිස් කෙලෙසන්නේ වෙයි. මහණෙනි, දුශ්ශීල වූ පාපධර්‍ම වූ මෙහෙණ පිරිස් කෙලෙසන්නී වෙයි. මහණෙනි, දුශ්ශීල වූ පාපධර්‍ම වූ උවසු පිරිස් කෙලෙසන්නේ වෙයි. මහණෙනි, දුශ්ශීල වූ පාපධර්‍ම වූ උවැසි පිරිස් කෙලෙසන්නී වෙයි. මහණෙනි, මේ සතර පරිසදූසනයෝ යි

මහණෙනි, මේ පරිසසෝභනයෝ සතර දෙනෙකි. කවර සතර දෙනෙක යත්:

මහණෙනි, සිල්වත් කලණදහම් ඇති මහණ පිරිස් හොබවන්නේ වෙයි. මහණෙනි, සිල්වත් කලණදහම් ඇති මෙහෙණ පිරිස් හොබවන්නී වෙයි. මහණෙනි, සිල්වත් කලණදහම් ඇති උවසු පිරිස් හොබවන්නේ වෙයි. මහණෙනි, සිල්වත් කලණදහම් ඇති උවැසි පිරිස් හොබවන්නී වෙයි. මහණෙනි, මේ සතර පරිසසොභනයෝ යි.

### 4. 5. 2. 2.

### [ පළමුවන නිරය - සග්‍ග නික්ඛිත්ත සූත්‍රය ]

12. මහණෙනි, දහම් සතරෙකින් සමන්‍නාගත වූයේ ගෙණවුත් බහා තබන ලද්දක් සෙයින් නිරයෙහි නික්ෂිප්ත වෙයි. කවර සතරෙකින යත්:

කායදුශ්චරිතයෙන, වාග්දුශ්චරිතයෙන, මනෝදුශ්චරිතයෙන, මිථ්‍යා-දෘෂ්ටියෙන.

මහණෙනි, මේ දහම් සතරින් සමන්‍නාගත වූයේ ගෙණවුත් බහා තබන ලද්දක් සෙයින් නිරයෙහි බැහෙයි.

මහණෙනි, කරුණු සතරෙකින් සමන්‍නාගත වූයේ ගෙණවුත් බහා තබන ලද්දක් සෙයින් ස්වර්‍ගයෙහි සිටුනේ ය කවර සතර කරුණෙකින යත්:

කායසුචරිතයෙන, වාක්සුචරිතයෙන, මනඃසුචරිතයෙන, සම්‍යග්-දෘෂ්ටියෙන. මහණෙනි, මේ සතර කරුණින් සමන්‍නාගත වූයේ ගෙණවුත් බහා තබන ලද්දක් සෙයින් ස්වර්‍ගයෙහි සිටුනේ ය

## 4. 5. 2. 3.

### [ දුතිය නිරය-සග්ග නික්ඛිත්තසුත්තං ]

13. චතූහි භික්ඛවෙ ධම්මෙහි සමන්නාගතො යථාභතං නික්ඛිත්තො එවං නිරයෙ. කතමෙහි චතූහි?

කායදුච්චරිතෙන, වචීදුච්චරිතෙන, මනොදුච්චරිතෙන, අකතඤ්ඤුතා අකතවෙදිතා. ඉමෙහි ඛො භික්ඛවෙ චතූහි ධම්මෙහි සමන්නාගතො යථාභතං නික්ඛිත්තො එවං නිරයෙති.

චතූහි භික්ඛවෙ ධම්මෙහි සමන්නාගතො යථාභතං නික්ඛිත්තො එවං සග්ගෙ. කතමෙහි චතූහි?

කායසුචරිතෙන, වචීසුචරිතෙන, මනොසුචරිතෙන, කතඤ්ඤුතා කතවෙදිතා. ඉමෙහි ඛො භික්ඛවෙ චතූහි ධම්මෙහි සමන්නාගතො යථාභතං නික්ඛිත්තො එවං සග්ගෙති.

## 4. 5. 2. 4.

### [ තතිය නිරය-සග්ග නික්ඛිත්ත සුත්තං ]

14. [චතූහි භික්ඛවෙ ධම්මෙහි සමන්නාගතො -පෙ-]

පාණාතිපාතී හොති. අදින්නාදායී හොති. කාමෙසු මිච්ඡාචාරී හොති. මුසාවාදී හොති. -පෙ- [යථාභතං නික්ඛිත්තො එවං නිරයෙති.]

[චතූහි භික්ඛවෙ ධම්මෙහි සමන්නාගතො -පෙ-]

පාණාතිපාතා පටිවිරතො හොති. අදින්නාදානා පටිවිරතො හොති. කාමෙසු මිච්ඡාචාරා පටිවිරතො හොති. මුසාවාදා පටිවිරතො හොති -පෙ- [යථාභතං නික්ඛිත්තො එවං සග්ගෙති.]

## 4. 5. 2. 5.

### [ චතුත්ථ නිරය-සග්ග නික්ඛිත්ත සුත්තං ]

15. [චතූහි භික්ඛවෙ ධම්මෙහි සමන්නාගතො -පෙ-]

මිච්ඡාදිට්ඨිකො හොති. මිච්ඡාසඞ්කප්පො හොති. මිච්ඡාවාචො හොති මිච්ඡාකම්මන්තො හොති -පෙ- [යථාභතං නික්ඛිත්තො එවං නිරයෙති]

[චතූහි භික්ඛවෙ ධම්මෙහි සමන්නාගතො -පෙ-]

සම්මාදිට්ඨිකො හොති. සම්මාසඞ්කප්පො හොති. සම්මාවාචො හොති සම්මාකම්මන්තො හොති. -පෙ- [යථාභතං නික්ඛිත්තො එවං සග්ගෙති]

4. 5. 2. 3.

[දෙවන නිරය-සග්ග නික්ඛිත්ත සූත්‍රය]

13. මහණෙනි, සතර කරුණෙකින් සමන්විත වූයේ ගෙණවුත් බහා තබන ලද්දක් සෙයින් නිරයෙහි වේ. කවර සතර කරුණෙක යත්:

කායදුශ්චරිතයෙන, වාග්දුශ්චරිතයෙන, මනොදුශ්චරිතයෙන, අකෘතඥතා-අකෘතවේදිතායෙන. මහණෙනි, මේ සතර කරුණින් සමන්විත වූයේ ගෙණවුත් බහා තබන ලද්දක් සෙයින් නිරයෙහි බහා තැබුයේ ය.

මහණෙනි, සතර කරුණෙකින් සමන්විත වූයේ ගෙණවුත් බහා තබන ලද්දේ යම් සේ ද එපරිදි ස්වර්ගයෙහි වේ. කවර සතර කරුණෙක යත්:

කායසුචරිතයෙන, වාක්සුචරිතයෙන, මනඃසුචරිතයෙන, කෘතඥතා-කෘතවෙදිතායෙන. මහණෙනි, මේ සතර කරුණින් සමන්විත වූයේ ගෙණවුත් බහා තබන ලද්දේ යම්සේ ද එපරිදි ස්වර්ගයෙහි වෙයි.

4. 5. 2. 4.

[තෙවන නිරය-සග්ග නික්ඛිත්ත සූත්‍රය]

14. [මහණෙනි, දහම් සතරෙකින් සමන්විත වූයේ ...]

පණිවා කරන්නේ වෙයි. අසිතාදන් ගන්නේ වෙයි. කාමයෙහි මිසහසර ඇතියේ වෙයි. මුසවා බණන්නේ වෙයි ... [ගෙණවුත් බහා තබන ලද්දක් සෙයින් නිරයෙහි බැහෙයි.]

[මහණෙනි, දහම් සතරෙකින් සමන්විත වූයේ ...]

පණිවායෙන් දුරුවූයේ වෙයි. අසිතාදනින් දුරුවූයේ වෙයි. කාමයෙහි මිසහසරින් දුරුවූයේ වෙයි. මුසවායෙන් දුරුවූයේ වෙයි. ... [ගෙණවුත් බහා තබන ලද්දක් සෙයින් ස්වර්ගයෙහි වෙයි.]

4. 5. 2. 5.

[සිවුවන නිරය-සග්ග නික්ඛිත්ත සූත්‍රය]

15. [මහණෙනි, දහම් සතරෙකින් සමන්විත වූයේ ...]

මිසදිටු ඇතියේ වෙයි. මිථ්‍යාසඞ්කල්ප ඇතියේ වෙයි. මිථ්‍යාවචන ඇතියේ වෙයි. මිථ්‍යාකර්මාන්ත ඇතියේ වෙයි ... [ගෙණවුත් බහා තබන ලද්දක් සෙයින් නිරයෙහි බැහෙයි.]

[මහණෙනි දහම් සතරෙකින් සමන්විත වූයේ .... ]

සම්‍යග්දෘෂ්ටි ඇත්තේ වෙයි. සම්‍යක්සඞ්කල්ප ඇතියේ වෙයි. සම්‍යග්-වචන ඇත්තේ වෙයි. සම්‍යක්කර්මාන්ත ඇත්තේ වෙයි. ... [ගෙණවුත් බහා තබන ලද්දක් සෙයින් ස්වර්ගයෙහි වෙයි.]

### 4. 5. 2. 6.

### [ පඤ්චම නිරය - සග්ග නික්ඛිත්ත සුත්තං ]

16. [චතූහි භික්ඛවෙ ධම්මෙහි සමන්නාගතො පෙ-]

මිච්ඡාආජීවො හොති. මිච්ඡාවායාමො හොති. මිච්ඡාසති හොති. මිච්ඡාසමාධි හොති. -පෙ- [යථාභතං නික්ඛිත්තො එවං නිරයෙ.]

[චතූහි භික්ඛවෙ ධම්මෙහි සමන්නාගතො -පෙ-]

සම්මාආජීවො හොති. සම්මාවායාමො හොති. සම්මාසති හොති සම්මාසමාධි හොති -පෙ- [යථාභතං නික්ඛිත්තො එවං සග්ගෙ.]

### 4. 5. 2. 7.

### [ ඡට්ඨම නිරය - සග්ග නික්ඛිත්ත සුත්තං ]

17. [චතූහි භික්ඛවෙ ධම්මෙහි සමන්නාගතො -පෙ-]

අදිට්ඨෙ දිට්ඨවාදී හොති. අසුතෙ සුතවාදී හොති. අමුතෙ මුතවාදී හොති අවිඤ්ඤාතෙ විඤ්ඤාතවාදී හොති -පෙ- [යථාභතං නික්ඛිත්තො එවං නිරයෙ.]

[චතූහි භික්ඛවෙ ධම්මෙහි සමන්නාගතො -පෙ-]

අදිට්ඨෙ අදිට්ඨවාදී හොති. අසුතෙ අසුතවාදී හොති. අමුතෙ අමුතවාදී හොති. අවිඤ්ඤාතෙ අවිඤ්ඤාතවාදී හොති -පෙ- [යථාභතං නික්ඛිත්තො එවං සග්ගෙ.]

### 4. 5. 2. 8.

### [ සත්තම නිරය - සග්ග නික්ඛිත්ත සුත්තං ]

18. [චතූහි භික්ඛවෙ ධම්මෙහි සමන්නාගතො -පෙ-]

දිට්ඨෙ අදිට්ඨවාදී හොති. සුතෙ අසුතවාදී හොති. මුතෙ අමුතවාදී හොති. විඤ්ඤාතෙ අවිඤ්ඤාතවාදී හොති -පෙ- [යථාභතං නික්ඛිත්තො එවං නිරයෙ.]

[චතූහි භික්ඛවෙ ධම්මෙහි සමන්නාගතො -පෙ-]

දිට්ඨෙ දිට්ඨවාදී හොති. සුතෙ සුතවාදී හොති. මුතෙ මුතවාදී හොති. විඤ්ඤාතෙ විඤ්ඤාතවාදී හොති -පෙ- [යථාභතං නික්ඛිත්තො එවං සග්ගෙ.]

## 4. 5. 2. 6.

### [ පස්වන නිරය-සග්ග නික්ඛිත්ත සූත්‍රය ]

16 [මහණෙනි, දහම් සතරෙකින් සමන්‍විාගත වූයේ .... ]

මිථ්‍යාජීව ඇතියේ වෙයි. මිථ්‍යා ව්‍යායාම ඇතියේ වෙයි. මිථ්‍යාසමෘති ඇතියේ වෙයි. මිථ්‍යාසමාධි ඇතියේ වෙයි ... [ගෙණවුත් බහා තබන ලද්දක් සෙයින් නිරයෙහි බැහෙයි.]

[මහණෙනි, දහම් සතරෙකින් සමන්‍විාගත වූයේ ... ]

සම්‍යග් ආජීව ඇතියේ වෙයි. සම්‍යග්ව්‍යායාම ඇතියේ වෙයි. සම්‍යක්-සමෘති ඇතියේ වෙයි. සම්‍යක්සමාධි ඇතියේ වෙයි ... [ගෙණවුත් බහා තබන ලද්දක් සෙයින් සවර්ගයෙහි වෙයි ]

## 4. 5. 2. 7.

### [ සවන නිරය-සග්ග නික්ඛිත්ත සූත්‍රය ]

17 [මහණෙනි, දහම් සතරෙකින් සමන්‍විාගත වූයේ ... ]

නොදුටු රූපායතනයෙහි දෘෂ්ටවාද ඇත්තේ වෙයි. නොඇසූ ශබ්දායතන-යෙහි ශ්‍රැතවාද ඇත්තේ වෙයි. එයින් සෙසු අමුත-ආයතනයෙහි මුතවාද ඇත්තේ වෙයි. අවිඥතධර්මයෙහි විඥතවාද ඇත්තේ වෙයි ... [ගෙණවුත් බහා තබන ලද්දක් සෙයින් නිරයෙහි බැහෙයි.]

[මහණෙනි, දහම් සතරෙකින් සමන්‍විාගත වූයේ .... ]

නොදුටු රූපායතනයෙහි අදෘෂ්ටවාද ඇත්තේ වෙයි. නොඇසූ ශබ්දායතනයෙහි අශ්‍රැතවාද ඇතියේ වෙයි. එයින් සෙසු අමුත-ආයතනයෙහි අමුතවාද ඇතියේ වෙයි. අවිඥතධර්මයෙහි අවිඥතවාද ඇත්තේ වෙයි ... [ගෙණවුත් බහා තබන ලද්දක් සෙයින් සවර්ගයෙහි වෙයි.]

## 4. 5. 2. 8.

### [ සත්වන නිරය-සග්ග නික්ඛිත්ත සූත්‍රය ]

18. [මහණෙනි, දහම් සතරෙකින් සමන්‍විාගත වූයේ ... ]

දෘෂ්ටායතනයෙහි අදෘෂ්ටවාද ඇත්තේ වෙයි. ශ්‍රැතායතනයෙහි අශ්‍රැතවාද ඇත්තේ වෙයි. මුතායතනයෙහි අමුතවාද ඇත්තේ වෙයි. විඥතආයතන-යෙහි අවිඥතවාද ඇත්තේ වෙයි ... [ගෙණවුත් බහා තබන ලද්දක් සෙයින් නිරයෙහි බැහෙයි.]

[මහණෙනි, දහම් සතරෙකින් සමන්‍විාගත වූයේ ... ]
දෘෂ්ටායතනයෙහි දෘෂ්ටවාද ඇත්තේ වෙයි. ශ්‍රැතායතනයෙහි ශ්‍රැතවාද ඇත්තේ වෙයි. මුතායතනයෙහි මුතවාද ඇත්තේ වෙයි. විඥතධර්මයෙහි විඥතවාද ඇත්තේ වෙයි ... [ගෙණවුත් බහා තබන ලද්දක් සෙයින් සවර්ගයෙහි වෙයි.]

## 4. 5. 2. 9.

### [ අට්ඨම නිරය-සග්ග නික්ඛිත්ත සුත්තං ]

19. [චතූහි භික්ඛවෙ ධම්මෙහි සමන්නාගතො -පෙ-]

අස්සද්ධො හොති. දුස්සීලො හොති. අහිරිකො හොති.! අනොත්තප්පී හොති -පෙ- [යථාභතං නික්ඛිත්තො එවං නිරයෙති.]

[චතූහි භික්ඛවෙ ධම්මෙහි සමන්නාගතො -පෙ-]

සද්ධො හොති. සීලවා හොති. හිරිමා හොති. ඔත්තප්පී හොති -පෙ- [යථාභතං නික්ඛිත්තො එවං සග්ගෙති.]

## 5. 2. 10.

### [ නවම නිරය-සග්ග නික්ඛිත්ත සුත්තං ]

20. චතූහි භික්ඛවෙ ධම්මෙහි සමන්නාගතො යථාභතං නික්ඛිත්තො එවං නිරයෙ. කතමෙහි චතූහි?

අස්සද්ධො හොති. දුස්සීලො හොති. කුසීතො හොති. දුප්පඤ්ඤො හොති. ඉමෙහි ඛො භික්ඛවෙ චතූහි ධම්මෙහි සමන්නාගතො යථාභතං නික්ඛිත්තො එවං නිරයෙති.

චතූහි භික්ඛවෙ ධම්මෙහි සමන්නාගතො යථාභතං නික්ඛිත්තො එවං සග්ගෙ. කතමෙහි චතූහි?

සද්ධො හොති. සීලවා හොති. ආරද්ධවිරියො හොති. පඤ්ඤවා හොති. ඉමෙහි ඛො භික්ඛවෙ චතූහි ධම්මෙහි සමන්නාගතො යථාභතං නික්ඛිත්තො එවං සග්ගෙති.

**පරිසසොභනවග්ගො දුතියො.***

---

* තස්සුද්දානං :

පරිසා දිට්ඨි අකතඤ්ඤුතා පාණාතිපාතාපි දෙව මග්ගා
දෙව වොහාරපථා ඔත්තප්පං අහිරිකං දුප්පඤ්ඤෙන චාති. - මජ්ඣං.

Free Distribution www.aathaapi.org

## 4. 5. 2. 9.

## [ අටවැනි නිරය-සග්ග නික්ඛිත්ත සූත්‍රය ]

19. [මහණෙනි, සතර කරුණෙකින් සමන්වාගත වූයේ ....]

සැදැහැ නැතියේ වෙයි. සිල් නැතියේ වෙයි. පවට ලජ්ජා නැතියේ වෙයි. පවට බිය නැතියේ වෙයි ... [ගෙණවුත් බහා තබන ලද්දක් සෙයින් නිරයෙහි වැටුනේ වෙයි.]

[මහණෙනි, සතර කරුණෙකින් සමන්වාගත වූයේ ... ]

සැදැහැ ඇතියේ වෙයි. සිල් ඇතියේ වෙයි. පවට ලජ්ජා ඇතියේ වෙයි. පවට බිය ඇතියේ වෙයි ... [ගෙණවුත් බහා තබන ලද්දක් සෙයින් සවර්ගයෙහි සිටුනේ වේ.]

## 4. 5. 2. 10.

## [ නවවැනි නිරය-සග්ග නික්ඛිත්ත සූත්‍රය ]

20. මහණෙනි, සතර කරුණෙකින් සමන්වාගත වූයේ ගෙණවුත් බහා තබන ලද්දක් සෙයින් නිරයෙහි වැටුනේ වේ. කවර සතර කරුණකින යත්:

සැදැහැ නැතියේ වෙයි. සිල් නැතියේ වෙයි. කුසීත වෙයි. අප්‍රාඥ වෙයි. මහණෙනි, මේ සතර කරුණින් සමන්වාගත වූයේ ගෙණවුත් බහා තබන ලද්දක් සෙයින් නිරයෙහි වැටුනේ වේ.

මහණෙනි, සතර කරුණෙකින් සමන්වාගත වූයේ ගෙණවුත් බහා තබන ලද්දක් සෙයින් සවර්ගයෙහි සිටුනේ වේ. කවර සතර කරුණකින යත්:

සැදැහැ ඇතියේ වෙයි. සිල් ඇතියේ වෙයි. ඇරඹූ වැර ඇතියේ වෙයි. පැණ ඇතියේ වෙයි. මහණෙනි, මේ සිවු කරුණින් සමන්වාගත වූයේ ගෙණවුත් බහා තබන ලද්දක් සෙයින් සවර්ගයෙහි සිටුනේ වේ.

පරිෂශෝභන වර්ගය දෙවැනි යි.

# 3. සුචරිතවග්ගො

## 4. 5. 3. 1.

### [ වචීසුචරිතසුත්තං ]

[සාවත්ථිනිදානං]

21. චත්තාරිමානි භික්ඛවෙ වචීදුච්චරිතානි. කතමානි චත්තාරි?

මුසාවාදො, පිසුණාවාචා, ඵරුසාවාචා, සම්ඵප්පලාපො ඉමානි ඛො භික්ඛවෙ චත්තාරි වචීදුච්චරිතානි.

චත්තාරිමානි භික්ඛවෙ වචීසුචරිතානි කතමානි චත්තාරි?

සච්චවාචා, අපිසුණාවාචා, සණ්හවාචා, මන්තාභාසා ඉමානි ඛො භික්ඛවෙ චත්තාරි වචීසුචරිතානි.

## 4. 5. 3. 2

### [ පඨම බාල-පණ්ඩිතසුත්තං ]

22. චතූහි භික්ඛවෙ ධම්මෙහි සමන්නාගතො බාලො අබ්‍යත්තො අසප්පුරිසො ඛතං උපහතං අත්තානං පරිහරති. සාවජ්ජො ච හොති සානුවජ්ජො විඤ්ඤූනං. බහුඤ්ච අපුඤ්ඤං පසවති. කතමෙහි චතූහි?

කායදුච්චරිතෙන, වචීදුච්චරිතෙන, මනොදුච්චරිතෙන, මිච්ඡාදිට්ඨියා. ඉමෙහි ඛො භික්ඛවෙ චතූහි ධම්මෙහි සමන්නාගතො බාලො අබ්‍යත්තො අසප්පුරිසො ඛතං උපහතං අත්තානං පරිහරති. සාවජ්ජො ච හොති සානුවජ්ජො විඤ්ඤූනං. බහුඤ්ච අපුඤ්ඤං පසවති.

චතූහි භික්ඛවෙ ධම්මෙහි සමන්නාගතො පණ්ඩිතො බ්‍යත්තො සප්පුරිසො අක්ඛතං අනුපහතං අත්තානං පරිහරති. අනවජ්ජො ච හොති අනනුවජ්ජො විඤ්ඤූනං. බහුඤ්ච පුඤ්ඤං පසවති කතමෙහි චතූහි?

කායසුචරිතෙන, වචීසුචරිතෙන, මනොසුචරිතෙන, සම්මාදිට්ඨියා. ඉමෙහි ඛො භික්ඛවෙ චතූහි ධම්මෙහි සමන්නාගතො පණ්ඩිතො බ්‍යත්තො සප්පුරිසො අක්ඛතං අනුපහතං අත්තානං පරිහරති. අනවජ්ජො ච හොති අනනුවජ්ජො විඤ්ඤූනං. බහුඤ්ච පුඤ්ඤං පසවතීති.

# 3. සුචරිත වර්ගය

## 4. 5. 3. 1.

## [ වචීසුචරිත සූත්‍රය ]

[ සැවැත් නිදානයි ]

21. මහණෙනි, මේ වාග්දුශ්චරිතයෝ සතර දෙනෙකි. කවර සතර දෙනෙක යත්:

මුසාවා ය, පිසුනුබස් ය, පරොස්බස් ය, පලප් යි. මහණෙනි, මේ සතර වාග්දුශ්චරිතයෝ යි.

මහණෙනි, මේ වාක්සුචරිතයෝ සතර දෙනෙකි. කවර සතර දෙනෙක යත්:

සබවස ය, නො පිසුනුබස ය, මොළොක්බස ය, පමණ දැන බණනා බස් යි. මහණෙනි, මේ සතර වාක්සුචරිතයෝ යි

## 4. 5. 3. 2.

## [ ප්‍රථම බාල - පණ්ඩිත සූත්‍රය ]

22. මහණෙනි, සතර කරුණෙකින් සමන්වාගත වූ අඥ වූ අව්‍යක්ත වූ අසත්පුරුෂ තෙමේ ගුණ විසින් සාරා (සාරා ලූ) ගුණ විසින් නට,ආත්මයක් පරිහරණය කෙරෙයි. සාවද්‍ය ද වෙයි. නුවණැතියන් විසින් උපවාද කටයුතු ද වෙයි. බොහෝ අකුසල් ද ප්‍රසව කෙරෙයි කවර සතර කරුණින යත්:

කායදුශ්චරිතයෙන, වාග්දුශ්චරිතයෙන, මනොදුශ්චරිතයෙන, මිථ්‍යා-දෘෂ්ටියෙන. මහණෙනි, මේ සතර කරුණින් සමන්වාගත වූ බාල වූ අව්‍යක්ත වූ අසත්පුරුෂ තෙමේ ගුණ විසින් සාළ, ගුණ විසින් නට ආත්මයක් පරිහරණය කෙරෙයි සාවද්‍ය ද වෙයි. නුවණැතියන් විසින් උපවාද කටයුතු ද වෙයි. බොහෝ අකුසල් ද රැස් කෙරෙයි.

මහණෙනි, සතර කරුණෙකින් සමන්වාගත වූ පණ්ඩිත වූ ව්‍යක්ත වූ සත්පුරුෂ තෙමේ ගුණ විසින් නො සාළ, එයින් නො නට ආත්මයක් පස්වැටුම් කෙරෙයි. අනවද්‍ය ද වෙයි නුවණැතියන් විසින් උපවාද නො කටයුතු ද වෙයි. බොහෝ පින් ද රැස් කෙරෙයි. කවර සතර කරුණින යත්:

කායසුචරිතයෙන, වාක්සුචරිතයෙන, මනඃසුචරිතයෙන, සම්‍යග් දෘෂ්ටියෙන. මහණෙනි, මේ සතර කරුණින් සමන්වාගත වූ පණ්ඩිත වූ ව්‍යක්ත වූ සත්පුරුෂ තෙමේ ගුණ විසින් නො සාළ, එයින් නො නට ආත්මයක් පස්වටයි. අනවද්‍ය ද වෙයි. නුවණැතියන් විසින් උපවාද නො කටයුතු ද වෙයි. බොහෝ පින් ද රැස් කෙරෙයි.

## 4. 5. 3. 3.

## [ දුතිය බාල - පණ්ඩිත සුත්තං ]

23. චතූහි භික්ඛවෙ ධම්මෙහි සමන්නාගතො බාලො අබ්‍යත්තො අසප්පුරිසො ඛතං උපහතං අත්තානං පරිහරති, සාවජ්ජො ච හොති සානුවජ්ජො විඤ්ඤූනං. බහුඤ්ච අපුඤ්ඤං පසවති. කතමෙහි චතූහි?

කායදුච්චරිතෙන, වචීදුච්චරිතෙන, මනොදුච්චරිතෙන, අකතඤ්ඤුතා අකතවෙදිතාය. [ඉමෙහි -පෙ- අසප්පුරිසො -පෙ- බහුඤ්ච අපුඤ්ඤං පසවති]

[චතූහි භික්ඛවෙ ධම්මෙහි සමන්නාගතො -පෙ- සප්පුරිසො -පෙ-]

කායසුචරිතෙන, වචීසුචරිතෙන, මනොසුචරිතෙන, කතඤ්ඤුතා කතවෙදිතාය. [ඉමෙහි -පෙ- බහුඤ්ච පුඤ්ඤං පසවතීති.]

## 4. 5. 3. 4.

## [ තතිය බාල - පණ්ඩිත සුත්තං ]

24. [චතූහි භික්ඛවෙ ධම්මෙහි සමන්නාගතො -පෙ- අසප්පුරිසො -පෙ-]

පාණාතිපාතී හොති. අදින්නාදායී හොති. කාමෙසු මිච්ඡාචාරී හොති. මුසාවාදී හොති. [ඉමෙහි -පෙ- බහුඤ්ච අපුඤ්ඤං පසවති.]

[චතූහි භික්ඛවෙ ධම්මෙහි සමන්නාගතො -පෙ- සප්පුරිසො -පෙ-]

පාණාතිපාතා පටිවිරතො හොති. අදින්නාදානා පටිවිරතො හොති. කාමෙසු මිච්ඡාචාරා පටිවිරතො හොති. මුසාවාදා පටිවිරතො හොති. [ඉමෙහි -පෙ- බහුඤ්ච පුඤ්ඤං පසවතීති.]

## 4. 5. 3. 5.

## [ චතුත්ථ බාල - පණ්ඩිත සුත්තං ]

25. [චතූහි භික්ඛවෙ ධම්මෙහි සමන්නාගතො -පෙ- අසප්පුරිසො -පෙ-]

මිච්ඡාදිට්ඨිකො හොති. මිච්ඡාසඞ්කප්පො හොති. මිච්ඡාවාචො හොති. මිච්ඡාකම්මන්තො හොති. [ඉමෙහි -පෙ- බහුඤ්ච අපුඤ්ඤං පසවති.]

[චතූහි භික්ඛවෙ ධම්මෙහි සමන්නාගතො -පෙ- සප්පුරිසො -පෙ-]

සම්මාදිට්ඨිකො හොති. සම්මාසඞ්කප්පො හොති. සම්මාවාචො හොති. සම්මාකම්මන්තො හොති. [ඉමෙහි -පෙ- බහුඤ්ච පුඤ්ඤං පසවතීති.]

## 4. 5. 3. 3.

## [ දෙවන බාල - පණ්ඩිත සූත්‍රය ]

23. මහණෙනි, සතර කරුණෙකින් සමන්වාගත වූ බාල වූ අව්‍යක්ත වූ අසත්පුරුෂ තෙමේ ගුණ විසින් සාරා දමන ලද, ගුණ විසින් නට ආත්මයක් පරිහරණය කෙරෙයි. සාවද්‍ය ද වෙයි. නුවණැතියන් විසින් උපවාද කටයුතු ද වෙයි. බොහෝ අකුසල් ද රැස් කෙරෙයි. කවර සතරෙකින යත්:

කායදුශ්චරිතයෙන, වාග්දුශ්චරිතයෙන, මනොදුශ්චරිතයෙන, අකෘතඥතා - අකෘතවේදිතායෙන. [මේ සතර කරුණින් ... බොහෝ අකුසල් ද රැස් කෙරෙයි.]

[මහණෙනි, සතර කරුණෙකින් සමන්වාගත ... සත්පුරුෂ තෙමේ .... ]

කායසුචරිතයෙන, වාක්සුචරිතයෙන, මනඃසුචරිතයෙන, කෘතඥතා-කෘතවෙදිතායෙන. [මේ සතර කරුණින් .. බොහෝ පින් ද රැස් කෙරෙයි.]

## 4. 5. 3. 4.

## [ තෙවන බාල - පණ්ඩිත සූත්‍රය ]

24. [මහණෙනි, සතර කරුණෙකින් සමන්වාගත ... අසත්පුරුෂ තෙමේ .... ]

පණිවා කරන්නේ වෙයි. අසිනාදන් ගන්නේ වෙයි. කාමයෙහි මිසහසර ඇතියේ වෙයි. මුසවා බණන්නේ වෙයි. [මේ සතර කරුණින් බොහෝ අකුසල් ද රැස් කෙරෙයි.]

[මහණෙනි, සතර කරුණෙකින් සමන්වාගත .. සත්පුරුෂ තෙමේ ... ]

පණිවායෙන් දුරු වූයේ වෙයි. අසිනාදනින් දුරු වූයේ වෙයි. කාමයෙහි මිසහසරින් දුරු වූයේ වෙයි. මුසවායෙන් දුරු වූයේ වෙයි. [මේ සතර කරුණින් බොහෝ කුසල් ද රැස් කෙරෙයි.]

## 4. 5. 3. 5.

## [ සිවුවන බාල - පණ්ඩිත සූත්‍රය ]

25. [මහණෙනි, සතර කරුණෙකින් සමන්වාගත ... අසත්පුරුෂ තෙමේ ...]

මිසදිටු ඇත්තේ වෙයි. මිථ්‍යාසඞ්කල්ප ඇත්තේ වෙයි. මිථ්‍යාවචන ඇත්තේ වෙයි. මිථ්‍යා කර්මාන්ත ඇත්තේ වෙයි. [මේ සතර කරුණින් ... බොහෝ අකුසල් ද රැස් කෙරෙයි.]

[මහණෙනි, සතර කරුණෙකින් සමන්වාගත .... අසත්පුරුෂ තෙමේ ... ]

සම්‍යග් දෘෂ්ටික වෙයි. සම්‍යක් සඞ්කල්ප ඇතියේ වෙයි. සම්‍යක් වචන ඇතියේ වෙයි. සම්‍යක් කර්මාන්ත ඇතියේ වෙයි. [මේ සතර කරුණින් ... බොහෝ කුසල් ද රැස් කෙරෙයි.]

## 4. 5. 3. 6.

### [ පඤ්චම බාල - පණ්ඩිත සුත්තං ]

26. [චතූහි භික්ඛවෙ ධම්මෙහි සමන්නාගතො -පෙ- අසප්පුරිසො -පෙ-]

මිච්ඡාආජීවො හොති. මිච්ඡාවායාමො හොති. මිච්ඡාසති හොති මිච්ඡාසමාධි හොති. [ඉමෙහි -පෙ- බහුඤ්ච අපුඤ්ඤං පසවති.]

[චතූහි භික්ඛවෙ ධම්මෙහි සමන්නාගතො -පෙ- සප්පුරිසො -පෙ-]

සම්මාආජීවො හොති. සම්මාවායාමො හොති. සම්මාසති හොති. සම්මාසමාධි හොති [ඉමෙහි -පෙ- බහුඤ්ච පුඤ්ඤං පසවතීති.]

## 4. 5. 3. 7.

### [ ඡට්ඨ බාල - පණ්ඩිත සුත්තං ]

27. [චතූහි භික්ඛවෙ ධම්මෙහි සමන්නාගතො -පෙ- අසප්පුරිසො -පෙ-]

අදිට්ඨෙ දිට්ඨවාදී හොති. අසුතෙ සුතවාදී හොති. අමුතෙ මුතවාදී හොති. අවිඤ්ඤාතෙ විඤ්ඤාතවාදී හොති. [ඉමෙහි -පෙ- බහුඤ්ච අපුඤ්ඤං පසවති.]

[චතූහි භික්ඛවෙ ධම්මෙහි සමන්නාගතො -පෙ- සප්පුරිසො -පෙ-]

අදිට්ඨෙ අදිට්ඨවාදී හොති. අසුතෙ අසුතවාදී හොති. අමුතෙ අමුතවාදී හොති. අවිඤ්ඤාතෙ අවිඤ්ඤාතවාදී හොති. [ඉමෙහි -පෙ- බහුඤ්ච පුඤ්ඤං පසවතීති ]

## 4. 5. 3. 8

### [ සත්තම බාල - පණ්ඩිත සුත්තං ]

28. [චතූහි භික්ඛවෙ ධම්මෙහි සමන්නාගතො -පෙ- අසප්පුරිසො -පෙ-]

දිට්ඨෙ අදිට්ඨවාදී හොති. සුතෙ අසුතවාදී හොති. මුතෙ අමුතවාදී හොති. විඤ්ඤාතෙ අවිඤ්ඤාතවාදී හොති. [ඉමෙහි -පෙ- බහුඤ්ච අපුඤ්ඤං පසවති]

[චතූහි භික්ඛවෙ ධම්මෙහි සමන්නාගතො -පෙ- සප්පුරිසො -පෙ-]

දිට්ඨෙ දිට්ඨවාදී හොති. සුතෙ සුතවාදී හොති. මුතෙ මුතවාදී හොති. විඤ්ඤාතෙ විඤ්ඤාතවාදී හොති. [ඉමෙහි -පෙ- බහුඤ්ච පුඤ්ඤං පසවතීති ]

4. 5. 3. 6.

[ පස්වන බාල - පණ්ඩිත සූත්‍රය ]

26 [මහණෙනි, සතර කරුණෙකින් සමන්‍වාගත ... අසත්පුරුෂ තෙමේ ... ]

මිථ්‍යා ආජීව ඇතියේ වෙයි. මිථ්‍යා ව්‍යායාම ඇතියේ වෙයි. මිථ්‍යාසමෘති ඇතියේ වෙයි. මිථ්‍යාසමාධි ඇතියේ වෙයි [මේ සතර කරුණින් ... බොහෝ අකුසල් ද රැස් කෙරෙයි.]

[මහණෙනි, සතර කරුණෙකින් සමන්‍වාගත ... සත්පුරුෂ තෙමේ ... ]

සම්‍යග් ආජීව ඇතියේ වෙයි සම්‍යග් ව්‍යායාම ඇතියේ වෙයි සම්‍යක් සමෘති ඇතියේ වෙයි. සම්‍යක් සමාධි ඇතියේ වෙයි. [මේ සතර කරුණින් ... බොහෝ කුසල් ද රැස් කෙරෙයි ]

4. 5. 3. 7.

[ සවන බාල - පණ්ඩිත සූත්‍රය ]

27. [මහණෙනි, සතර කරුණෙකින් සමන්‍වාගත .... අසත්පුරුෂ තෙමේ .... ]

අදෘෂ්ට ආලම්බනයෙහි දෘෂ්ටවාදී වෙයි. අශ්‍රැත ආලම්බනයෙහි ශ්‍රැතවාදී වෙයි. අමුත ආලම්බනයෙහි මුතවාදී වෙයි. අවිඥාත ආලම්බනයෙහි විඥාතවාදී වෙයි. [මේ සතර කරුණින් ... බොහෝ අකුසල් ද රැස් කෙරෙයි.]

[මහණෙනි, මේ සතර කරුණෙකින් සමන්‍වාගත ... සත්පුරුෂ තෙමේ ...]

දෘෂ්ට ආලම්බනයෙහි අදෘෂ්ටවාදී වෙයි. අශ්‍රැත ආලම්බනයෙහි අශ්‍රැතවාදී වෙයි. අමුත ආලම්බනයෙහි අමුතවාදී වෙයි. අවිඥාත ආලම්බනයෙහි අවිඥාතවාදී වෙයි. [මේ සතර කරුණින් .. බොහෝ කුසල් ද රැස් කෙරෙයි.]

4. 5. 3. 8.

[ සත්වන බාල-පණ්ඩිත සූත්‍රය ]

28. [මහණෙනි, සතර කරුණෙකින් සමන්‍වාගත .. අසත්පුරුෂ තෙමේ ... ]

දෘෂ්ටාලම්බනයෙහි අදෘෂ්ටවාදී වෙයි. ශ්‍රැතාලම්බනයෙහි අශ්‍රැතවාදී වෙයි. මුතාලම්බනයෙහි අමුතවාදී වෙයි. විඥාතාලම්බනයෙහි අවිඥාතවාදී වෙයි [මේ සතර කරුණෙන් ... බොහෝ අකුසල් ද රැස් කෙරෙයි.]

[මහණෙනි, සතර කරුණෙකින් සමන්‍වාගත ... සත්පුරුෂ තෙමේ ... ]

දෘෂ්ටාලම්බනයෙහි දෘෂ්ටවාදී වෙයි. ශ්‍රැතාලම්බනයෙහි ශ්‍රැතවාදී වෙයි. මුතාලම්බනයෙහි මුතවාදී වෙයි. විඥාතාලම්බනයෙහි විඥාතවාදී වෙයි. [මේ සතර කරුණෙන් ... බොහෝ කුසල් ද රැස් කෙරෙයි.]

## 4. 5. 3. 9

### [අට්ඨම බාල - පණ්ඩිත සුත්තං]

29. [චතූහි භික්ඛවෙ ධම්මෙහි සමන්නාගතො -පෙ- අසප්පුරිසො -පෙ-]

අස්සද්ධො හොති. දුස්සීලො හොති. අහිරිකො හොති. අනොත්තප්පී හොති. [ඉමෙහි -පෙ- බහුඤ්ච අපුඤ්ඤං පසවති.]

[චතූහි භික්ඛවෙ ධම්මෙහි සමන්නාගතො -පෙ- සප්පුරිසො -පෙ-]

සද්ධො හොති. සීලවා හොති. හිරිමා හොති. ඔත්තප්පී හොති. [ඉමෙහි -පෙ- බහුඤ්ච පුඤ්ඤං පසවතීති.]

## 4. 5. 3. 10

### [නවම බාල - පණ්ඩිත සුත්තං]

30. [චතූහි භික්ඛවෙ ධම්මෙහි සමන්නාගතො -පෙ- අසප්පුරිසො -පෙ-]

අස්සද්ධො හොති. දුස්සීලො හොති. කුසීතො හොති. දුප්පඤ්ඤො හොති. [ඉමෙහි -පෙ- බහුඤ්ච අපුඤ්ඤං පසවති.]

[චතූහි භික්ඛවෙ ධම්මෙහි සමන්නාගතො -පෙ- සප්පුරිසො -පෙ-]

සද්ධො හොති, සීලවා හොති, ආරද්ධවිරියො හොති, පඤ්ඤවා හොති. ඉමෙහි ඛො භික්ඛවෙ චතූහි ධම්මෙහි සමන්නාගතො පණ්ඩිතො බ්‍යත්තො සප්පුරිසො අක්ඛතං අනුපහතං අත්තානං පරිහරති. අනවජ්ජො ච හොති. අනනුවජ්ජො විඤ්ඤූනං. බහුඤ්ච පුඤ්ඤං පසවතීති.

## 4. 5. 3. 11

### [කවිසුත්තං]

31. චත්තාරොමෙ භික්ඛවෙ කවී. කතමෙ චත්තාරො?

චින්තාකවි, සුතකවි, අත්ථකවි, පටිභානකවි. ඉමෙ ඛො භික්ඛවෙ චත්තාරො කවීති.

**සුචරිතවග්ගො තතියො.***

---

* **තස්සුද්දානං:**

දුච්චරිතං දිට්ඨි අකතඤ්ඤු ච පාණාතිපාතාපි ද්වෙ මග්ගා,
ද්වෙ වොහාරපථා වුත්තා අහිරිකං දුප්පඤ්ඤකවිනා චාති - මජ්ඣ

## 4. 5. 3. 9.

## [ අටවැනි බාල-පණ්ඩිත සූත්‍රය ]

29. [මහණෙනි, සතර කරුණෙකින් සමන්වාගත ... අසත්පුරුෂ තෙමේ ... ]

ශ්‍රද්ධා නැත්තේ වෙයි. දුශ්ශීල වෙයි. පවට ලජ්ජා නැතියේ වෙයි. පවට බිය නැතියේ වෙයි [මේ සතර කරුණෙන් .... බොහෝ අකුසල් ද රැස් කෙරෙයි.]

[මහණෙනි, සතර කරුණෙකින් සමන්වාගත .... සත්පුරුෂ තෙමේ ...]

ශ්‍රද්ධා ඇතියේ වෙයි, ශීල ඇතියේ වෙයි. පවට ලජ්ජා ඇතියේ වෙයි. පවට බිය ඇතියේ වෙයි .... [මේ සතර කරුණෙන් .... බොහෝ කුසල් ද රැස් කෙරෙයි.]

## 4. 5. 3 10.

## [ නවවැනි බාල - පණ්ඩිත සූත්‍රය ]

30. [මහණෙනි, සතර කරුණෙකින් සමන්වාගත ... අසත්පුරුෂ තෙමේ ... ]

ශ්‍රද්ධා නැතියේ වෙයි. දුශ්ශීල වෙයි. කුසීත වෙයි. දුෂ්ප්‍රාඥ වෙයි. [මේ සතර කරුණෙන් ... බොහෝ අකුසල් ද රැස් කෙරෙයි.]

[මහණෙනි, සතර කරුණෙකින් සමන්වාගත .... සත්පුරුෂ තෙමේ .... ]

ශ්‍රද්ධා ඇතියේ වෙයි. සිල්වත් වෙයි. රුකුළු වැර ඇතියේ වෙයි. ප්‍රඥවත් වෙයි. මහණෙනි, මේ සතර කරුණින් සමන්වාගත වූ පණ්ඩිත වූ ව්‍යක්ත වූ සත්පුරුෂ තෙමේ ගුණ විසින් සාරා නො ලන ලද, ගුණ විසින් නො නට ආත්මයක් පරිහරණය කෙරෙයි. අනවද්‍ය ද වෙයි නුවණැත්තන් විසින් උපවාද නො කටයුතුත් වෙයි. බොහෝ කුසල් ද රැස් කෙරෙයි.

## 4. 5. 3. 11.

## [කවි සූත්‍රය]

31. මහණෙනි, මේ කවීහු සතර දෙනෙකි. කවර සතර දෙනෙක යත්:

චින්තාකවිය, ශ්‍රැතකවිය, අර්ථකවිය, ප්‍රතිභානකවි යි. මහණෙනි, මේ සතර කවීහු වෙති.

**සුචරිතවර්ගය නවවැනි යි.**

# 4. කම්මවග්ගො

## 4. 5. 4. 1.

## [පඨම කම්මසුත්තං]

[සාවත්ථිනිදානං]

32. චත්තාරිමානි භික්ඛවෙ කම්මානි මයා සයං අභිඤ්ඤා සච්ඡිකත්වා පවෙදිතානි. කතමානි චත්තාරි?

අත්ථි භික්ඛවෙ කම්මං කණ්හං කණ්හවිපාකං. අත්ථි භික්ඛවෙ කම්මං සුක්කං සුක්කවිපාකං. අත්ථි භික්ඛවෙ කම්මං කණ්හසුක්කං කණ්හසුක්කවිපාකං. අත්ථි භික්ඛවෙ කම්මං අකණ්හං අසුක්කං අකණ්හඅසුක්කවිපාකං කම්මක්ඛයාය සංවත්තති.

ඉමානි ඛො භික්ඛවෙ චත්තාරි කම්මානි මයා සයං අභිඤ්ඤා සච්ඡිකත්වා පවෙදිතානීති.

## 4. 5. 4. 2.

## [දුතියකම්මසුත්තං]

33. චත්තාරිමානි භික්ඛවෙ කම්මානි මයා සයං අභිඤ්ඤා සච්ඡිකත්වා පවෙදිතානි. කතමානි චත්තාරි?

අත්ථි භික්ඛවෙ කම්මං කණ්හං කණ්හවිපාකං. අත්ථි භික්ඛවෙ කම්මං සුක්කං සුක්කවිපාකං. අත්ථි භික්ඛවෙ කම්මං කණ්හසුක්කං කණ්හසුක්කවිපාකං. අත්ථි භික්ඛවෙ කම්මං අකණ්හං අසුක්කං අකණ්හඅසුක්කවිපාකං කම්මක්ඛයාය සංවත්තති.

කතමඤ්ච භික්ඛවෙ කම්මං කණ්හං කණ්හවිපාකං? ඉධ භික්ඛවෙ එකච්චො සබ්‍යාපජ්ඣං කායසඞ්ඛාරං අභිසඞ්ඛරොති, සබ්‍යාපජ්ඣං වචීසඞ්ඛාරං අභිසඞ්ඛරොති, සබ්‍යාපජ්ඣං මනොසඞ්ඛාරං අභිසඞ්ඛරොති. සො සබ්‍යාපජ්ඣං කායසඞ්ඛාරං අභිසඞ්ඛරිත්වා සබ්‍යාපජ්ඣං වචීසඞ්ඛාරං අභිසඞ්ඛරිත්වා සබ්‍යාපජ්ඣං මනොසඞ්ඛාරං අභිසඞ්ඛරිත්වා සබ්‍යාපජ්ඣං ලොකං උපපජ්ජති. තමෙනං සබ්‍යාපජ්ඣං ලොකං උපපන්නං සමානං සබ්‍යාපජ්ඣා ඵස්සා ඵුසන්ති. සො සබ්‍යාපජ්ඣෙහි ඵස්සෙහි ඵුට්ඨො සමානො සබ්‍යාපජ්ඣං වෙදනං වෙදියති එකන්තදුක්ඛං. සෙය්‍යථාපි සත්තා නෙරයිකා. ඉදං වුච්චති භික්ඛවෙ කම්මං කණ්හං කණ්හවිපාකං.

කතමඤ්ච භික්ඛවෙ කම්මං සුක්කං සුක්කවිපාකං? ඉධ භික්ඛවෙ එකච්චො අබ්‍යාපජ්ඣං කායසඞ්ඛාරං අභිසඞ්ඛරොති, අබ්‍යාපජ්ඣං වචීසඞ්ඛාරං අභිසඞ්ඛරොති, අබ්‍යාපජ්ඣං මනොසඞ්ඛාරං අභිසඞ්ඛරොති. සො අබ්‍යාපජ්ඣං කායසඞ්ඛාරං අභිසඞ්ඛරිත්වා අබ්‍යාපජ්ඣං වචීසඞ්ඛාරං අභිසඞ්ඛරිත්වා අබ්‍යාපජ්ඣං මනොසඞ්ඛාරං අභිසඞ්ඛරිත්වා අබ්‍යාපජ්ඣං ලොකං උපපජ්ජති. තමෙනං අබ්‍යාපජ්ඣං ලොකං උපපන්නං සමානං අබ්‍යාපජ්ඣා ඵස්සා ඵුසන්ති. සො අබ්‍යාපජ්ඣෙහි ඵස්සෙහි ඵුට්ඨො සමානො අබ්‍යාපජ්ඣං වෙදනං වෙදියති එකන්තසුඛං. සෙය්‍යථාපි දෙවා සුභකිණ්හා. ඉදං වුච්චති භික්ඛවෙ කම්මං සුක්කං සුක්කවිපාකං.

# 4. කර්ම වර්ගය

## 4. 5. 4. 1.

## [ ප්‍රථම කර්ම සූත්‍රය ]

**[සැවැත් නිදානයි]**

32. මහණෙනි, මේ සතර කර්මයෝ මා විසින් තමන් ම විශිෂ්ටඥානයෙන් දැන ප්‍රත්‍යක්ෂ කොට ප්‍රකාශ කරණ ලද්දාහු ය. කවර සතර කර්මයක යත්:

මහණෙනි, කෘෂ්ණවිපාක ඇති කෘෂ්ණ (අකුශල) කර්මයෙක් ඇත. මහණෙනි, ශුක්ල විපාක ඇති ශුක්ල (කුශල) කර්මයෙක් ඇත. මහණෙනි, කෘෂ්ණ වූ ද ශුක්ල වූ ද විපාක ඇති (මිශ්‍රක වන) කෘෂ්ණ-ශුක්ලකර්මයෙක් ඇත. මහණෙනි, කෘෂ්ණ ද නො වූ ශුක්ල ද නොවූ විපාක ඇති කර්මක්ෂය පිණිස පවත්නා අකෘෂ්ණ-අශුක්ල (චතුර්මාර්ගඥාන) කර්මයෙක් ඇත.

මහණෙනි, මේ සතර කර්මයෝ මා විසින් තමන් ම විශිෂ්ටඥානයෙන් දැන ප්‍රත්‍යක්ෂ කොට ප්‍රකාශ කරණ ලදහ.

## 4. 5. 4. 2.

## [ දෙවන කර්ම සූත්‍රය ]

33. මහණෙනි, මේ කර්මයෝ සතර කොතෙක් මා විසින් තමන් ම විශිෂ්ට-ඥානයෙන් දැන ප්‍රත්‍යක්ෂ කොට පවසන ලද්දාහු ය. කවර සතර කර්මයක යත්:

මහණෙනි, අනිෂ්ටවිපාක ඇති අකුශලකර්මයෙක් ඇත. මහණෙනි, ඉෂ්ටවිපාක ඇති කුශලකර්මයෙක් ඇත. මහණෙනි, අනිෂ්ට වූ ද ඉෂ්ට වූ ද විපාක ඇති කෘෂ්ණ – ශුක්ලකර්මයෙක් ඇත. මහණෙනි, අකෘෂ්ණ – අශුක්ල විපාක ඇති කර්මක්ෂය පිණිස පවත්නා අකෘෂ්ණ – අශුක්ලකර්මයෙක් ඇත.

මහණෙනි, අනිෂ්ට විපාක ඇති අකුශලකර්මය කවරේ ය? මහණෙනි, මෙලොවහි ඇතැමෙක් සද්වේෂ් වූ (කායද්වාරිකචේතනා සඞ්ඛ්‍යාත) කායසංස්කාරය රැස් කෙරෙයි. සද්වේෂ් (වාග්ද්වාරිකචේතනා සඞ්ඛ්‍යාත) වාක්සංස්කාරය රැස් කෙරෙයි. සද්වේෂ් වූ (මනොද්වාරිකචේතනා සඞ්ඛ්‍යාත) මනඃසංස්කාරය රැස් කෙරෙයි. හේ ද්වේෂ් සහිත කායසංස්කාරය රැස් කොට ද්වේෂ් සහිත වාක්සංස්කාරය රැස් කොට ද්වේෂ් සහිත මනඃ-සංස්කාරය රැස් කොට දුක් සහිත ලෝකයට උත්පත්ති වශයෙන් පැමිණෙයි. දුක් සහිත ලොවහි උපන් ඔහු දුක් සහිත විපාකස්පර්ශයෝ පහස්නාහ. දුක් සහිත ස්පර්ශයන් විසින් පහස්නා ලද හේ ඒකාන්තයෙන් දුක් වූ ආබාධ සහිත විපාකවේදනාව විඳියි. තිරිසනුන් සෙයිනි. මහණෙනි, මේ අනිෂ්ටවිපාක ඇති අකුශලකර්මය යි කියනු ලැබේ.

මහණෙනි, ඉෂ්ටවිපාක ඇති කුශලකර්මය කවරේ ය? මහණෙනි, මෙලොව ඇතැමෙක් නිද්වේෂ් වූ කායසංස්කාරය රැස් කෙරෙයි. නිද්වේෂ් වූ වාක්සංස්කාරය රැස් කෙරෙයි නිද්වේෂ් වූ මනඃසංස්කාරය රැස් කෙරෙයි. හේ නිද්වේෂ් වූ කායසංස්කාරය රැස් කොට නිද්වේෂ් වූ වාක්සංස්කාරය රැස් කොට නිද්වේෂ් වූ මනඃසංස්කාරය රැස් කොට නිදුක් ලොවට එළඹෙයි. නිදුක් ලොවට එළඹි ඔහු දුක් රහිත විපාක ස්පර්ශයෝ පහස්නාහ. නිදුක් ස්පර්ශයන් විසින් පහස්නා ලද හේ ඒකාන්තසුඛ වූ නිරාබාධවේදනා විඳී. සුභකිණ්හ දෙවියන් සෙයිනි. මහණෙනි, මේ ඉෂ්ටවිපාක ඇති කුශලකර්මය යි කියනු ලැබේ.

කතමඤ්ච භික්ඛවෙ කම්මං කණ්හසුක්කං කණ්හසුක්කවිපාකං? ඉධ භික්ඛවෙ එකච්චො සබ්‍යාපජ්ඣම්පි අබ්‍යාපජ්ඣම්පි කායසඞ්ඛාරං අභිසඞ්ඛරොති, සබ්‍යාපජ්ඣම්පි අබ්‍යාපජ්ඣම්පි වචීසඞ්ඛාරං අභිසඞ්ඛරොති, සබ්‍යාපජ්ඣම්පි අබ්‍යාපජ්ඣම්පි මනොසඞ්ඛාරං අභිසඞ්ඛරොති. සො සබ්‍යාපජ්ඣම්පි අබ්‍යාපජ්ඣම්පි කායසඞ්ඛාරං අභිසඞ්ඛරිත්වා සබ්‍යාපජ්ඣම්පි අබ්‍යාපජ්ඣම්පි වචීසඞ්ඛාරං අභිසඞ්ඛරිත්වා සබ්‍යාපජ්ඣම්පි අබ්‍යාපජ්ඣම්පි මනොසඞ්ඛාරං අභිසඞ්ඛරිත්වා සබ්‍යාපජ්ඣම්පි අබ්‍යාපජ්ඣම්පි ලොකං උපපජ්ජති. තමෙනං සබ්‍යාපජ්ඣම්පි අබ්‍යාපජ්ඣම්පි ලොකං උපපන්නං සමානං සබ්‍යාපජ්ඣාපි අබ්‍යාපජ්ඣාපි ඵස්සා ඵුසන්ති. සො සබ්‍යාපජ්ඣෙහිපි අබ්‍යාපජ්ඣෙහිපි ඵස්සෙහි ඵුට්ඨො සමානො සබ්‍යාපජ්ඣම්පි අබ්‍යාපජ්ඣම්පි වෙදනං වෙදියති වොකිණ්ණසුඛදුක්ඛං. සෙය්‍යථාපි මනුස්සා එකච්චෙ ච දෙවා එකච්චෙ ච විනිපාතිකා. ඉදං වුච්චති භික්ඛවෙ කම්මං කණ්හසුක්කං කණ්හසුක්කවිපාකං.

කතමඤ්ච භික්ඛවෙ කම්මං අකණ්හං අසුක්කං අකණ්හඅසුක්කවිපාකං කම්මක්ඛයාය සංවත්තති? තත්‍ර භික්ඛවෙ යමිදං කම්මං කණ්හං කණ්හවිපාකං තස්ස පහාණාය යා චෙතනා, යම්පිදං කම්මං සුක්කං සුක්කවිපාකං තස්ස පහාණාය යා චෙතනා, යම්පිදං කම්මං කණ්හසුක්කං කණ්හසුක්කවිපාකං තස්ස පහාණාය යා චෙතනා, ඉදං වුච්චති භික්ඛවෙ කම්මං අකණ්හං අසුක්කං අකණ්හ අසුක්කවිපාකං කම්මක්ඛයාය සංවත්තති.

ඉමානි ඛො භික්ඛවෙ චත්තාරි කම්මානි මයා සයං අභිඤ්ඤා සච්ඡිකත්වා පවෙදිතානීති.

## 4. 5. 4. 3.

## [භතිය කම්ම සුත්තං]

34. අථ ඛො **සිඛාමොග්ගල්ලානො** බ්‍රාහ්මණො යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවතා සද්ධිං සම්මොදි, සම්මොදනීයං කථං සාරාණීයං වීතිසාරෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නො ඛො සිඛාමොග්ගල්ලානො බ්‍රාහ්මණො භගවන්තං එතදවොච:

පුරිමානි භො ගොතම දිවසානි පුරිමතරානි **සොණකායනො** මාණවො යෙනාහං තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා මං එතදවොච:

සමණො ගොතමො සබ්බකම්මානං අකිරියං පඤ්ඤපෙති. සබ්බකම්මානං ඛො පන අකිරියං පඤ්ඤපෙන්තො උච්ඡෙදං ආහ ලොකස්ස. කම්මසච්චායං භො ලොකො, කම්මසමාරම්භට්ඨායීති.

[භගවා:]

දස්සනම්පි ඛො අහං බ්‍රාහ්මණ සොණකායනස්ස මාණවස්ස නාභිජානාමි. කුතො පනෙවරූපො කථාසල්ලාපො?

මහණෙනි, ඉෂ්ටානිෂ්ටවිපාක ඇති කෘෂ්ණශුක්ලකර්ම කවරේ ය? මහණෙනි, මෙලොව ඇතැමෙක් සදොස් වූත් නිදොස් වූත් කායසංස්කාර රැස් කෙරෙයි. සදොස් වූත් නිදොස් වූත් වාක්සංස්කාර රැස් කෙරෙයි. සදොස් වූත් නිදොස් වූත් මනඃසංස්කාර රැස් කෙරෙයි. හේ සදොස් වූත් නිදොස් වූත් කායසංස්කාර රැස් කොට සදොස් වූත් නිදොස් වූත් වාක්සංස්කාර රැස් කොට සදොස් වූත් නිදොස් වූත් මනඃසංස්කාර රැස් කොට සදුක් වූ ද නිදුක් වූ ද ලෝකයට එළඹෙයි. සදුක් වූ ද නිදුක් වූ ද ලොවට එළඹි ඔහු දුක් සහිත වූ ද දුක් රහිත වූ ද විපාකස්පර්ශයෝ පහස්නාහ. සදුක් වූ ද නිදුක් වූ ද ස්පර්ශයන් විසින් පහස්නා ලද හේ ව්‍යතිමිශ්‍රසුඛදුඃඛ ඇති සදුක් වූත් නිදුක් වූත් විපාකවේදනා විඳියි. මිනිසුන් සෙයිනි. ඇතැම් දෙවියන් හා ඇතැම් විනිපාතිකයන් ද සෙයිනි. මහණෙනි, මේ ඉටු අනිටු විපාක ඇති කෘෂ්ණශුක්ලකර්මය යි කියනු ලැබේ.

මහණෙනි, කර්මක්ෂය පිණිස පවත්නා කෘෂ්ණවිපාකත් නො වූ ශුක්ල-විපාකත් නො වූ අකෘෂ්ණඅශුක්ලකර්මය කවරේ ය? මහණෙනි, එහි ලා යම් කර්මයෙක් කෘෂ්ණ වේ ද කෘෂ්ණවිපාක වේ ද, ඒ කර්මයාගේ ප්‍රහාණය පිණිස යම් චේතනාවෙක් ඇද්ද, යම් කර්මයෙක් ශුක්ල වේ ද ශුක්ලවිපාක වේ ද, ඒ කර්මයාගේ ප්‍රහාණය පිණිස යම් චේතනාවෙක් ඇද්ද, යම් කර්මයෙක් කෘෂ්ණශුක්ල වේ ද කෘෂ්ණශුක්ලවිපාකත් වේ ද, ඒ කර්මයාගේ ප්‍රහාණය පිණිස යම් චේතනාවෙක් ඇද්ද, මහණෙනි, මේ කර්මක්ෂය පිණිස පවත්නා අකෘෂ්ණඅශුක්ල වූ අකෘෂ්ණඅශුක්ලවිපාකත් වූ කර්මය යි කියනු ලැබේ.

මහණෙනි, මේ සතර කර්මයෝ මා විසින් තමන් ම විශිෂ්ටඥානයෙන් දැන ප්‍රත්‍යක්ෂ කොට පවසන ලදහ.

## 4. 5. 4. 3.

## [ තෙවන කම් සූත්‍රය ]

34. එකල්හි සිඛාමොග්ගල්ලාන බමුණු භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹියේ ය. එළඹ භාග්‍යවතුන් වහන්සේ සමග සතුටු වී. සතුටට කරුණු වූ සිහි කරුණුවට නිසි කථා කොට නිමවා එකත්පසෙක හිඳ. එකත්පස් ව හුන් සිළුමුගලන් බමුණු භාග්‍යවතුන් වහන්සේට තෙල සැළ කෙළේ ය:

භවත් ගෞතමයන් වහන්ස, පුරිම වූත් පුරිමතර වූත් දිනයෙහි සොණකායන නම් මාණවක මා කරා එළඹියේ ය. එළඹ මට තෙල කී ය:

මහණ ගොයුම් සියලු කර්මයන්ගේ අක්‍රියාව පණවයි. සියලු කර්මයන්ගේ අක්‍රියාව පණවන්නේ ලොවට උච්ඡේදයක් කියයි. භවත්නි, මේ ලෝකය කර්මය සැහැවි කොට ඇත. කර්මසමාරම්භයෙන් (කම් රැස් කිරීමෙන්) සිටුනාසුලු ය. (කම් නොකරණුයේ උච්ඡේදයට යෙයි යුතේය.)

[භාග්‍යවත්හු:]

බමුණ, මම සොණකායන නම් මාණවකයාගේ දැක්මක් ද නො දනිමි. මෙබඳු කථා සල්ලාපයෙක් කොහි වී ද?

චත්තාරිමානි බ්‍රාහ්මණ කම්මානි මයා සයං අභිඤ්ඤා සච්ඡිකත්වා පවෙදිතානි. කතමානි චත්තාරි?

අත්ථි බ්‍රාහ්මණ කම්මං කණ්හං කණ්හවිපාකං. අත්ථි බ්‍රාහ්මණ කම්මං සුක්කං සුක්කවිපාකං. අත්ථි බ්‍රාහ්මණ කම්මං කණ්හසුක්කං කණ්හසුක්කවිපාකං. අත්ථි බ්‍රාහ්මණ කම්මං අකණ්හං අසුක්කං අකණ්හඅසුක්කවිපාකං කම්මක්ඛයාය සංවත්තති.

කතමඤ්ච බ්‍රාහ්මණ කම්මං කණ්හං කණ්හවිපාකං? ඉධ බ්‍රාහ්මණ එකච්චො සබ්‍යාපජ්ඣං කායසඞ්ඛාරං අභිසඞ්ඛරොති, සබ්‍යාපජ්ඣං වචීසඞ්ඛාරං අභිසඞ්ඛරොති, සබ්‍යාපජ්ඣං මනොසඞ්ඛාරං අභිසඞ්ඛරොති. සො සබ්‍යාපජ්ඣං කායසඞ්ඛාරං අභිසඞ්ඛරිත්වා සබ්‍යාපජ්ඣං වචීසඞ්ඛාරං අභිසඞ්ඛරිත්වා සබ්‍යාපජ්ඣං මනොසඞ්ඛාරං අභිසඞ්ඛරිත්වා සබ්‍යාපජ්ඣං ලොකං උපපජ්ජති. තමෙනං සබ්‍යාපජ්ඣං ලොකං උපපන්නං සමානං සබ්‍යාපජ්ඣා ඵස්සා ඵුසන්ති. සො සබ්‍යාපජ්ඣෙහි ඵස්සෙහි ඵුට්ඨො සමානො සබ්‍යාපජ්ඣං වෙදනං වෙදියති එකන්තදුක්ඛං. සෙය්‍යථාපි සත්තා නෙරයිකා. ඉදං වුච්චති බ්‍රාහ්මණ කම්මං කණ්හං කණ්හවිපාකං.

කතමඤ්ච බ්‍රාහ්මණ කම්මං සුක්කං සුක්කවිපාකං? ඉධ බ්‍රාහ්මණ එකච්චො අබ්‍යාපජ්ඣං කායසඞ්ඛාරං අභිසඞ්ඛරොති, අබ්‍යාපජ්ඣං වචීසඞ්ඛාරං අභිසඞ්ඛරොති, අබ්‍යාපජ්ඣං මනොසඞ්ඛාරං අභිසඞ්ඛරොති. සො අබ්‍යාපජ්ඣං කායසඞ්ඛාරං අභිසඞ්ඛරිත්වා අබ්‍යාපජ්ඣං වචීසඞ්ඛාරං අභිසඞ්ඛරිත්වා අබ්‍යාපජ්ඣං මනොසඞ්ඛාරං අභිසඞ්ඛරිත්වා අබ්‍යාපජ්ඣං ලොකං උපපජ්ජති. තමෙනං අබ්‍යාපජ්ඣං ලොකං උපපන්නං සමානං අබ්‍යාපජ්ඣා ඵස්සා ඵුසන්ති. සො අබ්‍යාපජ්ඣෙහි ඵස්සෙහි ඵුට්ඨො සමානො අබ්‍යාපජ්ඣං වෙදනං වෙදියති එකන්තසුඛං. සෙය්‍යථාපි දෙවා සුභකිණ්හා. ඉදං වුච්චති බ්‍රාහ්මණ කම්මං සුක්කං සුක්කවිපාකං.

කතමඤ්ච බ්‍රාහ්මණ කම්මං කණ්හසුක්කං කණ්හසුක්කවිපාකං? ඉධ බ්‍රාහ්මණ එකච්චො සබ්‍යාපජ්ඣම්පි අබ්‍යාපජ්ඣම්පි කායසඞ්ඛාරං අභිසඞ්ඛරොති, සබ්‍යාපජ්ඣම්පි අබ්‍යාපජ්ඣම්පි වචීසඞ්ඛාරං අභිසඞ්ඛරොති, සබ්‍යාපජ්ඣම්පි අබ්‍යාපජ්ඣම්පි මනොසඞ්ඛාරං අභිසඞ්ඛරොති. සො සබ්‍යාපජ්ඣම්පි අබ්‍යාපජ්ඣම්පි කායසඞ්ඛාරං අභිසඞ්ඛරිත්වා සබ්‍යාපජ්ඣම්පි අබ්‍යාපජ්ඣම්පි වචීසඞ්ඛාරං අභිසඞ්ඛරිත්වා සබ්‍යාපජ්ඣම්පි අබ්‍යාපජ්ඣම්පි මනොසඞ්ඛාරං අභිසඞ්ඛරිත්වා සබ්‍යාපජ්ඣම්පි අබ්‍යාපජ්ඣම්පි ලොකං උපපජ්ජති. තමෙනං සබ්‍යාපජ්ඣම්පි අබ්‍යාපජ්ඣම්පි ලොකං උපපන්නං සමානං සබ්‍යාපජ්ඣාපි අබ්‍යාපජ්ඣාපි ඵස්සා ඵුසන්ති. සො සබ්‍යාපජ්ඣෙහිපි අබ්‍යාපජ්ඣෙහිපි ඵස්සෙහි ඵුට්ඨො සමානො සබ්‍යාපජ්ඣම්පි අබ්‍යාපජ්ඣම්පි වෙදනං වෙදියති වොකිණ්ණසුඛදුක්ඛං. සෙය්‍යථාපි මනුස්සා එකච්චෙ ච දෙවා එකච්චෙ ච විනිපාතිකා. ඉදං වුච්චති බ්‍රාහ්මණ කම්මං කණ්හසුක්කං කණ්හසුක්කවිපාකං.

කතමඤ්ච බ්‍රාහ්මණ කම්මං අකණ්හං අසුක්කං අකණ්හාසුක්කවිපාකං කම්මක්ඛයාය සංවත්තති? තත්‍ර බ්‍රාහ්මණ යමිදං කම්මං කණ්හං කණ්හවිපාකං තස්ස පහාණාය යා චෙතනා, යම්පිදං කම්මං සුක්කං සුක්කවිපාකං තස්ස පහාණාය යා චෙතනා, යම්පිදං කම්මං කණ්හසුක්කං කණ්හසුක්කවිපාකං තස්ස පහාණාය යා චෙතනා: ඉදං වුච්චති බ්‍රාහ්මණ කම්මං අකණ්හං අසුක්කං අකණ්හාසුක්කවිපාකං කම්මක්ඛයාය සංවත්තති.

ඉමානි ඛො බ්‍රාහ්මණ චත්තාරි කම්මානි මයා සයං අභිඤ්ඤා සච්ඡිකත්වා පවෙදිතානීති.

බමුණ, මේ සතර කර්ම කෙනෙක් මා විසින් තමන් ම විශිෂ්ටඥානයෙන් දැන ප්‍රත්‍යක්‍ෂ කොට ප්‍රකාශ කරණ ලදහ. කවර සතර කර්මයහ යත්:

බමුණ, කෘෂ්ණවිපාක ඇති කෘෂ්ණකර්මයෙක් ඇත. බමුණ, ශුක්ලවිපාක ඇති ශුක්ලකර්මයෙක් ඇත. බමුණ, කෘෂ්ණශුක්ලවිපාක ඇති කෘෂ්ණශුක්ල කර්මයෙක් ඇත. කර්මක්‍ෂය පිණිස පවත්නා අකෘෂ්ණ අශුක්ල විපාක ඇති අකෘෂ්ණ අශුක්ල කර්මයෙක් ඇති.

බමුණ, කෘෂ්ණවිපාක ඇති කෘෂ්ණකර්මය කවරේ ද? බමුණ, මෙලොව ඇතැමෙක් සදොස් වූ කායසංස්කාර රැස් කෙරෙයි. සදොස් වූ වාක්සංස්කාර රැස් කෙරෙයි. සදොස් වූ මනස්සංස්කාර රැස් කෙරෙයි. හේ සදොස් කායසංස්කාර රැස් කොට සදොස් වාක්සංස්කාර රැස් කොට සදොස් මනස්-සංස්කාර රැස් කොට සදුක් වූ ලොවට එළඹෙයි. සදුක් ලොවට එළඹියහු සදුක් විපාකස්පර්ශයෝ පහස්නාහ. හේ සදුක් ස්පර්ශයන් විසින් පහස්නා ලද්දේ ම ඒකාන්ත දුඃඛ වූ සදුක් වේදනා විඳී. නිරිසතුන් සෙයිනි. බමුණ, මේ කෘෂ්ණවිපාක ඇති කෘෂ්ණකර්ම යි කියනු ලැබේ.

බමුණ, ශුක්ලවිපාක ඇති ශුක්ලකර්මය කවරේ ද? බමුණ, මෙලොව ඇතැමෙක් නිදොස් කායසංස්කාර රැස් කෙරෙයි. නිදොස් වාක්සංස්කාර රැස් කෙරෙයි. නිදොස් මනස්සංස්කාර රැස් කෙරෙයි. හේ නිදොස් කායසංස්කාර රැස් කොට නිදොස් වාක්සංස්කාර රැස් කොට නිදොස් මනස්සංස්කාර රැස් කොට නිදුක් ලෝකයට එළඹෙයි. නිදුක් ලෝකයට එළඹියහු නිදුක් ස්පර්ශයෝ පහස්නාහ. හේ නිදුක් ස්පර්ශයන් විසින් පහස්නා ලද්දේ ඒකාන්ත සුඛ වූ නිදුක් වේදනා විඳී. සුභකිණ්හ දෙවියන් සෙයිනි. බමුණ, මේ ශුක්ලවිපාක ඇති ශුක්ලකර්ම යි කියනු ලැබේ

බමුණ, කෘෂ්ණ-ශුක්ලවිපාක ඇති කෘෂ්ණ-ශුක්ලකර්මය කවරේ ද? බමුණ, මෙලොව ඇතැමෙක් සදොස් වූ ද නිදොස් වූ ද කායසංස්කාර රැස් කෙරෙයි. සදොස් වූ ද නිදොස් වූ ද වාක්සංස්කාර රැස් කෙරෙයි. සදොස් වූ ද නිදොස් වූ ද මනස්සංස්කාර රැස් කෙරෙයි. හේ සදොස් වූ ද නිදොස් වූ ද කායසංස්කාරය රැස් කොට සදොස් වූ ද නිදොස් වූ ද වාක්සංස්කාරය රැස් කොට සදොස් වූ ද නිදොස් වූ ද මනස්සංස්කාරය රැස් කොට සදුක් වූ ද නිදුක් වූ ද ලෝකයට එළඹෙයි. සදුක් වූ ද නිදුක් වූ ද ලොවට එළඹියහු සදුක් වූ ද නිදුක් වූ ද විපාකස්පර්ශයෝ පහස්නාහ. හේ සදුක් වූ ද නිදුක් වූ ද ස්පර්ශයන් විසින් පහස්නා ලද්දේ ව්‍යවකීර්ණ සුඛදුඃඛ ඇති සදුක් වූ ද නිදුක් වූ ද විපාකවේදනා විඳී. ඇතැම් මිනිසුන් සෙයිනි. ඇතැම් දෙවියන් හා විනිපාතිකයන් ද සෙයිනි. බමුණ, මේ කෘෂ්ණශුක්ලවිපාක ඇති කෘෂ්ණශුක්ල කර්ම යි කියනු ලැබේ.

බමුණ, කර්මක්‍ෂය පිණිස පවත්නා අකෘෂ්ණ අශුක්ල විපාක ඇති අකෘෂ්ණ අශුක්ලකර්මය කවරේ ද? බමුණ, එහි ලා කෘෂ්ණවිපාක ඇති යම් කෘෂ්ණකර්මයෙක් ඇත් ද ඒ කර්මයාගේ ප්‍රහාණය පිණිස යම් චේතනාවෙක් ඇත් ද, ශුක්ලවිපාක ඇති යම් ශුක්ලකර්මයෙක් ඇත් ද ඒ කර්මයාගේ ප්‍රහාණය පිණිස යම් චේතනාවෙක් ඇත් ද, කෘෂ්ණශුක්ලවිපාක ඇති යම් කෘෂ්ණශුක්ලකර්මයෙක් ඇත් ද ඒ කර්මයාගේ ප්‍රහාණය පිණිස යම් චේතනාවෙක් ඇත් ද, බමුණ, මේ කර්මක්‍ෂය පිණිස පවත්නා අකෘෂ්ණ අශුක්ල විපාක ඇති අකෘෂ්ණ අශුක්ල කර්ම යි කියනු ලැබේ.

බමුණ, මේ සතර කර්මයෝ මා විසින් තමන් ම විශිෂ්ටඥානයෙන් දැන ප්‍රත්‍යක්‍ෂ කොට ප්‍රකාශ කරණ ලදහ.

## 4. 5. 4. 4

## [ චතුත්ථ කම්මසුත්තං ]

35. චත්තාරිමානි භික්ඛවෙ කම්මානි මයා සයං අභිඤ්ඤා සච්ඡිකත්වා පවෙදිතානි. කතමානි චත්තාරි ?

අත්ථි භික්ඛවෙ කම්මං කණ්හං කණ්හවිපාකං. අත්ථි භික්ඛවෙ කම්මං සුක්කං සුක්කවිපාකං. අත්ථි භික්ඛවෙ කම්මං කණ්හසුක්කං කණ්හසුක්කවිපාකං. අත්ථි භික්ඛවෙ කම්මං අකණ්හං අසුක්කං අකණ්හාසුක්කවිපාකං කම්මක්ඛයාය සංවත්තති.

කතමඤ්ච භික්ඛවෙ කම්මං කණ්හං කණ්හවිපාකං ? ඉධ භික්ඛවෙ එකච්චො පාණාතිපාතී හොති, අදින්නාදායී හොති, කාමෙසු මිච්ඡාචාරී හොති, මුසාවාදී හොති, සුරාමෙරයමජ්ජපමාදට්ඨායී හොති. ඉදං වුච්චති භික්ඛවෙ කම්මං කණ්හං කණ්හවිපාකං.

කතමඤ්ච භික්ඛවෙ කම්මං සුක්කං සුක්කවිපාකං ? ඉධ භික්ඛවෙ එකච්චො පාණාතිපාතා පටිවිරතො හොති, අදින්නාදානා පටිවිරතො හොති, කාමෙසු මිච්ඡාචාරා පටිවිරතො හොති, මුසාවාදා පටිවිරතො හොති, සුරාමෙරයමජ්ජපමාදට්ඨානා පටිවිරතො හොති. ඉදං වුච්චති භික්ඛවෙ කම්මං සුක්කං සුක්කවිපාකං.

කතමඤ්ච භික්ඛවෙ කම්මං කණ්හසුක්කං කණ්හසුක්කවිපාකං? ඉධ භික්ඛවෙ එකච්චො සබ්‍යාපජ්ඣම්පි අබ්‍යාපජ්ඣම්පි කායසඞ්ඛාරං අභිසඞ්ඛරොති -පෙ- [වචීසඞ්ඛාරං -පෙ- මනොසඞ්ඛාරං අභිසඞ්ඛරොති.] ඉදං වුච්චති භික්ඛවෙ කම්මං කණ්හසුක්කං කණ්හසුක්කවිපාකං.

කතමඤ්ච භික්ඛවෙ කම්මං අකණ්හං අසුක්කං අකණ්හඅසුක්කවිපාකං කම්මක්ඛයාය සංවත්තති ? තත්‍ර භික්ඛවෙ යමිදං කම්මං කණ්හං කණ්හවිපාකං [තස්ස පහාණාය යා චෙතනා] -පෙ- ඉදං වුච්චති භික්ඛවෙ කම්මං අකණ්හං අසුක්කං අකණ්හඅසුක්කවිපාකං කම්මක්ඛයාය සංවත්තති.

ඉමානි ඛො භික්ඛවෙ චත්තාරි කම්මානි මයා සයං අභිඤ්ඤා සච්ඡිකත්වා පවෙදිතානීති.

## 4. 5. 4. 5

## [ පඤ්චම කම්මසුත්තං ]

36. චත්තාරිමානි භික්ඛවෙ කම්මානි මයා සයං අභිඤ්ඤා සච්ඡිකත්වා පවෙදිතානි. කතමානි චත්තාරි ?

අත්ථි භික්ඛවෙ කම්මං කණ්හං කණ්හවිපාකං. අත්ථි භික්ඛවෙ කම්මං සුක්කං සුක්කවිපාකං. අත්ථි භික්ඛවෙ කම්මං කණ්හසුක්කං කණ්හසුක්කවිපාකං. අත්ථි භික්ඛවෙ කම්මං අකණ්හං අසුක්කං අකණ්හඅසුක්කවිපාකං කම්මක්ඛයාය සංවත්තති.

## 4. 5. 4. 4.

## [සිවුවන කම්ම සූත්‍රය]

35. මහණෙනි, මේ කර්මයෝ සතර දෙනෙක් මා විසින් තමන් ම විශිෂ්ටඥානයෙන් දැන ප්‍රත්‍යක්ෂ කොට ප්‍රකාශ කරණ ලදහ. කවර සතර කර්මයක යත්:

මහණෙනි, කෘෂ්ණ විපාක ඇති කෘෂ්ණ කර්මයෙක් ඇත. මහණෙනි, ශුක්ල විපාක ඇති ශුක්ල කර්මයෙක් ඇත. මහණෙනි, කෘෂ්ණ වූ ද ශුක්ල වූ ද විපාක ඇති කෘෂ්ණ ශුක්ල කර්මයෙක් ඇත. මහණෙනි, කර්මක්ෂය පිණිස පවත්නා අකෘෂ්ණ අශුක්ල විපාක ඇති අකෘෂ්ණ අශුක්ල කර්මයෙක් ඇත.

මහණෙනි, කෘෂ්ණ විපාක ඇති කෘෂ්ණ කර්මය කවරේය? මහණෙනි, මේ ලොව ඇතැමෙක් පණිවා කරන්නේ වෙයි. අයිතාදන් ගන්නේ වෙයි. කාමයෙහි මිසහසර ඇතියේ වෙයි. මුසවා බණන්නේ වෙයි. මද්‍ය පමා දෙකට කරුණු වන රහ මෙර පිමෙහි සිටුනේ වෙයි. මහණෙනි, මේ කෘෂ්ණ විපාක ඇති කෘෂ්ණ කර්මය යි කියනු ලැබේ.

මහණෙනි, ශුක්ල විපාක ඇති ශුක්ල කර්මය කවරේ ය? මහණෙනි, මේ ලොව ඇතැමෙක් පණිවායෙන් දුරු වූයේ වෙයි. අයිතාදනින් දුරු වූයේ වෙයි. කාමයෙහි මිසහසරින් දුරු වූයේ වෙයි. මුසවායෙන් දුරු වූයේ වෙයි. මද්‍ය පමා දෙකට කරුණු වන රහමෙර පිමෙන් දුරු වූයේ වෙයි. මහණෙනි, මේ ශුක්ල විපාක ඇති ශුක්ල කර්මය යි කියනු ලැබේ.

මහණෙනි, කෘෂ්ණ වූ ද ශුක්ල වූ ද විපාක ඇති කෘෂ්ණ ශුක්ල කර්මය කවරේ ය? මහණෙනි, මෙලොව ඇතැමෙක් සදොස් වූ ද නිදොස් වූ ද කායසංස්කාර රැස් කෙරෙයි ... [වාක්සංස්කාර ... මනස්සංස්කාර රැස් කෙරෙයි.] මහණෙනි, මේ කෘෂ්ණ වූ ද ශුක්ල වූ ද විපාක ඇති කෘෂ්ණ ශුක්ල කර්මය යි කියනු ලැබේ.

මහණෙනි, කර්මක්ෂය පිණිස පවත්නා අකෘෂ්ණ අශුක්ල විපාක ඇති අකෘෂ්ණ අශුක්ල කර්මය කවරේ ය? මහණෙනි, එහි ලා කෘෂ්ණ විපාක ඇති යම් කෘෂ්ණ කර්මයෙක් වේ ද [ඒ කර්මයාගේ ප්‍රහාණය පිණිස යම් චේතනාවෙක් ඇත් ද,] .. මහණෙනි, මේ කර්මක්ෂය පිණිස පවත්නා අකෘෂ්ණ වූ ද අශුක්ල වූ ද විපාක ඇති අකෘෂ්ණ අශුක්ල කර්මය යි කියනු ලැබේ.

මහණෙනි, මේ සතර කර්මයෝ මා විසින් තමන් ම විශිෂ්ටඥානයෙන් දැන ප්‍රත්‍යක්ෂ කොට ප්‍රකාශ කරණ ලදහ.

## 4. 5. 4. 5.

## [පස්වන කම්ම සූත්‍රය]

36. මහණෙනි, මේ කර්මයෝ සතර දෙනෙක් මා විසින් තමන් ම විශිෂ්ටඥානයෙන් දැන ප්‍රත්‍යක්ෂ කොට ප්‍රකාශ කරණ ලදහ. කවර සතර කර්මයක යත්:

මහණෙනි, කෘෂ්ණ විපාක ඇති කෘෂ්ණකර්මයෙක් ඇත. මහණෙනි, ශුක්ල විපාක ඇති ශුක්ලකර්මයෙක් ඇත. මහණෙනි, කෘෂ්ණ ශුක්ල විපාක ඇති කෘෂ්ණශුක්ලකර්මයෙක් ඇත. මහණෙනි, කර්මක්ෂය පිණිස පවත්නා අකෘෂ්ණ අශුක්ල විපාක ඇති අකෘෂ්ණ අශුක්ලකර්මයෙක් ඇත.

කතමඤ්ච භික්ඛවෙ කම්මං කණ්හං කණ්හවිපාකං? ඉධ භික්ඛවෙ එකච්චෙන මාතා ජීවිතා වොරොපිතා හොති, පිතා ජීවිතා වොරොපිතො හොති, අරහං ජීවිතා වොරොපිතො හොති, තථාගතස්ස දුට්ඨෙන චිත්තෙන ලොහිතං උප්පාදිතං හොති. සඞ්ඝො පි භින්නො හොති. ඉදං වුච්චති භික්ඛවෙ කම්මං කණ්හං කණ්හවිපාකං.

කතමඤ්ච භික්ඛවෙ කම්මං සුක්කං සුක්කවිපාකං? ඉධ භික්ඛවෙ එකච්චො පාණාතිපාතා පටිවිරතො හොති, අදින්නාදානා පටිවිරතො හොති, කාමෙසු මිච්ඡාචාරා පටිවිරතො හොති, මුසාවාදා පටිවිරතො හොති, පිසුණාවාචා පටිවිරතො හොති, ඵරුසාවාචා පටිවිරතො හොති, සම්ඵප්පලාපා පටිවිරතො හොති, අනභිජ්ඣාලු හොති, අබ්‍යාපන්නචිත්තො හොති, සම්මාදිට්ඨිකො හොති. ඉදං වුච්චති භික්ඛවෙ කම්මං සුක්කං සුක්කවිපාකං.

කතමඤ්ච භික්ඛවෙ කම්මං කණ්හසුක්කං කණ්හසුක්කවිපාකං? ඉධ භික්ඛවෙ එකච්චො සබ්‍යාපජ්ඣම්පි අබ්‍යාපජ්ඣම්පි කායසඞ්ඛාරං අභිසඞ්ඛරොති, -පෙ- ඉදං වුච්චති භික්ඛවෙ කම්මං කණ්හසුක්කං කණ්හසුක්කවිපාකං.

කතමඤ්ච භික්ඛවෙ කම්මං අකණ්හං අසුක්කං අකණ්හඅසුක්කවිපාකං කම්මක්ඛයාය සංවත්තති? තත්‍ර භික්ඛවෙ යමිදං කම්මං කණ්හං කණ්හවිපාකං [තස්ස පහාණාය යා චෙතනා] -පෙ- ඉදං වුච්චති භික්ඛවෙ කම්මං අකණ්හං අසුක්කං අකණ්හඅසුක්කවිපාකං කම්මක්ඛයාය සංවත්තති.

ඉමානි ඛො භික්ඛවෙ චත්තාරි කම්මානි මයා සයං අභිඤ්ඤා සච්ඡිකත්වා පවෙදිතානීති.

### 4. 5 4. 6

### [ ඡට්ඨකම්මසුත්තං ]

37. චත්තාරිමානි භික්ඛවෙ කම්මානි මයා සයං අභිඤ්ඤා සච්ඡිකත්වා පවෙදිතානි. කතමානි චත්තාරි?

අත්ථි භික්ඛවෙ කම්මං කණ්හං කණ්හවිපාකං, අත්ථි භික්ඛවෙ කම්මං සුක්කං සුක්කවිපාකං, අත්ථි භික්ඛවෙ කම්මං කණ්හසුක්කං කණ්හසුක්කවිපාකං, අත්ථි භික්ඛවෙ කම්මං අකණ්හං අසුක්කං අකණ්හඅසුක්කවිපාකං කම්මක්ඛයාය සංවත්තති.

කතමඤ්ච භික්ඛවෙ කම්මං කණ්හං කණ්හවිපාකං? ඉධ භික්ඛවෙ එකච්චො සබ්‍යාපජ්ඣං කායසඞ්ඛාරං අභිසඞ්ඛරොති -පෙ- ඉදං වුච්චති භික්ඛවෙ කම්මං කණ්හං කණ්හවිපාකං.

කතමඤ්ච භික්ඛවෙ කම්මං සුක්කං සුක්කවිපාකං? ඉධ භික්ඛවෙ එකච්චො අබ්‍යාපජ්ඣං කායසඞ්ඛාරං අභිසඞ්ඛරොති, -පෙ- ඉදං වුච්චති භික්ඛවෙ කම්මං සුක්කං සුක්කවිපාකං.

කතමඤ්ච භික්ඛවෙ කම්මං කණ්හසුක්කං කණ්හසුක්කවිපාකං? ඉධ භික්ඛවෙ එකච්චො සබ්‍යාපජ්ඣම්පි අබ්‍යාපජ්ඣම්පි කායසඞ්ඛාරං අභිසඞ්ඛරොති, -පෙ ඉදං වුච්චති භික්ඛවෙ කම්මං කණ්හසුක්කං කණ්හසුක්කවිපාකං.

මහණෙනි, කෘෂ්ණ විපාක ඇති කෘෂ්ණකර්මය කවරේ ය? මහණෙනි, මේ ලොව ඇතමකු විසින් මව දිවියෙන් තොරකරණ ලදු වෙයි. පියා දිවියෙන් තොර කරණ ලද්දේ වෙයි. රහත් දිවියෙන් තොර කරණ ලද්දේ වෙයි. දුෂ්ට සිතින් තථාගතයන් වහන්සේගේ කයෙහි ලේ සොල්වන ලද්දේ වෙයි. සඞ්ඝයා බිඳනා ලද්දේ වෙයි. මහණෙනි, මේ කෘෂ්ණවිපාක ඇති කෘෂ්ණ කර්මය යි කියනු ලැබේ.

මහණෙනි, ශුක්ලවිපාක ඇති ශුක්ලකර්මය කවරේ ය? මහණෙනි, මෙලොව ඇතැමෙක් ප්‍රාණිවධයෙන් දුරුවූයේ වෙයි. අයිනාදනින් දුරුවූයේ වෙයි. කාමයෙහි මිසඟසරින් දුරුවූයේ වෙයි. මුසාවාදයෙන් දුරුවූයේ වෙයි. පිසුණු බසින් දුරුවූයේ වෙයි. පරොස්බසින් දුරුවූයේ වෙයි. පලපිනින් දුරුවූයේ වෙයි. දල ලොභ නැතියේ වෙයි. ව්‍යාපාදයට නොපත් සිත් ඇතියේ වෙයි. සම්‍යග්දෘෂ්ටික වෙයි. මහණෙනි, මේ ශුක්ලවිපාක ඇති ශුක්ලකර්මය යි කියනු ලැබේ.

මහණෙනි, කෘෂ්ණශුක්ලවිපාක ඇති කෘෂ්ණශුක්ලකර්මය කවරේ ය? මහණෙනි, මෙලොව ඇතැමෙක් සදොස් වූ ද නිදොස් වූ ද කායසංස්කාර රැස් කෙරෙයි... මහණෙනි, මේ කෘෂ්ණශුක්ල විපාක ඇති කෘෂ්ණශුක්ලකර්මය යි කියනු ලැබේ.

මහණෙනි, කර්මක්ෂය පිණිස පවත්නා අකෘෂ්ණ අශුක්ලවිපාක ඇති අකෘෂ්ණ අශුක්ලකර්මය කවරේ ය? මහණෙනි, එහි ලා යම් කර්මයක් කෘෂ්ණ වේ ද කෘෂ්ණවිපාක ඇත්තේ වේ ද [ඒ කර්මයාගේ ප්‍රහාණය පිණිස යම් චේතනාවෙක් ඇද්දී ද] ... මහණෙනි, කර්මක්ෂය පිණිස පවත්නා මෙය අකෘෂ්ණ අශුක්ලවිපාක ඇති අකෘෂ්ණ අශුක්ලකර්මය යි කියනු ලැබේ.

මහණෙනි, මේ සතර කර්මයෝ මා විසින් තමන් ම විශිෂ්ටඥානයෙන් දැන ප්‍රත්‍යක්ෂ කොට වදාරණ ලදහ.

## 4. 5. 4. 6.

## [ සවන කර්මසූත්‍රය ]

37. මහණෙනි, මේ සතර කර්මයෝ මා විසින් තමන් ම විශිෂ්ටඥානයෙන් දැන සාක්ෂාත් කොට වදාරණ ලදහ. කවර සතර කර්මයහ යත්:

මහණෙනි, කෘෂ්ණවිපාක ඇති කෘෂ්ණ කර්මයෙක් ඇත. ශුක්ලවිපාක ඇති ශුක්ලකර්මයෙක් ඇත. කෘෂ්ණශුක්ලවිපාක ඇති කෘෂ්ණශුක්ලකර්මයෙක් ඇත. කර්මක්ෂය පිණිස පවත්නා අකෘෂ්ණ අශුක්ලවිපාක ඇති අකෘෂ්ණ අශුක්ලකර්මයෙක් ඇත.

මහණෙනි, කෘෂ්ණවිපාක ඇති කෘෂ්ණකර්මය කවරේ ය? මහණෙනි, මෙලොව ඇතැමෙක් සදොස් වූ කායසංස්කාරය රැස් කෙරෙයි ... මහණෙනි, මේ කෘෂ්ණවිපාක ඇති කෘෂ්ණකර්මය යි කියනු ලැබේ.

මහණෙනි, ශුක්ලවිපාක ඇති ශුක්ලකර්මය කවරේ ය? මහණෙනි, මෙලොව ඇතැමෙක් නිදොස් වූ කායසංස්කාරය රැස් කෙරෙයි ... මහණෙනි, මේ ශුක්ලවිපාක ඇති ශුක්ලකර්මය යි කියනු ලැබේ.

මහණෙනි, කෘෂ්ණශුක්ලවිපාක ඇති කෘෂ්ණශුක්ලකර්මය කවරේ ය? මහණෙනි, මෙලොව ඇතැමෙක් සදොස් වූ ද නිදොස් වූ ද කායසංස්කාරය රැස් කෙරෙයි ... මහණෙනි, මේ කෘෂ්ණශුක්ලවිපාක ඇති කෘෂ්ණශුක්ලකර්මය යි කියනු ලැබේ.

කතමඤ්ච භික්ඛවෙ කම්මං අකණ්හං අසුක්කං අකණ්හඅසුක්කවිපාකං කම්මක්ඛයාය සංවත්තති? සම්මාදිට්ඨි -පෙ- සම්මාසමාධි, ඉදං වුච්චති භික්ඛවෙ කම්මං අකණ්හං අසුක්කං අකණ්හඅසුක්කවිපාකං කම්මක්ඛයාය සංවත්තති.

ඉමානි ඛො භික්ඛවෙ චත්තාරි කම්මානි මයා සයං අභිඤ්ඤා සච්ඡිකත්වා පවෙදිතානීති.

## 4. 5. 4. 7.

## [ සත්තඞ්ගකම්මසුත්තං ]

38. චත්තාරිමානි භික්ඛවෙ කම්මානි මයා සයං අභිඤ්ඤා සච්ඡිකත්වා පවෙදිතානි. කතමානි චත්තාරි?

අත්ථි භික්ඛවෙ කම්මං කණ්හං කණ්හවිපාකං, අත්ථි භික්ඛවෙ කම්මං සුක්කං සුක්කවිපාකං, අත්ථි භික්ඛවෙ කම්මං කණ්හසුක්කං කණ්හසුක්ක-විපාකං, අත්ථි භික්ඛවෙ කම්මං අකණ්හං අසුක්කං අකණ්හඅසුක්කවිපාකං කම්මක්ඛයාය සංවත්තති.

කතමඤ්ච භික්ඛවෙ කම්මං කණ්හං කණ්හවිපාකං? ඉධ භික්ඛවෙ එකච්චො සබ්‍යාපජ්ඣං කායසඞ්ඛාරං අභිසඞ්ඛරොති -පෙ- [වචීසඞ්ඛාරං -පෙ- මනො-සඞ්ඛාරං -පෙ-] ඉදං වුච්චති භික්ඛවෙ කම්මං කණ්හං කණ්හවිපාකං.

කතමඤ්ච භික්ඛවෙ කම්මං සුක්කං සුක්කවිපාකං? ඉධ භික්ඛවෙ එකච්චො අබ්‍යාපජ්ඣං කායසඞ්ඛාරං අභිසඞ්ඛරොති -පෙ- [වචීසඞ්ඛාරං -පෙ- මනො-සඞ්ඛාරං -පෙ-] ඉදං වුච්චති භික්ඛවෙ කම්මං සුක්කං සුක්කවිපාකං.

කතමඤ්ච භික්ඛවෙ කම්මං කණ්හසුක්කං කණ්හසුක්කවිපාකං? ඉධ භික්ඛවෙ එකච්චො සබ්‍යාපජ්ඣම්පි අබ්‍යාපජ්ඣම්පි කායසඞ්ඛාරං අභිසඞ්ඛරොති, -පෙ- [වචීසඞ්ඛාරං -පෙ- මනොසඞ්ඛාරං -පෙ-] ඉදං වුච්චති භික්ඛවෙ කම්මං කණ්හසුක්කං කණ්හසුක්කවිපාකං.

කතමඤ්ච භික්ඛවෙ කම්මං අකණ්හං අසුක්කං අකණ්හඅසුක්කවිපාකං කම්මක්ඛයාය සංවත්තති? සතිසම්බොජ්ඣඞ්ගො, ධම්මවිචයසම්බොජ්ඣඞ්ගො, විරියසම්බොජ්ඣඞ්ගො, පීතිසම්බොජ්ඣඞ්ගො, පස්සද්ධිසම්බොජ්ඣඞ්ගො, සමාධි-සම්බොජ්ඣඞ්ගො, උපෙක්ඛාසම්බොජ්ඣඞ්ගො. ඉදං වුච්චති භික්ඛවෙ කම්මං අකණ්හං අසුක්කං අකණ්හා අසුක්කවිපාකං කම්මක්ඛයාය සංවත්තති.

ඉමානි ඛො භික්ඛවෙ චත්තාරි කම්මානි මයා සයං අභිඤ්ඤා සච්ඡිකත්වා පවෙදිතානීති.

## 4. 5. 4. 8.

## [ සාවජ්ජ - අනවජ්ජකම්ම සුත්තං ]

39. චතූහි භික්ඛවෙ ධම්මෙහි සමන්නාගතො යථාභතං නික්ඛිත්තො එවං නිරයෙ. කතමෙහි චතූහි?

සාවජ්ජෙන කායකම්මෙන, සාවජ්ජෙන වචීකම්මෙන, සාවජ්ජෙන මනො-කම්මෙන, සාවජ්ජාය දිට්ඨියා.

මහණෙනි, කර්මක්ෂය පිණිස පවත්නා අකෘෂ්ණ අශුක්ලවිපාක ඇති අකෘෂ්ණ අශුක්ලකර්මය කවරේ ය? සම්‍යග් දෘෂ්ටිය .. සම්‍යක් සමාධි යි. මහණෙනි, කර්මක්ෂය පිණිස පවත්නා මේ අකෘෂ්ණ අශුක්ලවිපාක ඇති අකෘෂ්ණ අශුක්ලකර්මය යි කියනු ලැබේ.

මහණෙනි, මේ සතර කර්මයෝ මා විසින් තමන් ම විශිෂ්ටඥානයෙන් දැන ප්‍රත්‍යක්ෂ කොට පවසන ලදහ.

4. 5. 4. 7.

## [ සත්වන කර්මසූත්‍රය ]

38. මහණෙනි, මේ සතර කර්මයෝ මා විසින් තමන් ම විශිෂ්ටඥානයෙන් දැන සාක්ෂාත් කොට ප්‍රකාශ කරණ ලදහ. කවර සතර කර්මයක යත්:

මහණෙනි, කෘෂ්ණවිපාක ඇති කෘෂ්ණකර්මයෙක් ඇත. මහණෙනි, ශුක්ල විපාක ඇති ශුක්ලකර්මයෙක් ඇත. මහණෙනි, කෘෂ්ණශුක්ලවිපාක ඇති කෘෂ්ණශුක්ලකර්මයෙක් ඇත. මහණෙනි, කර්මක්ෂය පිණිස පවත්නා අකෘෂ්ණ අශුක්ලවිපාක ඇති අකෘෂ්ණ අශුක්ලකර්මයෙක් ඇත.

මහණෙනි, කෘෂ්ණවිපාක ඇති කෘෂ්ණකර්මය කවරේ ය? මහණෙනි, මෙලොව ඇතැමෙක් සද්වේෂ්වූ කායසංස්කාර රැස් කෙරෙයි [වාක්සංස්කාර... මනඃසංස්කාර .... [මහණෙනි, මේ කෘෂ්ණවිපාක ඇති කෘෂ්ණකර්මය යි කියනු ලැබේ.

මහණෙනි, ශුක්ලවිපාක ඇති ශුක්ලකර්මය කවරේ ය? මහණෙනි, මෙලොව ඇතැමෙක් නිද්වේෂ් වූ කායසංස්කාර රැස් කෙරෙයි ... [වාක්සංස්කාර .... මනඃසංස්කාර ....] මහණෙනි, මේ ශුක්ල විපාක ඇති ශුක්ලකර්මය යි කියනු ලැබේ.

මහණෙනි, කෘෂ්ණ ශුක්ලවිපාක ඇති කෘෂ්ණශුක්ලකර්මය කවරේ ය? මහණෙනි, මෙලොව ඇතැමෙක් සද්වේෂ් වූ ද නිද්වේෂ් වූ ද කායසංස්කාර රැස් කෙරෙයි [වාක්සංස්කාර ... මනඃසංස්කාර] මහණෙනි, මේ කෘෂ්ණශුක්ල විපාක ඇති කෘෂ්ණශුක්ලකර්මය යි කියනු ලැබේ.

මහණෙනි, කර්මක්ෂය පිණිස පවත්නා අකෘෂ්ණ අශුක්ල විපාක ඇති අකෘෂ්ණ අශුක්ලකර්මය කවරේ ය? ස්මෘතිසම්බොධ්‍යඞ්ගය, ධර්මවිචය-සම්බොධ්‍යඞ්ගය, වීර්‍ය්‍යසම්බොධ්‍යඞ්ගය, ප්‍රීතිසම්බොධ්‍යඞ්ගය, ප්‍රශ්‍රබ්ධි-සම්බොධ්‍යඞ්ගය, සමාධිසම්බොධ්‍යඞ්ගය, උපෙක්ෂාසම්බොධ්‍යඞ්ග යි. මහණෙනි, මේ කර්මක්ෂය පිණිස පවත්නා අකෘෂ්ණ අශුක්ලවිපාක ඇති අකෘෂ්ණ අශුක්ලකර්මය යි කියනු ලැබේ.

මහණෙනි, මේ සතර කර්මයෝ මා විසින් තමන් ම විශිෂ්ටඥානයෙන් දැන සාක්ෂාත් කොට ප්‍රකාශ කරණ ලදහ.

4. 5. 4. 8.

## [ සාවද්‍ය - අනවද්‍ය කර්මසූත්‍රය ]

39. මහණෙනි, සතර කරුණෙකින් සමන්වාගත වූයේ ගෙණවුත් බහා තබන ලද්දේ යම්සේ ද, එසෙයින් නිරයෙහි වේ. කවර සතරෙකින යත්:

සාවද්‍යකායකර්මයෙන, සාවද්‍යවාක්කර්මයෙන, සාවද්‍යමනඃකර්මයෙන, සාවද්‍ය දෘෂ්ටියෙන යි.

ඉමෙහි ඛො භික්ඛවෙ චතූහි ධම්මෙහි සමන්නාගතො යථාභතං නික්ඛිත්තො එවං නිරයෙ.

චතූහි භික්ඛවෙ ධම්මෙහි සමන්නාගතො යථාභතං නික්ඛිත්තො එවං සග්ගෙ කතමෙහි චතූහි?

අනවජ්ජෙන කායකම්මෙන අනවජ්ජෙන වචීකම්මෙන, අනවජ්ජෙන මනොකම්මෙන, අනවජ්ජාය දිට්ඨියා.

ඉමෙහි ඛො භික්ඛවෙ චතූහි ධම්මෙහි සමන්නාගතො යථාභතං නික්ඛිත්තො එවං සග්ගෙති.

## 4. 5. 4 9.

### [ සබ්‍යාපජ්ඣ - අබ්‍යාපජ්ඣකම්මසුත්තං ]

40. චතූහි භික්ඛවෙ ධම්මෙහි සමන්නාගතො යථාභතං නික්ඛිත්තො එවං නිරයෙ. කතමෙහි චතූහි?

සබ්‍යාපජ්ඣෙන කායකම්මෙන, සබ්‍යාපජ්ඣෙන වචීකම්මෙන, සබ්‍යාපජ්ඣෙන මනොකම්මෙන, සබ්‍යාපජ්ඣාය දිට්ඨියා. ඉමෙහි ඛො භික්ඛවෙ චතූහි ධම්මෙහි සමන්නාගතො යථාභතං නික්ඛිත්තො එවං නිරයෙ.

චතූහි භික්ඛවෙ ධම්මෙහි සමන්නාගතො යථාභතං නික්ඛිත්තො එවං සග්ගෙ. කතමෙහි චතූහි?

අබ්‍යාපජ්ඣෙන කායකම්මෙන, අබ්‍යාපජ්ඣෙන වචීකම්මෙන, අබ්‍යාපජ්ඣෙන මනොකම්මෙන, අබ්‍යාපජ්ඣාය දිට්ඨියා.

ඉමෙහි ඛො භික්ඛවෙ චතූහි ධම්මෙහි සමන්නාගතො යථාභතං නික්ඛිත්තො එවං සග්ගෙති.

## 4. 5. 4. 10.

### [ සමණසුත්තං ]

41. ඉධෙව භික්ඛවෙ සමණො, ඉධ දුතියො සමණො, ඉධ තතියො සමණො, ඉධ චතුත්ථො සමණො, සුඤ්ඤා පරප්පවාදා සමණෙහි අඤ්ඤෙහීති එවමෙතං භික්ඛවෙ සම්මා සීහනාදං නදථ.

කතමො ච භික්ඛවෙ සමණො? ඉධ භික්ඛවෙ භික්ඛු තිණ්ණං සංයොජනානං පරික්ඛයා සොතාපන්නො හොති අවිනිපාතධම්මො නියතො සම්බොධිපරායණො. අයං භික්ඛවෙ සමණො.

කතමො ච භික්ඛවෙ දුතියො සමණො? ඉධ භික්ඛවෙ භික්ඛු තිණ්ණං සංයොජනානං පරික්ඛයා රාගදොසමොහානං තනුත්තා සකදාගාමී හොති, සකිදෙව ඉමං ලොකං ආගන්ත්වා දුක්ඛස්සන්තං කරොති. අයං භික්ඛවෙ දුතියො සමණො.

මහණෙනි, මේ සතර කරුණින් සමන්වාගත වූයේ ගෙණවුත් බහා තබන ලද්දේ යම්සේ ද, එපරිදි නිරයෙහි වේ.

මහණෙනි, සතර කරුණෙකින් සමන්වාගත වූයේ ගෙණවුත් බහා තබන ලද්දේ යම්සේ ද, එසෙයින් ස්වර්ගයෙහි වේ. කවර සතරෙකින යත්:

අනවද්‍ය කායකර්මයෙන, අනවද්‍ය වාක්කර්මයෙන, අනවද්‍ය මනඃකර්මයෙන, අනවද්‍ය දෘෂ්ටියෙනැ යි.

මහණෙනි, මේ සතර කරුණින් සමන්වාගත වූයේ ගෙණවුත් බහා තබන ලද්දේ යම්සේ ද, එසේ ස්වර්ගයෙහි වේ.

## 4. 5. 4. 9

## [ සව්‍යාපජ්ඣ-අව්‍යාපජ්ඣ කර්මසූත්‍රය ]

40. මහණෙනි, සතර කරුණෙකින් සමන්වාගත වූයේ ගෙණවුත් බහා තබන ලද්දේ යම්සේ ද, එසෙයින් නිරයෙහි වේ. කවර සතරෙකින යත්:

සදොස් වූ කායකර්මයෙන, සදොස් වූ වාක්කර්මයෙන, සදොස් වූ මනඃකර්මයෙන, සදොස් වූ දෘෂ්ටියෙනැ යි,

මහණෙනි, මේ සතර කරුණින් සමන්වාගත වූයේ ගෙණවුත් බහා තබන ලද්දේ යම් සේ ද, එසෙයින් නිරයෙහි වේ.

මහණෙනි, සතර කරුණෙකින් සමන්වාගත වූයේ ගෙණවුත් බහා තබන ලද්දේ යම්සේ ද, එසෙයින් ස්වර්ගයෙහි වේ. කවර සතරෙකින යත්:

නිදොස් වූ කායකර්මයෙන, නිදොස් වූ වාක්කර්මයෙන, නිදොස් වූ මනඃකර්මයෙන, නිදොස් වූ දෘෂ්ටියෙනැ යි.

මහණෙනි, මේ සතර කරුණින් සමන්වාගත වූයේ ගෙණවුත් බහා තබන ලද්දේ යම්සේ ද, එසෙයින් ස්වර්ගයෙහි වේ.

## 4. 5. 4. 10.

## [ සමණ සූත්‍රය ]

41. මහණෙනි, ප්‍රථම (ස්‍රොතාපන්න) මහණ ද මෙසස්නෙහි ම ය. දෙවන (සකෘදාගාමී) මහණ ද මෙසස්නෙහි ම ය. තෙවන (අනාගාමී) මහණ ද මෙසස්නෙහි ම ය. සිවුවන (අර්හත්) මහණ ද මෙසස්නෙහි ම ය. අන්‍ය වූ පරප්‍රවාදයෝ ශ්‍රමණයන් කෙරෙන් තොරයහ යි. මහණෙනි, මෙසේ මොනොවට සිංහනාද කරව.

මහණෙනි, (ප්‍රථම ස්‍රොතාපන්න) ශ්‍රමණ කවරේ ය? මහණෙනි, මෙසස්නෙහි මහණ ත්‍රිවිධසංයොජනයන්ගේ ක්‍ෂය කිරීමෙන් අවිනිපාතස්වභාව ඇති නියත වූ සම්බොධිපරායණ වූ ස්‍රොතාපන්නයෙක් වේ. මහණෙනි, මේ (ප්‍රථම) ශ්‍රමණ යි.

මහණෙනි, දෙවන මහණ කවරේ ය? මහණෙනි, මෙසස්නෙහි මහණ ත්‍රිවිධසංයෝජනයන් ක්‍ෂය කිරීමෙන් රාගද්වෙෂමෝහයන් තුනී බැවින් සකෘදාගාමී වෙයි. එක් වරක් ම මෙලොවට අවුත් දුක් කෙළවර කෙරෙයි. මහණෙනි, මේ දෙවන මහණ යි.

කතමො ච භික්ඛවෙ තතියො සමණො? ඉධ භික්ඛවෙ භික්ඛු පඤ්චන්නං ඔරම්භාගියානං සංයොජනානං පරික්ඛයා ඔපපාතිකො හොති තත්ථ පරිනිබ්බායී අනාවත්තිධම්මො තස්මා ලොකා. අයං භික්ඛවෙ තතියො සමණො.

කතමො ච භික්ඛවෙ චතුත්ථො සමණො? ඉධ භික්ඛවෙ භික්ඛු ආසවානං ඛයා අනාසවං චෙතොවිමුත්තිං පඤ්ඤාවිමුත්තිං දිට්ඨෙව ධම්මෙ සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරති. අයං භික්ඛවෙ චතුත්ථො සමණො.

ඉධෙව භික්ඛවෙ සමණො, ඉධ දුතියො සමණො, ඉධ තතියො සමණො, ඉධ චතුත්ථො සමණො. සුඤ්ඤා පරප්පවාදා සමණෙහි අඤ්ඤෙ'ති. එවමෙතං භික්ඛවෙ සම්මා සීහනාදං නදථාති.

## 4. 4 5 11.

### [ සප්පුරිසානිසංසසුත්තං ]

42. සප්පුරිසං භික්ඛවෙ නිස්සාය චත්තාරො ආනිසංසා පාටිකඞ්ඛා. කතමෙ චත්තාරො?

අරියෙන සීලෙන වඩ්ඪති. අරියෙන සමාධිනා වඩ්ඪති, අරියාය පඤ්ඤාය වඩ්ඪති, අරියාය විමුත්තියා වඩ්ඪති.

සප්පුරිසං භික්ඛවෙ නිස්සාය ඉමෙ චත්තාරො ආනිසංසා පාටිකඞ්ඛාති.

කම්මවග්ගො චතුත්ථො.*

---

තත්‍රුද්දානං:

* සංඛිත්තවිත්ථාර සොණකායන සික්ඛාපදං අරියමග්ගා
සාවජ්ජඤ්චෙව අබ්‍යාපජ්ඣං සමණො ච සප්පුරිසානිසංසොති මජ සං.

මහණෙනි, තෙවන මහණ කවරේ ද.? මහණෙනි, මෙසස්නෙහි මහණ පඤ්ච ඔරම්භාගිය සංයෝජනයන් ක්ෂය කිරීමෙන් එ බඹලොව පිරිනිවෙනසුලු එලොවින් වටාලා නොඑනසුලු ඕපපාතික වේ. මහණෙනි, මේ තෙවන මහණ යි.

මහණෙනි, සිවුවන මහණ කවරේ ද.? මහණෙනි, මෙසස්නෙහි මහණ ආශ්‍රවක්ෂය කිරීමෙන් අනාශ්‍රව වූ චෙතොවිමුක්තිය ප්‍රඥාවිමුක්තිය ඉහාත්මයෙහි තමන් විසින් ම විශිෂ්ටඥානයෙන් දැන සාක්ෂාත් කොට එළඹ වෙසේ, මහණෙනි, මේ සිවුවන මහණ යි.

මහණෙනි, පළමු මහණ මෙසස්නෙහි ය, දෙවන මහණ මෙසස්නෙහි ය, තෙවන මහණ මෙසස්නෙහි ය, සිවුවන මහණ මෙසස්නෙහි ය. අන්‍ය වූ පරප්‍රවාදයෝ මහණුන් කෙරෙන් තොරයහ. මහණෙනි, මෙසේ මොනොවට තෙල සිංහනාදය කරව.

## 4. 5. 4. 11.

### [ සප්පුරිසානිසංස සූත්‍රය ]

42. මහණෙනි, සත්පුරුෂයා නිසා අනුසස් සතරෙක් කැමැතිවිය යුතුයි. කවර සතරෙක යත්;

ආර්‍යශීලයෙන් වැඩෙයි. ආර්‍යසමාධියෙන් වැඩෙයි. ආර්‍යප්‍රඥයෙන් වැඩෙයි. ආර්‍යවිමුක්තියෙන් වැඩෙයි.

මහණෙනි, සත්පුරුෂයා නිසා මේ සතර අනුසස් කැමැතිවිය යුතුයි.

**කාමවග්ගය සිවුවැනි යි.**

# 5. ආපත්තිභයවග්ගො

## 4. 5. 5. 1.

### [ පාපභික්ඛුසුත්තං ]

43. එකං සමයං භගවා **කොසම්බියං** විහරති **ඝොසිතාරාමෙ**. අථ ඛො ආයස්මා **ආනන්දො**, යෙන භගවා තෙනුපසඞ්කමි, උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නං ඛො ආයස්මන්තං ආනන්දං භගවා එතදවොච:

අපි නු තං ආනන්ද අධිකරණං වූපසන්තන්ති? “කුතො තං, භන්තෙ අධිකරණං වූපසමිස්සති, ආයස්මතො භන්තෙ **අනුරුද්ධස්ස** **බාහියො** නාම සද්ධිවිහාරිකො කෙවලකප්පං සඞ්ඝභෙදාය ඨිතො, තත්‍රායස්මා අනුරුද්ධො න එකවාචිකම්පි භණිතබ්බං මඤ්ඤතී”ති.

කදා පනානන්ද අනුරුද්ධො සඞ්ඝමජ්ඣෙ අධිකරණෙසු වොයුඤ්ජති? නනු ආනන්ද යානි කානි චි අධිකරණානි උප්පජ්ජන්ති සබ්බානි තානි තුම්හෙ චෙව වූපසමෙථ **සාරිපුත්තමොග්ගල්ලානා** ච.

චත්තාරොමෙ ආනන්ද අත්ථවසෙ සම්පස්සමානො පාපභික්ඛු සඞ්ඝභෙදෙන නන්දති. කතමෙ චත්තාරො?

ඉධානන්ද පාපභික්ඛු දුස්සීලො හොති පාපධම්මො අසුචි සඞ්කස්සරසමාචාරො පටිච්ඡන්නකම්මන්තො අස්සමණො සමණපටිඤ්ඤො අබ්‍රහ්මචාරී බ්‍රහ්මචාරීපටිඤ්ඤො අන්තොපූති අවස්සුතො කසම්බුජාතො. තස්ස එවං හොති: “සචෙ ඛො මං භික්ඛූ ජානිස්සන්ති: ‘දුස්සීලො පාපධම්මො අසුචි සඞ්කස්සරසමාචාරො පටිච්ඡන්නකම්මන්තො අස්සමණො සමණපටිඤ්ඤො අබ්‍රහ්මචාරී බ්‍රහ්මචාරීපටිඤ්ඤො අන්තොපූති අවස්සුතො කසම්බුජාතො’ති, සමග්ගා මං සන්තා නාසිස්සන්ති, වග්ගා පන මං න නාසිස්සන්තී”ති. ඉදං ආනන්ද පඨමං අත්ථවසං සම්පස්සමානො පාපභික්ඛු සඞ්ඝභෙදෙන නන්දති.

පුන ච පරං ආනන්ද පාපභික්ඛු මිච්ඡාදිට්ඨිකො හොති අන්තග්ගාහිකාය දිට්ඨියා සමන්නාගතො. තස්ස එවං හොති: “සචෙ ඛො මං භික්ඛූ ජානිස්සන්ති ‘මිච්ඡාදිට්ඨිකො අන්තග්ගාහිකාය දිට්ඨියා සමන්නාගතො’ති. සමග්ගා මං සන්තා නාසිස්සන්ති. වග්ගා පන මං න නාසිස්සන්තී”ති. ඉදං ආනන්ද දුතියං අත්ථවසං සම්පස්සමානො පාපභික්ඛු සඞ්ඝභෙදෙන නන්දති.

---

1. නාසෙස්සන්ති. - මජසං.

# 5. ආපත්තිභය වර්ගය

## 4. 5. 5. 1.

### [ පාපභික්ඛු සූත්‍රය ]

43. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ **කොසඹෑනුවර ඝොෂිතාරාම** යෙහි වැඩ වසන සේක. ඉක්බිති ආයුෂ්මත් **අනද** තෙරණුවෝ භාග්‍යවතුන් වහන්සේ කරා එළඹියහ. එළඹ භාග්‍යවතුන් වහන්සේ සකසා වැඳ එකත්පස්ව හුන්හ. එකත්පස්ව හුන් ආයුෂ්මත් අනද තෙරණුවන්ට භාග්‍යවතුන් වහන්සේ තෙල වදාළහ:

කිම ආනන්දය, ඒ (උපන්) අධිකරණය සන්සිඳුනේ වේ ද? "වහන්ස, කෙසේ ඒ අධිකරණ සන්සිඳෙන්නේ වේ ද, වහන්ස, ආයුෂ්මත් **අනුරුද්ධ** ස්ථවිරයන් වහන්සේගේ **බාහිය** නම් සද්ධිවිහාරිකයෙක් වටාගෙණ සඟුන් හා විරුද්ධවාදයට සිටියේ ය. එහි ලා ආයුෂ්මත් අනුරුද්ධස්ථවිරයන් වහන්සේ එක් බසකුත් කිණියයුතු සේ නහමක් සිතත්."

ආනන්දය, කිනම් දිනෙක අනුරුද්ධ සඟුන් මැද අධිකරණයෙහි අනුයෝගවනට නැගේ ද, ආනන්දය, යම්කිසි අධිකරණ කෙනෙක් ඇද්ද, එ හැම තෙපි හෝ සන්සිඳුවන්නහු නො වේ ද, **සැරියුත් මුගලන්** දෙනම හෝ සන්සිඳුවන්නාහු නො වේ ද,

ආනන්දය, මේ සතර කරුණක් දක්මින් පවිටු මහණ සඞ්ඝභෙදයෙන් සතුටු වෙයි. කවර සතර කරුණෙක යත්:

ආනන්දය, මෙසස්නෙහි පවිටු මහණ දුසිල් වූයේ, ලමුදහම් ඇතියේ, කෙලෙසුන් විසින් අපවිත්‍ර වූයේ, සැකයෙන් සිහිකළ යුතු හැසිරීම් ඇතියේ, පිළිසන් කර්මාන්ත ඇතියේ, අශ්‍රමණ වූයේත් 'ශ්‍රමණයෙමි සි' ප්‍රතිඥ කරණුයේ, අබ්‍රහමචාරී වූයේත්, 'බ්‍රහමචාරීමි' සි ප්‍රතිඥ කරණුයේ, කෙලෙසුන් විසින් ඇතුළත දුගඳ වූයේ, කෙලෙසුන් විසින් තෙත් වූයේ, හටගත් කෙලෙස්කසළ ඇතියේ වෙයි. ඔහුට මෙබඳු සිතෙක් වෙයි: "ඉදින් මහණහු 'සිල් නැත්තෙක, පාපධර්ම ඇත්තෙක, කෙලෙසුන් විසින් අපවිත්‍රයෙක, සැකයෙන් සිහි කළයුතු හැසිරීම් ඇත්තෙක, පිළිසන් කර්මාන්ත ඇත්තෙක, අශ්‍රමණ වූයේත් 'ශ්‍රමණයෙමි'සි ප්‍රතිඥ කරන්නෙක, අබ්‍රහමචාරී වූයේත්, 'බ්‍රහමචාරීමි'සි ප්‍රතිඥ කරන්නෙක, කෙලෙසුන් විසින් ඇතුළත දුගඳ වූයෙක, කෙලෙසුන් විසින් තෙත් වූයෙක, උපන් කෙලෙස් කසළ ඇතියෙකැ' සි මා දනිත් නම් සමගි වූ ඒ මහණහු මා නෙරත්. වැලිත් වගී වූවාහු මා නො නෙරත්" සියා සි ආනන්දය, මේ පළමුවන කරුණ දක්මින් පවිටු මහණ සඞ්ඝභෙදයෙන් තුටු වෙයි.

නවද ආනන්දය, පවිටු මහණ මිසදිටු ඇතියේ අන්තග්‍රාහදෘෂ්ටියෙන් සමන්වාගත වූයේ වෙයි. ඔහුට මෙබඳු සිතෙක් වෙයි: "ඉදින් භික්ෂූහු 'මිථ්‍යාදෘෂ්ටිකයෙක, අන්තග්‍රාහදෘෂ්ටියෙන් සමන්වාගතයෙකැ' සි මා දනිත් ද, සමගි වූවාහු මා නෙරත්. වගී වූවාහු මා නො නෙරත් ය" සියා සි. ආනන්දය, මේ දෙවන කරුණ දක්මින් පවිටු මහණ සඞ්ඝභෙදයෙන් තුටු වෙයි:

පුන ච පරං ආනන්ද පාපභික්ඛු මිච්ඡාආජීවො හොති. මිච්ඡාජීවෙන ජීවිකං කප්පෙති. තස්ස එවං හොති: "සචෙ ඛො මං භික්ඛූ ජානිස්සන්ති: 'මිච්ඡාආජීවො මිච්ඡාආජීවෙන ජීවිකං කප්පෙතී'ති, සමග්ගා පන මං නාසිස්සන්ති. වග්ගා පන මං න නාසිස්සන්ති"ති. ඉදං ආනන්ද තතියං අත්ථවසං සම්පස්සමානො පාපභික්ඛු සඞ්ඝභෙදෙන නන්දති.

පුන ච පරං ආනන්ද පාපභික්ඛු ලාභකාමො හොති සක්කාරකාමො අනවඤ්ඤත්තිකාමො. තස්ස එවං හොති: "සචෙ ඛො මං භික්ඛූ ජානිස්සන්ති: 'ලාභකාමො සක්කාරකාමො අනවඤ්ඤත්තිකාමො'ති, සමග්ගා මං න සක්කරිස්සන්ති න ගරුකරිස්සන්ති න මානෙස්සන්ති න පූජෙස්සන්ති. වග්ගා පන මං සක්කරිස්සන්ති ගරුකරිස්සන්ති මානෙස්සන්ති පූජෙස්සන්ති"ති. ඉදං ආනන්ද චතුත්ථං අත්ථවසං සම්පස්සමානො පාපභික්ඛු සඞ්ඝභෙදෙන නන්දති.

ඉමෙ ඛො ආනන්ද චත්තාරො අත්ථවසෙ සම්පස්සමානො පාපභික්ඛු සඞ්ඝභෙදෙන නන්දතීති.

## 4. 5. 5. 2.

## [ ආපත්තිභය සුත්තං ]

44. චත්තාරිමානි භික්ඛවෙ ආපත්තිභයානි. කතමානි චත්තාරි?

සෙය්‍යථාපි භික්ඛවෙ චොරං ආගුචාරිං ගහෙත්වා රඤ්ඤො දස්සෙය්‍යුං "අයං තෙ දෙව චොරො ආගුචාරී, ඉමස්ස දෙවො දණ්ඩං පණෙතූ"ති. තමෙනං රාජා එවං වදෙය්‍ය: ගච්ඡථ භො ඉමං පුරිසං දළ්හාය රජ්ජුයා පච්ඡාබාහං ගාළ්හබන්ධනං බන්ධිත්වා ඛුරමුණ්ඩං කරිත්වා ඛරස්සරෙන පණවෙන රථියාය රථියං[1] සිඞ්ඝාටකෙන සිඞ්ඝාටකං පරිනෙත්වා දක්ඛිණද්වාරෙන නික්ඛාමෙත්වා දක්ඛිණතො නගරස්ස සීසං ඡින්දථාති. තමෙනං රඤ්ඤො පුරිසා දළ්හාය රජ්ජුයා පච්ඡාබාහං ගාළ්හබන්ධනං බන්ධිත්වා ඛුරමුණ්ඩං කරිත්වා ඛරස්සරෙන පණවෙන රථියාය රථියං සිඞ්ඝාටකෙන සිඞ්ඝාටකං පරිනෙත්වා දක්ඛිණද්වාරෙන නික්ඛාමෙත්වා දක්ඛිණතො නගරස්ස සීසං ඡින්දෙය්‍යුං. තත්‍රඤ්ඤතරස්ස ථලට්ඨස්ස පුරිසස්ස එවමස්ස පාපකං වත භො අයං පුරිසො කම්මං අකාසි ගාරය්හං සීසච්ඡෙජ්ජං, යත්‍ර හි නාම රඤ්ඤො පුරිසා දළ්හාය රජ්ජුයා පච්ඡාබාහං ගාළ්හබන්ධනං බන්ධිත්වා ඛුරමුණ්ඩං කරිත්වා ඛරස්සරෙන පණවෙන රථියාය රථියං සිඞ්ඝාටකෙන සිඞ්ඝාටකං පරිනෙත්වා දක්ඛිණද්වාරෙන නික්ඛාමෙත්වා දක්ඛිණතො නගරස්ස සීසං ඡින්දිස්සන්ති. සො වතස්සාහං[2] එවරූපං පාපං කම්මං න කරෙය්‍යං[3] ගාරය්හං සීසච්ඡෙජ්ජන්ති.

එවමෙව ඛො භික්ඛවෙ යස්ස කස්සචි භික්ඛුස්ස වා භික්ඛුනියා වා එවං තිබ්බා භයසඤ්ඤා පච්චුපට්ඨිතා හොති පාරාජිකෙසු ධම්මෙසු, තස්සෙතං පාටිකඞ්ඛං: අනාපන්නො වා පාරාජිකං ධම්මං න ආපජ්ජිස්සති. ආපන්නො වා පාරාජිකං ධම්මං යථාධම්මං පටිකරිස්සති.

---

1. රථිකාය රථිකං - මජ්සං. 2. සොවතස්සායං - සීමු. මජ්සං. 3. න කරෙය්‍ය - සීමු.

තවද ආනන්දය, පව්ටූ මහණ මිථ්‍යාආජීව ඇති වෙයි. මිථ්‍යාආජීවයෙන් ජීවිකාව කෙරෙයි. ඔහුට මෙබඳු සිතෙක් වෙයි: "ඉදින් මහණහු 'මිථ්‍යා ආජීව ඇතියෙක. මිථ්‍යා ආජීවයෙන් ජීවිකා කෙරේ ය' යි මා දනිත් නම්, සමග්‍ර වූවාහු මා නෙරත්, ව්‍යග්‍ර වූවාහු මා නො නෙරත්ය" කියා යි. ආනන්දය, මේ තුන්වන කරුණ දක්මින් පව්ටූ මහණ සඞ්ඝභෙදයෙන් තුටූ වෙයි.

තවද ආනන්දය, පව්ටූ මහණ ලාභ කැමැති වෙයි. සත්කාර කැමැති වෙයි. නොගරහනු කැමැති වෙයි. ඔහුට මෙබඳු සිතෙක් වෙයි: "ඉදින් මහණහු 'ලාභ කැමැතියෙක, සත්කාර කැමැතියෙක, නොගරහනු කැමැතියෙකැ' යි මා දනිත් නම්, සමග්‍ර වූවාහු මා නෙරත්, ගරු නො කෙරෙත්, බුහුමන් නො කෙරෙත්, නොපුදත්. ව්‍යග්‍ර වූවාහු මට සත්කාර කරත්, ගරු කරත්, බුහුමන් කෙරෙත්, පූජා කෙරෙති" යි කියා යි. ආනන්දය, මේ සතරවන කරුණ දක්මින් පව්ටූ මහණ සඞ්ඝභේදයෙන් තුටූ වෙයි.

ආනන්දය, මෙ සතර කරුණු දක්මින් පව්ටූ මහණ සඞ්ඝභේදයෙන් තුටූ වෙයි.

## 4. 5. 5. 2.

### [ ආපත්තිභය සූත්‍රය ]

44. මහණෙනි, මේ ආපත්තිභය සතර දෙනෙකි. කවර සතර දෙනෙක යත්:

මහණෙනි, යම් පරිදි අපරාධ කරණ සොරහු ගෙණ රජුට දක්වත් ද, "දේවයෙනි, තොපට මේ සොරු අපරාධකාරීය. මොහුට දේවයෝ දඬුවම් එලවත්වා" කියා යි. රජ තුලුත් ගෙණ මෙසේ කිය යි: 'භවත්නි, යව මේ මිනිසා දලරැහැණින් දෙහොත් පිටත් කොට දැඩියේ බැඳ කර මුඩු කොට කැකුළු හඬ ඇති වදබෙරින් වීථියෙන් වීථියට මංසන්ධියෙන් මංසන්ධියට හැද ගෙණ ගොස් දකුණු දෙරින් නෙරවා නුවරට දකුණු දික්හි හිස සිඳුව" කියා යි. රජුගේ පුරුෂයෝ ඒ සොරහු දලරැහැණින් දෙහොත පිටත ලා හයා දැඩි කොට බැඳ කර මුඩු කොට කැකුළු හඬ ඇති වදබෙරින් වීථියෙන් වීථියට මංසන්ධියෙන් මංසන්ධියට ගෙණ ගොස් දකුණු දෙරින් නෙරවා නුවරට දකුණෙහි හිස සිඳිත්. එහි එකත්පස්ව සිටුනා අන්‍යතර පුරුෂයකුට මෙබඳු සිතෙක් වෙයි: "භවත්නි, මේ මිනිස් ගැරහිය යුතු හිස සිඳිය යුතු ලාමක කර්මයක් කෙළේ ම ය. "භවත්නි, යම් කර්මයක් නිසා යම් පුරුෂයකු රජහුගේ පුරුෂයෝ දලරැහැණින් දෙඅත් පිටත ලා හයා දැඩි කොට බැඳ කර මුඩු කොට කැකුළු හඬ ඇති පණාබෙරින් වීථියෙන් වීථියට මංසන්ධියෙන් මංසන්ධියට ගෙණ ගොස් දකුණු දෙරින් නෙරවා නුවරට දකුණෙහි හිස සිඳිත්තාහු ද, "මේ මිනිස් තෙමේ ගැරහිය යුතු හිස සිඳලිය යුතු එබඳු ලාමක කර්මයක් කෙළේම ය. හෙ මම නම් මෙබඳු ගැරහියයුතු හිස් සිඳියයුතු පාපකර්මයක් නො කෙරෙමි" යි.

මහණෙනි, එපරිද්දම යම් කිසි මහණකුට හෝ මෙහෙණකට හෝ පරිජ්දහම්හි මෙසේ තීව්‍රභය සංඥ එළඹ සිටී ද, ඔහුට මෙල කැමැති වියයුතුයි: පරිජිඇවැතට නො පැමිණියේ පරිජිඇවැතට නො පැමිණෙන්නේ ය. පරිජි-ඇවැතට අවන්නේ හෝ ධර්මානුරූප කොට ප්‍රතිකර්ම කරන්නේය (=හෙරණ බැව්හි සිටුනේ ය.)

සෙය්‍යථාපි භික්ඛවෙ පුරිසො කාළකං වත්ථං[1] පරිධාය කෙසෙ පකිරිත්වා මුසලං ඛන්ධෙ ආරොපෙත්වා මහාජනකායං උපසඞ්කමිත්වා එවං වදෙය්‍ය: “අහං භන්තෙ පාපං කම්මං අකාසිං ගාරය්හං මොසල්ලං. යෙන මෙ ආයස්මන්තො අත්තමනා හොන්ති තං කරොමී”ති. තත්‍රඤ්ඤතරස්ස ථලට්ඨස්ස පුරිසස්ස එවමස්ස: “පාපකං වත භො අයං පුරිසො කම්මං අකාසි ගාරය්හං මොසල්ලං, යත්‍ර හි නාම කාළකං වත්ථං පරිධාය කෙසෙ පකිරිත්වා මුසලං ඛන්ධෙ ආරොපෙත්වා මහාජනකායං උපසඞ්කමිත්වා එවං වක්ඛති: ‘අහං භන්තෙ පාපං කම්මං අකාසිං ගාරය්හං මොසල්ලං. යෙන මෙ ආයස්මන්තො අත්තමනා හොන්ති, තං කරොමී’ති. සො වතාස්සාහං එවරූපං පාපං කම්මං න කරෙය්‍යං ගාරය්හං මොසල්ලන්ති.”

එවමෙව ඛො භික්ඛවෙ යස්ස කස්සචි භික්ඛුස්ස වා භික්ඛුනියා වා එවං තිබ්බා භයසඤ්ඤා පච්චුපට්ඨිතා හොති සඞ්ඝාදිසෙසෙසු ධම්මෙසු, තස්සෙතං පාටිකඞ්ඛං: අනාපන්නො වා සඞ්ඝාදිසෙසං ධම්මං න ආපජ්ජිස්සති. ආපන්නො වා සඞ්ඝාදිසෙසං ධම්මං යථාධම්මං පටිකරිස්සති.

සෙය්‍යථාපි භික්ඛවෙ පුරිසො කාළකං වත්ථං පරිධාය කෙසෙ පකිරිත්වා අස්සපුටං[2] ඛන්ධෙ ආරොපෙත්වා මහාජනකායං උපසඞ්කමිත්වා එවං වදෙය්‍ය: “අහං භන්තෙ පාපං කම්මං අකාසිං ගාරය්හං අස්සපුටං යෙන මෙ ආයස්මන්තො අත්තමනා හොන්ති, තං කරොමී”ති තත්‍රඤ්ඤතරස්ස ථලට්ඨස්ස පුරිසස්ස එවමස්ස: “පාපකං වත භො අයං පුරිසො කම්මං අකාසි ගාරය්හං අස්සපුටං. යත්‍ර හි නාම කාළකං වත්ථං පරිධාය කෙසෙ පකිරිත්වා අස්සපුටං ඛන්ධෙ ආරොපෙත්වා මහාජනකායං උපසඞ්කමිත්වා එවං වක්ඛති: ‘අහං භන්තෙ පාපං කම්මං අකාසිං ගාරය්හං අස්සපුටං, යෙන මෙ ආයස්මන්තො අත්තමනා හොන්ති, තං කරොමී’ති. සො වතාස්සාහං එවරූපං පාපං කම්මං න කරෙය්‍යං ගාරය්හං අස්සපුටන්ති.”

එවමෙව ඛො භික්ඛවෙ යස්ස කස්සචි භික්ඛුස්ස වා භික්ඛුනියා වා එවං තිබ්බා භයසඤ්ඤා පච්චුපට්ඨිතා හොති පාචිත්තියෙසු ධම්මෙසු, තස්සෙතං පාටිකඞ්ඛං: අනාපන්නො වා පාචිත්තියං ධම්මං න ආපජ්ජිස්සති. ආපන්නො වා පාචිත්තියං ධම්මං යථා ධම්මං පටිකරිස්සති.

සෙය්‍යථාපි භික්ඛවෙ පුරිසො කාළකං වත්ථං පරිධාය කෙසෙ පකිරිත්වා මහාජනකායං උපසඞ්කමිත්වා එවං වදෙය්‍ය: “අහං භන්තෙ පාපං කම්මං අකාසිං ගාරය්හං උපවජ්ජං. යෙන මෙ ආයස්මන්තො අත්තමනා හොන්ති, තං කරොමී”ති තත්‍රඤ්ඤතරස්ස ථලට්ඨස්ස පුරිසස්ස එවමස්ස. “පාපකං වත භො අයං පුරිසො කම්මං අකාසි ගාරය්හං උපවජ්ජං, යත්‍ර හි නාම කාළකං වත්ථං පරිධාය කෙසෙ පකිරිත්වා මහාජනකායං උපසඞ්කමිත්වා එවං වක්ඛති: ‘අහං භන්තෙ පාපං කම්මං අකාසිං ගාරය්හං උපවජ්ජං. යෙන මෙ ආයස්මන්තො අත්තමනා හොන්ති, තං කරොමී’ති. සො වතාස්සාහං එවරූපං පාපං කම්මං න කරෙය්‍යං ගාරය්හං උපවජ්ජන්ති.”

එවමෙව ඛො භික්ඛවෙ යස්ස කස්සචි භික්ඛුස්ස වා භික්ඛුනියා වා එවං තිබ්බා භයසඤ්ඤා පච්චුපට්ඨිතා හොති පාටිදෙසනීයෙසු ධම්මෙසු, තස්සෙතං පාටිකඞ්ඛං: අනාපන්නො වා පාටිදෙසනීයං ධම්මං න ආපජ්ජිස්සති. ආපන්නො වා පාටිදෙසනීයං ධම්මං යථා ධම්මං පටිකරිස්සති.

ඉමානි ඛො භික්ඛවෙ චත්තාරි ආපත්තිභයානීති.

1. කාළවත්ථං - මජ්ඣං. 2. භස්මපුටං. මජ්ඣං.

මහණෙනි, යම් පරිදි පුරුෂයෙක් කළුවතක් හැඳ කෙස් විසුරුවා ගෙණ මොහොලක් කර තබා ගෙණ මහාජනකායට වැද මෙසේ කියන්නේ වේ ද: භවත්නි, මම ගැරහිය යුතු මොහොල් පහරට නිසි පාපකර්මයක් කෙළෙමි ආයුෂ්මත්හු මට දෙන යම් දඬුවමෙකින් සතුටු වවූ නම්, එය කෙරෙමි කියා යි. එහි දී එකත්පස්ව සිටුනා එක්තරා පුරුෂයකුට මෙබඳු සිතෙක් වෙයි: "භවත්නි, 'මම ගැරහිය යුතු මොහොලින් පහර දිය යුතු පාපකර්මයක් කෙළෙමි. ආයුෂ්මත්හු මට කරණ යම් දඬුවමෙකින් සතුටු වවූ ද ඒ කෙරෙමි'' යි යම් පුරුෂයෙක් කළුවතක් හැඳ කෙස් විසුරුවා ගෙණ මොහොලක් කර තබා ගෙණ මහජනකායට එළඹ මෙසේ කී ද,' මේ පුරුෂ ගැරහිය යුතු, මොහොලින් පහර දියයුතු, එබඳු පව්කමක් කෙළේ ය. හේ මම නම් එබඳු ගැරහිය යුතු මොහොලින් පහර දියයුතු පාපකර්මයක් නො කෙරෙමි ම ය."

මහණෙනි, එපරිදි ම යම් කිසි මහණකුට හෝ මෙහෙණකට හෝ සඞ්ඝාදිසෙස් ඇවැත්හි මෙබඳු තීව්‍රභයසංඥ එළඹ සිටියා වේ ද, ඔහුට මෙල කැමැති විය යුතුයි: සඞ්ඝාදිසෙස් ඇවැතට නො පැමිණියේ හෝ නො අවද-නේ ය. සඞ්ඝාදිසෙස් ඇවැතට අවන්නේ හෝ ධර්මානුකූල කොට ප්‍රතිකර්ම කරන්නේ ය.

මහණෙනි, යම් පරිදි පුරුෂයෙක් කළුවතක් හැඳ කෙස් විසුරුවා ගෙණ හළු පොදියක් කර තබා ගෙණ මහාජනකායට වැද මෙසේ කියන්නේ වේ ද: "භවත්නි, මම හළුපොදියෙන් හිසැ පැහැරිය යුතු පාපකර්මයක් කෙළෙමි. ආයුෂ්මත්හු මට කරණ යම් දඬුවමෙකින් සතුටු වවූ ද, එය කෙරෙමි'' යි. එහිදී එකත්පස්ව සිටුනා එක්තරා පුරුෂයකුට මෙබඳු සිතෙක් වෙයි: "භවත්නි, 'මම ගැරහිය යුතු හළු පොදියෙන් හිස පහර දුනමනා පාපකර්මයක් කෙළෙමි. ආයුෂ්මත්හු මට කරණ යම් දඬුවමෙකින් සතුටු වවූ ද, එය කෙරෙමි' යි කියා යම් පුරුෂයෙක් කළුවතක් හැඳ කෙස් විසුරුවා ගෙණ හළුපොදියක් කර තබා ගෙණ මහාජනකායට එළඹ මෙසේ කියේ වේ ද, හේ මම නම් මෙබඳු ගැරහිය යුතු හළු පොදියක් තබා පහළ යුතු පාපකර්මයක් නො කෙරෙමි'' යි.

මහණෙනි, එපරිදි ම යම් කිසි මහණකුට හෝ මෙහෙණකට හෝ පචිති ඇවැත්හි මෙසේ තීව්‍ර වූ භය සංඥව එළඹ සිටියා වේ ද, ඔහුට මෙල කැමැති විය යුතුය: පචිති ඇවැතට නො පැමිණියේ හෝ එයට නො අවදනේ යි. පචිති ඇවැතට අවන්නේ හෝ ධර්මානුකූල කොට ප්‍රතිකර්ම කරන්නේ ය.

මහණෙනි, යම් පරිදි පුරුෂයෙක් කළුවතක් හැඳ කෙස් විසුරුවා ගෙණ මහාජනකායට වැද මෙසේ කියන්නේ වේ ද: "භවත්නි, මම ගැරහිය යුතු උපවාද කළ යුතු පාපකර්මයක් කෙළෙමි. ආයුෂ්මත්හු මට කරණ යම් දඬුවමකින් සතුටු වවූ ද, එය කෙරෙමි කියා යි. එහි දී එකත්පස්ව සිටුනා එක්තරා පුරුෂයකුට මෙබඳු සිතෙක් වෙයි: "භවත්නි, 'මම ගැරහිය යුතු උපවාද කළයුතු පාපකර්මයක් කෙළෙමි. ආයුෂ්මත්හු මට කරණ යම් දඬුවමකින් සතුටු වවූ ද, එය කෙරෙමි' යි කියා යම් පුරුෂයෙක් කළුවතක් හැඳ කෙස් විසුරුවා ගෙණ මහාජනකායට අවුත් මෙසේ කී ද, ඉන් මම නම් මෙබඳු ගැරහිය යුතු උපවාද කළයුතු පව්කමක් නො කරමි. කියා යි.

මහණෙනි, එපරිදි ම යම් කිසි මහණකුට හෝ මෙහෙණකට හෝ පාටිදෙසනීය ඇවැත්හි මෙසේ තීව්‍ර වූ භයසංඥව එළඹ සිටී ද, ඔහුට මෙය කැමැති විය යුතුය: පාටිදෙසනීය ඇවැතට නො පැමිණියේ හෝ නො අවදනේ ය. පාටිදෙසනීය ඇවැතට අවන්නේ හෝ ධර්මානුකූල කොට ප්‍රතිකර්ම කරන්නේ ය කියා යි.

මහණෙනි, මේ සතර ආපත්තිභයයහ.

## 4. 5. 5. 3

## [ සික්ඛානිසංසසුත්තං ]

45. සික්ඛානිසංසමිදං භික්ඛවෙ බ්‍රහ්මචරියං වුස්සති පඤ්ඤුත්තරං විමුත්තිසාරං සතාධිපතෙය්‍යං.

කථඤ්ච භික්ඛවෙ සික්ඛානිසංසං හොති? ඉධ භික්ඛවෙ මයා සාවකානං ආභිසමාචාරිකා සික්ඛා පඤ්ඤත්තා අප්පසන්නානං පසාදාය, පසන්නානං භිය්‍යොභාවාය. යථා යථා භික්ඛවෙ මයා සාවකානං ආභිසමාචාරිකා සික්ඛා පඤ්ඤත්තා අප්පසන්නානං පසාදාය, පසන්නානං භිය්‍යොභාවාය, තථා තථා සො තස්සා සික්ඛාය අඛණ්ඩකාරී හොති අච්ඡිද්දකාරී අසබලකාරී අකම්මාසකාරී. සමාදාය සික්ඛති සික්ඛාපදෙසු. පුන චපරං භික්ඛවෙ මයා සාවකානං ආදිබ්‍රහ්මචරියිකා සික්ඛා පඤ්ඤත්තා සබ්බසො සම්මා දුක්ඛක්ඛයාය. යථා යථා භික්ඛවෙ මයා සාවකානං ආදිබ්‍රහ්මචරියිකා සික්ඛා පඤ්ඤත්තා සබ්බසො සම්මා දුක්ඛක්ඛයාය. තථා තථා සො තස්සා සික්ඛාය අඛණ්ඩකාරී හොති. අච්ඡිද්දකාරී අසබලකාරී අකම්මාසකාරී සමාදාය සික්ඛති සික්ඛාපදෙසු. එවං භික්ඛවෙ සික්ඛානිසංසං හොති.

කථඤ්ච භික්ඛවෙ පඤ්ඤුත්තරං හොති? ඉධ භික්ඛවෙ මයා සාවකානං ධම්මා දෙසිතා සබ්බසො සම්මා දුක්ඛක්ඛයාය. යථා යථා භික්ඛවෙ මයා සාවකානං ධම්මා දෙසිතා සබ්බසො සම්මා දුක්ඛක්ඛයාය, තථා තථාස්ස තෙ ධම්මා පඤ්ඤාය සමවෙක්ඛිතා හොන්ති. එවං ඛො භික්ඛවෙ පඤ්ඤුත්තරං හොති.

කථඤ්ච භික්ඛවෙ විමුත්තිසාරං හොති? ඉධ භික්ඛවෙ මයා සාවකානං ධම්මා දෙසිතා සබ්බසො සම්මා දුක්ඛක්ඛයාය යථා යථා භික්ඛවෙ මයා සාවකානං ධම්මා දෙසිතා සබ්බසො සම්මා දුක්ඛක්ඛයාය, තථා තථාස්ස තෙ ධම්මා විමුත්තියා ඵස්සිතා[2] හොන්ති. එවං ඛො භික්ඛවෙ විමුත්තිසාරං[1] හොති.

කථඤ්ච භික්ඛවෙ සතාධිපතෙය්‍යං හොති? ඉති අපරිපූරං වා ආභිසමාචාරිකං සික්ඛං පරිපූරෙස්සාමි, පරිපූරං වා ආභිසමාචාරිකං සික්ඛං තත්‍ථ තත්‍ථ පඤ්ඤාය අනුග්ගහෙස්සාමීති. අජ්ඣත්තං යෙව සති සූපට්ඨිතා හොති. ඉති අපරිපූරං වා ආදිබ්‍රහ්මචරියිකං සික්ඛං පරිපූරෙස්සාමි, පරිපූරං වා ආදිබ්‍රහ්මචරියිකං සික්ඛං තත්‍ථ තත්‍ථ පඤ්ඤාය අනුග්ගහෙස්සාමීති අජ්ඣත්තං යෙව සති සූපට්ඨිතා හොති. ඉති අසමවෙක්ඛිතං වා ධම්මං පඤ්ඤාය සමවෙක්ඛිස්සාමි, සමවෙක්ඛිතං වා ධම්මං තත්‍ථ තත්‍ථ පඤ්ඤාය අනුග්ගහෙස්සාමීති අජ්ඣත්තං යෙව සති සූපට්ඨිතා හොති. ඉති අඵස්සිතං වා ධම්මං විමුත්තියා ඵස්සිස්සාමි.[3] ඵස්සිතං[4] වා ධම්මං තත්‍ථ තත්‍ථ පඤ්ඤාය අනුග්ගහෙස්සාමීති අජ්ඣත්තං යෙව සති සූපට්ඨිතා හොති එවං ඛො භික්ඛවෙ සතාධිපතෙය්‍යං 'හොති.

---

1, විමුත්තිසාරං - සීමු. 2. ඵුසිතා, මජසං. 3 ඵුසිස්සාමි — මජසං. 4. ඵුසිතං මජසං.

## 4. 5. 5. 3.

## [ සික්ඛාපදානිසංස සූත්‍රය ]

45. මහණෙනි, ශික්‍ෂා අනුසස් කොට ඇති, ප්‍රඥා උතුම් කොට ඇති, විමුක්ති හර කොට ඇති, සමෘති ආධිපත්‍යය කොට ඇති, මේ බඹසර වසනු ලැබේ.

මහණෙනි, මේ බඹසර කෙසේ ශික්‍ෂා අනුසස් කොට ඇත්තේය යත්: මහණෙනි, මෙසස්නෙහි සව්වනට මා විසින් අප්‍රසන්නයන්ගේ ප්‍රසාදය පිණිස, ප්‍රසන්නයන්ගේ භූයොභාවය පිණිස ආභිසමාචාරික (උතුම්වත් පිළිබඳ) ශික්‍ෂා පණවන ලද්දී. මහණෙනි, යම් යම් සැටියෙකින් මා විසින් අප්‍රසන්නයන්ගේ ප්‍රසාදය පිණිස ප්‍රසන්නයන්ගේ භූයොභාවය පිණිස සව්වනට ආභිසමාචාරික ශික්‍ෂා පණවන ලද ද, ඒ ඒ සැටියෙන් හේ (ශික්‍ෂාකාමී මහණ තෙම) ඒ ශික්‍ෂායෙහි අඛණ්ඩකාරී වේ. අච්ඡිද්‍රකාරී වේ. අශබලකාරී වේ. අකල්මාෂකාරී වේ. මොනොවට සමාදන්ව ශික්‍ෂාපදයෙහි හික්මේ. තව ද මහණෙනි, මා විසින් සර්වප්‍රකාරයෙන් මොනොවට දුක් නස්නා පිණිස ශ්‍රාවකයනට ආදිබ්‍රහමචර්‍යය [මාර්ගබ්‍රහමචර්‍යයට මුල් වූ සංවර) ශික්‍ෂා පණවන ලද්දී. මහණෙනි, යම් යම් සැටියෙකින් මා විසින් සර්වප්‍රකාරයෙන් මොනොවට දුක් නස්නා පිණිස ශ්‍රාවකයනට ආදිබ්‍රහමචර්‍යයිකශික්‍ෂා පණවන ලදු ද, ඒ ඒ සැටියෙන් හේ ඒ ශික්‍ෂායෙහි අඛණ්ඩකාරී වෙයි. අච්ඡිද්‍රකාරී වෙයි. අශබලකාරී වෙයි. අකල්මාෂකාරී වෙයි. මොනොවට සමාදන් ව ශික්‍ෂාපදයෙහි හික්මෙයි. මහණෙනි, මෙසේ මේ බඹසර ශික්‍ෂා අනුසස් කොට ඇති වෙයි.

මහණෙනි, බඹසර කෙසේ ප්‍රඥාව උත්තර කොට ඇත්තේය යත්: මහණෙනි, මෙසස්නෙහි සව්වනට මා විසින් සර්වප්‍රකාරයෙන් මොනොවට දුක් නසනු පිණිස චතුඃසත්‍ය ධර්මයෝ දෙසන ලදහ. මහණෙනි, යම් යම් සැටියෙකින් මා විසින් සර්වප්‍රකාරයෙන් මොනොවට දුක් නසනු පිණිස ශ්‍රාවකයනට දහම් දෙසන ලද ද, ඒ ඒ සැටියෙන් ඔහු විසින් ඒ ධර්මයෝ ප්‍රඥායෙන් මොනොවට අවබොධ කරණ ලද්දාහු වෙත්. මහණෙනි, මෙසේ මේ බඹසර ප්‍රඥාව උත්තර කොට ඇත් වෙයි.

මහණෙනි, බඹසර කෙසේ විමුක්තිය සාර කොට ඇත්තේය යත්: මහණෙනි, මෙසස්නෙහි මා විසින් සර්වප්‍රකාරයෙන් දුක් නසනු පිණිස ශ්‍රාවකයනට දහම් දෙසන ලදී. මහණෙනි, යම් යම් සැටියකින් මා විසින් සර්වප්‍රකාරයෙන් මොනොවට දුක් නසනු පිණිස ශ්‍රාවකයනට දහම් දෙසන ලද ද, ඒ ඒ සැටියෙන් ඔහු විසින් ඒ ධර්මයෝ විමුක්ති (ඥාන) යෙන් පහස්නා ලද්දාහු වෙති. මහණෙනි, මෙසේ බඹසර විමුක්තිය සාර කොට ඇත්තේ වෙයි.

මහණෙනි, කෙසේ බඹසර සමෘතිය ආධිපත්‍යය කොට ඇත්තේය යත්: මෙසේ අපරිපූර්ණ වූ හෝ ආභිසමාචාරිකශික්‍ෂා පුරමි යි, පරිපූර්ණ වූ හෝ ආභිසමාචාරිකශික්‍ෂා ඒ ඒ තැන විදර්ශනාප්‍රඥායෙන් ලුහුබැඳ ගන්මි යි තමා සතන්හි සමෘතිය මොනොවට එළඹ සිටුනී වෙයි. මෙසේ අපරිපූර්ණ වූ හෝ ආදිබ්‍රහමචර්‍යයිකශික්‍ෂා පුරමි යි, පරිපූර්ණ වූ හෝ ආදිබ්‍රහමචර්‍යයිකශික්‍ෂා ඒ ඒ තැන විදර්ශනා ප්‍රඥායෙන් ලුහුබැඳ ගන්මි යි අධ්‍යාත්මයෙහි ම සමෘතිය මොනොවට එළඹ සිටුනී වෙයි. මෙසේ මාර්ගප්‍රඥායෙන් නො දක්නා ලද හෝ චතුස්සත්‍යධර්මය මාර්ගප්‍රඥායෙන් දක්මි යි මාර්ගප්‍රඥායෙන් දක්නා ලද හෝ චතුස්සත්‍යධර්මය ඒ ඒ තැන මාර්ගප්‍රඥායෙන් ලුහුබැඳ ගන්මි යි අධ්‍යාත්මයෙහි ම සමෘතිය මොනොවට එළඹ සිටුනී වෙයි. මෙසේ ඥානස්පර්ශයෙන් නො පහස්නා ලද ධර්මය අර්හත්ඵලවිමුක්තියෙන් පහස්නෙමි යි පහස්නා ලද හෝ ධර්මය ඒ ඒ තැන ප්‍රඥායෙන් ලුහුබැඳ ගන්මි යි අධ්‍යාත්මයෙහි ම සමෘතිය මොනොවට එළඹ සිටුනී වෙයි. මහණෙනි, මෙසේ බඹසර සමෘතිය අධිපති කොට ඇති වෙයි.

සික්ඛානිසංසමිදං භික්ඛවෙ බ්‍රහ්මචරියං වුස්සති පඤ්ඤුත්තරං විමුත්තිසාරං සතාධිපතෙය්‍යන්ති ඉති යං තං වුත්තං, ඉදමෙතං පටිච්ච වුත්තන්ති.

### 4. 5. 5. 4

### [ සෙය්‍යාසුත්තං ]

46. චතස්සො ඉමා භික්ඛවෙ සෙය්‍යා. කතමා චතස්සො?

පෙතසෙය්‍යා, කාමභොගිසෙය්‍යා, සීහසෙය්‍යා, තථාගතසෙය්‍යා

කතමා ච භික්ඛවෙ පෙතසෙය්‍යා? යෙභුය්‍යෙන භික්ඛවෙ පෙතා උත්තානා සෙන්ති. අයං වුච්චති භික්ඛවෙ පෙතසෙය්‍යා.

කතමා ච භික්ඛවෙ කාමභොගිසෙය්‍යා? යෙභුය්‍යෙන භික්ඛවෙ කාමභොගී වාමෙන පස්සෙන සෙන්ති. අයං වුච්චති භික්ඛවෙ කාමභොගිසෙය්‍යා.

කතමා ච භික්ඛවෙ සීහසෙය්‍යා? සීහො භික්ඛවෙ මිගරාජා දක්ඛිණෙන පස්සෙන සෙය්‍යං කප්පෙති පාදෙ පාදං අච්චාධාය, අන්තරා සත්ථිං නඞ්ගුට්ඨං අනුපක්ඛිපිත්වා. සො පටිබුජ්ඣිත්වා පුරිමං කායං අබ්භුන්නාමෙත්වා පච්ඡිමං කායං අනුවිලොකෙති. සචෙ භික්ඛවෙ සීහො මිගරාජා කිඤ්චි පස්සති කායස්ස වික්ඛිත්තං වා විසටං වා, තෙන භික්ඛවෙ සීහො මිගරාජා අනත්තමනො හොති. සචෙ පන භික්ඛවෙ සීහො මිගරාජා න කිඤ්චි පස්සති කායස්ස වික්ඛිත්තං වා විසටං වා, තෙන භික්ඛවෙ සීහො මිගරාජා අත්තමනො හොති. අයං වුච්චති භික්ඛවෙ සීහසෙය්‍යා.

කතමා ච භික්ඛවෙ තථාගතසෙය්‍යා? ඉධ භික්ඛවෙ තථාගතො විවිච්චෙව කාමෙහි [-පෙ- පඨමං ඣානං -පෙ- දුතියං ඣානං -පෙ- තතියං ඣානං] -පෙ- චතුත්ථං ඣානං උපසම්පජ්ජ විහරති. අයං වුච්චති භික්ඛවෙ තථාගතසෙය්‍යා.

ඉමා ඛො භික්ඛවෙ චතස්සො සෙය්‍යාති

### 4. 5. 5. 5

### [ ථූපාරහසුත්තං ]

47. චත්තාරොමෙ භික්ඛවෙ ථූපාරහා. කතමෙ චත්තාරො?

තථාගතො අරහං සම්මාසම්බුද්ධො ථූපාරහො, පච්චෙකබුද්ධො ථූපාරහො, තථාගතසාවකො ථූපාරහො, රාජා චක්කවත්තී ථූපාරහො.

ඉමෙ ඛො භික්ඛවෙ චත්තාරො ථූපාරහාති.

### 4. 5. 5. 6

### [ පඤ්ඤාවුද්ධි සුත්තං ]

48. චත්තාරොමෙ භික්ඛවෙ ධම්මා පඤ්ඤාවුද්ධියා සංවත්තන්ති. කතමෙ චත්තාරො?

සප්පුරිසසංසෙවො, සද්ධම්මස්සවණං, යොනිසො මනසිකාරො, ධම්මානුධම්මපටිපත්ති

ඉමෙ ඛො භික්ඛවෙ චත්තාරො ධම්මා පඤ්ඤාවුද්ධියා සංවත්තන්තීති.

---

1. අන්තරසත්ථිම්හි - මජසං.

මහණෙනි, ශික්ෂා අනුසස් කොට ඇති, ප්‍රඥ උත්තර කොට ඇති, විමුක්තිය හර කොට ඇති, සමෘතිය ආධිපත්‍යය කොට ඇති, මේ බඹසර වැසේය යි මෙසේ යමක් වදාරණ ලදද, මෙය තෙල කරුණ පිණිස වදාරණ ලදී.

## 4. 5. 5. 4.

## [ ශෙය්‍යා සුත්‍රය ]

46. මහණෙනි, මේ ශය්‍යාවෝ සතර දෙනෙකි. කවර සතර දෙනෙක යත්:

ප්‍රෙතශය්‍යා ය, කාමභොගිශය්‍යා ය, සිංහශය්‍යා ය, තථාගතශය්‍යා යි.

මහණෙනි, ප්‍රෙතශය්‍යා කවර? මහණෙනි, මළාහු උඩුහුරුව හොවිත්. මහණෙනි, මේ ප්‍රෙතශය්‍යා යි කියනු ලැබේ.

මහණෙනි, කාමභොගීශය්‍යා නම් කවර? මහණෙනි, බෙහෙවින් කාමභොගීහු වම්පසින් හොවිත්. මහණෙනි, මේ කාමභොගීශය්‍යා යි කියනු ලැබේ.

මහණෙනි, සිංහශය්‍යා නම් කවර? මහණෙනි, මෘගරජව් වූ සිංහ පාපිට පය මඳක් ඇද කබා දෙකලවේ අතර නගුට බහා තබා දකුණු ඇලයෙන් ශය්‍යා කෙරෙයි. හේ පිබිද උඩුකය නගාගෙණ යටකය විමසා බලයි. මහණෙනි, ඉදින් මෘගරජව් වූ සිංහ ශරීරවයව විසිරීමක් හෝ විහිරීමක් හෝ කිසිත් ඉදින් දක්තේ නම් මහණෙනි, එයින් මෘගරජව් වූ සිංහ නො සතුටු වෙයි. මහණෙනි, මෘගරජව් වූ සිංහ ශරීරවයව විසිරීමක් හෝ විහිරීමක් හෝ කිසිත් නොදක්තේ නම්, මහණෙනි, එයින් මෘගරජව් වූ සිංහ සතුටු වෙයි. මහණෙනි, මේ සිංහශය්‍යා යි කියනු ලැබේ.

මහණෙනි, තථාගතශය්‍යා නම් කවර? මහණෙනි, මෙලොව තථාගතයන් වහන්සේ කාමයෙන් වෙන්ව ම ... ප්‍රථම ධ්‍යානයට ... ද්විතීය ධ්‍යානයට ... තෘතීය ධ්‍යානයට ... චතුර්ථධ්‍යානයට එළඹ වෙසෙති. මහණෙනි, මේ තථාගතශය්‍යා යි කියනු ලැබේ.

මහණෙනි, මේ සතර ශය්‍යාවෝ යි.

## 4. 5. 5. 5.

## [ ථූපාරහ සුත්‍රය ]

47. මහණෙනි, මේ ථූපාරහ පුද්ගලයෝ සතර දෙනෙකි. කවර සතර දෙනෙක යත්:

තථාගත අර්හත් සම්‍යක්සම්බුද්ධයන් වහන්සේ ථූපාරහයහ. ප්‍රත්‍යෙක සම්බුද්ධයන් වහන්සේ ථූපාරහයහ. තථාගතශ්‍රාවකයන් වහන්සේ ථූපාරහයහ. සක්විති රජ ථූපාරහ යි.

මහණෙනි, මේ සතර දෙනා ථූපාරහයයෝ (=සෑ බැඳ පුදන්නට නිස්සෝ) යි.

## 4. 5. 5. 6.

## [ ප්‍රඥාවෘද්ධි සුත්‍රය ]

48. මහණෙනි, මේ සතර දහම් කෙනෙක් ප්‍රඥාවෘද්ධිය පිණිස පවතිත්. කවර සතර දහම් කෙනෙක යත්:

සත්පුරුෂයන් සෙවුනාබව ය, සද්ධර්මශ්‍රවණ ය, නුවණින් මෙනෙහි කිරීම ය, ධර්මානුධර්මප්‍රතිපත් ය.

මහණෙනි, මේ සතර දහම්හු ප්‍රඥාවෘද්ධිය පිණිස පවතිත්.

4 5 5 7

[ බහුකාරසුත්තං ]

49. චත්තාරොමෙ භික්ඛවෙ ධම්මා මනුස්සභූතස්ස බහුකාරා හොන්ති: කතමෙ චත්තාරො?

සප්පුරිසසංසෙවො, සද්ධම්මසවණං, යොනිසො මනසිකාරො, ධම්මානුධම්මපටිපත්ති.

ඉමෙ ඛො භික්ඛවෙ චත්තාරො ධම්මා මනුස්සභූතස්ස බහුකාරා හොන්තීති.

4. 5. 5 8

[ අනරිය වොහාරසුත්තං ]

50. චත්තාරොමෙ භික්ඛවෙ අනරියවොහාරා. කතමෙ චත්තාරො?

අදිට්ඨෙ දිට්ඨවාදිතා, අසුතෙ සුතවාදිතා, අමුතෙ මුතවාදිතා, අවිඤ්ඤාතෙ විඤ්ඤාතවාදිතා

ඉමෙ ඛො භික්ඛවෙ චත්තාරො අනරියවොහාරාති

4. 5. 5 9

[ අරිය වොහාරසුත්තං ]

51. චත්තාරොමෙ භික්ඛවෙ අරියවොහාරා. කතමෙ චත්තාරො?

අදිට්ඨෙ අදිට්ඨවාදිතා, අසුතෙ අසුතවාදිතා, අමුතෙ අමුතවාදිතා, අවිඤ්ඤාතෙ අවිඤ්ඤාතවාදිතා.

ඉමෙ ඛො භික්ඛවෙ චත්තාරො අරියවොහාරාති

4. 5 5. 10

[ අනරිය වොහාරසුත්තං ]

52. චත්තාරොමෙ භික්ඛවෙ අනරියවොහාරා. කතමෙ චත්තාරො?

දිට්ඨෙ අදිට්ඨවාදිතා, සුතෙ අසුතවාදිතා, මුතෙ අමුතවාදිතා, විඤ්ඤාතෙ අවිඤ්ඤාතවාදිතා.

ඉමෙ ඛො භික්ඛවෙ චත්තාරො අනරියවොහාරාති

4. 5. 5 12

[ අරිය වොහාරසුත්තං ]

53. චත්තාරොමෙ භික්ඛවෙ අරියවොහාරා. කතමෙ චත්තාරො?
දිට්ඨෙ දිට්ඨවාදිතා,[1] සුතෙ සුතවාදිතා, මුතෙ මුතවාදිතා විඤ්ඤාතෙ විඤ්ඤාතවාදිතා.

ඉමෙ ඛො භික්ඛවෙ චත්තාරො අරියවොහාරාති.

ආපත්තිභයවග්ගො පඤ්චමො *

පණ්ණාසකං පඤ්චමං.

1. 'දිට්ඨවාදී' හොති, ආදි, සීමු.

* තස්සුද්දානං-

සෙද ආපත්ති සික්ඛා ච සෙය්‍යා ථූපාරහෙන ච
පඤ්ඤාවුද්ධි බහුකාරා වොහාරා චතුරො තීතාති - මජ්ඣං

4. 5. 5. 7.

[ බහුකාර සූත්‍රය ]

49. මහණෙනි, සතර දහම් කෙනෙක් මනුෂ්‍යබූවක්හට බොහෝ උපකාර වෙති. කවර සතර දහම් කෙනෙක යත්:

සත්පුරුෂයන් සෙවුනා බව ය. සද්ධර්මශ්‍රවණ ය, නුවණින් මෙනෙහි කිරීම ය, ධර්මානුධර්ම ප්‍රතිපත්ය යි.

මහණෙනි, මේ සතර දහම්හු මනුෂ්‍ය බූවක්හට බොහෝ උපකාර වෙති.

4. 5. 5. 8.

[ අනාර්යවෝහාර සූත්‍රය ]

50. මහණෙනි, මේ අනාර්ය ව්‍යවහාරයෝ සතර දෙනෙකි. කවර සතර දෙනෙක යත්:

අදෘෂ්ටයෙහි දෘෂ්ටවාදිතා ය, අශ්‍රුතයෙහි ශ්‍රැතවාදිතා ය, අමූතයෙහි මූතවාදිතා ය. අවිඥාතයෙහි විඥාතවාදිතා යි.

මහණෙනි, මේ සතර අනාර්ය ව්‍යවහාරයෝ යි.

4. 5. 5. 9.

[ අරියවෝහාර සූත්‍රය ]

51. මහණෙනි, මේ ආර්යව්‍යවහාරයෝ සතර දෙනෙකි. කවර සතර දෙනෙක යත්:

අදෘෂ්ටයෙහි අදෘෂ්ටවාදිතා ය. අශ්‍රැතයෙහි අශ්‍රැතවාදිතා ය, අමූතයෙහි අමූතවාදිතා ය, අවිඥාතයෙහි අවිඥාතවාදිතා යි.

මහණෙනි, මේ සතර ආර්යව්‍යවහාරයෝ යි.

4. 5. 5. 10.

[ අනාර්යවෝහාර සූත්‍රය ]

52. මහණෙනි, මේ අනාර්යව්‍යවහාරයෝ සතර දෙනෙකි. කවර සතර දෙනෙක යත්:

දෘෂ්ටයෙහි අදෘෂ්ටවාදිතා ය. ශ්‍රැතයෙහි අශ්‍රැතවාදිතා ය, මූතයෙහි අමූතවාදිතා ය, විඥාතයෙහි අවිඥාතවාදිතා ය.

මහණෙනි, මේ සතර අනාර්ය ව්‍යවහාරයෝ යි.

4. 5. 5. 11

[ අරියවෝහාර සූත්‍රය ]

53. මහණෙනි, මේ ආර්යව්‍යවහාරයෝ සතර දෙනෙකි. කවර සතර දෙනෙක යත්:

දෘෂ්ටයෙහි දෘෂ්ටවාදිතා ය, ශ්‍රැතයෙහි ශ්‍රැතවාදිතා ය, මූතයෙහි මූතවාදිතා ය, විඥාතයෙහි විඥාතවාදිතා ය .

මහණෙනි, මේ සතර ආර්යව්‍යවහාරයෝ ය.

ආපත්ති වර්ගය පස්වැනි යි.

පස්වන පණ්ණාසකය යි.

# 6. අභිඤ්ඤාවග්ගො

## 4. 6. 1.

### [අභිඤ්ඤා සුත්තං]

[සාවත්ථි නිදානං]

1. චත්තාරොමෙ භික්ඛවෙ ධම්මා, කතමෙ චත්තාරො?

අත්ථි භික්ඛවෙ ධම්මා අභිඤ්ඤා පරිඤ්ඤෙය්‍යා. අත්ථි භික්ඛවෙ ධම්මා අභිඤ්ඤා පහාතබ්බා. අත්ථි භික්ඛවෙ ධම්මා අභිඤ්ඤා භාවෙතබ්බා. අත්ථි භික්ඛවෙ ධම්මා අභිඤ්ඤා සච්ඡිකාතබ්බා.

කතමෙ ච භික්ඛවෙ ධම්මා අභිඤ්ඤා පරිඤ්ඤෙය්‍යා? පඤ්චුපාදානක්ඛන්ධා ඉමෙ වුච්චන්ති භික්ඛවෙ ධම්මා අභිඤ්ඤා පරිඤ්ඤෙය්‍යා

කතමෙ ච භික්ඛවෙ ධම්මා අභිඤ්ඤා පහාතබ්බා? අවිජ්ජා ච භවතණ්හා ච ඉමෙ වුච්චන්ති භික්ඛවෙ ධම්මා අභිඤ්ඤා පහාතබ්බා

කතමෙ ච භික්ඛවෙ ධම්මා අභිඤ්ඤා භාවෙතබ්බා? සමථො ච විපස්සනා ච ඉමෙ වුච්චන්ති භික්ඛවෙ ධම්මා අභිඤ්ඤා භාවෙතබ්බා

කතමෙ ච භික්ඛවෙ ධම්මා අභිඤ්ඤා සච්ඡිකාතබ්බා? විජ්ජා ච විමුත්ති ච ඉමෙ වුච්චන්ති භික්ඛවෙ ධම්මා අභිඤ්ඤා සච්ඡිකාතබ්බා.

ඉමෙ ඛො භික්ඛවෙ චත්තාරො ධම්මාති

## 4 6. 2

### [පරියෙසනා සුත්තං]

2. චතස්සො ඉමා භික්ඛවෙ අනරියපරියෙසනා කතමා චතස්සො?

ඉධ භික්ඛවෙ එකච්චො අත්තනා ජරාධම්මො සමානො ජරාධම්මං යෙව පරියෙසති. අත්තනා ව්‍යාධිධම්මො සමානො ව්‍යාධිධම්මං යෙව පරියෙසති අත්තනා මරණධම්මො සමානො මරණධම්මං යෙව පරියෙසති. අත්තනා සංකිලෙසධම්මො සමානො සංකිලෙසධම්මං යෙව පරියෙසති.

ඉමා ඛො භික්ඛවෙ චතස්සො අනරියපරියෙසනාති

# 6. අභිඤ්ඤාවග්ගය

## 4. 6. 1.

### [ අභිඤ්ඤා සූත්‍රය ]

[සැවැත්නිදානයි-]

1. මහණෙනි, මේ ධර්මයෝ සතර දෙනෙකි. කවර සතර දෙනෙක යත්:

මහණෙනි, ප්‍රඥායෙන් දැන (පරිඥෙය) අවබෝධ කටයුතු ධර්ම කෙනෙක් ඇත. මහණෙනි, ප්‍රඥායෙන් දැන ප්‍රහාතව්‍ය (ප්‍රහාණය කළයුතු) ධර්ම කෙනෙක් ඇත. මහණෙනි, ප්‍රඥායෙන් දැන භාවිතව්‍ය (=බැවිය යුතු) ධර්ම කෙනෙක් ඇත. මහණෙනි, ප්‍රඥායෙන් දැන සාක්ෂාත් කාතව්‍ය (ප්‍රත්‍යක්ෂ කටයුතු) ධර්ම කෙනෙක් ඇත.

මහණෙනි, ප්‍රඥායෙන් දැන පරිඥෙය්‍ය ධර්මයෝ කවරහු: පඤ්ච-උපාදානස්කන්ධයෝ යි. මහණෙනි, මේ ධර්මයෝ ප්‍රඥායෙන් දැන පරිඥෙය (අවබෝධකටයුතු) හ යි කියනු ලැබෙත්.

මහණෙනි, ප්‍රඥායෙන් දැන ප්‍රහාතව්‍ය ධර්මයෝ කවරහු: අවිද්‍යාව හා භවතෘෂ්ණා යි. මහණෙනි, මේ ධර්මයෝ ප්‍රඥායෙන් දැන ප්‍රහාතව්‍යයහ යි කියනු ලැබෙත්.

මහණෙනි, ප්‍රඥායෙන් දැන භාවිතව්‍ය ධර්මයෝ කවරහු: සමථය හා විදර්ශනා යි. මහණෙනි, මේ ධර්මයෝ ප්‍රඥායෙන් දැන භාවිතව්‍යයහ යි කියනු ලැබෙත්.

මහණෙනි, ප්‍රඥායෙන් දැන සාක්ෂාත් කාතව්‍ය ධර්මයෝ කවරහු: විද්‍යාව හා විමුක්ති යි. මහණෙනි, මේ ධර්මයෝ ප්‍රඥායෙන් දැන සාක්ෂාත් කාතව්‍යයහ යි කියනු ලැබෙත්.

මහණෙනි, මේ සතර ධර්මයෝ යි.

## 4. 6. 2.

### [ පරියෙසනා සූත්‍රය ]

2. මහණෙනි, මේ අනාර්යයන්ගේ පර්යේෂණාවෝ සතර දෙනෙකි. කවර සතර දෙනෙක යත්:

මහණෙනි, මෙලොව ඇතැමෙක් තෙමේ ජරාස්වභාව ඇතියේ ම ජරා-ස්වභාවය ම සොයයි. තෙමේ ව්‍යාධිස්වභාව ඇතියේ ම ව්‍යාධිස්වභාවය ම සොයයි. තෙමේ මරණස්වභාව ඇතියේ ම මරණස්වභාවය ම සොයයි. තෙමේ සංක්ලෙශස්වභාව ඇතියේ ම සංක්ලෙශස්වභාවය ම සොයයි.

මහණෙනි, මේ සතර අනාර්ය පර්යේෂණාවෝ යි.

චතස්සො ඉමා භික්ඛවෙ අරියපරියෙසනා. කතමා චතස්සො?

ඉධ භික්ඛවෙ එකච්චො අත්තනා ජරාධම්මො සමානො ජරාධම්මෙ ආදීනවං විදිත්වා අජරං අනුත්තරං යොගක්ඛෙමං නිබ්බානං පරියෙසති. අත්තනා ව්‍යාධිධම්මො සමානො ව්‍යාධිධම්මෙ ආදීනවං විදිත්වා අව්‍යාධිං අනුත්තරං යොගක්ඛෙමං නිබ්බානං පරියෙසති. අත්තනා මරණධම්මො සමානො මරණධම්මෙ ආදීනවං විදිත්වා අමතං අනුත්තරං යොගක්ඛෙමං නිබ්බානං පරියෙසති. අත්තනා සංකිලෙසධම්මො සමානො සංකිලෙසධම්මෙ ආදීනවං විදිත්වා අසංකිලිට්ඨං අනුත්තරං යොගක්ඛෙමං නිබ්බානං පරියෙසති.

ඉමා ඛො භික්ඛවෙ චතස්සො අරියපරියෙසනාති.

## 4. 6. 3.

## [ සඞ්ගහවත්ථුසුත්තං ]

3. චත්තාරිමානි භික්ඛවෙ සඞ්ගහවත්ථූනි. කතමානි චත්තාරි?

දානං, පෙය්‍යවජ්ජං, අත්ථචරියා, සමානත්තතා.

ඉමානි ඛො භික්ඛවෙ චත්තාරි සඞ්ගහවත්ථූනීති.

## 4. 6. 4.

## [ මාලුඞ්ක්‍යපුත්තසුත්තං ]

4. අථ ඛො ආයස්මා **මාලුඞ්ක්‍යපුත්තො** යෙන භගවා තෙනුපසඞ්කමි, උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නො ඛො ආයස්මා මාලුඞ්ක්‍යපුත්තො භගවන්තං එතදවොච:

සාධු මෙ භන්තෙ භගවා සඞ්ඛිත්තෙන ධම්මං දෙසෙතු, යමහං භගවතො ධම්මං සුත්වා එකො වූපකට්ඨො අප්පමත්තො ආතාපී පහිතත්තො විහරෙය්‍යන්ති.

එත්ථදානි මාලුඞ්ක්‍යපුත්ත කිං දහරෙ වක්ඛාම, යත්‍ර හි නාම ත්වං ජිණ්ණො වුද්ධො මහල්ලකො තථාගතස්ස සඞ්ඛිත්තෙන ඔවාදං යාචසීති.

"දෙසෙතු මෙ භන්තෙ භගවා සඞ්ඛිත්තෙන ධම්මං, දෙසෙතු සුගතො සඞ්ඛිත්තෙන ධම්මං, අප්පෙව නාමාහං භගවතො භාසිතස්ස අත්ථං ආජානෙය්‍යං අප්පෙව නාමාහං භගවතො භාසිතස්ස දායාදො අස්සන්ති."

චත්තාරොමෙ මාලුඞ්ක්‍යපුත්ත තණ්හුප්පාදා යත්ථ භික්ඛුනො තණ්හා උප්පජ්ජමානා උප්පජ්ජති. කතමෙ චත්තාරො?

චීවරහෙතු වා මාලුඞ්ක්‍යපුත්ත භික්ඛුනො තණ්හා උප්පජ්ජමානා උප්පජ්ජති, පිණ්ඩපාතහෙතු වා මාලුඞ්ක්‍යපුත්ත භික්ඛුනො තණ්හා උප්පජ්ජමානා උප්පජ්ජති, සෙනාසනහෙතු වා මාලුඞ්ක්‍යපුත්ත භික්ඛුනො තණ්හා උප්පජ්ජමානා උප්පජ්ජති, ඉති භවාභවහෙතු වා මාලුඞ්ක්‍යපුත්ත භික්ඛුනො තණ්හා උප්පජ්ජමානා උප්පජ්ජති

ඉමෙ ඛො මාලුඞ්ක්‍යපුත්ත චත්තාරො තණ්හුප්පාදා යත්ථ භික්ඛුනො තණ්හා උප්පජ්ජමානා උප්පජ්ජති.

මහණෙනි, මේ ආර්යයන්ගේ පර්යේෂණාවෝ සතර දෙනෙකි. කවර සතර දෙනෙක යත්:

මහණෙනි, මෙලොව ඇතැමෙක් තෙමේ ජරාස්වභාව ඇතියේ ජරාස්වභාවයෙහි ආදීනව දැන ජරා රහිත අනුත්තර වූ යොගක්ෂෙම වූ නිර්වාණය සොයයි. තෙමේ ව්‍යාධිස්වභාව ඇතියේ ව්‍යාධිස්වභාවයෙහි ආදීනව දැන ව්‍යාධි රහිත අනුත්තර වූ යොගක්ෂෙම වූ නිර්වාණය සොයයි. තෙමේ මරණස්වභාව ඇතියේ මරණස්වභාවයෙහි ආදීනව දැන මරණ රහිත වූ අනුත්තර වූ යොගක්ෂෙම වූ නිර්වාණය සොයයි. තෙමේ සංක්ලේශස්වභාව ඇතියේ සංක්ලේශස්වභාවයෙහි ආදීනව දැන සංක්ලේශ රහිත වූ අනුත්තර වූ යොගක්ෂෙම වූ නිර්වාණය සොයයි.

මහණෙනි, මේ සතර ආර්යපර්යේෂණාවෝ යි.

## 4. 6. 3.

## [ සඞ්ගහවත්ථු සුත්‍රය ]

3. මහණෙනි, මේ සඞ්ග්‍රහවස්තූහු සතර දෙනෙකි. කවර සතර දෙනෙක යත්:

දාන ය, ප්‍රියවචන ය, අර්ථචර්‍ය්‍යා ය, සමානාත්මතා යි.

මහණෙනි, මොහු සතර සඞ්ග්‍රහ වස්තූහු යි.

## 4. 6. 4.

## [ මාලුඞ්ක්‍යපුත්ත සුත්‍රය ]

4. එකල්හි ආයුෂ්මත් මාලුඞ්ක්‍යපුත්‍ර මහතෙරහු භාග්‍යවතුන් වහන්සේ කරා එළඹියහ. එළඹ භාග්‍යවතුන් වහන්සේ සකසා වැඳ එකත්පස්ව හුන්හ. එකත්පස්ව හුන් ආයුෂ්මත් මාලුඞ්ක්‍යපුත්‍ර මහතෙරහු භාග්‍යවතුන් වහන්සේට මෙසේ සැල කළහ:

මම භාග්‍යවතුන් වහන්සේගේ යම් දහමක් අසා එකාකී වූයෙම් ගණසඞ්ගණිකායෙන් වෙන් වූයෙම් අප්‍රමත්ත වූයෙම් කෙලෙස් තවන වීර්‍ය්‍ය ඇත්තෙම් ජීවිතනිරපෙක්ෂක වූයෙම් වෙසෙම් ද, වහන්ස, ආයාචනා කරමි. භාග්‍යවතුන් වහන්සේ සැකෙවින් එබඳු දහමක් දෙසන සේක්වා යනුයි.

මාලුඞ්ක්‍යපුත්‍රය, යම් හෙයෙකින් තෝ දිරූයෙහි වයෝවෘද්ධ වූයෙහි මහලු වූයෙහි සැකෙවින් තථාගතයන්ගේ අවවාදය යදනෙහි ද, මෙතෙල අවවාද දානයෙහි ලා දැන් තරුණ යොගාවචරයනට කුමක් කියමෝ ද,

වහන්ස, භාග්‍යවතුන් වහන්සේ මට සැකෙවින් දහම් දෙසන සේක්වා! සුගතයන් වහන්සේ සැකෙවින් දහම් දෙසන සේක්වා. මම භාග්‍යවතුන් වහන්සේගේ තෙපුලෙහි අරුත් දැනගණිම් නම් මැනව, මම භාග්‍යවතුන් වහන්සේගේ තෙපුලට දායාද වන්නෙම් නම් මැනව.

මාලුඞ්ක්‍යපුත්‍රය, මහණහට යම් අරමුණෙක උපදනා තෘෂ්ණාව උපදිනී වේ ද, මේ තෘෂ්ණොත්පාදයෝ සතර දෙනෙකි. කවර සතර දෙනෙක යත්:

මාලුඞ්ක්‍යපුත්‍රය, මහණහට චීවරහේතුයෙන් හෝ උපදනා තෘෂ්ණායෙක් උපදී. මාලුඞ්ක්‍යපුත්‍රය, මහණහට පිණ්ඩපාතහේතුයෙන් හෝ උපදනා තෘෂ්ණායෙක් උපදී. මාලුඞ්ක්‍යපුත්‍රය, මහණහට සයනාසනහේතුයෙන් හෝ උපදනා තෘෂ්ණායෙක් උපදී. මාලුඞ්ක්‍යපුත්‍රය, මහණහට ඉති භවාභව-හේතුයෙන් හෝ උපදනා තෘෂ්ණායෙක් උපදී.

මාලුඞ්ක්‍යපුත්‍රය, මහණහට යම් අරමුණෙක උපදනා තෘෂ්ණාව උපදිනී වේ ද, මේ සතර ඒ තෘෂ්ණොත්පාදයෝ යි.

යතො ඛො මාලුඞ්ක්‍යපුත්ත භික්ඛුනො තණ්හා පහීණා හොති, උච්ඡින්නමූලා තාලාවත්ථුකතා අනභාවකතා ආයතිං අනුප්පාදධම්මා. අයං වුච්චති මාලුඞ්ක්‍යපුත්ත භික්ඛු අච්ඡෙච්ඡි තණ්හං, වාවත්තයි සංයොජනං, සම්මාමානාභිසමයා අන්තමකාසි දුක්ඛස්සාති.

අථ ඛො ආයස්මා මාලුඞ්ක්‍යපුත්තො භගවතා ඉමිනා ඔවාදෙන ඔවදිතො උට්ඨායාසනා භගවන්තං අභිවාදෙත්වා පදක්ඛිණං කත්වා පක්කාමි. අථ ඛො ආයස්මා මාලුඞ්ක්‍යපුත්තො එකො වූපකට්ඨො අප්පමත්තො ආතාපී පහිතත්තො විහරන්තො න චිරස්සෙව යස්සත්ථාය කුලපුත්තා සම්මදෙව අගාරස්මා අනගාරියං පබ්බජන්ති, තදනුත්තරං බ්‍රහ්මචරියපරියොසානං දිට්ඨෙව ධම්මෙ සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහාසි. ඛීණා ජාති, වුසිතං බ්‍රහ්මචරියං, කතං කරණීයං, නාපරං ඉත්ථත්තායාති අබ්භඤ්ඤාසි.

අඤ්ඤතරො ච පනායස්මා මාලුඞ්ක්‍යපුත්තො අරහතං අහොසීති.

## 4.6.5.

## [ කුලසුත්තං ]

5. යානි කානිචි භික්ඛවෙ කුලානි භොගෙසු මහත්තතං[1] පත්තානි න චිරට්ඨිතිකානි භවන්ති, සබ්බානි තානි චතූහි ඨානෙහි, එතෙසං වා අඤ්ඤතරෙන. කතමෙහි චතූහි?

නට්ඨං න ගවෙසන්ති, ජිණ්ණං න පටිසඞ්ඛරොන්ති, අපරිමිතපානභොජනා හොන්ති, දුස්සීලං ඉත්ථිං වා පුරිසං වා ආධිපච්චෙ ඨපෙන්ති

යානි කානිචි භික්ඛවෙ කුලානි භොගෙසු මහත්තතං පත්තානි න චිරට්ඨිතිකානි භවන්ති, සබ්බානි තානි ඉමෙහි චතූහි ඨානෙහි, එතෙසං වා අඤ්ඤතරෙන.

යානි කානිචි භික්ඛවෙ කුලානි භොගෙසු මහත්තතං පත්තානි චිරට්ඨිතිකානි භවන්ති, සබ්බානි තානි චතූහි ඨානෙහි, එතෙසං වා අඤ්ඤතරෙන. කතමෙහි චතූහි?

නට්ඨං ගවෙසන්ති, ජිණ්ණං පටිසඞ්ඛරොන්ති, පරිමිතපානභොජනා හොන්ති, සීලවන්තං ඉත්ථිං වා පුරිසං වා ආධිපච්චෙ ඨපෙන්ති

යානි කානිචි භික්ඛවෙ කුලානි භොගෙසු මහත්තතං පත්තානි චිරට්ඨිතිකානි භවන්ති, සබ්බානි තානි ඉමෙහි චතූහි ඨානෙහි, එතෙසං වා අඤ්ඤතරෙනාති.

---

1. මහත්තං - මජසං.

මාලුඞ්ක්‍යපුත්‍රය, යම් කලෙක මහණහට තෘෂ්ණාව ප්‍රහීණ වේ ද, මුලුසුන් වේ ද, මස්තකච්ඡින්න තාලයක් සෙයින් අවස්තුක බවට පමුණුවන ලද ද, පුන පුනා කළ අභාවය ඇද්ද, මතුයෙහි අනුත්පාද ස්වභාවය ඇද්ද, මාලුඞ්ක්‍යපුත්‍රය, මේ මහණ තෘෂ්ණා සිඳපී ය යි සංයෝජනා පෙරළාලී ය යි මොනොවට මානයාගේ ප්‍රහාණාභිසමයයෙන් දුක් කෙළවර කෙළේ ය යි කියනු ලැබේ.

එක්බිති ආයුෂ්මත් මාලුඞ්ක්‍යපුත්‍ර මහතෙරහු භාග්‍යවතුන් වහන්සේ විසින් මේ අවවාදයෙන් අවවාද කරණ ලද්දහු හුනස්නෙන් නැගී භාග්‍යවතුන් වහන්සේ සකසා වැඳ පැදකුණු කොට ගියහ. එක්බිති ආයුෂ්මත් මාලුඞ්ක්‍යපුත්‍ර මහතෙර එකාකී වූයේ ගණසඞ්ගණිකායෙන් වෙන් වූයේ අප්‍රමත්ත වූයේ කෙලෙස් තවන වැර ඇත්තේ නිවනට ගිය සිත් ඇතියේ වෙසෙමින් මඳ කලෙකින් යම් අර්ථයක් පිණිස කුලපුත්‍රයෝ මොනොවට ගිහිගෙන් නික්ම පැවිද්දට පැමිණෙද් ද, මාර්ගබ්‍රහ්මචර්‍ය්‍යය කෙළවර කොට ඇති ඒ අර්ථය වර්තමාන භවයෙහි ම තමා විසින් විශිෂ්ටඥනයෙන් දැන ප්‍රත්‍යක්ෂ කොට ඊට පැමිණ විසී. ජාතිය ක්ෂීණ විය. බඹසර වැස නිමවින. සතර මග කිස කරණ ලදි. මේ අර්ථවාණ පිණිස අන් දූයෙක් නැති යි දත්හ

ආයුෂ්මත් මාලුඞ්ක්‍යපුත්‍ර මහතෙරහු රහතුන් කෙරෙහි එක්තරු කෙනෙක් ද වූහු.

## 4. 6 5.

## [ කුල සූත්‍රය ]

5. මහණෙනි, භෝගයෙහි මහත්වයට පැමිණි යම් කිසි කුලයෝ ඇත් ද, ඒ හැම කුලයෝ සතර කරුණෙකින් හෝ සතර කරුණු අතුරෙන් අන්‍යතරයෙකින් හෝ චිරස්ථායී නො වෙත්. කවර සතර කරුණෙක යත්:

නට දෑය නො සොයත්. දිරූ දෑය පිළිසකර නො කෙරෙත්. පරිමාණ රහිත පානභෝජන වළඳනාහු වෙත්. සිල් නැති ස්ත්‍රියක හෝ පුරුෂයකු හෝ භාණ්ඩාගාරික භාවයෙහි තබත්.

මහණෙනි, භෝගයෙහි මහත්වයට පැමිණි යම් කිසි කුලයෝ ඇත් ද, ඒ හැම කුලයෝ මේ සතර කරුණින් හෝ මේ සතර කරුණු අතුරෙන් අන්‍යතරයෙකින් හෝ චිරස්ථායී නො වෙත්.

මහණෙනි, භෝගයෙහි මහත්වයට පැමිණි යම් කිසි කුලයෝ ඇත් ද, ඒ හැම කුලයෝ සතර කරුණින් හෝ සතර කරුණු අතුරින් අන්‍යතරයෙකින් හෝ චිරස්ථායී වෙත්. කවර සතර කරුණින යත්:

නට දෑ සොයත්. දිරූ දෑය පිළිසකර කෙරෙත්. පරිමාණ සහිත පාන භෝජන වළඳනාහු වෙත්. සිල් ඇති ස්ත්‍රියක හෝ පුරුෂයකු හෝ අධිපති- භාවයෙහි තබත්.

මහණෙනි, භෝගයෙහි මහත්වයට පැමිණි යම් කිසි කුලයෝ ඇත් ද, ඒ හැම කුලයෝ මේ සතර කරුණින් හෝ මේ සතර කරුණු අතුරින් අන්‍යතරයෙකින් හෝ චිරස්ථායී වෙත්.

## 4. 6. 6.

### [පඨම ආජානීයසුත්තං]

6. චතූහි භික්ඛවෙ අඞ්ගෙහි සමන්නාගතො රඤ්ඤො භද්‍රො අස්සාජානීයො රාජාරහො හොති රාජභොග්ගො, රඤ්ඤො අඞ්ගන්තෙව සඞ්ඛං ගච්ඡති. කතමෙහි චතූහි?

ඉධ භික්ඛවෙ රඤ්ඤො භද්‍රො අස්සාජානීයො වණ්ණසම්පන්නො ච හොති, බලසම්පන්නො ච, ජවසම්පන්නො ච, ආරොහපරිණාහසම්පන්නො ච.

ඉමෙහි ඛො භික්ඛවෙ චතූහි අඞ්ගෙහි සමන්නාගතො රඤ්ඤො භද්‍රො අස්සාජානීයො රාජාරහො හොති රාජභොග්ගො, රඤ්ඤො අඞ්ගන්තෙව සඞ්ඛං ගච්ඡති.

එවමෙව ඛො භික්ඛවෙ චතූහි ධම්මෙහි සමන්නාගතො භික්ඛු ආහුනෙය්‍යො හොති -පෙ- [පාහුණෙය්‍යො -පෙ- දක්ඛිණෙය්‍යො -පෙ- අඤ්ජලිකරණීයො -පෙ-] අනුත්තරං පුඤ්ඤක්ඛෙත්තං ලොකස්ස. කතමෙහි චතූහි?

ඉධ භික්ඛවෙ භික්ඛු වණ්ණසම්පන්නො ච හොති, බලසම්පන්නො ච, ජවසම්පන්නො ච, ආරොහපරිණාහසම්පන්නො ච.

කථඤ්ච භික්ඛවෙ භික්ඛු වණ්ණසම්පන්නො හොති? ඉධ භික්ඛවෙ භික්ඛු සීලවා හොති -පෙ- සමාදාය සික්ඛති සික්ඛාපදෙසු. එවං ඛො භික්ඛවෙ භික්ඛු වණ්ණසම්පන්නො හොති.

කථඤ්ච භික්ඛවෙ භික්ඛු බලසම්පන්නො හොති? ඉධ භික්ඛවෙ භික්ඛු ආරද්ධවිරියො විහරති අකුසලානං ධම්මානං පහානාය, කුසලානං ධම්මානං උපසම්පදාය, ථාමවා දළ්හපරක්කමො අනික්ඛිත්තධුරො කුසලෙසු ධම්මෙසු. එවං ඛො භික්ඛවෙ භික්ඛු බලසම්පන්නො හොති.

කථඤ්ච භික්ඛවෙ භික්ඛු ජවසම්පන්නො හොති? ඉධ භික්ඛවෙ භික්ඛු ඉදං දුක්ඛන්ති යථාභූතං පජානාති -පෙ- අයං දුක්ඛසමුදයොති -පෙ- අයං දුක්ඛනිරොධොති -පෙ- අයං දුක්ඛනිරොධගාමිනී පටිපදාති යථාභූතං පජානාති. එවං ඛො භික්ඛවෙ භික්ඛු ජවසම්පන්නො හොති.

කථඤ්ච භික්ඛවෙ භික්ඛු ආරොහපරිණාහසම්පන්නො හොති? ඉධ භික්ඛවෙ භික්ඛු ලාභී හොති චීවරපිණ්ඩපාතසෙනාසනගිලානපච්චයභෙසජ්ජපරික්ඛාරානං. එවං ඛො භික්ඛවෙ භික්ඛු ආරොහපරිණාහසම්පන්නො හොති. ඉමෙහි ඛො භික්ඛවෙ චතූහි ධම්මෙහි සමන්නාගතො භික්ඛු ආහුනෙය්‍යො හොති -පෙ- [පාහුණෙය්‍යො -පෙ- දක්ඛිණෙය්‍යො -පෙ- අඤ්ජලිකරණීයො] -පෙ- අනුත්තරං පුඤ්ඤක්ඛෙත්තං ලොකස්සාති.

## 4. 6. 7.

### [දුතිය ආජානීය සුත්තං]

7. චතූහි භික්ඛවෙ අඞ්ගෙහි සමන්නාගතො රඤ්ඤො භද්‍රො අස්සාජානීයො රාජාරහො හොති රාජභොග්ගො, රඤ්ඤො අඞ්ගන්තෙව සඞ්ඛං ගච්ඡති. කතමෙහි චතූහි?

4. 6. 6.

## [ ප්‍රථම ආජානීය සූත්‍රය ]

6. මහණෙනි, සතර කරුණෙකින් සමන්වාගත වූ රජසතු භද්‍ර අශ්වාජානීය රාජාර්හ වෙයි. රජුන් විසින් වළඳ කළයුතු වෙයි. රජුගේ අවයවයෙකැයි ගණනට යෙයි. කවර සතර කරුණකින යත්:

මහණෙනි, මෙ ලොව රජක්හුගේ භද්‍ර අශ්වාජානීයයෙක් වර්ණසම්පන්නත් වේ ද, බලසම්පන්නත් වේ ද, ජවසම්පන්නත් වේ ද, ආරෝහපරිණාහ සම්පන්නත් වේ ද, මහණෙනි, මේ සතර කරුණෙන් සමන්වාගත වූ රජසතු භද්‍ර අශ්වාජානීය රාජාර්හ වෙයි. රජුන් විසින් වළඳ කළයුතු වෙයි. රජුගේ අවයවයෙකැයි ගණනට යෙයි.

මහණෙනි, එ පරිද්දෙම සතර ධර්මයෙකින් සමන්වාගත වූ මහණ ආහුනෙය්‍ය වෙයි. ප්‍රාහුණෙය්‍ය වෙයි. දක්ඛිණෙය්‍ය වෙයි. අඤ්ජලිකරණීය වෙයි. ලෝකයට අනුත්තර පුණ්‍යක්ෂෙත්‍ර වෙයි. කවර සතර ධර්මයෙකින යත්:

මහණෙනි, මෙ සස්නෙහි මහණ වර්ණසම්පන්න ද වෙයි. බලසම්පන්න ද වෙයි. ජවසම්පන්න ද වෙයි. ආරෝහපරිණාහසම්පන්න ද වෙයි.

මහණෙනි, මහණ කෙසේ වර්ණසම්පන්න වේ ද? මහණෙනි, මෙ සස්නෙහි මහණ සිල්වත් වෙයි. ... සික්ඛාපදයෙහි සමාදන් ව හික්මෙයි. මහණෙනි, මෙසේ මහණ වර්ණසම්පන්න වෙයි.

මහණෙනි, කෙසේ නම් මහණ බලසම්පන්න වේ ද? මහණෙනි, මෙ සස්නෙහි මහණ අකුසල් දහම් ප්‍රහාණය පිණිස කුසල් දහම් රැස් කිරීම පිණිස ඇරඹූ වැර ඇත්තේ ථාමයෙන් යුක්ත වූයේ දැඩි පැරකුම් ඇතියේ කුසල්දහම්හි බහා නොහැඹූ වීර්‍ය්‍යධුර ඇත්තේ වෙසෙසි. මහණෙනි, මෙසේ මහණ බලසම්පන්න වෙයි.

මහණෙනි, මහණ කෙසේ නම් ජවසම්පන්න වේ ද? මහණෙනි, මෙ සස්නෙහි මහණ මේ දුඃඛය යි තත් වූ පරිද්දෙන් දනී. මේ දුඃඛසමුදය යි ... මේ දුඃඛනිරෝධය යි ... මේ දුඃඛ නිරෝධගාමිනී ප්‍රතිපදාය යි තත් වූ පරිද්දෙන් දනී. මහණෙනි, මෙසේ මහණ ජවසම්පන්න වෙයි.

මහණෙනි, කෙසේ මහණ ආරෝහපරිණාහයෙන් යුක්ත වූයේ වේ ද? මහණෙනි, මෙ සස්නෙහි මහණ සිවුරු පිඬුවා සෙනසුන් ගිලන්පස බෙහෙත් පිරිකර ලබන්නෙක් වෙයි. මහණෙනි, මෙසේ මහණ ආරෝහ පරිණාහ සම්පන්න වූයේ වෙයි.

මහණෙනි, මේ සතර ධර්මයෙන් සමන්වාගත වූ මහණ ආහුනෙය්‍ය වෙයි... ලෝකයට අනුත්තර පුණ්‍යක්ෂෙත්‍ර වෙයි.

4. 6. 7.

## [ දෙවැනි ආජානීය සූත්‍රය ]

7. මහණෙනි, සතර කරුණෙකින් සමන්වාගත වූ රජසතු භද්‍ර අශ්වාජානීය රාජාර්හ වෙයි. රජුන් විසින් වළඳ කටයුතු වෙයි. රජුගේ අවයවයෙකැයි ගණනට යේ. කවර සතර කරුණකින යත්:

ඉධ භික්ඛවෙ රඤ්ඤො භද්‍රො අස්සාජානීයො වණ්ණසම්පන්නො ච හොති, බලසම්පන්නො ච, ජවසම්පන්නො ච, ආරොහපරිණාහසම්පන්නො ච.

ඉමෙහි ඛො භික්ඛවෙ චතූහි අඞ්ගෙහි සමන්නාගතො රඤ්ඤො භද්‍රො අස්සාජානීයො රාජාරහො හොති රාජභොග්ගො. රඤ්ඤො අඞ්ගන්තෙව සඞ්ඛං ගච්ඡති.

එවමෙව ඛො භික්ඛවෙ චතූහි ධම්මෙහි සමන්නාගතො භික්ඛු ආහුනෙය්‍යො හොති, [පාහුණෙය්‍යො - දක්ඛිණෙය්‍යො - අඤ්ජලිකරණීයො] -පෙ- අනුත්තරං පුඤ්ඤක්ඛෙත්තං ලොකස්ස. කතමෙහි චතූහි?

ඉධ භික්ඛවෙ භික්ඛු වණ්ණසම්පන්නො ච හොති, බලසම්පන්නො ච, ජවසම්පන්නො ච, ආරොහපරිණාහසම්පන්නො ච.

කථඤ්ච භික්ඛවෙ භික්ඛු වණ්ණසම්පන්නො හොති? ඉධ භික්ඛවෙ භික්ඛු සීලවා හොති -පෙ- සමාදාය සික්ඛති සික්ඛාපදෙසු. එවං ඛො භික්ඛවෙ භික්ඛු වණ්ණසම්පන්නො හොති.

කථඤ්ච භික්ඛවෙ භික්ඛු බලසම්පන්නො හොති? ඉධ භික්ඛවෙ භික්ඛු ආරද්ධවිරියො විහරති. ථාමවා දළ්හපරක්කමො අනික්ඛිත්තධුරො කුසලෙසු ධම්මෙසු. එවං ඛො භික්ඛවෙ භික්ඛු බලසම්පන්නො හොති.

කථඤ්ච භික්ඛවෙ භික්ඛු ජවසම්පන්නො හොති? ඉධ භික්ඛවෙ භික්ඛු ආසවානං ඛයා -පෙ- සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරති. එවං ඛො භික්ඛවෙ භික්ඛු ජවසම්පන්නො හොති.

කථඤ්ච භික්ඛවෙ භික්ඛු ආරොහපරිණාහසම්පන්නො හොති? ඉධ භික්ඛවෙ භික්ඛු ලාභී හොති චීවරපිණ්ඩපාතසෙනාසනගිලානපච්චය-භෙසජ්ජපරික්ඛාරානං. එවං ඛො භික්ඛවෙ භික්ඛු ආරොහපරිණාහසම්පන්නො හොති.

ඉමෙහි ඛො භික්ඛවෙ චතූහි ධම්මෙහි සමන්නාගතො භික්ඛු ආහුනෙය්‍යො හොති, [පාහුණෙය්‍යො-දක්ඛිණෙය්‍යො-අඤ්ජලිකරණීයො] -පෙ- අනුත්තරං පුඤ්ඤක්ඛෙත්තං ලොකස්සාති.

## 4. 6. 8.

## [ බලසුත්තං ]

8. චත්තාරිමානි භික්ඛවෙ බලානි. කතමානි චත්තාරි?

විරියබලං සතිබලං සමාධිබලං පඤ්ඤාබලං. ඉමානි ඛො භික්ඛවෙ චත්තාරි බලානීති.

## 4 6 9

## [ අරඤ්ඤසෙනාසන සුත්තං ]

9 චතූහි භික්ඛවෙ ධම්මෙහි සමන්නාගතො භික්ඛු නාලං අරඤ්ඤවනපත්ථානි පන්තානි සෙනාසනානි පටිසෙවිතුං. කතමෙහි චතූහි?

මහණෙනි, මෙ ලොව රජසතු භද්‍ර අශ්වාජානීය වර්ණසම්පන්න ද වෙයි. බලසම්පන්න ද වෙයි. ජවසම්පන්න ද වෙයි. ආරෝහපරිණාහසම්පන්න ද වෙයි

මහණෙනි, මේ සතර කරුණින් යුත් රාජකීය භද්‍ර අශ්වාජානීය තෙමේ රාජාර්හ ද වෙයි රාජභොග්‍ය ද වෙයි. රජුගේ අවයවයෙකැ යි ගණනට යෙයි.

මහණෙනි, එ පරිදි ම සතර කරුණෙකින් යුක්ත වූ මහණ ආහුනෙය්‍ය වෙයි. පාහුණෙය්‍ය වෙයි. දක්ඛිණෙය්‍ය වෙයි. අඤ්ජලිකරණීය වෙයි. ලෝකයට අනුත්තර පුණ්‍යක්ෂෙත්‍ර වෙයි. කවර සතර කරුණින යත්:

මහණෙනි, මෙ සස්නෙහි මහණ වර්ණසම්පන්න ද වෙයි. බලසම්පන්න ද වෙයි. ජවසම්පන්න ද වෙයි. ආරෝහපරිණාහසම්පන්න ද වෙයි.

මහණෙනි, කෙසේ නම් මහණ වර්ණසම්පන්න වේ ද? මහණෙනි, මෙ සස්නෙහි මහණ සිල් ඇත්තේ වේ ද ... සික්පදයන් සමාදන් ව ගෙණ හික්මේ ද, මහණෙනි, මෙසේ මහණ වර්ණසම්පන්න වෙයි.

මහණෙනි, කෙසේ නම් මහණ බලසම්පන්න වේ ද? මහණෙනි, මෙ සස්නෙහි මහණ රුකුසලු වැර ඇත්තේ බලවත් වූයේ දෘඪපරාක්‍රම ඇත්තේ කුසල්දහම්හි බහා නොතැබූ ධුර ඇත්තේ වෙසෙයි. මහණෙනි, මහණ මෙසේ බලසම්පන්න වෙයි.

මහණෙනි, කෙසේ නම් මහණ ජවසම්පන්න වේ ද? මහණෙනි, මෙ සස්නෙහි මහණ ආශ්‍රවක්ෂයයෙන් ... සාක්ෂාත් කොට එයට පැමිණ වෙසෙයි මහණෙනි, මහණ මෙසේ ජවසම්පන්න වෙයි.

මහණෙනි, කෙසේ නම් මහණ ආරෝහපරිණාහසම්පන්න වේ ද? මහණෙනි, මෙ සස්නෙහි මහණ සිවුරු පිඬුවා සෙනසුන් ගිලන්පස බෙහෙත් පිරිකර ලබන්නේ වෙයි. මහණෙනි, මෙසේ මහණ ආරෝහ-පරිණාහසම්පන්න වෙයි.

මහණෙනි, මේ සතර කරුණින් සමන්වාගත මහණ ආහුනෙය්‍ය වෙයි පාහුණෙය්‍ය වෙයි. දක්ඛිණෙය්‍ය වෙයි. අඤ්ජලිකරණීය වෙයි. ලෝකයට අනුත්තර පුණ්‍යක්ෂෙත්‍ර වෙයි.

## 4. 6. 8.

## [ බලසූත්‍රය ]

8. මහණෙනි, මේ සතර බලකෙනෙකි. කවර සතර දෙනෙක යත්:

වීර්‍ය්‍යබල ය, සමෘතිබල ය, සමාධිබල ය, ප්‍රඥාබල යි. මහණෙනි, මේ බල සතර යි.

## 4. 6. 9.

## [ අරඤ්ඤසෙනාසන සූත්‍රය ]

9. මහණෙනි, සතර කරුණෙකින් සමන්වාගත මහණ අරණ සෙනසුන ද, මිනිස්හසර ඉක්ම වූ වනසෙනසුන් ද, අරණෙහි ඉතා දුරසෙනසුන් ද, සෙවීමට නොනිසි වෙයි. කවර සතරෙකින යත්:

කාමවිතක්කෙන, ව්‍යාපාදවිතක්කෙන, විහිංසාවිතක්කෙන, දුප්පඤ්ඤො හොති ජළො එළමූගො.

ඉමෙහි ඛො භික්ඛවෙ චතූහි ධම්මෙහි සමන්නාගතො භික්ඛු නාලං අරඤ්ඤවනපත්ථානි පන්තානි සෙනාසනානි පටිසෙවිතුන්ති.

චතූහි භික්ඛවෙ ධම්මෙහි සමන්නාගතො භික්ඛු අලං අරඤ්ඤවනපත්ථානි පන්තානි සෙනාසනානි පටිසෙවිතුං. කතමෙහි චතූහි?

නෙක්ඛම්මවිතක්කෙන, අව්‍යාපාදවිතක්කෙන, අවිහිංසාවිතක්කෙන, පඤ්ඤවා හොති අජළො අනෙළමූගො.

ඉමෙහි ඛො භික්ඛවෙ චතූහි ධම්මෙහි සමන්නාගතො භික්ඛු අලං අරඤ්ඤවනපත්ථානි පන්තානි සෙනාසනානි පටිසෙවිතුන්ති.

## 4. 6. 10

### [ සාවජ්ජ - අනවජ්ජ සුත්තං ]

10. චතූහි භික්ඛවෙ ධම්මෙහි සමන්නාගතො බාලො අව්‍යත්තො අසප්පුරිසො ඛතං උපහතං අත්තානං පරිහරති. සාවජ්ජො ච හොති සානුවජ්ජො විඤ්ඤූනං. බහුං ච අපුඤ්ඤං පසවති. කතමෙහි චතූහි?

සාවජ්ජෙන කායකම්මෙන, සාවජ්ජෙන වචීකම්මෙන, සාවජ්ජෙන මනොකම්මෙන, සාවජ්ජාය දිට්ඨියා.

ඉමෙහි ඛො භික්ඛවෙ චතූහි ධම්මෙහි සමන්නාගතො බාලො අව්‍යත්තො අසප්පුරිසො ඛතං උපහතං අත්තානං පරිහරති. සාවජ්ජො ච හොති සානුවජ්ජො විඤ්ඤූනං. බහුං ච අපුඤ්ඤං පසවතීති.

චතූහි භික්ඛවෙ ධම්මෙහි සමන්නාගතො පණ්ඩිතො ව්‍යත්තො සප්පුරිසො අක්ඛතං අනුපහතං අත්තානං පරිහරති. අනවජ්ජො ච හොති අනනුවජ්ජො විඤ්ඤූනං. බහුං ච පුඤ්ඤං පසවති. කතමෙහි චතූහි?

අනවජ්ජෙන කායකම්මෙන, අනවජ්ජෙන වචීකම්මෙන, අනවජ්ජෙන මනොකම්මෙන, අනවජ්ජාය දිට්ඨියා.

ඉමෙහි ඛො භික්ඛවෙ චතූහි ධම්මෙහි සමන්නාගතො පණ්ඩිතො ව්‍යත්තො සප්පුරිසො අක්ඛතං අනුපහතං අත්තානං පරිහරති. අනවජ්ජො ච හොති අනනුවජ්ජො විඤ්ඤූනං. බහුඤ්ච පුඤ්ඤං පසවතීති.

අභිඤ්ඤවග්ගො ඡට්ඨො.*

---

* තස්සුද්දානං:-

අභිඤ්ඤා පරියෙසනා සඞ්ගහං මාලුඞ්ක්‍යපුත්තො
කුලං දෙව ච ආජානීයා බලං අරඤ්ඤකම්මුනාති. - මජ්සං.

කාමවිතර්කයෙන් යුක්ත වූයේ වේ. ව්‍යාපාදවිතර්කයෙන් යුක්ත වූයේ වේ. විහිංසාවිතර්කයෙන් යුක්ත වූයේ වේ. ජඩ වූයේ එළතොලු වූයේ දුෂ්ප්‍රාඥ ද වෙයි.

මහණෙනි, මේ සතර කරුණින් සමන්විත වූ මහණ අරණ්‍යසෙනසුන ද මිනිස්හසර ඉක්ම වූ වනසෙනසුන් ද අරණ්‍යෙහි ඉතා දුරසෙනසුන් ද සෙවීමට නො නිසි වෙයි

මහණෙනි, කරුණු සතරෙකින් සමන්විත මහණ අරණ්‍යසෙනසුන ද මිනිස්හසර ඉක්ම වූ වනසෙනසුන් ද අරණ්‍යෙහි ඉතා දුර සෙනසුන් ද සෙවීමට නිසි වෙයි. කවර සතර කරුණෙක යත්:

නෛෂ්ක්‍රම්‍යවිතර්කයෙන් යුක්ත වූයේ වේ. අව්‍යාපාදවිතර්කයෙන් යුක්ත වූයේ වේ අවිහිංසාවිතර්කයෙන් යුක්ත වූයේ වේ. ජඩ නොවූයේ එළතොලු නොවූයේ පැණැතියේ ද වේ.

මහණෙනි, මේ සතර කරුණින් සමන්විත මහණ අරණ්‍යසෙනසුන් ද මිනිස්හසර ඉක්ම වූ වනසෙනසුන් ද අරණ්‍යෙහි ඉතා දුරසෙනසුන් ද සෙවීමට නිසි වෙයි

## 4. 6. 10

## [ සාවජ්ජ - අනවජ්ජ සූත්‍රය ]

10. මහණෙනි, සතර කරුණෙකින් සමන්විත වූ බාල වූ අව්‍යක්ත වූ අසත්පුරුෂ ගුණ විසින් සාරු ගුණ විසින් තට ආත්මයක් පරිහරණය කෙරෙයි. සාවද්‍ය ද වෙයි නුවණැත්තන් විසින් උපවාද කටයුතු වූයේ බොහෝ පව් ද රැස් කෙරෙයි. කවර සතරෙකින යත්:

සාවද්‍ය වූ කායකර්මයෙන් යුක්ත වූයේ වෙයි· සාවද්‍ය වූ වාක්කර්මයෙන් යුක්ත වූයේ වෙයි. සාවද්‍ය වූ මනඃකර්මයෙන් යුක්ත වූයේ වෙයි. සාවද්‍ය වූ දෘෂ්ටියෙන් යුක්ත වූයේ වෙයි.

මහණෙනි, මේ සතර කරුණින් සමන්විත වූ බාල අව්‍යක්ත අසත්-පුරුෂ ගුණ විසින් සාරා දැමූ ගුණ විසින් තට ආත්මයක් පරිහරණය කෙරෙයි. සාවද්‍ය ද වෙයි නුවණැත්තන් විසින් උපවාද කටයුතු වූයේ බොහෝ අකුසල් ද රැස් කෙරෙයි.

මහණෙනි, සතර කරුණෙකින් සමන්විත වූ පණ්ඩිත ව්‍යක්ත සත්පුරුෂ ගුණ විසින් සාරු නොදැමූ ගුණ විසින් නොතට ආත්මයක් පරිහරණය කෙරෙයි. නිරවද්‍ය ද වෙයි නුවණැත්තන් විසින් උපවාද නොකටයුත්තෝ බොහෝ පින් ද රැස් කෙරෙයි. කවර සතර කරුණෙකින යත්:

අනවද්‍ය වූ කායකර්මයෙන් යුක්ත වූයේ වේ. අනවද්‍ය වූ වාක්කර්මයෙන් යුක්ත වූයේ වේ. අනවද්‍ය වූ මනඃකර්මයෙන් යුක්ත වූයේ වේ. අනවද්‍ය වූ දෘෂ්ටියෙන් යුක්ත වූයේ වෙයි.

මහණෙනි, මේ සතර කරුණින් සමන්විත වූ පණ්ඩිත වූ ව්‍යක්ත වූ සත්පුරුෂ ගුණ විසින් සාරු නො දැමූ ගුණ විසින් නොතටුවා වූ ආත්මයක් පරිහරණය කෙරෙයි. අනවද්‍ය ද වෙයි. නුවණැත්තන් විසින් උපවාද නො කටයුත්තෝ බොහෝ කුසල් ද රැස් කෙරෙයි.

අභිඥාවර්ගය සවැනි යි.

# 7. කම්මපථවග්ගො

## 4. 7. 1.

## [පාණාතිපාතසුත්තං]

**[සාවත්ථිනිදානං]**

1. චතූහි භික්ඛවෙ ධම්මෙහි සමන්නාගතො යථාභතං නික්ඛිත්තො එවං නිරයෙ. කතමෙහි චතූහි?

අත්තනා ච පාණාතිපාතී හොති, පරඤ්ච පාණාතිපාතෙ සමාදපෙති, පාණාතිපාතෙ ච සමනුඤ්ඤො හොති, පාණාතිපාතස්ස ච වණ්ණං භාසති

ඉමෙහි ඛො භික්ඛවෙ චතූහි ධම්මෙහි සමන්නාගතො යථාභතං නික්ඛිත්තො එවං නිරයෙ.

චතූහි භික්ඛවෙ ධම්මෙහි සමන්නාගතො යථාභතං නික්ඛිත්තො එවං සග්ගෙ. කතමෙහි චතූහි?

අත්තනා ච පාණාතිපාතා පටිවිරතො හොති, පරඤ්ච පාණාතිපාතා වෙරමණියා සමාදපෙති, පාණාතිපාතා වෙරමණියා ච සමනුඤ්ඤො හොති, පාණාතිපාතා වෙරමණියා ච වණ්ණං භාසති.

ඉමෙහි ඛො භික්ඛවෙ චතූහි ධම්මෙහි සමන්නාගතො යථාභතං නික්ඛිත්තො එවං සග්ගෙති.

## 4. 7. 2

## [අදින්නාදානසුත්තං]

2. චතූහි භික්ඛවෙ ධම්මෙහි සමන්නාගතො යථාභතං නික්ඛිත්තො එවං නිරයෙ. කතමෙහි චතූහි?

අත්තනා ච අදින්නාදායී හොති, පරඤ්ච අදින්නාදානෙ සමාදපෙති, අදින්නාදානෙ ච සමනුඤ්ඤො හොති, අදින්නාදානස්ස ච වණ්ණං භාසති. ඉමෙහි ඛො -පෙ- [යථාභතං නික්ඛිත්තො එවං නිරයෙ.]

[චතූහි භික්ඛවෙ ධම්මෙහි සමන්නාගතො -පෙ-]

අත්තනා ච අදින්නාදානා පටිවිරතො හොති, පරඤ්ච අදින්නාදානා වෙරමණියා සමාදපෙති, අදින්නාදානා වෙරමණියා ච සමනුඤ්ඤො හොති, අදින්නාදානා වෙරමණියා ච වණ්ණං භාසති. ඉමෙහි ඛො -පෙ- [යථාභතං නික්ඛිත්තො එවං සග්ගෙති.]

# 7. කම්මපථ වර්ගය

## 4. 7. 1.

### [ පාණාතිපාත සූත්‍රය ]

[සැවැත්නිදානයි]

1. මහණෙනි, සතර කරුණෙකින් සමන්වාගත වූයේ ගෙනවුත් බහා තැබූයේ යම්සේ වේ ද, එ පරිදි නිරයෙහි වේ. කවර සතර කරුණෙක යත්:

තෙමේත් පණිවා කරන්නේ වෙයි. මෙරමාත් පණිවායෙහි සමාදන් කරවයි. පණිවායෙහි ද අනුදන්නේත් වෙයි. පණිවා පිළිබඳ ගුණ කියන්නේත් වෙයි.

මහණෙනි, මේ සතර කරුණින් සමන්වාගත වූයේ ගෙණ වුත් බහා තැබූයේ යම්සේ වේ ද, එ පරිදි නිරයෙහි වේ.

මහණෙනි, සතර කරුණෙකින් සමන්වාගත වූයේ ගෙණ වුත් බහා තැබූයේ යම්සේ ද, එපරිදි සවර්ගයෙහි වේ. කවර සතර කරුණෙක යත්:

තෙමේත් පණිවායෙන් දුරු වූයේ වෙයි. මෙරමාත් පණිවායෙන් දුරු වීමෙහි සමාදන් කරවයි. පණිවායෙන් දුරු වීමෙහි අනුදන්නේත් වෙයි. පණිවායෙන් දුරු වීම පිළිබඳ ගුණ කියන්නේත් වෙයි.

මහණෙනි, මේ සතර කරුණින් සමන්වාගත වූයේ ගෙණවුත් බහා තැබූයේ යම්සේ ද, එසෙයින් සවර්ගයෙහි වේ.

## 4. 7. 2

### [ අදින්නාදාන සූත්‍රය ]

2. මහණෙනි, සතර කරුණෙකින් සමන්වාගත වූයේ ගෙණවුත් බහා තැබූයේ යම්සේ වේ ද, එපරිදි නිරයෙහි වේ. කවර සතර කරුණෙක යත්:

තෙමේත් අයිනාදන් ගන්නේ වෙයි, මෙරමාත් අයිනාදනෙහි සමාදන් කරවයි. අයිනාදනෙහි ද අනුදන්නේ වෙයි. අයිනාදන පිළිබඳ ගුණ කියන්නේ වෙයි. මහණෙනි, මේ සතර කරුණින් .. [ගෙණ වුත් බහා තැබූයේ යම් සේ ද, එ පරිදි නිරයෙහි වේ.]

[මහණෙනි, සතර කරුණෙකින් සමන්වාගත වූයේ...]

තෙමේත් අයිනාදනින් දුරුවූයේ වෙයි, මෙරමාත් අයිනාදනින් දුරු-වීමෙහි සමාදන් කරවයි. අයිනාදනින් දුරුවීමෙහි අනුදන්නේත් වෙයි. අයිනාදනින් දුරුවීම පිළිබඳ ගුණ කියයි. මහණෙනි, මේ සතර කරුණින් ... [ගෙණ වුත් බහා තැබූයේ යම් සේ ද, එ පරිදි සවර්ගයෙහි වේ.]

## 4. 7. 3.

## [ කාමමිච්ඡාචාරසුත්තං ]

3. [චතූහි භික්ඛවෙ ධම්මෙහි සමන්නාගතො -පෙ-]

අත්තනා ච කාමෙසු මිච්ඡාචාරී හොති, පරඤ්ච කාමෙසු මිච්ඡාචාරෙ සමාදපෙති, කාමෙසු මිච්ඡාචාරෙ ච සමනුඤ්ඤො හොති, කාමෙසු මිච්ඡාචාරස්ස ච වණ්ණං භාසති. ඉමෙහි ඛො -පෙ- [යථාභතං නික්ඛිත්තො එවං නිරයෙ.]

[චතූහි භික්ඛවෙ ධම්මෙහි සමන්නාගතො -පෙ-]

අත්තනා ච කාමෙසු මිච්ඡාචාරා පටිවිරතො හොති, පරඤ්ච කාමෙසු මිච්ඡාචාරා වෙරමණියා සමාදපෙති, කාමෙසු මිච්ඡාචාරා වෙරමණියා ච සමනුඤ්ඤො හොති, කාමෙසු මිච්ඡාචාරා වෙරමණියා ච වණ්ණං භාසති. ඉමෙහි ඛො -පෙ- [යථාභතං නික්ඛිත්තො එවං සග්ගෙ.]

## 4. 7. 4.

## [ මුසාවාදසුත්තං ]

4. [චතූහි භික්ඛවෙ ධම්මෙහි සමන්නාගතො -පෙ-]

අත්තනා ච මුසාවාදී හොති, පරඤ්ච මුසාවාදෙ සමාදපෙති, මුසාවාදෙ ච සමනුඤ්ඤො හොති, මුසාවාදස්ස ච වණ්ණං භාසති. ඉමෙහි ඛො -පෙ- [යථාභතං නික්ඛිත්තො එවං නිරයෙ.]

[චතූහි භික්ඛවෙ ධම්මෙහි සමන්නාගතො -පෙ-]

අත්තනා ච මුසාවාදා පටිවිරතො හොති, පරඤ්ච මුසාවාදා වෙරමණියා සමාදපෙති, මුසාවාදා වෙරමණියා ච සමනුඤ්ඤො හොති, මුසාවාදා වෙරමණියා ච වණ්ණං භාසති. ඉමෙහි ඛො -පෙ- [යථාභතං නික්ඛිත්තො එවං සග්ගෙ ]

## 4. 7. 5.

## [ පිසුණාවාචාසුත්තං ]

5. [චතූහි භික්ඛවෙ ධම්මෙහි සමන්නාගතො -පෙ-]

අත්තනා ච පිසුණාවාචො හොති, පරඤ්ච පිසුණාවාචාය සමාදපෙති, පිසුණාවාචාය ච සමනුඤ්ඤො හොති, පිසුණාවාචාය ච වණ්ණං භාසති ඉමෙහි ඛො -පෙ- [යථාභතං නික්ඛිත්තො එවං නිරයෙ.]

[චතූහි භික්ඛවෙ ධම්මෙහි සමන්නාගතො -පෙ-]

අත්තනා ච පිසුණාවාචා පටිවිරතො හොති, පරඤ්ච පිසුණාවාචාය වෙරමණියා සමාදපෙති, පිසුණාවාචා වෙරමණියා ච සමනුඤ්ඤො හොති, පිසුණාවාචා වෙරමණියා ච වණ්ණං භාසති. ඉමෙහි ඛො -පෙ- [යථාභතං නික්ඛිත්තො එවං සග්ගෙ]

4. 7. 3.

[ කාමමිච්ඡාචාර සූත්‍රය ]

3. [මහණෙනි, සතර කරුණෙකින් සමන්‍වාගත වූයේ ... ]

තෙමේත් කාමයෙහි මිසහසර ඇතියේ වෙයි. මෙරමාත් කාමයෙහි මිසහසරෙහි සමාදන් කරවයි. කාමයෙහි මිසහසරෙහි අනුදන්නේත් වෙයි. කාමයෙහි මිසහසර පිළිබඳ ගුණ කියන්නේත් වෙයි. මහණෙනි, මේ සතර කරුණින් ... [ගෙණ වුත් බහා තැබූයේ යම් සේ ද, එපරිදි නිරයෙහි වේ.]

[මහණෙනි, සතර කරුණෙකින් සමන්‍වාගත වූයේ .... ]

තෙමේත් කාමයෙහි මිසහසරින් දුරුවූයේ වෙයි. මෙරමාත් කාමයෙහි මිසහසරින් දුරුවීමෙහි සමාදන් කරවයි. කාමයෙහි මිසහසරින් දුරුවීමෙහි අනුදන්නේත් වෙයි. කාමයෙහි මිසහසරින් දුරුවීම පිළිබඳ ගුණ කියන්නේත් වෙයි. මහණෙනි, මේ සතර කරුණින් ... [ගෙණ වුත් බහා තැබූයේ යම් සේ ද, එපරිදි සවර්ගයෙහි වේ. ]

4. 7. 4.

[ මුසාවාද සූත්‍රය ]

4. [මහණෙනි, සතර කරුණෙකින් සමන්‍වාගත වූයේ ... ]

තෙමේත් මුසවා බණන්නේ වෙයි. මෙරමාත් මුසවායෙහි සමාදන් කරවයි. මුසවායෙහි අනුදන්නේත් වෙයි. මුසවා පිළිබඳ ගුණ කියන්නේත් වෙයි මහණෙනි, මේ සතර කරුණින් ... [ගෙණවුත් බහා තැබූයේ යම් සේ ද, එපරිදි නිරයෙහි වේ.]

[මහණෙනි, සතර කරුණෙකින් සමන්‍වාගත වූයේ ... ]

තෙමේත් මුසවායෙන් දුරුවූයේ වෙයි. මෙරමාත් මුසවායෙන් දුරුවීමෙහි සමාදන් කරවයි. මුසවායෙන් දුරුවීමෙහි අනුදන්නේත් වෙයි. මුසවායෙන් දුරුවීම පිළිබඳ ගුණ කියන්නේත් වෙයි මහණෙනි, මේ සතර කරුණින් ... [ගෙණවුත් බහා තැබූයේ යම් සේ ද, එපරිදි සවර්ගයෙහි වේ.]

4. 7. 5

[ පිසුණාවාචා සූත්‍රය ]

5. [මහණෙනි, සතර කරුණෙකින් සමන්‍වාගත වූයේ ... ]

තෙමේත් පිසුනුබස් ඇතියේ වෙයි. මෙරමාත් පිසුනුබස්හි සමාදන් කරවයි. පිසුනුබස්හි අනුදන්නේත් වෙයි. පිසුනුබස් පිළිබඳ ගුණ කියන්නේත් වෙයි. මහණෙනි, මේ සතර කරුණින් ... [ගෙණවුත් බහා තැබූයේ යම් සේ ද, එපරිදි නිරයෙහි වේ.]

[මහණෙනි, සතර කරුණෙකින් සමන්‍වාගත වූයේ .. ]

තෙමේත් පිසුනුබසින් දුරුවූයේ වෙයි. මෙරමාත් පිසුනුබසින් දුරුවීමෙහි සමාදන් කරවයි. පිසුනුබසින් දුරුවීමෙහි අනුදන්නේත් වෙයි. පිසුනුබසින් දුරුවීම පිළිබඳ ගුණ ද කියයි. මහණෙනි, මේ සතර කරුණින් ... [ගෙණවුත් බහා තැබූයේ යම්සේ ද, එපරිදි සවර්ගයෙහි වේ.]

## 4. 7. 6

### [ ඵරුසාවාචාසුත්තං ]

6. [චතූහි භික්ඛවෙ ධම්මෙහි සමන්නාගතො -පෙ-]

අත්තනා ච ඵරුසාවාචො හොති, පරඤ්ච ඵරුසාවාචාය සමාදපෙති, ඵරුසාවාචාය ච සමනුඤ්ඤො හොති, ඵරුසාවාචාය ච වණ්ණං භාසති. ඉමෙහි ඛො -පෙ- [යථාභතං නික්ඛිත්තො එවං නිරයෙ.]

[චතූහි භික්ඛවෙ ධම්මෙහි සමන්නාගතො -පෙ-]

අත්තනා ච ඵරුසාවාචාය පටිවිරතො හොති, පරඤ්ච පරුසාවාචාය වෙරමණියා සමාදපෙති, ඵරුසාවාචාය වෙරමණියා ච සමනුඤ්ඤො හොති, ඵරුසාවාචා වෙරමණියා ච වණ්ණං භාසති. ඉමෙහි ඛො -පෙ- [යථාභතං නික්ඛිත්තො එවං සග්ගෙති.]

## 4. 7. 7

### [ සම්ඵප්පලාපසුත්තං ]

7. [චතූහි භික්ඛවෙ ධම්මෙහි සමන්නාගතො -පෙ-]

අත්තනා ච සම්ඵප්පලාපී හොති, පරඤ්ච සම්ඵප්පලාපෙ සමාදපෙති, සම්ඵප්පලාපෙ ච සමනුඤ්ඤො හොති, සම්ඵප්පලාපස්ස ච වණ්ණං භාසති. ඉමෙහි ඛො -පෙ- [යථාභතං නික්ඛිත්තො එවං නිරයෙ.]

[චතූහි භික්ඛවෙ ධම්මෙහි සමන්නාගතො -පෙ-]

අත්තනා ච සම්ඵප්පලාපා පටිවිරතො හොති, පරඤ්ච සම්ඵප්පලාපා වෙරමණියා සමාදපෙති, සම්ඵප්පලාපා වෙරමණියා ච සමනුඤ්ඤො හොති, සම්ඵප්පලාපා වෙරමණියා ච වණ්ණං භාසති. ඉමෙහි ඛො -පෙ- [යථාභතං නික්ඛිත්තො එවං සග්ගෙති.]

## 4. 7. 8.

### [ අභිජ්ඣාලුසුත්තං ]

8. [චතූහි භික්ඛවෙ ධම්මෙහි සමන්නාගතො -පෙ-]

අත්තනා ච අභිජ්ඣාලු හොති, පරඤ්ච අභිජ්ඣාය සමාදපෙති, අභිජ්ඣාය ච සමනුඤ්ඤො හොති, අභිජ්ඣාය ච වණ්ණං භාසති. ඉමෙහි ඛො -පෙ- [යථාභතං නික්ඛිත්තො එවං නිරයෙ.]

[චතූහි භික්ඛවෙ ධම්මෙහි සමන්නාගතො -පෙ-]

අත්තනා ච අනභිජ්ඣාලු හොති, පරඤ්ච අනභිජ්ඣාය සමාදපෙති, අනභිජ්ඣාය ච සමනුඤ්ඤො හොති, අනභිජ්ඣාය ච වණ්ණං භාසති. ඉමෙහි ඛො -පෙ- [යථාභතං නික්ඛිත්තො එවං සග්ගෙති.]

4. 7. 6.

[ ඵරුසාවාචා සූත්‍රය ]

6. [මහණෙනි, සතර කරුණෙකින් සමන්නාගත වූයේ ]

තෙමේත් පරොස්බස් ඇතියේ වෙයි. මෙරමාත් පරොස්බස්හි සමාදන් කරවයි. පරොස්බස්හි අනුදන්නේත් වෙයි. පරොස්බස් පිළිබඳ ගුණ ද කියයි. මහණෙනි, මේ සතර කරුණින් ... [ගෙණවුත් බහා තැබූයේ යම් සේ ද, එපරිදි නිරයෙහි වේ.]

[මහණෙනි, සතර කරුණෙකින් සමන්නාගත වූයේ ]

තෙමේත් පරොස්බසින් දුරුවූයේ වෙයි. මෙරමාත් පරොස්බසින් දුරුවීමෙහි සමාදන් කරවයි. පරොස්බසින් දුරුවීමෙහි අනුදන්නේත් වෙයි. පරොස්බසින් දුරුවීම පිළිබඳ ගුණ ද කියයි. මහණෙනි, මේ සතර කරුණින් ... [ගෙණවුත් බහා තැබූයේ යම් සේ ද, එපරිදි සවර්ගයෙහි වේ.]

4. 7. 7.

[ සම්ඵප්පලාප සූත්‍රය ]

7. [මහණෙනි, සතර කරුණෙකින් සමන්නාගත වූයේ ]

තෙමේත් සම්ඵප්‍රලාප ඇතියේ වෙයි. මෙරමාත් සම්ඵප්‍රලාපයෙහි සමාදන් කරවයි. සම්ඵප්‍රලාපයෙහි අනුදන්නේත් වෙයි. සම්ඵප්‍රලාපය පිළිබඳ ගුණ ද කියයි. මහණෙනි, මේ සතර කරුණින් ... [ගෙණවුත් බහා තැබූයේ යම් සේ ද, එපරිදි නිරයෙහි වේ.]

[මහණෙනි, සතර කරුණෙකින් සමන්නාගත වූයේ . ]

තෙමේත් සම්ඵප්‍රලාපයෙන් දුරුවූයේ වෙයි. මෙරමාත් සම්ඵප්‍රලාපයෙන් දුරුවීමෙහි සමාදන් කරවයි. සම්ඵප්‍රලාපයෙන් දුරුවීමෙහි අනුදන්නේත් වෙයි. සම්ඵප්‍රලාපයෙන් දුරුවීම පිළිබඳ ගුණත් කියයි. මහණෙනි, මේ සතර කරුණින් ... [ගෙණවුත් බහා තැබූයේ යම් සේ ද, එපරිදි සවර්ගයෙහි වේ.]

4. 7. 8

[ අභිජ්ඣාලු සූත්‍රය ]

8. [මහණෙනි, සතර කරුණෙකින් සමන්නාගත වූයේ .. ]

තෙමේත් අභිධ්‍යා බහුල වෙයි. මෙරමාත් අභිධ්‍යායෙහි සමාදන් කරවයි. අභිධ්‍යායෙහි අනුදන්නේත් වෙයි. අභිධ්‍යාව පිළිබඳ ගුණ කියන්නේත් වෙයි. මහණෙනි, මේ සතර කරුණින් ... [ගෙණවුත් බහා තැබූයේ යම් සේ ද, එපරිදි නිරයෙහි වේ.]

[මහණෙනි, සතර කරුණෙකින් සමන්නාගත වූයේ .. ]

තෙමේත් අභිධ්‍යාබහුල නොවූයේ වෙයි. මෙරමාත් අනභිධ්‍යායෙහි සමාදන් කරවයි. අනභිධ්‍යායෙහි අනුදන්නේත් වෙයි. අනභිධ්‍යාව පිළිබඳ ගුණ කියන්නේත් වෙයි. මහණෙනි, මේ සතර කරුණින් ... [ගෙණවුත් බහා තැබූයේ යම් සේ ද, එපරිදි සවර්ගයෙහි වේ ]

## 4. 7. 9.

### [ බ්‍යාපන්නචිත්තසුත්තං ]

9. [චතූහි භික්ඛවෙ ධම්මෙහි සමන්නාගතො -පෙ-]

අත්තනා ච බ්‍යාපන්නචිත්තො හොති, පරඤ්ච ව්‍යාපාදෙ සමාදපෙති, ව්‍යාපාදෙ ච සමනුඤ්ඤො හොති, ව්‍යාපාදස්ස ච වණ්ණං භාසති. ඉමෙහි ඛො -පෙ- [යථාභතං නික්ඛිත්තො එවං නිරයෙ.]

[චතූහි භික්ඛවෙ ධම්මෙහි සමන්නාගතො -පෙ-]

අත්තනා ච අබ්‍යාපන්නචිත්තො හොති, පරඤ්ච අව්‍යාපාදෙ සමාදපෙති, අව්‍යාපාදෙ ච සමනුඤ්ඤො හොති, අව්‍යාපාදස්ස ච වණ්ණං භාසති. ඉමෙහි ඛො -පෙ- [යථාභතං නික්ඛිත්තො එවං සග්ගෙ.]

## 4. 7. 10.

### [ මිච්ඡාදිට්ඨිසුත්තං ]

10 [චතූහි භික්ඛවෙ ධම්මෙහි සමන්නාගතො -පෙ-]

අත්තනා ච මිච්ඡාදිට්ඨි හොති, පරඤ්ච මිච්ඡාදිට්ඨියා සමාදපෙති, මිච්ඡාදිට්ඨියා ච සමනුඤ්ඤො හොති, මිච්ඡාදිට්ඨියා ච වණ්ණං භාසති. ඉමෙහි ඛො භික්ඛවෙ චතූහි ධම්මෙහි සමන්නාගතො [යථාභතං නික්ඛිත්තො එවං නිරයෙ.]

[චතූහි භික්ඛවෙ ධම්මෙහි සමන්නාගතො -පෙ- ]

අත්තනා ච සම්මාදිට්ඨි හොති, පරඤ්ච සම්මාදිට්ඨියා සමාදපෙති, සම්මාදිට්ඨියා ච සමනුඤ්ඤො හොති, සම්මාදිට්ඨියා ච වණ්ණං භාසති. ඉමෙහි ඛො භික්ඛවෙ චතූහි ධම්මෙහි සමන්නාගතො [යථාභතං නික්ඛිත්තො එවං සග්ගෙ ]

**කම්මපථවග්ගො සත්තමො.**

4. 7. 9.

[ ඛ්‍යාපන්නචිත්ත සූත්‍රය ]

9. [මහණෙනි, සතර කරුණෙකින් සමන්‍වාගත වූයේ ... ]

තෙමේත් ව්‍යාපන්න සිත් ඇත්තේ වෙයි. මෙරමාත් ව්‍යාපාදයෙහි සමාදන් කරවයි. ව්‍යාපාදයෙහි අනුදන්නේත් වෙයි. ව්‍යාපාදය පිළිබඳ ගුණත් කියයි. මහණෙනි, මේ සතර කරුණින් ... [ගෙණවුත් බහා තැබූයේ යම් සේ ද, එපරිද්දම නිරයෙහි වේ.]

[මහණෙනි, සතර කරුණෙකින් සමන්‍වාගත වූයේ ... ]

තෙමේත් ව්‍යාපාද රහිත සිතැත්තෝ වෙයි. මෙරමාත් අව්‍යාපාදයෙහි සමාදන් කරවයි. අව්‍යාපාදයෙහි අනුදන්නේත් වෙයි. අව්‍යාපාදය පිළිබඳ ගුණත් කියයි. මහණෙනි, මේ සතර කරුණින් ... [ගෙණවුත් බහා තැබූයේ යම් සේ ද, එපරිදි සවර්ගයෙහි වේ.]

4. 7. 10.

[ මිච්ඡාදිට්ඨි සූත්‍රය ]

10 [මහණෙනි, සතර කරුණෙකින් සමන්‍වාගත වූයේ ]

තෙමේත් මිථ්‍යාදෘෂ්ටි ඇතියේ වෙයි. මෙරමාත් මිථ්‍යාදෘෂ්ටියෙහි සමාදන් කරවයි. මිථ්‍යාදෘෂ්ටියෙහි අනුදන්නේත් වෙයි. මිථ්‍යාදෘෂ්ටිය පිළිබඳ ගුණත් කියයි. මහණෙනි, මේ සතර කරුණින් සමන්‍වාගත වූයේ ... [ගෙණවුත් බහා තැබූයේ යම් සේ ද, එපරිදි නිරයෙහි වේ.]

[මහණෙනි, සතර කරුණෙකින් සමන්‍වාගත වූයේ ... ]

තෙමේත් සම්‍යග්දෘෂ්ටි ඇතියේ වෙයි. මෙරමාත් සම්‍යග්දෘෂ්ටියෙහි සමාදන් කරවයි. සම්‍යග්දෘෂ්ටියෙහි අනුදන්නේත් වෙයි. සම්‍යග්දෘෂ්ටිය පිළිබඳ ගුණත් කියයි. මහණෙනි, මේ සතර කරුණින් සමන්‍වාගත වූයේ ... [ගෙණවුත් බහා තැබූයේ යම්සේ වේ ද, එපරිදි සවර්ගයෙහි වේ.]

කම්පථවර්ගය සත්වැනි යි.

# 8. රාගාදිපෙය්‍යාලං

## 4. 8. 1

### [ චතුසතිපට්ඨානසුත්තං ]

[සාවත්ථිනිදානං]

1. රාගස්ස භික්ඛවෙ අභිඤ්ඤාය චත්තාරො ධම්මා භාවෙතබ්බා. කතමෙ චත්තාරො?

ඉධ භික්ඛවෙ භික්ඛු කායෙ කායානුපස්සී විහරති ආතාපී සම්පජානො සතිමා විනෙය්‍ය ලොකෙ අභිජ්ඣා දොමනස්සං. වෙදනාසු -පෙ- චිත්තෙ -පෙ- ධම්මෙසු ධම්මානුපස්සී විහරති ආතාපී සම්පජානො සතිමා විනෙය්‍ය ලොකෙ අභිජ්ඣා දොමනස්සං.

රාගස්ස භික්ඛවෙ අභිඤ්ඤාය ඉමෙ චත්තාරො ධම්මා භාවෙතබ්බාති.

## 4. 8. 2.

### [ චතුසම්මප්පධානසුත්තං ]

2. රාගස්ස භික්ඛවෙ අභිඤ්ඤාය චත්තාරො ධම්මා භාවෙතබ්බා. කතමෙ චත්තාරො?

ඉධ භික්ඛවෙ භික්ඛු අනුප්පන්නානං පාපකානං අකුසලානං ධම්මානං අනුප්පාදාය ඡන්දං ජනෙති වායමති විරියං ආරභති චිත්තං පග්ගණ්හාති පදහති. උප්පන්නානං පාපකානං අකුසලානං ධම්මානං පහානාය -පෙ- අනුප්පන්නානං කුසලානං ධම්මානං උප්පාදාය -පෙ- උප්පන්නානං කුසලානං ධම්මානං ඨිතියා අසම්මොසාය භීයොභාවාය වෙපුල්ලාය භාවනාය පාරිපූරියා ඡන්දං ජනෙති වායමති විරියං ආරභති චිත්තං පග්ගණ්හාති පදහති.

රාගස්ස භික්ඛවෙ අභිඤ්ඤාය ඉමෙ චත්තාරො ධම්මා භාවෙතබ්බාති.

## 4. 8. 3.

### [ චතුඉද්ධිපාදසුත්තං ]

3. රාගස්ස භික්ඛවෙ අභිඤ්ඤාය චත්තාරො ධම්මා භාවෙතබ්බා. කතමෙ චත්තාරො?

ඉධ භික්ඛවෙ භික්ඛු ඡන්දසමාධිපධානසඞ්ඛාරසමන්නාගතං ඉද්ධිපාදං භාවෙති. විරියසමාධි-පෙ- චිත්තසමාධි -පෙ- වීමංසාසමාධිපධානසඞ්ඛාර-සමන්නාගතං ඉද්ධිපාදං භාවෙති.

රාගස්ස භික්ඛවෙ අභිඤ්ඤාය ඉමෙ චත්තාරො ධම්මා භාවෙතබ්බාති.

Free Distribution www.aathaapi.org

# 8. රාගාදිපෙය්‍යාලය

## 4. 8. 1.

### [ චතුසතිපට්ඨාන සූත්‍රය ]

[සැවැත්නිදානයි]

1. මහණෙනි, රාගයාගේ අභිඥ පිණිස ධර්මයෝ සතර දෙනෙක් වැඩිය යුතුයහ. කවර සතර දෙනෙක යත්:

මහණෙනි, මෙ සස්නෙහි මහණ කෙලෙස් තවන වීර්‍ය්‍ය ඇතියේ නුවණින් දන්නේ සමෘතිමත් වූයේ පඤ්චස්කන්ධලෝකයෙහි අභිධ්‍යාදෞර්මනස්‍ය දුරු කොට කයෙහි කය නුවණින් දක්නේ වෙසෙයි. වෙදනායෙහි ... චිත්තයෙහි ... කෙලෙස් තවන වීර්‍ය ඇතියේ නුවණින් දන්නේ සමෘතිමත් වූයේ පඤ්චස්කන්ධලොකයෙහි අභිධ්‍යාදෞර්මනස්‍ය දුරු කොට ධර්මයෙහි ධර්මය නුවණින් දක්නේ වෙසෙයි.

මහණෙනි, රාගයාගේ අභිඥ පිණිස මේ සතර ධර්මයෝ වැඩිය යුත්තාහ.

## 4. 8. 2.

### [ චතුසම්මප්පධාන සූත්‍රය ]

2. මහණෙනි, රාගයාගේ අභිඥ පිණිස ධර්මයෝ සතර දෙනෙක් වැඩිය යුත්තාහ. කවර සතර දෙනෙක යත්:

මහණෙනි, මෙ සස්නෙහි මහණ නූපන් ලාමක අකුශල ධර්මයන්ගේ අනුත්පාදය පිණිස ඡන්දය උපදවයි ව්‍යායාම කෙරෙයි. වීර්‍ය්‍යාරම්භ කෙරෙයි. සිත දැඩි කොට ගණියි. ප්‍රධන්වීර්‍ය්‍ය කෙරෙයි. උපන් ලාමක අකුශල-ධර්මයන්ගේ ප්‍රහාණය පිණිස ... නූපන් කුශලධර්මයන්ගේ උත්පාදය පිණිස ... උපන් කුශලධර්මයන්ගේ ස්ථිතිය පිණිස සමෙමාෂය නොවනු පිණිස භූයොභාවය පිණිස වෛපුල්‍යය පිණිස භාවනායෙන් පරිපූර්ණත්වය පිණිස ඡන්දය දනවයි. ව්‍යායාම කෙරෙයි. වීර්‍ය්‍යාරම්භ කෙරෙයි. සිත දැඩි කොට ගණියි ප්‍රධන්වීර්‍ය්‍ය කෙරෙයි.

මහණෙනි, රාගයාගේ අභිඥ පිණිස මේ සතර ධර්මයෝ භාවිතව්‍යයෝ යි.

## 4 8 3

### [ චතුරිද්ධිපාද සූත්‍රය ]

3. මහණෙනි, රාගයාගේ අභිඥ පිණිස ධර්මයෝ සතර දෙනෙක් වැඩිය යුත්තාහ කවර සතර දෙනෙක යත්:

මහණෙනි, මෙ සස්නෙහි මහණ ඡන්දසමාධි පූර්වක ප්‍රධන්වීර්‍ය්‍ය සඞ්ඛ්‍යාත සංස්කාරයෙන් සමන්වාගත ඍද්ධිපාදය හවයි. වීර්‍ය්‍යසමාධිපූර්වක ... චිත්ත-සමාධිපූර්වක .... විමංසාසමාධිපූර්වක ප්‍රධන්වීර්‍ය්‍ය සඞ්ඛ්‍යාත සංස්කාරයෙන් සමන්වාගත ඍද්ධිපාදය හවයි:

මහණෙනි, රාගයාගේ අභිඥ පිණිස මේ සතර ධර්මයෝ භාවිතව්‍යයෝ යි.

[4. 8. 4.-30]

රාගස්ස භික්ඛවෙ පරිඤ්ඤාය [චත්තාරො ධම්මා භාවෙතබ්බා -පෙ- රාගස්ස භික්ඛවෙ] පරික්ඛයාය -පෙ- පහාණාය -පෙ- ඛයාය -පෙ- වයාය -පෙ- විරාගාය -පෙ- නිරොධාය-පෙ-චාගාය-පෙ-පටිනිස්සග්ගාය -පෙ- ඉමෙ චත්තාරො ධම්මා භාවෙතබ්බාති.

[4. 8. 31-60]

දොසස්ස [භික්ඛවෙ අභිඤ්ඤාය චත්තාරො ධම්මා භාවෙතබ්බා -පෙ-] දොසස්ස භික්ඛවෙ පරිඤ්ඤාය -පෙ- පරික්ඛයාය -පෙ- පහාණාය -පෙ- ඛයාය -පෙ- වයාය -පෙ- විරාගාය -පෙ- නිරොධාය -පෙ- චාගාය -පෙ- පටිනිස්සග්ගාය -පෙ- ඉමෙ චත්තාරො ධම්මා භාවෙතබ්බාති

[4, 8. 61-480]

මොහස්ස භික්ඛවෙ -පෙ- කොධස්ස -පෙ- උපනාහස්ස -පෙ- මක්ඛස්ස -පෙ- පළාසස්ස -පෙ- ඉස්සාය -පෙ- මච්ඡරියස්ස -පෙ- මායාය -පෙ- සාඨෙය්‍යස්ස -පෙ- ථම්භස්ස -පෙ- සාරම්භස්ස -පෙ- මානස්ස -පෙ- මදස්ස -පෙ- පමාදස්ස -පෙ- අභිඤ්ඤාය -පෙ- පරිඤ්ඤාය -පෙ- පරික්ඛයාය -පෙ- පහාණාය -පෙ- ඛයාය -පෙ- වයාය -පෙ- විරාගාය -පෙ- නිරොධාය -පෙ- චාගාය -පෙ- පටිනිස්සග්ගාය [චත්තාරො ධම්මා භාවෙතබ්බාති. කතමෙ චත්තාරො? ඉධ භික්ඛවෙ භික්ඛු කායෙ කායානුපස්සී - පෙ- වෙදනාසු වෙදනානුපස්සී -පෙ- චිත්තෙ චිත්තානුපස්සී -පෙ- ධම්මෙසු ධම්මානුපස්සී විහරති -පෙ- අකුසලානං ධම්මානං අනුප්පාදාය -පෙ- පහාණාය -පෙ- කුසලානං ධම්මානං උප්පාදාය -පෙ- පාරිපූරියා ඡන්දං ජනෙති -පෙ- ඡන්දසමාධිපධානසඞ්ඛාරසමන්නාගතං ඉද්ධිපාදං -පෙ- විරියසමාධි -පෙ- චිත්තසමාධි -පෙ- වීමංසාසමාධිපධානසඞ්ඛාරසමන්නාගතං ඉද්ධිපාදං භාවෙති. පමාදස්ස භික්ඛවෙ අභිඤ්ඤාය -පෙ- පටිනිස්සග්ගාය ඉමෙ චත්තාරො ධම්මා භාවෙතබ්බාති.

* රාගාදිපෙය්‍යාලං නිට්ඨිතං

# චතුක්කං සමත්තං.

* රාගපදතො පට්ඨාය පමාදපදපරියන්තෙසු සොළසසු පෙය්‍යාලෙසු එකමෙකං අභිඤ්ඤාදි දසහි පදෙහි යොජෙත්වා "චත්තාරො ධම්මා භාවෙතබ්බා"ති නිද්දිට්ඨ සතිපට්ඨාන සම්මප්පධාන ඉද්ධිපාදෙහි පච්චෙකං සවිතානි සබ්බ සුත්තානි අසීතානිකචත්තාරි සතානි හොන්ති.

[ 4. 8. 4 – 30 ]

මහණෙනි, රාගයාගේ පරිඥා පිණිස ... ධර්මයෝ සතර දෙනෙක් වැඩිය යුත්තාහ. මහණෙනි, රාගයාගේ පරික්ෂය පිණිස ... ප්‍රහාණය පිණිස ... ක්ෂය පිණිස ... ව්‍යය පිණිස ... විරාගය පිණිස ... නිරෝධය පිණිස ... ත්‍යාගය පිණිස ... ප්‍රතිනිස්සර්ගය පිණිස මේ සතර ධර්මයෝ භාවිතව්‍යයෝ යි.

[ 4. 8. 31 – 60 ]

මහණෙනි, ද්වේෂයාගේ අභිඥා පිණිස ධර්මයෝ සතර දෙනෙක් වැඩිය යුත්තාහ. මහණෙනි, ද්වේෂයාගේ පරිඥා පිණිස ... පරික්ෂය පිණිස... ප්‍රහාණය පිණිස ... ක්ෂය පිණිස ... ව්‍යය පිණිස ... විරාගය පිණිස ... නිරෝධය පිණිස ... ත්‍යාගය පිණිස ... ප්‍රතිනිස්සර්ගය පිණිස ... මේ සතර ධර්මයෝ වැඩිය යුත්තාහ.

[ 4. 8. 61 – 480 ]

මහණෙනි, මෝහයාගේ ... ක්‍රෝධයාගේ ... උපනාහයාගේ ... ම්‍රක්ෂයාගේ ... ප්‍රලාසයාගේ ... ඊර්ෂ්‍යාවගේ ... මාත්සර්යයාගේ ... මායාවගේ ශඨභාවයාගේ ... ස්තම්භයාගේ... සාරම්භයාගේ ... මානයාගේ... මදයාගේ ... ප්‍රමාදයාගේ ... අභිඥා පිණිස ... පරිඥා පිණිස ... පරික්ෂය පිණිස ... ප්‍රහාණය පිණිස ... ක්ෂය පිණිස ... ව්‍යය පිණිස ... විරාගය පිණිස ... නිරෝධය පිණිස ... ත්‍යාගය පිණිස ... ප්‍රතිනිස්සර්ගය පිණිස ධර්මයෝ සතර දෙනෙක් වැඩිය යුත්තාහ. කවර සතර දෙනෙක යත්: මහණෙනි, මේ ශාසනයෙහි මහණ තෙම කායෙහි කාය නුවණින් දක්නේ ... වේදනාවන්හි වේදනා නුවණින් දක්නේ ... ධර්මයන්හි ධර්ම නුවණින් දක්නේ වෙසෙයි ... අකුශල ධර්මයන්ගේ අනුත්පාදය පිණිස ... ප්‍රහාණය පිණිස ... කුශලධර්මයන්ගේ උත්පාදය පිණිස ... භාවනායෙන් පරිපූර්ණත්වය පිණිස ඡන්දය දනවයි ... ඡන්ද සමාධි ප්‍රධන්වීර්ය සමන්වාගත ඍද්ධිපාදය ... වීර්ය සමාධි ... චිත්ත සමාධි ... වීමංසාසමාධි ප්‍රධන්වීර්ය සමන්වාගත ඍද්ධිපාදය වඩයි. මහණෙනි, ප්‍රමාදයාගේ අභිඥා පිණිස ... ප්‍රතිනිස්සර්ගය පිණිස මේ සතර ධර්මයෝ වැඩිය යුත්තාහ.

*රාගාදි පෙය්‍යාලය නිමි

# චතුක්ක නිපාතය සමාප්ත යි.

* මෙහි රාග පදය පටන් ප්‍රමාද පදය අවසන් කොට ඇති සොළොස් පදයන්ට 'අභිඥා පිණිස' ආදි දශපදයන් වෙන වෙන ම සම්බන්ධ කොට එක් එක් පදය 'ධර්මයෝ සතර දෙනෙක් වැඩිය යුත්තාහ'යි කී නයින් සතිපට්ඨාන, සම්මප්පධාන, ඉද්ධිපාද යන සූත්‍ර තුන සමග යොදගත් කල සියලු සූත්‍ර සංඛ්‍යාව 480 කි. රාගාදි එක් එක් පෙය්‍යාලයෙහි සූත්‍රයෝ තිස් දෙනෙකි.

# ගාථාදිපාදනුක්කමණිකා


පිට්ඨඞ්කා

අ

අග්ගතො වෙ පසන්නානං 70
අග්ගස්ස දාතා මෙධාවී 70
අග්ගස්මිං දානං දදතං 70
අග්ගෙ ධම්මෙ පසන්නානං 70
අජෙළකා ච ගාවො ච 84
අජ්ඣත්තඤ්ච න ජානාති 134
අජ්ඣත්තඤ්ච පජානාති 134
අත්ථා සම්පචුරා හොන්ති 114, 116
අනණං සුඛං ඤත්වාන 132
අනත්ථං පරිවජ්ජෙති 90
අනභිජ්ඣාලු විහරෙය්‍ය 60
අනවජ්ජෙන තුට්ඨස්ස 54
අනිච්චං අනිච්චතො දක්ඛුං 102
අනිච්චෙව නිච්චසඤ්ඤිනො 102
අන්ධකාරෙන ඔනද්ධා 104
අන්නෙන අථ පානෙන 132
අප්පමත්තො අයං කලි 8
අප්පස්සුතොපි වෙ හොති 16
අපාදකෙහි මෙ මෙත්තං 136
අබ්‍යාපන්නා සදා සත්තා 64
අභිසඞ්ඛතං නිරාරම්භං 86
අවිජ්ජා නිවුතා පොසා 134
අවීතිවත්තා සක්කායං 68
අස්සමෙධං පුරිසමෙධං 84

ඉ

ඉති දෙවමනුස්සා ච 50
ඉති බුද්ධො අභිඤ්ඤාය 4
ඉති හෙතං නමස්සන්ති 50
ඉධ ධම්මං චරිත්වාන 114, 116

උ

උද්ධං තිරියං අපාචීනං 30, 34
උපට්ඨිතා සීලවන්තා 180
උභො ච හොන්ති දුස්සීලා 112, 116
උභො සද්ධා වදඤ්ඤූ ච 114, 116

පිට්ඨඞ්කා

එ

එකංසවචනං එකං 90
එතඤ්ච සල්ලං පටිගච්ච දිස්වා 52
එතමාදීනවං දිස්වා 20
එතං අනුස්සරං මච්චො 130
එතං හි යජමානස්ස 84
එතාදිසං යඤ්ඤමනුස්සරන්තා 120
එතෙ ච සබ්බගා තාස්සු 66
එවං නරං අන්නද පානදවත්ථදං 108
එවං යජිත්වා මෙධාවී 86
එවං විහරමානාපි 80
එසඛීණාසවො බුද්ධො 50
එසමග්ගො මහන්තෙහි 52
එස යො භගවා බුද්ධො 50

කා

කාමයොගෙන සංයුත්තා 24
කාමෙසනා භවෙසනා 82

කු

කුම්මග්ගං පටිපන්නො සො 28
කුහා ථද්ධා ලපා සිඞ්ගී 54

කො

කොධමක්ඛගරු භික්ඛු 92

ග

ගමනෙන න පත්තබ්බො 96, 98

ගි

ගිහිසාමීචිපටිපදං 122

ගු

ගුත්තානං වෙ තරමානානං 142

ච

චරං වා යදි වා තිට්ඨං 28




Free Distribution www.aathaapi.org

| | පිට්ඨඞ්කා |
|---|---|
| **චු** | |
| චුතා පතන්ති පතිතා | 6 |
| **චෙ** | |
| චෙතො සම්ඵස්සාමිචිං | 30 |
| **ඡ** | |
| ඡන්දා දොසා භයා මොහා | 36, 38 |
| **ත** | |
| තඤ්ච සම්මග්ගතා යඤ්ඤං | 84 |
| තණ්හා දුතියො පුරිසො | 20 |
| තතො හවෙ දූරතරං වදන්ති | 98 |
| තස්මා හවෙ ලොකවිදූ | 96, 98 |
| තස්මා හි අත්ථකාමෙන | 44 |
| තස්මා හි තෙ සප්පුරිසා පසංසියා | 40 |
| තස්මා හි ධීරො ඉධූපට්ඨිතා සති | 12 |
| තස්මා සද්ධඤ්ච සීලඤ්ච | 110 |
| **තා** | |
| තාය අධම්මචරියාය | 10 |
| තාය ධම්මචරියාය | 10 |
| තාය තං පරිචරියාය | 132 |
| **තෙ** | |
| තෙ මං ධම්මං පකාසෙන්ති | 102 |
| තෙසං දිවා ච රත්තො ච | 422 |
| **ද** | |
| දන්තො දමයතං සෙට්ඨො | 50 |
| **දා** | |
| දානඤ්ච පෙය්‍යවජ්ජඤ්ච | 66 |
| **දූ** | |
| දූරසඳෙ දූපපසඟො | 90 |
| **න** | |
| නභඤ්ච දූරෙ පථවී ච දූරෙ | 98 |
| න භාසමානං ජානන්ති | 100 |
| **නා** | |
| නාරති සහතී වීරං | 58 |
| **නි** | |
| නික්කුහා නිල්ලපා ධීරා | 54 |



| | පිට්ඨඞ්කා |
|---|---|
| **ප** | |
| පතිරූපෙ වසෙ දෙසෙ | 66 |
| පරොවරා යස්ස සමෙච්ච ධම්මා | 14 |
| පහීන ජාතිමරණො | 48 |
| **පා** | |
| පාණාතිපාතා අදින්නාදානං | 132 |
| **ඵ** | |
| ඵලං වෙ කදලිං හන්ති | 138 |
| **බ** | |
| බහුස්සුතං ධම්මධරං | 16 |
| බහුස්සුතොපි චෙ හොති | 16 |
| **බ්‍ර** | |
| බ්‍රහ්මාති මාතාපිතරො | 132 |
| **භා** | |
| භාසයෙ ජොතයෙ ධම්මං | 100 |
| **භි** | |
| භික්ඛු ච සීලසම්පන්නො | 18 |
| **භු** | |
| භුත්තා භොගා භටා භච්චා | 130 |
| **ම** | |
| මග්ගාමග්ගස්ස කුසලො | 76 |
| මහොදධිං අපරිමිතං මහාසරං | 108 |
| **මා** | |
| මාතරි පිතරි චාපි | 10 |
| මා මං අපාදකො හිංසි | 116 |
| **මි** | |
| මිච්ඡාජීවෙන ජීවන්ති | 104 |
| මිච්ඡාදිට්ඨිගතා සත්තා | 102 |
| **ය** | |
| යඤ්ච යඤ්ඤං නිරාරම්භං | 84 |
| යඤ්ඤෙ වා යදි වා සද්ධෙ | 84 |
| යතං චරෙ යතං තිට්ඨෙ | 30 |
| යදා බුද්ධා අභිඤ්ඤාය | 68 |
| යං කිඤ්චි දිට්ඨං ච සුතං මුතං වා | 52 |
| යස්මා ච සබ්බගා එතෙ | 66 |
| යස්ස සද්ධා තථාගතෙ | 110 |

පිට්ඨඞ්කා

යෙ

යෙ කෙචි කාමෙසු
අසඤ්ඤතා ජනා 12, 40
යෙ කෙචි මෙ වාදපථා
පුථුස්සිතා 20
යෙ ච කාමෙ පරිඤ්ඤාය 24
යෙ චබ්භතීතා සම්බුද්ධා 44
යෙච රූපෙන පාමිංසු 134
යෙ චස්ස ධම්මා අක්ඛාතා 54
යෙ ච සද්ධම්මගරුනො 92
යෙන දෙවූපපත්‍යස්ස 78
යෙපි දීඝායුකා දෙවා 68
යෙහි උපක්කිලිට්ඨා 104

යො

යො උද්ධතෙන චිත්තෙන 48
යො ච තෙසං තත්ථ තත්ථ 90
යො චරං වා තිට්ඨං වා 28
යො ච සීලෙන සම්පන්නො 48
යො ධම්මචක්කං අභිභුය්‍ය කෙවලී 20
යො නින්දියං පසංසති 8
යො වෙ කිලෙසානි පහාය පඤ්ච 14
යො වෙදි සබ්බසත්තානං 76
යො සඤ්ඤතානං පරදත්ත
භොජනං 120
යො හොති ව්‍යත්තො ච
විසාරදො ච 18

රා

රාගජඤ්ච දොසජඤ්ච 134
රාගදොස පරික්ඛිට්ඨා 104
රාහුග්ගං අත්තභාවිතං 34

රූ

රූපසොබ්භම්හි තං ඤත්වා 36

වි

විපස්සමානො ජානාති 132
විවත්තච්ඡද්දා යෙ ලොකෙ 86
විරූපක්ඛෙහි මෙ මෙත්තං 136

පිට්ඨඞ්කා

ස

සක්කායඤ්ච නිරොධඤ්ච 68
සඞ්ඛාය ලොකස්මිං පරොවරානි 90
සඞ්ඛාරෙ පරතො ඤත්වා 36
සඞ්ඝෙ පසාදො යස්සත්ථි 110
සතං සහස්සානං නිරබ්බුදානං 8
සත්තා ගච්ඡන්ති සංසාරං 102
සබ්බකම්ම විහායිනං 58
සබ්බරාග විරත්තස්ස 82
සබ්බලොකං අභිඤ්ඤාය 48
සබ්බෙ සත්තා සබ්බෙ පාණා 136
සබ්බෙ සද්ධම්මගරුනො 44
සම්මප්පධානා මාරධෙය්‍යාභිභූතා 32
සචෙ සහොතා සතො භික්ඛු 82
සචෙ සබ්බාභිභූ ධීරො 50

සා

සාමිකො සීලවා හොති 114, 116
සාමිකො හොති දුස්සීලො 114, 116
සාරත්තා රජනීයෙසු 134

සං

සංවරත්ථං පහානත්ථං 52
සංවරො ච පහානඤ්ච 34, 40

සී

සීලං සමාධිපඤ්ඤා ච 4
සීලෙ පතිට්ඨිතො භික්ඛු 80

සු

සුරං පිබන්ති මෙරයං 104
සුසඞ්ඛතං භොජනං යා දදාති 120
සුහුතා සුසිට්ඨං සුප්පත්තං 86

සො

සො ආයුදසී බලදසී 120, 122

# සඤ්ඤානාමානුක්කමණිකා


පිටඞ්කා

අ

අග්ගිවෙස්සො 348
අජපාලනිග්‍රොධො 42, 44
අජාතසත්තු 852
අන්නභාරො 60, 342
අනාථපිණ්ඩිකො 120, 122, 124, 130
අනුරුද්ධස්ස 462

ආ

ආනන්දචෙතියෙ 826
ආනන්දො 150, 156, 280, 304, 314, 324, 462
අභයො 384

උ

උක්කට්ඨං 76
උක්කලා 64
උග්ගො 384
උජ්ජායො බ්‍රාහ්මණො 84
උදයී බ්‍රාහ්මණො 86
උපකො මණ්ඩිකාපුත්තො 352
උපවත්තනෙ 184
උපවාණො 316
උප්පලවණ්ණා 318
උරුවෙලායං 42, 44

එ

එලෙය්‍යො 384

ක

කම්බොජං 156
කලන්දකනිවාපෙ 334, 346

කා

කාලකාරාමෙ 50

කු

කුසිනාරායං 148
කූටාගාර සාලායං 384

පිටඞ්කා

කෙ

කෙසි 218

කො

කොලියෙසු 120
කොසම්බියං 156, 280, 462

ඛු

ඛුජ්ජුත්තරා 318

ඛෙ

ඛෙමා 418

ග

ගන්ධබ්බ 384

ගි

ගිජ්ඣකූටෙ 60, 136, 338, 352

ඝො

ඝොසිතාරාමෙ 156, 280, 304, 462

චි

චිත්තො 318

ජා

ජාණුස්සොණි 336

ජෙ

ජෙතවනෙ 42, 92, 100, 134, 196, 388

තො

තොදෙය්‍යස්ස 348

දෙ

දෙවදත්තො 136

දො

දොණො 76




Free Distribution www.aathaapi.org

පිට්ඨඞ්කා

**න**

නකුලපිතුනො 116
නකුලමාතා 118
නන්දමාතා 318

**නා**

නාවින්දකී 348

**නෙ**

නෙරඤ්ජරාය 42, 44

**පො**

පොතලියො 190

**බා**

බාහියො 460

**බ්‍ර**

බ්‍රහ්මා සහම්පති 44

**භ**

භග්ගෙසු 116
භණ්ඩගාමෙ 2

**භෙ**

භෙසකලාවනෙ 116

**භො**

භොගනගරෙ 326
භොජපුත්තො 94

**ම**

මධුරං 110
මන්ධාතා 34
මල්ලානං 148
මල්ලිකා 388
මහාකොට්ඨිතො 312, 314
මහාමොග්ගල්ලානො 300

**මා**

මාගධො 352
මාලුඞ්ක්‍යපුත්තො 476

**මි**

මිගදායෙ 116

**මො**

මොග්ගල්ලො 348

**ය**

යමකො 348

පිට්ඨඞ්කා

**රා**

රාජගහෙ 60, 72, 136, 334, 338, 346, 352
රාමපුත්තො 338
රාහුලො 318

**රො**

රොහිතස්ස 92, 94

**ලො**

ලොණකාරදාරකො 352

**ව**

වරධරො 60, 342
වස්සකාරො 72, 346
වස්සභඤ්ඤ 64

**වි**

විසාඛො 100

**වෙ**

වෙදෙහි පුත්තො 352
වෙරඤ්ජං 110
වෙළුකණ්ටකියා 318, 336, 346
වෙසාලියං 384

**ස**

සකුලුදායී 60, 342
සජ්ජනෙලං 120

**සා**

සාකෙතෙ 50
සාරිපුත්තො 152, 278, 298, 300, 308, 312, 316, 324
සාළ්හා 384, 386
සාවත්ථියං 42, 92, 100, 134, 196, 388

**සි**

සිඛාමොග්ගල්ලානො 116

**සු**

සුංසුමාරගිරෙ 116
සුප්පවාසාය 120

**සෙ**

සෙතව්‍යං 76

**සො**

සොණකායනො මාණවො 448

**හ**

හත්ථකො ආලවකො 318

# පදානුක්කමණිකා


| | පිට්ඨඞ්කා |
|---|---|
| **අ** | |
| අක්ඛී | 340 |
| අකතකල්‍යාණො | 338 |
| අකතකුසලො | 338 |
| අකතඤ්ඤුතාය අකතවෙදිතාය | 440 |
| අකතපුබ්බං | 226 |
| අකතභීරුත්තාණො | 338 |
| අකතං කුසලං | 338 |
| අකතං භීරුත්තාණං | 338 |
| අකතං වත මෙ කල්‍යාණං | 338 |
| අකථංකථී | 400 |
| අකප්පියං තෙ න ඛාදිතබ්බං | 240 |
| අකම්මාසෙහි | 100 |
| අකසිරලාභී | 46, 166 |
| අකාලවාදී | 46 |
| අකාලිකො | 108 |
| අකිච්චං කරොති | 126 |
| අකිච්ඡලාභී | 46, 166 |
| අකිරියවාද | 64 |
| අකිරියං පඤ්ඤපෙති | 448 |
| අකුක්කුච්චකජාතං | 386 |
| අකුසලා ධම්මා අභිවඩ්ඪන්ති | 336 |
| අකුසලානං ධම්මානං | 480 |
| අකුසලෙ ධම්මෙ | 228 |
| අකුසලං පහාතබ්බන්ති | 352 |
| අක්කොධනා | 390 |
| අක්කොසකපරිභාසකො | 112 |
| අක්කොසන්තං | 410 |
| අක්කොසන්තං පච්චක්කොසති | 294 |
| අක්කොසිකපරිභාසිකා | 112 |
| අඛණ්ඩකාරී හොති | 468 |
| අඛණ්ඩෙහි | 110 |
| අක්ඛණවෙධී | 332, 386 |
| අක්ඛාතං | 6 |
| අක්ඛමා | 284 |
| අක්ඛමා පටිපදා | 294 |

| | පිට්ඨඞ්කා |
|---|---|
| **අ** | |
| අක්ඛමො හොති | 296 |
| අගතපුබ්බා | 228 |
| අගතිගමනානි | 36, 38 |
| අගපීතො | 56 |
| අග්ගඤ්ඤු | 56 |
| අග්ගපඤ්ඤත්තියො | 34 |
| අග්ගප්පසාද | 70 |
| අග්ගාභා | 268 |
| අගාරසමා | 238, 478 |
| අගාරවො | 42 |
| අගාරං අජ්ඣාවසතා | 498 |
| අග්ගාලොකො | 270 |
| අග්ගිං ජුහන්ති | 396 |
| අග්ගිතො වා | 128 |
| අග්ගිපජ්ජොතො | 270 |
| අග්ගිප්පභා | 268 |
| අග්ගිභයං | 234 |
| අග්ගෙ ජිනෙදය්‍ය | 386 |
| අග්ගෙ තෙ පසන්නා | 70 |
| අග්ගො ච | 182 |
| අග්ගාභාසො | 270 |
| අග්ගො විපාකො | 70 |
| අඝතො | 246 |
| අඞ්ගා | 250 |
| අඞ්ගණෙනෙව | 220 |
| අඞ්ගෙහි | 220 |
| අච්චයො | 282 |
| අච්චගමා | 282 |
| අච්චයං අච්චයතො | 282 |
| අචින්තෙය්‍යානි | 150 |
| අචින්තෙය්‍යා | 150 |
| අචිරපක්කන්තෙ | 136 |
| අචෙලකො | 394 |
| අච්ඡරියං | 150, 250, 348 |

පිට්ඨඞ්කා

අ


අච්ඡරියා අබ්භුතා ධම්මා 256
අච්ඡින්දකාරී 468
අච්ඡෙන්දති 110
අච්ඡෙච්ඡි තණ්හං 320, 478
අජරං 476
අජ්ජලො 484
අජ්ජවෙන 220
අජා හඤ්ඤන්තු 396
අජිනක්ඛිපම්පි 394
අජිනම්පි 394
අජෙළකා හඤ්ඤන්ති 84
අජෙළකපටිග්ගහණා 398
අජ්ඣත්තං 174, 306, 400
අජ්ඣත්තං චෙතොසම්ඵස්ස 174, 176
අජ්ඣත්තං යෙව 468
අජ්ඣත්තං සම්පසාදනං 244
අජ්ඣත්තිකස්ස උපාදාය 404
අජ්ඣත්තිකා ආපොධාතු 320
අජ්ඣත්තිකා තෙජොධාතු 320
අජ්ඣත්තිකා පඨවීධාතු 320
අජ්ඣත්තිකා වායොධාතු 320
අජ්ඣාගාරෙ 132
අජ්ඣෙසනං 44
අඤ්ජලිකම්මං 348
අඤ්ජලිකරණීයො 70, 110, 220, 332, 480
අඤ්ඤතරං 54
අඤ්ඤතිත්ථියානං 342
අඤ්ඤත්‍ර ඛීණාසවෙහි 278
අඤ්ඤත්‍ර විජ්ජාචරණෙන 318
අඤ්ඤත්‍රෙව 94
අඤ්ඤථස්මීති හොති 404
අඤ්ඤථා භවිස්සන්ති හොති 404
අඤ්ඤථා සන්ති හොති 404
අඤ්ඤදත්ථු 48
අඤ්ඤදත්ථුදසො 48
අඤ්ඤං ජාතිං 392
අඤ්ඤං ජීවං 82
අඤ්ඤං සරීරං 82
අඤ්ඤ චිත්තං උපට්ඨපෙති 252
අඤ්ඤාණා 22
අඤ්ඤතාදි 52
අඤ්ඤෙපි කිර භො 250

අ

අට්ඨඞ්ගිකො මග්ගො පඤ්ඤත්තො 70
අට්ඨ ච තණ්හාවිචරිතානි සතං හොති 404
අට්ඨ විමොක්ඛා 166, 170, 172
අට්ඨපුරිසපුග්ගලා 70, 110
අට්ඨානගතා 128
අට්ඨානං අනවකාසො 348
අට්ඨාරසතණ්හාවිචරිතානි 402
අට්ඨිකසඤ්ඤං 34
අට්ඨිවෙධවිද්ධො 222
අට්ඨිකඞ්කලා 226
අණුමත්තෙසු වජ්ජෙසු 28
අත්තාගුත්තියා 136
අත්තනා ච අදින්නාදායී හොති 486
අත්තනා ච අභිජ්ඣාලු හොති 490
අත්තනා ච කාමෙසු මිච්ඡාචාරී හොති 486
අත්තනා ච කාමෙසු මිච්ඡාචාරා පටිවිරතො හොති 486
අත්තනා ච පාණාතිපාතා පටිවිරතො හොති 486
අත්තනා ච පාණාතිපාතී හොති 486
අත්තනා ච පිසුණාවාචා පටිවිරතො හොති 488
අත්තනා ච පිසුණාවාචො හොති 488
අත්තනා ච ඵරුසාවාචො හොති 488
අත්තනා ච ඵරුසාවාචාය පටිවිරතො හොති 488
අත්තනා ච මුසාවාදා පටිවිරතො හොති 488
අත්තනා ච මුසාවාදී හොති 488
අත්තනා ච සම්ඵප්පලාපී හොති 488
අත්තනා ච සම්ඵප්පලාපා පටිවිරතො හොති 488
අත්තනි වා රූපං 408
අත්තනි වා විඤ්ඤාණං 408
අත්තනි වා වෙදනං 408
අත්තනි වා සඞ්ඛාරෙ 408
අත්තනි වා සඤ්ඤං 408
අත්තපරිතාපනානුයොග- මනුයුත්තො 396

පිට්ඨඞ්කා

අ

අත්තපරිත්තාය 136
අත්තභාව පටිලාභා 308
අත්තභාවිතං 34
අත්තරක්ඛාය 136
අත්තරූපෙන 232
අත්තවධාය 136
අත්තසඤ්චෙතනා ච කමති පරසඤ්චෙතනා ච 308
අත්තසඤ්චෙතනා ච කමති නො පරසඤ්චෙතනා 308
අත්තානං පරිහරති 6
අත්තානුවාදභයං 234
අතිචරිතා 118
අතිත්තාව 254
අතිපිබලිං 128
අතිපාතෙය්‍ය 94
අතිවිජ්ඣ පස්සති 224
අතීතානාගතපච්චුප්පන්නං 332, 386
අතීතානි ඡත්තිංස තණ්හා විචරිතානි 404
අතීතමද්ධානං 44
අථ කො චරහි 76
අථානෙන 398
අත්ථකවි 444
අත්ථගමඤ්ච 20
අත්ථඞ්ගමා 82
අත්ථචරියා 66, 476
අත්ථඤ්ඤං කිඤ්චි 312
අත්ථි ධම්මා 474
අත්ථතො පරියාදතං 268
අත්ථද්ධා 54
අත්ථපටිසම්භිදා සච්ඡිකතා 310
අත්ථමෙති 98
අත්ථවසෙ 462
අත්ථවාදී 46, 398
අත්ථස්ස විඤ්ඤාපනියා 100
අත්ථසංහිතං 46, 398
අත්ථි කම්මං අකණ්හං අසුක්කං අකණ්හඅසුක්කවිපාකං 446
අත්ථි කම්මං කණ්හං කණ්හවිපාකං 446

පිට්ඨඞ්කා

අ

අත්ථි කම්මං කණ්හසුක්කං කණ්හසුක්කවිපාකං 446
අත්ථිකම්මං සුක්කං සුක්කවිපාකං 446
අත්ථියාතං 228
අත්ථිසුඛං 130
අත්ථුපපරික්ඛී 186
අථෙවාපි දුන්නයො 284
අදිට්ඨං න මඤ්ඤති 52
අදිට්ඨෙ අදිට්ඨවාදිතා 472
අදිට්ඨෙ අදිට්ඨවාදී 434
අදිට්ඨෙ දිට්ඨවාදිතා 472
අදිට්ඨෙ දිට්ඨවාදී 434
අදින්නාදානෙ ච සමනුඤ්ඤො හොති 486
අදින්නාදානෙ සමාදපෙති 418
අදින්නාදායිනී 112
අදුක්ඛං අසුඛං 82, 224, 292
අධම්මවාදී 46
අධිකරණං තං න හොති 308
අධිකරණෙසු 462
අධිගච්ඡති සුඛං 130
අධිගච්ඡති සොමනස්සං 130
අධිගමනීයානි 130
අධිපඤ්ඤධම්මවිපස්සනාය 174
අධිමත්තං 178
අධිමත්තානි පාතුභවන්ති 292
අධිමත්තො ඡන්දො 176
අධිවචනං 132
අධිවාසකජාතිකො 228
අබ්භුතාගතචබ්භුතාසමෙන 148
අද්ධගතා 44
අද්ධදණ්ඩකෙනපි තාළෙන්තෙන 236
අද්ධවාසිකම්පි 394
අද්ධමාසූපසම්පන්නෙන 310
අද්ධානමග්ගපටිපන්නා 76, 110
අද්ධුවා 68
අනකොකාසක පරිභාසිකා 114
අනගාරියං 238, 478
අනඞ්ගණෙ 402
අනජ්ඣාපන්නො 56
අනණසුඛං 130
අනත්තනො 246
අනත්තන්තපො 392

පිට්ඨඞ්කා

අ

අනත්තනි අත්තානි 100
අනත්තමනො 238, 352
අනත්ථවාදී 46
අනත්ථසංහිතං 46
අනධිගතස්ස අධිගමාය 286
අනධිවාසකජාතිකො හොති 296
අනනුබොධා 2
අනනුවජ්ජො 6
අනනුච්ච 6, 158
අනන්තරධානාය 286
අනන්තරහිතාය භූමියා 39
අනන්තවා ලොකොති 82
අනපගතා 54
අනපදෙසං 46
අනභාවකතා 78, 478
අනභාවං ගමෙති 228, 294
අනභිජ්ඣා 58
අනභිජ්ඣාධම්මපදං 62
අනභිජ්ඣාය ච වණ්ණං භාසති 490
අනභිජ්ඣාය ච සමනුඤ්ඤො
හොති 190
අනභිජ්ඣාය සමාදපෙති 490
අනභිජ්ඣාලූනී 114
අනභිජ්ඣාලූ 454
අනභිසිතො 166
අනභිභූතො 48
අනරියපරියෙසනා 474
අනරියවොහාරා 472
අනලසො 56
අනවජ්ජතා ච 80, 282
අනවජ්ජබලං 274
අනවජ්ජසුඛං 130, 400
අනවජ්ජානි 54
අනවජ්ජාය දිට්ඨියා 456
අනවජ්ජෙන 130
අනවජ්ජෙන කායකම්මෙන 458
අනවජ්ජෙන මනොකම්මෙන 458
අනවජ්ජෙන වචීකම්මෙන 458
අනවජ්ජො 6, 262
අනවජ්ජො ච හොති
අනනුවජ්ජො 438
අනවඤ්ඤත්තිකාමො 464
අනවඤ්ඤපටිලාභාය 278

පිට්ඨඞ්කා

අ

අනාස්සවෙය්‍යුං 32, 294, 400
අනාගාමිනො හොන්ති
අනාගන්තාරො 308
අනාතාපී 26
අනාපන්නා වා 464
අනායතනසො 128
අනාලයෙ ධම්මෙ 252
අනාවත්ති ධම්මො 12, 268, 460
අනාසවං 12, 166, 282, 408, 460
අනික්කට්ඨකායො ච
අනික්කට්ඨ චිත්තො ච 264
අනික්ඛිත්තධුරො 480
අනිච්චතො 246
අනිච්චානුපස්සී 302
අනිච්චා වත කිර 68
අනිච්චෙව නිච්චන්ති 100
අනිට්ඨංගතො 338
අනිට්ඨෙන අකන්තෙන
අමනාපෙන 406
අනිධානවතිං වාචං 46
අනිස්සාමනිකා 390
අනිස්සිතාය 100
අනුකම්පාය 342
අනුකූලයඤ්ඤං 84
අනුත්තරං 116, 232, 476
අනුත්තරං ධම්මචක්කං 252
අනුත්තරා පුඤ්ඤක්ඛෙත්තං
70, 110, 332, 480
අනුත්තරං සම්මාසම්බොධිං 252
අනුත්තරාය සම්බොධාය 386
අනුත්තරොපුරිසදම්මසාරථි 68, 218
අනුපක්ඛිපිත්වා 470
අනුපට්ඨිතාය සතියා 240
අනුප්පාදෙන්තො 352
අනුපලිත්තං උදකෙන 78
අනුපහතං 6
අනුපාදිසෙසාය නිබ්බානධාතුයා 232
අනුපායාසබහුලා 390
අනුප්පන්නානං කුසලානං
ධම්මානං 492
අනුප්පන්නානං පාපකානං
අකුසලානං ධම්මානං 30, 138, 492
අනුප්පවෙච්ඡති 140

| අ | පිට්ඨඞ්කා |
|---|---|
| අනුමොදිතබ්බා | 72 |
| අනුරක්ඛනප්පධානං | 32, 140 |
| අනුවිච්ච | 6, 160 |
| අනුවිචරිතං | 48 |
| අනුවිලොකෙති | 66, 470 |
| අනුසයා | 304 |
| අනුස්සරිතා | 72 |
| අනුසාසනිං | 284 |
| අනුසාසාමීති | 238 |
| අනුසාසිතබ්බං | 220 |
| අනුසෙති | 216 |
| අනුසොතගාමීපුග්ගලො | 12 |
| අනෙකවස්සගණිකා | 322 |
| අනෙකවිහිතං | 394 |
| අනෙලගලාය | 100, 186 |
| අනෙලමූගො | 484 |
| අනෙසනං | 56 |
| අනොත්තප්පී හොති | 416, 436 |
| අනොත්තප්පෙ සමාදපෙති | 416 |
| අන්තග්ගාහිකාය දිට්ඨියා | 238 |
| අන්තකිරියා | 238 |
| අන්තමකාසි දුක්ඛස්ස | 320, 478 |
| අන්තරධානාය | 214 |
| අන්තරහිතො | 44 |
| අන්තරාකථා | 342 |
| අන්තරාපරිනිබ්බායිස්ස | 258 |
| අන්තරායිකා ධම්මා | 18 |
| අන්තරායෙව | 94 |
| අන්තරා ච | 76, 110 |
| අන්තරාසජ්ජිතං | 470 |
| අන්තරෙන යමකසාලානං | 148 |
| අන්තවා ලොකොති | 82 |
| අන්තං | 94 |
| අන්තො පූති | 462 |
| අන්තොසුසුද්ධා | 386 |
| අන්ධකාරතිමිසා | 250 |
| අන්නස්ස පානස්ස | 162 |
| අපගතා | 54 |
| අපජ්ඣායති | 412 |
| අපඤ්ජසා | 140 |
| අපණ්ණකතං පටිපදං | 144 |
| අපදු මා | 70 |



| අ | පිට්ඨඞ්කා |
|---|---|
| අපම්මුට්ඨා | 28 |
| අපරන්තපො | 392 |
| අපරාධෙන්තා | 126 |
| අපරාමට්ඨෙහි | 110 |
| අපරික්ඛීණා | 18 |
| අපරිපූරස්ස බො | 42 |
| අපරිපූරං වා ආදිබ්‍රහ්මචරියකං | 468 |
| අපරිමාණා ධම්මදෙසනා | 352 |
| අපරිමාණා පදා | 352 |
| අපරිමාණා බ්‍යඤ්ජනා | 352 |
| අපරිමිතපානභොජනා හොන්ති | 478 |
| අපරියන්තවතිං | 46 |
| අපරියොගාහෙත්වා | 6, 158 |
| අපරියොනද්ධත | 88 |
| අපරිසුද්ධකායසමාචාරා | 386 |
| අපරිසුද්ධමනොසමාචාරා | 386 |
| අපරිසුද්ධාජීවා | 386 |
| අපරිහීනා | 308 |
| අපරෙන සමයෙන | 146, 176, 282 |
| අපායමුඛානි | 322 |
| අපායං | 162, 236 |
| අපි අඤ්ඤදත්ථා සන්ති හොති | 404 |
| අපි ඉච්ඡං සන්ති හොති | 404 |
| අපි නු තං | 462 |
| අපිසුනාවාචා | 438 |
| අපි හසන්ති හොති | 404 |
| අපුඤ්ඤං | 6 |
| අප්පකස්ස සුතස්ස | 14 |
| අප්පකසිරෙන | 94 |
| අප්පකං සුතං හොති | 14 |
| අප්පච්චයසද්ධ | 388 |
| අප්පජානතො | 20 |
| අප්පටිවානී ච | 176 |
| අප්පටිවිරතො | 188 |
| අප්පටිවෙධා | 2 |
| අප්පටිසරණා | 284 |
| අප්පත්තගතා | 128 |
| අප්පත්තමානසො | 172 |
| අප්පත්තස්ස පත්තියා | 286 |
| අප්පතිකුට්ඨා | 56 |
| අප්පතිරූපං | 56 |
| අප්පතිස්සා | 42 |

පිට්ඨඞ්කා

අ

අප්පදක්ඛිණග්ගාහිතො 284
අප්පන්නපානභොජනො 162
අප්පපුඤ්ඤං පසවති 314
අප්පපතිතො 4
අප්පභොගා අප්පෙසක්ඛා 388
අප්පමාණං චෙතොසමාධිං 106
අප්පමාණෙන 246
අප්පමාණො උළාරො ඔභාසො 250
අප්පමාණො ධම්මො 136
අප්පමාණො පුඤ්ඤාභිසන්දො 106
අප්පමාණො බුද්ධො 136
අප්පමාණො සඞ්ඝො 136
අප්පමාදරතො භික්ඛු 80
අප්පමාදො 230, 232
අප්පමෙය්‍යො 106
අප්පම්පි වුත්තා සමානා 388
අප්පවජ්ජං 262
අප්පසන්නානං පසාදාය 468
අප්පසාදනීයෙ ඨානෙ 6, 158
අප්පස්සුතෙ සමාදපෙති 416
අප්පස්සුතො සුතෙන අනුපපන්නො 14
අප්පස්සුතො සුතෙන උපපන්නො 14
අප්පහීණත්තා 78
අප්පං අයාචිතො 166
අප්පානි ච සුලභානි ච 54
අප්පාබාධො 166
අප්පායුකා 140
අප්පියතො වා 128
අඵස්සිතං වා ධම්මං 468
අබ්‍යාපජ්ඣා ඵස්සා 446, 450
අබ්‍යාපජ්ඣං කායසඞ්ඛාරං 446, 450
අබ්‍යාපජ්ඣං මනොසඞ්ඛාරං 446, 450
අබ්‍යාපජ්ඣං ලොකං 446, 450
අබ්‍යාපජ්ඣං වචීසඞ්ඛාරං 446, 450
අබ්‍යාපජ්ඣං වෙදනං 446, 450
අබ්‍යාපජ්ඣෙන 246
අබ්‍යාපජ්ඣෙන කායකම්මෙන 458
අබ්‍යාපජ්ඣෙන මනොකම්මෙන 458
අබ්‍යාපන්නචිත්තො 400, 454, 490
අබ්‍යාසෙකසුඛං 400
අබ්‍රහ්මචරියං 398

පිට්ඨඞ්කා

අ

අබ්‍රහ්මචාරී 462
අභබ්බා 386
අභයප්පත්තා 18
අභික්කන්තතරො 182
අභික්කන්තවණ්ණා 92
අභික්කන්තාය රත්තියා 92
අභික්කන්තං 202
අභික්කන්තෙ පටික්කන්තෙ 400
අභික්කමිතබ්බං 238
අභික්ඛණං 288
අභිජ්ඣං ලොකෙ 400
අභිජ්ඣා දොමනස්සා 32, 294, 400
අභිජ්ඣාය ච වණ්ණං භාසති 490
අභිජ්ඣාය ච සමනුඤ්ඤො හොති 490
අභිජ්ඣාලූ 114
අභිජ්ඣා විසමලොභාභිභූතො 126
අභිජ්ඣාවිසමලොභො 126
අභිජ්ඣාව්‍යාපාදො 28
අභිඤ්ඤාතා 60
අභිඤ්ඤාතා අභිඤ්ඤාතා 342
අභිඤ්ඤා පරිඤ්ඤෙය්‍යා 474
අභිඤ්ඤා පහාතබ්බා 474
අභිඤ්ඤා භාවෙතබ්බා 474
අභිඤ්ඤා සච්ඡිකතා 450
අභිඤ්ඤා සච්ඡිකාතබ්බා 474
අභිනන්දිතා 336, 344
අභිප්පසන්නා 34
අභිභූ 48
අභිරූපා දස්සනීයා 388
අභිරූපො 162
අභිවදන්ති 46
අභිවාදනං 348
අභිසඞ්ඛරොති 446, 450
අභිසජ්ජති 388
අභිසම්පරායඤ්ච 118
අභිසම්බුජ්ඣති 48, 252
අභිසම්බුද්ධො 42, 44, 48, 232
අභූතවාදී 46
අබ්භඤ්ඤාසි 50, 478
අබ්භත්ථං ගච්ඡති 88
අබ්භා 102
අබ්භුග්ගච්ඡතු 124

| | |
|---|---|
| | පිට්ඨඞ්කා |
| **අ** | |
| අබ්භුතධම්මං | 14, 198, 346 |
| අබ්භුතා ධම්මා | 250, 254 |
| අබ්භුදෙති | 98 |
| අබ්භුන්නාමෙති | 470 |
| අබ්භොකාසං | 400 |
| අබ්භොකාසො පබ්බජ්ජා | 398 |
| අමඤ්ඤිංසු | 64 |
| අමඤ්ඤිම්හ | 68 |
| අමතං | 476 |
| අමනාපං කාතුං | 228 |
| අමනාපාතං | 278 |
| අමනාපානි | 284 |
| අමුකස්මිං | 224 |
| අමුකස්මිං නාම ආවාසෙ | 326 |
| අමුච්ඡිතො | 56 |
| අමූතෙ අමූතවාදිනා | 472 |
| අමූතෙ අමූතවාදී | 434 |
| අමූතං න මඤ්ඤති | 52 |
| අමුත්‍ර අක්ඛාතා | 398 |
| අමුත්‍ර වා සුත්වා | 398 |
| අමූසං භෙදාය | 398 |
| අම්බානි | 206 |
| අම්බූපමා | 206 |
| අයමන්තරාකථා උදපාදි | 342 |
| අයං දුක්ඛනිරොධගාමිනී පටිපදා | 332, 346, 388, 402, 480 |
| අයං දුක්ඛනිරොධො | 332, 346, 388, 402, 489 |
| අයං දුක්ඛසමුදයො | 332, 346, 388, 402, 480 |
| අයං ධම්මො | 326 |
| අයං විනයො | 326 |
| අයොගක්ඛෙමීති වුච්චති | 22 |
| අරක්ඛිතාය වාචාය | 240 |
| අරක්ඛිතෙන චිත්තෙන | 240 |
| අරක්ඛිතෙනෙව කායෙන | 240 |
| අරඤ්ඤං | 400 |
| අරතිරතිසහො | 58 |
| අරහත්තප්පත්තිං | 304 |
| අරහතො සම්මාසම්බුද්ධස්ස | 250 |
| අරහන්තා | 44 |
| අහරමග්ගං වා සමාපන්නා | 84 |
| | පිට්ඨඞ්කා |
| **අ** | |
| අරහං | 64, 396 |
| අරහං ජීවිතා වොරොපිතො | 454 |
| අරහං සම්මාසම්බුද්ධො | 34 |
| අරියකන්තානි | 110 |
| අරියපරියෙසනා | 476 |
| අරියවංසා | 56 |
| අරියවොහාරා | 472 |
| අරියස්ස විනයෙ | 282 |
| අරියස්ස සමාධිස්ස | 2 |
| අරියස්ස සීලස්ස | 2 |
| අරියසාවකො | 386 |
| අරියසාවිකා | 120 |
| අරියා | 292 |
| අරියාය පඤ්ඤාය | 2, 460 |
| අරියාය විමුත්තියා | 2, 460 |
| අරියෙ ඤායෙ | 72 |
| අරියෙන ඉන්ද්‍රියසංවරෙන | 400 |
| අරියෙන සමාධිනා | 460 |
| අරියෙන සීලක්ඛන්ධෙන | 400 |
| අරියෙන සීලෙන | 460 |
| අරියො අට්ඨඞ්ගිකො මග්ගො | 70 |
| අරූපිනො වා | 70 |
| අලද්ධා ච චීවරං | 56 |
| අලමත්තදසතරෙහි | 350 |
| අලමෙවත්ථා | 144 |
| අලං කාතුං අලං සංවිධාතුං | 72 |
| අවණ්ණාරහස්ස | 6, 158, 190 |
| අවණ්ණො | 144, 218 |
| අවසෙසෙන | 396 |
| අවිගතඡන්දො | 338 |
| අවිගතතණ්හො | 338 |
| අවිගතපරිළාහො | 338 |
| අවිගතපිපාසො | 338 |
| අවිගතපෙමො | 338 |
| අවිචාරං | 292 |
| අවිජ්ජා | 22 |
| අවිජ්ජා අනුපතිතා | 306 |
| අවිජ්ජාක්ඛන්ධං පදාලෙති | 388 |
| අවිජ්ජා ච භවතණ්හා ච | 474 |
| අවිජ්ජාපභෙදං | 322 |
| අවිජ්ජායමෙව | 306 |
| අවිජ්ජායොග විසංයොගො | 22 |
| අවිජ්ජායොගො | 20 |

| අ | පිට්ඨඞ්කා |
|---|---|
| අවිජ්ජාසවාපි | 402 |
| අවිඤ්ඤාතං න මඤ්ඤති | 52 |
| අවිඤ්ඤාතබ්බං න මඤ්ඤති | 52 |
| අවිඤ්ඤාතෙ අවිඤ්ඤාතවාදිතා | 472 |
| අවිඤ්ඤාතෙ විඤ්ඤාතවාදිතා | 472 |
| අවිඤ්ඤාතෙ අවිඤ්ඤාතවාදී | 434 |
| අවිඤ්ඤාතෙ විඤ්ඤාතවාදී | 434 |
| අසඞ්කිණ්ණපුබ්බා | 56 |
| අසඞ්ඛාරපරිනිබ්බායී | 300 |
| අසඞ්ඛෙය්‍යානි | 276 |
| අසඞ්ඛෙය්‍යො | 106 |
| අසච්ඡිකතස්ස සච්ඡිකිරියාය | 286 |
| අසඤ්ඤතො වා | 70 |
| අසතඤ්ච | 98 |
| අසද්ධම්මො | 92 |
| අසන්තෙන | 94 |
| අසන්තුට්ඨො | 278 |
| අසප්පුරිසඤ්ච | 414 |
| අසප්පුරිසතරඤ්ච | 414 |
| අසප්පුරිසෙන අසප්පුරිසතරො | 418 |
| අසප්පුරිසො | 6, 144, 348, 418, 438, 484 |
| අසප්පුරිසො අයං භවන්ති | 348 |
| අසබලකාරී | 468 |
| අසබලෙහි | 110 |
| අසමනුපස්සනතා | 18 |
| අසමවෙක්ඛිතං වා ධම්මං | 468 |
| අසමාහිතං | 64 |
| අසමාහිතා | 54 |
| අසම්පජානා | 62 |
| අසම්පජානො වා | 306 |
| අසම්මොසාය | 30, 286, 492 |
| අසල්ලිනා | 28 |
| අස්මීති හොති | 404 |
| අසස්සතා | 68 |
| අසස්සතො ලොකොති | 82 |
| අසහිතඤ්ච | 266 |
| අසංකිලිට්ඨං | 476 |
| අසංවුතං | 32 |
| අසංවුතා | 250 |
| අසංවුතෙහි ඉන්ද්‍රියෙහි | 240 |
| අස්මිමානො | 82, 412 |
| අස්මීති සති | 404 |
| අස්සදම්මසාරථී | 218, 220 |
| අස්සද්ධියෙ සමාදපෙති | 416 |
| අස්සද්ධො හොති | 416, 436 |
| අස්සපුටං | 466 |
| අස්සමණො | 462 |
| අස්සාජානීයො | 220, 480 |
| අස්සාදඤ්ච | 20 |
| අස්සුතවතා | 242 |
| අස්සුමුඛො | 12 |
| අස්සුමුඛා | 396 |
| අසාතාතං | 278 |
| අසාතානි | 224 |
| අසාරද්ධො | 28 |
| අසිතපීතඛායිතසායිතා | 94 |
| අසිතෙ පීතෙ | 400 |
| අසිනාපි සීසං ඡින්දෙන්ත | 236 |
| අසිප්පහාරකං | 226 |
| අසුචි | 468 |
| අසුතං න මඤ්ඤති | 52 |
| අසුතෙ අසුතවාදිතා | 472 |
| අසුතෙ අසුතවාදී | 434 |
| අසුතෙ සුතවාදිතා | 472 |
| අසුතෙ සුතවාදී | 494 |
| අසුභානුපස්සී | 290, 292, 302 |
| අසුභෙ සුභන්ති | 100 |
| අසුරො අසුරපරිවාරො | 174 |
| අසුරො දෙවපරිවාරො | 172 |
| අසු හි සාලලට්ඨී | 386 |
| අසෙසවිරාගනිරොධා | 306, 312 |
| අහාපෙත්වා | 144 |
| අහිනා දට්ඨො | 134 |
| අහිරිකතාය සමාදපෙති | 416 |
| අහිරිකො හොති | 416, 436 |
| අහෙතුවාදා | 64 |
| **ආ** | |
| ආකඞ්ඛති විතක්කෙතුං | 72 |
| ආකඞ්ඛාමි විතක්කෙතුං | 74 |
| ආකාසං | 66 |
| ආකිඤ්චඤ්ඤං යෙව පටිපදං | 344 |
| ආගතවිසො | 216 |
| ආගතාගමා | 284 |
| ආගුචාරිං | 236 |

| විසයා | පිට්ඨඞ්කා |
|---|---|
| **ආ** | |
| ආචරියකුලස්ස | 218 |
| ආචරියම්පි | 148 |
| ආචාමභක්ඛාපි | 194 |
| ආචාරගොචරසම්පන්නො | 78 |
| ආතාපනපරිතාපනානුයොගමනුයුත්තො | 394 |
| ආතාපී | 26, 476 |
| ආදිකල්‍යාණං | 46, 396 |
| ආදිත්තචෙලො වා | 178 |
| ආදිත්තසීසො වා | 178 |
| ආදිබ්‍රහ්මචරියකා සික්ඛා | 468 |
| ආදීනවඤ්ච | 20 |
| ආදීනවදස්සාවී | 56 |
| ආධිපච්චෙ ඨපෙන්ති | 478 |
| ආධිපතෙය්‍යානං | 34 |
| ආනන්තරියං | 288 |
| ආනීතා | 118 |
| ආනුභාවං | 62 |
| අනෙඤ්ජප්පත්තෙ | 402 |
| ආපත්තිභයානි | 464 |
| ආපදි | 128 |
| ආපන්නො | 464 |
| ආපාථදෙසො | 126 |
| ආපාදකා | 132 |
| ආපොධාතුරෙවෙසා | 320 |
| ආබාධතො | 246 |
| ආබාධිකිනී | 280 |
| ආභස්සරානං දෙවානං | 244 |
| ආභා | 250, 268 |
| ආභිචෙතසිකානං | 46, 166 |
| ආභිසමාචාරිකා සික්ඛා | 468 |
| ආභිසෙකො | 166 |
| ආභුජිත්වා | 76 |
| ආමකධඤ්ඤ පටිග්ගහණා | 398 |
| ආමකමංස පටිග්ගහණා | 398 |
| ආමවණ්ණී | 206 |
| ආමො හොති | 206 |
| ආමං පක්කවණ්ණී | 206 |
| ආයතනං තං න හොති | 308 |
| ආයතනසො | 128 |
| ආයතිං අනුප්පාදධම්මා | 78, 408, 478 |
| ආයතිං ජාතිජරාමරණිකානි | 334 |
| ආයතිං ජාතිජරාමරණිකෙහි | 22 |

| විසයා | පිට්ඨඞ්කා |
|---|---|
| **ආ** | |
| ආයතිං සංවරායාති | 282 |
| ආයම්බානි | 322 |
| ආයාචෙය්‍ය | 318 |
| ආයුං දෙති | 120 |
| ආයුප්පමාණං | 242 |
| ආයුස්ස | 120 |
| ආරක්ඛො | 232 |
| ආරද්ධවිරියො | 26, 144, 416, 436, 480 |
| ආරද්ධං හොති විරියං | 28 |
| ආරාචාරී | 398 |
| ආරාමිකසමණුද්දෙසු | 148 |
| ආරාමෙ | 42, 196 |
| ආරොග්‍යං පච්චාජානමානා | 276 |
| ආරොහපරිණාහසම්පන්නො | 480 |
| ආලයරතා | 252 |
| ආලයාරාමා | 252 |
| ආලයසමුග්ඝාතො | 70 |
| ආලයසම්මුදිතා | 252 |
| ආලොකසඤ්ඤං | 88 |
| ආලොකසඤ්ඤී | 400 |
| ආලොකා | 270 |
| ආලොකිතෙ විලොකිතෙ | 400 |
| ආලොකෙතබ්බං | 238 |
| ආවට්ටභයස්ස භීතො | 240 |
| ආවට්ටභයං | 238 |
| ආවරණීයෙහි ධම්මෙහි | 80 |
| ආසජ්ජ | 74 |
| ආසනපටික්ඛිත්තො | 394 |
| ආසනෙන වා නිමන්තෙන්ති | 46 |
| ආසභං ඨානං | 18 |
| ආසයා නික්ඛමති | 66 |
| ආසවනිරොධගාමිනී පටිපදාති | 402 |
| ආසවනිරොධොති | 402 |
| ආසවසමුදයොති | 402 |
| ආසවා | 18 |
| ආසවානං ඛයා | 12, 88, 166, 282, 408, 460 |
| ආසවානං ඛයඤාණාය | 402 |
| ආසවා පහීණා | 78 |
| ආසාදෙතබ්බං | 352 |
| ආසිවිසා | 216 |
| ආසිවිසූපමා | 216 |
| ආසීතිකො | 46 |

පිට්ඨඞ්කො

ආ

ආසෙවති 304
ආහාරසම්භූතො භගිනි අයං
කායො 280
ආහාරං ආහාරෙති 80, 282, 394
ආහාරං නිස්සාය 280
ආහාරෙ පටිකූලසඤ්ඤි 290, 302
ආහාරො පහාතබ්බො 280
ආහුනෙය්‍යාති
70, 110, 132, 220, 332, 480
ඉච්ඡාගතං 94
ඉච්ඡෙය්‍යාම 118
ඉට්ඨා 110, 124
ඉට්ඨාය කන්තාය 106
ඉට්ඨො 406
ඉතරීතරචීවරපිණ්ඩපාත
සෙනාසනගිලානපච්චය
භෙසජ්ජපරික්ඛාරෙන 278
ඉතරීතර චීවරසන්තුට්ඨියා 56
ඉතරීතර පිණ්ඩපාත සන්තුට්ඨියා 56
ඉතරීතරසෙනාසනසන්තුට්ඨියා 56
ඉතරීතරෙන චීවරෙන 56
ඉතරීතරෙන පිණ්ඩපාතෙන 56
ඉතරීතරෙන සෙනාසනෙන 56
ඉති 282
ඉති උද්ධමධො 246
ඉති එවරූපානි 404
ඉති ඛො 52
ඉති ඛො පනෙතං වුත්තං 282
ඉති තිරච්ඡානයොනී 218
ඉති දෙවා 218
ඉති පටිසඤ්චික්ඛති 228, 398
ඉතිපි බ්‍රාහ්මණසච්චානි 342
ඉති පුට්ඨො සමානො 76, 314
ඉති පෙත්තිවිසයො 218
ඉතිභවාභව හෙතු 20, 476
ඉති මනුස්සා 218
ඉති මං ජනො ජානාතු 52
ඉති යන්තං වුත්තං 282
ඉති රූපං 88, 172
ඉති වදං 342
ඉති වාදප්පමොක්ඛත්ථං 52
ඉති විඤ්ඤාණං 172
ඉති වුත්තකං 14, 198, 346

පිට්ඨඞ්කො

ඉ

ඉති වෙදනා 172
ඉති සක්කාය නිරොධගාමිනී
පටිපදා 68
ඉති සක්කාය නිරොධො 68
ඉති සක්කාය සමුදයො 68
ඉති සක්කායො 68
ඉති සඞ්ඛාරා 172
ඉති සඤ්ඤා 172
ඉත්ථත්තං 388
ඉත්ථත්තං ආගච්ඡති 154
ඉත්ථන්නාමා 28
ඉත්ථං භවිස්සන්ති හොති 404
ඉත්ථස්මීති හොති 404
ඉත්ථිකුමාරිකා පටිග්ගහණා 398
ඉදමෙතං පටිච්ච වුත්තං 282
ඉදමස්සාහං 54
ඉදං අකුසලන්ති 352
ඉදං තෙ නාසිතබ්බං 240
ඉදං දුක්ඛන්ති
198, 332, 388, 402, 480
ඉදං දුක්ඛන්ති සුතං හොති 346
ඉදං සප්පුරිසාසනන්ති 326
ඉධ චතුත්ථො සමණො 458
ඉධ තතියො සමණො 458
ඉධ තථාගතො ජාතො 232
ඉධ දුතියො සමණො 458
ඉධ ධම්මං චරිත්වාන 118
ඉධෙව සමණො 458
ඉද්ධිපාදං 492
ඉද්ධිමා 94
ඉන්ද්‍රියසංවරෙන 400
ඉන්ද්‍රියානි 274
ඉන්ද්‍රියෙසු ගුත්තද්වාරො 78
ඉමස්මා ධම්මවිනයා 4, 54
ඉමිනා අඤ්ඤදත්ථස්මීති හොති 404
ඉමිනා අඤ්ඤථා භවිස්සන්ති
හොති 404
ඉමිනා අඤ්ඤථා සන්ති හොති 404
ඉමිනා අපි ඉත්ථං සන්ති හොති 404
ඉමිනා අපි එවං සන්ති හොති 404
ඉමිනා අපිහ සන්ති හොති 404
ඉමිනා අසස්මීති හොති 404
ඉමිනා අස්මීති සති 404

පිට්ඨඞ්කා

### ඉ

ඉමිනා ඉත්ථස්මීති හොති 404
ඉමිනා ඉත්ථං භවිස්සන්ති හොති 404
ඉමිනා ඉත්ථං සන්ති හොති 404
ඉමිනා එවං භවිස්සන්ති හොති 404
ඉමිනා එවමස්මීති හොති 404
ඉමිනා එවං සන්ති හොති 404
ඉමිනා තයෙන නෙති 503
ඉමිනාපි අඤ්ඤථා සන්ති හොති 404
ඉමිනා භවිස්සන්ති හොති 404
ඉමිනා සතස්මීති හොති 404
ඉමිනා සන්ති හොති 404
ඉමෙ ධම්මා අනභිසම්බුද්ධාති 18
ඉමෙසං භෙදාය 398
ඉස්සති 388
ඉස්සරාධිපච්චං කාරෙමි 392
ඉස්සං බන්ධති 388
ඉස්සාමනකා 388
ඉස්සාය 494
ඉසි අහොසිං 94
ඉස්සුකී 156

### උ

උක්කුජ්ජෙය්‍ය 194
උක්කුටිකප්පධානමනුයුත්තා 394
උක්කුටිකොපි 394
උක්කොටනවඤ්චනනිකතිසාචි
යොගා 398
උග්ඝටිතඤ්ඤූ 260
උච්චාරපස්සාව කම්මා 94
උච්චාරපස්සාවං සන්ධාරෙති 278
උච්චාසයනමහාසයනා 398
උච්චෙ කුලෙ 162
උච්චෙසු විමානෙසු 68
උච්ඡින්නමූලා 78, 478
උච්ඡින්නා භවතණ්හා 4
උච්ඡෙදං ආහ ලොකස්ස 448
උජුං 386
උජුං කායං 76
උජුං කායං පණිධාය 400
උජුප්පටිපන්නා 110
උට්ඨානඵලූපජීවී න
කම්මඵලූපජීවි 260
උට්ඨානවීරියාධිගතා 130

පිට්ඨඞ්කා

### උ

උට්ඨානසඤ්ඤං 80
උණ්ණානාභී 136
උණ්හස්ස 228, 278, 296
උතුපරිනාමජානි 166
උතුසංවච්ඡරා 150
උත්තම දමථ සමථ මනුප්පත්තං 76
උත්තමො ච 182
උත්තරාය චෙපි දිසාය 58
උත්තරීතරං 36
උත්තරිතරො වා 52
උත්තරිං ආසවානං ඛයාය 178
උත්තරිං පඤ්ඤං 344
උත්තානි කරෙමි 310
උත්තානො 204
උත්තානොභාසො 204
උත්තාසෙය්‍යුං 236
උදකතොවා 128
උදකභයං 234
උදකරහදො 204
උදකා අච්චුග්ගම්ම 78
උදකාළ්හකසතසහස්සානීති 108
උදකාළ්හකානීති 108
උදකොරොහනානුයොගමනු
යුත්තා 394
උදකොරොහනකස්ස 238
උදයබ්බයානුපස්සී 88, 172
උද්ධතං 14, 198, 346
උද්ධග්ගිකං 128
උද්ධච්චකුක්කුච්චං 28, 126
උද්ධච්චකුක්කුච්චාභිභූතෙන 126
උද්ධංසොතස්ස
අකනිට්ඨගාමිනො 258
උද්ධුමාතකසඤ්ඤං 34
උන්නතුන්නතො 641
උන්නතොනතො 164
උන්නලා 54
උපක්කිලිට්ඨා 102
උපක්කිලෙසොති 126
උපජ්ඣායම්පි 148
උපට්ඨපෙත්වා 76
උපට්ඨාකසාලායං 100
උපට්ඨිතසතී 416
උපදංසෙති 158

පිට්ඨඞ්කා

### උ

උපද්දුස්සති 838
උපතාපස්ස 494
උපනිස්සාය 42, 44, 290
උපනීය 74
උපපජ්ජති 162
උපපත්ති අසාධාරණා
පුථුජ්ජනෙහි 246
උපපත්ති පටිලාභිකානි 258
උපවජ්ජං 466
උපවජ්ජානි 352
උපසම්පජ්ජ විහාසි 478
උපහතං 6
උපහරන්ති 166
උපහාරං 166
උපායාසෙහි 238
උපාරම්භභයා 64
උපාසක පරිසා 254
උපාසකො දුස්සීලො 430
උපාසකො සීලවා 430
උපාසිකා 16
උපාසිකා දුස්සීලා 430
උපාසිකා පරිසා 254
උපාසිකා සීලවතී 430
උපෙක්ඛකො ච 292
උපෙක්ඛකො ච විහරති 244
උපෙක්ඛා 192
උපෙක්ඛාසති පාරිසුද්ධිං 82, 244, 292
උපෙක්ඛාසම්බොජ්ඣඞ්ගො 456
උපෙක්ඛාසහගතෙන චෙතසා 248
උප්පජ්ජමානා උප්පජ්ජන්ති 20
උප්පන්නං කාම විතක්කං 32
උප්පන්නානං කුසලානං
ධම්මානං 492
උප්පන්නානං පාපකානං
අකුසලානං ධම්මානං 429
උප්පන්නුප්පන්නෙ පාපකෙ
අකුසලෙ ධම්මෙ 32
උබ්බට්ටකොටි 394
උබ්බෙජෙතා 212
උභතො පදිත්තං 182
උභයෙනෙව හීනා 298
උභො ච 118
උභො ඤාතිපක්ඛයො 118

පිට්ඨඞ්කා

### උ

උභො සද්ධා 118
උම්මග්ගො 344
උම්මාදස්ස 150
උරත්තාළිං කන්දති 338
උරබ්භා සඞ්ඝාතං 396
උළුකපක්ඛම්පි 394
උසභා සඞ්ඝාතං 396
උස්සාහො ච 176
උස්සොළ්හී ච 176
උසුපහාරිතං 226

### ඌ

ඌමිභයං 238

### එ

එකග්ගං 28
එකග්ගමානසො 178
එකච්චස්ස පුග්ගලස්ස 14, 258
එකත්ථම්භං 98, 100
එකන්තදුක්ඛං 446, 450
එකන්තපරිපුණ්ණං 398
එකන්තසුඛං 446
එකභත්තිකො 398
එකමත්තානං 128
එකමන්තං 44, 190
එකමන්තං අට්ඨාසි 92
එකමිදාහං 42, 44
එකම්පි වස්සං 276
එකවාචිකම්පි 460
එකවීසතිකප්පම්හි 100
එකසිඛා 66
එකං දිසං ඵරිත්වා 246
එකංසං 34, 162
එකංසබ්‍යාකරණීයො 90
එකංසං උත්තරාසඞ්ගං
කරිත්වා 44, 282
එකස්මිං ඨානෙ 396
එකාහිකම්පි 394

### ඒ

එකිස්සා ගාවියා 396
එකිස්සාපි දන්තියා 394

පිට්ඨඞ්කා

ඒ

එකෙ 104
එකොදිකාතබ්බං 180, 244, 292
එකොදි හොති 304
එණෙය්‍යකම්පි 236
එතදග්ගං 34
එතස්මිං අන්තරෙ 48
එතං පමාණං 318
එතෙ ධම්මා 46
එතෙසං වා අඤ්ඤතරෙන 478
එත්තකො පුඤ්ඤාභිසන්දො 106
එන්දනි 476
එරකවත්තිකම්පි 236
එලමූගො 484
එළකමන්තරං 394
එවම්භූතො 26
එවමෙම දිට්ඨන්ති 334
එවමෙම මුතන්ති 334
එවමෙම විඤ්ඤාතන්ති 334
එවමෙම සුතන්ති 334
එවමස්මීති හොති 404
එවමස්ස වචනීයො 178
එවරූපං 394, 464
එවරූපං දිට්ඨං 336
එවරූපං මුතං 336
එවරූපං විඤ්ඤාතං 336
එවරූපං සුතං 336
එවං ජානතො එවං පස්සතො 402
එවං දිට්ඨි 334
එවං නිරයෙ 38, 430, 486
එවං බුද්ධා අබොධියා 82
එවං මහානුභාවො 68
එවං මහෙසක්ඛො 68
එවං වාදී 334
එවං සග්ගෙ 40, 158, 430, 486
එවං සන්ති හොති 404
එවං සික්ඛිතබ්බා 278
එසනාය 30
එසං 290
එසා තුලා 318
එසිකා 78
එහිපස්සිකො 108
එහි භද්දන්තිකො 394

පිට්ඨඞ්කා

ඔ

ඔක්කමම 110
ඔක්කමන්තෙ පුබ්බඞ්ගමා 286
ඔකොටිමකො 162
ඔඝස්ස නිත්ථරණාය 386
ඔතිණ්ණාමහි 238, 240
ඔත්තප්පබලං 290
ඔත්තප්පී හොති 26, 416, 436
ඔතාරියමානානි 326
ඔදරිකත්තනසෙසතං අධිවචනං 240
ඔධිසො 310
ඔනතුන්නතො 164
ඔනතොනතො 164
ඔනීතපත්තපාණිං 120
ඔපක්කමිකානි 166
ඔපනයිකො 108
ඔපපාතිකො 12, 168, 460
ඔභාසො 270
ඔරබ්භිකො 396
ඔරම්භාගියානං සංයොජනානං 12, 168, 460
ඔරම්භාගියානි සංයොජනානි 258, 308
ඔරිමඤ්ච 98
ඔළාරිකං වා සුඛුමං වා 332, 386
ඔවදුමපි 238
ඔසිකෙඩ්වය්‍යුං 256
ඔහාරෙත්වා 396
ඔහිතසොතො 226

ක

කඞ්ඛා 148
කඞ්ඛවිතම්හි 338
කටුකානි 224
කණ්ණසුඛා 398
කණ්ටකාපස්සයිකොපි 394
කණ්ටකාපස්සයෙ සෙය්‍යං කප්පෙන්ති 394
කණ්ඩච්ඡන්නකානි 386
කණ්හකෙබාපි 394
කතත්තා හොති 128
කතෙතා 406
කන්දරං 400
කත්ථචි කිඤ්චනතාම්හි 344

පිට්ඨඞ්කා

ක

කඤ්ඤා 124
කඤ්ඤු බො 42
කතං කරණීයං 402, 478
කතං කිබ්බිසං 338
කතං පාපං 338
කතං ලුද්දං 338
කතකල්‍යාණො 340
කතකිබ්බිසො 338
කතකුසලො 340
කතඤ්ඤුතා කතවෙදිතා 440
කතපාපො 338
කතභීරුත්තාණො 340
කතපුබ්බං 226
කතමො ච භික්ඛවෙ සුගතො 284
කතලුද්දො 338
කතහත්ථො 94
කතා මෙ රක්ඛා 136
කතා මෙ පරිත්තා 136
කතූපාසනො 94
කථාසල්ලාපො 448
කප්පස්ස 276
කප්පියං තෙ ඛාදිතබ්බං 240
කප්පො 276
කප්පො ආයුප්පමාණං 242
කම්මං අකණ්හං අසුක්කං
අකණ්හ අසුක්කවිපාකං 450
කම්මං කණ්හං කණ්හවිපාකං 450
කම්මං කණ්හසුක්කං කණ්හ
සුක්කවිපාකං 450
කම්මං සුක්කං සුක්කවිපාකං 450
කම්මක්ඛයාය සංවත්තති 446, 450
කම්මකරණි වා 396
කම්මකාරණා 236
කම්මන්තං පයොජෙති 156
කම්මනියෙ 402
කම්මඵලූපජීවී ච
උට්ඨානඵලූපජීවී 260
කම්මවිපාකජානි 166
කම්මවිපාකො 150
කම්මසච්චායං ලොකො 448
කම්මානි 128, 446, 450
කයවික්කයා 398
කයිරමානං 228

පිට්ඨඞ්කා

ක

කරණීයං 176, 230
කරණීයාධිකරණීයෙසු 350
කරුණාසහගතෙන චෙතසා 248
කල්‍යාණං 340
කල්‍යාණධම්මඤ්ච 426
කල්‍යාණධම්මතා 72
කල්‍යාණධම්මෙන කල්‍යාණ-
ධම්මතරඤ්ච 426
කල්‍යාණවාක්කරණො 186
කල්‍යාණවාචො 186
කල්‍යාණී පරිපුච්ඡා 344
කල්‍යාණෙන කල්‍යාණතරඤ්ච 424
කලෙබරෙ 98
කවී 444
කස්ස ච උප්පන්නස්ස වසං
ගච්ඡන්තීති 344
කස්ස චි කිඤ්චනත්ථුස්මිං 344
කසිරවුත්තිකො 162
කසිරෙන 163
කසම්බුජාතො 462
කසාභිපි තාළෙන්ති 236
කහාපණකම්පි 236

කා

කාණො 162
කාමභොගිතං 34
කාමජ්ඣොසානං 20
කාමතණ්හා 20
කාමනන්දී 20
කාමපරිළාහො 20
කාමපිපාසා 20
කාමභොගී චාමෙන
පයොසෙන ගෙසෙන්ති 470
කාමභොගීසෙය්‍යා 470
කාමමුච්ඡා 20
කාමයොගවිසංයොගො 22
කාමයොගො 20
කාමරාගො 20
කාමවිතක්කං 228, 294
කාමවිතක්කො 26
කාමසිනෙහො 20
කාමානං සමුදයං 20
කාමාසවාපි 402

පිට්ඨඞ්කො

කා

කාමෙසු අවීතරාගො 338
කාමෙසනා 82
කාමෙසු 20
කාමෙසු මිච්ඡාචාරා 188
කාමෙසු මිච්ඡාචාරස්ස ච
වණ්ණං භාසති 486
කාමෙසු මිච්ඡාචාරා පටිවිරතො 415
කාමෙසු මිච්ඡාචාරා වෙරමණියා
ච වණ්ණං භාසති 486
කාමෙසු මිච්ඡාචාරා වෙරමණියා
ච සමනුඤ්ඤො හොති 486
කාමෙසු මිච්ඡාචාරිනී 112
කාමෙසු මිච්ඡාචාරී 12, 138, 158, 418
කාමෙසු මිච්ඡාචාරෙ ච
සමනුඤ්ඤො 486
කාමෙසු මිච්ඡාචාරෙ සමාදපෙති 418
කායකම්මෙන 130, 166
කායදුච්චරිතං 230, 234
කායදුච්චරිතෙන 430
කායඥුත්ථ 342
කායපාරිහාරිකෙන චීවරෙන 400
කායසඞ්ඛාරං 306
කායසඤ්චෙතනා හෙතු 306
කායසුචරිතං 230
කායං අබ්භඤ්ජිත්වා 396
කායිකො ච රොගො 276
කායෙ කායානුපස්සී 492
කායෙන ඵුසිත්වා 166
කායෙන ඵොට්ඨබ්බං ඵුසිත්වා
32, 294, 400
කාරණං 220
කාලඤ්ඤුතා 192
කාලකතො 94, 134, 224
කාලවාදී 46, 398
කාලා 270, 272
කාලෙ 240
කාලෙන ධම්මසවණං 270, 272
කාලෙන ධම්මසාකච්ඡා 270, 272
කාලෙන විපස්සනා 270, 272
කාලෙන සමථො 270, 272
කාලං කුරුමානො 242
කාසායානි වත්ථානි අච්ඡාදෙත්වා 398
කාළකං වත්ථං 466

පිට්ඨඞ්කො

කි

කිච්චං අපරාධෙති 126
කිඤ්ච නං 234, 236
කිඤ්චාපි සො 228
කිම්භගපනාගනාති 282
කිඤ්චෙතං පටිච්ච වුත්තං 282
කිබ්බිසං 340
කිමස්ස උත්තරිං කරණීයං 28
කිං කරණීයානි 72
කිං දහරෙ වක්ඛාම 476

කු

කුක්කුටසූකරා 84
කුක්කුටසූකරපටිග්ගහණා 398
කුච්ඡිපරිහාරිකෙන
පිණ්ඩපාතෙන 400
කුඨාරීහි තච්ඡෙය්‍ය 386
කුණී 162
කුතො තං භවෙත 462
කුතො පන 118, 448
කුදස්සු නාම 282
කුපිතො 238, 352
කුම්භිමුඛා 394
කුම්භීලභයං 238
කුම්භූපමා 200
කුරූරකම්මන්තා 396
කුලපුත්තා 478
කුලම්හා 200
කුසචීරම්පි 394
කුසලධම්මතා 72
කුසලං 340
කුසලා ධම්මා පරිහායන්ති 336
කුසලානං ධම්මානං
30, 138, 140, 176
කුසලාභිසන්ද 106
කුසලෙසු ධම්මෙසු 186, 400, 480
කුසීතො 26, 416, 436
කුහා 54

කෙ

කෙවලකප්පං 92, 460
කෙවලපරිපුණ්ණං 396
කෙවලපරිපුණ්ණා 46
කෙවලස්ස දුක්ඛක්ඛන්ධස්ස 328

පිට්ඨඞ්කා

කෙ

කෙසකම්බලම්පි 394
කෙසමස්සුලොචකො 394
කෙසමස්සුලොචනානු-
යොගමනුයුත්තො 394
කෙසෙ පකිරිත්වා 466

කො

කොධගරු න සද්ධම්මගරු 90
කොධගරු හොති 160
කොධනා හොන්ති
උපායාසබහුලා 388
කොධමක්ඛගරු භික්ඛු 92
කොධූපායාසස්ස එතං
අධිවචනං 238
කො පච්චයො 152
කොපඤ්ච 388
කො පන වාදො 144
කොලියධීතාය 120
කොලියානං 120
කොසජ්ජෙ සමාදපෙති 416

ඛ

ඛජ්ජයාපි 322
ඛඤ්ජා 162
ඛතං 6
ඛතං උපහතං අත්තානං 438, 484
ඛත්තියකඤ්ඤාපි 392
ඛත්තියපරිසා 256
ඛත්තියමහාසාලකුලෙ 162
ඛත්තියො මුද්ධාවසිත්තො 396
ඛත්තා 226
ඛත්තියා 220
ඛන්තිසොරච්චෙ 128
ඛන්ධෙ ආරොපෙත්වා 466
ඛමා පටිපදා 294
ඛමා භවිස්සාම 278
ඛමො හොති 226
ඛරස්සරෙන පණවෙන 464
ඛරාජිනං නිවාසෙත්වා 396
ඛලොපිමුඛා 394
ඛාදිතබ්බං 240
ඛාරපතච්ඡිකම්පි 236
ඛායිතෙ සායිතෙ 400

පිට්ඨඞ්කා

ඛි

ඛිප්පඤ්ඤෙව 226, 228
ඛිප්පනිසන්ති 186

ඛී

ඛීණා ජාති 402, 478
ඛීණා භවනෙත්ති 4
ඛීණාසවස්ස 18
ඛීරම්හා දධි 182
ඛීරං 396

ඛු

ඛුරමුණ්ඩං කරිත්වා 464

ඛෙ

ඛෙත්තං තං න හොති 308
ඛෙත්තවත්ථුපටිග්ගහණා 398
ඛෙමප්පත්තො 18

ග

ගජ්ජිතා 196
ගණ්ඩතො 246
ගතපුබ්බං 226
ගති 338
ගතෙ ඨිතෙ නිසින්නෙ සුත්තෙ
ජාගරිතෙ භාසිතෙ
තුණ්හීභාවෙ 400
ගන්තා 226
ගන්ධබ්බා නො භවං 76
ගඹෙන 94
ගම්භීරෙසු 278
ගම්භීරා 204
ගම්භීරාභාසො 204
ගරහිතබ්බං 64
ගරුකත්වා 42, 44
ගවා ඛීරං 182
ගහට්ඨකානි 72
ගහපතයො 118
ගහපතානී 118
ගහපති 110
ගහපතිකඤ්ඤාපි 392
ගහපතිමහාසාලකුලෙ 162
ගහපතිපරිසා 256
ගහපතිපුත්තො වා 398


Free Distribution www.aathaapi.org

පිට්ඨඞ්කා

ගා

ගාථං 14, 198
ගාධං කත්වා 208
ගාමනිගමරාජධානීසු 68
ගාවො හඤ්ඤන්ති 84
ගාරය්හං 464
ගාරය්හා ඨානා 64
ගාරය්හො 352
ගාළ්හබන්ධනං බන්ධිත්වා 464
ගාළ්හා රොගාතඞ්කා ඵුසන්ති 338

ගි

ගිරිගුහං 400
ගිලානපච්චය
භෙසජ්ජපරික්ඛාරං 60, 106, 166
ගිහීනා කාමභොගිනා 130
ගිහීසාමීචිපටිපදං 122

ගු

ගූථානං 76
ගුළාගුණ්ඨිකජාතො 402

ගෙ

ගෙය්‍යං 14, 198, 346

ගො

ගොචරාය පක්කමන්ති 66
ගොමයභක්ඛාපි 394

ඝ

ඝටිස්සාම 278

ඝා

ඝානෙන ගන්ධං ඝායිත්වා
32, 294, 400
ඝාසච්ඡාදෙ 162

ඝො

ඝොරවිසො 216
ඝොසප්පමාණො
ඝොසප්පසන්නො 134

පිට්ඨඞ්කා

ච

චක්කානි 66, 76
චක්ඛුමන්තො 194
චක්ඛුනා රූපං දිස්වා
32, 78, 294, 400
චක්ඛුන්ද්‍රියං 32, 78, 294, 400
චණ්ඩාලකුලෙ 162
චතස්සො අග්ගපඤ්ඤත්තියො 34
චතස්සො ආභා 268
චතස්සො පභා 268
චතස්සො සෙය්‍යා 470
චත්තානි 82
චත්තාරි කම්මානි 450
චත්තාරි අභිරාජකුලානි 136
චත්තාරි චක්කානි 66
චත්තාරි ඨානානි 120
චත්තාරි ධම්මපදානි 60
චත්තාරිපිවස්සානි 276
චත්තාරි බලානි 482
චත්තාරිමානි ඣානානි 406
චත්තාරිමානි පධානානි 138
චත්තාරි පුරිසයුගානි 70, 110
චත්තාරිමානි අගතිගමනානි 36
චත්තාරිමානි සම්මප්පධානානි 30
චත්තාරිමානි සුඛානි 130
චත්තාරිමානි සුවිදූරවිදූරානි 98
චත්තාරිමානි සොබ්මමානි 36
චත්තාරි වචීදුච්චරිතානි 272
චත්තාරි සඞ්ගහවත්ථූනි 66, 476
චත්තාරිසම්පි වස්සානි 276
චත්තාරො අච්ඡරියා 254
චත්තාරො අබ්භුතා ධම්මා 254
චත්තාරො අරියවංසා 56
චත්තාරො ආනිසංසා 460
චත්තාරො ආලොකා 270
චත්තාරො ඔභාසා 270
චත්තාරො කප්පා 244
චත්තාරො කවී 444
චත්තාරො කාලා 270, 272
චත්තාරො ධම්මකථිකා 266
චත්තාරො ධම්මා 124, 270
චත්තාරො පජ්ජොතා 270
චත්තාරොමෙ පුග්ගලා 12, 134, 258
චත්තාරොමෙ විසංයොගා 22

පිට්ඨඞ්කා

ච

චත්තාරො යොගා 20
චත්තාරො වාදී 268
චත්තාරො සඤ්ඤාවිපල්ලාසා 100
චත්තාරො සංවාසා 110
චත්තාරො සාරා 272
චතුචක්කං වත්තති 66
චතුන්නං ඛාතානං 46
චතුන්නං ධම්මානං 334
චතුත්ථං අත්ථවසං 464
චතුත්ථං ඣානං 82, 244, 400
චතුත්ථං ඨානගතං 128
චතුත්ථං මහාපදෙසං 330
චතුත්ථස්මිං ඨානෙ 396
චතුත්ථො අච්ඡරියො
අබ්භුතො ධම්මො 252
චතුත්ථො ධම්මො 124
චතුපජ්ජොතො 270
චතුප්පදා වා 70
චතූසු ඨානෙසු 232
චතූසු ධාතූසු 320
චතූහි අඞ්ගෙහි 332, 480
චතූහි ඨානෙහි අප්පමාදො 230
චතූහි අරියවංසෙහි 58
චතූහි ඨානෙහි 478
චතූහි ධම්මෙහි 122, 480
චතූහි පටිසම්භිදාහි 268
චතූහි පුඤ්ඤාභිසන්දෙහි 108
චතූහි මග්ගෙහි 304
චන්දප්පභා 268
චන්දාභා 268
චන්දලොකො 270
චන්දිමසූරියා 140
චන්දොභාසො 270
චම්මවෙධවිධො 222
චරණවිපන්නො 318
චරණසම්පන්නො 318
චරණෙන සන්තකරො 316
චරතොවෙති 26
චරම්පි භික්ඛු 26

පිට්ඨඞ්කා

චා

චාගසම්පදා 124
චාගාය 494

චි

චිත්තං 180
චිත්තං අභිනින්නාමෙති 402
චිත්තං පග්ගණ්හාති 30, 138, 492
චිත්තං පරිසොධෙති 400
චිත්තං විමුච්චති 402
චිත්තවිපල්ලාසො 100
චිත්තසමාධි 492
චිත්තස්ස වසං ගච්ඡති 344
චිත්තෙන ඛො භික්ඛු
ලොකො නීයති 344
චිත්තෙන පරිකිස්සති 344
චිත්තා කවි 444
චිරකතම්පි 72
චිරට්ඨිතිකා 68
චිරභාසිතම්පි 72
චිරං ජීවාමි 124

චී

චීරකවාසිකම්පි 236
චීවරං 166
චීවරහෙතු වා 476
චීවරෙන 122

චු

චුතූපපාතඤාණාය 402

චෙ

චෙතනා 450
චෙතසා 126
චෙතසිකො ච රොගො 276
චෙතසො 226
චෙතසො උපක්කිලෙසෙ 400
චෙතොපරිචිතකම්මඤ්ඤාය 44
චෙතසො පරිචිතකො 42
චෙතොවසිප්පත්තො 72
චෙතොවිමුත්තිං 12, 160, 228, 408
චෙතොවිමුත්ති 460
චෙතොසමථස්ස 174
චෙලස්ස වා 178


Free Distribution www.aathaapi.org

පිට්ඨඞ්කා

### චො

චොරඝාතකො 396
චොරතො වා 128
චොරභයං 234
චොරං ආගුචාරිං 464
චොරො 396

### ඡ

ඡබ්බස්සානි 326
ඡත්තිංස තණ්හාවිචරිතානි 404
ඡන්දසුඛ 178
ඡන්දං ජනෙති 30, 138, 492
ඡන්දසමාධිපධානසඞ්ඛාර-
සමන්නාගතං 492
ඡළඞ්ගතිං 26, 38
ඡන්නං ඵස්සායතනානං 22, 312
ඡවදුස්සානිපි ධාරෙති 394
ඡවාලාතං 182
ඡවො ඡවාය 110
ඡවො දෙවියා 110
ඡසු ඵස්සායතනෙසු 22

### ඡි

ඡින්දෙය්‍යුං 236
ඡින්නමූලකො 284

### ඡේ

ඡේදගාමිනී 152, 154
ඡේදනබන්ධනවිපරාමොස
ආලොපසහසාකාරා 398

### ජ

ජනකුහනත්ථං 52
ජනලපනත්ථං 52
ජම්බාලි 322
ජරා 238
ජරාධම්මං 334, 474
ජරාධම්මෙ ආදීනවං විදිත්වා 476
ජරාභයං 234
ජවසම්පන්නො ච 480
ජවෙන 220
ජවො 94
ජළො 484

පිට්ඨඞ්කා

### ජා

ජාගරස්ස වෙමි භික්ඛුනො 26
ජාගරියං අනුයුත්තො 78
ජාගරො 28
ජාතකං 14, 198, 346
ජාතරූපරජතපටිග්ගහණා
104, 398
ජාතරූපරජතං සාදියන්ති 104
ජාතියා 46, 238
ජාතිභයං 234
ජානෙය්‍ය 348
ජාලිනිං 402

### ජි

ජිඝච්ඡාය 228, 278, 296
ජිණ්ණං න පටිසඞ්ඛරොන්ති 478
ජිණ්ණා 44
ජිව්හාය රසං සායිත්වා 32, 294
ජීවන්තම්පි සූලෙ
උත්තාසෙන්ති 236

### ජෙ

ජෙට්ඨපුත්තා 166

### ජො

ජොතිජොතිපරායනො 162
ජොතිතමපරායනො 162
ජොතිපරායනො 162
ජොතිමාලිකම්පි කරොන්ති 236
ජොති හොති 164

### ඣා

ඣානවිසයො 150
ඣායිස්ස 150

### ඤා

ඤාණදස්සනපටිලාභාය 88
ඤාණදස්සනාය 386
ඤාණමෙව හෙතු 150
ඤාතය්‍යං 94
ඤාතිපරිවට්ටං පහාය 398
ඤාතිබලිං 128
ඤාති වා 224
ඤායපටිපන්නො 110

පිට්ඨඞ්කා

ඨ

ඨපනීයො 90

ඨා

ඨානි 28
ඨානකුසලො 332
ඨානගතං 128
ඨානවික්ඛම්භිතො 30
ඨානාඨානෙ 70, 76
ඨානාඨානෙසු 278
ඨානානි 228, 232
ඨානං ඛො එතං බ්‍රාහ්මණ 348

ඨි

ඨිතත්තො පුග්ගලො 12
ඨිතස්ස වෙපි භික්ඛුනො 26
ඨිතිභාගියා සඤ්ඤාති 324
ඨිතියා 282, 492
ඨිතෙ 402
ඨිතො වෙපි භික්ඛු 26

ඩ

ඩංසමකසවාතාතපසිරිංසප සම්ඵස්සානං 228, 278, 296

ත

තක්කරස්ස 18
තක්කලානි 26, 250
තගරමල්ලිකානි 176
තග්ඝ 282
තච්ඡං 190
තජ්ජිතො 72
තණ්හක්ඛයො 70, 228
තණ්හං 402
තණ්හං නිස්සාය 280
තණ්හා 20
තණ්හා උප්පජ්ජමානා 476
තණ්හා පහාතබ්බා 280
තණ්හා පහීණා 478
තණ්හා විචරිතානි 402
තණ්හාසම්භූතො අයං කායො 280
තණ්හාසල්ලස්ස 44
තණ්හා සොතං 72
තණ්හුප්පාදා 20, 476

පිට්ඨඞ්කා

ත

තතියො අච්ඡරියො අබ්භුත ධම්මො 252
තතියො ධම්මො 124
තතියං අත්ථවසං 464
තතියං ඣානං 400
තතියං ඨානගතං 128
තතියං මහාපදෙසං 330
තතියස්මිං ඨානෙ 396
තතො චුතො 154, 388
තතොනපි තෙලෙන ඔසිඤ්චතො 236
තත්‍රඤ්ඤතරස්ස 464
තත්‍ර වත මං 18
තත්‍රූපායවීමංසාය සමන්නාගතො 72
තං කිස්ස හෙතු 58
තං ජීවං 82
තම්පස්ස තාදිසමෙව 52
තං මම අස්ස මුසා 50
තං මමස්ස කලි 52
තං සරීරං 82
තථාගතප්පවෙදිතෙ 226
තථාගතස්ස 124, 250, 454
තථාගතස්ස විදිතං 50
තථාගතසාවකසඞ්ඝො 70
තථාගතසාවකො 8
තථාගතසාවකො ථූපාරහො 470
තථාගතසෙය්‍යා 470
තථාගතො 396
තථාගතො ථූපාරහො 470
තථා චතුත්ථං 246
තථා තථා 468
තථා තතියං 246
තථා දුතියං 46
තථාපබ්බජිතං සමානං 238
තථාරූපාය 128
තථාරූපාස්ස ධම්මා 46
තථාරූපිං වාචං 398
තදූපමාහං 182, 196
තථෙව හොති 48
තත්ථ පරිනිබ්බායි 12, 168, 460
තත්ථෙවන්තරධායි 44
තදඞ්ගං 62

| | පිට්ඨඞ්කා |
|---|---|
| **ත** | |
| තදධිමුත්තො | 242, 308 |
| තදනුත්තරං | 478 |
| තදභිසඞ්ඛය | 342, 344 |
| තදස්සාදෙති | 242, 308 |
| තනුත්තා | 168 |
| තනුමජ්ඣිමා | 38, 70 |
| තන්තාකුලකජාතො | 402 |
| තන්නිකාමෙති | 242, 308 |
| තප්පයන්ති | 38 |
| තපොජිගුච්ඡං අල්ලීනා | 386 |
| තපොජිගුච්ඡාවාදා | 386 |
| තපොජිගුච්ඡාසාරා | 386 |
| තබ්බහුලවිහාරී | 242, 308 |
| තමන්ධකාරනිහිතා | 132 |
| තමන්ධකාරං | 78 |
| තම්පරායනො | 162 |
| තමහං ජානාමි | 50 |
| තමෙව ධම්මං | 42 |
| තම්බචූළිකො | 26 |
| තම්හා ච පන තාදිතම්හා | 52 |
| තමො ජොතිපරායනො | 162 |
| තමො තම්පරායනො | 162 |
| තමො හොති | 162 |
| තයො අග්ගී | 84 |
| තරිං | 92 |
| තළාකෙ | 24 |
| තස්මා තථාගතො | 48 |
| තස්මා ලොකා | 168, 460 |
| තස්මිං යෙව භවෙ | 242 |
| තස්ස තස්සෙව | 178 |
| තස්ස පහාණාය | 448 |
| තස්ස සංවරාය | 400 |
| තස්සා සික්ඛාය | 468 |
| තස්සෙතං පාටිකඞ්ඛං | 386, 464 |
| **තා** | |
| තාදිනා | 40 |
| තාදිසාව | 154 |
| තාදිසො හොමි | 318 |
| තාදී | 108 |
| තාදී යෙව තාදී | 52 |
| තාතස්ස | 166 |
| තානි පදබ්‍යඤ්ජනානි | 326 |
| තාපසො | 28, 156 |
| තාරකරූපානි | 140 |
| තාරාගණො | 48 |
| තාවතා | 314 |
| තාවදූරෙ | 74 |
| තාවදෙව | 34, 44 |
| තාලච්ඡායං | 94 |
| තාලපන්තීහි | 60 |
| තාලාවත්ථුකතා | 78, 408, 478 |
| තාලෙලයූපං | 236 |
| **ත්‍යා** | |
| ත්‍යාස්ස | 166 |
| ත්‍යාස්සුදං | 350 |
| **ති** | |
| තිකච්ඡෙදෙ | 76 |
| තික්ඛත්තුං | 50, 66 |
| තික්ඛපඤ්ඤො | 132 |
| තික්ඛං | 214 |
| තිට්ඨභද්දන්තිකො | 394 |
| තිණත්ථරෙ | 246 |
| තිණභක්ඛාපි | 394 |
| තිණසන්ථරං | 172 |
| තිණ්ණවිචිකිච්ඡො | 400 |
| තිණ්ණං වෙදානං පාරගූ | 42 |
| තිණ්ණං සඤ්ඤොජනානං | 168 |
| තිණ්හං කුඨාරිං | 386 |
| තිත්ථියෙ | 78 |
| තිදණ්ඩපරිධාරකො | 162 |
| තිදසා | 88 |
| තිධා පභින්නමාතඞ්ගං | 242 |
| තිධා පභින්නා | 26 |
| තින්දුකානි | 26 |
| තිබ්බදොසජාතිකො | 288 |
| තිබ්බමොහජාතිකො | 288 |
| තිබ්බරාගජාතිකො | 288 |
| තිබ්බසාරාගා | 62 |
| තිබ්බා | 464 |
| තිම්බරූසකවණ්ණාභො | 120 |
| තිමිරං | 220 |
| තිරච්ඡානගතා | 66 |
| තිරච්ඡානගතානං පාණානං | 68 |

| | පිට්ඨඞ්කා |
|---|---|
| **ති** | |
| තිරච්ඡානයොනිම්පි | 242 |
| තිරියං | 94, 240 |
| තිරියං තාලච්ඡායං | 94 |
| තිරීටානි | 394 |
| තිංසකප්පසහස්සම්හි | 106 |
| තිංසතබ්බතුල්ලං | 60 |
| තිස්සො විජ්ජා | 56 |
| තිසම්පදං | 218 |
| තිස්සස්ස | 208 |
| **තී** | |
| තීණිපි වස්සානි | 276 |
| තීණි සරණානි | 134 |
| තීහගතීහි | 52 |
| තීහි ඨානෙහි රජාරහො හොති | 386 |
| **තු** | |
| තුවෙජ්ජා | 200 |
| තුණ්හී අහෙසුං | 118 |
| තුරියං | 56, 256 |
| තුලාමණ්ඩලෙ | 34 |
| තුලාකූටකංසකූටමානකූටා | 398 |
| තුවට්ටිසණ්ඨානි | 218 |
| තුසිතා කායා චවිත්වා | 250 |
| **තෙ** | |
| තෙජොධාතුරෙවෙසා | 320 |
| තෙජොධාතුසු | 148 |
| තෙන ච චිත්තං ආපජ්ජති | 242, 308 |
| තෙනඤ්ජලිං පණාමෙත්වා | 44 |
| තෙන න සම්මණ්ණාති මඤ්ඤති | 342 |
| තෙනෙතොභාසෙන | 250 |
| තෙලපජ්ජොතං | 194 |
| තෙවිජ්ජා | 134 |
| තෙසත්තාතිම්හි | 98 |
| තෙසු දෙසං ජනෙති | 406 |
| තෙසු පෙමං ජනෙති | 406 |
| **තො** | |
| තොයෙන පදුමං යථා | 50 |
| තොරණෙ | 218 |

| | පිට්ඨඞ්කා |
|---|---|
| **ථ** | |
| ථද්ධා | 54 |
| ථම්භස්ස | 494 |
| ථලට්ඨස්ස පුරිසස්ස | 464 |
| ථලෙ තිට්ඨති බ්‍රාහ්මණො | 12 |
| **ථා** | |
| ථාමවා | 480 |
| **ථි** | |
| ථිනමිද්ධං | 28, 126 |
| ථිනමිද්ධං පහාය | 400 |
| ථිනමිද්ධාභිභූතෙන | 126 |
| **ථූ** | |
| ථූපාරහා | 470 |
| **ථෙ** | |
| ථෙතො | 398 |
| ථෙරකාරණධම්මා | 46 |
| ථෙරකරණෙ ච ධම්මෙ | 46 |
| ථෙරස්ස සුගහිතනානි | 300 |
| ථෙරතං සම්මුඛා | 328 |
| ථෙර භික්ඛු | 286 |
| **ද** | |
| දකං | 66 |
| දකාසයා | 66 |
| දක්ඛිණං | 128 |
| දක්ඛිණං ජාණුමණ්ඩලං | 44 |
| දක්ඛිණතො නගරස්ස | 464 |
| දක්ඛිණද්වාරෙන | 464 |
| දක්ඛිණා | 152 |
| දක්ඛිණාය වෙපි දිසාය | 58 |
| දක්ඛිණා විසුද්ධියො | 152 |
| දක්ඛිණෙන පස්සෙන | 80, 470 |
| දක්ඛිණෙය්‍යො | 70, 110, 220, 332, 480 |
| දක්ඛිතානි | 194 |
| දක්ඛො | 56 |
| දට්ඨබ්බං න මඤ්ඤති | 52 |
| දට්ඨයං | 94 |
| දට්ඨා | 52 |
| දට්ඨාරං න මඤ්ඤති | 52 |

පිට්ඨඞ්කා

ද

දට්ඨුං 94
දණ්ඩතජ්ජිතා 396
දණ්ඩං පණෙතු 464
දණ්ඩභයං 234, 236
දද්දල්ලහකොපි 394
දධිම්හා නවනීතං 182
දන්තා 76
දන්ධං 288
දබ්බා ලූයන්ති 396
දමා පටිපදා 294
දයාපන්නා 398
දළිද්දා – අප්පස්සකා 388
දළ්හධම්මා 94
දළ්හපරක්කමො 480
දළ්හාය රජ්ජුයා 464
දළ්හානි වරත්තානි 68
දසපි වස්සානි 276
දසන්නම්පි ඛො 448
දස්සනීයානි 232
දස්සෙත 254
දස්සෙතාරො 132
දහරස්සෙව 118
දහරො වෙති 46
දාතා හොති 390
දානසංවිභාගරතො 126
දායකතො විසුජ්ඣති 152
දායාදතො වා 128
දායාදෙ අස්සං 476
දාසකම්මකරපොරිසෙ 146
දාසානි ච 396
දාසිදාසපරිග්ගහණා 398

දි

දිට්ඨං 48
දිට්ඨං න මඤ්ඤන්ති 52
දිට්ඨං හාසති 334
දිට්ඨධම්මසුඛවිහාරානං 46, 166
දිට්ඨසුතමුතවිඤ්ඤාතබ්බෙසු 52
දිට්ඨානුගතිං 286
දිට්ඨිඅජ්ඣොසානං 22
දිට්ඨි තණ්හා 22
දිට්ඨිතඤ්ඤී 22
දිට්ඨිපරිළාහො 22
දිට්ඨිපිපාසා 22
දිට්ඨිමුච්ඡා 22
දිට්ඨියා සුප්පටිවිද්ධා 46
දිට්ඨියොගවිසංයොගො 22
දිට්ඨියොගො 20
දිට්ඨිරාගො 22
දිට්ඨිවිපල්ලාසො 100
දිට්ඨිසිනෙහො 22
දිට්ඨීනං සමුදයඤ්ච 22
දිට්ඨෙ අදිට්ඨවාදිතා 472
දිට්ඨෙ චෙව ධම්මෙ 118
දිට්ඨෙ දිට්ඨවාදිතා 472
දිට්ඨෙව ධම්මෙ 12, 166, 282, 324, 392, 478
දින්නපාටිකඞ්ඛී 398
දින්නාදායී 398
දිපදා වා 70
දිබ්බස්ස වා 120
දිවසං වඩ්ඪමෙත 80
දිවාසඤ්ඤං අධිට්ඨාති 88
දිසමෙපසෙති 226

දී

දීඝමද්ධානං 2
දීඝමද්ධායුං 124
දීඝරත්තං 216
දීඝෙන අද්ධුනා 228

දු

දුක්ඛං 42
දුක්ඛක්ඛන්ධා 238
දුක්ඛතො 246
දුක්ඛනිරොධගාමිනී පටිපදා 198
දුක්ඛනිරොධොති 198, 202
දුක්ඛපරෙතො 238, 240
දුක්ඛවිපාකානි 334
දුක්ඛසමුදයොති 198
දුක්ඛවිපාකෙහි 22
දුක්ඛස්ස ච පහාණා 82, 244, 292
දුක්ඛස්සන්තං කරොති 108, 458
දුක්ඛාන්තං 278
දුක්ඛාපටිපදා ඛිප්පාභිඤ්ඤා 288, 292
දුක්ඛාපටිපදා දන්ධාභිඤ්ඤා 288
දුක්ඛිතො වා 274
දුක්ඛෙන සුඛනාති 100

පිට්ඨඞ්කා

### දු

දුක්ඛොතිණ්ණා 238, 204
දුග්ගතිං 162, 236
දුග්ගතිභයං 234
දුග්ගහීතත්තා 326
දුග්ගහීතං සුත්තන්තං 284
දුච්චරිතං චරති 162
දුච්චරිතං චරෙය්‍ය 234
දුට්ඨෙන චිත්තෙන 454
දුතියං අජ්ඣවසං 462
දුතියං ඨානං 244, 400
දුතියං ඣානගතං 128
දුතියං මහාපදෙසං 328
දුතියො 232
දුතියො අච්ඡරියො අබ්භුතො ධම්මො 252
දුතියො ධම්මො 124
දුද්දසිකො 162
දුන්නික්ඛිත්තෙහි 284
දුන්නිවත්ථං 242
දුප්පඤ්ඤතාය සමාදපෙති 416
දුප්පඤ්ඤො 156
දුප්පඤ්ඤො හොති 416, 436, 484
දුප්පාරුතං 242
දුබ්බචා 284
දුබ්බණ්ණා 140, 392
දුබ්බණ්ණා දුරූපා 388
දුබ්බලා 140
දුරාගතානං 228, 296
දුරුත්තානං 228, 296
දුල්ලභා 124
දුල්ලභා ලොකස්මිං 278
දුස්සති 232
දුස්සීලං ඉත්ථිං වා පුරිසං වා 478
දුස්සීලා 112, 152, 174
දුස්සීලො 112, 114, 214, 430, 462

### දූ

දූතෙය්‍යපහිනගමනානුයොගා 398
දූරෙපාතී 332, 386

### දෙ

දෙති 120
දෙවතා 140

පිට්ඨඞ්කා

දෙවතාබලිං 128
දෙවපුත්තො 92
දෙවමනුස්සානං 284
දෙවා දීඝායුකා 68
දෙවානං දෙවානුභාවං 250
දෙවා සුභකිණ්හා 446; 450
දෙවො ජවාය 110
දෙවො අසුරපරිවාරො 174
දෙවො දෙවපරිවාරො 174
දෙවො දෙවියා 110
දෙවො නො භවං 76
දෙවො භවෙය්‍යං 76
දෙසියමානෙ 252

### දො

දොමනස්සෙහි 238
දොවචස්සකරණෙහි ධම්මෙහි 284
දොසක්ඛය 388
දොසජං දුක්ඛං 288
දොසනීයෙසු ධම්මෙසු 252
දොසවිනයාය 182
දොසවෙපුල්ලතං 278
දොසාගතිං 36, 38
දොසා දොසො ජායති 406
දොසා පෙමං ජායති 406

### ද්ව

ද්වාහිකම්පි 394
ද්වින්නං පුග්ගලානං 182
ද්විහිපි දන්තෙහි 394
ද්වෙකප්පා ආයුප්පමාණං 244
ද්වෙපි වස්සානි 276
ද්වෙ මෙ රොගා 276

### ධ

ධංසති 176
ධනා 46
ධනානං ච ධම්මානං 186
ධනුග්ගහො 94
ධම්මං දෙසෙති 386, 476
ධම්මක්ඛාය 194
ධම්මකථිකා 266
ධම්මකථිකොත්වෙව සඞ්ඛං ගච්ඡති 266

පිට්ඨඞ්කා

ධ

ධම්මචක්කං 232
ධම්මධරු 16, 284
ධම්මපදං 58
ධම්මප්පමාණො
ධම්මප්පසන්නො 134
ධම්මමච්ඡරිය 14, 186
ධම්මලද්ධා 130
ධම්මලද්ධෙහි 128
ධම්මවාදී 46, 498
ධම්මවිචයසම්බොජ්ඣඞ්ගං 34
ධම්මවිචයසම්බොජ්ඣඞ්ගො 456
ධම්මවිනයෙ 226
ධම්මා දෙසිතා 468
ධම්මානුධම්මපටිපත්ති 470
ධම්මානුධම්මපටිපන්නො 14, 186
ධම්මා සඞ්ඛතා 70
ධම්මිකා 170
ධම්මිකෙහි 128
ධම්මියා කථාය 100
ධම්මුද්ධච්චවිග්ගහීතං
මානං හොති 304
ධම්මෙ 108, 148
ධම්මෙසු 492
ධම්මෙහි 22
ධම්මො 44, 194

ධා

ධාරකජාතිකො 186
ධාරෙතබ්බං 238
ධාරෙය්‍ය 194

ධී

ධීරො 58

ධු

ධුචමහාති 68

ධූ

ධූමරජො 102

පිට්ඨඞ්කා

න

න අත්තනියං 820
න අත්ථමච්ඡරි 14
න අනභාවං ගමෙති 26
න අපජ්ඣායති 408
න ආපජ්ජිස්සති 464
න උද්දිස්සකටං 394
න උපට්ඨාසි 50
න උපවදෙය්‍යාති 234
න උපවදෙය්‍යං 234
න උපපජ්ජති 94
න උප්පාදෙස්සාමි 282
න කත්තබ්බං 228
න කප්පති 232
න කරෙය්‍ය 464
න කස්සචි කිඤ්චි ධාරෙති 130
නක්ඛත්තානි 140
න ඛො පනාහං 42
නඞ්ගුට්ඨං 479
න ච ජානාමීති වදෙය්‍යං 52
න ච මම ඛමති 344
න චවති 94
න චින්තෙතබ්බානි 150
න චිරට්ඨිතිකානි භවන්ති 478
න චිරස්සෙව 66, 478
නච්චගීතවාදිතවිසූකදස්සනා 398
නච්ඡමහති 232
නච්ඡින්නමූලකො 286
න ජායති 94
න ජීයති 94
නට්ඨං න ගවෙසන්ති 478
නත්තුමත්තා මඤ්ඤෙ 238
නත්ථඤ්ඤං කිඤ්චි 312
නත්ථි කොචි පාටිභොගො 334
නත්ථි තතො දෙසො 334
නත්ථිදානි පුනබ්භවො 4
නත්ථීති වදාමි 52
නදතො 66
න දතා 388
නදිං තරිතුකාමො 386
නදිං පතාරෙය්‍ය 386
න ධම්මමච්ඡරිය 14
න ධූපායති 408

පිට්ඨඞ්කා

න

න තජ්ජාමි 52
න නිමිත්තග්ගාහී 32, 78
න පකම්පති 320
න පජ්ජලති 408
න පඤ්ඤාගරු හොති
න පඤ්ඤාධිපතෙය්‍යො 264
න පටික්කොසිතබ්බං 326
න පටිසෙවති 408
න පන පටික්කොසාමි 78
න පරිතස්සති 56
නප්පජහති 26
නප්පජානාති 198
නප්පසීදති 320
න බ්‍රාහ්මණොති මඤ්ඤති 342
න භායති 336
න මණ්ඩනාය 80, 282
න මදාය 80, 282
න මීයති 94
න මෙසො අත්තා 320, 332, 336
නමො භගවතො 136
නයිදං බ්‍රහ්මචරියං 52
න රජ්ජති 328
නවං 386, 396
නවඤ්ච වෙදනං 80, 282
නවනීතම්හා සප්පි 182
න විභූසනාය 282
න වෙධති 232
න ව්‍යන්තී කරොති 26
න සඞ්ඛියන්ති 56
න සඞ්ඛිසිස්සන්ති 56
න සදිසො හමස්මීති මඤ්ඤති 342
න සත්තානං ආපජ්ජති 232
න සත්තානං ආපජ්ජති
මරණස්ස 336
න සමාධිගරු හොති
න සමාධාධිපතෙය්‍යො 264
න සම්පත්තමෙව 46
න සීලගරු හොති
න සීලාධිපතෙය්‍යො 264
න සෙය්‍යො හමස්මීති මඤ්ඤති 342
නහන්හුත 136
න හීනො හමස්මීති මඤ්ඤති 342
න හොති තථාගතො 82

පිට්ඨඞ්කා

නා

නාකඞ්ඛති විතක්කෙතුං 72
නාගං 76
නාකඞ්ඛාමි සංකප්පෙතුං 74
නාගතිගමනානි 38
නාධිමුච්චති 320
නාධිවාසෙති 26, 228, 294
නානාකරණං 242
නානුභොන්ති 250
නානුබ්‍යඤ්ජනග්ගාහී 32, 78, 294
නාපරං ඉත්ථත්තායාති 402, 478
නාභිජානාමි 118
නාභිසජ්ජති 390
නාභිහටං 394
නාලං අන්තරායාය 18
නාලං පටිසෙවිතුං 482
නාවා න සංසිදිස්සති 386
නාවුතිකො 46
නාසම්පි ජීඥතෙත 236
නාසික්ඛිම්හ 148
නාසිස්සන්ති 462
නාහං ඛවන 344

නි

නිකට්ඨකායො
අනිකට්ඨචිත්තො 264
නිකට්ඨකායො ච
නිකට්ඨචිත්තො ච 264
නිකාමලාභී 46, 166
නික්කුජ්ජිතං 194
නික්කුහා 54
නික්ඛාමෙත්වා 464
නික්ඛිත්තො 38, 158
නිගමං වා 240
නිගමො 120
නිච්චවදතං 84
නිජ්ඣාතො 392
නිට්ඨං ගතො සද්ධම්මෙ 340
නිට්ඨමෙත්ථ ගන්තබ්බං 278, 326
නිඥුකිලම්ථෙ පටිවිනොදනා 94
නිරාහවතිං වාචං 46, 398
නිරූබභාරෙනා 64
නිබ්බානං 70, 228, 476
නිබ්බානස්සෙව සන්තිකෙ 78

පිට්ඨඞ්කා

නි

නිබ්බාපනාය 178
නිබ්බුතො 392
නිබ්බෙධභාගියා සඤ්ඤාති 324
නිබ්බෙධිකපඤ්ඤා 346
නිමන්තනං සාදියති 394
නිමිත්තං 18
නිමිත්තග්ගාහි 294, 400
නිමිත්තමෙතං 18
නියතො 150, 168, 458
නිරයං 162, 236
නිරාරම්භං යඤ්ඤං 84
නිරුත්තිපටිසම්භිදා 310
නිරොධත්ථං 52
නිරොධනිස්සිතං 34
නිරොධො 70, 228
නිල්ලපා 54
නිවිට්ඨා 128
නිවෙසනං 116
නිස්සරණඤ්ච 20
නිස්සරණපඤ්ඤා 56
නිහතිච්චාත 78
නිසිතදණ්ඩා 398
නිසිතසත්ථා 398

නී

නීචෙකුලෙ 162
නීවාරභක්ඛාපි 394

නෙ

නෙක්ඛම්ම විතක්කො 484
නෙගමජානපදා 140
නෙතං මම 320, 332, 386
නෙය්‍යො 60
නෙලා 398
නෙව ඛො තථාහං 72
නෙව ගජ්ජිතා 196
නෙව ගාමෙ කට්ඨත්ථං 182
නෙවත්තනහිතාය පටිපන්නො 180
නෙවත්තානුක්කංසෙති 56
නෙව දවාය 80, 282
නෙව යුත්තපටිභානො
නෙවමුත්තපටිභානො 260

පිට්ඨඞ්කා

නෙ

නෙව සගච්චණ්ඩා 210
නෙවසඤ්ඤානාසඤ්ඤා
යතනූපගා 308
නෙවසඤ්ඤීනාසඤ්ඤීනො වා 70
නෙවුට්ඨානඵලූපජීවී
නෙවකම්මඵලූපජීවී 260
නෙවුස්සෙනෙති 408
නෙවාගතවිසො 216
නෙසාදකුලෙ 162
නෙසොහමස්මි 320, 332, 386

නො

නො අඤ්ඤථා 48
නො පරං වම්භෙති 56
නො පරගච්චණ්ඩා 210
නො පරහිතාය 180
නො වස්සිතා 196

ප

පකතියාපි 288
පකාසිතො 194
පක්කවණ්ණී 206
පක්කො පක්කවණ්ණී 208
පක්ඛහතො 162
පක්ඛිසකුණො 400
පච්චක්ඛාසති 294, 410
පච්චයිකො 398
පච්චයො 154
පච්චාජාතො 162
පච්චුට්ඨාතං 348
පච්චුපට්ඨිතා 464
පච්චුප්පන්නානි ඡත්තිංස
තණ්හා විචරිතානි 404
පච්චෙකබුද්ධො ඌපාරගො 470
පච්ඡාබාහං 464
පච්ඡිමං කායං 470
පච්ඡිමා ජනතා 286
පජා 254
පජ්ජොතා 270
පඤ්ච නීවරණා 400
පඤ්චන්නං කාමගුණානං
අධිවචනං 240
පඤ්චසු පාදුකබන්ධෙසු 172

පිට්ඨඞ්කා

**ප**

පඤ්චහි කාමගුණෙහි 240
පඤ්චින්ද්‍රියානි 284
පඤ්චුපාදානක්ඛන්ධා 478
පඤ්ඤත්තා 468
පඤ්ඤාචක්ඛුං න කමති 278
පඤ්ඤාපජ්ජෝතො 270
පඤ්ඤාපභා 268
පඤ්ඤාබලං 274, 290, 482
පඤ්ඤාභා 268
පඤ්ඤාය අනුග්ගහෙස්සාමි 468
පඤ්ඤාය 224
පඤ්ඤාය චස්ස අත්ථං
අභිවිජ්ඣ පස්සති 346
පඤ්ඤාය දුබ්බලීකරණෙ 400
පඤ්ඤාය සමවෙක්ඛිතා 468
පඤ්ඤායෙථාති 238
පඤ්ඤාලොකො 270
පඤ්ඤාවිමුත්තිං 166, 282, 408, 462
පඤ්ඤාවුද්ධියා සංවත්තන්ති 470
පඤ්ඤාසම්පදාය 416
පඤ්ඤාසම්පන්නො 416
පඤ්ඤාසාරො 272
පඤ්ඤින්ද්‍රියං 288
පඤ්ඤුත්තරං 468
පඤ්ඤොභාසො 270
පඤ්හෙන 310
පටික්කමිතබ්බං 238
පටිකරිස්සති 464
පටිච්ඡන්නකම්මන්තො 462
පටිනිස්සග්ගාය 494
පටිපදෙ 166
පටිබුජ්ඣිත්වා 470
පටිභණන්ති 294, 410
පටිභානකවි 444
පටිභානපටිසම්භිදා 312
පටිරොසන්ති 294, 410
පටිවිරතො 188, 398
පටිසංවෙදෙති 292, 400
පටිසඞ්ඛානබලං 276
පටිසඞ්ඛායොනිසො 286

පිට්ඨඞ්කා

**ප**

පටිහඞ්ඛාමි 282
පඨමං අත්ථවසං 462
පඨමං ඣානං 242, 292
පඨමං මහාපදෙසං 326
පඨමො අච්ඡරියො
අබ්භුතො ධම්මො 250
පඨවීධාතුරෙවෙසා 320
පණිධාති 278
පණීතතරො 182
පණීතා අක්ඛායති 298
පණ්ඩිතො 228, 350
පණ්ඩිතො මහාපඤ්ඤො 346
පණ්ඩිතො ව්‍යත්තො සප්පුරිසො 484
පතිකරොමි 220
පතිට්ඨීයති 388
පතිසල්ලානා වුට්ඨිතො 342
පතොදච්ඡායං 222
පත්තිකම්පි 226
පත්ථයමානො 166, 172
පදක්ඛිණං කත්වා පක්කාමි 478
පදක්ඛිණග්ගාහිතො 286
පදපරමො 260
පදබ්‍යඤ්ජනෙහි 284, 286
පදහති 492
පපඤ්ච නිරොධො 314
පපඤ්ච වූපසමො 314
පපඤ්චස්ස ගති 314
පබ්බතං 400
පභා 268
පමාදස්ස 494
පයුත්තා 154
පරං වාචෙන්ති 284
පරඤ්ච අදින්නාදානෙ
සමාදපෙන්ති 486
පරඤ්ච කාමෙසු මිච්ඡාචාරා
වෙරමණියා සමාදපෙති 486
පරඤ්ච කාමෙසුමිච්ඡාචාරෙ
සමාදපෙති 486
පරඤ්ච පාණාතිපාතා
වෙරමණියා සමාදපෙති 486

පිට්ඨඞ්කා

**ප**

පරඤ්ච පාණාතිපාතෙ සමාදපෙති 486
පරඤ්ච පිසුනාවාචාය වෙරමණියා සමාදපෙති 488
පරඤ්ච පිසුනාවාචාය සමාදපෙති 488
පරඤ්ච ඵරුසාවාචාය වෙරමණියා සමාදපෙති 488
පරඤ්ච මුසාවාදා වෙරමණියා සමාදපෙති 488
පරඤ්ච මුසාවාදෙ සමාදපෙති 488
පරඤ්ච සම්ඵප්පලාපා වෙරමණියා සමාදපෙති 488
පරඤ්ච සම්ඵප්පලාපෙ සමාදපෙති 488
පරගවචණ්ඩා 310
පරතො 246
පරන්තපො 392
පරපරිතාපනානුයොග මනුයුත්තො 392
පරපරිසං 212
පරම්මරණා 162, 236
පරමතිපච්චාකාරං 348
පරමසච්චං 224
පරමාය වණ්ණපොක්ඛරතාය සමන්නාගතො 388
පරලාභසක්කාරගරුකාර මානනවන්දනපූජනාසු 388
පරසඤ්චෙතනා කමති නො අත්තසඤ්චෙතනා 308
පරහිතාය පටිපන්නො 180
පරාධිප්පායා හොති 154
පරානුවාදභයං 234
පරිකම්මානි 396
පරික්ඛයා 168
පරිචාරයමානං 240
පරිධාය 466
පරිනිබ්බුතොති 232
පරිනෙත්වා 464
පරිපූරා වා ආදිබ්‍රහ්මචරියකං 468
පරිබ්බාජකාරාමෙ 352
පරිබ්බාජකො 342
පරිමුඛං සතිං උපට්ඨපෙත්වා 400
පරියන්තවතිං 398
පරියායභත්තභොජනානු- යොගමනුයුත්තො 394

පිට්ඨඞ්කා

**ප**

පරියොගාහෙත්වා 160
පරියොදාතෙ 402
පරියොනද්ධා 402
පරියොසානකල්‍යාණං 396
පරිසදූසකං 430
පරිසසොභනා 430
පරිසතිං 348
පරිසා ච කුසලා 266
පරිසා ච බ්‍යත්තා 174
පරිසා ච න කුසලා 266
පරිසාපියස්ස 174
පරිසුද්ධකායසමාචාරා 386
පරිසුද්ධමනොසමාචාරා 386
පරිසුද්ධවචීසමාචාරා 386
පරිසුද්ධාජීවා 386
පරිගායාමි කුසලෙහි 278
පරිහාරකා 350
පරූපාරම්භං 348
පරෙ වාස්ස 306
පලාලපීඨකම්පි 286
පලාලපුඤ්ජං 400
පලාසස්ස 494
පලිඝපරිවත්තිකම්පි 236
පලුම්පෙන්තා 236
පලොකතො 246
පල්ලඞ්කං ආභුජිත්වා 400
පවත්තඵලභොජී 394
පවත්තෙතසීති 232
පවරො ච 182
පවිවෙකෙ නික්ඛිත්තධුරා 286
පවිවෙකෙ පුබ්බඞ්ගමා 286
පංසුකූලානිපි 394
පසන්නානං භිය්‍යොභාවාය 468
පසාදං උපදංසෙති 158
පසාදනියෙ ඨානෙ 158
පසාරිතං 202
පසාරිතබ්බං 238
පස්සද්ධිසම්බොජ්ඣඞ්ගො 456
පහානාය 494
පහිතත්තො 224, 476
පහීණං 230
පහීණානි 258
පහූතජාතරූපරජතෙ 162
පහූතධනධඤ්ඤෙ 162
පහූතවිත්තූපකරණෙ 162

පිට්ඨඞ්කා

පා

පාචිත්තියෙසු ධම්මෙසු 466
පාටිකඞ්ඛිතබ්බානි 238
පාටිකඞ්ඛා 322
පාටිදෙසනීයෙසු ධම්මෙසු 466
පාටිභොගො 334
පාණඝරාතං 278
පාණාතිපාතා 188
පාණාතිපාතස්ස වණ්ණං භාසති 486
පාණාතිපාතා පටිවිරතො 418
පාණාතිපාතා වෙරමණියා ච සමනුඤ්ඤො හොති 486
පාණාතිපාතා වෙරමණියා ච වණ්ණං භාසති 486
පාණාතිපාතී 158, 418
පාණාතිපාතෙ සමාදපෙති 418
පාණාතිපාතෙ ච සමනුඤ්ඤො හොති 486
පාණානං යෙව අනුද්දයාය 342
පාණුපෙතා 194
පාතබ්බං 240
පාතුභාවා 250
පාදම්පි ඡින්දෙන්ත 236
පාදෙ පාදං අච්චාධාය 470
පාදෙ සිරසා වන්දි 280
පාදෙසු සිරසා නිපතිත්වා 282
පාපං 340
පාපකා අකුසලා ධම්මා 294, 400
පාපකානං කම්මානං හෙතු 236
පාපකානි කම්මානි 334
පාපකො විපාකො 236
පාපධම්මස්ස 426
පාපධම්මෙන පාපධම්මතරස්ස 426
පාපධම්මා 174, 214, 430, 462
පාපභික්ඛු 462
පාපිකං ඉච්ඡං 278
පාපෙන පාපතරස්ස 424
පාභතං 236
පාමොක්ඛා 182
පාරාජිකං ධම්මං 464
පාරාජිකෙසු ධම්මෙසු 464
පාරිපූරියා 492
පාසාණගුළෙන ධූපෙය්‍ය 386
පාසාදිකං 202

පිට්ඨඞ්කා

පා

පාසෙන 352
පාහුණෙය්‍යො 220, 332, 480
පාළිප්පභෙදෙ 322

පි

පිඤ්ඤාකභක්ඛාපි 394
පිට්ඨිං කණ්ඩූවමානො 396
පිණ්ඩපාතපටික්කන්තො 40
පිණ්ඩපාතහෙතු වා 476
පිතා ජීවිතා වොරොපිතො 454
පිත්තසමුට්ඨානානි 166
පිපාසාය 228, 278, 296
පියාරිත්තං බන්ධෙය්‍ය 386
පියා වත මං කාමා ජහිස්සන්ති 338
පියො ච මං කායො ජහිස්සති 340
පිසුණාවාචා 272
පිසුණාවාචා පටිවිරතො 418
පිසුණාවාචාය ච වණ්ණං භාසති 488
පිසුණාවාචාය ච සමනුඤ්ඤො හොති 488
පිසුණාය වාචාය සමාදපෙති 418
පිසුණාවාචා වෙරමණියා ච සමනුඤ්ඤො හොති 488
පිසුණාවාචා වෙරමණියා ච වණ්ණං භාසති 488
පිසුණාවාචො 158, 418
පිහිතො 200
පීතිසම්බොජ්ඣඞ්ගො 456
පීතිසුඛං 242, 292

පු

පුක්කුසකුලෙ 162
පුග්ගලා 162, 300
පුඤ්ඤක්ඛෙත්තං 220
පුඤ්ඤානි ච කාතුං 240
පුත්තමත්තා මඤ්ඤෙ 238
පුථුජ්ජනො 242, 318
පුබ්බණ්හසමයං 240
පුබ්බෙනිවාසානුස්සතිඤාණාය 402
පුබ්බෙව සොමනස්සදොමනස්සානං අත්ථඞ්ගමා 244, 292
පුරත්ථිමෙන නගරස්ස 399

පිට්ඨඞ්කා

පු

පුරාණඤ්ච වේදනං 282
පුරිමං කායං 470
පුරිමතරානි 448
පුරිමානි දිවසානි 448
පුරිසත්ථාමෙ 228
පුරිසදම්මං 218
පුරිසදම්මසාරථි 396
පුරිසපරක්කමෙ 228
පුරිසවීරියෙ 228
පුරිසාජානීයා 222
පූරෝ 200

පෙ

පෙච්ච ගච්ඡාමීති 338
පෙතසෙය්‍යා 470
පෙතා උත්තානා සෙන්ති 470
පෙත්තිවිසයම්පි 242
පෙමනීයා 398
පෙමා දොසො ජායති 406
පෙමා පෙමං ජායති 406
පෙය්‍යවජ්ජං 476
පෙසකානි වා 396
පොනොභවිකානි 334
පොරියා වාචාය 186
පොරී 398

ඵ

ඵරති 182
ඵරසුප්පහාරකං 226
ඵරිත්වා විහරති 246
ඵරුසාවාචාය වෙරමණියා ච
වණ්ණං භාසති 488
ඵරුසාවාචාය ච
සමනුඤ්ඤො හොති 488
ඵරුසාය වාචාය සමාදපෙති 418
ඵරුසාවාචා 472
ඵරුසාවාචා පටිවිරතො 418
ඵරුසාවාචො 114, 158, 418
ඵරුසෙනපි 218
ඵරෙය්‍ය 136
ඵලං වෙ කදලිං හන්ති 138
ඵලකචීරම්පි 394
ඵස්සායතනානං 312

පිට්ඨඞ්කා

ඵ

ඵස්සිත්වා විහරති 166
ඵාසුවිහාරො වාති 80, 282

ඵු

ඵුට්ඨො 224
ඵුට්ඨො සමානො 446

ඵෙ

ඵෙග්ගු 214
ඵෙග්ගුපරිවාරො 214

බ

බන්ධනාගාරිකො 396
බන්ධනානි සඤ්ඡින්දිත්වා 68
බන්ධනෙහි බද්ධො 68
බරිහිසත්ථාය 396
බලවා පුරිසො 44
බලසම්පන්නො 480
බලානි 274
බලිවද්දා 210
බලිවද්දූපමා 210
බලිසමංසිකම්පි 236
බව්හාබාධා 140, 162
බහිද්ධා සුපරිකම්මකතා 386
බහුකරණීයානි 350
බහුකාරා 132, 472
බහුකිච්චා මයං 350
බහුජනකන්තා 398
බහුජනමනාපා 398
බහුජනසුඛාය 72, 284
බහුජනහිතාය 284
බහුඤ්ච අපුඤ්ඤං පසවති 438, 484
බහුඤ්ච පුඤ්ඤං පසවති 438, 484
බහුඤ්ච භාසති 266
බහුදෙව උපපජ්ජන්ති 166
බහුප්පදා වා 70
බහුම්පි චූතනා සමානා 390
බහුලං චීවරං 166
බහුස්ස ජනතා 72
බහුස්සුතා 14, 16
බහුස්සුතො 14, 46, 72, 144
බහුස්සුතො ධම්මධරො 344
බහුස්සුතො ධම්මධරොති
අලං වචනාය 364

පිට්ඨඞ්කා

බ

බහුස්සුතො සුතෙන
අනුපපන්නො 14
බහුස්සුතො සුතෙන උපපන්නො 14
බහුස්සුතො හොති 416

බා

බාලො 6, 228
බාලො අබ්‍යත්තො 438, 484
බාලො ථෙරොත්වෙව 46
බාහාබලපරිචිතා 130
බාහාබලපරිචිතෙහි 128
බාහිරස්ස උපාදාය 404
බාහිරා ආපොධාතු 320
බාහිරා තෙජොධාතු 320
බාහිරා පඨවිධාතු 320
බාහිරා වායොධාතු 320
බාහුලිකා 286
බාළ්හගිලානා 280
බාහුසච්චෙ 416

බි

බිලඞ්ගථාලිකම්පි කරොන්ත 236
බිලං 66
බිලාසයා 66

බී

බීජගාම භූතගාම සමාරම්භා 398

බු

බුද්ධවිසයො 150
බුද්ධානං 150
බුද්ධෙ 108
බුද්ධෙ පසන්නා 70
බුද්ධෙ වා 148
බුද්ධා 68, 78, 396

බො

බොධිං 124
බොධිසත්තො 250

බ්‍ය

බ්‍යත්තො සප්පුරිසො 438
බ්‍යන්තී කරොති 228, 294

පිට්ඨඞ්කා

බ්‍යා

බ්‍යාපජ්ජති 338
බ්‍යාපන්නචිත්තො 64, 418, 490
බ්‍යාපාදපදොසං 400
බ්‍යාපාදවිතක්කං 294
බ්‍යාමමත්තෙන 98

බ්‍ර

බ්‍රහ්මකායිකානං දෙවානං 242
බ්‍රහ්මචක්කං පවත්තෙති 18
බ්‍රහ්මචරියං 12; 396, 398
බ්‍රහ්මචරියං වුස්සති 468
බ්‍රහ්මචරියපරියොසානං 478
බ්‍රහ්මචරියානුග්ගහාය 80, 282
බ්‍රහ්මචරියෙසනා 82
බ්‍රහ්මචාරිපටිසෙද්ධ 462
බ්‍රහ්මභූතෙන අත්තනා 392
බ්‍රහ්මලොකෙ 44
බ්‍රහ්මානි 132
බ්‍රහ්මා වා 18, 334
බ්‍රාහ්මණං වා 154
බ්‍රාහ්මණකඤ්ඤම්පි 392
බ්‍රාහ්මණගහපතිකා 140
බ්‍රාහ්මණපරිසා 256
බ්‍රාහ්මණමහාසාලකුලෙ 162
බ්‍රාහ්මණ සච්චානි 342
බ්‍රාහ්මණෙ 46
බ්‍රාහ්මණෙන ච පුරොහිතෙන 396
බ්‍රාහ්මණො පුරොහිතො 396
බ්‍රාහ්මණො වා 18, 334
බ්‍රාහ්මණො වා මහාසාලො 396

භ

භගවතො පන සාවකො 242
භගවතො පාදෙසු 76
භගවා 42, 68, 220, 396
භණ්ඩනානං 410
භණ්ඩනානං පටිභණ්ඩති 294
භණිතබ්බං මඤ්ඤති 462
භත්තුද්දෙසකො 38
භද්දකං පටිභාණං 344
භද්දකං සමාධිනිමිත්තං 34
භද්දකො උම්මග්ගො 344

| | පිට්ඨඞ්කා |
|---|---|
| **භ** | |
| භද්‍රක තොබ්බෙත | 46 |
| භද්‍රා | 220 |
| භද්‍රා අස්සාජානීයො | 480 |
| භබ්බා | 66 |
| භයං | 66 |
| භයදස්සාවිතං | 28 |
| භයදස්සාවිනො | 28 |
| භයදස්සාවී | 78 |
| භයසන්දදු | 464 |
| භයාගතිං | 36, 38 |
| භයාති | 234 |
| භරියාපිස්ස | 112 |
| භවග්ගං | 148 |
| භවජ්ඣොසානං | 22 |
| භවපටිලාභියානි | 258 |
| භවතණ්හා | 22 |
| භවනන්දී | 22 |
| භවන්තං ගොතමං ධාරෙම | 74 |
| භවපරිළාහො | 22 |
| භවපිපාසා | 22 |
| භවමුච්ඡා | 22 |
| භවම්පි නො ගොතමො | 84 |
| භවයොගවිසංයොගො | 22 |
| භවයොගො | 20 |
| භවරාගො | 22 |
| භවානං සමුදයං | 22 |
| භවාසවාපි | 402 |
| භවිස්සන්ති අනාගතමද්ධානං | 44 |
| භවිස්සන්ති හොති | 404 |
| භවසිනෙහො | 22 |
| භවෙසනා | 22 |
| භවෙසු | 22 |
| **භා** | |
| භාගිනි | 120 |
| භාගිනී හොති | 120 |
| භාවනාප්පධානං | 32, 138 |
| භාවනා බලං | 276 |
| භාවනාය | 30, 492 |
| භාවනාරතීයා | 56 |
| භාවනාරතො | 56 |



| | පිට්ඨඞ්කා |
|---|---|
| **භා** | |
| භාවනාරාමතාය | 56 |
| භාවනාරාමො | 56 |
| භාවිතා | 48 |
| භාසිතං | 90 |
| භාසිතස්ස අත්ථං ආජානෙය්‍යං | 476 |
| භාසිතා | 46, 190, 196, 398 |
| භාසිතෙනපි | 254 |
| **භි** | |
| භික්ඛු දුස්සීලො | 430 |
| භික්ඛුනී | 16, 280 |
| භික්ඛුනී දුස්සීලා | 430 |
| භික්ඛුනී පරිසා | 254 |
| භික්ඛුනී සීලවතී | 430 |
| භික්ඛුනූපස්සයො | 280 |
| භික්ඛු පරිසා | 254 |
| භික්ඛු සීලවා | 430, 480 |
| භින්නානං සන්ධාතා | 398 |
| **භී** | |
| භීතා | 68 |
| භීයොභාවාය | 30, 492 |
| **භු** | |
| භුජිස්සානි | 110 |
| භුඤ්ජිතබ්බං | 240 |
| භුත්තාවිං | 120 |
| **භූ** | |
| භූතං | 190 |
| භූතපුබ්බාහං | 94 |
| භූතවාදී | 46, 398 |
| **භෙ** | |
| භෙරිපණවසඞ්ඛතිණවනින්නාද සන්දනං | 226 |
| භෙසජ්ජානං | 54 |
| **භො** | |
| භො | 46 |
| භොගක්ඛන්ධං පහාය | 398 |

පිට්ඨඞ්කා

භො

භොගසුඛං 130
භොගා 124, 130
භොගෙ ලද්ධා 124
භොගෙසු මහන්තත්තං 478
භොජනං 120
භොජනීයෙන 120
භොජනෙ මත්තඤ්ඤුතා 78

ම

මක්ඛගරු 160
මක්ඛගරුතා 92
මක්ඛගරු න සද්ධම්මගරු 90
මක්ඛස්ස 494
මගධමහාමත්තො 72, 334
මග්ගං 194
මග්ගා ඔක්කම්ම 76
මග්ගෙ ච 148
මග්ගො සඤ්ජායති 304
මඞ්ගුරා 26
මචලප්පත්තො 166
මච්චුකාළම්හි 166
මච්ඡඝාතකො 396
මච්ඡරියස්ස 494
මච්ඡරී 156
මච්ඡා 26
මච්ඡෙරමලපරියුට්ඨිතෙන චෙතසා 112, 144
මජ්ජති 232
මජ්ඣන්තිකෙව 120
මජ්ඣිමං යාමං 80
මජ්ඣෙ කල්‍යාණං 46, 396
මජ්ඣෙ ගූථගතං 182
මඤ්චා වුට්ඨහිත්වා 282
මඤ්ඤෙය්‍ය 64
මණ්ඩපං 156
මණ්ඩපෙ 68
මණිමයා 98
මත්තං ච 82
මත්තඤ්ඤූ 80
මත්තාභස්සං 438
මත්තිකං 120
මදති මමදනො 60
මදනීයෙසු ධම්මෙසු 232

පිට්ඨඞ්කා

ම

මදප්පමාද 128
මදස්ස 494
මද්දසී 34
මධුකා 26
මධුබුද්දං 154
මනසා 162
මනසා ධම්මං විඤ්ඤාය 32, 294, 400
මනසානුපෙක්ඛිතා 46
මනසාපි 118
මනාපං කාතුං 228
මනාපසඤ්ඤෙව 166
මනාපාය 106, 110
මනාපො 406
මනින්ද්‍රියං අසංවුතං 400
මනුජො 52
මනුස්සත්තං 88
මනුස්සභූතස්ස 472
මනුස්සභූතස්ස පාදති 76
මනුස්සො නො භවං 76
මන්තධරං 78
මන්තපදං 32, 122
මන්තාභාසා 272
මන්තෙ 276
මකුලකා 48
මකුලකොසී 28
මනින්ද්‍රියෙ සංවරං ආපජ්ජති 294
මනොකම්මෙන 130, 166
මනොදුච්චරිතං 234
මනොදුච්චරිතෙන 430
මනොමයම්හි 104
මනොරමං 82
මනොසඞ්ඛාරං 306
මනොසඤ්චෙතනා හෙතු 306
මනොසුචරිතෙන 430
මමඤ්ඤෙව තුම්හාකඤ්ඤෙව 2
මයූරා 26
මරණධම්මං 334
මරණධම්මො සමානො 336
මරණභයං 234
මරණසඤ්ඤා 290
මල්‍යං 176
මල්ලිකාහි 188
මසාණානිපි ධාරෙති 394

පිට්ඨඞ්කා

ම

මහණ්ණවෙ 34
මහතා පාසෙන 352
මහන්තිං සාලලට්ඨිං 386
මහන්තො කායස්ස පදාලෙතා 332. 386
මහන්තෙන 44
මහද්ධනෙ 162
මහන්තං අවිජ්ජාක්ඛන්ධං පදාලෙසි 334
මහන්තත්තං 66
මහල්ලකා 34
මහල්ලකො 476
මහාඉසි 94
මහාකාරුණිකො 138
මහාකාලා 26
මහාජනකායං 466
මහානාගං 114
මහානාදෙ 88
මහානිලං 126
මහානුභාවං 250
මහාපඤ්ඤං මහාපුරිසං 72
මහාපඤ්ඤො 126, 346
මහාපදෙසෙ 326
මහාපුඤ්ඤක්ඛෙත්තාචෙව 106
මහාපුරිසා 72
මහාපූගගණො 98
මහාභතානං 112
මහාභූතගණාලයො 280
මහාභූරිගණො 238
මහාභොගං 42
මහාභොගා මහෙසක්ඛා 388
මහාභොගෙ 162
මහාමුනිං 142
මහාමෙඝො 52, 186
මහායසො 42
මහාවාදිං 142
මහාවීරො 32
මහාසද්දො 30
මහාසමණො 44
මහාසමුද්දෙ 108
මහාසයනවොසිතා 218
මහාසරං 72
මහාසාලෙ 132
මහිකා 102

පිට්ඨඞ්කා

ම

මහිච්ඡා හොති 278
මහිද්ධිකා 94
මහිද්ධිකාතං 250
මහී 48
මහෙසිත්තං 166
මහෙසී 396
මහොදධිං 38
මහොදධිනිවාසනං 56
මංසදනෙන 202

මා

මාගවිකො 396
මා ජීරිති 334
මා ත්වං අඤ්ඤස 352
මාතඞ්ගා 26
මාතරි 8
මාතා ජීවිතා වොරොපිතා 454
මාතාපිතරෙ 132
මාතාපිතරො 128, 132
මාතාපිතූනං 132
මාතිකාධරා 284
මාතුකුච්ඡිං ඔක්කමති 250
මාතුකුච්ඡිස්මා නික්ඛමති 250
මාතුගාමො 156, 388
මාතුපට්ඨායකො 132
මාතුලුඞ්ගියො 24
මාදිසො 80
මා දුස්සීති 232
මානත්ථද්ධො 66
මානරතා 254
මානවිනයෙ 254
මානවිනයෙ ධම්මෙ 254
මානසම්භූතො අයං කායො 280
මානසමුද්දිතා 254
මානාරාමා 254
මානාරාමා පජා 254
මා නිබ්බත්තතීති 334
මානුසකං 156
මානුසං 120
මානුසස්ස 120
මානුසා 106
මානෙ සසනාති 464
මානො පහාතබ්බො 280


Free Distribution www.aathaapi.org

පිට්ඨඞ්කා

මා

මා පච්ඡා විප්පටිසාරිනො අහුවත්ථ 148
මා පමාදත්ථ 230
මාමකා 54
මා මජ්ජීති 232
මා මීයීති 384
මා මුය්හීති 232
මායාය 494
මාරකායිකා 50
මා රජ්ජීති 232
මාරක්ඛවාපි 78
මාරිස 42, 136
මාරො පාපිමා 34
මාලාකාරො 206, 244
මාලාගන්ධවිලෙපනං 388
මාලාගන්ධවිලෙපනධාරණ-
මණ්ඩනවිභූසනට්ඨානා 398
මාලාගන්ධවිලෙපනස්ස 162
මාලිකො 216, 242
මා ව්‍යාධියීති 334
මාසද්ධමාසා 140
මා හෙවං 312
මා හෙවං ආවුසො 314
මාළං 98, 100

මි

මිගරක්ඛස්ස 50
මිගරාජා 50
මිගරාජව 48
මිගලුද්දො 214
මිගවිසාණෙන 396
මිච්ඡා ආජීවො 420, 442, 464
මිච්ඡාකම්මන්තො 420
මිච්ඡාජීවෙන ජීවන්ති 104
මිච්ඡාජීවෙන ජීවිකං කප්පෙති 464
මිච්ඡාඤාණී 422
මිච්ඡාදිට්ඨිං 230
මිච්ඡාදිට්ඨිකො 114, 418, 420, 462
මිච්ඡාදිට්ඨියා 420
මිච්ඡාදිට්ඨියා ච වණ්ණං භාසති 490
මිච්ඡාදිට්ඨියා සමාදපෙති 490
මිච්ඡාපටිපජ්ජමානො 8

පිට්ඨඞ්කා

මි

මිච්ඡාවාචො 420
මිච්ඡාවායාමො 420, 442
මිච්ඡා විමුත්ති 422
මිච්ඡා සඞ්කප්පො 420
මිච්ඡා සමාධි 420, 442,
මච්ඡා සති 420, 442
මිත්තභාණී 172
මිත්තස්ස 78
මිත්තාමච්ච 128
මිය්‍යාමි 158
මිළ්හමක්ඛිතං 86

මු

මුඛාවරණං 240
මුච්චමහාති 68
මුඤ්ජ 26
මුඤ්ජබබ්බජභූතො 402
මුට්ඨස්සච්චෙ සමාදපෙති 416
මුට්ඨස්සතිං 62
මුත්තං 48
මුත්තං න මක්ඛදති 52
මුත්තං භාසති 334
මුත්තො 52
මුත්තෙ අමුත්තවාදිතා 472
මුත්තෙ අමුත්තවාදී 434
මුත්තෙ මුත්තවාදිතා 472
මුත්තකරීසං වජමානා 68
මුත්තවාගො 124
මුත්තපටිභානො න යුත්ත
පටිභානො 260
මුත්තාවාරෙ 394
මුත්තාති 82
මුදිතා සහගතෙන චෙතසා 248
මුදුතා 288
මුදුභූතෙ 402
මුද්ධාවසිත්තස්ස 166
මුනි 32
මුනිභාවො 44
මුය්හති 232
මුලාලියො 26
මුසලං 466
මුසාවාදස්ස ච වණ්ණං භාසති 488
මුසාවාදා 188

Free Distribution www.aathaapi.org

පිට්ඨඞ්කා

මු

මුසාවාද පටිවිරතො 418
මුසාවාද වෙරමණියා වණ්ණං භාසති 488
මුසාවාද වෙරමණියා ච සමනුඤ්ඤො 488
මුසාවාදිනි 112
මුසාවාදී 112, 123. 158, 418
මුසාවාදෙ ච සමනුඤ්ඤො හොති 488
මුසාවාදෙ සමාදපෙති 418
මුසාවාදෙ 272
මුහුත්තමපි 278

මූ

මූලං 158
මූලඤ්ච 118
මූලතො 72
මූලෙ ඡින්දෙය්‍ය 386
මූසිකා 136, 2 08
මූසිකූපමා 210
මූළ්හස්ස 194

මෙ

මෙසෙ 74
මෙත්තචිත්තවත්තාය 84
මෙත්තාවිහාරිනො 30
මෙත්තාසහගතෙන චෙතසා 246
මෙත්තෙන චිත්තෙන ඵරි 136
මෙථුනං ධම්මං පතිසෙවන්ති 104
මෙථුනසම්භූතො අයං කායො 280
මෙථුනෙ ච සෙතුඝාතො 280
මෙදිනිං 250
මෙරයං 104
මොතබ්බං 52
මොතබ්බං න මඤ්ඤති 52
මොදිතා 30
මොනෙ 42
මොනෙය්‍ය සම්පන්නා 46
මොසල්ලං 466
මොහජං දුක්ඛං 288
මොහක්ඛයානුත්තානං 280
මොහනීයෙ 28, 118
මොහනීයෙසු ධම්මෙසු 232
මොහවිනයාය 182

පිට්ඨඞ්කා

මො

මොඝවෙපුල්ලතං 278
මොහස්ස 494
මොහාගතිං 36, 38

ය

යක්ඛයොනිං 262
යක්ඛො නො භවං 76
යඤ්ච රතනං 48
යඤ්ඤං න වණ්ණෙමි 84
යඤ්ඤං වණ්ණෙතීති 84
යඤ්ඤත්ථාය 396
යඤ්ඤදෙව 154
යඤ්ඤදෙව රතනං 146
යත්වාධිකරණමෙතං 32, 294, 400
යත්ථ යත්ථ පච්චාජායති 388
යත්ථිමෙසං චන්දිමසුරියානං 250
යත්‍ර හි නාම 352, 464, 476
යථා අකුසලං 282
යථාකම්මූපගතාවුතො 316
යථාදිට්ඨං 178
යථාදිවා තථාරත්තිං 88
යථා ධම්මං 464
යථා ධම්මං පටිකරොසි 282
යථාපි පදුමං 48
යථාපි භූමි අචලා 82
යථාපි සෙලො 50
යථාබාලං 282
යථාභතං 88
යථාභතං නික්ඛිත්තො 158; 132, 430
යථාභූතං 298; 318, 386
යථාභූතං නප්පජානාති 20
යථාභූතං පජානාති 332, 402, 480
යථාමූළ්හං 282
යථා යථා 468
යථාරූපානං 230
යථාරූපෙ යඤ්ඤෙ 84
යථාවාදී තථාකාරී 48
යථා විදිතං 178
යදිච්ඡං 30
යදෙව තත්ථ සච්චං 344, 342
යම්පච්චයාස්ස 306
යම්පායං පටිපදා 298

| | පිට්ඨඞ්කා |
|---|---|
| **ය** | |
| යමිදං කම්මං | 448 |
| යමුනා | 48 |
| යථායං පුග්ගලො | 176 |
| යසං ලද්ධා | 124 |
| යසභොගසමප්පිතො | 80 |
| යස්ස කස්සචි | 464, 128 |
| යසස්සිනො | 28 |
| යසා ච | 126 |
| යසො | 224 |
| යසොපටිලාභිනිං | 122 |
| යං කිඤ්චි රූපං | 332, 386 |
| යං කිඤ්චි විඤ්ඤාණං | 332, 386 |
| යං දූරෙ සන්තිකෙ වා | 332, 386 |
| යං විතක්කං | 72 |
| යං සඞ්කප්පං | 72 |
| යංගිතං | 168 |
| **යා** | |
| යා කාචි වෙදනා | 332, 386 |
| යා කාචි සඤ්ඤා | 332, 386 |
| යාචයොගො | 126 |
| යාචිතොව | 156 |
| යා චෙතනා | 448, 286 |
| යාත්‍රා ච මෙ භවිස්සති | 282 |
| යාතස්ස | 162 |
| යානි කානිචි කුලානි | 478 |
| යානුත්තානං | 392 |
| යාපනාය | 80, 282 |
| යාව | 94 |
| යාවතකං | 242 |
| යාවතකො අහොසි | 352 |
| යාවතා | 52, 70, 314 |
| යාවතායුකං | 242 |
| යාවදෙව | 80, 282 |
| යාවධංසි වායං ලොණකාරදාරකො | 352 |
| යාවපගබ්භා | 352 |
| යාව මුඛරො | 352 |
| යාවසුභාසිතං විදං | 74 |
| යාවසුභාසිතං | 94 |
| යාහං එවමාහංසිං | 282 |

| | පිට්ඨඞ්කා |
|---|---|
| **යි** | |
| යිට්ඨුකාමො | 114, 270 |
| **යු** | |
| යුජ්ජරෙ | 34, 162 |
| යුත්තපටිභානො න මුත්තපටිභානො | 260 |
| යුත්තපටිභානො ච මුත්තපටිභානො ච | 260 |
| යුත්තයොගො | 92 |
| යුවා | 46 |
| **යූ** | |
| යූථා | 120 |
| යූපුස්සාය | 326 |
| යූපො | 34 |
| **යෙ** | |
| යෙ කෙචි සඞ්ඛාරා | 332, 386 |
| යෙන පවාරෙති , | 154 |
| යෙන යෙනෙව බෙති | 400 |
| යෙන යෙනෙව පක්කමති | 400 |
| යෙපිස්ස | 380 |
| යෙභුය්‍යෙන | 66, 476 |
| යෙසං ඛො | 78 |
| යෙහි වෙසාරජ්ජෙහි | 18 |
| **යො** | |
| යො ඛො ම්‍යායං පුග්ගලො | 406 |
| යොගං | 156 |
| යොගක්ඛෙමං | 166, 172, 476 |
| යොගක්ඛෙමාධිවාහනං | 92, 146 |
| යොගා | 20 |
| යොගො කරණීයො | 176 |
| යොධාජීවො | 332, 386 |
| යොනි චස්ස ආරද්ධා | 144 |
| යොනිසො පදහති | 224 |
| යොනිසො මනසිකාරො | 470 |
| යොපායං | 44 |
| යොපායං ධම්මො | 42 |
| යො සඤ්ඤුදත්තානං පරදත්තභොජිනං | 122 |

පිට්ඨඞ්කා

ර

රක්ඛති චක්ඛුන්ද්‍රියං 294, 400
රජනීයෙසු ධම්මෙසු 232
රජාපථෙ 398
රඤ්ඤො අභිගමනඤ්ච 332, 386, 480
රඤ්ඤෙ චක්කවත්තිම්හි 256
රඤ්ඤො නාගා 68
රත්තඤ්ඤු 56
රත්තින්දිවං 140
රත්තූපරතො 398
රථකාරකුලෙ 162
රපිකම්පි 226
රපියා රපියං 464
රහොගතස්ස 42

රා

රාගජං දුක්ඛං 288
රාගදොසමොහානං 168, 458
රාගවිනයාය 182
රාගවෙපුල්ලතං 278
රාගස්ස පරිඤ්ඤාය 494
රාගො චිත්තං අනුද්ධංසෙති 242
රාජතො වා 128
රාජබලිං 128
රාජභයං 234
රාජභොග්ගො 220, 332, 386, 480
රාජයුත්තා 140
රාජා 396
රාජාචක්කවත්ති 266
රාජාචක්කවත්ති ථූපාරහො 470
රාජානං චක්කවත්තිං 256
රාජාතො 236
රාජානො අධම්මිකා 140
රාජාරහො 220, 332, 480
රාමපුත්තො 348
රාහු අසුරින්දො 34, 102
රාහුම්බම්පි කරොන්ත 236

රු

රුක්ඛමූලං 54, 400
රුක්ඛා 214
රුක්ඛා ජිජ්ජන්තු 396
රුක්ඛූපමා 214
රුදමානා 396
රුදමානො 12

පිට්ඨඞ්කා

රූ

රූපං අත්තතො සමනුපස්සති 408
රූපග්ගං 148
රූපගතං 246
රූපප්පමාණො රූපප්පසන්නො 134
රූපවන්තං වා අත්තානං 408
රූපස්මිං වා අත්තානං 408
රූපසොඛුම්මං 36
රූපසොඛුම්මෙන 36
රූපස්ස අත්ථඞ්ගමො 88, 172
රූපස්ස සමුදයො 88
රූපිතො වා 70

රො

රොගතො 246
රොගා 276
රොගාතඞ්කෙන ඵුට්ඨස්ස 338
රොසන්තා 410
රොසන්තං පටිරොසති 294

ල

ලජ්ජී 398
ලද්ධා ච චීවරං 56
ලපති 48
ලපා 54
ලසගතෙන 322
ලසගතෙන හත්ථෙන 322
ලහුකෙන 94
ලහුකෙන අසනෙන 94

ලා

ලාභකාමො හොති 464
ලාභගරු 160
ලාභගරුතා 92
ලාභගරු න සද්ධම්මගරු 90
ලාභසක්කාරසිලොකපටිලාභාය 278
ලාභසක්කාරසිලොකානිසංසත්ථං 52
ලාභසක්කාරසිලොකො 136
ලාභී හොති චීවරපිණ්ඩපාත-
සෙනාසනගිලානපච්චය-
භෙසජ්ජපරික්ඛාරානං 480

ලු

ලූඛං 340
ලූඛෙ 396
ලූඛප්පමාණො ලූඛප්පසන්නො 134
ලෙඛනියා ලිඛෙය්‍ය 386

පිට්ඨඞ්කා

ලො

ලොකං 162
ලොකං අභිභුය්‍ය 78
ලොකචින්තා 150
ලොකනිරොධගාමිනිඤ්ච 98
ලොකනිරොධගාමිනීපටිපදා 48
ලොකනිරොධඤ්ච 98
ලොකනිරොධො 48
ලොකන්තරිකා 250
ලොකවිදූ 68, 396
ලොකසමුදයඤ්ච 98
ලොකසමුදයො 48
ලොකසමා 48
ලොකස්මිං 124
ලොකස්ස 94
ලොකස්ස අන්තං 94
ලොකානුකම්පාය 284
ලොකෙ ජාතො 78
ලොකො 48
ලොකො උද්ධසෙනා 402
ලොකො නීයති 344
ලොකො පරිකිස්සති 344
ලොමවෙධවිධො 222
ලොහිතං උප්පාදිතා 454

ව

වග්ගා 462
වචනපථානි 228, 278, 296
වචනීයාධිවචනීයෙසු 360
වචසා පරිචිතා 46
වචීකම්මෙන 130, 166
වචීදුච්චරිතං 234
වචීසඞ්ඛාරං 306
වචීසඤ්චෙතනා හෙතු 306
වචීසුචරිතානි 272, 438
වච්ඡකො 396
වච්ඡතරා සඤ්ඤදන්තා 396
වජ්ජබහුලො 262
වජ්ජීසු 2
වට්ටූපච්ඡෙදෙ 70
වණ්ණං 190
වණ්ණං දෙති 120
වණ්ණං භාසති 6, 158
වණ්ණපොක්ඛරතාය 162

පිට්ඨඞ්කා

ව

වණ්ණවන්තො 68
වණ්ණවාදී 56
වණ්ණසම්පන්නො ච 480
වණ්ණාරහස්ස 158, 190
වණිජ්ජා 152, 154
වත්තති 128
වත්තබ්බං 220
වත්ථං සාකං 388
වත්ථස්ස 162
වත්ථුං තං න හොති 308
වද භන්තෙ පච්චයෙනාති 154
වනං 66
වනපත්ථං 400
වනපත්ථානි පන්තානි-
සෙනාසනානි 482
වනමූලඵලාහාරො 394
වනාසයා 66
වන්තාති 82
වයාය 494
වයො අනුප්පත්තා 44
වයො අනුප්පත්තො 46
වලාහකා 196, 216
වලාහකූපමා 196
වංසඤ්ඤූ 56
වසවත්තී 48
වස්සසතං 94
වස්සසතජීවී 94
වස්සසතසහස්සානීති වා 276
වස්සසතායුකො 94
වස්සසතිකො 46
වස්සසහස්සානීති වා 276
වස්සානීති වා 276
වස්සිතා 196
වසිතා 208

වා

වාකචීරම්පි 394
වාචා භාසිතා 74
වාචාය 162
වාතසමුට්ඨානානි 166
වාතා 140
වාදපාසෙන 352
වාදී 268

පිට්ඨඞ්කා

**වා**

වායාමො ච 176
වායොධාතුරෙවෙසා 320
වාලකම්බලම්පි 394
වාචතනසී 320
වාචතනසී සංයොජනං 478
වාසීහි තච්ඡෙය්‍ය 386

**වි**

විකාලෙ 240
වික්ඛිත්තා වා 470
විගතච්ඡන්දො 340
විගතතණ්හා 340
විගතථීනමිද්ධො 400
විගතපරිළාහො 340
විගතපිපාසො 340
විගතපෙමො 340
විගතමල මච්ඡෙරෙන 126
විගතමල මච්ඡෙරෙන චෙතසා 112
විගතාභිජ්ඣෙන චෙතසා 400
විගතූපක්කිලෙසෙ 402
විගතො හොති 28
විඝාතවා 278
විඝාතස්ස භාගී 150
විචිකිච්ඡං පහාය 400
විචිකිච්ඡා 28, 126
විචිකිච්ඡාභිභූතො 126
විච්ඡිකා 136
විච්ඡිද්දකසඤ්ඤං 34
විජම්භති 66
විජ්ජාචරණසම්පන්නො 68, 396
විජ්ජාචරණෙනන්තකරො 316
විජ්ජා ච විමුත්ති ච 474
විජ්ජායන්තකරො 316
විඤ්ඤාණං 88
විඤ්ඤාණං අත්තතො 408
විඤ්ඤාණගතං 246
විඤ්ඤාණවන්තං වා අත්තානං 408
විඤ්ඤාණස්මිං වා අත්තානං 408
විඤ්ඤාණස්ස අත්ථගමො 172
විඤ්ඤාණස්ස සමුදයො 172
විඤ්ඤාතං 48
විඤ්ඤාතං න මඤ්ඤති 52
විඤ්ඤාතං භාසති 334

පිට්ඨඞ්කා

**වි**

විඤ්ඤාතබ්බං 52
විඤ්ඤාතා 52
විඤ්ඤාතාරං න මඤ්ඤති 52
විඤ්ඤාතෙ අවිඤ්ඤාතවාදිතා 472
විඤ්ඤාතෙ අවිඤ්ඤාතවාදී 434
විඤ්ඤාතෙ විඤ්ඤාතවාදිතා 472
විඤ්ඤාතෙ විඤ්ඤාතවාදී 434
විඤ්ඤාපතියා 186
විඤ්ඤූපසත්ථෙහි 110
විඤ්ඤූ 220
විඤ්ඤූහි 56
විතක්කං විතක්කෙති 72
විතක්කපථෙසු 72
විතක්කවිචාරානං වූපසමා 292
විතක්කා 88
විත්ථාරෙන 144
විදිතා උපට්ඨහන්ති 88
විදිතා වෙදනා උප්පජ්ජන්ති 88
විදිතා සඤ්ඤා 88
විනයං 220
විනයධරා 284
විනයවාදී 46, 398
විනයෙ සන්දස්සෙතබ්බානි 326
විනයස්ස 352
විනිපාතං 162, 236
විනිපාතිකා 450
විනීතා 16
විනීලකසඤ්ඤං 34
විනෙය්‍ය ලොකෙ අභිජ්ඣා
දොමනස්සං 494
විනොදෙති 26, 228, 294
විපච්චිතඤ්ඤූ 260
විපරිණාමධම්මානි 342
විපස්සනං 304
විපස්සනා පුබ්බඞ්ගමං සමථං 304
විපස්සිතබ්බානි 178
විපාකො 218, 334
විපුබ්බකසඤ්ඤං 34
විපුලෙන මහග්ගතෙන 246
විප්පකතා 342
විභජාමි 310
විභජ්ජව්‍යාකරණීයො 90
විභූසනාය 80

පිට්ඨඞ්කා

වි

විබ්භන්තචිත්තං 64
විමති 148
විමුත්තග්ගං 148
විමුත්තමිතිඤාණං 402
විමුත්තස්මිං 402
විමුත්තික්ඛන්ධස්ස 42
විමුත්තියා ඵස්සිතා 418
විමුත්තියා ඵස්සිස්සාමි 464
විමුත්තිසම්පන්නතරං 42
විමුත්තිසාරං 468
විමුත්තිසාරෙ 272
වියත්තො 6
විරතො මෙථුනා ගාමධම්මා 398
විරතො විකාලභොජනා 394
විරාගට්ඨං 52
විරාගනිස්සිතං 34
විරාගාය 494
විරාගො 70, 228
විරාජෙති 320
විරියං ආරභති 30, 132, 286, 492
විරියබලං 274, 290, 482
විරියසමාධි 492
විරියසම්බොජ්ඣඞ්ගං 34
විරියසම්බොජ්ඣඞ්ගො 456
විරියින්ද්‍රියං 274, 288
විරියාරම්භො 416
විරූළ්හිං 54
විරොචන්ති 102
විලොකිතං 202
විලොකෙතබ්බං 238
විවටෙන චෙතසා 88
විවටො 200
විවට්ටති 276
විවට්ටො තිට්ඨති 276
විවරාමි 310
විවරෙය්‍ය 194, 322
විවිච්ච අකුසලෙහි ධම්මෙහි 242
විවිච්චෙව කාමෙහි 88, 242, 292, 400
විවිත්තං සෙනාසනං භජති 400
විවිධා 236
විවිධා පාණා 84
විවෙකජං 242, 292
විවෙකනිස්සිතං 34

පිට්ඨඞ්කා

වි

විසංයුත්තො 24, 48
විසටං වා 402
විසත්තිකං 402
විසමං 140
විසමපරිහාරජානි 166
විසමපාකිනී 140
විසාරද 16
විසෙසභාගියා සඤ්ඤඤුති 324
විසෙසො 242
විස්සට්ඨාය 100, 186
විස්සාසමත්තාය 146
විහරතං 28
විහරති 58, 120, 166
විහරතු 44
විහරන්තො 126
විහරාමි 44, 78
විහරිංසු 44
විහරෙය්‍යාත්ථ 42, 476
විහාසිං 44
විහිංසාවිතක්කා 32, 228
විහිංසාවිතක්කත 484
විහිංසා විතක්කො 26
විහිංසූපරතියා 80, 282

වී

වීතදොසත්තා 232
වීතමදත්තා 232
වීතමොහත්තා 232
වීතරාගත්තා 232
වීතරාගො 340
වීතිසාරෙත්වා 44, 84, 190

වී

වීමංසා සමාධිපධාන-
සඞ්ඛාරසමන්නාගතං 492

වු

වුච්චන්ති 128
වුඩ්ඪා 44
වුඩ්ඪිං 54
වුඩ්ඪි හෙසා 282
වුඩ්ඪෙ 46
වුඩ්ඪො 476

පිට්ඨඞ්කා

වු

වුඩ්ඪො චෙපි 46
වුසිතං බ්‍රහ්මචරියං 402, 478
වුස්සති 52

වූ

වූපකට්ඨො 476
වූපසමිස්සති 492

වෙ

වෙචිකිච්ඡී 332
වෙණුකුලෙ 162
වෙඨෙන්තිපි තාළෙන්ත 236
වෙදනං අත්තතො 408
වෙදනග්ගං 148
වෙදනා 88
වෙදනාගතං 246
වෙදනානං 278
වෙදනාය වා අත්තානං 408
වෙදනාය අත්ථගමො 172
වෙදනාය සමුදයො 172
වෙදනාවන්තං වා අත්තානං 408
වෙදනා සොඛුම්මං 36
වෙදනාහි 224
වෙදයිතානි 166
වෙදල්ලං 14, 198
වෙදියති 450
වෙපුල්ලං 54
වෙපුල්ලතං 66
වෙපුල්ලාය 30, 492
වෙය්‍යාකරණං 14, 198, 346
වෙය්‍යාකරණෙන 310
වෙරමණියො 188
වෙරොචනො 98
වෙහප්ඵලානං දෙවානං 244
වෙහාසඞ්ගමො 94
වෙසාරජ්ජප්පත්තො 18
වෙසාරජ්ජානි 18

වො

වොකිණ්ණසුඛදුක්ඛං 448
වොසුජ්ජති 262
වොස්සග්ගපරිණාමිං 34
වොස්සග්ගරතො 126

ව්‍ය

ව්‍යඤ්ජනසො 310
ව්‍යන්තී කරොති 26

ව්‍යා

ව්‍යාකරිස්සාමි 78
ව්‍යාධිධම්මං 334
ව්‍යාධිභයං 234
ව්‍යාපන්නචිත්තො 114
ව්‍යාපාදවිතක්කං 32, 228
ව්‍යාපාදවිතක්කෙන 484
ව්‍යාපාදවිතක්කො 26
ව්‍යාපාදස්ස ච වණ්ණං භාසති 490
ව්‍යාපාදෙ ච සමනුඤ්ඤො හොති 490
ව්‍යාපාදෙ සමාදපෙති 490
ව්‍යාපාදෙ 126
ව්‍යාහරතු 62

ස

සකං පරිසං 212
සකදාගාමී 168, 458
සකිදෙව ඉමං ලොකං 168, 458
සක්කච්චං 284
සක්කායො 42, 44
සක්කරිස්සන්ති 464
සක්කා නු ඛො 94
සක්කායනිරොධං 320
සක්කායපරියාපන්නානි 68
සක්කාරකාමො 464
සක්කාරගරු 160
සක්කාරගරුතා 92
සක්කාරගරු න සද්ධම්මගරු 90
සඞ්කප්පං සඞ්කප්පෙති 72
සඞ්කප්පෙතුං 72
සඞ්කස්සරසමාචාරෙ 462
සඞ්කිලෙසිකානි 334
සඞ්කිලෙසිකෙහි 22
සඞ්ඝං ගච්ඡති
46, 106, 220, 332, 386, 480
සඞ්ඛතා වා අසඞ්ඛතා වා 70
සඞ්ඝමුණ්ඩිකම්පි කරෙන්ත 236
සඞ්ඝලිඛිතං 398
සඞ්ඛාතුං 276
සඞ්ඛාය කුලානි උපසඞ්කමති 278

| | පිට්ඨඞ්කා |
|---|---|
| **ස** | |
| සඞ්ඛාය ධම්මං භාසති | 278 |
| සඞ්ඛාය නිසීදති | 278 |
| සඞ්ඛාරගතං | 246 |
| සඞ්ඛාරවන්තං වා අත්තානං | 408 |
| සඞ්ඛාරසොබ්භම්මං | 36 |
| සඞ්ඛාරා | 88, 178 |
| සඞ්ඛාරානං අත්ථගමො | 172 |
| සඞ්ඛාරානං සමුදයො | 172 |
| සඞ්ඛාරා විපස්සිතබ්බා | 178 |
| සඞ්ඛාරෙ අත්තතො | 408 |
| සඞ්ඛාරෙසු වා අත්තානං | 408 |
| සඞ්ඛිත්තෙන | 476 |
| සගච්චණ්ඩා | 210 |
| සග්ගං | 162 |
| සග්ගං ලොකං | 124 |
| සග්ගසංවත්තනිකං | 122, 128 |
| සග්ගසංවත්තනිකා | 106 |
| සග්ගසංවත්තනිකො | 110 |
| සඞ්ගහවත්ථූනි | 66, 476 |
| සඞ්ගාමගතො | 226 |
| සඞ්ගාහබලං | 274, 276 |
| සඞ්ඝං සොභෙන්ති | 16 |
| සඞ්ඝභෙදාය | 460 |
| සඞ්ඝභෙදක නන්දති | 462 |
| සඞ්ඝස්ස සම්මුඛා | 326 |
| සඞ්ඝාටිපත්තචීවරං | 238 |
| සඞ්ඝාටිපත්තචීවරධාරණං | 202 |
| සඞ්ඝාටිපත්තචීවරධාරණො | 400 |
| සඞ්ඝාතං ආපජ්ජන්ති | 84 |
| සඞ්ඝාදිසෙසං ධම්මං | 466 |
| සඞ්ඝාදිසෙසෙසු ධම්මෙසු | 466 |
| සඞ්ඝා වා ගණා වා | 70 |
| සඞ්ඝෙ වා | 148 |
| සඞ්ඝෙපි භින්නෙ හොති | 454 |
| සඞ්ඝෙ විහරති | 326 |
| සචෙ | 220, 254, 462, 470 |
| සචෙ හි | 136 |
| සච්චං | 220 |
| සච්චවාචා | 272, 438 |
| සච්චවාදී | 398 |
| සච්චසන්ධො | 398 |
| සච්ඡිකතො | 48 |
| සච්ඡිකත්වා පවෙදෙන්ති | 446 |

| | පිට්ඨඞ්කා |
|---|---|
| **ස** | |
| සජ්ඣායාපි | 322 |
| සඤ්ඤං අත්තතො | 408 |
| සඤ්ඤග්ගං | 148 |
| සඤ්ඤා | 88 |
| සඤ්ඤාගතං | 246 |
| සඤ්ඤාතො | 218 |
| සඤ්ඤාය අත්ථගමො | 172 |
| සඤ්ඤාය වා අත්තානං | 408 |
| සඤ්ඤාය සමුදයො | 172 |
| සඤ්ඤාවන්තං වා අත්තානං | 408 |
| සඤ්ඤාවිපල්ලාසා | 100 |
| සඤ්ඤොජනා | 304 |
| සඤ්ඤිතො වා | 70 |
| සඤ්ඤිම්හි | 98 |
| සඤ්ඤාසොබ්භම්මං | 36 |
| සණ්ඨපෙතබ්බං | 180 |
| සණ්හඵරුසසම්ඵං | 218 |
| සණ්හවාචා | 272, 438 |
| සණ්හෙනපි | 218 |
| සතතං සමිතං | 26 |
| සතපදී | 136 |
| සතසමිති හොති | 404 |
| සතාධිපතෙය්‍යං | 468 |
| සති ච | 176 |
| සති චෙතසො | 232 |
| සතින්ද්‍රියං | 274, 288 |
| සතිපට්ඨානෙ | 416 |
| සති බලං | 274, 482 |
| සතිමා | 72 |
| සතිමා සුඛවිහාරී | 244, 292 |
| සතිසම්පජඤ්ඤාන | 88 |
| සතිසම්පජඤ්ඤෙන | 400 |
| සතිසම්බොජ්ඣඞ්ගො | 456 |
| සති සුපට්ඨිතා | 468 |
| සතො | 400 |
| සතො ච සම්පජානො, | 244, 292 |
| සත්තානං සම්මාසම්බුද්ධානං | 136 |
| සත්තාහිපි දදන්ති | 394 |
| සත්තා | 70 |
| සත්තා උප්පන්නා | 250 |
| සත්තාගාරිකො | 394 |
| සත්තා නෙරයිකා | 416, 450 |
| සත්තාලොපිකො | 394 |

| | පිට්ඨඞ්කා |
|---|---|
| **ස** | |
| සත්තාභිකම්පි | 394 |
| සත්තිප්පහාරතං | 226 |
| සථෙරෙ | 326 |
| සත්ථා දෙවමනුස්සානං | 68, 396 |
| සත්ථුගාරවෙනාපි | 150 |
| සදරති | 334 |
| සදරෙහි | 22 |
| සදෙවකෙ ලොකෙ | 34, 250 |
| සදෙවමනුස්සාය | |
| සදෙසො | 134 |
| සද්දං | 124 |
| සද්ධං පටිලභති | 338 |
| සද්ධම්මගරු | 160 |
| සද්ධම්මගරු න කොධගරු | 90 |
| සද්ධම්මසවණං | 470 |
| සද්ධම්මා | 92 |
| සද්ධම්මස්ස සම්මොසාය | 284 |
| සද්ධස්ස කුලපුත්තස්ස | 232 |
| සද්ධා | 238 |
| සද්ධා උපාසිකා | 318 |
| සද්ධාබලං | 274, 290 |
| සද්ධා භික්ඛුනී | 318 |
| සද්ධාසම්පදාය | 416 |
| සද්ධාසම්පන්නො | 416 |
| සද්ධින්ද්‍රියං | 274, 288 |
| සද්ධිවිහාරිකො | 460 |
| සද්ධො හොති | 124, 416, 436 |
| සනාභිකානි | 76 |
| සනෙමිකානි | 76 |
| සන්තං චෙතොවිමුත්තිං | 320, 322 |
| සන්තපෙපසි | 120 |
| සන්තමානසං | 76 |
| සන්තාසං | 66 |
| සන්ති | 104 |
| සන්ති ඛො පන | 392 |
| සන්තිට්ඨති | 304 |
| සන්තින්ද්‍රියං | 76 |
| සන්ති සත්තා ඉධූපපන්නා | 250 |
| සන්ති හොති | 404 |
| සන්තුට්ඨො හොති | 54, 56 |
| සන්තො සංවිජ්ජමානා | 12, 90, 162 |
| සන්ථාගාරං | 396 |
| සන්දස්සකො | 186 |

| | පිට්ඨඞ්කා |
|---|---|
| **ස** | |
| සන්දස්සියමානානි | 326 |
| සන්දස්සෙති | 100 |
| සන්දිට්ඨිකො | 108 |
| සන්ධාවිතං සංසරිතං | 2 |
| සන්නිපාතිකානි | 166 |
| සන්නිසාදෙතබ්බං | 180 |
| සන්නිසීදති | 304 |
| සපත්තභාරෙව ඩෙති | 400 |
| සපාමොක්ඛා | 326 |
| සපුබ්බදෙවතානි | 132 |
| සපුබ්බාචරියකානි | 132 |
| සප්පටිසරණො | 286 |
| සප්පභාසං චිත්තං | 88 |
| සප්පිතෙලෙන | 396 |
| සප්පිමණ්ඩො | 182 |
| සප්පිම්හා | 182 |
| සප්පුරිසතරඤ්ච | 414 |
| සප්පුරිසඤ්ච | 414 |
| සප්පුරිසසංසෙවො | 470 |
| සප්පුරිසූපස්සයො | 66 |
| සප්පුරිසෙන සප්පුරිසතරො | 418 |
| සප්පුරිසො | 6, 146, 418 |
| සබ්බකම්මානං අකිරියං | 448 |
| සබ්බත්තතාය | 246 |
| සබ්බධි | 246 |
| සබ්බලොකෙ අනභිරතසඤ්ඤී | 290, 302 |
| සබ්බසඞ්ඛාරසමථො | 228 |
| සබ්බසඞ්ඛාරෙසු අනිච්චානුපස්සී | 290 |
| සබ්බසො | 368 |
| සබ්බාකාරපරිපූරානි | 76 |
| සබ්බානිස්ස තානි | 82 |
| සබ්බාවන්තං ලොකං | 246 |
| සබ්බූපධිපටිනිස්සග්ගො | 228 |
| සබ්බෙ කාමා අනිච්චා දුක්ඛා විපරිණාම ධම්මා | 342 |
| සබ්බෙ පාණා අවජ්ඣාති | 342 |
| සබ්බෙ භවා අනිච්චා දුක්ඛා විපරිණාමධම්මා | 344 |
| සබ්බං දිට්ඨං භාසිතබ්බන්ති | 336 |
| සබ්බං මුතං භාසිතබ්බන්ති | 336 |
| සබ්බං සද්දං | 84 |
| සබ්බං රූපං | 386 |

පිට්ඨඞ්කා

ස

සබ්බං විඤ්ඤාතං භාසිතබ්බන්ති 336
සබ්බං සුතං භායිතබ්බන්ති 336
සබ්‍යඤ්ජනං 396
සබ්‍යාපජ්ඣං කායසඞ්ඛාරං 446, 450
සබ්‍යාපජ්ඣං මනොසඞ්ඛාරං 446, 450
සබ්‍යාපජ්ඣම්පි අබ්‍යාපජ්ඣම්පි කායසඞ්ඛාරං 448
සබ්‍යාපජ්ඣං ලොකං උපපජ්ජති 446
සබ්‍යාපජ්ඣං වචීසඞ්ඛාරං 446, 450
සබ්‍යාපජ්ඣං වෙදනං 446, 450
සබ්‍යාපජ්ඣා ඵස්සා 446, 450
සබ්‍යාපජ්ඣාය දිට්ඨියා 458
සබ්‍යාපජ්ඣෙන කායකම්මෙන 458
සබ්‍යාපජ්ඣෙන මනොකම්මෙන 458
සබ්‍යාපජ්ඣෙන වචීකම්මෙන 458
සබ්‍රහ්මකානි කුලානි 132
සබ්‍රහ්මකෙ 32
සබ්‍රහ්මචාරී 220, 238
සමග්ගකරණිං වාචං 398
සමග්ගනන්දී 398
සමග්ගරතො 398
සමග්ගාරාමො 398
සමඞ්ගිභූතං 240
සමණපටිඤ්ඤො 462
සමණපරිසා 256
සමණබ්‍රාහ්මණා 386
සමණමචලො 166, 168
සමණවචනහෙතුපි 232
සමණපදුමො 166
සමණපුණ්ඩරීකො 166
සමණසුඛුමාලො 166
සමණෙන වා 18, 334
සමථපුබ්බඞ්ගමං විපස්සනං 304
සමථවිපස්සනං යුගනද්ධං භාවෙති 304
සමථො ච විපස්සනා ච 474
සමනකෙ 98
සමනුපස්සති 36, 246
සමන්තා චතුද්දිසා 66
සමන්නාගතො 36, 44, 122, 186

පිට්ඨඞ්කා

ස

සමන්නාහරිත්වා 226
සමපඤ්ඤා 118
සමප්පිතං 240
සමයං 42, 44
සමයෙන සමයං 130
සමවයසට්ඨෙසනො 80
සමවෙක්ඛිස්සාමි 468
සමසද්ධා 118
සමසීලා 118
සමාදපකො 186
සමාදපෙති 100, 182, 188
සමාදහාතබ්බං 180
සමාදාය සික්ඛති 468
සමාදායෙව පක්කමති 400
සමාදාය සික්ඛති සික්ඛාපදෙසු 480
සමාධඞ්ගං 148
සමාධික්ඛන්ධස්ස 42
සමාධිජං 292
සමාධිජං පීතිසුඛං 244
සමාධින්ද්‍රියං 274, 288
සමාධිබලං 274, 482
සමාධිභාවනා 88
සමාධිස්මිං පරිපූරකාරී 262
සමාධිසම්පන්නතරං 42
සමාධිසම්බොජ්ඣඞ්ගො 456
සමාධිසංවත්තනිකෙහි 110
සමාධිසාරෙ 272
සමානත්තතා 66, 476
සමානා 68
සමානො 134
සමා පටිපදා 294
සමාරකෙ සබ්‍රහ්මකෙ 260
සමාහිතං චිත්තං 28
සමාහිතෙ චිත්තෙ 402
සමුත්තෙජකො 186
සමුත්තෙජෙති 100
සමුදයඤ්ච 22
සමුදාචරන්ති 166, 406
සමෙති 294
සමෙන්ති 128
සමොහො 134
සම්පජඤ්ඤඤ්ච
සම්පජානකාරී 400


Free Distribution www.aathaapi.org

පිට්ඨඞ්කා

ස

සම්පජානො 56, 306, 400
සම්පදාලෙත්වා 68
සම්පන්නපාතිමොක්ඛා 28
සම්පන්නසීලා 28
සම්පරායිකස්ස 230
සම්පවාරෙසි 120
සම්පසාදනං 292
සම්පස්සමානො 464
සම්පහංසකො 186
සම්පහංසෙති 100
සම්ඵප්පලාපස්ස ච වණ්ණං භාසති 488
සම්ඵප්පලාපා පටිවිරතො 418
සම්ඵප්පලාපා වෙරමණියා ච වණ්ණං භාසති 488
සම්ඵප්පලාපා වෙරමණියා ච සමනුඤ්ඤො හොති 488
සම්ඵප්පලාපී 114, 418
සම්ඵප්පලාපෙ ච සමනුඤ්ඤො හොති 488
සම්ඵප්පලාපෙ සමාදපෙති 418
සම්ඵප්පලාපො 158, 272
සම්බහුලා 60, 110
සම්බහුලා ථෙරා 328
සම්බහුලා බ්‍රාහ්මණා 44
සම්බාධො ඝරාවාසො 398
සම්බොධිපරායනො 150, 168, 458
සම්මදෙව 478
සම්මප්පඤ්ඤාය දට්ඨබ්බං 320
සම්මප්පඤ්ඤාය පස්සති 386
සම්මප්පධානානි 30
සම්මසිතබ්බා 178
සම්මා ආජීවො 170, 422
සම්මා ආයාචමානො 318
සම්මාකම්මන්තො 170, 422
සම්මාඤාණී 170, 422
සම්මාදිට්ඨිං 230
සම්මාදිට්ඨිකා 114
සම්මාදිට්ඨිකො 170, 422, 454
සම්මාදිට්ඨියා ච වණ්ණං භාසති 490
සම්මාදිට්ඨියා ච සමනුඤ්ඤො හොති 490
සම්මාදිට්ඨි හොති 490

පිට්ඨඞ්කා

ස

සම්මාදුක්ඛක්ඛයාය 18, 468
සම්මාධාරං 140
සම්මාධාරං නානුප්පවෙච්ඡෙය්‍ය 322
සම්මාපටිපජ්ජමානො 10
සම්මාමානාභිසමයා 320, 478
සම්මාවදමානො 168
සම්මාවාචො 170, 422
සම්මාවායාමො 170, 422
සම්මාවිමුත්ති 170, 388, 422
සම්මාසති 60, 422
සම්මාසති ධම්මපදං 62
සම්මාසතී 170, 442
සම්මාසමාධි 60, 170
සම්මාසමාධි ධම්මපදං 62
සම්මාසමාධී 422
සම්මාසමාධී හොති 442
සම්මාසම්බුද්ධස්ස 18
සම්මාසම්බුද්ධො 44, 68, 396
සම්මාසම්බොධිං 232
සම්මා සීහනාදං නදථ 458
සම්මා සුඛං පරිහරති 128
සම්මිඤ්ජිතං 202
සම්මිඤ්ජිතං වා බාහං 44
සම්මිඤ්ජිතබ්බං 238
සම්මිඤ්ජිතෙ පසාරිතෙ 400
සම්මිඤ්ජෙය්‍ය 44
සම්මුඛා මෙතං සුතං 326
සම්මුඛා පටිග්ගහිතං 326
සම්මුඛීභූතො 148, 310
සම්මොදනීයං කථං 44, 84, 190
සම්මොදි 84, 120
සම්මොදිංසු 44
සම්මොහං ආපජ්ජති 338
සයං අභිඤ්ඤා 12, 166, 446
සයං අභිඤ්ඤා සච්ඡිකත්වා 282, 478
සයානස්ස චෙපි භික්ඛුනො 26
සයානොපි භික්ඛු 28
සරණං ගච්ඡාමි 134
සරණං ගතං 194
සරභූ 136
සරාගො 134
සරිතං 402
සරිතා 72

| ස | පිට්ඨඞ්කා |
| --- | --- |
| සරූපවච්ඡාය | 396 |
| සල්ලතො | 246 |
| සවිචාරං | 232 |
| සවිතක්කං | 242 |
| සවිතක්කං සවිචාරං | 292 |
| සවුපාදානොව සමානො | 318 |
| ස්වාක්ඛාතො | 108 |
| සොච අරතිං සහති | 58 |
| සසඞ්ඛාර පරිනිබ්බායී | 300 |
| සසීසං පාරුපිත්වා | 280 |
| සසුරම්පි | 146 |
| සසුරෙපි | 146 |
| සස්සතම්හාති | 68 |
| සස්සතො ලොකොති | 82 |
| සස්සමණ බ්‍රාහ්මණියා | 34 |
| සස්සමණ බ්‍රාහ්මණියා පජාය | 250 |
| සස්සාති | 140 |
| සස්සුයාපි | 146 |
| සස්සුම්පි | 146 |
| සහ උපජ්ඣායෙහි | 124 |
| සහ සදීහි | 124 |
| සහත්ථා | 120 |
| සහධම්මිකා වාදානුපාතා | 64 |
| සහධම්මෙන | 18, 124 |
| සහව්‍යතං උපපජ්ජති | 242, 308 |
| සහස්සාරානි | 76 |
| සහාපි දුක්ඛෙන | 12 |
| සහාපි දොමනස්සෙන | 12 |
| සහායකොපි | 150 |
| සහිතානං අනුප්පදාතා | 398 |
| සහිතා සහිතස්ස | 266 |
| සංකිලෙස ධම්මං යෙව | 474 |
| සංයතින්ද්‍රියං | 76 |
| සංයුත්තා | 22 |
| සංවට්ටති | 276 |
| සංවත්තන්ති | 124 |
| සංවරං ආපජ්ජති | 32, 400 |
| සංවරත්ථං | 52 |
| සංවරප්පධානං | 138 |
| සංවරප්පධානාය | 32 |
| සංවරාය පටිපජ්ජති | 32, 294 |
| සංවාසම්භාග | 146 |

| ස | පිට්ඨඞ්කා |
| --- | --- |
| සංවාසා | 110, 114 |
| සංවිජ්ජති | 222 |
| සංවිගො | 224 |
| සංවෙගං | 66 |
| සංවෙගං ආපජ්ජති | 220 |
| සංවෙජනීයානි | 232 |
| සංසාරං නාතිවත්තති | 402 |

| සා | |
| --- | --- |
| සා අත්තමනා හොති | 254 |
| සාකභක්ඛාපි | 394 |
| සාකුන්තිකො | 396 |
| සාඛාපලාසං | 326 |
| සාඨෙය්‍යස්ස | 494 |
| සාණානිපි ධාරෙති | 394 |
| සාළිකා | 286 |
| සාත්ථං | 396 |
| සාත්ථා | 46 |
| සාධුකං උග්ගහෙත්වා | 326 |
| සාධු කිර | 280 |
| සාධු සාධු භික්ඛු | 344 |
| සානුවජ්ජො | 6, 484 |
| සානුසෙති | 20 |
| සාපදෙසං | 46, 398 |
| සාමං පස්සති | 224 |
| සාමඤ්ඤඞ්ගං | 54 |
| සාමඤ්ඤෙච | 224 |
| සාමාක භක්ඛාපි | 394 |
| සාමිකම්පි | 146 |
| සාමිකො | 114 |
| සාමීචිකම්මං | 348 |
| සාමීචිපටිපන්නො | 110 |
| සායතනියකම්පි | 394 |
| සායන්හසමයං | 60, 342 |
| සාසිතබ්බං | 240 |
| සාරපරිවාරෙ | 214 |
| සාරම්භං යඤ්ඤං | 84 |
| සාරම්භස්ස | 494 |
| සාරු | 272 |
| සාරාණියං | 44, 84 |
| සාරීරිකානං | 278 |
| සාරීරිකාහි | 224 |
| සාරො | 214 |

පිට්ඨඞ්කා

සා

සාලෝහිතො වා 224
සාවකසඞ්ඝා 70, 110
සාවකානං 468
සාවජ්ජාය දිට්ඨියා 456, 484
සාවජ්ජෙන කායකම්මෙන 262, 456, 484
සාවජ්ජෙන මනොකම්මෙන 262, 456, 484
සාවජ්ජෙන වචීකම්මෙන 262, 456, 484
සාවජ්ජො 6, 262, 438, 484
සාහං 236
සාහුනෙය්‍යකානි 132

සි

සික්ඛං පච්චක්ඛාය 238, 240
සික්ඛානිසංසං 468
සික්ඛානිසංසමිදං 468
සික්ඛාසාජීව සමාපන්නො 398
සික්ඛිතො 94
සිඛී 54
සිඞ්ඝාටකෙන සිඞ්ඝාටකං 464
සියා ඛො පන 148
සිරිංසපානි 136

සී

සීතස්ස 228, 278, 296
සීතිභූතො 392
සීලක්ඛන්ධස්ස 42
සීලක්ඛන්ධෙන 440
සීලග්ගං 148
සීලතො 234
සීලවතී 114, 174
සීලවා 46, 144, 214, 436
සීලසම්පදා 124
සීලසම්පන්නො 78
සීලසාරෙ 272
සීලෙසු න පරිපූරකාරී 262
සීලෙහි 110
සීසං ඡින්දථ 464
සීසච්ඡෙජ්ජං 464
සීසස්ස වා 178
සීහනාදං නදති 18, 66

පිට්ඨඞ්කා

සී

සීහසෙය්‍යං කප්පෙති 86
සීහසෙය්‍යා 470
සීහො මිගරාජා 66, 470

සු

සුකරං 106, 108, 276, 398
සුකුසලො 310
සුඛඤ්ච 290
සුඛඤ්ච කායෙන පටිසංවෙදෙති 244
සුඛං දෙති 120
සුඛදුක්ඛං 306
සුඛපටිසංවෙදී 392
සුඛබහුලා 68
සුඛවිපාකං 128
සුඛවිපාකො 106, 110
සුඛස්ස ච පහානා 82, 244, 292
සුඛස්සාහාරො 106
සුඛා ච 162
සුඛා පටිපදා ඛිප්පාභිඤ්ඤා 288
සුඛා පටිපදා දන්ධාභිඤ්ඤා 288
සුඛෙති 128
සුගත 44
සුගතවිනයො වා 284
සුගතිං 124, 162
සුගතො 68, 184, 396
සුග්ගහීතං 286
සුචරිතං 162
සුචිභූතෙන අත්තනා 398
සුඤ්ඤතො 246
සුඤ්ඤා පරප්පවාදා සමණෙහි 458
සුණාති 324
සුතං 48
සුතං න මඤ්ඤති 50
සුතං නෙතං 46
සුතං භාසති 334
සුතකවි 444
සුතජාතස්ස 72
සුතධරො 46
සුතවතො අරියසාවකස්ස 242
සුතවා 346
සුතවා නිබ්බෙධික පඤ්ඤො 346
සුතසන්නිචයො 46

Free Distribution www.aathaapi.org

පිට්ඨඞ්කා

සු

සුතානඤ්ච ධම්මානං 186
සුතෙ අසුතවාදිතා 472
සුතෙ අසුතවාදී 434
සුතෙ සුතවාදිතා 472
සුතෙ සුතවාදී 434
සුත්තං 14, 198, 346
සුත්තන්තානං 284, 286
සුත්වා ඔතාරෙතබ්බානි 326
සුද්ධං අත්තානං 234
සුද්ධාවාසානං දෙවානං 246
සුද්ධෙන හත්ථෙන 322
සුනඛෙහිපි ඛාදාපෙන්ත 236
සුනයො හොති 286
සුපටිපන්නො 110
සුපාපිකා දස්සනාය 388
සුප්පවාසාය 120
සුබ්බචා හොන්ති 286
සුභකිණ්හානං දෙවානං 244
සුභාසිතං 94
සුරම්පිවන්ති 104
සුරාමෙරයපානා 104
සුරාමෙරයමජ්ජපමාදට්ඨානා 112, 188
සුරාමෙරයමජ්ජපමාදට්ඨායිනී 112
සුරියපජ්ජොතො 270
සුරියප්පභා 268
සුරියාභා 268
සුරියාලොකො 270
සුලභඤ්ච 54
සුවචො 98
සුවිසොධිතං 386
සුවූපසන්තචිත්තො 400
සුසමාහිතා 54
සුසානං 400
සුසුකාභයං 238
සුසුකාභයස්ස භීතො 242
සුසුකාලකෙසො 46
සුස්සූසන්ති 252
සූකරිකො 396
සූපට්ඨිතා හොති 290, 302

පිට්ඨඞ්කා

සෙ

සෙබ්බලානි 290
සෙඛො හොති 166, 172
සෙට්ඨො ච 182
සෙදාවක්ඛිත්තා 130
සෙදාවක්ඛිත්තෙහි 128
සෙනාසනං 166
සෙනාසනහෙතු 20, 56, 476
සෙනාසනානං 54
සෙනාසනෙන 122
සෙම්හසමුට්ඨානානි 166
සෙය්‍යං කප්පෙති 396
සෙය්‍යං කප්පෙන්ති 470
සෙය්‍යථාපි අස්සතරී 138
සෙය්‍යථාපි කදලී 138
සෙය්‍යථාපි නළො 138
සෙය්‍යථාපි නාම 44
සෙය්‍යථාපි වඩ්ඪකා 146
සෙය්‍යථාපි වෙළු 138
සෙය්‍යාවසථපදීපෙය්‍යං 388
සෙය්‍යාවසථපදීපෙය්‍යස්ස 162

සො

සො කායො න හොති 306
සොණ්ඩි 238
සොබ්භමානි 36
සොතං ඔදහන්ති 252
සොතබ්බං 52
සොතබ්බං න මඤ්ඤන්ති 52
සොතා 226
සොතාපන්නො 150, 168, 458
සොතෙන සද්දං සුත්වා 32, 294, 400
සොත්ථිං 128
සොත්ථිනා පාරං ගමිස්සති 386
සොපිස්ස පහීනො හොති 408
සොමනස්සදොමනස්සානං 82
සොරච්චෙන 220
සොවග්ගිකං 128
සොවග්ගිකො 110
සොවචස්සකරණෙහි ධම්මෙහි 286

| පිට්ඨඞ්කා | |
|---|---|
| **හ** | |
| හටභෙකඛාපි | 394 |
| හත්ථප්පජ්ජොතිකම්පි | 236 |
| හත්ථපාදම්පි ඡින්දන්තෙ | 236 |
| හත්ථම්පි ඡින්දන්තෙ | 236 |
| හත්ථාපලෙඛනො | 394 |
| හත්ථිගවාස්සවළවාපටිග්ගහණා | 398 |
| හත්ථිදම්මසාරථි | 226 |
| හත්ථිම්පි | 226 |
| හදයඞ්ගමා | 398 |
| හතාම්හි | 218, 220 |
| හතාසා | 226 |
| හන්දවදන්ති | 350 |
| හරිතුපලිත්තාය | 396 |
| හාසභාගියා සන්දස්සෙති | 324 |

| පිට්ඨඞ්කා | |
|---|---|
| **හි** | |
| හිතාය | 106, 110, 284 |
| හිරිඔත්තප්පං | 146 |
| හිරිබලං | 290 |
| හිරීමතාය | 416 |
| හිරීමා හොති | 416, 436 |
| හීනං වා පණීතං වා | 332 386 |
| හීනවීරියොති | 26 |
| හීනා අක්ඛායති | 298 |
| හීනායාවත්තති | 238, 240 |
| **හෙ** | |
| හෙතු | 154 |
| **හො** | |
| හොති ච න හොති ච | 82 |
| හොති තථාගතො | 82 |

## නැවත මුද්‍රණය - සම්බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථ මාලා

| | | |
|---|---|---|
| 1 | පාරාජිකා පාළි | |
| 2 | (i) පාචිත්තිය පාළි | |
| | (ii) පාචිත්තිය පාළි | |
| 3 | මහාවග්ග පාළි | I |
| 4 | මහාවග්ග පාළි | II |
| 5 | (i) චුල්ලවග්ග පාළි | I |
| | (ii) චුල්ලවග්ග පාළි | II |
| 6 | (i) පරිවාර පාළි | I |
| | (ii) පරිවාර පාළි | II |
| 7 | දීඝනිකාය 1 | |
| 8 | දීඝනිකාය 2 | |
| 9 | දීඝනිකාය 3 | |
| 10 | මජ්ඣිම නිකාය | I |
| 11 | මජ්ඣිම නිකාය | II |
| 12 | මජ්ඣිම නිකාය | III |
| 13 | සංයුක්ත නිකාය | I |
| 14 | සංයුක්ත නිකාය | II |
| 15 | සංයුක්ත නිකාය | III |
| 16 | සංයුක්ත නිකාය | IV |
| 17 | (i) සංයුක්ත නිකාය | V |
| | (ii) සංයුක්ත නිකාය | V |
| 18 | අංගුත්තර නිකාය | I |
| 19 | අංගුත්තර නිකාය | II |
| 20 | අංගුත්තර නිකාය | III |
| 21 | අංගුත්තර නිකාය | IV |
| 22 | අංගුත්තර නිකාය | V |
| 23 | අංගුත්තර නිකාය | VI |
| 24 | ඛුද්දක නිකාය | I |